වාර්ෂික වාර්තාව 2022

II වන වෙළුම

ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2022
වර්ෂය සඳහා

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්
ගරු මුදල් ඇමති වෙත ඉදිරිපත්
කරනු ලබන

වාර්ෂික වාර්තාව
(II වන වෙළුම)

පිටපතක මිල (I වෙළුම සඳහා)

මහ බැංකු කවුන්ටරයෙන් මිලදී ගැනීමේ දී	- පිටපතක මිල රුපියල් 700 යි.
සාමාන්‍ය තැපෑලෙන් එවීමට	- පිටපතක මිල රුපියල් 1,000 යි.
ලියාපදිංචි තැපෑලෙන් එවීමට	- පිටපතක මිල රුපියල් 1,520 යි.

පිටපතක මිල (II වෙළුම සඳහා)

මහ බැංකු කවුන්ටරයෙන් මිලදී ගැනීමේ දී	- පිටපතක මිල රුපියල් 800 යි.
සාමාන්‍ය තැපෑලෙන් එවීමට	- පිටපතක මිල රුපියල් 1,100 යි.
ලියාපදිංචි තැපෑලෙන් එවීමට	- පිටපතක මිල රුපියල් 1,650 යි.

පිටපතක මිල (වෙළුම් දෙකම සඳහා)

මහ බැංකු කවුන්ටරයෙන් මිලදී ගැනීමේ දී	- පිටපතක මිල රුපියල් 1,500 යි.
සාමාන්‍ය තැපෑලෙන් එවීමට	- පිටපතක මිල රුපියල් 1,850 යි.
ලියාපදිංචි තැපෑලෙන් එවීමට නොහැක.	

එතෙර මිල (ඉහත ඕනෑම වෙළුමකට හෝ වෙළුම් දෙකම සඳහා)

ගුවන් තැපෑලෙන් (පළමුවැනි පන්තිය) එවීමට	- පිටපතක මිල එ.ජ.ඩොලර් 40 යි (ලි.ප.තැ.)
ගුවන් තැපෑලෙන් (දෙවැනි පන්තිය) එවීමට	- පිටපතක මිල එ.ජ.ඩොලර් 35 යි (ලි.ප.තැ.)
මුහුදු තැපෑලෙන්	- පිටපතක මිල එ.ජ.ඩොලර් 25 යි (ලි.ප.තැ.)

ISBN 978-624-5917-34-1
ISSN 1391-359X

කොළඹ 12, සාන්ත බස්තියම කන්ද, අංක 20 දරන ස්ථානයේ පිහිටි සීමාසහිත ඇම්.ඩී.ගුණසේන මුද්‍රණකරුවෝ සහ (පුද්ගලික) සමාගම විසින් මුද්‍රණය කරන ලදුව, කොළඹ 01 ජනාධිපති මාවතේ, අංක 30 දරන ස්ථානයේ පිහිටි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පළ කරන ලදි.

පටුන

II වන වෙළුම

දෙවැනි කොටස

ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු 1-156

තුන්වැනි කොටස

මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ රජය හා මුදල් මණ්ඩලය විසින් වසර තුළදී උපයෝගී කරගනු ලැබූ පරිපාලන විධිවිධාන 1-124

හතරවැනි කොටස

2022 වසරේ දී සම්මත කරන ලද මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ ප්‍රධාන නීති අණපනත් 1-90

දෙවැනි කොටස

දෙවැනි කොටස
ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම් සහ කටයුතු

		පිටුව
1.	ගිණුම්කරණ සහ මූල්‍ය	1
2.	බැංකු අධීක්ෂණ	87
3.	බැංකු විදු පියෙස	90
4.	සන්නිවේදන	91
5.	ව්‍යවහාර මුදල්	93
6.	දේශීය මෙහෙයුම් කටයුතු	95
7.	ආර්ථික පර්යේෂණ	99
8.	සේවක අර්ථසාධක අරමුදල	103
9.	පහසුකම් කළමනාකරණ	106
10.	මූල්‍ය කටයුතු	106
11.	මූල්‍ය පාරිභෝගික සබඳතා	108
12.	මූල්‍ය බුද්ධි ඒකකය	109
13.	විදේශ විනිමය	111
14.	විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීම්	115
15.	මානව සම්පත්	116
16.	තොරතුරු තාක්ෂණ	123
17.	අභ්‍යන්තර විගණන	125
18.	ජාත්‍යන්තර මෙහෙයුම්	126
19.	නීති හා අනුකූලතා	128
20.	සාර්ව විචක්ෂණතා අධ්‍යයන	129
21.	ගෙවීම් සහ පියවීම්	131
22.	ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ	134
23.	රාජ්‍ය ණය	134
24.	ප්‍රාදේශීය සංවර්ධන	137
25.	නිරාකරණ හා බලගැන්වීම්	142
26.	අවදානම් කළමනාකරණ	144
27.	ලේකම් දෙපාර්තමේන්තුව	145
28.	ආරක්ෂක සේවා	146
29.	කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ	146
30.	සංඛ්‍යාන	147
31.	බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය	150

1. ගිණුම්කරණ සහ මූල්‍ය

2022 මූල්‍ය වර්ෂය තුළ සහ ඊට අදාළ, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ක්‍රියාකාරී වාර්තාව

1. හැඳින්වීම

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව මුදල් මණ්ඩල අනු කමිටුවකි. එය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද උපදේශන විගණන කමිටු රාමුව මගින් පාලනය වන අතර, ඒ අනුව මෙම ක්‍රියාකාරී වාර්තාවේ අන්තර්ගතය සැකසී ඇත. මෙම කමිටුව විසින් මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලනයන්, අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලය විසින් පැවරූ වෙනත් කරුණුවලට අදාළ ප්‍රතිපත්ති පිළිබඳව මුදල් මණ්ඩලයට නිර්දේශ ලබා දීම සිදු කරයි.

2. මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සංයුතිය

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සභාපතිත්වය මුදල් මණ්ඩලයට පත් කරන ලද සාමාජිකයෙකු විසින් දරනු ලබන අතර, සෙසු සාමාජිකයන් ලෙස විගණන/ගණකාධිකරණ වෘත්තීයවේදීහු දෙදෙනෙකු කටයුතු කරති.

2022 වර්ෂය තුළ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i) ආචාර්ය රාණි ජයමහ - සභාපතිනිය

ii) අනුෂා අයි. මොහොට්ටි මහත්මිය - සාමාජිකා

iii) ඒ. ඉන්ද්‍රජිත්. ප්‍රනාන්දු මහතා - සාමාජික

මුදල් මණ්ඩලයේ ලේකම්, මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ද ලේකම් ධූරය දරනු ලබන අතර, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, කමිටුවේ සහකාර ලේකම් ධූරය දරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව කමිටුවේ ලේඛන කටයුතු සඳහා පහසුකම් සපයයි. මූල්‍ය දෙපාර්තමේන්තුව හාර සහකාර අධිපති, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අනුකූලතා නිලධාරී, ප්‍රධාන ගණකාධිකාරී සහ ප්‍රධාන අවදානම් නිලධාරී මෙන්ම ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණන කටයුතු මෙහෙයවන ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරී, නිරීක්ෂකයන් ලෙස කමිටු රැස්වීම් වලට සහභාගී වෙති. කමිටුව විසින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු ප්‍රධානීන් වෙත සාකච්ඡා සඳහා සහ විගණන විමසුම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය වූ විට ආරාධනා කරනු ලබයි. ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව සාකච්ඡා කිරීමේ දී විගණකාධිපති විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ බාහිර විගණන කටයුතු ක්‍රියාත්මක කිරීමට පත් කරන ලද විගණන ආයතනයේ හවුල්කරු ද ආරාධනාව පරිදි කමිටු රැස්වීම් වලට සහභාගී වේ.

කමිටුව අවම වශයෙන් වර්ෂයකට හය (06) වරක් රැස්විය යුතු ය. කමිටුවේ ලේකම් විසින් සභාපතිනියගේ අනුමැතිය සහිතව මුදල් මණ්ඩලයේ, බාහිර විගණකයන්ගේ/ප්‍රධාන ගණකාධිකාරීගේ හෝ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂගේ සහ සේවක අර්ථසාධක අරමුදලේ අධිකාරීවරයාගේ ඉල්ලීම පරිදි කමිටු රැස්වීම් කැඳවනු ලබයි. රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය වනුයේ සභාපතිනිය ඇතුලුව සාමාජිකයින් දෙදෙනෙකි.

3. කමිටුව 2022.01.01 දින සිට 2023.03.31 දින දක්වා රැස්වීම් දහනවයක් (19) (2022 වර්ෂය තුළදී රැස්වීම් පහළොවක් සහ 2023 වර්ෂය තුළ දී රැස්වීම් හතරක්) පවත්වන ලදී. 2022 සහ 2023 වර්ෂයන්හී දී පහත සඳහන් කාර්යයන් එම රැස්වීම්වල දී ඉටු කොට ඇත.

3.1 2022 වර්ෂය තුළ දී උපදේශන විගණන කමිටුව විසින් සිදු කළ කාර්යයන් පහත සඳහන් වෙයි.

3.1.1. මූල්‍ය වාර්තාකරණය සහ බාහිර විගණනය

කමිටුව විසින්,

i) 2021.12.31 න් අවසන් වූ වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන විගණනය ට අදාළව KPMG ආයතනය විසින් ඉදිරිපත් කළ අතුරු කළමනාකාරිත්ව ලිපිය, අවසන් කළමනාකාරිත්ව ලිපිය සහ ඒ සඳහා වූ කළමනාකාරිත්වයේ ප්‍රතිචාර,

ii) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන,

iii) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) වගන්තියට අනුකූලව 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු සම්බන්ධයෙන් විගණකාධිපතිගේ වාර්තාව සහ ඒ සඳහා වූ කළමනාකාරීත්වයේ ප්‍රතිචාර,

iv) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන,

v) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණකාධිපතිගේ වාර්තාව,

vi) 2021.12.31 ට ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාම අරමුදල් පහේ (05) (විශ්‍රාම අරමුදල, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම අරමුදල, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම අරමුදල, නව විශ්‍රාම අරමුදල, නව වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම අරමුදල) මූල්‍ය ප්‍රකාශන,

vii) 2021.12.31 න් අවසන් වර්ෂය සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකුවේ අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන,

viii) ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් E & Y ආයතනයේ විගණන සැලැස්ම, සමාලෝචනය කරන ලදී.

3.1.2. අභ්‍යන්තර පාලනයන්

කමිටුව විසින්,

i) ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර පාලනයන් සමාලෝචනය කර අවශ්‍ය උපදේශයන් සපයන ලදී.

ii) අදාල පාර්ශවකරුවන් විසින් කමිටු නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය සමාලෝචනය කරන ලදී.

3.1.3. අභ්‍යන්තර විගණනය

කමිටුව විසින්,

i) අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද අභ්‍යන්තර විගණනයන්ගේ ප්‍රගතිය සමාලෝචනය කිරීම,

ii) ක්‍රියාවලි හිමිකරුවන් විසින් විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමේ තත්ත්වය සමාලෝචනය කිරීම,

iii) 2022 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම සමාලෝචනය කිරීම සහ නැවත තක්සේරු කිරීම,

iv) 2023 - 2026 කාලපරිච්ඡේදය සඳහා වන උපාය මාර්ගික විගණන සැලැස්ම සහ 2023 වර්ෂය සඳහා වන වාර්ෂික විගණන සැලැස්ම නිර්දේශ කිරීම,

v) 2021 වසර සඳහා වූ අඛණ්ඩ ප්‍රගති අධීක්ෂණයන් (Ongoing Monitoring of Performance) සහ කාලානුරූප ස්වයං තක්සේරුකරණයන් (Periodic Self-Assessment) හි වාර්තා සමාලෝචනය කිරීම,

vi) සංශෝධිත අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රය නිර්දේශ කිරීම,

vii) ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ආරක්ෂණ තක්සේරුව (Safeguards Assessment of International Monetary Fund) සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීම.

3.2 උපදේශන විගණන කමිටුව විසින් 2022 මූල්‍ය වාර්තාවලට අදාලව 2023 වසරේ දී සිදු කළ කාර්යයන් පහත දැක්වේ.

i) 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා E & Y ආයතනය විසින් නිකුත් කළ අතුරු කළමනාකාරීත්ව ලිපිය,

ii) 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා සේවක අර්ථසාධක අරමුදලේ මූල්‍ය ප්‍රකාශන,

iii) 2022.12.31 න් අවසන් වර්ෂය සඳහා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන, සමාලෝචනය කරන ලදී.

2022 මූල්‍ය වර්ෂය තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ ක්‍රියාකාරකම් වාර්තාව

1. හැඳින්වීම

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව (Board Risk Oversight Committee) යනු මුදල් මණ්ඩලය (Monetary Board) විසින් පත් කරන ලද අනුකමිටුවකි. ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් කළමනාකරණය සහ අනුකූලතා කාර්යයන් සඳහා පුළුල් උපාය මාර්ග සහ ප්‍රතිපත්ති සම්පාදනය කිරීමේ වගකීම මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව සතු වන අතර, එය බැංකුවේ අවදානම් කළමනාකරණය සහ අනුකූලතාවය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කිරීම සහතික කිරීමට මුදල් මණ්ඩලයට සහාය වේ.

2. මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සංයුතිය

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ මුලසුන හොබවන්නේ, මුදල් මණ්ඩලය විසින් නම් කරන ලද ස්වාධීන මුදල් මණ්ඩල සාමාජිකයෙකු විසිනි. එහි සාමාජිකත්වය, මෙම කමිටුවට පත්වීමට පෙර අවම වශයෙන් වසරක කාලයක් මූල්‍ය සේවා අංශයට සම්බන්ධ නොවී සිටියා වුත්, අදාළ විශේෂිත දැනුම් සහ කුසලතාවලින් යුක්ත වුත්, ස්වාධීන බාහිර විශේෂඥයින් දෙදෙනෙකුගෙන් සමන්විත විය යුතුය.

2022 වර්ෂය තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සංයුතිය පහත පරිදි වේ.

i) සංජීව ජයවර්ධන මහතා, ජනාධිපති නීතිඥ - මුදල් මණ්ඩලයේ පත් කළ සාමාජික (සභාපති)

ii) නයෝමාල් ගුණවර්ධන මහතා (ස්වාධීන බාහිර සාමාජික - වසර 3 ක නිල කාලය 2022/03/14 දිනෙන් අවසන් විය)

iii) ට්‍රවින් ජයසේකර මහතා (ස්වාධීන බාහිර සාමාජික - 2022/07/23 දින පත් කරන ලදී)

iv) එච්. ඒ. කරුණාරත්න මහතා (ස්වාධීන බාහිර සාමාජික - 2022/07/23 දින පත් කරන ලදී)

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ ලේකම් තනතුර මුදල් මණ්ඩල ලේකම් විසින් හොබවන අතර, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අවදානම් නිලධාරී) මෙහි සහකාර ලේකම් තනතුර දරයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවට ලේකම් පහසුකම් සපයයි.

සියලුම නියෝජ්‍ය අධිපතිවරුන්, ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් කමිටුවේ (Business Continuity Planning Committee) සභාපති, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අනුකූලතා නිලධාරී සහ අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මෙම කමිටුවේ නිරීක්ෂකයින් ලෙස සහභාගී වේ.

මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ සභාපතිවරයා විසින් තීරණය කරනු ලබන පරිදි හෝ මුදල් මණ්ඩලය විසින් නියම කරන ලද පරිදි, අවම වශයෙන් සෑම කාර්තුවකට වරක් හෝ ඊට වැඩි වාර ගණනක් කමිටු රැස්වීම් පැවැත්වේ. මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ රැස්වීම්, එම කමිටුවේ ලේකම් විසින් කැඳවනු ලැබේ. රැස්වීමක් සඳහා වූ ගණපූරණය දෙදෙනෙකු වන අතර එයට අනිවාර්යයෙන්ම සභාපතිවරයා ඇතුළත් විය යුතුය.

3. 2022 මුදල් වර්ෂය තුළ ක්‍රියාකාරකම්

2022 වර්ෂය තුළ මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටු රැස්වීම් 02ක් පැවැත්වූ අතර සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් පහත පරිදි වේ.

i) දෙපාර්තමේන්තු අවදානම් ලේඛන (Departmental Risk Register) සමාලෝචනය කර මෙහෙයුම් අවදානම් අවම කිරීම කඩිනම් කිරීම සඳහා මුදල් මණ්ඩලය වෙත නිර්දේශ ඉදිරිපත් කරන ලදී.

ii) සංශෝධනය කරන ලද මෙහෙයුම් අවදානම් වර්ගීකරණය (Operational Risk Taxonomy) සමාලෝචනය කර, එය මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

iii) සංශෝධනය කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශය (Risk Management Policy Statement) සමාලෝචනය කර, එය මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

iv) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කළමනාකරණය කරනු ලබන අරමුදල්වල (ජාත්‍යන්තර සංචිත (International Reserves), අභ්‍යන්තර ආයෝජන අරමුදල් (Internal Investment Funds) සහ සේවක අර්ථසාධක අරමුදල (Employees' Provident Fund)) අවදානම් සමාලෝචනය කරන ලද අතර, අදාළ ආයෝජන නිර්දේශිත පරාමිතීන් තුළ පවතින බව සහතික කරන ලදී.

v) ජාත්‍යන්තර සංචිත සහ අභ්‍යන්තර ආයෝජන අරමුදල් සඳහා ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශ (Investment Policy Statements) වැඩිදියුණු කිරීම් සමාලෝචනය කර මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

vi) ජාත්‍යන්තර සංචිත, සේවක අර්ථසාධක අරමුදල සහ අභ්‍යන්තර ආයෝජන අරමුදල් සඳහා යෝජිත නව උපාය මාර්ගික වත්කම් වෙන්කිරීම් (Strategic Asset Allocation) සමාලෝචනය කර මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

vii) ජාත්‍යන්තර සංචිත සහ අභ්‍යන්තර ආයෝජන අරමුදල් සඳහා ආයෝජන මාර්ගෝපදේශ (Investment Guidelines) වැඩිදියුණු කිරීම් සමාලෝචනය කර මුදල් මණ්ඩල අනුමැතිය සඳහා නිර්දේශ කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව

2022 දෙසැම්බර් 31 දිනට කළමනාකාරිත්ව ප්‍රකාශය

ස්වකීය අරමුණුවලට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගිණුම්කටයුතු භාවය සහ මූල්‍ය කාර්යසාධනය

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස මහ බැංකුව මුදල් නීති පනත යටතේ ස්ථාපිත කරන ලදී. එම පනතේ විධිවිධාන පරිදි ප්‍රධාන පරමාර්ථයන් වන ආර්ථික සහ මිල ස්ථායිතාවය හා මූල්‍ය පද්ධති ස්ථායිතාවය සාක්ෂාත් කර ගැනීමේ වගකීම බැංකුව වෙත පැවරී ඇත.

එබැවින්, මහ බැංකුවේ ගිණුම්කටයුතුභාවය සහ එකී මෙහෙයුම් වල සාර්ථකත්වය වන්නේ එම ප්‍රධාන පරමාර්ථයන් කරා ළඟාවීම සඳහා වන ප්‍රතිපත්ති හා මෙහෙයුම් වල සඵලතාවය විනා එහි ලාභදායීත්වය නොවන්නේය. මහ බැංකුව, වෙනත් පුද්ගලික හෝ රාජ්‍ය ආයතනවලින් වෙන් කොට හඳුනා ගැනෙන මූලික ලක්ෂණය නම් මෙම ව්‍යවස්ථාපිත පරමාර්ථයන්ය. පොළී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය කෙරෙහි බලපාන මුදල් ප්‍රතිපත්ති ක්‍රියාමාර්ගයන් මගින් ලාභ ජනනය කිරීමේ අද්විතීය හැකියාවක් මහ බැංකුව සතු බැවින් බැංකුව විසින් ලාභදායීත්ව ප්‍රවේශයක් අනුගමනය කළේ නම් ලාභ ජනනය වන අතර ප්‍රධාන පරමාර්ථ නොසලකා හැරීමක් වනු ඇත. එබැවින් මහ බැංකුවේ ආර්ථික සහ මිල ස්ථායිතා හා මූල්‍ය පද්ධති ස්ථායිතා පරමාර්ථයන්, ලාභදායිතා අරමුණු වලින් වියුක්ත කළයුතු අතර එය හුදෙක් ආනුශාංගික අරමුණක් වියයුතු වන්නේය.

මහ බැංකුවේ ප්‍රතිපත්ති මෙහෙයුම්, විනිමය අනුපාත කළමනාකරණය, මුදල් නෝට්ටු නිකුතුව ආදිය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල, උපලබ්ධි වටිනාකම් මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන්හි අදාල ගිණුම්කරණ සහ වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූලව සටහන් කරන අතර, මෙය සමස්ත රාජ්‍ය ගිණුම්කරණ කටයුතුභාවයෙන් කොටසක් සාක්ෂාත් කර ගැනීමක් ලෙස මූල්‍ය ගිණුම්කරණ කටයුතුභාවය සඳහා පදනම සපයනු ලබන අතර, මෙම ප්‍රකාශයන්හි වාර්තා කර ඇති මූල්‍ය කාර්යසාධනය සහ අවබෝධ කර ගැනීම එම පසුතලයේ පිහිටා කළයුතුය.

මුදල් නීති පනතේ 42 හා 43 වගන්ති ප්‍රකාර විගණකාධිපති විසින් කරනු ලබන බාහිර විගණනයකට ශ්‍රී ලංකා මහ බැංකුව භාජනය වේ. ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතයන්ට අනුකූල බවට සහතික වීම සඳහා ජාත්‍යන්තර විගණක ප්‍රමිතයන්ට අනුකූලව විගණනයක් කිරීම සඳහා අර්න්ස්ට් සහ යංග් වරලත් ගණකාධිකාරීවරුන්ගේ සේවය විගණකාධිපතිතුමා විසින් ලබාගෙන ඇත.

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } බීඒඑන්/ජී/සිබීඑස්එල්/1/21/1

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2022 මාර්තු 29 දින

ගරු මුදල් අමාත්‍යතුමා,

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ("බැංකුව") 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් ප්‍රකාශනය, වෙනත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාල සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ, 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තියේ සහ මුදල් නීති පනතේ 42(2) වගන්තියේ (422 අධිකාරිය) ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ. මෙම විගණනය සඳහා ප්‍රසිද්ධ ව්‍යක්තියෙහි යෙදී සිටින වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා ලබා ගන්නා ලදි.

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට (IFRSs) අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISAs) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. එම ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම්, මාගේ වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මුදල් මණ්ඩලයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මූල්‍ය ප්‍රකාශන ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම මුදල් මණ්ඩලයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී බැංකුව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම සහ අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අදාළ වන පරිදි අනාවරණය කිරීම ද මුදල් මණ්ඩලයේ වගකීමකි.

බැංකුවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් කරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, බැංකුවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හෝ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ජාත්‍යන්තර විගණන ප්‍රමිති (ISAs) ප්‍රකාරව විගණනය සිදුකිරීමේදී එය සෑමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා හෝ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මකභාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ජාත්‍යන්තර විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තිය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශකරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කර ක්‍රියාත්මක කරන ලදි. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන

බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවූව ද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳ අවබෝධයක් ලබා ගන්නා ලදි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ මුදල් මණ්ඩලය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදි.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් බැංකුවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේ ද යන්න සම්බන්ධයෙන් ලබා ගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම මුදල් මණ්ඩලය යොදාගැනීමේ අදාලත්වය තීරණය කරන ලදි. ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. මාගේ විගණන වාර්තාවේ දිනය දක්වා ලබාගන්නා ලද විගණන සාක්ෂි මාගේ නිගමනයන්ට පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත බැංකුවේ අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම අගයන ලදි.

මාගේ විගණනයේදී හඳුනාගත් අනෙකුත් කරුණු අතර, අභ්‍යන්තර පාලනයේ සැලකිය යුතු යම් අඩුපාඩු ඇතුළත් වැදගත් විගණන සොයාගැනීම් සම්බන්ධයෙන් පාලනය කරනු ලබන පාර්ශවයන් මම දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ.

2.1.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා බැංකුව පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (i) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද සියලු ප්‍රමාණාත්මක නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් දෑ ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඈ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට බැංකුව සම්බන්ධවී ඇති යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව;

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව යම් අදාල ලිඛිත නීතියකට හෝ බැංකුවේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු සහ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව;

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව;

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව බැංකුවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව.

අත්සන් කළේ :

ඩබ්ලිව්.පී.සී. වික්‍රමරත්න
විගණකාධිපති

ශ්‍රී ලංකා මහ බැංකුව

2022 දෙසැම්බර් 31 වැනි දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන	2022 රු. 000	2021 රු. 000
වත්කම්			
විදේශීය මූල්‍ය වත්කම්			
මුදල් සහ මුදල් සමානයන්	8	**651,687,864**	512,762,452
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	9	**10,867,425**	8,818,244
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	10	**401,580**	54,022,836
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම්	11	**281,421,074**	188,045,837
අනිකුත් ලැබිය යුතු දෑ	30.3	**37,022,631**	-
මුළු විදේශීය මූල්‍ය වත්කම්		**981,400,574**	763,649,369
දේශීය මූල්‍ය වත්කම්			
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	12	**2,498,995,015**	1,377,820,347
ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්	13	**698,069,219**	567,532,312
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	14	**235,638,700**	150,128,800
මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	15	**1,817,132**	1,671,218
බැංකු සඳහා දෙන ලද ණය	16	**28,257,902**	90,572,746
අනෙකුත් වත්කම්	17	**30,182,560**	34,063,770
මුළු දේශීය මූල්‍ය වත්කම්		**3,492,960,528**	2,221,789,193
මුළු මූල්‍ය වත්කම්		**4,474,361,102**	2,985,438,562
විදේශීය මූල්‍ය නොවන වත්කම්			
රන්	18	**10,031,610**	35,151,981
මූල්‍ය නොවන වත්කම්			
තොගය	19	**4,788,407**	4,928,533
අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම්		**1,222,568**	961,456
දේපල පිරියත සහ උපකරණ	20	**19,035,278**	19,235,994
අස්පෘශ්‍ය වත්කම්	21	**908,137**	561,632
මුළු මූල්‍ය නොවන වත්කම්		**35,986,000**	60,839,596
මුළු වත්කම්		**4,510,347,102**	3,046,278,158
බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය			
විදේශීය මූල්‍ය බැරකම්			
බැංකු සහ මූල්‍ය ආයතන	22	**146,408,028**	13,701
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	10	**71,697,994**	1,139,323
ආසියානු නිශ්කාෂණ සංගමය	23	**736,258,129**	104,764,616
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.)	24	**1,127,925,092**	670,065,243
අනිකුත්	25	**594,383,451**	357,295,676
මුළු විදේශීය මූල්‍ය බැරකම්		**2,676,672,694**	1,133,278,559
දේශීය මූල්‍ය බැරකම්			
බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු	26	**323,046,181**	300,704,162
රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු	27	**221,411**	1,392,301
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් හා නිත්‍ය තැන්පතු පහසුකම	28	**330,637,059**	101,062,880
සංසරණයෙහි පවතින මුදල්	29	**1,026,567,252**	1,005,099,066
අනිකුත් ගෙවිය යුතු දෑ	30	**68,320,347**	19,163,882
මුළු දේශීය මූල්‍ය බැරකම්		**1,748,792,250**	1,427,422,291
මුළු මූල්‍ය බැරකම්		**4,425,464,944**	2,560,700,850
අනිකුත් බැරකම්			
විලම්බිත ප්‍රදාන	31	**1,834**	1,178
විශ්‍රාම වැටුප් හා අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම්	32	**1,772,429**	17,929,737
විවිධ බැරකම් සහ උපචිතයන්	33	**855,043**	4,027,349
මුළු අනිකුත් බැරකම්		**2,629,306**	21,958,264
මුළු බැරකම්		**4,428,094,250**	2,582,659,114
හිමිකරු ප්‍රාග්ධනය			
ප්‍රාග්ධන අරමුදල		**50,000,000**	50,000,000
අනෙකුත් සංචිත	34	**(191,184,970)**	315,128,226
රඳවාගත් ලාභ		**223,437,822**	98,490,818
මුළු හිමිකරු ප්‍රාග්ධනය		**82,252,852**	463,619,044
මුළු බැරකම් සහ හිමිකරු ප්‍රාග්ධනය		**4,510,347,102**	3,046,278,158

පිටු අංක 14 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

මෙම මූල්‍ය ප්‍රකාශයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරී විසින් 2023 මාර්තු 31 වැනි දින මුදල් මණ්ඩලය වෙනුවෙන් නිකුත් කිරීම සඳහා අනුමත කරන ලදී.

ආචාර්ය පී.නන්දලාල් වීරසිංහ - අධිපති

ඩී.එස්.එල්. සිරිමාන්න - ප්‍රධාන ගණකාධිකාරී

ශ්‍රී ලංකා මහ බැංකුව
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ආදායම් ප්‍රකාශය

	සටහන	2022 රු. 000	2021 රු. 000
මෙහෙයුම් ආදායම:			
විදේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම			
පොළී ආදායම	36	**1,579,295**	4,379,048
උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය	37	**(127,286,104)**	41,859,703
මිල වෙනස්වීම්වලින් උපලබ්ධි වාසිය		**(9,968,941)**	20,317,794
විදේශීය මූල්‍ය වත්කම්වලින් මුළු ආදායම		**(135,675,750)**	66,556,544
විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත වියදම්			
පොළී වියදම	38	**(32,293,277)**	(3,634,528)
විදේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ ආපසු හැරවුම්/(අයකිරීම්)	39	**(763,218)**	2,282,695
විදේශීය මූල්‍ය බැරකම් ආශ්‍රිත මුළු වියදම		**(33,056,495)**	(1,351,833)
ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන වාසිය		**(610,149,293)**	34,041,805
විදේශීය මූල්‍ය ආයෝජන ආදායම		**(778,881,538)**	99,246,516
ශුද්ධ දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ආදායම			
පොළී ආදායම	36	**482,676,527**	68,612,928
මිල වෙනස්කම් මත උපලබ්ධි ලාභය/ (පාඩුව)		**(7,866,974)**	(387,202)
පොළී වියදම	38	**(37,619,594)**	(8,469,897)
දේශීය මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ අයකිරීම්	39	**497,432**	(808,696)
දේශීය මූල්‍ය වත්කම් ආශ්‍රිත ශුද්ධ ආදායම		**437,687,391**	58,947,133
අනිකුත් ආදායම්	40	**2,454,218**	16,280,370
අනිකුත් වියදම්	40.1	**(10,260,110)**	-
මුළු ශුද්ධ මෙහෙයුම් ආදායම		**(349,000,039)**	174,474,019
මෙහෙයුම් වියදම් :			
සේවක මණ්ඩල වියදම් :	41		
- වැටුප් සහ වේතන		**(6,691,770)**	(7,116,223)
- නිශ්චිත දායක සැලසුම් පිරිවැය		**(11,550,422)**	(1,717,811)
- පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් පිරිවැය		**(2,091,404)**	(1,891,272)
		(20,333,596)	(10,725,306)
ක්ෂයවීම් සහ ක්‍රමක්ෂය		**(737,304)**	(526,675)
තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය)		**(2,339,653)**	(2,780,250)
පරිපාලන සහ අනිකුත් වියදම්	42	**(1,910,381)**	(2,279,122)
මුළු මෙහෙයුම් වියදම්		**(25,320,934)**	(16,311,353)
බදු වලට පෙර ලාභය		**(374,320,973)**	158,162,666
බදු	43	**-**	-
වර්ෂය සඳහා ශුද්ධ ලාභය		**(374,320,973)**	158,162,666

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.
පිටු අංක 14 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව
2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
අනෙකුත් විස්තීරණ ආදායම් ප්‍රකාශය

		2022 රු. 000	2021 රු. 000
වර්ෂය සඳහා වූ ශුද්ධ ලාභය		**(374,320,973)**	158,162,666
අනෙකුත් විස්තීරණ ආදායම්			
පසු කාලපරිච්ඡේදයකදී ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය වන හෝ විය හැකි අයිතම			
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(පාඩුව)	34	**(1,189,382)**	(16,108,192)
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන රජයේ සුරැකුම්පත් සඳහා වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය/(පාඩුව)	34	**11,225,713**	(11,641,542)
		10,036,331	(27,749,734)
පසු කාලපරිච්ඡේදයකදී ආදායම් ප්‍රකාශයට නැවත වර්ගීකරණය නොවන අයිතම			
අනෙකුත් විස්තීරණ ආදායමට ගලපන ලද පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්(වියදම්)/ආදායම්	32	**14,163,877**	1,293,721
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන මත වූ ශුද්ධ සාධාරණ වටිනාකම් ලාභය	34	**145,915**	55,862
		14,309,792	1,349,583
අනෙකුත් විස්තීරණ ආදායම/(වියදම)		**24,346,123**	(26,400,151)
මුළු විස්තීරණ ආදායම		**(349,974,850)**	131,762,515

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.
පිටු අංක 14 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ස්කන්ධ ප්‍රාග්ධනයේ වෙනස්වීම් ප්‍රකාශය

	දායක ප්‍රාග්ධනය රු. 000	අනිකුත් සංචිත රු. 000	රඳවාගත් ලාභ රු. 000	එකතුව රු. 000
2021 ජනවාරි 1 දිනට ශේෂය	50,000,000	282,012,023	15,153,549	347,165,572
වර්ෂය සඳහා ශුද්ධ ලාභය	-	-	158,162,666	158,162,666
තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම	-	369,008	(369,008)	-
අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය	-	-	1,293,721	1,293,721
ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය මාරු කිරීම (IRR)	-	34,041,805	(34,041,805)	-
ශ්‍රී.ලං.ම.බැ. අභ්‍යන්තර අරමුදල්වලට මාරු කිරීම	-	-	(291,870)	(291,870)
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට වූ සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ ලාභය	-	(16,108,192)	-	(16,108,192)
රඳවාගත් ලාභයෙන් වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම	-	23,574,367	(23,574,367)	-
පොදු සංචිතයට අරමුදල් මාරු කිරීම	-	2,859,208	(2,859,208)	-
2019 වර්ෂයට අදාළ ලාභයන් රජයට පැවරීම - මහ බැංකුව වෙත ඇති රජයේ බැඳීම් යළි පියවා ගැනීම	-	-	(15,016,745)	(15,016,745)
ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම	-	-	(72)	(72)
පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිරීම	-	757,613	(757,613)	-
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කරන ලද ප්‍රාග්ධන ආයෝජනවල වෙළඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය	-	55,862	-	55,862
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කළ රජයේ සුරැකුම්පත්වල වෙළඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය	-	(11,641,542)	-	(11,641,542)
දේපල පිරියත සහ උපකරණ ප්‍රත්‍යාගණන ලාභ	-	(791,926)	791,570	(356)
2021 දෙසැම්බර් 31 දිනට ශේෂය	50,000,000	315,128,226	98,490,818	463,619,044
2022 ජනවාරි 1 දිනට ශේෂය	**50,000,000**	**315,128,226**	**98,490,818**	**463,619,044**
වර්ෂය සඳහා ශුද්ධ ලාභය/ අලාභය	**-**	**-**	**(374,320,973)**	**(374,320,973)**
තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා වූ නිධන්ගත අරමුදලට පැවරීම	**-**	**438,146**	**(438,146)**	**-**
අනෙකුත් විස්තීරණ ආදායමේ හඳුනාගත් පශ්චාත් සේවක ප්‍රතිලාභ පිරිවැය	**-**	**-**	**14,163,877**	**14,163,877**
ශුද්ධ විදේශ විනිමය ප්‍රත්‍යාගණන ලාභය/(පාඩුව) මාරු කිරීම (IRR)	**-**	**(610,149,293)**	**610,149,293**	**-**
ශ්‍රී.ලං.ම.බැ. අභ්‍යන්තර අරමුදල්වලට මාරු කිරීම	**-**	**-**	**(355,494)**	**(355,494)**
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ගණනය කරන ලද සුරැකුම්පත් හි ශුද්ධ සාධාරණ වටිනාකම මත වූ පාඩුව	**-**	**(1,189,382)**	**-**	**(1,189,382)**
රඳවාගත් ලාභයෙන් වෙළඳපොල ප්‍රත්‍යාගණන සංචිතයට අරමුදල් මාරු කිරීම	**-**	**49,638,590**	**(49,638,590)**	**-**
පොදු සංචිතයට අරමුදල් මාරු කිරීම්	**-**	**27,526,076**	**(27,526,076)**	**-**
2021 වර්ෂයට අදාළ ලාභය අනුව ප්‍රා.සං.දෙපාර්තුමේන්තුවේ මෙහෙයුම් සඳහා මධ්‍යම හා දිගුකාලීන අය සංචිතයට අරමුදල් මාරු කිරීම	**-**	**15,000,000**	**(15,000,000)**	
2021 වසර සඳහා ලාභ විසර්ජනය - 2021 වසර සඳහා වන ලාභයෙන් ශ්‍රී ලංකා රජය සමග ඇති බැඳීම් අයකර ගැනීම	**-**	**-**	**(31,035,788)**	**(31,035,788)**
ශ්‍රී ලංකා මහ බැංකු සේවාදායක සහ විශ්‍රාම ආපදා සහන අරමුදලට අරමුදල් මාරු කිරීම	**-**	**-**	**(60)**	**(60)**
පශ්චාත් සේවක ප්‍රතිලාභ මූල්‍යනය සඳහා වූ සංචිතයට අරමුදල් මාරු කිීම	**-**	**1,051,039**	**(1,051,039)**	**-**
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කල රජයේ සුරැකුම්පත් වල වෙළෙඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය	**-**	**11,225,713**	**-**	**11,225,713**
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කල ප්‍රාග්ධන ආයෝජන වල වෙළෙඳපොල ප්‍රත්‍යාගණනය මත වූ ලාභය	**-**	**145,915**	**-**	**145,915**
2022 දෙසැම්බර් 31 දිනට	**50,000,000**	**(191,184,970)**	**223,437,822**	**82,252,852**

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ. පිටු අංක 14 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මුදල් ප්‍රවාහ ප්‍රකාශය

	සටහන	2022 රු. 000	2021 රු. 000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්			
ලැබීම්:			
ලැබුණු පොළිය - විදේශීය මුදල්		**1,550,703**	16,510,461
ලැබුණු පොළිය - දේශීය මුදල් - අනිකුත්		**3,498,481**	2,433,655
ද්‍රවශීලතා කළමනාකරණ සහ වෙළෙඳ ආදායම්		**(17,835,915)**	14,468,586
උපලබ්ධි වූ විනිමය අලාභය		**(179,967,468)**	(13,003,097)
ලැබුණු අනිකුත් ආදායම්		**8,020,273**	1,572,512
		(184,733,926)	21,982,117
විය පැහැදීම්:			
ගෙවන ලද පොළිය - විදේශීය මුදල්		**23,170,613**	5,841,243
ගෙවන ලද පොළිය - දේශීය මුදල්		**40,437,692**	6,571,438
සේවකයින්ට ගෙවීම්		**12,435,846**	8,295,030
සැපයුම්කරුවන්ට ගෙවීම්		**(31,924,158)**	498,361
		44,119,993	21,206,072
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	44	**(228,853,919)**	776,045
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්			
ලැබීම් :			
අනිකුත් දේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම		**(2,431,705)**	(3,542,041)
අනිකුත් ආයතනවලට ප්‍රදානය කළ ණය සහ අත්තිකාරම් - ප්‍රාග්ධන අයකරගැනීම්		**49,642**	5,534
දේපළ, පිරියත සහ උපකරණ විකිණීමෙන් ලද ආදායම		**(234)**	338,246
ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ මිලට ගත් සුරකුම්පත්වල ශුද්ධ (අඩුවීම)/වැඩිවීම		**229,574,179**	(108,445,017)
		227,191,882	(111,643,278)
විය පැහැදීම් :			
විදේශ මුදල් සුරකුම්පත්වල ශුද්ධ අඩුවීම		**31,403,136**	(755,979,008)
අනිකුත් විදේශීය මූල්‍ය වත්කම්වල ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**(42,189,977)**	22,242,111
අනිකුත් විදේශීය මූල්‍ය බැරකම්වල ශුද්ධ (වැඩිවීම)/ අඩුවීම		**(704,622,720)**	218,313,967
අනිකුත් දේශීය තැන්පතු සහ ගෙවිය යුතු මුදල්වල ශුද්ධ (වැඩිවීම)/ අඩුවීම		**(3,660)**	489
දේපල, පිරියත හා උපකරණ මිලට ගැනීම් (ප්‍රදානයන් අඩු කිරීමෙන් පසු)		**3,773**	686,469
අස්පෘෂ්‍ය වත්කම් මිලදී ගැනීම්		**879,377**	72,928
කල්බදු වත්කම් මිලදී ගැනීම්		**-**	9,113
රන් සංචිතයේ ශුද්ධ අඩුවීම		**(26,108,952)**	(38,743,707)
අනෙකුත් ආයතන වෙත ලබා දුන්/ (අයකරගත්) ණය හා අත්තිකාරම්		**(61,796,952)**	(30,118,054)
		(802,435,975)	(583,515,692)
ආයෝජන ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය		**1,029,627,857**	471,872,414
මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ලද මුදල් ප්‍රවාහයන්			
ලැබීම් :			
සංසරණ මුදල් නිකුතුව		**347,595,479**	390,975,631
සංසරණ මුදල් ආපසු ගැනීම්		**(326,127,293)**	(220,684,424)
සංසරණ මුදල් ශුද්ධ නිකුතුව		**21,468,186**	170,291,207
විය පැහැදීම් :			
රජයේ ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතු	45	**851,954,489**	1,172,364,801
බැංකු සහ මූල්‍ය ආයතන ගනුදෙනු ආශ්‍රිත සංසරණ මුදල් ශුද්ධ නිකුතුව/ (ආපසු ගැනීම්)	46	**(22,342,019)**	(171,102,641)
සංසරණ මුදල් ශුද්ධ නිකුතු		**829,612,470**	1,001,262,160
සංසරණ මුදල් ශුද්ධ අඩුවීම		**(808,144,284)**	(830,970,953)
විය පැහැදීම් :			
විදේශීය මුදල් කාලීන බැරකම් ආපසු ගෙවීම		**27,384,295**	(145,925,443)
අනිකුත් අරමුදල් සඳහා ගෙවීම		**60**	72
විශ්‍රාම අරමුදල සඳහා ගෙවීම		**3,363,735**	7,547,179
රජයේ ඒකාබද්ධ අරමුදල සඳහා ලාභ පැවරීම		**30,000,000**	15,000,000
		60,748,090	(123,378,192)
මූල්‍ය ක්‍රියාකාරකම් සඳහා භාවිතා කළ ශුද්ධ මුදල් ප්‍රවාහය		**(868,892,374)**	(707,592,761)
මුදල් සහ මුදල් සමානයන්ගේ ශුද්ධ වැඩිවීම/ (අඩුවීම)		**(68,118,436)**	(234,944,302)
මුදල් සහ මුදල් සමානයන් මත වන විනිමය අනුපාතයන්ගේ බලපෑම		**(3,321,000)**	28,871,146
වර්ෂය ආරම්භයේ දී මුදල් සහ මුදල් සමානයන්		**197,504,486**	403,577,642
දෙසැම්බර් 31 දිනට මුදල් සහ මුදල් සමානයන්	8	**126,065,050**	197,504,486

වරහන් තුළ ඇති සංඛ්‍යා මගින් අඩුකිරීමක් නිරූපණය වේ.

පිටු අංක 14 සිට 85 දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති හා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශවල කොටසක් වේ.

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් කාලපරිච්ඡේදය සඳහා මූල්‍ය ප්‍රකාශනයන්ගේ කොටසක් ලෙස කියවිය යුතු සටහන

1. වාර්තා කිරීමේ ඒකකය සහ ව්‍යවස්ථාපිත පදනම

ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය කිරීම සඳහා වගකිවයුතු අධිකාරිය ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව ("බැංකුව" හෝ "ශ්‍රී.ලං.ම.බැ.") ආයතනයක් ලෙස ස්ථාපිත කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව නිත්‍යව ශ්‍රී ලංකා ප්‍රජාත්‍රාන්ත්‍රික සමාජවාදී ජනරජය තුළ පිහිටුවා ඇති අතර, කොළඹ 01, ජනාධිපති මාවතේ අංක 30 දරණ ස්ථානයේ පිහිටා ඇත.

මුදල් මණ්ඩලය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති සහ ප්‍රධාන ගණකාධිකාරි විසින් මෙම මූල්‍ය ප්‍රකාශනයන්, 2023 මාර්තු 31 වැනි දින අනුමත කරන ලදී.

1.1 ප්‍රාථමික ක්‍රියාකාරකම්

1949 අංක 58 දරණ මුදල් නීති පනත (සංශෝධිත පරිදි) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය මණ්ඩලය විසින් ප්‍රතිපත්ති පියවර නිශ්චය කිරීමට අමතරව මහ බැංකුවේ බලතල, යුතුකම් සහ කර්තව්‍යයන් පැවැරෙන අතර, බැංකුවේ කළමණාකාරීත්වය, මෙහෙයුම් සහ පරිපාලනය සඳහා පොදුවේ වගකිවයුතු වන්නේය. බැංකුව විසින් මූලිකව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධති පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා පොදුවේ වගකිවයුතු අතර රජයේ මූල්‍ය නියෝජිත ලෙස ද කටයුතු කරනු ලැබේ. බැංකුවේ ක්‍රියාකාරකම්වලට ප්‍රධාන වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් ය.

- මුදල් සහ විනිමය අනුපාත ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම.
- මුදල් නිකුත් කිරීම.
- නිල විදේශ සංචිතය කළමනාකරණය කිරීම.
- මූල්‍ය පද්ධතිය අධීක්ෂණය කිරීම.
- බැංකු හා තෝරාගත් බැංකු නොවන මූල්‍ය ආයතනවලට බලපත්‍ර ලබා දීම, නියාමනය සහ අධීක්ෂණය.
- පියවීම් පහසුකම් සඳහා ප්‍රතිපාදන හා ගෙවීම් පද්ධතිය නියාමනය කිරීම.
- ආර්ථික දත්ත සම්පාදනය, බෙදාහැරීම සහ විශ්ලේෂණය.
- විවිධ පහසුකම් යටතේ රජයට, බැංකුවලට සහ මූල්‍ය ආයතන වලට ණය සහ අත්තිකාරම් සැපයීම.
- රජයේ හා එහි නියෝජිතයන් හෝ බැංකුකරු ලෙස කටයුතු කිරීම, රාජ්‍ය සුරැකුම්පත් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ වාණිජ බැංකු නොවන ප්‍රාථමික වෙළෙඳුන්ට ජංගම ගිණුම් පහසුකම් සැලසීම.

ශ්‍රී ලංකාවේ ඵලදායී සම්පත් සංවර්ධනය, දිරි ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීමේ අදහසින් යුතුව එහි පරමාර්ථය වන ආර්ථික, මිල සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය සපුරාගැනීම සඳහා පවත්වාගෙන යන ක්‍රියාකාරකම්, විදේශීය මුදල් ක්‍රියාකාරකම් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස පුළුල්ව වෙන්කර දැක්විය හැකිය. මෙම ක්‍රියාකාරකම් වල ප්‍රතිඵල ආදායම් ප්‍රකාශනයට අදාලව මෙහෙයුම් ක්‍රියාකාරකම් වේ.

2. මූල්‍ය වාර්තා ඉදිරිපත් කිරීමේ පදනම

2.1. අනුකූලතා ප්‍රකාශනය

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශනයන් ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිති (ජා.මු.වා.ප්‍ර.) ප්‍රකාර පිළියෙල කර තිබේ.

2.2 මිනුම් කිරීමේ පදනම

පහත අයිතමයන් හැරුණු කොට මූල්‍ය වාර්තා ඓතිහාසික පිරිවැය මත පදනම්ව පිළියෙල කරනු ලබයි.

- රන්, ආදායම් ප්‍රකාශය තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම.
- ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ, ලාභ අලාභ හා අනෙකුත් විස්තීරණ ආදායම් මගින් සාධාරණ අගයට මිණුම් කරන ව්‍යුත්පන්න නොවන මූල්‍ය උපකරණ සාධාරණ අගයට මිනුම් කිරීම.
- අත්පත් කර ගැනීමේදී පිරිවැයට මිනුම් කරන එහෙත් අනතුරුව ප්‍රත්‍යාගණනය කරනු ලබන වටිනාකම්වන් සමුච්චිත ක්ෂය හා සමුච්චිත හානිකරන වෙන්කිරීම් අඩුකරන ලද වටිනාකමට මිණුම් කරන ඉඩම් හා ගොඩනැගිලි.
- සේවා නියුක්තිකයන්ගේ නිශ්චිත ප්‍රතිලාභ බැදියාව, අදාළ නිශ්චිත ප්‍රතිලාභ වගකීමෙහි වර්තමාන අගයෙන් ප්‍රතිලාභ යෝජනා ක්‍රම වල වත්කම්හි සාධාරණ අගය අඩුකර මිනුම් ගත කිරීම.

2.3 වාර්තා කිරීමේ ආකෘතිය

බැංකුව විසින් මූල්‍ය වත්කම් සහ මූල්‍ය බැරකම් ද ඒවාට අදාල ආදායම් සහ වියදම් මාර්ග ද විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට ඉදිරිපත් කරනු ලැබේ. මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ වත්කම් සහ බැරකම් ඉදිරිපත් කිරීමේදී පුළුල් වශයෙන් එක් එක් වර්ගයන් යටතේ ද්‍රවශීලතාවයේ පිළිවෙළට දක්වා ඇත. මෙම වාර්තාකරණ ප්‍රවේශය මගින්, අංක 7 දරණ සටහනෙහි විස්තරාත්මකව දක්වා ඇති බැංකුවේ ක්‍රියාකාරකම් උචිතව වාර්තා කෙරෙන බව බැංකුවේ අදහස වේ.

2.4 ක්‍රියාකාරි හා වාර්තා කරන මුදල් ඒකකය

මූල්‍ය වාර්තා ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර එය බැංකුවේ ක්‍රියාකාරී මුදල් ඒකකයද වේ. වාර්තා කර ඇති සියලු අගයන් ආසන්නතම දහස් සංඛ්‍යාවට දක්වා ඇති අතර බැංකුවේ ක්‍රියාකාරී හා වාර්තා කරන මුදල් ඒකකයන්හි කිසිදු වෙනසක් සලකා බලන කාලපරිච්ඡේදය තුළදී සිදුවී නැත.

2.5 ප්‍රමාණාත්මකභාවය හා සමාහාරය

ප්‍රමාණාත්මකභාවය අඩු අයිතමයන් හැර එක් එක් ප්‍රමාණාත්මක කාණ්ඩයන්හි සමාන අයිතම හා අසමාන ස්වභාවයක් හා කාර්ය්‍යයන් සහිත අයිතමයන් මූල්‍ය ප්‍රකාශනයන්හි වෙන් වෙන් වශයෙන් වාර්තා කරනු ලැබේ.

2.6 හිලව් කිරීම

මූල්‍ය වත්කම් හා වගකීම් හිලව් කොට ශුද්ධ අගය මූල්‍ය ප්‍රකාශ වල ඉදිරිපත් කළ හැක්කේ බැංකුවට හඳුනාගත් අගයන් හිලව් කිරීමට නෛතික අයිතියක් හා ශුද්ධ පදනම මත නිරවුල් කිරීමට හෝ වත්කම් උපලබ්ධි කිරීමට සමගාමීව වගකීම් නිරවුල් කිරීමට අපේක්ෂා කරයි නම් පමණි.

2.7 සංසන්දනාත්මක තොරතුරු

අවශ්‍ය විටක වර්තමාන කාලපරිච්ඡේදයේ ඉදිරිපත් කිරීමට අනුකූල වීම සඳහා සංසන්දනාත්මක තොරතුරු නැවත වර්ගීකරණය කරනු ලබයි.

3. ගිණුම් විනිශ්චයන් සහ ඇස්තමේන්තු භාවිතය

බැංකුවේ මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම මත, වාර්තා කරන ලද ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් ප්‍රමාණයන් සහ අනුගාමී හෙළිදරව් කිරීම් මෙන්ම අසම්භාව්‍ය බැරකම්වල හෙළිදරව් කිරීම්වලට බලපාන්නා වූ විනිශ්චයන් ඇස්තමේන්තු හා උපකල්පනයන් සකස් කිරීමට කළමනාකරණයට සිදු වේ. මෙම උපකල්පනයන්, ඇස්තමේන්තු හා සම්බන්ධ අවිනිශ්චිතතාවය, වත්කම් හා බැරකම්හි ධාරණ අගයන්වලට අනාගත කාලපරිච්ඡේදවලදී බලපාන ලෙස ප්‍රමාණාත්මක ගැලපීමක් අවශ්‍ය කරන ප්‍රතිඵලයක් ඇති කළ හැක.

ඇස්තමේන්තු සහ ඒ සඳහා පාදක වූ උපකල්පන යාවත්කාලීන පදනමක් මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තුවල සංශෝධනයන් අනාගතයට බලපාන පරිදි හඳුනාගනු ලැබේ.

මූල්‍ය ප්‍රකාශ වල හඳුනාගෙන ඇති ප්‍රමාණාත්මක බලපෑමක් සහිත අයිතමයන් සඳහා පදනම් කරගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සඳහා වූ විනිශ්චයන් පිළිබඳ තොරතුරු පහත සටහන් මගින් පැහැදිලි කෙරේ.

3.1 මූල්‍ය වත්කම් වර්ගීකරණය හා හානිකරණය

බැංකුව විසින් මූල්‍ය වත්කම් වල ව්‍යාපාර ආකෘතිය හා ඒවාහි ගිවිසුම්ගත කොන්දේසි වලින් ඇතිවන මුදල් ප්‍රවාහ, මූලික මුදල හා ඒ මත වන පොලිය පමණක්ද යන්න තක්සේරු කිරීම සඳහා විනිශ්චයන් භාවිතා කරයි. තවද, බැංකුව විසින් මුල් වරට හඳුනාගැනීමෙන් පසු මූල්‍ය වත්කමක ණය අවධානමෙහි සැලකිය යුතු වර්ධනයක් වී ඇත්දැයි යන්න තීරණය කිරීම සඳහා වන නිර්නායකයන් ස්ථාපිත කිරීමේදී හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා ඉදිරි දැක්මක් සහිත තොරතුරු ඇතුලත් කිරීමේදී භාවිතා කරන ක්‍රමවේදය හා අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීම සඳහා වූ ආකෘති (Model) තෝරා ගැනීමේ හා අනුමත කිරීමේදී ද විනිශ්චයන් භාවිතා කරයි. බැංකුවේ ණය අලාභ ගණනය කිරීමේදී යොදාගත් ඇස්තමේන්තු හා විනිශ්චයන් වලට කොවිඩ්-19 නිසා ඇති වූ බලපෑම සටහන් අංක 3.4 මඟින් විස්තර කර ඇත.

3.2 විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්වල පිරිවැය ආයුගණන ඇගයීම් මත තීරණය කරනු ලැබේ. ආයුගණන ඇගයීමක දී වට්ටම් අනුපාත, අනාගත වන්දි ගෙවීම් වැඩිවීම්, මරණ අනුපාතය සහ විශ්‍රාම වැටුප්වල අනාගත වැඩිවීම් පිළිබඳ උපකල්පනයන් සිදුකරනු ලැබේ. මෙම සැලසුම් වල දිගුකාලීන ස්වභාවය හේතුවෙන් එවැනි ඇස්තමේන්තු සැලකිය යුතු ලෙස අවිනිශ්චිතතාවයකට භාජනය වේ. ආයුගණන ඇගයීමේදී භාවිතා කරන ලද උපකල්පන සටහන් අංක 32 හි දැක්වේ.

3.3 මූල්‍ය උපකරණවල සාධාරණ අගය

මූල්‍ය වත්කම් හා වගකීම්වල සාධාරණ අගයන් මූල්‍ය තත්ව ප්‍රකාශයේ වාර්තාගත කරන විට එම අගයන් සක්‍රීය වෙළඳපළ තුළින් ලබාගත නොහැකි අවස්ථාවලදී, එම අගයන් ලබා ගැනීම සඳහා විවිධ ආකාරයේ ආගණනය කරනු ලබන ගණිතමය ආකෘතිවලින් යුතු ශිල්පීය ක්‍රම උපයෝගී කරගෙන ඇත. මෙම ආකෘති තුළට යොදාගන්නා යෙදවුම් හැකි සෑම විටම නිරීක්ෂිත වෙළඳපොළ දත්ත මත ලබාගන්නා අතර, එවැනි දත්ත නොමැති අවස්ථාවන්හිදී විනිශ්චයන් මගින් සාධාරණ අගය ලබාගනු ලබයි. විනිශ්චයන්වලට එළඹීමේදී ද්‍රවශීලතාවය සහ දීර්ඝ කාලීන ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල (longer-dated derivatives) වෙනස්වීම වැනි ආකෘතිවලට යොදාගන්නා යෙදවුම් සැලකිල්ලට ගෙන ඇත. ණය යෝජනා ක්‍රමයන් සාධාරණ අගයට ගණනය කිරීමේදී යොදාගත් ඇස්තමේන්තු හා විනිශ්චයන් වලට කොවිඩ්-19 නිසා ඇති වූ බලපෑම සටහන් අංක 3.4 මඟින් විස්තර කර ඇත.

3.4 අහිතකර ආර්ථික තත්ත්ව සහ කොවිඩ්-19 හි පොදු බලපෑම

මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කිරීමේ දී බැංකුව විසින් අහිතකර ආර්ථික තත්ත්ව සහ කොවිඩ්-19න් ඇති වූ බලපෑම සැලකිල්ලට ගනු ලැබිය. විනිශ්චයන් සඳහා යොදා ගනු ලබන විශේෂ අයිතමයන් නොවෙනස්ව පැවතුන ද, අහිතකර ආර්ථික තත්ත්ව සහ කොවිඩ්-19 හි බලපෑම හේතුවෙන් අතිරේක විනිශ්චයන් හා ඇස්තමේන්තු යොදා ගැනීමට සිදුවිය.

ඒ අනුව මූලික වශයෙන් බැංකු සඳහා දෙන ලද ණය ශේෂය සහ අපේක්ෂිත ණය අලාභ තක්සේරු කිරීමේදී මෙකී අතිරේක විනිශ්චයන් හා ඇස්තමේන්තු බැංකුව විසින් යොදා ගනු ලැබිය.

කොවිඩ්-19 පැතිරයාම හේතුවෙන් අහිතකර බලපෑමට ලක්වූ ආර්ථිකය පුනර්ජීවනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පුළුල් පරාසයක විහිදුණු සහන හා ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරන ලදී. ඒ අතරින් මූල්‍ය ප්‍රකාශ වලට බලපෑමක් ඇති වඩාත් වැදගත් සහන ක්‍රියාමාර්ගය ලෙස ක්‍රියාත්මක කළ නව ණය යෝජනා ක්‍රම හැඳින්විය හැක. ඒ අනුව බැංකුව විසින් සෞභාග්‍යා කොවිඩ්-19 පුනුරුදය අදියර I, II, III හා ඉදිකිරීම් අංශය සඳහා ද්‍රවශීලතා පහසුකම මැයෙන් වන ප්‍රතිමූල්‍ය හා ණය යෝජනා ක්‍රම සහනදායී පොළී අනුපාත යටතේ මාස 6ක් වසර 2ක් අතර වන කල් පිරීම් කාල සීමාවක් සහිතව වසංගත තත්වය හේතුවෙන් බලපෑමට ලක් වූ ව්‍යාපාර සඳහා ණය ලබා දීමේ කොන්දේසියට යටත්ව බලපත්‍රලාභී වාණිජ හා බලපත්‍රලාභී විශේෂිත බැංකු තුළින් ක්‍රියාත්මක කරන ලදී. 2022 වසර තුළ පැවති අහිතකර ආර්ථික තත්ත්වයන් නිසා ලබාදුන් ණය සහන දිගු හේතුවෙන් මෙම පහසුකම් වලින් බොහොමයක් 2022 දෙසැම්බර් 31 දිනට අයකරගත යුතු ලෙස දැක්වේ.

තක්සේරු කිරීමේ ශිල්පිය ක්‍රම හා තක්සේරු යෙදවුම් අදාළ හා සුදුසු බවට විශේෂයෙන් තහවුරු කිරීම සඳහා නිරීක්ෂණය

කළ නොහැකි යෙදවුම් හා විනිශ්චයන් තක්සේරු ශිල්පීය ක්‍රම තුළ යොදා ගනු ලැබේ. එවන් තක්සේරු ශිල්පක්‍රම භාවිතයෙන් වත්කමක සාධාරණ අගය මිනුම් කරනු ලබයි. ඒ අනුව ඉහත සඳහන් කළ ණය යෝජනා ක්‍රම වල මූලික හඳුනාගැනීමේ සාධාරණ අගය ගණනය කිරීමේදී ණය ආපසු ගෙවීම් කොන්දේසි හා වෙළඳපොළ පොලී අනුපාත යනාදී තීරණාත්මක උපකල්පනයන් හා විනිශ්චය යොදා ගන්නා ලදී.

පෙර කාලපරිච්ඡේද වල යොදාගත් අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රියාවලිය හා බැඳුණු මූලික අපේක්ෂිත ණය අලාභ ආකෘතිය, ක්‍රම හා ක්‍රමවේදය ස්ථාවර හා නොවෙනස්ව පැවතිය ද බැංකුව විසින් අහිතකර ආර්ථික තත්ත්ව සහ කොවිඩ්-19 බලපෑම, අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ ක්‍රියාවලියේ යෙදවුම්, උපකල්පනයන් හා ඉදිරි දැක්මක් පවතින සාර්ව ආර්ථික විචල්‍යයන් තුළින් හඳුනාගෙන ඇත. ඊට අමතරව අහිතකර ආර්ථික තත්ත්ව සහ කොවිඩ්-19 ප්‍රතිඵලයක් ලෙස සාර්ව ආර්ථික විචල්‍යයන්හි සිදුවූ චලනයන් හේතුවෙන් ඒවා යෙදවුම් ලෙස යොදා ගන්නා අපේක්ෂිත ණය අලාභ ආකෘතියේ ඇතිවන්නා වූ අනපේක්ෂිත සංඛ්‍යානමය වෙනස්වීම් අවම කර ගැනීම සඳහා බැංකුව විසින් සාමාන්‍යකරණය කරන ලද ඉදිරි දැක්මක් සහිත සාර්ව ආර්ථික විචල්‍යයන් භාවිතා කරන ලදී.

කෙසේ වෙතත් බැංකු තක්සේරුවට අනුව මූල්‍ය නොවන වත්කම්වල ධාරණ අගයට අහිතකර ආර්ථික තත්ත්ව සහ කොවිඩ්-19 මඟින් බලපෑමක් ඇතිවී නොමැති අතර එම වත්කම් සුදුසු වටිනාකමට 2022 දෙසැම්බර් 31 වන දිනට මූල්‍ය ප්‍රකාශ වල තක්සේරු කර ඇත.

4. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති වල වෙනස්වීම්

මෙම මූල්‍ය වර්ෂය තුළදී ගිණුම්කරණ ප්‍රතිපත්ති නොවෙනස්ව පැවති අතර ඒවා පූර්ව කාලපරිච්ඡේදයේදී භාවිතා කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති හා ස්ථාවරව පවතී.

5. වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

5.1 විදේශීය මුදල් පරිවර්තනය හා ශේෂයන්

විදේශීය මුදල්වලින් වන ගනුදෙනු, එකී ගනුදෙනු සිදුවන දිනයේ දී පවතින විනිමය අනුපාතික ප්‍රකාර බැංකුවේ භාවිතා වන මුදල් වටිනාකමට සටහන් කරනු ලැබේ. විදේශීය මුදල්වලින් වූ මූල්‍ය වත්කම් සහ බැරකම්, වාර්තාකරන දිනට පවතින විනිමය අනුපාතිකයන් ප්‍රකාර නැවත පරිවර්තනය කරනු ලැබේ. වෙනස්කම් සියල්ල ආදායම් ප්‍රකාශනයට ගනු ලැබේ. වාර්තා කරන දිනට වටිනාකම් නැවත පරිවර්තනය කිරීමේ දී, ප්‍රධාන ව්‍යවහාර මුදල්වලට වූ පහත දැක්වෙන ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතයන් භාවිතා කරන ලදී.

මුදල් වර්ගය	2022 රු.	2021 රු.
ඕස්ට්‍රේලියානු ඩොලර් 1	**247.0237**	145.5851
කැනේඩියානු ඩොලර් 1	**268.4335**	158.6150
යුරෝ 1	**388.3461**	227.8832
ජපන් යෙන් 1	**2.7703**	1.7417
විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) 1	**483.3276**	280.9312
ස්ටර්ලින් පවුම් 1	**437.4023**	271.2270
ඇමරිකා එක්සත් ජනපද ඩොලර් 1	**363.1100**	200.4338
චීන යුවාන් 1 (අක්වෙරළ)	**52.6513**	31.5294

මූල්‍ය නොවන අයිතමයන් ඒවා සිදුවුන දින තිබූ විදේශීය මුදල් පරිවර්තනයට අනුව ඓතිහාසික අගයට පොත්වලට සටහන් කර ඇත.

5.2 සාධාරණ අගය මිනුම් කිරීම

බැංකුව විසින් විදේශීය සුරැකුම්පත්, ව්‍යුත්පන්න උපකරණ වැනි මූල්‍ය උපකරණයන් සහ රන් ආදී වූ මූල්‍ය නොවන උපකරණයන් එකී වාර්තාකරණ දිනයන්හි දී සාධාරණ අගයන්ට මිනුම්ගත කර ඇත. මීට අමතරව, ක්‍රමක්ෂය පිරිවැයට මිනුම්ගත කරන ලද මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් අංක 50 සටහනෙහි හෙළිදරව් කර ඇත.

සාධාරණ අගය යනු වෙළෙඳපොළ ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම්ගත කරන ලද දිනයට, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදල ය.

මෙම සාධාරණ අගය මිනුම් කිරීම සඳහා පදනම් වන පූර්ව නිගමනය වනුයේ වත්කමක් විකිණීම හෝ වගකීමක් හුවමාරු කිරීම යන ගනුදෙනුවක්:

- වත්කම හෝ වගකීම අදාළ ප්‍රධාන වෙළෙඳපොළෙහි දී සිදුවීම හෝ,
- එවැනි ප්‍රධාන වෙළෙඳපොළක් නොමැති අවස්ථාවකදී එම වත්කම හෝ වගකීම සඳහා වඩාත් ම වාසි සහගත වෙළෙඳපොළෙහි දී සිදුවීමය.

මෙම ප්‍රධාන වෙළෙඳපොළ හෝ වඩාත් වාසිසහගත වෙළෙඳපොළ බැංකුවට පිවිසිය හැක්කක් විය යුතු ය.

වෙළඳපොළ ගණුදෙනුකරුවන්, ඔවුන්ට උපරිම ආර්ථික වාසි සැලසෙන ආකාරයට කටයුතු කිරීමේදී යොදාගනු ලබන උපකල්පනයක් මත පදනම්ව වත්කමක හෝ වගකීමක සාධාරණ අගය මිනුම් ගත කරයි. මූල්‍ය නොවන වත්කමක සාධාරණ අගය මිනුම් කිරීමේදී එම වත්කම වෙළඳපොළ ගනුදෙනුකරුවෙක්ට එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කොට හෝ එම වත්කම් එහි උපරිම හා විශිෂ්ට ලෙස භාවිතා කිරීමට හැකියාව ඇති වෙනත් වෙළඳපොළ ගනුදෙනුකරුවෙක්ට විකිණීමෙන් ආර්ථික වාසි ජනනය කිරීමට ඇති හැකියාව සලකා බලනු ලැබේ.

බැංකුව විසින් සාධාරණ අගයන් මිනුම් කිරීමේ ක්‍රියාවලිය උදෙසා අවස්ථාවට ඉතාමත් උචිත සහ සාධාරණ අගයන් මිනුම්ගත කිරීම අදාළ නිරීක්ෂණ යෙදවුම් හි උපරිම භාවිතය සහ නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම් භාවිතය අවම කිරීම යන කාර්යයන් සඳහා ප්‍රමාණවත් දත්ත අගය කිරීමේ ක්‍රමවේදයන් යොදා ගනු ලබයි. මූල්‍ය වාර්තාවන්හි සාධාරණ අගය මිනුම්ගත කළ හෝ හෙළිදරව් කළ සියළු වත්කම් හා වගකීම් සාධාරණ අගයන් ධුරාවලිය තුළ පහත දැක්වෙන පරිදි

වර්ගීකරණයට ලක් කර ඇති අතර එය සමස්තයක් වශයෙන් සාධාරණ අගයන් නිශ්චය කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම් වේ.

පළමුවන මට්ටම - අනන්‍ය වත්කම හා වගකීම සඳහා ක්‍රියාකාරී වෙළෙඳපොළ තුළ හිමි ප්‍රකාශිත (නො සැකසූ) මිළ ගණන්

දෙවන මට්ටම - ඍජුව හෝ වක්‍රාකාරයෙන් නිරීක්ෂණය කළ හැකි, සාධාරණ අගයන් මිනුම් කිරීම සඳහා වැදගත් වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්

තෙවන මට්ටම - නිරීක්ෂණය කළ නොහැකි, සාධාරණ අගයන් මිනුම්ගත කිරීම සඳහා වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් භාවිතා කරන ඇගයුම් ක්‍රමවේදයන්.

පුනරාවර්තන පදනම මත හඳුනාගත් වත්කම් හා වගකීම් වල ඉහත ධූරාවලි මට්ටම් අතර මාරුවීම් සිදු වී ඇත්දැයි, යන්න වර්ගීකරණයේ නැවත තක්සේරු කිරීම් තුළින් (සාධාරණ අගයට මිණුම් කිරීම උදෙසා සමස්තයක් වශයෙන් වැදගත්වන අවම මට්ටමේ යෙදවුම් මත පදනම්ව) සෑම කාලපරිච්ඡේදයක් අවසානයේදීම බැංකුව තහවුරු කරනු ලබයි.

5.3 මූල්‍ය වත්කම් සහ බැරකම්

බැංකුව, මූල්‍ය වත්කම් සහ බැරකම් සහ ආශ්‍රිත ආදායම් හා වියදම් මාර්ගයන් ඉදිරිපත් කරනු ලබන්නේ විදේශීය මුදල් සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් වෙන්කොට හඳුනා දැක්වීමෙන්ය. විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් උද්ගත වන්නේ බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යයන්ගෙන්ය. මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම, මුදල් නිකුතු සහ බැංකු කටයුතුවලට ආශ්‍රිත වත්කම් සහ බැරකම් දේශීය මූල්‍ය ක්‍රියාකාරකම්වලින් පිළිබිඹු වේ.

මෙම ක්‍රියාකාරකම් වෙන් වෙන්ව වාර්තා කිරීම මගින්, බැංකුවේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්ය සාධනය සහ අවදානම් ආකෘතිය වඩා යෝග්‍ය අයුරින් ඉදිරිපත් කිරීම අපේක්ෂා කරනු ලැබේ. විදේශීය සහ දේශීය මුදල් ක්‍රියාකාරකම් ඒකාබද්ධව වාර්තා කිරීමෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි දැනුවත් කිරීමේ අගය දුර්වල වන බව බැංකුව විසින් සලකනු ලැබේ.

5.3.1 හඳුනාගැනීම හා මූලික මිනුම් කිරීම

සියළු මූල්‍ය වත්කම් හා වගකීම් මූලිකව පිරිවැය මත හඳුනාගනු ලබන අතර ආයෝජනයට අදාල අත්පත් කර ගැනීමේ වියදම් ද ඇතුළුව, ඉදිරිපත් වන ප්‍රතිඡ්ඨාවෙහි සාධාරණ වටිනාකම පිරිවැයට ඇතුළත් වේ. සාමාන්‍යයෙන් මිලට ගනු ලබන සහ විකුණනු ලබන සියළු මූල්‍ය වත්කම් හා වගකීම් වෙළෙඳාම්දිනයේදී හඳුනාගනු ලැබේ. මෙලෙස මිලට ගනු ලබන සහ විකුණන මූල්‍ය වත්කම් වූ කලී සාමාන්‍ය රෙගුලාසි මගින් හෝ වෙළෙඳපොළේ පවත්නා සම්ප්‍රදාය මගින් නියමිත කාල රාමුව තුළ දී භාරදිය යුතු මිලට ගනු ලැබූ හෝ විකුණනු ලැබූ මූල්‍ය වත්කම් වන්නේය.

5.3.2 වර්ගීකරණය

මූල්‍ය වත්කම්

මූලික මිනුම් හඳුනාගැනීමේදී බැංකුව විසින් මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරනු ලබයි.

- මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම්කරණ මූල්‍ය වත්කම්
- ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිණුම්කරණ මූල්‍ය වත්කම්

පහත සඳහන් කොන්දේසි වලට අනුකූලව යන ලාභ අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරුකුම්පත් යටතේ වර්ගීකරණය නොකළ මූල්‍ය වත්කම් ක්‍රමක්ෂය පිරිවැයට අගය කරනු ලැබේ.

- එම මූල්‍ය වත්කම ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන් රැස්කිරීමේ පරමාර්ථය සහිත ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ, මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොළියෙන් පමණක් සමන්විත වීම.

මූල්‍ය වත්කමක් පහත සඳහන් කොන්දේසි වලට අනුකූල නම් සහ ලාභ හෝ පාඩු තුළින් සාධාරණ මිලට ඇති සුරුකුම්පත් යටතේ වර්ග කළ නොහැකි නම් එම මූල්‍ය වත්කම් අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය කළ හැක.

- යම් කිසි මූල්‍ය වත්කමක් ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහ රැස්කිරීමේ හා මූල්‍ය වත්කම් විකිණීම යන පරමාර්ථ ද්විත්වයෙන් ව්‍යාපාර ආකෘතියක පවත්වාගෙන යෑම.
- මූල්‍ය වත්කමේ ගිවිසුම්ගත කොන්දේසි මගින් නිශ්චිත දින වල ඇතිකරන මුදල් ප්‍රවාහ මුල් මුදල හා මුල් මුදල මත ගෙවන පොළියෙන් පමණක් සමන්විත වීම.

වෙළඳාම සඳහා තබා නොගත් ස්කන්ධ ආයෝජන වල සාධාරණ අගයෙන් පසුව සිදුවන වෙනස්වීම් විස්තීරණ ආදායම තුළින් හඳුනාගැනීමේ අවලංගු කළ නොහැකි තෝරා ගැනීමක් එම ආයෝජනය මූලික හඳුනාගැනීමේදී බැංකුවට කළ හැකිය. අනෙකුත් සියලු මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කිරීම සඳහා වර්ගීකරණය කොට ඇත.

ව්‍යාපාර ආකෘතිය තක්සේරු කිරීම

බැංකුව විසින් ව්‍යාපාර ආකෘතියේ අරමුණු තක්සේරු කිරීමේදී මූල්‍ය වත්කම් අන්තර්ගත වන ආයෝජන කළඹ අරමුණු කොට එය සිදු කරනු ලබයි. ව්‍යාපාරය කළමණාකරණය කරන ආකාරය හා කළමණාකාරීත්වයට තොරතුරු ලබාදෙන ආකාරය මෙමගින් හොඳින්ම නිරූපනය වීම එයට හේතුවයි.

එසේ සලකා බලන තොරතුරු වලට පහත ඒවා ඇතුළත් වන නමුත් ඒවාට පමණක් සීමා නොවේ.

- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනය සහ ව්‍යාපාරික අකෘතිය තුළ රඳවා ඇති මූල්‍ය වත්කම් අගය කිරීම හා ප්‍රධාන කළමණාකාරීත්වයට වාර්ථා කරන ආකාරය
- ව්‍යාපාරික ආකෘතියේ කාර්ය සාධනයට බලපෑ හැකි අවදානම් (සහ එම ව්‍යාපාරික ආකෘතිය තුළ රඳවාගෙන

ඇති මූල්‍ය වත්කම්) සහ විශේෂයෙන් අවදානම් කළමණාකරණය කරන ආකාරය.

- පූර්ව කාලපරිච්ඡේදයේ විකුණුම්වල වාර ගණන, වටිනාකම්, එම විකුණුම්වල කාල නිර්ණය විකිණීමට බලපෑ හේතු සාධක සහ අනාගත විකුණුම්වල අපේක්ෂාවන් සලකා බැලීම අවශ්‍ය වේ. කෙසේ වෙතත් විකුණුම් මගින්ම ව්‍යාපාරික ආකෘතිය නිර්ණය නොවන බැවින් එය හුදෙකලාව සැලකිල්ලට ගත නොහැක. ඒ වෙනුවට එය බැංකුවේ මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා ප්‍රකාශිත අරමුණු සාක්ෂාත් කර ගැනීම හා මුදල් ප්‍රවාහ උපලබ්ධි කරගන්නේ කෙසේද යන සමස්ථ තක්සේරුවේ කොටසක් ලෙස යොදා ගත යුතුවේ.

වෙළඳාම සඳහා තබාගත් හෝ සාධාරණ අගය වෙනස්වීම මත පදනම්ව කාර්ය සාධනය මනිනු ලබන මූල්‍ය වත්කම් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මනිනු ලැබේ. එයට හේතුව ඒවා ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ රැස්කිරීම හා මූල්‍ය වත්කම් විකිණීමට හෝ රඳවාගෙන නොමැති නිසාය.

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ යනු, මූලික මුදල හා ඒ මත වන පොළිය (SPPI) පමණක්දැයි විමසීම පිළිබඳව වන තක්සේරුව.

බැංකුව විසින් මූලික හා මූලික මුදල මත පොළිය පමණක් යන කොන්දේසිය (SPPI Test) තහවුරු කර ගැනීම සඳහා මූල්‍ය වත්කම් වල ගිවිසුම්ගත කොන්දේසි තක්සේරු කරනු ලැබේ. මේ සඳහා මූල්‍ය වත්කමක් පළමු වරට හඳුනාගැනීමේදී ඇති සාධාරණ අගය "මූලික මුදල" ලෙසද කිසියම් කාලසීමාවක් තුළ ගෙවීමට ඇති මුල් මුදල හා බැඳි ණය අවධානමත්, අනෙකුත් මූලික ණය දීමේ අවධානම හා පිරිවැයත්, මුදලේ කාලීන වටිනාකමෙහි අගයත් "මූලික මුදල මත වන පොළිය" ලෙස අර්ථ දැක්වේ.

මූලික ණය දීමේ එකඟතාවයකදී පොළියේ ඇති වඩාත් වැදගත් මූලිකාංගයන් ලෙස මුදලේ කාලීන අගය හා ණය අවධානම සඳහා ගෙවනු ලබන අගය හැඳින්විය හැකිය.

SPPF තක්සේරුව කිරීම සඳහා බැංකුව විසින් විනිශ්චයන් අදාළ කර ගන්නා අතර මූල්‍ය වත්කම් නිරූපනය කරන මුදල් ඒකකය හා පොළී අනුපාතය නියම කර ඇති කාලපරිච්ඡේදය යනාදිය අදාළ සාධක ලෙස සලකා බලනු ලබයි.

කෙසේ වුවද ණයදීම පිළිබඳ මූලික එකඟතාවයන් හා සම්බන්ධ නැති ගිවිසුම්ගත මුදල් ප්‍රවාහයන්හි අවධානම හෝ විචලනය වන ස්වභාවයට අනාවරණය වීම් හඳුන්වාදෙන ආකාරයේ ගිවිසුම්ගත කොන්දේසි, මූලික මුදල හා ඒ මත වන පොළිය (SPPF) පමණක් වූ මුදල් ප්‍රවාහ වලට හේතු නොවේ. එවන් අවස්ථාවන්හිදී, එකී මූල්‍ය වත්කම ලාභ අලාභ තුළින් සාධාරණ අගයට මිනුම් කරනු ලැබේ.

ප්‍රතිවර්ගීකරණය

බැංකුව විසින් මූල්‍ය වත්කම් කළමණාකරණය සඳහා වූ ව්‍යාපාර ආකෘතිය වෙනස් කිරීමේ දී හැර, මූල්‍ය වත්කම් පළමුවරට හඳුනාගත් පසු ප්‍රතිවර්ගීකරණය නොකරයි.

5.3.3. ඉවත් කිරීම්

මූල්‍ය වත්කම්

බැංකුවට මූල්‍ය වත්කමෙහි මුදල් ප්‍රවාහ සඳහා ඇති ගිවිසුම්ගත අයිතිවාසිකම් අවසන්වීමේදී හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු ප්‍රමාණයක් වෙනත් පාර්ශ්වයකට පවරන්නේ නම් හෝ මූල්‍ය වත්කමේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සෑහෙන දුරට පැවරුම් කර හෝ රඳවාගෙන නොමැති විට හා වත්කමේ පාලනය රඳවාගෙන නොමැති විට එය පොත් වලින් ඉවත් කළ යුතුය.

මූල්‍ය වත්කමක් ඉවත් කිරීමේදී,

(i) එහි ධාරණ අගය හා ප්‍රතිශ්ඨාව අතර වෙනස සහ

(ii) විස්තීරණ ආදායම් තුළ කලින් හඳුනා ගන්නා ලද සම්මුච්චිත ලාභය හෝ අලාභය

යන දෙකම ආදායම ප්‍රකාශය තුළ නිරූපණය විය යුතුය.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන ස්කන්ධ ආයෝජන පොත් වලින් ඉවත් කිරීමේදී ඊට අදාළව විස්තීරණ ආදායම තුළ හඳුනාගත් සමුච්චිත ලාභ අලාභ ආදායම් ප්‍රකාශය තුළ ඇතුළත් නොකෙරේ.

පැවරුම කිරීමකින් පොත්වලින් ඉවත් කරන ලද මූල්‍ය වත්කමකට අදාළව ජනනය කරන ලද හෝ රඳවා ගත් පොළිය වෙනම වත්කමක් හෝ බැරකමක් ලෙස හඳුනා ගැනේ.

මූල්‍ය තත්ත්ව ප්‍රකාශය මත හඳුනාගෙන පවරන ලද එහෙත් සියළු අවදානම් හා ප්‍රතිලාභයන් හෝ ඉන් වැඩි ප්‍රමාණයක් රඳවාගත් වත්කම් ඉවත් කරනු නොලබයි. සුරුකුම්පත් ණයට දීම, විකිණීම සහ ප්‍රතිමිලදී ගැනීම් ගණුදෙනු මේ සඳහා උදාහරණයන් වේ. මෙබඳු ගණුදෙනු වලදී බැංකුව අදාළ මූල්‍ය වත්කමෙහි හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන් හෝ කොටසක් රඳවා ගැනීම හෝ මාරු කිරීම සිදු කරනු නොලබන අතර වත්කමෙහි පාලනය බැංකුව සතුව රඳවා ගනී. අදාළ වත්කම කෙරෙහි බැංකුව දක්වන අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණය අනුව එම වත්කම හඳුනා ගැනේ.

මූල්‍ය බැරකම්

මූල්‍ය බැරකමක් ඉවත් කරනු ලබනුයේ එහි ගිවිසුම්ගත බැඳීම නිදහස් කිරීම, අවලංගු කිරීම හෝ කල් පිරීම සිදු වූ විටය.

5.3.4. මූල්‍ය වත්කම් හානිකරණය

බැංකුව විසින් ලාභ අලාභ තුළින් සාධාරණ අගයට අගය නොකළ පහත මූල්‍ය උපකරණ වෙනුවෙන් අපේක්ෂිත ණය අලාභ සඳහා හානිකරන අලාභ හඳුනා ගනී.

- අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට නිරූපිත මූල්‍ය වත්කම්
- ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය වත්කම්
- ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ණය ඇපකර ගිවිසුම්

ස්කන්ධ ආයෝජන මත හානිකරණ අලාභ හඳුනා නොගැනේ. බැංකුව විසින් ඉහළ ආයෝජන ශ්‍රේණියෙහි පිහිටි (Baa3/BBB- සහ ඉහළ ශ්‍රේණිගත) ආයෝජන සඳහා මාස 12 ක අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයන් හඳුනා ගනී. අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට හෝ ක්‍රමක්ෂය පිරිවැයට වර්ගීකරණය කරන

ලද බැංකුවේ බහුතරයක් ආයෝජන Baa3/BBB- අගයට ඉහලින් ශ්‍රේණිගතය. මාස 12 ක අපේක්ෂිත ණය අලාභයක් හඳුනාගන්නා මූල්‍ය උපකරණ "පළමු අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හඳුනා ගැනේ.

මුල්වරට හඳුනාගැනීමේදී පහළ ආයෝජන ශ්‍රේණිගත හෝ මුල්වරට හඳුනාගැනීමෙන් පසුව ණය ශ්‍රේණිය පහළ හෙළන ලද (Baa3/BBB- අගයට වඩා පහළ ශ්‍රේණිගත) ආයෝජන උපකරණ සඳහා හෝ මුල්වරට හඳුනා ගැනීමෙන් පසු ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක් දක්වා වර්ධනය වූ ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් ගණනය කරයි. ජීවකාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරන අලාභයන් හඳුනාගනු ලබන, එහෙත් මුළුමනින්ම ණය හානිකරණය නොකරන ලද ණය උපකරණ "දෙවන අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හඳුනා ගැනේ. ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභවලට සමාන හානිකරණ අලාභයක් ගණනය කරනු ලබන විට ඒවා (මුළුමනින්ම ණය හානිකරණය කරන ලද ණය උපකරණ) "තෙවන අදියරේ මූල්‍ය උපකරණ" ලෙස හැඳින්වේ.

අපේක්ෂිත ණය අලාභ මැනීම

අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේ යාන්ත්‍රණය පහත ප්‍රධාන මූලිකාංගයන් සමඟ විස්තර කර ඇත.

ණය පැහැර හැරීමේ සම්භාවිතාව

පැහැර හැරීමේ සම්භාවිතාව යනු දෙන ලද කාල සීමාවක් තුළ ගෙවීම් පැහැර හැරීමට ඇති නැඹුරුව සම්බන්ධ ඇස්තමේන්තුවයි. අදාළ පහසුකම (ආයෝජනය/ණය) පොත්වලින් ඉවත් කොට නොමැතිනම් හා තවමත් ආයෝජන කළඹෙහි ඇතුළත් නම් පමණක් තක්සේරු කරන කාලපරිච්ඡේදය තුළදී ගෙවීම් පැහැර හැරීම, යම් නිශ්චිත කාලයක් තුළ සිදුවිය හැක.

බැංකුව විසින් සියලු විදේශ ආයෝජන (ක්‍රමක්ෂය පිරිවැයට හා විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කරන වත්කම්) සඳහා නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශ්වයන්ගේ නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් බ්ලූම්බර්ග් (Bloomberg) තොරතුරු පද්ධතිය තුළින් ලබා ගනී. එවන් නිශ්චිත ස්කන්ධ කොටස් මත වන පැහැර හැරීමේ සම්භාවිතයන් නැතිවිට බැංකුව විසින් අදාළ නිකුත් කරන්නන්ගේ හා ප්‍රතිපාර්ශ්වයන්ගේ ශ්‍රේණිගත කිරීම් සඳහා බ්ලූම්බර්ග් තොරතුරු පද්ධතියේ ඇති පොදු පැහැර හැරීමේ සම්භාවිතා වගුව (Common PD Table) මගින් වාර්තා කරන දිනට ඇති පැහැර හැරීමේ සම්භාවිතාවය ලබා ගනු ලැබේ.

ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය

ගෙවීම් පැහැර හැරීමේදී ඇති නිරාවරණය යනු අනාගත ගෙවීම් පැහැර හරින දිනයකදී බැංකුව නිරාවරණය වන මූල්‍ය වත්කමෙහි වටිනාකම පිළිබඳ ඇස්තමේන්තුවයි. එම ඇස්තමේන්තුව මූලික මුදල හා ඒ මත වන පොලිය ආපසු ගෙවීම, කොන්ත්‍රාත්තුවකින් හෝ වෙනත් ආකාරයකින් නියම කරනු ලබන ණය බැඳියාවන්ගේ අනාගත නිකුත් කිරීම හා මඟහැරුණු ගෙවීම් සඳහා වන උපචිත පොලිය ඇතුළත්ව අනාගත නිරාවරණ ප්‍රමාණය මත වන අපේක්ෂිත වෙනස්වීම් සැලකිල්ලට ගනිමින් සිදු කරනු ලබයි.

පැහැර හැරීමකදී වන අලාභය

පැහැර හැරීමකදී වන අලාභය යනු දී ඇති දිනයකදී ගෙවීම් පැහැර හැරීම නිසා බැංකුවට සිදුවන අලාභය පිළිබඳ ඇස්තමේන්තුවයි. එය ලැබීමට නියමිත ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ හා බැංකුව ලැබීමට අපේක්ෂා කරන මුදල් ප්‍රවාහය අතර වෙනසට ඇප වශයෙන් තබා ඇති වත්කම් උපලබ්ධි කිරීමෙන් ලැබෙන ප්‍රමාණයද ඇතුළත් කිරීමෙන් ගණනය කෙරේ. බැංකුවට එක් එක් වෙන්වූ මූල්‍ය වත්කමෙන් වන අවදානම් නිරාවරණය මත පදනම්ව යොදාගත යුතු පැහැර හැරීමකදී වන අලාභ ප්‍රතිශතය තීරණය කිරීමට අභ්‍යන්තරව අනුමත කරන ලද ප්‍රතිපත්තියක් ඇත.

ආර්ථික සාධක ගැලපීම

යම් කාලපරිච්ඡේදයක් සඳහා බලපැවැත්වෙන පැහැර හැරීමේ සම්භාවිතාව, යම් මොහොතක පවතින (වාර්තා කරන දිනට) පැහැර හැරීමේ සම්භාවිතාවයකට පරිවර්තනය කිරීම සඳහා බැංකුව විසින් ආර්ථික සාධක ගැලපීම යොදා ගනී. බැංකුව, පැහැර හැරීමේ සම්භාවිතාව වෙනස් කිරීම සඳහා ප්‍රධාන ආර්ථික සාධක ලෙස දළ දේශීය නිෂ්පාදනය, උද්ධමනය හා පොළී අනුපාතය යන දත්ත යොදාගනී.

ණය අවධානමේ සැලකිය යුතු වැඩිවීමක් ඇත්දැයි ඇගයීම

මූල්‍ය වත්කම්/ උපකරණ මුල් වරට හඳුනාගැනීමේ දිනට පසු සිදුවන ගෙවීම් පැහැර හැරීමේ සම්භාවිතාවේ දෙගුණයක වර්ධනයක් හෝ අදාළ මූල්‍ය වත්කම/ උපකරණ නිකුත් කරන්නන්ගේ හෝ ප්‍රතිපාර්ශ්වයේ ශ්‍රේණිගත කිරීම BBB - වලට වඩා පහළ යාමක් සිදුවේ නම් එය අදාළ මූල්‍ය උපකරණයේ ණය අවදානමේ සැලකිය යුතු වැඩිවීමක් ලෙස බැංකුව සලකා බලනු ලැබේ.

ඉහත කරුණු ඉහළ ආයෝජන ශ්‍රේණියක සිට පහළ ආයෝජන ශ්‍රේණියක් දක්වා වන සියලු ශ්‍රේණිගත කිරීම්වල පහළ වැටීමත් (Baa3 සිට Ba1 දක්වා වූ සුළු පහත වැටීමක්ද ඇතුළත්ව) ගෙවීම පැහැර හැරීමේ සම්භාවිතාවය දෙගුණයක හෝ ඊට වැඩි අගයකින් වැඩිවීමට තුඩුදෙන බවට වන නිරීක්ෂණය මත පදනම් වේ.

ණය හානිකරණය වූ මූල්‍ය වත්කම්

ක්‍රමක්ෂය පිරිවැයට හා විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මිනුම් කළ මූල්‍ය වත්කම් හා ණය ඇපකර යනාදිය ණය හානිකරණය වී ඇත්දැයි (අදියර 3 ලෙස සඳහන් කර ඇති මූල්‍ය වත්කම්) සෑම වාර්තා කරන දිනකදීම බැංකුව විසින් අගයනු ලබයි. මූල්‍ය වත්කම් එහි ඇස්තමේන්තු කළ අනාගත මුදල් ප්‍රවාහ වලට අවාසිදායක බලපෑමක් වී ඇති එකක් හෝ ඊට වැඩි සිද්ධීන් ඇති වූ විට එම මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇත. මූල්‍ය වත්කම ණය හානිකරණය වී ඇති බවට නිරීක්ෂණය කළ හැකි සාක්ෂි වලට පහත සිද්ධීන් පිළිබඳව දත්ත ඇතුළත් වේ.

- නිකුත් කරන්නාගේ හෝ ණය ගන්නාගේ සැළකිය යුතු අන්දමේ මූල්‍ය දුෂ්කරතා

- ගෙවීම් පැහැර හැරීමක් හෝ කල් ඉකුත් වූ සිද්ධීන් වැනි ගිවිසුම් කඩ කිරීමක්
- ණය ගැණුම්කරුවන් බුන්වත් බවට හෝ වෙනත් මූල්‍ය ප්‍රතිව්‍යුහගත කිරීමකට පත්වීම අපේක්ෂා කළ හැකි බව

අපේක්ෂිත ණය අලාභ සඳහා වන වෙන්කිරීම් මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ ඉදිරිපත් කිරීම

අපේක්ෂිත ණය අලාභ සඳහා වන වෙන්කිරීම්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ පහත අයුරින් ඉදිරිපත් කර ඇත.

- ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලබන මූල්‍ය වත්කම් : අදාළ මූල්‍ය වත්කමේ දළ ධාරණ වටිනාකමෙන් අඩු කොට දැක්වීම.
- විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට මනිනු ලබන මූල්‍ය වත්කම් : මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ මෙවැනි දළ ධාරණ වටිනාකම සාධාරණ අගය වන හෙයින් ණය අලාභ වෙන් කිරීම් කිසිවක් මූල්‍ය තත්ව ප්‍රකාශය තුළ හඳුනාගනු නොලබයි. කෙසේ වෙතත් අදාළ ණය අලාභ වෙන් කිරීම් විස්තීරණ ආදායම තුළ හඳුනාගෙන අනාවරණය කර ඇත.
- ණය ඇපකර ගිවිසුම : වෙන්කිරීමක් ලෙස.

ලියා හැරීම

ණය දීමක් හෝ ණය සුරුකුම්පතක් නැවත අය කර ගැනීමට (සම්පූර්ණයෙන්ම හෝ අර්ධ වශයෙන්) බැංකුවට සාධාරණ අපේක්ෂාවන් නොමැති විට ඒවා ලියා හරිනු ලබයි. ලියා හැරීමට යටත් ණයගැතියන්ට ණය ආපසු ගෙවීම සඳහා ප්‍රමාණවත් මුදල් ප්‍රවාහ රැස්කර ගැනීමට හැකි වත්කම් හෝ ආදායම් මූලාශ්‍ර නොමැති විට මෙසේ ණය ලියා හරිනු ලබයි. මෙම ඇගයීම එක් එක් වත්කම සම්බන්ධයෙන් සිදුකරන අතර, කලින් ලියා හරින ලද ප්‍රමාණයන් ආපසු අයකර ගැනීමකදී එම මුදල ආදායම් ප්‍රකාශයේ හා විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ "මූල්‍ය උපකරණ මත වන හානිකරණ අලාභ" යන මැයෙන් ඇතුළත් කරනු ලැබේ.

5.4 ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගයට ඇති සුරුකුම්පත්

වෙළෙඳාම සඳහා ගැනෙන මූල්‍ය වත්කම්, "ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගයට ඇති වත්කම්" යටතේ වර්ග කර ඇතුළත් කර ඇත. මූලික හඳුනාගැනීමේදී ආරෝපණය කළ ගනුදෙනු පිරිවැය ආදායම් ප්‍රකාශය තුළ දරණ ලද ලෙස හඳුනාගනු ලැබේ. මෙම සුරුකුම්පත් අනතුරුව ප්‍රකාශිත වෙළෙඳපොළ මිල ප්‍රකාර අගය කරනු ලැබේ. වෙළෙඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශනයෙහි සුරුකුම්පත් යටතේ වටිනාකම් වැඩිවීමක් හෝ අඩුවීමක් ලෙස හඳුනා ගන්නා අතර එයින් උද්ගත වන වාසිය/පාඩුව ආදායම් ප්‍රකාශයෙහි හඳුනාගනු ඇත.

සුරුකුම්පත් තවදුරටත් අයිතිව පවතින්නේ නම් අදාළ වාසිය/අවාසිය "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයෙන් වාසිය/(පාඩුව)" ලෙස වාර්තා කරනු ලැබේ. සුරුකුම්පත් විකිණීම මගින් වාසියක් හෝ අවාසියක් උද්ගත වන්නේ නම්, එය "මිල වෙනස්වීමේ උපලබ්ධි වාසිය/(පාඩුව)" ලෙස වාර්තා කරනු ලැබේ.

5.5 අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම්

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති මූල්‍ය වත්කම් වනුයේ ව්‍යුත්පන්න නොවන ආයෝජන හා අනෙකුත් මූල්‍ය වත්කම් කාණ්ඩයකට වාර්තා නොකරන ලද ආයෝජනයි. මෙයට ස්කන්ධ සුරුකුම්පත් හා ණය සුරුකුම්පත් ඇතුළත් වේ.

මෙම ආයෝජන පසුව වෙළඳපොළ මිල අනුව අගය කරනු ලැබේ. වෙළඳපොළ අගයෙහි වෙනස්වීම, මූල්‍ය තත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරුකුම්පත් වල වටිනාකම වැඩිවීම හෝ අඩුවීම වශයෙන් හඳුන්වනු ලැබේ.

අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ස්කන්ධ ආයෝජන, වෙළඳපොළ අගයන් නොමැතිවීම හේතුවෙන් ඒ ඒ ආයෝජන පවතින ආයතනයන්ගේ ශුද්ධ වත්කම් මත පදනම්ව අගය කර ඇත.

මෙම වර්ගීකරණයට අදාළ දේශීය හා විදේශීය ණය සුරුකුම්පත් හා ස්කන්ධ ආයෝජන වල වෙළඳපොළ අගයෙහි වෙනස්වීම් නිසා උද්ගතවන වාසි හෝ අවාසි එම වත්කම් විකිණීම, ප්‍රතිග්‍රහණය, ඉවත් කිරීම හෝ හානිකරණය වන තෙක් කෙලින්ම බැංකුවේ හිමිකරු ප්‍රාග්ධනය (විස්තීරණ ආදායම) හි ඇති අනෙකුත් සංචිත තුළ පෙන්වන අතර ඉහත සඳහන් ක්‍රමවලින් වත්කම පොත් වලින් ඉවත් කරන විට අදාළ ලාභ හා පාඩු, ආදායම් ප්‍රකාශය තුළ වාර්තා කරනු ලබයි.

කෙසේ වෙතත් ස්කන්ධ ආයෝජන පොත් වලින් ඉවත් කිරීමේදී එයට අදාළ වෙළඳපොළ අගයන්ගේ වෙනස්වීමෙන් ලද ලාභ හා පාඩු, ආදායම් ප්‍රකාශනය තුළින් ප්‍රතිචක්‍රණය නොකෙරේ.

මෙම වත්කම් වලට අදාළ පොළී ආදායම සඵල පොළී ක්‍රමය භාවිතා කර ආදායම් ප්‍රකාශනය තුළ හඳුනාගනු ලැබේ.

5.6 ක්‍රමක්ෂය පිරිවැය යටතේ රඳවාගත් උපකරණ

ගිවිසුම්ගත මුදල් ප්‍රවාහ ලබාගැනීමේ අරමුණින් යුතු ව්‍යාපාර ආකෘතිය යටතේ රඳවාගත් හා ගිවිසුම්ගත කොන්දේසි අනුව නිශ්චිත දිනයන්හිදී මූලික මුදල හා ඒ මත පොළිය පමණක් ලබාදෙන මූල්‍ය වත්කම්, ක්‍රමක්ෂය පිරිවැය යටතේ රඳවාගත් උපකරණ ලෙස වර්ගීකරණය කරනු ලැබේ. මෙම උපකරණ පසුකාලීනව සඵල පොළී ක්‍රමය භාවිතා කර ක්‍රමක්ෂය පිරිවැය යටතේ මනිනු ලැබේ.

5.7 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

මුදල් නුවමාරු, ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වැනි ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ බැංකු විසින් භාවිතා කරනු ලබන අතර ඒවා භාවිතා කරනුයේ අවදානම් කළමනාකරණය කිරීමේ අරමුණු සඳහා මිස සමපේක්ෂාත්මක අරමුණු සඳහා නොවේ. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ එහි සාධාරණ අගයට වාර්තා කරන අතර එහි සාධාරණ අගය ධන අගයක් ගන්නා විට වත්කමක් ලෙසත් එම අගය ඍණ අගයක් ගන්නා විට වගකීමක් ලෙසත් වාර්තා කරයි. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්ගේ සාධාරණ අගයෙහි ඇතිවන චලනයන් "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් වාසිය/(පාඩුව)" යටතේ වාර්තා කරනු ලැබේ.

ගනුදෙණුවක මිල ඒ හා සමාන ගණුදෙණු පවතින්නා වූ නිරීක්ෂණය කළ හැකි වර්ථමාන වෙළෙඳපළක සාධාරණ අගයෙන් වෙනස් වේ නම් හෝ මිල නිරීක්ෂණය කල හැකි වර්ථමාන වෙළෙඳපළෙහි දත්ත පමණක් විචල්‍යන් ලෙස යොදාගත් ඇගයීම් ශිල්ප ක්‍රමයක් භාවිතයෙන් ලබාගත් මිලෙන් වෙනස් වේ නම්, බැංකුව විසින් එම ගණුදෙණුවේ මිල හා සාධාරණ අගය අතර වෙනස (දිනට වෙනස) "උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණන ලාභ/(පාඩු)" ලෙස හඳුනාගනු ලබයි. ගණුදෙණුවක සාධාරණ අගය නිරීක්ෂණය කළ නොහැකි දත්ත මත පැනවීම තිරණය කළ අවස්ථාවක එම ගණුදෙණුවේ මිල හා අදාල ඇගයීම් රාමුවේ මිල අතර වෙනස, අදාළ යෙදවුම් නිරීක්ෂණය කළ හැකි වූ විට හෝ එම උපකරණ මූල්‍ය ප්‍රකාශ වලින් ඉවත් කල විට පමණක් ආදායම් ප්‍රකාශය තුළ ගලපනු ලබයි.

5.8 ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ ශේෂයන් (IMF)

බැංකුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සමග කරනු ලබන ගනුදෙනු ශ්‍රී ලංකා රජයේ නියෝජිතයෙකු ලෙස නොව, තම බලතල ප්‍රකාර සිදුකරනු ලැබේ. බැංකුව විසින් ජා.මු.අ. සමඟ සිදුකෙරෙන සියළු ගනුදෙනු එම පදනම මත මෙම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇතුළත් කර ඇත.

ජා.මු.අ. සමඟ වූ පංගුව වත්කමක් වශයෙන් බැංකුව විසින් සටහන් කර ඇති අතර, එම පංගුව සඳහා ජා.මු.අ. වෙත ගෙවිය යුතු මුදල බැංකුවේ බැරකමක් ලෙස සටහන් කර ඇත. ජා.මු.අ. විසින් වෙන් කරන ලද සමුච්චිත විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) ප්‍රමාණය බැරකමක් ලෙස සලකනු ලැබේ. ජා.මු.අ. සමඟ වූ පංගුව ලාභය හෝ පාඩුව තුළින් සාධාරණ අගය ලෙස වර්ගීකරණය කර ඇති අතර අනෙකුත් ජා.මු.අ. හා අදාල වන සියලුම වත්කම් සහ වගකීම් සළුල පොලී ක්‍රමය මත ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනු ලැබේ. ජා.මු.අ. විසින් වාර්තාකරණ දිනට ප්‍රකාශයට පත්කරන ලද විනිමය අනුපාතිකයන් අනුව ජා.මු.අ. වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උද්ගත වන විනිමය ලාභ හෝ පාඩු ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ජා.මු.අ. සමඟ වූ ශේෂයන්ට අදාළ සියළුම ගාස්තු සහ පොළිය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ.

5.9 මුදල් සහ මුදල් සමානයන්

විදේශීය බැංකු සහ මූල්‍ය ආයතනයන්හි ඇති මුදල්, කෙටිකාලීන තැන්පතු සහ පරිණත කාලය මාස තුනකට අඩු, සාධාරණ අගය වෙනස්වීමේ සැලකිය යුතු අවදානමක් නොමැති සහ බැංකුව මගින් එහි කෙටිකාලීන බැඳීම් කළමණාකරණය සඳහා යොදා ගන්නා ඉහළ ද්‍රවශීලතාවයකින් යුතු මූල්‍ය වත්කම් මුදල් සහ මුදල් සමානයන්ට අයත් වේ.

මුදල් සහ මුදල් සමානයන් ක්‍රමක්ෂය පිරිවැයට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශනයේ ඇතුලත් කරනු ලැබේ.

දේශීය මුදල් ක්‍රියාකාරකම්වල අංගයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව ඇතැම් ආදායම් ඉපැයීම් ද ඇතැම් වියදම් දැරීම ද සිදුකරන නමුත්, එමගින් මුදල් චලනයක් සිදු නොවේ. එම ක්‍රියාකාරකම්වලින් ඇතැම් වත්කම් සහ බැරකම් ද උද්ගත වන අතර එයට ප්‍රධාන වශයෙන් ශ්‍රී ලංකා රජය සමග සහ දේශීය බැංකු සහ මූල්‍ය ආයතන සමග ගනුදෙනු අදාළ වේ. ශ්‍රී ලංකා රජය සමග වන ගනුදෙනුවලට මූල්‍ය ප්‍රතිපත්ති කාරකයක් ලෙස රජය විසින් නිකුත් කරනු ලබන භාණ්ඩාගාර බිල්පත්වල දායක නොවූ කොටසක් සහ රජය විසින් නිකුත් කරනු ලබන බැඳුම්කර අයත් වේ. එවැනි මිලට ගැනීම්, බැහැර කිරීම් හෝ ඒ මත පොළිය හුදෙක් පොත් සටහන් වශයෙන් පමණක් ශ්‍රී ලංකා මහ බැංකු වාර්තාවල සටහන් කරනු ලැබේ. මේවා මූල්‍ය ප්‍රකාශයන්හි සටහන් 45 සහ සටහන් 46 යටතේ වෙන් වෙන්ව හෙළිදරව් කර ඇත.

මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාර, ව්‍යවස්ථාපිත අධිකාරිය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මහජනයා වෙත මුදල් නිකුත් කරනු ලැබේ. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල්, දරන්නා වෙනුවෙන් බැංකුව මගින් හිමිකමක් පවතී. මෙය බැංකුවට බැරකමක් වන අතර දරන්නාට අතැති මුදල් වේ. සංසරණ මුදල්වල චලනය, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයෙන් ඉදිරිපත් කරන අතර, මහ බැංකු අතර පවත්නා පරිචය ප්‍රකාර, මූල්‍ය ක්‍රියාකාරකම්වල කොටසක් ලෙස ඇතුළත් කරනු ලැබේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල්/ගෙවීම් නියෝග ක්‍රියාවලිය මගින් නෝට්ටු සහ කාසි හෝ ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නිකුත් කරන චෙක්පත් මගින් ලබාගන්නා භාණ්ඩ සහ සේවා සඳහා සැපයුම්කරුවන් සහ සේවකයින් වන විවිධ අණ ලද්දන් වෙත මුදල් ගෙවනු ලැබේ. ඒවා සංසරණ මුදල් බැරකමට හෝ වාණිජ බැංකු සහ මූල්‍ය ආයතන සමග වන තැන්පතු ශේෂයන්ට හෝ එකතු කරනු ලැබේ. එවැනි කටයුතු සඳහා වූ මුදල් භාවිතා කිරීම ශ්‍රී ලංකා මහ බැංකුවෙන් පිටතට යන මුදල් ප්‍රවාහයට අයත් වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි, මුදල් සහ මුදල් සමානයන්ට මුදල්/මුදල් විධානයන්ගේ ශුද්ධ ගලායෑම් හා ඉහත විස්තර කරන ලද මුදල් සහ මුදල් සමානයන් ද අඩංගු වේ.

5.10 ප්‍රතිමිලදි ගැනුම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු

ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිලදීගනු ලබන සුරුකුම්පත්, වත්කම් ලෙස අඛණ්ඩව ශේෂ පත්‍රයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම සඳහා වූ වගකීම් (ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත විකුණන ලද සුරුකුම්පත්) බැරකමක් ලෙස හඳුනාගනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීම් ගනුදෙනුවල විකුණුම් සහ ප්‍රතිමිලදී ගැනීමේ මිල සහ ප්‍රතිවර්තන මිලදී ගැනීමේ ගනුදෙනුවල මිලදි ගැනීමේ මිල සහ විකුණුම් මිල අතර වෙනස පිළිවෙලින් වියදමක් සහ ආදායමක් වන අතර, එය ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ.

ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත රඳවාගෙන ඇති සුරුකුම්පත් (නැවත විකිණිම සඳහා වූ ගිවිසුම් මත මිලදීගත් සුරුකුම්) වත්කම් ලෙස මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රතිමිලදී ගැනීමේ සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනු ඒවායේ උපචිත ආදායම් හා වියදම් ද ඇතුළුව ක්‍රමක්ෂය පිරිවැය යටතේ වාර්තා කරනු ලැබේ.

5.11 නිත්‍ය තැන්පතු සහ ණයදීමේ පහසුකම්

2014 පෙබරවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි නිත්‍ය තැන්පතු පහසුකම (පෙර නිත්‍ය ප්‍රතිමිලදී ගැනුම් පහසුකම) සුරුකුම් රහිත තැන්පතු පහසුකමක් බවට පරිවර්තනය කරන ලදී. එබැවින් සහභාගී වන ආයතන තම අතිරේක අරමුදල් නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාත යටතේ දෛනිකව ආයෝජනය කරනු ලබයි.

නිත්‍ය ණය පහසුකම, (පෙර නිත්‍ය ප්‍රතිවිකුණුම් පහසුකම) හා සර්ව සම අතර මෙය මූල්‍ය තත්ව ප්‍රකාශයේ ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගනී.

5.12 ශ්‍රී ලංකා මහ බැංකු සුරුකුම්පත්

වෙළෙඳපොළේ අතිරික්ත ද්‍රවශීලතාවය අන්තර්ග්‍රහණය කර ගැනීම සඳහා මුදල් ප්‍රතිපත්ති ක්‍රියාත්මකවීම් යටතේ බැංකුව විසින් කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකු සුරුකුම්පත් නිකුත් කරනු ලබයි. මෙසේ නිකුත් කරනු ලබන සුරුකුම්පත් වගකීමක් ලෙස වාර්තා කරනු ලැබේ.

5.13 ශ්‍රී ලංකා රජයේ සුරුකුම්පත්

ශ්‍රී ලංකා රජයේ සුරුකුම්පත්, ශ්‍රී ලංකා රජයෙන් මිලට ගන්නා ලද භාණ්ඩාගාර බිල්පත්වලින් වලින් සහ බැඳුම්කර වලින් සමන්විත වේ. ශ්‍රී ලංකා රජයේ සුරුකුම්පත්හි ආයෝජන මූල්‍ය තත්ව ප්‍රකාශයේ අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගය ලෙස වාර්තා කරනු ලැබේ.

5.14 රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ (සංශෝධිත පරිදි) 89 වගන්තිය යටතේ ශ්‍රී ලංකා රජය වෙත ඍජුව දෙන ලද කාලීන අත්තිකාරම්වලින්, රජයට දෙන ලද අත්තිකාරම් නියෝජනය වේ. මෙම අත්තිකාරම් පසුව ක්‍රමක්ෂය පිරිවැයට දක්වා ඇත.

5.15 අනිකුත් ආයතනවලට දෙන ලද ණය

අනිකුත් ආයතනවලට දෙන ලද ණය ක්‍රමක්ෂය පිරිවැයට හඳුනාගෙන දක්වා ඇත.

5.16 සුරුකුම්පත් ණයට දීම සහ ණයට ගැනීම

බැංකුව විසින් එහි මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාකාරිත්ව අවශ්‍යතා සඳහා ප්‍රධාන සංස්ථාපිත ආයෝජකයින් වෙතින් රාජ්‍ය සුරුකුම්පත් ණයට ගැනීම සිදු කරයි. මෙම ණයට ගත් සුරුකුම්පත්, බැංකුව විසින් ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරිත්වය මත වෙළෙඳපොළ තුළ පවතින අතිරික්ත ද්‍රවශීලතාවය අවශෝෂණය කර ගැනීමට යොදා ගනී.

සුරුකුම්පත් ණයට ගැනීම යනු නැවත බාරදීම අතපසු වන විටක දී, සුරුකුම්පත් නැවත භාරදීම, එකඟ වූ ගාස්තු ගෙවීම සහ වෙළෙඳපොළ වටිනාකම මත වන්දි ගෙවීම (බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ප්‍රාථමික වෙළෙඳපොළ සහභාගීවන්නන්ට දැනුම් දී ඇති වෙළෙඳපොළ මිල) සඳහා වන කොන්දේසි විරහිත ඇපවීමකි. ණයට ගත් සුරුකුම්පත් වෙළෙඳපොළ වටිනාකමින් කිසියම් අවස්ථාවක දී ප්‍රතිමිලදී ගැනීමේ ක්‍රියාකාරකම් සඳහා යොදා නොගත් සුරුකුම්පත් අසම්භාව්‍ය වගකීම් ලෙස වාර්තා කරනු ලැබේ. අදාළ ගාස්තු ගෙවීම උපචිත පදනම මත වාර්තාකරණු ලබයි.

ණයට දීමේ ගනුදෙනුවක් යටතේ ප්‍රතිපාර්ශ්වයකට සුරුකුම්පත් මාරු කිරීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙහි පෙන්නුම් කරෙනුයේ හිමිකාරිත්වයේ අවදානම් හා ප්‍රතිලාභයන්ද මාරු වූයේ නම් පමණි.

5.17 සේවක ණය

සහනදායී පොළී අනුපාත යටතේ ණය පහසුකම් ලබාගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ට හිමිකම ලැබේ. 2008 වසරේ සිට නිකුත් කල මෙම ණය, ජා.මු.වා.ප්‍ර. 9 අනුව, වට්ටම් කරන ලද මුදල් ප්‍රවාහ ක්‍රමය භාවිතා කරමින් ඒවායේ සාධාරණ අගයට ගණනය කරනු ලැබේ.

වට්ටම් අනුපාතය - ශ්‍රී.ලං.ම. බැංකුවේ ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සකස්කරනු ලබන, නිශ්චිත කාලයක් සඳහා අදාළ වන දිගු කාලීන උද්ධමන ඉලක්ක හා අපේක්ෂිත මූර්ත පොළී අනුපාතයට බැංකුවේ උපදේශන විගණන කමිටුව මඟින් අනුමත කළ පරිදි සියයට 1ක අවදානම් අධිභාරයක් එකතු කළ අනුපාතය, වට්ටම් අනුපාතය ලෙස භාවිතා කරන අතර එය, ණයවල කාලපරිච්ඡේදය සමඟ වෙනස් වේ.

මෙම ණය සහනදායී පොළී අනුපාතයන් යටතේ ලබාදීම නිසා බැංකුව විසින් දරණ ලද වියදම වාර්තා කිරීමට සේවක ණයවල වර්ෂ ආරම්භ දිනට සහ වර්ෂ අවසාන දිනට වර්තමාන අගයන්ගේ වෙනස වාර්ෂිකව ක්‍රමක්ෂය කරන අතර බැංකුව විසින් මෙම ණය, වෙළෙඳපොළ අනුපාතිකයන්ට දෙනු ලැබුවේ නම්, බැංකුව විසින් උපයනු ලබන ආදායම වාර්තා කිරීමට සමාන අගයක්, අනෙකුත් ආදායම් ලෙස වාර්තා කරයි.

සාධාරණ අගය කිරීම ගණනය සඳහා යොදාගනු ලබන උපකල්පනයන්:

- සේවක ණය ලබාදුන් දිනය ලෙස ජනවාරි 01 දින සලකන ලදී.
- මෙම ණය සඳහා කිසිදු ආකාරයක ගැලපීමක් හෝ කලින් පියවීමක් සිදුවී නොමැත.

5.18 රන්

මුදල් නීති පනතේ 67(1) වගන්තිය ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවට තම ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස, රන් දැරිය හැක. මුදල් නීති පනතේ 67(2) වගන්තිය ප්‍රකාරව, මුදල් මණ්ඩලය විසින් රන් න්‍යෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ ඍජුව හෝ වක්‍රව පරිවර්තනය කළ හැකි විනිමයක් ලෙස පවත්වාගත යුතුයි. මෙම රන් තොගය ජාත්‍යන්තර සංචිතයේ කොටසක් වන බැවින් සහ සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී වෙළෙඳ භාණ්ඩයක් ලෙස හුවමාරු නොවන බැවින් රන් සාධාරණ අගයට අගය කොට ලාභය හෝ අලාභය ආදායම් ප්‍රකාශයට මාරු කරනු ලැබේ. රන්වලින් උපලබ්ධි නොවූ ලාභය ලාභාලාභ විසර්ජනයට පෙර අදාළ සංචිත ගිණුමට මාරු කරනු ලැබේ.

5.19 මුදල් තොග

බැංකුවේ තොගය තුළ, සංසරණය සඳහා නිකුත් කර නොමැති නව ව්‍යවහාර මුදල් අන්තර්ගත වේ. නව මුදල් නෝට්ටු සහ කාසිවලට අදාල නිෂ්පාදන සහ නිර්මාණ පිරිවැය, මුල්වරට පිරිවැයට හඳුනාගනු ලැබේ. සංසරණය සඳහා නිකුත් කරනු ලබන නව මුදල් නෝට්ටු සහ කාසිවල අදාල පිරිවැය බර තබන ලද සාමාන්‍ය පදනමක් මත තීරණය කරන අතර, නිකුත් කරන අවස්ථාවේදී එය ආදායම් ප්‍රකාශනයට ගලපනු ලැබේ. සෙමෙන් චලනය වන තොගය සඳහා වෙන් කිරීම් සිදු කර ඇත.

5.20 අනෙකුත් තොග

අනෙකුත් තොග, පිරිවැය හෝ උපලබ්ධි වටිනාකම් වන දෙකෙන් අඩු ප්‍රමාණය මත දක්වා ඇත. බර තබන ලද සාමාන්‍ය පිරිවැය පදනම්ව පිරිවැය නිශ්චය කරනු ලැබේ.

5.21 දේපළ, පිරියත සහ උපකරණ

ඉඩම් සහ ගොඩනැගිලි හැර දේපළ, පිරියත සහ උපකරණ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ වටිනාකම අඩුකළ පිරිවැයට දක්වනු ලැබේ. එකී දේපළ, පිරියත සහ උපකරණවල කොටස් ආදේශ කිරීමේ පිරිවැය එය දරන අවස්ථාවේදී හඳුනා ගැනීම සඳහා වූ නිර්නායකයන් සපුරන ලද්දේ නම්, එකී වියදම් ද එවැනි පිරිවැයට ඇතුළත් වනු ඇත.

ඉඩම් සහ ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය කරන දිනට එහි සාධාරණ අගය වන ප්‍රත්‍යාගණන අගයට අගය කර ඉන් අනතුරුව හඳුනාගන්නා සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානිකරණ අලාභ අඩුකර දක්වනු ලැබේ.

සින්නක්කර ඉඩම් හැර, වත්කම්වල පහත සඳහන් ඇස්තමේන්තු කළ ජීවකාලය තුළ සරළ මාර්ග ක්‍රමය අනුව ක්ෂය ගණනය කරනු ලැබේ.

වත්කම් වර්ගය	ජීවකාලය
සින්නක්කර ඉඩම්වල පිහිටි ගොඩනැගිලි	වර්ෂ 50 ක් තුළ
කල්බදු ඉඩම්වල පිහිටි ගොඩනැගිලි	කල්බදු කාල පරිච්ඡේදය තුළ හෝ වසර 50 යන දෙකෙන් අවමය
පිරියත සහ පිරියත කොටස්	වර්ෂ 20 ක් තුළ
ලී බඩු සහ උපකරණ	වර්ෂ 10 ක් තුළ
මෝටර් රථ	වර්ෂ 5 ක් තුළ
2014 වර්ෂයේ සිට මිලදී ගත් මෝටර් රථ	වර්ෂ 10 ක් තුළ
පරිගණක දෘඪාංග	වර්ෂ 4 ක් තුළ
වෙනත්	වර්ෂ 3 ක් තුළ

ධාරණ අගයක් අයකරගත නොහැකි බවට සිද්ධීන් හෝ අවස්ථානුකූල වෙනස්කම් හෝ මගින් පෙන්නුම් කරන විටක දේපල, පිරියත හා උපකරණවල සාධාරණ අගය හානිකරණය සඳහා සමාලෝචනය කළ යුතුය.

බැංකුවේ ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනය සඳහා වූ ප්‍රතිපත්තිය වන්නේ අවම වශයෙන් වසර 3කට වරක් හෝ සැලකිය යුතු තක්සේරු ගැලපීමක් ඊට අඩු කාලසීමාවක් තුළදී ප්‍රත්‍යක්ෂ වූ විටය.

ප්‍රත්‍යාගණන අතිරික්තය ප්‍රත්‍යාගණන සංචිතයට බැරකර, මූල්‍ය තත්ව ප්‍රකාශයේ හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. කෙසේ වුවද මීට පෙර එම වත්කමෙහි හඳුනාගත් ප්‍රත්‍යාගණන අඩුවීමක් ප්‍රතිවර්තනය කරනු ලබන ප්‍රමාණයට එම ප්‍රත්‍යාගණන වැඩිවීම, ආදායමක් ලෙස හඳුනාගෙන ආදායම් ප්‍රකාශනයෙහි දක්වනු ලැබේ. ප්‍රත්‍යාගණන අඩුවීම් ද ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. කෙසේ වුවද, ප්‍රත්‍යාගණන අඩුවීමක් එම වත්කම සම්බන්ධයෙන්ම වූ පෙර ප්‍රත්‍යාගණන අතිරික්තයක් නිෂ්ප්‍රභා කරන්නේ නම්, එම ප්‍රත්‍යාගණන අඩුවීම්, ප්‍රත්‍යාගණන සංචිතයේ ඇති අතිරික්තය සමග ගලපනු ලැබේ. වත්කමක් බැහැර කිරීමේදී, කිසියම් වත්කමකට සම්බන්ධ ප්‍රත්‍යාගණන අතිරික්තයක් වෙතොත් එය රඳවාගත් ඉපැයීම්වලට මාරු කරනු ලැබේ. කිසියම් වත්කමක් ඉවත් කිරීමෙන් භාවිතා කිරීමෙන් හෝ ඉවත්කිරීමේ අනාගත ප්‍රතිලාභ ලැබීමේ අපේක්ෂාවක් නොමැතිනම් එය දේපළ, පිරියත සහ උපකරණ ලෙස හඳුනා ගනු නොලැබේ. එවැනි අවස්ථාවක උද්ගත වන ලාභ හා අලාභ (ඉවත් කිරීමෙන් ලබන ශුද්ධ මුදල සහ ධාරණ අගය අතර වෙනස) එම වර්ෂයේදීම ආදායම් ප්‍රකාශනයෙහි හඳුනාගනු ලැබේ. වත්කමෙහි අවශේෂ වටිනාකම, ජීවකාලය සහ ක්‍රමයන් සමාලෝචනයට භාජනය කරනු ලබන අතර අවශ්‍ය වේ නම් නිරතුරුව ගැලපීම් කරනු ලැබේ.

ප්‍රාග්ධන නොනිමි වැඩ එහි පිරිවැයට දක්වා ඇත. මෙම වියදම් ප්‍රාග්ධන ස්වභාවයේ වන අතර ගොඩනැගිලි ඉදිකිරීමේදී ප්‍රධාන පිරියත සහ යන්ත්‍ර සහ පද්ධති සංවර්ධනයේදී සෘජුව දරා ඇති අතර ප්‍රාග්ධනීකරණය කිරීමට සූදානමින් පවතින වියදම් වේ.

5.22 කල්බදු

යම් ගිවිසුමක් ආරම්භයේදී එම ගිවිසුම කල්බදු ගිවිසුමක්ද යන්න හෝ ගිවිසුමෙහි කල්බද්දක් අන්තර්ගත වේද යන්න බැංකුව විසින් නිර්ණය කරනු ලැබේ. ප්‍රතිෂ්ඨාව සඳහා හුවමාරුවේදී යම් නිශ්චිත කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතා කිරීමේ අයිතිය ගිවිසුමකින් පවරා දෙන්නේනම් එවන් ගිවිසුමක් කල්බද්දකින් සමන්විත වේ. යම් ගිවිසුමක් මගින් හඳුනාගත් වත්කමක් භාවිතා කිරීමේ අයිතියක් ලබාදේද යන්න නිර්ණය කිරීම සඳහා බැංකුව විසින් ජා.මු.වා.ප්‍ර. 16 හි ඇතුළත් වන කල්බදු සඳහා වන නිර්වචනය යොදා ගනු ලැබේ.

බැංකුව කල්බදු ගැණුම්කරුවෙකු ලෙස ක්‍රියා කිරීම.

බැංකුව විසින් කල්බද්ද ආරම්භ වන දිනයේදී වත්කම භාවිතා කිරීමේ හිමිකමක් හා කල්බදු වගකීමක් හඳුනාගනු ලැබේ. වත්කම භාවිතා කිරීමේ හිමිකම ආරම්භයේදී පිරිවැයට මනිනු ලැබේ. මෙහිදී පිරිවැය ලෙස සලකනුයේ කල්බද්ද ආරම්භ වන දින හෝ ඊට පෙර කරන ලද කල්බදු ගෙවීම් ගලපන ලද ආරම්භක කල්බදු වගකීමට බැංකුව විසින් දරන ලද මූලික ඍජු පිරිවැය හා අදාල කල්බදු ඉඩම් හා කාර්යාල පරිශ්‍රයන් සඳහා කරන ලද නවීකරණයන් ඉවත්කිරීමට අවශ්‍ය වන ඇස්තමේන්තුගත පිරිවැය එකතු කළ විට ලැබෙන අගයයි.

වත්කම භාවිතා කිරීමේ හිමිකම, කල්බද්ද ආරම්භ කළ දිනයේ සිට කල්බදු වාරය අවසන් වන දිනය තෙක් සරල මාර්ග ක්‍රමයට ක්ෂය කරනු ලැබේ. මීට අමතරව වත්කම භාවිතා කිරීමේ හිමිකමෙන් හානිකරන අලාභ අඩුකරන අතර කල්බදු වගකීමේ නැවත මැනීම් ගැළපීමද සිදුකරනු ලැබේ.

කල්බදු වාරය ආරම්භ කළ දිනට, නොගෙවූ කල් බදු ගෙවීම් වල වර්තමාන වටිනාකමට කල්බදු වගකීම මනිනු ලැබේ. මේ සඳහා කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය භාවිතයෙන් කල්බදු ගෙවීම් වට්ටම් කරනු ලබන අතර එම පොලී අනුපාතිකය නිශ්චය කළ නොහැකි විට ඒ සඳහා බැංකුවේ වර්ධක ණය අනුපාතිකය භාවිතා කරනු ලැබේ.

කල්බදු වගකීම් මැනීමේදී පහත සඳහන් කල්බදු ගෙවීම් සලකා බලනු ලැබේ.

- ප්‍රධාන ස්ථාවර ගෙවීම් ඇතුළත් වන ස්ථාවර ගෙවීම්;
- දර්ශකයක් හෝ අනුපාතිකයක් මත රඳා පවතින, කල්බද්ද ආරම්භක දිනට දර්ශකයක් හෝ අනුපාතිකයක් භාවිතයෙන් මනිනු ලැබූ විචල්‍ය කල්බදු ගෙවීම්;
- අවශේෂ වටිනාකම සහතික කිරීම් යටතේ බැංකුව විසින් ගෙවීමට අපේක්ෂා කරන අගය; හා

- බැංකුව විසින් මිලදී ගැනීමේ විකල්පයක් ක්‍රියාත්මක කිරීම සාධාරණ පමණින් නිශ්චිත නම් එම විකල්පය ක්‍රියාත්මක කිරීමේ මිල, බැංකුවට කල්බදු වාරය දීර්ඝ කිරීම සඳහා අවස්ථාවක් ඇති විට, එසේ කල්බදු වාරය දීර්ඝ කිරීම සාධාරණ පමණින් නිශ්චිත නම් එම කාලය තුළදී ගෙවීමට අපේක්ෂිත කල්බදු ගෙවීම් හා කල්බදු වාරය අවසන් වීමට පෙර බැංකුව විසින් කල්බද්ද අවසන් කිරීමට ක්‍රියාත්මක වේ නම් ඒ සඳහා අදාල වන දඩ ගෙවීම්.

කල්බදු වගකීම සළුල පොලී අනුපාත ක්‍රමය භාවිතයෙන් ක්‍රමක්ෂය පිරිවැයට මනිනු ලැබේ. එනමුදු යම් දර්ශකයක හෝ අනුපාතිකයක වෙනස්වීමක් මත වන අනාගත කල්බදු වාරිකවල වන වෙනසක්, අවශේෂ වටිනාකම සහතික කිරීම යටතේ බැංකුව විසින් ගෙවීමට අපේක්ෂිත අගයේ සිදුවන වෙනසක්, කල්බදු වාරය දීර්ඝ කිරීමේ අවස්ථාවක් ක්‍රියාත්මක කිරීම පිළිබඳ බැංකුවේ අදහස වෙනස්වීමක්, කල්බදු වාරය අවසන් වීමට පෙර කල්බද්දක් අවසන් කිරීම වෙනුවෙන් බැංකුව විසින් ගෙවිය යුතු දඩයක් හා ප්‍රධාන ස්ථාවර ගෙවීම්වල සිදුවන වෙනස්වීම් හේතුවෙන් කල් බදු වගකීම් නැවත මැනීමට සිදු වේ.

ඉහත අයුරින් නැවත මනින ලද කල්බදු වගකීමෙහි වන වෙනස්වීම අදාළ වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගයට ගලපනු ලැබේ. අදාල වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ධාරණ අගය ශූන්‍ය වේ නම් එම කල්බදු වගකීමෙහි වෙනස් වීම ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ.

බැංකුව විසින් වත්කම භාවිතා කිරීමේ හිමිකම හා කල්බදු වගකීම මූල්‍ය තත්ත්ව ප්‍රකාශයෙහි පිළිවෙලින් දේපල, පිරියත හා උපකරණ (සටහන 20) හා විවිධ බැරකම් හා උපචිතයන් (සටහන 33) තුළ දක්වා ඇත.

5.23 අස්පෘශ්‍ය වත්කම්

පරිගණක දෘඪාංගවල සංරචකයන් නොවන පරිගණක මෘදුකාංග, අස්පෘෂ්‍ය වත්කම් ලෙස දක්වා පිරිවැයට හඳුනාගනු ලැබේ. මූලික හඳුනා ගැනීමෙන් අනතුරුව මෙම අස්පෘෂ්‍ය වත්කම්, සමුච්චිත ක්‍රමක්ෂය සහ සමුච්චිත හානිකරණ අඩුකළ ධාරණ අගයකට පවත්වා ගෙන යනු ලැබේ.

මෘදුකාංග වත්කම් සඳහා පසුකාලීනව ඇතිවන වියදම් ප්‍රාග්ධනීකරණය කරන්නේ එමඟින් ඊට අදාල නිශ්චිත වත්කමේ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ ඉහළ යන්නේ නම් පමණි. අනෙකුත් සියලු වියදම් දරන ලද අවස්ථාවේදී ම වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

වත්කමෙහි අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ අපේක්ෂිත පරිභෝජන රටාව මැනවින් පිළිබිඹු වන බැවින් අදාල වත්කම පාවිච්චිය සඳහා සූදානම් දිනයේ සිට වසර 4ක ඵලදායී ජීව කාලයක් තුළ සෘජු පදනමක් යටතේ ක්‍රමයෙන් ආදායම් ප්‍රකාශයේ හඳුනාගනු ලැබේ.

5.24 අනෙකුත් වත්කම්

අනෙකුත් වත්කම් අපේක්ෂිත උපලබ්ධි වටිනාකමට පවත්වාගෙන යනු ලැබේ.

5.25 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

එක් එක් වාර්තා කිරීමේ දිනයේදී කිසියම් මූල්‍ය නොවන වත්කමක් හානිකරණයට භාජනය වීමේ සළකුණු දක්වන්නේ ද යන්න නිර්ණය කිරීම සඳහා බැංකුව විසින් එම වත්කම්වල ධාරණ අගය සමාලෝචනය කිරීම සිදු කරනු ලබයි.

වත්කම් හානිකරණ පරීක්ෂාව සඳහා, අනෙකුත් වත්කම්වල මුදල් ගලාඒම් වලින් බොහෝ දුරට ස්වාධීන වූ මුදල් ගලා ඒම් ඇති වත්කම් කුඩා වත්කම් සමූහවලට කාණ්ඩගත කරනු ඇත.

“වත්කමක අයකරගත හැකි වටිනාකම” එම වත්කමෙහි “භාවිතයේ පවතින වටිනාකම” හෝ සාධාරණ අගයෙන් විකිණීමට දරණ පිරිවැය අඩුකොට ගන්නා වටිනාකම යන දෙකෙන් ඉහළ අගය වේ. වත්කමක භාවිතයේ පවතින වටිනාකම වනුයේ එම වත්කමේ ඇස්තමේන්තුගත අනාගත මුදල් ප්‍රවාහ එකී වත්කමේ වර්තමාන වෙළෙඳපොළ තක්සේරුවේ කාල අගය හා එම වත්කමටම විශේෂ වූ අවදානම් පිළිබිඹු කරනා පූර්ව බදු වට්ටම් අනුපාතයකින් වට්ටම් කිරීමෙන් ලැබෙන වර්තමාන අගයයි.

වත්කමක ධාරණ අගය එකී වත්කමේ අයකර ගත හැකි වටිනාකම ඉක්මවා යයි නම් හානිකරණ අලාභයක් හඳුනාගනු ලබයි.

ගලපන ලද හානිකරණ අලාභ නැවත හැරවිය හැක්කේ අදාළ වත්කමේ ධාරණ අගය එම වත්කම මත හානිකරණ අගයක් හඳුනා නොගත් අවස්ථාවක නිර්ණය කළ, ක්ෂය හෝ ක්‍රමක්ෂය ගලපන ලද ශුද්ධ ධාරණ අගය ඉක්මවා නොයන අවස්ථාවක පමණි.

5.26 ප්‍රතිපාදන

අතීත සිදුවීමක ප්‍රතිඵලයක් වශයෙන් බැංකුවට වර්තමාන වගකීමක් (නෛතික හෝ සම්මුතියකින්) ඇතිවිටෙක දී වගකීම බේරුම් කිරීම සඳහා ආර්ථික වාසි ඇතුළු සම්පත් ගලායාමක් අවශ්‍යවීමත්, එම වගකීම පිළිබඳ විශ්වසනීය ඇස්තමේන්තුවක් පිළියෙල කිරීමට හැකිවීමත් මත ප්‍රතිපාදන හඳුනාගනු ලැබේ. ප්‍රතිපාදනයක් ප්‍රතිපූර්ණය කිරීමට බැංකුව අපේක්ෂා කරන්නේ නම්, එම ප්‍රතිපූර්ණය නිසැකවම තහවුරු වන්නා වූ අවස්ථාවලදී, එය වෙන ම වත්කමක් ලෙස හඳුන්වනු ලැබේ.

5.27 සංසරණයේ පවතින මුදල්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරනු ලබන මුදල් ඒවා දරන්නන්ට බැංකුව මත හිමිකමක් පවතී. සංසරණයේ පවතින මුදල් සඳහා බැරකම, ඒවායේ මුහුණත වටිනාකම මත මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශයේ සටහන් කරනු ලැබේ.

5.28 නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රමයන් යනු නිශ්චිත දායක යෝජනා ක්‍රමයක් නොවන පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ යෝජනා ක්‍රමයකි.

බැංකුව විසින් විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප්, වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප්, විශ්‍රාම පාරිතෝෂික සහ විශ්‍රාම සේවක වෛද්‍ය ප්‍රතිලාභ යන නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම පවත්වා ගෙන යනු ලබයි. ඉන් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලබන පළමු යෝජනා ක්‍රම 3 ට බැංකුව සහ සුදුසුකම් ලත් ප්‍රතිලාභීන් විසින් දායක මුදල් ගෙවනු ලැබේ. නිශ්චිත ප්‍රතිලාභ යෝජනාක්‍රම යටතේ ප්‍රතිලාභ ගෙවීමේ පිරිවැය, පුරෝකථනය කළ ඒකීය බැර ආයුගණන ක්‍රමයක් මත එක් එක් යෝජනා ක්‍රමයට වෙන් වෙන් වශයෙන් තීරණය කරනු ලැබේ.

එක් එක් නිශ්චිත ප්‍රතිලාභ යෝජනා ක්‍රම සඳහා බැංකුවේ බැඳීම් වෙන වෙනම ගණනය කරන අතර එහිදී සේවා නියුක්තිකයින්ගේ වර්තමාන හා පෙර කාලසීමාවන් හි සපයන ලද සේවාවන්ට ඉපැයූ ප්‍රතිලාභවල අනාගත ප්‍රතිලාභ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී ප්‍රතිලාභ වට්ටම් කර එහි වර්තමාන අගය තීරණය කරයි. මෙහිදී හඳුනානොගත් අතීත සේවා පිරිවැය සහ යෝජනා ක්‍රමයේ වත්කම්වල සාධාරණ අගය අඩුකරනු ලැබේ. වට්ටම් අනුපාතය වනුයේ ඉදිරියට ඇති සේවා කාලයේ සාමාන්‍යයට ආසන්න කල්පිරීම් දිනයන් සහිත රජයේ බැඳුම්කරවල තක්සේරු දිනට ඉපැයීම් අනුපාතයයි. සටහන් අංක 32 හි හෙලිදරව් කල සියළුම ප්‍රධාන ආයුගණන උපකල්පන, වාර්ෂිකව සංශෝධනය කරනු ලැබේ.

5.29 නිශ්චිත දායක සැලසුම්

අදාල ව්‍යවස්ථා සහ රෙගුලාසි ප්‍රකාර සේවකයින්ට සේවක අර්ථසාධක අරමුදලේ දායකත්වය සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලේ දායකත්වයට හිමිකමක් ලැබේ. බැංකුව විසින් සේවකයින්ගේ දළ පාරිශ්‍රමිකයෙන් සියයට 24 ක් සහ සියයට 3 ක් පිළිවෙලින් සේවක අර්ථසාධක අරමුදලට සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදලට දායක වශයෙන් ගෙවනු ලැබේ. මෙම අරමුදලේ නිශ්චිත දායක සැලසුම් වෙන් වෙන්ව පරිපාලනය කරනු ලැබේ.

නිශ්චිත දායක යෝජනා ක්‍රමයේ දායකත්ව වගකීම් ඒවා පැන නගින අවස්ථාවන්හිදී ආදායම් ප්‍රකාශනයේ වියදමක් ලෙස හඳුනාගනී.

5.30 ප්‍රදානයන්

සාධාරණ වටිනාකමට හඳුනාගෙන ඇති ප්‍රදානයන්, ඒවා ලබා ගැනීම සඳහා පමුණුවා ඇති කොන්දේසිවලට අනුකූලවීමට ඇති ඉඩකඩ පිළිබඳ සාධාරණ තහවුරුවක් ඇතිවිට ඒවා හිමිකරු ප්‍රාග්ධනය යටතේ දක්වනු ලැබේ. ප්‍රදානයන් වියදම් විෂයකට අදාල වන අවස්ථාවක දී වියදමට සරිලන කාල පරිච්ඡේදයක් තුළ ක්‍රමානුකූල පදනමක් මත එය ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ප්‍රදානයක් වත්කමට අදාල වන අවස්ථාවක දී එහි සාධාරණ අගය රජයේ විලම්භීත ප්‍රදාන ගිණුමකට බැරකර, එම වත්කමේ ක්ෂය ප්‍රතිපත්තියට අනුකූල වූ ක්‍රමානුකූල පදනමක් මත එහි අපේක්ෂිත ප්‍රයෝජනවත් ආයුකාලය තුළ ආදායම් ප්‍රකාශයට මුදාහරිනු ලැබේ.

5.31 අසම්භාව්‍ය වගකීම් සහ බැඳීම්

නිශ්චිත නොවන අනාගත සිදුවීම් මගින් පවතින බවට තහවුරු කෙරෙන හෝ ආර්ථික ප්‍රතිලාභ මාරුවීම නිශ්චිත නොවන හෝ එහි ප්‍රතිලාභ විශ්වාසනීය ලෙස අගය කළ නොහැකි බැඳීමක් අසම්භාව්‍ය වගකීමක් ලෙස හැඳින්වේ. ණය ගැනිකම් සහතිකවීම්, ඉදිරි විදේශ විනිමය ගනුදෙනු සහ අනිකුත් බැඳීම් සියල්ල මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනා නොගන්නා අතර අදාල ශීර්ෂ යටතේ අසම්භාව්‍ය වගකීම් හා බැඳීම් අයිතම ලෙස හෙලිදරව්කර ඇත. අවශ්‍යවන අවස්ථාවන්හිදී මෙම ප්‍රමාණ වඩාත් උචිත ඇස්තමේන්තු අනුව මිනුම් කර ඇත.

ආදායම් ප්‍රකාශය සහ විස්තීරණ ආදායම් ප්‍රකාශය

5.32 ආදායම සහ වියදම

බැංකුව වෙත ආර්ථික ප්‍රතිලාභ ගලාඒමේ හැකියාව සහ ආදායම නිසැකව ම මිනුම් කළ හැකි ප්‍රමාණය අනුව ආදායම් ගිණුම්ගත කරනු ලැබේ. දරන ලද පිරිවැය සහ උපයන ලද නිශ්චිත ආදායම අතර සෘජු සම්බන්ධතාවය පදනම් කරගෙන ආදායම් ප්‍රකාශනයෙහි වියදම් සටහන් කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සහ දේපල, පිරියත, උපකරණ කාර්යක්ෂමව පවත්වා ගැනීම සඳහා දරන ලද සියළුම වියදම්, වර්ෂය සඳහා ප්‍රතිඵල ගණනය කිරීම පිණිස ආදායමට එරෙහිව සටහන් කර ඇත.

ආදායම් හා වියදම් හඳුනාගැනීමට පෙර පහත දැක්වෙන ගිණුම්ගත කිරීම් හඳුනාගැනීමේ නිර්ණායකයන් සපුරාලිය යුතුය.

5.32.1 පොළී ආදායම් සහ වියදම්

පොළිය ලැබීම පිළිබඳ සැකයක් නොමැති නම්, මිලට ගැනීමේ සත්‍ය මිල පදනම්ව, සඵල ඵලදායිත්ව ක්‍රමයට, උපචිත පදනම මත පොළී ආදායම සහ වියදම, ආදායම් ප්‍රකාශනයෙහි සටහන් කරනු ලැබේ. ස්ථාවර ආදායම් ආයෝජන හා සුරුකුම්පත් මත උපයන කුපන්, භාණ්ඩාගාර බිල්පත් හා අනිකුත් වට්ටම් උපකරණ මත උපචිත වට්ටම් සහ අධිමිල, පොළී ආදායමට ඇතුළත් ය. ණය අයකර ගැනීම සැක සහිත අවස්ථාවල දී පොළී ආදායම අත්හිටුවන අතර, ඒවා ලැබෙනතුරු පොළී ආදායමෙන් බැහැර කරනු ලැබේ.

5.32.2 ලාභාංශ

ලාභාංශ ආදායම කොටස්හිමියා වෙත ලැබීමේ අයිතිය තහවුරු වූ විට හඳුනාගනු ලැබේ.

5.32.3 විවිධ ආදායම් හා වියදම්

විවිධ ආදායම් සහ වියදම් උපචිත පදනම මත හඳුනාගනු ලැබේ. දේපල, පිරියත සහ උපකරණ බැහැර කිරීමේදී උද්ගතවන ආදායම් ස්වභාවයේ ශුද්ධ ලාභ හෝ පාඩු, (විකුණුම් ප්‍රතිශ්ඨාවෙන් වත්කමේ ධාරණ අගය සහ විකුණුම් වියදම් අඩු කිරීමෙන් ලැබෙන) විකුණුම් වියදම්, ආදායම් ප්‍රකාශයෙහි ගිණුම්ගත කර ඇත.

ප්‍රධාන ලාභ උත්පාදන ක්‍රියාකරකම්වලට අනුෂාංගික ක්‍රියාකාරකම්වලින් උද්ගතවන සහ සමාන ගනුදෙනු සමූහයකින් උද්ගතවන එතරම් වැදගත් නොවන ලාභ සහ පාඩු එකතුකොට ශුද්ධ පදනම මත වාර්තාකර ඉදිරිපත් කරනු ලැබේ.

5.32.4 සේවක මණ්ඩල වියදම්

සේවක මණ්ඩල වියදම්වලට, මුළු කාර්ය මණ්ඩල ප්‍රතිලාභවල පූර්ණ පිරිවැය ඇතුළත් ය. වර්ෂය අවසානයේ දී ගෙවිය යුතු වැටුප් සහ සම්බන්ධිත වියදම්, අනිකුත් දේශීයව ගෙවිය යුතු ශේෂයන් යටතේ දක්වනු ලැබේ.

5.32.5 ආදායම් බදු වියදම

1949 අංක 58 දරණ මුදල් නීති (සංශෝධිත) පනතේ 118 වගන්තිය, 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ 9 (1) වගන්තිය සහ ඉන්පසුව කරන ලද 2021 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත සහ 2022 අංක 45 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත ප්‍රකාරව බැංකුවේ ආදායම, ආදායම් බද්දෙන් නිදහස් වේ. 2017 අංක 7 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව 2017 අප්‍රේල් 1 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි බැංකුව විසින් ආර්ථික සේවා ගාස්තු ගෙවිය යුතු වේ. එහෙත් 2018 අංක 33 දරණ ආර්ථික සේවා ගාස්තු (සංශෝධිත) පනත අනුව 2018 ඔක්තෝබර් මස

සිට උපලබ්ධි නොවූ ලාභ සහ විදේශ මූල්‍ය වත්කම්වල මිල වෙනස්වීමෙන් වන උපලබ්ධි නොවූ ලාභ ආර්ථික සේවා ගාස්තුවලින් නිදහස් වේ. තවද 2013 අංක 17 දරණ එකතු කල අගය මත බදු (සංශෝධිත) පනත යටතේ මූල්‍ය සේවා සැපයීම මත එකතු කල අගය මත බද්දෙන් බැංකුව නිදහස් වේ.

2020 ජනවාරි 1 දින සිට බලපැවැත්වෙන පරිදි ආර්ථික සේවා ගාස්තු අහෝසිකරන ලදී.

5.33 වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිද්ධීන්

වාර්තාකරණ කාලපරිච්ඡේදයට පසු සිදු වූ සියළුම ප්‍රමාණාත්මක සිදුවීම් සැලකිල්ලට ගෙන අදාල පරිදි, මූල්‍ය ප්‍රකාශයන්හි නියමිත සටහන් තුළ සංශෝධන හෝ හෙළිදරව් කිරීම් ලෙස දක්වා ඇත.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

ජා.ගි.ප්‍ර. 7 - මුදල් ප්‍රවාහ ප්‍රකාශන සමග අනුකූලව, මුදල් ප්‍රවාහ ප්‍රකාශය සැකසීම සඳහා වන "සෘජු ක්‍රමය" භාවිතයෙන් මුදල් ප්‍රවාහ ප්‍රකාශය පිලියෙල කර ඇත. මුදල්/මුදල් විධානයන්ගේ ගලායෑම් ගැළපීමෙන් අනතුරුව ලැබෙන අගය ඉහත නිර්වචනය කළ පරිදි මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙහි මුදල් හා මුදල් සමානයන් ලෙස දක්වා ඇත.

6. ප්‍රකාශිත නමුත් වාර්තා කරන දිනට බල සහිත නොවූ ප්‍රමිතීන් මත වූ සංශෝධන සහ නිර්වචනයන්

පහත ප්‍රමිතීන් මත වූ සංශෝධන හා බැඳුනු නව නිර්වචනයන් 2022 ජනවාරි 01 දිනට පසු එළඹෙන වාර්ෂික කාලපරිච්ඡේදවලට බල පැවැත්වෙන අතර ඒවා නියමිත දිනට පෙර යොදා ගැනීමට අවසර ඇත. එසේ වුවද, මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීමේ දී බැංකුව විසින් මෙකී සංශෝධිත ප්‍රමිතීන් නියමිත දිනට පෙර අදාළ කර නොගන්නා ලදී. තවද පහත දක්වා ඇති සංශෝධිත ප්‍රමිත බැංකුවේ මූල්‍ය ප්‍රකාශ මත සැලකිය යුතු බලපෑමක් ඇති කරනු ඇතැයි බැංකුව බලාපොරොත්තු නොවේ.

6.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම (ජා.ගි.ප්‍ර 1 සහ ජා.මු.වා.ප්‍ර (Practice Statement) **2 සඳහා කරන ලද සංශෝධන)**

ජා.ගි.ප්‍ර. 1 හි ප්‍රධාන සංශෝධනයන්හි ඇතුළත් වන්නේ,

- සමාගමක සැලකිය යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට වඩා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළි කිරීමේ අවශ්‍යතාවය ආදේශ කිරීම:
- ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම පිළිබඳ තීරණ ගැනීමේදී, ආයතන, ප්‍රමාණාත්මක සංකල්පය අදාළ කරගන්නා ආකාරය පිළිබඳ මාර්ගෝපදේශ සැපයීම:
- වගකීම් ජංගම සහ ජංගම නොවන ලෙස වර්ගීකරණය කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කිරීම.

මෙම සංශෝධන 2023 ජනවාරි 1 සිට බලපැවැත්වේ.

6.2 ගිණුම්කරණ ඇස්තමේන්තු අර්ථ දැක්වීම (ජා.ගි.ප්‍ර. 8ට කරන ලද සංශෝධන)

මෙම සංශෝධන මගින් ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා නව අර්ථ දැක්වීමක් හඳුන්වා දෙන අතර ඒවා මිනුම් අවිනිශ්චිතතාවයට යටත් වන මූල්‍ය ප්‍රකාශනවල මුදල් ප්‍රමාණයන් බව පැහැදිලි කෙරේ.

එසේම, ගිණුම්කරණ ප්‍රතිපත්තියක් මඟින් දක්වා ඇති අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා බැංකුව විසින් ගිණුම්කරණ ඇස්තමේන්තුවක් සකස් කිරීම ඔස්සේ ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ ගිණුම්කරණ ඇස්තමේන්තු අතර වන සම්බන්ධය මෙම සංශෝධන මඟින් පැහැදිලි කෙරේ.

ගිණුම්කරණ ඇස්තමේන්තුවක් ගොඩනැගීමේදී පහත කරුණු දෙකම ඇතුළත් කෙරේ.

- මිනුම් ක්‍රමයක් තෝරා ගැනීම (ඇස්තමේන්තු කිරීම හෝ තක්සේරු කිරීමේ ශිල්ප ක්‍රමය) උදා ජා.මු.වා.ප්‍ර. 9 'මූල්‍ය උපකරණ' අනුව අපේක්ෂිත ණය පාඩු සඳහා අලාභ දීමනාව මැනීමට භාවිතා කරනු ලබන ඇස්තමේන්තු ක්‍රමය; හා
- තෝරාගත් මිනුම් ක්‍රමය යොදන විට භාවිතා කළ යුතු යෙදවුම් තෝරා ගැනීම උදා - ජා.මු.පා.ප්‍ර. 37 'ප්‍රතිපාදන, අවිනිශ්චිත වගකීම් සහ අවිනිශ්චිත වත්කම්' අනුව වගකීම් සඳහා ප්‍රතිපාදන තීරණය කිරීම සඳහා අපේක්ෂිත මුදල් ගලායෑම්

මෙම සංශෝධන 2023 ජනවාරි 1 දින හෝ ඉන්පසුව ආරම්භ වන කාලසීමාවන් සඳහා බලපැවැත්වෙන අතර, කලින් යොදා ගැනීමට අවසර ලබා දී ඇත.

බැංකුව විසින් සංශෝධන අදාළ කර ගනු ලබන පළමු වාර්ෂික වාර්තාකරණ කාලසීමාව ආරම්භයේ හෝ ඉන්පසුව සිදුවන ගිණුම් ඇස්තමේන්තුවල වෙනස්කම් සහ ගිණුම්කරණ ප්‍රතිපත්තිවල වෙනස්කම් අනාගත කාලපරිච්ඡේදවලට බලපාන ලෙස යොදා ගනු ලැබේ.

7. ක්‍රියාකාරකම්වල ස්වභාවය සහ විෂය පථය

7.1 විදේශීය මුදල් ක්‍රියාකාරකම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි විදේශීය සංචිත කළමනාකරණය යටතේ පවත්වාගෙන යනු ලබන විදේශීය මුදල් වත්කම්වලින් විදේශීය මුදල් ක්‍රියාකාරකම් ප්‍රධාන වශයෙන් ජනිත වේ. විදේශීය සංචිත කළමනාකරණ කළඹ, විදේශීය මුදල් මැදිහත්වීමේ කාර්යයන් සඳහා වූ විදේශීය මුදල් වත්කම් සහ වෙළෙඳ කටයුතු සඳහා වූ අනිකුත් විදේශීය මුදල් වත්කම්වලින් සමන්විත වේ.

විදේශීය මුදල් වත්කම් විවිධ මුදල් වර්ගවලින් පවත්වා ගනු ලැබේ. එයින් වැඩි ප්‍රමාණයක් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ඔස්ට්‍රේලියානු ඩොලර්, යුරෝ, බ්‍රිතාන්‍ය පවුම්, ජපන් යෙන් සහ නවසීලන්ත ඩොලර් වලින් පවතී.

මෙම විදේශීය මුදල් කළඹ තුළ වූ මූල්‍ය ලියවිලි ප්‍රධාන වශයෙන් සෛචරී සුරුකුම්පත්, ප්‍රතිවිකුණුම් ගනුදෙනු යටතේ රඳවා ගත් සුරුකුම් හෝ අනිකුත් මහ බැංකු, වාණිජ බැංකු හා අනිකුත් භාරකාර ආයතන සමඟ පවත්නා වූ ශේෂයන්ගෙන් සමන්විත වේ.

විදේශීය වෙළෙඳපොළේ මෙහෙයුම්වලින් උද්ගත වන්නා වූ විදේශීය මුදල් වත්කම් සහ බැරකම් ද, කලින් කලට ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දරනු ලැබේ.

7.2 දේශීය මුදල් ක්‍රියාකාරකම්

දේශීය මුදල් ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි උද්ගත වේ.

(i) ද්‍රවශීලතා කළමනාකරණ මෙහෙයුම්: බැංකු පද්ධතියට අරමුදල් අත්තිකාරම් දීමෙන් හෝ බැංකු පද්ධතියෙන් අරමුදල් ආපසු ගැනීමෙන් රජයට හෝ මූල්‍ය

වෙළෙඳපොළට දෛනිකව සිදුවන ශුද්ධ ගලායාම්/ගලාඒම් හිලව් කිරීම මඟින් ද්‍රවශීලතා කළමනාකරණය සිදුකරනු ලබයි. මෙම කටයුතු බොහොමයක් දෛනික විවට වෙළෙඳපොළ මෙහෙයුම් මඟින් සිදුකරනු ලැබේ.

(ii) විවෘත වෙළෙඳපොළ කටයුතු සඳහා ආධාරකයක් වශයෙන් ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් වලින් සමන්විත ආයෝජන කළඹක් බැංකුව පවත්වා ගනී. බැංකුවේ ප්‍රතිපත්තිය වන්නේ මෙම ආයෝජන වෙළඳාම සඳහා නොව මුදල් මෙහෙයුම් කටයුතු සඳහා පමණක් පවත්වා ගැනීමය.

7.3 භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

භාරකාරත්ව සහ පරිපාලන විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන අගයන්, බැංකුවේ මූල්‍ය ප්‍රකාශනවල මූලිකාංගයන්ට අයත් කොටසක් නොවන බැවින් මෙම මූල්‍ය ප්‍රකාශයන්හි ඇතුලත් කර නොමැත.

8. මුදල් සහ මුදල් සමානයන්

	2022 රු. 000	2021 රු. 000
බැංකු සමඟ ඇති ශේෂයන්	**7,626,592**	23,385,534
බැංකු සමඟ ඇති කාලීන තැන්පතු	**-**	49,430,045
එක්දින ස්ථාපනය කිරීම්	**118,410,171**	124,669,823
මුදල් සහ මුදල් සමානයන් සඳහා ලැබිය යුතු පොලී	**28,287**	19,084
මුදල් ප්‍රවාහ ප්‍රකාශයට අනුව මුදල් සහ මුදල් සමානයන්	**126,065,050**	197,504,486
සීමාසහිත භාවිතයන් සඳහා පවතින මුදල් සහ මුදල් සමානයන් (සටහන 8.1)	**526,467,646**	315,345,334
අඩුකළා: මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 8.2)	**(844,832)**	(85,368)
එකතුව	**651,687,864**	512,762,452

8.1 25.5 සටහනෙහි දක්වා ඇති ආකාරයට ශ්‍රී.ලං.ම.බැ. හා පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා අතර ඇති වූ ද්වීපාර්ශ්වික මුදල් හුවමාරු පහසුකම යටතේ ලැබුනු චීන යුආන් බිලියන 10ක මුදල සීමාසහිත භාවිතයන් සඳහා පවතින මුදල් සහ මුදල් සමානයන් ලෙස දක්වා ඇත.
මෙම පහසුකම යටතේ ලැබුණු මුදල්, රටවල් දෙක අතර වෙළඳ කටයුතුවලදී, ඍජු ආයෝජනවලදී සහ දෙපාර්ශ්වය මඟින් එකඟවන වෙනත් කාරණයක් සඳහා යොදාගත හැකිය.

8.2 මුදල් සහ මුදල් සමානයන් මත අපේක්ෂිත ණය අලාභයන්ගේ චලනය

	2022			2021		
	අදියර I රු. 000	අදියර II රු. 000	එකතුව රු. 000	අදියර I රු. 000	අදියර II රු. 000	එකතුව රු. 000
ජනවාරි 1 දිනට ශේෂය	**52,009**	**33,359**	**85,368**	90,277	180,061	270,338
වර්ෂය තුල අය කිරීම්/(ආපසු හැරවුම්)	**789,431**	**(29,967)**	**759,464**	(38,268)	(146,702)	(184,970)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**841,440**	**3,392**	**844,832**	52,009	33,359	85,368

9. විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන්

	2022 රු. 000	2021 රු. 000
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්		
- විදේශීය සුරැකුම්පත්වල ආයෝජනයන්	**10,867,425**	8,818,244
විදේශ සුරැකුම්පත් ආයෝජනවල එකතුව	**10,867,425**	8,818,244
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 9.1)	**4,744**	995

9.1 අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වූ සුරැකුම්පත් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

	2022			2021		
	අදියර I රු. 000	අදියර II රු. 000	එකතුව රු. 000	අදියර I රු. 000	අදියර II රු. 000	එකතුව රු. 000
ජනවාරි 1 දිනට ශේෂය	**995**	**-**	**995**	36,546	2,062,175	2,098,721
වර්ෂය තුළ අය කිරීම්/(ආපසු හැරවුම්)	**3,749**	**-**	**3,749**	(35,551)	(2,062,175)	(2,097,726)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**4,744**	**-**	**4,744**	995	-	995

10. ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

10.1 පහත දක්වා ඇති වගුව මගින් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණයන්හි සාධාරණ අගයන් එහි කාල්පනික අගයන් සමග වත්කම් හෝ බැරකම් වශයෙන් වාර්තා කර ඇත. දළ අගයන් වශයෙන් වාර්තා කර ඇති කාල්පනික අගයන් ලෙස හඳුනා ගනුයේ ව්‍යුත්පන්නයට පාදක වූ වත්කමෙහි නිර්දේශ අනුපාතයෙහි හෝ දර්ශකයෙහි අගය වන අතර ව්‍යුත්පන්න උපකරණයන්ගේ අගයන්හි සිදුවන වෙනස්වීම් මිනුම් කිරීමේ පදනම ද වේ. කාලපරිච්ඡේදයේ අවසාන දිනට හිඟව පවතින ගනුදෙණුවල පරිමාව කාල්පනික අගයන්ගෙන් නිරූපණය වන අතර එමගින් වෙළඳපල අවදානම හෝ ණය අවදානම නොහැඟවේ.

	2022			2021		
	වත්කම් රු. 000	වගකීම් රු. 000	කාල්පනික අගය රු. 000	වත්කම් රු. 000	වගකීම් රු. 000	කාල්පනික අගය රු. 000
මුදල් හුවමාරු (Currency SWAPS)	**401,580**	**71,669,551**	**208,591,719**	54,022,803	1,130,519	197,002,554
ඉදිරියෙහි වූ හුවමාරු (Forex Forward)	**-**	**28,443**	**1,724,773**	33	8,804	229,487
එකතුව	**401,580**	**71,697,994**	**210,316,492**	54,022,836	1,139,323	197,232,041

10.2 ඉහත සඳහන් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ සමන්විත වනුයේ මුදල් හුවමාරු සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම් වලිනි. මෙවැනි උපකරණ යොදා ගනුයේ බැංකුවේ ව්‍යාවස්ථාපිත අරමුණක් වන ජාත්‍යන්තර අරමුදල් පවත්වා ගැනීමේ දී පැන නගින්නා වූ වෙළඳපොල සහ ද්‍රවශීලතා අවදානම් කළමනාකරණය කිරීම සඳහාය. මීට අමතරව මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු සහ විදේශ මහ බැංකු සමඟ හුවමාරු ගිවිසුම් සහ ඉදිරි විදේශ විනිමය ගිවිසුම්වලට එළඹීම මගින් ශ්‍රී ලංකා රුපියල අන්තර්ජාතිකව ස්ථාවරව පවත්වා ගැනීමත්, දේශීය මූල්‍ය පද්ධතිය ශක්තිමත් කිරීමත්, විදේශ මුදල් රට තුළට ගෙන ඒමට එම බැංකු දිරිමත් කිරීමත් අපේක්ෂා කෙරේ.

10.3 ව්‍යුත්පන්නයන් යනු පොලී අනුපාත, මූල්‍ය උපකරණවල වටිනාකම, භාණ්ඩ මිල ගණන්, විදේශ විනිමය අනුපාත, ණය අවදානම් සහ දර්ශක වෙනස්වීම්වලට අනුව අගය තීරණය වන මූල්‍ය ගිවිසුම්ය.

10.4 විනිමය අනුපාත අවදානම සහ කෙටිකාලීන ද්‍රවශීලතාවය පාලනය කිරීම සඳහා වූ උපායමාර්ග යක් ලෙස එළඹුණු මුදල් හුවමාරු (Currency SWAP) බැංකුවේ ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ කළඹයෙහි වැදගත් කොටසක් වශයෙන් අඩංගු වී ඇත. මුදල් හුවමාරුවකදී බැංකුව, නියමිත දින දෙකකදී එක් මුදල් වර්ගයකින් නිශ්චිත ප්‍රමාණයක් තවත් මුදල් වර්ගයක් සමඟ එකඟ වූ අනුපාතයන් යටතේ හුවමාරු කර ගනී.

10.5 ඉදිරි විදේශ විනිමය ගිවිසුම් මගින් බැංකුව, එකඟ වූ අනුපාතයකට, එකඟ වූ ඉදිරි දිනයකදී නිශ්චිත විදේශ මුදල් ප්‍රමාණයක් මිලදී ගැනීමට හෝ විකිණීමට බැඳී සිටී.

10.6 සමස්ථ අවදානම් කළමනාකරණයෙහි කොටසක් ලෙස ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවලින් අපේක්ෂිත ප්‍රතිලාභ බැංකුව වෙත ලැබීම තහවුරු කිරීමට, බැංකුව විසින් ව්‍යුත්පන්න ගිවිසුම් වෙත නිරාවරණය වීම සමීප වශයෙන් අධීක්ෂණය කරනු ලබයි.

10.7 දිගු කාලීන ඇ.ඒ.ජ. ඩොලර්/රුපියල් විකුණුම් මිලදී ගැනීම් හුවමාරු පහසුකම් (USD/LKR Buy-Sell Swap Agreements)

විදේශ සංචිත ඉහළ නැංවීමේ අරමුණින් බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සමඟ දිගුකාලීන (2023.6.30 න් පසුව කල්පිරෙන) ඇ.ඒ.ජ. ඩොලර්/රුපියල් විකුණුම් මිලදී ගැනීම් හුවමාරු පහසුකම් වලට එළඹීම් සටහන අංක 10.1 හි අන්තර්ගතවේ. 2022 දෙසැම්බර් 31 දිනට පවතින පහසුකම් සඳහා ගෙවිය යුතු මුදල් පහත පරිදි වේ.

බැංකුව	ගිවිසුම්ගත දිනය	ගෙවිය යුතු මුදල ඇ.එ.ජ. ඩොලර් මිලියන	අවසාන වාරිකය කල් පිරෙන දිනය	කාලසීමාව/ කොන්දේසි	ගනුදෙණුවේ අදාළත්වය
ලංකා බැංකුව ලංකා බැංකුව මහජන බැංකුව මහජන බැංකුව	2021 අප්‍රේල් 22 2021 ජූනි 29 2021 අප්‍රේල් 23 2021 සැප්තැම්බර් 30	45.00 44.78 45.00 44.78	2027 දෙසැම්බර් 15	• අවුරුදු 6ක් සඳහා ශුන්‍ය පිරිවැය ලෙස • ආසන්න වශයෙන් ඇ.එ.ජ. ඩොලර් මි. 10 ක් සෑම මාස 6ක දීම පියවෙන පරිදි අදියර 5 කදී පියවීම කළ යුතුය.	Asian Infrastructure Investment Bank මගින් කොවිඩ්-19 හදිසි හා ආපදා සහන ලබාදීමේ ව්‍යාපෘතිය සඳහා ලබාදුන් ණය
DFCC බැංකුව	2021 පෙබරවාරි 24	125.00	2028 අගෝස්තු 15	• අවුරුදු 7ක් සඳහා ශුන්‍ය පිරිවැය ලෙස • ඇ.එ.ජ. ඩොලර් මි. 6.25 ක් සෑම මාස 3කට වරක්ම පියවෙන පරිදි අදියර 20කදී පියවීම කළ යුතුය.	United States International Development Finance Corporation මගින් ලබාදුන් ණය.
කොමර්ෂල් බැංකුව	2021 නොවැම්බර් 17	35.00	2026 නොවැම්බර් 23	• වසර 05 ක කාලසීමාවක් සහිත මෙම ගිවිසුම පළමු මාස 18 සඳහා ශුන්‍ය පිරිවැය යටතේත්, ඉතිරි කාලසීමාව සඳහා ඇ.එ.ජ. ඩොලර් 01 කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගින් අර්ධ වාර්ෂිකවත් පියවිය යුතුය. • කල් පිරෙන දිනයේදී සම්පූර්ණ මුදලම පියවිය යුතුය.	එක්සත් රාජධානියේ CDC PLC වෙතින් ලැබුණු ණය.
ජාතික සංවර්ධන බැංකුව (NDB)	2022 මාර්තු 18	36.00	2029 මාර්තු 19	• සම්පූර්ණ කාලසීමාව අවුරුදු 7කි. ඉන් පළමු මාස 18 තුළදී ඇ.එ.ජ ඩොලර් 01 කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගිනුත් ඉතිරි කාලසීමාව සඳහා ඇ.එ.ජ ඩොලර් 01 කට ශ්‍රී ලංකා රුපියල් 1ක් බැගින් අර්ධ වාර්ෂිකවත් පියවිය යුතුය. • ඇ.එ.ජ. ඩොලර් මිලියන 3ක් අර්ධ වාර්ෂිකව පියවෙන පරිදි අදියර 12 ක් යටතේ පියවිය යුතුය.	United States International Development Finance Corporation මගින් ලබාදුන් ණය.

II. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්

	2022 රු. 000	2021 රු. 000
ලාභ/අලාභ මත සාධාරණ අගයට මිනුම් කළ		
ජා.මූ.අ. පංගුව (සටහන 11.1)	**279,779,554**	162,603,548
විශේෂ ගැනුම් හිමිකමේ දැරීම (සටහන 11.2)	**626,461**	24,800,563
	280,406,015	187,404,111
ක්‍රමක්ෂය පිරිවැය යටතේ මිනුම් කළ		
ජා.මූ.අ. තැන්පතු (සටහන 11.3)	**377,081**	216,785
කලින් ගෙවීම් - ජා.මූ.අ. ණය	**637,986**	424,944
අඩුකළා: ජා.මූ.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 11.4)	(8)	(3)
	1,015,059	641,726
	281,421,074	188,045,837

II.1 ජා.මූ.අ. පංගුව (IMF quota)

ජා.මූ.අ. හි වත්කම් වල ප්‍රාථමික මූලාශ්‍රය වන්නේ එහි සාමාජික රටවලින් ලබා ගන්නා ලද ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් පංගුව හෙවත් ප්‍රග්ධන දායකත්වයයි. එක් එක් රටවල පංගුව, පුළුල් වශයෙන්, එම රටෙහි සාපේක්ෂ ආර්ථික වටිනාකම පදනම් කර ගනිමින් තිරණය කරනු ලබයි. ජා.මූ.අරමුදලෙහි සාමාජිකත්වය ලබාගැනීමෙන් පසු තම පංගුවෙන් 25%ක ප්‍රමාණයක් පුළුල්ව පිළිගත් විදේශ මුදලකින් හෝ විශේෂ ගැනුම් හිමිකම මගින්ද ඉතිරි 75%ක මුදල එම රටෙහි දේශීය මුදලින්ද ගෙවිය යුතුය. ජා.මූ. අරමුදලේ කොන්දේසිවලට අනුව රජය වෙනුවෙන් බැංකුව සිය ගිණුමෙන්ම ගනුදෙනු සිදුකරනු ලබන හෙයින් ජා.මූ.අ. පංගුව බැංකුවේ වත්කමක් ලෙස නියෝජනය වේ.

ජා.මූ අරමුදලේ පොදු පංගු සමාලෝචන ගිවිසුම යටතේ, 2016 ජනවාරි මස දී 189ක් වූ ජා.මූ.අ සාමාජිකයන්ගේ පංගුව වැඩි කිරීමට තීරණය කරන ලදී. (වර්තමානයේ ජා.මූ.අ. සාමාජිකයින් ගණන 190 කි.)

එහි ප්‍රතිඵලයක් වශයෙන් ශ්‍රී ලංකා ජා.මූ.අ. පංගුව වි.ගැ.හි. මිලියන 413.40 ක් වූ පෙර පංගු ප්‍රමාණයේ සිට 2016 පෙබරවාරි 17 වන දිනට වි.ගැ.හි. මිලියන 578.80 දක්වා වර්ධනය විය.

ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල 24 වන සටහනේ පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත. සාමාජික පංගුව මගින් ජා.මු.අ. සමඟ රටක පවතින මූල්‍යමය සහ සංවිධානාත්මක සම්බන්ධතාවය තහවුරුකරනු ලබන අතර පහත පහසුකම් ද මේ සඳහා ඇතුළත් වේ.

සාමාජිකයෙකු ජා.මු.අ. වෙතින් ඉවත්වුවහොත්, එහි පංගු දායකත්වය ජා.මු.අ. වෙත ශුද්ධ බැඳීම් පියවීමට අවශ්‍ය නොවන ප්‍රමාණය දක්වා ආපසු ගෙවනු ලැබේ. කෙසේ වෙතත්, සාමාජිකයන්ට ජා.මු.අ. පංගුව සඳහා පොළියක් හිමි නොවන අතර එම නිසා මුදල් වල කාල වටිනාකම සඳහා වන්දි මුදලක් හිමි නොවේ. එම නිසා, ජා.මු.වා.ප්‍ර. 9 යටතේ මෙය ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට පවතින අගයක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සාධාරණ අගය ගණනය කිරීමට කල්පිරීමේ කාලයක් නොමැති බැවින් සාධාරණ අගය ක්‍රමක්ෂය පිරිවැය අගයට සමාන වේ.

i.) **දායකය** - ජා.මූ.අ. වෙත සාමාජිකයකුගේ දායකය සාමාජිකයාගේ පංගුවට සමාන වේ. එමගින් සාමාජිකයා විසින් ජා.මූ.අ. වෙත ලබාදීමට බැඳී ඇති උපරිම මූල්‍ය සම්පත් ප්‍රමාණය නිශ්චය කරනු ලැබේ. සාමාජිකයකු විසින් දායකය සම්පූර්ණයෙන් ම ගෙවිය යුතු අතර, සියයට 25 ක් ජා.මූ.අ. විසින් නියම කරනු ලබන සංචිත වත්කම්වලින් (වි.ගැ.හි. හෝ පාවිච්චි කළ හැකි මුදල්) ගෙවිය යුතුය. ඉතිරි ප්‍රමාණය සාමාජිකයාගේ ව්‍යවහාර මුදලින් ගෙවිය යුතුය.

ii.) **ඡන්දය දීමේ බලතල** - ජා.මූ.අ. තීරණවලදී සාමාජිකයාගේ ඡන්දය දීමේ බලතල පංගුව මගින් නිර්වචනය වේ. එක් එක් ජා.මූ.අ. සාමාජිකයාට මූලික ඡන්දයක් ද පංගුවෙහි සෑම වි.ගැ.හි. 100,000 ක් සඳහා එක් අතිරේක ඡන්දයක් ද බැගින් හිමි වේ. 2008 ප්‍රතිසංස්කරණ මගින් මූලික ඡන්ද සංඛ්‍යාව මුළු ඡන්ද සංඛ්‍යාවෙන් සියයට 5.50 ක් ලෙස ස්ථාවර කරන ලදී.

iii.) **මූල්‍යකරණයට පිවිසීම** - ජා.මු.අ. මගින් සාමාජිකයෙකුට ලබාගත හැකි මූල්‍ය පහසුකම් ප්‍රමාණය (එහි පිවිසීමේ සීමා) සාමාජිකයාගේ පංගුව මත තීරණය වේ. සමීපස්ථ සහ ව්‍යාප්ත කළ සැලසුම් ප්‍රකාර සාමාජිකයෙකුට වාර්ෂිකව පංගුවෙන් සියයට 145 ක් ද (ජා.මු.අ කොවිඩ් -19 තත්වයට ප්‍රතිචාර වශයෙන් තාවකාලිකව මෙය පංගුවෙන් සියයට 245ක් දක්වා 2021 වර්ෂය අවසාන තෙක් වැඩි කරන ලදී.) සමුච්චිත වශයෙන් සියයට 435 ක් ද දක්වා ණය ලබාගත හැකිය. අසාමාන්‍ය අවස්ථාවකදී ප්‍රවේශය මීට වැඩිවිය හැකිය.

iv.) **වි.ගැ.හි. වෙන්කිරීම්** - සාමාජිකයන්ගේ පංගුවලට සමානුපාතිකව ඔවුන්ගේ වි.ගැ.හි. වෙන්කිරීම් ප්‍රමාණය නියම කරනු ලැබේ. ඇ.එ.ජ. ඩොලර් බිලියන 650 කට සමාන, සාමාන්‍ය වි.ගැ.හි. වෙන්කිරීමක් ජා.මූ.අ සාමාජිකයන් මෙන්ම වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ සහභාගීවන්නන්හට ඔවුන්ගේ පවතින පංගුවට සමානුපාතිකව 2021 අගෝස්තු 23 වන දින සිට බලපැවැත්වෙන පරිදි ලබාදෙන ලදී. මෙම සාමාන්‍යවි.ගැ.හි වෙන් කිරීමෙන් ශ්‍රී ලංකාව ලද කොටස වි.ගැ.හි මිලියන 554.8 ක් විය.

II.2 විශේෂ ගැනුම් හිමිකම් දැරීම

විශේෂ ගැනුම් හිමිකම් (වි.ගැ.හි.) දැරීම වූ කලී ජා.මූ.අ. සාමාජිකයන් හට බාධාවකින් තොරව පාවිච්චි කළ හැකි මුදල් වර්ග සඳහා පවතින විභව්‍ය හිමිකමකි. එනම්, වි.ගැ.හි. දරන්නන් විසින් එම මුදල් සඳහා අනෙකුත් සංචිත මුදල් හුවමාරු කරගත හැකිවීමය. වි.ගැ.හි සංචිත වත්කමක් ලෙස සලකනුයේ ජා.මු.අ. සාමාජිකයින් වි.ගැ.හි දැරීමට සහ පිළිගැනීමට බැඳී සිටීම සහ වි.ගැ.හි. පද්ධතියේ මෙහෙයුම්වලට අදාළ විවිධ වගකීම්වලට ගරු කිරීමට බැඳී සිටීම තුළිණි. අබාධව පාවිච්චි කළ හැකි මුදල් මත වි.ගැ.හි. වල පවතින හිමිකම දෙයාකාරයකින් ගරු කිරීම ජා.මූ.අ. විසින් තහවුරු කරනු ලැබේ. එනම්, දුර්වල විදේශීය තත්ත්වයන්හි පවතින සාමාජිකයන්ගෙන් වි.හැ.හි. මිලට ගැනීම සඳහා බලවත් විදේශීය තත්ත්වයන් පවත්නා සාමාජිකයන් නම් කිරීම මගින් සහ කළමනාකරණය කළ වෙළෙඳපොළක් තුළ සාමාජිකයන් අතර, ස්වෙච්ඡා හුවමාරු කිරීම මගින් ය. අදාළ ව්‍යාකරණ දිනයේ දී බැංකුව විසින් දරන ලද මුළු ප්‍රමාණය ඉහත සංඛ්‍යාවන්ගෙන් දැක්වේ.

විශේෂ ගැණුම් හිමිකම් දැරීම සතුව මුදල් වලට සමාන ලක්ෂණ පවතී. එමනිසා, ජා.මු.වා.ප්‍ර. 9 යටතේ මෙය ලාභ හෝ අලාභ තුළින් සාධාරණ මිලට පවතින අගයක් ලෙස වර්ගීකරණය කරනු ලැබේ. සාධාරණ අගය ගණනය කිරීමට කල්පිරීමේ කාලයක් නොමැති බැවින් සාධාරණ අගය ක්‍රමක්ෂය පිරිවැය අගයට සමාන වේ.

II.3 ජා.මූ. අරමුදලේ තැන්පතු - දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම - (PRGF - HIPC) භාර තැන්පතුව

දැඩි ණයගැති භාවයට පත්වී සිටින රටවල් වෙනුවෙන් දිළිඳුකම පිටුදැකීමේ සහ වර්ධන පහසුකම (PRGF - HIPC) වෙනුවෙන්, 2000 අප්‍රේල් 21 වන දින, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමඟ ශ්‍රී ලංකාව පවත්වාගෙන යනු ලබන (පරිපාලිත -Administered) වි.ගැ.හි. 788,783 ක ශේෂයකින් යුත් විශේෂ විලම්හිත ගිණුම (SCA 2) පැවරීමෙන් අරඹන ලදී. මෙම ගිණුම අරඹන ලද්දේ ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මග පෙන්වීම මත SCA 2 ගිණුම වසා දැමීමට තීරණය කිරීමේ දී SCA 2 ගිණුමෙහි පැවැති ශේෂය මාරු කිරීමෙනි.

මෙම ගිණුමෙහි ශේෂයන් ඇති රටවලින් ජා.මූ.අ. පහත දැක්වෙන ඉල්ලීම් කරන ලදී. උක්ත ගිණුමෙහි සඳහන් ශේෂයන් (PRGF-HIPC) භාර ගිණුම වෙත ප්‍රතිපාදන කිරීම කළ යුත්තේ එකවර දෙනු ලබන පැවැරුමක් ලෙසින් හෝ සහනාධාරයක් ලෙසිනි. මෙය PRGF-HIPC ණය වෙනුවෙන් සපයා දිය යුතුය. ඒ අනුව SCA 2 ගිණුමේ ශේෂය PRGF-HIPC භාර ගිණුම වෙත පවරා දීමට ශ්‍රී ලංකා රජය එකඟ විය. මෙය පවරා දෙනු ලබන්නේ එකවර මුදාහරිනු ලබන සහනාධාරයක් ලෙසින් නොව 2018 වසර දක්වා බල පැවැත්වෙන පොළී රහිත තැන්පතුවක් වශයෙනි. පසුව මෙය 2024 දක්වා දීර්ඝ කරන ලදී.

11.4 ජා.මු.අ. සම්බන්ධිත වත්කම් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

	2022 රු. 000	2021 රු. 000
අදියර 1		
ජනවාරි 1 දිනට ශේෂය	**3**	2
වර්ෂය තුළ දී අයකිරීම්/(ආපසු හැරවුම්)	**5**	1
දෙසැම්බර් 31 දිනට ශේෂය	**8**	3

12. ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්

මුදල් ප්‍රතිපත්ති යටතේ විවට වෙළෙඳපොළ කටයුතු පවත්වාගෙන යාම සඳහා මුදල් නීති පනතේ 90(2) වගන්තිය අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මගින් ලබාගත් සහ පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සුරැකුම්පත් කළඹ මේ යටතට ගැනේ. එයට අමතරව, රාජ්‍ය සුරැකුම්පත් කළඹ තුළ මුදල් නීති පනතේ 112 වගන්තිය යටතේ බැංකුව විසින් මිලදීගත් සුරැකුම්පත්ද අන්තර්ගත වේ.

	2022 රු. 000	2021 රු. 000
භාණ්ඩාගාර බිල්පත්	**2,480,822,291**	1,351,378,149
භාණ්ඩාගාර බැඳුම්කර	**17,708,352**	25,876,232
ලැබිය යුතු පොළී	**464,372**	565,966
	2,498,995,015	1,377,820,347

ශ්‍රී.ලං.ම.බැ. මඟින් ලබාගත් සහ පවත්වාගෙන යනු ලබන රාජ්‍ය සුරැකුම්පත් ජා.මු.වා.ප්‍ර. 9ට අනුකූලව සමුච්චිත හානිකරන වෙන් කිරීම සඳහා ගැළපිය යුතුය. කෙසේ වෙතත් 2021 දෙසැම්බර් 31 දක්වා වූ මූල්‍ය ප්‍රකාශ වල, රාජ්‍ය සුරැකුම්පත් වල අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී ශූන්‍ය අලාභ දීමනාවක් භාවිතා කර ඇත. පවතින තොරතුරු මත පදනම්ව ඉහත තත්ත්වය වෙනස් කිරීමට වර්තමානයේදී කිසිදු ඇඟවීමක් නොමැත.

13. ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්

	2022 රු. 000	2021 රු. 000
ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්	**691,637,000**	567,297,000
ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත් මත ලැබිය යුතු පොළී	**6,432,219**	235,312
	698,069,219	567,532,312

14. රජයට දෙන ලද කාලීන අත්තිකාරම්

රජයේ ඒකාබද්ධ අරමුදලින් දැරීම සඳහා අවසර ලබාදී ඇති වියදම් මූල්‍යනය සඳහා වූ නියමයන්හි සඳහන් කර ඇති තත්ත්වයන්ට යටත්ව මුදල් නීති පනතේ 89 වන වගන්තිය යටතේ අදාළ වර්ෂය සඳහා රජය වෙත ලැබිය යුතු ඇස්තමේන්තු ගත ආදායමෙන් 10%ක උපරිමයකට යටත්ව ශ්‍රී ලංකා රජයට ලබාදෙන අත්තිකාරම් මෙමගින් නියෝජනය කරයි. රජය විසින් මෙම අත්තිකාරම පොළී රහිත නැවත ලබාගත හැකි ණය පහසුකමක් ලෙස භාවිතාකරන අතර මාස 6ක් නොඉක්මවන කාලයක් තුළදී නැවත පියවීමට බැඳී සිටී.

15. මූල්‍ය සහ අනිකුත් ආයතන වල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන

මුදල් නීති පනතේ 105 (අ) වගන්තිය යටතේ මෙම ආයෝජන සිදු කරනු ලබයි. මෙය යටතේ මුදල් මණ්ඩලයේ අභිමතය පරිදි බැංකු සහ මූල්‍ය අංශයේ මානව සම්පත් සහ තාක්ෂණික සංවර්ධනය, දියුණුව සහ ප්‍රවර්ධනය සඳහා හෝ ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වාණිජ බැංකුවල ගනුදෙනු නිශ්කාෂණය කිරීම පහසු කිරීම සඳහා පිහිටුවන ලද සමාගමක කොටස් අත්පත්කර ගැනීමට බැංකුව වෙත බලතල පවරා තිබේ.

15.1 ආයෝජන තත්ත්වය

ආයතනය	ව්‍යාපාර කටයුතුවල ස්වභාවය	2022 කොටස් ගණන	2022 ධාරණ අගය රු.000	2021 කොටස් ගණන	2021 ධාරණ අගය රු.000
සීමාසහිත ලංකා පේ (පුද්ගලික) සමාගම	ස්වයංක්‍රීය චෙක්පත් නිශ්කාෂණය	**2,986,824**	**769,866**	2,986,824	653,414
ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ්	ස්වයංක්‍රීය අරමුදල් හුවමාරුව	**500,000**	**-**	500,000	-
සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය	ණය තොරතුරු සම්පාදනය	**48,244**	**1,047,266**	48,244	1,017,804
			1,817,132		1,671,218

2022 නොවැම්බර් 03 වැනිදා සිට සීමාසහිත ලංකා ක්ලියර් (පුද්ගලික) සමාගම සහ ලංකා පේ (පුද්ගලික) සමාගම යන සමාගම් 'ලංකා පේ (පුද්ගලික) සමාගම' යන තනි නාමයෙන් හඳුන්වනු ලබයි.

15.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්කන්ධ ආයෝජන 2022 දෙසැම්බර් 31 දිනට පැවති සාධාරණ අගයට වාර්තා කර ඇත. එම ආයෝජනවල සාධාරණ අගය, බැංකුවේ මූල්‍ය වාර්තා පිළියෙළ කරන දිනට ආයෝජිත සමාගම් විසින් හෙලිදරව් කරන ලද විගණනය නොකල නවතම මූල්‍ය වාර්තාවල සඳහන් කොටසක ශුද්ධ වත්කම් අගය අනුව ගණනය කරනු ලැබේ. ඒ අනුව, මෙහි දැක්වෙන දිනයන්හි පැවති කොටසක ශුද්ධ වත්කම් අගය ඉහත ගණනය කිරීම් සඳහා යොදාගන්නා ලදී.

සීමාසහිත ලංකා පේ (පුද්ගලික) සමාගම	- 2022 දෙසැම්බර් 31
කොටසක ශුද්ධ වත්කම් අගය	- රු. 257.75
ලංකා ෆයිනෑන්ෂල් සර්විසස් බියුරෝ ලිමිටඩ්	- 2022 නොවැම්බර් 30
කොටසක ශුද්ධ වත්කම් අගය	- රු. -4.60
සීමාසහිත ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය	- 2022 දෙසැම්බර් 31
කොටසක ශුද්ධ වත්කම් අගය	- රු. 21,707.69

16. බැංකු සඳහා දෙන ලද ණය

	2022 රු. 000	2021 රු. 000
බැංකු සඳහා දෙන ලද ණය (සටහන 16.1)	**28,601,832**	**90,621,674**
අඩු කළා: බැංකු සඳහා දෙන ලද ණය මත අපේක්ෂිත ණය අලාභ (සටහන 16.2)	**(343,930)**	**(48,928)**
	28,257,902	**90,572,746**

16.1 බැංකු සඳහා දෙන ලද ණය

මුදල් නීති පනතේ 5 වන පරිච්ඡේදයේ III (අ) කොටසට අනුව ඵලදායීතා කටයුතු සඳහා ලබාදෙනු ලබන ණය වේ.

	2022 රු. 000	2021 රු. 000
මධ්‍යම සහ දිගුකාලීන ණය යෝජනා ක්‍රමය		
- සම්බන්ධිත පාර්ශ්වයන්	**18,173**	20,368
උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය		
- සම්බන්ධිත පාර්ශ්වයන්	**42,260**	89,707
සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද සහන ණය පහසුකම (සටහන 16.1.1)		
- සම්බන්ධිත පාර්ශ්වයන්	**1,337,217**	60,373,446
- අනෙකුත්	**484,532**	9,245,265
සෞභාග්‍යා කොවිඩ් 19 පුනරුද ප්‍රතිමූල්‍ය ණය පහසුකම (සටහන 16.1.2)		
- සම්බන්ධිත පාර්ශ්වයන්	**11,207,691**	8,644,208
- අනෙකුත්	**2,570,533**	3,173,742
සෞභාග්‍යා ණය පහසුකම (සටහන 16.1.3)		
- සම්බන්ධිත පාර්ශ්වයන්	**10,469,090**	6,850,588
- අනෙකුත්	**2,087,594**	2,211,334
ශ්‍රී.ලං.ම.බැංකුවේ ණය ඇපකර පහසුකම යටතේ ලබාදුන් ණය		
- සම්බන්ධිත පාර්ශ්වයන්	**86,307**	13,016
දේශීය කෘෂිකර්මාන්තය නඟාසිටුවීමේ ණය යෝජනා ක්‍රමය (නියමු ව්‍යාපෘතිය) (සටහන 16.1.4)		
- සම්බන්ධිත පාර්ශ්වයන්	**227,305**	-
- අනෙකුත්	**71,130**	-
	28,601,832	**90,621,674**

16.1.1 සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය පහසුකම: කොවිඩ්-19 පැතිරයාම හේතුවෙන් බලපෑමට ලක් වූ ආර්ථිකය පුනර්ජීවනය කිරීමට පහසුකම් සැපයීමක් ලෙස 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ 83 කොටස ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත කොවිඩ්-19 පැතිර යාමෙන් අහිතකර බලපෑමට ලක් වූ ව්‍යාපාර වෙත ණය ලබාදීම යන කොන්දේසියට යටත්ව ලබා දෙන ලදී.

16.1.2 සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද ප්‍රතිමූල්‍ය ණය පහසුකම: කොවිඩ්-19 පැතිර යාම හේතුවෙන් අහිතකර බලපෑමට ලක් වූ ක්ෂුද්‍ර කුඩා හා මධ්‍යම අංශයේ ව්‍යාපාර පුනර්ජීවනය කිරීම සහ රටේ ආර්ථික ක්‍රියාකාරකම් ප්‍රවර්ධනය කිරීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම නව ප්‍රතිමූල්‍ය ණය පහසුකම සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ 2020 වසරේදී දියත් කරන ලදී.

16.1.3 සෞභාග්‍යා ණය පහසුකම: මුදල් නීති පනතේ 88(අ) වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් කෘෂිකාර්මික, පශු සම්පත්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සහ ආපදාවන්ගෙන් හානිවූ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා ණය පහසුකම් සැපයීම අරමුණු කරගනිමින් සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය 2010 වසරේදී හඳුන්වා දෙන ලදී.

16.1.4 දේශීය කෘෂිකර්මාන්ත නඟාසිටුවීමේ ණය යෝජනා ක්‍රමය නියමු ව්‍යාපෘතිය (DAD-PP): මුදල් නීති පනතේ 88(අ) වගන්තිය ප්‍රකාරව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තුමේන්තුව මඟින් සැමට ප්‍රතිලාභ බෙදී යන කෘෂිකාර්මික සංවර්ධනයන් ප්‍රවර්ධනය කිරීම සඳහා කුඩා පරිමාණ ගොවි ප්‍රජාව වෙත දැරිය හැකි මූල්‍ය පහසුකම් ලබාදීම ඇතුළුව වඩාත් හොඳ වෙළඳපොළ අවස්ථා උදාකිරීම හා තාක්ෂණික සහය ලබාදීම සඳහා මෙම ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන ලදී.

16.2 බැංකුවලට ලබා දුන් ණය මත අපේක්ෂිත ණය අලාභවල චලනය

	2022				2021			
	අදියර 1 රු. 000	අදියර 2 රු. 000	අදියර 3 රු. 000	එකතුව රු. 000	අදියර 1 රු. 000	අදියර 2 රු. 000	අදියර 3 රු. 000	එකතුව රු. 000
ජනවාරි 1 දිනට ශේෂය	**14,435**	**21,477**	**13,016**	**48,928**	6,215	148,153	-	154,368
වර්ෂය තුළදී අය කිරීම් / (ආපසු හැරවුම්)	**(8,378)**	**230,088**	**73,291**	**295,001**	8,220	(120,676)	13,016	(105,440)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,057**	**251,565**	**86,307**	**343,930**	14,435	21,477	13,016	48,928

17. අනිකුත් වත්කම්

	2022 රු. 000	2021 රු. 000
මූල්‍ය වත්කම්		
අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන	**18,557,124**	16,490,667
අඩුකළා: අභ්‍යන්තර අරමුදලෙහි ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.1)	**(405)**	(280)
ශුද්ධ අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන	**18,556,719**	16,490,387
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ආයෝජන	**-**	5,380,169
අඩුකලා: ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ආයෝජන මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.2)	**-**	(150)
	-	5,380,019
ක්‍රමක්ෂය පිරිවැයට කාර්ය මණ්ඩල ණය	**5,355,855**	5,592,375
භාණ්ඩාගාර සහ අනෙකුත් අමාත්‍යාංශ වලින් ලැබිය යුතු දෑ	**3,540,585**	4,087,983
අනෙකුත් ලැබිය යුතු දෑ	**2,258,723**	2,258,932
අඩුකලා: අනෙකුත් ලැබීම් මත අපේක්ෂිත ණය අලාභ (සටහන 17.3)	**(2,226,887)**	(2,226,887)
	8,928,276	9,712,403
	27,484,994	31,582,809
මූල්‍ය නොවන වත්කම්		
කාර්ය මණ්ඩල ණය මත වූ විලම්භිත වත්කම්	**2,697,566**	2,480,961
	30,182,560	34,063,770

17.1 අභ්‍යන්තර අරමුදල්හි ආයෝජන මත අපේක්ෂිත ණය අලාභවල චලනය

	2022			2021		
	අදියර 1 රු. 000	අදියර 2 රු. 000	එකතුව රු. 000	අදියර 1 රු. 000	අදියර 2 රු. 000	එකතුව රු. 000
ජනවාරි 1 දිනට ශේෂය	**39**	**241**	**280**	48	79,524	79,572
වර්ෂය තුළ අයකිරීම්/(ආපසු හැරවුම්)	**47**	**78**	**125**	(9)	(79,283)	(79,292)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**86**	**319**	**405**	39	241	280

17.2 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මෙහෙයවන ආයෝජන මත අපේක්ෂිත ණය අලාභවල චලනයන්

	2022 අදියර 01 රු. 000	2021 අදියර 01 රු. 000
ජනවාරි 1 දිනට ශේෂය	**150**	-
වර්ෂය තුළදී අය කිරීම්	**(150)**	150
දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	150

17.3 අනෙකුත් ලැබීම් මත අපේක්ෂිත ණය අලාභවල චලනය

	2022 අදියර 03 රු. 000	2021 අදියර 03 රු. 000
ජනවාරි 1 දිනට ශේෂය	**2,226,887**	183,276
වර්ෂය තුළදී අය කිරීම්	**-**	-
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වාගෙන ගිය ශේෂයන් මාරු කිරීම්	**-**	2, 043,611
දෙසැම්බර් 31 දිනට ශේෂය	**2,226,887**	2,226,887

18. රන්

මුදල් නීති පනතේ 67(1) සහ 67(2) වගන්ති ප්‍රකාරව බැංකුවේ ජාත්‍යන්තර සංචිතයේ කොටසක් ලෙස බැංකුව සතුව භෞතිකව ඇති රන්වල වටිනාකම මෙයින් අදහස් වේ. තවද මුදල් නීති පනතේ වගන්ති 67(2) ප්‍රකාරව, අවම වශයෙන් රන් න්‍යාෂ්ටික සංචිතයක් ලෙසින් හෝ රන්වලට නිදහසේ සෘජුව හෝ වක්‍රව පරිවර්තනය කළ හැකි විනිමයක් ලෙසින් පවත්වාගැනීමට මුදල් මණ්ඩලයට සිදු වේ.

19. තොග

	2022 රු. 000	2021 රු. 000
සංසරණය සඳහා ඇති නෝට්ටු	**2,485,880**	1,788,014
සංසරණය සඳහා ඇති කාසි	**2,074,163**	2,821,514
මාර්ගස්ථ කාසි	**-**	-
මාර්ගස්ථ නෝට්ටු	**144,188**	253,168
	4,704,231	4,862,696
අඩුකළා : සෙමින් චලනය වන අයිතමයන් සඳහා වෙන්කිරීම්	**(2,446)**	(2,446)
	4,701,785	4,860,250
ලිපි ද්‍රව්‍ය සහ විවිධ තොග	**86,622**	68,124
වෛද්‍ය මධ්‍යස්ථාන තොගය	**-**	159
මුළු තොගය	**4,788,407**	4,928,533

2022 දී තොගයන්හි වටිනාකමින් රුපියල් මිලියන 2,339.65 (2021 - රු.මිලියන 2,780.25) තොග පිරිවැය (නව මුදල් නිකුතු පිරිවැය) ලෙස සටහන් කර ඇත.

20. දේපළ පිරියත සහ උපකරණ

පිරිවැය/තක්සේරු වටිනාකම	ඉඩම් සහ ගොඩනැගිලි	පිරියත සහ පිරියත උපකරණ	ලී බඩු සහ උපකරණ	මෝටර් වාහන	පරිගණක	වත්කම් භාවිතා කිරීමේ හිමිකම	අනිකුත්	නොනිමි ඉදිකිරීම්	එකතුව 2022	එකතුව 2021
	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
ජනවාරි 01 දිනට ශේෂය	**18,174,063**	**1,615,478**	**1,394,680**	**611,793**	**1,141,540**	**69,049**	**57,417**	**154,042**	**23,218,062**	**24,026,767**
එකතු කිරීම්	**2,473**	**14,042**	**221,970**	**-**	**9,841**	**-**	**286**	**216,736**	**465,348**	**293,823**
බැහැර කිරීම්	**-**	**(95)**	**(5,357)**	**-**	**(2,025)**	**-**	**-**	**-**	**(7,477)**	**(1,091,338)**
මාරු කිරීම්	**-**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**(177,699)**	**(177,699)**	**-**
බැහැර කළ වත්කම් භාවිතා කිරීමේ අයිතිය	**-**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**(11,190)**
දෙසැම්බර් 31 දිනට අගය	**18,176,536**	**1,629,425**	**1,611,293**	**611,793**	**1,149,356**	**69,049**	**57,703**	**193,079**	**23,498,234**	**23,218,062**

සමුච්චිත ක්ෂය	ඉඩම් සහ ගොඩනැගිලි	පිරියත සහ පිරියත උපකරණ	ලී බඩු සහ උපකරණ	මෝටර් වාහන	පරිගණක	වත්කම් භාවිතා කිරීමේ හිමිකම	අනිකුත්	නොනිමි ඉදිකිරීම්	එකතුව 2022	එකතුව 2021
	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000	රු.000
ජනවාරි 01 දිනට අගය	**219,099**	**1,143,599**	**1,133,460**	**463,386**	**974,746**	**8,194**	**39,584**	**-**	**3,982,068**	**3,571,315**
වර්ෂය සඳහා ක්ෂය	**219,129**	**75,892**	**82,240**	**30,973**	**72,414**	**7,161**	**242**	**-**	**488,051**	**503,845**
බැහැර කිරීම්	**-**	**(56)**	**(5,198)**	**-**	**(1,909)**	**-**	**-**	**-**	**(7,163)**	**(81,902)**
බැහැර කළ වත්කම් භාවිතා කිරීමේ අයිතිය	**-**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**-**	**(11,190)**
දෙසැම්බර් 31 දිනට අගය	**438,228**	**1,219,435**	**1,210,502**	**494,359**	**1,045,251**	**15,355**	**39,826**	**-**	**4,462,956**	**3,982,068**
ශුද්ධ පොත් අගය	**17,738,308**	**409,990**	**400,791**	**117,434**	**104,105**	**53,694**	**17,877**	**193,079**	**19,035,278**	**19,235,994**

ඉඩම් සහ ගොඩනැගිලිවල ධාරණ වටිනාකම, සාධාරණ වටිනාකම අනුව සටහන් කරනු ලැබේ. ඉතා ආසන්නම ස්වාධීන තක්සේරුව 2020 දෙසැම්බර් 31 දිනට වරලත් තක්සේරුකරු ඒ.ඒ.එම්. ෆාතිහු මහතා විසින් සිදු කරන ලද අතර 2020 දෙසැම්බර් 31 දිනට එය වාර්තාගත කර තිබුණි. 2022 දෙසැම්බර් 31 දිනට පවතින මෙම ඉඩම් හා ගොඩනැගිලිවල ධාරණ අගය 2020 දෙසැම්බර් 31 දිනට පැවති සාධාරණ අගයන් හා සසඳන කළ සැලකිය යුතු වෙනසකට භාජනය වී නොමැති බව බැංකුවේ අදහසයි.

මෙම මූල්‍ය වර්ෂය තුළදී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු. මිලියන 617.28 (2021 - රු.මිලියන 680.89) මුළු වටිනාකම්න් යුත් දේපල, පිරියත සහ උපකරණ අත්පත් කරගන්නා ලදී.

2022 දෙසැම්බර් 31 දිනට මුළුමනින්ම ක්ෂය කරන ලද නමුත් භාවිතයේ ඇති වත්කම්වල වටිනාකම රු. මිලියන 2,939.00 ක් වේ (2021 - රු. මිලියන 1,929.55).

තක්සේරුකරණ ප්‍රවේශය සහ සින්නක්කර ඉඩම්, ගොඩනැගිලි සහ කල්බදු ක්‍රමය යටතේ ලබාගත් ඉඩම්වල ඇති ගොඩනැගිලි තක්සේරු කිරීමේදී යොදාගත් සැලකිය යුතු නිරීක්ෂණය කළ නොහැකි යෙදවුම්

දේපළ	වරලත් තක්සේරුකරුවන්ගේ නම	තක්සේරු ප්‍රවේශය	පර්චස් එකක ඇස්තමේන්තුගත මිල (රු.)	වර්ග අඩියක ඇස්තමේන්තුගත මිල (රු.)	ඇස්තමේන්තුගත මාසික කුලිය (රු.)	පිටතට යන වියදම්	වසර මිලදී ගැනීම්	දෙසැම්බර් 31 දිනට සාධාරණ අගය (රු.000)
ඉඩම් හා ගොඩනැගිලි								
ප්‍රධාන කාර්යාලය - කොළඹ 01	ඒ.ඒ.එම්. ෆාතිහු	වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය	15,750,000	11,000 - 18,500	-	-	-	10,437,567
වයිට්(අ)වේස් ගොඩනැගිල්ල -කොළඹ - 01	- එම් -	වෙළඳපොල ප්‍රවේශය හා ආදායම් ප්‍රවේශය	13,200,000	-	7,000,000	35%	16.66	783,407
සෙන්ට්‍රල් පොයින්ට් ගොඩනැගිල්ල කොළඹ - 01	- එම් -	වෙළඳපොල ප්‍රවේශය හා ආදායම් ප්‍රවේශය	14,400,000	-	10,000,000	35%	16.66	1,077,180
බැංකු විදු පියස - රාජගිරිය	- එම් -	වෙළෙඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය	3,600,000	3,000 - 12,000	-	-	-	2,660,026
අධිපති නිල නිවස - කොළඹ 07	- එම් -	වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය	10,000,000	4,000 - 11,000	-	-	-	1,709,163
ප්‍රාදේශීය කාර්යාලය - මාතර	- එම් -	වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය	2,000,000 - 4,000,000	4,000 - 9,500	-	-	-	360,397
ප්‍රාදේශීය කාර්යාලය - මාතලේ	- එම් -	වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය	150,000 - 750,000	3,000 - 9,500	-	-	-	222,786
නිවාඩු නිකේතනය - නුවරඑළිය	- එම් -	වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය	1,350,000	5,000 - 8,750	-	-	-	334,193
නිවාඩු නිකේතනය - කතරගම	- එම් -	වෙළඳපොල ප්‍රවේශය හා පිරිවැය ප්‍රවේශය	270,000	5,000 - 12,500	-	-	-	231,605
කල්බදු ඉඩම්වල ඇති ගොඩනැගිලි								
ප්‍රාදේශීය කාර්යාලය - අනුරාධපුරය	- එම් -	පිරිවැය ප්‍රවේශය	-	4,500 - 9,500	-	-	-	90,783
නිවාඩු නිකේතනය - අනුරාධපුරය	- එම් -	පිරිවැය ප්‍රවේශය	-	7,000	-	-	-	21,960
ප්‍රාදේශීය කාර්යාලය - කිලිනොච්චි	- එම් -	පිරිවැය ප්‍රවේශය	-	2,000 - 8,500	-	-	-	199,050
නිවාඩු නිකේතනය - සෝමාවතිය	- එම් -	පිරිවැය ප්‍රවේශය	-	11,750 - 12,000	-	-	-	45,946

ඉඩම් සහ ගොඩනැගිලිවල සංයුතිය

	ධාරණ අගය 2022 රු. 000	ධාරණ අගය 2021 රු. 000
සින්නක්කර ඉඩම්	**10,855,725**	10,855,725
සින්නක්කර ඉඩම්වල ගොඩනැගිලි	**6,593,850**	6,798,976
කල්බදු ඉඩම්වල ගොඩනැගිලි	**288,733**	300,263
	17,738,308	17,954,964

ප්‍රත්‍යාගණනය කළ ඉඩම් සහ ගොඩනැගිලි, මූල්‍ය ප්‍රකාශනයන්හි ක්ෂය අඩුකළ පිරිවැයට දැක්වුයේ නම් ඒවායේ ධාරණ වටිනාකම රු.මි. 7,133.73 ක් වේ (2021 - රු.මි. 7,273.50).

21. අස්පෘෂ්‍ය වත්කම්

	2022 අස්පෘෂ්‍ය වත්කම් රු. 000	2022 නොනිමි අස්පෘෂ්‍ය වත්කම් රු. 000	2022 එකතුව රු. 000	2021 රු. 000
පරිගණක මෘදුකාංග : පිරිවැය:				
ජනවාරි 01 දිනට අගය	**1,083,541**	**481,375**	**1,564,916**	1,088,965
වර්ෂය තුළදී එකතු කිරීම්	**879,377**	**329,632**	**1,209,009**	475,951
වර්ෂය තුළදී මාරු කිරීම්	**-**	**(613,507)**	**(613,507)**	-
දෙසැම්බර් 31 දිනට අගය	**1,962,918**	**197,500**	**2,160,418**	1,564,916
ක්‍රමක්ෂය:				
ජනවාරි 01 දිනට අගය	**1,003,284**	**-**	**1,003,284**	980,713
වර්ෂය සඳහා ක්‍රමක්ෂය ගාස්තුව	**248,997**	**-**	**248,997**	22,571
දෙසැම්බර් 31 දිනට අගය	**1,252,281**	**-**	**1,252,281**	1,003,284
ශුද්ධ පොත් අගය:				
දෙසැම්බර් 31 දිනට අගය	**710,637**	**197,500**	**908,137**	561,632

වර්ෂය තුළ දී බැංකුව විසින් මුදල් ගෙවීම මගින් රු.මි. 879.38 (2021 - රු.මි. 78.50) මුළු වටිනාකමකින් යුතු අස්පෘෂ්‍ය වත්කම් අත්පත් කර ගන්නා ලදී.

2022 දෙසැම්බර් 31 දිනට සම්පූර්ණයෙන් ක්‍රමක්ෂය කරන ලද එහෙත් තවදුරටත් ප්‍රයෝජනයට ගන්නා අස්පෘෂ්‍ය වත්කම්වල ප්‍රමාණය රු. මි. 982.69 (2021 රු. මි. 957.20)ක් වේ.

22. බැංකු සහ මූල්‍ය ආයතන

	2022 රු. 000	2021 රු. 000
විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල්	**146,381,827**	7,380
අනිකුත් විදේශීය මූල්‍ය ආයතනයන්ට ගෙවිය යුතු මුදල්	**26,201**	6,321
	146,408,028	13,701

විදේශීය බැංකුවලට ගෙවිය යුතු මුදල් ලෙස දක්වා ඇති රු.බි. 146.37 ක මුදල, දකුණු ආසියානු කලාපීය සහයෝගිතා සංගමයේ (සාර්ක්) රටවල් සඳහා වන මුදල් හුවමාරු පහසුකම් විධිවිධාන යටතේ ශ්‍රී.ලං.ම.බැ සහ ඉන්දියානු මහ බැංකුව අතර 2020 ජූලි මාසයේ ඇතිවූ මුදල් හුවමාරු ගිවිසුම අනුව ගෙවිය යුතු ශේෂය වේ. මෙම ගිවිසුම යටතේ ඇ.එ.ජ. ඩොලර් මි. 400ක් ශ්‍රී ලංකාවට මූලික වශයෙන් 2020 ජූලි මාසයේදී ලැබුණු අතර 2020 නොවැම්බර් මාසයේදී සිදුකළ එහි පළමු දීර්ඝ කිරීමෙන් පසු 2021 පෙබරවාරි මාසයේදී එම හුවමාරු පහසුකම සම්පූර්ණයෙන් ගෙවා දමන ලදී. 2022 ජනවාරි මාසයේදී ශ්‍රී.ලං.ම.බැ. විසින් පෙර ගිවිසුම යටතේ ඇ.එ.ජ. ඩොලර් මි. 400ක දෙවන ලබාගැනීමක් කළ අතර එය 2022 අප්‍රේල් මාසයේදී නැවත දීර්ඝ කිරීමෙන් පසුව ගෙවාදැමීමට නියමිතව පවතී.

23. ආසියානු නිශ්කාෂණ සංගමය

	2022 රු. 000	2021 රු. 000
ආසියානු නිශ්කාෂණ සංගමය වෙත ඇති බැඳීම්	**731,375,677**	104,755,558
උපචිත පොළිය	**4,882,452**	9,058
	736,258,129	104,764,616

සහභාගිවන රටවල මහ බැංකු අතර ගෙවීම් බේරුම් කිරීමේ ආයතනයක් වශයෙන් එක්සත් ජාතීන්ගේ ආසියානු සහ පැසිෆික් කලාපයේ ආර්ථික සහ සාමාජික කටයුතු කොමිසමේ මූලිකත්වය යටතේ ආසියානු නිශ්කාෂණ සංගමය (ආ.නි.ස.) 1974 වර්ෂයේ දී පිහිටුවන ලදී. ශ්‍රී ලංකාව, බංගලාදේශය, භූතානය, ඉන්දියාව, ඉරානය, මාලදිවයින, මියන්මාරය, නේපාලය සහ පකිස්ථානය එහි සහභාගි රටවල් වේ. මෙය සහභාගි වන රටවල් අතර ජාත්‍යන්තර ගනුදෙනු බහුපාර්ශ්වීය පදනමක් මත බේරුම් කිරීම සඳහා වූ නිශ්කාෂණ ක්‍රමයකි. එක් එක් මාසය අවසානයේ දී පවත්නා ශුද්ධ තත්ත්වය මාස දෙකක ණය කාල පරිච්ඡේදයකින් පසුව බේරුම් කිරීම හෝ ලබාගැනීම සිදුකරනු ලැබේ. එක් එක් සහභාගීවන රටවල ශුද්ධ පියවුම් තත්ත්වය ඔවුන්ගේ මාස දෙකක් තුළ දෛනික හිඟ ශේෂය මත ගණනය කරනු ලබන අතර එකී පියවීම් ඊලඟ මාසයේ වැඩ කරන දින 4ක් තුළ සිදුකරනු ඇත. මෙයට අදාළ පොළී අනුපාතිකය 2022 වර්ෂය තුළ 0.10%ත් 4.09% (2021 වර්ෂය තුලදී 0.09% සහ 0.15%) ත් අතර පරාසයක් තුළ පැවතිනි.

24.ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)

	සටහන	2022 රු. 000	2021 රු. 000
පොළිය දරන ණය	24.1	**385,639,212**	253,476,993
වි.ගැ.හි. වෙන්කිරීම්	24.2	**459,264,653**	266,944,782
පංගු බැරකම්	24.3	**129,765,698**	75,425,522
ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල්	24.4	**153,255,529**	74,217,946
		1,127,925,092	670,065,243

24.1 පොළී දරණ ණය, ජා.මු. අරමුදලෙන් ලබාගන්නා විස්තිර්ණ ණය පහසුකම් (EFF) වලින් සමන්විත වේ. විස්තිර්ණ ණය පහසුකම යනු රජයේ ආර්ථික ප්‍රතිසංස්කරණ න්‍යායාය පත්‍රයට සහය දීමට හා ශේෂය පියවීම සඳහා සහය දීමට ජා.මු.අ. විසින් දෙන ලද තුන් අවුරුදු පහසුකමකි. ජා.මු.අ. 2016 ජූනි හිදී විස්තිර්ණ ණය පහසුකම් වි.ගැ.හි බිලියන 1.10 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.බිලියන 1.50 ක්) ලබා දීමට අනුමැතිය දී තිබේ. මෙම මුදල ජා.මු. අරමුදලේ රටවල්වල වර්තමාන පංගුවෙන් සියයට 185 කට සමාන වේ. 2016 ජූනි මස විස්තිර්ණ ණය පහසුකම යටතේ පළමුවැනි වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො.මිලියන 168.10) ලබා දෙන ලදී. විස්තිර්ණ ණය පහසුකම යටතේ දෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 162.56), තෙවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 119.89 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 167.20), හතරවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 251.40), පස්වන වාරිකය ලෙස වි.ගැ.හි මිලියන 177.77 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 252.00) හයවන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 118.50 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 164.10) සහ හත්වන වාරිකය ලෙස වි.ගැ.හි. මිලියන 118.50 ක් (ආසන්න වශයෙන් ඇ.ඩො. මිලියන 164.00) පිළිවෙලින් 2016 නොවැම්බර්, 2017 ජූලි, 2017 දෙසැම්බර්, 2018 ජූනි, 2019 මැයි සහ නොවැම්බර් 2019 යන මාස වලදී ලබාදී ඇත. හත්වන වාරිකය නිදහස් කිරීමත් සමඟ විස්තීරණ ණය පහසුකම යටතේ ඇ.ඩො. බිලියන 1.31 ක් ශ්‍රී ලංකාව වෙත ලැබී ඇත. විස්තීරණ ණය පහසුකම සඳහා අදාල වන පොළී අනුපාතය භාර මූලික අනුපාතය වේ. මෙය වි.ගැ.හි. පොළී අනුපාතයට (2022 දෙසැම්බර් 31 දිනට වාර්ෂිකව 2.916%) පදනම් අංක 100 ක එකතුවට සමාන වේ.

	සළුල පොළී අනුපාතිකය %	පරිණත වර්ෂය	2022 රු. 000	2021 රු. 000
විස්තීර්ණ ණය පහසුකම (EFF)	0.077	2029	385,639,212	253,476,993
පොළී දරණ මුළු ණය මුදල			385,639,212	253,476,993

24.2 **විශේෂ ගැණුම් හිමිකම (වි.ගැ.හි.)** යනු පවත්නා සංචිත වත්කම්වලට පරිපූරණයන් වශයෙන් දිගුකාලීන ගෝලීය අවශ්‍යතාවයන් සපුරාලීම සඳහා ජා.මූ.අ. විසින් පිහිටුවන ලද සංචිත වත්කමකි. සාමාජික රටවලට ඒවායේ ජා.මූ.අ. පංගු ප්‍රකාර වි.ගැ.හි. වෙන්කිරීම් සිදු කරයි. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුවට (ජා.මූ.අ. තුළ පිහිටි ගිණුම් ඒකකයකි), සහභාගී වන රටවලට පමණක් වි.ගැ.හි. වෙන් කළ හැකිය. ජා.මූ.අ. සතු රන්, විදේශ විනිමය සහ සංචිත තත්වයන් ආදී වූ නිල සංචිත වත්කම්වලට පරිපූරක වශයෙන් ජා.මූ.අ. විසින් වි.ගැ.හි. බිහි කරන ලදී. බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් අත්සන් කරන ලද ගිවිසුමේ සඳහන් ඇතැම් කොන්දේසි ප්‍රකාර, ජා.මූ.අ. විසින් සාමාජිකයන්ට ඔවුන්ගේ ජා.මූ.අ. පංගු ප්‍රමාණය අනුව වි.ගැ.හි. වෙන් කළ හැකි වන්නේය. ජා.මූ.අ. විසින් වි.ගැ.හි. වෙන්කිරීම මගින් එක් එක් සාමාජිකයාට පිරිවැය රහිත වත්කමක් උද්ගත වන අතර ඒ සඳහා පොළී ඉපැයීමක් හෝ ගෙවීමක් සිදු නොවේ. වි.ගැ.හි. අවලංගු කිරීමට ද ගිවිසුමේ කොන්දේසිවලින් විධිවිධාන සලසා තිබෙන නමුත් මෙතෙක් එම විධිවිධාන ක්‍රියාත්මක කර නොමැත. වි.ගැ.හි. වෙන් කිරීම් වැඩි වීමෙන් 11 වැනි සටහනේ විස්තර කර ඇති පරිදි වි.ගැ.හි. දැරීම් වැඩි වේ. ජා.මූ.අරමුදලෙහි වි.ගැ.හි. දෙපාර්තමේන්තුව අවසන් කරන හෝ ඈවර කරන අවස්ථාවක දී සාමාජිකයන් විසින් ශුද්ධ සමුච්චිත වෙන්කිරීම්වලට සමාන මුදලක් සහ වි.ගැ.හි. දෙපාර්තමේන්තුවේ කටයුතුවලට සහභාගී වීම හේතුවෙන් ගෙවිය යුතු අනෙකුත් යම් මුදලක් වෙතොත් එය ද ජා.මූ.අ. වෙත ගෙවීමට බැඳී සිටී.

24.3 **පංගු බැරකම:** අංක 11.1 දරණ සටහනේ විස්තර කර ඇති ජා.මූ.අ. පංගුව සඳහා ගෙවිය යුතු මුදල පංගු බැරකම ශීර්ෂය යටතේ දක්වා ඇත.

24.4 **ජා.මූ.අ. වෙත ගෙවිය යුතු අනිකුත් මුදල්:** මෙහෙයුම් සහ පරිපාලන ගනුදෙනු වෙනුවෙන් බැංකුව ජා.මූ.අ. වෙත ගෙවිය යුතු ප්‍රමාණය මෙයින් දැක්වේ.

25. අනෙකුත්

	2022 රු. 000	2021 රු. 000
DST එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III (සටහන 25.1)	179	99
DST - එස්ක්‍රෝ ගිවිසුම (Escrow Agreement) යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II (සටහන 25.2)	30,071	16,599
DST විශේෂ ඩොලර් ගිණුම 2 (සටහන 25.3)	991,218	1,484,824
මුදල් හුවමාරු පහසුකම යටතේ බංගලාදේශ මහබැංකුවට (Bangaladesh Bank) වෙත ගෙවීමට ඇති මුදල (සටහන 25.4)	73,060,873	40,161,167
මුදල් හුවමාරු පහසුකම යටතේ පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා වෙත ගෙවීමට ඇති මුදල (සටහන 25.5)	520,231,000	315,452,000
අනෙකුත් විදේශීය බැරකම්	70,110	180,987
	594,383,451	357,295,676

25.1 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III

ඇ.එ.ජ. ඩොලර් මිලියන 300 ක් සඳහා වූ මෙම පහසුකම් ගිවිසුම චීන සංවර්ධන බැංකුව සහ ශ්‍රී ලංකා රජය අතර 2014 මාර්තු 11 වන දින අත්සන් කර ඇත. ප්‍රමුඛතා මාර්ග III වන ව්‍යාපෘතියේ I වන අදියර තවදුරටත් දියුණු කිරීම සහ යළි

නඟා සිටුවීම සඳහා වන වියදම් මූල්‍යනය කිරීම මෙම ණය මුදලේ අරමුණ වේ. ණය පහසුකම් ගිවිසුමට අනුව රජයේ බැංකුව ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව පත් කරගන්නා ලදී. ඒ අනුව, හුදෙක් ණය මුදල් තැන්පත් කිරීම සහ එවැනි ලැබුනු මුදල් මාර්ග ව්‍යාපෘති වෙත බෙදා හැරීම සඳහා පමණක් පොදු ලෙජරයේ ගිණුමක් විවෘත කෙරිණි. 2019 වර්ෂය තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 19.13 ක් බෙදාහරින ලදී. 2020 වර්ෂය තුළදී සිදුකල බෙදාහැරීම් වලින් අනතුරුව 2020 දෙසැම්බර් 31 දිනට මෙහි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.0004කි. 2021 සහ 2022 වර්ෂ තුළදී කිසිදු ගණුදෙනුවක් සිදුනොවූ බැවින් 2022 දෙසැම්බර් 31 දිනටද මෙහි ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.0004 කි.

25.2 එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන ප්‍රමුඛතා මාර්ග ව්‍යාපෘතිය III අදියර II

එස්ක්‍රෝ ගිවිසුම යටතේ ක්‍රියාත්මක වන II වන අදියර සඳහා වන ඇ.එ.ජ. ඩොලර් මිලියන 100 ක් 2014 නොවැම්බර් 24 වන දින හිමි විය, 2019 වසරේදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 20.24 ක් බෙදාහරින ලදී. 2020 වර්ෂය තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 13.83ක් බෙදාහරින ලද අතර 2021 සහ 2022 වර්ෂ තුළදී කිසිදු බෙදාහැරීමක් සිදු නොකළ බැවින් 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි වූ ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 0.082 කි.

25.3 DST විශේෂ ඩොලර් ගිණුම 2

මෙම ඩොලර් ගිණුම භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුව වෙනුවෙන් පවත්වාගෙන යන අතර ඇ.එ.ජ. මුදලින් භාණ්ඩාගාරයට බැර කරනු ඇත.

2022 වර්ෂය තුළදී ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර මඟින් ලද මුදල් සහ දේශීය සහ විදේශීය ආයතන මඟින් භාණ්ඩාගාරයට ලැබුණු විවිධ ඇ.එ.ජ. ඩොලර් ලැබීම් භාවිතා කරමින් රජය වෙනුවෙන් ණය ගෙවීම් සිදු කරන ලදී. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ශේෂය ඇ.එ.ජ. ඩොලර් මිලියන 2.73 කි.

25.4 බංගලාදේශ මහ බැංකුව (Bangaladesh Bank) සහ ශ්‍රී.ලං.ම.බැ. අත්සන් කරන ලද මුදල් හුවමාරු පහසුකම යටතේ බංගලාදේශ මහ බැංකුවට ගෙවීමට ඇති මුදල

ශ්‍රී.ලං.ම.බැ. සහ බංගලාදේශ මහ බැංකුව 2021 අගෝස්තු මාසයේදී මුදල් හුවමාරු ගිවිසුමකට එළඹෙන ලද අතර 2022 මැයි මාසයේදී එම ගිවිසුමට අතිරේක ගිවිසුමක් එකතු විය. මෙම ගිවිසුම් ප්‍රකාරව, 2021 අගෝස්තු සහ සැප්තැම්බර් යන මාස තුළදී ඇ.එ.ජ. ඩොලර් මිලියන 200ක මුදලක්, ඒ හා සමාන ශ්‍රී ලංකා රුපියල් අගයකට අදියර 03ක් යටතේ මාස 03 කාලයක් සඳහා හුවමාරු කරගන්නා ලද අතර එය සමාන කාලයක් සඳහා අවස්ථා පහකදී නැවත ලබාගැනීමේ හැකියාවකින් යුතු වේ.

ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය ලෙස 2021 නොවැම්බර් සහ දෙසැම්බර් මාසවලදී යළි ලබාගත් ඇ.එ.ජ. ඩොලර් මිලියන 200 දැක්වෙන අතර එහි මීළඟ ලබාගැනීම, මහ බැංකු දෙක අතර ඇතිවන අන්‍යෝන්‍ය එකඟතාවය මත 2023 පෙබරවාරි සහ මාර්තු මාසවලදී සිදුකිරීමට නියමිතව ඇත.

25.5 පීපල්ස් බෑන්ක් ඔෆ් චයිනා (People's Bank of China) සහ ශ්‍රී.ලං.ම.බැ. අත්සන් කරන ලද මුදල් හුවමාරු පහසුකම යටතේ පීපල්ස් බෑන්ක් ඔෆ් චයිනා වෙත ගෙවීමට ඇති මුදල

ශ්‍රී.ලං.ම.බැ. සහ පීපල්ස් බෑන්ක් ඔෆ් චයිනා 2021 මාර්තු 19 වැනි දින මුදල් හුවමාරු ගිවිසුමකට එළඹෙන ලදී. මෙම ගිවිසුම ප්‍රකාරව, 2021 දෙසැම්බර් මාසයේදී සීමා සහිත භාවිතයක් සඳහා (සටහන 8.1) චීන යුආන් බිලියන 10ක මුදලක් (ඇ.එ.ජ. ඩොලර් බිලියන 1.5කට සමාන මුදලක්) ඒ හා සමාන ශ්‍රී ලංකා රුපියල් අගයකට, වසරක කාලයක් සඳහා හුවමාරු කරගන්නා ලදී. 2022 දෙසැම්බර් 31 දිනට ඉතිරි ශේෂය ලෙස 2022 දෙසැම්බර් මාසයේදී වසරක කාලයක් සඳහා යලි ලබාගත් චීන යුආන් බිලියන 10 ක මුදල දැක්වෙන අතර, එහි දෙවන ලබා ගැනීම 2023 දෙසැම්බර් මාසයේ සිට ගිවිසුම කල් ඉකුත්වන 2024 මාර්තු මාසය දක්වා ලබාගැනීම, බැංකු දෙක අතර ඇතිවන අන්‍යෝන්‍ය එකඟතාවය මත සිදුවනු ඇත.

26. බැංකු සහ මූල්‍ය ආයතනයන් විසින් තැන්පතු

මුදල් නීති පනතේ 93 වන වගන්තිය ප්‍රකාරව ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා සපුරාලීම පිණිස බලපත්‍රලාභී වාණිජ බැංකු පවත්වාගෙන යන තැන්පතු සහ මුදල් නීති පනතේ විධිවිධාන යටතේ තත්කාලීන දළ පියවුම් ක්‍රමය යටතේ (RTGS) සහභාගීවන්නන් වන බලපත්‍රලාභී වාණිජ බැංකු රජයේ සුරැකුම්පත්වල ප්‍රාථමික වෙළෙඳුන් සහ සේවක අර්ථසාධක අරමුදල් යන ආයතනවල තැන්පතු මේ යටතේ වේ. මෙම ක්‍රමය යටතේ, පියවුම් පද්ධතියේ සුමට ක්‍රියාකාරීත්වය සඳහා සහභාගී පාර්ශ්වයන්ට අදාල ගෙවීම් අවශ්‍යතාවයන් දිනක් තුළදී සපුරාලීමට රජය විසින් සම්පූර්ණයෙන්ම සුරැකුම් සහිත, පොලී රහිත එක් දින දුවශීලතා පහසුකම ලබා ගැනීමේ හැකියාව ඇත. ගිණුම්කරණ හෙළිදරව් කිරීමේ අවශ්‍යතාවයන් මත මෙම තැන්පතු, සම්බන්ධිත පාර්ශ්ව සහ අනෙකුත් ලෙස වර්ග කළද, එය බැංකුව හා සඳහන් කළ ආයතන අතර වූ විශේෂ ව්‍යාපාර සම්බන්ධතා නිසා හටගන්නක් නොවේ.

	2022 රු. 000	2021 රු. 000
බැංකුව විසින් තැන්පත් කිරීම්:		
- සම්බන්ධිත පාර්ශ්වයන්	**240,719,873**	221,738,927
- අනිකුත්	**70,817,929**	67,657,247
	311,537,802	289,396,174
මූල්‍ය ආයතන විසින් තැන්පත් කිරීම්:		
- සම්බන්ධිත පාර්ශ්වයන්	**216**	21
- අනිකුත්	**11,508,163**	11,307,967
	11,508,379	11,307,988
බැංකු සහ අනිකුත් මූල්‍ය ආයතන විසින් කරන ලද මුළු තැන්පතු	**323,046,181**	300,704,162

27. රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු

	2022 රු. 000	2021 රු. 000
රජයේ තැන්පතු	**160,513**	160,511
රජයේ නියෝජිතයන් සහ අරමුදල්	**60,898**	1,231,790
	221,411	1,392,301

රජයේ සහ/හෝ රජයේ නියෝජිතයන්ගේ හෝ ආයතනවල නිල තැන්පතුධාරී වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතේ අංක 106 (1) දරන වගන්තියට යටත්ව මෙම තැන්පතු පවත්වාගෙන යනු ලබයි.

28. ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරුකුම්පත් සහ නිත්‍ය තැන්පතු පහසුකම

	2022 රු. 000	2021 රු. 000
නිත්‍ය තැන්පතු පහසුකම	**330,637,059**	101,062,880
	330,637,059	101,062,880

මූල්‍ය ප්‍රතිපත්තිය හැසිරවීමේ අංගයක් ලෙස මුදල් නීති පනතේ වගන්ති 90 හා 91 යටතේ මුදල් වෙළෙඳපොළ ද්‍රවශීලතාවය නියාමනයට විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් ප්‍රති මිලදී ගැනීමේ එකඟතාවන් නිර්මාණය කරනු ලබයි. මෙම ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවයන් බැංකුව විසින් කලින් කලට තීරණය කරනු ලබන වෙළෙඳපළ ද්‍රවශීලිතා ප්‍රතිපත්තිය මත රඳා පවතිමින් එක් දිනක් සඳහා වන පදනම් මත හෝ කාලීන පදනම මත රජයේ සුරුකුම්පත් පමණක් යොදා ගනිමින් ක්‍රියාත්මක කරනු ලැබේ. 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමිලදී ගැනීම් යටතේ වන ශ්‍රී ලංකා රජයේ සුරුකුම්පත් ශේෂයක් නොමැත. (2021-ශේෂයක් නොමැත)

මුදල් වෙළඳපොළ ද්‍රවශීලතා නියාමනයට විවෘත වෙළඳපල මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම සඳහා ද නිත්‍ය තැන්පතු පහසුකම යොදාගනී. මෙම පහසුකම දෛනික ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසියේදී ද්‍රවශීලතා අවශ්‍යතාවයන් ලබාගැනීමට නොහැකිවන, ඒ සඳහා සහභාගී වන ආයතන සඳහා අදාළ වේ. මෙය එක්දින පදනම යටතේ පමණක් සිදුවන සුරුකුම් රහිතව පවතින පහසුකමක් වේ.

29. සංසරණයේ ඇති මුදල්

ශ්‍රී ලංකාවේ මුදල් නිකුත් කිරීමේ එකම බලධාරියා වශයෙන් බැංකුව විසින් අඛණ්ඩව නීතියෙන් වලංගු මුදල් නිකුත් කිරීම සිදු කරනු ලැබේ. වාර්තාකරණ දිනට නිකුත්කර සංසරණයේ තිබූ මුදල් ප්‍රමාණයන් පහත සඳහන් පරිදි විය.

වර්ගය කාසි	2022 රු. 000	2021 රු. 000
සත 1	**3,631**	3,631
සත 2	**5,709**	5,709
සත 5	**23,267**	23,267
සත 10	**39,236**	39,236
සත 25	**122,475**	121,246
සත 50	**185,097**	185,147
රුපියල් 1	**1,054,291**	1,023,087
රුපියල් 2	**1,633,948**	1,587,838
රුපියල් 5	**5,373,467**	5,168,455
රුපියල් 10	**8,278,530**	7,673,980
රුපියල් 20	**149,777**	40,955
සමරු කාසි	**604,099**	598,953
	17,473,527	16,471,504
නෝට්ටු		
රුපියල් 1	**4,981**	4,981
රුපියල් 2	**26,694**	26,694
රුපියල් 5	**37,191**	37,191
රුපියල් 10	**1,247,314**	1,249,128
රුපියල් 20	**7,714,028**	7,235,137
රුපියල් 50	**7,672,840**	7,086,604
රුපියල් 100	**27,890,398**	27,472,139
රුපියල් 200	**126,206**	126,412
රුපියල් 500	**52,838,832**	52,284,157
රුපියල් 1,000	**154,427,683**	160,770,610
රුපියල් 2,000	**2,709,640**	2,950,509
රුපියල් 5,000	**754,397,918**	729,384,000
	1,009,093,725	988,627,562
සංසරණයේ ඇති මුළු මුදල් ප්‍රමාණය	**1,026,567,252**	1,005,099,066

30. අනෙකුත් ගෙවිය යුතු දෑ

	2022 රු. 000	2021 රු. 000
වෙන්කිරීම් සහ අයකිරීම්	**7,910,908**	3,791,015
වාණිජ බැංකු සඳහා ගෙවිය යුතු මුදල්	**-**	431,145
අත්හරින ලද දේපළ ලැබීම් සඳහා වූ වගකීම් (සටහන 30.1)	**15,415,255**	11,592,360
විස්කම් ණය යෝජනා ක්‍රමය යටතේ දායක වූ බැංකු සඳහා ඇති ගෙවීම්	**-**	1,683,468
සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන් (සටහන 30.2)	**12,361**	8,701
අනෙකුත් ගෙවිය යුතු මුදල් (සටහන 30.3)	**44,981,823**	1,657,193
	68,320,347	19,163,882

30.1 අත්හරින ලද දේපලවලට අදාළව ගෙවිය යුතු මුදලින් නියෝජනය වන්නේ බලපත්‍රලාභී වාණිජ බැංකුවල අත්හරින ලද දේපළ හඳුනාගැනීම, වාර්තා කිරීම, මාරු කිරීම හා පවත්වාගෙන යෑමට අදාළ 2009 අංක 05 දරණ බැංකු පනතේ විධානයට අනුකූලව බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් සහ මූල්‍ය ආයතනවලින් රැස් කරගත් අරමුදල වේ. අත්හරින ලද දේපල වලට හිමිකම් පාන අවස්ථාවකදී බැංකුව තැන්පතු මුදල හා එයට අදාල පොළිය ගෙවීමට වගකීමෙන් බැඳේ. එම නිසා මුළු තැන්පතු මුදල හා බරතැබූ සාමාන්‍ය භාණ්ඩාගාර බිල්පත් පොළී අනුපාතය අනුව ගණනය කරන ලද පොළිය බැංකුවෙහි වගකීමක් ලෙස වාර්තා කරයි.

30.2. සේවක ප්‍රතිලාභ සැලසුම්වල වූ ශේෂයන්

බැංකුව විසින්, බැංකුවේ සාමාන්‍ය කාර්යයන් ලෙස එහි සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා ජංගම ගිණුම් පහසුකම් සපයනු ලැබේ. වෙනමම පරිපාලනය කරනු ලබන බැංකුවේ සේවක ප්‍රතිලාභ සැලසුම්වලට අදාළ ජංගම ගිණුම්වල සහ අන්තර් ඒකක ගිණුම්වල ශේෂයන් මෙසේය.

	2022 රු. 000	2021 රු. 000
ශ්‍රී.ලං.ම.බැ. අර්ථසාධක අරමුදල, ශ්‍රී.ලං.ම.බැ. විශ්‍රාම යෝජනා ක්‍රමය සහ වැන්දඹු/ වැන්දඹු, පුරුෂ හා අනත්දරු විශ්‍රාම යෝජනා ක්‍රමයන් හි ශේෂය	**12,361**	8,701
	12,361	8,701

30.3. අනෙකුත් ලැබිය යුතු දෑ යටතේ අන්තර්ගත රු.බි 37.02 ක මුදල, දේශීය බැංකු මඟින් කල්පිරෙන දිනයේදී පියවීම් සිදු නොකළ ඇ.එ.ජ. ඩොලර් / රුපියල් හුවමාරු හේතුවෙන් ශ්‍රී.ලං.ම. බැංකුවට ලැබිය යුතු ඇ.එ.ජ. ඩොලර් ප්‍රමාණය නිරූපණය කරන අතර අනෙකුත් ගෙවිය යුතු දෑ යටතේ අන්තර්ගත රු.බි. 35.67 ක මුදල ඉහත හුවමාරුවේ ගෙවිය

යුතු රුපියල් අගය වේ.

31. විලම්භීත ප්‍රදානයන්

	2022 රු. 000	2021 රු. 000
ජනවාරි 01 වන දිනට	**1,178**	789
වර්ෂය තුළදී එකතු කිරීම්	**1,288**	3,089
වර්ෂය තුළ ක්‍රමක්ෂය	**(632)**	(2,700)
දෙසැම්බර් 31 දිනට	**1,834**	1,178

විලම්භීත ප්‍රදානයන් අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙතට සරිලන පරිදි කාලය පුරා ක්‍රමක්ෂය කරනු ලැබේ. ගෙවීමක් නොමැතිව බැංකුවට හිමි වූ වත්කම් මෙහි ඇතුලත් වේ. වත්කමෙහි සාධාරණ අගය විලම්භීත ප්‍රදානයන් ගිණුමට බැර කරන ලද අතර අදාල වත්කමෙහි ක්ෂය පිළිවෙත හා සංගත වන පරිදි ප්‍රයෝජනවත් ජීවිත කාලය පුරා අනෙකුත් ආදායම් වෙත ලියා හරින ලදී.

මෙම එකතු කිරීම් අතර, කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන (SAPP) සඳහා නව ස්වයංක්‍රීය පද්ධතියක් සකස්කිරීමට අවශ්‍ය මෘදුකාංග වැඩිදියුණු කිරීම සඳහා වැයවන මුදලෙන් 70% ක් වන පරිදි SAPP හි ව්‍යාපෘති කළමණාකරණ ඒකකය විසින් ශ්‍රී.ලං.ම.බැංකුවට කරන ලද ප්‍රදානයක් (රු.මි.1.29), Bank of Korea හි Knowledge Partnership Program මගින් 2020 සහ 2021 වසරවල දී ශ්‍රී.ලං.ම.බැංකුවේ සේවක සේවිකාවන් සඳහා වන පුහුණු වැඩසටහන් වල වියදම් දරා ගැනීම සඳහා ලබාදුන් රු.මි. 1.45ක පරීක්ෂණ ප්‍රදානයන් දෙකක් සහ එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩපිළිවෙළ යටතේ තිරසාර මූල්‍යනය සඳහා වන දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම සඳහා ලබාදුන් රු.මි. 2.32 ක ප්‍රදානයක් ඇතුළත් වේ.

32. විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම්

සියළුම සුදුසුකම්ලත් සේවකයින් ආවරණය වන නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් හතක් බැංකුව විසින් මෙහෙයවනු ලැබේ. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පැරණි) යටතේ, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවට බැඳුනු සේවකයින්, වර්ෂ 10 ක සේවා කාලයක් නිම කිරීමෙන් අනතුරුව එයට සුදුසුකම් ලබති. 1998 ජනවාරි 01 දිනට පසු බැංකු සේවයට එක්වී වසර 10 ක සේවා කාලය සම්පූර්ණ කල සේවකයන් නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි. සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය දායක මුදල් නොගෙවන විශ්‍රාමවැටුප් යෝජනා ක්‍රමයක් වන අතර, එහි ප්‍රතිලාභ පිරිවැය සම්පූර්ණයෙන්ම බැංකුව විසින් දරනු ලැබේ. පිරිමි සේවකයන් සඳහා වූ වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, කාන්තා සේවිකාවන් සඳහා වූ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය, 1998 ජනවාරි 01 දිනට පෙර බැංකුවේ සේවයට බැඳුනු සේවකයින්ට විවෘතය. 1998 ජනවාරි 01 දිනට පසුව එකතු වූ සේවකයින් සඳහා නව වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමය විවෘතව පවතී. වැන්දඹු සහ අනත්දරු (පැරණි) සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු (පැරණි) විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රම සඳහා 1994 අගෝස්තු 01 දිනට පෙර බඳවා ගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5% ක ප්‍රමාණයකින් දායක වන අතර, 1994 අගෝස්තු 01 දින හෝ ඊට පසු බඳවාගත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 10% කින් දායක වෙයි. තවද නව වැන්දඹු අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයට අයත් සේවකයින් මාසික මූලික වැටුපෙන් 5.5% කින් දායක වෙයි.

අවුරුදු 5 ක සේවා කාලයක් සම්පූර්ණ කළ සේවක වැටුප් විශ්‍රාම ක්‍රමය යටතේ විශ්‍රාම වැටුපකට හිමිකම් නොලබන සේවකයන් සඳහා පාරිතෝෂික ප්‍රතිලාභ ද බැංකුව විසින් සලසනු ලැබේ. මෙම බැරකම පියවීම සඳහා ආයුගණන අගය කිරීමට අනුකූලව ගණනය කළ බැරකමට සමාන ප්‍රතිපාදනයක් මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයේ ඉදිරියට ගෙනයනු ලැබේ.

පශ්චාත් වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ විශ්‍රාමලත් බැංකු සේවකයන් හට තමා හා තම කාලත්‍රයන්, දෙමව්පියන් සහ වැන්දඹුවන්/වැන්දඹු පුරුෂයන් විසින් දරන ලද ඇතැම් වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරගත හැක.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු සහ අනත්දරු හා වැන්දඹු පුරුෂ සහ අනත්දරු නව විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රමවල වර්ෂය තුළ නිශ්චිත ප්‍රතිලාභ බැඳීම් හා ප්‍රවර්ථන සේවා පිරිවැය නැවත තක්සේරු කිරීම සඳහා කේ. ඒ. පණ්ඩිත් උපදේශකයන් හා ආයුගණකයන්ගේ (මුම්බායි) සේවය ලබාගෙන ඇත.

සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය, වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමයන්හි අරමුදල් වෙන්ව කළමනාකරණය කරන අතර, වෙන් වූ පොත් පවත්වාගෙන යනු ලබයි. කෙසේ හෝ පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය සහ වෛද්‍ය ප්‍රතිලාභ යන යෝජනා ක්‍රම බැංකුවේ ගිණුම් පොත්වලින් වෙන්ව පවත්වාගෙන යනු නොලැබේ. තවදුරටත්, ආයෝජන හා ආයෝජන ආදායම්, බැංකු පොත්වල මෙම අරමුදල්වලට පරිබාහිරව වාර්තා කරනු ලැබේ. තවද, ආයෝජන ආදායම් නැවත මෙම අරමුදල්වලට මාරු කරන අතර බෙදාහැරීමකින් තොරව නැවත ආයෝජනය කරනු ලැබේ.

මුළු සැලසුම් වත්කම් හි සාධාරණ අගය වන රු.මි. 43,838.73 (2021 - රු.මි. 53,334.41) ප්‍රතිලාභ බැරකමෙහි වර්තමාන අගය වන රු.මි. 40,853.23 (2021 - රු.මි. 66,279.21) ඉක්මවා යන අතර වාර්තාකරණ කාලය අවසානයේදී රු.මි. 2,985.49 (2021-හිඟය රු.මි. 12,944.80) ක අතිරික්තයක් පෙන්නුම් කරයි.

2022 දෙසැම්බර් 31 දිනට

ප්‍රතිලාභ බැරකම්/ (වත්කම්)	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු සහ අනත්දරු සහ වැන්දඹු පුරුෂ සහ අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
ප්‍රතිලාභ බැඳීම්වල වර්තමාන වටිනාකම	28,743,485	742,361	6,594,557	769,222	256,344	316,311	3,430,954	40,853,234
සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ වටිනාකම	(27,133,747)	(4,890,127)	(5,575,619)	(2,151,516)	(1,101,040)	(210,570)	(2,776,110)	(43,838,729)
ශුද්ධ ප්‍රතිලාභ බැරකම්/(වත්කම්)	1,609,738	(4,147,766)	1,018,938	(1,382,294)	(844,696)	105,741	654,844	(2,985,495)

මූල්‍ය තත්ව ප්‍රකාශයේ විශ්‍රාම සේවක හා අනෙකුත් සේවක පශ්චාත් ප්‍රතිලාභ සැලසුම් යටතේ දක්වා ඇති බැරකම් ශේෂය ස්වාධීන ආයුගණනය කරන්නා විසින් දෙනු ලැබූ ශුද්ධ බැරකම් ශේෂයෙන් වෙනස් වීමට පහත හේතු බලපා ඇත.

(අ) වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය යටතේ ආයුගණනය කරන්නා විසින් දෙන ලද ශුද්ධ වත්කම් ප්‍රමාණය ගිණුම්ගත කොට නැත්තේ, එකී අරමුදල් වල ඉතිරි වන්නා වූ යම් ශේෂයක් වෙතොත් එය බැංකුවට ලබා ගැනීමට ඇති සම්භාවිතාව ඉතා අඩු බැවිනි.

(ආ) පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය හා වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ගිණුම් ගත කොට ඇත්තේ, ආයුගණනය කරන්නාට අනුව ඇති ශුද්ධ බැරකම් ප්‍රමාණය නොව දළ බැරකම් ප්‍රමාණය වන අතර එයට හේතු වන්නේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එකී යෝජනා ක්‍රමවලට අදාල වත්කම් අභ්‍යන්තරව කළමණාකරණය වන ස්වාධීන අරමුදලක් යටතේ පවත්වා නොගැනීමයි.

	2022 රු. 000	2021 රු. 000
සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	**1,609,738**	15,142,138
සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	**(4,147,765)**	(3,589,011)
වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	**1,018,938**	2,649,217
වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	**(455,747)**	(455,747)
පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (දළ අගය)	**316,311**	379,276
වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (දළ අගය)	**3,430,954**	3,803,864
	1,772,429	17,929,737

2022 දෙසැම්බර් 31 දිනට **ප්‍රතිලාභ බැරකම්/(වත්කම්) වෙනස්වීම**	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
2022 ජනවාරි 01 දිනට	15,142,138	(3,589,011)	2,649,217	(1,147,643)	(455,747)	53,957	291,888	12,944,799
ශුද්ධ ප්‍රතිලාභ වියදම්/(ආදායම්)	1,753,459	(336,011)	258,156	(146,789)	(175,238)	35,323	1,131,049	2,519,949
අනෙකුත් විස්තීරණ ආදායම් හි හඳුනාගත් අගය	(11,675,870)	342,225	(1,777,027)	(87,862)	(213,711)	16,461	(768,093)	(14,163,877)
දායක ගෙවීම්	(3,609,989)	(564,969)	(111,408)	-	-	-	-	(4,286,366)
2022 දෙසැම්බර් 31 දිනට	1,609,738	(4,147,766)	1,018,938	(1,382,294)	(844,696)	105,741	654,844	(2,985,495)

පුරෝකථනය කළ ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන වටිනාකම්වල වෙනස්වීම	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
2022 ජනවාරි 01 දිනට	47,559,244	2,047,071	10,151,236	1,537,384	801,139	379,275	3,803,864	66,279,213
පොළී පිරිවැය	5,507,360	237,051	1,175,513	178,029	92,772	43,920	440,487	7,675,132
ප්‍රවර්තන සේවා පිරිවැය	-	79,596	-	-	-	29,075	63,979	172,650
අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ	-	-	-	-	-	-	1,040,563	1,040,563
පසුගිය සේවා පිරිවැය	(4,024,579)	(10,118)	(844,658)	(62,097)	(803)	(68,904)	(327,305)	(5,338,464)
බැඳීම් මත ආයුගණන (ලාභ)/ අලාභ	(20,298,540)	(1,611,239)	(3,887,534)	(884,094)	(636,764)	(67,055)	(1,590,634)	(28,975,860)
2022 දෙසැම්බර් 31 දිනට	28,743,485	742,361	6,594,557	769,222	256,344	316,311	3,430,954	40,853,234

සැළසුම් වත්කම්/ආයෝජනවල සාධාරණ අගය වෙනස්වීම	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
2022 ජනවාරි 01 දිනට	32,417,106	5,636,082	7,502,019	2,685,027	1,256,886	325,318	3,511,976	53,334,414
පොළී ආදායම	3,753,901	652,658	868,734	310,926	145,547	37,672	406,687	6,176,125
සේවායෝජක දායකත්වය	3,609,989	564,969	111,408	-	-	-	-	4,286,366
සේවාදායක දායකත්වය	-	-	48,623	13,892	122,463	-	7,293	192,271
අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ	(4,024,579)	(10,118)	(844,658)	(62,097)	(803)	(68,904)	(327,305)	(5,338,464)
සැලසුම් වත්කම්/ආයෝජන මත ප්‍රතිලාභ, පොළී ආදායම හැර	(8,622,670)	(1,953,464)	(2,110,507)	(796,232)	(423,053)	(83,516)	(822,541)	(14,811,983)
2022 දෙසැම්බර් 31 දිනට	27,133,747	4,890,127	5,575,619	2,151,516	1,101,040	210,570	2,776,110	43,838,729

2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායම්හි හඳුනාගත් වියදම්/(ආදායම)	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
වර්ෂය සඳහා බැඳීම් මත ආයුගණන (ලාභ)/ අලාභ								
මූල්‍ය උපකල්පනවල වෙනස්වීම් මත	(21,280,959)	(1,681,421)	(5,338,738)	(821,271)	(690,550)	(149,497)	(1,908,889)	(31,871,325)
පලපුරුද්ද මත	982,419	70,182	1,451,204	(62,823)	53,786	82,442	318,255	2,895,465
සැලසුම් වත්කම්/ආයෝජන මත ප්‍රතිලාභ, පොළී ආදායම හැර	8,622,670	1,953,464	2,110,507	796,232	423,053	83,516	822,541	14,811,983
වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් ශුද්ධ (ආදායම්)/ වියදම	(11,675,870)	342,225	(1,777,027)	(87,862)	(213,711)	16,461	(768,093)	(14,163,877)

2022 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රතිලාභ වියදම	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය	5,507,360	237,051	1,175,513	178,029	92,772	43,920	440,487	7,675,132
සැලසුම් වත්කම්/ආයෝජන මත පොළී ආදායම	(3,753,901)	(652,658)	(868,734)	(310,926)	(145,547)	(37,672)	(406,687)	(6,176,125)
ප්‍රවර්තන සේවා පිරිවැය	-	79,596	-	-	-	29,075	63,979	172,650
අතීත සේවා පිරිවැය	-	-	-	-	-	-	1,040,563	1,040,563
සේවාදායක දායකත්වයන්	-	-	(48,623)	(13,892)	(122,463)	-	(7,293)	(192,271)
ප්‍රතිලාභ වියදම්/ (ආදායම)	1,753,459	(336,011)	258,156	(146,789)	(175,238)	35,323	1,131,049	2,519,949

සැලසුම් වත්කම්/ආයෝජනවල සංයුතිය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
රජයේ සුරැකුම්පත්වල ආයෝජන	25,156,360	4,598,490	5,063,782	1,955,169	1,072,593	196,145	2,658,415	40,700,954
ප්‍රතිවිකුණුම්වල ආයෝජන	112,927	42,808	33,002	2,015	9,225	9,252	43,525	252,754
ණයකරවල ආයෝජන	817,628	222,411	342,261	58,157	17,361	5,173	74,170	1,537,161
ස්ථාවර තැන්පතුවල ආයෝජන	1,043,051	24,187	134,333	134,847	968	-	-	1,337,386
ජංගම ගිණුම්වල ඉතිරි ශේෂය	3,781	2,231	2,241	1,328	893	-	-	10,474
2022 දෙසැම්බර් 31 දිනට සැලසුම් වත්කම්/ආයෝජනවල එකතුව	27,133,747	4,890,127	5,575,619	2,151,516	1,101,040	210,570	2,776,110	43,838,729

2021 දෙසැම්බර් 31 දිනට

ප්‍රතිලාභ බැරකම/(වත්කම) වෙනස් වීම	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
2021 ජනවාරි 01 දිනට	16,989,329	(2,464,375)	4,660,286	(895,516)	825,451	18,494	2,145,748	21,279,417
ශුද්ධ ප්‍රතිලාභ වියදම්/(ආදායම්)	1,444,093	(53,181)	364,126	(86,665)	5,855	31,478	262,381	1,968,087
අනෙකුත් විස්තීරණ ආදායම් හි හඳුනාගත් අගය	2,157,568	(752,427)	(421,712)	(165,462)	(889,978)	3,986	(1,225,696)	(1,293,721)
දායක ගෙවීම්	(5,448,852)	(319,028)	(1,953,483)	-	(397,075)	-	(890,545)	(9,008,983)
2021 දෙසැම්බර් 31 දිනට	15,142,138	(3,589,011)	2,649,217	(1,147,643)	(455,747)	53,958	291,888	12,944,800

පුරෝකථනය කළ ප්‍රතිලාභ බැඳීම්හි වර්තමාන වටිනාකම්වල වෙනස්වීම	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
2021 ජනවාරි 01 දිනට	47,170,831	3,223,066	10,827,211	1,932,117	1,713,506	353,689	5,020,814	70,241,234
පොළී පිරිවැය	4,009,521	273,961	920,313	164,230	145,648	30,064	426,769	5,970,506
ප්‍රවර්තන සේවා පිරිවැය	-	156,290	-	-	-	29,906	87,410	273,606
අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ	(2,926,130)	(11,321)	(560,527)	(39,986)	-	(21,590)	(277,412)	(3,836,966)
බැඳීම් මත ආයුගණන ලාභ	(694,978)	(1,594,925)	(1,035,761)	(518,977)	(1,058,015)	(12,793)	(1,453,717)	(6,369,166)
2021 දෙසැම්බර් 31 දිනට	47,559,244	2,047,071	10,151,236	1,537,384	801,139	379,276	3,803,864	66,279,214

සැලසුම් වත්කම්/ ආයෝජනවල සාධාරණ අගයේ වෙනස්වීම	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
2021 ජනවාරි 01 දිනට	30,181,502	5,687,441	6,166,925	2,827,633	888,055	335,195	2,875,066	48,961,817
පොළී ආදායම	2,565,428	483,432	524,189	240,349	75,485	28,492	244,381	4,161,756
සේවායෝජක දායකත්වය	5,448,852	319,028	1,953,483	-	397,075	-	890,545	9,008,983
සේවාදායක දායකත්වය	-	-	31,998	10,546	64,308	-	7,417	114,269
අරමුදලින් ගෙවූ ප්‍රතිලාභ	(2,926,130)	(11,321)	(560,527)	(39,986)	-	(21,590)	(277,412)	(3,836,966)
සැලසුම් වත්කම්/ආයෝජන මත ප්‍රතිලාභ, පොළී ආදායම හැර	(2,852,546)	(842,498)	(614,049)	(353,515)	(168,037)	(16,779)	(228,021)	(5,075,445)
2021 දෙසැම්බර් 31 දිනට	32,417,106	5,636,082	7,502,019	2,685,027	1,256,886	325,318	3,511,976	53,334,414

2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායම්හි හඳුනාගත් වියදම්/(ආදායම්)	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
වර්ෂය සඳහා බැඳීම් මත ආයුගණන (ලාභ)/ අලාභ								
මූල්‍ය උපකල්පනවල වෙනස්වීම් මත	(6,924,201)	(1,751,717)	(3,345,121)	(867,007)	(1,078,686)	(88,794)	(740,428)	(14,795,954)
පලපුරුද්ද මත	6,229,223	156,792	2,309,360	348,030	20,671	76,001	(713,289)	8,426,788
සැලසුම් වත්කම්/ආයෝජන මත ප්‍රතිලාභ, පොළී ආදායම හැර	2,852,546	842,498	614,049	353,515	168,037	16,779	228,021	5,075,445
වර්ෂය සඳහා අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් ශුද්ධ (ආදායම්)/ වියදම	2,157,568	(752,427)	(421,712)	(165,462)	(889,978)	3,986	(1,225,696)	(1,293,721)

2021 දෙසැම්බර් 31 න් අවසන් වර්ෂය සඳහා ප්‍රතිලාභ වියදම	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
ප්‍රතිලාභ බැඳීම් මත පොළී පිරිවැය	4,009,521	273,961	920,313	164,230	145,648	30,064	426,769	5,970,506
සැලසුම් වත්කම්/ආයෝජන මත පොළී ආදායම	(2,565,428)	(483,432)	(524,189)	(240,349)	(75,485)	(28,492)	(244,381)	(4,161,756)
ප්‍රවර්තන සේවා පිරිවැය	-	156,290	-	-	-	29,906	87,410	273,606
සේවාදායක දායකත්වයන්	-	-	(31,998)	(10,546)	(64,308)	-	(7,417)	(114,269)
ප්‍රතිලාභ වියදම/ (ආදායම)	1,444,093	(53,181)	364,126	(86,665)	5,855	31,478	262,381	1,968,087

සැලසුම් වත්කම්/ආයෝජනවල සංයුතිය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනත්දරු සහ වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
රජයේ සුරැකුම්පත්වල ආයෝජන	26,570,667	5,287,728	5,537,069	2,383,033	1,224,677	310,153	2,806,478	44,119,805
ප්‍රතිවිකුණුම්වල ආයෝජන	1,568,583	75,086	427,511	50,582	13,509	-	224,262	2,359,533
ණයකරවල ආයෝජන	820,495	219,709	342,517	56,934	16,850	5,094	70,832	1,532,431
ස්ථාවර තැන්පතුවල ආයෝජන	3,454,948	52,207	1,193,074	193,479	869	10,071	410,404	5,315,052
ජංගම ගිණුම්වල ඉතිරි ශේෂය	2,413	1,352	1,848	999	981	-	-	7,593
2021 දෙසැම්බර් 31 දිනට සැලසුම් වත්කම්/ආයෝජනවල එකතුව	32,417,106	5,636,082	7,502,019	2,685,027	1,256,886	325,318	3,511,976	53,334,414

සියලුම සේවක ප්‍රතිලාභ බැඳීම් නිශ්චය කිරීමේ දී යොදාගන්නා ලද ප්‍රධාන උපකල්පනයන් පහත දැක්වේ.

	2022	2021
වට්ටම් අනුපාතිකය	**19.00%**	11.58%
වත්කම් මත අපේක්ෂිත ප්‍රතිලාභ අනුපාතිකය	**19.00%**	11.58%
වැටුප් වැඩිවීම් අනුපාතය - පාරිතෝෂික, වැන්දඹු හා අනත්දරු හා වැන්දඹු පුරුෂ හා අනත්දරු, විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය (පැරණි)	**7.00%**	7.00%
වැටුප් වැඩිවීම් අනුපාතය - විශ්‍රාම (නව), වැන්දඹු හා අනත්දරු, වැන්දඹු පුරුෂ හා අනත්දරු (නව)	**6.50%**	6.50%
අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම අනුපාතය - විශ්‍රාම (පැරණි)	**6.00%**	7.50%
අනාගත විශ්‍රාම වැටුප් වැඩිවීම් අනුපාතය - විශ්‍රාම (නව)	**2.50%**	2.00%
සේවය හැරයාමේ අනුපාතය	**2.00%**	2.00%
වෛද්‍ය පිරිවැයෙහි උද්ධමන අනුපාතය	**4.50%**	4.50%
ඉතිරි සාමාන්‍ය සේවා කාලය		
ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප්	**අවුරුදු 26**	අවුරුදු 26
ශ්‍රී ලං.ම.බැ. විශ්‍රාම වැටුප් - නව	**අවුරුදු 39**	අවුරුදු 38
වැන්දඹු හා අනත්දරු	**අවුරුදු 26**	අවුරුදු 26
වැන්දඹු පුරුෂ හා අනත්දරු	**අවුරුදු 26**	අවුරුදු 26
වැන්දඹු හා අනත්දරු හා වැන්දඹු පුරුෂ හා අනත්දරු - නව	**අවුරුදු 39**	අවුරුදු 38
පාරිතෝෂික විශ්‍රාම වැටුප්	**අවුරුදු 17**	අවුරුදු 17
වෛද්‍ය ප්‍රතිලාභ	**අවුරුදු 27**	අවුරුදු 26
විශ්‍රාමික වයස	**අවුරුදු 60**	අවුරුදු 60

0.5% දී සංවේදීතා විශ්ලේෂණය (2022 දෙසැම්බර් 31 දිනට)	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	සේවක විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	වැන්දඹු හා අනන්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වැන්දඹු හා අනන්දරු සහ වැන්දඹු පුරුෂ හා අනන්දරු විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය - නව	පාරිතෝෂික විශ්‍රාම වැටුප් යෝජනා ක්‍රමය	වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
පුරෝකථනය කරන ලද ප්‍රතිලාභ සඳහා වන බැඳීම් මත ඇති වත්මන් උපකල්පනයන්	**28,743,485**	**742,361**	**6,594,557**	**769,222**	**256,344**	**316,311**	**3,430,954**
"+" වට්ටම් අනුපාතිකය වෙනස්වීමේ බලපෑම	(668,156)	(65,500)	(158,025)	(23,092)	(17,521)	(6,674)	(84,038)
"-" වට්ටම් අනුපාතිකය වෙනස්වීමේ බලපෑම	702,459	31,989	166,673	24,480	19,426	6,982	88,853
"+" සේවය හැර යාමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම	-	-	-	-	-	68,915	-
"-" සේවය හැර යාමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම	-	-	-	-	-	(73,479)	-
"+" වැටුප් වැඩි වීමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම	24,664	38,679	955	384	11,353	7,748	-
"-" වැටුප් වැඩි වීමේ සීඝ්‍රතාවය වෙනස්වීමේ බලපෑම	(24,212)	(36,178)	(939)	(376)	(10,648)	(7,438)	-
"+" වෛද්‍ය පිරිවැයෙහි උද්ධමනය වෙනස්වීමේ බලපෑම	-	-	-	-	-	-	101,086
"-" වෛද්‍ය පිරිවැයෙහි උද්ධමනය වෙනස්වීමේ බලපෑම	-	-	-	-	-	-	(95,784)
"+" විශ්‍රාම වැටුප් ඉහළ යාමේ ප්‍රතිශතය වෙනස්වීමේ බලපෑම	761,600	-	185,807	27,040	-	-	-
"-" විශ්‍රාම වැටුප් ඉහළ යාමේ ප්‍රතිශතය වෙනස්වීමේ බලපෑම	(727,576)	-	(176,763)	(25,592)	-	-	-

33. විවිධ බැරකම් හා උපචිතයන්

විවිධ බැරකම් හා උපචිතයන්හි ශේෂය තුළ, ගෙවීමට ඇති කල්බදු හා අනෙකුත් ගෙවිය යුතු ගිණුම්, කොන්ත්‍රාත් මත රඳවා ගැනීම් හා නැවත ලබාදිය යුතු ටෙන්ඩර් තැන්පතු අන්තර්ගතය.

	2022 රු. 000	2021 රු. 000
කල්බදු වගකීම (සටහන 33.1.4)	**60,142**	61,144
ණය ඇපකර සඳහා වෙන් කිරීම් (සටහන 33.2)	**220,347**	1,117,492
අනෙකුත් වගකීම්	**574,554**	2,848,713
	855,043	4,027,349

33.1 කල්බදු

බැංකුව විසින් ඉඩම් හා ගොඩනැගිලි කිහිපයක් කල්බදු පදනම මත ලබාගෙන ඇති අතර එවැනි කල්බදු කාල පරාසය වසර 2ත් 30ත් අතර වේ. අදාළ කාල සීමාවෙන් පසු ගිවිසුම් නැවත අලුත් කිරීමේ විකල්ප මින් ගිවිසුම් කිහිපයක ඇතුළත්ය. වෙළෙඳපොළ මිල ගණන්වල වෙනස්වීම් වලට අනුරූපව වසර 05කට වරක් කල්බදු වාරිකය නැවත සලකාබැලීම ඉහත කල්බදු කිහිපයක් සඳහා සිදුකරනු ලබයි. බැංකුව කල්බදු ගැණුම්කරුවෙකු වන කල්බදු සම්බන්ධ තොරතුරු පහත ඉදිරිපත් කර ඇත.

33.1.1 වත්කම් භාවිතා කිරීමේ හිමිකම

වත්කම් භාවිතා කිරීමේ හිමිකම, දේපළ, පිරියත හා උපකරණ (සටහන 20) යටතේ දක්වා ඇති කල්බදු පදනම මත ලබාගත් ඉඩම් හා ගොඩනැගිලි අදාළ වේ.

33.1.2 ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගත් ප්‍රමාණය

	2022 රු. 000	2021 රු. 000
කල්බදු වගකීම් මත පොළිය	**6,030**	5,482
වත්කම භාවිතා කිරීමේ හිමිකමෙහි ක්‍රමක්ෂය	**7,161**	6,501

33.1.3 මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ හඳුනාගත් ප්‍රමාණය

	2022 රු. 000	2021 රු. 000
කල්බදු මත මුළු මුදල් පිටතට ගලා යෑම්	**7,032**	5,489

33.1.4 කල්බදු වගකීම්

	2022 රු. 000	2021 රු. 000
ජනවාරි 01 දිනට ශේෂය	**61,144**	52,038
වර්ෂය තුළදී එකතුවීම්	**-**	9,114
වර්ෂය තුළදී නැවත මැනීම්	**-**	-
වර්ෂය තුළ පොළී වියදම	**6,030**	5,481
වර්ෂය තුළ කල්බදු වාරික ගෙවීම්	**(7,032)**	(5,489)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**60,142**	61,144

33.1.5 කල්බදු වගකීම් කල්පිරීම් විශ්ලේෂණය

	2022 රු. 000	2021 රු. 000
දිගුකාලීන	**57,642**	58,815
කෙටිකාලීන	**2,500**	2,329
දෙසැම්බර් 31 දිනට ශේෂය	**60,142**	61,144

33.1.6 වට්ටම් නොකළ ගිවිසුම් ගත කල්බදු මුදල් ප්‍රවාහ මත පදනම් වූ කල්පිරීම් විශ්ලේෂණය

	2022 රු. 000	2021 රු. 000
වර්ෂ 1 ට අඩු	**8,303**	8,359
වර්ෂ 1 සිට 5 දක්වා	**23,198**	20,836
වර්ෂ 5 ට වැඩි	**119,492**	130,157
මුළු වට්ටම් නොකළ කල්බදු වගකීම්	**150,993**	159,352

33.2 ණය ඇපකර සඳහා වෙන් කිරීම්

	2022 රු. 000	2021 රු. 000
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මෙහෙයවන ණය ඇපකර මත විලම්හීත ආදායම	**1,023**	105,760
ණය ඇපකර මත අපේක්ෂිත ණය අලාභ (සටහන 33.2.1)	**219,324**	1,011,732
දෙසැම්බර් 31 දිනට ශේෂය	**220,347**	1,117,492

33.2.1 ණය ඇපකර මත අපේක්ෂිත ණය අලාභවල වෙනස්වීම්

	2022 අදියර 1 රු. 000	2021 අදියර 1 රු. 000
ජනවාරි 01 දිනට ශේෂය	**1,011,732**	-
වර්ෂය තුළදී අය කිරීම්	**(792,408)**	1,011,732
දෙසැම්බර් 31 දිනට ශේෂය	**219,324**	1,011,732

34. හිමිකරු ප්‍රාග්ධනය

හිමිකරු ප්‍රාග්ධන විෂයයන්ගේ ස්වභාවය

34.1 ප්‍රාග්ධන අරමුදල්

දායක ප්‍රාග්ධනය - මුදල් නීති පනතේ 6 වැනි වගන්තිය ප්‍රකාර බැංකුවේ ප්‍රාග්ධනය, ප්‍රාග්ධන ගිණුමෙන් පෙන්නුම් කරයි. 2014 අංක 15 දරණ මුදල් නීති පනතෙහි (සංශෝධිත) 6 වන වගන්තියට අනුව බැංකුවේ දායක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50.00 ක් දක්වා ඉහළ නංවන ලදී. ඒ අනුව බැංකුව විසින් මුදල් ඇමතිගේ එකඟතාවය ඇතිව 2014 සැප්තැම්බර් මස බැංකුවේ සංචිත ප්‍රාග්ධනිත කරමින් දායක ප්‍රාග්ධනය රුපියල් බිලියන 50.00 තෙක් වැඩි කරන ලදී.

34.2 ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය

ජා.ගි.ප්‍ර 16 - දේපළ පිරියත හා උපකරණ අනුව දේපළ පිරියත හා උපකරණ ප්‍රත්‍යාගණන අධිභාරයන්ගේ එකතුවෙන් මෙම සංචිතය නිර්මාණය වී ඇත.

34.3 අනෙකුත් සංචිත පහත සඳහන් දේ වලින් සමන්විත වේ;

i. ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය (IRR) : ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය වූ කලී මුදල් නීති පනතේ 41 වැනි වගන්තිය ප්‍රකාර පිහිටුවන ලද සංචිතයකි. මෙම වගන්තිය ප්‍රකාර, රන් හෝ විදේශ මුදල්වලින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ වත්කම් සහ බැරකම් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ හෝ පාඩු බැංකුවේ ශුද්ධ ලාභය ගණනය කිරීම සඳහා සැලකිල්ලට නොගත යුතු අතර, ඒ වෙනුවට එම ලාභ හෝ පාඩු ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කළ යුතුය.

ii. වෙළඳපළ ප්‍රත්‍යාගණන සංචිතය (MRR) : ජාත්‍යන්තර වෙළඳපල තුළ සිදුවන අහිතකර චලන ප්‍රතිවිපාකයන් හි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර මුල්‍ය වත්කම් වල වෙළඳපල මිල ගණන් හි සිදුවන අහිතකර වෙනස්වීම්වලට මුහුණ දීමේ පරමාර්ථයෙන් ජාත්‍යන්තර වත්කම් වෙළඳපල මිල මත ඇගැයීමේ ලාභ මාරු කිරීම සඳහා 2003 ජනවාරි 30 දින ලබා දුන් මුදල් මණ්ඩල තීරණයට අනුව වෙළඳපල ප්‍රත්‍යාගණන සංචිතය පිහිටුවන ලදී. මුදල් මණ්ඩලය විසින් මෙම සංචිතය ශ්‍රී.ලං.ම.බැ. දළ විදේශ සංචිත වලින් සියයට දහයක ප්‍රමාණයක් දක්වා ගොඩනැගීමට තීරණය කරන ලදී.

තවද, 2016 පෙබරවාරි 29 වන දින MB/DG(W)/7/1/2016 දරන මුදල් මණ්ඩලයේ යෝජිත සංශෝධිත බැංකුවේ ලාභ බෙදා දීමේ ප්‍රතිපත්තියට අනුව, මුදල් මණ්ඩලයට අවශ්‍යයැයි සලකන ඕනෑම අවස්ථාවකදී උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නා වූ පාඩු වැඩිවීම නිසා රඳවාගත් ලාභයන් සෘණ අගයක් ගන්නා අවස්ථාවකදී වෙළෙඳපොල ප්‍රත්‍යාගණන සංචිතයේ සිට රඳවාගත් ලාභයන් වෙත හුවමාරු කිරීමක් සිදු කල හැක.

2021 දී වාර්තා වුණු පසුකාලීන වෙළඳපල ප්‍රත්‍යාගණන ලාභ සැලකිල්ලට ගෙන 2022 පෙබරවාරි 24 දිනැති BP/MB/F/6/3/2022 දරන මුදල් මණ්ඩල තීරණය පරිදි රු. බිලියන 49.64 ක් රඳවාගත් ලාභයෙන් වෙලඳපල ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කරන ලදී.

iii. අනෙකුත් සංචිත : පොදු සංචිතය, ගොඩනැගිලි සංචිතය හා ණය ඇපකර සංචිතයන් අනෙකුත් සංචිතයන් තුළ ඇතුලත් වේ. මුදල් මණ්ඩලය විසින් රඳවාගත් ලාභයන්ගෙන් වෙන්කල ප්‍රමාණයන්ගෙන් පොදු සංචිතය සමන්විත වේ.

iv. අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වන සුරැකුම්පත් මත ශුද්ධ සාධාරණ ලාභය/(පාඩුව) : අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත් ප්‍රත්‍යාගණනයෙන් උපලබ්ධි නොවූ ලාභ සහ පාඩු මෙම සංචිතයට මාරු කරන ලදී.

v. තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදල : තත්කාලීන දළ පියවුම් පද්ධතිය සඳහා සහභාගිවන්නන්ගේ අයකිරීම්වලින් මෙම අරමුදල ගොඩනගා ඇත.

vi. විශ්‍රාම ප්‍රතිලාභ සංචිතය : මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් රුපියල් බිලියන 3.00 ක් මාරු කිරීමෙන් ආරම්භ කරන ලද අතර, බාහිර අවදානම් තත්ත්වයන් යටතේ බැංකුවේ ආදායම් ඉපැයීමේ ධාරිතාවයේ වන උච්ඡාවචනයන් හමුවේ විශ්‍රාම අරමුදලේ වන හිඟතාවයන් සඳහා යොදාගැනීමට අපේක්ෂා කෙරේ. 2011 ලාභවලින් තවත් රුපියල් බිලියන 1.00 ක් මෙම සංචිතයට මාරු කරන ලදී. MB/HR/11/12/2015 දරණ මුදල් මණ්ඩල පත්‍රිකාව අනුව නව විශ්‍රාම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා 2015 ජූනි මාසය තුළදී විශ්‍රාම ප්‍රතිලාභ සංචිතයෙන් රුපියල් බිලියන 2.00ක් නව විශ්‍රාම ගිණුමට මාරු කරන ලදී.

vii. තාක්ෂණික අභිවර්ධන සංචිතය : මෙම සංචිතය 2007 වර්ෂයේ ලාභයෙන් ගොඩනගා ඇති අතර එය මහ බැංකුවේ දැනට භාවිතා කරන තොරතුරු තාක්ෂණ පද්ධති වන පොදු ලෙජර පද්ධතිය, තත්කාලීන ගෙවුම් පියවුම් පද්ධතිය, භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය හා නිර්ලේඛනගත සුරැකුම්පත් පියවීම් ක්‍රමය යන පද්ධතීන්වල සිදු කළ යුතු නවීකරණ කටයුතු හෝ වැඩි දියුණු කිරීම් සඳහා අවශ්‍ය අරමුදල් සැපයීම සඳහා මෙය යොදා ගැනීමට අපේක්ෂා කෙරේ.

2018 මාර්තු මසදී 2017 වර්ෂයේ ලාභයෙන් රු. බිලියන 2.00 ක අමතර මුදලක් මෙම සංචිතයට මාරු කරන ලදී.

viii. විශේෂිත ණය ඇප ක්‍රම සංචිතය : මධ්‍යම හා දීර්ඝකාලීන ණය අරමුදලින් රුපියල් බිලියන 2.00 ක් මාරු කිරීමෙන් 2014 දී මෙම අරමුදල පිහිටුවන ලද අතර ඉන් රුපියල් බිලියන 1.00 ක් බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන සෞභාග්‍යා ණය ක්‍රමය, පිබිදෙන උතුර (අදියර II), නැගෙනහිර පළාත තුළ ආර්ථික කටයුතු ප්‍රතිස්ථාපනය කිරීම (අදියර II) සහ උතුරු හා නැගෙනහිර හානි වූ නිවාස ප්‍රතිසංස්කරණය කිරීම යන ණය ක්‍රමයන් ප්‍රති ව්‍යුහගත කිරීම සඳහා වෙන්කර ඇත. අනෙක් රුපියල් බිලියන 1.00 කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යාපාරවලට ණය දීම සඳහා වාණිජ බැංකු මගින් විශේෂිත ණය ඇප ක්‍රමයක් ක්‍රියාවට නැංවීමට වෙන් කර ඇත.

ix. පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් මූල්‍යනය සඳහා වූ සංචිතය : 2016 දෙසැම්බර් 16 දිනැති මුදල් මණ්ඩල තීරණ MB/F/39/20/2016 ට අනුව ප්‍රමාණවත් බෙදාහැරිය හැකි ලාභ පවතින්නේනම් යම් වසරක (2016 න් ආරම්භ වන) ආයුගණනයේ ප්‍රතිලාභ වියදමින් සියයට 50 ක් වෙනම සංචිතයකට මාරු කිරීමට යෝජනා කර ඇත. මෙය ආයුගණනයේ අලාභ හා ප්‍රතිලාභ වියදම්වලින් බැංකුවේ ප්‍රාග්ධනය මත වන අහිතකර බලපෑම අවම කිරීමේ අරමුණ ඇතිව සිදු කරයි. 2021 වර්ෂයේ දී බැංකුවේ බෙදාහැරිය හැකි ලාභවලින් රු. මිලියන 1051,04ක් 2022 පෙබරවාරි මාසයේදී මෙම සංචිතයට මාරු කරන ලදී.

x. මධ්‍යම හා දිගු කාලීන ණය සංචිතය : 2020 අප්‍රේල් 15 දිනැති මුදල් මණ්ඩල තීරණ MB/FD/11/14/2020 සහ 2020 ජූනි 11 දිනැති මුදල් මණ්ඩල තීරණ MB/RD/19/28/2020 වලට අනුව, කෝවිඩ් 19 වසංගතයෙන් ඇති වූ බලපෑම මැඩපැවැත්වීම සඳහා බැංකුව විසින් දියත් කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමය මූල්‍යනය කිරීම සඳහා පොදු සංචිතයෙන් සහ ගොඩනැගිලි සංචිතයෙන් රු. බිලියන 15.46ක් ද, විශේෂිත ණය ඇප ක්‍රම සංචිතයෙන් රු. බිලියන 1.96ක් ද තාක්ෂණික අභිවර්ධන සංචිතයෙන් රු. බිලියන 3.00 ක්ද පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් මූල්‍යනය සඳහා වූ සංචිතයෙන් රු. බිලියන 4.33ක් ද 2020 වර්ෂය තුළදී මධ්‍ය හා දිගු කාලීන ණය සංචිතයට මාරු කරන ලදී.

තවද, 2022 පෙබරවාරි 24 දිනැති මුදල් මණ්ඩල තීරණ MB/F/6/4/2022 ට අනුව 2021 දෙසැම්බර් 31 දින සිදුකරන ලද ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් අවශෝෂණයේදී, එම අවශෝෂණයේ දළ බලපෑම වූ රු. බිලියන 15.0 ක මුදල, 2021 වර්ෂයේ බැංකුවේ බෙදාහැරිය හැකි ලාභයෙන් මෙම සංචිතයට මාරු කරන ලදී

අනෙකුත් සංචිතවල වෙනස් වීම පහත පරිදි වේ.

	මධ්‍ය සහ දිගු කාලීන ණය සංචිතය	වෙළෙඳපළ ප්‍රත්‍යාගණන සංචිතය	අනෙකුත් සංචිත	විශේෂිත ණය ඇප ක්‍රම සංචිතය	තත් කාලීන දළ පියවුම් නිධන් අරමුදල	ස්ථාවර වත්කම් ප්‍රත්‍යාගණන සංචිතය	ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතය	අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්වල ශුද්ධ සාධාරණ ලාභය/(අලාභය)	විශ්‍රාම අරමුදල් සංචිතය	පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් මූල්‍යනය සඳහා වන සංචිතය	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
2022 ජනවාරි 01 දිනට ශේෂය	**29,577,739**	**87,037,512**	**4,001,226**	**40,000**	**3,239,926**	**11,902,670**	**182,036,032**	**(6,210,465)**	**2,000,000**	**1,503,586**	**315,128,226**
තත්කාලීන දළ පියවුම් නිධන් අරමුදලට මාරු කිරීම	-	-	-	-	438,146	-	-	-	-	-	438,146
ලාභයන් පොදු සංචිතයට මාරු කිරීම	-	-	27,526,076	-	-	-	-	-	-	-	27,526,076
2021 වසරේ ලාභය ගැළපුම් කිරීමේ මුදල් මණ්ඩල තීරණය අනුව ප්‍රා.සං. දෙපාර්තුමේන්තුවේ මෙහෙයුම් කටයුතු සඳහා මධ්‍යම හා දිගුකාලීන ණය සංචිතයට අරමුදල් මාරු කිරීම	15,000,000	-	-	-	-	-	-	-	-	-	15,000,000
විදේශ විනිමය ප්‍රත්‍යාගණන ශුද්ධ ලාභය / (පාඩුව) මාරු කිරීම	-	-	-	-	-	-	(610,149,293)	-	-	-	(610,149,293)
අනෙකුත් විස්තීරණ ආදායම මඟින් සාධාරණ අගයට වූ සුරැකුම්පත්වල ශුද්ධ අලාභය	-	-	-	-	-	-	-	(1,189,382)	-	-	(1,189,382)
වෙළඳපළ ප්‍රත්‍යාගණන සංචිතය වෙත මාරු කිරීම	-	49,638,590	-	-	-	-	-	-	-	-	49,638,590
පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුම් මූල්‍යනය සඳහා වන සංචිතයට මාරු කිරීම	-	-	-	-	-	-	-	-	-	1,051,039	1,051,039
වෙළඳපළ ඇගයීම් සංචිතය - අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති රජයේ සුරැකුම්පත්	-	-	-	-	-	-	-	11,225,713	-	-	11,225,713
වෙළඳපළ ඇගයීම් සංචිතය - අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ස්කන්ධ ආයෝජන	-	-	-	-	-	-	-	145,915	-	-	145,915
2022 දෙසැම්බර් 31 දිනට	**44,577,739**	**136,676,102**	**31,527,302**	**40,000**	**3,678,072**	**11,902,670**	**(428,113,261)**	**3,971,781**	**2,000,000**	**2,554,624**	**(191,184,970)**

35. ලාභ බෙදාහැරීම

මුදල් නීති පනතට අනුව සහ මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ලාභ බෙදාහැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව, (2018 වසරේ සිට බලපැවැත්වෙන පරිදි) බෙදිය හැකි ලාභය ගණනය කිරීමේදී වසර සඳහා වන ශුද්ධ ලාභය සඳහා පහත දැක්වෙන ගැලපීම් කරනු ලැබේ.

(අ) විදේශ විනිමය ලාභ ඉවත්කරනු ලැබේ. විදේශ විනිමය අලාභ, සමුච්චිත ලාභයන්ගෙන් අවශෝෂණය කිරීමට ප්‍රමාණවත් වන තෙක් පමණක් ඉවත් කෙරේ. ඉතිරි විදේශ විනිමය අලාභය ආදායම් ප්‍රකාශයට ගලපනු ලැබේ. (ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ බෙදාහැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව)

(ආ) විදේශ වත්කම්වල උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නාවූ පාඩු ගලපනු ලබන අතර උපලබ්ධි නොවූ ප්‍රත්‍යාගණනයන්ගෙන් ඇතිවන්නාවූ වාසි ඉවත් කෙරේ (ශ්‍රී ලංකා මහ බැංකුවේ ලාභ බෙදා හැරීමේ ප්‍රතිපත්තියට අනුකූලව).

(ඇ) මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලද පරිදි මුදල් නීති පනතේ වගන්ති අංක 38 අනුව සංචිතයන්ට සිදු කරනු ලබන වෙනත් ඕනෑම මාරු කිරීමක් සහ මුදල් නීති පනතේ වගන්ති අංක 39 අනුව කළ යුතු ගැලපුම් කරනු ලැබේ.

තවද ගිණුම්කරණ ප්‍රමිති සහ කළමණාකාරීත්වයේ තීරණ අනුව කළ යුතු ගැලපුම් ද බෙදිය හැකි ලාභය ගණනය කිරීමේ දී ගලපනු ලැබේ. ඉහත ගැළපීම් මත පදනම්ව, 2022 දෙසැම්බර් 31 න් අවසන් වූ වර්ෂය සඳහා බෙදාහැරිය හැකි ලාභය පහත පරිදි වේ. කෙසේ වෙතත් මුදල් නීති පනතේ 41 වන වගන්තියට අනුකූල වීම සඳහා පහත දක්වා ඇති බෙදිය හැකි ලාභය ගණනය කිරීමේදී ඉහත (අ) හි සඳහන් ගැළපීම සිදුකර නොමැත. ඒ අනුව මුදල් මණ්ඩලයේ අනුමැතිය ඇතිව බෙදිය හැකි ලාභය ගණනය කිරීමේදී වාර්තා කළ වර්ෂයේ විදේශ විනිමය පාඩු සම්පූර්ණයෙන්ම ඉවත්කර ඇත.

ඉහත සඳහන් ගැලපුම් වලට අනුව ගණනය කරන ලද 2022 දෙසැම්බර් 31 දිනට බෙදිය හැකි ලාභය පහත පරිදි වේ.

අයිතමය	2022 රු. 000
බෙදාහැරීමේ ලාභය ගණනය කිරීම	
IFRS ලාභය / (අලාභය)	**(374,320,973)**
අඩුකළා :	
විදේශ විනිමය ප්‍රත්‍යාගණන පාඩුව ජාත්‍යන්තර ප්‍රත්‍යාගණන සංචිතයට මාරු කිරීම. (මුදල් නීති පනත ප්‍රකාරව)	(610,149,293)
අභ්‍යන්තර අරමුදල් මත පොළී ආදායම අදාළ අරමුදල් වෙත මාරු කිරීම	793,692
මුදල් නීති පනතට, බැංකුවේ ලාභ බෙදාහැරීමේ ප්‍රතිපත්තියට සහ අනෙකුත් ගැලපීම්වලට අනුකූලව බෙදිය හැකි ලාභය	**235,034,628**
ලාභය බෙදාහැරීම	
අතිරික්තයට මාරු කිරීම	235,034,628

මුදල් නීති පනතේ 39 (ආ) වගන්තියට අනුව, ප්‍රාග්ධනයට දේශීය වත්කම්හි අනුපාතය සියයට 15 දක්වා ළඟා වන තෙක් ඉතිරිව ඇති ශුද්ධ ලාභය අතිරික්තයට ගෙන යා යුතුය. ඒ අනුව, රු. බිලියන 235.03 ක් වූ 2022 වර්ෂයේ සමස්ථ බෙදාහැරිය හැකි ලාභය අතිරික්තයට මාරු කරනු ලැබේ.

36. මූල්‍ය වත්කම්වලින් පොළී ආදායම

	2022 රු. 000	2021 රු. 000
විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම		
මුදල් හා කෙටිකාලීන තැන්පතු	**1,229,509**	274,786
මූල්‍ය වත්කම්	**349,787**	4,104,262
විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම	**1,579,295**	4,379,048
දේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ පොළී ආදායම		
ශ්‍රී ලංකා රජයේ සුරකුම්පත්	**357,442,399**	55,718,603
ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරකුම්	**117,769,763**	8,806,814
අනිකුත් ණය සහ අත්තිකාරම්	**5,661,688**	2,770,062
අනිකුත් වත්කම් වලින් ලද පොළී ආදායම	**1,802,677**	1,317,449
දේශීය මූල්‍ය වත්කම් වලින් ඉපැයූ මුළු පොළී ආදායම	**482,676,527**	68,612,928
මුළු මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදායම	**484,255,823**	72,991,976

2022 වසර තුළදී සජීව පොළී අනුපාත ක්‍රමය යටතේ ගණනය කරන ලද මුළු පොළී ආදායම රු. මිලියන 357,596.28 (2021 - රු. මිලියන 58,662.72)

37. උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් ලද ලාභ/අලාභ

	2022 රු. 000	2021 රු. 000
විදේශ සුරකුම්පත්	**-**	(302,953)
රන්	**(3,106,177)**	(7,475,934)
විදේශ විනිමය සහ මුදල් හුවමාරු	**(124,179,927)**	49,638,590
උපලබ්ධි නොවූ මිල ප්‍රත්‍යාගණනයන්ගෙන් ලද සම්පූර්ණ ලාභය	**127,286,104**	41,859,703

38. මූල්‍ය බැරකම් මත පොළී වියදම

	2022 රු. 000	2021 රු. 000
විදේශීය මූල්‍ය බැරකම් මත වූ පොළී වියදම		
ආසියානු නිශ්කාෂණ සංගමයට ගෙවිය යුතු මුදල	**13,109,060**	78,207
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සම්බන්ධ වගකීම්	**14,332,873**	2,946,797
අනෙකුත් ගෙවිය යුතු මුදල් - විදේශීය	**4,851,344**	609,524
විදේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම	**32,293,277**	3,634,528
දේශීය මූල්‍ය බැරකම් මත වූ පොළී වියදම		
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම මත අලෙවිකරණ ලද සුරුකුම්පත්	**465,598**	890,946
නිත්‍ය තැන්පතු පහසුකම	**29,948,163**	5,668,475
අත්හල දේපල	**3,072,799**	623,593
විවිධ පොළී වියදම්	**4,133,034**	1,286, 883
දේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම	**37,619,594**	8,469,897
මූල්‍ය බැරකම් මත වූ සම්පූර්ණ පොළී වියදම	**69,912,871**	12,104,425

බැංකුව විසින් මුදල් වෙළෙඳපොල තුළ ඇති වූ අතිරික්ත ද්‍රවශීලීතාවය උකහාගැනීම වෙනුවෙන් රු.මි. 72,133.23 ක ශුද්ධ නිවාරණ ලාභයක් 2022 වර්ෂය තුළදී දරා ඇත (2021 පිරිවැය රු.මි. 3,050.59 කි). පහත විස්තර කර ඇති පරිදි මෙම නිවාරණ පිරිවැය, ප්‍රති මිලදීගැනුම් ගිවිසුම් යටතේ සුරුකුම්පත් විකිණීම මත වූ පොළී වියදම, බැඳුම්කර ණයට ගැනීම මත වූ පොළී වියදම, නිත්‍ය තැන්පතු පහසුකම් මත පොළී වියදමින් ශ්‍රී ලංකා රජයේ සුරුකුම්පත්වලින් ලද පොළී ආදායමෙහි අඩංගු නැවත විකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරුකුම්පත්වලින් ලද පොළී ආදායම විදේශ මූල්‍ය වත්කම් මත වූ පොළී ආදායමෙහි අඩංගු ඇ.එ.ජ. ඩොලර්/රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ ලාභයන්ගේ ශුද්ධ අගයෙන් සහ ඇ.එ.ජ.ඩොලර්/රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මත මිල වෙනස්වීම්වලින් ලද උපලබ්ධි ලාභ/(පාඩුව) ගැලපීමෙන් ලබා ගනී.

	2022 රු. 000	2021 රු. 000
ප්‍රතිමිලදී ගැනුම් ගිවිසුම් මත විකුණූ සුරුකුම්පත් වෙනුවෙන් දරණ ලද පොළී වියදම්	**465,598**	890,946
නිත්‍ය තැන්පතු පහසුකම මත පොළී වියදම	**29,948,163**	5,668,475
අඩු කළා :		
ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරුකුම්පත් වෙනුවෙන් ලද පොළී ආදායම	**117,769,763**	8,806,814
ඇ.එ.ජ.ඩොලර්/රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල ලාභය/අලාභය	**(15,222,772)**	803,202
	72,133,230	3,050,595

39. මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ (අය කිරීම්) /හැරවුම්

	2022 රු. 000	2021 රු. 000
විදේශීය මූල්‍ය වත්කම්		
ක්‍රමක්ෂය පිරිවැයට වූ මූල්‍ය වත්කම්		
මුදල් සහ මුදල් සමානයන් (සටහන 8.2)	**(759,464)**	184,970
ජා.මු.අ. සම්බන්ධ වත්කම් (සටහන 11.4)	**(5)**	(1)
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට වූ සුරුකුම්පත් (සටහන 9.2)	**(3,749)**	2,097,726
විදේශීය මූල්‍ය වත්කම් මත මුළු අපේක්ෂිත ණය අලාභ (අය කිරීම්)/හැරවුම්	**(763,218)**	2,282,695
දේශීය මූල්‍ය වත්කම්		
ක්‍රමක්ෂය පිරිවැයට වූ මූල්‍ය වත්කම්		
බැංකු සඳහා දෙන ලද ණය (සටහන 16.2)	**(295,001)**	123,745
අභ්‍යන්තර අරමුදල් මගින් කල ආයෝජන (සටහන 17.1 හා 17.2)	**25**	79,291
ණය ඇපකර සඳහා වෙන්කිරීම් (සටහන 33.2.1)	**792,408**	(1,011,732)
දේශීය මූල්‍ය වත්කම් මත මුළු අපේක්ෂිත ණය අලාභ අය කිරීම්	**497,432**	(808,696)
මූල්‍ය වත්කම් මත මුළු අපේක්ෂිත ණය අලාභ (අය කිරීම්)/හැරවුම්	**(265,786)**	1,473,999

40. අනෙකුත් ආදායම්

	2022 රු. 000	2021 රු. 000
ලාභාංශ ආදායම		
- සම්බන්ධිත පාර්ශ්වයන්	**138,037**	153,987
විලම්භිත ප්‍රදානය ක්‍රමක්ෂය වීම	**28**	28
මූල්‍ය ආයතනයන්ට අදාල බලපත්‍ර ගාස්තු	**673,300**	614,575
කුලී ආදායම්	**207,766**	282,174
තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි සහභාගීකරුවන්ගෙන් අයකරන ලද ගාස්තු	**71,809**	54,237
ප්‍රා.සං.දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් අවශෝෂණයේදී ලද වෙනත් ආදායම් (සටහන 40.2)	**597,118**	14,705,875
විවිධ ආදායම්	**766,160**	469,494
මුළු අනිකුත් ආදායම්	**2,454,218**	16,280,370

40.1 අනෙකුත් වියදම්

	2022 රු. 000	2021 රු. 000
විදේශ ශ්‍රමික ප්‍රේෂණ සඳහා වූ දිරිගැන්වීම්	**10,260,110**	-
	10,260,110	-

විධිමත් අරමුදල් මාරුකිරීමේ මාර්ග හරහා වැඩි වශයෙන් ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ දිරිගැන්වීමේ අරමුණින්, ශ්‍රී ලංකා මහ බැංකුව විදේශයන්හී සේවය කරන ශ්‍රී ලාංකිකයන් සඳහා ශ්‍රමිකයන්ගේ ප්‍රේෂණ සඳහා දරණ ගණුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කරමින් දිරිගැන්වීමක් ලබාදීමට තීරණය කරන ලදී. ඒ අනුව, 2022 වර්ෂය තුළදී බලපත්‍රලාභී බැංකු වෙත ප්‍රතිපූරණය කරන ලද මුළු ගණුදෙනු පිරිවැය වෙනත් වියදම් යටතේ අනාවරණය කර ඇත.

40.2 ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන ලද ව්‍යාපෘති හා සම්බන්ධ ශුද්ධ වත්කම් අවශෝෂණය කිරීම.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මගින් මෙහෙයවන ලද ප්‍රති මූල්‍යණය හා ණය ඇපකර යෝජනා ක්‍රම හා සම්බන්ධ ශේෂයන්, 2021 දෙසැම්බර් 31 දිනට මහා භාණ්ඩාගාරයේ මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ එකඟතාවය සමග, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශ වෙත අවශෝෂණය කිරීම සඳහා අනුමැතිය ලබා දෙන ලදී. ඒ අනුව, රු. බිලියන 14.706 ක දළ වත්කම් අගයක්, ප්‍රා.සං. දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් අවශෝෂනයේදී ලද වෙනත් ආදායම් වශයෙන් 2021 දෙසැම්බර් 31 දිනට සටහන් කරන ලදී. එසේම, මෙම අවශෝෂණය හා සම්බන්ධව 2022 වසරේදී සිදුකරන ලද ගැළපීම් ද ප්‍රා.සං. දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් අවශෝෂණයේ දී ලද වෙනත් ආදායම් වශයෙන් අනෙකුත් ආදායම් යටතේ දක්වා ඇත.

41. සේවක මණ්ඩල වියදම්

	2022 රු. 000	2021 රු. 000
වේතන සහ වැටුප්	**6,691,770**	7,116,223
නිශ්චිත දායක සැලසුම් පිරිවැය	**11,550,422**	1,717,811
පශ්චාත් සේවක නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් පිරිවැය	**2,091,404**	1,891,272
මුළු සේවක මණ්ඩල වියදම්	**20,333,596**	10,725,306

42. පරිපාලන හා අනිකුත් වියදම්

	2022 රු. 000	2021 රු. 000
අලුත්වැඩියා සහ නඩත්තු	**1,277,530**	879,065
දේපළ, පිරියත උපකරණ ඉවත් කිරීම් මත අලාභ	**-**	669,923
රොයිටර්, බ්ලූම්බර්ග්, SWIFT ආදිය වෙනුවෙන් මෙහෙයුම් වියදම්	**285,862**	205,041
ගමනාගමන වියදම්	**48,967**	22,008
මුද්‍රණ වියදම්	**61,428**	41,699
විගණන ගාස්තු	**12,338**	9,225
මුදල් මණ්ඩලයේ/ අනුකමිටු සාමාජිකයිනට පාරිශ්‍රමිකය	**4,500**	3,975
ප්‍රචාරණ වියදම්	**50,765**	48,796
උපදේශාත්මක, සන්නිවේදන සහ වෘත්තිමය ගාස්තු	**220,071**	210,337
කල්බදු වගකීම් සඳහා පොළී වියදම්	**6,030**	5,482
විවිධ වියදම්	**(57,110)**	183,571
මුළු පරිපාලන හා අනිකුත් වියදම්	**1,910,381**	2,279,122

43. බදු

2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ වගන්ති 9 (i) ප්‍රකාරව හා 2021 අංක 10 දරණ දේශීය ආදායම් (සංශෝධිත) හා 2022 අංක 45 දරණ දේශීය ආදායම් (සංශෝධිත) පනත්වල සංශෝධන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවට ආදායම් බදු ගෙවීම සඳහා වගකීමක් නොමැත.

2022 වසර තුළදී බැංකුව කිසිදු බදු මුදලක් ගෙවා නොමැත. (2021 වසරේදී ද කිසිදු බදු මුදලක් ගෙවා නැත.)

44. මෙහෙයුම් ලාභය මෙහෙයුම් මුදල් ප්‍රවාහය සමග සැසඳීම

	2022 රු. 000	2021 රු. 000
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් වාර්තා කෙරුණු ශුද්ධ ලාභය	**(374,320,973)**	158,162,666
මුදල් නොවන අයිතමයන් එකතුකළා/(අඩුකළා)		
ක්ෂයවීම් හා ක්‍රමක්ෂය	**737,304**	526,675
දේශීය මුදල් ආයෝජන කළඹ මගින් ලැබිය යුතු පොලිය	**(475,212,162)**	(64,504,574)
නිශ්චිත සේවක ප්‍රතිලාභ සැලසුම් සඳහා වන ශුද්ධ වෙන්කිරීම්	**7,810,442**	2,290,446
උපලබ්ධි නොවූ දළ විදේශ විනිමය ලාභය	**430,181,826**	(43,638,970)
දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලද (ලාභය)/අලාභය	**548**	669,924
වෙන් කිරීම් හා උපචිතයන් මූල්‍ය වත්කම් මත අපේක්ෂිත ණය අලාභ වෙන් කිරීම	**43,215,464**	3,144, 366
විලම්භීත ප්‍රදාන	**265,786**	(1,473, 999)
PRGF තැන්පතු ක්‍රමක්ෂය	**656**	389
නොනිමි ඉදිකිරීම් ලියාහැරීම්	**(3,953)**	(2,372)
ස්ථාවර ආදායම් සුරැකුම්පත් ක්‍රමක්ෂය වියදම්	**-**	(356)
ප්‍රා.සං.දෙපාර්තමේන්තුවේ ශුද්ධ වත්කම් අවශෝෂණයෙන් ලද අනෙකුත් ආදායම්	**(9,800)**	877,761
එකතුකළා / (අඩුකළා) අනෙකුත් කාරක ප්‍රාග්ධන අයිතමයන්ගේ වෙනස්වීම්	**5,568,805**	(14,705,875)
තොගවල අඩුවීම	**140,126**	1,373,286
ලැබිය යුතු පොළිය අඩුවීම	**(33,191,964)**	3,593,983
විවිධ බැරකම්වල වැඩිවීම	**(6,324,458)**	1,539,342
ගෙවිය යුතු පොළිය වැඩිවීම	**12,431,642**	425,395
අනෙකුත් ලැබීම් වැඩිවීම	**32,570,689**	(2,236,407)
එකතුකළා/(අඩුකළා) ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම්		
ශුද්ධ උපලබ්ධි නොවූ වෙළෙඳපොළ අගය වෙනස්වීම	**127,286,104**	(45,265,635)
මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ලද ශුද්ධ මුදල් ප්‍රවාහය	**(228,853,919)**	776,045

45. රජයේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුත්/(ආපසු ගැනීම්)

	2022 රු. 000	2021 රු. 000
ශ්‍රී ලංකා රජයේ සුරකුම්පත් මිලදී ගැනීම	**1,132,877,429**	1,218,291,655
ලැබුණු පොළිය - දේශීය මුදල් - ශ්‍රී ලංකා රජයේ සුරකුම්පත්	**(367,603,730)**	(43,061,965)
ශ්‍රී ලංකා රජයට දෙන ලද ණය සහ අත්තිකාරම් අඩුවීම	**85,509,900**	(2,933,100)
රජය සහ රජයේ ආයතන සමග ශේෂ (වැඩිවීම)/අඩුවීම	**1,170,890**	68,211
	851,954,489	1,172,364,801

46. බැංකු සහ මූල්‍ය ආයතනයන්ගේ ගනුදෙනු මත සංසරණ මුදල් ශුද්ධ නිකුත්/(ආපසු ගැනීම්)

	2022 රු. 000	2021 රු. 000
බැංකු හා මූල්‍ය ආයතනයන්ගේ තැන්පතු අඩුවීම්/(වැඩිවීම)	**(22,342,019)**	(171,102,641)
	(22,342,019)	(171,102,641)

47. අරමුදල්කරණයේ සංකේන්ද්‍රණය වීම

වර්ෂ අවසානයට බැංකුවේ අරමුදල්කරණයේ සැලකිය යුතු සංකේන්ද්‍රණය වීම පහත පරිදිය.

47.1. 2022 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකා රජය	ශ්‍රී ලංකා මහජනයා	ශ්‍රී ලංකා වාණිජ බැංකු	විදේශීය බැංකු සහ මූල්‍ය ආයතන	අධි ජාතික මූල්‍ය ආයතන	අනිකුත්	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය වත්කම්							
මුදල් සහ මුදල් සමානයන්	-	-	-	643,040	651,044,824	-	**651,687,864**
අනෙකුත් විස්තිරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරකුම්පත්	-	-	-	-	10,867,425	-	**10, 867,425**
වියුත්පන්න මූල්‍ය උපකරණ	-	-	401,580	-		-	**401,580**
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම්	-	-	-	-	281,421,074	-	**281,421,074**
අනෙකුත් ලැබිය යුතු දෑ	-	-	37,022,631	-	-	-	**37,022,631**
මුළු විදේශීය මූල්‍ය වත්කම්	-	-	37,424,211	643,040	943,333,323	-	**981,400,574**
දේශීය මූල්‍ය වත්කම්							
ශ්‍රී ලංකා රජයේ සුරකුම්පත්	2,498,995,015	-	-		-	-	**2,498,995,015**
ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරකුම්පත්	698,069,219	-	-		-	-	**698,069,219**
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	235,638,700	-	-		-	-	**235,638,700**
මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු							
ප්‍රාග්ධන ආයෝජන	-	-	-	-	-	1,817,132	**1,817,132**
බැංකු සඳහා දෙන ලද ණය	-	-	28,257,902		-	-	**28,257,902**
අනෙකුත් වත්කම්	-		-	-	-	30,182,560	**30,182,560**
මුළු දේශීය මූල්‍ය වත්කම්	3,432,702,934	-	28,257,902	-	-	31,999,692	**3,492,960,528**
මුළු මූල්‍ය වත්කම්	3,432,702,934	-	65,682,113	643,040	943,333,323	31,999,692	**4,474,361,102**
විදේශීය මූල්‍ය නොවන වත්කම්							**-**
රන්	-	-	-	-	-	10,031,610	**10,031,610**
	-	-	-	-	-	10,031,610	**10,031,610**
මූල්‍ය නොවන වත්කම්							
තොගය	-	-	-		-	4,788,407	**4,788,407**
අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම්	-	-	-	-	-	1,222,568	**1,222,568**
දේපල පිරියත සහ උපකරණ	-	-	-	-	-	19,035,278	**19,035,278**
අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-	-	908,137	**908,137**
මුළු මූල්‍ය නොවන වත්කම්	**-**	**-**	**-**	**-**	**-**	25,954,390	**25,954,390**
මුළු වත්කම්	3,432,702,934	-	65,682,113	643,040	943,333,323	67,985,692	**4,510,347,102**

2021 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක සංඛ්‍යා පහත පරිදිය.

47.2. 2021 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකා රජය	ශ්‍රී ලංකා මහජනයා	ශ්‍රී ලංකා වාණිජ බැංකු	විදේශීය බැංකු සහ මූල්‍ය ආයතන	අධි ජාතික මූල්‍ය ආයතන	අනිකුත්	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය වත්කම්							
මුදල් සහ මුදල් සමානයන්	-	-	-	51,348,516	461,413,936	-	512,762,452
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරකුම්පත්	-	-	-	-	8,818,244	-	8,818,244
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	54,022,836	-	-	-	54,022,836
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මු.අ.) සම්බන්ධ වත්කම්	-	-	-	-	188,045,837	-	188,045,837
මුළු විදේශීය මූල්‍ය වත්කම්	-	-	54,022,836	51,348,516	658,278,017	-	763,649,369
දේශීය මූල්‍ය වත්කම්							
ශ්‍රී ලංකා රජයේ සුරකුම්පත්	1,377,820,347	-	-		-	-	1,377,820,347
ප්‍රති විකුණුම් ගිවිසුම් මත මිලදීගත් සුරකුම්පත්	567,532,312	-	-		-	-	567,532,312
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	150,128,800	-	-		-	-	150,128,800
මූල්‍ය සහ අනිකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	-	-		-	1,671,218	1,671,218
බැංකු සඳහා දෙන ලද ණය		-	90,572,746		-	-	90,572,746
අනෙකුත් වත්කම්	-		-			34,063,770	34,063,770
මුළු දේශීය මූල්‍ය වත්කම්	2,095,481,459	-	90,572,746	-	-	35,734,988	2,221,789,193
මුළු මූල්‍ය වත්කම්	2,095,481,459	-	144,595,582	51,348,516	658,278,017	35,734,988	2,985,438,562
විදේශීය මූල්‍ය නොවන වත්කම්							
රන්	-	-	-	-	-	35,151,981	35,151,981
						35,151,981	35,151,981
මූල්‍ය නොවන වත්කම්	-	-	-	-	-	-	-
තොගය	-	-	-	-	-	4,928,533	4,928,533
අනෙකුත් ලැබිය යුතු දෑ හා කලින් ගෙවීම්	-	-	-	-	-	961,456	961,456
දේපල පිරියත සහ උපකරණ	-	-	-	-	-	19,235,994	19,235,994
අස්පෘශ්‍ය වත්කම්	-	-	-	-	-	561,632	561,632
මුළු මූල්‍ය නොවන වත්කම්						25,687,615	25,687,615
මුළු වත්කම්	2,095,481,459	-	144,595,582	51,348,516	658,278,017	96,574,584	3,046,278,158

47.3. 2022 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකා රජය	ශ්‍රී ලංකා මහජනයා	ශ්‍රී ලංකා වාණිජ බැංකු	අධි ජාතික මූල්‍ය ආයතන	අනිකුත්	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය බැරකම්						
බැංකු සහ මූල්‍ය ආයතන වලට ගෙවිය යුතු මුදල්	-	-	-	-	146,408,028	**146,408,028**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	71,697,994	-	-	**71,697,994**
ආසියානු නිශ්කාෂණ සංගමය	-	-	-	736,258,129	-	**736,258,129**
ජා.මු.අ.	-	-	-	1,127,925,092	-	**1,127,925,092**
අනිකුත්	1,021,468	-	-	69,173	593,292,810	**594,383,451**
මුළු විදේශීය මූල්‍ය බැරකම්	1,021,468	-	71,697,994	1,864,252,394	739,700,838	**2,676,672,694**
දේශීය මූල්‍ය බැරකම්						
බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු	-	-	311,537,802	-	11,508,379	**323,046,181**
රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු	221,406	5	-	-	-	**221,411**
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අළෙවි කළ සුරැකුම්පත් හා නිත්‍ය තැන්පතු පහසුකම	-	-	330,637,059	-	-	**330,637,059**
සංසරණයේ ඇති මුදල්	-	1,026,567,252	-	-	-	**1,026,567,252**
අනෙකුත් ගෙවිය යුතු දෑ	86,808	-	-	-	68,233,539	**68,320,347**
මුළු දේශීය මූල්‍ය බැරකම්	308,214	1,026,567,257	642,174,861	-	79,741,918	**1,748,792,250**
මුළු මූල්‍ය බැරකම්	1,329,682	1,026,567,257	713,872,855	1,864,252,394	819,442,756	**4,425,464,944**
අනිකුත් බැරකම්						
විලම්බිත ප්‍රදානයන්	-	-	-	-	1,834	**1,834**
විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම්	-	-	-	-	1,772,429	**1,772,429**
විවිධ බැරකම් සහ උපචිතයන්	-	-	-	-	855,043	**855,043**
මුළු අනිකුත් බැරකම්	-	-	-	-	2,629,306	**2,629,306**
මුළු බැරකම්	1,329,682	1,026,567,257	713,872,855	1,864,252,394	822,072,062	**4,428,094,250**

47.4. 2021 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකා රජය	ශ්‍රී ලංකා මහජනයා	ශ්‍රී ලංකා වාණිජ බැංකු	අධි ජාතික මූල්‍ය ආයතන	අනිකුත්	එකතුව
	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය බැරකම්						
බැංකු සහ මූල්‍ය ආයතන වලට ගෙවිය යුතු මුදල්	-	-	-	-	13,701	13,701
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	1,139,323	-	-	1,139,323
ආසියානු නිශ්කාෂණ සංගමය	-	-	-	104,764,616	-	104,764,616
ජා.මු.අ.	-	-	-	670,065,243	-	670,065,243
අනිකුත්	1,501,522	-	-	178,312	355,615,842	357,295,676
මුළු විදේශීය මූල්‍ය බැරකම්	1,501,522	-	1,139,323	775,008,171	355,629,543	1,133,278,559
දේශීය මූල්‍ය බැරකම්						
බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු	-	-	289,396,174	-	11,307,988	300,704,162
රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු	1,392,104	197	-	-	-	1,392,301
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අළෙවි කළ සුරැකුම්පත් හා නිත්‍ය තැන්පතු පහසුකම	-	-	99,426,206	-	1,636,674	101,062,880
සංසරණයේ ඇති මුදල්	-	1,005,099,066	-	-	-	1,005,099,066
අනෙකුත් ගෙවිය යුතු දෑ	26,525	-	8,947,739	-	10,189,618	19,163,882
මුළු දේශීය මූල්‍ය බැරකම්	1,418,629	1,005,099,263	397,770,119	-	23,134,280	1,427,422,291
මුළු මූල්‍ය බැරකම්	2,920,151	1,005,099,263	398,909,442	775,008,171	378,763,823	2,560,700,850
අනිකුත් බැරකම්						
විලම්බිත ප්‍රදානයන්	-	-	-	-	1,178	1,178
විශ්‍රාම වැටුප් සහ අනෙකුත් පශ්චාත් රැකියා ප්‍රතිලාභ සැලසුම්	-	-	-	-	17,929,737	17,929,737
විවිධ බැරකම් සහ උපචිතයන්	-	-	-	-	4,027,349	4,027,349
මුළු අනිකුත් බැරකම්	-	-	-	-	21,958,264	21,958,264
මුළු බැරකම්	2,920,151	1,005,099,263	398,909,442	775,008,171	400,722,087	2,582,659,114

48. අවදානම් කළමනාකරණය

ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්ති අරමුණ කර ළඟා වීමේ දී විවිධාකාර වූ මූල්‍ය හා මූල්‍ය නොවන අවදානම් රැසකට මුහුණ දෙනු ලබයි. මෙම අවදානම් වලින් ඇතිවිය හැකි බරපතල වූ හානිකර බලපෑම් පාලනය කරනු වස් ශ්‍රී ලංකා මහ බැංකුව තුළ නිසි පරිදි සැලසුම් කළ අවදානම් කළමණාකරණ රාමුවක් ස්ථාපිත කිරීම අත්‍යවශ්‍ය වේ. ඒ අනුව ශ්‍රී ලංකා මහ බැංකුව මුහුණ දෙන අවදානම් නිසි පරිදි කළමණාකරණය කිරීම සඳහා බැංකුව විසින්, ආයතනික අවදානම් කළමණාකරණ රාමුවක් (Enterprise -wide Risk Management Framework) ස්ථාපිත කරන ලදි.

මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අවදානම් යහපාලන රාමුව, අවදානම් යහපාලනය හා අවදානම් කළමනාකරණය ව්‍යුහයන්ගෙන් සමන්විත වන අතර බැංකුව විසින් මුහුණ දෙනු ලබන මූල්‍යමය හා මූල්‍යමය නොවන අවදානම් මෙමගින් ආවරණය වේ. අවදානම් යහපාලන ව්‍යුහය, මුදල් මණ්ඩලයෙන්ද මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව සහ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව යන අනුකමිටු වලින් ද සමන්විත වේ. මුදල් මණ්ඩලය විසින් බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණ ක්‍රියාවලියේ මූලිකත්වය ද අවසාන වගකීමද දරනු ලැබේ.

මුදල් මණ්ඩලය විසින් සිදුකළ විධිමත් බලය පැවරීමකට අනුව, මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව, ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත අවදානම් කළමනාකරණය සහ අනුකූලතා කාර්යයන් අධීක්ෂණය කිරීම සහ බැංකුවේ අවදානම් කළමනාකරණ සහ අනුකූලතා කාර්යය සඳහා පුළුල් උපායමාර්ග සහ ප්‍රතිපත්තීන් සකස් කිරීම සිදු කරනු ලබයි. බැංකුවේ අවදානම් කළමනාකරණ සහ අනුකූලතාවය තහවුරු කිරීම වෙනුවෙන් මුදල් මණ්ඩලයට සහාය ලබා දීමද මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව විසින් සිදු කරනු ලැබේ.

අවදානම් කළමනාකරණ රාමුව, මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව, ආයෝජන අධීක්ෂණ කමිටු සහ සියලු දෙපාර්මේන්තුවලින් සමන්විත වේ. ශ්‍රී ලංකා මහ බැංකුව අවදානම් කළමනාකරණය කිරීමේදී තෙවැදෑරුම් ආරක්ෂණ පිළිවෙතක් (Three lines of defense) අනුගමනය කරනු ලබයි. මෙහි ප්‍රථම පෙළ ආරක්ෂණ කටයුතු සඳහා සියලු දෙපාර්මේන්තු විසින් වගකීම දරනු ලබයි. ඒ අනුව මෙහෙයුම් දෙපාර්තමේන්තු විසින් බැංකුවේ අවදානම් කළමනාකරණ ව්‍යුහයට අනුකූලව ඔවුන්ගේ කාර්යයන් හා සබැඳි මූල්‍ය සහ /හෝ මෙහෙයුම් අවදානම් හඳුනාගැනීම, විශ්ලේෂණය, ඇගයීම, පිළියම් යෙදීම, අධීක්ෂණය, සමාලෝචනය හා ඒවා තම වාර්තාකරණ ධුරාවලිය හරහා වාර්තා කිරීමේ වගකීමෙන් බැඳී සිටියි. දෙවන පෙළ ආරක්ෂක වැඩපිළිවෙල ක්‍රියාත්මක කරනු ලබන අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, අවදානම් කළමනාකරණය හා බැඳි කාර්යයන් සම්බන්ධීකරණය, මග පෙන්වීම හා උපදේශනය තුළින් බැංකුවේ මූල්‍ය හා මෙහෙයුම් අවදානම්වලට අදාළ අවදානම් කළමනාකරණ ක්‍රියාවලියට පහසුකම් සැපයීමේ වගකීම දරනු ලබයි. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව හරහා මෙහෙයුම් අවදානම් මුදල් මණ්ඩල අධීක්ෂණ කාරක සභාව වෙතද මූල්‍ය අවදානම් සෘජුවම මුදල් මණ්ඩල අධීක්ෂණ කාරක සභාවටද නිශ්චිත කාලසීමාවකදී වාර්තා කරනු ලබයි. තෙවන පෙළ ආරක්ෂක ක්‍රමවේදය ලෙස ක්‍රියාකරන අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ වගකීම වන්නේ, ස්වාධීන තහවුරු කිරීමේ හා නිර්දේශ ඉදිරිපත් කිරීම තුළින් අගය වැඩි කිරීම් සහ බැංකුවේ මෙහෙයුම් කටයුතු විගණනයෙන් ඒ හා බැඳි අභ්‍යන්තර පාලන පරිසරය වැඩි දියුණු කිරීම වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව කාර්තුවකට වරක් සිය විගණන කටයුතුවල ප්‍රගතිය හා විගණකාධිපති වෙත ඉදිරිපත් කරන ලද විගණන වාර්තාවල තොරතුරු ද මුදල් මණ්ඩලයට සහ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව වෙත ඉදිරිපත් කරනු ලබයි.

ආයතනික අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයක් සකස්කොට ඇති අතර සමස්ත බැංකුව තුළ අවදානම් කළමනාකරණ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍යවන ප්‍රතිපත්ති එහි ඇතුළත් වේ. මෙම ක්‍රියාවලිය තුළදී, ශ්‍රී ලංකා මහ බැංකුව සිය අවදානම් කළමනාකරණය සඳහා පිළිගත් ප්‍රමිතීන් හා මාර්ගෝපදේශ අනුගමනය කරන අතරතුර අවදානම් හිමිකාරිත්වය හා කළමනාකරණය විවිධ පාර්ශවයන් වෙත පැහැදිලි වගවීමක් සහිතව පවරා දීමක් සිදුකරනු ලබයි.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර සංචිත, අභ්‍යන්තර ආයෝජන අරමුදල් සහ රජය සඳහා නියෝජිතායතන කාර්යයක් ලෙස සිදු කරනු ලබන සේවක අර්ථ සාධක අරමුදලේ අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම්වල මූල්‍ය අවදානම් කළමනාකරණය කිරීමට පහසුකම් සැපයීම සඳහා වගකියනු ලැබේ. ඒ අනුව, ඉහත අරමුදල් තුනම කළමනාකාරණය කිරීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය, උපාය මාර්ගික වත්කම් විභජනය හා ආයෝජන මාර්ගෝපදේශය සකස්කොට ඇති අතර ඒවාට අදාළ වෙනස්කම් ඇතුළත් කිරීම සඳහා ඒවා නිතිපතා සමාලෝචනයට ලක් කරයි. තවද අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ඉහත අරමුදල් කළමනාකරණ කාර්යයන් හා සබැඳි වෙළඳපල හා ණය අවදානම් ස්වාධීනව නිරීක්ෂණය කරන අතර එමගින් මෙම ආයෝජන මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද උපායමාර්ගික වත්කම් විභජනය, ආයෝජනය ප්‍රතිපත්ති ප්‍රකාශය හා ආයෝජන මාර්ගෝපදේශවල නියම කර ඇති ආයෝජන සීමාවන් තුළ පවතින්නේ ද යන්න තහවුරු කරනු ලබන අතර එම තොරතුරු අදාළ ආයෝජන අධීක්ෂණ කමිටු, මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කාරක සභාව සහ මුදල් මණ්ඩලය වෙත නිශ්චිත කාලසීමාවන් වලදී වාර්තා කරනු ලබයි.

අවදානම් කළමනාකරණය සඳහා පහසුකම් සලසනු වස්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් අවදානම් වර්ගීකරණය වාර්ෂිකව සමාලෝචනය කරන අතර එයට අවදානම් වර්ග ඇතුළත් කිරීම / ඉවත් කිරීම හා පවතින අවදානම් පරිසරයට ගැලපෙන අනෙකුත් වෙනස්කම් සිදු කිරීම මගින් යාවත්කාලීන කරනු ලැබේ. බැංකුව තුළ අවදානම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව බැංකුවේ සේවකයන් සඳහා අවදානම් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් විවිධ අවස්ථාවලදී වර්ෂය පුරා පවත්වන

ලදී. ඊට අමතරව, පවතින මෙහෙයුම් අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය පිළිබඳ ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ දැනුවත්භාවය තීරණය කරනු වස්, ද්විවාර්ෂික සංජානන සමීක්ෂණයක් අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. මෙම සමීක්ෂණයේ ප්‍රතිඵල ඉදිරි දැනුවත් කිරීමේ වැඩසටහන් සුදුසු පරිදි සැලසුම් කිරීමටත් එමගින් මහ බැංකුව තුළ අවදානම් සංස්කෘතිය වැඩි දියුණු වීමත් දැනට පවතින මෙහෙයුම් අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය දියුණු කිරීමටත් ඉවහල් වනු ඇත.

තවද, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව අනෙකුත් දෙපාර්තමේන්තු සමග වැඩ කරමින් අවදානම් ලේඛනය පිළියෙල කිරීම සමග spreadsheet පදනම් කරගත් අවදානම් ලේඛන ආකෘතිය අදියර වශයෙන් විධිමත් කිරීම සඳහා පහසුකම් සලසනු ලබයි. මෙම දෙපාර්තමේන්තු අවදානම් ලේඛනය යොදා ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ අවදානම් ගොනුව (risk profile) පිළියෙල කරන අතර එමගින් මෙහෙයුම් අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය වැඩි දියුණු වේ.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින්, සිදුවීම් වාර්තා කරන පද්ධතිය ඔස්සේ වාර්තාවන සිද්ධීන් අධීක්ෂණය කිරීම තවදුරටත් සිදුකළ අතර, එමගින් කේන්ද්‍රගත සිදුවීම් දත්ත ගබඩාවක් ගොඩනැඟීම සහ අනුගමනය කළ නිවැරදි කිරීමේ ක්‍රියා පටිපාටියේ ප්‍රගතිය මැන බැලීම සිදු කරන ලදි. මෙම පද්ධතිය ඔස්සේ ලබා ගත් තොරතුරු ඇතිවිය හැකි අවදානම් ප්‍රවණතා හඳුනා ගැනීම, අවදානම් සහගත කලාප හඳුනා ගැනීම සහ අවදානම් අවම කිරීමේ පියවර වැඩි දියුණු කිරීම යන කරුණු සඳහා උපකාරී වේ.

48.1 ණය අවදානම

(අ) භූගෝලීය ප්‍රදේශ අනුව ණය සංකේන්ද්‍රණය

බැංකුවේ වර්ෂය අවසානයේ දී සැලකිය යුතු ණය සංකේන්ද්‍රණයන් භූගෝලීය ප්‍රදේශ අනුව (ආයතනයේ අයිතිකාරත්ව රටවල් පදනම් කරගෙන) පහත දැක්වේ.

	2022 රු. 000	2021 රු. 000
ශ්‍රී ලංකාව	**3,530,384,740**	2,275,756,176
ඇමෙරිකා එක්සත් ජනපදය	**129,318,087**	130,712,211
ජපානය	**158,350**	9,457,390
බ්‍රිතාන්‍යය	**140,790**	1,008,405
යුරෝපය	**2,232,018**	1,582,664
අධි ජාතික මූල්‍ය ආයතන	**284,961,366**	190,963,416
වෙනත්	**527,165,751**	375,958,300
මුළු මූල්‍ය වත්කම්	**4,474,361,102**	2,985,438,562

(ආ) ආයතනය අනුව ණය සංකේන්ද්‍රණය

බැංකුවේ වර්ෂය අවසානයට වන සැලකිය යුතු ණය සංකේන්ද්‍රණය වීම ආයතන වර්ගයන් අනුව පහත දැක්වේ.

	2022 රු. 000	2021 රු. 000
රජයන්	**3,403,598,633**	2,014,470,178
අධි ජාතික මූල්‍ය ආයතන	**295,828,791**	227,180,460
විදේශීය බැංකු සහ මූල්‍ය ආයතන	**643,040**	15,187,326
ශ්‍රී ලංකා බැංකු හා මූල්‍ය ආයතන	**764,200,061**	718,635,801
අනිකුත්	**10,090,577**	9,964,797
මුළු මූල්‍ය වත්කම්	**4,474,361,102**	2,985,438,562

(ඇ) ණය ශ්‍රේණිගත කිරීම මගින් ණය අවදානම මැනීම

ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් සහ ෆිච් රේටින්ග්ස් සමාගමට අනුව ණය ශ්‍රේණිගත කිරීම සිදුකළ බැංකුවේ මූල්‍ය වත්කම් හෝ මූල්‍ය වත්කම් නිකුතුකරුවන් පහත වගුවෙන් දැක්වේ. ස්ටෑන්ඩර්ඩ් සහ පුවර්ස් සහ ෆිච් රේටින් සමාගමේ ශ්‍රේණිගත කිරීම් අනුව AAA සංකේතය ඉතා ඉහළම ශ්‍රේණිගත කිරීම හා අවම අපේක්ෂිත ණය අවදානම පෙන්නුම් කරන අතර, යම්කිසි ආයතනයකට පොළීය සහ මුල් මුදල් ගෙවීමට හැකි ශක්තිමත් තත්වයක් තිබෙන බව දක්වයි. AA සංකේතයෙන් ඉතා ඉහළ ශ්‍රේණිගත කිරීමක් හා ඉතා අඩු අපේක්ෂිත ණය අවදානමක් දැක්වෙන අතර, ශක්තිමත් තත්වයක් දක්වයි. A සංකේතයෙන් ඉහළ මධ්‍යම ශ්‍රේණියන් දක්වන අතර ශක්තිමත් තත්ත්වයක් හා ණය අවදානමේ පහළ තත්වයක් දක්වයි. BBB සංකේතයෙන් පහළ ම ආයෝජන ශ්‍රේණිගත කිරීම හා පහළ මට්ටමේ ණය අවදානමක් බවතින බව දක්වන අතර, ප්‍රමාණවත් ආරක්ෂක පරාමිති පෙන්නුම් කරයි. AAA සංකේතයට පහළ ශ්‍රේණි ප්‍රධාන ප්‍රභේදයන් අතර පවත්නා තත්ත්වය දැක්වීම පිණිස + හෝ - ලකුණු මගින් කාණ්ඩකරණය කළ හැකිය. බැඳුම්කර, ණය හෝ වෙනත් සැළකිය යුතු මූල්‍ය බැඳීම් මත ගෙවීම් පැහැර හැරීම් හෝ අවාසිසහගත ණය හුවමාරු කිරීම් RD ශ්‍රේණිගත කිරීම මඟින් පෙන්නුම් කෙරේ. ස්ටෑන්ඩර්ඩ් ඇන්ඩ් පුවර්ස් හා ෆිච් රේටින්ග් සමාගම් විසින් ණය ශ්‍රේණිගත නොකළ බව NR සංකේතයෙන් දැක්වේ.

ණය ශ්‍රේණිගත කිරීම මගින් ණය අවදානම මැනීම	ණය ශ්‍රේණිය	2022 රු. 000	%	2021 රු. 000	%
මුදල් හා මුදල් සමානයන්					
ෆෙඩරල් රිසව් බැන්ක් - ඇ.එ.ජ./ රිසව් බැන්ක් ඔෆ් ඕස්ට්‍රේලියා /බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/බැන්ක් ඔෆ් ජැපෑන්/ඩොයිෂ් බුන්ඩෙස් බැන්ක්/බැන්ක් ඔෆ් ඉන්ග්ලන්ඩ්/සෙවරිග්ස් රික්ස් බැන්ක්/බැන්ක් ඔෆ් කැනඩා/රිසව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ්/රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්දියා/පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා		**651,044,824**	**14.55%**	497,630,980	16.67%
අනෙකුත් ප්‍රතිපාර්ෂවියන්					
	AAA	**-**	**0.00%**	4,009,562	0.13%
	AA-	**96,911**	**0.00%**	2,004,771	0.07%
	A+	**80,743**	**0.00%**	8,094,146	0.27%
	A-	**353,258**	**0.01%**	768,180	0.03%
	BBB	**68,247**	**0.00%**	40,255	0.00%
	NR	**43,881**	**0.00%**	214,558	0.01%
		651,687,864	**14.56%**	512,762,452	17.18%
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්					
	AAA	**1,090,124**	**0.03%**	2,830,756	0.09%
	AA+	**9,777,301**	**0.23%**	5,987,488	0.20%
		10,867,425	**0.24%**	8,818,244	0.29%
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ					
	A	**-**	**0.00%**	55,853	0.00%
දේශීය ශ්‍රේණිගත කිරීම	AA-	**-**	**0.00%**	34,088,798	1.14%
	A+	**-**	**0.00%**	19,788,494	0.67%
	A	**343,437**	**0.01%**	33,378	0.00%
	A-	**58,143**	**0.00%**	-	0.00%
	BBB-	**-**	**0.00%**	2	0.00%
	BB+	**-**	**0.00%**	56,311	0.00%
		401,580	**0.01%**	54,022,836	1.81%
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්		**281,421,074**	**6.29%**	188,045,837	6.30%
		281,421,074	**6.29%**	188,045,837	6.30%
අනෙකුත් ලැබිය යුතු දෑ	A	**37,022,631**	**0.83%**	-	0.00%
		37,022,631	**0.83%**	-	0.00%
මූළු විදේශීය මූල්‍ය වත්කම්		**981,400,574**	**21.93%**	763,649,369	25.58%
දේශීය මූල්‍ය වත්කම්	RD	**2,498,995,015**	**55.85%**	-	0.00%
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	CCC+	**-**	**0.00%**	1,377,820,347	46.15%
නැවත විකිණීමේ ගිවිසුම් මත මිලදී ගත් සුරැකුම්පත්	AAA	**8,624,339**	**0.19%**	-	0.00%
	AA-	**-**	**0.00%**	557,856,718	18.69%
	A	**650,453,702**	**14.54%**	5,656,932	0.19%
	A-	**15,966,586**	**0.36%**	-	0.00%
	BBB-	**3,327,832**	**0.07%**	-	0.00%
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	NR	**19,696,760**	**0.45%**	4,018,662	0.14%
මූල්‍ය සහ අනෙකුත් ආයතනවල හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	RD	**235,638,700**	**5.27%**	-	0.00%
බැංකු සඳහා ලබාදුන් ණය	CCC+	**-**	**0.00%**	150,128,800	5.03%
	NR	**1,817,132**	**0.04%**	1,671,218	0.06%
	AAA	**3,327**	**0.00%**	24,917	0.00%
	AA-	**-**	**0.00%**	51,999,491	1.74%
	A+	**-**	**0.00%**	16,372,930	0.55%
	A	**12,416,991**	**0.28%**	9,977,843	0.33%
	A-	**5,473,684**	**0.12%**	-	0.00%

	BBB+	**79,516**	**0.00%**	6,201,554	0.21%
	BBB-	**1,134,172**	**0.03%**	2,933,926	0.10%
	BB+	**9,070,842**	**0.20%**	2,688,669	0.09%
	NR	**79,370**	**0.00%**	373,416	0.01%
අනෙකුත් වත්කම්	AAA	-	**0.00%**	325,579	0.01%
	AA-	**188,211**	**0.00%**	5,699,123	0.19%
	A+	**-**	**0.00%**	727,308	0.02%
	A	**299,219**	**0.01%**	-	0.00%
	A-	**149,510**	**0.00%**	-	0.00%
	RD	**21,460,386**	**0.48%**	-	0.00%
	CCC+	**-**	**0.00%**	19,206,430	0.64%
	NR	**8,085,234**	**0.18%**	8,105,330	0.27%
මූළු දේශීය මූල්‍ය වත්කම්		**3,492,960,528**	**78.07%**	2,221,789,193	74.42%
මූළු මූල්‍ය වත්කම්		**4,474,361,102**	**100.00%**	2,985,438,562	100.00%

(ඈ) ප්‍රධාන ණය ශ්‍රේණිවල සාරාංශය	ණය ශ්‍රේණිය	**2022 රු. 000**	**%**	2021 රු. 000	**%**
විදේශීය මූල්‍ය වත්කම්					
ෆෙඩරල් රිසර්ව් බැන්ක් - ඇ.එ.ජ./රිසර්ව් බැන්ක් ඔෆ් ඕස්ට්‍රේලියා/බැන්ක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/බැන්ක් ඔෆ් ජැපෑන්/ඩොයිෂ් බුන්ඩෙස් බැන්ක්/බැන්ක් ඔෆ් ඉංග්ලන්ඩ්/ සෙවරීග්ස් රික්ස් බැන්ක්/ බැන්ක් ඔෆ් කැනඩා/රිසර්ව් බැන්ක් ඔෆ් නිව්සීලන්ඩ්/රිසර්ව් බැන්ක් ඔෆ් ඉන්දියා/පීපල්ස් බැන්ක් ඔෆ් චයිනා		**651,044,824**	**14.55%**	497,630,980	16.67%
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්		**281,421,074**	**6.29%**	188,045,837	6.30%
	AAA	**1,090,124**	**0.01%**	6,840,318	0.22%
	AA+/-	**9,874,212**	**0.22%**	7,992,259	0.27%
	A+/-	**37,456,632**	**0.84%**	8,918,179	0.30%
	BBB+/-	**68,247**	**0.00%**	40,255	0.00%
	NR	**43,881**	**0.00%**	214,558	0.01%
දේශීය ශ්‍රේණිගත කිරීම	AA+/-	**-**	**0.00%**	34,088,798	1.14%
	A+/-	**401,580**	**0.02%**	19,821,872	0.67%
	BBB+	**-**	**0.00%**	2	0.00%
	BB+	**-**	**0.00%**	56,311	0.00%
මුළු විදේශීය මූල්‍ය වත්කම්		**981,400,574**	**21.93%**	763,649,369	25.58%
දේශීය මූල්‍ය වත්කම්	AAA	**8,627,666**	**0.19%**	350,496	0.01%
	AA+/-	**188,211**	**0.00%**	615,555,332	20.62%
	A+/-	**684,759,692**	**15.29%**	32,735,013	1.09%
	BBB+/-	**4,541,520**	**0.10%**	9,135,480	0.31%
	BB+/-	**9,070,842**	**0.20%**	2,688,669	0.09%
	CCC+	**2,756,094,101**	**61.60%**	1,547,155,577	51.82%
	NR	**29,678,496**	**0.67%**	14,168,626	0.48%
මුළු දේශීය මූල්‍ය වත්කම්		**3,492,960,529**	**78.07%**	2,221,789,193	74.42%
මුළු මූල්‍ය වත්කම්		**4,474,361,102**	**100.00%**	2,985,438,562	100.00%

ඉ) ණය තත්ව විශ්ලේෂණය

ණය අවදානම් උපරිම නිරාවරණය ණය ශ්‍රේණිගත කිරීම අනුව දැක්වීම

ක්‍රමක්ෂය පිරිවැයට සහ අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ අගයට වර්ගීකරණය කර ඇති මූල්‍ය වත්කම් වල ණය තත්වය පහත වගුවෙන් දැක්වේ.

		අපේක්ෂිත ණය අලාභ සඳහා යටත් නොවන	මාස 12ක් සඳහා අපේක්ෂිත ණය අලාභ	ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභ		2022
			අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
		රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය වත්කම්						
මුදල් හා මුදල් සමානයන්						
ෆෙඩරල් රිසර්ව් බැංක් - ඇ.එ.ජ./රිසර්ව් බැංක් ඔෆ් ඔස්ට්‍රේලියා/බැංක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙටිල්මන්ට්ස්/ බැංක් ඔෆ් ජැපැන්/ඩොයිෂ් බුන්ඩෙස් බැංක්/බැංක් ඔෆ් ඉන්ග්ලන්ඩ්/සෙවරිග්ස් රික්ස් බැංක්/බැංක් ඔෆ් කැනඩා/රිසර්ව් බැංක් ඔෆ් නිව්සීලන්ඩ්/රිසර්ව් බැංක් ඔෆ් ඉන්ඩියා/පීපල්ස් බැංක් ඔෆ් චයිනා		-	649,672,094	2,217,173	-	**651,889,267**
	AAA	-	-	-	-	**-**
	AA-	-	97,027	-	-	**97,027**
	A+	-	80,749	-	-	**80,749**
	A-	-	12,185	341,301	-	**353,486**
	BBB	-	68,279	-	-	**68,279**
	NR	-	43,888	(1)	-	**43,887**
දළ ධාරණ අගය		-	649,974,222	2,558,473	-	**652,532,695**
හානිකරණ අලාභ		-	(841,440)	(3,391)	-	**(844,831)**
ධාරණ අගය		-	649,132,782	2,555,082	-	**651,687,864**
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්						
	AAA	-	1,090,124	-	-	**1,090,124**
	AA+	-	9,777,301	-	-	**9,777,301**
		-	10,867,425	-	-	**10,867,425**
ජා.මු.අ. සම්බන්ධ වත්කම්	NR	-	281,421,082	-	-	**281,421,082**
දළ ධාරණ අගය		-	281,421,082	-	-	**281,421,082**
හානිකරණ අලාභ		-	(8)	-	-	**(8)**
ධාරණ අගය		-	281,421,074	-	-	**281,421,074**
දේශීය මූල්‍ය වත්කම්						
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	රජයේ සුරැකුම්පත් (අවදානම් රහිත ආයෝජන)	2,498,995,015	-	-	-	**2,498,995,015**
		2,498,995,015	-	-	-	**2,498,995,015**
නැවත විකිණීමේ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්	අනෙකුත් අවදානම් රහිත ආයෝජන	698,069,219	-	-	-	**698,069,219**
		698,069,219	-	-	-	**698,069,219**
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	රජයෙන් ලැබිය යුතු දෑ (අවදානම් රහිත ආයෝජන)	235,638,700	-	-	-	**235,638,700**
		235,638,700	-	-	-	**235,638,700**
බැංකු සඳහා දෙන ලද ණය	AAA	-	-	3,333	-	**3,333**
	AA+	-	-	-	-	**-**
	AA	-	-	-	-	**-**
	AA-	-	-	-	-	**-**
	A+	-	-	-	-	**-**
	A	-	5,513,369	6,906,357	-	**12,419,726**
	A-	-	4,133,725	1,342,976	-	**5,476,701**
	BBB+	-	-	79,786	-	**79,786**
	BBB	-	-	-	-	**-**
	BBB-	-	1,126,323	11,592	-	**1,137,915**
	BB+	-	-	9,318,648	-	**9,318,648**
	BB	-	-	-	-	**-**
	BB-	-	-	-	-	**-**
	NR	-	79,416	-	-	**79,416**

	ශ්‍රී.ලං.මි.බැ. ණය ඇපකර පහසුකම	-	–	-	86,307	**86,307**
දළ ධාරණ අගය		-	10,852,833	17,662,692	86,307	**28,601,832**
හානිකරන අලාභ		-	(6,057)	(251,566)	(86,307)	**(343,930)**
ධාරණ අගය		-	10,846,776	17,411,126	-	**28,257,902**
අනෙකුත් වත්කම්	රජයේ සුරැකුම්පත් (අවදානම් රහිත ආයෝජන)	17,919,801	-	-	-	**17,919,801**
	රජයෙන් ලැබිය යුතු දෑ (අවදානම් රහිත ආයෝජන)	3,540,585	-	-	-	**3,540,585**
	අනෙකුත් අවදානම් රහිත ලැබිය යුතු දෑ	8,085,234	-	-	-	**8,085,234**
දේශීය ශ්‍රේණිගත කිරීම	AAA	-	-	-	-	**-**
	AA-	-	188,293	-	-	**188,293**
	A+	-	-	-	-	**-**
		-	130,285	168,989	-	**299,274**
		-	9,252	140,526	-	**149,778**
		-	-	-	-	**-**
		-	-	-	-	**-**
		-	-	-	-	**-**
		-	-	-	-	**-**
		-	-	-	-	**-**
		-	-	-	-	**-**
	NR	-	-	-	2,226,887	**2,226,887**
දළ ධාරණ අගය		29,545,620	327,830	309,515	2,226,887	**32,409,852**
හානිකරන අලාභ		-	(86)	(319)	(2,226,887)	**(2,227,292)**
ධාරණ අගය		29,545,620	327,744	309,196	-	**30,182,560**

2021 දෙසැම්බර් 31 දිනට සංසන්දනාත්මක අගයන් පහත පරිදි වේ.

		අපේක්ෂිත ණය අලාභ සඳහා යටත් නොවන	මාස 12ක් සඳහා අපෙක්ෂිත ණය අලාභ	ජීව කාලයේ අපේක්ෂිත ණය අලාභ		2021
			අදියර 1	අදියර 2	අදියර 3	එකතුව
		රු. **000**	රු. **000**	රු. **000**	රු. **000**	රු. **000**
විදේශීය මූල්‍ය වත්කම්						
මුදල් හා මුදල් සමානයන්						
ෆෙඩරල් රිසර්ව් බැංක් - ඇ.එ.ජ./රිසර්ව් බැංක් ඔෆ් ඔස්ට්‍රේලියා/බැංක් ෆෝ ඉන්ටර්නැෂනල් සෙට්ල්මන්ට්ස්/ බැංක් ඔෆ් ජැපෑන්/ඩොයිෂ් බුන්ඩෙස් බැංක්/බැංක් ඔෆ් ඉන්ග්ලන්ඩ්/සෙවරිග්ස් රික්ස් බැංක්/බැංක් ඔෆ් කැනඩා/රිසර්ව් බැංක් ඔෆ් නිව්සීලන්ඩ්/රිසර්ව් බැංක් ඔෆ් ඉන්ඩියා/පීපල්ස් බැංක් ඔෆ් චයිනා		-	487,881,870	9,805,548	-	497,687,418
	AAA	-	4,009,618	-	-	4,009,618
	AA-	-	2,004,789	-	-	2,004,789
	A+	-	8,094,153	-	-	8,094,153
	A	-	-	-	-	-
	A-	-	768,194	-	-	768,194
	BBB+	-	-	-	-	-
	BBB	-	40,261	-	-	40,261
	NR	-	-	243,387	-	243,387
දළ ධාරණ අගය		-	502,798,885	10,048,935	-	512,847,820
හානිකරණ අලාභ		-	(52,009)	(33,359)	-	(85,368)
ධාරණ අගය		-	502,746,876	10,015,576	-	512,762,452
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම් පත්						
	AAA	-	2,830,756	-	-	2,830,756
	AA+	-	5,987,488	-	-	5,987,488
	AA	-	-	-	-	-

	AA-	-	-	-	-	-
	A+	-	-	-	-	-
		-	8,818,244	-	-	8,818,244
ජා.මු.අ. සම්බන්ධ වත්කම්	NR	-	188,045,840	-	-	188,045,840
දළ ධාරණ අගය		-	188,045,840	-	-	188,045,840
හානිකරණ අලාභ		-	(3)	-	-	(3)
ධාරණ අගය		-	188,045,837	-	-	188,045,837
දේශීය මූල්‍ය වත්කම්						
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	රජයේ සුරැකුම්පත් (අවදානම් රහිත ආයෝජන)	1,377,820,347	-	-	-	1,377,820,347
		1,377,820,347	-	-	-	1,377,820,347
නැවත විකිණීමේ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්	අනෙකුත් අවදානම් රහිත ආයෝජන	567,532,312	-	-	-	567,532,312
		567,532,312	-	-	-	567,532,312
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	රජයෙන් ලැබිය යුතු (අවදානම් රහිත ආයෝජන)	150,128,800	-	-	-	150,128,800
		150,128,800	-	-	-	150,128,800
බැංකු සඳහා දෙන ලද ණය						
	AAA	-	24,917	-	-	24,917
	AA+	-	-	-	-	-
	AA-	-	46,591,702	5,408,477	-	52,000,179
	A+	-	16,374,633	-	-	16,374,633
	A	-	9,979,661	-	-	9,979,661
	A-	-	-	-	-	-
	BBB+	-	6,205,432	-	-	6,205,432
	BBB-	-	2,939,496	-	-	2,939,496
	BB+	-	390,018	2,320,747	-	2,710,765
	BB	-	-	-	-	-
	BB-	-	-	-	-	-
	NR	-	373,575	-	-	373,575
ශ්‍රී.ලං.ම.බැ. ණය ඇපකර යෝජනා ක්‍රමය		–	-	–	13,016	13,016
දළ ධාරණ අගය		-	82,879,434	7,729,224	13,016	90,621,674
හානිකරණ අලාභ		-	(14,435)	(21,477)	(13,016)	(48,928)
ධාරණ අගය		-	82,864,999	7,707,747	-	90,572,746
අනෙකුත් වත්කම්						
	රජයේ සුරැකුම්පත් (අවදානම් රහිත ආයෝජන)	15,118,446	-	-	-	15,118,446
	රජයෙන් ලැබිය යුතු දෑ (අවදානම් රහිත ආයෝජන)	4,087,983	-	-	-	4,087,983
	අනෙකුත් අවදානම් රහිත ලැබිය යුතු දෑ	8,105,330	-	-	-	8,105,330
දේශීය ශ්‍රේණිගත කිරීම	AAA	-	325,580	-	-	325,580
	AAA-	-	5,681,358	17,393	-	5,699,251
	AA+	-	-	-	-	-
	A+	-	600,404	127,206	-	727,610
	A	-	-	-	-	-
	A-	-	-	-	-	-
	BBB+	-	-	-	-	-
	BBB	-	-	-	-	-
	BBB-	-	-	-	-	-
	BB+	-	-	-	-	-
	BB	-	-	-	-	-
	BB-	-	-	-	-	-
	NR	-	-	-	2,226,887	2,226,887
දළ ධාරණ අගය		27,311,759	6,607,842	144,599	2,226,887	36,291,087
හානිකරන අලාභ		-	(189)	(241)	(2,226,887)	(2,227,317)
ධාරණ අගය		27,311,759	6,607,653	144,358	-	34,063,770

(ඊ) ණය අනාවරණයෙහි විචලනය - අපේක්ෂිත ණය අලාභයේ අදියර අනුව

මූල්‍ය උපකරණ වර්ග මගින් හාණ්ඩකරණය සඳහා වෙන් කිරීම ආරම්භක ශේෂයේ සිට අවසාන ශේෂය දක්වා සැසඳුමක් ලෙස පහත සටහන මගින් ඉදිරිපත්කර ඇත.

	2022				2021			
	අදියර 1 රු. 000	අදියර 2 රු. 000	අදියර 3 රු. 000	එකතුව රු. 000	අදියර 1 රු. 000	අදියර 2 රු. 000	අදියර 3 රු. 000	එකතුව රු. 000
මුදල් හා මුදල් සමානයන්								
ජනවාරි 1 දිනට ශේෂය	**52,009**	**33,359**	**-**	**85,368**	90,277	180,061	-	270,338
අදියර 01ට මාරු කිරීම	**28,828**	**(28,828)**	**-**	**-**	1,164	(1,164)	-	-
අදියර 02ට මාරු කිරීම	**(35)**	**35**	**-**	**-**	(52)	52	-	-
අදියර 03ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	**760,638**	**(1,174)**	**-**	**759,464**	(39,380)	(145,590)	-	(184,970)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**841,440**	**3,392**	**-**	**844,832**	52,009	33,359	-	85,368
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති සුරැකුම්පත්								
ජනවාරි 1 දිනට ශේෂය	**995**	**-**	**-**	**995**	36,546	2,062,175	-	2,098,721
අදියර 01ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
අදියර 02ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
අදියර 03ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	**3,749**	**-**	**-**	**3,749**	(35,551)	(2,062,175)	-	(2,097,726)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**4,744**	**-**	**-**	**4,744**	995	-	-	995
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්								
ජනවාරි 1 දිනට ශේෂය	**3**	**-**	**-**	**3**	2	-	-	2
අදියර 01ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
අදියර 02ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
අදියර 03ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	**5**	**-**	**-**	**5**	1	-	-	1
දෙසැම්බර් 31 දිනට ශේෂය	**8**	**-**	**-**	**8**	3	-	-	3
බැංකු සඳහා ලබාදුන් ණය								
ජනවාරි 1 දිනට ශේෂය	**14,435**	**21,477**	**-**	**35,912**	6,215	148,153	-	154,368
අදියර 01ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	140,773	(140,773)	-	-
අදියර 02ට මාරු කිරීම	**(4,804)**	**4,804**	**-**	**-**	(37)	37	-	-
අදියර 03ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	**(3,574)**	**225,285**	**-**	**221,711**	(132,516)	14,060	-	(118,456)
දෙසැම්බර් 31 දිනට ශේෂය	**6,057**	**251,566**	**-**	**257,623**	14,435	21,477	-	35,912
ණය ඇපකර යටතේ ගෙවන ලද මුදල්								
ජනවාරි 1 දිනට ශේෂය	**-**	**-**	**13,016**	**13,016**	-	-	-	-
අදියර 01ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
අදියර 02ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
අදියර 03ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	**-**	**-**	**73,291**	**73,291**	-	-	13,016	13,016
දෙසැම්බර් 31 දිනට ශේෂය	**-**	**-**	**86,307**	**86,307**	-	-	13,016	13,016
අනෙකුත් වත්කම්								
ජනවාරි 1 දිනට ශේෂය	**189**	**241**	**2,226,887**	**2,227,317**	48	79,524	183,276	262,848
අදියර 01ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	(1)	1	-	-
අදියර 02ට මාරු කිරීම	**(1)**	**1**	**-**	**-**	-	-	-	-
අදියර 03ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	**(104)**	**77**	**-**	**(27)**	142	(79,284)	2,043,611	1,964,469
දෙසැම්බර් 31 දිනට ශේෂය	**84**	**319**	**2,226,887**	**2,227,290**	189	241	2,226,887	2,227,317
ණය ඇපකර								
ජනවාරි 1 දිනට ශේෂය	**1,011,732**	**-**	**-**	**1,011,732**	-	-	-	-
අදියර 01ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
අදියර 02ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
අදියර 03ට මාරු කිරීම	**-**	**-**	**-**	**-**	-	-	-	-
ආදායම් ප්‍රකාශයට අයකරගත් අගය	**(792,408)**	**-**	**-**	**(792,408)**	1,011,732	-	-	1,011,732
දෙසැම්බර් 31 දිනට ශේෂය	**219,324**	**-**	**-**	**219,324**	1,011,732	-	-	1,011,732

(උ) රඳවාගත් ඇපකර සහ වෙනත් ණය වැඩිදියුණු කිරීම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එහි සමහරක් ණය අනාවරණයන්ට එරෙහිව ඇපකර සහ වෙනත් ණය වැඩිදියුණු කිරීම් රඳවාගෙන තිබේ. විවිධ මූල්‍ය වත්කම්වලට එරෙහිව රඳවාගත් ප්‍රධාන ඇපකර පිළිබඳව පහත සටහනින් දැක්වේ.

ණය අනාවරණයේ ආකාරය

	ඇපකරයක අවශ්‍යතාවයට යටත්වන අනාවරණයේ ප්‍රතිශතය		
	2022	**2021**	**රඳවාගත් ප්‍රධාන ඇපකරය/ඇපකරයන්**
නැවත විකිණීමේ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්	100	100	අලෙවිකල හැකි රජයේ සුරැකුම්පත්
බැංකු සඳහා ලබාදුන් ණය			
සෞභාග්‍යා කෝවිඩ්-19 පුනරුද පහසුකම්	100	100	අලෙවිකල හැකි රජයේ සුරැකුම්පත් සහ ලැබිය යුතු ණය

(ඌ) අපේක්ෂිත ණය අලාභයේ සිදුවූ සැළකිය යුතු වෙනස්වීම්

සලකා බැලූ කාලපරිච්ඡේදය තුළදී, මූල්‍ය උපකරණ වල දළ ධාරණ අගයේ සිදුවූ සැළකිය යුතු වෙනස්වීම්, හානිකරණ අගයේ වෙනස්වීමට දායකවූ ආකාරය පහත සටහන් මඟින් විස්තරාත්මකව දක්වා ඇත.

	2022 බලපෑම: වැඩිවීම /(අඩුවීම)		
	අදියර 01	අදියර 02	අදියර 03
	රු. **000**	රු. **000**	රු. **000**
මුදල් සහ මුදල් සමානයන්	789,431	(29,967)	-
වැඩිදියුණු වූ ණය ශ්‍රේණියක් සහිත ප්‍රතිපාර්ශවයන් සමඟ මුදල් ශේෂයේ වැඩිවීම			
අනෙකුත් විස්තීරණ ආදායම මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	3,749	-	-
වර්ෂය තුළදී ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹෙන් සැළකිය යුතු කොටසක් රජයේ විදේශීය ණය ගෙවීම සඳහා බැහැර කිරීම			
බැංකු සඳහා ලබාදුන් ණය			
- **මෙතෙක් පැවති ශේෂයන්**			
දේශීය බැංකු වල ණය ශ්‍රේණිගත කිරීම අඩුවීම හේතුවෙන් වැඩිවී ඇත.	(8,378)	230,089	-
බැංකු වලට ගෙවන ලද ණය ඇපකර හිමිකම් හේතුවෙන් වැඩිවී ඇත.	-	-	73,291
අභ්‍යන්තර අරමුදල්			
- **මෙතෙක් පැවති ශේෂයන්**			
දේශීය බැංකු වල ණය ශ්‍රේණිගත කිරීම අඩුවීම නිසා වැඩිවී ඇත.	47	78	-
- **අවශෝෂණය කරන ලද ශේෂයන්**			
වර්ෂය තුළදී ප්‍රා.සං.දෙ. යටතේ තිබූ ආයෝජන බැහැර කිරීම නිසා අඩුවී ඇත.	(151)	-	-
ණය ඇපකර			
ණය ඇපකර වල අවිනිශ්චිත වගකීම අඩුවීම නිසා අඩුවී ඇත	(792,408)	-	-
	(7,710)	200,200	73,291

	2021 බලපෑම: වැඩිවීම /(අඩුවීම)		
	අදියර 01	අදියර 02	අදියර 03
	රු. **000**	රු. **000**	රු. **000**
මුදල් සහ මුදල් සමානයන්	(38,267)	(146,702)	-
වැඩිදියුණු වූ ණය ශ්‍රේණියක් සහිත ප්‍රතිපාර්ශවයන් සමඟ මුදල් ශේෂයේ වැඩිවීම			
අනෙකුත් විස්තීරණ ආදායම මත සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	(35,551)	(2,062.174)	-
වර්ෂය තුළදී ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹෙන් සැළකිය යුතු කොටසක් ගෙවීම සඳහා බැහැර කිරීම			
බැංකු සඳහා ලබාදුන් ණය			
- **මෙතෙක් පැවති ශේෂයන්**			
වස්ඔය තුළදී ගෙවන ලද ණය හේතුවෙන් අඩුවී ඇත.	-	(140,425)	-
බැංකු වලට ගෙවන ලද ණය ඇපකර හිමිකම් හේතුවෙන් වැඩිවී ඇත.	-	-	13,016
- **අවශෝෂණය කරන ලද ශේෂයන්**			
ප්‍රා.සං.දෙ. යටතේ තිබූ ආයෝජන ශේෂයන් ශ්‍රී.ලං.ම. බැංකුවේ මූල්‍ය ප්‍රකාශ වලට අවශෝෂණය කිරීම නිසා වැඩිවී ඇත	4,555	13,749	-
- **අභ්‍යන්තර අරමුදල්**			
- **මෙතෙක් පැවති ශේෂයන්**			
ශ්‍රේණිගත නොකළ ප්‍රතිපාර්ශවයන් සමඟ සිදුවූ අවම අනාවරණය නිසා අඩුවී ඇත		(79,282)	
- **අවශෝෂණය කරන ලද ශේෂයන්**			
ප්‍රා.සං.දෙ. යටතේ තිබූ ආයෝජන ශේෂයන් ශ්‍රී.ලං.ම. බැංකුවේ මූල්‍ය ප්‍රකාශ වලට අවශෝෂණය කිරීම නිසා වැඩිවී ඇත	151	-	-
ණය ඇපකර			
අපේක්ෂිත ණය අලාභ ගණනය කිරීමේදී, උප ණය ගැණුම්කරුවන්ගේ අක්‍රිය ණය අනුපාතයන් සලකා බැලීමමම නිසා වැඩි වී ඇත.	1,011,732	-	-
	942,620	(2,414,834)	13,016

(ඒ) ක්‍රමක්ෂය පිරිවැයට ණය හානිකරණය කරන ලද වත්කම් වල දළ ධාරණ අගයේ වෙනස්වීම

ක්‍රමක්ෂය පිරිවැයට ණය හානිකරණය කරන ලද වත්කම් වල දළ ධාරණ අගයේ වෙනස්වීම සංසන්දනාත්මකව පහත සටහනෙන් දැක්වේ.

	2022 රු. 000	2021 රු. 000
ජනවාරි 01 දිනට ක්‍රමක්ෂය පිරිවැයට ණය හානිකරණය කරන ලද වත්කම්	-	-
වසර තුළදී ණය හානිකරණ වත්කම් ලෙස වර්ගීකරණය කරන ලද ප්‍රමාණය	**73,291**	13,016
ප්‍රා.සං.දෙ. යටතේ තිබූ වත්කම් අවශෝෂණයේ දී අවශෝෂණය කරගත් ණය හානිකරණ වත්කම්	-	2,043,610
අපේක්ෂිත ණය අලාභ දීමනාවේ වෙනස	**(73,291)**	(2,056,626)
දෙසැම්බර් 31 දිනට ක්‍රමක්ෂය පිරිවැයට ණය හානිකරණය කරන ලද වත්කම්	-	-

48.2 පොළී අනුපාතික අවදානම

(අ) විදේශීය මුදල් පොළී අනුපාත සංවේදීතාවය

පොළී අනුපාත අවදානම යනු පොළී අනුපාතයේ වෙනස්වීම නිසා ඇතිවන පාඩු විඳීමේ අවදානමයි.

ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹෙහි පොළී අනුපාත සංවේදීතාවය, පොළී අනුපාතය පදනම් අංක 10 කින් වෙනස්වීමෙන් විය හැකි ලාභය/ පාඩුව මගින් මනිනු ලැබේ. බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් ආයෝජන කළඹෙහි අවදානම් නිරාවරණ සංවේදීතාවය පහත දැක්වේ.

බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ	විය හැකි පාඩුව (ඇ.ඒ.ජ. ඩොලර් මිලියන)	
	2022	2021
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති ආයෝජන	**0.10**	0.16

අවදානම් කළමණාකරණ දෙපාර්තමේන්තුව විසින් විදේශ වත්කම් ආයෝජන කළඹෙහි පොළී අනුපාත අවදානම කළමනාකරණය කිරීම සඳහා පහත දැක්වෙන උපාය මාර්ගයන් අනුගමනය කරනු ලැබේ.

(i) පොළී අනුපාත වෙනස්වීම මත විදේශ වත්කම් ආයෝජන කළඹට ඇතිවන බලපෑම පොළී අනුපාත සංවේදීතාවය මගින් මනිනු ලබන අතරම පොළී අනුපාතය මෙන්ම ආයෝජනයේ කාල සීමාව සැලකිල්ලට ගනු ලබන විකරිත කාලච්ඡේදය පොළී අනුපාත අවදානම මැනීම සඳහා බැංකුව විසින් යොදා ගනු ලැබේ. විකරිත කාලච්ඡේදය මගින් 1% ක පොළී අනුපාත (ඵලදාව) වෙනස්වීම් මත සුරැකුම්පත්වල මිල වෙනස්වීම් මනිනු ලැබේ. ඉහළ විකරිත කාලච්ඡේදයක් මගින් ඉහළ අවදානමක් පෙන්නුම් කෙරේ. එමනිසා මූල්‍ය වෙළෙඳපොලවල් තුළ ඇති වන සංවර්ධනයන්, ආයෝජන කළඹේ ඇති සංලක්ෂණයන් හා බැඳුම්කර ආයෝජන කළඹේ ඇති අවදානම් අභිරුචිය යන කරුණු සලකා බැලීමෙන් අනතුරුව මහ බැංකුව විසින් උචිත විකරිත කාලච්ඡේදයන් කලින් කලට සකස් කරනු ලැබේ. විදේශ වත්කම් ආයෝජන කළඹේ විකරිත කාලච්ඡේදය පහත ආකාර වේ.

ආයෝජන බණ්ඩය	විකරිත කාලච්ඡේදය	
	2022	2021
ප්‍රාග්ධන වෙළෙඳපොළ (ස්ථාවර ආදායම් සුරැකුම්පත්)	3.36	3.69

(ii) විකරිත කාලච්ඡේදය මගින් විශාල වශයෙන් වන මිල වෙනස්වීම් ගණනය නොවන නිසා, විදේශ සංචිත ආයෝජන කළඹේ පොළී අනුපාත අවදානම මැනීම සඳහා භාවිතා කරන තවත් මිනුමක් ලෙස උත්තලතාවය (convexity) දැක්විය හැකිය. උත්තලතාවය මගින් බැඳුම්කර මිල ඵලදා වක්‍රය සරල රේඛීය සළුල කාල පරිච්ඡේදයට සාපේක්ෂව වෙනස්වීම මනිනු ලබයි. මෙමගින් ස්ථාවර සුරැකුම්පත් මිල, පොළී අනුපාතයට දක්වන සංවේදීතාවය තවදුරටත් නියමිත අගයට ආසන්න කිරීමට ඉඩකඩ ලබාදේ. කාලච්ඡේදයේ වෙනස සඳහා ඵලදා අනුපාතයේ වෙනස උත්තලතාවයයි. ඉන් විකරිත කාලච්ඡේදයේ පුරෝකතනය කළ දෝෂය මනිනු ලබයි. මෙය ඵලදා අනුපාතය සම්බන්ධයෙන් සුරැකුම්පත්වල මිලෙහි දෙවන අවකලනයයි.

බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹේ උත්තලතාවය

බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරැකුම්පත් කළඹ	විය හැකි පාඩුව (ඇ.ඒ.ජ.ඩොලර් මිලියන)	
	2022	2021
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති ආයෝජන	**0.145**	0.180

(iii) අවදානම් වටිනාකම (Value at Risk)

සාමාන්‍ය වෙළෙඳපොළ තත්ත්වයන් යටතේ මූල්‍ය වෙළෙඳපොළ චලනයන් මගින් ආයෝජන කළඹක අයහපත් දිසාවට අවදානම තනි අගයකට සාරාංශ කිරීමක් අවදානම් වටිනාකම මගින් සිදුකරයි. එම නිසා අවදානම් වටිනාකම ඉලක්ක කාල සීමාව පුරාවට වන උපරිම අලාභය වන අතර එහි දී සත්‍ය අලාභය ඉහළ වීමේ සම්භාවිතාව පහළ හා කලින් සඳහන් මට්ටමේ විය හැක. අවදානම් වටිනාකම මගින්, අවදානම සහ තත්ත්වය හරහා සමාහාරය කළ හැකි මුදලින් ප්‍රකාශ කරනු ලබන සංඛ්‍යාවක් ලබා දේ.

ස්ථාවර ආදායම් සුරැකුම්පත් ආයෝජන කළඹෙහි අවදානම් වටිනාකම, 99% ක විශ්‍රම්භ ප්‍රාන්තරයක් හා දින 10 ක කාල

සීමාවක් උපයෝගී කරගනිමින් Historical & Parametric ක්‍රමය ඔස්සේ ගණනය කරනු ලැබේ.

බණ්ඩනය කරන ලද ස්ථාවර ආදායම් සුරකුම්පත් කළඹ	අවදානම් වටිනාකම		
	2022		2021
	Historical	Parametric	
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති ආයෝජන	**0.65**	**0.63**	0.48

(iv) වෙළෙඳ හා විවෘත තත්ත්වයන් (Open Positions) හි සීමා

බැංකුව විසින් අන්තර් දින කටයුතු සඳහා නිශ්චිත ගණුදෙනුකරු සීමා (Specific Dealer Limit) ද එක්දින තත්ත්ව සීමා (Overnight Position Limit) ද බැංකුවේ ගණුදෙනුකරුවන් (Dealers) සඳහා පනවනු ලබයි.

(ආ) දේශීය මුදල් පොළී අනුපාත සංවේදීතාවය

ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය තත්ව ප්‍රකාශයේ දක්වා ඇති දේශීය භාණ්ඩාගාර බිල්පත් කළඹ, ජා.මු.වා.ප්‍ර. 9 යෙහි ඇති ව්‍යාපාරික ආකෘතික තක්සේරුව පරිදි අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට, මූල්‍ය තත්ව ප්‍රකාශයෙහි වාර්තා කරනු ලබයි. බැංකුව පොළී ආදායම ඉපැයීම අරමුණු කර නොගෙන රජයේ සුරකුම්පත් මිලදී ගැනීම සිදු කරන හෙයින් රජයේ සුරකුම්පත් කළඹ, ආයෝජන කළඹක් ලෙස නොසැලකේ. බැංකුවේ මූලික අරමුණුවලින් එකක් වන, ආර්ථික හා මිල ස්ථායිතාවය රැකීම සම්බන්ධ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දේශීය වෙළෙඳපොළට ද්‍රවශීලතාවය විදීමට හෝ දේශීය වෙළෙඳපොළින් ද්‍රවශීලතාවය උකහා ගැනීමට බැංකුව රජයේ සුරකුම්පත් මිලදී ගැනීම හෝ විකිණීම සිදු කරනු ලබයි. එහෙයින් බැංකු ආයෝජන කළඹෙහි රජයේ සුරකුම්පත්වල ප්‍රමාණය, එහි මූල්‍ය ප්‍රතිපත්තිය විසින් තීරණය කරනු ලැබේ. ඊට අමතරව, රුපියල් වෙළෙඳපොළේ මූලික පොළී අනුපාත එනම්, ප්‍රතිමිලදී ගැනීමේ අනුපාතය හා ප්‍රතිවිකුණුම් අනුපාත, මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා බැංකුව විසින් තීරණය කරනු ලබයි. වැඩිදුරටත්, රුපියල් ද්‍රවශීලතාවය විදීම් හෝ වෙළෙඳපොළින් රුපියල් ද්‍රවශීලතාවය උකහා ගැනීම් සඳහා වූ බැංකුවේ ක්‍රියාමාර්ග පොදු රුපියල් වෙළෙඳපොළේ පොළී අනුපාතයන් කෙරෙහි බලපානු ලබයි. ඒ අනුව රජයේ සුරකුම්පත් කළඹ මගින් උද්ගත වන පොළී ආදායමේ වෙනස්වීම් කෙරෙහි ආයෝජන තීරණවලට වඩා බැංකුවෙහි රජයේ සුරකුම්පත් කළඹෙහි ප්‍රමාණය මෙන් ම මූලික වශයෙන් බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග බලපානු ලබයි. එම නිසා බැංකුව දේශීය මූල්‍ය වත්කම්වල පොළියේ වන සංවේදීතාවය ගැන නොසලකනු ලැබේ.

(ඇ) වත්කම් සහ වගකීම් කල් පිරීම හෝ ප්‍රතිමිල කිරීම පහත සඳහන් කාලච්ඡේදවලදී සිදුවේ.

විදේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය :	හරිත සාමාන්‍ය පොළී අනුපාතය %	2022 එකතුව රු. 000	හය මසක් හෝ අඩු රු. 000	මාස 6 සිට 12 දක්වා රු. 000	වර්ෂ 1 සිට 2 දක්වා රු. 000	වර්ෂ 2 සිට 5 දක්වා රු. 000	වර්ෂ 5 ට වැඩි රු. 000
පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්							
මුදල් හා මුදල් සමානයන්	0.0000	**651,687,864**	651,687,864	-	-	-	-
ලාභ/අලාභ තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	0.0000	**-**	-	-	-	-	-
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	1.3005	**10,867,425**	34,125	1,076,988	-	9,756,312	-
ජා.මු.අ. සම්බන්ධ වත්කම්	2.9160	**2,006,502**	2,006,502	-	-	-	-
මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්		**664,561,791**	653,728,491	1,076,988	-	9,756,312	-
පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්							
ජා.මු.අ. සම්බන්ධ වත්කම්		**279,414,572**	29,523	-	-	377,081	279,007,968
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		**401,580**	401,580	-	-	-	-
අනෙකුත් ලැබිය යුතු දෑ		**37,022,631**	37,022,631	-	-	-	-
මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්		**316,838,783**	37,453,734	-	-	377,081	279,007,968
මූළු විදේශීය මූල්‍ය වත්කම්		**981,400,574**	691,182,225	1,076,988	-	10,133,393	279,007,968
පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්							
ජා.මු.අ.	3.9160	**385,639,212**	28,807,533	33,580,393	-	308,932,705	14,318,581
ආසියානු නිශ්කාෂණ සංගමය	0.0100	**736,258,129**	736,258,129	-	-	-	-
මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්		**1,121,897,341**	765,065,662	33,580,393	-	308,932,705	14,318,581
පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්							
බැංකු සහ මූල්‍ය ආයතන		**146,408,028**	146,408,028	-	-	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		**71,697,994**	5,537,140	5,238,797	11,469,456	40,991,347	8,461,254
ජා.මු.අ.		**742,285,880**	-	-	-	-	742,285,880
අනිකුත් විදේශීය වගකීම්		**594,383,451**	73,060,874	521,322,577	-	-	-
මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්		**1,554,775,353**	225,006,042	526,561,374	11,469,456	40,991,347	750,747,134
මුළු විදේශීය මූල්‍ය වගකීම්		**2,676,672,694**	990,071,704	560,141,767	11,469,456	349,924,052	765,065,715
විදේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය		**(457,335,550)**	(111,337,171)	(32,503,405)	-	(299,176,394)	(14,318,580)
දේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය :							
පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්							
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	4.7333	**2,498,995,015**	2,481,264,384	-	15,768,874	1,961,757	-
ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිළදී ගත් සුරැකුම්පත්	15.5000	**698,069,219**	698,069,219	-	-	-	-
බැංකුවලට දෙන ලද ණය	1.0000	**28,257,902**	26,398,994	196,759	1,561,865	100,284	-
අනිකුත් වත්කම් - සේවක ණය	3.3688	**8,053,421**	261,770	226,096	461,704	1,469,430	5,634,421
- අනෙකුත්	9.0352	**18,556,718**	1,763,964	2,738,646	1,696,628	5,502,281	6,855,199
මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්		**3,251,932,275**	3,207,758,331	3,161,501	19,489,071	9,033,752	12,489,620
පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්							
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්		**235,638,700**	235,638,700	-	-	-	-
අනෙකුත් වත්කම් - අනෙකුත්		**3,572,421**	3,572,421	-	-	-	-

අනෙකුත් විස්තිරණ ආදායම තුළින් සාධාරණ මිලට ඇති ප්‍රාග්ධන ආයෝජන		**1,817,132**	-	-	-	-	1,817,132
මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්		**241,028,254**	239,211,121	-	-	-	1,817,132
මූළු දේශීය මූල්‍ය වත්කම්		**3,492,960,529**	3,446,969,452	3,161,501	19,489,071	9,033,752	14,306,752
පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්							
නිත්‍ය තැන්පතු පහසුකම්	14.5000	**330,637,059**	330,637,059	-	-	-	-
මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්		**330,637,059**	330,637,059	-	-	-	-
පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්							
බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු		**323,046,181**	323,046,181	-	-	-	-
රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු		**221,411**	221,411	-	-	-	-
සංසරණයෙහි පවතින මුදල්		**1,026,567,252**	1,026,567,252	-	-	-	-
අනිකුත් ගෙවිය යුතු දෑ		**68,320,347**	68,320,347	-	-	-	-
මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්		**1,418,155,191**	1,418,155,191	-	-	-	-
මුළු දේශීය මූල්‍ය වගකීම්		**1,748,792,250**	1,748,792,250	-	-	-	-
දේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය		**2,921,295,216**	2,877,121,272	3,161,501	19,489,071	9,033,752	12,489,620

විදේශ මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය:	**භරිත සාමාන්‍ය පොළී අනුපාතය**	**2021 එකතුව**	**හය මසක් හෝ අඩු**	**මාස 6 සිට 12 දක්වා**	**වර්ෂ 1 සිට 2 දක්වා**	**වර්ෂ 2 සිට 5 දක්වා**	**වර්ෂ 5 ට වැඩි**
	%	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්							
මුදල් හා මුදල් සමානයන්	0.3942	512,762,452	512,762,452	-	-	-	-
අනෙකුත් විස්තිරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	1.0799	8,818,244	44,216	-	2,798,126	5,975,902	-
ජා. මූ. අ. සම්බන්ධ වත්කම්	0.0770	38,244,608	38,244,608	-	-	-	-
මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වත්කම්		559,825,304	551,051,276	-	2,798,126	5,975,902	-
පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්							
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්		149,801,229	549	-	-	216,785	149,583,895
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		54,022,836	396,731	981,508	1, 980,676	33, 823,817	16,840,104
මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වත්කම්		203,824,065	397,280	981,508	1, 980,676	34,040,602	166,423,999
මූළු විදේශීය මූල්‍ය වත්කම්		763,649,369	551,448,556	981,508	4,778,802	40,016,504	166,423,999
විදේශ මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය:							
පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්							
ජා.මූ.අ.	1.0770	253,476,994	12,582,348	16,744,203	-	200,569,216	23,581,227
ආසියානු නිශ්කාෂණ සංගමය	0.0900	104,764,616	104,764,616	-	-	-	-
මුළු පොළී සංවේදී විදේශීය මූල්‍ය වගකීම්		358,241,610	117,346,964	16,744,203	-	200,569,216	23,581,227
පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්							
බැංකු හා මූල්‍ය ආයතන		13,701	13,701	-	-	-	-
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ		1,139,323	909,548	229,775	-	-	-
ජා.මූ.අ.		416,588,249	-	-	-	-	416,588,249
අනෙකුත් විදේශ වගකීම්		357,295,676	40,161,167	317, 134, 509	-	-	-
මුළු පොළී සංවේදී නොවන විදේශීය මූල්‍ය වගකීම්		775,036,949	41,084,416	317,364, 284	-	-	416,,588,249
මුළු විදේශීය මූල්‍ය වගකීම්		1,133,278,559	158,431,380	334,108,487	-	200,569,216	440,169,476
විදේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය		201,583,694	433,704,312	(16,744,203)	2,798,126	(194,593,314)	(23,581,227)

දේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය :							
පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්							
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	5.1119	1,377,820,347	1,018,529,204	336,001,028	482,143	22,807,972	-
ප්‍රතිවිකිණීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් සුරැකුම්පත්	7.2022	567,532,312	567,532,312	-	-	-	-
බැංකුවලට දෙන ලද ණය	1.0007	90,572,746	70,896,466	18,461,922	1,206,709	7,649	-
අනිකුත් වත්කම් - සේවක ණය	3.3012	8,073,335	437,218	263,936	539,529	1,723,015	5,109,637
- අනෙකුත්	9.9582	21,870,406	6,509,990	488,099	3,196,792	5,483,148	6,192,377
මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වත්කම්		2,065,869,146	1,663,905,190	355,214,985	5,425,173	30,021,784	11,302,014
පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්							
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්		150,128,800	150,128,800	-	-	-	-
අනෙකුත් වත්කම් - අනෙකුත්		4,120,029	4,120,029	-	-	-	-
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති ප්‍රාග්ධන ආයෝජන		1,671,218	-	-	-	-	1,671,218
මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වත්කම්		155,920,047	154,248,829	-	-	-	1,671,218
මූළු දේශීය මූල්‍ය වත්කම්		2,221,789,193	1,818,154,019	355,214,985	5,425,173	30,021,784	12,973,232
පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්							
නිත්‍ය තැන්පතු පහසුකම	5.0000	101,062,880	101,062,880	-	-	-	-
මුළු පොළී සංවේදී දේශීය මූල්‍ය වගකීම්		101,062,880	101,062,880	-	-	-	-
පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්							
බැංකු සහ මූල්‍ය ආයතන විසින් තැන්පතු		300,704,162	300,704,162	-	-	-	-
රජය සහ රජයේ ආයතන විසින් තැන්පතු		1, 392,301	1, 392,301	-	-	-	-
සංසරණයේ පවතින මුදල්		1,005,099,066	1,005,099,066	-	-	-	-
අනිකුත් ගෙවිය යුතු දෑ		19,163,882	19,163,882	-	-	-	-
මුළු පොළී සංවේදී නොවන දේශීය මූල්‍ය වගකීම්		1,326,359,411	1,326,359,411	-	-	-	-
මුළු දේශීය මූල්‍ය වගකීම්		1,427,422,291	1,427,422,291	-	-	-	-
දේශීය මුදල් පොළී අනුපාත සංවේදිතා අන්තරය		1,964,806,266	1,562,842,310	355,214,985	5,425,173	30,021,784	11,302,014

48.3 විදේශීය මුදල් අවදානම

බැංකුවේ විදේශීය සංචිත කළමනාකරණ කාර්යය යටතේ දරන්නා වූ විදේශීය වත්කම් තුළින් බැංකුවෙහි විදේශ මුදල් කටයුතු නිරූපණය වේ. විදේශ විනිමය වෙළෙඳපොළේ වෙනස්වීම් හේතුවෙන් බැංකුව, විනිමය අවදානමට විවෘත වේ. මුදල් මණ්ඩලය සහ විදේශ සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුව විසින් බැංකුවේ විදේශ සංචිතයෙහි විවිධ මුදල් වර්ගවලින් දැරිය යුතු ප්‍රතිශත ප්‍රමාණයක් නියම කර තිබේ. මුදල් වෙන්කිරීම පිළිබඳව තීරණය කිරීමේ දී රාජ්‍ය ණය ආපසු ගෙවීමේ අවශ්‍යතාවයන් සැලකිල්ලට ගනු ලැබේ. එබැවින් බැංකුව විසින් ප්‍රධාන මුදල් වර්ග බොහොමයක්, එනම් ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්, ස්ටර්ලිං පවුම්, ජපන් යෙන්, යුරෝ, ඕස්ට්‍රේලියන් ඩොලර්, චීන යුආන් හා නවසීලන්ත ඩොලර් රඳවා ගනු ලබයි. විදේශීය මුදල් මත පනවා ඇති සීමාවන්ට අනුකූලවීම නිරන්තර සුපරීක්ෂණයට භාජනය වේ.

විදේශ මුදල් සඳහා ශුද්ධ නිරාවරණය

2022 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල්වලට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ නිරාවරණය පහත පරිදි වේ.

	මුදල් වර්ගය									
2022 දෙසැම්බර් 31 දිනට	ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්	යුරෝ	ජපන් යෙන්	ස්ටර්ලිං පවුම්	විශෙෂ	ඕස්ට්‍රේලියානු ඩොලර්	කැනේඩියානු ඩොලර්	නවසීලන්ත ඩොලර්	අනිකුත් මුදල්	සියළුම මුදල් වර්ගවල එකතුව
විදේශීය මූල්‍ය වත්කම්	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
මුදල් හා මුදල් සමානයන්	118,593,473	2,002,372	130,117	373,692	-	62,567	17,653	10, 635	531,342,187	**652,532,696**
ලාභ/අලාභ තුළින් සාධාරණ මිලට ඇති හා අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරකුම්පත්	10,867,425	-	-	-	-	-	-	-	-	**10,867,425**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	-	-	-	-	-	-	401,580	**401,580**
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	-	-	-	-	281,421,082	-	-	-	-	**281,421,082**
අනෙකුත් ලැබිය යුතු දෑ	63,061,108	-	-	-	-	-	-	-	-	**63,061,108**
මුළු විදේශීය මූල්‍ය වත්කම්	192,522,006	2,002,372	130,117	373,692	281,421,082	62,567	17,653	10.635	531,743,767	**1,008,283,891**
සමානුපාතය	19.09%	0.20%	0.01%	0.04%	27.91%	0.01%	0.00%	0.00%	52.74%	**100%**
විදේශීය මූල්‍ය බැරකම්										
බැංකු හා මූල්‍ය ආයතන	146,407,286	-	-	687	-	55	-	-	-	**146,408,028**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	-	-	-	-	-	-	71,697,994	**71,697,994**
ආසියානු නිශ්කාෂණ සංගමය	736,258,128	-	-	-	-	-	-	-	-	**736,258,128**
ජා.මූ.අ.	-	-	-	-	1,127,925,092	-	-	-	-	**1,127,925,092**
අනෙකුත්	74,083,264	-	-	-	-	12	-	-	520,300,174	**594,383,450**
මුළු විදේශීය මූල්‍ය බැරකම්	956,748,678	-	-	687	1,127,925,092	67	-		596,113,648	**2,676,672,692**
සමානුපාතය	35.74%	0.00%	0.00%	0.00%	42.141%	0.00%	0.00%	0.00%	22.24%	**100%**
ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය	(764,226,672)	2,002,372	130,117	373,005	(846,504,010)	62,500	17.653	10,635	(60,254,401)	**(1,668,388,801)**

වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මූල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ.

2022 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකා රුපියල්	ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්	ස්ටර්ලිං පවුම්
	රු. 000	රු. 000	රු. 000
මිලදී ගැනුම්	38,782,950	242,870,513	5,467,529
විකුණුම්	(186,160,301)	(38,126,550)	-
ඉදිරි ප්‍රති ගිණුම	-	-	-

2021 දෙසැම්බර් 31 දිනට ප්‍රධාන මුදල්වලට ශ්‍රී ලංකා මහ බැංකුවේ ශුද්ධ නිරාවරණය පහත පරිදි වේ.

	මුදල් වර්ගය									
2021 දෙසැම්බර් 31 දිනට	ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්	යුරෝ	ජපන් යෙන්	ස්ටර්ලිං පවුම්	විශෙෂ	ඕස්ට්‍රේලියානු ඩොලර්	කැනේඩියානු ඩොලර්	නවසීලන්ත ඩොලර්	අනිකුත් මුදල්	සියළුම මුදල් වර්ගවල එකතුව
	රු. 000	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**
විදේශීය මූල්‍ය වත්කම්										
මුදල් හා මුදල් සමානයන්	138,000,677	568,045	9,461,477	1,996,158	-	650,773	31,353	11,271	362,128,066	512,847,820
ලාභ/අලාභ තුළින් සාධාරණ මිලට ඇති හා අනිකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති	8,818,244	-	-	-	-	-	-	-	-	8,818,244
සුරැකුම්පත්	55,853	-	-	-	-	-	-	-	53,966,983	54,022,836
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	-	-	188,045,840	-	-	-	-	188,045,840
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	146,874,774	568,045	9,461,477	1,996,158	188,045,840	650,773	31,353	11,271	416,095,049	763,734,740
මුළු විදේශීය මූල්‍ය වත්කම්	19.23%	0.08%	1.24%	0.26%	24.62%	0.09%	0.00%	0.00%	54.48%	100.00%
සමානුපාතය										
විදේශීය මූල්‍ය බැරකම්										
බැංකු හා මූල්‍ය ආයතන	13,641	-	-	-	-	-	-	-	60	13,701
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	-	-	-	-	-	-	-	1,139,323	1,139,323
ආසියානු නිශ්කාෂණ සංගමය	104,764,616	-	-	-	-	-	-	-	-	104,764,616
ජා.මූ.අ.	480,115	-	-	-	669,585,128	-	-	-	-	670,065,243
අනෙකුත්	41,662,689	-	-	-	-	-	-	-	315,632,987	357,295,676
මුළු විදේශීය මූල්‍ය බැරකම්	146,921,061	-	-	-	669,585,128	-	-	-	316,772,370	1,133,278,559
සමානුපාතය	12.97%	0.00%	0.00%	0.00%	59.08%	0.00%	0.00%	0.00%	27.95%	100.00%
ශුද්ධ විදේශීය මුදල් නිරාවරණය	(46,287)	568,045	9,461,477	1,996,158	(481,539,288)	650,773	31,353	11,271	99,322,679	(369,543,819)

වත්මන් මූල්‍ය වර්ෂයට අදාල වෙළෙඳ දිනයන් සහිත හා තක්සේරු දිනයන් මීලඟ මූල්‍ය වර්ෂයට අදාලව සිදුවීමට නියමිත විදේශ විනිමය ගණුදෙනු මුදල් හා මුදල් සමානයන් තුළ අඩංගු වේ. එම ගණුදෙනු පහත පරිදි වේ

2021 දෙසැම්බර් 31 දිනට	ශ්‍රී ලංකා රුපියල්	ඇමෙරිකා එක්සත් ජනපද ඩොලර්	ජපන් යෙන්
	රු. 000	**රු. 000**	**රු. 000**
මිලදී ගැනුම්	145,161,075	50,073,176	-
විකුණුම්	(45,145,128)	(147,228,648)	(4,876,735)
ඉදිරි ප්‍රති ගිණුම	2,016,260	-	-

පහත සඳහන් විනිමය අනුපාතිකයන් බැංකුව විසින් යොදාගන්නා ලදී.

	සාමාන්‍ය අනුපාතය		වර්ෂ අවසාන එතැන් අනුපාතය	
මුදල් වර්ගය	**2022**	**2021**	**2022**	**2021**
	රු.	රු.	රු.	රු.
ඇ.එ.ජ. ඩොලර් 1	**328.1818**	200.1553	**363.1100**	200.4338
යූරෝ 1	**343.2079**	236.2532	**388.3461**	227.8832
ජපන් යෙන් 1	**2.4762**	1.8137	**2.7704**	1.7417
ස්ටර්ලින් පවුම් 1	**400.7632**	275.2172	**437.4023**	271.2270
වි.ගැ.හි. 1	**436.4326**	285.0534	**483.3276**	280.9312
ඕස්ට්‍රේලියානු ඩොලර් 1	**226.3545**	149.8331	**247.0237**	145.5851

සංවේදිතා විශ්ලේෂණය

වාර්තාකරණ දිනය ප්‍රකාරව ඉහත සඳහන් මුදල් වර්ගයක් ශ්‍රී ලංකා රුපියලට එරෙහිව සාධාරණ ලෙස ශක්තිමත් වීම/(දුර්වල වීම), විදේශීය මුදල් වලින් මූල්‍ය උපකරණ මිනුම් කිරීම මත බලපෑමක් ඇති කරනු ලැබූ අතර, ලාභය හෝ අලාභය කෙරෙහි පහත පෙන්වන පරිදි බලපා ඇත.

	ලාභයන් හෝ අලාභය	
	ශක්තිමත් වීම	දුර්වල වීම
2022 දෙසැම්බර් 31	රු. **000**	රු. **000**
ඇ.එ.ජ. ඩොලර් (5% විචලනය)	(38,211,334)	38,211,334
යූරෝ (5% විචලනය)	100,119	(100,119)
ජපන් යෙන් (5% විචලනය)	6,506	(6,506)
ස්ටර්ලින් පවුම් (5% විචලනය)	18,650	(18,650)
වි.ගැ.හි. (5% විචලනය)	(42,325,201)	42,325,201
ඕස්ට්‍රේලියානු ඩොලර් (5% විචලනය)	3,125	(3,125)

	ලාභයන් හෝ අලාභය	
	ශක්තිමත් වීම	දුර්වල වීම
2021 දෙසැම්බර් 31	රු. **000**	රු. **000**
ඇ.එ.ජ. ඩොලර් (5% විචලනය)	(2,314)	2,314
යූරෝ (5% විචලනය)	28,402	(28,402)
ජපන් යෙන් (5% විචලනය)	473,074	(473,074)
ස්ටර්ලින් පවුම් (5% විචලනය)	99,808	(99,808)
වි.ගැ.හි. (5% විචලනය)	(24,076,964)	24,076,964
ඕස්ට්‍රේලියානු ඩොලර් (5% විචලනය)	32,539	(32,539)

48.4 මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම්

2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම් පහත පරිදි වේ.

2022 දෙසැම්බර් 31 දිනට	මාස 6ට අඩු රු. **000**	මාස 6 සිට වර්ෂ 1 දක්වා රු. **000**	වර්ෂ 1 සිට 2 දක්වා රු. **000**	වර්ෂ 2 සිට 5 දක්වා රු. **000**	වර්ෂ 5ට වැඩි රු. **000**	එකතුව රු. **000**
විදේශීය මූල්‍ය වත්කම්						
මුදල් හා මුදල් සමානයන්	651,687,864	-	-	-	-	651,687,864
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	76,939	1,166,269	122,550	11,138,399	-	12,504,157
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	2,036,025	-	-	377,081	279,007,968	281,421,074
අනිකුත් ලැබිය යුතු දෑ	37,022,631	-	-	-	-	37,022,631
මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම්	690,823,459	1,166,269	122,550	11,515,480	279,007,968	982,635,726
දේශීය මූල්‍ය වත්කම්						
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	2,576,853,759	1,110,750	1,648,793	162,211	-	2,579,775,513
නැවත විකිණීමේ ගිවිසුම් මත මිලදීගත් සුරැකුම්පත්	698,069,219	-	-	-	-	698,069,219
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	235,638,700	-	-	-	-	235,638,700
මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	-	-	-	1,817,132	1,817,132
බැංකු සඳහා දෙන ලද ණය	17,790,731	2,406,273	3,778,538	5,463,674	-	29,439,216
අනෙකුත් වත්කම්	10,080,599	2,433,073	4,303,462	12,088,605	108,728,649	137,634,388
මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්	3,538,433,008	5,950,096	9,730,793	17,714,490	110,545,781	3,682,374,168
මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්	4,229,256,467	7,116,365	9,853,343	29,229,970	389,553,749	4,665,009,894
විදේශීය මූල්‍ය වගකීම්						
බැංකු සහ මූල්‍ය ආයතන	146,408,028	-	-	-	-	146,408,028
ආසියානු නිශ්කාසන සංගමය	736,258,129	-	-	-	-	736,258,129
ජා.මූ.අ.	42,676,142	47,398,218	102,078,683	264,345,549	994,038,353	1,450,536,945
අනෙකුත්	73,060,873	521,322,578	-	-	-	594,383,451
මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්	998,403,172	568,720,796	102,078,683	264,345,549	994,038,353	2,927,586,553
දේශීය මූල්‍ය වගකීම්						
බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු	323,046,181	-	-	-	-	323,046,181
රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු	221,411	-	-	-	-	221,411
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත අලෙවි කළ සුරැකුම්පත් හා නිත්‍ය තැන්පතු පහසුකම	330,637,059	-	-	-	-	330,637,059
සංසරණයෙහි පවත්නා මුදල්	1,026,567,252	-	-	-	-	1,026,567,252
අනෙකුත් ගෙවිය යුතු දෑ	68,320,347	-	-	-	-	68,320,347
මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්	1,748,792,250	-	-	-	-	1,748,792,250
මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්	2,747,195,422	568,720,796	102,078,683	264,345,549	994,038,353	4,676,378,803
ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම් / (වගකීම්)	1,482,061,045	(561,604,431)	(92,225,340)	(235,115,579)	(604,484,604)	(11,368,909)

	මාස 6ට අඩු	මාස 6 සිට වර්ෂ 1 දක්වා	වර්ෂ 1 සිට 2 දක්වා	වර්ෂ 2 සිට 5 දක්වා	වර්ෂ 5ට වැඩි දක්වා	එකතුව
2022 දෙසැම්බර් 31 දිනට	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්	27,845,531	5,982,333	14,498,792	51,034,302	6,360,968	105,721,926
ව්‍යුත්පන්න මූල්‍ය වගකීම්	31,340,783	10,620,241	25,779,358	89,890,059	10,076,303	167,706,744

විදේශීය මුදල් පරිවර්තනය

විදේශීය මූල්‍ය වත්කම් හා වගකීම්වලට සම්බන්ධ සියළුම අනාගත මූල්‍ය ප්‍රවාහ, වාර්තාගතකරණ මුදල් ඒකකයට පරිවර්තනය කර ඇත්තේ, වාර්තාකරණ දිනයට අදාළ විනිමය අනුපාතිකයටයි.

2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වත්කම් හා වගකීම් හි වට්ටම් නොකළ මුදල් ප්‍රවාහවල ගිවිසුම්ගත කල් පිරීම් පහත පරිදි වේ.

2021 දෙසැම්බර් 31 දිනට	මාස 6ට අඩු රු. 000	මාස 6 සිට වර්ෂ 1 දක්වා රු. 000	වර්ෂ 1 සිට 2 දක්වා රු. 000	වර්ෂ 2 සිට 5 දක්වා රු. 000	වර්ෂ 5 ට වැඩි රු. 000	එකතුව රු. 000
විදේශීය මූල්‍ය වත්කම්						
මුදල් හා මුදල් සමානයන්	512,762,452	-	-	-	-	512,762,452
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරැකුම්පත්	72,720	72,720	2,851,296	6,215,953	-	9,212,689
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	38,245,157	-	-	216,785	149,583,895	188,045,837
අනිකුත් ලැබිය යුතු දෑ	551,080,329	72,720	2,851,296	6,432,738	149,583,895	710,020,978
මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වත්කම්						
දේශීය මූල්‍ය වත්කම්						
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	1,039,925,021	356,959,017	2,731,167	24,517,061	-	1,424,132,266
නැවත විකිණීමේ ගිවිසුම මත මිලදීගත් සුරැකුම්පත්	567,532,312	-	-	-	-	567,532,312
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	150,128,800	-	-	-	-	150,128,800
මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	-	-	-	1,671,218	1,671,218
බැංකු සඳහා දෙන ලද ණය	79,700,303	4,111,486	4,107,462	3,432,763	-	91,352,014
අනෙකුත් වත්කම්	13,862,510	1,675,011	5,311,071	10,164,003	15,569,723	46,582,318
මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වත්කම්	1,851,148,946	362,745,514	12,149,700	38,113,827	17,240,941	2,281,398,928
මුළු වට්ටම් නොකළ මූල්‍ය වත්කම්	2,402,229,275	362,818,234	15,000,996	44,546,565	166,824,836	2,991,419,906
විදේශීය මූල්‍ය වගකීම්						
බැංකු සහ මූල්‍ය ආයතන	13,701	-	-	-	-	13,701
ආසියානු නිශ්කාෂන සංගමය	104,764,616	-	-	-	-	104,764,616
ජා.මූ.අ.	16,817,583	15,339,852	38,786,708	135,825,841	475,810,517	682,580,501
අනෙකුත්	40,161,167	317,134,509	-	-	-	357,295,676
මුළු වට්ටම් නොකළ විදේශීය මූල්‍ය වගකීම්	161,757,067	332,474,361	38,786,708	135,825,841	475,810,517	1,144,654,494
දේශීය මූල්‍ය වගකීම්						
බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු	300,704,162	-	-	-	-	300,704,162
රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු	1,392,301	-	-	-	-	1,392,301
ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් මත අලෙවි කළ සුරැකුම්පත් හා නිත්‍ය තැන්පතු පහසුකම	101,062,880	-	-	-	-	101,062,880
සංසරණයෙහි පවත්නා මුදල්	1,005,099,066	-	-	-	-	1,005,099,066
අනෙකුත් ගෙවිය යුතු දෑ	19,163,882	-	-	-	-	19,163,882
මුළු වට්ටම් නොකළ දේශීය මූල්‍ය වගකීම්	1,427,422,291	-	-	-	-	1,427,422,291
මුළු වට්ටම් නොකළ මූල්‍ය වගකීම්	1,589,179,358	332,474,361	38,786,708	135,825,841	475,810,517	2,572,076,785
ශුද්ධ වට්ටම් නොකළ මූල්‍ය වත්කම් / (වගකීම්)	813,049,917	30,343,873	(23,785,712)	(91,279,276)	(308,985,681)	419,343,121

	මාස 6ට අඩු	මාස 6 සිට වර්ෂ 1 දක්වා	වර්ෂ 1 සිට 2 දක්වා	වර්ෂ 2 සිට 5 දක්වා	වර්ෂ 5ට වැඩි	එකතුව
	රු. 000	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**	**රු. 000**
2020 දෙසැම්බර් 31 දිනට						
ව්‍යුත්පන්න මූල්‍ය වත්කම්	17,388,862	14,913,000	5,154,573	45,842,140	16,748,562	100,047,137
ව්‍යුත්පන්න මූල්‍ය වගකීම්	16,884,671	15,032,535	5,260,986	46,097,369	16,698,942	99,974,503

48.5 ද්‍රවශීලතා අවදානම

මූල්‍ය ලියවිලි ආශ්‍රිත බැඳීම් සපුරාලීමට අවශ්‍යවන අරමුදල් කෙටි දැනුම්දීමක දී සපයා ගැනීම සඳහා ඒකකයක් විසින් මුහුණපානු ලබන දුෂ්කරතා, ද්‍රවශීලතා අවදානම වේ. ඒකකයකට තම මූල්‍ය වත්කම් ඉක්මණින්, සාධාරණ අගයට වඩා ඉතා අඩු මිලකට විකිණීමට සිදුවීම ද ද්‍රවශීලතා අවදානමකි.

(අ) බැංකුවේ විදේශීය මුදල් වත්කම් සංයුතිය නිශ්චය කිරීමේදී ද ප්‍රධාන වශයෙන් සැලකිලිමත් වන්නේ ද්‍රවශීලතාවය සම්බන්ධයෙනි. අවශ්‍ය අවස්ථාවන්හි දී මැදිහත්වීමේ කාර්යයන් ද රාජ්‍ය ණය සහ ජා.මූ.අ. ණය ආපසු ගෙවීම වැනි වූ බැඳීම් බේරුම් කිරීම සඳහා ද විදේශීය සංචිත ඈවර කිරීමේ විභව අවශ්‍යතාවය මෙයින් ගම්‍ය වේ. අරමුදල්වලට ඉක්මණින් ප්‍රවේශවීම තහවුරු කර ගැනීම සඳහා බැංකුව පහත සඳහන් මිනුම් යොදා ගනී.

- රඳවාගෙන ඇති සුරක්‍රුම්පත්වල ද්‍රවශීලතා ලක්ෂණයන් පදනම් කළ ද්‍රවශීලතා වත්කම් අනුපාත.
- එක් එක් මුදල් වර්ගයෙන් සහ එක් එක් ප්‍රතිපාර්ශ්වය සමග රඳවා ගත හැකි සංචිතවල උපරිම සංකලනය වන සීමාවන්.

(ආ) විවිට වෙළෙඳපොල කටයුතු වැනි දේශීය මුදල් ඒකකයන් භාවිතා කරමින් කරන කටයුතුවල ද්‍රවශීලතා අවදානම අඩු කිරීම සඳහා ඉතා ද්‍රවශීලී වෙළෙඳපොළ උපකරණ වන භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර, ඇප සුරක්‍රුම් ලෙස භාවිතා කර ඇත. මහ බැංකු සුරක්‍රුම්පත්, භාණ්ඩාගාර බිල්පත් ප්‍රතිමිලදී ගැනීම්/විකිණීම් හා ඇමෙරිකානු එක්සත් ජනපද ඩොලර් මත ශ්‍රී ලංකා රුපියල් හුවමාරු වැනි උපකරණ භාවිතයෙන්, විදීම් හා උකහා ගැනීම් ඔස්සේ බැංකු පද්ධතියේ දෛනික ද්‍රවශීලතා තත්වය කළමනාකරණය කරනු ලබයි.

(ඇ) අනාගත මූල්‍යනයට සහාය වීම සඳහා පවතින මූල්‍ය වත්කම්

අනාගත මූල්‍යනයට සහාය වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සතු මූල්‍ය වත්කම් පහත සටහනින් දැක්වේ.

2022 දෙසැම්බර් 31 දිනට	යටත් වූ ඇපකරයක් ලෙස ඔඩපන කළ රු. 000	යටත් නොවූ ඇපකරයක් ලෙස යොදාගත හැකි රු. 000	එකතුව රු. 000
විදේශීය මූල්‍ය වත්කම්			
මුදල් හා මුදල් සමානයන්	-	651,687,864	**651,687,864**
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරක්‍රුම්පත්	1,090,124	9,777,301	**10,867,425**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	401,580	**401,580**
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	-	281,421,074	**281,421,074**
අනෙකුත් ලැබිය යුතු දෑ	-	37,022,631	**37,022,631**
දේශීය මූල්‍ය වත්කම්			
ශ්‍රී ලංකා රජයේ සුරක්‍රුම්පත්	-	2,498,995,015	**2,498,995,015**
නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරක්‍රුම්පත්	-	698,069,219	**698,069,219**
රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම්	-	235,638,700	**235,638,700**
මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	1,817,132	**1,817,132**
බැංකු සඳහා දෙන ලද ණය	-	28,257,902	**28,257,902**
අනෙකුත් වත්කම්	-	30,182,645	**30,182,645**
මුළු වත්කම්	1,090,124	4,473,271,064	**4,474,361,188**

2021 දෙසැම්බර් 31 දිනට	යටත් වූ ඇපකරයක් ලෙස ඔඩපන කළ රු. 000	යටත් වූ ඇපකරයක් ලෙස යොදාගත හැකි රු. 000	එකතුව රු. 000
විදේශීය මූල්‍ය වත්කම්			
මුදල් හා මුදල් සමානයන්	-	512,762,452	512,762,452
අනෙකුත් විස්තීරණ ආදායම් තුළින් සාධාරණ මිලට ඇති සුරක්‍රුම්පත්	2,830,756	5,987,488	8,818,244
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	54,022,836	54,022,836
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	-	188,045,837	188,045,837
දේශීය මූල්‍ය වත්කම්			
ශ්‍රී ලංකා රජයේ සුරක්‍රුම්පත්	-	1,377,820,347	1,377,820,347
නැවත විකිණීමේ එකඟතාවය මත මිලදී ගත් සුරක්‍රුම්පත්	-	567,532,312	567,532,312
රජයට දෙනු ලැබූ කාලීන අත්තිකාරම්	-	150,128,800	150,128,800
මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	1,671,218	1,671,218
බැංකු සඳහා දෙන ලද ණය	-	90,572,746	90,572,746
අනෙකුත් වත්කම්	-	34,063,770	34,063,770
මුළු වත්කම්	2,830,756	2,982,607,806	2,985,438,562

49. මූල්‍ය වත්කම් හා වගකීම්

49.1 මූල්‍ය වත්කම් හා වගකීම් වර්ගීකරණය

මූල්‍ය තත්ව ප්‍රකාශනයේ පේළි අයිතම සහ මූල්‍ය උපකරණ කාණ්ඩයන් අතර සැසඳුමක් පහත සටහනින් සපයයි.

	ලාභ/අලාභ මගින් සාධාරණ අගය	අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ණය උපකරණ	අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ස්කන්ධ උපකරණ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
2022 දෙසැම්බර් 31 දිනට	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය වත්කම්					
මුදල් හා මුදල් සමානයන්	-	-	-	651,687,864	**651,687,864**
අනිකුත් විස්තීරණ ආදායම මත සාධාරණ මිලට ඇති සුරකුම්පත්	-	10,867,425	-	-	**10,867,425**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	401,580	-	-	-	**401,580**
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්	280,406,015	-	-	1,015,059	**281,421,074**
අනිකුත් ලැබිය යුතු දෑ	-	-	-	37,022,631	**37,022,631**
මුළු විදේශීය මූල්‍ය වත්කම්	280,807,595	10,867,425	-	689,725,554	**981,400,574**
දේශීය මූල්‍ය වත්කම්					
ශ්‍රී ලංකා රජයේ සුරකුම්පත්	-	2,498,995,015	-	-	**2,498,995,015**
නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරකුම්පත්	-	-	-	698,069,219	**698,069,219**
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	-	-	-	235,638,700	**235,638,700**
මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	-	1,817,132	-	**1,817,132**
බැංකු සඳහා දෙන ලද ණය	-	-	-	28,257,902	**28,257,902**
අනෙකුත් වත්කම්	-	-	-	30,182,560	**30,182,560**
මුළු දේශීය මූල්‍ය වත්කම්	-	2,498,995,015	1,817,132	992,148,381	**3,492,960,528**
විදේශීය මූල්‍ය බැරකම්					
බැංකු සහ මූල්‍ය ආයතන	-	-	-	146,408,028	**146,408,028**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	71,697,994	-	-	-	**71,697,994**
ආසියානු නෂ්කාගන සංගමය	-	-	-	736,258,129	**736,258,129**
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)	-	-	-	1,127,925,092	**1,127,925,092**
අනෙකුත්	-	-	-	594,383,451	**594,383,451**
මුළු විදේශීය මූල්‍ය බැරකම්	71,697,994	-	-	2,604,974,700	**2,676,672,694**
දේශීය මූල්‍ය බැරකම්					
බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු	-	-	-	323,046,181	**323,046,181**
රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු	-	-	-	221,411	**221,411**
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරකුම්පත් සහ නිත්‍ය තැන්පතු පහසුකම	-	-	-	330,637,059	**330,637,059**
සංසරණයේ පවත්නා මුදල්	-	-	-	1,026,567,252	**1,026,567,252**
අනෙකුත් ගෙවිය යුතු දෑ	-	-	-	68,320,347	**68,320,347**
මුළු දේශීය මූල්‍ය බැරකම්	-	-	-	1,748,792,250	**1,748,792,250**

	ලාභ/අලාභ මගින් සාධාරණ අගය	අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ණය උපකරණ	අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ අගයට ඇති - ස්කන්ධ උපකරණ	ක්‍රමක්ෂය පිරිවැය	එකතුව
2021 දෙසැම්බර් 31 දිනට	රු. 000	රු. 000	රු. 000	රු. 000	රු. 000
විදේශීය මූල්‍ය වත්කම්					
මුදල් හා මුදල් සමානයන්	-	-	-	512,762,452	512,762,452
අනිකුත් විස්තීරණ ආදායම මත සාධාරණ මිලට ඇති සුරකුම්පත්	-	8,818,244	-	-	8,818,244
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	54,022,836	-	-	-	54,022,836
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.) සම්බන්ධ වත්කම්	187,404,111	-	-	641,726	188,045,837
මුළු විදේශීය මූල්‍ය වත්කම්	216,626,384	8,818,244	-	538,204,741	763,649,369
දේශීය මූල්‍ය වත්කම්					
ශ්‍රී ලංකා රජයේ සුරකුම්පත්	-	1,377,820,347	-	-	1,377,820,347
නැවත විකිණීමේ එකඟතාවය මත මිලදීගත් සුරකුම්පත්	-	-	-	567,532,312	567,532,312
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	-	-	-	150,128,800	150,128,800
මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි හිමිකරු ප්‍රාග්ධන ආයෝජන	-	-	1,671,218	-	1,671,218

බැංකු සඳහා දෙන ලද ණය	-	-	-	90,572,746	90,572,746
අනිකුත් වත්කම්	-	-	-	34,063,770	34,063,770
මුළු දේශීය මූල්‍ය වත්කම්	-	1,377,820,347	1,671,218	842,297,628	2,221,789,193
විදේශීය මූල්‍ය බැරකම්					
බැංකු සහ මූල්‍ය ආයතන	-	-	-	13,701	13,701
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,139,323	-	-	-	1,139,323
ආසියානු නිශ්කාශන සංගමය	-	-	-	104,764,616	104,764,616
ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (ජා.මූ.අ.)	-	-	-	670,065,243	670,065,243
අනිකුත්	-	-	-	357,295,676	357,295,676
මුළු විදේශීය මූල්‍ය බැරකම්	1,139,323	-	-	1,132,139,236	1,133,278,559
දේශීය මූල්‍ය බැරකම්					
බැංකු හා මූල්‍ය ආයතන විසින් තැන්පතු	-	-	-	300,704,162	300,704,162
රජයේ හා රජයේ ආයතන විසින් තැන්පතු	-	-	-	1,392,301	1,392,301
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරැකුම්පත් සහ නිත්‍ය තැන්පතු පහසුකම	-	-	-	101,062,880	101,062,880
සංසරණයේ පවත්නා මුදල්	-	-	-	1,005,099,066	1,005,099,066
අනෙකුත් ගෙවිය යුතු දෑ	-	-	-	19,163,882	19,163,882
මුළු දේශීය මූල්‍ය බැරකම්	-	-	-	1,427,422,291	1,427,422,291

50. සාධාරණ අගය පිළිබඳ හෙලිදරව් කිරීම්

50.1 වත්කම් හා වගකීම් වල සාධාරණ අගය

සාධාරණ අගය යනු වෙළඳපල ගණුදෙනුකරුවන් අතර සිදුවන ක්‍රමවත් ගනුදෙනුවක දී, මිනුම් ගත කරනු ලබන දිනයට, ප්‍රධාන වෙළඳපොළෙහි දී හෝ එවැනි ප්‍රධාන වෙළඳපොළක් නොමැති අවස්ථාවක දී එම දිනයේ දී ලඟා විය හැකි වඩාත් වාසි සහගත වෙළඳපොළෙහි දී, වත්කමක් විකිණීමෙන් ලැබෙන මුදල හෝ වගකීමක් හුවමාරු කිරීමේ දී ගෙවීමට සිදුවන මුදලයි. වගකීමක සාධාරණ අගය මගින් එම වගකීම ඉටු නොවීමේ අවදානම පිළිඹිබු වේ.

ගිණුම්කරණ ප්‍රතිපත්ති සටහන් 5.2 හි විස්තර කර ඇති පරිදි නිරීක්ෂණය කල හැකි වෙළඳපොළ මිල ගණන් නොමැති අවස්ථාවක දී මූල්‍ය වත්කම් හා වගකීම් වල සාධාරණ අගය තීරණය කිරීම සඳහා තක්සේරු ශිල්පයම භාවිතා කරයි.

නිරන්තර වෙළඳාම් සිදු නොවන සහ ඉතා අඩු මිල විනිවිදභාවයක් සහිත මූල්‍ය උපකරණ ඒවාහි නිවැරදි සාධාරණ අගය නිරූපණය නොකරයි. ඒවාහි සාධාරණ අගය මිණුම් කිරීමේදී, ද්‍රවශීලතාවය, සංකේන්ද්‍රය, වෙළඳපොළ සාධකයන්හි අවිනිශ්චිත බව, මිල උපකල්පන හා විශේෂිත උපකරණයන්ට බලපාන අනෙකුත් අවදානම් මත පදනම් වූ විවිධ මට්ටම්වල විනිශ්චයන් යොදාගනු ලැබේ.

මූල්‍ය උපකරණ සඳහා වූ සාධාරණ අගය ධූරාවලිය පහත දැක්වේ

පළමුවන මට්ටම : අනන්‍ය වත්කම හෝ වගකීම සඳහා ක්‍රියාකාරී වෙළඳපල තුළ හිමි ප්‍රකාශිත (නොගලපන ලද) මිල ගණන් භාවිතයෙන් සාධාරණ අගය මැනීම;

දෙවන මට්ටම : පළමුවන මට්ටමේ සඳහන් ප්‍රකාශිත මිල ගණන් නොවන, එහෙත් සෘජුව (උදා:- මිල ගණන්) හෝ වක්‍රව (උදා:- මිල ඔස්සේ තීරණය වුණු) වත්කම් හා වගකීම් සඳහා නිරීක්ෂිත යෙදවුම් භාවිතයෙන් සාධාරණ අගය මැනීම, සහ

තෙවන මට්ටම : නිරීක්ෂණය කළ හැකි වෙළඳපල දත්ත මත පදනම් නොවූ (උදා:- නිරීක්ෂණය කළ නොහැකි) යෙදවුම් භාවිතයෙන් වත්කම් හා වගකීම්හි සාධාරණ අගය මැනීම.

පහත දැක්වෙන වගුව මගින් සාධාරණ අගය ධූරාවලිය අනුව වාර්තා කරන ලද වත්කම් හා වගකීම්වල විශ්ලේෂණයක් පෙන්නුම් කරයි.

2022 දෙසැම්බර් 31 දිනට	පළමුවන මට්ටම රු. 000	දෙවන මට්ටම රු. 000	තෙවන මට්ටම රු. 000	එකතුව රු. 000
මූල්‍ය වත්කම්				
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට වූ සුරැකුම්පත්	10,867,425	-	-	**10,867,425**
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	401,580	-	**401,580**
ජා.මූ.අ. සම්බන්ධ වත්කම්	280,406,015	-	-	**280,406,015**
	291,273,440	401,580	-	**291,675,020**
මූල්‍ය නොවන විදේශ වත්කම්				
රන්	10,031,610	-	-	**10,031,610**
	10,031,610	-	-	**10,031,610**
දේශීය මූල්‍ය වත්කම්				
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	2,498,995,015	-	-	**2,498,995,015**
මූල්‍ය සහ රජයේ ආයතනයන්හි ස්කන්ධ ආයෝජන	-	-	1,817,132	**1,817,132**
	2,498,995,015	-	1,817,132	**2,500,812,147**
අනෙකුත් මූල්‍ය නොවන වත්කම්				
ඉඩම්	-	-	10,855,725	**10,855,725**
ගොඩනැගිලි	-	-	7,099,239	**7,099,239**
	-	-	17,954,964	**17,954,964**
මූල්‍ය වගකීම්				
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	71,697,994	-	**71,697,994**
	-	71,697,994	-	**71,697,994**

2021 දෙසැම්බර් 31 දිනට	පළමුවන මට්ටම රු. 000	දෙවන මට්ටම රු. 000	තෙවන මට්ටම රු. 000	එකතුව රු. 000
මූල්‍ය වත්කම්				
අනෙකුත් විස්තීරණ ආදායම තුළින් සාධාරණ මිලට වූ සුරැකුම්පත්	8,818,244	-	-	8,818,244
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	54,022,836	-	54,022,836
ජා.මු.අ. සම්බන්ධ වත්කම්	187,404,111	-	-	187,404,111
	196,222,355	54,022,836	-	250,245,191
මූල්‍ය නොවන විදේශ වත්කම්				
රන්	35,151,981	-	-	35,151,981
	35,151,981	-	-	35,151,981
දේශීය මූල්‍ය වත්කම්				
ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	1,377,820,347	-	-	1,377,820,347
මූල්‍ය සහ රජයේ ආයතනයන්හි ස්කන්ධ ආයෝජන	-	-	1,671,218	1,671,218
	1,377,820,347	-	1,671,218	1,379,491,565
අනෙකුත් මූල්‍ය නොවන වත්කම්				
ඉඩම්	-	-	10,855,725	10,855,725
ගොඩනැගිලි	-	-	7,099,239	7,099,239
	-	-	17,954,964	17,954,964
මූල්‍ය වගකීම්				
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	-	1,139,323	-	1,139,323
	-	1,139,323	-	1,139,323

මූල්‍ය හා අනෙකුත් ආයතනයන්හි ස්කන්ධ ආයෝජන

කොටසක ශුද්ධ වත්කම් තක්සේරු ශිල්ප ක්‍රමය භාවිතයෙන්, ස්කන්ධ ආයෝජනයන්හි සාධාරණ අගය ගණනය කරන ලදී.

නිරීක්ෂණය කළ නොහැකි සුවිශේෂී යෙදවුම්

කොටසක ශුද්ධ වත්කම් අගය

සංවේදීතා විශ්ලේෂණය

කොටසක ශුද්ධ වත්කම් අගයේ 10% ක වැඩිවීම හේතුවෙන් සාධාරණ අගය 10% කින් ඉහල යයි.

	2022 රු. 000	2021 රු. 000
ජනවාරි 1 දිනට ශේෂය	**1,671,218**	1,615,356
වර්ෂය තුළ එකතු කිරීම	**-**	-
අනෙකුත් විස්තීරණ ආදායමෙහි හඳුනාගත් සාධාරණ මිලට වූ ලාභය	**145,915**	55,862
දෙසැම්බර් 31 දිනට ශේෂය	**1,817,133**	1,671,218

ඉඩම් හා ගොඩනැගිලි

අගය කිරීමේ ක්‍රමය

සෘජු සන්සන්දනාත්මක ක්‍රමය සමඟ වෙළඳපොල ප්‍රවේශය භාවිතා කරමින් ඉඩම් අගය කරනු ලබන අතර එහිදී වත්කම නුදුරේදී සිදුකරන ලද සමාන වත්කමක විකුණුම් අගය සමඟ සංසන්දනය කොට එකී අගයට එකතු කළ හෝ නාමිකව එකතු කළ වැඩිදියුණු අගයක් ගැලපුම් කිරීමකින් තොරව ස්ථානීය වෙනස්වීම් (Points of Difference) සඳහා පමණක් ගැලපුම් කිරීමෙන් සාධාරණ අගය ගණනය කරනු ලබයි.

පොදු මහජනතාවට සේවා සපයන රාජ්‍ය අංශ ඒකකයන් විසින් පාලනය කරනු ලබන වත්කම්, විවෘත ද්‍රවශීල වෙළඳපොලෙහි හුවමාරු නොවන බැවින් සෙන්ට්‍රල් පොයින්ට් සහ වයිට් අවේස්, ගොඩනැගිලි හැර අනෙකුත් සියළුම ගොඩනැගිලි ක්ෂය කරන ලද ප්‍රවර්තන ප්‍රතිස්ථාපන පිරිවැය (DRC) ක්‍රමයට තක්සේරු කර ඇත.

අනෙකුත් ගොඩනැගිලි අගය කිරීම සඳහා, තනි වර්තමාන අගයකට හැර වූ (වට්ටම් කල) ඇස්තමේන්තුගත අනාගත ආදායම, ලාභය හෝ මුදල් ප්‍රවාහයන් මත පදනම්ව දේපල අගය කරනු ලබන ආදායම් ප්‍රවේශය යොදා ගන්නා ලදී.

පහත සඳහන් දෑ හේතුවෙන් වෙළඳපොල ප්‍රවේශය යටතේ ඇස්තමේන්තු කරන ලද සාධාරණ අගය වැඩිවීම/(අඩුවීම) සිදුවිය හැක.

- පර්චසයක ඒකක මිල වැඩිවීම/(අඩුවීම)
- වර්ග අඩියක ඒකක මිල වැඩිවීම/(අඩුවීම)
- ගොඩනැගිලි සඳහා වන ක්ෂය අනුපාතය අඩුවීම/(වැඩිවීම)

පහත සඳහන් දෑ හේතුවෙන් ආදායම් ප්‍රවේශය යටතේ ඇස්තමේන්තු කරන ලද සාධාරණ අගය වැඩිවීම/(අඩුවීම) සිදුවිය හැක.

- දළ වාර්ෂික කුලිය වැඩිවීම/(අඩුවීම)
- වසර මිලදී ගැනීම (years purchase) වැඩිවීම/(අඩුවීම)

ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ

ව්‍යුත්පන්න උපකරණ අගය කිරීමේ අගය ආකෘතින් යෙදවුම් ලෙස ඉදිරි මිල ගණන් (වෙළඳපොළෙහි ඇති ඉදිරි ලකුණු forward points පදනම් කරගනිමින් සකස් කරන ලද) හා අගය කරන දිනට අදාළ එක් එක් මුදල් වර්ගයන්හි ශූන්‍ය පොලී ඵලදා වක්‍ර මත පදනම්ව ගණනය කළ වට්ටම් අනුපාත යොදා ගැනේ. අගය කරන ලද උපකරණයේ ආන්තිකයක් අඩංගු වේ

නම්, ආන්තික අනුපාතයන් හි බලපෑම ඉදිරිපත් කිරීමටත් ඉදිරි මිල ගණන්වලට හා/හෝ පොළී අනුපාතයන්වලට ගැලපීම සිදුකරනු ලබයි.

රන්

	2022 රු. 000	2021 රු. 000
ජනවාරි 1 දිනට ශේෂය	**35,151,981**	76,220,055
වර්ෂය තුළදී මිලදී ගැනීම්/විකිණීම්)	**(26,108,952)**	(38,743,707)
විදේශ විනිමය ලැබීම්/හීවු)	**4,094,758**	5,151,566
රන් මිලෙහි වෙනස්වීම	**(3,106,177)**	(7,475,934)
	10,031,610	35,151,981

50.2 ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගිවිසුම් / නිත්‍ය තැන්පතු පහසුකම්

ගිවිසුම්වල කෙටිකාලීන ස්වභාවය නිසා, ආසන්න සාධාරණ අගයක් ලබා ගැනීමට ප්‍රතිමිලදී ගැනීම් සහ ප්‍රතිවිකුණුම් ගනුදෙනුවල වාර්තා කළ අගය සලකා බලනු ලැබේ. 2022 දෙසැම්බර් 31 දිනට නිත්‍ය තැන්පතු පහසුකම රු.මි. 330,637,06 හා (2021 - රු.මි. 101,062,88) 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රතිවිකුණුම් ගිවිසුම් යටතේ පවතින ශ්‍රී ලංකා රජයේ සුරුකුම්පත්වල ධාරණ වටිනාකම රු.මි. 698,069,22 (2021 - රු.මි. 567,532,31) ක් වේ. 2022 දෙසැම්බර් 31 දිනට ප්‍රතිමිලදී ගැනීම් යටතේ වන ශ්‍රී ලංකා රජයේ සුරුකුම්පත් ශේෂයක් නොමැත. (2021-ශේෂයක් නොමැත).

50.3 සංසරණයේ ඇති මුදල්

සංසරණයේ ඇති මුදල්වල සාධාරණ අගය, මූල්‍ය ප්‍රකාශනවල වාර්තාකර ඇති පරිදි ඒවායේ මුහුණත වටිනාකමය.

50.4 තැන්පතු වටිනාකම

ඉල්ලූ විටෙක දී ගෙවිය යුතු බැවින් තැන්පතුවල ධාරණ අගය ආසන්න සාධාරණ අගය ලෙස සලකනු ලැබේ.

50.5 සාධාරණ වටිනාකමට මනිනු නොලබන මූල්‍ය උපකරණ

සාධාරණ වටිනාකමට මනිනු නොලබන මූල්‍ය උපකරණ පහත වගුවෙන් දැක්වේ.

	ධාරණ වටිනාකම්		සාධාරණ වටිනාකම්	
	2022 රු. 000	2021 රු. 000	2022 රු. 000	2021 රු. 000
විදේශීය මූල්‍ය වත්කම්				
මුදල් සහ මුදල් සමානයන්	**651,687,864**	512,762,452	**651,687,864**	512,762,452
ජා.මු.අ. සම්බන්ධ වත්කම්	**1,641,520**	25,442,289	**1,632,712**	25,446,757
අනෙකුත් ලැබිය යුතු දෑ	**37,022,631**	-	**37,022,631**	-
දේශීය මූල්‍ය වත්කම්				
ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරුකුම්පත්	**698,069,219**	567,532,312	**567,532,312**	567,532,312
රජයට දෙන ලද කාලීන අත්තිකාරම්	**235,638,700**	150,128,800	**150,128,800**	150,128,800
බැංකු සඳහා දෙන ලද ණය	**28,257,902**	90,572,746	**88,468,648**	88,468,648
අනිකුත් වත්කම්	**30,182,560**	34,063,770	**25,686,027**	33,614,096
විදේශීය මූල්‍ය වගකීම්				
බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන	**146,408,028**	13,701	**146,408,028**	13,701
ආසියානු නිශ්කාෂන සංගමය	**736,258,128**	104,764,616	**736,258,128**	104,764,616
ජා.මු.අ.	**1,127,925,092**	670,065,243	**1,127,925,092**	670,065,243
අනෙකුත්	**594,383,451**	357,295,676	**594,383,451**	357,295,676
දේශීය මූල්‍ය වගකීම්				
බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතනවල තැන්පතු	**323,046,181**	300,704,162	**323,046,181**	300,704,162
රජයේ සහ රජයේ ආයතනවල තැන්පතු	**221,411**	1,392,301	**221,411**	1,392,301
ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවිකල සුරුකුම්පත් හා නිත්‍ය තැන්පතු පහසුකම	**330,637,059**	101,062,880	**330,637,059**	101,062,880
සංසරණයේ පවතින මුදල්	**1,026,567,252**	1,005,099,066	**1,026,567,252**	1,005,099,066
අනෙකුත් ගෙවිය යුතු දෑ	**68,320,347**	19,163,882	**68,320,347**	19,163,882

ජා.මු.අ. සම්බන්ධ වත්කම්, බැංකු වෙත ලබා දී ඇති ණය හා අභ්‍යන්තර අරමුදල්වලින් කරන ලද ආයෝජනවල සාධාරණ වටිනාකම ඒවායේ ධාරණ වටිනාකමෙන් වෙනස් වේ.

විදේශ මූල්‍ය වත්කම් යටතේ දක්වා ඇති මුදල් හා මුදල් සමානයන් හා අනෙකුත් ලැබිය යුතු දෑ, දේශීය මූල්‍ය වත්කම් යටතේ දක්වා ඇති ප්‍රතිවිකුණුම් ගිවිසුම් මත මිලදී ගත් සුරුකුම්පත් හා රජයට දෙන ලද කාලීන අත්තිකාරම්, විදේශීය මූල්‍ය වගකීම් යටතේ දක්වා ඇති බැංකු සහ අනෙකුත් මූල්‍ය ආයතන, ආසියානු නිෂ්කාශන සංගමය, ජා.මු.අ. සහ අනෙකුත් විදේශීය මූල්‍ය වගකීම් සහ දේශීය මූල්‍ය වගකීම් යටතේ දක්වා ඇති බැංකු හා අනෙකුත් මූල්‍ය ආයතනවල තැන්පතු, රජය හා රජයේ ආයතනවල තැන්පතු, ප්‍රතිමිලදී ගැනීමේ එකඟතාවය මත අලෙවි කළ සුරුකුම්පත්, සංසරණයේ පවත්නා මුදල් හා අනෙකුත් ගෙවිය යුතු දෑ හි සාධාරණ වටිනාකම හා ඒවායෙහි ධාරණ වටිනාකම් සමාන වේ.

51. සංසන්දනාත්මක තොරතුරු

වර්තමාන වර්ෂයේ ඉදිරිපත්කිරීම හා අනුකූල වීම සඳහා පහත සංසන්දනාත්මක අගයන් නැවත වර්ගීකරණය කරන ලදී.

51.1 ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ මත වූ පොළී ආදයම සහ පොළී වියදම, මිල වෙනස්වීම් වලින් උපලබ්ධි වූ වාසිය ලෙස නැවත වර්ගීකරණය කිරීම.

ආදයම් ප්‍රකාශයට සිදු වූ වෙනස්වීම

	2021		
	පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට	ගැළපීම්	නැවත වර්ගීකරණය කරන ලද
	රු.000	රු.000	රු.000
පොළී ආදයම	11,815,701	(7,436,653)	4,379,048
පොළී වියදම	(5,609,176)	1,974,648	(3,634,528)
මිල වෙනස්කම්වලින් උපලබ්ධි වූ වාසිය	14,855,788	(5,462,005)	20,317,793

මූල්‍ය වත්කම්වලින් පොළී ආදයම (සටහන 36) සිදු වූ වෙනස්කම්

	2021		
	පෙරාතුව ඉදිරිත් කළ ආකාරයට	ගැළපීම්	නැවත වර්ගීකරණය කරන ලද
	රු.000	රු.000	රු.000
විදේශීය මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදයම	11,815,701	(7,436,653)	4,379,048
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	7,436,653	(7,436,653)	-
මුළු මූල්‍ය වත්කම්වලින් ඉපැයූ මුළු පොළී ආදයම	80,428,629	(7,436,653)	72,991,976

මූල්‍ය බැරකම් මත පොළී වියදම (සටහන 38) සිදු වූ වෙනස්වීම්

	2021		
	පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට	ගැළපීම්	නැවත වර්ගීකරණය කරන ලද
	රු.000	රු.000	රු.000
විදේශීය මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම	(5,609,176)	1,974,648	(3,634,528)
ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	1,974,648	(1,974,648)	-
මූල්‍ය බැරකම් මත වූ මුළු පොළී වියදම	14,079,073	(1,974,648)	12,104,425

වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා, 2021 වර්ෂයේ පොළී ආදයම යටතේ දක්වන ලද ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල ලාභය වූ රු. මිලියන 7,436.65 සහ පොළී වියදම යටතේ දක්වන ලද ව්‍යුත්පන්න මූල්‍ය උපකරණවල අලාභය වූ රු. මිලියන 1,974.65, මේ වර්ෂයේදී මිල වෙනස්කම්වලින් උපලබ්ධි වූ වාසිය යටතේ අනාවරණය කරන ලදී.

51.2 අනෙකුත් ණය සහ අත්තිකාරම්වලින් ඉපැයූ පොළී ආදයම් යටතේ දක්වන ලද අභ්‍යන්තර අරමුදල්වලින් ඉපැයූ පොළී ආදයම අනෙකුත් වත්කම්වලින් ඉපැයූ පොළී ආදයම් ලෙස නැවත වර්ගීකරණය කිරීම

මූල්‍ය වත්කම්වලින් පොළී ආදායම (සටහන 36) සිදු වූ වෙනස්වීම

	2021		
	පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට	ගැළපීම්	නැවත වර්ගීකරණය කරන ලද
	රු.000	රු.000	රු.000
අනෙකුත් ණය සහ අත්තිකාරම්	2,770,062	1,317,449	1,452,613
අනෙකුත් වත්කම්	1,317,449	1,317,449	2,634,898

වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා, 2021 වර්ෂයේ මූල්‍ය වත්කම් වලින් පොළී ආදයම සටහන යටතේ අනෙකුත් ණය සහ අත්තිකාරම් වලින් ඉපැයූ පොළී ආදයම් ලෙස දක්වන ලද අභ්‍යන්තර අරමුදල් වලින් ඉපයූ රු. මිලියන 1,317.45 පොළී ආදායම මේ වර්ෂයේ දී එම සටහන යටතේම අනිකුත් වත්කම් වලින් ඉපයූ පොළී ආදායම ලෙස අනාවරණය කරන ලදී.

51.3 අනෙකුත් ආදයම් යටතේ විවිධ ආදයම් ලෙස දක්වන ලද බලපත්‍ර ගාස්තු (වාර්ෂික සහ නව සේවාවන්), මූල්‍ය ආයතනයන්ට අදාල බලපත්‍ර ගාස්තු ලෙස නැවත වර්ගීකරණය කිරීම

අනෙකුත් ආදයම (සටහන 40) සිදු වූ වෙනස්වීම

	2021		
	පෙරාතුව ඉදිරිපත් කළ ආකාරයට	ගැළපීම්	නැවත වර්ගීකරණය කරන ලද
	රු.000	රු.000	රු.000
විවිධ ආදයම්	469,494	5,525	463,969
මූල්‍ය ආයතනයන්ට අදාල බලපත්‍ර ගාස්තු	614,575	5,525	620,100

වඩාත් හොඳ ඉදිරිපත් කිරීමක් සඳහා, 2021 වර්ෂයේ අනෙකුත් ආදයම් සටහන යටතේ විවිධ ආදයම් ලෙස දක්වන ලද ගෙවීම් කාඩ්පත් සහ ජංගම ගෙවීම් පද්ධති බලපත්‍රලාභී සේවා සපයන්නන් වෙතින් ලැබුණු රු. මිලියන 5.52, මේ වර්ෂයේ දී මූල්‍ය ආයතනයන්ට අදාල බලපත්‍ර ගාස්තු යටතේ අනාවරණය කරන ලදී.

52. සම්බන්ධිත පාර්ශවයන්

52.1 රජය සහ රජය විසින් පාලනය කරනු ලබන ආයතන සමග ගනුදෙනු

බැංකුව විසින් සාමාන්‍ය මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ ගණුදෙනුවලට පිවිසෙනු ලැබේ. ශ්‍රී ලංකා රජය (ශ්‍රී.ලං.ම.බැ. පරම අයිතිකරු වශයෙන්), විවිධ රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සම්බන්ධිත පාර්ශ්වයන්ට ඇතුළත් වේ. අන්තර්ජාතික ගිණුම්කරණ ප්‍රමිත 24 (සංශෝධිත) සම්බන්ධිත පාර්ශ්වයන් පිළිබඳ හෙළිදරව් කිරීමේ ගිණුම්කරණ ප්‍රමිතියට අනුව, තනිව ගත් කළ සැළකිය යුතු මට්ටමේ වන හා අනෙකුත් ගණුදෙනුවලදී සාමූහිකව සැළකිය යුතු මට්ටමේ වන, රජය සහ රජය මගින් පාලනය කෙරෙන ආයතන සමඟ එළැඹී ගණුදෙනු සහ විධිවිධානයන් පහත පරිදි වේ.

ගනුදෙනු වල ස්වභාවය	2022 රු. 000	2021 රු. 000
ගනුදෙනු:		
විකුණන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	**242,099**	980,906
ප්‍රතිවිකිණීමේ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් හෝ විකුණූ ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්	**143,913,767,948**	68,218,243,292
ප්‍රතිවිකිණීමේ හා ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ මිලදී ගත් හෝ විකුණූ ශ්‍රී.ලං.ම.බැ. සහ ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් සඳහා පොලී ආදායම් හෝ වියදම්	**56,770,262**	8,378,432
රජය වෙනුවෙන් ලද අරමුදල්	**210,540,495**	365,111,003
රජය වෙනුවෙන් දරන ලද විය පැහැදම්	**211,034,101**	362,223,823
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ පිරිවැය (සටහන 52.1.3)	**1,856,465**	1,086,655
දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා භාණ්ඩ, සේවා සහ බදු සඳහා ගෙවීම් (සටහන 52.1.4)	**5,147,957**	1,129,790
වර්ෂය තුළදී දළ විදේශ විනිමය ගනුදෙනු (සටහන 52.1.6)		
- විකුණුම්	**872,421,407**	225,597,381
- මිලට ගැනීම්	**695,124,187**	61,515,180
- ඇ.එ.ජ.ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් ව්‍යුත්පන්න මූල්‍ය උපකරණ	**595,270,456**	651,697,925
වර්ෂය තුළදී අත්හල දේපල වෙනුවෙන් ලද අරමුදල්	**365,405**	914,309
කුලී ආදායම්	**207,763**	282,173
ලාභාංශ ආදායම්	**115,786**	115,786
අනෙකුත් ගනුදෙනු (සටහන 52.1.9)	**794,842**	1,088,948
ශේෂයන් :		
ශ්‍රී ලං.ම.බැ. විසින් අයිතිකාරිත්වය දරන ලද ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත් (සටහන 52.1.7)	**2,498,995,015**	1,377,820,347
රජයට දෙන ලද කාලීන අත්තිකාරම් (සටහන 14)	**235,638,700**	150,128,800
කොවිඩ් -19 පුනරුද්ධ ණය පහසුකම යටතේ ලබාදුන් ණය	**1,821,749**	11,817,950
නිශ්චිත අරමුණු සඳහා මිලදීගත් රජයේ සුරැකුම්පත්	**17,930,602**	15,938,729
බැංකු හා මූල්‍ය ආයතනවල තත්කාලීන දළ පියවුම් පද්ධතියේ (RTGS) ශේෂයන් (සටහන 26)	**240,719,873**	221,738,927
ලංකා බැංකුවේ ලන්ඩන් ශාඛාවේ පවත්වාගෙන යනු ලබන නොස්ට්‍රෝ ගිණුමේ ශේෂය	**43,888**	243,388
භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙතින් ලැබිය යුතු දෑ	**3,540,670**	4,087,983
භාණ්ඩාගාරය හා අනෙකුත් අමාත්‍යාංශ වෙත කළ යුතු ගෙවීම් (සටහන 25)	**1,021,468**	1,484,824
දෙසැම්බර් 31 දිනට රජයේ හා රජයේ ආයතන සමග ජංගම ගිණුම් ශේෂයන්	**(297)**	(1,107,407)
අත්හල දේපල වල ශේෂයන්	**5,998,940**	5,998,940
අනෙකුත් ශේෂයන් (සටහන 52.1.9)	**13,321,704**	292,917

52.1.1 මුදල් නීති පනතේ 28-33 වගන්ති අනුව පැවරෙන ලද බලය ප්‍රකාර බැංකුවේ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ බලපත්‍රලාභී බැංකුවල කටයුතු නියාමනය හා සුපරීක්ෂණය කරනු ලබයි. 2022 දෙසැම්බර් 31 දිනට රජය මගින් අරමුදල් සැපයූ හෝ රජයේ සුවිශේෂ බලපෑමක් ඇති බලපත්‍රලාභී වාණිජ බැංකු 04 ක් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 01 ක් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණයට භාජනය කර ඇති අතර ඒවා බැංකුවේ සම්බන්ධිත පාර්ශ්ව වේ.

බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ලියාපදිංචි බැංකු නොවන, මූල්‍ය සමාගම්වල නියාමනය සහ සුපරීක්ෂණය කරගෙන යනු ලබයි. ඒ අනුව, රජය විසින් පාලනය කරනු ලබන හෝ අරමුදල් සපයා ඇති බැංකුවලට සම්බන්ධිත ආයතන සහ බැංකු නොවන මූල්‍ය සමාගම් මෙම දෙපාර්තමේන්තුවේ සුපරීක්ෂණය යටතට පැවරේ.

52.1.2 මුදල් නීති පනතේ 113 වගන්තිය ප්‍රකාර රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ක්‍රියාපටිපාටිය, මුදල් මණ්ඩලය හා බැංකුව සතු වේ. ඒ අනුව, රජයේ නියෝජිතයා ලෙස, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් අයවැය අවශ්‍යතා සහ දේශීය හා විදේශීය ණය සේවා සපුරා ගැනීම සඳහා දේශීය වෙළෙඳපොළට සුරැකුම්පත් නිකුත් කිරීම කරනු ලැබේ. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය ණය කළමනාකරණය හා ණය වෙළෙඳපොළ සංවර්ධනය කිරීම කරනු ලබයි. රජයේ අවශ්‍යතා හා එහි පියවීම් බැරකම් සපුරාලීම සාක්ෂාත් කර ගැනීම සඳහා රාජ්‍ය ණය පරිපාලනය කිරීම මෙම දෙපාර්තමේන්තුව විසින් කරනු ලැබේ.

52.1.3 මුදල් නීති පනතේ 49 වගන්තිය ප්‍රකාර, මුදල් නිකුත් කිරීමේ තනි අයිතිය හා බලතල බැංකුව සතු වේ. ඒ අනුව බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව, නෛතික ව්‍යවහාර මුදල් නිකුත් කිරීමේ තනි බලධාරියා ලෙස කටයුතු කරයි. මුදල් නෝට්ටු මුද්‍රණය කිරීමේ කාර්යය ඩී ලා රූ ලංකා කරන්සි ඇන්ඩ් සෙකියුරිටි ප්‍රින්ට් (පුද්) සමාගම විසින් කරගෙන යනු ලැබේ. මෙහි කොටස් හිමිකමෙන් 40% දරන්නේ රජයයි.

52.1.4 බැංකුව සාමාන්‍යයෙන් මෙහෙයුම් කටයුතු කරගෙන යාමේ දී, විවිධ භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා රාජ්‍ය ආයතන හෝ රජයේ සුවිශේෂ බලපෑමක් හෝ පාලනයක් ඇති ආයතන සමඟ ගනුදෙනුවලට එළඹෙනු ලැබේ.

52.1.5 සටහන් අංක 55 හි පැහැදිලි කර ඇති පරිදි බැංකුව භාරකරු සහ අනෙකුත් විශ්වාසභා තත්ත්වයන්හි කටයුතු කිරීම මගින් රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සාමාන්‍යයෙන් සිදුකරනු ලැබේ.

52.1.6 මුදල් නීති පනතට යටත්ව බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව විසින් දේශීය, විදේශීය විනිමය වෙළෙඳපොළෙහි සංවර්ධනය හා වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ එක් දින විවෘත විදේශ විනිමය තත්ත්වය සුපරීක්ෂණය කරනු ලැබේ. දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ සංවර්ධනය සුපරීක්ෂණයේ දී ශ්‍රී ලංකා රුපියලේ විනිමය අනුපාතය දැඩි ලෙස වෙනස්වීම ලිහිල් කිරීමේ අරමුණින් බැංකුව වෙළෙඳපොළෙහි මෙම අංශ දෙකෙහි ම නියැලෙන්නේය. කෙසේවෙතත්, 2022 වසර තුළදී ඇති වූ උග්‍ර විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය සහ විදේශ සංචිත දරුණු ලෙස පහත වැටීම යන කරුණු නිසා දේශීය විදේශ විනිමය වෙළඳපොළේ ඇති වූ අහිතකර වර්ධනයන් සැළකිල්ලට ගනිමින් ශ්‍රී.ලං.ම.බැ. විසින් වාණිජ බැංකු හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව වෙත පනවා තිබූ අනිවාර්ය විදේශ විනිමය විකිණීමේ අවශ්‍යතාවය මත විදේශ විනිමය මිලට ගැනීම සහ රට තුළ ආර්ථික කටයුතු අවම මට්ටමින් හෝ පවත්වා ගෙන යාමට අවශ්‍ය ඉන්ධන, ගෑස්, ගල් අඟුරු, බෙහෙත් සහ ආහාර වැනි අත්‍යාවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සඳහා මූල්‍යනය කිරීමට විදේශ විනිමය වෙළඳපොළට විකිණීම වැනි අතිවිශේෂ ප්‍රයත්නයන් අනුගමනය කරමින් විදේශ විනිමය මැදිහත්වීම් සිදුකරන ලදී. විදේශ විනිමය මිලට ගැනීම් සහ විකුණුම් ප්‍රමාණයන් එම ක්‍රියාවලින්වල ප්‍රතිඵල නියෝජනය කෙරේ.

52.1.7 දේශීය මෙහෙයුම් දෙපාර්තමේන්තුව, 1949 අංක 58 දරණ මුදල් නීති සංශෝධිත පනතේ 90-92 වගන්ති ප්‍රකාර, බැංකුවේ මූල්‍ය ප්‍රතිපත්ති ක්‍රියාවට නැංවීමේ කාර්යයන් ලෙස විවෘත වෙළෙඳපොළ මෙහෙයුම් කටයුතුවල නියැලීම, මුදල් නීති පනතේ 93-98 වගන්ති ප්‍රකාර, නෛතික සංචිත පවත්වා ගැනීමේ අවශ්‍යතාව බලාත්මක කිරීම හා රජයේ කොටස් හිමිකම් ඇති වාණිජ බැංකුවල හා අනෙකුත් සමහරක් මූල්‍ය ආයතන හා රාජ්‍ය ආයතනවල බැංකුකරු ලෙස කටයුතු කරයි. 2022 දෙසැම්බර් 31 දිනට මෙම කාර්ය කිරීමේ දී උද්ගත වූ මුළු ශේෂය සටහන් අංක 12 හි දක්වා ඇත. රජයේ සුරැකුම්පත් මත උපයාගත් පොළිය 36 සටහනෙහි දැක්වේ.

52.1.8 රජයේ පාලනයට යටත් එක් බැංකුවක භාරකාරත්ව විධිවිධානවල බැංකුව නියැලුනි.

52.1.9 තනි වශයෙන් ගත්කල සුවිශේෂී නොවන, රජය, රජයේ දෙපාර්තමේන්තු සහ රජය මගින් පාලනය වන ආයතන සමඟ බැංකුව විසින් සිදුකල ගනුදෙනුවල ශේෂයන්, අනෙකුත් ගනුදෙනු හා ශේෂයන් හි ඇතුලත් වේ.

52.2 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සමඟ ගණුදෙනු

අධිපති ඇතුළු මුදල් මණ්ඩලයේ සාමාජිකයන්, නියෝජ්‍ය අධිපතිවරුන් සහ සහකාර අධිපතිවරුන් ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයට ඇතුළත් වේ. ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය බැංකුව සමඟ සිදුකරන ලද ගනුදෙනු පහත පරිදි වේ.

52.3 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය වෙත කළ ගෙවීම්

	2022	2021
	රු. 000	රු. 000
කෙටිකාලීන සේවක ප්‍රතිලාභ	**261,043**	180,218

මෙයට අමතරව ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලය සඳහා ඔවුන්ගේ සේවා ගිවිසුම්වලට යටත්ව මූල්‍ය නොවන ප්‍රතිලාභ ද සපයනු ලැබේ.

52.4 ප්‍රධාන කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් සමඟ වූ වෙනත් ගණුදෙනු

	2022	2021
	රු. 000	රු. 000
කළමනාකරණ කාර්යය මණ්ඩලයේ සාමාජිකයන් හට දුන් ණය ශේෂය	**329,345**	98,648
වසර තුළදී ප්‍රදානය කළ ණය	**203,018**	6,699
වසර තුළදී අය කරගත් ණය	**187,331**	10,038

මෙම ණය සඳහා අදාළ වන වාර්ෂික පොළී අනුපාතයන් සියයට 2 සිට සියයට 7 දක්වා පරාසයන්හි වන අතර, මාසිකව ගෙවනු ලබන එම සියළු ණය ප්‍රමාණවත් පරිදි ආරක්ෂිත කොට ඇත.

52.5 පශ්චාත් සේවා ප්‍රතිලාභ සැලසුම් සමඟ ගණුදෙනු

	2022	2021
	රු. 000	රු. 000
ගෙවන ලද සහ ගෙවිය යුතු දායකය	**106,371**	73,517

සටහන් අංක 32 හි දක්වා ඇති පරිදි බැංකුව විසින් විශ්‍රාම වැටුප් සහ අනිකුත් පශ්චාත් සේවා විශ්‍රාම සැලසුම් සඳහා විවිධ මුදල් ප්‍රමාණවලින් දායක වූ අතර රු.මි. 986.99 ක් (2021 - රු.මි. 717.59) සේවක අර්ථසාධක අරමුදලට ගෙවන ලදී.

සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී බැංකුව විසින් ස්වකීය පශ්චාත් සේවා සැළසුම් සඳහා බැංකු සහ මූල්‍ය සේවා සපයනු ලබයි. එවැනි සැළසුම් වල ශේෂයන් 30.2 සටහනෙහි දක්වා ඇත.

53. අසම්භාව්‍ය වගකීම්

53.1 මූල්‍ය ඇප කොන්ත්‍රාත්

රජයේ හෝ එහි නියෝජිතයන්ගේ සහ ආයතනවල නියෝජිත ලෙස ක්‍රියාකරමින්, මහා භාණ්ඩාගාරය විසින් බැංකුව වෙත නිකුත් කරනු ලබන ප්‍රති ඇප මත විවිධ පාර්ශ්වයන්ට ඇප සපයනු ලැබේ. 2022 දෙසැම්බර් 31 දිනට එවැනි ඇප කිසිවක් නොවීය.

53.2 ණය ඇපකර

බැංකුවෙහි ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ (ප්‍රා.සං.දෙ.) කාර්යයන් වන්නේ පිටස්තර ණය මාර්ග තුළින් ලැබෙන මුදල් සහභාගී මූල්‍ය ආයතන මගින් ප්‍රතිමූල්‍යකරණ ණය ලෙස සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසායකයින්ට ලබාදීම, එම ණය මත සහභාගී මූල්‍ය ආයතන වෙත ණය ඇපවීම් නිකුත් කිරීම, ඇප වාරික රැස්කිරීම, ණය පැහැරහැරීම් මගහැරවීම සඳහා හා එම ණය නිසිපරිදි යෙදවෙන බවට සාක්ෂාත් කර ගැනීම සඳහා පශ්චාත් ණය සුපරීක්ෂණය කිරීම සහ ණය ඇපකරු අරමුදල් පරිපාලනය කිරීමයි. මෙම වැඩපිළිවෙල යටතේ ලබාදුන් ණය සම්බන්ධයෙන් සහභාගි මූල්‍ය ආයතනවලට සිදුවිය හැකි පාඩු ආවරණය සැපයීම සඳහා ණය ඇපකර පහසුකම් සැපයීම ප්‍රා.සං.දෙ. විසින් සමාලෝචිත වර්ෂය තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී. මෙය ණය පැහැර හැරීමේ ප්‍රමාණය මත වන ආවරණයක් නොවන අතර සහභාගී වන මූල්‍ය ආයතන මගින් ණය ලබාදුන් පාර්ශ්වයන්ගෙන් ණය ආපසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් පසු, ඉතිරිවන පාඩු සඳහා වන ආවරණයකි. ණය අයකර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව සිදුවිය හැකි පාඩු පිළිබඳව සහභාගි වූ මූල්‍ය ආයතන විසින් කරනු ලබන ඉල්ලීම් පමණක් සලකා බැලීම මෙහි අර්ථය වේ. මෙම වැඩපිළිවෙල මගින් උද්ගත වන අසම්භාව්‍ය බැරකම් පහත දැක්වේ.

දේශීය වාණිජ බැංකු වෙත ලබා දුන් ණය ඇපකර :

	නොපියවා පැවැති ඇප ප්‍රමාණය	
	2022 රු. 000	**2021 රු. 000**
සම්බන්ධිත පාර්ශ්වයන්	**1,989,471**	21,742,330
අනෙකුත්	**88,808**	526,405
මුළු ණය ඇප ප්‍රමාණය	**2,078,279**	22,268,735

2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ණය ඇපකර මත හඳුනාගත් අපේක්ෂිත ණය අලාභය, සටහන 39 හි වාර්තා කොට ඇත.

53.3 විශ්වස්ත ක්‍රියාකාරකම්

මුදල් නීති පනත අනුව බැංකුව විසින් විශ්වස්ත ක්‍රියාකාරකම් කරගෙන යනු ලබයි. ඒ අනුව ක්‍රියාකිරීමේ දී විවිධ පාර්ශ්වයන් සඳහා අරමුදල් දැරීම හෝ ස්ථාපනය කිරීම ද කරනු ලැබේ. කෙසේ වුවද එසේ කිරීමෙන් කිසියම් බැරකමක් ඇතිවේ යැයි බැංකුව අපේක්ෂා කරනු නොලැබේ.

53.4 නෛතික හිමිකම්

බැංකුවට එරෙහිව නීති කෘත්‍යන් ගණනාවක් 2022 දෙසැම්බර් 31 දිනට පරිශේෂව තිබුණු අතර මේ සම්බන්ධයෙන් සැලකිය යුතු පාඩුවක් බැංකුවට ඇති නොවේය යනු බැංකුවේ මතය බැවින් ඒ සඳහා ප්‍රතිපාදන සලසා නොමැත.

54. බැඳීම්

(අ) 2022 වසරේදී වාණිජ බැංකුවල පැවති විදේශ මුදල් හිඟය හේතුවෙන් ඇතිවූ අත්‍යවශ්‍ය ද්‍රව්‍ය අපනයනය කිරීමේ අපහසුතාවය මගහරවා ගැනීමට සහය දැක්වීමක් ලෙස, මුදල් නීති පනතේ 106(1) සහ 108(2) යන වගන්ති ප්‍රකාරව ශ්‍රී.ලං.ම.බැ. විසින් එවකට පැවති විදේශ මුදල් සංචිත මත පදනම්ව, ශ්‍රී ලංකා රුපියල් වලට හුවමාරු කිරීම සඳහා විදේශ මුදල් ලබාදෙන ලෙස වාණිජ බැංකු වලට බැඳීම් ලිපි නිකුත් කරන ලදී. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට එලෙස නිකුත් කල බැඳීම් ලිපි වල වටිනාකම ඇ.එ.ජ. ඩොලර් මිලියන 174.50 ක් ලෙස දැක්විණි. වාර්තාකරණ දිනයෙන් පසුව, එම බැඳීම් ප්‍රමාණයෙන්, එදින පැවති වෙළඳපොළ විනිමය අනුපාතයට සමානව රුපියල්වලට හුවමාරු කිරීමේ පදනමින් නිකුත් කරන ලද ඇ.එ.ජ. ඩොලර් මිලියන 40ක බැඳීම් ප්‍රමාණයක් භාවිතයේ ඇත.

(ආ) 2022 දෙසැම්බර් 31 දිනට දේපළ, පිරියත හා උපකරණ අත්පත් කර ගැනීම හා මුදල් අච්චු ගැසීම වෙනුවෙන් රු.මි. 657.37 ක ප්‍රාග්ධන බැඳීමක් බැංකුව විසින් ඇති කර ගෙන තිබේ.

(ඇ) 2022 දෙසැම්බර් 31 දිනට ඉදිරි හුවමාරු ගණුදෙනු මෙසේය.

	2022 000	**2021 000**
ඉදිරි විනිමය කොන්ත්‍රාත්තු		
ඉදිරි විනිමය විකුණුම්		
- ඇ.එ.ජ. ඩොලර්	**559,112**	734,550
- ස්ටර්ලිං පවුම්	**12,500**	-
- ජපන් යෙන්	**-**	2,800,000
ඉදිරි විනිමය මිලදී ගැනීම්		
- ඇ.එ.ජ. ඩොලර්	**4,750**	225,145

55. මූල්‍ය වත්කම් මාරු කිරීම්

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී, මූලිකව දේශීය හා විදේශීය යන දෙවර්ගයෙන්ම පවත්නා ණය සුරැකුම්පත් සම්බන්ධයෙන් බැංකුව විසින් ගණුදෙනු වලට එළඹීමේ ප්‍රතිඵලයක් ලෙස මූල්‍ය වත්කම් මාරුවීමක් සිදු විය හැක. සටහන් 5.3.3. හි දක්වා ඇති ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුව, එසේ මාරුකරන ලද මූල්‍ය වත්කම් පෙර හඳුනාගත් ලෙසම පවත්වාගැනීම හෝ බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමේ ප්‍රමාණයට පවත්වාගැනීම හෝ සම්පූර්ණයෙන් හඳුනා නොගෙන සිටීමට සිදුවිය හැක.

සම්පූර්ණයෙන් ඉවත් නොකරන ලද හෝ පහත ගණුදෙනු තුළින් මූලිකව බැංකුවේ අඛණ්ඩ මැදිහත්වීමක් පවතී නම් මූල්‍ය වත්කම් මාරුකිරීමක් සිදු කරයි.

- ප්‍රති මිලදී ගැනුම් ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්
- සුරැකුම්පත් ණයට දීම
- සුරැකුම්පත් ඔඩපන කිරීම

55.1 සම්පූර්ණයෙන් ඉවත් නොකල නමුත් මාරුකල මූල්‍ය වත්කම්

(අ) ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත්

බැංකුවේ මුදල් ප්‍රතිපත්ති මෙහෙයුම් වල කොටසක් ලෙස ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ගණුදෙනුවල නිරතවන අතර හිමිකාරීත්වයේ අවදානම් හා ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතුව පැවතීම හේතුවෙන්, මූල්‍ය තත්ව ප්‍රකාශයේ "ශ්‍රී ලංකා රජයේ සුරැකුම්පත්" යටතේ එම ප්‍රමාණය සම්පූර්ණයෙන් හඳුනාගෙන තවදුරටත් පවත්වාගෙන යනු ලැබේ. ඒ අනුව ඒ මත ගෙවිය යුතු මුදල් ප්‍රතිෂ්ඨාව සහ උපචිත පොළිය, මූල්‍ය තත්ව ප්‍රකාශයේ දේශීය මූල්‍ය වගකීම්හි ප්‍රතිමිලදී ගැනීමේ ගිවිසුම් යටතේ විකුණූ සුරැකුම්පත් ලෙස හඳුනාගෙන ඇත.

(ආ) සුරැකුම්පත් ණයට දීම

සුරැකුම්පත් ණය, ස්ථාපිත වෙළඳපල පුරුදු විස්තර කරන අතර එමගින්, ගාස්තුවකට යටත්ව, සුරැකුම්පත් එක් පාර්ශවයකගෙන් (ණය දීමනාකරු - ශ්‍රී ලංකා මහ බැංකුව), තවත් පාර්ශ්වයකට (ණය ගන්නා) තාවකාලිකව හුවමාරු වීම සිදුවේ. ණයගන්නා ඉල්ලූ විටදී හෝ යම් එකඟ වූ කාලසීමාව අවසානයේදී ඒවා නැවත ලබා දීමට බැඳේ. මේ වන විට අධිජාතික බැඳුම්කර සහ විවිධ නිකුත්කරන්නන් විසින් නිකුත් කරන ලද බැඳුම්කර සඳහා භාරකරු ලෙස තෝරාගත් නිශ්කාශණ ආයතනයක් කටයුතු කරයි.

නිශ්කාශණ ආයතනයේ කැමැත්ත පරිදි එම බැඳුම්කර සඳහා වන ඉල්ලුම මත පදනම්ව ණය දීමට බලය පැවරෙන පරිදි ගිවිසුමක් අත්සන් කර ඇත. ශ්‍රී ලංකා මහ බැංකුව මෙම ණය දීමට සම්බන්ධ නොවන බැවින් හා නිශ්කාශන ආයතන, ණයකරුවන්ට සෘජුවම ණයදෙන බැවින්, මෙම ක්‍රියාවලිය "ස්වයං බැඳුම්කර ණය දීම" ලෙස හඳුන්වයි. ස්වයං බැඳුම්කර ණය දීමේ වැඩසටහන යටතේ බැඳුම්කර සඳහා යම් ණයදීමක් සිදුකර ඇත්නම්, එක් එක් මාසය අවසානයේ භාරකරු විසින් ස්වයං බැඳුම්කර ණයදීම සඳහා ගාස්තු ශ්‍රී ලංකා මහ බැංකුවට එවනු ලබයි. හිමිකාරීත්වයේ අවදානම් සහ ප්‍රතිලාභ සම්පූර්ණයෙන්ම පාහේ බැංකුව සතු වීම හේතුවෙන් බැංකුව විසින් එම සුරැකුම්පත් සම්පූර්ණයෙන්ම මූල්‍ය තත්ව ප්‍රකාශයේ හඳුනාගැනීම තවදුරටත් සිදු කරයි. මෙම සුරැකුම්පත් මූල්‍ය තත්ව ප්‍රකාශයේ "අනෙකුත් විස්තීරණ ආදායම මගින් සාධාරණ අගයට වූ සුරැකුම්පත්" ලෙස ඉදිරිපත් කරයි.

(ඇ) සුරැකුම්පත් ඔඩපන කිරීම්

2017 ජනවාරි මාසය දක්වා සුරැකුම්පත් බේරුම් ක්‍රියාවලියට පහසුකම් සැපයීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඕස්ට්‍රේලියානු ඩොලර් මිලියන 35 ක සුරැකුම්පත් යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කොට ඇ.ඒ.ජ ඩොලර් මිලියන 30.0 ක ණය පහසුකම් ලබාගන්නා ලදී. වර්තමානයේදී යූරෝ ක්ලියර් බැංකුවට ඔඩපන කරන ලද සුරැකුම්පත්වල වටිනාකම ඇ.ඒ.ජ. ඩොලර් මිලියන 13.5 කි. ඔඩපන කරන ලද සුරැකුම්පත් යූරෝ ක්ලියර්හි වෙනම ගිණුමක රඳවා ඇත.

	2022	2021
	අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්	අනෙකුත් විස්තීරණ ආදායම් මත සාධාරණ අගයට වූ මූල්‍ය වත්කම්
	රු. 000	රු. 000
වත්කම්		
යූරෝ ක්ලියර් බැංකුව වෙත ඔඩපන කරන ලද සුරැකුම්පත්	**1,090,124**	2,830,756
වත්කම් වල ධාරණ අගය	**1,090,124**	2,830,756

56. භාර සහ භාරකාරත්ව ක්‍රියාකාරකම්

බැංකුව, සාමාන්‍යයෙන් භාරකරුවකු ලෙස හා අනෙකුත් විශ්වාසකා තත්ත්වයන්හි ක්‍රියාකිරීමේ ප්‍රතිඵලයක් ලෙස රජය, භාරයන්, විශ්‍රාම ප්‍රතිලාභ සැලසුම් සහ අනිකුත් ආයතන වෙනුවෙන් වත්කම් සහ බැරකම් දැරීම හෝ ස්ථාපනය කිරීම සිදු කරනු ලැබේ. බැංකුව විසින් ඉටු කරනු ලබන සැලකිය යුතු භාර ක්‍රියාකාරකම් පහත සඳහන් පරිදි වේ.

56.1 විවිධ විදේශීය ණය සහ විදේශ අරමුදල් යොදන සංවර්ධන ව්‍යාපෘති සහ ණය යෝජනා ක්‍රම සඳහා වන ප්‍රදානයන්හි ණය මුදාහැරීම සහ ආපසු ගෙවීම් බැංකුව විසින් ශ්‍රී ලංකා රජය වෙනුවෙන් සිදු කරනු ලැබේ. තවද ශ්‍රී ලංකා රජය වෙනුවෙන් විවිධ විදේශීය ණය සහ ප්‍රදානයන් යටතේ ප්‍රතිපාර්ශ්වීය අරමුදල් රැස්කර ප්‍රදානය කරන නියෝජිත ආයතනයන්ගේ ඉල්ලීම පරිදි එම අරමුදල් භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය කරනු ලැබේ.

56.2 බැංකුව සේවක අර්ථසාධක අරමුදලේ (සේ.අ.අ) භාරකාරත්වය උසුලයි. ඒ අනුව, පනතේ විධි විධාන ප්‍රකාර දායක මුදල් ලබා ගැනීම, අධිභාර ලබාගැනීම, ආයෝජනවලින් ආදායම ලබා ගැනීම, සේ.අ.අ. අරමුදලේ ලියාපදිංචි සාමාජිකයන්ගේ ගිණුම් පවත්වාගෙන යාම, අතිරික්ත මුදල් ආයෝජනය සහ සාමාජිකයින්ට ප්‍රතිලාභ ගෙවීම මුදල් මණ්ඩලයේ කාර්යයන්ට ඇතුළත් වන්නේය.

56.3 ශ්‍රී ලංකා මහ බැංකුවෙහි බලපත්‍රලාභී බැංකු ආයතන සහ 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි, බැංකු ව්‍යාපාරයෙහි යෙදී සිටින සමුපකාර සමිති සඳහා විවෘතව ඇති ස්වෙච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයක් වන "තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" බැංකුව විසින් පරිපාලනය කර ඇත. 2010 ඔක්තෝබර් 01 දා සිට එම යෝජනා ක්‍රමයෙහි ඇති අරමුදල්, 2010 සැප්තැම්බර් 28 දා තම, ගැසට් අංක 1673/11 යටතේ පිහිට වූ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමය" වෙත පවරා ඇත.

56.4 2010 සැප්තැම්බර් 28 දිනැති වූ 1673/11 අංක දරණ (සංශෝධිත) ගැසට් පත්‍රය අනුව 2010 ඔක්තෝබර් 01 දා සිට බැංකුව විසින් "ශ්‍රී ලංකා තැන්පතු

රක්ෂණ යෝජනා ක්‍රමය" නමින් අනිවාර්ය තැන්පතු රක්ෂණ ක්‍රමයක් ජාතික අවශ්‍යතාවයක් ලෙස තැන්පත්කරුවන්ගේ අරමුදල් ආරක්ෂාව වෙනුවෙන් පිහිටුවා ඇත.

මෙම යෝජනා ක්‍රමය සහ අරමුදල 2013 නොවැම්බර් 22 වන දින සිට පිළිවෙලින් "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය" සහ "ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක අරමුදල" ලෙස නම් කරන ලදී.

තවද අංක 2239/52 දරණ ගැසට් පත්‍රය අනුව 2010 සැප්තැම්බර් 28 දිනැති අංක 01 දරණ ආරම්භ රෙගුලාසිය අවලංගු කරමින් 2021 අගෝස්තු 06 දිනැති නව රෙගුලාසි අංක 2, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය ලෙස නිකුත්කොට ඇත.

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු හා ලියාපදිංචි මූල්‍ය සමාගම් මෙම යෝජනා ක්‍රමයේ සාමාජිකයන් වේ. ඒ අනුව, 2022 දෙසැම්බර් 31 දිනට මෙහි සමස්ථ සාමාජිකයන් ගණන 67 කි. ඉහත ගැසට් පත්‍රයේ 5.1 වගන්තියට අනුව සාමාජික ආයතනයන්හි ඉල්ලුම් තැන්පතු, කාලීන තැන්පතු සහ ඉතිරිකිරීමේ තැන්පතු වගකීම් 2010 හා 2011 වර්ෂවල කරන ලද මුදල් මණ්ඩලයේ මගපෙන්වීම් අනුව 2012 ජනවාරි 1 දිනට පෙර ක්‍රියාත්මක කරන ලද ව්‍යාපාර ප්‍රතිව්‍යුහගත සැලසුම්වලට අනුව ස්කන්ධය බවට පරිවර්තනය වූ අතීතයේ තැන්පත්කරුවන් වූ දැනට කොටස් හිමියන්ගේ කොටස් රක්ෂණය කෙරෙන අතර ඉහත ගැසට් පත්‍රයේ වගන්ති 5.2 ට අනුව වන තැම්පතු වගකීම් හා සියලු ණය උපකරණ රක්ෂණයෙන් ඉවත් කරනු ලැබේ.

රු.මි. 350.20 ක් වූ ස්වෙච්ඡා තැන්පත් රක්ෂණ යෝජනා ක්‍රමයෙහි ආයෝජන හා රු.මි. 1,168.31 ක් වූ වාණිජ බැංකුවල අත්හල දේපළ තුළින් කරන ලද ආයෝජන පැවරීමෙන් මෙම තැන්පතු රක්ෂණ අරමුදල පිහිටුවා ඇත. 2022 දෙසැම්බර් 31 දිනට එම අරමුදලේ ප්‍රමාණය රු. මිලියන 86.424.05 ක් (විගණනය නොකළ) වන අතර, ඇ.එ.ජ. ඩොලර් මිලියන 30.0 ක ණය පහසුකම් ලබාගන්නා ලදී. දැනට මෙම අරමුදලෙන් තැන්පතු හිමියෙකුට ගෙවන වන්දි මුදල් ප්‍රමාණය එක් මූල්‍ය ආයතනයක් සඳහා රු. ලක්ෂ 11 ක් හෝ විදේශ විනිමය තැන්පතු සඳහා ඊට සමාන මුදලකි.

වන්දි ගෙවීම බැංකුවේ හෝ මුදල් මණ්ඩලයේ වගකීමක් නොවන අතර තැන්පත් අරමුදල විසින් එසේ ගෙවිය යුතු මුළු වන්දි මුදල් ප්‍රමාණය තැන්පත් අරමුදලේ අවසරලත් ණය සහ එකතු වී ඇති වාරික මුදල් ද ඇතුළුව තැන්පතු රක්ෂණ අරමුදලෙහි රැස් වී ඇති, පවත්නා මුදල් ප්‍රමාණයට සීමා විය යුතුය. අරමුදලේ බැරට ඇති මුදල් ප්‍රමාණය ඉක්මවා යන කිසිදු වගකීමකට මුදල් මණ්ඩලය හා බැංකුව වගකියනු නොලැබේ.

යෝජනා ක්‍රමයේ මෙහෙයුම් හා කළමණාකරණ කටයුතු නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ පිහිටා ඇති තැන්පත් රක්ෂණ ඒකකය මගින් මූල්‍ය මණ්ඩලය මගින් අනුමත වූ රෙගුලාසි හා ප්‍රතිපත්තීන් වලට අනුව නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකවරයාගේ අධීක්ෂණය හා උපදෙස් අනුව සිදු කෙරෙන අතර බැංකුවේ මූල්‍ය ප්‍රකාශවලින් වෙන් වූ පොත් හා ගිණුම් පවත්වාගෙන යනු ලැබේ. විගණනය භාරව විගණකාධිපති කටයුතු කරයි.

56.5 ලියාපදිංචි මූල්‍ය සමාගම් නියාමනය කිරීම හා සුපරීක්ෂණ කටයුතු, මුදල් මණ්ඩලය විසින් පවරා ඇති බලතල ප්‍රකාරව, බැංකුව විසින් සිදුකරයි. එසේ ක්‍රියාකිරීමේ දී ආරක්ෂිත ක්‍රියාමාර්ගයක් ලෙස එම ස්වශක්තිතාවයන් නොමැති හා බුන්වත් වූ මූල්‍ය සමාගම්වල වගකිවයුතු පුද්ගලයන් ගේ වත්කම් මුදල් මණ්ඩලය වෙත පවරාගැනීම ද කරනු ලබයි.

56.6 ශ්‍රී. ලං.ම.බැ. මුදල් මණ්ඩලය වෙනුවෙන් රජය හා විදේශ විසින් මූල්‍යනය කරන ලද ව්‍යාපෘති සම්බන්ධයෙන් රජයේ අති විශේෂ නියෝජිතයා ලෙස ප්‍රාදේශිය සංවර්ධන දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

I ශ්‍රී ලංකා රජය හෝ අනුග්‍රාහකයෙකු විසින් මූල්‍යනය කළ ව්‍යාපෘති

(i) නිමකර අවසන් ව්‍යාපෘති

ව්‍යාපෘතියේ නම / ණය යෝජනා ක්‍රමය	මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන)		ණය මුදලේ අරමුණ	සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන)
තේ සංවර්ධන ව්‍යාපෘතිය	ඇ.එ.ජ. ඩොලර්	24.50	කුඩා පරිමාණ තේ වතු හිමියන්ගේ ආදායම වැඩිකිරීම හා ව්‍යාපෘති කලාපවල ස්වභාවික පරිසරය සංවර්ධනය	2,550.90
දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය	වි. ගැ. හි.	11.56	බහු වාර්ෂික භෝග අංශය වාණිජ්‍යකරණය, නිෂ්පාදන වැඩි දියුණු කිරීම, තවාන් සංවර්ධනය, පසු අස්වනු පාලනය, සැකසීම හා අලෙවිකරණය	1,453.11
වැවිලි අංශය ප්‍රතිසංස්කරණ ව්‍යාපෘතිය	ඇ.එ.ජ. ඩොලර්	40.00	ශ්‍රී ලංකාවේ භෝග කර්මාන්තයේ භෝග අනු අංශ වල ප්‍රතිපත්ති හා ආයතනමය ප්‍රතිසංස්කරණ වලට සහාය දීම, නිෂ්පාදනය හා ලාභදායිත්වය වැඩිදියුණු කිරීම, තරඟකාරී වාසිය පවත්වා ගැනීම	5,200.00
කුඩා ව්‍යාපාර නඟා සිටුවීමේ වැඩසටහන	රුපියල්	2,656.00	සුනාමියෙන් බලපෑමට ලක්වූ කුඩා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත නඟා සිටුවීම සඳහා ණය පහසුකම් ලබා දීම	2,663.40
කුඩා ව්‍යාපාර නඟා සිටුවීමේ වැඩසටහන - චක්‍රීය අරමුදල	රුපියල්	150.00	සුනාමිය මගින් බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරයන් නැවත ආරම්භ කිරීම සඳහා ණය පහසුකම් ලබා දීම	122.72
හැකියා සංවර්ධන ව්‍යාපෘතිය	රුපියල්	94.31	ගුණාත්මයෙන් අනූන ශ්‍රම බලකායක් බිහි කිරීම සඳහා අවශ්‍ය හැකියා පුහුණු වැඩසටහන් වල අදාලත්වය සහ ගුණාත්මය වැඩි දියුණු කිරීම හා හැකියා නොගැලපීම් ආමන්ත්‍රණය කිරීම	94.59
නාගරික පාරිසරික යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය	ඇ.එ.ජ. ඩොලර්	4.00	නාගරික හා අර්ධ නාගරික ප්‍රදේශවල ජීවත් වන ජනතාවගේ පාරිසරික, සෞඛ්‍ය හා සනීපාරක්ෂක පහසුකම් වර්ධනය කිරීම	369.15
අඩු ආදායම් නිවාස සෙවණ ණය ඇපකර ව්‍යාපෘතිය	ඇ.එ.ජ. ඩොලර්	25.00	රටේ අඩු ආදායම්ලාභී ජනතාවට නිවාස ගොඩනැගීම අළුත්වැඩියාව සහ ඔවුන්ගේ වාසස්ථාන පුළුල් කිරීමට ආධාර කිරීම.	1,362.00
නාගරික සංවර්ධන අඩු ආදායම් නිවාස ව්‍යාපෘතිය	වි.ගැ.හි	15.10	අඩු ආදායම් ලාභීන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම සඳහා නිවාස සංවර්ධනයට ආධාර කිරීම	1,915.76
වයඹ පලාත් ජලසම්පත් සංවර්ධන ව්‍යාපෘතිය	ඇ.එ.ජ. ඩොලර්	1.80	වයඹ පලාත් වාසීන්ගේ ආර්ථික, සමාජීය හා පෝෂණ සුබ සාධනය වැඩි දියුණු කිරීම.	102.76
මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ ව්‍යාපෘතිය	වි.ගැ.හි	2.00	කුඩා ව්‍යවසායකයින්ගේ ආදායම් තිරසාර වර්ධනය	249.06
රට මැද බහු වාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය	වි. ගැ. හි.	11.56	රට මැද බහුවාර්ෂික භෝග නිෂ්පාදන ධාරිතාව නඟා සිටුවීමට ණය පහසුකම් සැලසීම	642.00
කෘෂිකාර්මික පුනරුත්ථාපන ව්‍යාපෘතිය.	වි. ගැ. හි.	17.05	සිවිල් අර්බුද වල බලපෑමට ලක්වූ උතුරු නැගෙනහිර පළාත් හා මායිම් දිස්ත්‍රික්ක පහ තුළ පුද්ගලයන් හා දේපල නැවත නඟා සිටුවීම	843.00
කුඩා තේ වතු හිමියන් සංවර්ධන ව්‍යාපෘති	ඇ.එ.ජ. ඩොලර්	12.60	කුඩා තේ වතු අංශය සංවර්ධනය කිරීම හා තේ වතු පහසුකම් පුනරුත්ථාපනය කිරීම	645.93
දිළිඳු බව පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය	ජපන් යෙන්	1,368.00	ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා විධිමත් ලෙස ණය යොමු කිරීමට ඵලදායී ණය බෙදාහැරීමේ යාන්ත්‍රණයක් ඇති කිරීම	1,402.45
ඉඩම් අහිමි කුඩා පරිමාණ ගොවි ණය ව්‍යාපෘතිය	ඇ.එ.ජ. ඩොලර්	17.40	අඩු ආදායම් ලබන්නන් සඳහා රැකියා උත්පාදනය කිරීමටත්, ඉතිරිකිරීමේ පුරුදු වර්ධනයටත් අවම පිරිවැයක් සහිත තිරසාර ක්ෂුද්‍ර ණය බෙදාහැරීමේ ක්‍රමයක් ස්ථාපිත කිරීම	345.69
කෑගල්ල සමෝධාන ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය	වි. ගැ. හි.	1.50	ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් සඳහා අනුග්‍රහය ලබාදීම මගින් ව්‍යාපෘතිය ක්‍රියාත්මක ප්‍රදේශ වල මිනිසුන්ගේ ජීවන තත්ත්වය නඟා සිටුවීම	148.00
දකුණු පළාත් ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතිය	වි. ගැ. හි.	27.90	දකුණු පළාත් වාසීන්ගේ ජීවන තත්ත්වය උසස් කිරීම හා ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම	564.00
EIB ගිවිසුම් B	යූරෝ	10.00	සංචාරක කර්මාන්තය හා ඒ ආශ්‍රිත සේවා අංශ ද ඇතුළත්ව සුනාමි මගින් සෘජු බලපෑමට ලක්වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් නැවත නඟා සිටුවීම	1,553.27
දෙවන බහුවාර්ෂික භෝග සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල	රුපියල්	1200.00	බහුවාර්ෂික භෝග අපනයනය සම්බන්ධ ක්‍රියාකාරකම් වැඩිදියුණු කිරීම	100.00
මාතලේ ප්‍රාදේශීය ආර්ථිකය වැඩිදියුණු කිරීමේ - චක්‍රීය අරමුදල	රුපියල්	77.00	ග්‍රාමීය ගොවි පවුල්වල ආදායම් වර්ධනය, ගොවි නොවන ව්‍යවසාය සංවර්ධනය සඳහා මධ්‍ය පරිමාණ ව්‍යවසායකත්ව අරමුදල් සම්පාදනය හා එම දිස්ත්‍රික්කයේ පවත්නා ව්‍යාපෘති ප්‍රසාරණය	77.00

සබරගමු පළාත් ග්‍රාමීය සාමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල	රුපියල්	100.00	සබරගමු පළාතේ නව ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා පවතින ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම	100.00
ඉදිකිරීම් අංශය සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	යූරෝ	9.00	පශ්චාත් සුනාමි ප්‍රතිසංස්කරණ කටයුතු යටතේ ඉදිකිරීමේ හා මහජන කටයුතුවලට සක්‍රීයව සහභාගී වීම සඳහා දේශීය පෞද්. ව්‍යාපාරවල මූල්‍ය හා තාක්ෂණික ශක්‍යතා ශක්තිමත් කිරීම	1,399.73
සබරගමු පළාත් ග්‍රාමීය සමෝධානික සංවර්ධන ව්‍යාපෘතිය - අදියර II	රුපියල්	70.00	සබරගමු පළාතේ නව ආදායම් ක්‍රියාකාරකම් ආරම්භ කිරීම හා වැඩි දියුණු කිරීම	70.00
දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II (ප්‍රබෝධිනී)	ජපන් යෙන්	2,381.00	ව්‍යාපෘති ප්‍රදේශයේ සිටින මාසික ආදායම රුපියල් 15,000 ට වඩා අඩු පවුල්වල ජීවන තත්ත්වය වර්ධනය කිරීම	3,213.20
ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය	රුපියල්	250.00	රටතුළ පිළිගත් වෘත්තීය පුහුණු ආයතනවලින් සමත් පුහුණු තරුණ තරුණියන්ට ස්වයං රැකියා ව්‍යාපෘති ගොඩනගා ගැනීමට මූල්‍ය සහනාධාර සැපයීම	232.39
වියලි කලාපීය ජීවනෝපාය හා හවුල්වීමේ ණය සහන වැඩසටහන	රුපියල්	252.95	අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල හා බදුල්ල දිස්ත්‍රික්කවල කෘෂිකර්මාන්තය ආශ්‍රිත ආර්ථික ක්‍රියාකාරකම් හරහා වැඩි ආදායමක් ඉපැයීමට අවස්ථාවක් සැලසීම	252.95
ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන වැඩසටහන	ඇ.එ.ජ. ඩොලර්	32.90	වෙළෙඳපොළ වටිනාකම්දාම තුළ සිට ප්‍රයෝජනලාභීන්ගේ ආදායම් ඉහළ නැංවීම මගින් සුළු ඉඩම් හිමි නිෂ්පාදකයින් හා ඉඩම් අහිමි වූවන්, විශේෂයෙන් යෞවනයන් සඳහා අරමුදල් හා පුහුණුව සපයා දීම	113.13
කුඩා පරිමාණ වැවිලි ව්‍යවසායකයින් සංවර්ධනය කිරීමේ ව්‍යාපෘතිය	වි.ගැ.හි	2.60	නුවර එළිය, මහනුවර, කෑගල්ල, මොණරාගල දිස්ත්‍රික්කවල අඩු ආදයම් ලාභීන්ගේ ජීවන තත්වය උසස් කිරීම	487.66
ජාතික කෘෂි ව්‍යාපාර සංවර්ධන ක්ෂුද්‍ර මූල්‍ය වැඩසටහන (NADeP)	රුපියල්	1,049.84	තෝරාගත් ව්‍යාපෘති ප්‍රදේශවල දිළිඳු ජනතාවගේ ආදායම් සහ සමාජ තත්ත්වය වර්ධනය කිරීම	1,049.84
NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන ප්‍රාග්ධන කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය	රුපියල්	135.69	කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් වැඩි කිරීම	135.69
NADeP හි කොන්ත්‍රාත් ගොවීන්ගේ ණය යෝජනා ක්‍රමය යටතේ ඇති අගය දාම සංවර්ධන සෘතුමය කෘෂිකාර්මික ණය යෝජනා ක්‍රමය	රුපියල්	302.04	කෘෂි නිෂ්පාදනයේ නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණත්වය සහ අගය එකතු කිරීම් තවදුරටත් වැඩි කිරීම	302.04
‘‘තරුණ දිරිය’’ NADeP තරුණයින් බලගැන්වීමේ හා රැකියා යෝජනා ක්‍රමය	රුපියල්	288.48	කුඩා ව්‍යාපාර සහ අනෙකුත් ආකාරයේ ව්‍යවසායකත්ව ස්වයං රැකියා ව්‍යාපෘති සඳහා ණය පහසුකම් සැපයීම තුළින් ග්‍රාමීය මට්ටමේ දිළිඳු යෞවනයන්ගේ ජීවනෝපාය වර්ධනය කිරීම සඳහා උපකාරී වීම.	288.48
වියලි කලාපීය ජීවනෝපාය සහායවීමේ හා හවුල්වීමේ ණය වැඩසටහන - චක්‍රීය අරමුදල	රුපියල්	252.90	අනුරාධපුර, මොණරාගල, කුරුණෑගල සහ බදුල්ල දිස්ත්‍රික්කයන්හි ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා පහසුකම් සැපයීම	252.89
සුළු ගොවියන් හා ඉඩම් අහිමි වූවන් සඳහා වන ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල	රුපියල්	345.69	සුළු පරිමාණ ගොවීන්ගේ කෘෂිකාර්මික නිෂ්පාදන වේගය වැඩිදියුණු කිරීම සහ සුළු පරිමාණ වගා නොවන ග්‍රාමීය ව්‍යවසායන් ස්ථාපනය කිරීම	1,564.75
දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය II - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී)	රුපියල්	2,764.84	ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම් සඳහා ණය සැපයීම මගින් දිළිඳු පවුල්වල ආදායම් තත්වය වැඩි දියුණු කිරීම	7,016.86
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Capital	ඇ.එ.ජ. ඩොලර්	30.29	වාණිජමය නැඹුරුවක් ඇති නිෂ්පාදන හා අලෙවිකරණ ක්‍රියාවලියක නිරත 57,500 ක් පමණ වන කුඩා ව්‍යාපාර හිමියන්ගේ දිළිඳුකම අවම කිරීම, තරඟකාරීත්වය, ආදායම හා ලබාගන්නා ආහාර වේලේ ගුණාත්මක බව වර්ධනයට දායක වීම. මෙම අරමුණු ළඟා කර ගැනීම සඳහා නිෂ්පාදිත කන්ඩායම්වල ධාරිතාවය ගොඩනැගීම හා වැඩිදියුණු කිරීමත්, පෞද්ගලික අංශය සමග හවුල්කාරිත්වයෙන් සබඳතා ජාලය ශක්තිමත් කිරීමත් යන ක්‍රියාවලිය තුළින් අත්පත් කර ගනී	125.85
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Seasonal				854.05
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) Youth				14.45
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) Income Generation				106.42

(ii) දැනට ක්‍රියාත්මක වන ව්‍යාපෘති

ව්‍යාපෘතියේ නම / ණය යෝජනා ක්‍රමය	මුළු අරමුදල් වෙන් කිරීම (මිලියන)		ණය මුදලේ අරමුණ	සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා ප්‍රතිමූල්‍ය ප්‍රතිපාදන (රුපියල් මිලියන)
තේ සංවර්ධන ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල	රුපියල්	1,100.00	තේ ඇඟය සංවර්ධනය සඳහා ණය පහසුකම් සපයාදීම	964.87
ස්වශක්ති ණය යෝජනා ක්‍රමය	රුපියල්	4,000.00	නව හා වත්මන් ව්‍යවසායකයින්ට මූල්‍ය සහනාධාර සැපයීම මගින් නව රැකියා අවස්ථා උත්පාදනය කිරීම	4,448.50
''අත්වැල'' ස්වාභාවික ව්‍යසන මගින් හානිවූ ආර්ථික කටයුතු නැවත නඟා සිටුවීම සඳහා වූ ණය යෝජනා ක්‍රමය (READ)	රුපියල්	2,000.00	රජය මගින් දැනුම් දී ඇති පරිදි ස්වභාවික ව්‍යසනයන්ගෙන් බලපෑමට ලක් වූ ආර්ථික කටයුතු යථා තත්ත්වයට පත් කිරීම සඳහා සුදුසුකම් ලත් ණය ගැතියන්ට මූල්‍ය සහනාධාර සැපයීම	1,687.52
දිළිඳුකම පිටුදැකීමේ ක්ෂුද්‍ර මූල්‍ය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල (ප්‍රබෝධිනී)	රුපියල්	1,031.00	විධිමත් මූල්‍ය පහසුකම්වලට ප්‍රවේශ වීමට අපහසු ග්‍රාමීය දිළිඳු පවුල් සඳහා ආදායම් ජනනය කරනු ලබන ක්‍රියාකාරකම්වලට ණය සැපයීම පිණිස ඵලදායී ණය ප්‍රදාන යාන්ත්‍රණයක් ස්ථාපිත කිරීම	5,518.79
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Agribusiness	ඇ.ඵ.ඡ. ඩොලර්	30.29	කෘෂි නිෂ්පාදනවල නිෂ්පාදනය, ඵලදායීතාවය, ගුණාත්මක බව හා අගය එකතු කිරීම, වැඩි දියුණු කිරීම	458.29
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P Youth				405.09
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Youth				490.21
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Agribusiness				173.85
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Income Generation				121.32
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) 4P FI Bulk Loan.				237.69
කුඩා කෘෂි ව්‍යාපාර, හවුල්කාර වැඩසටහන RFFI Bulk Loan.				59.36
කුඩා කෘෂි ව්‍යාපාර හවුල්කාර වැඩසටහන (SAPP) RF Promoter Bulk Loan.				31.16
ස්වයං රැකියා ප්‍රවර්ධන මූලික ණය යෝජනා ක්‍රමය - අදියර II (SEPI II)	රුපියල්	950.00	ජාතික වෘත්තීය පුහුණු ආයතනයේ සහතිකපත්‍ර හෝ ඩිප්ලෝමා පාඨමාලාව අවසන් කළ යෞවනයන් සඳහා නව ව්‍යාපාරයන් ආරම්භ කිරීමට හෝ පවත්නා ව්‍යාපාරයන් වැඩි දියුණු කිරීමට සහාය දීම	493.13
සැපයුම් දාමය නැවත පණ ගැන්වීම සඳහා ණය යෝජනා ක්‍රමය (SCREL)	රුපියල්	500.00	ලියාපදිංචි තේ නිෂ්පාදනය කරන්නන්ගේ ප්‍රතිවියුහගත ණය සැලසුම් අවසන් කිරීම සඳහා පවතින ව්‍යාපාරයන් නඟා සිටුවීම සහ සැපයුම් දාමය නැවත පණගැන්වීම සඳහා සැපයුම්කරුවන් වෙත ගෙවීමට නියමිත හිඟමුදල් පියවීම	213.75

56. වාර්තාකරණ දිනට පසු ඇතිවූ සිදුවීම්

ශ්‍රී ලංකා රජය වෙත ජාත්‍යන්තර මූල්‍ය අරමුදල මගින් විස්තීර්ණ ණය පහසුකම (EFF) යටතේ 2023 මාර්තු 22 දින ලබාදුන් SDR මිලියන 254.00ක ආධාරය හැරුණු විට, මූල්‍ය ප්‍රකාශනවලට ගැලපීමක් හෝ හෙළිදරව් කිරීමක් අවශ්‍ය වන කිසිදු ප්‍රමාණාත්මක සිදුවීමක් වාර්තා කරන දිනට පසු ඇති නොවීය.

2. බැංකු අධීක්ෂණ

1949 අංක 58 දරන මුදල් නීති පනතේ සහ 1988 අංක 30 දරන බැංකු පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව මෙරට බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මින්මතු බලපත්‍රලාභී බැංකු වශයෙන් හඳුන්වනු ලැබේ) අඛණ්ඩව අධීක්ෂණය කිරීම, කාලීනව ව්‍යවස්ථානුකූල පරීක්ෂා කිරීම සහ බලපත්‍රලාභී බැංකු සඳහා නියාමන මාර්ගෝපදේශ නිකුත් කිරීම සඳහා විශේෂිත බලතල සහ වගකීම් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවට තිබේ. බැංකු ක්ෂේත්‍රයේ සුරක්ෂිතතාව සහ සවිමත්භාවය තහවුරු කිරීම සහ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකුවල තැන්පතුකරුවන්ගේ හා අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ හිමිකම් සුරක්ෂිත කිරීම බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ වේ.

එකී අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී බැංකු නියාමනය සහ අධීක්ෂණය සිදු කිරීම, බැංකු ව්‍යාපාර පවත්වාගෙන යාම සඳහා බලපත්‍ර නිකුත් කිරීම, විචක්ෂණශීලී නියාමන සකස් කිරීම සහ නිකුත් කිරීම, අඛණ්ඩ අධීක්ෂණය සහ කාලීන ව්‍යවස්ථානුකූල පරීක්ෂා කිරීම, බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන්, සහ ප්‍රධාන කළමනාකරණ කාර්යයන් හි නිරත වන නිලධාරීන්ගේ යථා යෝග්‍යතාවය තක්සේරු කිරීම සහ අනුමත කිරීම, නියාමන අනුමැතීන් ලබා දීම, අවශ්‍ය තැන්හි දී මුදල් මණ්ඩලය විසින් නියම කර ඇති පරිදි නියාමන ක්‍රියාමාර්ග ගැනීම සහ බැංකු ක්ෂේත්‍රයේ දැනුම්වත් කිරීම සහ ශක්‍යතා වර්ධනය යන ආදිය සිදු කරනු ලබයි.

2022 වසර අවසානය වන විට මෙරට බැංකු ක්ෂේත්‍රය බලපත්‍රලාභී වාණිජ බැංකු 24කින් සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු 6කින් සමන්විත විය. මෙයට අමතරව, විදේශීය බැංකුවල නියෝජිත කාර්යාල 4ක් ද ශ්‍රී ලංකාව තුළ ස්ථාපනය කර ඇත. මෙරට ක්‍රියාත්මක බලපත්‍රලාභී බැංකු සහ නියෝජිත කර්යාලයන්ගේ නාමලේඛනය ඇමුණුම I හි දක්වා ඇත.

2022 වසරේ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන කාර්යයන්ගේ සාරාංශයක් පහත දක්වා ඇත.

2.1. විචක්ෂණශීලී නියාමනයන් නිකුත් කිරීම

කොවිඩ් පසු කම්පන සහ අභියෝගාත්මක ආර්ථික පරිසරයෙන් යථා තත්ත්වයට පත්වීම මධ්‍යයේ, බැංකු ක්ෂේත්‍රයේ ස්ථායීතාවය සහ ඔරොත්තු දීමේ හැකියාව තහවුරු කිරීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පූර්වෝපායික විචක්ෂණශීලී නියාමන හඳුන්වා දීම සඳහා කටයුතු කරන ලද අතර බලපත්‍රලාභී බැංකුවල අගතියට පත් ණය ගණුදෙනුකරුවන් වෙත තවදුරටත් සහන ලබා දීමටද කටයුතු කරන ලදී.

2022 වසරේ දී හඳුන්වා දුන් ප්‍රධාන විචක්ෂණශීලී නියාමන ක්‍රියාමාර්ගයන් කිහිපයක් පහත සාරාංශගතකර ඇත. මෙකී නියාමනයන් මෙම වාර්තාවේ III වන කොටසෙහි සවිස්තරාත්මකව දක්වා ඇත.

(අ) පවතින අභියෝගාත්මක ආර්ථික තත්වයන් හමුවේ හඳුන්වා දුන් නියාමන අවශ්‍යතාවන්

(ආ) බලපත්‍රලාභී බැංකුවල තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම්

(ඇ) බලපත්‍රලාභී බැංකුවල පශ්චාත් කොවිඩ්-19 පුනර්ජීවන ඒකක පිහිටුවීම පිළිබඳ මාර්ගෝපදේශ

(ඈ) පවතින අභියෝගාත්මක ආර්ථික තත්වයන් හමුවේ අගතියට ලක්වූ ණය ගනුදෙනුකරුවන් සඳහා වන සහන

(ඉ) ද්‍රවශීලතා අනුපාත පිළිබඳ නියාමන අවශ්‍යතා

(ඊ) බලපත්‍රලාභී බැංකුවල අභිමතානුසාරී ගෙවීම් සීමා කිරීම

(උ) පාරිභෝගික ප්‍රඥප්තියට අතිරේකය - විශේෂ අවශ්‍යතා සහිත ගනුදෙනුකරුවන් හට බැංකු සේවා සඳහා ප්‍රවේශයන් සැලසීම

(ඌ) ආනයනයන්ට එරෙහිව ආන්තික අවශ්‍යතා නියම කිරීම

(එ) නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් සඳහා බැංකු (අක්වෙරළ බැංකුකරණ ව්‍යාපාර කටයුතු පටිපාටිය) නියෝගය

(ඒ) බලපත්‍රලාභී බැංකුවල තැන්පත්කරුවන්ගේ අනන්‍ය හඳුනාගැනීමේ අංක සටහන් කිරීම අනිවාර්ය කිරීම

(ඔ) බලපත්‍රලාභී බැංකුවල ණය සහ තැන්පතු පහසුකම් සඳහා වන උපරිම පොලී අනුපාත

(ඕ) බලපත්‍රලාභී වාණිජ බැංකු මගින් විදේශ විනිමය ඉදිරි විකුණුම් සහ මිලට ගැනීම්

(අඅ) බලපත්‍රලාභී බැංකු වල වාර්ෂික බලපත්‍ර ගාස්තු

තවද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ණය පහසුකම් සම්බන්ධයෙන් පවතින උපරිම සීමාවන් පිළිබඳ බැංකු පනත් විධානය වැනි ප්‍රධාන විචක්ෂණ රෙගුලාසීන් සමාලෝචනය කිරීම ආරම්භ කරන ලදී.

2.2 නව බැංකු පනත කෙටුම්පත් කිරීම

බලපත්‍රලාභී බැංකුවල නෛතික සහ නියාමන රාමුව තවදුරටත් ශක්තිමත් කිරීම සඳහා නව බැංකු පනතක් කෙටුම්පත් කිරීම සඳහා අදාළ වන කටයුතු බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. යෝජිත නව බැංකු පනතෙහි සමානුපාතිකත්වය සඳහා විභේදිත නියාමන රාමුවක් හඳුන්වා දීම, ආයතනික යහපාලනය ශක්තිමත් කිරීම, ඒකාබද්ධ අධීක්ෂණය, මූල්‍යමය දණ්ඩනයන්/දඩ පැනවීම, සංස්පර්ෂිත අවදානම අවම කිරීම සඳහා බැංකුවලට සීමානිර්ණ පැනවීම, අත්පත් කර ගැනීම්, ඒකාබද්ධ කිරීම් සහ මිලට ගැනීම් සඳහා ප්‍රතිපාදන ශක්තිමත් කිරීම සඳහා විධිවිධාන ඇතුළත් වේ. මෙම නව පනත 2023 වසර අවසන් වන විට ක්‍රියාත්මක කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව අපේක්ෂා කරයි.

2.3 මුදල් මණ්ඩලය සහ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ විසින් ලබා දුන් අනුමැතීන්

(අ) බලපත්‍රලාභී බැංකු ශාඛා හා වෙනත් බැංකු ඒකක

2022 වර්ෂය අවසන් වන විට දී බැංකු ශාඛා සහ වෙනත් බැංකු ඒකක සඳහා වන ඉල්ලීම් 220ක් සලකා බැලූ අතර ඉන් 178ක් සඳහා අනුමැතීන් ලබා දී ඇති අතර විචක්ෂණශීලී හේතු මත 31ක් පමා කිරීම හෝ ප්‍රතික්ෂේප කර ඇත (II-1 සංඛ්‍යා සටහන). ඒ අනුව 2022 දෙසැම්බර් මස වන විට බැංකු ශාඛා 3,630ක්, ශිෂ්‍ය ඉතුරුම් ඒකක 3,794ක් සහ ස්වයංක්‍රිය සේවා සපයන යන්ත්‍ර 6,678ක් ක්‍රියාත්මක විය.

2022 වසර තුළ දී, කොළඹ වරාය නගරය තුළ අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු 4ක් සඳහා 2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත ප්‍රකාරව ගරු මුදල් අමාත්‍යවරයා විසින් බලපත්‍ර නිකුත් කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් එකඟතාව ලබා දී ඇත.

II-1 සංඛ්‍යා සටහන

බැංකු ශාඛා හා වෙනත් බැංකු ඒකක සඳහා ලබා දුන් අනුමැතීන්

අනුමැතියේ ස්වභාවය	අනුමැතීන් සංඛ්‍යාව	
	ඉල්ලීම්	අනුමැතීන්
විවෘත කිරීම් සහ ස්ථාපනය කිරීම්	**114**	**85**
ශාඛාවන්	29	23
ස්වයංක්‍රිය සේවා සපයන යන්ත්‍ර	51	48
ශිෂ්‍ය ඉතුරුම් ඒකක	4	3
වෙනත් බැංකුකරණ ඒකක	3	2
බලපත්‍රලාභී බැංකුවල නියෝජිතයන්	27	9
ප්‍රතිස්ථාපන කිරීම්	**72**	**62**
ශාඛාවන්	63	54
ස්වයංක්‍රිය සේවා සපයන යන්ත්‍ර	5	4
වෙනත්	4	4
ශාඛා සහ වෙනත් සේවා ඒකක වසා දැමීම හෝ ලබා දී ඇති අනුමැතීන් අවලංගු කිරීම්	8	7
ස්වයංක්‍රිය ටෙලර් යන්ත්‍ර හා අනෙකුත් ස්වයංක්‍රිය යන්ත්‍ර ස්ථාපනය සඳහා ලබා දුන් අනුමැතීන් අත්හිටුවීම් සහ අවලංගු කිරීම	12	12
බලපත්‍රලාභී බැංකුවල නියෝජිතයන් සඳහා ලබා දී ඇති අනුමැතීන් අත්හිටුවීම් සහ අවලංගු කිරීම	14	12
මුළු එකතුව	220	178

(ආ) වෙනත් නියාමන අනුමත කිරීම්

2022 වසර තුළ දී වෙනත් නියාමන අනුමැතීන් 283ක් ලබා දී ඇත (II-2 සංඛ්‍යා සටහන).

II-2 සංඛ්‍යා සටහන

වෙනත් නියාමන අනුමත කිරීම්

අනුමැතියේ ස්වභාවය	අනුමැතීන් සංඛ්‍යාව
අධ්‍යක්ෂවරුන්, ප්‍රධාන විධායක නිලධාරීන්, ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් හා විදේශ විනිමය ව්‍යාපාර කටයුතුවල නිරත වන පුද්ගලයන් පත් කිරීම හා ධුරයේ අඛණ්ඩව රැඳී සිටීම සඳහා යථා යෝග්‍යතාවය තක්සේරු කිරීම	185
සේවා බාහිරීන් ලබා ගැනීමේ කටයුතු	19
වෙළඳපළ වටිනාකමට වඩා අඩු වටිනාකමකට දේපළ බැහැර කිරීම	20
දෙවන ස්ථර ප්‍රාග්ධනයට ණයකර ඇතුළත් කිරීම	3
ණය පහසුකම් සම්බන්ධයෙන් පවතින උපරිම සීමාවන් ප්‍රමාණය ඉක්මවා යාම	1
අතහැර දැමූ දේපල ප්‍රතිපූරණයන්	1
විදේශික සේවකයන් සඳහා නව වීසා බලපත්‍ර ලබා ගැනීම/ වීසා බලපත්‍ර අළුත් කිරීම සඳහා නිර්දේශ නිකුත් කිරීම	17
වෙනත් අනුමත කිරීම්	37
මුළු එකතුව	283

(ඇ) නියාමන ක්‍රියාමාර්ග

2022 වර්ෂයේ දී බලපත්‍රලාභී බැංකු විසින් බැංකු පනත හා එම පනත යටතේ නිකුත් කළ නියාමනයන්ට අනුකූල නොවන අවස්ථා 25ක් සම්බන්ධයෙන් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා අදාළ බැංකුවලට නියම කරන ලදී.

2.4 අබණ්ඩ අධීක්ෂණයන් සිදු කිරීම

(අ) බැංකු පද්ධතියේ මෙහෙයුම් කාර්යක්ෂමතාවය සහ දිගුකාලීන පැවැත්ම සහතික කරලනු වස් අවදානම් හඳුනාගැනීමේ පූර්ව ක්‍රමවේදයක් ලෙස හා අවශ්‍ය අවස්ථාවන්හි දී නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාවට නංවමින් තැන්පත්කරුවන්ගේ අරමුදල්වල සුරක්ෂිතභාවය තහවුරු කිරීම සඳහා එක් එක් බැංකුවේ කටයුතු පිළිබඳව නිරන්තර අධීක්ෂණය කිරීමේ යාන්ත්‍රණය, අබණ්ඩ අධීක්ෂණය යනුවෙන් හඳුන්වනු ලැබේ. සාර්ව ආර්ථිකය සම්බන්ධයෙන් පැන නැගුණු ගැටලු හේතුවෙන් මතු වූ ප්‍රබල අභියෝග මධ්‍යයේ බැංකු අංශය සුරක්ෂිත කිරීම සහ ශක්තිමත් කිරීම අරඹයා අබණ්ඩ අධීක්ෂණය තීව්‍ර කරන ලදී. බැංකු විසින් ජාලගත මාධ්‍යය පාදක කරගත් FinNet පද්ධතිය ඔස්සේ සතිපතා/මාසිකව/කාර්තුමය/වාර්ෂිකව, යොමු කරන්නා වූ කාලීන මූල්‍ය හා විචක්ෂණශීලී තොරතුරු පදනම්ව නිරන්තර අධීක්ෂණය සිදු කරනු ලබයි.

(ආ) 2022 වසරේ පැවති අසාමාන්‍ය තත්ත්වයන් හේතුවෙන් ඇති වූ ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන ආතතීන් සැලකිල්ලට ගනිමින් මුදල් මණ්ඩලයට විශේෂ මුදල් මණ්ඩල පත්‍රිකා ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, ද්‍රවශීලතා සහ ප්‍රාග්ධන සීමාවන් හේතුවෙන් බැංකු විසින් වර්තමානයේ මුහුණ දෙනු ලබන අභියෝග සහ එම සීමාවන් මඟහරවා ගැනීමට බැංකු විසින් අනුගමනය කරනු ලබන උපාය

මාර්ග පිළිබඳව සාකච්ඡා කිරීම සඳහා මුදල් මණ්ඩලයේ සාමාජිකයින් සහ බලපත්‍රලාභී බැංකුවල අධ්‍යක්ෂ මණ්ඩලයේ නියෝජිතයින් හා ප්‍රධාන කළමනාකරණ නිලධාරීන් සමග රැස්වීම් පවත්වන ලදී.

(ඇ) තවද, 2022 වර්ෂය තුළ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තොරතුරු දැනගැනීමේ පනත හා සම්බන්ධ ඉල්ලීම් ආඥන්න වශයෙන් 29ක් සහ පාරිභෝගික පැමිණිලි 177ක් සම්බන්ධයෙන්ද කටයුතු සිදු කරන ලදී.

(ඈ) බලපත්‍රලාභී බැංකුවල ව්‍යවස්ථාපිත පරීක්ෂණවල දී හඳුනාගන්නා ලද නියාමන ගැටලු නියමිත කාලරාමු තුළ දී විසඳීමේ ප්‍රගතිය කාර්තුමය පදනමින් අධීක්ෂණය කිරීම ද බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

2.5 කාලීන පරීක්ෂණ පැවැත්වීම

(අ) 2022 වසර තුළ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු 04ක ව්‍යවස්ථාපිත පරීක්ෂණ ද ඇතුළුව බලපත්‍රලාභී බැංකුවල සම්පූර්ණ විෂය පථය ආවරණය වන ව්‍යවස්ථාපිත පරීක්ෂණ 22ක් පවත්වන ලදී. මෙහිදී, පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු මත පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ 04න් 02ක් එම බැංකුවලට අයත් ආයතන සමූහයන්ගේ ඒකාබද්ධ අවධානම් තත්වයන් පරීක්ෂා කිරීම අරමුණු කර ගනිමින් ඒකාබද්ධ අවධානම් ඇගයීම මත පදනම් වූ ව්‍යවස්ථාපිත පරීක්ෂණ ලෙස දියත් කරන ලදී.

(ආ) 2022 වසර තුළ දී, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් ව්‍යවස්ථාපිත පරීක්ෂණ පිළිබඳ වාර්තා 22ක් මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම වාර්තා 22, 2021 වසර තුළදී සහ 2022 වසර තුළදී පවත්වන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ වාර්තා 12කින් සහ 10කින් පිළිවෙළින් සමන්විත වූ අතර, පද්ධතිමය වශයෙන් වැදගත් දේශීය බැංකු 02ක අතුරු පරීක්ෂණ වාර්තා 2ක්ද මෙයට ඇතුළත් වේ.

(ඇ) ඉහත කරුණුවලට අමතරව, බලපත්‍රලාභී බැංකු කිහිපයක අපනයනය ආදායම් පරිවර්තනය කිරීම් හා භාවිතා කිරීම්, විදේශ ශ්‍රමික ප්‍රේෂණ, විදේශ මුදල් ගණුදෙනු, Fin-Net දත්ත සත්‍යාපනය සහ පාරිභෝගික පැමිණිලි යනාදි වූ කරුණු විමර්ශනය කිරීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සීමිත විෂය පථයක් සහිත ස්ථානීය පරීක්ෂණ 17ක් ද සිදු කරන ලදී.

(ඈ) තවද, 2022 වසර තුළ දී බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය, ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව සහ විදේශ ප්‍රේෂණ පහසුකම් සැලසීමේ දෙපාර්තමේන්තුව සමග සාමූහික ව්‍යවස්ථාපිත පරීක්ෂණ ද සිදු කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී බැංකුවල මෙහෙයුම් කටයුතු වල අවදානම් සාධක සහ අනුකූලතා තත්වයන් කෙරෙහි ප්‍රධාන වශයෙන් අවධානය යොමු කරමින් 2022 වර්ෂය තුළ දී සිදු කරන ලද ව්‍යවස්ථාපිත පරීක්ෂණ 22න් 16ක් මූල්‍ය බුද්ධි ඒකකය සමගද එක් පරීක්ෂණයක් ගෙවීම් හා පියවීම් දෙපාර්තමේන්තුව සමග ද තවත් පරීක්ෂණ 02ක් විදේශ ප්‍රේෂණ පහසුකම් සැලසීමේ දෙපාර්තමේන්තුව සමග ද පවත්වන ලදී.

2.6 අර්බුද සඳහා වූ පෙර සූදානම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග

අර්බුදකාරී තත්වයන්ට මුහුණ දීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ පවත්නා පෙර සූදානම ශක්තිමත් කිරීමෙහි අරමුණින්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් අනෙක් දෙපාර්තමේන්තු ද සමග එක්ව බලපත්‍රලාභී බැංකු වෙත හදිසි ණය සහ අත්තිකාරම් ලබා දීම සඳහා රාමුවක් පිහිටුවීම සඳහා පියවර ගෙන ඇත. තවද, නිරාකරණය සහ තැන්පතු රක්ෂණය පිළිබඳ නියාමන රාමුව ශක්තිමත් කිරීමට සහ අර්බුද කළමනාකරණ කමිටුව පිහිටුවීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සහාය විය.

2.7 බැංකු අංශයේ දැනුම්වත්භාවය, ධාරිතා වර්ධනය සහ 2022 වසර තුලදී පවත්වනු ලැබූ රැස්වීම්

බැංකු අංශයේ මෙන්ම වෙනත් අංශයන්හී ධාරිතා ගොඩනැගීමේ වැඩසටහන් සඳහා සම්පත් දායකත්වය සැපයීම මෙන්ම, තම කාර්යමණ්ඩලය සඳහා පුහුණු හා සංවර්ධන අවස්ථා සැලසීම සඳහා බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව 2022 වසරේදීත් අඛණ්ඩව කටයුතු කරන ලද අතර, මෙම වැඩසටහන් මඟින් බැංකුකරණය සහ මූල්‍ය, නියාමන අනුකූලතාව, අවදානම් කළමනාකරණය, සහ තිරසාර මූල්‍ය වැනි ක්ෂේත්‍ර ආවරණය විය. තවද, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් 2022 වසරේදීත් විවිධ කමිටු රැසක සාමාජිකත්වය දරමින් අඛණ්ඩව සේවය සැපයීමට කටයුතු කර ඇත.

පැවති අසාමාන්‍ය ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ ආර්ථික ප්‍රවණතා සම්බන්ධ කරුණු සහ බැංකු ක්ෂේත්‍රය සහ රෙගුලාසි හා අධීක්ෂණ රාමුව පිළිබඳ කාරණා, සාකච්ඡාවට ලක් කිරීමේ අරමුණින්, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2022 දී බැංකු ප්‍රධාන විධායක නිලධාරීන්ගේ මාසික රැස්වීම් 10ක් සහ විශේෂ රැස්වීම් 4ක් පවත්වන ලදී. මීට අමතරව, බැංකු අංශයේ කාර්යසාධනය, ආර්ථිකයෙහි ඇති වූ වර්ධනයන් සහ පවතින ආර්ථික අර්බුදය හමුවේ බැංකු නියාමන අපේක්ෂාවන් පිළිබඳව අවබෝධයක් ඇති කිරීමේ අරමුණින්, බැංකු සභාපතිවරුන්ගේ රැස්වීම් 2ක් ද සංවිධානය කෙරිණි.

2022 වර්ෂය තුළ දී, මූල්‍ය අංශයේ ස්ථායීකරණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් ලෝක බැංකුව, ආසියානු සංවර්ධන බැංකුව සහ ජාත්‍යන්තර මුල්‍ය අරමුදල නියෝජනය කරන ලද දූත මණ්ඩල කිහිපයක් සමග සාකච්ඡා පැවැත්වීමට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තු නිලධාරීන් තම දායකත්වය ලබා දෙන ලදී.

ඇමුණුම II-1

2022.12.31 දිනට බලපත්‍රලාභී බැංකුවල නාමලේඛනය

බලපත්‍රලාභී වාණිජ බැංකු

1. අමානා බෑන්ක් පී එල් සී
2. ලංකා බැංකුව
3. බෑන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්
4. කාගිල්ස් බෑන්ක් ලිමිටඩ්
5. සිටි බෑන්ක් එන් ඒ
6. කොමර්ෂල් බෑන්ක් ඔෆ් සීලෝන් පී එල් සී
7. ඩොයිමේ බෑන්ක් ඒ ජී
8. ඩී එෆ් සී සී බෑන්ක් පී එල් සී
9. හබීබ් බෑන්ක් ලිමිටඩ්
10. හැටන් නැෂනල් බෑන්ක් පී එල් සී
11. ඉන්දියන් බෑන්ක්
12. ඉන්දියන් ඕවර්සීස් බෑන්ක්
13. එම් සී බී බෑන්ක් ලිමිටඩ්
14. නැෂනල් ඩිවලොප්මන්ට් බෑන්ක් පී එල් සී
15. නේෂන්ස් ට්‍රස්ට් බෑන්ක් පී එල් සී
16. පෑන් ඒෂියා බෑන්කින් කෝපරේෂන් පී එල් සී
17. මහජන බැංකුව
18. පබ්ලික් බෑන්ක් බර්හෑඩ්
19. සම්පත් බෑන්ක් පී එල් සී
20. සෙලාන් බෑන්ක් පී එල් සී
21. ස්ටෑන්ඩර්ඩ් චාර්ටඩ් බෑන්ක්
22. ස්ටේට් බෑන්ක් ඔෆ් ඉන්දියා
23. ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ්
24. යූනියන් බෑන්ක් ඔෆ් කලම්බු පී එල් සී

බලපත්‍රලාභී විශේෂිත බැංකු

1. ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
2. ජාතික ඉතිරිකිරීමේ බැංකුව
3. ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
4. සණස ඩිවලොප්මන්ට් බෑන්ක් පී එල් සී
5. ශ්‍රී ලංකා සේවින්ස් බෑන්ක් ලිමිටඩ්
6. රාජ්‍ය උකස් හා ආයෝජන බැංකුව

විදේශ බැංකු වල නියෝජිත කාර්යාල

1. දෝහා බෑන්ක් කිව් පී එස් සී
2. ජේ පී මෝගන් චේස් බෑන්ක් එන් ඒ
3. එම් යූ එෆ් ජී බෑන්ක් ලිමිටඩ්
4. අයි සී අයි සී අයි බෑන්ක් ලිමිටඩ්

3. බැංකු විදු පියෙස

ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු විදු පියෙස දශක 04 කටත් අධික කාලයක් මුළුල්ලේ ශ්‍රී ලංකාවේ මුල්‍ය සේවා අංශයේ ධාරිතාව ඉහළ නැංවීම සඳහා ඵලදායී පුහුණු වැඩසටහන් පැවැත්වීමේ දී ප්‍රමුඛත්වය ගෙන කටයුතු කරයි. ඊට අමතරව කාලීන වැදගත්කමකින් යුතු ආර්ථිකයට අදාල කාරණා පිළිබඳව සමාජයේ දැනුවත්බව වැඩි දියුණු කිරීම සඳහා විවිධ දේශන සහ සාකච්ඡාවන් ද බැංකු විදු පියෙස මගින් සංවිධානය කරයි. 2022 වසර තුළදී තාක්ෂණික වර්ධනයන් මගින් පෝෂණය වූ මූල්‍ය අංශයේ සීඝ්‍රයෙන් වෙනස් වන පුහුණු අවශ්‍යතා සපුරාලීම සඳහා බැංකු විදු පියෙසේ අවධානය මූලික වශයෙන් යොමුවූ අතර, එහි පාර්ශවකරුවන්ට බැංකු හා මූල්‍ය අංශය ඉහළ තලයකට ඔසවා තැබීමට අවශ්‍ය දැනුම සහ අති නවීන කුසලතා ලබා දීමෙන් ඔවුන්ගේ වෘත්තීය අරමුණු සාක්ෂාත් කර ගැනීමට සහාය විය. එසේම Covid-19 වසංගතයේ අවසාන අදියර මෙන්ම ආර්ථික අර්බුද සහ සමාජ නොසන්සුන්තාව හේතුවෙන් බාධා ඇති වුවද, බැංකු විදු පියෙස 2022 වසර පුරා සිය සේවාවන් අඛණ්ඩව පවත්වා ගෙන යන ලදී.

වර්තමාන අවශ්‍යතා සපුරාලීම සඳහා දැනට පවතින වැඩසටහන් තවදුරටත් වැඩිදියුණු කිරීමේ අරමුණින් සහ ඉහළ ඉල්ලුමක් ඇති නව්‍ය සහ නැගී එන විෂය ක්ෂේත්‍ර ආවරණය කිරීම සඳහා 2022 දී බැංකු විදු පියෙස විසින් නව පුහුණු වැඩසටහන් ගණනාවක් හඳුන්වා දෙන ලදී. මෙම නව පුහුණු වැඩහටහන් ශ්‍රී ලාංකේය මූල්‍ය ක්ෂේත්‍රය පමණක් නොව, කලාපය පුරා උනන්දුවක් දක්වන අනෙකුත් පාර්ශවයන් ඉලක්ක කර ගනිමින් බැංකු සහ මූල්‍ය, අවදානම් කළමනාකරණය සහ අනුකූලතාව, භාණ්ඩාගාර මෙහෙයුම්, ගිණුම්කරණය සහ මූල්‍ය කළමනාකරණය, නීති සහ රෙගුලාසි, පර්යේෂණ සහ දත්ත විශ්ලේෂණ, ආර්ථික විද්‍යා, මානව සම්පත් සහ කළමනාකරණය, ග්‍රාමීය අංශ සංවර්ධනය සහ ක්ෂුද්‍ර මූල්‍ය, තොරතුරු තාක්ෂණය සහ මෘදු කුසලතා ඇතුළු විවිධ ක්ෂේත්‍ර ආවරණය වන පරිදි හඳුන්වා දෙන ලදී.

බැංකු විදු පියෙස විසින් 2022 වසර තුළ දී පෙර සැලසුම් කරන ලද වැඩසටහන් 65ක් (අලුතින් හඳුන්වා දුන් වැඩසටහන් 10ක් ද ඇතුළුව), විශේෂිත වැඩසටහන් 19ක්, (විවිධ ආයතනවල ඉල්ලීම මත සකස් කරන ලද සහ වෙළඳපල ඉල්ලුමට අනුව සකස් කරන ලද වැඩසටහන්), සහතිකපත්‍ර පාඨමාලා 4ක් සහ ජාත්‍යන්තර මූල්‍ය ආයතනවල සහයෝගිත්වයෙන් සිදු කල වැඩසටහන් 4ක් ද ඇතුළුව සම්පූර්ණ වැඩසටහන් 140ක් පවත්වන ලදී. තවද, බැංකු විදු පියෙස ආසියානු කලාපයේ ප්‍රමුඛ ධාරිතා ගොඩනැංවීමේ හවුල්කරුවෙකු ලෙස මංසලකුණු ස්ථාපිත කිරීමේ අරමුණින්, 2022 වසරේ දී කලාපීය දැනුම බෙදාගැනීමේ වැඩසටහනක් හඳුන්වා දෙමින් බැංකු විදු පියෙස විසින් තවත් සන්ධිස්ථානයක් සනිටුහන් කරන ලදී. “Developments in FinTech and Central Bank Digital Currencies” පිළිබඳව පැවැත්වූ මෙම වැඩසටහන සඳහා ආසියානු කලාපයෙන් විදේශීය සහභාගිවන්නන් රැසක් සහභාගී විය. තවද, බැංකු විදු පියෙස විසින් විවිධ අංශයන් නියෝජනය කරන ප්‍රවීණයන්ගේ සහභාගීත්වයෙන් වත්මන් ආර්ථික මාතෘකා සාකච්ඡා කිරීමට වේදිකාවක් නිර්මාණය කිරීමේ අරමුණ ඇතිව 2022 මාර්තු මාසයේ දී විද්වත් මණ්ඩල කතිකා (EPD) මාලාවක් දියත් කරන ලදී. මෙම සාකච්ඡා මගින් අපේක්ෂා කරනුයේ සුමට ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාවලියක් ඇති කිරීම සඳහා මහජනතාව සහ ව්‍යාපාරික ප්‍රජාව ප්‍රතිපත්ති සම්පාදකයින් හට ගැටළු සම්බන්ධයෙන් විවිධ දෘෂ්ටිකෝණයන් අවබෝධ කරලීම හා ව්‍යාපාරික ප්‍රජාව හා මහජනතාව අතර දැනුවත් භාවයක් ඇති කරලීමයි. මීට අමතරව, රාජ්‍ය සහ පෞද්ගලික අංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් ඇතුළු මෙවන් කතිකාවන් සඳහා උනන්දුවක් දක්වන සියලු

පාර්ශවයන් ඉලක්ක කර ගනිමින් "Confronting the current Foreign Exchange Crisis in Sri Lanka: Lessons from Global Experiance" යන මැයෙන් මෙම වසරේදී ඉහළ පෙළ සම්මන්ත්‍රණයක් (HLS) සාර්ථකව පවත්වන ලදී.

තවද 2022 වසර තුළදීත්, ශ්‍රී ලංකාව තුල තිරසර මූල්‍ය ක්‍රියාවලීන් ශක්තිමත් කිරීම සඳහා අවශ්‍ය කරන පුහුණු වැඩසටහන් සංවිධානය කිරීමට ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවේද (International Finance Corporation) සහාය ඇතිව බැංකු විදු පියෙස කටයුතු කරන ලදී. මීට අමතරව අග්නිදිග ආසියානු මහ බැංකු පර්යේෂණ සහ පුහුණු මධ්‍යස්ථානය (The Southeast Asian Central Banks Research and Training Centre) සහ ජර්මනියේ මහ බැංකුව වන Deutsche Bundesbank ඇතුළු ලොව පිළිගත් මූල්‍ය ආයතනවල සහයෝගීත්වය සහිතව "Recovery and Resolution with a Focus on Credit Institutions", "Monetary Policy Implementation - Importance of Market Intelligence", "FinTech Regulation and Supervision" යන පුහුණු වැඩසටහන් බැංකු විදු පියෙස විසින් සංවිධානය කෙරිණි. එමෙන්ම ආර්ථික සංකල්ප සහ මූල්‍ය පද්ධතිය පිළිබඳ ජනමාධ්‍යවේදීන් සතු දැනුම ඉහළ නැංවීමේ අරමුණින් සම්පාදනය කරන ලද "ජනමාධ්‍යවේදීන් සඳහා සාර්ව ආර්ථික විද්‍යාව" නමින් නව සහතික පත්‍ර පාඨමාලාවක් ද බැංකු විදු පියෙස විසින් 2022 වසරේදී දියත් කරන ලදි.

ශ්‍රී ලාංකීය පුරවැසියන්ගේ මූල්‍ය සහ ආර්ථික සාක්ෂරතාවය ඉහළනැංවීමේ සමාජ වගකීම තව දුරටත් ඉටු කරමින්, විවිධ විෂය ක්ෂේත්‍ර ආවරණය වන දැනුවත් කිරීමේ වැඩසටහන් රාශියක් 2022 වසරේ දී බැංකු විදු පියෙස සංවිධානය කල අතර එයට ප්‍රසිද්ධ දේශනා 20ක් ද අන්තර්ගත විය. තවද රටෙහි අධ්‍යාපන ක්ෂේත්‍රයටද අවශ්‍ය දායකත්වය ලබා දෙමින් උපාධි අපේක්ෂකයන් සහ පාසල් සිසුන් සඳහා වැඩසටහන් 8ක් පවත්වන ලදී. මේ අතරට, ද්විතියික පාසල් දරුවන් ඉලක්ක කරගනිමින් "මූල්‍ය සාක්ෂරතාව" පිළිබඳ අලුතින් ආරම්භ කරන ලද වැඩසටහන් 2ක් ද ඇතුලත් විය.

තවද, උසස් පෙළ සඳහා ආර්ථික විද්‍යාව හදාරන සිසුන් ඉලක්ක කර ගනිමින් නිෂ්පාදනය කෙරෙන "තක්ෂිලාව" සහ " අරිවුවිරු" යන රූපවාහිනී වැඩසටහන් ද්විත්වය 2022 වසරේදී ද බැංකු විදු පියෙස විසින් සම්බන්ධීකරණය කරන ලදී. සිංහල සහ දමිල මාධ්‍යයන්ගෙන් විකාශනය වූ මෙම වැඩසටහන් කොටස් 20කින් සමන්විත විය. එමෙන්ම, බැංකු විදු පියෙස විසින් ශ්‍රී ලංකා මහ බැංකුවෙහි ප්‍රාදේශීය කාර්යාල සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සමග එක්ව ප්‍රාදේශීය මට්ටමේ වැඩසටහන් මාලාවක් ද වසර පුරා පවත්වන ලදී. සමස්තයක් ලෙස ගත් කල 2022 වසර තුළදී බැංකු විදු පියෙස පරීශ්‍රයට පැමිණ හෝ මාර්ගගත ක්‍රමවේදයන් ඔස්සේ පුද්ගලයින් 10,447දෙනෙකු මෙහි පැවැත්වූ වැඩසටහන්වලට සහභාගී වී ඇත.

තවද බැංකු විදු පියෙසෙහි මෙහෙයුම් වල කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීම සඳහා, නවීකරණය කරන ලද වෙබ් අඩවියට සමාන්තරව ආයතනික කළමණාකරණ පද්ධතියක් (IMS) ද 2022 වසරේදී හඳුන්වා දෙන ලදි.

ස්ථාවර මෙන්ම ශක්තිමත් මූල්‍ය පද්ධතියක පැවැත්ම සහතික කරලීම සඳහා මූල්‍ය ක්ෂේත්‍රයේ වෘත්තිකයන් දැනුමෙන් සහ කුසලතාවයන්ගෙන් තවදුරටත් ශක්තිමත් කිරීම අරමුණු කරගනිමින් 2022 වසර අවසානයේ දී බැංකු විදු පියෙස විසින්, 2023 වසර සඳහා වූ සිය පාඨමාලා නාමාවලිය ද එලිදක්වන ලදි.

4. සන්නිවේදන

බොහෝ අවිනිශ්චිතතාවන් මධ්‍යයේ වුව ද 2022 වසරේ දී ශ්‍රී ලංකා මහ බැංකුව සිය ප්‍රතිපත්තිමය තීරණ හා ඒවායින් ආර්ථිකය මත ඇති කරන බලපෑම පිළිබඳ ව වඩාත් පැහැදිලි කිරීමට සහ ජනතා අපේක්ෂා මත අනුබලයක් ඇති කිරීමේ අරමුණින් විවිධ තලයේ සන්නිවේදන උපායමාර්ග භාවිත කරමින් විවිධ සන්නිවේදන මාධ්‍ය ඔස්සේ මහජනතාව ඇතුළු ඉලක්කගත ග්‍රාහක සමූහයා වෙත තොරතුරු බෙදාහැරීමේ නිරත විය. එම අභ්‍යන්තර හා බාහිර සන්නිවේදන කටයුතු කලට වේලාවට ඉටු කරගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවලට අවශ්‍ය සහයෝගය සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ලබා දෙන ලදි.

4.1 අභ්‍යන්තර සන්නිවේදනය

සන්නිවේදන දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති තීරණවලට මාධ්‍ය විසින් දක්වනු ලබන ප්‍රතිචාර හඳුනා ගන්නා අතරතුර, මුදල් ප්‍රතිපත්ති විවරණයෙහි මූලික පණිවුඩ අදාළ පාර්ශ්වයන් වෙත ළඟා වීමේ සඵලදායීත්වය තක්සේරු කිරීමට, විශේෂයෙන් ම, එක් එක් මාධ්‍ය හමුවෙන් පසු සතියක කාලයක් තුළ හා මුදල් ප්‍රතිපත්ති විවරණ වටයන් ආරම්භයේ දී මාධ්‍යය විසින් වාර්තා කරනු ලබන පරිදි වෙළෙඳපොළ අභිප්‍රායයන් සහ ප්‍රතිපත්ති පොලී අනුපාතික පුරෝකථන විශ්ලේෂණ සිදු කිරීම මගින් නිසි කළමනාකරණ තොරතුරු ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්තිමය කර්තව්‍යයන් උදෙසා සහාය ලබා දුනි. එමෙන්ම, ශ්‍රී ලංකා මහ බැංකුවේ සිදුවීම් පිළිබඳ කාර්ය මණ්ඩලයේ මනා දැනුවත් බව තහවුරු කිරීමේ අරමුණින්, මහ බැංකුවේ මාධ්‍ය හමු සහ අනෙකුත් වැදගත් අවස්ථාවල සජීවී මාධ්‍ය ආවරණ ඔවුන්ගේ පරිගණක වෙත සැපයීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව සහාය විය. රැකියා පරිසරයේ බෙදීම් සහ සීමා බිඳ දැමීමට සහ කාර්ය මණ්ඩලය අතර අදාළ දෙපාර්තමේන්තුවල ප්‍රතිපත්ති සහ ක්‍රියාවලීන්ට අදාළව තොරතුරු හුවමාරු කර ගැනීමට 2022 වසරේ දී මංගත දැනුම හුවමාරු කර ගැනීමේ සැසියක් හඳුන්වා දෙනු ලැබූ අතර, මෙහි දී මයික්‍රොසොෆ්ට් ටීම්ස් (MS Teams) වේදිකාව ඔස්සේ කාලීන මාතෘකා 8ක් සාකච්ඡා කෙරිණි. මහ බැංකුවේ සියලුම කාර්ය මණ්ඩලය දේශීය ආර්ථිකය පිළිබඳව මෙන්ම ගෝලීය මූල්‍ය වෙළෙඳපොළෙහි ප්‍රවණතාවන් පිළිබඳ මනා දැනුමින් හෙබි නිලධාරීන් බවට තහවුරු කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුවේ පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය මගින්, සියලුම අදාළ පුවත්පත් ලිපි අභ්‍යන්තර ජාලය වෙත උඩුගත කර අදාළ සියලුම මංගත පුවත් විද්‍යුත් තැපෑල ඔස්සේ කාර්ය මණ්ඩලය අතර බෙදා හරින ලදී. සියලුම ඉතා වැදගත් පුවත් අයිතම ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ අවධානයට යොමු කරනු ලැබිණි. මුද්‍රිත පුවත්පත්වල මිල ඉහළ යෑම සලකා බලමින්,

පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථානය එම පිරිවැය අවම කර ගැනීම සඳහා විද්‍යුත් පුවත්පත් පරිශීලනයට අවතීර්ණ විය. වෙනත් රටවල් මෙවන් අර්බුදකාරී අවස්ථාවලට මුහුණ දී ඇත්තේ කෙසේද සහ ඔවුන් සිය රටවල අර්බුද ජය ගැනීමට ගත් ක්‍රියා මාර්ග මොනවාද යන්න පිළිබඳව තොරතුරු අඩංගු විද්‍යුත් ග්‍රන්ථ, ග්‍රන්ථවල අදාළ පරිච්ඡේද, විද්වත් ලිපි යනාදිය කාර්ය මණ්ඩලය අතර පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් බෙදා හරින ලදී. මීට අමතරව, පුස්තකාල සහ තොරතුරු මධ්‍යස්ථානය ජාතික කියවීමේ මාසය සමරනු වස් කාර්ය මණ්ඩලය සඳහා ග්‍රන්ථ විචාර තරගයක් යළි දියත් කළ අතර, ජයග්‍රාහකයන් දෙදෙනෙකු තෝරා ගනු ලැබිණි. ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්ය මණ්ඩලයෙහි නිර්මාණ විශේෂාංග ලිපි සහ පුවත් ඇතුළත් නිල අභ්‍යන්තර ප්‍රවෘත්ති ප්‍රකාශනය වන "කවුළුව" ඩිජිටල් ආකෘතියෙන් ප්‍රකාශයට පත් කෙරුණු අතර, එය කාර්තුමය පදනමක් මත මංසල වෙත උඩුගත කෙරිණි.

4.2 බාහිර සන්නිවේදන

පසු ගිය වසරවල දී මෙන්, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සහ ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුව සමග සහයෝගයෙන් පිළිවෙලින් ප්‍රතිපත්ති පොලී අනුපාතික සහ විනිමය (විදුලි පැවරුම්) අනුපාතිකවලට අදාළව කෙටි පණිවුඩ සේවාව හරහා තත්කාලීන දැනුම් දීම් ද අඛණ්ඩව සිදු කරන ලදි. තවද, ව්‍යවහාර මුදල අවප්‍රමාණය වීම සලකා බලමින්, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව සියලුම බලපතලාභී වාණිජ බැංකුවල ජ්‍යෙෂ්ඨ නිලධාරීන් වෙත එ.ජ.ඩො./ශ්‍රී ලංකා රුපියල් මධ්‍ය එතැන් විනිමය අනුපාතිකය සහ විචල්‍ය අනුපාතිකය භාෂාත්‍රයෙන් ම නිකුත් කරන ලදී. මීට අමතරව, සන්නිවේදන දෙපාර්තමේන්තුව සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ සහයෝගයෙන් 2022 වසර තුළ දී දෛනික, සතිපතා සහ මාසික පදනම මත ප්‍රධාන ආර්ථික දර්ශක ප්‍රකාශයට පත් කරන ලදී.

'මුදල් ප්‍රතිපත්ති විවරණය'ට අදාළ මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ ප්‍රධාන තීරණ සහ මූල්‍ය ආයතන සහ මූල්‍ය වෙළෙඳපොළ සම්බන්ධව මාධ්‍ය නිවේදන 1,860ක් භාෂාත්‍රයෙන් ම නිකුත් කෙරිණි. වසර ආරම්භයේ දී අපේක්ෂා කළ පරිදි, සන්නිවේදන දෙපාර්තමේන්තුව මුදල් ප්‍රතිපත්ති විවරණය පිළිබඳව මාධ්‍ය හමු 8ක් සංවිධානය කළ අතර, සුවිසල් ප්‍රේක්ෂක ප්‍රජාවක් වෙත මෙම පණිවුඩ ප්‍රතිප්‍රචාරණය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සමාජ මාධ්‍ය නාලිකා ඔස්සේ සජීව විකාශය සිදු කෙරිණි. එමෙන්ම, මෙම දෙපාර්තමේන්තුව විසින් මෙම තීරණ සඳහා මුල් වූ කරුණු සරලව පහදා දීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ බැංකු විදු පියස සමග සහයෝගයෙන් පිළිවෙළින් නුවරඑළිය, ත්‍රිකුණාමලය, මාතලේ සහ මාතර යන ප්‍රාදේශීය කාර්යාලවල දී සිංහල සහ දෙමළ භාෂාවලින් මංගත දැනුවත් කිරීමේ සැසි 4ක් ද සංවිධානය කරන ලදී.

සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් විදේශ ප්‍රේෂණ සම්බන්ධයෙන් සහ වත්මන් ආර්ථික තත්ත්වය පිළිබඳ අතිරේක මාධ්‍ය හමු කිහිපයක් සඳහා පහසුකම් සැලසූ අතර, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි ඉල්ලීම මත මාධ්‍ය හමුවක් පවත්වන ලදී. මේ අතර, 2022 වසරේ දී අනෙකුත් දෙපාර්තමේන්තුවල අවශ්‍යතාවන්ට අනුව සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ගැසට් නිවේදන 12ක් සහ ප්‍රචාරණ දැන්වීම් ඇතුළුව මාධ්‍ය දැන්වීම් 141ක් ද නිකුත් කරන ලදී.

ජීවිතයකට යහපත් පුරුදු ඉගැන්විය හැක්කේ පාසල් වියේ දී වන බැවින්, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර ප්‍රාදේශීය කාර්යාලයේ සහයෝගයෙන් කැකිරාව සහ රාජාංගනයෙහි පාසල්වල දරුවන්ගේ ආර්ථික විද්‍යා දැනුම සහ මූල්‍ය සාක්ෂරතා මට්ටම් ඉහළ නැංවීමේ අරමුණැතිව ඔවුන් සඳහා ප්‍රාදේශීය මට්ටමින් දැනුවත් කිරීමේ වැඩසටහන් සංවිධානය කරන ලදී. මූල්‍ය සාක්ෂරතාවෙන් යුත් සමාජයක් ඇතිකරලීමට, නිති පදනමක් මත ඉතිරි කිරීමේ වැදගත්කම ඉස්මතු කරමින් මෙම අවස්ථාවට සමගාමීව, චිත්‍ර සහ රචනා තරග ද සංවිධානය කළ අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානයේ සහාය ඇතිව පොත් ලබා දීමේ වැඩසටහනක් ද සංවිධානය කෙරිණි. ඊට අමතරව, මහ බැංකු අරමුණු සහ කාර්යයන් මෙන්ම, ආර්ථික විද්‍යාව, බැංකුකරණය සහ මූල්‍යය යන විෂයයන් යටතේ තෝරා ගත් මාතෘකා මත දැනුවත් කිරීමේ වැඩසටහන් 52ක් පාසල් දරුවන් හා විද්‍යාර්ථීන් සඳහා ඉල්ලීම් මත සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් මහ බැංකු ප්‍රධාන කාර්යාලයේ සංවිධානය කළ අතර, මේ සමග ශ්‍රී ලංකා මහ බැංකුවේ ව්‍යවහාර මුදල් කෞතුකාගාරය නැරඹීමේ අවස්ථාව ද ලබා දුණි. මීට අමතරව, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් ඉලක්ක කරගනිමින් "ශ්‍රී ලංකාවේ වත්මන් ආර්ථික තත්ත්වය සහ ඉදිරි ගමන්මග" පිළිබඳ ඔවුන්ගේ දැනුම යාවත්කාලීන කර ගැනීමට වැඩසටහන් මෙන්ම, බලපිටිය සහ අම්බලන්ගොඩ ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් ඉලක්ක කරගනිමින් "පිරමීඩ යෝජනා ක්‍රම ඇතුළුව, නීතිවිරෝධී සහ නීත්‍යනුකූල නොවන මූල්‍ය කටයුතු" පිළිබඳව ඔවුන්ගේ දැනුවත්බව වර්ධනය කර ගැනීමට තවත් වැඩසටහනක් ද සංවිධානය කරන ලදී.

තවද, පාසල් දරුවන්ගේ මූල්‍ය සාක්ෂරතා මට්ටම් ඉහළ නැංවීම පිණිස ශ්‍රී ලංකා මහ බැංකු කාර්යයන්ට අදාළ මාතෘකා මත "ව්‍යවසායකත්වය සහ මූල්‍ය සාක්ෂරතාව" නම් අලුතින් හඳුන්වා දුන් විෂයයෙහි විෂය නිර්දේශයට යෝජනා ඉදිරිපත් කිරීමට පත් කළ කමිටුවේ ශ්‍රී ලංකා මහ බැංකුවේ දෙපාර්තමේන්තු හයක් සහ ජාතික අධ්‍යාපන ආයතනය සමග සම්බන්ධීකරණය ප්‍රධාන දෙපාර්තමේන්තුව/ලේකම්වරයා ලෙස සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

මහ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තුවල සහාය ද ඇතිව, සන්නිවේදන දෙපාර්තමේන්තුව යාවත්කාලීන කරන ලද මහ බැංකු නිල වෙබ් අඩවිය වසර පුරා ජාතික භාෂා ප්‍රතිපත්තියට

අනුකූලව භාෂාත්‍රයෙන් ම අඛණ්ඩව පවත්වා ගෙන යන ලදි. මහ බැංකුව විසින් ඉටු කරනු ලබන කාර්යයන්ට අදාළව නිතර යොමු කරන මහජන විමසීම්වලට ප්‍රතිචාරයක් ලෙස, මහ බැංකු පොදු විද්‍යුත් තැපෑල ඔස්සේ ලැබෙන විද්‍යුත් තැපැල් පණිවුඩ සමාලෝචනය කර, ඍජුවම ඒ සඳහා ප්‍රතිචාර කිරීමට හැකි වන සේ අදාළ දෙපාර්තමේන්තු වෙත යවන ලදි. ඇතැම් විමසීම් සඳහා අදාළ තොරතුරු ඇති අවස්ථාවල දී සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් ම ප්‍රතිචාර දක්වන ලදී.

මාධ්‍ය නිවේදන, පුවත්පත් දැන්වීම්, විධාන, වාර්ෂික වාර්තාව යනාදිය ඇතුළු අනෙකුත් ප්‍රකාශනයන්හි දෙමළ භාෂා පරිවර්තන අවශ්‍යතා සපුරාලීමට සන්නිවේදන දෙපාර්තමේන්තුවෙහි පිහිටුවා ඇති දෙමළ භාෂා පරිවර්තන ඒකකය පිටු 5,022කින් සමන්විත කාර්යයන් 1,161ක නිරත විණි.

එමෙන්ම, සන්නිවේදන දෙපාර්තමේන්තුව මහ ජනයාගේ මූල්‍ය සාක්ෂරතා මට්ටම් ඉහළ නැංවීමට සහ විදේශ ප්‍රේෂණ සහ සේවක අර්ථසාධක අරමුදල් සේවා වැනි ආශ්‍රිත අංශ පිළිබඳ ප්‍රයෝජනවත් තොරතුරු සැපයීමට අනෙකුත් දෙපාර්තමේන්තු සමග සහයෝගීව ගුවන්විදුලි සාකච්ඡාවන් දෙකක් සහ රූපවාහිනී වැඩසටහන් තුනක් සංවිධානය කරන ලදී.

තම පර්යේෂණ කටයුතු සඳහා තොරතුරු අවශ්‍ය වූ විශ්වවිද්‍යාල විද්‍යාර්ථීන් සහ අනෙකුත් බාහිර පර්යේෂකයන් විසින් සිදු කරන ලද ඉල්ලීම්වලට අනුව පුස්තකාලය සහ තොරතුරු මධ්‍යස්ථානය විසින් ඊට ඉඩ ලබා දුන් අතර, තම සාකච්ඡා, දේශන සහ අධ්‍යයන කටයුතු සඳහා පුස්තකාලය භාවිත කිරීමට මහ බැංකුවේ සීමාවාසික පුහුණුවෙහි නිරත විශ්වවිද්‍යාල සිසුන් 36 දෙනෙකුට ඒ සඳහා පහසුකම් සලසන ලදී.

මින් පෙර වසරේ දී මෙන්, මහ බැංකුවේ කතුවරයන්ට ඔවුන්ගේ අදාළ ක්ෂේත්‍රවල හැකියාව වැඩි දියුණු කර ගැනීමට තෝතැන්නක් සපයමින්, සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් "සටහන", "නිව්ස් සර්වේ" සහ "වෛජ්පහම්" යන වාර සඟරා අඛණ්ඩව වෙබ් අඩවියෙහි පළ කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පවත්වන ලද සියලුම වැදගත් සිදුවීම්/අවස්ථාවන්හි ඡායාරූප ආවරණය සන්නිවේදන දෙපාර්තමේන්තුවේ ඡායාරූප ඒකකය මගින් ඉටු කෙරිණි. සමස්තයක් ලෙස, අවස්ථා 160ක් ආවරණය කර ඇති අතර, ඉන් 64ක් වීඩියෝ දර්ශන ආවරණයන් වේ. සන්නිවේදන දෙපාර්තමේන්තුව ඡායාරූප සහ වීඩියෝ සංස්කරණ කාර්යයන් වැනි අනෙකුත් ආශ්‍රිත කටයුතුවල ද සේවා සපයන්නෙකු ලෙස ක්‍රියා කළ අතර, මාධ්‍ය හමු තුළින් අවස්ථා ග්‍රහණය කර ගනිමින්, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ණය, සේ.අ.අ. මංගත සේවයේ ප්‍රතිලාභ, වංචනික මූල්‍ය ක්‍රම සඳහා නිරාවරණය වීමේ දරුණු ප්‍රතිවිපාක ආදිය සම්බන්ධයෙන් නව වීඩියෝ දර්ශන නිර්මාණය කිරීමට, දෙපාර්තමේන්තුවේ දැනුවත් කිරීමේ කණ්ඩායම සමග සමීපව සම්බන්ධ විය.

5. ව්‍යවහාර මුදල්

1949 අංක 58 දරන මුදල් නීති පනත ප්‍රකාරව ශ්‍රී ලංකාව තුළ ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීමේ පරම අයිතිය හා අධිකාරිය ශ්‍රී ලංකා මහ බැංකුව සතු වේ. මුදල් මණ්ඩලය වෙත පැවරී ඇති මෙම ව්‍යවස්ථාපිත වගකීම් හා බැඳි කාර්යයන් හැසිරවීම මහ බැංකුවේ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. කෝවිඩ්-19 හේතුවෙන් ඇති වූ අභියෝග මධ්‍යයේ වුව ද, 2022 වර්ෂයේදී ද ආර්ථිකයේ සුමට ක්‍රියාකාරිත්වය සඳහා අත්‍යාවශ්‍ය වන ව්‍යවහාර මුදල් ඒකකයේ වටිනාකම හා විශ්වාසනීයත්වය ආරක්ෂා කරමින් සහ ඉල්ලුමට සරිලන පරිදි අවශ්‍ය තොග පවත්වා ගනිමින් ව්‍යවහාර මුදල් පිළිබඳ මහජන විශ්වාසය ගොඩනැගීම සහ එය පවත්වා ගැනීම අඛණ්ඩව සිදු කරන ලදී.

5.1 ව්‍යවහාර මුදල් සංසරණය

2022 මුල් භාගය තුළ ව්‍යවහාර මුදල් සඳහා පැවති ඉහළ ඉල්ලුම, අප්‍රේල් මාසයේ දී රුපියල් බිලියන 1,240 දක්වා වැඩි වූ අතර එය 2022 දෙවන භාගයේ දී ක්‍රමයෙන් අඩු විය. II-1 සංඛ්‍යා සටහන සහ II-1 රූප සටහන මගින් පෙන්වා ඇති පරිදි, 2022 දෙසැම්බර් 31 දින වන විට මුළු ව්‍යවහාර මුදල් සංසරණය පෙර වර්ෂයට වඩා සියයට 2.1 කින් රුපියල් බිලියන 1,026.0 ක් දක්වා වැඩි වී ඇත.

II-3 සංඛ්‍යා සටහන

ව්‍යවහාර මුදල් සංසරණය (2022 දෙසැම්බර් 31 දින වන විට)

අයිතමය	වටිනාකම (රුපියල් බිලියන)					වෙනස(%)				
	2018	2019	2020	2021	2022	2018	2019	2020	2021	2022
නෝට්ටු	627.1	663.1	819.3	988.6	1,009.1	7.1	5.7	23.6	20.7	2.1
කාසි (අ)	13.2	14.2	14.9	15.9	16.9	9.0	7.6	4.9	6.7	6.1
එකතුව	640.3	677.4	834.2	1,004.5	1,026.0	7.2	5.8	23.1	20.4	2.1

(අ) සමරු කාසි අන්තර්ගත නොවේ.

II-1 රූප සටහන

ව්‍යවහාර මුදල් සංසරණය 2018-2022



සංසරණයේ පැවති ව්‍යවහාර මුදල් නෝට්ටුවල වටිනාකම 2022 වර්ෂයේ දී රුපියල් බිලියන 1,009.1 දක්වා සියයට 2.1 කින් වැඩි විය. II-2 රූප සටහන මගින් පෙන්වා ඇති පරිදි 2022 දෙසැම්බර් 31 දින වන විට සංසරණයේ පැවති රුපියල් 5000 සහ රුපියල් 1000 මුදල් නෝට්ටුවල වටිනාකමට අනුව එක්ව ගත්කළ එය සංසරණයේ පැවති මුළු ව්‍යවහාර මුදල් නෝට්ටු වටිනාකමින් සියයට 90.1 ක තරම් සැලකිය යුතු ඉහළ ප්‍රතිශතයක් විය. එමෙන්ම, සංසරණයේ පැවති රුපියල් 20 සහ රුපියල් 100 නෝට්ටු ප්‍රමාණයට අනුව එක්ව ගත්කළ එය සියයට 54 කට ආසන්න අගයක් විය.

II-2 රූප සටහන

2022 වර්ෂය අවසානයේ ව්‍යවහාර මුදල් නෝට්ටු සංසරණයේ වටිනාකම සහ ප්‍රමාණය





5.2 ව්‍යවහාර මුදල් කළමනාකරණය

ගුණාත්මක තත්ත්වයෙන් යුතු ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි මුදල් සංසරණයට නිකුත් කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් ව්‍යවහාර මුදල් තැන්පතු බාර ගැනීම සහ භාවිතා කළ නොහැකි (සේවා අනිසි) ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි මුදල් සංසරණයෙන් ඉවත් කිරීම මුදල් කළමනාකාරණයේ ප්‍රධාන කාර්යයන් වේ. ව්‍යවහාර මුදල් කළමනාකරණයේ සඵලතාව සහතික කිරීම සඳහා 2022 වර්ෂය තුළ සිදු කරන ලද කාර්යයන් පහත පරිදි වේ.

(අ) ව්‍යවහාර මුදල් මුද්‍රණය සහ ටංකනය කිරීම

මහජන ඉල්ලුම සැපිරීම සඳහා ප්‍රමාණවත් තොග පවත්වා ගැනීම සහ මුදල් සංසරණය තුළ ගුණාත්මක තත්ත්වයේ මුදල් නෝට්ටු පැවතීම තහවුරු කිරීම සඳහා ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය තුළ දී මුදල් නෝට්ටු මිලියන 495 ක් ඇණවුම් කරන ලදී. මහජන ඉල්ලුම සැපිරීම සඳහා ප්‍රමාණවත් කාසි තොග ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව සතුව පැවති බැවින් එම වර්ෂය තුළ කාසි ඇණවුම් නොකරන ලදී.

(ආ) ව්‍යවහාර මුදල් නිකුත් කිරීම

වසංගත තත්ත්වය හේතුවෙන් 2020 වර්ෂයේ දී ආරම්භ කරන ලද මුදල් සංසරණය සඳහා නැවත යෙදවිය හැකි මුදල් නෝට්ටු (සේවා නිසි) බලපත්‍රලාභී වාණිජ බැංකු අතර සෘජුව හුවමාරු කර ගැනීම සඳහා පහසුකම් සැලසීම ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂය තුළදී ද අඛණ්ඩව සිදු කරන ලදී. මේ හේතුවෙන් 2022 වර්ෂයේ දී මහ බැංකුව විසින් සිදු කරන ලද ව්‍යවහාර මුදල් නෝට්ටු නිකුතුව අඩු මට්ටමක විය. 2022 වර්ෂය තුළ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් මෙරට මුදල් සංසරණය වෙත නිකුත් කරන ලද මුදල් නෝට්ටු සහ කාසිවල වටිනාකම පිළිවෙළින් රුපියල් බිලියන 384.5 ක් සහ රුපියල් බිලියන 1.0 ක් විය.

II-4 සංඛ්‍යා සටහන

ව්‍යවහාර මුදල් නෝට්ටු සහ කාසි නිකුත් කිරීම

නිකුත් කිරීම	වටිනාකම (රු. බිලියන)				
	2018	2019	2020	2021	2022
සේවා නිසි නෝට්ටු	467.0	526.5	467.1	172.7	167.6
නව නෝට්ටු	328.4	248.7	229.5	217.3	216.9
කාසි(අ)	1.1	1.0	0.7	0.9	1.0
එකතුව	**796.5**	**776.2**	**697.3**	**390.9**	**385.5**

(අ) සමරු කාසි අන්තර්ගත නොවේ.

(ඇ) ව්‍යවහාර මුදල් තැන්පතු බාර ගැනීම

මූලික වශයෙන් මූල්‍ය ප්‍රතිපත්ති මෙවලක් වශයෙන් මහ බැංකුව විසින් පනවා ඇති ව්‍යවස්ථාපිත සංචිත අවශ්‍යතා පවත්වා ගැනීම සහ ව්‍යවහාර මුදල් මෙහෙයුම් කටයුතුවල කොටසක් ලෙස ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් මුදල් තැන්පතු බාර ගනු ලබයි. 2022 වර්ෂයේ දී ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් II-5 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි සේවා නිසි සහ සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් බාර ගන්නා ලදී. 2021 වර්ෂයට සාපේක්ෂව 2022 වර්ෂයේ දී ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු වටිනාකම ඉහළ ගියද බලපත්‍රලාභී වාණිජ බැංකු අතර සේවා නිසි ව්‍යවහාර මුදල් නෝට්ටු සෘජුව හුවමාරු කිරීමට පහසුකම් සැලසීම හේතුවෙන් 2022 වර්ෂය තුළ ව්‍යවහාර මුදල් තැන්පතු වටිනාකම සාමාන්‍යයෙන් අඩු මට්ටමක පැවතුණි.

II-5 සංඛ්‍යා සටහන

ව්‍යවහාර මුදල් නෝට්ටු තැන්පතු

තැන්පතු	වටිනාකම (රු. බිලියන)				
	2018	2019	2020	2021	2022
සේවා නිසි නෝට්ටු	524.1	606.9	445.0	144.6	272.5
සේවා අනිසි නෝට්ටු	229.6	132.1	95.4	76.1	91.6
එකතුව	**753.7**	**739.0**	**540.4**	**220.7**	**364.1**

සටහන: බලපත්‍රලාභී වාණිජ බැංකු වෙතින් මහ බැංකුව වෙත කරනු ලබන කාසි තැන්පතුවල වටිනාකම සැලකිය යුතු අගයක් නොගනී.

(ඇ) සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීම

රටෙහි මුදල් සංසරණය තුළ ගුණාත්මක තත්ත්වයේ ව්‍යවහාර මුදල් නෝට්ටු පැවතීම තහවුරු කිරීමේ අරමුණ ඇතිව, ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේ දී රුපියල් බිලියන 207.3 ක වටිනාකමින් යුත් සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු මිලියන 238.5 ක් විනාශ කරන ලදී (II-6 සංඛ්‍යා සටහන).

II-6 සංඛ්‍යා සටහන

සේවා අනිසි ව්‍යවහාර මුදල් නෝට්ටු විනාශ කිරීම

නෝට්ටු	2018	2019	2020	2021	2022
ප්‍රමාණය (මිලියන)	343.8	235.0	127.3	108.2	238.5
වටිනාකම (රුපියල් බිලියන)	252.2	139.8	62.2	44.3	207.3

5.3 අනෙකුත් කටයුතු

(අ) ව්‍යවහාර මුදල් කවුළු මෙහෙයවීම

2022 වර්ෂය තුළ දී රුපියල් මිලියන 102 ක වටිනාකම සහිත පලුදු වූ මුදල් නෝට්ටු මහ බැංකුවේ පලුදු නෝට්ටු හුවමාරු කවුළුව හරහා හුවමාරු කිරීම මගින් ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව මහජනතාව වෙත සිය සේවා සපයන ලදී. ලංකා බැංකු පිටකොටුව ශාඛාවෙහි මහජනතාව සඳහා ස්ථාපිත විශේෂ මුදල් හුවමාරු කවුළුව මගින් රුපියල් මිලියන 1,812.7 ක ව්‍යවහාර මුදල් නෝට්ටු සහ රුපියල් මිලියන 59.8 ක කාසි නිකුත් කරන ලදී.

(ආ) ආර්ථික ඉතිහාස කෞතුකාගාරය මෙහෙයවීම

2022 වර්ෂයේ මුල් භාගයේ රට තුළ පැවති වසංගත තත්ත්වය හේතුවෙන් ආර්ථික ඉතිහාස කෞතුකාගාරය එහි පූර්ණ විභවයෙන් ක්‍රියාත්මක නොවීය. එසේ වුවත්, නාණක විද්‍යාව, සමරු මුදල් නෝට්ටු, කාසි සහ අනෙකුත් සංග්‍රාහක අයිතම අලෙවි කිරීම සහ දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන් පැවැත්වීම මගින් පුද්ගලයන් 4,415 කට ආර්ථික ඉතිහාස කෞතුකාගාරය සිය සේවාව සපයන ලදී. තවද, 2022 වර්ෂයේ දී අභාවිත පුරාකෘති සංරක්ෂණය කිරීමේ ක්‍රියාවලියක් ආර්ථික ඉතිහාස කෞතුකාගාරය විසින් ආරම්භ කර ඇත.

(ඇ) ව්‍යවහාර මුදල් කෙරෙහි මහජන විශ්වාසය ආරක්ෂා කිරීම

ව්‍යාජ මුදල් නෝට්ටු සැකසීමේ උත්සාහයන් සම්බන්ධයෙන් කටයුතු කරනු ලබන පොලිස් අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ ව්‍යාජ මුදල් විමර්ශන කාර්යාංශය සහ නීතිය බලාත්මක කරනු ලබන බලධාරීන් සමඟ ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුව සමීප සහයෝගයෙන් යුතුව කටයුතු කරන ලදී. 2022 වර්ෂයේ දී අනාවරණය කර ගන්නා ලද ව්‍යාජ මුදල් නෝට්ටු සංඛ්‍යාව 1,987 ක් වේ. මුදල් සංසරණය තුළ පවතින මුදල් නෝට්ටු මිලියනයකට ව්‍යාජ මුදල් නෝට්ටු ප්‍රමාණය අනුපාතයක් ලෙස 2022 වර්ෂයේ දී 1.4 ක් විය.

අධිකරණමය නඩු විභාගයන් සඳහා පහසුකම් සලසමින් ව්‍යවහාර මුදල් නෝට්ටු අනුකරණය සම්බන්ධ තීරණාත්මක සාක්ෂි වශයෙන් මුදල් නීති පනතේ 59 වන වගන්තිය ප්‍රකාරව, අධිපතිතුමාගේ අත්සනින් යුත් සහතික 98 ක් නිකුත් කිරීමට පහසුකම් සපයන ලද අතර ව්‍යාජ මුදල් නෝට්ටු සම්බන්ධ සාක්ෂි දීමේ අධිකරණමය නඩු විභාග 6 ක් සඳහා සහභාගී විය.

(ඈ) සමරු කාසි නිකුත් කිරීම

කොළඹ විශ්ව විද්‍යාලයීය වෛද්‍ය පීඨයේ 150 වන සංවත්සරය සහ ශ්‍රී ලංකාවේ ජන හා නිවාස සංගණනයේ 150 වන සංවත්සරය සනිටුහන් කිරීම නිමිත්තෙන් රු.20 වටිනාකමින් යුතු සංසරණය සඳහා භාවිතා කරනු ලබන සමරු කාසි 2 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිල වශයෙන් නිකුත් කරන ලදී.

6. දේශීය මෙහෙයුම් කටයුතු

6.1 දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්

මිල හා ආර්ථික ස්ථායීතාව සහ මූල්‍ය පද්ධති ස්ථායීතාව යන මහ බැංකුවේ අරමුණු ද්විත්වයට අදාළ වන්නා වූ වගකීම්වලින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන් සමන්විත වේ. ඒ අනුව, සහභාගිත්ව ආයතන සමග විවට වෙළඳපොළ කටයුතු සිදු කිරීම හරහා මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම, බලපත්‍රලාභී වාණිජ බැංකුවල ව්‍යවස්ථාපිත සංචිත නියාමනය කිරීම, රජය, රජයේ නියෝජිත ආයතන සහ අනෙකුත් නියෝජිත ආයතන සඳහා බැංකුකරු සහ රාජ්‍ය තැන්පතු භාරය ලෙස කටයුතු කිරීම, සෘජු අලෙවි සහභාගිවන්නන් සඳහා දවස ඇතුළත ද්‍රවශීලතා ණය පහසුකම සැපයීම සහ බලයලත් මුදල් තැරැව්කරුවන් නියාමනය හා අධීක්ෂණය කිරීම යනාදිය දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සිදු කරනු ලබන ප්‍රධාන කාර්යයන්වලට අයත් වේ.

6.2 මුදල් ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම

6.2.1 විවට වෙළඳපොළ කටයුතු

දැනට ක්‍රියාත්මක වන නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුවෙහි මෙහෙයුම් ඉලක්කය ලෙස සැලකෙන බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය (AWCMR) අඩු විචලනාවකින් යුතුව අපේක්ෂිත මට්ටමේ පවත්වා ගැනීමේ අරමුණ ඇතිව දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් විවට

වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සිදු කරන ලදී. 2022 වසර තුළ නිත්‍ය පොලී අනුපාතික කොරිඩෝවේ ඉහළ සීමාව දක්වා ඉහළ නැංවුණු බරිත සාමාන්‍ය ඒක්ෂණ මුදල් අනුපාතිකය අඛණ්ඩව ඉහළ සීමාවෙහිම පැවතිණි. විශේෂයෙන්ම, රාජ්‍ය මූල්‍ය අංශය තුළ වර්ධනය වෙමින් පැවති තත්ත්වයන් හමුවේ වෙළඳපොළ තුළ අවිනිශ්චිතතා ඉහළ යෑම හේතුවෙන් 2022 අප්‍රේල් මස සිට ඒක්ෂණ මුදල් වෙළඳපොළ ගනුදෙනු අවම මට්ටමක පැවතිණි.

(අ) මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව පුරෝකථනය කිරීම

දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සාධක ගණනාවක් මත පදනම්ව දේශීය මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව දෛනික වශයෙන් ඇස්තමේන්තු කරයි. මහ බැංකුවේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය හා අනුකූල වෙමින් සුදුසු විටට වෙළඳපොළ කටයුතු පැවැත්වීම හරහා සහභාගිත්ව ආයතනවල ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීමට මෙම ඇස්තමේන්තු භාවිතා කරනු ලැබේ. මහ බැංකුව විසින් මුදල් ප්‍රතිපත්තියට අදාළව සිදු කරනු ලැබූ මෙහෙයුම් ක්‍රියාමාර්ගවල බලපෑම මෙන්ම, ද්‍රවශීලතාව කෙරෙහි බලපානු ලබන ස්වායක්ත සාධක වන සංසරණයේ පවතින ව්‍යවහාර මුදල් ප්‍රමාණය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිදු කරනු ලබන විදේශ විනිමය සම්බන්ධ ගනුදෙනු, බලපත්‍රලාභී වාණිජ බැංකු සතු සංචිතවල සිදුවන වෙනස්වීම් සහ ශ්‍රී ලංකා මහ බැංකුව රජය සමග සිදු කරන ගනුදෙනු ද මේ සඳහා සැලකිල්ලට ගනු ලබයි. 2022 වසරේදී දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ද්‍රවශීලතා ඇස්තමේන්තු කටයුතු අභියෝග රැසක් මධ්‍යයේ සිදු කරන ලදී. වසර ආරම්භයේදී මුදල් වෙළඳපොළ හිඟ ද්‍රවශීලතාව රුපියල් බිලියන 335.75 ක් වූ අතර, වසර පුරා ද්‍රවශීලතාව හිඟ මට්ටමක පැවතිණි. කෙසේ වෙතත්, 2022 වසරේ දෙවන භාගයේ සිට හිඟ ද්‍රවශීලතාව ක්‍රමිකව අඩුවූ අතර, දෙසැම්බර් මස වන විට හිඟ ද්‍රවශීලතාව රුපියල් බිලියන 231.25 ක් ලෙස වාර්තා විය.

(ආ) වෙළඳපොළ මෙහෙයුම් කමිටුව වෙත නිර්දේශ ලබා දීම

මුදල් මණ්ඩලය විසින් තීරණය කරනු ලබන සමස්ත මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය දෛනික මුදල් මෙහෙයුම් බවට පත්කිරීමේ කාර්යභාරය වෙළඳපොළ මෙහෙයුම් කමිටුව වෙත පැවරේ. මුදල් මණ්ඩලය විසින් ගනු ලැබූ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳ තීරණය ක්‍රියාත්මක කිරීමේ ක්‍රියාදාමය සඳහා දේශීය මුදල් වෙළඳපොළෙහි ප්‍රවණතා හා ද්‍රවශීලතා ඇස්තමේන්තු පිළිබඳ තොරතුරු දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළ මෙහෙයුම් කමිටුව වෙත ලබා දීම සිදු කෙරේ. ඒ අනුව, දේශීය මුදල් වෙළඳපොළ සහ විදේශ විනිමය වෙළඳපොළෙහි ප්‍රවණතා හේතුවෙන් දෛනිකව වෙළඳපොළ රුපියල් ද්‍රවශීලතාව මත ඇති වන බලපෑම සැලකිල්ලට ගනිමින් මුදල් වෙළඳපොළ ද්‍රවශීලතාව සහ කෙටිකාලීන පොලී අනුපාතික කළමනාකරණයේදී වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ සලකා බැලීම සඳහා වන ක්‍රියාමාර්ග දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව යෝජනා කරයි. ඇස්තමේන්තුගත ද්‍රවශීලතාව, මෙහෙයුම් ඉලක්කයෙහි යෝග්‍ය මට්ටම, සහභාගිත්ව ආයතන අතර පවත්නා ද්‍රවශීලතා ව්‍යාප්තිය, මුදල් වෙළඳපොළට සුදුසු සංඥා සැපයීමේ අවශ්‍යතාව යනාදී සාධක සැලකිල්ලට ගනිමින් ක්‍රියාත්මක කිරීම සඳහා යෝග්‍ය ක්‍රියාමාර්ග වෙළඳපොළ මෙහෙයුම් කමිටුව විසින් තීරණය කරනු ලබයි. 2022 වසර තුළ දී දේශීය මුදල් වෙළඳපොළෙහි සහභාගිත්ව ආයතන අතර පැවති ද්‍රවශීලතාව බෙදී යෑමේ අසමානතාව සහ ද්‍රවශීලතා පීඩන අවම කිරීමේ අරමුණින් දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මුදල් මෙහෙයුම් කටයුතු සිදු කළේය.

(ඇ) වෙන්දේසි පැවැත්වීම

2022 වසරේදී සමස්ත ද්‍රවශීලතා කළමනාකරණයට සහාය වීම සඳහා දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව අවශ්‍යතාව අනුව ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම මෙන්ම, ද්‍රවශීලතාව වෙළඳපොළට සැපයීම සඳහා උපයෝගී කර ගනු ලැබූ විවට වෙළඳපොළ මෙහෙයුම් යටතේ වෙන්දේසි පවත්වන ලදී. ඒ අනුව, 2022 වසරේදී දේශීය මුදල් වෙළඳපොළ මත පැවති පීඩනය අවම කිරීම සඳහා උපයෝගී කර ගනු ලැබූ උපකරණ වශයෙන් පහත සඳහන් වෙන්දේසි පවත්වන ලදී (II-7 සංඛ්‍යා සටහන).

(i) ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි

දේශීය මුදල් වෙළඳපොළ අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා 2022 වසර මුලදී එක්දින සහ කාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වන ලදී. ඒ අනුව, එක්දින පදනමින් ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා එක්දින ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි මෙන්ම, එදිනම පියවීමේ පදනම මත සතියක කාලසීමාවක් දක්වා ද්‍රවශීලතාව අවශෝෂණය කර ගැනීම සඳහා කෙටිකාලීන ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි පවත්වන ලදී.

(ii) ප්‍රතිවිකුණුම් වෙන්දේසි

ඇතැම් වාණිජ බැංකුවල පැවති ද්‍රවශීලතා පීඩනය අවම කිරීමේ අරමුණ ඇතිව දේශීය මුදල් වෙළඳපොළට ද්‍රවශීලතාව ලබාදීම සඳහා 2022 වසරේදී දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසි පවත්වන ලදී. කාලයක් තිස්සේ වෙළඳපොළෙහි පැවති ද්‍රවශීලතා අවශ්‍යතා සපුරාලීම සඳහා පවත්වන ලද දිගුකාලීන ප්‍රතිවිකුණුම් වෙන්දේසිවල පියවීම් දිනය, වෙන්දේසි දිනට පසුව එළැඹෙන ව්‍යාපාරික දිනයේදී සිදු විය.

(iii) ස්ථිර පදනම මත වන වෙන්දේසි

මහ බැංකුව විසින් ප්‍රාථමික වෙළඳපොළ හරහා භාණ්ඩාගාර බිල්පත් මිලදී ගැනීමෙන් වෙළඳපොළට සපයන ලද ද්‍රවශීලතාව ස්ථිර පදනමින් යළි අවශෝෂණය කර ගැනීම සඳහා 2022 වසරේදී මහ බැංකුව ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකුණුම් වෙන්දේසි පවත්වන ලදී. තවද, ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලදීගැනීමේ වෙන්දේසි පැවැත්වීම හරහා දිගුකාලීන වශයෙන් ද්‍රවශීලතාව වෙළඳපොළට ලබාදීමට 2022 වසර අවසානයේදී උත්සාහ කළද එය සාර්ථක නොවීය. එමෙන්ම, 2022 වසරේදී ස්ථිර පදනම මත සිදු කරනු ලබන භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි නොපවත්වන ලදී.

II-7 සංඛ්‍යා සටහන
2022 වසරේ දී පවත්වන ලද විවට වෙළඳපොළ වෙන්දේසි

වෙන්දේසි වර්ගය	පැවැත්වූ වෙන්දේසි ගණන	රු. බිලියන	
		ඉදිරිපත් කළ මුළු ලංසු ප්‍රමාණය	පිළිගත් මුළු ලංසු ප්‍රමාණය
ප්‍රතිමිලදීගැනුම් වෙන්දේසි			
එක් දින	25	1,880.00	1,533.25
කෙටිකාලීන (දින 7 ක් දක්වා)	08	100.00	22.00
දිගුකාලීන (දින 8 සිට දින 90 දක්වා)	-	-	-
ප්‍රතිවිකුණුම් වෙන්දේසි			
එක් දින	-	-	-
කෙටිකාලීන (දින 7 ක් දක්වා)	03	235.00	235.00
දිගුකාලීන (දින 8 සිට දින 90 දක්වා)	25	1,235.00	954.50
ස්ථිර පදනම මත වන වෙන්දේසි			
ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් විකිණීම්	11	150.00	23.53
ස්ථිර පදනම මත භාණ්ඩාගාර බිල්පත් මිලට ගැනීම්	01	20.00	0.00
ස්ථිර පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර විකිණීම්	-	-	-
ස්ථිර පදනම මත භාණ්ඩාගාර බැඳුම්කර මිලට ගැනීම්	-	-	-
ද්‍රවශීලතා ආධාරක පහසුකම්*			
එක් දින	-	-	-
කෙටිකාලීන (දින 7 ක් දක්වා)	-	-	-
දිගුකාලීන (දින 8 සිට දින 90 දක්වා)	-	-	-

* විවට වෙළඳපොළ කටයුතු යටතේ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් සඳහා වෙනම ලබාදෙන ප්‍රතිවිකුණුම් වෙන්දේසියකි.

(ඈ) නිත්‍ය පහසුකම් සැපයීම

මුදල් වෙළඳපොළ සහ විවට වෙළඳ කටයුතු හරහා දෛනික ද්‍රවශීලතා අවශ්‍යතා පූර්ණ වශයෙන් සපුරා ගැනීමට අපොහොසත් වූ සහභාගීත්ව ආයතන සඳහා සිය ද්‍රවශීලතා අවශ්‍යතා සපුරා ගැනීම සඳහා මහ බැංකුව විසින් නිත්‍ය පහසුකම් (Standing Facilities) සපයනු ලැබේ. සහභාගිත්ව ආයතන සතු අතිරික්ත ද්‍රවශීලතාව අවශෝෂණය කිරීම සඳහා නිත්‍ය තැන්පතු පහසුකම භාවිතා කරනු ලබන අතර, කෙටිකාලීන ද්‍රවශීලතා අවශ්‍යතාව සපුරාගත නොහැකි සහභාගිත්ව ආයතනවලට ද්‍රවශීලතාව ලබාදීම සඳහා නිත්‍ය ණය පහසුකම භාවිතා කෙරේ. නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය යටතේ නිත්‍ය තැන්පතු පහසුකමද, නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය යටතේ නිත්‍ය ණය පහසුකමද මහ බැංකුව විසින් සහභාගිත්ව ආයතනවලට ලබා දෙන ලදී. ඒ අනුව, නිත්‍ය තැන්පතු පහසුකම යටතේ 2022 වසරේදී රුපියල් බිලියන 54,528.34 ක් තැන්පත් කරන ලද අතර, නිත්‍ය ණය පහසුකම යටතේ රුපියල් බිලියන 163,058.05 ක් සහභාගිත්ව ආයතනවලට ලබාදෙන ලදී (II-8 සංඛ්‍යා සටහන).

II-8 සංඛ්‍යා සටහන
2022 වසර තුළ නිත්‍ය පහසුකම් සැපයීම

රු. බිලියන

නිත්‍ය පහසුකම	අවමය	උපරිමය	සාමාන්‍යය	මුළු ව්‍යවහාරය
නිත්‍ය තැන්පතු පහසුකම	51.37	378.67	227.20	54,528.34
නිත්‍ය ණය පහසුකම	424.16	850.60	679.41	163,058.05

6.2.2 ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය පවත්වාගෙන යෑම සහ අධීක්ෂණය කිරීම

සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම තමා සතු සමස්ත රුපියල් තැන්පතු වගකීම්වලට අනුපාතිකව, මහ බැංකුවේ පවත්වා ගෙන යා යුතු අවම සංචිත අවශ්‍යතාව ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය මඟින් තීරණය කෙරේ. ව්‍යවස්ථාපිත සංචිත අනුපාත අවශ්‍යතාව පවත්වා ගැනීම සඳහා වාණිජ බැංකු විසින් දක්වන අනුකූලතාව අධීක්ෂණය කිරීම දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවෙහි වගකීමකි. ඒ අනුව, 2022 වසර තුළ සියයට 4 ක් ලෙස නොවෙනස්ව පැවති ව්‍යවස්ථාපිත සංචිත අනුපාතය යටතේ සංචිත පවත්වාගෙන යෑම පරිපාලනය කිරීම සහ වාණිජ බැංකු විසින් ඊට දක්වන අනුකූලතාව අධීක්ෂණය කිරීම, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී.

6.2.3 බැංකු අනුපාතිකය පරිපාලනය කිරීම

මුදල් නීති පනතේ 86 සහ 87 වන වගන්තිය යටතේ අවසාන ණය ලබාදෙන්නා ලෙස, එනම් මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සඳහා හදිසි ද්‍රවශීලතා අවශ්‍යතා සැපයීම සඳහා බැංකු අනුපාතිකය භාවිතා කරනු ලැබේ. 2020 වසරේ අප්‍රේල් මස 16 වන දින සිට, බැංකු අනුපාතිකය, නිත්‍ය තැන්පතු ණය පහසුකම් අනුපාතිකය සඳහා පදනම් අංක 300ක ආන්තිකයක් එකතු කොට ස්වයංක්‍රීය ලෙස ගැළපීමට ඉඩහරින ලදී. කෙසේ නමුත්, බැංකු අනුපාතිකය වෙළඳපොළ තත්ත්වයන් මත ගැළපීමට ඉඩහරිමින්, 2022 නොවැම්බර් මස 03 වන දින ව්‍යාපාරික දිනය අවසානය පටන් බලපැවැත්වෙන පරිදි බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකයට පදනම් අංක 700 ක ආන්තිකයක් එකතු කොට තීරණය කරන ලදී. තවද, දේශීය මුදල් වෙළඳපොළෙහි ප්‍රවණතා සැලකිල්ලට ගනිමින් 2023 ජනවාරි මස 02 වන දින සිට බලපැවැත්වෙන පරිදි, බැංකු අනුපාතිකය සඳහා වූ ආන්තිකය, පදනම් අංක 300 ක් දක්වා අඩු කරන ලදී. 2022 වසර තුළදී බලපත්‍රලාභී වාණිජ බැංකුවලට මහ බැංකුවෙන් ණය ලබාගැනීමේ හදිසි අවශ්‍යතා ඇති නොවූ අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් හදිසි ණය සහ අත්තිකාරම් (Emergency Loans and Advances - ELA) සඳහා වූ රාමුව තවදුරටත් ශක්තිමත් කරන ලදී.

6.3 වාණිජ බැංකු, ප්‍රාථමික අලෙවිකරුවන් සහ රජය සඳහා වන කාර්යයන්

6.3.1 මූල්‍ය ආයතනවල ගිණුම් පවත්වාගෙන යෑම

තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පාර්ශ්වකරුවන් සඳහා ගෙවීම් සහ පියවීම් පහසුකම් සපයමින් සහ ආරක්ෂිත සහ කාර්යක්ෂම ගෙවීම් සහ පියවීම් සිදු කරමින් ශ්‍රී ලංකා මහ

බැංකුව ආර්ථිකයෙහි ක්‍රියාකාරීත්වය සඳහා ඉතා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. විශාල වටිනාකමක් සහිත ගෙවීම් සිදු කිරීමට පහසුකම් සැපයීම සහ අන්තර් බැංකු මුදල් වෙළඳපොළෙහි කටයුතු සඳහා පහසුකම් සැපයීම තුළින් මෙම කාර්යභාරය ඉටු කෙරේ. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව මඟින් පවත්වා ගෙන යනු ලබන පොදු ලෙජර් ගිණුම මඟින් ගෙවීම් හා පියවීම් මෙන්ම, තත්කාලීන දළ පියවීම් පද්ධතියේ පාර්ශ්වකරුවන් අතර නිර්ලේඛන සුරැකුම්පත් ගනුදෙනුවල ගෙවීම් හා පියවීම් නිෂ්කාශනය සඳහා පහසුකම් සැපයීම ද සිදු කෙරේ. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ව්‍යවස්ථාපිත සංචිත අනුපාතයට අනුව සංචිත පවත්වාගෙන යෑම උදෙසා ද මෙම ගිණුම් භාවිතා කෙරේ. 2022 වසර අවසානයේදී බලපත්‍රලාභී වාණිජ බැංකු 24 ක්, ජාතික ඉතිරි කිරීමේ බැංකුව සහ බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන් 8 කට අදාළව තත්කාලීන දළ පියවීම් ගිණුම් පවත්වාගෙන යනු ලැබීය.

6.3.2 රජයේ ගිණුම්

රජයේ බැංකුකරු වශයෙන් මහ බැංකුවේ කාර්යභාරය ඉටුකරමින්, දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් රජයේ දෙපාර්තමේන්තු, රාජ්‍ය නියෝජිත ආයතන සහ රාජ්‍ය ආයතන මෙන්ම, ඇතැම් විදේශීය ආයතන සඳහා ද බැංකු පහසුකම් සැපයීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2022 වසර අවසානයේදී පවත්වාගෙන යන ලද එවැනි ගිණුම් සංඛ්‍යාව 48 ක් විය. එම ගිණුම්වල පවත්වා ගනු ලැබූ මුළු ගනුදෙනු සංඛ්‍යාවෙන් සියයට 90 කට ආසන්න ප්‍රමාණයක් නියෝජ්‍ය භාණ්ඩාගාර ලේකම් ගිණුම, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ජංගම ගිණුම, දේශීය ආදායම් කොමසාරිස්ගේ එකතු කළ අගය මත බදු ආපසු ගෙවීමේ ගිණුම සහ ජනාධිපති අරමුදල් ගිණුම යන ගිණුම්වලට අයත් විය.

මුදල් නීති පනතේ 89 වැනි වගන්තිය ප්‍රකාරව, යම් මුදල් වර්ෂයක් සඳහා පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද රජයේ ඇස්තමේන්තුගත ආදායමෙන් සියයට 10 ක උපරිමයකට යටත්ව රජය වෙත පොලී රහිත තාවකාලික අත්තිකාරම් ලබා දීමට මහ බැංකුව විසින් කටයුතු කරනු ලැබේ. රජය විසින් මෙම අත්තිකාරම චක්‍රීය ණය පහසුකමක් ලෙස භාවිතා කරනු ලබන අතර, එය මාස 6 කට නොවැඩි කාල සීමාවක් තුළ නැවත ගෙවිය යුතු වේ. 2022 වර්ෂය ආරම්භයේදී, තාවකාලික අත්තිකාරම් යටතේ ලබාගත හැකි උපරිම ණය ප්‍රමාණය, 2022 වසරේ ඇස්තමේන්තුගත ආදායම මත පදනම්ව රුපියල් බිලියන 225.05 ක් දක්වා, එනම් රුපියල් බිලියන 73.01 කින් ඉහළ නංවන ලදී. කෙසේ නමුත්, 2022 වසර අවසානයේදී පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද සංශෝධිත අතරමැදි රාජ්‍ය අයවැය අනුව, තාවකාලික අත්තිකාරම් යටතේ ලබාගත හැකි උපරිම ප්‍රමාණය අමතර රුපියල් බිලියන 12.33 කින් ඉහළ නංවන ලදී. ඒ අනුව, රජයට ලබාදුන් තාවකාලික අත්තිකාරම් මුදල් ප්‍රමාණය, 2021 වසර අවසානයේදී වාර්තා වූ රුපියල් බිලියන 152.04 හා සැසඳීමේදී 2022 වසර අවසානයේදී රුපියල් බිලියන 237.37 ක් විය. 2023 වසර සඳහා අනුමත කරන ලද රාජ්‍ය අයවැය මත පදනම්ව, වසර ආරම්භයේදී රජයට ලබාදුන් තාවකාලික අත්තිකාරම් ප්‍රමාණය රුපියල් බිලියන 344.95 දක්වා රුපියල් බිලියන 107.58 කින් ඉහළ ගියේය.

6.4 දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සැපයීම

තත්කාලීන දළ පියවීම් පද්ධතිය තුළ මෙහෙයුම් කටයුතු සුමටව හා කාර්යක්ෂමව පවත්වා ගෙන යෑම සඳහා දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සෘජු අලෙවිකරුවන් සඳහා දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම (Intra-day Liquidity Facility) සපයනු ලබයි. භාණ්ඩාගාර බිල්පත් හා භාණ්ඩාගාර බැඳුම්කර සුරැකුම් ලෙස තබා ගනිමින් සහ ගාස්තුවකින් තොරව මෙම පහසුකම සපයන අතර, අදාළ දිනය තුළදී සුරැකුම්පත්වල වර්තමාන වෙළඳපොළ මිල ගණන් වෙනස්වීම හේතුවෙන් අදාළ සුරැකුම්පත්වල මිලෙහි ඇති විය හැකි උච්චාවචන මඟින් ඇති කෙරෙන අලාභය අවම කිරීම සඳහා යම් ගැළපීමක් (Haircut) අන්තර්ගත කරමින් අදාළ සුරැකුම්පත්වල නිල මිල ගණන් තීරණය කෙරේ. 2022 වර්ෂය තුළදී එක්දින ද්‍රවශීලතා පහසුකමේ මුළු අගය රුපියල් බිලියන 157,166.18 ක් ද, දෛනික සාමාන්‍ය අගය රුපියල් බිලියන 657.60 ක් ද විය. 2021 වසරේදී එම මුළු අගය රුපියල් බිලියන 50,777.45 ක් ද දෛනික සාමාන්‍ය අගය රුපියල් බිලියන 215.16 ක් ද විය. ඒ අනුව, පසුගිය වසරට සාපේක්ෂව 2022 වසරේදී එක්දින ද්‍රවශීලතා පහසුකම භාවිතය සැලකිය යුතු ඉහළ යෑමක් පෙන්නුම් කළේය.

6.5 බලයලත් මුදල් තැරැව්කරුවන් අධීක්ෂණය

බලයලත් මුදල් තැරැව්කරුවන් (Authorised Money Brokers) විසින් මුදල්, විදේශ විනිමය සහ රජයේ සුරැකුම්පත් යන වෙළඳපොළ ගනුදෙනුවල අතරමැදිකරණ කාර්යයන් සිදු කෙරේ. දේශීය මුදල් වෙළඳපොළ තුළ මුදල් තැරැව්කරුවන්ගේ වෘත්තීයමය ක්‍රියාකාරීත්වය සහතික කිරීම පිණිස ශ්‍රී ලංකාවේ බලයලත් මුදල් තැරැව්කරුවන් නියාමනය කිරීමේ බලය දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත පවරමින් මුදල් නීති පනතේ 10(සී) වගන්තියේ විධිවිධාන ප්‍රකාරව 2013 සහ 2016 යන වසරවලදී නිකුත් කළ මුදල් තැරැව්කරණ රෙගුලාසි අවලංගු කරමින්, 2018 අංක 01 දරන මුදල් තැරැව්කරණ රෙගුලාසි නිකුත් කර ඇත. ඉහත රෙගුලාසි යටතේ 2022 වසර අවසානය වන විට සමාගම් 9 ක් සඳහා "බලය පැවරීමේ සහතික" නිකුත් කර ඇති අතර, එම සමාගම් "බලයලත් මුදල් තැරැව්කරුවන්" ලෙස නම් කර ඇත. වසර තුළදී දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් සියලුම බලයලත් මුදල් තැරැව්කරුවන් සඳහා එතැන් පරීක්ෂණ සිදු කරන ලදී.

2022.12.31 දිනට බලයලත් මුදල් තැරැව්කරණ සමාගම් ලේඛනය

1. බී එම් ආර් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
2. සෙන්ට්‍රල් ෆොරෙක්ස් ඇන්ඩ් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
3. ෆස්ට් එලායන්ස් මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
4. ජෝර්ජ් ස්ටුවර්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
5. එම් වී එස් මනි බ්‍රෝකර්ස් ලිමිටඩ්
6. පිගට් චැප්මන් ඇන්ඩ් කම්පැනි (ප්‍රයිවට්) ලිමිටඩ්
7. එස් එම් බී මනි බ්‍රෝකර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
8. තැප්‍රොබේන් ඉන්වෙස්ට්මන්ට්ස් (ප්‍රයිවට්) ලිමිටඩ්
9. විෂ්විත් මනි ඇන්ඩ් එක්ස්චේන්ජ් බ්‍රෝකර්ස් ලිමිටඩ්

7. ආර්ථික පර්යේෂණ

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 25වන වගන්තිය මගින් මුදල් මණ්ඩලයට සහ මහ බැංකුවෙහි අධිපතිට ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සම්පාදනය හා ක්‍රියාත්මක කිරීම සඳහා සහාය වීම පිණිස සහ මහජනතාව වෙත මුදල් හා බැංකු සහ පොදු උනන්දුවක් දක්වන වෙනත් ආර්ථික විෂයයන් සම්බන්ධයෙන් තොරතුරු සැපයීම සඳහා දත්ත සම්පාදනය කිරීමේ හා ආර්ථික පර්යේෂණ සිදු කිරීමේ වගකීම ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවට පැවරී ඇත. පෙර නොපැවති ආකාරයේ අභියෝගාත්මක දේශීය හා ජාත්‍යන්තර තත්ත්වයන් මධ්‍යයෙහි වුවද, 2022 වසර තුළ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ඵලදායී ලෙස සිය වගකීම් ඉටු කරන ලදී. සිය වගකීම් ඉටු කිරීමේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආර්ථික සහ මිල ස්ථායීතාවයට අදාළ ප්‍රතිපත්තිමය තීරණ ගැනීමට අවශ්‍ය සහයෝගය ලබා දීම සඳහා සාර්ව ආර්ථික ප්‍රවණතාවයන් පිළිබඳ පුළුල් විශ්ලේෂණයන් සපයමින් කළමනාකාරීත්වයට හා මුදල් මණ්ඩලයට කාලීන වශයෙන් වැදගත් ප්‍රතිපත්ති නිර්දේශ කිරීම අඛණ්ඩව සිදු කළේය. මුදල් ප්‍රතිපත්තිය, වර්ධනයෙහි සහ උද්ධමනයෙහි වෙනස් වීම්, රාජ්‍ය මූල්‍ය අංශය සහ විදේශීය අංශය ඇතුළුව වසර තුළ දී ශ්‍රී ලංකා ආර්ථිකය මුහුණ දුන් සාර්ව ආර්ථික අභියෝග කෙරෙහි දෙපාර්තමේන්තුවේ පර්යේෂණ න්‍යාය පත්‍රයෙහි මූලික අවධානය යොමු විය. වසර තුළ දී පුද්ගල සහභාගීත්වය සහිතව සිදු කරන ලද බොහෝ කටයුතුවලට අමතරව, මුදල් සමස්ත සහ ගෙවුම් ශේෂය හා සම්බන්ධ දත්තවල ප්‍රාථමික මූලාශ්‍රය ලෙස, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රිත හා විද්‍යුත් මාධ්‍ය හරහා මහජනතාව ඇතුළු සියලුම පාර්ශ්වකරුවන් වෙත සංඛ්‍යාලේඛන සහ අනෙකුත් සාර්ව ආර්ථික තොරතුරු සැපයීමේ කාර්යභාරය අඛණ්ඩව සිදු කරන ලදී. ප්‍රතිපත්ති කෙරෙහි නැඹුරු වූ පර්යේෂණ සහ දැනුම බෙදා ගැනීමේ කටයුතු සිදු කිරීමෙහිලා දූනටමත් ස්ථාපිත වී ඇති සම්ප්‍රදායට දායක වෙමින් වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් සිය හැකියාවන් තවදුරටත් ශක්තිමත් කර ගත් අතර, මහ බැංකුව තුළ පර්යේෂණ කටයුතු සිදු කිරීම ද ප්‍රවර්ධනය කරන ලදී. දැනුම බෙදා ගැනීමේ අරමුණ සම්පූර්ණ කර ගැනීම සඳහා දෙපාර්තමේන්තුව විසින් මහජනතාව ඇතුළු සියලු පාර්ශ්වකරුවන් දැනුම්වත් කිරීම සඳහා දැනුම්වත් කිරීමේ වැඩසටහන් කිහිපයක් පැවැත් වූ අතර, ආර්ථිකයේ ක්‍රියාකාරීත්වය සහ ප්‍රතිපත්ති සමතුලිතව පවත්වා ගැනීමේ දී මුහුණ දීමට සිදුවන අභියෝග පිළිබඳව පැහැදිලි කිරීමට එමගින් අවස්ථාව හිමි විය. මහ බැංකුව සතු රටේ මූල්‍ය අධිකාරීමය ධාරිතාවය තුළ, විදේශීය පාර්ශ්වකරුවන්, ජාත්‍යන්තර නියෝජිතායතන සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සමග සමීප සම්බන්ධතාවයන් ස්ථාපිත කිරීමට සහ පවත්වාගෙන යෑම සඳහා, ජාත්‍යන්තර සබඳතා පවත්වාගෙන යෑමේ කේන්ද්‍රස්ථානය ලෙස ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ඉතා වැදගත් භූමිකාවක් ඉටු කරන ලදී. විශේෂයෙන් ම, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග පැවති රැස්වීම්වලට අවශ්‍ය තාක්ෂණික යෙදවුම් සකස් කරමින් සහ අවස්ථා කිහිපයකදී ම ඔවුන්ගේ තාක්ෂණික මට්ටමේ ගැටලුවලට ප්‍රතිචාර දක්වමින්, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකමෙහි මහ බැංකුවට අදාළ සාකච්ඡාවලට පහසුකම් සැලසීමේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන භූමිකාව ඉටු කරන ලදී. රජය විසින් ක්‍රියාත්මක කර ඇති ණය ප්‍රතිව්‍යුහගතකරණයට පහසුකම් සැලසීම සඳහා අවශ්‍ය යෙදවුම් ලබා දෙමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ණය ප්‍රතිව්‍යුහගතකරණ ක්‍රියාවලිය සඳහා පත් කළ මූල්‍ය සහ නීති උපදේශකයන් සමග සමීපව සම්බන්ධීකරණ කටයුතු සිදු කළේය. තවද, 2022 වසර තුළ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම සම්බන්ධව සහ ක්ෂේත්‍ර කිහිපයක් සඳහා තාක්ෂණික සහාය ලබා දීමට පැවැත්වූ මෙහෙයුම් වැඩසටහන් කිහිපයක් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සම්බන්ධීකරණය කරන ලදී.

7.1 ආර්ථික සහ මිල ස්ථායීතාවය පවත්වා ගැනීම

ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පූර්වෝපායික සහ දත්ත මත පදනම් වූ මුදල් ප්‍රතිපත්ති තීරණවලට එළැඹීම සඳහා මුදල් මණ්ඩලයට සහාය වීමේ අරමුණ පෙරදැරිව ප්‍රක්ෂේපණ සහ පුරෝකථන සිදු කරමින් දේශීය ආර්ථිකයේ මුදල්, විදේශීය, මූර්ත සහ රාජ්‍ය මූල්‍ය අංශවල මෙන්ම ගෝලීය ආර්ථික ප්‍රවණතාවලට අදාළ දත්ත සම්පාදනය, අධීක්ෂණය සහ විශ්ලේෂණය අඛණ්ඩව සිදු කරන ලදී. මුදල් ප්‍රතිපත්ති කමිටුවේ ලේකම් කාර්යාලය වශයෙන් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පෙර සැලසුම් කරන ලද මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම් අටක් පැවැත්වීම සඳහා පහසුකම් සලසන ලදී. මුදල් මණ්ඩලය වෙත දැනුම්වත් ප්‍රතිපත්ති නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුවට ආර්ථිකයේ සිදුවන වර්ධනයන්, මුදල් තත්ත්වයන්, විදේශීය අංශයේ ගැටලු මෙන්ම, උද්ධමනය සහ ආර්ථික වර්ධනය වැනි ආකෘති මත පදනම් වූ සාර්ව ආර්ථික පුරෝකථනයන්ද ඇතුළත් විස්තරාත්මක වාර්තා ඉදිරිපත් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සාර්ව ආර්ථික ස්ථායීතාවය සහතික කිරීම සඳහා අවශ්‍ය සුදුසු ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ඉස්මතු කරමින් විවිධ ආර්ථික ගැටලු පිළිබඳව මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය වෙත විශ්ලේෂණ සහ වාර්තා ලබා දෙන ලදී. මේ අතර, මීට පෙර මහ බැංකුවේ ක්‍රියාත්මක වූ මුදල් ප්‍රතිපත්ති උපදේශන කමිටුව (MPCC) සහ මූල්‍ය පද්ධති ස්ථායිතා උපදේශන කමිටුව (FSSCC) ප්‍රතිස්ථාපනය කරමින් 2022 ජූලි මාසයේ දී පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්ව කමිටුව (SEC) පිහිටුවන ලදී. කීර්තිමත් ව්‍යාත්තිකයන්, විද්වතුන් සහ පෞද්ගලික අංශය නියෝජනය කරන්නන් ඇතුළු විවිධ පාර්ශ්වකරුවන්ගෙන් මෙම කමිටුව සමන්විත වේ. පාර්ශ්වකරුවන්ගේ සහභාගිත්ව කමිටුව සාමාන්‍යයෙන් කාර්තුමය පදනමින් රැස්වන අතර රැස්වීම් සඳහා පහසුකම් මෙන්ම ලේකම් කටයුතු සහාය ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් සපයන ලදී. මුදල් ප්‍රතිපත්ති තීරණ ගැනීම සහ සන්නිවේදනය සඳහා දායක වන විශ්ලේෂණාත්මක ධාරිතාව පුළුල් කිරීමේ අඛණ්ඩ ප්‍රයත්නවල කොටසක් ලෙස, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙතින් ලැබුණු තාක්ෂණික සහාය ඇතිව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සිය අභ්‍යන්තර ආකෘතීකරණ සහ පුරෝකථන හැකියාව අඛණ්ඩව වැඩිදියුණු කරන ලදී. නම්‍යශීලී උද්ධමන ඉලක්කකරණ රාමුව තුළ මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරන බැවින්, අපේක්ෂිත මැදි කාලීන උද්ධමන මාවත අනුව උද්ධමන අපේක්ෂාවන් පාලනය කිරීමේ අරමුණින්, බාහිර

සන්නිවේදනය වැඩිදියුණු කිරීමට සහ පොදු මහජනතාව සහ අනෙකුත් පාර්ශ්වකරුවන් අතර දැනුම්වත්භාවය වැඩිදියුණු කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පියවර කිහිපයක් ආරම්භ කරන ලදී. මුදල් මණ්ඩලයේ මුදල් ප්‍රතිපත්ති ස්ථාවරය පිළිබඳව මහජනතාව දැනුම්වත් කරමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්ති සමාලෝචනය පිළිබඳ මාධ්‍ය නිවේදන අටක් ප්‍රකාශයට පත් කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සන්නිවේදන දෙපාර්තමේන්තුව සංවිධානය කරන ලද මුදල් ප්‍රතිපත්ති සමාලෝචන මාධ්‍ය සාකච්ඡා සඳහා පහසුකම් සලසමින් ඒවා මංගත ක්‍රමවේද සහ සමාජ මාධ්‍ය හරහා සජීවීව විකාශනය කරන ලද අතර එමගින් පුළුල් ව්‍යාප්තියක් සහිතව තත්කාලීනව මුදල් ප්‍රතිපත්ති සන්නිවේදනය කළ හැකි විය. මහ බැංකුවේ සන්නිවේදන ප්‍රයත්නයන්ට සහාය වෙමින්, මුදල් ප්‍රතිපත්ති නිවේදනයෙන් පසුව මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල මගින් සම්බන්ධීකරණය කරන මංගත සැසි සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සම්පත්දායකයන් ලබාදෙන ලදී. මහ බැංකුවේ කාර්යයන් සම්බන්ධ තෝරාගත් ක්ෂේත්‍ර පිළිබඳව මහ බැංකු කාර්ය මණ්ඩලයේ තාක්ෂණික අවබෝධය වැඩිදියුණු කිරීම සඳහා සන්නිවේදන දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන දැනුම හුවමාරු කරගැනීමේ සැසි සඳහා ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව දායක විය. මේ අතර, වසර තුළ දී මුදල් සහ පොලී අනුපාතික සංඛ්‍යාන සම්පාදනය කිරීම සහ බෙදා හැරීම තවදුරටත් වැඩිදියුණු කිරීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා ලදී. ඒ අනුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් පොලී අනුපාතික සංඛ්‍යාන පිළිබඳ වැඩි සංඛ්‍යාතයක් සහිත කාණ්ඩිත දත්ත රැස් කිරීම ආරම්භ කළ අතර, මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ගේ සිදු වූ වෙනස්කම්වලින් පසුව මුදල් හා පොලී අනුපාතික දත්ත රැස්කිරීමේ ක්‍රියාවලිය විධිමත් කරන ලදී.

7.2 විදේශීය අංශයේ ස්ථායීතාවය පවත්වා ගැනීම

ආර්ථිකයේ විදේශීය අංශයේ ස්ථාවරත්වය සහතික කිරීමේ අරමුණින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර වෙළඳාම, විදේශ මූල්‍ය, විනිමය අනුපාතික සහ දළ නිල සංචිත සම්බන්ධ සංඛ්‍යා දත්ත එකතු කිරීම, සම්පාදනය කිරීම සහ විශ්ලේෂණය කිරීම තුළින් මුදල් ප්‍රතිපත්ති කමිටුවට සහ මුදල් මණ්ඩලය වෙත විදේශීය අංශය පිළිබඳ සුදුසු හා කාලීන ප්‍රතිපත්ති උපදෙස් සහ නිර්දේශ අඛණ්ඩව ලබා දෙන ලදී. අභියෝගාත්මක සහ අවදානම් ආර්ථික තත්ත්වයන් මධ්‍යයේ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විනිමය අනුපාතිකයේ පීඩනය නිරන්තරයෙන් විශ්ලේෂණයට ලක් කරන ලද අතර, විදේශීය අංශයේ අවදානම් විසඳීමට අවශ්‍ය ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග සමගින් විදේශීය අංශයේ වර්ධනයන් සහ ගැටලු පිළිබඳව ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට සහ මුදල් මණ්ඩලයට අඛණ්ඩව ඉදිරිපත් කිරීම් සහ වාර්තා ලබාදීම් සිදු කරන ලදී. මුදල් නීති පනතේ 114වන වගන්තියට අනුව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් රජයේ ඉල්ලීම පරිදි, යෝජිත විදේශ ණය ලබා ගැනීමට පෙර, එම ණය මගින් මුදල් තත්ත්වය මත ඇතිවන බලපෑම අඛණ්ඩව විශ්ලේෂණය කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ගෙවුම් තුලන ලේඛනයේ 6වන සංස්කරණ (BPM6) ආකෘතිය අනුව ගෙවුම් තුලන හා ජාත්‍යන්තර ආයෝජන තත්ත්වය පිළිබඳ සංඛ්‍යා දත්ත කාර්තුමය පදනම මත ද, ජාත්‍යන්තර සංචිත දත්ත සටහන මාසික පදනම මත ද ප්‍රකාශයට පත් කළ අතර, කාර්තුමය විදේශ ණය පිළිබඳ සංඛ්‍යා දත්ත ලෝක බැංකුව වෙත ද, වාර්ෂික පදනම මත ඍජු ආයෝජන දත්ත විදේශීය ආයෝජන පිළිබඳ ඒකාබද්ධ සමීක්ෂණය වෙත ද ඉදිරිපත් කරන ලදී. විදේශීය අංශයේ දත්තවල නිරවද්‍යතාවය තහවුරු කිරීමට සහ වඩාත් කාලීන තොරතුරු ලබා ගැනීම තහවුරු කිරීම සඳහා ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ ලැබීම් සම්බන්ධයෙන් වූ මාසික සමීක්ෂණ, පෞද්ගලික අංශයේ විදේශීය වත්කම් සහ වගකීම් පිළිබඳ තොරතුරු එක්රැස් කිරීම සඳහා ක්‍රියාත්මක කෙරෙන වාර්ෂික අන්තර්ජාතික ආයෝජන තත්ත්වය පිළිබඳ සමීක්ෂණය සහ නේවාසික හා අනේවාසික ගුවන් සමාගම්, නාවික සමාගම්, විදුලි සංදේශ, ඉදිකිරීම් සහ රක්ෂණ ආදී අංශ රැසක් ආවරණය කෙරෙන සේවා වෙළඳාම පිළිබඳ සමීක්ෂණය ඇතුළු සමීක්ෂණ රැසක් සිදු කරන ලදී. වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින්, බැංකු පද්ධතිය හරහා සිදු වන විදේශ මුදල් ගනුදෙනු පිළිබඳ විස්තරාත්මක තොරතුරු රැස් කිරීමේ සහ සම්පාදනය කිරීමේ ව්‍යාපෘතියක් වන අන්තර්ජාතික ගනුදෙනු වාර්තා කිරීමේ පද්ධතිය (ITRS) ක්‍රියාත්මක කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින්, විශේෂයෙන්ම විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලියට සහ 2022 සැප්තැම්බර් මාසයේ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විස්තීරණ ණය පහසුකම යටතේ කාර්ය මණ්ඩල මට්ටමේ ගිවිසුමකට එළඹීම සඳහා විදේශීය පාර්ශ්වයන් සමග කටයුතු කිරීමට පහසුකම් සැලසීය.

7.3 පූර්වෝපායික ප්‍රතිපත්තිමය උපදේශන

2022 වසර තුළ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මුදල් ප්‍රතිපත්තිය, විදේශ විනිමය ප්‍රතිපත්තිය, විදේශ වෙළඳාම සහ රාජ්‍ය මූල්‍ය අංශය හා සම්බන්ධ ගැටලු පිළිබඳව මුදල් මණ්ඩලයට, රජයට සහ අනෙකුත් පාර්ශ්වයන්ට ප්‍රතිපත්ති උපදෙස් සැපයීමේ ප්‍රධාන භූමිකාව, අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ඒ අනුව, ඉහළ කළමනාකාරීත්වයට සහ මුදල් මණ්ඩලයට අමතරව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ගරු මුදල් අමාත්‍යවරයාට, ගරු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සහ පාර්ලිමේන්තු කමිටු කිහිපයකට රහස්‍ය වාර්තා සකස් කොට ඉදිරිපත් කරන ලදී. දෙපාර්තමේන්තුවේ ව්‍යවස්ථාපිත කාර්යභාරය ඉටු කිරීමේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින්, මුදල් නීති පනතේ 64 සහ 68 වගන්ති යටතේ, මුදල් හා විදේශීය අංශ සම්බන්ධයෙන් දැනට පවතින සහ අපේක්ෂිත තත්ත්වයන් පිළිබඳව ගරු මුදල් අමාත්‍යවරයා වෙත රහස්‍ය වාර්තා ඉදිරිපත් කළ අතර, එමගින් ආර්ථික හා මිල ස්ථායීතාවය සහ විදේශීය අංශයේ ස්ථායීතාව තහවුරු කිරීම සඳහා ගත යුතු පූර්වෝපායික ක්‍රියාමාර්ග ද යෝජනා කළේය. මුදල් නීති පනතේ 116 (1) වගන්තිය යටතේ, මහ බැංකුවෙහි අරමුණු ඉටු කර ගැනීමේ දී වත්මන් රාජ්‍ය මූල්‍ය ප්‍රතිපත්තියෙහි බලපෑම අවධාරණය කරමින්, 2023 ජාතික අයවැයට අන්තර්ගත කිරීම සඳහා ප්‍රතිපත්ති යෝජනා ද ඇතුළත් කොට සැප්තැම්බර් 15 රහස්‍ය වාර්තාව ගරු මුදල් අමාත්‍යවරයාට ඉදිරිපත් කරන ලදී.

2022 වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අවශ්‍ය ප්‍රතිපත්තිමය කරුණු සැපයීම සඳහා මුදල් මණ්ඩල රැස්වීම්වලට නිරන්තරයෙන් සහභාගී වූ අතර, මුදල් ප්‍රතිපත්ති කමිටුව, වෙළඳපොළ මෙහෙයුම් කමිටුව, මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව, දේශීය ණය කළමනාකරණ කමිටුව, රජයේ සුරැකුම්පත් නිකුත් කිරීම සඳහා වූ ටෙන්ඩර් මණ්ඩල, පුනුණුකටයුතු කමිටුව සහ පුස්තකාල උපදේශන කමිටුව ඇතුළුව අභ්‍යන්තර කමිටු ගණනාවක අඛණ්ඩව සාමාජිකත්වය දරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, අභ්‍යන්තර ආයෝජන අධීක්ෂණ කමිටුවෙහි සහ ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුවෙහි නිරීක්ෂකයෙකු ලෙස ද අඛණ්ඩව කටයුතු කළේය. මීට අමතරව, සාර්ව ආර්ථික ප්‍රවණතාවයන් සහ කාලීන වැදගත්කමක් ඇති විෂයයන් සම්බන්ධයෙන් අවශ්‍ය කරුණු සපයමින් ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ, නිත්‍ය සහ විශේෂ සැසිවාරමෙන් ම අභ්‍යන්තර කමිටු රැස්වීම් සහ මූල්‍ය ආයතනවල සභාපතිවරුන්ගේ සහ ප්‍රධාන විධායක නිලධාරීන්ගේ රැස්වීම් හා බලපත්‍රලාභී බැංකුවල භාණ්ඩාගාර සේවා ප්‍රධානීන්ගේ රැස්වීම් සඳහා සහභාගී විය. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් ලංකා මිනරල් සෑන්ඩ්ස් සීමිත සමාගම විසින් ඛනිජ වැලි විකිණීමේ දී ඒ සඳහා නිශ්චිත මිල සීමාවක් නියම කිරීමේ කමිටුව, වහලය මත/බිම් මට්ටමින් සවි කෙරෙන සූර්ය බල පද්ධති සඳහා වන තීරු බදු සංශෝධනය කිරීමේ කමිටුව, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය පෙර දැක්ම ක්‍රියාත්මක කිරීමේ මෙහෙයුම් කමිටුවට සහාය වීමේ තාක්ෂණික කමිටුව, පුනර්ජනනීය බලශක්ති ප්‍රභවයන්ගෙන් ජනනය කරන මෙගා වොට් 10ක් හෝ ඊට අඩු විදුලිය සඳහා සම්මත විදුලි ගාස්තු යාවත්කාලීන කිරීමේ කමිටුව, කුරුන්චතිව් ලුණු ලේවාය ප්‍රතිසංස්කරණය කිරීමේ ව්‍යාපෘති කමිටුව, අපනයන සංවර්ධන මණ්ඩලයේ වෙළඳ ප්‍රවර්ධන හා තොරතුරු පිළිබඳ උපදේශන කමිටුව, රාජ්‍ය මූල්‍ය සංඛ්‍යා දත්ත සම්බන්ධීකරණය කිරීමේ කමිටුව, ගෑස් සඳහා මිල සූත්‍රයක් හඳුන්වා දීමේ කමිටුව, ඛනිජ තෙල් නිෂ්පාදන සඳහා මිල සූත්‍රයක් හඳුන්වා දීමේ කමිටුව, ජීවන වියදම පාලනය කිරීම සඳහා වන කමිටුව, භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් මෙහෙයවන කාබනේට් පාෂාණ හා ඛනිජවල ආර්ථික වටිනාකම තීරණය කිරීමේ ඇගයීම් කමිටුව, ආහාර ප්‍රතිපත්ති කමිටුව සහ අධිවේගී මාර්ග ඇතුළු ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කොන්ත්‍රාත්වල මිල වෙනස් වීම් ගැලපීම සඳහා සුදුසු ක්‍රමවේදයක් සකස් කිරීම සඳහා වන කමිටුව ඇතුළු බාහිර ආයතන කිහිපයක කමිටු සහ මණ්ඩල නියෝජනය කරන ලදී. අතිගරු ජනාධිපතිතුමා විසින් පත් කරන ලද ආර්ථික ස්ථායීතාවය, ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සහ වර්ධනය ඉහළ නැංවීම සඳහා වන කමිටුවට ද ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ ජ්‍යෙෂ්ඨ සාමාජිකයන් විවිධ ආකාරයෙන් සහාය දක්වන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්, වසර තුළ දී වැඩසටහන් කිහිපයක දී මහ බැංකුව නියෝජනය කළ අතර, සමුද්‍ර අවකාශය භාවිතයට ගන්නා ආකාරය පිළිබඳව සැලසුම් කිරීම සහ 30*30 ව්‍යාපාරය : ශ්‍රී ලංකාවට ලැබෙන ප්‍රතිලාභ, Global Green Growth (GGGI) ආයතනය මගින් මෙහෙයවූ ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය වැඩසටහන, තිරසාර සංවර්ධනය සඳහා ESCAP සාර්ව ආර්ථික ආකෘතිය ක්‍රියාත්මක කිරීම සහ විදේශ විනිමය ගලා ඒම් ශක්තිමත් කිරීමේ කාර්යසාධක බලකාය වැනි වැඩසටහන් ඒ අතර වේ. මීට අමතරව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව, ලංකා විදුලිබල මණ්ඩලය, කොළඹ වරාය නගරය (පෞද්ගලික) සමාගම ඇතුළු විවිධ ආයතනවල රැස්වීම් සඳහා සහභාගී විය. මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන් හරිත මූල්‍ය වර්ගීකරණය පිළිබඳ මෙහෙයුම් කමිටුවට සහභාගී වූ අතර, හරිත මූල්‍ය වර්ගීකරණය ක්‍රියාවට නැංවීමේ වැඩසටහන සංවිධානය කිරීමට ද සම්බන්ධ විය. එක්ස්ප්‍රස් පර්ල් සමුද්‍රීය නෞකාවෙන් සිදු වූ ව්‍යසනයේ බලපෑම තක්සේරු කිරීම, ජාතික ඉන්ධන අවසර පත්‍ර ක්‍රමයෙහි කාර්සාධනය, ඉල්ලුම කළමනාකරණය කිරීම සඳහා දේශීය ඛනිජ තෙල් මිල කඩිනමින් සංශෝධනය කිරීමේ අවශ්‍යතාවය, ආහාර සුරක්ෂිතතාවය සහ ආර්ථිකය යථා තත්ත්වයට පත් කිරීම සඳහා කෘෂිකාර්මික අංශයෙහි පුනරුදයක් ඇති කිරීම සහ කර්මාන්ත අංශයේ ගැටලු සහ අපේක්ෂාවන් ඇතුළුව කාලීන වැදගත්කමක් සහිත විශ්ලේෂණ අඛණ්ඩව සිදු කරන ලදී. නිදහස් වෙළඳ ගිවිසුම් පිළිබඳ සාකච්ඡා යථාවත් කිරීමේ රජයේ ප්‍රයත්නයන්ට දායක වෙමින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සහ නිලධාරීන්, ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් සත්කාරකත්වය දරන චීන - ශ්‍රී ලංකා නිදහස් වෙළඳ ගිවිසුමෙහි සාකච්ඡා සඳහා පිහිටුවන ලද ආයෝජන අනුකමිටුව වැනි කමිටු සහ අනුකමිටුවලට සහභාගී විය.

7.4 ව්‍යවස්ථාපිත ප්‍රකාශන සහ දත්ත හා තොරතුරු බෙදා හැරීම

මුදල් නීති පනතේ ඇති ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට අනුව, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින්, මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තුවල සහාය ද ඇතිව, 2021 වසර සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික වාර්තාව භාෂා ත්‍රිත්වයෙන්ම ප්‍රකාශයට පත්කරන ලදී. මහ බැංකුවේ ප්‍රමුඛතම වාර්ෂික ප්‍රකාශනය වන මෙය 2021 වසරේ අප්‍රේල් මස අවසානයේ දී ගරු මුදල් අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද අතර එය මහජනයා සඳහා ද ලබාදෙන ලදී. මීට අමතරව, පැවති සාර්ව ආර්ථික තත්ත්වයන්ගේ මධ්‍ය වාර්ෂික තක්සේරුවක් සහ 2023 සඳහා ඉදිරි දැක්ම පිළිබඳ තොරතුරු සපයන 'මෑත කාලීන ආර්ථික ප්‍රවණතා -2022 සුවිශේෂ සිදුවීම් සහ 2023 අපේක්ෂා' ප්‍රකාශනය අනෙකුත් දෙපාර්තමේන්තුවල සහාය ද ඇතිව 2022 වසරේ ඔක්තෝබර් මාසයේ දී ප්‍රකාශයට පත්කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් මාසික සංඛ්‍යාන විවරණිකා සහ සාර්ව ආර්ථික ප්‍රස්ථාර එකතුව ප්‍රකාශයට පත් කරන ලද අතර, විවිධ මාධ්‍ය සහ මහ බැංකුවේ වෙබ් අඩවියේ මංගත දත්ත පුස්තකාලය හරහා ප්‍රකාශයට පත් කරන ලද දෛනික, සතිපතා සහ මාසික දර්ශක සහ විවරණිකා හරහා ආර්ථික හා මූල්‍ය තොරතුරු අඛණ්ඩව බෙදා හරින ලදී. එමෙන්ම, මහජනතාවගේ දැනුවත්මිවත්භාවය ඉහළ නැංවීමේ අරමුණින්, නිතිපතා ප්‍රකාශයට පත්කරන මුදල් ප්‍රතිපත්ති

විවරණ සහ විදේශීය අංශයේ ප්‍රවණතා හා සම්බන්ධ විශේෂ සිදුවීම් පිළිබඳ මාධ්‍ය නිවේදන සහ පුවත්පත් නිවේදන නිකුත් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් ආර්ථිකයේ සියලුම අංශ ආවරණය වන පරිදි ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුව සම්පාදිත සංඛ්‍යාන දත්ත මුද්‍රාහරින ලදී. ආර්ථික පර්යේෂණ අධ්‍යක්ෂ විසින් බාහිර කටයුතුවල දී මහ බැංකුව නියෝජනය කළ අතර, ප්‍රධාන ආර්ථික ගැටලු පිළිබඳව විද්‍යුත් මාධ්‍යවල සාකච්ඡා රාශියකට ද සහභාගී විය. එමෙන්ම, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව මගින් අධිපතිවරයා විසින් නොයෙකුත් අවස්ථාවල පවත්වන ලද දේශන සඳහා කථන කරුණු සහ ඉදිරිපත් කිරීම් පිළියෙළ කළ අතර, ගරු අමාත්‍යවරුන් වෙත විවිධ මාතෘකා පිළිබඳ තොරතුරු ලබාදීම ද සිදු කරන ලදී.

7.5 ප්‍රතිපත්ති පර්යේෂණවල නිරත වීම සහ දැනුම බෙදා හැරීම

මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදනයට පහසුකම් සැලසීම සඳහා පර්යේෂණ සහ විශ්ලේෂණ හැකියා ඉහළ නංවාලීමට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව සිය දෙපාර්තමේන්තුව තුළ සහ මහ බැංකුව තුළ පර්යේෂණ පසුබිමක් අඛණ්ඩව ප්‍රවර්ධනය කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි පර්යේෂණ සංස්කෘතිය වැඩිදියුණු කිරීමේ අරමුණින් සකස් කරන ලද අභ්‍යන්තර කමිටුවක් වන පර්යේෂණ උපදේශන කමිටුව විසින්, පර්යේෂණ ආශ්‍රිත කාර්යයන් සඳහා මග පෙන්වීම් සහ දැනුම හුවමාරු කිරීමේ වැඩසටහන් අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, පර්යේෂණ උපදේශන කමිටුවෙහි සාමාජිකයින් විසින් මහ බැංකුවේ නිලධාරීන්ගේ පර්යේෂණ කුසලතා වැඩිදියුණු කිරීම සඳහා පර්යේෂකයන්ට මග පෙන්වන පර්යේෂණ ක්‍රියාකාරකම් සඳහා ක්‍රියාකාරීව දායක වූ අතර බැංකු විදු පියෙසෙහි සහාය ඇතිව 'ආර්ථික විද්‍යාත්මක පර්යේෂණ' (Research in Economics) සහ 'Eviews' ඇතුළු පර්යේෂණ ක්‍රමවේද පිළිබඳ පුහුණු පාඨමාලා කිහිපයක සම්පත් දායකයින් ලෙස කටයුතු කළේය. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ආසියානු සංවර්ධන බැංකු ආයතනය සහ ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමයේ සහයෝගිතාව ඇතිව 2022 වසරේ සැප්තැම්බර් මාසයේ දී අඛණ්ඩව තෙවන වරටත් 'සාර්ව ආර්ථික ස්ථායිතාව සඳහා මතුවන ගැටලු' යන තේමාව යටතේ ඒකාබද්ධ වාර්ෂික ජාත්‍යන්තර පර්යේෂණ වැඩමුළුවක් සංවිධානය කරන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලය විසින් ආසියා ශාන්තිකර ව්‍යවහාරික ආර්ථික විද්‍යා සංගමයේ පර්යේෂකයන් සමග සාමූහිකව සකස් කරන ලද පර්යේෂණ පත්‍රිකා තුනක් මෙම වැඩමුළුවේ දී ඉදිරිපත් කරන ලදී. 2022 වසරේ අගෝස්තු මාසයේ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ පර්යේෂකයන් විසින් දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ අතථ්‍ය සම්මන්ත්‍රණයේ දී අප රටෙහි අත්දැකීම් ඇසුරෙන් පර්යේෂණ පත්‍රිකාවක් ඉදිරිපත් කරන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ පශ්චාත් උපාධි අපේක්ෂයන් සඳහා සාර්ව ආර්ථික විද්‍යාව, ක්ෂුද්‍ර ආර්ථික විද්‍යාව සහ ආර්ථික විද්‍යාව සඳහා ගණිතය යන ක්ෂේත්‍රයන්හි පුහුණුව ලබා දීම සඳහා මූලිකත්වය ගෙන ක්‍රියා කළේය. පර්යේෂණ උපදේශන කමිටුවෙහි සාමාජිකයින් මහ බැංකුවේ පශ්චාත් උපාධි අපේක්ෂකයින්ගේ පර්යේෂණ යෝජනා සහ පර්යේෂණ පත්‍රිකා ඇගයීම සහ විශ්ව විද්‍යාල පද්ධතියේ පශ්චාත් උපාධි සිසුන් සඳහා අධීක්ෂණ සේවා සැපයීම අඛණ්ඩව සිදුකළ අතර, පර්යේෂණ උපදේශන කමිටුවෙහි මගපෙන්වීම යටතේ මහ බැංකුවේ නිල පර්යේෂණ ප්‍රකාශනය වන 'මාණ්ඩලික පත්‍රිකා' 2022 වසරේ ප්‍රකාශයට පත්විය. එපමණක් නොව, පර්යේෂණ උපදේශන මණ්ඩලයෙහි සාමාජිකයින් විසින් 'නිවුස් සර්වේ' (News survey), 'සටහන' සහ 'වෛප්පම්' (Vaippaham) යන මහ බැංකුවේ වාර සඟරා තුනෙහි පල කිරීම සඳහා සම්පාදනය කරන ලද ලිපි සමාලෝචනය කිරීමද සිදු කරන ලදී.

මේ අතර, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව පාසල් හා විශ්ව විද්‍යාල සිසුන්, රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල නිලධාරීන්ගේ ප්‍රයෝජනය සඳහා මහ බැංකුවේ සන්නිවේදන දෙපාර්තමේන්තුව, බැංකු විදු පියෙස සහ ප්‍රාදේශීය කාර්යාලවල සහයෝගය ඇතිව මහ බැංකුව තුළ සහ ඉන් පිටත උනන්දුවක් දක්වන පාර්ශ්වයන් අතර ආර්ථික විද්‍යා දැනුම වැඩිදියුණු කිරීමට කටයුතු කරන ලදී. එසේම, මහ බැංකුවේ සීමාවාසික වැඩසටහන යටතේ, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් විශ්වවිද්‍යාල සිසුන් 45 දෙනෙකුගේ පර්යේෂණ කුසලතා වර්ධනය කිරීමට සහාය වෙමින් සහ රටේ ආර්ථික ප්‍රතිපත්ති සම්පාදනයේ දී ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවෙහි සහ මහ බැංකුවෙහි කාර්යභාරය පිළිබඳව ඔවුන් දැනුම්වත් කරමින් උපදේශකත්ව සේවා ලබා දෙන ලදී. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් විසින් '2021 මහ බැංකු වාර්ෂික වාර්තාවෙන් පිළිබිඹුවන ශ්‍රී ලංකා ආර්ථිකය, ඉදිරි දැක්ම සහ අභියෝග' යන මැයෙන් ප්‍රධාන මහජන දේශනයක් භාෂා ත්‍රිත්ත්වයෙන් ම පවත්වන ලදී. තවද, මුදල් ප්‍රතිපත්තිය, මහ බැංකුවේ අරමුණු සහ කාර්යයන්, මෑත කාලීන ආර්ථික ප්‍රවණතා සහ වත්මන් ආර්ථික අර්බුදය වැනි අංශ පිළිබඳව මංගත සහ පුද්ගල සහභාගිත්වයෙන් අධ්‍යාපනික සහ දැනුම්වත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී. මීට අමතරව, 2022 වසරේ දී බැංකු විදු පියෙස විසින් සංවිධානය කරනු ලැබූ, 'තක්ෂිලාව' සහ 'අරිවූටෘ' නම් වූ, පිළිවෙළින්, සිංහල සහ දෙමළ භාෂාවලින් පවත්වන ලද, රූපවාහිනී අධ්‍යාපනික දේශන මාලාව වෙත ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගේ සේවය හිමි විය.

7.6 ජාත්‍යන්තර සබඳතා

2022 වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව රජය සහ මහ බැංකුව වෙනුවෙන් ජාත්‍යන්තර සංවිධාන සහ බහුපාර්ශ්වීය ආයතන සමග පවතින ආර්ථික හා මූල්‍ය සබඳතා තවදුරටත් ශක්තිමත් කරන ලදී. වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග මංගත ක්‍රමවේදය ඔස්සේ පවත්වන ලද රැස්වීම් සම්බන්ධීකරණය කළ අතර, IVවන වගන්තිය හා VIII වන වගන්තිය යටතේ වන උපදේශන සහ තාක්ෂණික සහාය ඇතුළුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙහි මෙහෙයුම් කිහිපයක් සඳහා පහසුකම් සලසන ලදී. තවද, අග්නිදිග ආසියානු මහ බැංකු මධ්‍යස්ථානය හරහා අග්නිදිග ආසියානු මහ බැංකු

විධායක කමිටුවේ හා මහ බැංකු අධිපතිවරුන්ගේ වාර්ෂික රැස්වීම් සම්බන්ධීකරණය කරමින්, සහ දකුණු ආසියානු මහ බැංකුවල අනෙකුත් සම්බන්ධීකාරකවරු සමග එක්ව දකුණු ආසියානු කලාපීය සහයෝගිතා මූල්‍ය සංවිධානයේ කටයුතු සම්බන්ධීකරණය කරමින්, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව කලාපීය මහ බැංකු සමග අඛණ්ඩව සක්‍රීය ලෙස කටයුතු කළේය. කොළඹ පිහිටි නවසීලන්ත මහ කොමසාරිස් කාර්යාලය සමග එක්ව ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් නවසීලන්ත සංචිත බැංකුවේ හිටපු වැඩබලන අධිපතිවරයාගේ සංචාරයකට සත්කාරකත්වය සැපයූ අතර, එහි දී මහ බැංකු කටයුතු සහ එයට සම්බන්ධ නීති පිළිබඳව සාකච්ඡා කිරීමට අමතරව ප්‍රසිද්ධ දේශනයක් ද පවත්වන ලදී. එසේම, වසර තුළ දී, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් ෆිච් (Fitch), එස් ඇන්ඩ් පී (S & P) සහ මූඩීස් (Moody's) යන ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ආයතන ත්‍රිත්වය සමග සමීපව කටයුතු කළ අතර, ජාත්‍යන්තර ස්වෛරීත්ව ශ්‍රේණිගත කිරීමේ ආයතන විසින් සිදු කළ විමසීම් සඳහා අවශ්‍ය කරුණු සපයන ලදී. දරිද්‍රතාවය තුරන් කිරීම, තාක්ෂණය සහ නවෝත්පාදන, ව්‍යුහාත්මක වෙනස් වීම්, කලාපීය ඒකාබද්ධතාවය, දේශගුණික විපර්යාස සහ ඉදිරියේ දී ඇති විය හැකි කම්පනවලට ඔරොත්තු දීමේ හැකියාව ගොඩනැංවීම යන අංශ පිළිබඳව අවධාරණය කරමින් පවත්වන ලද අවම සංවර්ධිත තත්ත්වයක් සහිත රටවල් සඳහා වන එක්සත් ජාතීන්ගේ පස්වන සමුළුව සඳහා අවශ්‍ය තොරතුරු ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී. තවද, ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුව විසින් 2022 එක්සත් ජාතීන්ගේ මහා මණ්ඩලයේ 77 වන සැසිවාරය, විදේශ ආයෝජකයින් සහ තානාපතිවරු සඳහා අවශ්‍ය ආර්ථික තොරතුරු සැපයීමට දායක වූ අතර ආර්ථිකයේ බාහිර පාර්ශ්වකරුවන් සමග පවතින සම්බන්ධතාවයන් අඛණ්ඩව පවත්වාගෙන යන ලදී.

8. සේවක අර්ථසාධක අරමුදල

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව (සේ. අ. අ. දෙපාර්තමේන්තුව) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනත ප්‍රකාරව මුදල් මණ්ඩලය වෙත පවරන ලද බලතල ක්‍රියාත්මක කිරීමට, රාජකාරීන් ඉටු කිරීමට සහ කාර්යයන් ක්‍රියාත්මක කිරීමට පහසුකම් සපයනු ලබයි. සේවක අර්ථසාධක අරමුදල් පනතේ විධිවිධාන වලට අනුව, අරමුදලෙහි සාමාන්‍ය පරිපාලනය කම්කරු කොමසාරිස්වරයා වෙත පැවරී ඇති අතර අරමුදල් කළමනාකරණය සඳහා වූ සියලු බලතල, කාර්යයන් සහ වගකීම් අරමුදලේ භාරකරු වන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙත පැවරී ඇත.

සේ. අ. අ. පනත යටතේ ගෙවන ලද සියලුම දායක මුදල්, අධිභාර සහ ගාස්තු සහ අරමුදලෙහි මුදල් යෙදවීමෙන් ලැබෙන ආදායම එක්රැස් කිරීම, අරමුදලෙහි මුදල් වල භාරය දැරීම, එක් එක් සාමාජිකයා වෙනුවෙන් වෙන වෙනම ගිණුම් පවත්වා ගැනීම, කම්කරු කොමසාරිස් විසින් සහතික කරනු ලැබූ තැනැත්තන් හට පනත යටතේ හිමි ප්‍රතිලාභ ගෙවීම, පනතෙහි කාර්යයන් සඳහා වහාම අවශ්‍ය නොවන මුදල් ආයෝජනය කිරීම, අරමුදලේ ගිණුම් පවත්වාගෙන යාම, අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සැකසීම, එහි පිටපතක් කම්කරු විෂය සම්බන්ධ ඇමති තුමා වෙත ලබාදීම සහ එය විගණකාධිපතිවරයාට ඉදිරිපත් කිරීම යන කාර්යයන් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය වෙනුවෙන් සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි.

2022 වසරේදී ද සේ.අ.අ. දෙපාර්තමේන්තුව, සේ.අ.අ. පනතේ ප්‍රතිපාදනයන්ට අනුගත වෙමින් ඉහත කාර්යයන් ඉටු කළ අතර කම්කරු කොමසාරිස්වරයා සමග ද සමීප සම්බන්ධීකරණයක් පවත්වා ගෙන යන ලදී. සමාලෝචිත වර්ෂය තුළ සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

(අ) දායක මුදල් ලැබීම් සහ හිමිකම් ඇති අයට ප්‍රතිලාභ ගෙවීම්

2022 වසරේ දායක මුදල් ලැබීම් රු. බිලියන 194.6 දක්වා පෙර වසරේ පැවති රු. බිලියන 165.7 සිට සියයට 17.4 කින් වැඩි වූ අතර, අරමුදලේ සාමාජිකයන් සහ ඔවුන්ගේ නෛතික උරුමකරුවන් වෙත ගෙවූ ප්‍රතිලාභ ද රු.බිලියන 163.0 ක් දක්වා පෙර වසරේ පැවති රු.බිලියන 118.2 සිට සියයට 37.9 කින් වැඩි විය. ඒ අනුව, 2022 වසරේ දී ශුද්ධ දායකත්වය (දායක මුදල් ලැබීම්වලින් ප්‍රතිලාභ ගෙවීම් අඩු කළ පසු), 2021 වසරේ පැවති රු.බිලියන 47.5 හා සැසඳීමේ දී රු.බිලියන 31.6 ක් දක්වා අඩුවිය. (II-9 සංඛ්‍යා සටහන)

(ආ) අරමුදලේ පොදු ගිණුම් සහ සාමාජික ගිණුම් පවත්වාගෙන යාම

2022 වසර අවසානයේ දී, අරමුදලේ මුළු වටිනාකම රු. බිලියන 3,459.9 ක් වූ අතර, එය 2021 වසර අවසානයේ වූ රු.බිලියන 3,166.1 හා සසඳන විට සියයට 9.3 ක වර්ධනයක් පෙන්නුම් කරයි. ආයෝජන තුළින් ඉපැයූ ආදායම් සහ සාමාජික ශුද්ධ දායක මුදල් ලැබීම් අරමුදලේ වර්ධනයට හේතු විය. 2021 වසරේ රුපියල් බිලියන 3,066.9 ක් ව පැවති අරමුදලේ සාමාජිකයන් වෙත වූ මුළු වගකීම (සාමාජික ශේෂය) 2022 අවසන් වන විට රු. බිලියන 3,380.6 දක්වා සියයට 10.2 කින් වර්ධනය විය (II-9 සංඛ්‍යා සටහන).

II-9 සංඛ්‍යා සටහන

අරමුදල පිළිබඳ මූලික දත්ත

අයිතමය	2021	2022(අ)	වෙනස(%)
අරමුදලෙහි සමස්ත වටිනාකම (රුපියල් බිලියන)	3,166.1	3,459.9	9.3
සාමාජිකයන් සඳහා වන සමස්ත වගකීම (රුපියල් බිලියන)	3,066.9	3,380.6	10.2
මුළු සාමාජික ගිණුම් සංඛ්‍යාව (මිලියන)	20.3	20.4	0.5
දැනට දායක මුදල් එවනු ලබන ගිණුම් (මිලියන)	2.5	2.4	(4.0)
දැනට දායක මුදල් එවනු නොලබන ගිණුම් (මිලියන)	17.8	18.0	1.1
මුළු දායක මුදල් ලැබීම් (රුපියල් බිලියන)	165.7	194.6	17.4
මුළු ප්‍රතිලාභ ගෙවීම් (රුපියල් බිලියන)	118.2	163.0	37.9
ශුද්ධ දායක මුදල් (රුපියල් බිලියන)	47.5	31.6	(33.6)
ප්‍රතිලාභ ගෙවීම් සංඛ්‍යාව	179,681	254,630	41.7

(අ) තාවකාලික

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(ඇ) අරමුදලෙහි ආයෝජන කටයුතු

සේවක අර්ථසාධක අරමුදලෙහි අරමුදල් කළමනාකරණ කටයුතු සම්බන්ධ තීරණ සේවක අර්ථසාධක අරමුදලෙහි ආයෝජන කමිටුව විසින් ගනු ලබයි. මෙම කමිටුව මගින් දෛනිකව අරමුදලේ මුදල් ප්‍රවාහය, වෙළඳපොළ තත්ත්වයන්, සහ ආයෝජන අවස්ථා ඇගයීම සිදු කරනු ලබන අතර, ආයෝජන කටයුතු සම්බන්ධ තීරණ ගනු ලබයි. සේ.අ.අ. ආයෝජන අධීක්ෂණ කමිටුව විසින් මාසිකව ආයෝජන කටයුතු අධීක්ෂණය කරනු ලබන අතර, මුදල් මණ්ඩලය අනුමත කරන ලද, ආයෝජන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ මූලික කර ගනිමින් උපායමාර්ගික සහ ප්‍රතිපත්තිමය මගපෙන්වීම් සපයනු ලබයි. තවද, සේ.අ.අ. දෙපාර්තමේන්තුව මගින් අරමුදල් ආයෝජන සම්බන්ධ ගනුදෙනු පිළිබඳව දෛනිකව සහ සතිපතා ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය දැනුම්වත් කරන අතර, ආයෝජන සම්බන්ධ ගනුදෙනු සහ ආයෝජන කළඹ පිළිබඳව මාසිකව මුදල් මණ්ඩලය දැනුම්වත් කරනු ලබයි. එමගින් ආයෝජන කටයුතු වල අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කරනු ඇත.

2022 අප්‍රේල් 12 වැනි දින ද්විපාර්ශ්වික සහ වාණිජ ණය සඳහා විදේශ ණය සේවාකරණ ගෙවීම තාවකාලිකව අත්හිටුවන බව රජය ප්‍රකාශ කිරීමත් සමග ඇති වූ ඉහළ සාර්ව ආර්ථික අවිනිශ්චිතතාවයකින් යුත් පරිසරයක් තුළ අරමුදලේ ආයෝජන ක්‍රියාකාරකම් සිදු කරන ලදී. ශ්‍රී ලංකා ආර්ථිකය සීග්‍ර ලෙස සංකෝචනය වීම, ඉතිහාසයේ මෙතෙක් වාර්තා කළ ඉහළම උද්ධමනය මට්ටම කරා ලඟා වීම, පොලී අනුපාතවල තියුණු වැඩිවීම, විදේශ අංශයේ අභියෝගයන්, අත්‍යවශ්‍ය භාණ්ඩ වල හිඟය සහ සමාජ හා දේශපාලන නොසන්සුන්තාවන් 2022 වර්ෂය තුළදී අත්විඳින ලදී. අරමුදලේ වත්කම් උපාය මාර්ගිකව විභජනය කිරීම සඳහා වූ මාර්ගෝපදේශයන්ට අනුකූලව සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව සිය අරමුදල් වලින් වැඩි ප්‍රතිශතයක් රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කළේය. මූල්‍ය වෙළඳපොළවල දක්නට ලැබුණු සැලකිය යුතු අස්ථාවරත්වය සැලකිල්ලට ගනිමින්, සේ.අ.අ. දිගුකාලීන රාජ්‍ය සුරැකුම්පත් ආයෝජනය කිරීම කෙරෙහි වැඩි අවධානයක් යොමු කළේය. තවද, වසරේ දෙවන හා තුන්වන කාර්තු තුළ පැවති උද්ධමන පීඩන මත කෙටි කාලීන පොලී අනුපාත වැඩිවීමේ ප්‍රවනතාවයෙහි වාසිය ලබාගැනීම සඳහා, සේ.අ.අ කෙටි කාලීන භාණ්ඩාගාර බිල්පත් වල ද ආයෝජනය කළේය. කොටස් වෙළඳපොළෙහි සිදු වූ ඉහළ විචලනයන් හමුවේ සේ.අ.අ. විසින් කොටස් වෙළඳපොළ තුළ ආයෝජන කිරීම සීමා කරන ලදී. අයහපත් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් සාංගමික ණයකරවල ආයෝජන අවස්ථා සීමා වූ අතර, සේ.අ.අ. හි සාංගමික ණය කළඹේ ණය අවදානම අවම කිරීම සඳහා ඉහළ ණය ශ්‍රේණිගත කිරීම් සහිත ආයතනවල ආයෝජනය කිරීමේ අවශ්‍යතාවය පිළිබඳව සේ.අ.අ දෙපාර්තමේන්තුව අවධානය යොමු කළේය.

ඒ අනුව, 2022 වසර අවසාන වන විට ආයෝජන කළඹේ රුපියල් බිලියන 3,466.5 ක් වූ වටිනාකමින් සියයට 96.9 ක් රාජ්‍ය සුරකුම්පත්ද, සියයට 2.3 ක් සමාගම කොටස්ද, සියයට 0.7 ක් සාංගමික ණයකරද, ඉතිරි සියයට 0.1 ප්‍රති විකුණුම් ගිවිසුම් වලින්ද සමන්විත විය.

(ඈ) සාමාජික ශේෂ සඳහා පොලී ගෙවීම්

සේ.අ. අරමුදල එහි සාමාජිකයින්ට පසුගිය වසර සමග අනුකූල වන පොලී අනුපාතයක් ගෙවීමට අදහස් කරනු ලබයි.

(ඉ) සාමාජික සේවාවන්හි නිරත වීම

(i) සාමාජික ගිණුම් ප්‍රකාශන නිකුත් කිරීම

සාමාජික ගිණුම් ප්‍රකාශන අරමුදලෙහි ලියාපදිංචි කර ඇති සේවායෝජකයන් හරහා වසරකට දෙවරක් සක්‍රීය සාමාජිකයින්ට බෙදා හරිනු ලැබේ. ඒ අනුව, 2021 වසරේ පළමු භාගයට සහ දෙවන භාගයට අදාළ සාමාජික ගිණුම් ප්‍රකාශන 2022 වසරේ දී බෙදා හරින ලදී (II-10 සංඛ්‍යා සටහන).

II-10 සංඛ්‍යා සටහන

නිකුත් කළ සාමාජික ගිණුම් ප්‍රකාශන

කාලපරිච්ඡේදය	සේවායෝජකයින් සංඛ්‍යාව	ප්‍රකාශන සංඛ්‍යාව (ක්‍රියාකාරී සාමාජිකයින්)
2021 පළමු අර්ධ වර්ෂය	64,257	2,001,329
2021 දෙවන අර්ධ වර්ෂය	70,257	2,498,231

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(ii) නිවාස ණය ලබා ගැනීම සඳහා සාමාජිකයන්ට ණය සුරැකුම් නිකුත් කිරීම

නිවාස ණය ක්‍රමය යටතේ සේවක අර්ථසාධක අරමුදල මගින් 2022 වසර තුළදී අදළ සාමාජිකයන්ගේ ගිණුම් ශේෂ මත පදනම්ව රුපියල් මිලියන 6,127 ක වටිනාකමක් සඳහා වූ ශේෂ සහතික පත් 9,443 ක ප්‍රමාණයක් එම සාමාජිකයින්ට නිවාස ණය ලබා ගැනීමට පහසුකම් සැලසීම සඳහා ණය ලබාදෙන ආයතන වෙත ලබා දෙන ලදී (II-11 සංඛ්‍යා සටහන). තවද, 2022 වසරේ දී 2021 වසර තුළ හිඟ ණය පියවීම සඳහා රුපියල් මිලියන 3,669 කට ආසන්න මුදලක් අදාළ සාමාජික ගිණුම් වලින් අඩු කොට, අදාළ ණය දෙන ආයතන වලට ප්‍රේෂණය කරන ලදී.

II-11 සංඛ්‍යා සටහන

නිවාස ණය සුරැකුම් පහසුකම

වසර	නිකුත් කළ ශේෂ සහතිකපත්	ශේෂ සහතිකපත්වල වටිනාකම (රුපියල් මිලියන)	පැහැර හරින ලද ණය වෙනුවෙන් සහභාගීවන ණය දෙන ආයතන වෙත කළ ප්‍රේෂණයන් (රුපියල් මිලියන)
2018	10,036	4,974	2,759
2019	10,022	5,097	3,164
2020	8,537	4,497	3,321
2021	9,068	5,423	3,573
2022	9,443	6,127	3,669

මූලය : සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව

(iii) පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය

2012 අංක 02 දරණ සේවක අර්ථසාධක අරමුදල් (සංශෝධිත) පනතට සහ පසුකාලීනව පාර්ලිමේන්තුව මඟින් සම්මත කරන ලද ක්‍රියාපටිපාටීන්ට අනුව, පූර්ව විශ්‍රාමික ප්‍රතිලාභ ගෙවීමේ ක්‍රමය හඳුන්වා දෙන ලදී. ඒ අනුව, නිවාස ඉදිකිරීම් හා වෛද්‍ය ප්‍රතිකාර සඳහා සාමාජික ගිණුම් ශේෂය රු. 300,000 ට වැඩි සහ වසර 10 ක කාලයක් අරමුදල වෙත දායක මුදල් ගෙවමින් පවතින සාමාජිකයන් හට තම ගිණුමේ ඇති ශේෂයෙන් රු. මිලියන 2 ක උපරිමයකට යටත්ව සියයට 30 ක් ආපසු ලබා ගැනීමේ හිමිකම 2015 වසරේ සිට ලබා දී ඇත. මෙම ක්‍රමය සඳහා සාමාජිකයන්ගේ ඉහළ ඉල්ලුමක් පවතී. මෙම ක්‍රමය යටතේ 2022 වසර තුළ දී ප්‍රතිලාභීන් 27,278 ක් වෙත රුපියල් බිලියන 16.4 ක් නිදහස් කර ඇති අතර, 224,335 ක්වූ ප්‍රතිලාභීන් වෙත රුපියල් බිලියන 123.5 ක මුදලක් 2022 අග වනවිට ගෙවන ලදී.

(iv) සේ. අ. අ. විද්‍යුත් දායක මුදල් රැස්කිරීම

සේ.අ.අ. දෙපාර්තමේන්තුව දැනට පවතින විද්‍යුත් එකතු කිරීමේ ක්‍රමය ශක්තිමත් කිරීම සඳහා එහි නිල වෙබ් අඩවිය හරහා යාන්ත්‍රණයක් හඳුන්වා දෙන ලදී. එමගින්, සේවායෝජකයින්ට සේ.අ.අ. නිල වෙබ් අඩවිය හරහා ඔවුන්ගේ විද්‍යුත් දත්ත වාර්තා ඉදිරිපත් කිරීමට සහ 'LankaPay Online Payment Platform (LPOPP)' හරහා නියෝජිත වාණිජ බැංකු සමග මාර්ගගතව ගෙවීමට හෝ චෙක්පතක් මගින් හෝ සෘජු හර ක්‍රමය යටතේ ගෙවීමට හැකියාව ලබා දෙනු ලැබේ. 2022 වර්ෂය අග වන විට ලංකා බැංකුව, මහජන බැංකුව, කොමර්ෂල් බැංකුව, සම්පත් බැංකුව සහ නේෂන්ස් ට්‍රස්ට් බැංකුව, මෙකී පහසුකම සැපයීමට සේ.අ.අ. දෙපාර්තමේන්තුව සමග සම්බන්ධ වූ බලපත්‍රලාභී වාණිජ බැංකු වේ. නව ක්‍රමයේ කැපී පෙනෙන ලක්ෂණයක් වන්නේ නිවැරදි ලෙස දායක මුදල් ගෙවා දිනක් ඇතුළත සාමාජික ගිණුම් යාවත්කාලීන වීමයි. තවද, මේ නව ක්‍රමය යටතේ, සේ.අ.අ. දෙපාර්තමේන්තුවෙහි දත්ත ගබඩාවේ ඇති සාමාජික විස්තරයන්හි නිරවද්‍යතාවය සහතික කිරීමට සේවායෝජකයන්ට පහසුකම් සපයයි.

2022 වසර අවසාන වන විට, ආසන්න වශයෙන් සක්‍රීය සාමාජිකත්වයෙන් සියයට 90 ක ප්‍රමාණයක් නියෝජනය කරමින් විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය සඳහා ලියාපදිංචි වූ සේවායෝජකයින් සංඛ්‍යාව 12,815 දක්වා වැඩිවූ අතර, අදාළ ගෙවීම් මාසික සමස්ත දායක මුදලෙන් සියයට 91 ක පමණ ප්‍රමාණයක් ආවරණය කරනු ලබයි. මීට අමතරව, විද්‍යුත් දත්ත රැස්කිරීමේ ක්‍රමවේදය තුලින් සේවායෝජකයන්ට අත්වන ප්‍රතිලාභ පිළිබඳව සහ සාමාජිකයන්ගේ තොරතුරු වල ඇති විෂමතාවයන් නිවැරදි කිරීම පිළිබඳව සේවායෝජකයින් තවදුරටත් දැනුම්වත් කිරීම සිදු කරන ලදී. මෙමගින් දායක මුදල් ප්‍රමාදයකින් තොරව අදාළ සාමාජික ගිණුම් වෙත බැර කිරීම සහතික කෙරේ.

(v) සේ.අ.අ. සාමාජිකයින් නැවත ලියාපදිංචි කිරීම

ඒකීය සාමාජික හඳුනාගැනීමේ දත්ත පද්ධතියක් පවත්වාගෙන යාමේ වැදගත්කම සැලකිල්ලට ගනිමින් සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් සේ. අ. අ. හි සක්‍රීය සාමාජිකයින් ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත් අංක සහ ජාතික හැඳුනුම්පතෙහි සඳහන් සම්පූර්ණ නම යටතේ නැවත ලියාපදිංචි කිරීමේ ව්‍යාපෘතිය අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමග ඇතිකරගත් අවබෝධතා ගිවිසුම යටතේ එහි දත්ත පද්ධතිය වෙත ප්‍රවේශවීමේ හැකියාව ලබා ගැනීමත් සමග ඉහත සඳහන් කල නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රමවේදය තුළ දී ජාතික හැඳුනුම්පත් දත්තයන්හි නිරවද්‍යතාවය පරීක්ෂා කිරමේ පහසුකම සැලසුණි. තවද, සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී නැවත ලියාපදිංචි කිරීමේ ක්‍රියාවලිය කඩිනම් කිරීමේ අරමුණින් ක්‍රියාමාර්ග කිහිපයක් ගනු ලැබුණි.

2022 වසර තුළ දී සක්‍රීය සාමාජිකයන් 26,959 ක් නැවත ලියාපදිංචි කරන ලද අතර 2022 වසර අවසානය වන විට මුළු සක්‍රීය සාමාජිකයන්ගෙන් 1,682,978 ක ප්‍රමාණයක් නැවත ලියාපදිංචි කර ඇත.

(vi) වෙනත් සේවා

2021 වසරේදී සේ.අ.අ. දෙපාර්තමේන්තුවේ මහජන සම්බන්ධතා සහ විමසීම් අංශය, සමාජ දේශපාලන නොසන්සුන්තාව මධ්‍යයේ වුවද අභියෝගාත්මක වසරක් සනිටුහන් කරන ලදී. කෙසේවෙතත්, සේ.අ.අ. දෙපාර්තමේන්තුව වෙත සාමාජික/සේවායෝජක පැමිණීම් 129,454 ක් වාර්තා වූ අතර, අනුපිළිවෙලින් දුරකථන ඇමතුම් සහ ඊමේල් හරහා පුද්ගලයින් 63,365 දෙනෙකුට සහ සාමාජිකයින් 14,114 දෙනෙකුට ද සේවා සපයා ඇත. තවද, සාමාජිකයින්, සේවා යෝජකයින් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් විසින් දෙපාර්තමේන්තුව වෙත එවන ලද ලිපි 1,630 කට ප්‍රතිචාර දක්වන ලදී.

2022 දී, සේ. අ. අ. දෙපාර්තමේන්තුවේ වාර්තා සංශෝධන අංශය විසින් සේ. අ. අ. සාමාජික ගිණුම්වලට අදාළ සේ. අ. අ. වාර්තා සංශෝධන 89,210 ක් පමණ සිදු කර ඇත. ඒ අනුව, ප්‍රාදේශීය කාර්යාල හරහා ලැබුණු නම/ජාතික හැඳුනුම්පත් සංශෝධන සඳහා ඉල්ලීම් 12,944 ක් ඇතුළුව නම්/ජාතික හැඳුනුම්පත් සංශෝධන 83,537 ක් සහ ගිණුම් සංශෝධන 5,673 ක් 2022 වසරේ දී සේ. අ. අ. දෙපාර්තමේන්තුව විසින් සිදුකරන ලදී.

(ඊ) ක්‍රියාවලි වැඩි දියුණු කිරීම සහ ධාරිතා සංවර්ධනය

ක්‍රියාවලි වැඩිදියුණු කිරීම් සහ ධාරිතා සංවර්ධන අංශය විසින් ගිණුම්කරණය, ආයෝජනය, සාමාජික වගකීම් කළමනාකරණය සහ සේ. අ. අ. දෙපාර්තමේන්තුව සඳහා ඒකාබද්ධ දත්ත ගබඩාවක් සහිත තොරතුරු තාක්ෂණ පද්ධතියක් සැලසුම් කිරීමේ සහ ක්‍රියාවට නැංවීමේ පහසුකම් සැලසීම සඳහා පත් කරන ලද උපදේශක ආයතනය සමග සම්බන්ධීකරණ කටයුතු අඛණ්ඩව සිදුකරන ලදී. ඒ අනුව, සේ. අ. අ. හි ක්‍රියාකාරකම්වලට අදාළව පවතින ව්‍යාපාර

පිළිවෙත් සහ ක්‍රියාවලීන් පිළිබඳ අධ්‍යයනය වසර තුළ සාර්ථකව සිදුකරන ලදී.

ඉහත අධ්‍යයනයෙන් පසුව, සේ. අ. අ. දෙපාර්තමේන්තුවෙහි ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනය (business process review), උපදේශක ආයතනය විසින් සම්පූර්ණ කරන ලදී. තවද, කාර්මික ප්‍රශස්ත භාවිතයන් (industrial best practices) සහ කලාපීය අර්ථසාධක අරමුදල් සඳහා මිණුම් නිර්ණය කිරීම (benchmarking) අවධාරණය කරමින් පරතරය විශ්ලේෂණ (gap analysis) වාර්තාව ද සම්පූර්ණ කර ඇත. ව්‍යාපාර ක්‍රියාවලි සමාලෝචනය සහ පරතරය විශ්ලේෂණය මත පදනම්ව, සේ. අ. අ. දෙපාර්තමේන්තුවෙහි ක්‍රියාවලීන්හි ක්‍රියාකාරී සැලසුම් කෙටුම්පත් කිරීම සිදු කරමින් පවතී.

9. පහසුකම් කළමනාකරණ

පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් නවීන තාක්ෂණික භාවිතාවන් මුසුවූ පහසුකම් සහ අනෙකුත් සැපයුම් සේවාවන් මහ බැංකු කාර්ය මණ්ඩලය වෙත මෙන්ම අනෙකුත් සේවාලාභීන් වෙත ලබාදීම උක්ත කාල පරිච්ඡේදය තුල රටතුල පැවති අහිතකර සමාජීය සහ ආර්ථික තත්ත්වයන් නිසා හටගත් බොහෝ බාධක පරයමින් සිදුකරන ලදී. රට තුල පැතිර පැවති බාධාකාරී ආනයන සීමාවන් අභිමුව පවා වඩා සපලදායී සහ ආරක්ෂාකාරී කාර්යාල වටපිටාවක් සුරක්ෂිත කිරීම සඳහා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව හැකි සෑම උත්සාහයක්ම දරන ලදී.

මහ බැංකු පරිශ්‍රය බාහිර සහ අභ්‍යන්තර පාර්ශවයන්ට වඩාත් ප්‍රියමනාප පරිසරයක් ඇති කරවනු පිණිස, එහි ඇති කල් ඉකුත්වූ මෙවලම් සහ උපාංග ප්‍රතිස්ථාපනය කිරීම තවදුරටත් ක්‍රියාත්මක වූ අතර ජෝන් එක්ස්ටර් ජාත්‍යන්තර සම්මන්ත්‍රණ ශාලාව සතුව පවතින දශක දෙකක් පමණ පැරණි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදන පද්ධතිය නවීකරණය කිරීම මෙම කාල පරිච්ඡේදයේදී සිදුකරනු ලැබීය. මහ බැංකුවේ ප්‍රධාන ගොඩනැගිලි සඳහා සිදුකරනලද තත්ත්ව පරීක්ෂාවේදී හඳුනාගත් යල්පිනු විද්‍යුත් සහ යාන්ත්‍රික පද්ධතීන් ප්‍රතිස්ථාපනය කිරීම පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් පසුගිය වසරතුල සිදුකල අතර ඊට අදාළ අවශේෂ කටයුතු තවදුරටත් සිදුකරමින් පවතී. තවද, මහ බැංකුවෙහි විවිධ දෙපාර්තමේන්තු වල ඉල්ලීම් සැලකිල්ලට ගනිමින් ඒ සඳහා අවශ්‍ය අමතර කාර්යාල ඉඩපහසුකම් කඩිනමින් සපයාදීම මගින් එම දෙපාර්තමේන්තුවල කාර්යයන් පහසුවෙන් ඉටුකිරීමට අවස්ථාව ලබා දෙන ලදී.

පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් ආරම්භ කරනලද බලශක්ති පිරිමැසුම් ක්‍රමවේදයන්ට අනුගත වෙමින් මහ බැංකුවේ ප්‍රධාන ගොඩනැගිලිවල වැඩි විදුලි පරිභෝජනයක් සහිත සම්ප්‍රදායික විදුලි පහන් වෙනුවට නවීන විදුලි පහන් ප්‍රතිස්ථාපනය කල අතර මධ්‍යගත වායු සමීකරණ පද්ධතියේ සිසිල් ජල පරිවහන නළ සඳහා කල් ඉකුත් වූ තාප පරිවාරක ඉවත්කර නව තාප පරිවාරක යෙදීම සිදුකරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකු මුලස්ථානයේ පිහිටි ප්‍රධාන ගොඩනැගිලිවල ව්‍යූහාත්මක කල්පැවැත්ම තහවුරු කිරීම සහ ටෙරස හරහා ජල කාන්දු නැවතීම අරමුණුකරගෙන ජලවාරක යෙදීමට අවශ්‍ය ප්‍රසම්පාදන කටයුතු දියත් කරන ලදී.

උක්ත කාල පරාසයතුල දී මාතලේ ප්‍රාදේශීය කාර්යාලය සහ කොළඹ 01, සර් බාරොන් ජයතිලක මාවතේ පිහිටි වයිට්එවෙස් ගොඩනැගිල්ල සඳහා නවීන අභ්‍යන්තර ස්වයංක්‍රීය දුරකථන හුවමාරු පද්ධතියක් ස්ථාපනය කිරීමට කටයුතු කරන ලද්දේ එම පරිශ්‍ර සඳහා අදාල සේවාවන් සැපයීමේදී එවන් පද්ධතියක අවශ්‍යතාවය සැලකිල්ලට ගනිමිනි.

කොළඹ 01, සර් බාරොන් ජයතිලක මාවතෙහි පිහිටි ලොයිඩ් ගොඩනැගිල්ලෙහි අයිතිය අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ලේකම් වෙත පැවරීමත් සමග ඇතිවූ තත්වය මත එම ගොඩනැගිල්ලෙහි ස්ථාපිතව තිබූ සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව, වයිට්එවෙස් ගොඩනැගිල්ලේ ණය තොරතුරු කාර්යාංශය පිහිටුවා තිබූ බිම් මහල තුල ස්ථාපිත කිරීමට අවශ්‍ය කඩිනම් කටයුතු සම්පාදනය කරන ලදී. තවද, එම ගොඩනැගිල්ලේ දෙවන මහල තුල සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව ස්ථාපිත කරමින් මෙම කටයුත්ත සම්පූර්ණ කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් මේ වනවිට සම්පූර්ණ කරමින් පවතී.

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය සමග එක්ව මහ බැංකු කාර්ය මණ්ඩලයට සේවයට වාර්තා කිරීමට හා නැවත නිවෙස් වලට යාම සඳහා කාර්යාල ප්‍රවාහන පහසුකම් සැපයීමට කටයුතු කරන ලද අතර මෙම විධිවිධානයන් පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කටයුතු අබාණ්ඩව පවත්වාගෙන යාම සඳහා උක්ත කාලසීමාව තුල ගන්නා ලද වඩාත්ම සාධනීය ක්‍රියාමාර්ගයකි.

තවද, ප්‍රාදේශීය කාර්යාල සඳහා රියදුරන් සමග රථ වාහන බාහිර සේවාලාභීන්ගෙන් ලබා දීම තවදුරටත් සිදුකල අතර අවශ්‍ය නඩත්තු කටයුතු සහ සේවා කිරීම් සමග දැනට මහ බැංකුව සතු වාහන සංචිතය තවදුරටත් ශක්තිමත් කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී. ඉන්ධන සපයාගැනීම ඉතා අසීරු පසුගිය වකවානුවේ දී පවා පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් සපයන ප්‍රවාහන පහසුකම් නොනවත්වා ක්‍රියාත්මක කිරීම සිදුවිය.

මහ බැංකුවේ ප්‍රධාන කාර්යාලය ඉදිරිපිට ඇති ආරක්ෂක වැට විශේෂිත ආලේපයක් සමග පින්තාරු කිරීම මගින් එය අලංකරණය කිරීමටත් වැටෙහි ආයුකාලය වර්ධනය සඳහා ඉදිරි පියවර ගැනීමටත් පියවර ගැනුනි.

දෙපාර්තමේන්තුව සතු මූලික වගකීමක් ලෙස සලකා අනෙකුත් නඩත්තු කටයුතු, සන්නිවේදන සේවා ඇතුළුව අවශේෂ සේවාවන් සැපයීම පහසුකම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් තවදුරටත් පවත්වාගෙන යන ලදී.

10. මූල්‍ය කටයුතු

ජාත්‍යන්තර ගිණුම්කරණ ප්‍රමිතීන්, ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් සහ 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ අදාළ විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය වාර්තාකරණ කාර්යය මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ. 2002 වර්ෂයේ සිට මෙම මූල්‍ය වාර්තා පිළියෙල කිරීම සඳහා ජාත්‍යන්තර මූල්‍ය වාර්තාකරණ රාමුව අදාල කර ගන්නා ලදී. මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ කාර්යයන්ට ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල

කිරීම, මහ බැංකුවේ වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම හා නිරීක්ෂණය කිරීම, මහ බැංකුවේ අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සඳහා ගෙවීම් සිදු කිරීම, දායක අරමුදල් මුදාහැරීම සහ රාජ්‍ය විදේශීය ණය ආපසු ගෙවීම, මූල්‍ය ගනුදෙනු අභ්‍යන්තර වාර්තාකරණය සඳහා පද්ධති පවත්වාගෙන යෑම, අභ්‍යන්තර අරමුදල් 16 හි ආයෝජන කළඹ කළමනාකරණය කිරීම, ශ්‍රී ලංකා මහ බැංකුවේ ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම සහ සේවක ණය දත්ත සංචිතය පවත්වාගෙන යෑම ඇතුළත් වේ.

10.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙළ කිරීම

(අ) **මාසික ශේෂ පත්‍රය** : 1949 අංක 58 දරණ මුදල් නීති පනතේ විධි විධාන ප්‍රකාරව, 2021 වසරේ දෙසැම්බර් මාසය හා 2022 වසරේ ජනවාරි මස සිට නොවැම්බර් මස දක්වා වූ මාසික ශේෂ පත්‍රයන් රජයේ ගැසට් පත්‍රයෙහි පළ කිරීම උදෙසා පිළියෙල කරන ලදී.

(ආ) **කාර්තුමය වාර්තා** : ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මූල්‍ය ප්‍රගතිය සහ මූල්‍ය තත්ත්වය කාර්තුමය වශයෙන් මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීම සිදු කරන ලදී.

(ඇ) **වාර්ෂික මූල්‍ය ප්‍රකාශන** : මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම උදෙසා අවශ්‍ය වන අදාළ ගිණුම්කරණ ප්‍රමිතීන් හා අවශ්‍යතාවයන් මත අනුකූලවීම සඳහා 2022 දෙසැම්බර් 31 දිනට ගිණුම්කරණ පද්ධතීන් හා කාර්ය පටිපාටිය යාවත්කාලීන කර ඇත. 2022 වර්ෂයේ දෙසැම්බර් 31න් අවසන් වර්ෂය සඳහා වූ මහ බැංකුවේ විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශන වාර්ෂික වාර්තාවේ II වන කොටස ආරම්භයේදී ඉදිරිපත් කර ඇත.

10.2 වාර්ෂික අයවැය ලේඛනය පිළියෙල කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 වසර සඳහා වූ වාර්ෂික ආදායම් හා වියදම් අයවැය හා ප්‍රාග්ධන අයවැය බැංකුවේ සියලුම දෙපාර්තමේන්තුවල උපායමාර්ගික සැලසුම් යටතේ ඇති කාර්ය සැලසුම්වලට අනුකූලව "පරිසණකගත අයවැය සැකසුම් පද්ධතියක්" මඟින් පිළියෙළ කරන ලදී. 2023 වාර්ෂික අයවැය සඳහා මුදල් මණ්ඩලයේ අනුමැතිය 2022 දෙසැම්බර් මස ලබා ගන්නා ලද අතර, එය 2023 වසරේ වැඩ කරන මුල් දින සිටම සියලුම දෙපාර්තමේන්තුවලට ලබාදෙන ලදී. 2022 වසර සඳහා වූ අයවැයෙහි ප්‍රගතිය දැක්වෙන කාර්තුමය වාර්තා, ඵලදායී අයවැය පාලනය සඳහා මුදල් මණ්ඩලය වෙත යොමු කරන ලදී.

10.3 අභ්‍යන්තර හා බාහිර පාර්ශවයන් සඳහා ගෙවීම් සිදු කිරීම

(අ) 2022 වසර තුළදී නියමිත කාලසීමාවන් ඇතුළත සියලු අභ්‍යන්තර ගෙවීම් එනම් සේවක වේතන, සේවක ණය හා මෙහෙයුම් වියදම් යනාදිය සිදු කරන ලදී.

(ආ) මහ බැංකුවේ ස්ථාවර නියෝග යටතේ ඇති ක්‍රියාපටිපාටීන්ට යටත්ව දේශීය හා විදේශීය සැපයුම්කරුවන්ට ගෙවිය යුතු සියලුම බාහිර ගෙවීම් සිදු කර ඇත. 2022 වර්ෂය ඇතුළත මුළු ගෙවීම් 6,876 ක් සිදු කරන ලද අතර, ඉන් 6,746 ක් දේශීය සැපයුම්කරුවන් සඳහාත් 130 ක් විදේශීය සැපයුම්කරුවන් සඳහාත් විය.

(ඇ) ආසන්න වශයෙන්, 2022 වසර තුළදී මහා භාණ්ඩාගාරයට සහ අදාළ ව්‍යාපෘතීන් සඳහා රු. බිලියන 665.41 ක වටිනාකමකින් යුත් ණය අරමුදල් නිදහස් කිරීම් 2,631 ක් සහ රු. බිලියන 751.02 ක වටිනාකමකින් යුත් විදේශීය ණය වාරික ආපසු ගෙවීම් 280 ක් සිදු කර ඇත. මීට අමතරව විදේශීය ණය සම්බන්ධයෙන් විදේශීය බැංකු දෙකක් සමග බැංකු එකඟතා ගිවිසුම් තුනක් 2022 වසර තුළදී අත්සන් කරන ලදි.

10.4 අභ්‍යන්තර අරමුදල් කළමනාකරණය

(අ) මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව යටතේ ස්ථාපිත මධ්‍යගත ආයෝජන ඒකකය මඟින් බැංකුවෙහි කාර්ය මණ්ඩලයේ සහ විශ්‍රාමිකයන්ගේ විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 8ක් සහ වෙනත් අරමුදල් 4ක්, නිරාකරණය හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන ශ්‍රී ලංකා තැන්පතු සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල සහ කාර්ය මණ්ඩල කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් පාලනය කරන අරමුදල් 3 ක් ඇතුළු අභ්‍යන්තර අරමුදල් 16 ක් කළමණාකරණය කරන ලදී.

මෙම සියලු අරමුදල් පොදු ආයෝජන ප්‍රතිපත්තියක් යටතේ මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් ආයෝජනය කෙරෙන අතර, අදාළ අරමුදල් හිමිකාර දෙපාර්තමේන්තු ඒවායේ පරිපාලක ලෙස කටයුතු කරයි. මෙම අරමුදල් කළමණාකරන ක්‍රියාවලිය මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශනය/ක්‍රියාපටිපාටීන් සහ ක්‍රමෝපායිකව වත්කම් ආයෝජනයන් සඳහා වෙන්කිරීම් වෙනුවෙන් වූ ක්‍රියාපටිපාටීන් මඟින් පාලනය වේ. තවද, මෙම ක්‍රියාවලිය ස්වාධීනව කටයුතු කරන ඉදිරි කාර්යාලය හා පසු කාර්යාලයකින් සමන්විත වන අතර මූල්‍ය අංශය නියාමනය හා අධීක්ෂණ කටයුතු භාර නියෝජ්‍ය අධිපතිවරයාගේ ප්‍රධානත්වයෙන් යුත් අභ්‍යන්තර ආයෝජන පිළිබඳ අධීක්ෂණ කමිටුව මඟින් මෙම ආයෝජන කාර්යයන් අධීක්ෂණය කෙරේ. අරමුදල් ආයෝජන උපදෙස් දීම සහ නිරීක්ෂණය කිරීම සඳහා වන මෙම කමිටුව 2022 වසර තුළ 12 වතාවක් රැස් විය. මෙම අභ්‍යන්තර අරමුදල් ආයෝජනයන්හි කාර්ය සාධන වාර්තා මාසික වශයෙන් මුදල් මණ්ඩලය වෙත වාර්තා කර ඇත.

(ආ) මෙම අරමුදල් ප්‍රධාන වශයෙන් රජයේ සුරැකුම්පත්වල, ස්ථාවර තැන්පතුවල, ඉහළ ශ්‍රේණිගත සංස්ථාපිත ණයකර වල හා කෙටිකාලීන ප්‍රතිවිකුණුම්වල ආයෝජනය කෙරේ. විශ්‍රාම ප්‍රතිලාභ අරමුදල් 6 ක 2021 වසර සඳහා වූ විගණනය කරන ලද මූල්‍ය වාර්තා එම අරමුදල්වල නීති රීති වලට අනුව මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කර ඇත. 2022 වසර අග වන විට මෙම මුළු අරමුදල රු. බිලියන 173.98 දක්වා වර්ධනය විය.

II- 12 සංඛ්‍යා සටහන

ආයෝජන කළඹ තත්ත්වය - (රු. බිලියන)

දෙපාර්තමේන්තුව	2022 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය)	2021 දෙසැම්බර් 31 දිනට ආයෝජන කළඹෙහි වටිනාකම (ආයෝජිත අගය)
මූල්‍ය	84.52	75.27
නිරාකරණ සහ බලගැන්වීම්	89.39	70.98
ප්‍රාදේශීය සංවර්ධන	-	5.38
කාර්ය මණ්ඩල කළමනාකරණ සේවා	0.07	0.06
එකතුව	173.98	151.69

10.5 ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව විසින් පොදු ලෙජරයේ ස්ථාවර වත්කම් මොඩියුලය යටතේ වන ස්ථාවර වත්කම් ලේඛනය තුළ මහ බැංකුවේ සියලුම ස්ථාවර වත්කම් පිළිබඳ වාර්තාවන් පවත්වාගෙන යනු ලබයි. මෙයට සම්බන්ධ සියලුම වෙනස්කම් එනම් නව මිලදී ගැනීම්, ස්ථානගත කිරීම්වල සිදු වූ වෙනස්කම්, ක්ෂයවීම් සහ ඉවත් කිරීම් 2022 වසර තුළ දී මෙම ලේඛනයේ වාර්තා කර ඇත. ඒ අනුව, අයිතමයන් අත්පත් කර ගැනීම් 554 ක් සහ බැහැර කිරීම් 232 ක් සමගින් 2022 වසර තුළදී මෙම ලේඛනය යාවත්කාලීන කරන ලදී.

10.6 කාර්යමණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය පවත්වාගෙන යෑම

මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව, තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහාය ඇතිව මහ බැංකු කාර්ය මණ්ඩල ණය පිළිබඳ දත්ත සංචිතය අඛණ්ඩ ලෙස යාවත්කාලීනව පවත්වාගෙන යන අතර, එමගින් ණය අයකර ගැනීම් වාර්තා කිරීමේ ක්‍රියාවලිය සඳහා සහ සේවකයන්ට සහ කළමණාකරණය වෙත ණය තොරතුරු සැපයීමේ කටයුතු සඳහා 2022 වසර තුළ දී පහසුකම් සපයන ලදී. ඒ අනුව, 2022 වසර තුළ දී රු. බිලියන 2.20 ක වටිනාකමකින් යුත් 1,631 ක ණය සංඛ්‍යාවක් සේවකයන් සඳහා පිරිනමා ඇත.

10.7 අනෙකුත් කාර්යයන් - මිලදී ගැනීමේ ක්‍රියාවලිය

ශ්‍රී ලංකා මහ බැංකුවේ නීති රීති වලට අනුව, මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුව බැංකුවෙහි භාණ්ඩ හා සේවා ලබා ගැනීම සඳහා වන සියලුම තාක්ෂණික ඇගයීම් කමිටු, ටෙන්ඩර් මණ්ඩල සහ ස්ථාවර වත්කම් බැහැර කිරීම් සඳහා වන සමීක්ෂණ මණ්ඩල නියෝජනය කරයි. ඒ අනුව, 2022 වසර තුළ දී මූල්‍ය කටයුතු දෙපාර්තමේන්තුවේ නිලධාරීන් එවැනි මිලදී ගැනීම් හා සම්බන්ධ ටෙන්ඩර් මණ්ඩල 81 ක් සහ තාක්ෂණික ඇගයීම් කමිටු 56 ක් නියෝජනය කර ඇත.

II. මූල්‍ය පාරිභෝගික සබඳතා

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවල මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින් 2020 අගෝස්තු මස මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලද අතර එමගින් මූල්‍ය පාරිභෝගිකයන්ගේ අයිතීන් හා සබැඳියාවන් මෙන්ම ඔවුන් වෙත සලසනු ලබන මූල්‍ය සේවාවන්වල සාධාරණ බව සහ විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම අපේක්ෂා කරයි.

ශ්‍රී ලංකා මහ බැංකුව මගින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවල පාරිභෝගිකයන් හට එම ආයතනවල සේවා සැපයීම හෝ ව්‍යාපාර ක්‍රියාපිළිවෙත් පිළිබඳව පැමිණිලි සහ දුක්ගැනවිලි මහ බැංකුව වෙත ඉදිරිපත් කිරීමේදී සම්බන්ධ වන තනි ඒකකය වශයෙන් මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව 2022 වසරේදී ක්‍රියාකරන ලදී. දෙපාර්තමේන්තුව මසකට පැමිණිලි 430 කට ආසන්න සාමාන්‍යයකින් යුතුව 2022 වසර තුලදී මුළු පැමිණිලි සහ දුක්ගැනවිලි 5,149 ක් සම්බන්ධයෙන් කටයුතු කර ඇත. මෙම පැමිණිලි හා දුක්ගැනවිලි බොහොමයක් මූල්‍ය ආයතන මඟින් ලබා ගත් මූල්‍ය පහසුකම් සඳහා සහන ඉල්ලීම්, ඉහළ පොළී අනුපාතිකයන් අය කිරීම, ණය සහන පිළිබඳ ගැටලු, මූල්‍ය ආයතන විසින් තොරතුරු/ලියකියවිලි ලබා නොදීම, ඉහළ ගාස්තු හා කොමිස් අයකිරීම් යන කරුණු සම්බන්ධයෙන් විය. ලැබෙන මූල්‍ය පාරිභෝගික පැමිණිලි සම්බන්ධයෙන් කටයුතු කර ප්‍රතිචාර දැක්වීම සඳහා මූල්‍ය ආයතන වෙත යම් කාලයක් ලබාදෙන අතර 2022 වසර තුලදී ලැබුණු පැමිණිලි අතරින් 75% ක් පමණ පැමිණිලි ලැබී මාස 02ක් ඇතුලතදී මූල්‍ය ආයතනයේ ප්‍රතිචාර ලබාගෙන පැමිණිල්ලට අදාල කටයුතු නිම කිරීමට/ නිරාකරණයන් ලබා දීමට දෙපාර්තමේන්තුව විසින් කටයුතු කර ඇත.

මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව විසින් එහි තවත් එක් කාර්යයක් වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ සබඳතා මධ්‍යස්ථානය (Contact Centre) අධීක්ෂණය කරනු ලබයි. 2022 වසර තුලදී සබඳතා මධ්‍යස්ථානය විසින් දුරකථන විමසීම් සහ වාචික පැමිණිලි 60,000 කට වඩා වැඩි ප්‍රමාණයක් සඳහා පිළිතුරු ලබා දී ඇත. මීට අමතරව පාරිභෝගිකයින් දැනුවත් කිරීමේ වැඩසටහන් මාලාවේ පියවරක් ලෙස මූල්‍ය පාරිභෝගිකයින් මුහුණ දෙන ගැටළු නිරාකරණය කර ගැනීමට ගත හැකි විවිධ ක්‍රියාමාර්ග සහ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ/ ශ්‍රී ලංකා මහ බැංකුවේ සහාය ලබා ගැනීමට අනුගමනය කළ යුතු පියවර පැහැදිලි කරමින් අන්තර්ජාල පෝස්ටරයක් (web poster) ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රදර්ශනය කරන ලදී. ඊට අමතරව, මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධයෙන් වඩා වැඩි පිරිසකට දැනුවත්භාවය ලබා දීම සඳහා දෙපාර්තමේන්තුව විසින් ජාතික සහ ප්‍රාදේශීය මට්ටමේ සම්මන්ත්‍රණ හා වැඩසටහන් කීපයක් පවත්වන ලදී. මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාවෙහි (International Finance Corporation) සහයෝගය ඇතිව මූල්‍ය පාරිභෝගික ආරක්ෂණය සම්බන්ධ මාධ්‍ය ප්‍රචාරක වැඩසටහනක් ව්‍යාප්තීමය ප්‍රචාරණ ආයතනයක් මඟින් නිර්මාණය කරමින් පවතින අතර එය 2023 මුල භාගයේදී දියත් කිරීමට නියමිත වේ.

තවද, මූල්‍ය ආයතන තම ව්‍යාපාර පවත්වාගෙන යාමේදී සහ සේවා සැපයීමේදී පාරිභෝගික ආරක්ෂණය ශක්තිමත් කිරීම උදෙසා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතනවලට අදාලව ඒකාබද්ධ මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුවක් හඳුන්වාදෙමින් නව පුළුල් රෙගුලාසි සමුදායක් සකස් කරන ලදී. මෙම රෙගුලාසි මඟින් වෙළෙඳපොළ හැසිරීම අධීක්ෂණය කිරීම සඳහා අධීක්ෂකයින් හට අවශ්‍ය විශේෂ නියාමන බලතල ලබා දීම සිදු කරනු ලබන අතර පසුකාලීනව මූල්‍ය පාරිභෝගිකයන් හට පැමිණිලි ඉදිරිපත් කිරීමට සිදුවන අවස්ථා අවම කිරීමේ අරමුණින් මූල්‍ය සේවා සැපයීමේදී සහ ලබා ගැනීමේදී සේවා සපයන්නන් සහ සේවා ලබා ගන්නන් සැලකිලිමත් විය යුතු කාරණා සම්බන්ධව පැහැදිලි කිරීම් ලබා දීම සිදු කරනු ලබයි. පාර්ශ්වකරුවන්ගේ උපදේශනය සඳහා, මෙම කෙටුම්පත් කරන ලද රෙගුලාසි මූල්‍ය අංශය සහ මහජනතාව වෙත ලබා දීමට කටයුතු කර ඇති අතර, අවසන් රෙගුලාසි 2023 මැද භාගයේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

12. මූල්‍ය බුද්ධි ඒකකය

රට තුළ මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සඳහා පහසුකම් සැලසීම අරමුණු කොටගෙන ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය 2006 වසරේ මාර්තු මාසයේ දී පිහිටුවන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකාවේ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ නීති රාමුව යටතට ගැනෙන 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත, 2006 අංක 5 දරන මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ පනත සහ 2005 අංක 25 දරන ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩ පැවැත්වීමේ සම්මුති පනත යන ප්‍රධාන නීති ත්‍රිත්වය පාදක කරගෙන, කාර්යක්ෂම වූ මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ක්‍රමවත් වැඩපිළිවෙලක් ස්ථාපනය කිරීම සඳහා පහසුකම් සැලසීම සහ ඒ සම්බන්ධ කටයුතු සම්බන්ධීකරණය කිරීම මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන වගකීම වේ.

12.1 මූල්‍ය බුද්ධි තොරතුරු ලබා ගැනීම, විශ්ලේෂණය කිරීම සහ බෙදා හැරීම

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15 වැනි වගන්තියට අනුව මූල්‍ය බුද්ධි ඒකකයේ ප්‍රධාන කාර්යභාරය වන සැක කටයුතු මූල්‍ය ගනුදෙනු වාර්තා ලබා ගැනීම, එම වාර්තා විශ්ලේෂණය කිරීම සහ විශ්ලේෂිත තොරතුරු අදාල නීතිය බලාත්මක කිරීමේ හෝ නියාමන ආයතන වෙත යොමු කිරීම 2022 වසරේදී ද සිදුකරන ලදී. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකු, බලපත්‍රලාභී මූල්‍ය සමාගම්, රක්ෂණ සමාගම්, කොටස් තැරැව්කාර සමාගම් සහ මුදල් හෝ වටිනාකම් හුවමාරු සේවා සපයන්නන් විසින් සිය ගනුදෙනුකරුවන් සමග සිදුකළ දේශීය සහ විදේශීය වශයෙන්, රුපියල් මිලියනයකට වැඩි හෝ යම් විදේශ ව්‍යවහාර මුදලකින් ඊට සමාන වන වටිනාකමක් ඉක්මවන මුදල් ගනුදෙනු වාර්තා සහ විද්‍යුත් අරමුදල් ප්‍රේෂණ වාර්තා අඛණ්ඩව මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී. 2022 වර්ෂය තුළ දී, ඉහත සඳහන් වාර්තාකරණ ආයතන විසින් 'LankaFin' වාර්තාකරණ පද්ධතිය මෙන්ම අලුතින් හඳුන්වා දුන් 'goAML' වාර්තාකරණ පද්ධතිය හරහා මුදල් ගනුදෙනු වාර්තා මිලියන 7.6 ක් සහ විද්‍යුත් අරමුදල් ප්‍රේෂණ ගනුදෙනු (දේශීය හා විදේශීය) මිලියන 10.8 ක් මූල්‍ය බුද්ධි ඒකකය වෙත වාර්තා කරන ලදී. 2023 ජනවාරි 01 වන දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා නියමිත සියලුම ගනුදෙනු වාර්තා කිරීම් 'LankaFin' පද්ධතිය හරහා වාර්තා කිරීම අත්හිටුවන ලදී.

තවද, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 7 වැනි වගන්තිය ප්‍රකාරව වාර්තාකරණ ආයතන විසින් සැක කටයුතු ගනුදෙනු වාර්තා 1,481 ක් මූල්‍ය බුද්ධි ඒකකය වෙත යොමු කරන ලදී. එලෙස ඉදිරිපත් කරන ලද සැක කටයුතු ගනුදෙනු වාර්තා විශ්ලේෂණය කිරීමෙන් අනතුරුව, ඒ අතරින් වාර්තා 419 ක් වැඩිදුර විමර්ශනය සඳහා නීතිය බලාත්මක කිරීමේ ආයතන සහ නියාමන අධිකාරීන් වෙත යොමු කරන ලදී. විශ්ලේෂිත වාර්තා අතරින් වාර්තා 605 ක් අඛණ්ඩ පරීක්ෂාව යටතේ තබා ඇති අතර, වැඩිදුර අධ්‍යයනය සහ විශ්ලේෂණය සඳහා වාර්තා 453 ක් තබා ඇත. ඉතිරි සැක කටයුතු ගනුදෙනු වාර්තා වැඩිදුර ක්‍රියාමාර්ග අවශ්‍ය නොවන කාණ්ඩය යටතේ වර්ගීකරණය කරන ලදී.

12.2 නීතිමය රාමුව සහ ආයතනික රාමුව

මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව රට තුළ එකී නීතිමය රාමුවෙහි සඵලතාව වැඩිදියුණු කිරීමේ අරමුණින්, 2023 වර්ෂය තුල දී එම නීතිමය රාමුව සඳහා අවශ්‍ය සංශෝධන ගෙන ඒමට මූල්‍ය බුද්ධි ඒකකය විසින් විවිධ ක්‍රියාමාර්ග ගන්නා ලදී. මෙම සංශෝධන 2023 වසර තුළදී අවසන් කිරීමට අපේක්ෂා කෙරේ.

2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනතේ 15(2) වැනි වගන්තිය ප්‍රකාරව පැවරී ඇති බලතල අනුව, 2022 වර්ෂය තුළ දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් විශුද්ධිකරණය හෝ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ පැවති සැකයන් මත පදනම්ව අවස්ථා 14 කට අදාල, පුද්ගලයන් 38 දෙනෙකුට සහ ආයතන 5කට අයත් ගිණුම් 136 ක ගනුදෙනු අත්හිටුවීමට පියවර ගන්නා ලදී. ඒ අනුව, රුපියල් මිලියන 96 ක බැංකු ගිණුම් ශේෂයන් වසර තුළ දී අත්හිටුවන ලදී. මීට අමතරව, නීතිය බලාත්මක කිරීමේ ආයතන විසින් විමර්ශන සඳහා තවදුරටත් කල් ඉල්ලා සිටි බැවින්, පසුගිය වසරවල නඩු 78කට අදාලව අත්හිටවූ බැංකු ගිණුම් 1,000 ක පමණ ගිණුම් ශේෂයන් 2022 වසර තුළ දී මාස දෙකක කාල පරාසයක් සහිතව අත්හිටුවීම් දීර්ඝ කිරීමට අඛණ්ඩව කටයුතු කරන ලදී. වාර්තාකරණ ආයතනයන් හි මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අනුකූලතාව ශක්තිමත් කිරීම සඳහා, මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2022 වසර තුළ දී චක්‍රලේඛ 4 ක් නිකුත් කරන ලද අතර ඒවා වාර්ෂික වාර්තාවේ III කොටසෙහි අන්තර්ගත වේ.

තවද, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ඵලදායී අධීක්ෂණයන් හා බලාත්මක කිරීම්, එතැන්, විතැන් සහ ස්ථානීය නිරීක්ෂණයන්, සහ අනුකූලතා සමාලෝචන රැස්වීම් ආදිය මගින් මූල්‍ය ආයතනයන්හි සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්හි අනුකූලතාව වැඩිදියුණු කිරීමට අඛණ්ඩ පියවර ගෙන ඇත. ඒ අනුව, 2022 වර්ෂයේ දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් මූල්‍ය ආයතනයන් සඳහා අවදානම් මත පදනම් වූ ඒකාබද්ධ එතැන් පරීක්ෂණ 22 ක්, එතැන් පරීක්ෂණ 3 ක් සහ ස්ථානීය පරීක්ෂණ 22 ක් පවත්වන ලදී. මීට අමතරව, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සඳහා අවදානම් මත පදනම් වූ එතැන් පරීක්ෂණ 17 ක් පවත්වන ලදී. ඉහත පරීක්ෂණයන්ට අමතරව, මූල්‍ය ආයතන සහ නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සඳහා තේමාත්මක සමාලෝචන 5 ක් ද පවත්වන ලදී.

2022 දී සිදු කරන ලද එතැන් පරීක්ෂණ මත පදනම්ව, 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත සහ 2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීතීන් උල්ලංඝනය කිරීම සම්බන්ධයෙන් බලපතලාභී බැංකු 6 කට රුපියල් මිලියන 11.75 ක මූල්‍යමය දණ්ඩන පනවන ලදී. එසේම, එකී පනත, රීතීන් සහ එකී පනත යටතේ පනවන ලද රෙගුලාසිවලට අනුකූල නොවීම් සම්බන්ධයෙන් මූල්‍ය ආයතන වෙත හේතු පැහැදිලි කිරීමේ අවශ්‍යතාව දන්වන ලිපි 8 ක් සහ අනතුරු ඇඟවීමේ ලිපි 9 ක් වසර තුළ දී නිකුත් කරන ලදී. තවද, 2022 වර්ෂය තුළ දී ස්ථානීය පරීක්ෂණ මගින් හඳුනාගත් අඩුපාඩු පිළිබඳව නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් 17කට දැනුම් දීමට මූල්‍ය බුද්ධි ඒකකය විසින් පියවර ගන්නා ලදී. එමෙන්ම, මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධව අනුකූලතාව දක්වන මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන් සංඛ්‍යාව ඉහළ නැංවීම සඳහා මූල්‍ය බුද්ධි ඒකකය විසින් අඛණ්ඩව කටයුතු කිරීමෙන් එම ආයතන වල මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ අධීක්ෂණය තවදුරටත් ශක්තිමත් කරන ලදී.

12.3 මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම සම්බන්ධයෙන් දේශීය සම්බන්ධීකරණය සහ ජාත්‍යන්තර සහයෝගීතාව ශක්තිමත් කිරීම

දේශීය හෝ විදේශීය රාජ්‍යයක යම් ආයතනයක් හෝ නියෝජිතායතනයක් සමග තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා අවබෝධතා ගිවිසුම් වෙත එළැඹීමට 2006 අංක 6 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීමේ පනත ප්‍රකාරව මූල්‍ය බුද්ධි ඒකකය වෙත බලය ලබා දී ඇත. 2022 වර්ෂය තුළ දී, මූල්‍ය බුද්ධි ඒකකය විසින් ලෙසතෝ රාජ්‍යයේ මූල්‍ය බුද්ධි ඒකකය, නැගෙනහිර ටිමෝර රාජ්‍යයේ මූල්‍ය බුද්ධි ඒකකය සහ උගන්ඩා මූල්‍ය බුද්ධි ඒකකය සමග එවැනි අවබෝධතා ගිවිසුම් අත්සන් කිරීම සඳහා අවශ්‍ය මූලික කටයුතු සිදු කරන ලදී.

මූල්‍ය කාර්ය සාධන බලකායේ කලාපීය අධීක්ෂණ ආයතනය වන මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ වාර්ෂික සැසිය 2022 ජූලි මාසයේ දී දෙමුහුන් සැසියක් ලෙස පැවැත්වූ අතර ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකයෙහි නිලධාරීහු මෙම සැසිවාරයේ රැස්වීම් සඳහා මාර්ගගතව සහභාගී වූහ. තවද, සාමාජිකයින්ගේ අන්‍යෝන්‍ය ඇගයීම් වාර්තා සහ පසු විපරම් වාර්තා සාකච්ඡා කිරීම සඳහා වසර තුළ දී පවත්වන ලද මාර්ගගත අන්‍යෝන්‍ය ඇගයීම් කමිටු රැස්වීම් කිහිපයකට ද මූල්‍ය බුද්ධි ඒකකයෙහි නිලධාරීහු සහභාගී වූහ. ශ්‍රී ලංකාව පිළිබඳ නිකුත් කරන ලද 7 වන පසු විපරම් වාර්තාව 2022 ජූලි මාසයේ දී පැවති මාර්ගගත අන්‍යෝන්‍ය ඇගයීම් කමිටු රැස්වීමේ දී අනුමත කරන ලද අතර, එහිදී ශ්‍රී ලංකාව කිසිදු ජාත්‍යන්තර නිර්දේශයක් සඳහා සිය දැනට පවතින අනුකූලතා තත්ත්වය ඉහළ නැංවීමේ ඉල්ලීම් ඉදිරිපත් නොකරන ලදී. ඒ අනුව, 2022 අවසානය වන විට, මූල්‍ය කාර්ය සාධන බලකායේ නිර්දේශ 40 සඳහා ශ්‍රී ලංකාවේ අනුකූලතා මට්ටම, නිර්දේශ 7 ක් අනුකූල ලෙස ද, නිර්දේශ 25 ක් විශාල වශයෙන් අනුකූල ලෙස ද, නිර්දේශ 7 ක් පාර්ශ්වීයව අනුකූල ලෙස ද, එක් නිර්දේශයක් අනුකූල නොවන ලෙස ද පවතී. මුදල් විශුද්ධිකරණය පිළිබඳ ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ වාර්ෂික සැසියේ දී, වසරක කාලයක් සඳහා ආසියා ශාන්තිකර කලාපීය කණ්ඩායමේ පාලන කමිටුවේ දකුණු ආසියානු උප කලාපීය නියෝජිතයා ලෙස ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය තේරී පත් විය.

ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය, ගෝලීය මූල්‍ය බුද්ධි ඒකක 166 ක සාමාජිකත්වයෙන් සැදි Egmont කණ්ඩායමේ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා පවතින ආරක්ෂිත ජාලය වන Egmont Secure Web හරහා සිය විමර්ශන සිදු කිරීමට අවශ්‍ය බුද්ධි තොරතුරු ලබා ගැනීමටත් අනෙකුත් රටවලට දක්වන සහයෝගයක් ලෙස ඔවුන්ගේ විමර්ශනයන් කරගෙන යාම සඳහා අවශ්‍ය තොරතුරු ලබා දීමටත් කටයුතු කරයි. ඒ අනුව, 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් අනෙකුත් සාමාජික මූල්‍ය බුද්ධි ඒකක විසින් තමන් වෙත කරන ලද තොරතුරු ඉල්ලීම් 27කට තොරතුරු සපයා දීම මගින් ප්‍රතිචාර දක්වා ඇති අතර, ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය දැනට සිදු කරගෙන යන විමර්ශනවලට අදාළ තොරතුරු හුවමාරු කර ගැනීම සඳහා සාමාජික මූල්‍ය බුද්ධි ඒකක වෙත තොරතුරු ඉල්ලීම් 35ක් ඉදිරිපත් කර ඇත. 2022 වසරේ Egmont කණ්ඩායමේ වාර්ෂික සැසිය පුද්ගල සහභාගිත්වයෙන් පැවැත්වුණු අතර නොවැළැක්විය හැකි හේතූන් මත මූල්‍ය බුද්ධි ඒකකයෙහි නිලධාරීන්ට මෙම සැසිය සඳහා සහභාගී වීමට නොහැකි විය.

12.4 මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම පිළිබඳ ජාතික අවදානම් තක්සේරුව

මූල්‍ය කාර්ය සාධන බලකායේ නිර්දේශයන්හි පළමු නිර්දේශයට අනුකූලව, ලෝක බැංකුවේ තාක්ෂණික සහාය ඇතිව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදය මුදල් සැපයීම පිළිබඳ ජාතික අවදානම් තක්සේරුව අඛණ්ඩව කරගෙන යන ලදී. ජාතික අවදානම් තක්සේරුවෙහි ප්‍රතිඵල

2023 වර්ෂයේ පළමු භාගයේ දී ප්‍රකාශයට පත් කිරීමට ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය අපේක්ෂා කරන අතර, එම ප්‍රතිඵලවලට අනුකූල වන ලෙස මුදල් විශුද්ධිකරණය වැළැක්වීමේ සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීමේ ඉදිරි ජාතික ප්‍රතිපත්තිය සම්පාදනය කෙරෙනු ඇත.

12.5 පාර්ශ්වකරුවන් සඳහා දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්වීම

මුදල් විශුද්ධිකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම මැඩපැවැත්වීම පිළිබඳ දැනුවත්භාවය වැඩිදියුණු කිරීමේ උත්සාහයන් අඛණ්ඩව කරගෙන යමින්, මූල්‍ය බුද්ධි ඒකකය විසින් 2022 වර්ෂය තුළ දැනුවත් කිරීම් මෙන්ම පුහුණු වැඩසටහන් 24 ක් සංවිධානය කිරීම හා සම්පත් දායකත්වය ලබා දීම සිදු කළ අතර, මූල්‍ය ආයතන, නම් කරන ලද මූල්‍ය නොවන ව්‍යාපාර සහ වෘත්තීන්, නීතිය බලාත්මක කිරීමේ ආයතන සහ නියාමන අධිකාරීන් වල නිලධාරීන් 2,250 කට ආසන්න ප්‍රමාණයක් මෙම වැඩසටහන් සඳහා සහභාගී වී ඇත. එසේම, මෙම වැඩසටහන් පුද්ගල සහභාගීත්වය ඇතිව මෙන්ම මාර්ගගත ක්‍රමවේද හරහා ද පවත්වන ලදී.

13. විදේශ විනිමය

විදේශ විනිමය ප්‍රවර්ධනය කිරීමේ හා නියාමනය කිරීමේ අරමුණ පෙරදැරිව, 2017 අංක 12 දරණ විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා, ශ්‍රී ලංකා රජයේ නියෝජිතයා වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති වගකීම ඉටු කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුව 2017 නොවැම්බර් 20 වන දින ස්ථාපනය කරන ලදී. පවරනු ලැබූ රාජකාරී ඉටු කිරීම සඳහා ප්‍රතිපත්ති, ප්‍රාග්ධන ගනුදෙනු, අධීක්ෂණ හා ආයතනික සේවා සහ විමර්ශන යන අංශ හතරකින් විදේශ විනිමය දෙපාර්තමේන්තුව සමන්විත වේ.

විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් පහත පරිදි වේ.

(අ) විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ ඇමතිවරයා විසින් නිකුත් කරන නියෝගයන් හා නියමයන් සඳහා පහසුකම් සැලසීම.

(ආ) විදේශ විනිමය පනත ප්‍රකාර ව මුදල් අමාත්‍යවරයා විසින් නියම කර ඇති පරිදි විදේශ විනිමය ගනුදෙනු සඳහා පරිසීමිත වෙළෙඳුන් හා වෙනත් පුද්ගලයින් පත් කිරීම.

(ඇ) විදේශ විනිමය පනත යටතේ බලයලත් වෙළඳුන් හට විධාන නිකුත් කිරීම හා පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි, නියම හා විධානවලට බලයලත් වෙළෙඳුන් අනුකූල වීම පිළිබඳ අධීක්ෂණය කිරීම.

(ඈ) විදේශ විනිමය කටයුතු හා විදේශ විනිමය ගණුදෙනු පවත්වා ගෙනයාම සඳහා රෙගුලාසි හා විධාන සකස් කිරීම හා නියමයන් නිකුත් කිරීම මගින් විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම.

(ඉ) අපනයන ආදායම් ලැබීම් අධීක්ෂණ පද්ධතිය (EPMS) මගින් ලබා ගන්නා ලද තොරතුරු මගින් මුදල් නීති පනත යටතේ නිකුත් කරනු ලැබූ රීති වලට අනුකූල ව ශ්‍රී ලංකාව වෙත කරනු ලබන අපනයන ආදායම් ලැබීම් අධීක්ෂණය කිරීම සහ අනුකූල නොවීම් වලට එරෙහි ව නියාමන ක්‍රියාමාර්ග ආරම්භ කිරීම.

(ඊ) විදේශ විනිමය පනත යටතේ පොදු අවසරයන් ප්‍රදානය කර නොමැති විශේෂ අරමුණු සඳහා අවසර ලබා දීම.

(එ) පවත්නා විදේශ විනිමය ප්‍රතිපත්ති වල ඵලදායීතාවය නිර්ණය කිරීම සහ විදේශ විනිමය වෙළෙඳපොලේ සිදුවන වර්ධනයන්ට සමගාමීව නව ප්‍රතිපත්ති වල අවශ්‍යතාවය හඳුනා ගැනීම සහ එම ප්‍රතිපත්ති නිසි ලෙස ක්‍රියාත්මක කිරීම.

(ඒ) විදේශ විනිමය පනතේ විධිවිධාන වලට අනුකූල නොවන අවස්ථාවන්ට අදාලව විමර්ශන කටයුතු සිදු කිරීම.

(ඔ) විදේශ විනිමය ගනුදෙනු පිළිබඳ විමසීම් සඳහා වැඩිදුර පැහැදිලි කිරීම් ලබා දීම හා ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්තා සහ ප්‍රකාශයන් සඳහා විදේශ විනිමය රෙගුලාසි සහ ප්‍රතිපත්ති වලට අදාල කරුණු සකස් කිරීම.

2022 වර්ෂය තුළ දී ගත් මූලික ක්‍රියාමාර්ග වල සාරාංශය පහතින් දැක්වේ.

13.1 නව නියෝග, නියම සහ විධානයන් නිකුත් කිරීම සඳහා පහසුකම් සැපයීම

විනිමය අනුපාතිකය මත පීඩනය ලිහිල් කිරීමට හා දේශීය විදේශ විනිමය වෙළෙඳපොලේ විදේශ විනිමය ද්‍රවශීලතාවට උපකාර වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව හඳුන්වාදෙනු ලැබූ අනෙකුත් මිනුම් සමග ඒකාබද්ධව, විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී, විදේශ විනිමය පනතේ විධිවිධාන ප්‍රකාර ව නියෝග, නියම හා විධානයන් නිකුත් කරන ලදී. මෙම වාර්තාවේ III කොටසේ දී ඇති විස්තර සමගින් ඇතැම් ප්‍රධාන නියෝග, නියම හා විධානයන් පහතින් ඉස්මතු කර දක්වා ඇත.

(i) නිශ්චිත ප්‍රාග්ධන ගනුදෙනු කිහිපයක් සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ නවතාලමින් සහ සීමා කිරීම් පනවමින් කලින් නිකුත් කරනු ලැබූ විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ වන නියමය, විනිමය අනුපාතිකය ස්ථාවර වීමට උපකාර වීම සඳහා වසර තුළ දී තවදුරටත් දිගු කරනු ලැබී ය.

(ii) රට තුළට විදේශ විනිමය ගලා ඒමේ විභවතාව සැලකිල්ලට ගෙන දැනටමත් විවෘත කර ඇති විශේෂ තැන්පතු ගිණුම්වල ඇති මුදල් රට තුළ රඳවා තබා ගැනීම ධෛර්යමත් කිරීමට එම ගිණුම්

විවෘත කළ දිනයේ සිට උපරිම මාස 36ක කාලයක් දක්වා අලුත් කර පවත්වාගෙන යාමට ඉඩ ලබා දෙන අතරම 2023 අප්‍රේල් 07 දක්වා මාස 12ක කාලයක් සඳහා නව විශේෂ තැන්පතු ගිණුම් විවෘත කිරීම සඳහා වන නියෝග දීර්ඝ කරනු ලැබී ය.

(iii) ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික පුද්ගලයකු සන්තකයේ ඇති විදේශ ව්‍යවහාර මුදල් බැංකු පද්ධතිය වෙත ආකර්ෂණය කර ගැනීමේ අරමුණ සහිතව තම සන්තකයේ තබා ගත හැකි උපරිම විදේශ ව්‍යවහාර මුදල් සීමාව එ.ජ.ඩො. 15,000 සිට එ.ජ.ඩො. 10,000 දක්වා අඩු කරමින් විදේශ විනිමය පනතේ 8 වන වගන්තිය යටතේ වන නියමය නිකුත් කරනු ලැබී ය.

(iv) දීර්ඝ කාලීන නේවාසික වීසා අපේක්ෂා කරන ශ්‍රී ලංකාවට පිටත නේවාසිකයන් සඳහා ආගමන හා විගමන දෙපාර්තමේන්තුවෙන් ක්‍රියාත්මක කරන ලද රන් පාරාදීසය වීසා වැඩසටහන යටතේ වන විදේශ ව්‍යවහාර මුදල් ගනුදෙනු සඳහා පහසුකම් සැලසීමට 2022 නොවැම්බර් මුල් භාගයේ දී විධාන නිකුත් කරනු ලැබී ය.

(v) භාණ්ඩ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ආනයනය කරන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගම්වලට එවැනි ආනයන සඳහා අදාල ගෙවීම් මූල්‍යනය කිරීම සඳහා ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත මව් සමාගමෙන් හෝ එකම සමාගම් සමූහයේ සමාගමකින් කෙටි කාලීන ණය පහසුකම් ලබා ගැනීමට අදාල අවසරයන් ප්‍රදානය කරමින් නියෝග සහ විධාන නිකුත් කරනු ලැබී ය.

(vi) භාණ්ඩ හා සේවා සැපයීම වෙනුවෙන් කොළඹ වරාය නගරයේ විශේෂ ආර්ථික කලාපය තුළ පිහිටි සමාගම් වලින් නේවාසිකයන් හට ගෙවීම් ලබා ගැනීමට හැකියාව ලබාදීම සහ එම ආර්ථික කලාපය තුළ පිහිටි සමාගම්වල සේවකයන් හට විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීමට ඉඩ ලබා දීම සිදු කරමින් එකී විශේෂ ආර්ථික කලාපය තුළ ආයෝජන කටයුතු සඳහා ආයෝජකයින්ට හා ආයෝජිතයින්ට බැංකු ගිණුම් විවෘත කිරීමට අදාල අවසරයන් ප්‍රදානය කරමින් නියෝග හා විධාන නිකුත් කරනු ලැබී ය.

(vii) ගනුදෙනුකරුවන් හට ඉහළ විනිමය අනුපාතයන් (විදේශ ව්‍යවහාර මුදල් සඳහා ඉහල මිල දී ගැනීමේ අනුපාතයන් පිළිගැන්වීම හේතුකොට ගෙන පරිසීමිත වෙළෙඳුන් විසින් සිදු කරන ලද අනුකූල නොවීම් සලකා බලා) ප්‍රදානය කිරීම තහනම් කරමින් පරිසීමිත වෙළෙඳුන් (එනම් මුදල් හුවමාරුකරුවන්) වෙත විධානයන් නිකුත් කරන ලදී.

නිල නොලත් විදේශ විනිමය ගනුදෙනු වැලැක්වීම සඳහා සුදුසු නියාමන බලගැන්වීමක් ලබා ගැනීම ඇතුළුව විදේශ විනිමය පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමේ දී හඳුනාගත් ගැටළු සහ ඇතැම් කාරණා සම්බන්ධයෙන් විදේශ විනිමය පනතට සංශෝධන යෝජනා කිරීමේ කාර්යය වසර තුලදී තවදුරටත් සිදු කරන ලදී.

13.2 විදේශ විනිමය ගනුදෙනු සඳහා අවසර ලබා දීම

(අ) විදේශ විනිමය පනත යටතේ ප්‍රදානය කරන ලද විශේෂ අවසරයන් පිළිබඳ තොරතුරු පහත II-13 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II-13 සංඛ්‍යා සටහන

විදේශ විනිමය පනත යටතේ ලබාදුන් විශේෂ අවසර

අරමුණ	අවසර ගණන	වටිනාකම එ.ඡ. ඩොලර් මිලියන
නේවාසික සමාගම් විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයන් වෙනුවෙන් නිකුත් කරනු ලබන බැංකු/ සමාගම් ඇපකර සඳහා	2	29.1
විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් විවෘත කිරීම.	29	අ/නො
බලයලත් වෙළෙඳුන්/ නේවාසික සමාගම් හට විදේශ විනිමය පනත යටතේ ප්‍රදානය කරන ලද පොදු අවසරයන්ගෙන් ආවරණය නොවන විවිධ විදේශ විනිමය ගනුදෙනු සිදු කිරීම සඳහා	101	අ/නො

අ/නො - අදාළ නොවේ.

(ආ) මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ යෙදීම සඳහා පරිසීමිත වෙළෙඳුන් සඳහා බලපත්‍ර ලබා දීම සහ එම මෙහෙයුම් කටයුතු නවතා දැමීම.

i. 2022 වසර තුළදී විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු මිලදී ගැනීම සහ හුවමාරු කිරීම සඳහා හෝටල් සමාගම් වෙත නව බලපත්‍ර 11 ක් නිකුත් කරන ලදී.

ii. එක් මුදල් හුවමාරු කිරීමේ අවසරපතක් අවලංගු කර දැමූ අතර තවත් එකක් තාවකාලිකව අත්හිටුවනු ලැබී ය. තවද, වසර තුළ දී බලපත්‍රලාභී මූල්‍ය සමාගම් 02 ක් ඔවුන්ගේ මුදල් හුවමාරු මෙහෙයුම් කටයුතු නවතා දමනු ලැබී ය.

iii. පරිසීමිත වෙළෙන්දන් වෙත මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ නිරතවීම සඳහා නිකුත් කර ඇති බලපත්‍ර වර්ග සහ ඔවුන්ගේ ආයතනික වර්ගීකරණය පිළිබඳ විස්තර පහත II-14 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II-14 සංඛ්‍යා සටහන

2022.12.31 වන විට මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයෙහි නිරතවීම සඳහා අවසරලත් පරිසීමිත වෙළෙඳුන්

ආයතන කාණ්ඩය	අවසරලත් ව්‍යාපාරික කටයුතු	නිකුත් කරන ලද බලපත්‍ර සංඛ්‍යාව
මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ පමණක් නියැලෙන සීමිත සමාගම් (මුදල් හුවමාරු කරන්නන්)	විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීම	59*
	විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම	
බලපත්‍රලාභී මූල්‍ය සමාගම්	විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම	06
සංචාරක හෝටල්	විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම	14
එකතුව		**79**

* මුදල් මාරු කිරීමෙහි නියැලෙන ව්‍යාපාරික ස්ථාන/ශාඛා 69 ක් ඇතුළුව සමාගම් 59ක් වෙත බලපත්‍ර නිකුත් කරන ලදී. එම ව්‍යාපාරික ස්ථාන 69න්, 58ක් වෙත විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම සහ හුවමාරු කිරීමට අවසර ලබා දී ඇති අතර, ඉතිරි ව්‍යාපාරික ස්ථාන 11ක් වෙත විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම සහ හුවමාරු කිරීම සඳහා අවසර ලබා දෙන ලදී.

ඒ අනුව, 2022 දෙසැම්බර් 31 වන විට, එම් එම් බී එල් මුදල් නුවමාරු පුද්. සමාගම (මුදල් මාරු කිරීමේ සේවයේ නිරත) සහ ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සමාගම (විදේශ විනිමයෙන් ණය ඇපකර නිකුත් කිරීමේ නියුතු) ඇතුළුව බලයලත් වෙළෙඳුන් 26 ක් සහ පරිසීමිත වෙළෙඳුන් 81 ක් මෙහෙයුම් කටයුතුවල නිරත වී ඇත. අනුමත විදේශ විනිමය ගනුදෙනු වල නිරත වීමට අවසරලත් බලයලත් වෙළෙඳුන් (එනම් අවසරලත් ගනුදෙනු සඳහා විදේශ විනිමයෙන් ගනුදෙනු කරන බලපත්‍රලාභී වාණිජ බැංකු සහ අදාල විශේෂිත අවසරය සහිත කාරණා සඳහා විදේශ විනිමයෙන් ගනුදෙනු කිරීම සඳහා අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකු) සහ පරිසීමිත වෙළෙඳුන් (ශාඛා ද ඇතුළුව) පිළිවෙලින් ඇමුණුම II-2 සහ ඇමුණුම II-3 හි සඳහන් වේ.

(ඇ) සංක්‍රමණිකයින්ගේ අරමුදල් මාරු කිරීම

ශ්‍රී ලාංකික සංක්‍රමණිකයන්ගේ විගාමික දීමනාව නිදහස් කිරීමේ අරමුණ සඳහා සහ විගාමිකයන්ට උරුම වූ මුදල් ප්‍රතිමුඛ ප්‍රේෂණය කිරීමට පහසුකම් සැලසීම සඳහා වසර තුළ ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් 215 ක් විවෘත කිරීම සඳහා බලයලත් වෙළෙඳුන් හට අවසර දෙන ලදී. කෙසේ වෙතත්, ඇතැම් ප්‍රාග්ධන ගනුදෙනු අත්හිටුවමින් විදේශ විනිමය පනතේ 22 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද නියෝගය හේතුවෙන් මෙම ගිණුම් හරහා හුවමාරු වූයේ එ.ජ.ඩො. මිලියන 1.26ක මුදලක් පමණි.

13.3 නේවාසික අයෝජකයන් උදෙසා නිෂ්කාශන ලිපි නිකුත් කිරීම

අමාත්‍යවරයා විසින් නිකුත් කර ඇති රෙගුලාසිවලට අනුව, ප්‍රතිමුඛ ආයෝජන සිදු කිරීම සඳහා විදේශ විනිමය පනත යටතේ සිදු කරමින් පවතින විමර්ශන නොමැති බවට තහවුරු කරමින් විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් නේවාසිකව ආයෝජකයන් වෙත නිෂ්කාශන ලිපි 12ක් වර්ෂය තුළදී නිකුත් කරන ලදී.

13.4 විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය සහ විමර්ශනය

i. සියලුම බලයලත් වෙළෙඳුන් ඔවුන් විසින් පවත්වාගෙන යන විදේශ මුදල් ගිණුම්වලට අදාල තොරතුරු, එකී විදේශ මුදල් ගිණුම්වලට අදාලව නිකුත් කර ඇති විධානයන් මඟින් පනවා ඇති වාර්තා කිරීමේ අවශ්‍යතාවයන්ට අනුව විදේශ විනිමය දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. තවදුරටත්, මුදල් නීති පනත යටතේ නිකුත් කරන ලද 2022 අංක 01 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති, සංශෝධිත, (රීතීන්) ප්‍රකාර ව සියලුම බලයලත් වෙළෙන්දන් විසින් අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒම සහ එම ඉපැයීම් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කිරීමට අදාල තොරතුරු ඉදිරිපත් කිරීම අවශ්‍ය වේ. මෙම තොරතුරු විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් විශ්ලේෂණය කොට අධීක්ෂණය, නියාමනය සහ ප්‍රතිපත්ති සැකසීමේ කාරණා සඳහා භාවිතා කරනු ලැබේ.

ii. මීට අමතරව, විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් බලයලත් වෙළෙඳුන් සහ අපනයනකරුවන් නිකුත් කර ඇති රීති සමග අනුකූල වන්නේ දැයි හඳුනාගැනීමට බලයලත් වෙළෙඳුන්ගේ එතැන් පරීක්ෂා කිහිපයක් පවත්වන ලද අතර අවශ්‍ය වන්නේ නම් නිවැරදි කිරීම් හෝ නියාමන ක්‍රියාමාර්ග ආරම්භ කර ඇත.

iii. විදේශ විනිමය පනත යටතේ නිකුත් කරනු ලැබූ නියෝග, නියම හා විධානයන්ට අනුකූල නොවීම්වලට අදාළව විදේශ විනිමය පනතේ විධිවිධාන ප්‍රකාර ව බලයලත් වෙළෙඳුන්, පරිසීමිත වෙළෙඳුන්, සහ අනෙකුත් පුද්ගලයන්ට එරෙහිව නව විමර්ශනයන් 47ක් ආරම්භ කරන ලදී.

iv. තවද, 2022 වසරට පෙර ආරම්භ කරන ලද විමර්ශන 17ක් සහ 2022 වසර තුළ දී ආරම්භ කරන ලද විමර්ශන 23ක් ලෙස විමර්ශන 40ක් වසර තුළ දී අදාල ක්‍රියාමාර්ග පටිපාටිය අනුගමනය කිරීමෙන් පසු අවසන් කරන ලදී.

v. එලෙසම, විදේශ විනිමය පනතෙහි විධිවිධානයන්ට අදාල කරුණු සම්බන්ධයෙන් විදේශ විනිමය දෙපාර්තමේන්තුව විසින් විශේෂඥ සාක්ෂි/දැනුම ලබා දීමෙන් නීති බලාත්මක කිරීමේ බලධාරීන්ට, නඩු පැවරීම් සහ නීතිමය කටයුතු සඳහා සහාය විය.

13.5 අපනයන ලැබීම් අධීක්ෂණ පද්ධතිය

2021 වසරේ දී, අපනයන ඉපැයීම් රටතුළට ලබා ගැනීම අධීක්ෂණය කිරීමට තොරතුරු තාක්ෂණය මත පදනම් වූ පද්ධතියක් ඇරඹීම සඳහා ක්‍රියාකාරී කමිටුවක් පත් කරන ලදී. එහි ප්‍රතිඵලයක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහ ශ්‍රී ලංකා රේගුවේ සහයෝගයෙන් 2022 ජූනි මාසයේ දී, ස්වයංක්‍රීය අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතියක් සකසා ක්‍රියාත්මක කරන ලදී. මෙම අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතියේ මූලිකම අරමුණ වනුයේ සියළුම භාණ්ඩ අපනයන එක් දත්ත ගොනුවකට ලබා ගැනීම සහතික කර ගැනීම සහ අපනයන ඉපැයීම්, අපනයන ඉපැයීම් රට තුළට ගෙන ඒමේ රීතින්ට අනුව සිදු වන්නේදැයි අධීක්ෂණය කිරීම වේ. අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතිය මඟින් ශ්‍රී ලංකා රේගුව වෙබ් සේවාවක් මඟින් සපයනු ලබන අපනයන තොරතුරු සහ බලයලත් වෙළෙඳුන් මඟින් පද්ධතියට ලබා දෙනු ලබන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ තොරතුරු ද එක්රැස් කරනු ලබයි. ඒ අනුව, අපනයන ඉපැයීම් අධීක්ෂණ පද්ධතිය තුළින් ශ්‍රී ලංකාවට අපනයන ඉපැයීම් ගෙන්වා ගැනීම අධීක්ෂණය කිරීමේ කාර්යය ශක්තිමත් කිරීම අපේක්ෂා කෙරේ.

13.6 විදේශ විනිමය රෙගුලාසි පිළිබඳ දැනුවත්භාවය ඉහළ නැංවීම

වසර තුලදී, බලයලත් වෙළෙඳුන් සහ අනෙකුත් පාර්ශ්වකරුවන් සඳහා විදේශ විනිමය පනතේ ප්‍රතිපාදන සහ පවතින විදේශ විනිමය රෙගුලාසි සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන් 9ක් පවත්වන ලදී. තවදුරටත්, විදේශ විනිමය නියෝග, නියම හා විධාන සම්බන්ධව මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා පුවත්පත් දැන්වීම් 10ක් නිකුත් කරන ලදී. නව විදේශ විනිමය නියෝග පිළිබඳ මහජනතාවගේ දැනුවත්භාවය

වැඩිදියුණු කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ නිල වෙබ් අඩවිය (www.dfe.lk) නිසි පරිදි යාවත්කාලීන කිරීම සිදු කෙරුණු අතර විදේශ විනිමය දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කෙරුණු විමසීම් වලට නොකඩවා පිළිතුරු ලබාදීම ද සිදු කරන ලදී.

ඇමුණුම II-2

2022 දෙසැම්බර් 31 දිනට බලයලත් වෙළෙඳුන්ගේ ලැයිස්තුව

බලපත්‍රලාභී වාණිජ බැංකු	
1	අමානා බැන්ක් පී.එල්.සී.
2	ලංකා බැංකුව
3	බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්
4	කාගිල්ස් බැන්ක් ලිමිටඩ්
5	සිටි බැන්ක්
6	කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී.
7	ඩොයිෂ් බැන්ක් ඒ.ජී.
8	ඩී එෆ් සී සී බැන්ක් පී.එල්.සී.
9	හබීබ් බැන්ක් ලිමිටඩ්
10	හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී.
11	ඉන්දියන් බැන්ක්
12	ඉන්දියන් ඔවර්සීස් බැන්ක්
13	එම්.සී.බී. බැන්ක් ලිමිටඩ්
14	නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් ලිමිටඩ්
15	නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පී.එල්.සී.
16	පෑන් ඒෂියා බැන්කිත් කොපරේෂන් පී.එල්.සී.
17	මහජන බැංකුව
18	පබ්ලික් බැන්ක් බර්හාඩ්
19	සම්පත් බැන්ක් පී.එල්.සී.
20	සෙලාන් බැන්ක් පී.එල්.සී.
21	ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බැන්ක්
22	ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
23	ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බැන්කිත් කොපරේෂන් ලිමිටඩ්
24	යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී.
බලපත්‍රලාභී විශේෂිත බැංකු	
25	ජාතික ඉතිරිකිරීමේ බැංකුව
26	සණස සංවර්ධන බැංකුව

ඇමුණුම II-3

2022 දෙසැම්බර් 31 දිනට පරිසීමිත වෙළෙඳුන්ගේ ලැයිස්තුව විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම හා හුවමාරු කිරීමට බලයලත් පරිසීමිත වෙළඳුන්

මුදල් හුවමාරු කරන ස්ථාන	
1	ආබ්ඩින් මනි චේන්ජර්ස් (පුද්) සමාගම
2	අබ්ලාශ් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
3	ආරියවංශ එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම
4	අරුණ ෆොරෙක්ස් (පුද්) සමාගම*
5	ඒෂියන් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
6	බ්‍රෙමියා ග්‍රාමින් (පුද්) සමාගම
7	බුලියන් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
8	කැපිටල් එක්ස්චේන්ජ් (පුද්) සමාගම
9	සෙන්ට්‍රල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
10	කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01
11	කලම්බු මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06
12	දැඩිගම ගෲප් (පුද්) සමාගම
13	ඩේටා එක්ස්චේන්ජ් ඉන්ටර්නැෂනල් (පුද්) සමාගම
14	දයා ඕතොරයිස්ඩ් මනි චේන්ජර් (පුද්) සමාගම
15	ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - ගාල්ල
16	ගෝල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - ගාලු කොටුව
17	ජෙව්ර්ජ් මයිකල් හොල්ඩින්ග්ස් (පුද්) සමාගම
18	ග්ලෝබල් විලේජ් එක්ස්චේන්ජ් (පුද්) සමාගම
19	ගෝල්ඩන් මනි චේන්ජර්ස් (පුද්) සමාගම
20	ගෝල්ඩ් ලංකා ජුවලරි (පුද්) සමාගම
21	හයිෆා ට්‍රැවල්ස් ඇන්ඩ් ටුවර්ස් (පුද්) සමාගම
22	ඉන්ටර්නැෂනල් එක්ස්චේන්ජ් (පුද්) සමාගම
23	ජයස් ඉන්වෙස්ට්මන්ට්ස් ලිමිටඩ්
24	ජෙයා ෆොරෙක්ස් එක්ස්චේන්ජ් (පුද්) සමාගම*
25	කමල් එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම*
26	කේසර් එක්ස්චේන්ජ් (පුද්) සමාගම
27	කුඩාමඩු මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම*
28	එම්. පී මනි චේන්ජර් (පුද්) සමාගම
29	මරුති මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - යාපනය
30	මයුරි මනි චේන්ජර්ස් (පුද්) සමාගම
31	මිඩ්නා මිනි මාර්කට් (පුද්) සමාගම*
32	මිලානෝ මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
33	නර්මතා ගෝල්ඩ් සෙන්ටර් (පුද්) සමාගම - යාපනය
34	නර්මතා ගෝල්ඩ් සෙන්ටර් (පුද්) සමාගම - කිලිනොච්චි
35	නිව් ලංකා ගෝල්ඩ් හවුස් (පුද්) සමාගම*
36	නිව් නටාෂා (පුද්) සමාගම
37	නිව් රීගල්ස් මනි චේන්ජර් (පුද්) සමාගම
38	රෆීක්ස් ජෙම්ස් (පුද්) සමාගම*
39	රිම්හා ජුවෙලරි (පුද්) සමාගම*
40	රිවිදූ එන්ටර්ප්‍රයිසස් (පුද්) සමාගම
41	රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01
42	රෝයල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06
43	රෝයල් මනි මාර්ට් (පුද්) සමාගම - අලුත්ගම
44	රෝයල් මනි මාර්ට් (පුද්) සමාගම - කොළඹ 01
45	සලාකා ට්‍රස්ට් ඉන්වෙස්ට්මන්ට්ස් (පුද්) සමාගම*
46	සාරාංගා මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම*
47	ෂිෆාස් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
48	සෝනම් ෆොරෙක්ස් (පුද්) සමාගම*
49	ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 01
50	ස්විස් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06
51	තමාෂා ෆොරෙක්ස් (පුද්) සමාගම*
52	තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - කොළඹ 02 - කොළොම්බු සිටි සෙන්ටර්
53	තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - කොළඹ 02 - වන් ගෝල් ෆේස් මෝල්
54	තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - නුවර
55	යුනික් ෆොරෙක්ස් (පුද්) සමාගම

56	වසන්තාස් ඉන්ටර්නැෂනල් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම*
57	වෙස්ටර්න් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
58	වින්ඩ්සර් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම

විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, හුවමාරු කිරීමට හා විකිණීමට අවසර ඇති පරිසීමිත වෙළඳුන්

59	අරුජිනා ජුවෙලරි (පුද්) සමාගම
60	සිටි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
61	කුවුන් මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
62	දේවි ෆොරෙක්ස් (පුද්) සමාගම
63	ජුවෙල් ලංකා මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම
64	මරුති මනි එක්ස්චේන්ජ් (පුද්) සමාගම - කොළඹ 06
65	මෙට්ට්‍රෝ ෆොරෙක්ස් (පුද්) සමාගම
66	පුෂ්පා මනි චේන්ජර් (පුද්) සමාගම
67	රවී ෆොරෙක්ස් (පුද්) සමාගම
68	තෝමස් කුක් ලංකා (පුද්) සමාගම - බණ්ඩාරනායක ජාත්‍යන්තර ගුවන් තොටුපල
69	යුනිවර්සල් මනි චේන්ජර්ස් (පුද්) සමාගම*
බලපත්‍රලාභී මූල්‍ය සමාගම්	
70	ඒෂියා ඇසට් ෆයිනෑන්ස් පී. එල්. සී
71	සිටිසන් ඩිවලොප්මන්ට්ස් බිස්නස් ෆයිනෑන්ස් පී. එල්. සී
72	ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆයිනෑන්ස් පී. එල්. සී
73	එල්. බී ෆයිනෑන්ස් පී. එල්. ස
74	සෙන්කඩගල ෆයිනෑන්ස් පී. එල්. සී
75	සිංගර් ෆයිනෑන්ස් (ලංකා) පී. එල්. සී
ව්‍යවහාර විදේශ මුදල් මිලදී ගැනීමට, අවසර ඇති පරිසීමිත වෙළඳුන්	
76	පර්ල් සිටි හොටෙල්
77	ෂැන්ග්‍රිලා හම්බන්තොට රිසෝට් ඇන්ඩ් ස්පා
78	ෂැන්ග්‍රිලා හොටෙල් කොළඹ
79	සිනමන් රෙඩ් කොළඹ
80	සිනමන් සිටඩෙල් නුවර
81	සිනමන් ලොජ් හබරණ
82	හබරණ විලේජ් බයි සිනමන්
83	ට්‍රින්කො බිලූ බයි සිනමන්
84	සිනමන් බෙන්තොට බීච්
85	හික්කා ට්‍රාන්ස් බයි සිනමන්
86	සිනමන් බේ බේරුවල
87	සිනමන් ග්‍රෑන්ඩ්
88	සිනමන් ලේක්සයිඩ්
89	සිනමන් වයිල්ඩ් යාල
අනෙකුත් ආයතන	
90	එම්.එම්. බී. එල් මනි ට්‍රාන්ස්ෆර් (පුද්) සමාගම (දේශීය ප්‍රතිලාභීන් වෙත ශ්‍රී ලංකා රුපියල් වලින් බෙදා හැරීමට ආමුඛ ප්‍රේෂණ විදේශ ව්‍යවහාර මුදලින් ලබා ගැනීමට පමණක් අවසර ඇත).
91	ශ්‍රී ලංකා අපනයන ණය රක්ෂණ සංස්ථාව (අපනයනකරුවන්ගේ ගිණුම් මත බලයලත් වෙළෙඳුන් වෙත විදේශ ව්‍යවහාර මුදලින් පෙර/පසු නැවිගත කිරීමේ ණය ඇපකර නිකුත් කිරීමට අවසර දී ඇත.)

* මෙම ආයතනවලට 2023 වසර සඳහා මුදල් හුවමාරු ව්‍යාපාරයෙහි යෙදීමට අවසර දී නොමැත.

14. විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීම්

විදේශ රැකියා සඳහා යන ශ්‍රමිකයින්ගේ සහ ඔවුන්ගේ ප්‍රේෂණවල ළඟාකරගත හැකි උපරිම මට්ටම ලබාගැනීමට කටයුතු කරමින් විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයන්ගේ එම ප්‍රේෂණ රට තුළට ගලා ඒම පහසු කිරීම සහ එය වඩා විධිමත් කිරීමේ අරමුණින් විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව පිහිටුවන ලදී. එම ඉලක්ක ළඟාකර ගැනීමේදී, විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව විදේශීය ප්‍රේෂණ අංශයේ අනෙකුත් අදාළ බලධාරීන් සමග සම්බන්ධ වෙමින් 2022 සහ 2023 මුල් කාලය තුළදී පහත ක්‍රියාකාරකම්වල නිරත විය.

14.1 සංක්‍රමණික ශ්‍රමිකයන් සඳහා මූල්‍ය හා මූල්‍ය නොවන දිරි දීමනා ක්‍රම හඳුන්වා දීම.

(අ) විදේශගත ශ්‍රී ලාංකික සේවා නියුක්තිකයින් විසින් බලපත්‍රලාභී බැංකුවල පවත්වාගෙන යනු ලබන රුපියල් ගිණුම්වලට සහ කවුන්ටරය හරහා මුදල් ලැබීමට, ශ්‍රී ලංකාවට මුදල් ප්‍රේෂණය කිරීමේදී දරනු ලබන ගණුදෙනු පිරිවැය ප්‍රතිපූරණයක් ලෙස රුපියල් 20,000ක් හෝ ඊට වැඩි සෑම ගනුදෙනුවකටම රුපියල් 1,000ක මුදලක් ලබාදීම සඳහා වන දිරිගැන්වීමේ යෝජනා ක්‍රමයක් හඳුන්වා දෙන ලදී. මෙම දිරිගැන්වීමේ ක්‍රමය සැලසුම් කර ක්‍රියාත්මක කිරීමට පෙර විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව විසින් මේ සම්බන්ධයෙන් පාකිස්ථානු මහ බැංකුව (State Bank of Pakistan), විදේශයන්හි ඇති ශ්‍රී ලාංකික සංක්‍රමණික සේවක සංගම්, විදේශයන්හි ඇති විනිමය හුවමාරු මධ්‍යස්ථාන වලින් සැදුම්ලත් සංගම් සහශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු සමග සාකච්ඡා පවත්වන ලදී. මෙම යෝජනා ක්‍රමය 2022 පෙබරවාරි 01 සිට ක්‍රියාත්මක වේ.

(ආ) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා අතිරේක තීරුබදු රහිත දීමනාවක් (Additional duty-free allowance) හඳුන්වාදීම සඳහා වන යෝජනා ක්‍රමයක් සැලසුම් කරන ලදී. මෙම යෝජනා ක්‍රමය මගින් විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන්ගේ ඉපැයීම් විධිමත් මාර්ග හරහා මෙරටට ප්‍රේෂණය කිරීම දිරිගන්වන අතර එමඟින් ණය නොවන විදේශ විනිමය රට තුළට ගලා ඒමේ තිරසාරභාවය සහ එහි මධ්‍ය කාලීන වර්ධනයට පහසුකම් සලසනු ඇත. මෙම යෝජනා ක්‍රමය සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර එය නුදුරු අනාගතයේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිතය.

(ඇ) විදේශගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට අවසර ලබා දීමේ යෝජනා ක්‍රමයක් සැලසුම් කිරීමට මෙම දෙපාර්තමේන්තුව සම්බන්ධ වූ අතර, මෙම යෝජනා ක්‍රමය කම්කරු හා විදේශ රැකියා අමාත්‍යාංශය විසින් ක්‍රියාත්මක

කරන ලදී. මෙම යෝජනා ක්‍රමය 2022 මැයි 01 දින සිට දෙසැම්බර් 31 දින දක්වා ප්‍රේෂණය කරන ලද විදේශ විනිමය ප්‍රමාණයෙන් සියයට 50කට සමාන හෝ ඊට අඩු CIF (මිල, රක්ෂණය සහ ගැල්කුලිය) අගයන් සහිත පූර්ණ විද්‍යුත් වාහන ආනයනය කිරීමට අවසර ලබා දෙන ලදී. මෙමගින් විදේශගත ශ්‍රමිකයන්ට ඔවුන්ගේ විදේශ විනිමය ඉපැයීම් විධිමත් මාර්ග හරහා මෙරටට ප්‍රේෂණය කිරීම දිරිමත් කරනු ඇත.

14.2 විදේශ විනිමය ප්‍රේෂණ සහ විදේශ රැකියා සඳහා පිටත්ව යෑම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම

(අ) විදේශ රැකියා සඳහා යොමුවන ශ්‍රමිකයින් ඉලක්ක කරගත් දිරිදීමනා ක්‍රම සහ විධිමත් ක්‍රම ඔස්සේ මුදල් හුවමාරු කිරීමේ වැදගත්කම පිළිබඳ මහජනතාව දැනුම්වත් කිරීම්, පුවත්පත්, ගුවන්විදුලි වැඩසටහන්, සම්මන්ත්‍රණ, සමාජ මාධ්‍ය සහ ප්‍රවෘත්ති වෙබ් අඩවි වැනි විවිධ ක්‍රම හරහා සිදුකරන ලදී.

(ආ) ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු සමග සෘජුව සම්බන්ධ වී සිටින විදේශ විනිමය ප්‍රේෂණ හුවමාරු නියෝජිතයින් සහ අනෙකුත් විදේශ විනිමය ප්‍රේෂණ සිදුකරන මාර්ග ඇතුළත් ලැයිස්තුවක් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලද අතර, එය නිරන්තරයෙන් යාවත්කාලීන කරන ලදී. මෙම ලැයිස්තුව ශ්‍රී ලංකාවට එතෙර සිට විදේශ විනිමය ප්‍රේෂණ එවීම සඳහා ඇති විධිමත් මාර්ග හඳුනා ගැනීමට හැකි වන පරිදි බලපත්‍රලාභී බැංකු සමග සෘජුවම සම්බන්ධ වී සිටින විදේශ විනිමය ප්‍රේෂණ හුවමාරු නියෝජිතයින් සහ අනෙකුත් විදේශ විනිමය ප්‍රේෂණ සිදුකරන මාර්ග පිළිබඳව, ශ්‍රී ලාංකික විදේශ සේවා නියුක්තිකයින්ගේ දැනුම්වත්භාවය වැඩි දියුණු කිරීම සඳහා උපකාරී වනු ඇත.

(ඇ) විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ අදාළ අනෙකුත් ආයතන සමග සම්බන්ධ වෙමින් විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මුහුණ දෙන දුෂ්කරතා සහ සීමාවන් මගහරවා ගැනීමට දායක වෙමින් විදේශ විනිමය මුදල් මෙරටට ප්‍රේෂණය කිරීම සම්බන්ධයෙන් පැහැදිලි කිරීම්, පැමිණිලි සහ දුක්ගැනවිලි වලට ප්‍රතිචාර දැක්වීමේ කටයුතුවල ද නිරත විය.

14.3 විදේශීය විනිමය ප්‍රේෂණ සහ සංක්‍රමණික සේවකයින් පිළිබඳ තොරතුරු බෙදාහැරීම

(අ) සංක්‍රමණික සේවකයින් සහ විදේශ විනිමය ප්‍රේෂණ පිළිබඳ අදාළ දත්ත ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කිරීම.

(ආ) සංක්‍රමණික සේවකයින් සහ විදේශ විනිමය ප්‍රේෂණ පිළිබඳ පර්යේෂණ සිදු කර ඒවා සඟරාවල සහ මහ බැංකු ප්‍රකාශනවල පළ කිරීම.

සංක්‍රමණික ශ්‍රමිකයින් ශ්‍රී ලංකාවට තම ඉපැයීම් ප්‍රේෂණය කිරීමට භාවිතා කරන ක්‍රම පිළිබඳ තොරතුරු වල පවත්නා අඩුපාඩු මගහැරවීම සහ ඵලදායී ප්‍රතිපත්ති සම්පාදනය සඳහා අවශ්‍ය තොරතුරු සැපයීම පිණිස, විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලාංකික විදේශගත සේවා නියුක්තිකයන් සහ ඔවුන්ගේ ප්‍රේෂණ රටාවන් පිළිබඳව ව්‍යුහගත ප්‍රශ්නාවලියක් මත පදනම් වූ මුහුණට මුහුණ සම්මුඛ සාකච්ඡා සහිත ගෘහස්ත සමීක්ෂණයක් දැනට සිදුකරමින් පවතී. ඉදිරියේදී අනෙකුත් අදාළ බලධාරීන් සමග සහයෝගයෙන් විදේශීය විනිමය ප්‍රේෂණ සහ විගමණික සේවක සුබසාධනය ඉහළ නැංවීම සඳහා සහනදායී ණය යෝජනා ක්‍රම වැනි නව යෝජනා ක්‍රම හඳුන්වාදීමේ ක්‍රියාවලියට පුළුල් ලෙස සම්බන්ධ වීමට විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව අපේක්ෂා කරයි. තවද, විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව රටවල් අතර විදේශ විනිමය ප්‍රේෂණ ප්‍රවාහයන් පිළිබඳ අධ්‍යයනයක් භාවිතයෙන් දැනට වෙළඳපොලේ පවත්නා ගනුදෙනු පිරිවැය පිළිබඳ විශ්ලේෂණය කිරීමට සැලසුම් කර ඇත.

15. මානව සම්පත්

කොවිඩ්-19 වසංගතය පැතිරීම, ඉන්ධන හිඟය හේතුවෙන් ඇති වූ ප්‍රවාහන දුෂ්කරතා ආදී විවිධ අභියෝග මධ්‍යයේ වුව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා දායක විය හැකි ඉහළ ඵලදායීතාවයකින් යුතු, අභිප්‍රේරිත, කාර්යශූර සේවක පිරිසක් මහ බැංකුව තුළ පවත්වා ගැනීම සහතික කිරීමේ අරමුණින් මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මානව සම්පත් කළමනාකරණ (HRM) කාර්යයන් සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ 2022 වසරේ උපායමාර්ගික ක්‍රියාකාරී සැලැස්මට අනුකූලව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ සිදුකරන ලද මෙහෙයුම් අතරට නව සේවක බඳවා ගැනීම්, උසස්වීම්, දෙපාර්තමේන්තු අතර සේවක ස්ථාන මාරුකිරීම්, සේවක වැටුප්, පුහුණු කිරීම් හා නිපුණතා සංවර්ධනය, කාර්යසාධන ඇගැයීම, සේවක අභිප්‍රේරණය, දුක් ගැනවිලි පිළිබඳව සොයා බැලීම සහ මහ බැංකුවේ අවශ්‍යතාවය පරිදි තෝරාගත් සේවාවන් බාහිර සේවා සපයන්නන් හරහා ලබා ගැනීම හා සම්බන්ධ විවිධ ක්‍රියාකාරකම් ඇතුළත් විය. තව ද, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මානව සම්පත් කළමනාකරණය හා සම්බන්ධ සියලු ගැටලු සහ අනෙකුත් ආයතනික කාර්යයන් සම්බන්ධ ගැටලු සඳහා යෝජනා ඉදිරිපත් කිරීම සහ තීරණ ගැනීම සම්බන්ධයෙන් සාකච්ඡා පැවැත්වීමට අවශ්‍ය පහසුකම් සලසමින් ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සඳහා ආයතනික කළමනාකරණ කමිටු, පුහුණු කමිටු සහ පුහුණු අනු කමිටු ආදී වූ රැස්වීම් සංවිධානය කරන ලදී. එමෙන්ම, මානව

සම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන ක්‍රියාකාරකම්, උපායමාර්ගික හා මෙහෙයුම් කටයුතු සම්බන්ධ ප්‍රතිපත්තිමය මෙන්ම මෙහෙයුම් කරුණු පිළිබඳ සාකච්ඡා කොට තීරණ ගැනීම සඳහා දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ රැස්වීම් නිරන්තරයෙන් කැඳවන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමනාකාරිත්වය, සියලු මට්ටම්වල සේවකයන් මෙන්ම වෘත්තීය සමිති අතර සාකච්ඡා සඳහා පහසුකම් සැළසීම තුළින් බැංකුවේ කාර්මික සාමය අඛණ්ඩව පවත්වා ගැනීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් දායකත්වය සපයන ලදී. එපමණක් නොව, මානව සම්පත් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ විශ්‍රාමිකයන්ට සහ විශ්‍රාමිකයන්ගේ සංගම්වලට මහ බැංකුවේ කළමනාකාරිත්වය සමග සාකච්ඡා කිරීමට සහ ඔවුන්ගේ අවශ්‍යතා/ඉල්ලීම් සළකා බැලීමට අවශ්‍ය පසුබිම සකසා දීමට කටයුතු කරන ලදී. එසේම, 2022 වසර ආරම්භයේ දී 2021 - 2023 ත්‍රෛවාර්ෂික වැටුප් සංශෝධනය අවසන් කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු කළමනාකාරිත්වය සහ සියලුම වෘත්තීය සමිති අතර සාකච්ඡා සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයන ලදී.

තව ද, 2022 වසරේ මුල් භාගයේ දී පැවති කොවිඩ්-19 වසංගත තත්වය මෙන්ම රට තුළ උද්ගත වූ ඉන්ධන හිඟය හේතුවෙන් ඇති වූ ප්‍රවාහන දුෂ්කරතා මධ්‍යයේ "නිවසේ සිට වැඩ කිරීමට" පහසුකම් සැළසීම තුළින් මානව සම්පත් දෙපාර්තමේන්තුව බැංකුවේ මෙහෙයුම් කටයුතු සුමටව සහ අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා දායක විය.

15.1 මානව සම්පත් ව්‍යුහය

2022 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත සේවක සංඛ්‍යාව 1,260ක් වූ අතර, එය මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 661කින්, කළමනාකරණ සහකාර පන්තියේ නිලධාරීන් 463කින් සහ කාර්යාල සහායක පන්තියේ සේවකයන් 136කින් සමන්විත විය. එකී සමස්ත සේවක සංඛ්‍යාවෙන් 656ක් පුරුෂ හා 604ක් ස්ත්‍රී වූ අතර, එය පිළිවෙලින් සමස්ත සේවක සංඛ්‍යාවෙන් සියයට 52ක් හා සියයට 48ක් විය. 2022 වසර අවසානය වන විට මහ බැංකු සේවකයකුගේ සාමාන්‍ය වයස අවුරුදු 40ක් විය.

15.2 ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්

II-15 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව, ඉහළ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම් සහ නිපුණතා වලින් හෙබි විවිධ දක්ෂතා ඇති කාර්ය මණ්ඩලයකින් සමන්විත වේ.

15.3 මානව සම්පත් කළමනාකරණය

(අ) බඳවා ගැනීම්

2022 වසරේ දී සාමාන්‍ය බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය යටතේ මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවට කණිෂ්ඨ පෞද්ගලික සහකාර (ඉංග්‍රීසි සහ සිංහල) තනතුරට බඳවා ගැනීම සඳහා කටයුතු කරන ලදී. ඒ අනුව, 2022 ඔක්තොම්බර් 29 දින පවත්වන ලද නිපුණතා පරීක්ෂණය සහ 2022 දෙසැම්බර් 22 දින පවත්වන ලද සම්මුඛ පරීක්ෂණ මත පදනම්ව තෝරාගත් අයදුම්කරුවන්හට පත්වීම් ලබාදීම, 2023 ජනවාරි මාසයේ දී සිදුකිරීමට නියමිත විය. තව ද, මහ බැංකුවේ බැංකු සහකාර (පුහුණු) තනතුරට බඳවා ගැනීම සඳහා වූ තරග විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග දෙපාර්තමේන්තුව සමග සාකච්ඡා කරන ලදී.

මීට අමතරව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2023 ජනවාරි 02 දින සිට වසරක කාලයක් සඳහා කොන්ත්‍රාත් පදනම යටතේ මහ බැංකුවේ ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සඳහා අධ්‍යක්ෂවරයකු බඳවා ගැනීමට කටයුතු කරන ලදී.

(ආ) කාර්යසාධන කළමනාකරණය

මහ බැංකුවේ කාර්යසාධන ඇගැයීමේ ක්‍රියාවලිය, සේවකයන්ගේ රැකියා විස්තර සකස් කිරීම හා සමාලෝචනය කිරීම, එක් එක් සේවකයන්ට අදාළ වන පරිදි ඉලක්ක හා අරමුණු පිහිටුවීම, කාර්යසාධනය නිරීක්ෂණය සහ කාර්යසාධනය ඇගැයීම යන අංග වලින් සමන්විත වේ.

කාර්යසාධන ඇගැයීමේ ක්‍රියාවලිය යටතේ, කාර්යසාධන ඇගැයීම් පටිපාටියේ සඳහන් වන පරිදි සාමාන්‍ය නිපුණතා සහ තාක්ෂණික නිපුණතා මෙන්ම ළඟා කරගත් කාර්යසාධන ප්‍රමාණනය කර ඒ සඳහා අගයන් ලබා දෙමින් සෑම සේවකයෙකුගේ ම කාර්යසාධන ඇගැයීම සිදුකරනු ලබයි.

II-15 සංඛ්‍යා සටහන

2022.12.31 දිනට ශ්‍රී ලංකා මහ බැංකු සේවකයන්ගේ අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සාමාජිකත්ව

සේවක පන්ති	අධ්‍යාපන සුදුසුකම්/වෘත්තීය සාමාජිකත්ව දරන්නන්								
	ආචාර්ය උපාධි	ශාස්ත්‍රපති උපාධි, ප්‍රථම උපාධි සහ වෘත්තීය සාමාජිකත්ව	ශාස්ත්‍රපති උපාධි සහ ප්‍රථම උපාධි	ප්‍රථම උපාධි සහ වෘත්තීය සාමාජිකත්ව	ශාස්ත්‍රපති උපාධි හා වෘත්තීය සාමාජිකත්ව	ශාස්ත්‍රපති උපාධි පමණක්	ප්‍රථම උපාධි පමණක්	වෘත්තීය සාමාජිකත්ව පමණක්	එකතුව
මාණ්ඩලික පන්තිය	26	123	169	71	44	3	171	10	617
කළමනාකරණ සහකාර පන්තිය	-	11	30	16	20	38	42	24	181
එකතුව	**26**	134	199	87	64	41	213	34	798

මාණ්ඩලික පන්තියේ III (2) ශ්‍රේණිය දක්වා සේවකයන් සඳහා උසස්වීම් පටිපාටියේ එක් නිර්ණායකයක් ලෙස සේවකයන්ගේ අවසාන කාර්යසාධන ලකුණු යොදා ගැනේ.

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවකයන්ගේ කාර්යසාධන ඇගැයීම් ක්‍රියාවලිය සැලසුම් කළ පරිදි වර්ෂය තුළ දී ක්‍රියාත්මක කරන ලදී. තව ද, 2022 වසරේ සිට කාර්තුමය කාර්යසාධන සමාලෝචන ක්‍රියාවලියක් මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් හඳුන්වාදෙන ලදී. සේවකයන්ගේ කාර්යසාධනය පියවරෙන් පියවර සමීපව නිරීක්ෂණය කිරීමට අධීක්ෂකවරුන්ට අවස්ථාවක් ලබා දීම, දෙපාර්තමේන්තුවල උපායමාර්ගික අරමුණු සාක්ෂාත් කරගැනීම සඳහා සේවකයන්ගේ කාර්යසාධනය මෙහෙයවීම සහ සේවකයන්හට අදාළ වාර්ෂික වෘත්තීමය ඉලක්ක සාක්ෂාත් කරගැනීම සඳහා මඟපෙන්වීමක් ලෙස භාවිතා කිරීම මෙහි අරමුණ වේ.

(ඇ) උසස්වීම්

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් සේවකයන්ගේ වෘත්තීය අභිවෘද්ධිය සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකු සේවක උසස්වීම් පටිපාටිය යටතේ, සේවක උසස්වීම් ලබා දීම සඳහා පහසුකම් සලසන ලදී. ඒ අනුව, 2022 වර්ෂයේ දී කාර්ය මණ්ඩල සාමාජිකයන් 272 දෙනෙකු සඳහා පන්ති සහ ශ්‍රේණි උසස්වීම් ලබා දෙන ලදී. ඒ යටතේ සහකාර අධිපතිවරයකු නියෝජ්‍ය අධිපතිවරයකු ලෙසත්, දෙපාර්තමේන්තු ප්‍රධානියකු ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානියකු ලෙසත්, නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් හත් දෙනෙකු අතිරේක දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙසත්, මාණ්ඩලික පන්තියේ III (1) ශ්‍රේණියේ නිලධාරීන් 11 දෙනෙකු නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් ලෙසත් උසස් කරන ලද අතර, සේවකයින් 252 දෙනෙකු සඳහා පන්ති සහ ශ්‍රේණි උසස්වීම් ලබා දෙන ලදී.

(ඈ) පුහුණු සහ කුසලතා සංවර්ධනය

මහ බැංකුවේ අරමුණු ඵලදායී ලෙස සපුරාලීමේ අරමුණින් සහ බැංකුව තුළ බහුවිධ නිපුණතාවයන්ගෙන් යුතු දක්ෂ කාර්ය මණ්ඩලයක් බිහිකිරීමේ අරමුණින් මහ බැංකුව විසින් තම කාර්ය මණ්ඩලය වෙත දැනුම වැඩි දියුණු කිරීමට සහ කුසලතා සංවර්ධනය කිරීමට අවස්ථාවන් සලසා දෙනු ලැබේ. ඒ අනුව, මහ බැංකුව විසින් පශ්චාත් උපාධි අධ්‍යයනය සඳහා වූ මහ බැංකු අනුග්‍රාහක වැඩපිළිවෙල යටතේ ජාත්‍යන්තරව පිළිගත් විශ්වවිද්‍යාලවල පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු සඳහා නිලධාරීන් දිරිමත් කරනු ලබයි. තව ද, මහ බැංකුවේ මානව ප්‍රාග්ධන සංවර්ධනයේ ඇති වන අවශ්‍යතාවන් සපුරාලීමටත්, බැංකුව තුළ දැනුම, ප්‍රවීණත්වය සහ කුසලතා අඛණ්ඩව වැඩිදියුණු කිරීමට සහාය වීමටත් මහ බැංකු සේවකයන්හට දේශීය හා ජාත්‍යන්තර පුහුණු වැඩසටහන් සඳහා සහභාගී වීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සපයනු ලබයි. කෙසේ වුව ද, රටේ පවතින වත්මන් ආර්ථික තත්ත්වය සැලකිල්ලට ගනිමින් 2022 වසර තුළ දී මහ බැංකු නිලධාරීන්හට "පශ්චාත් උපාධි අධ්‍යයනය" කටයුතු ද ඇතුළුව විදේශ පුහුණු අවස්ථාවන් සඳහා පහසුකම් සැළසීමට කිසිදු විදේශ විනිමය වියදමක් නොදැරීමට මහ බැංකුව විසින් තීරණය කරන ලදී. එනමුත්, මහ බැංකුවේ නිලධාරීන්හට මහ බැංකුව විසින් පිළිගනු ලබන ආයතන විසින් අනුග්‍රහ දක්වන "විදේශ පුහුණුවීම්" සඳහා සහභාගීවීමට අවසර ලබා දුන් අතර, මහ බැංකුව විසින් පිළිගනු ලබන බාහිර මූලාශ්‍ර විසින් ප්‍රදානය කරනු ලබන පූර්ණ ශිෂ්‍යත්ව සඳහා සුදුසුකම් ලබන මහ බැංකු නිලධාරීන්හට පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට මහ බැංකුව විසින් අවස්ථාව සලසා දෙන ලදී.

ඕස්ට්‍රේලියානු රජය විසින් පිරිනමනු ලබන පූර්ණ ශිෂ්‍යත්ව යටතේ, 2022 වසරේ දී මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් නිලධාරීන් දෙදෙනෙකුහට ඕස්ට්‍රේලියාවේ ඉහළම ශ්‍රේණිගත විශ්වවිද්‍යාලවල ආර්ථික විද්‍යාව පිළිබඳ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට පහසුකම් සපයන ලදී. 2018 වර්ෂයේ සිට 2022 වර්ෂය අවසානය දක්වා කාලය තුළ මහ බැංකු අනුග්‍රාහක වැඩපිළිවෙළ යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු ආරම්භ කර ඇති/සම්පූර්ණ කර නැවත පැමිණි නිලධාරීන් සංඛ්‍යාව පහත II-16 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II-16 සංඛ්‍යා සටහන

මහ බැංකු අනුග්‍රාහකත්වය යටතේ පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු

වර්ෂය	පශ්චාත් උපාධි අධ්‍යයනය				එකතුව	
	ආචාර්ය උපාධි		ශාස්ත්‍රපති උපාධි		ආරම්භ කරන ලද	සම්පූර්ණ කරන ලද*
	ආරම්භ කරන ලද	සම්පූර්ණ කරන ලද*	ආරම්භ කරන ලද	සම්පූර්ණ කරන ලද*		
2018	8	1	8	14	16	15
2019	4	1	7	7	11	8
2020	2	5	6	8	8	13
2021	1	4	1	6	2	10
2022	-	1	2	1	2	2
එකතුව	15	12	24	36	39	48

*පශ්චාත් උපාධි අධ්‍යයන කටයුතු අවසන් කිරීමෙන් පසු නැවත පැමිණි.

ඉහත සඳහන් පුහුණුවීම්වලට අමතරව ලොව අනෙකුත් මහ බැංකු සහ ජාත්‍යන්තර මූල්‍ය අරමුදල (IMF), අග්නිදිග ආසියානු මහ බැංකු සංගමය (SEACEN), ලෝක බැංකුව (World Bank) වැනි ජාත්‍යන්තර සංවිධාන සහ දේශීය ආයතන විසින් පවත්වනු ලබන මාර්ගගත පුහුණු වැඩසටහන් (online training programmes) සඳහා සහභාගීවීමට මහ බැංකු නිලධාරීන්හට 2022 වසර තුළ දී පහසුකම් සලසනු ලැබීය. ඒ අනුව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් විදේශීය පුහුණු වැඩසටහන් 402ක් සඳහා නිලධාරීන් 621 දෙනෙකුට මාර්ගගත ක්‍රමය ඔස්සේ සහභාගී වීමටත්, විදෙස් සංවිධායක ආයතනවල මූල්‍ය අනුග්‍රාහකත්වය යටතේ පවත්වන ලද විදේශ පුහුණු වැඩසටහන් 36ක් සඳහා නිලධාරීන් 65 දෙනෙකුට සහභාගීවීමටත් පහසුකම් සලසන ලදී.

මේ අතර, බාහිර දේශීය පුහුණු ආයතන (external local training institutes) මඟින් පවත්වනු ලබන දේශීය පුහුණු වැඩසටහන් 93කට සහභාගී වීමට නිලධාරීන් 479 දෙනෙකුට සහ බැංකු විදු පියෙස මඟින් පවත්වනු ලබන දේශීය පුහුණු වැඩසටහන් 85කට සහභාගී වීමට නිලධාරීන් 1,716 දෙනෙකුට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් පහසුකම් සලසන ලදී.

මීට අමතරව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයන්හට දිගුකාලීන දේශීය (අර්ධකාලීන) පුහුණු වැඩසටහන්වලට සහභාගී වීමට සහ දේශීය ආයතන විසින් පිරිනමනු ලබන අනෙකුත් සහතික පත්‍ර පාඨමාලා සහ ඩිප්ලෝමා වැඩසටහන් සඳහා සහභාගී වීමට පහසුකම් සපයන ලද අතරම වරලත් මූල්‍ය විශ්ලේෂක (CFA) සුදුසුකම් සඳහා වන අනුග්‍රාහක වැඩපිළිවෙළ අඛණ්ඩව පවත්වාගෙන යන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයන් අතර සහ අනෙකුත් මහ බැංකු කාර්ය මණ්ඩල අතර දැනුම හුවමාරු කර ගැනීමේ වැඩසටහන් මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවන ලදී. ඒ අනුව, 2022 වසරේ "විදේශ විනිමය ගනුදෙනු අධීක්ෂණය සහ වෙළඳපොළ ස්ථායීකරණ පියවර" (FX Transaction Monitoring and Market Stabilization Measures) යන මාතෘකාව යටතේ මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් කොරියානු බැංකුව (BOK) සමග දැනුම බෙදාගැනීමේ වැඩසටහන් පවත්වන ලදී. තව ද, කොරියානු බැංකුව (BOK) විසින් පවත්වනු ලැබූ විවිධ දැනුම බෙදාගැනීමේ සැසිවාරයන් කිහිපයකටම සහභාගීවීමට ද ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන්හට පහසුකම් සපයන ලදී.

(ඉ) දෙපාර්තමේන්තු අතර සේවක ස්ථාන මාරු කිරීම්

මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ ඵලදායිතාවය ඉහළ නංවන අතරම, බැංකුව තුළ බහුවිධ නිපුණතා සහිත මානව සම්පත් සංවර්ධනය කිරීමේ අරමුණ සාක්ෂාත් කර ගැනීම සඳහා දෙපාර්තමේන්තු අතර සේවක ස්ථාන මාරු කිරීම් ප්‍රතිපත්තිය 2022 වසරේදී ද අඛණ්ඩව සිදු කරනු ලැබීය. ඒ අනුව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් 2022 ජනවාරි 03 දින සිට ක්‍රියාත්මක වන පරිදි දෙපාර්තමේන්තු අතර වාර්ෂික සේවක ස්ථාන මාරු කිරීම් යෝජනා ක්‍රමය යටතේ මාණ්ඩලික පන්තියේ නිලධාරීන් 23 දෙනෙකු සහ කාර්යාල සහායක පන්තියේ සේවකයන් 50 දෙනෙකුගේ සේවක ස්ථාන මාරු කිරීම් සිදු කරන ලදී. තව ද, වාර්ෂික සේවක ස්ථාන මාරු කිරීම් යෝජනා ක්‍රමය යටතේ එන වැඩවාර සටහන මත පදනම්ව කාර්යාල සහායක පන්තියේ සේවකයන් 12 දෙනෙකුට සේවක ස්ථාන මාරුවීම් ලබාදෙන ලදී.

(ඊ) කාර්මික සාමය

මානව සම්පත් දෙපාර්තමේන්තුව, කළමනාකාරීත්වය සහ වෘත්තීය සමිති අතර සමීප සම්බන්ධතාවයක් පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම හා පහසුකම් සැලසීම අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2022 වසර තුළ දී කළමනාකාරීත්වය සහ වෘත්තීය සමිති අතර රැස්වීම් නවයක් පවත්වන ලද අතර, එමඟින් සේවක වැටුප්, උසස්වීම්, පුහුණුවීම්, සුභ සාධනය, නව බඳවා ගැනීම් සහ පරිපාලනය සම්බන්ධයෙන් පැවති ගැටලු විසඳා ගැනීමට අවස්ථාව ලැබිණි.

(උ) බාහිර සේවා සපයන්නන්ගේ සේවය ලබාගැනීම

බැංකුවේ මූලික කාර්යයන්ට අදාළ නොවන කාර්යයන් සිදු කිරීම උදෙසා අවශ්‍ය මානව සම්පත් බාහිර සේවා සපයන්නන්ගෙන් ලබා ගැනීම සඳහා මානව සම්පත් දෙපාර්තමේන්තුව වෙත බලය පවරා ඇත. ඒ අනුව, මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් අදාළ දෙපාර්තමේන්තුවල ඉල්ලීම මත බාහිර සේවා සපයන්නන්ගෙන් සේවා ලබාගැනීම සඳහා ටෙන්ඩර් පටිපාටිය අනුගමනය කරනු ලබයි. 2022 වසර තුළ දී බැංකුවේ අවශ්‍යතා අනුව, ආරක්ෂක සේවය, මෘදුකාංග ඉංජිනේරුවරුන්ගේ සේවය, නිවාඩු නිකේතන කළමනාකරණය සඳහා සේවය, විගණන අංශවල සේවය සහ වෛද්‍ය නිලධාරීන්ගේ සේවය ආදී වූ ක්ෂේත්‍ර පහකට අදාළ සේවා, බාහිර සේවා සපයන්නන් හරහා ලබා ගැනීමට මානව සම්පත් දෙපාර්තමේන්තුව විසින් කටයුතු කරන ලදී.

15.4 දෙපාර්තමේන්තු වසා දැමීම

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 33 වැනි වගන්තියේ විධිවිධාන අනුව, මුදල් මණ්ඩලය විසින් 2022 අප්‍රේල් 08 දින පැවැති අංක 11/2022 දරන මුදල් මණ්ඩල රැස්වීමේ දී අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ කටයුතු, ලේකම් දෙපාර්තමේන්තුවට අනුබද්ධිතව අධිපති ලේකම් කාර්යාලය වෙත පැවැරීමටත් 2022 අප්‍රේල් 08 දින සිට බලපැවැත්වෙන පරිදි අධිපති ලේකම් දෙපාර්තමේන්තුව වසා දැමීමටත් අනුමැතිය ලබා දෙන ලදී.

15.5 2022 වසර තුළ අධිපතිතුමා සහභාගී වූ රැස්වීම්

(අ) අධිපතිතුමා සිදු කරන ලද විදෙස් සංචාර

i. 2022 ජනවාරි 04 දින කටාර් මහ බැංකුවේ අධිපති අතිගරු ෂෙයික් බන්ඩාර් බින් මොහොමඩ් බින් සවුද් අල්-තානි සමග පැවති රැස්වීම සඳහා සහභාගී වීම.

ii. 2022 මාර්තු 25 සිට 27 දින දක්වා කාලය තුළ දෝහා කටාර්හි, දෝහා සංසදය සඳහා සහභාගී වීම.

iii. 2022 අප්‍රේල් 17 සිට 24 දින දක්වා කාලය තුළ ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී. සී. හි පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල / ලෝක බැංකු (IMF/WB) වසන්ත සෘතු රැස්වීම් (Spring Meeting) සඳහා සහභාගී වීම.

iv. 2022 ඔක්තෝම්බර් 10 සිට 16 දින දක්වා කාලය තුළ ඇමරිකා එක්සත් ජනපදයේ වොෂින්ටන් ඩී. සී. හි පැවති ජාත්‍යන්තර මූල්‍ය අරමුදල / ලෝක බැංකු (IMF/WB) වාර්ෂික රැස්වීම් සඳහා සහභාගී වීම.

(ආ) අධිපතිතුමා සහභාගී වූ විශේෂ අවස්ථා (දේශීය)

i. 2022 ජනවාරි 18 දින සිනමන් ග්‍රෑන්ඩ් හෝටලයේ දී පැවති ශ්‍රී ලංකා වෘත්තීය බැංකුකරුවන්ගේ සංගමය විසින් සංවිධානය කරන ලද 32 වැනි සංවත්සර සමුළුවේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

ii. 2022 පෙබරවාරි 14 දින ජාතික ආරක්ෂක විද්‍යාලයේ දී "ජාතික ආරක්ෂාවේ අනිවාර්ය අංගයක් ලෙස ආර්ථික ආරක්ෂාව" (Economic Security as an integral part of National Security) යන මැයෙන් පැවති සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

iii. 2022 අප්‍රේල් 28 දින ලංකා වාණිජ මණ්ඩලයේ මාසික රැස්වීමේ ආරාධිත දේශනය පැවැත්වීම.

iv. 2022 මැයි 11 දින සංවර්ධනය වෙමින් පවතින රටවල ණය තිරසාරභාවය පිළිබඳ දක්ෂිණ කලාපීය රටවල් අතර ප්‍රතිපත්තිමය අත්දැකීම් බෙදා හදා ගැනීමේ (South-South Sharing of Policy Experiences) මාර්ගගත රැස්වීමේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

v. 2022 මැයි 25 දින තරුණ ලාංකික ව්‍යවසායකයන්ගේ මණ්ඩලයේ (COYLE) මහා සභා රැස්වීමේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහ ප්‍රධාන දේශක ලෙස සහභාගී වීම.

vi. 2022 මැයි 28 දින කොචින් (Cochin) වාණිජ හා කර්මාන්ත මණ්ඩලය විසින් සංවිධානය කරන ලද මාර්ගගත රැස්වීමේ ආරාධිත දේශක ලෙස සහභාගී වීම.

vii. 2022 ජූනි 03 දින ශ්‍රී ලංකා කෘෂිකාර්මික ආයතනයේ වාර්ෂික මහා සභා රැස්වීමේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

viii. 2022 ජූනි 24 දින කොළඹ ගොල්ෆ් සමාජය විසින් සංවිධානය කරන ලද රාත්‍රී භෝජන රැස්වීමේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

ix. 2022 ජූලි 19 දින කොළඹ සමාජයේ දිවා භෝජන රැස්වීමේ ආරාධිත දේශක ලෙස සහභාගී වීම.

x. 2022 ජූලි 29 දින කැලණිය විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර පරිපාලන ආචාර්ය උපාධියෙහි 7වැනි බඳවා ගැනීමේ සමාරම්භක උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

xi. 2022 අගෝස්තු 31 දින "ශ්‍රී ලංකාව මුහුණ දී ඇති ආර්ථික අර්බුදය සහ ඉන් යථා තත්ත්වයට පත්වීමේ මඟ" යන මැයෙන් ජපාන ප්‍රේක්ෂකයන් සඳහා පැවති මාර්ගගත රැස්වීමේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xii. 2022 සැප්තැම්බර් 15 දින ශ්‍රී ලංකා විදුලි හා යාන්ත්‍රික ඉංජිනේරුවන්ගේ රාත්‍රී භෝජන සංග්‍රහයේ ආරාධිත දේශක ලෙස සහභාගී වීම.

xiii. 2022 සැප්තැම්බර් 20 දින කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) ආදි සිසුන්ගේ උපාය මාර්ගික සංසදයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xiv. 2022 සැප්තැම්බර් 30 දින කොළඹ තේ ව්‍යාපාරිකයන්ගේ සංගමයේ 128 වැනි වාර්ෂික මහා සභා රැස්වීමේ ප්‍රධාන ආරාධිත අමුත්තා සහ ප්‍රධාන දේශක ලෙස සහභාගී වීම.

xv. 2022 ඔක්තෝම්බර් 22 දින කැලණිය විශ්වවිද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ වාර්ෂික රැස්වීමේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

xvi. 2022 ඔක්තෝම්බර් 25 දින "ශ්‍රී ලංකාවේ ආර්ථික තත්ත්වය - ආර්ථික අර්බුදයේ සිට යථා තත්ත්වයට පත්වීම දක්වා ගනු ලැබූ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග" යන මැයෙන් පැවති දේශනයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xvii. 2022 නොවැම්බර් 15 දින බැංකු විදු පියෙස (CBS) විසින් සංවිධානය කරන ලද අයවැය විවරණයෙහි ප්‍රධාන දේශනය පැවැත්වීම.

xviii. 2022 නොවැම්බර් 15 දින ඉදිකිරීම් කර්මාන්තය තුළින් කර්මාන්ත අංශයේ ගැටලු විසඳීම සහ ආර්ථිකය ඉහළ නංවාලීම සඳහා වූ සම්මන්ත්‍රණයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xix. 2022 නොවැම්බර් 19 දින මාතර රාහුල විද්‍යාලය විසින් සංවිධානය කරන ලද ඕල්කට් රාත්‍රියේ (Olcott Night) ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

xx. 2022 නොවැම්බර් 22 දින 2022 වසරේ අන්තර්ජාල දිනය වෙනුවෙන් ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ කර්මාන්ත සම්මේලනය විසින් සංවිධානය කරන ලද උත්සවයෙහි සාමාජිකයෙකු ලෙස සහභාගී වීම.

xxi. 2022 නොවැම්බර් 22 දින ශ්‍රී ලංකා අපනයනකරුවන්ගේ ජාතික මණ්ඩලය විසින් සංවිධානය කරන ලද අයවැය පසු විපරම සම්මන්ත්‍රණයේ සාමාජිකයෙකු ලෙස සහභාගී වීම.

xxii. 2022 නොවැම්බර් 24 දින කොළඹ විශ්වවිද්‍යාලයේ ව්‍යාපාර ආර්ථික විද්‍යා ශිෂ්‍ය සංගමය විසින් සංවිධානය කරන ලද උත්සවයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xxiii. 2022 නොවැම්බර් 25 දින ශ්‍රී ලංකා වෛද්‍ය පරිපාලකවරුන්ගේ විද්‍යාලයේ 29 වැනි වාර්ෂික විද්‍යාත්මක සැසියේ පදවි ප්‍රාප්තිය සහ සමාරම්භක උත්සවයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xxiv. 2022 නොවැම්බර් 26 දින කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයේ (PIM) වාර්ෂික උපාධි ප්‍රධානෝත්සවයේ ප්‍රධාන දේශක ලෙස සහභාගී වීම.

xxv. 2022 නොවැම්බර් 28 දින සී. ටී. සී. එල්. එස්. ඒ. සුරැකුම්පත් (පුද්ගලික) ආයතනය විසින් (CT CLSA Securities (Pvt) Ltd) විදේශ ආයතනික ආයෝජකයන් සඳහා වූ වාර්ෂික ආයෝජක සංසදයේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xxvi. 2022 නොවැම්බර් 30 දින ඉංජිනේරු හා තාක්ෂණ ආයතනය විසින් සංවිධානය කරන ලද "ශ්‍රී ලංකාවේ ආර්ථිකය යථා තත්ත්වය පත්කිරීම සඳහා වූ පෙර දැක්ම" (The Road Map for Economic Recovery of Sri Lanka) පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ ගෞරවනීය ආරාධිතයා ලෙස සහභාගී වීම සහ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xxvii. 2022 දෙසැම්බර් 02 දින ශ්‍රී ලංකා තොරතුරු තාක්ෂණ ආයතනයේ (SLIIT) තිරසාරභාවය සහ ඩිජිටල් ව්‍යාපාර - 2022 පිළිබඳ ජාත්‍යන්තර සම්මන්ත්‍රණයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

xxviii. 2022 දෙසැම්බර් 02 දින වරලත් රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරී (CPFA) සහ ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමයේ (APFASL) 2022 වසරේ වාර්ෂික සමුළුවේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xxix. 2022 දෙසැම්බර් 03 දින බැංකුකරුවන්ගේ මූල්‍ය වෙළඳ සංගමයේ 125 වැනි සංවත්සර උත්සවයේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම.

xxx. 2022 දෙසැම්බර් 05 දින 58 වැනි අග්නිදිග ආසියානු මහ බැංකු සංගමයේ (SEACEN) අධිපතිවරුන්ගේ සම්මේලනයේ මාර්ගගත දේශනය පැවැත්වීම.

xxxi. 2022 දෙසැම්බර් 06 දින 2022 වසරේ ශ්‍රී ලංකා ආර්ථික සමුළුවේ ප්‍රධාන දේශනය පැවැත්වීම.

xxxii. 2022 දෙසැම්බර් 06 දින ආර්ථිකය යථා තත්ත්වයට පත්කිරීම සහ තිරසාර වර්ධනය සඳහා ව්‍යුහාත්මක ප්‍රතිසංස්කරණ පිළිබඳ ඉහළ මට්ටමේ වට මේස සාකච්ඡාව සඳහා සම්බන්ධ වීම.

xxxiii. 2022 දෙසැම්බර් 09 දින ශ්‍රී ලංකා ආර්ථික සංගමයේ වාර්ෂික ජාත්‍යන්තර සමුළුවේ සමාරම්භක සැසියේ ප්‍රධාන ආරාධිත අමුත්තා ලෙස සහභාගී වීම සහ ප්‍රධාන දේශනය පැවැත්වීම.

15.6 උසස් කිරීම්/පත් කිරීම්

i. ටී. එම්. ජේ. වයි. පී. ප්‍රනාන්දු මහත්මිය 2022 දෙසැම්බර් 01 දින සිට ශ්‍රී ලංකා මහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපති ලෙස නම් කරන ලදී.

ii. කේ. එම්. ඒ. එන්. දවුලගල මහත්මිය 2022 ඔක්තෝම්බර් 07 දින සිට නියෝජ්‍ය අධිපති ලෙස උසස් කරන ලදී.

iii. බී. එල්. ජේ. එස්. බාලසූරිය මහතා 2022 පෙබරවාරි 03 දින සිට ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානියෙකු ලෙස මාණ්ඩලික පන්තියේ විශේෂ ශ්‍රේණියට උසස් කරන ලදී.

iv. දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය ආර්. ඒ. ඒ. පෙරේරා මහතා 2022 ජනවාරි 01 දින සිට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2022 අප්‍රේල් 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

v. ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය පී. කේ. ජී. හරිස්චන්ද්‍ර මහතා 2022 ජනවාරි 01 දින සිට දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද, අනතුරුව 2022 අප්‍රේල් 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

vi. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආර්. එම්. සී. එච්. කේ. ජයසිංහ මහත්මිය 2022 ජනවාරි 03 දින සිට බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

vii. අධිපති ලේකම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඩබ්. ආර්. එම්. කේ. ප්‍රනාන්දු මහතා 2022 අප්‍රේල් 08 දින සිට ලේකම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (විශේෂ ව්‍යාපෘති) ලෙස ද, අනතුරුව 2022 අප්‍රේල් 12 දින සිට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී.

viii. සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජී. ඩී. පී. ඩී. ජයතිලක මහතා 2022 අප්‍රේල් 12 දින සිට සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

ix. මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ඩී. ආර්. කරුණාරත්න මහත්මිය 2022 අප්‍රේල් 12 දින සිට විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

x. සන්නිවේදන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ඊ. එච්. මොහොට්ටි මහත්මිය 2022 අප්‍රේල් 12 දින සිට මූල්‍ය බුද්ධි ඒකකයේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xi. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය එච්. කේ. ජේ. ඒකනායක මහත්මිය 2022 අප්‍රේල් 12 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංඛ්‍යාන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xii. විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ආචාර්ය ඒ. ඒ. අයි. එන්. වික්‍රමසිංහ මහත්මිය 2022 අප්‍රේල් 12 දින සිට නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xiii. ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී පී. ඩී. ආර්. දයානන්ද මහතා 2022 අප්‍රේල් 17 දින සිට ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස පත් කරන ලදී.

xiv. නීති හා අනුකූලතා දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ආචාර්ය ඩබ්. ජී. එස්. එස්. ජේ. කීර්තිරත්න මහත්මිය 2022 මැයි 06 දින සිට මූල්‍ය බුද්ධි ඒකකයේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xv. මූල්‍ය බුද්ධි ඒකකයේ අතිරේක අධ්‍යක්ෂ ඩබ්. එම්. ප්‍රියංකර මහතා 2022 මැයි 06 දින සිට ලේකම් දෙපාර්තමේන්තුවේ අතිරේක ලේකම් ලෙස පත් කරන ලදී.

xvi. විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ජී. සී. ඒ. ආරියදාස මහතා 2022 මැයි 06 දින සිට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xvii. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එන්. ඩී. වයි. සී. වීරසිංහ මහතා 2022 මැයි 06 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ලෙස ද, අනතුරුව 2022 දෙසැම්බර් 06 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අධිකාරී ලෙස ද පත් කරන ලදී.

xviii. ජාත්‍යන්තර මෙහෙයුම් දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ඩී. කේ. මායාදුන්න මහත්මිය 2022 මැයි 06 දින සිට අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද, පසුව 2022 ජූනි 15 දින සිට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස ද පත් කරන ලදී. ඉන් අනතුරුව, ඇය 2022 ජූලි 01 දින සිට අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xix. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ආචාර්ය ඊ. ඩබ්. කේ. ජේ. බී. ඇහැලේපොල මහතා 2022 ජූනි 16 දින සිට ආර්ථික පර්යේෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xx. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ එම්. ආර්. විජේවර්ධන මහතා 2022 ජූලි 14 දින සිට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxi. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ කේ. වී. කේ. අල්විස් මහතා 2022 ජූලි 14 දින සිට ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

xxii. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ඩී. එල්. නිහාල් මහතා 2022 ජූලි 14 දින සිට සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.

xxiii. සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ඩබ්. එල්. එස්. ඩබ්. ජයසුන්දර මහත්මිය 2022 ජූලි 14 දින සිට රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ අතිරේක අධිකාරී ලෙස පත් කරන ලදී.

xxiv. තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අතිරේක අධ්‍යක්ෂ එච්. එම්. පී. බී. හේරත් මහතා 2022 ජූලි 14 දින සිට තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ලෙස පත් කරන ලදී.

15.7 මුදා හරිනු ලැබ සිටි නිලධාරීන්

i. 2022 ජනවාරි 01 දින සිට මාණ්ඩලික පන්තියේ IV ශ්‍රේණියේ, ආචාර්ය සී. අමරසේකර මහතා, විකල්ප විධායක අධ්‍යක්ෂ ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

ii. 2022 අප්‍රේල් 08 දින සිට නියෝජ්‍ය අධිපති කේ. එම්. එම්. සිරිවර්ධන මහතා, භාණ්ඩාගාර ලේකම් ලෙස මුදල් අමාත්‍යාංශය වෙත.

iii. 2022 අප්‍රේල් 11 දින සිට මාණ්ඩලික පන්තියේ II ශ්‍රේණියේ (ආයතනික සේවා), එෆ්. ආර්. බන්සජයා මහත්මිය මුදල් අමාත්‍යාංශය වෙත.

iv. 2022 අප්‍රේල් 11 දින සිට කළමනාකරණ සහකාර පන්තියේ II ශ්‍රේණියේ (නැවත ශ්‍රේණිගත කරන ලද) එම්. ජී. අශෝක මහතා මුදල් අමාත්‍යාංශය වෙත ද, අනතුරුව 2022 ජූනි 01 දින සිට නැවත මහ බැංකුව වෙත.

v. 2022 සැප්තැම්බර් 12 වන දින සිට මාණ්ඩලික පන්තියේ I ශ්‍රේණියේ (ආයතනික සේවා) එම්. ඉසෙඩ්. එන්. හනීෆා මහත්මිය පරිපාලන සහකාරවරියක් ලෙස ජාත්‍යන්තර මූල්‍ය අරමුදල වෙත.

15.8 විශ්‍රාම ගැනීම්/ සේවයෙන් ඉල්ලා අස්වීම්

2022 වසර තුළ දී, නියෝජ්‍ය අධිපතිවරයෙක්, සහකාර අධිපතිවරයෙක්, ජ්‍යෙෂ්ඨ දෙපාර්තමේන්තු ප්‍රධානියෙක්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්තිදෙනෙක්,අතිරේකදෙපාර්තමේන්තු ප්‍රධානීන් දෙදෙනෙක් සහ නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානීන් දෙදෙනෙක් ඇතුළුව සේවකයින් 42 දෙනෙකු බැංකු සේවයෙන් විශ්‍රාම ගනු ලැබීය. දෙපාර්තමේන්තු ප්‍රධානියෙක්, නියෝජ්‍ය දෙපාර්තමේන්තු ප්‍රධානියෙක් සහ කොන්ත්‍රාත් සේවකයන් තිදෙනෙක් ඇතුළුව සේවකයන් 51 දෙනෙකු බැංකු සේවයෙන් ඉල්ලා අස්විය.

16. තොරතුරු තාක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා උසස් ප්‍රමිතියෙන් යුතු ඒකාබද්ධ මෘදුකාංග සපයමින් තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව (තො.තා.දෙ.) එහි ක්‍රියාකාරී කාර්යභාරය අඛණ්ඩව සිදු කරන ලදී. තො.තා.දෙ. විසින් ව්‍යවසාය මට්ටමේ ඒකාබද්ධ තොරතුරු තාක්ෂණ විසඳුම් සහ ආයතනික සේවා සපයන අතරම, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සඳහා ආරක්ෂාව අඛණ්ඩව වැඩි දියුණු කරන ලදී.

වසර තුළ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව විසින් පහත සඳහන් ප්‍රධාන ක්ෂේත්‍ර යටතේ සිය සේවාවන් සපයන ලදී. (අ) පිරිවැය-ඵලදායී මෘදුකාංග විසඳුම් ලබා දීම, (ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම, (ඇ) අති නවීන මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් පිහිටුවීමට දායක වීම, (ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම සහ (ඉ) තොරතුරු තාක්ෂණ සේවා කවුළු සහාය සහ කාර්ය මණ්ඩලයේ නිපුණතා වැඩිදියුණු කිරීම.

(අ) පිරිවැය-ඵලදායී මෘදුකාංග විසඳුම් ලබා දීම

අපනයන ආදායම නැවත මෙරටට ගෙන්වා ගැනීම සහ එම අපනයන ආදායම ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අධීක්ෂණය කිරීම සඳහා විදේශ විනිමය දෙපාර්තමේන්තුවට (DFE) පහසුකම් සැලසීම සඳහා තො.තා.දෙ. විසින් අපනයන ආදායම් අධීක්ෂණ පද්ධතියක් (EPMS) නිර්මාණය කරන ලදී. මෙම පද්ධතිය මගින් ශ්‍රී ලංකා රේගුවෙන් භාණ්ඩ අපනයනයට අදාළ දත්ත දෛනික පදනමින් ග්‍රහණය කර ගන්නා අතර, බලපත්‍රලාභී වාණිජ බැංකු (LCBs) මගින් සතිපතා ලබාගත් අපනයන ආදායම ආපසු ගෙන්වා ගැනීමේ දත්ත සමග ගැලපීම සිදු කරයි. තවද, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් වාර්තා කරන ලද සේවා අපනයනය සඳහා ලැබෙන ආදායම ආපසු ගෙන්වා ගැනීම සම්බන්ධ දත්ත ද මෙම දත්ත පද්ධතිය ග්‍රහණය කරයි. මෙම පද්ධතිය මගින් එකතු කර ගත් දත්ත හොඳින් විශ්ලේෂනය කර නියාමනය සඳහා අවශ්‍ය වාර්තා සකස් කිරීමට සහ දත්ත මත පදනම් වූ නියාමන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට විදේශ විනිමය දෙපාර්තමේන්තුවට පහසුකම ලැබී ඇත.

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (LSBs) හි ගනුදෙනුකරුවන්ගේ දේශසීමා විදේශ මුදල් ගනුදෙනු පිළිබඳ දත්ත රැස් කිරීම සඳහා තො.තා.දෙ. විසින් සංවර්ධනය කරන ලද ජාත්‍යන්තර ගනුදෙනු වාර්තාකරණ පද්ධතිය (ITRS) තවදුරටත් වැඩිදියුණු කරන ලදී. මීට අමතරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මෙහෙයුම් සහ ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලිය වැඩිදියුණු කිරීම සඳහා දේශසීමා ගනුදෙනු දත්ත විශ්ලේෂණය කිරීමට උපකරණ පුවරු සකස් කරන ලදී. තවද, තො.තා.දෙ. විසින් ITRS හි සුමට ක්‍රියාකාරිත්වය සහතික කිරීම සඳහා LCBs සහ LSBs වෙත තාක්ෂණික සහාය අඛණ්ඩව ලබා දුන්නේය.

මූල්‍ය ආයතනවල අඛණ්ඩ අධීක්ෂණය සහ විභාග ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා, ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට (SLFRS-9) අනුකූලව මූල්‍ය තොරතුරු වාර්තා කිරීම සඳහා FinNet පද්ධතිය (LCBs, LSBs සහ බලපත්‍රලාභී මූල්‍ය සමාගම් වෙතින් නියාමන දත්ත රැස් කිරීමේ පද්ධතිය) තවදුරටත් වැඩිදියුණු කරන ලදී.

නිරාකරණ සහ බලාත්මක කිරීමේ දෙපාර්තමේන්තුව (RED) සඳහා සියලුම බැංකු සහ මූල්‍ය සමාගම් වෙතින් නියමිත කාල පරතරයන්හිදී දත්ත රැස් කිරීම සඳහා තැන්පත්කරුවන්ගේ දත්ත එකතු කිරීමේ පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී. මෙම පද්ධතිය මොඩියුල තුනකින් සමන්විත වේ. එනම්, මූල්‍ය ආයතන සතු මහ බැංකුවට අවශ්‍ය තැන්පතු දත්ත වලංගු කිරීමට සහ ඉදිරිපත් කිරීමට හැකි වලංගු කිරීමේ මෙවලම, ඉදිරිපත් කරන ලද දත්තවල සාරාංශ තොරතුරු ලබා ගැනීමට RED සඳහා වන වෙබ් අතුරු මුහුණත සහ නියමිත කාල පරතරයන්හිදී FinNet හරහා නියාමන වාර්තා ඉදිරිපත් කිරීමේ මොඩියුලය වේ.

සේවක අර්ථසාධක අරමුදල් දෙපාර්තමේන්තුව (EPFD) විසින් සිදුකරන මෙහෙයුම් කිහිපයක් ස්වයංක්‍රීය කිරීමට තො.තා.දෙ. තවදුරටත් පහසුකම් සලසා ඇත. අන්තර්ජාලය හරහා මෙන්ම අදාළ බැංකු කවුන්ටර හරහා සිදු කරන ලද සේවායෝජකයාගේ ගෙවීම් ප්‍රතිසන්ධානය කිරීම, ප්‍රතිලාභ මුදල් ගෙවීම් මුදා හැරීමට පෙර එම ගෙවීම්වලට අදාළ ශේෂ පිරික්සුම පරීක්ෂා කිරීම, අදාළ බැංකු හරහා ප්‍රතිලාභ මුදල් ගෙවීම් සැකසීම, වීසා බලපත්‍ර අරමුණු සඳහා විද්‍යුත් ලේඛන නිකුත් කිරීම, වසර තුළ ස්වයංක්‍රීය කරන ලද ක්‍රියාවලි කිහිපයකි.

ව්‍යවහාර මුදල් දෙපාර්තමේන්තුවේ (CRD) මුදල් කවුන්ටර ක්‍රියාකාරිත්වය, අවශ්‍ය සියලුම වාර්තා සමග මුදල් කළමනාකරණ පද්ධතියට (CIMS) සම්පූර්ණයෙන්ම ඒකාබද්ධ කරන ලද අතර, එමගින් කඩදාසි භාවිතය අවම කරන ලදී. තවද, CRD සඳහා නව ව්‍යාජ නෝට්ටු හඳුනාගැනීමේ පද්ධතියක් සකස් කරන ලදී. මෙම පද්ධතිය මගින් මහ බැංකුව විසින් උසාවි නඩු සඳහා සපයන සියලුම තොරතුරු වාර්තා කරනු ලබන අතර, අනාගත අධිකරණ නඩු සඳහා විමර්ශන මූලාශ්‍ර ලබා දීම පහසු වේ. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව (RDD) විසින් ක්ෂුද්‍ර, කුඩා සහ මධ්‍යම අංශයේ ව්‍යවසායන් වෙත බැංකු හරහා ප්‍රදානය කරන ලද ප්‍රතිමූල්‍යකරණය, පොළී සහනාධාර සහ ණය සහතික

යෝජනා ක්‍රම ණය පහසුකම් කළමනාකරණය කිරීමේ පද්ධතියක් තො.තා.දෙ. විසින් නිර්මාණය කරන ලදී. මෙම ක්‍රමය මඟින් ණය සැකසීම ක්‍රමවත් කිරීමටත්, ඵලදායිතාව සහ කාර්යක්ෂමතාව වැඩි කිරීමටත් අපේක්ෂා කෙරේ. ඉහත පද්ධතියේ ප්‍රතිමූල්‍යකරණ මොඩියුලය සජීවීව ක්‍රියාත්මක කරන ලද අතර අනෙකුත් මොඩියුලවල නිර්මාණ කටයුතු සිදු වෙමින් පවතී.

භාණ්ඩාගාරයේ මුදල් අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩාගාර බැඳුම්කර වෙන්දේසි පද්ධතිය තුලින් පළමු අදියරේදී සම්පූර්ණයෙන්ම පිළිගන්නා ලද භාණ්ඩාගාර බැඳුම්කර, සෘජු නිකුතු කවුළුවක් හරහා නිකුත් කිරීමේ පහසුකම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව (PDD) වෙත ලබා දෙන ලදී.

මහ බැංකුව තුළ තොරතුරු තාක්ෂණ වත්කම්වල ජීව කාලය කාර්යක්ෂම හා ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ ස්ථාවර වත්කම් සඳහා තොග කළමනාකරණ මෘදුකාංග පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී.

මාණ්ඩලික සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව (SSMD) විසින් සිදු කරනු ලබන කාර්ය මණ්ඩල ණය සැකසීමේ කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා තො.තා.දෙ. විසින් කාර්ය මණ්ඩල ප්‍රතිලාභ යෝජනා ක්‍රමය (SBS) සඳහා නව සහ වැඩිදියුණු කළ වෙබ් පාදක ණය ප්‍රදානය කිරීමේ පද්ධතියක් සකස් කරන ලද අතර කාර්ය මණ්ඩලය සඳහා නව සහ වැඩිදියුණු කළ නිවාස ණය ප්‍රදානය කිරීමට පද්ධතියක් ද (SHL) සකස් කිරීම ආරම්භ කරන ලදී.

විගණන උපදේශක කමිටුවේ (AAC) නිර්දේශ පරිදි අභ්‍යන්තර වැඩ ප්‍රවාහ ස්වයංක්‍රීය කරන කාර්ය විමසුම් පද්ධතිය (Task Tracker System) නව කාර්ය ප්‍රවාහයක් ඇතුළත් කිරීම සඳහා ප්‍රතිසංස්කරණය කරන ලදී.

ඉහත සඳහන් කර ඇති සම්පූර්ණ කරන ලද ව්‍යාපෘතිවලට අමතරව, මහ බැංකුවේ මෙහෙයුම් සඳහා වැදගත් වන තවත් නව පද්ධති සහ වැඩිදියුණු කිරීම් කිහිපයක් තො.තා.දෙ. විසින් කරන ලදී.

ISO 20022 SWIFT MX සංක්‍රමණය සඳහා වන SWIFT මාර්ගෝපදේශයන්ට අනුකූල වීම සඳහා, මහ බැංකුවේ පොදු ලෙජර පද්ධතිය වන iGLAS හි බාහිර පණිවිඩ සඳහා දැනට පවතින SWIFT MT පණිවිඩ ආකෘති ISO 200022 MX පණිවිඩ ආකෘති බවට පරිවර්තනය කිරීම සාර්ථකව පරීක්ෂා කරන ලදී. තො.තා.දෙ. විසින් මහ බැංකුවේ දෙපාර්තමේන්තු වල විශේෂ දත්ත අවශ්‍යතා සඳහා දත්ත ලබා දෙන අතර මෘදුකාංග පද්ධති සහ ඒ ආශ්‍රිත ක්‍රියාවලි සම්බන්ධයෙන් සිදු කරන ලද විගණන ක්‍රියාවලීන් සඳහා ද පහසුකම් සපයන ලදී.

තවද, තො.තා.දෙ. විසින් දෙපාර්තමේන්තු කිහිපයක භෞතික ලේඛන ඩිජිටල්කරණ ක්‍රියාවලීන් සම්පූර්ණ කරමින්, ලේඛන හැසිරවීමට අදාළ පුද්ගල ඵලදායිතාව වැඩි කරමින් ලේඛන කළමනාකරණ පද්ධතියේ (DMS) භාවිතය තවදුරටත් පුළුල් කළේය.

(ආ) තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් අඛණ්ඩව වැඩිදියුණු කිරීම

බැංකුවේ භාවිතා වන සියලු තොරතුරු තාක්ෂණ පද්ධති නවීන තාක්ෂණික සංවර්ධනයන්ට ඔරොත්තු දෙන පරිදි, තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් වසර තුළදී නඩත්තු කරන ලදී.

විදුලි සංදේශ කර්මාන්ත සංගමය (TIA) 942 Rated-3 ප්‍රමිතියට අනුකූල වන පරිදි තො.තා.දෙ. විසින් නව ප්‍රධාන කාර්යාල දත්ත මධ්‍යස්ථානය ඉදිකිරීම අවසන් කරන ලදී. මෙය පරිගණක උපකරණ සඳහා සේවා සපයන, අතිරික්ත ධාරිතා සංරචක සහ බහු ස්වාධීන බෙදාහැරීමේ මාර්ග ඇති දත්ත මධ්‍යස්ථානයකි.

ඉහත නව දත්ත මධ්‍යස්ථානය සමඟින්, අධිවේගී ප්‍රකාශ තන්තු (fibre) සහ ගිගාබිට් ඊතර්නෙට් (Gigabit Ethernet) හරහා අවසාන පරිශීලකයා දක්වා මූල බන්ධකය (backbone) පුළුල් කරමින් ප්‍රධාන කාර්යාල ගොඩනැගිල්ලේ තත් ප්‍රදේශ ජාලය (Local Area Network) වැඩිදියුණු කිරීමට තො.තා.දෙ. සැලසුම් කර ඇත.

(ඇ) අති නවීන මූල්‍ය වෙළෙඳපොළ යටිතල පහසුකම් ස්ථාපිත කිරීමට දායක වීම

වසර තුළ ජාතික මට්ටමේ තොරතුරු තාක්ෂණ ව්‍යාපෘති කිහිපයකට තො.තා.දෙ. විසින් තාක්ෂණික විශේෂඥතාව ලබා දෙන ලදී.

තො.තා.දෙ. විසින් ජාතික ගෙවීම් සහ පියවීම් පද්ධති නවීකරණ ව්‍යාපෘතියට දායක වූයේ පද්ධති ක්‍රියාවට නැංවීමේ විෂය පථය සැලසුම් කිරීම සහ පරීක්ෂා කිරීමේ අදියරවලදී ක්‍රියාකාරී මැදිහත්වීමෙනි.

(ඈ) තොරතුරු තාක්ෂණ ආරක්ෂාව සහ ඔරොත්තු දීමේ හැකියාව ශක්තිමත් කිරීම

තො.තා.දෙ., බැංකුවේ සියලුම තොරතුරු තාක්ෂණ වත්කම් සුරක්ෂිත කිරීමට පියවර ගත් අතර බැංකුවේ සියලුම සේවකයින් සඳහා ආරක්ෂිතව නිවසේ සිට රාජකාරි කිරීමේ (WFH) පරිසරයක් සඳහා අවශ්‍ය පරිදි පහසුකම් සැලසීය. මහ බැංකුවේ තොරතුරු සුරක්ෂිතතාව ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන ලේඛනය වන තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තිය නිවසේ සිට වැඩ කිරීමේ ප්‍රතිපත්තිය සහ ලැප්ටොප් භාවිත ප්‍රතිපත්තිය ඇතුළත් කරමින් යාවත්කාලීන කරන ලදී.

මෘදුකාංග යෙදුම්වල අභ්‍යන්තරව සිදු කරනු ලබන නිරන්තර අවදානම් තක්සේරු (Vulnerability Assessment) කිරීම්වලට අමතරව, ඕනෑම සයිබර් ආරක්ෂණ තර්ජනයක් සඳහා පද්ධති හොඳින් සූදානම් බව සහතික කිරීම සඳහා මූල්‍ය පණිවුඩකරණ ජාලය ආශ්‍රිත තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් පිළිබඳ අවදානම් තක්සේරුවක් ද සිදු කරන ලදී. ඉහළ මට්ටමේ ආරක්ෂාවක් සහතික කිරීම සඳහා මූල්‍ය පණිවිඩ ජාලය සහ අනෙකුත් තීරණාත්මක මෙහෙයුම් පද්ධති ඉලක්ක කර ගනිමින් බාහිර තොරතුරු ආරක්ෂණ තක්සේරුවක් ද සිදු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයන්ට අලුතින් හඳුන්වා දුන් ආරක්ෂක ප්‍රතිපත්ති, දත්ත වර්ගීකරණය සහ දත්ත උපස්ථ ක්‍රම (data backup methods) පිළිබඳව දැනුම සහ මග පෙන්වීම ලබා දීම සඳහා අතථ්‍ය පරිශීලක දැනුවත් කිරීමේ වැඩසටහන් ක්‍රියාත්මක කරන ලදී. තතුබෑම් (phishing) ඊමේල් හඳුනා ගැනීම පිළිබඳ පරිශීලක දැනුවත්භාවය වැඩි දියුණු කිරීම සඳහා තතුබෑම් අනුකරණ සිදු කරන ලදී.

(ඉ) තොරතුරු තාක්ෂණ සේවා කවුළු සහාය සහ කාර්ය මණ්ඩලයේ නිපුණතා වැඩිදියුණු කිරීම

නිවසේ සිට රාජකාරී කිරීම සඳහා තො.තා.දෙ. මගින් සහය ලබා දුන් අතර, බැංකුවේ දෛනික මෙහෙයුම් දිගටම අඛණ්ඩව කරගෙන යාමට එනිසා හැකි විය. තවද පද්ධති වෙත ආරක්ෂිතව ප්‍රවේශ වීමේ අවස්ථාව සහතික කරමින් මෘදුකාංග භාවිතය පිලිබඳ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රයේ පිළිගත් ප්‍රශස්ත ක්‍රමවේද භාවිත කිරීමට සේවකයන්ට අවස්ථාව සලසන ලදී. විවිධ අභියෝග මධ්‍යයේ තො.තා.දෙ. අභ්‍යන්තර තාක්ෂණික සේවා කවුළුව (Help desk) සියලුම සේවා විමසුම් සඳහා එකවර සහය ලබා දීමට සමත් වූ අතර තොරතුරු තාක්ෂණ ප්‍රමිතීන්ට සමගාමීව තීරණාත්මක යටිතල පහසුකම් (99.5% ට වැඩි) ඉහළ මට්ටමක පවත්වා ගෙන ගියේය.

කාර්ය මණ්ඩලයේ තොරතුරු තාක්ෂණ නිපුණතා නංවාලීම සඳහා සහ බැංකුව තුළ වඩාත් තාක්ෂණික දැනුමක් ඇති සහ නව අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමේ හැකියාවැති සේවක ප්‍රජාවක් ඇති කිරීම සඳහා, තො.තා.දෙ. විසින් දැනුම්වත් කිරීමේ බැනර් අන්තර්ජාලයේ ප්‍රකාශයට පත් කිරීම සහ කාර්ය මණ්ඩලය වෙත විද්‍යුත් තැපෑල හරහා ආරක්ෂක උපදේශන ඇඟවීම් බෙදා හැරීම අඛණ්ඩව සිදු කරන ලදී.

මීට අමතරව, තො.තා.දෙ. හි කාර්ය මණ්ඩලය, බැංකුවේ තොරතුරු තාක්ෂණ පද්ධතිවල සහ අදාළ යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය ඉහළ නැංවීම සඳහා අවශ්‍ය තොරතුරු තාක්ෂණ දියුණුව පිළිබඳ ඔවුන්ගේ කුසලතා සහ දැනුම වැඩිදියුණු කිරීම සඳහා දේශීය හා ජාත්‍යන්තර අතථ්‍ය වැඩමුළු සහ සම්මන්ත්‍රණ සඳහා ක්‍රියාකාරීව සහභාගී වූහ.

17. අභ්‍යන්තර විගණන

ශ්‍රී ලංකා මහ බැංකුවේ අභ්‍යන්තර විගණන කටයුතු 1951 වසරේ සිට ක්‍රියාත්මක වේ. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අරමුණ සහ මෙහෙවර, කාර්ය වපසරිය, අධිකාරී බලය, වගකීම, ස්වාධීනත්වය සහ වාස්තවිකත්වය, මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර විගණන අධිකාරී පත්‍රයේ අන්තර්ගතව ඇත. විගණන කටයුතු සිදු කිරීමේ දී අභ්‍යන්තර විගණකවරුන්ගේ ආයතනයේ අන්තර්ජාතික වෘත්තීය පරිචය රාමුව (International Professional Practices Framework of Institute of Internal Auditors) අනුගමනය කරනු ලබයි. 2022 වසර තුළ දී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

17.1 අභ්‍යන්තර විගණන සැලසුම්

2023-2026 සඳහා උපාය මාර්ගික විගණන සැලැස්ම සහ 2023 වසර සඳහා වාර්ෂික විගණන සැලැස්ම සකස් කොට 2022 දෙසැම්බර් මස අග දී මුදල් මණ්ඩල අනුමැතිය ලබා ගන්නා ලදී.

17.2 විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීම

(අ) ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති විගණනයන්

2022 වසරේ දී, ක්‍රියාවලි සහ තොරතුරු පද්ධති විගණනයන් සිදු කරන ලදී. සෑම විගණනයක්ම පිළිවෙලින් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම, විගණන ප්‍රතිඵල සන්නිවේදනය සහ විගණන නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාල පසු විපරම් කිරීම යන පියවර හතරකින් ක්‍රියාත්මක කරන ලදී. විගණන වාර්තා හතළිස් හතක් (47) වසර තුළ දී නිකුත් කර ඇති අතර ප්‍රතිපත්ති, අනුකූලතා, මෙහෙයුම්, නෛතික සහ වෙනත් අදාල අවදානම් ආවරණය කරමින් විගණන නිරීක්ෂණයන් සහ නිර්දේශයන් සමග අදාල දෙපාර්තමේන්තු වෙත සන්නිවේදනය කරන ලදී.

(ආ) ප්‍රගතිය වාර්තා කිරීම

විගණන පැවරුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය මුදල් මණ්ඩලයට සහ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවට වාර්තා කරන ලදී. එමෙන්ම කරන ලද විගණනයන්හි වාර්තා මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව හරහා ජාතික විගණන කාර්යාලයේ විගණන අධිකාරීට ඉදිරිපත් කරන ලදී. තව ද 2018 අංක 19 දරණ ජාතික විගණන පනතට අනුකූලව සහ මුදල් අමාත්‍යාංශයේ ඉල්ලීම පරිදි අභ්‍යන්තර විගණන වාර්තාවල අන්තර්ගතයන් මුදල් අමාත්‍යාංශයේ, කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් වෙත ඉදිරිපත් කරන ලදී.

17.3 තත්ත්වය ඇගයීමේ සහ වැඩිදියුණු කිරීමේ වැඩසටහන්

වර්ෂය තුළ දී විගණන කටයුතු පිළිබඳ අඛණ්ඩ ප්‍රගති අධීක්ෂණයන් (Ongoing Monitoring of Performance) සහ කාලානුරූප ස්වයං තක්සේරුකරණයන් (Periodic Self-Assessment) සිදු කරන ලද අතර ඒවායේ ප්‍රතිඵලයන් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව හරහා මුදල් මණ්ඩලයට වාර්තා කරන ලදී.

17.4 ධාරිතා ඉහළ නැංවීම සහ දැනුවත් කිරීම

අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ නිලධාරීන් සඳහා අදාල විවිධ විෂය පථයන් සම්බන්ධව ධාරිතා ඉහළ නැංවීමේ වැඩසටහන් වසර තුළ දී ක්‍රියාත්මක කරන ලදී. තව ද විගණන සම්බන්ධීකරණ නිලධාරීන් සඳහා "අභ්‍යන්තර විගණන පහසුකම් සැපයීමේ මාර්ගෝපදේශ මාලාව" පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහනක් අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් 2022 වසරේ පළමු කාර්තුවේ දී සිදු කරන ලදී. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ කාර්ය මණ්ඩලයේ ප්‍රයෝජනය සඳහා තොරතුරු පද්ධති විගණන වෘත්තිකයෙකු විසින් ආරාධිත දේශනයක් සිදු කරන ලදී.

17.5 මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව සඳහා පහසුකම් සැලසීම

මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුව මුදල් මණ්ඩලයේ අනු කමිටුවක් වන අතර මූල්‍ය වාර්තාකරණය, අභ්‍යන්තර පාලන, අභ්‍යන්තර විගණන, බාහිර විගණන සහ මුදල් මණ්ඩලය විසින් පැවරූ වෙනත් කරුණු මත මුදල් මණ්ඩලයට උපදෙස් දීම එමගින් සිදු කරයි. මුදල් මණ්ඩලයේ ලේකම් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ද ලේකම් ලෙස කටයුතු කරයි. අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ සහකාර ලේකම් ලෙස කටයුතු කරයි. ඒ අනුව, අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ ලේඛන කටයුතු සඳහා පහසුකම් සැලසීම සිදු කරයි. තව ද මෙම කාලපරිච්ඡේදය තුළ දී මුදල් මණ්ඩල උපදේශන විගණන කමිටුවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට අදාල පසු විපරම් කිරීම ද කාලානුරූපව සිදු කරන ලදී.

18. ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු

1949 අංක 58 දරණ මුදල් නීති පනතේ විධිවිධාන ප්‍රකාරව, නිල විදේශ විනිමය සංචිත කළමනාකරණ සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් අධීක්ෂණ කාර්යයන් විධිමත්ව හා සුමටව ක්‍රියාත්මක කිරීමේ කාර්යභාර්ය ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

18.1 ජාත්‍යන්තර සංචිත කළමනාකරණය

ජාත්‍යන්තර සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුවේ (IRIOC) පුළුල් මගපෙන්වීම යටතේ සකස් කර, මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශය (Investment Policy Statement) සහ ආයෝජන මාර්ගෝපදේශයන්ට (Investment Guideline) අනුකූලව, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ සංචිත කළමනාකරණ කටයුතු සිදු කරනු ලැබේ. වත්කම් හා වගකීම් ව්‍යුහයට අනුකූලව ගොඩනැගූ විද්‍යාත්මක රාමුවක් මත පදනම්ව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2016 වසරේ සිට විදේශ සංචිත කළමනාකරණය සිදු කරනු ලබන අතර, මෙම විද්‍යාත්මක රාමුව ගොඩනැගීමේදී, ශ්‍රී ලංකා මහ බැංකුවේ අවධානම දැරීමේ සීමාවන්ට යටත්ව, ද්‍රවශීලතා අවශ්‍යතා, ප්‍රාග්ධන සංරක්ෂණය සහ ආදායම් උත්පාදනය යන කරුණු ප්‍රධාන වශයෙන් සැලකිල්ලට ගැනුණි.

2022 වසර ඉතිහාසයේ වඩාත් ම අභියෝගාත්මක වසර සනිටුහන් කළ අතර, එම වසර තුළ දී ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට සිය සම්මත සංචිත කළමනාකරණ මෙහෙයුම් කටයුතු සීමා කරමින්, වඩාත් කාලානුරූපී සහ අවස්ථානුකූල වූ විශේෂිත ප්‍රවේශයන් අනුගමනය කිරීමට සිදු විය. 2020 වසරේ සිට පැන නැගුණු පෙර නොවූ විරූ ආකාරයේ විදේශ විනිමය ද්‍රවශීලතා අර්බුදය මෙන් ම, ගෝලීය වශයෙන් ඇති වූ විවිධ අහිතකර තත්ත්වයන් හේතුවෙන් 2021 මැද භාගයේ සිට සාම්ප්‍රදායික සංචිත කළමනාකරණ අරමුණු වෙනස් මානයකට යොමු කෙරිණි. විදේශ මුදල් ද්‍රවශීලතාවයේ උග්‍ර හිඟයක් ඇතිවීම මෙරට ප්‍රමුඛත ම ප්‍රශ්නයක් බවට පත්වීමත් සමග, ශ්‍රී ලංකාවට දැඩි අභියෝගවලට මුහුණ දීමට සිදු විය.

මූලික වශයෙන් ඉන්ධන, ඉවුම් කටයුතු සඳහා භාවිතා කරන ගෑස් සහ ගල් අඟුරු යන අත්‍යවශ්‍ය ද්‍රව්‍යවල ඇතිවූ දැඩි හිඟයන් සමග, 2021 වසරේ සිට මෙම විදේශ විනිමය ද්‍රවශීලතා හිඟය අතිශය අර්බුදකාරී තත්ත්වයකට පත් වූ අතර, 2022 පළමු කාර්තුව අවසන් වන විට එම තත්ත්වය පෙර නොවූ විරූ මට්ටමකට උග්‍ර විය. මෙම තත්ත්වය යටතේ, ශ්‍රී ලංකා මහ බැංකුවට විදේශ විනිමය අර්බුදය පාලනය කිරීම උදෙසා විශේෂිත ක්‍රියාමාර්ග භාවිත කිරීමටත්, අත්‍යවශ්‍ය ආර්ථික ක්‍රියාකාරකම් අවම වශයෙන් හෝ පවත්වා ගනු පිණිස අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා අවශ්‍ය විදේශ විනිමය සපුරාලීම සඳහා හිඟ විදේශ සංචිත ප්‍රශස්ත ලෙස යෙදවීමටත් සිදුවිය. අත්‍යවශ්‍ය අවශ්‍යතා සපුරා ගැනීම සම්බන්ධයෙන් දැඩි පීඩනකාරී තත්ත්වයන් සහ දැවැන්ත මහජන විරෝධයක් නැගෙමින් තිබිය දී, අතිශය සීමිත හා ශීඝ්‍රයෙන් අඩුවෙමින් පැවති විදේශ සංචිතවලට සාපේක්ෂව විදේශ මුදල් ඉල්ලුම කළමනාකරණය කිරීම, මහ බැංකුවේ සංචිත කළමනාකරණ කණ්ඩායමට දැඩි අසීරු කාර්යයක් වූ අතර, විදේශ සංචිත කළමනාකරණයේ සම්පූර්ණ අවධානය ද්‍රවශීලතා කළමනාකරණය වෙත යොමු විය. 2022 අප්‍රේල් මාසයේ දී ණය ප්‍රතිව්‍යුහගත කිරීම සඳහා ප්‍රවේශය ප්‍රකාශයට පත් කිරීමත් සමග, විදේශ විනිමය උපයෝගී කරගත යුතු ණය පියවීම, බහුපාර්ශ්වික සංවිධානවලින් ලබාගත් ණය පියවීම සඳහා පමණක් සීමා කෙරිණි.

එසේ වුව ද, සම්මත සංචිත කළමනාකරණ පිළිවෙත්වලින් බැහැරව කාලානුරූපී සහ අවස්ථානුකූලව විශේෂිත පියවර අනුගමනය කිරීමට මහ බැංකුවට සිදු විය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, වසර අවසානයේ දී විදේශ මුදල් සඳහා පැවති දැඩි ඉල්ලුම ක්‍රමයෙන් අඩුවීමක් නිරීක්ෂණය කල හැකි හැකි වූ අතර, දේශීය වෙළෙඳපොළේ විදේශ මුදල් ද්‍රවශීලතාවයේ කැපී පෙනෙන වර්ධනයක් දැකිය හැකි විය.

18.2 කාර්යසාධන විශ්ලේෂණය හා පහසුකම් සැලසීමේ ක්‍රියාකාරකම්

විදේශ සංචිත මට්ටම්වල තියුණු පහත වැටීමක් තිබියදීත්, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සුපුරුදු පරිදි දෛනිකව, මහ බැංකුව විසින් කළමනාකරණය කෙරෙන සංචිත සහ දළ නිල සංචිත සම්පාදනය කළ අතර උපලබ්ධි ප්‍රතිලාභ ප්‍රවේශය මත පදනම්ව සංචිත කළමනාකරණ ක්‍රියාකාරකම්වල කාර්යසාධනය තක්සේරු කළේය. සංචිත කළමනාකරණයේ කාර්යසාධනය විදේශ සංචිත ආයෝජන අධීක්ෂණ කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත පිළිවෙලින් මාසික සහ කාර්තුමය පදනමින් ඉදිරිපත් කළ අතර, එහිදී සංචිත කළමනාකරණය හා සම්බන්ධ ගැටළු පිළිබඳව සාකච්ඡා කරන ලදී.

නිල සංචිත ගොඩනගා ගන්නා තෙක්, කෙටි කාලීන විදේශ විනිමය ද්‍රවශීලතාවය තුළින් හෝ නිල සංචිත සඳහා යම් සහායක් ලබා ගැනීමේ අදහසින් ඉන්දියානු සංචිත බැංකුව, බංග්ලාදේශ බැංකුව සහ චීන මහජන බැංකුව යන කලාපීය මහ බැංකු සමග ද්වීපාර්ශවික මුදල් හුවමාරු ගිවිසුම් කිහිපයක් ඔස්සේ විදේශ අරමුදල් සලසා ගැනීම සඳහා පියවර ගැනුණි. ඉන්දියානු සංචිත බැංකුව විසින් සපයන ලද ද්වීපාර්ශවික මුදල් හුවමාරු පහසුකම දෙවන වර ලබා ගැනීම 2022 ජනවාරි මාසයේදී සිදු කළ අතර, බංග්ලාදේශ බැංකුව විසින් 2021

අගෝස්තු/සැප්තැම්බර් මාසවල දී සපයන ලද සහ දෙවරක් අලුත් කරන ලද ද්විපාර්ශවික මුදල් හුවමාරු පහසුකම, 2022 දී තවදුරටත් අලුත් කරන ලදී. චීන මහජන බැංකුව සමග සිදු කරන ලද ද්විපාර්ශවික මුදල් හුවමාරු පහසුකම තවත් මාස දොළහක කාලයක් සඳහා අලුත් කරන ලදී.

මේ අතර, අතිශය අභියෝගාත්මක ගෝලීය සහ දේශීය විදේශ විනිමය වෙළෙඳපොළ තත්ත්වයන් මධ්‍යයේ වුව ද, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී සක්‍රීය විදේශීය ගණුදෙනුකරුවන්ගේ මුදල් විශුද්ධිකරණයට එරෙහි හා ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ පිළිපැදීම් අනුකූලතාවන්ට අදාළ වාර්ෂික ඇගයීම සිදු කරන ලදී.

පෙර පැවති භාණ්ඩාගාර කළමනාකරණ පද්ධතියේ බලපත්‍රය කල් ඉකුත් වූ පසු, මහ බැංකුව විසින් 2022 වසරේ දී නව සංචිත කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක කරන ලදී. නව සංචිත කළමනාකරණ පද්ධතියෙහි ප්‍රධාන පරිශීලකයා ලෙස, අනෙකුත් පරිශීලක දෙපාර්තමේන්තු සහ මෘදුකාංග සපයන්නා අතර නිසි සම්බන්ධීකරණයක් සහතික කරන අතර ම, මෙම සංචිත කළමනාකරණ පද්ධතියෙහි පද්ධති පරිපාලන ක්‍රියාකාරිත්වයේ වගකීම ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙත පැවරී ඇත.

18.3 දේශීය විදේශ විනිමය වෙළඳපොළ ප්‍රවණතා

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, වසර තුළ දී, උග්‍ර ද්‍රවශීලතා හිඟයකට මුහුණ දුන් දේශීය විදේශ විනිමය වෙළඳපොළ අධීක්ෂණය කිරීමේ හා මග පෙන්වීමේ කටයුතුවල සක්‍රීයව නිරත විය. 2021 සැප්තැම්බර් මාසයේ දී මහ බැංකුව විසින් සපයන ලද මාර්ගෝපදේශයන්ට අනුව 2022 මාර්තු මස මුල් කාලය දක්වා එ. ජ. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතිකය රු. 200 - රු. 203 අතර පරාසයක පැවතුණි. කෙසේ වෙතත්, දළ නිල සංචිත තියුණු ලෙස පහළ යෑම සහ දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පැවති සැළකිය යුතු පීඩන හේතුවෙන් 2022 මාර්තු 07 වන දින විනිමය අනුපාතිකයේ නිසි ගැලපීමක් සිදුවීමට ඉඩ දීමට මහ බැංකුව ගත් තීරණයෙන් පසුව, එ. ජ. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් විනිමය අනුපාතිකය විශාල ලෙස අවප්‍රමාණය විය. අභියෝගාත්මක ද්‍රවශීලතා තත්ත්වයක් යටතේ සහ සක්‍රීය අන්තර්බැංකු විදේශ විනිමය වෙළඳපොළක් නොපැවති තත්ත්වයක් හමුවේ විනිමය අනුපාතිකයේ දිනක් තුළ සිදුවිය හැකි උච්චාවචනය නිසි මට්ටමකින් කළමනාකරණය කිරීමේ පියවරක් ලෙස, 2022 මැයි 13 දින සිට ක්‍රියාත්මක වන පරිදි මහ බැංකුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ වෙත විචල්‍ය ආන්තිකයක් සමග විනිමය අනුපාතික මාර්ගෝපදේශයක් දෛනිකව ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කළේය. එහි ප්‍රතිඵලයක් වශයෙන්, විනිමය අනුපාතිකයේ උච්චාවචන ක්‍රමානුකූලව ස්ථාවර වූ අතර, 2022 මැයි මාසයේ මැද සිට දෙසැම්බර් මාසයේ අවසානය දක්වා කාලය තුළ අන්තර්බැංකු විදේශ විනිමය වෙළඳපොළෙහි බර තබන ලද සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය එ. ජ. ඩොලරයකට රු. 360 - රු. 363 අතර පැවතුණි. 2022 මැයි මස මැද භාගයේ සිට, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් ප්‍රකාශිත විචල්‍ය ආන්තිකය ද සමග එ. ජ. ඩොලර්/ශ්‍රී ලංකා රුපියල් මධ්‍ය එතැන් විනිමය අනුපාතිකය සහ අනෙකුත් ජාත්‍යන්තර මුදල් ඒකක පනස් හයක් සඳහා මධ්‍ය විනිමය අනුපාතික ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ දිනපතා ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලදී. මීට අමතරව, ප්‍රධාන මුදල් ඒකක නවයක් සඳහා ශ්‍රී ලංකා රුපියලට සාපේක්ෂව විදුලි පැවරුම් සඳහා වූ මිලදී ගැනීමේ සහ විකිණීමේ විනිමය අනුපාතික සාමාන්‍ය අගයයන් ද ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියේ දෛනිකව ප්‍රකාශයට පත් කළේය.

2022 වසර තුළදී, මහ බැංකුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකුවලින් සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙන් අනිවාර්යයෙන් රුපියල් බවට පරිවර්තනය කරන ලද භාණ්ඩ අපනයන ආදායමෙන් සහ රුපියල් බවට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ සේවා අපනයන ආදායමෙන් කොටසක් මිල දී ගැනීම අබණ්ඩව සිදු කරන ලදී. මීට අමතරව, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව ගල් අඟුරු සහ ඉන්ධන ආනයන මූල්‍යනය කිරීම සඳහා ඉහත ආදායමෙන් තවත් කොටසක් ස්වේච්ඡාවෙන් මහ බැංකුවට ලබා දෙන ලදී. තවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි විදේශ විනිමය ද්‍රවශීලතා ගැටලු විසඳීම සඳහා, පවතින විදේශ විනිමය ගලා ඒම් තුළ සිය විදේශ විනිමය ගලා යෑම කළමනාකරණය කරමින් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයන සඳහා ප්‍රමුඛත්වය ලබා දෙන ලෙස සියලුම බැංකුවලට උපදෙස් දෙන අතර ම, පුළුල් පරාසයකට අයත් අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයන සඳහා විදේශ විනිමය මූල්‍යනය කිරීම වැනි නව ක්‍රියාමාර්ග කිහිපයක් ක්‍රියාත්මක කිරීමට ද මහ බැංකුවට සිදු විය. මහජන නොසන්සුන්තාවයන් මධ්‍යයේ ආර්ථික කටයුතු පවත්වාගෙන යාමේ දී අත්‍යවශ්‍ය ද්‍රව්‍ය ආනයනය සඳහා වන ඉල්ලීම්වල ජාතික වැදගත්කම හේතුවෙන් ඉන්ධන, ගෑස්, ගල් අඟුරු, ඖෂධ සහ ආහාර ද්‍රව්‍ය වැනි අත්‍යවශ්‍ය ද්‍රව්‍ය සඳහා සැලකිය යුතු ප්‍රමාණයක විදේශ විනිමය ඉල්ලීම් සඳහා පහසුකම් සලසමින් ශුද්ධ විකුණුම්කරුවෙකු ලෙස මහ බැංකුව පෙනී සිටීම දේශීය විදේශ විනිමය වෙළඳපොළ ක්‍රියාකාරකම්වල කැපී පෙනෙන ලක්ෂණයක් විය. මෙම ප්‍රයත්නයේදී, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුවට රජය, රජය සතු ව්‍යාපාර ව්‍යවසායයන්, පුද්ගලික අංශයේ සහභාගිවන්නන් සහ ගනුදෙනුකරුවන් ඇතුළු විවිධ පාර්ශ්වකරුවන් සමග ඔවුන්ගේ විමසීම්/ගැටලු නිරාකරණය සඳහා සැලකිය යුතු කාලයක් කැප කිරීමට සිදු විය.

මේ අතර, විනිමය අනුපාතිකයේ අධික උච්චාවචන සහ අනවශ්‍ය විදේශ විනිමය තත්ත්ව ගොඩනැංවීම වළක්වමින් ඉහළ මට්ටමේ වෙළඳපොළ ක්‍රියාකාරීත්වයක් සහතික කිරීම සඳහා, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී දේශීය විදේශ විනිමය වෙළඳපොළ කටයුතු සුමට ලෙස ක්‍රියාත්මක කිරීමට පහසුකම් සැලසීමේ අරමුණින් බලපත්‍රලාභී වාණිජ බැංකු/ජාතික ඉතිරිකිරීමේ බැංකුවට අදාළ ශුද්ධ විදේශ විනිමය අනාවරණ තත්ත්ව සීමාවන් එක් එක් බැංකුවල අවශ්‍යතා අනුව තාවකාලිකව සංශෝධනය කිරීමට පියවර ගත්තේය. වෙළඳපොළ අපේක්ෂාවන්ට අනුකූලව, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව, දේශීය විදේශ විනිමය වෙළඳපොළ ක්‍රමවත්ව පවත්වාගෙන යෑම සහතික කිරීමේ වගකීමට අනුව, විනිමය අනුපාතිකයේ අනිසි උච්චාවචන මැඩපැවැත්වීම සඳහා සිය නිර්දේශ ලබා දුන් අතර, මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු මෙන්ම,

බාහිර ආයතන විසින් යොමු කරන ලද විවිධ ප්‍රතිපත්ති, යෝජනා සහ රෙගුලාසිවලින් ඇති විය හැකි බලපෑම් පිළිබඳ සිය අදහස්, නිරීක්ෂණ සහ නිර්දේශ ඉදිරිපත් කිරීම ද වසර තුළ දී සිදු කළේය.

ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව වෙළඳපොළ මෙහෙයුම් කමිටුවේ ලේකම්වරයා වශයෙන් අඛණ්ඩව කටයුතු කළ අතර, එම කමිටුවට වෙළඳපොළ මෙහෙයුම් කටයුතු සම්බන්ධව ඵලදායී නිර්දේශ ඉදිරිපත් කිරීම සඳහා අදාළ සියලු තොරතුරු ලබා දුන්නේය. එමෙන්ම, ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව දේශීය විදේශ විනිමය වෙළඳපොළ සහ දළ නිල සංචිතවල ප්‍රවණතා පිළිබඳව මුදල් ප්‍රතිපත්ති කමිටුව වෙත ද සිය අදහස් හා යෝජනා ලබා දුන්නේය. තවද, දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි ප්‍රවණතා පිළිබඳ ගැටලු සහ ඉදිරි දැක්ම පිළිබඳව මුදල් මණ්ඩලය අඛණ්ඩව දැනුවත් කරමින් සුදුසු නිර්දේශ කාලානුරූපීව ලබා දීමට කටයුතු කළේය.

මේ අතර, දේශීය විදේශ විනිමය වෙළඳපොළ සංවර්ධනය කිරීම මෙන් ම, වෙළඳපොළ අධීක්ෂණ කටයුතු වැඩිදියුණු කිරීම අරමුණු කර ගනිමින් මහ බැංකුව විසින් ක්‍රියාත්මක කිරීමට නියමිත ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය සඳහා ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව සිය දායකත්වය සහ නිර්දේශ අඛණ්ඩව ලබා දුන්නේය.

19. නීති හා අනුකූලතා

නීති දෙපාර්තමේන්තුව රටේ සාර්ව ආර්ථික ව්‍යාකූලත්වය හේතුවෙන් ඇති වූ අභියෝගාත්මක වටපිටාව නොතකමින් මහ බැංකුවේ සියලු උපාය මාර්ගික ප්‍රමුඛතා ළඟා කර ගැනීමට ක්‍රියාකාරීව දායක විය. එකී කාර්යය සඳහා 2022 වර්ෂය තුළ නීති දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම් සමහරක් පහත පරිදි සාරාංශ ගත කර ඇත.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදල් වැඩසටහනේ පූර්ව ක්‍රියාමාර්ග යක් වූ ශ්‍රී ලංකා මහ බැංකු පනත කෙටුම්පත් කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුව විසින් මුදල් අමාත්‍යාංශය, නීතිපති දෙපාර්තමේන්තුව, නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව, ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සහ ලෝක බැංකුව වැනි විවිධ පාර්ශවකරුවන්ගේ සහාය ඇතිව කටයුතු කරන ලද අතර 2019.11.01 වන දින එකී පනත් කෙටුම්පත ගැසට් මගින් ප්‍රකාශයට පත් කිරීමට කටයුතු කරන ලදී. මෙකී පනත් කෙටුම්පත ඉහතින් දැක්වූ පාර්ශවයන්ගේ ද සහාය ඇතිව මහ බැංකුකරණයේ නව්‍ය ක්ෂේත්‍රයන් ආවරණය කරනු වස් තව දුරටත් වැඩි දියුණු කරන ලදී. මෙම පනත් කෙටුම්පත වෙනත් කරුණු අතර, වැඩිදියුණු කරන ලද පාලන ප්‍රමිතීන්ගෙන් යුත් මහ බැංකුවේ ස්වාධීනත්වය, එහි අරමුණු සුරක්ෂිත කිරීම පිණිස පවතින උසස් මට්ටමේ පාලන මණ්ඩල ව්‍යුහයක්, වැඩි දියුණු කරන ලද නියාමන හා අධීක්ෂණ බලතල ආදී දෑ සඳහා ප්‍රතිපාදන සලසයි. මෙම කෙටුම්පත පනතක් ලෙස බලාත්මක වීමෙන් අනතුරුව 1949 අංක 58 දරන මුදල් නීති පනත අවලංගු වනු ඇත.

මීට අමතරව, 2022 දී, නීති දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ නියාමන සහ අධීක්ෂණ සහ නිරාකරණ රාමුව වැඩිදියුණු කිරීම සඳහා නව නීති කෙටුම්පත් කිරීමේ නිරත විය. වෙළඳ නිෂ්කාශන සහ පියවීම් පිළිබඳ පනත, බැංකු (විශේෂ විධිවිධාන) පනත සහ ක්ෂුද්‍ර මූල්‍ය සහ ණය නියාමන අධිකාරී පනත් නව නීති අතරට ඇතුළත්ය. තවද, මහ බැංකුවේ නියාමන, අධීක්ෂණ සහ නිරාකරණ අධිකාරිය වැඩි දියුණු කිරීමේ අරමුණින් වත්මන් වෙළඳපල වර්ධනයන්ගෙන් පැන නගින අභියෝග රාශියකට විසඳුම් සැපයීම සඳහා අනෙකුත් අධීක්ෂණ දෙපාර්තමේන්තුවල සහයෝගයෙන් ද යුතුව නීති දෙපාර්තමේන්තුව විසින් 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත, 2000 අංක 56 දරන මුල්‍ය කල්බදු පනත, 2017 අංක 12 දරන විදේශ විනිමය පනත සහ 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත සඳහා සංශෝධන ඉදිරිපත් කිරීමට කටයුතු කරන ලදී.

2022 දී, රටේ ඇති වූ ආර්ථික පසුබෑමත් සමග මහ බැංකුවට එරෙහිව පවරන ලද නඩු කටයුතුවල සැලකිය යුතු වර්ධනයක් ඇති වූ අතර නීති දෙපාර්තමේන්තුව අදාළ අනෙකුත් දෙපාර්තමේන්තුවල සහයෝගය ඇතිව බැංකුවේ බැදියාවන් සුරක්ෂිත කිරීමට අවශ්‍ය කරුණු දැක්වීම් සිදු කරන ලදී. එමෙන්ම අනවසර මූල්‍ය සමාගම්, තහනම් යෝජනා ක්‍රමවලට එරෙහිව නඩු කටයුතු ආරම්භ කිරීම මෙන්ම මුදල් මණ්ඩලය විසින් බලපත්‍ර අවලංගු කර ඇති මූල්‍ය සමාගම් ඈවර කිරීම සඳහා නඩු කටයුතු ආරම්භ කිරීම වැනි නීතිමය ක්‍රියාමාර්ග ගනිමින් තැන්පත්කරුවන්ගේ සහ ණය හිමියන්ගේ යහපත සුරක්ෂිත කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුව විසින් රටේ නීතිය ක්‍රියාත්මක කරන බලධාරීන් සමග එක්ව, ක්‍රියාමාර්ග ගැනීමද සිදු කරන ලදී.

මහ බැංකුවේ නියාමන අධිකාරිය වැඩි දියුණු කිරීම සහ එමගින් බැංකුකරණයේ සහ මූල්‍ය අංශයේ ශක්තිමත්භාවය සහතික කිරීම සඳහා මහ බැංකුව විසින් පරිපාලනය කරනු ලබන ව්‍යවස්ථා යටතේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද අනු ව්‍යවස්ථා සම්පාදනය කිරීම සහ සංශෝධනය කිරීමට මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සමග සක්‍රීය දායකත්වයෙන් කටයුතු කිරීමට නීති දෙපාර්තමේන්තුව සමත් විය. 2022 අංක 09 දරණ පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත සහ 2021 අංක 11 දරණ කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභා පනත ඇතුළු පනත්වල අන්තර්ගත ප්‍රතිපාදනවලට නිරීක්ෂණ ලබා දෙමින් මහ බැංකුවෙන් පිටත සකස් කරන ලද පනත් සමාලෝචනය කිරීම සඳහාද නීති දෙපාර්තමේන්තුව දායක විය.

එපමණක් නොව, 2022 දී, විදේශීය සමපාර්ශවයන්ගේ අනුකූලතා අවශ්‍යතා සඳහා පහසුකම් සැලසීමෙන් සහ මුදල් විශුද්ධිකරණය පදනම් කර ගනිමින් විදේශීය සමපාර්ශවයන් පිළිබඳ වාර්ෂික සමාලෝචනය කිරීමෙන් නීති දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ අනුකූලතා කර්තව්‍යය මෙහෙයවන ලදී. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධානවලට මහ බැංකුවේ අනුකූලභාවය සහතික කිරීම සඳහා නීති දෙපාර්තමේන්තුව තුළ පිහිටුවා ඇති තොරතුරු දැනගැනීමේ ඒකකය 2022 වර්ෂය තුළ මහ බැංකුවට අදාළ තොරතුරු ඉල්ලීම් 188 ක් සහ අභියාචනා 23ක් හසුරුවා ඇත. තවද, තහනම් යෝජනා ක්‍රම, අනවසර මූල්‍ය ව්‍යාපාර, සහ මූල්‍ය සහ ලීසිං අංශයේ විකාශනය වන ගැටලු වැනි මූල්‍ය අංශයේ ගැටලු පිළිබඳව මහජනතාවගේ දැනුම පුළුල් කිරීමේ වැඩසටහන් සඳහා

නීති දෙපාර්තමේන්තුව ක්‍රියාකාරීව සහභාගී විය. නීති දෙපාර්තමේන්තු නිලධාරීන් බැංකුව නියෝජනය කරමින් බොහෝ සංවාදවල සම්පත් දායකයින් ලෙස කටයුතු කර ඇති අතර ගෙවීම් සහ පියවීම් පද්ධති පනත සමාලෝචනය කිරීම, ශ්‍රී ලංකන් එයාර්ලයින්ස් ලිමිටඩ්හි ණය ප්‍රතිව්‍යුහගත කිරීමේ ක්‍රියාවලිය, නිව් යෝර්ක් ෆෙඩරල් අධිකරණයේ හැමිල්ටන් රිසර්ව් බැංකුව මඟින් ගොනු කරන ලද නඩු කටයුත්ත, මූල්‍ය වත්කම් කළමනාකරණ නියෝජිතායතන රාමුව සංවර්ධනය කිරීම සහ ශ්‍රී ලංකාව සඳහා මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ග සැලැස්ම ඇතුළත්ව අභ්‍යන්තර/බාහිර කමිටු රැසකටද නීති දෙපාර්තමේන්තුව විසින් තම දායකත්වය සපයා ඇත.

20. සාර්ව විචක්ෂණතා අධ්‍යයන

මහ බැංකුවේ මූලික ව්‍යවස්ථාපිත අරමුණුවලින් එකක් වන රට තුළ මූල්‍ය පද්ධති ස්ථායීතාව පවත්වා ගැනීමේ අරමුණ ඇතිව, මූල්‍ය පද්ධතියට බලපෑම් කළ හැකි පද්ධතිමය අවදානම් තක්සේරු කිරීම සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මඟින් පුළුල් පරාසයක විශ්ලේෂණ සිදු කරනු ලබයි. මේ සඳහා නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන වලින්, ලැයිස්තුගත සමාගම්වලින් සහ වෙනත් විවිධ මූලාශ්‍රවලින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විශ්ලේෂණ සිදු කිරීම සඳහා දත්ත රැස් කරයි. මෙම විශ්ලේෂණවල ප්‍රතිඵල මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියට පහසුකම් සපයන අතර මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පවත්වා ගැනීම පිණිස පද්ධතිමය අවදානම් අවම කිරීමට සාර්ව විචක්ෂණ ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග හඳුන්වා දීමට ද සහාය වේ. ඒ අනුව, මෙම විශ්ලේෂණ මූල්‍ය පද්ධති ස්ථායීතාවය ඇති කිරීමේ දී ක්ෂුද්‍ර විචක්ෂණ නියාමනයට සහ අධීක්ෂණයට අනුපූරක වේ.

නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන විසින් වාර්තා කරන ලද දත්ත මෙන්ම සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මඟින් වෙනත් මූලාශ්‍රවලින් රැස් කරන ලද දත්ත ද භාවිතා කරමින් සාර්ව විචක්ෂණ නිරීක්ෂණ රාමුව මඟින් ගෝලීය සහ දේශීය සාර්ව ආර්ථික වර්ධනයන්, මූල්‍ය වෙළෙඳපොළ ක්‍රියාකාරකම් සහ මූල්‍ය ආයතන අංශයෙන් මතුවන අවදානම් ආවරණය කරනු ලබයි. තවද, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය ආයතනවල අවදානම් තක්සේරු කිරීම සඳහා ආතති පරීක්ෂණ සහ මූල්‍ය පද්ධති ස්ථායීතාවයට ඇති බලපෑම තක්සේරු කිරීම සඳහා ගෘහස්ථ හා ආයතනික අංශයේ වර්ධනයන් පිළිබඳ විශ්ලේෂණ ද සිදු කරනු ලබයි. තවදුරටත්, දේශීය මූල්‍ය පද්ධතියේ විවිධ උප අංශවල ස්ථායීතාවය සහ ශක්තිමත්භාවය තක්සේරු කිරීම සඳහා සංයුක්ත මූල්‍ය පද්ධති ස්ථායීතා දර්ශක ගණනාවක් අඛණ්ඩව සම්පාදනය කරන අතරම මෙම දර්ශකවල විශ්වසනීයත්වය වැඩිදියුණු කිරීමට ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් පියවර ගන්නා ලදී. එවැනි විශ්ලේෂණවලින් අනතුරුව, 2022 වසර තුළ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට ඇති විය හැකි අවදානම් සහ මූල්‍ය පද්ධතියේ ස්ථායීතාව පිළිබඳ අනෙකුත් කාලීන කරුණු ඉස්මතු කරමින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් කාර්තුමය අවදානම් තක්සේරු වාර්තා ඇතුළු මුදල් මණ්ඩල පත්‍රිකා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී. තවද, තිරසාර මූල්‍ය ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා අඛණ්ඩව පහසුකම් සැලසීම සිදු කරන ලද අතර ඒ සඳහා වෙනම ඒකකයක් දෙපාර්තමේන්තුව තුළ ස්ථාපිත කරන ලදී. 2022 වසර තුළ දී සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද ප්‍රධාන ක්‍රියාකාරකම්වල සාරාංශයක් පහත දැක්වේ.

(අ) ආතති පරීක්ෂණ රාමුව

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලබාගත් තාක්ෂණික සහාය ද ඇතිව වැඩි දියුණු කරන ලද ගතික නුඹුන්වත් ආතති පරීක්ෂණ (Dynamic Solvency Stress Testing) බැංකු අංශය සඳහා ද්විවාර්ෂික පදනමින් සිදු කරන ලදී. ගතික නුඹුන්වත් ආතති පරීක්ෂණ ආකෘතිය උපකල්පිත නමුත් පිළිගත හැකි අවස්ථා යටතේ මූල්‍ය පද්ධතියේ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කිරීම තුළින් සාර්ව විචක්ෂණ දෘෂ්ටිකෝණයක් සපයයි. බැංකු අංශය පිළිබඳ විස්තරාත්මක දත්ත රැස් කිරීමට සහ ආතති පරීක්ෂණ සඳහා සාර්ව ආර්ථික අවස්ථා සම්පාදනය කිරීමට සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව සම්බන්ධ වූ අතර ආතති පරීක්ෂණ කාල රාමුව තුළ දී අවදානම් මොඩියුල සහිත ප්‍රමාණාත්මක මෙවලම් කට්ටලය ක්‍රියාත්මක කරමින් අපේක්ෂිත කම්පන මඟින් බැංකුවල ඔරොත්තුදීමේ හැකියාව මත ඇති කරන බලපෑම ඇගයීමට කටයුතු කළේය. සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් උපකල්පිත සාර්ව ආර්ථික අවස්ථා මත පදනම්ව බලපත්‍රලාභී මූල්‍ය සමාගම් අංශය සඳහා ද්විවාර්ෂිකව ස්ථිතික නුඹුන්වත් ආතති පරීක්ෂාව අඛණ්ඩව සිදු කරන ලදී.

ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ තාක්ෂණික සහාය ඇතිව වැඩි දියුණු කරන ලද, මුදල් ගලා ඒම් සහ ගලා යෑම් වල නොගැළපීම් හඳුනා ගනු ලබන කල් පිරීමේ ඉනිමං ආකෘතිය (Maturity Ladder Template) හරහා බැංකු අංශයෙන් එක් රැස් කළ දත්ත භාවිත කරමින් සිදු කළ ද්‍රවශීලතා ආතති පරීක්ෂණ මඟින් සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවේ පද්ධති අවදානම් විශ්ලේෂණය වැඩි දියුණු කළේය. ද්‍රවශීලතා ආතති පරීක්ෂණ රාමුව මඟින් පද්ධතිමය ද්‍රවශීලතා කම්පනවලට බැංකු අංශයේ ඔරොත්තු දීමේ හැකියාව තක්සේරු කරනු ලබයි.

මෙම වසර තුළ දී ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ලැබුණු තාක්ෂණික සහාය ඇතිව බැංකු අංශයේ අන්තර් සම්බන්ධිතභාවය සහ සංස්පර්ශනය විශ්ලේෂණය සඳහා නව රාමුවක් සකස් කළේය. බැංකු අංශයේ අන්තර් සම්බන්ධිතභාවය සහ සංස්පර්ෂණය විශ්ලේෂණයේ දී අන්තර් බැංකු නිරාවරණයන් තුළින් බැංකු අංශය කෙරෙහි ඇති වන අවදානම් පිළිබඳ මූලික අවධානය යොමු කරනු ලබන අතර නුඹුන්වත්බව සහ ද්‍රවශීලතාව යන සාධක ද සැලකිල්ලට ගනිමින් රාජ්‍ය ව්‍යවසායන් සහ බලපත්‍රලාභී මුදල් සමාගම් තුළින් පැන නගින අවදානම් තක්සේරු කිරීම දක්වා ව්‍යාප්ත කරන ලදී. තවද, සාර්ව විචක්ෂණතා අධ්‍යන දෙපාර්තමේන්තුව විසින් වසර තුළ දී අන්තර් සම්බන්ධිතභාවය සහ සංස්පර්ෂණය පිළිබඳ නියමු විශ්ලේෂණයක් ද සිදු කරන ලදී.

(ආ) සමීක්ෂණ, දර්ශක සහ දත්ත රැස් කිරීම

සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් පද්ධතිමය අවදානම පිළිබඳ ද්විවාර්ෂික සමීක්ෂණය අඛණ්ඩව සිදු කරන ලද අතර එය මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවයට

ඇතිවිය හැකි පද්ධතිමය අවදානම් සහ දැඩි බලපෑමක් ඇති කළ හැකි සිදුවීම්වල වියහැකියාව පිළිබඳ වෙළඳපොළ සහභාගීවන්නන්ගේ ආකල්ප හඳුනාගැනීමට පවත්වන ඉදිරිදැක්මක් සහිත සමීක්ෂණයකි. මෙම අවදානම් යථාර්ථයක් බවට පත්වුවහොත් මූල්‍ය අතරමැදිකරණ ක්‍රියාවලියට බාධා එල්ල විය හැකි අතර මූල්‍ය පද්ධතිය කෙරෙහි මහජන විශ්වාසයට ද බලපෑම් කරනු ඇත. තවද, මූල්‍ය පද්ධතියේ දුර්වලතා පිළිබඳ සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුවෙහි අභ්‍යන්තර තක්සේරු වලංගු කිරීම සඳහා ද පද්ධතිමය අවදානම පිළිබඳ සමීක්ෂණය උපකාරී වේ.

තවද, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් බැංකු අංශයේ ශක්තිමත්භාවය පිළිබඳ දර්ශකය, බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ ශක්තිමත්භාවය පිළිබඳ දර්ශකය, මූල්‍ය වෙළඳපොළ ස්ථායීතා දර්ශකය සහ මූල්‍ය වෙළෙඳපොළ ස්ථායීතා දර්ශකය, බැංකු අංශයේ ශක්තිමත්භාවය පිළිබඳ දර්ශකය, බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ ශක්තිමත්භාවය පිළිබඳ දර්ශකය භාවිතා කරමින් සංයුක්ත මූල්‍ය පද්ධති ස්ථායීතා දර්ශකය යනාදී දර්ශක කිහිපයක් කාර්තුමය පදනමින් සම්පාදනය කරන ලදී.

දත්ත ගබඩාව වැඩි දියුණු කිරීමේ අරමුණින්, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් නියාමනය කරනු ලබන මූල්‍ය ආයතන, කොළඹ කොටස් හුවමාරුව, ශ්‍රී ලංකා රක්ෂණ නියාමන කොමිෂන් සභාව, සුරුකුම්පත් හා විනිමය කොමිෂන් සභාව, ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ණය තොරතුරු කාර්යාංශය වැනි බාහිර ආයතන වලින්ද අඛණ්ඩව විස්තරාත්මක දත්ත රැස් කරන ලදී.

(ඇ) මහ බැංකුවේ ව්‍යවස්ථාපිත වාර්තා සහ අනෙකුත් ප්‍රකාශන සඳහා දායක වීම

මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය : සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාවේ මූල්‍ය අංශය මුහුණ දෙන අවදානම් මෙන්ම සලකා බලනු ලබන කාල සීමාව තුළ අනුගමනය කරන ලද අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග සාකච්ඡා කරනු ලබන මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය ප්‍රකාශයට පත් කරන ලදී.

ව්‍යවස්ථාපිත ප්‍රකාශන: 2021 වසරේ මහ බැංකු වාර්ෂික වාර්තාවේ සහ මෑතකාලීන ආර්ථික ප්‍රවණතා 2022 හි "මූල්‍ය අංශයේ ක්‍රියාකාරිත්වය සහ පද්ධති ස්ථායීතාව" යන පරිච්ඡේදය සම්බන්ධීකරණය කිරීම සහ සම්පාදනය කිරීම හරහා මහ බැංකුවේ ප්‍රධාන ප්‍රකාශන සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව අඛණ්ඩව දායක විය. තවද, මුදල් භාර අමාත්‍යවරයා වෙත ඉදිරිපත් කරන ලද රහස්‍ය වාර්තාවක් වන සැප්තැම්බර් 15 වාර්තාවේ මූල්‍ය පද්ධතියට අදාළ කොටස සැකසීමට ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව දායක විය. මීට අමතරව, මූල්‍ය අංශයේ දත්ත සම්පාදනය කිරීම සහ මූල්‍ය පද්ධතියේ උප අංශ පිළිබඳ විශ්ලේෂණ සැපයීම මගින් මහ බැංකුවේ අනෙකුත් ප්‍රකාශන සඳහා ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව දායක විය.

(ඈ) ආයතනික අංශය සහ ගෘහස්ථ අංශය විශ්ලේෂණය කිරීම

ආයතනික සහ ගෘහස්ථ යන දෙඅංශයෙන් පැන නගින මූල්‍ය අවදානම් තක්සේරු කිරීම සඳහා සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් විශ්ලේෂණ සිදු කරයි. මේ අනුව, මූල්‍ය නොවන සමාගම් සඳහා නිදර්ශකයක් වන කොළඹ කොටස් හුවමාරුවේ ලැයිස්තුගත මූල්‍ය නොවන සමාගම් පිළිබඳ තොරතුරු භාවිතා කරමින්, එම සමාගම් මගින් මූල්‍ය පද්ධතියට පැන නගින අවදානම් තක්සේරු කිරීම තුළින් ආයතනික අංශයේ දුර්වලතා කාර්තුමය පදනමින් විශ්ලේෂණය කෙරේ. මීට අමතරව, ගෘහ හා ආයතනික අංශවල ණය ගැතියන්ගෙන් පැන නගින මූල්‍ය අවදානම් තක්සේරු කිරීමට සහ පද්ධතිමය අවදානම් ගොඩනැගීම හඳුනා ගැනීමට සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් එම ණයගැතියන්ගේ ණයගැතිභාවය විශ්ලේෂණය කරනු ලබයි. ණය තොරතුරු කාර්යාංශයෙන් ලබාගත් බැංකු අංශයේ සහ බලපත්‍රලාභී මුදල් සමාගම් හා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශයේ කාර්තුමය ණය දත්ත මත පදනම්ව එම විශ්ලේෂණය සිදු කෙරේ.

(ඉ) මූල්‍ය පද්ධති ස්ථාවරත්වය පිළිබඳ කමිටු සම්බන්ධීකරණය

මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව: මූල්‍ය අංශයට බලපාන අවදානම් හඳුනා ගැනීම සහ අවදානම් අවම කිරීම සඳහා වන ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම පිණිස පහසුකම් සැලසීම සඳහා මෙන්ම මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වය ප්‍රවර්ධනය කිරීමට දෙපාර්තමේන්තු අතර සම්බන්ධීකරණය සඳහා පිහිටුවා ඇති මහ බැංකුවේ අන්තර් දෙපාර්තමේන්තු සංසදයක් වන මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුවෙහි ලේකම් කටයුතු සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. විශේෂිත කරුණු සඳහා අත්‍යවශ්‍යම සාමාජිකයින්ට පමණක් සීමා කරන ලද රැස්වීම් හතක් ඇතුළුව මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටු රැස්වීම් 11ක් 2022 වසර තුළ දී පවත්වන ලදී. කාර්තුමය අවදානම් තක්සේරු වාර්තා සහ මූල්‍ය පද්ධති ස්ථායීතා සමාලෝචනය 2022 මුදල් මණ්ඩලයට ඉදිරිපත් කිරීමට පෙර සාමාජිකයින්ගේ අදහස් ලබා ගැනීම සඳහා මූල්‍ය පද්ධති ස්ථායීතා කමිටුව වෙත ඉදිරිපත් කරන ලදී.

මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිලය (Financial System Oversight Council): මූල්‍ය පද්ධතියේ කාර්යක්ෂමතාව, ශක්තිමත්භාවය සහ සුරක්ෂිතභාවය සහතික කිරීම පිණිස මූල්‍ය අංශයේ නියාමන ආයතන අතර සහයෝගිතාවයට පහසුකම් සැලසීම සඳහා එම ආයතන ප්‍රධානීන්ගෙන් සමන්විත මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිලයෙහි ලේකම් කටයුතු ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි. ඒ අනුව, අදාළ මූල්‍ය අංශයේ නියාමකයින්ගේ විෂය පථය යටතේ එන අවදානම් සහ එවැනි කරුණු පිළිබඳව සාකච්ඡා කිරීමට 2022 වසර තුළ මූල්‍ය පද්ධති අධීක්ෂණ කවුන්සිල රැස්වීම් දෙකක් පවත්වන ලදී.

පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව කමිටුව (Stakeholder Engagement Committee): ආර්ථිකයේ මුදල් හා මූල්‍ය අංශවල අන්තර් සම්බන්ධිතබාවය, ප්‍රතිපත්ති ස්ථාවරයේ වෙනස්වීම් සහ එක් අංශයක් අනෙක් අංශයට දක්වන ප්‍රතිචාර සැලකිල්ලට ගනිමින්, විවිධ ක්ෂේත්‍ර සමූහයක සාමාජිකයින්ගෙන්

සමන්විත වන පාර්ශ්වකරුවන්ගේ සහභාගීත්ව කමිටුව 2022 වසරේ දී පිහිටුවන ලදී. ඒ අනුව, සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව පාර්ශවකරුවන්ගේ සහභාගීත්ව කමිටුවෙහි රැස්වීම්වලට සහභාගී වීම, අවශ්‍ය විට දී සාර්ව මූල්‍ය වර්ධනයන් පිළිබඳ කමිටුව දැනුවත් කිරීම සඳහා ඉදිරිපත් කිරීම් සිදු කිරීම, කමිටු රැස්වීම්වල අදාළ සාකච්ඡාවලට සම්බන්ධ වීම සහ කමිටුව විසින් යෝජනා කරන ලද අදාළ ක්‍රියාමාර්ග පිළිබඳ පසු විපරම් කිරීම සිදු කරනු ලබයි.

(ඊ) ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය ක්‍රියාකාරකම් සම්බන්ධීකරණය කිරීම සහ පහසුකම් සැලසීම

ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය පිළිබඳ පෙර දැක්මට සමගාමීව සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව විසින් තිරසාර මූල්‍යකරණයේ නියැලී සිටින දේශීය හා ජාත්‍යන්තර පාර්ශවකරුවන් සම්බන්ධීකරණය කරමින් පෙර දැක්ම ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසන ලදී. තවද, මේ සම්බන්ධයෙන් පිහිටුවා ඇති අභ්‍යන්තර කමිටු සඳහා ලේකම් කාර්යාලය ලෙස ද සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව කටයුතු කළේය.

(උ) ජාත්‍යන්තර නියෝජිතායතන සමග සම්බන්ධීකරණය

සාර්ව විචක්ෂණතා සමීක්ෂණයට ප්‍රතිචාර දැක්වීමේ දී මූල්‍ය පද්ධති ස්ථායීතා කාණ්ඩයේ සම්බන්ධීකරණ දෙපාර්තමේන්තුව ලෙස සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මූල්‍ය අරමුදල සමග කටයුතු කරයි. තවද, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය පිළිබඳ පෙර දැක්මට අනුකූලව තිරසාර මූල්‍ය කටයුතු සඳහා පහසුකම් සැලසීමේ අධිකාරිය ලෙස සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව ජාත්‍යන්තර මූල්‍ය සංස්ථාව, එක්සත් ජාතීන්ගේ සංවර්ධන වැඩසටහන, ආසියානු සංවර්ධන බැංකුව සහ ආසියා සහ පැසිෆික් කලාප සඳහා එක්සත් ජාතීන්ගේ ආර්ථික හා සමාජ කොමිසම ඇතුළු බහුපාර්ශ්වික ආයතන සමග සම්බන්ධීකරණය කළේය.

(ඌ) අර්බුද කළමනාකරණ කමිටුවක් පිහිටුවීම

මූල්‍ය අර්බුද යනු බොහෝ රටවල් පෙර සූදානම් වී නොමැති අඩු සම්භාවිතාවක් සහිත නමුත් ඉහළ බලපෑමක් ඇති සිදුවීම් වේ. එබැවින්, මූල්‍ය අර්බුදයක් ඇති වුවහොත් ඒ සඳහා පෙර සූදානම් වීම ශක්තිමත් කිරීමේ සහ එය කළමනාකරණය කිරීමේ අවශ්‍යතාව ජාත්‍යන්තර නියෝජිතායතන සහ මහ බැංකුව විසින් හඳුනාගන්නා ලදී. මේ සඳහා කාලෝචිත සහ ඵලදායී ආකාරයෙන් ප්‍රතිචාර දැක්වීම සඳහා නෛතික, නියාමන සහ ආයතනික රාමුවක් ගොඩනැගීම අවශ්‍ය විය. එබැවින් ප්‍රතිපත්ති සම්බන්ධීකරණය සඳහා වූ සංසදයක් ලෙස මූල්‍ය අංශයේ අර්බුද කළමනාකරණ කමිටුවක් පිහිටුවීම ලෝක බැංකුව විසින් අවධාරණය කරන ලදී. ඒ අනුව, අර්බුදකාරී කාල සීමාවන් තුළ දී ඵලදායී ලෙස මූල්‍ය අර්බුද කළමනාකරණය සඳහා මෙන්ම අර්බුද නොමැති කාලවකවානු තුළ දී රට මූල්‍ය අර්බුද සඳහා පෙර සූදානම් වීමේ රාමුව ශක්තිමත් කිරීම සඳහා ද ස්ථිර සංසදයක් වන අර්බුද කළමනාකරණ කමිටුව පිහිටුවීමේ රාමුව සකස් කිරීමට සාර්ව විචක්ෂණතා අධ්‍යයන දෙපාර්තමේන්තුව මූලිකත්වය ගත්තේය.

21. ගෙවීම් සහ පියවීම්

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 5 වැනි වගන්තියේ දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව ශ්‍රී ලංකාවේ මුදල්, මූල්‍ය සහ ගෙවීම් පද්ධතියේ පරිපාලනය, අධීක්ෂණය සහ නියාමනය සඳහා වගකිව යුතු අධිකාරිය වේ. ශ්‍රී ලංකාවේ ගෙවීම් සහ පියවීම් පද්ධතිවල සුරක්ෂිතභාවය, කාර්යක්ෂමතාව, තරඟකාරිත්වය සහ ස්ථාවරත්වය ඇති කිරීමේ අරමුණ ඇතිව ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණය කිරීමට ජාතික ගෙවීම් පද්ධති ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැවරී ඇති ව්‍යවස්ථාපිත බලය ක්‍රියාත්මක කිරීම ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව හරහා සිදු කරනු ලැබේ.

තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කිරීම, ජාත්‍යන්තර සංචිත කළමනාකරණය සඳහා පසු මෙහෙයුම් කාර්යාල කටයුතු සිදු කිරීම, අන්තර් බැංකු මූල්‍ය තොරතුරු සන්නිවේදන සංගමය (SWIFT(ස්විෆ්ට්)) හරහා ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් ස්විෆ්ට් පද්ධතිය කළමනාකරණය, ආසියානු නිෂ්කාශන සංගමය (ACU) සඳහා වන යාන්ත්‍රණ හරහා ගනුදෙනු සිදු කිරීම, ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය සහ අවේක්ෂණ කටයුතු සිදු කිරීම හා ගෙවීම් සේවා සපයන්නන්ගේ නියාමනය සහ අධීක්ෂණය, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කළ ප්‍රධාන කාර්යයන් වේ.

21.1 තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 62අ වගන්තිය මගින් අරමුදල් හුවමාරු සඳහා පද්ධති පිහිටුවීම සහ මෙහෙයවීමට, ගෙවීම් සඳහා වන වගකීම් පියවීමට සහ සහභාගීත්ව ආයතන වෙත පද්ධති රීති නිකුත් කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවට බලය ලබා දෙන අතර, ඒ අනුව, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ප්‍රාථමික අලෙවිකරුවන් සමග විවට වෙළඳපොල මෙහෙයුම් මෙන්ම නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් සම්බන්ධ ගනුදෙනු පියවීම වැනි අන්තර් සාමාජිකයන්ගේ මෙන්ම ගනුදෙනුකරුවන්ගේ කාල සංවේදී සහ විශාල වටිනාකම් සහිත ගෙවීම්, තත්කාලීනව, දළ පියවීම් පදනම මත සිදු කිරීම සඳහා තත්කාලීන දළ පියවීම් පද්ධතිය ක්‍රියාත්මක කරන ලදී.

ජාත්‍යන්තර යහ භාවිතයන්ට අනුගත වෙමින්, රාජ්‍ය සුරැකුම්පත් පියවීම් පද්ධතිය සහ තත්කාලීන දළ පියවීම් පද්ධතියෙන් සමන්විත ලංකාසෙට්ල් පද්ධතියෙහි උපයෝගිතාවය වර්ෂය තුළ දී සාමාන්‍යයෙන් සියයට 99.75ක මට්ටමක පවත්වා ගෙන යන ලදී. තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සුමට ක්‍රියාකාරිත්වය තහවුරු කිරීම සඳහා ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් අතිරේක අරමුදල් සඳහා ඉල්ලීම් කරන සහභාගීත්ව ආයතන වෙත එක් දින ද්‍රවශීලතා පහසුකම් ලබා දීම අධීක්ෂණය කරන ලදී. තත්කාලීන දළ පියවීම්

පද්ධතියෙහි සහභාගීත්ව ආයතන සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව, බලපත්‍රලාභී වාණිජ බැංකු, බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්, බැංකු නොවන ප්‍රාථමික අලෙවිකරුවන්, සේවක අර්ථසාධක අරමුදල සහ කොළඹ කොටස් හුවමාරුවේ මධ්‍යම තැන්පතු පද්ධතිය ඇතුලත් වේ.

2022 වර්ෂය අවසන් වන විට, තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතන සංඛ්‍යාව 35 ක් විය. වර්ෂය තුළ දී, තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් ගනුදෙනු 638,733 ක් පියවා ඇති අතර එහි මුළු වටිනාකම රු. ට්‍රිලියන 827 කි. දෛනික සාමාන්‍ය ගනුදෙනු ප්‍රමාණය සහ වටිනාකම පිළිවෙළින් 2,661 සහ රුපියල් බිලියන 3,446 කි. එක් දින ද්‍රවශීලතා පහසුකම් සැපයීම පිළිබඳ මෙහෙයුම් කටයුතු වලදී, දෛනිකව සාමාන්‍ය වශයෙන් රුපියල් බිලියන 658.5 ක් සහභාගීත්ව ආයතන වෙත මුදා හැර ඇත.

21.2 ජාත්‍යන්තර සංචිත කළමනාකරණය සඳහා පසු මෙහෙයුම් කාර්යාල කටයුතු සිදු කිරීම

රටේ ජාත්‍යන්තර සංචිත කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා පසු මෙහෙයුම් කාර්යාල කටයුතු ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. 2022 වර්ෂය තුළ දී, විදේශ විනිමය අලෙවි සහ මුල්‍යනය, මුදල් වෙළෙඳපොළ ගනුදෙනු සහ ප්‍රතිමිලදී ගැනුම් /විකුණුම් ගනුදෙනු ඇතුළුව මුළු ගනුදෙනු 3,495 ක් සිදු කර ඇත.

(ආ) විවට වෙළඳපොල කටයුතු, නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් ආශ්‍රිත ගනුදෙනු පියවීම

වෙළඳපොල ද්‍රවශීලතා කළමනාකරණයට පහසුකම් සැලසීම සඳහා, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් නිත්‍ය තැන්පතු පහසුකම් සහ නිත්‍ය ණය පහසුකම් ආශ්‍රිත ගනුදෙනු පියවීමට අමතරව විවට වෙළඳපොල කටයුතු යටතේ ප්‍රතිමිලදී ගැනුම් /විකුණුම් සිදු කරන ලදී.

සමාලෝචනය කරනු ලබන කාලසීමාව තුළ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රු. බිලියන 1,550.3ක් වටිනා ප්‍රතිමිලදී ගැනුම් 232ක්, රු. බිලියන 1,189.5ක් වටිනා ප්‍රතිවිකුණුම් 78ක්, රු. බිලියන 54,183.1ක් වටිනා නිත්‍ය තැන්පතු පහසුකම් ගනුදෙනු 4,966ක්, රු. බිලියන 163,073.8 ක් වටිනා නිත්‍ය ණය පහසුකම් ගනුදෙනු 9563 ක් සහ රු. බිලියන 27.7ක් වටිනා ස්ථිර පදනම මත මිලදී ගැනීමේ ගනුදෙනු 43ක් සිදු කිරීම සහ පහසුකම් සැලසීම සිදු විය.

21.3 ස්විෆ්ට් සන්නිවේදන පද්ධතිය කළමනාකරණය

පාලන විධිවිධාන, ක්‍රියාපටිපාටීන්, අවදානම් කළමනාකරණ ක්‍රියාදාමයන් සහ පාලනය සම්බන්ධයෙන් ස්විෆ්ට් ජාලය විසින් නියම කර ඇති ක්‍රියාදාමයන්ට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුවේ සියලුම පරිශීලකයින් වෙනුවෙන් ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව ස්විෆ්ට් පද්ධතිය කළමනාකරණය කරන ලදී.

2022 වර්ෂය තුළ, ස්විෆ්ට් පද්ධතිය ශක්තිමත් කිරීමට සහ ස්විෆ්ට් සේවය භාවිතා කරන්නන්හට ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව වඩාත් ආරක්ෂිත සහ කාර්යක්ෂම සේවාවක් සැපයීම සඳහා ස්විෆ්ට් ආයතනය විසින් සපයනු ලබන අනිවාර්ය යාවත්කාලීන කිරීම් සිදු කරන ලදී.

ස්විෆ්ට් ආයතනය විසින් ISO 20022 ප්‍රමිතියට මූල්‍ය පණිවුඩ හුවමාරු කිරීමේ ගෝලීය ව්‍යාපෘතියක් ආරම්භ කර ඇත. එය ඉහළ ආකෘතියක් සහිත විවෘත ප්‍රමිතියක් වන අතර වඩා හොඳ තොරතුරු ප්‍රවාහයකටද පහසුකම් සපයයි. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවද, ISO 20022 පණිවුඩකරණ ප්‍රමිතිය සඳහා අනුගත වීමට කටයුතු කරමින් සිටියි.

21.4 ආසියානු නිෂ්කාශන සංගමය යටතේ සිදු කරන ගනුදෙනු සඳහා පහසුකම් සැලසීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකාව සහ ආසියානු නිෂ්කාශන සංගමයෙහි සාමාජික රටවල් අතර සුදුසුකම් ලද වෙළෙඳ කටයුතු ආශ්‍රිත ගනුදෙනු පියවීම සඳහා අබණ්ඩව පහසුකම් සැලසීය. කෙසේ වෙතත්, 2022 ඔක්තෝබර් 14 දින සිට ක්‍රියාත්මක වන පරිදි, වාණිජ බැංකුවලට නැවත දැනුම් දෙන තුරු ආසියානු නිෂ්කාශන සංගමයෙහි සාමාජික රටවල බැංකු සමග සෘජුවම නිෂ්කාශන සංගමයෙන් පිටත යාන්ත්‍රණයක් භාවිතා කරමින් ඔවුන්ගේ වෙළෙඳ ආශ්‍රිත ගනුදෙනු පියවීම සඳහා උපදෙස් දෙන ලදී.

2022 ජනවාරි මස සිට ඔක්තෝබර් මස දක්වා ආසියානු නිෂ්කාශන සංගමය සඳහා වන යාන්ත්‍රණය හරහා ක්‍රියාත්මක වූ ආනයන සහ අපනයනවලට අදාළ මුළු ගනුදෙනු සංඛ්‍යාව 3,301ක් වූ අතර මෙම ගනුදෙනුවල වටිනාකම පිලිවෙලින් ඇමෙරිකානු ඩොලර් මිලියන 1,741.8 සහ ඇමෙරිකානු ඩොලර් මිලියන 181.9ක් විය.

2022 අප්‍රේල් මාසයේදී ඉන්දියානු සංචිත බැංකුව විසින් සංවිධානය කරන ලද ආසියානු නිෂ්කාශන සංගමයෙහි විශේෂ ස්ථාවර තාක්ෂණික කමිටු රැස්වීමට ශ්‍රී ලංකා මහ බැංකුව සහභාගී වූ අතර 2022 මැයි මාසයේදී පාකිස්තාන මහ බැංකුව විසින් සංවිධානය කරන ලද ආසියානු නිෂ්කාශන සංගමයෙහි ස්ථාවර තාක්ෂණික කමිටුවෙහි අධ්‍යක්ෂ මණ්ඩලයේ 50 වැනි රැස්වීමට ද සහභාගී විය.

21.5 ගෙවීම් සහ පියවීම් පද්ධති නියාමනය, අවේක්ෂණ කටයුතු හා ගෙවීම් සේවා සපයන්නන්ගේ නියාමනය සහ අධීක්ෂණය

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව ඩිජිටල් ගෙවීම් තාක්ෂණයන් ප්‍රවර්ධනය කිරීම සඳහා පහසුකම් සලසන ලද අතර විද්‍යුත් ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා එහි නියාමන, අවේක්ෂණ සහ අධීක්ෂණ කටයුතු අබණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, 2022 තුළ දී, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව පහත සඳහන් ප්‍රධාන කාර්යයන් ඉටු කරන ලදී.

(අ) අවශ්‍ය සුදුසුකම් සපුරාලීමෙන් පසු ජාතික ඉතිරිකිරීමේ බැංකුවට ලංකාසෙට්ල් පද්ධතියේ ප්‍රාථමික සහභාගි කරුවෙකු වශයෙන් කටයුතු කිරීමට අවසර ලබා දෙන ලදී. බලපත්‍රලාභී විශේෂිත බැංකු අතර මෙම අවසරය ලබා ගත් පළමු බැංකුව ජාතික ඉතිරිකිරීමේ බැංකුවයි.

(ආ) ජාතික ඉතිරිකිරීමේ බැංකුව තත්කාලීන දළ පියවීම් පද්ධතියේ සහභාගිකරුවෙකු වීමෙන් පසුව බලපත්‍රලාභී

විශේෂිත බැංකුවලට ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතියේ, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ, සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික සාමාජිකත්වය ලබා ගත හැකි වන පරිදි 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත යටතේ ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් පද්ධතිය, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු, සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිළිබඳ පොදු විධි විධාන, සංශෝධනය කර නිකුත් කරන ලදී.

(ඇ) රට තුළට විදේශ ප්‍රේෂණ ගලා ඒම ප්‍රවර්ධනය කිරීමේ අරමුණින්, ජාතික ප්‍රේෂණ ජංගම යෙදුම වන 'Lanka Remit' 2022 පෙබරවාරි මාසයේදී දියත් කරන ලද අතර, එමඟින් විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයින්ට, ශ්‍රී ලංකාවට මුදල් යැවීමට සහ විදේශයන්හි නිකුත් කරන ලද ගෙවීම් කාඩ්පත් භාවිතයෙන් උපයෝගිතා බිල්පත් ගෙවීමට හැකියාව ලැබේ. තවද, 2022 අගෝස්තු මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව සහ ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය විසින් විදෙස්ගත සේවා නියුක්තිකයින් අතර Lanka Remit ජංගම යෙදුම ප්‍රචලිත කිරීම සඳහා දැනුවත් කිරීමේ වැඩසටහනක් පවත්වන ලදී.

(ඈ) 2005 අංක 28 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පනත සමාලෝචනය කිරීමට ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) තාක්ෂණික සහාය ලබා දීමේ මෙහෙය සඳහා එහි සාමාජිකයන් තිදෙනෙක් 2022 ඔක්තෝම්බර් මාසයේදී ශ්‍රී ලංකා මහ බැංකුව වෙත පැමිණෙන ලදී. ගෙවීම් සහ පියවීම් පද්ධති පනත සමාලෝචනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කරන ලද අභ්‍යන්තර කමිටුව ඇතුළු ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන් සහ තවත් බාහිර පාර්ශ්වකරුවන් කිහිප දෙනෙකුගේ සහභාගීත්වයෙන් යුතුව එහි රැස්වීම් පවත්වන ලදී.

(ඉ) 2021 ඔක්තෝම්බර් මාසයේදී ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා වූ හවුල් ක්‍රමවේදයට අදාල සංකල්ප සාධනය සාර්ථකව නිම කිරීමෙන් අනතුරුව, ශ්‍රී ලංකාව සඳහා, සුදුසු ගනුදෙනුකරු හඳුනාගැනීම සඳහා වූ හවුල් ක්‍රමවේද යෙදුමක් මිලදී ගැනීම ආරම්භ කිරීමට අවශ්‍ය පියවර ගන්නා ලදී.

(ඊ) ශ්‍රී ලංකාවේ ගෙවීම් උපකරණ/ක්‍රම සහ යටිතල පහසුකම් විදහා දැක්වෙන ශ්‍රී ලංකාවේ ගෙවීම් සේවා සඳහා මාර්ගෝපදේශය නමින් අත්පොතක් මුද්‍රිත සහ විද්‍යුත් වශයෙන් ප්‍රකාශයට පත් කරන ලදී. විද්‍යුත් පිටපත ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙන් ලබා ගත හැකිය.

(උ) රටේ පුරවැසියන් අතර ඩිජිටල් ගෙවීම් ප්‍රවර්ධනය කිරීම සඳහා, ජාතික අධ්‍යාපන ආයතනය වෙත ඩිජිටල් ගෙවීම් භාවිතය පිළිබඳ පාසල් දරුවන් දැනුවත් කිරීම සඳහා නිර්දේශිත විෂය මාලාවක් ලබා දෙන ලදී.

(ඌ) ශ්‍රී ලංකාව තුළ මහ බැංකු ඩිජිටල් මුදල් (CBDC) හඳුන්වාදීමේ ශක්‍යතා අධ්‍යයනයක් සිදු කරන ලදී.

(එ) ගනුදෙනුකරුවන්ගේ පහසුව සහ වෙළඳුන් වෙත සිදු කරන ගෙවීම්වල කාර්යක්ෂමතාව ඉහළ නැංවීම සඳහා නව ගෙවීම් උපකරණ හඳුන්වාදීම සඳහා අවසර ඉල්ලා යෝජනා ඉදිරිපත් කළ මූල්‍ය ආයතන කිහිපයකට අනුමැතිය ලබා දෙන ලදී.

(ඒ) ගෙවීම් කාඩ්පත් සහ ජංගම දුරකතන ආශ්‍රිත ගෙවීම් පද්ධති පිලිබඳ බලපත්‍රලාභී සේවා සපයන්නන්ගේ පද්ධතිවල විශ්වසනීයත්වය සහ ආරක්ෂාව සහතික කිරීම සඳහා එතැන් පරීක්ෂණ සහ විතැන් අවේක්ෂණ කටයුතු අඛණ්ඩව සිදු කරන ලදී.

(ඔ) හදිසි අවස්ථාවකදී ව්‍යාපාර මෙහෙයුම් කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යෑම සඳහා ඇති හැකියාව සහතික කිරීම සඳහා ලංකාසෙට්ල් පද්ධතියෙහි සහභාගිවන්නන්ගේ සහ ලංකාපේ (පුද්ගලික) සමාගමෙහි ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් ඇගයීමට සහ අධීක්ෂණයට ලක් කරන ලදී.

21.6 ජාතික ගෙවීම් කවුන්සිලය

ජාතික ගෙවීම් කවුන්සිලයෙහි, ලේකම් කටයුතු ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලබයි. ජාතික ගෙවීම් කවුන්සිලය, රටෙහි ගෙවීම් පද්ධතිවල සියලුම පාර්ශ්වකරුවන්ගේ නියෝජනය සහිත වේ. ගෙවීම් සඳහා නව ක්‍රම සහ තාක්ෂණයන් සංවර්ධනයට පහසුකම් සැලසීම, ගෙවීම් පද්ධතිවල ආරක්ෂාව සහ කාර්යක්ෂමතාව ප්‍රවර්ධනය කිරීම සහ මූල්‍ය පද්ධතියේ ස්ථාවරත්වයට පහසුකම් සැලසීම ජාතික ගෙවීම් කවුන්සිලයෙහි වගකීම් වේ. 2022 වසර තුල දී, නව ගෙවීම් තාක්ෂණයන්, සුරක්ෂිත ඩිජිටල් ගනුදෙනු සහ ඩිජිටල් ගෙවීම් ක්‍රම පිළිබඳ පාරිභෝගික දැනුවත්භාවය වැඩි කිරීම කෙරෙහි අවධානය යොමු කරන 2022-2024 ගෙවීම් පද්ධති සඳහා වන පෙරදැක්ම ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතිය ජාතික ගෙවීම් කවුන්සිලය විසින් අධීක්ෂණය කරන ලදී.

21.7 මහජනතාව දැනුම්වත් කිරීම

ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් රටෙහි ක්‍රියාත්මක ගෙවීම් සහ පියවීම් පද්ධති පිළිබඳ තොරතුරු සහ සංඛ්‍යාලේඛන ප්‍රචාරය කිරීම සඳහා නිකුත් කරනු ලබන කාර්තුමය විවරණිකාව ශ්‍රී ලංකා මහ බැංකු වෙබ් අඩවියෙහි අඛණ්ඩව ප්‍රකාශයට පත් කරන ලදී. මීට අමතරව, ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව විසින් ඩිජිටල් ගෙවීම්, ගෙවීම් ආශ්‍රිත වංචා, අතථ්‍ය මුදල් ආශ්‍රිත අවදානම සහ ගෙවීම් සම්බන්ධ වෙනත් කාලීන මාතෘකා පිළිබඳව සාමාන්‍ය ජනතාව දැනුවත් කිරීම සඳහා මාධ්‍ය නිවේදන නිකුත් කිරීම සහ දැනුවත් කිරීමේ වැඩසටහන් පවත්වන ලදී.

22. ප්‍රතිපත්ති සමාලෝචන සහ නිරීක්ෂණ

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිපත්තිවල බලපෑම සමාලෝචනය හා ඇගයීමත් ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සහ ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීම නිරීක්ෂණය කිරීමත් යන අරමුණු පෙරදැරි ව ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව 2007 දී පිහිටුවන ලදි. තවද, බැංකුවේ උපාය මාර්ගික සැලසුම් ක්‍රියාවලියට අවශ්‍ය පහසුකම් සැපයීම ද ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව මගින් සිදු කරනු ලබයි.

22.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ උපාය මාර්ගික සහ ක්‍රියාමාර්ගික සැලසුම

මහ බැංකුවේ අරමුණු හා අනුගත ව එක් එක් දෙපාර්තමේන්තුව විසින් 2022 දී ක්‍රියාත්මක කළ යුතු උපායයන් සහ ක්‍රියාමාර්ග සාකච්ඡා කිරීම සඳහා "Balancing Basics" යන තේමාව යටතේ 2022 උපායමාර්ගික කතිකාවත 2022 පෙබරවාරි මාසයේ දී පවත්වන ලදි. එහි දී සිදු කරන ලද සාකච්ඡා අනුව, 2022 අප්‍රේල් සිට දෙසැම්බර් දක්වා කාලසීමාව සඳහා වන ශ්‍රී ලංකා මහ බැංකුවේ උපායමාර්ගික සහ ක්‍රියාමාර්ගික සැලැස්ම පිළියෙළ කරන ලදි.

2023 උපාය මාර්ගික කතිකාවත, "Regaining Stability" යන තේමාව යටතේ 2022 නොවැම්බර් මාසයේ දී පවත්වන ලදි. මෙහි දී, ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුව සිය නිරීක්ෂණ සහ නිර්දේශයන් ද සහිත ව 2022 වර්ෂයේ දෙපාර්තමේන්තු ක්‍රියාකාරී සැලසුම්හි සමස්ත ප්‍රගතිය ඉදිරිපත් කළ අතර අනෙකුත් දෙපාර්තමේන්තු බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීම උදෙසා 2022 වසරේ ඔවුන්ගේ දායකත්වයත් එහි දී ඔවුන්ට මුහුණ දීමට සිදු වූ අභියෝගත් ඉදිරිපත් කරන ලදි. 2023 දෙපාර්තමේන්තුමය ක්‍රියාකාරී සැලසුම් ද මෙහි දී සාකච්ඡා කරන ලදි. උපාය මාර්ගික කතිකාවතේ දී සාකච්ඡා කරන ලද කරුණු ද සැලකිල්ලට ගෙන ශ්‍රී ලංකා මහ බැංකුවේ 2023 උපායමාර්ගික සහ ක්‍රියාමාර්ගික සැලැස්ම පිළියෙළ කර ඇත.

මුදල් මණ්ඩලයේ සාමාජිකයින්ගේ සහ බැංකුවේ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ සහභාගීත්වයෙන් ඉහත උපාය මාර්ගික කතිකාවත් දෙකම පවත්වන ලදි.

22.2 ප්‍රගති නිරීක්ෂණය

ප්‍රධාන කාර්ය සාධන දර්ශකවල ප්‍රගතිය ඇගයීමට එම එක් එක් ප්‍රධාන කාර්ය සාධන දර්ශක යටතේ හඳුනාගත් කාර්තුමය ඉලක්ක පාදක කරගනිමින් ප්‍රතිපත්ති සමාලෝචන හා අධීක්ෂණ දෙපාර්තමේන්තුව, එක් එක් දෙපාර්තමේන්තුවල ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමට අදාළ ප්‍රගතිය නිරීක්ෂණය කරන ලදි. ඒ සඳහා එක් එක් දෙපාර්තමේන්තුව සමග කාර්තුමය වශයෙන් ප්‍රගති සමාලෝචන රැස්වීම් පැවැත්විණි.

ක්‍රියාකාරී සැලසුම් ක්‍රියාත්මක කිරීමේ ප්‍රගතියත් ඇතැම් ක්‍රියාකාරකම් ප්‍රමාද වීමට බල පෑ කරුණුත් ප්‍රතිපත්ති සමාලෝචන හා නිරීක්ෂණ දෙපාර්තමේන්තුවෙහි නිරීක්ෂණ සහ නිර්දේශයන් ද සහිතව ආයතනික කළමනාකරණ කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලදි.

22.3 2023 ප්‍රමුඛතා ක්ෂේත්‍ර

සාර්ව ආර්ථික ස්ථාවරත්වය නැවත ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2023 සඳහා ප්‍රමුඛතා ක්ෂේත්‍ර පහක් හඳුනාගෙන ඇත. ඒ අනුව, මැදි කාලීන දැක්මක් සහිත ව බාහිර හා අභ්‍යන්තර සාධක යන දෙකම සැලකිල්ලට ගෙන මෙම ක්ෂේත්‍ර පහ තුළ දැනට පවතින සහ ඉදිරියේ දී ඇති විය හැකි අභියෝග ජය ගැනීම සඳහා අවශ්‍ය උපායමාර්ගයන් සැලසුම් කිරීම සඳහා එක් එක් ප්‍රමුඛතා ක්ෂේත්‍රයට අදාළ ව ප්‍රධාන දෙපාර්තමේන්තුවක් සහ අනෙකුත් වගකිව යුතු දෙපාර්තමේන්තු හඳුනා ගන්නා ලදි.

2023 වසර සඳහා හඳුනාගත් ප්‍රමුඛතා ක්ෂේත්‍ර පහ පහත පරිදි වේ.

- සාර්ව ආර්ථික ස්ථායීකරණ රාමුව ක්‍රියාත්මක කිරීම තුළින් මිල සහ ආර්ථික ස්ථායිතාව නැවත ඇති කිරීම
- අර්බුද සඳහා වන පූර්ව සූදානම හා කළමනාකරණය වැඩිදියුණු කිරීම තුළින් මූල්‍ය පද්ධති ස්ථායීතාව ආරක්ෂා කිරීම
- මහජනයාගේ සහ අනෙකුත් පාර්ශ්වකරුවන්ගේ අවබෝධය වැඩි දියුණු කිරීම සඳහා පැහැදිලි සහ සංක්ෂිප්ත සන්නිවේදනය
- ඉහළ ඵලදායිත්වයකින් යුතු, අභිප්‍රේරිත, රාජකාරිය වෙත යොමු වූ සහ තෘප්තිමත් මානව සම්පත් කණ්ඩායමක් ඇති කිරීම
- ශ්‍රී ලංකා මහ බැංකුවේ වගවීම සහතික කරමින් ස්වාධීනත්වය සහ අධිකාරිය ඉහළ නැංවීම

22.4 ප්‍රතිපත්ති සමාලෝචනය

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රසම්පාදන ක්‍රියාවලියේ ඵලදායිතාව, ප්‍රාදේශීය සංවර්ධනය පිළිබඳ මහ බැංකුවේ කාර්යභාරය සහ ප්‍රතිව්‍යුහගත කිරීම හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ සම්පත් ප්‍රශස්ත අයුරින් යොදා ගැනීම පිළිබඳ ව ප්‍රතිපත්ති අධ්‍යයන තුනක් 2022 වර්ෂය තුළ සිදු කරන ලදි.

23. රාජ්‍ය ණය

ශ්‍රී ලංකා මහ බැංකුව 1950 අගෝස්තු මස 28 වන දින ආරම්භ කරන අවස්ථාවේදීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ස්ථාපිත කරන ලදී. මුදල් නීති පනතේ 113 වන වගන්තිය ප්‍රකාරව රජයේ නියෝජිතයා වශයෙන් මහ බැංකුව වෙත පැවරී ඇති රාජ්‍ය ණය කළමනාකරණය කිරීමේ ව්‍යවස්ථාපිත වගකීම රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ඉටුකරනු ලබයි. මෙහිලා, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යයන් වනුයේ කාර්යක්ෂම රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළක් සංවර්ධනය කිරීම හා පවත්වාගෙන යාම, වෙළඳපොළ සහභාගීකරුවන්ට හා පොදු මහජනතාවට අවශ්‍ය තොරතුරු ලබාදීම, විචක්ෂණශීලී අවදානම් මට්ටමක් පවත්වා ගනිමින් අවම පිරිවැයක් යටතේ ප්‍රශස්ත ප්‍රතිඵලයන්ට හා පරිවයන්ට අනුකූලව රාජ්‍ය මූල්‍ය අවශ්‍යතා සපුරාලීම සහ අදාළ ප්‍රතිපත්තීන්ට අනුකූලව රාජ්‍ය ණය සේවාකරණය යනාදියයි. ඒ අනුව, 2022 වසර තුළදී රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ප්‍රධාන කාර්යයන් පහත දක්වා ඇත.

23.1 රජයේ දළ ණය ලබාගැනීමේ අවශ්‍යතාව සපුරාලීම සඳහා අරමුදල් රැස්කිරීම

(අ) දුර්වල වූ සාර්ව ආර්ථික තත්ත්වයන්, සමාජ දේශපාලනමය අස්ථාවරතා හා ණය කළමනාකරණ පරිමිතිය පිළිබඳ වූ අනුමාන නිසා හටගත් අවිනිශ්චිතතා හේතුවෙන් පැනනැගුණු දැඩි අභියෝග කාරී වාතාවරණයක් මධ්‍යයේ, විචක්ෂණශීලී ණය කළමනාකරණ ක්‍රමෝපායන්ට අනුකූලව, කල්පිරෙන ණය හේතුකොටගෙන ඇතිවන රජයේ ඉහළ දේශීය මූල්‍යන අවශ්‍යතාව භාණ්ඩාගාර බිල්පත් හා බැඳුම්කර සඳහා වෙළඳපොළ සහභාගීත්වය තුළින් සපුරාලීමට ක්‍රියාකාරී ලෙස කටයුතු කරන ලදී.

(ආ) භාණ්ඩාගාර බිල්පත් සැලකීමේ දී ආයෝජකයන් කෙටිකාලීන කල්පිරීම් සඳහා වැඩි නැඹුරුවක් පෙන්නුම් කරන ලද අතර භාණ්ඩාගාර බැඳුම්කර සඳහා ඔවුන්ගේ නැඹුරුව වැඩි වශයෙන් දිගු කාලීන කල්පිරීම් සඳහා දක්නට ලැබුණි.

(ඇ) 2022 පළමු අර්ධය තුළ දී, භාණ්ඩාගාරයේ විදේශ විනිමය අරමුදල් අවශ්‍යතාවයෙන් කොටසක් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වෙන්දේසි සහ සෘජු නිකුතු ක්‍රමවේද ඔස්සේ නිකුත් කිරීම හරහා සපුරාගැනීමට හැකිවිය.

(ඈ) එක් එක් අරමුදල් ප්‍රභවය යටතේ සංක්ෂිප්ත ක්‍රියාකාරකම් පහත සංඛ්‍යා සටහනෙහි දැක්වේ.

23.2 රජයේ ණය සේවාකරණය

විදේශ රාජ්‍ය ණය සේවාකරණය සම්බන්ධයෙන් 2022 අප්‍රේල් 12 දිනැති අන්තර්වාර ප්‍රතිපත්තියට අනුකූලව, රජය විසින් බහුපාර්ශ්වික ආයතන වලට ගෙවිය යුතු ණය හැර විදේශ ව්‍යවහාර මුදලින් නාමනය කරන ලද විදේශ රාජ්‍ය ණය සේවාකරණය අත්හිටුවන ලදී. මේ අතර, රජයේ විදේශ ණය ප්‍රතිව්‍යුහගත කිරීම ආරම්භ කිරීම සඳහා රජය විසින් 2022 මැයි මාසයේදී පිළිවෙලින් මූල්‍ය සහ නීති උපදේශකයන් ලෙස Lazard Frères SAS සහ Clifford Chance LLP පත් කරන ලදී.

2022 අප්‍රේල් 12 දිනැති ශ්‍රී ලංකාවේ විදේශ රාජ්‍ය ණය සේවාකරණය පිළිබඳ අන්තර්වාර ප්‍රතිපත්තිය යටතේ හඳුන්වා දී ඇති "බලපෑමට ලක් වූ ණය" වලින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර බැහැර කොට ඇත. ද්‍රවශීල විදේශ ව්‍යවහාර සම්පත්වල පවත්නා සීමා මත පදනම්ව ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ගෙවීම් සඳහා විකල්ප යාන්ත්‍රණයක් හඳුන්වා දෙමින් ආයෝජකයින් වෙත පහත සඳහන් විකල්ප යෝජනා ඉදිරිපත් කරන ලදී.

1. මුදල් ප්‍රතිපත්ති සීමාවන්ට යටත්ව ශ්‍රී ලංකා රුපියල්වලින් ගෙවීම් සිදු කිරීම.
2. මූලික නිකුතුවේ එක් එක් ලංසු සඳහා අදාළ වන පොලී අනුපාතික වැනි නියම සහ කොන්දේසි සහිතව අදාළ ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන (පොලී ගෙවීම්ද ඇතුළුව) අවම වශයෙන් මාස හයක කාලයක් දක්වා කල්පිරීම දීර්ඝ කිරීම.
3. අදාළ ප්‍රාථමික වෙන්දේසියේ සිට රාජකාරී දින හතක් ඇතුළත, ප්‍රාථමික වෙළෙඳපොළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකය යටතේ රජයේ සුරැකුම්පත් (භාණ්ඩාගාර බැඳුම්කර) නිකුත් කිරීම. පූර්ව ප්‍රාථමික වෙන්දේසියකදී පිරිනමන කල්පිරීම්වලට වඩා වෙනස් ඉතිරිව ඇති

II- 17 සංඛ්‍යා සටහන

2021 සහ 2022 වසරේ ණය උපකරණ සහ නිකුතු ක්‍රියාකාරිත්වය

උපකරණය	2021				2022			
	නිකුත් කිරීම් (රු. බිලියන)	බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%)	සාමාන්‍ය පරිණත කාලය (වසර)	වෙන්දේසි ගණන	නිකුත් කිරීම් (රු. බිලියන)	බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%)	සාමාන්‍ය පරිණත කාලය (වසර)	වෙන්දේසි ගණන
භාණ්ඩාගාර බිල්පත්	3,821.4	6.09	0.48	53	9,942.8	25.21	0.33	52
භාණ්ඩාගාර බැඳුම්කර	1,762.0	8.70	5.12	22	2,373.0	21.24	5.15	24
	නිකුත් කිරීම් (ඒ.ජ.ඩො. මිලියන)	බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%)	සාමාන්‍ය පරිණත කාලය (වසර)	වෙන්දේසි ගණන	නිකුත් කිරීම් (ඒ.ජ.ඩො. මිලියන)	බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතිකය (%) (ආ)	සාමාන්‍ය පරිණත කාලය (වසර)	වෙන්දේසි ගණන
ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර(අ)	1,041.3	7.34	1.47	5	622.3	7.76 [3.40]	0.53	2

(අ) මහ බැංකුවට නිකුත් කරන ලද භාණ්ඩාගාර බිල්පත් ඇතුළුව දළ භාණ්ඩාගාර බිල්පත් නිකුත් කිරීම්

(ආ) [ ] තුළ ඇති අගයන් මඟින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල විවෘත්‍ය අනුපාතිකයන්හි බර තැබූ සාමාන්‍ය ඵලදා අනුපාතික ව්‍යාප්තිය පිළිඹිබු කෙරෙයි. 2021 වසරේදී විවෘත්‍ය අනුපාතික සහිත ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත් කර නොමැත.

(ඇ) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර නිකුත්කිරීම් අගයන් 2022 දෙසැම්බර් මස 30 දින තෙක් ලද ආයෝජන තහවුරු කිරීම් සහ විකල්ප පියවීම් ක්‍රමවේදය යටතේ සිදු කරන ලද පරිණතීන් දීර්ඝ කිරීම් වලට අනුව දක්වා ඇත.

කල්පිරීම් සහිත වෙනත් රජයේ සුරැකුම්පත් සඳහා, ප්‍රාථමික වෙළෙඳපොළ බරිත සාමාන්‍ය ඵලදා අනුපාතික කල්පිරීමට අදාළව ගළපනු ලැබේ.

2022 වර්ෂය තුළ දී රුපියල් මිලියන 2,510,281 ක දේශීය ණය සේවාකරණ ගෙවීම් සහ රුපියල් මිලියන 487,364ක විදේශීය ණය සේවාකරණ ගෙවීම් ද ඇතුළුව, රුපියල් මිලියන 2,997,645ක සමස්ත ණය සේවාකරණ ගෙවීම් සිදුකිරීමට පහසුකම් සලසන ලදී. එහිදී, 2022.04.12 දින ප්‍රකාශයට පත් කරන ලද විදේශ රාජ්‍ය ණය සේවාකරණය සම්බන්ධයෙන් වූ රජයේ අන්තර්වාර ප්‍රතිපත්තියට අනුකූලව විදේශ ණය සේවාකරණය සිදු කරන ලදී. දේශීය ණය සේවාකරණය සම්බන්ධයෙන් සලකා බලන විට, 2022 වසරේදී දේශීය ව්‍යවහාර මුදල් ණය සඳහා පොලී සහ කල් පිරීමේ වටිනාකම් ගෙවීමේදී ජාත්‍යන්තර සුරැකුම්පත් හඳුනාගැනීමේ අංක (ISIN) 218ක් සඳහා ණය සේවාකරණය කරන ලද අතර එය 2021 දී හඳුනාගැනීමේ අංක 224ක් විය. විදේශීය විනිමය ණය සේවාකරණය සම්බන්ධයෙන් සලකා බලන විට, 2022 වසරේදී අවස්ථා 1249කදී විදේශ ණය සේවාකරණය කරන ලද අතර 2021 වසරේ දී එය 1836ක් විය.

23.3 රාජ්‍ය සුරැකුම්පත් හිමිකම් ලේඛනය පවත්වාගෙන යෑම

රාජ්‍ය නිර්ලේඛිත සුරැකුම්පත්හි හිමිකම් ලේඛනය, මධ්‍යම තැන්පතු පද්ධතියෙහි වාර්තා වේ. 2022 දෙසැම්බර් මස අගදී නිර්ලේඛිත සුරැකුම්පත්වල මුළු හිමිකම් ප්‍රමාණයෙහි මුහුණත වටිනාකම රුපියල් බිලියන 12,848.5ක් විය. මෙය භාණ්ඩාගාර බිල්පත් රුපියල් බිලියන 4,126.3කින් සහ භාණ්ඩාගාර බැඳුම්කර රුපියල් බිලියන 8,722.1කින් සමන්විත විය. 2022 දෙසැම්බර් අවසානය වන විට මධ්‍යම තැන්පතු පද්ධතියෙහි ලියාපදිංචි ගිණුම් සංඛ්‍යාව 129,627ක් ලෙස සටහන් විය.

මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට ඔවුන්ගේ හිමිකම්, ගනුදෙනු හා ගෙවීම් වශයෙන් වූ කාලීන ප්‍රකාශන යැවීමේ කාර්යය වසර පුරා අඛණ්ඩව සිදුවිය. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ විද්‍යුත් තැපෑල මඟින් ප්‍රකාශන 13,424ක් සහ සාමාන්‍ය තැපෑල මඟින් අර්ධ වාර්ෂික හිමිකම් ප්‍රකාශන 48,530ක්, මාසික ගනුදෙනු ප්‍රකාශන 105,863ක් සහ ගෙවීම් ප්‍රකාශන 40,089ක් මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් වෙත යවන ලදී.

මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන් සඳහා 2019 වසරේදී හඳුන්වා දෙන ලද තත්කාලීන දැනුම් දීමේ පහසුකම මඟින්, මධ්‍යම තැන්පතු පද්ධතියේ ලියාපදිංචි හා තත්කාලීන දැනුම් දීමේ පහසුකම ලබාගත් ගිණුම් හිමියන් වෙත එක් එක් නිර්ලේඛිත සුරැකුම්පත් ගිණුම් හරහා සිදු කරනු ලබන සියලුම හර හා බැර වාර්තා වීම්, කෙටි පණිවුඩ සහ/හෝ විද්‍යුත් තැපෑල මඟින් තත්කාලීන දැනුම් දීම් වශයෙන් ලබා දෙන ලදී. 2022 වසර තුළ, ලංකාසෙක්‍යු පද්ධතිය විසින් විද්‍යුත් තැපෑල මඟින් තත්කාලීන දැනුම්දීම් 260,028ක් සහ කෙටි පණිවුඩ මඟින් තත්කාලීන දැනුම් දීම් 121,634ක් ලබාදී ඇති අතර 2021 වසර දී එම අගයන් පිළිවෙළින් 147,744ක් සහ 47,561ක් විය.

මීට අමතරව, රාජ්‍ය සුරැකුම්පත්වල ආයෝජනය කිරීමේදී සුරක්ෂිතභාවය වැඩිදියුණු කිරීම සඳහා හඳුන්වාදෙනු ලැබූ ආරක්ෂිත ක්‍රියාමාර්ග අතුරින්, මධ්‍යම තැන්පතු පද්ධතියේ ගිණුම් හිමියන්ට තම යාවත්කාලීන ගිණුම් තොරතුරු අන්තර්ජාලය හරහා පරීක්ෂා කිරීමේ පහසුකම ලබා දෙන ලදී.

23.4 රාජ්‍ය සුරැකුම්පත් පියවීමේ පහසුකම් සැලසීම

රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව මඟින් ක්‍රියාත්මක කරනු ලබන සහ නඩත්තු කරනු ලබන ලංකාසෙක්‍යු පද්ධතිය, මධ්‍යම තැන්පතු පද්ධතියෙන් හා නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතියෙන් සමන්විත වේ. නිර්ලේඛිත සුරැකුම්පත් පියවීමේ පද්ධතිය මඟින් රාජ්‍ය සුරැකුම්පත්වල ප්‍රාථමික සහ ද්විතීයික වෙළෙඳපොළ ගනුදෙනු සඳහා පියවීම් සේවා සපයනු ලබයි. රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව ලංකාසෙක්‍යු පද්ධතියෙහි මෙහෙයුම් අඛණ්ඩව හා තත්කාලීනව සිදුවන බව සහතික කරමින්, රජයේ සුරැකුම්පත් ගනුදෙනුවල පියවීමේ කටයුතුවලට අදාළ පහසුකම් සැලසීමෙහි ලා ප්‍රධාන කාර්යභාරයක් ඉටු කරයි.

2022 වසර අවසාන වන විට, ලංකාසෙක්‍යු පද්ධතිය, තමන් වෙනුවෙන් සහ රජයේ සුරැකුම්පත්වල ආයෝජනය කර ඇති තමන්ගේ ගනුදෙනුකරුවන් වෙනුවෙන් ගිණුම් පවත්වාගෙන යනු ලබන සෘජු අලෙවි සහභාගීකරුවන් තිස් දෙදෙනෙකුගෙන් (බලපත්‍රලාභී වාණිජ බැංකු 24ක්, බලපත්‍රලාභී විශේෂිත බැංකු 1ක් සහ ප්‍රාථමික අලෙවි සමාගම් 7ක්) සහ තමන් වෙනුවෙන් පමණක් ගිණුම් පවත්වාගෙන යනු ලබන සෘජු සහභාගීකරුවන් තිදෙනෙකුගෙන් (ශ්‍රී ලංකා මහ බැංකුව, කොළඹ කොටස් වෙළෙඳපළ සහ සේවක අර්ථසාධක අරමුදල) සමන්විත විය.

23.5 ණය කළමනාකරණ මූලපිරිම් සහ වෙළඳපොළ සංවර්ධනයන්

යෝග්‍ය මූලාශ්‍ර හරහා අවශ්‍ය සම්පත් සපුරාලන අතරම, රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ වැඩි දියුණු කිරීමේ අරමුණින් එහි කාර්යක්ෂමතාව, ඵලදායීතාව සහ විනිවිදභාවය වැඩි දියුණු කිරීම සඳහා, පහත සඳහන් පියවර අනුගමනය කරන ලදී.

(අ) භාණ්ඩාගාර බිල්පත් සඳහා අදියර II හඳුන්වා දීම

භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියකට පසුව, එම වෙන්දේසියට අදාළ භාණ්ඩාගාර බිල්පත් සඳහා තවදුරටත් ලංසු ඉදිරිපත් කිරීමට, දෙවන අදියරක් හඳුන්වා දෙන ලදී. අදියර II සඳහා පිරිනමන උපරිම මුදල් ප්‍රමාණය, භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේදී හිඟයක් ඇති වුවහොත් එම හිඟය සහ වෙන්දේසියේදී පිරිනමන ලද සමස්ත මුදලින් සියයට 25කට සීමා වන අතර, භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියේ දී එක් එක් පරිණතයන් සඳහා තීරණය වන බරිත සාමාන්‍ය ඵලදා අනුපාතිකයන්ට යටත්ව මෙම නිකුතුව සිදු වේ. අදියර II සඳහා ඉදිරිපත් කරන ලද ප්‍රමාණය අභිබවා ලංසු ලැබුණහොත්, වෙන්දේසියට සහභාගී වූ පාර්ශවයන්ගේ සමස්ත සාර්ථකත්වයට සමානුපාතිකව වෙන් කිරීම් සිදු කෙරෙනු ඇත.

(ආ) සෘජු නිකුතු කවුළුව හරහා ඉදිරිපත් කරන ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන ප්‍රවර්ධනය කිරීම සඳහා දිරි දීමනා ක්‍රමවේදයක් හඳුන්වාදීම

විශේෂයෙන්ම, භාණ්ඩ හා සේවා අපනයන ආදායම් උපයන්නන් සහ අනෙකුත් විදේශ ව්‍යවහාර මුදල් හිමියන් සඳහා, 2022 පෙබරවාරි සිට ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන දිරි ගැන්වීමේ අරමුණින්, සෘජු නිකුතු කවුළුව හරහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල ආයෝජන යොමු කරන සැකසුම්කරුවන් වෙත දිරි දීමනාවක් ලබා දීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී. ඒ අනුව, ආයෝජන රැගෙන එන ආයෝජන සැකසුම්කරුවන්ට එකී ආයෝජන වටිනාකමෙන් සියයට 0.5කට (පදනම් අංක 50කින්) සමාන ප්‍රමාණයක ප්‍රවර්ධන හෝ මෙහෙයුම් ගාස්තුවක් පත්කළ නියෝජිතයන් හරහා ශ්‍රී ලංකා රුපියල් වලින් දිරි දීමනාවක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලබා දෙන ලදී.

(ඇ) භාණ්ඩාගාර මෙහෙයුම් කළමනාකරණ පද්ධතිය වෙනුවට සංචිත නොවන කළමනාකරණ පද්ධතියක් හඳුන්වා දෙන ලදී

විදේශ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම සඳහා දැනට පවතින පද්ධතිය වෙනුවට සංචිත නොවන කළමනාකරණ පද්ධතිය යටතේ නව පද්ධතියක් ප්‍රතිස්ථාපනය කිරීමේ ක්‍රියාවලිය ආරම්භ කරන ලදී. මෙම පද්ධතියේ ප්‍රධාන අරමුණ වන්නේ විදේශීය ණය සේවාකරණ ගෙවීම් ක්‍රියාවලියේ කාර්යක්ෂමතාව වැඩි කිරීමයි. මෙම නව පද්ධතිය 2022 ජනවාරි 01 වැනිදා සිට ක්‍රියාත්මක වේ.

(ඈ) ප්‍රාග්ධන වෙළඳපොළ යටිතල පහසුකම් සංවර්ධන ව්‍යාපෘතිය

දැනට ක්‍රියාත්මක ප්‍රාග්ධන වෙළඳපොළ සංවර්ධන ව්‍යාපෘතිය (Capital Market Development Project) යටතේ යෝජිත අති නවීන යටිතල පහසුකම් භාවිතය මඟින්, මූල්‍ය වෙළඳපොළ ගනුදෙනු සිදු කිරීම සහ ඒවායේ පියවීම් ක්‍රියාවලියෙහි වෙනසක් ඇති කිරීම තුළින් ශ්‍රී ලංකාව තුළ පවතින සමස්ත ආයෝජන හැසිරීම්, ජාත්‍යන්තරව පිළිගත් ඉහළ ප්‍රමිතීන් සමග ගැලපීමට අපේක්ෂා කෙරේ. එක්සත් රාජධානියේ ස්ථාපිත බී. ටී. ඒ. කන්සල්ටින්ග් ලිමිටඩ් ආයතනය විසින් ව්‍යාපෘතිය සඳහා උපදේශන සේවා සපයමින් සිටියි. විද්‍යුත් වෙළඳ පද්ධතියක්, මධ්‍යම ප්‍රතිපාර්ශවීය පද්ධතියකින් සමන්විත නිශ්කාෂණාගාරයක්, වැඩිදියුණු කළ මධ්‍යම සුරැකුම්පත් පද්ධතියක් සහ වෙළඳපොළ ආවේක්ෂණ පද්ධතියක් මෙම ව්‍යාපෘතිය යටතේ ස්ථාපිත කිරීමට අපේක්ෂා කෙරේ. කෙසේ වුවද, 2022 වසර තුළ රටේ පැවති ආර්ථික ගැටලු හේතුවෙන් මෙම ව්‍යාපෘතියේ ප්‍රසම්පාදන කටයුතු ක්‍රියාත්මක නොවූ අතර එම කටයුතු ඉදිරි වසරේදී නැවත ක්‍රියාත්මක වනු ඇත.

(ඉ) ලංකා සෙකියු සේවාවන් ඩිජිටල්කරණ වැඩසටහන ආරම්භ කිරීම

ලංකා සෙකියු විසින් සපයනු ලබන විද්‍යුත් සේවාවන් ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් 2022 වර්ෂයේ මැද භාගයේ සිට විධිවිධාන සම්පාදනය කර ඇති අතර, 2023 වර්ෂයේ දී ලංකාසෙකියු සේවාවේ දැනට පවතින භෞතික හා කඩදාසි මත පදනම් වූ සේවාවන් සම්පූර්ණයෙන්ම විද්‍යුත් මාධ්‍යයට පරිවර්තනය කිරීමට අපේක්ෂා කරනු ලබයි. සිය සේවාවන් ඩිජිටල්කරණය කිරීම හරහා ලෝකයේ තාක්ෂණික දියුණුව සමග සමගාමී වීමට බලාපොරොත්තු වන අතර, එමඟින් පිරිවැය සහ සන්නිවේදනයේ ඇතිවන ප්‍රමාදයන් අවම කිරීම මෙන්ම අයෝජකයන්ගේ තොරතුරු පුළුල් කිරීම ද අපේක්ෂා කෙරේ.

(ඊ) අපේක්ෂිත රාජ්‍ය ණය කළමනාකරණ නියෝජිත ආයතනය පිහිටුවීම සඳහා බලධාරීන්ට සහාය වීම

පවතින වත්මන් විධිවිධාන වෙනුවට ජාතික ණය කළමනාකරණ නියෝජිත ආයතනයක් පිහිටුවීමේ අවශ්‍යතාව රජය විසින් 2022 අගෝස්තු මාසයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරන ලද 2022 අතුරු අයවැය මඟින් නිවේදනය කරන ලදී. මේ සම්බන්ධයෙන් අවශ්‍ය තාක්ෂණික සහාය රාජ්‍ය ණය කළමනාකරණ දෙපාර්තුමේන්තුව මඟින් සපයනු ලැබේ.

23.6 ස්වෛරීත්ව ණය ශ්‍රේණිගත කිරීමේ සමාලෝචන මෙහෙයුම් සම්බන්ධීකරණය කිරීම

2022 වර්ෂයේදී, රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව විසින් ජාත්‍යන්තර ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනවල (ෆිච් ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය, මූඩීස් ආයෝජක සේවාව, එස් ඇන්ඩ් පී ගෝලීය ණය ශ්‍රේණිගත කිරීමේ ආයතනය) ශ්‍රේණිගත කිරීමේ කටයුතු වලට අනුකූලව, ඔවුන්ගේ ශ්‍රේණි ගත කිරීම් සමාලෝචන සඳහා පහසුකම් සලසන ලදී.

24. ප්‍රාදේශීය සංවර්ධන

2022 වසරේ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව රටේ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා නව ප්‍රතිපත්තිමය ක්‍රමෝපායන් සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය මූලික පියවර ගත් අතර, එවැනි මෙහෙයුම් කටයුතු හා සම්බන්ධව මෙතෙක් පැවති ක්‍රියාවලි යම්තාක් දුරට ස්වයංක්‍රීය කිරීම මඟින් ණය මෙහෙයුම් කටයුතුවල කාර්යක්ෂමතාව ඉහළ නැංවීමේ ක්‍රමවේදයන් පිළිබඳව තවදුරටත් අධ්‍යයනය කරන ලදී. තවද, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොවීන්ගේ හා අනෙකුත් අගය දාම සහභාගීකරුවන්ගේ මූලික අවශ්‍යතා සහ ජාතික ආර්ථිකය වෙත ඔවුන්ට දායක වීමට ඇති හැකියාව හඳුනා ගනිමින් කෘෂිකාර්මික අගය දාම මූල්‍යකරණ ක්‍රියාමාර්ග කෙරෙහි ද සිය අවධානය යොමු කරන ලදී.

මේ අතර, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වසර තුළ දී ණය පරිපූරක සේවා රැසක් සපයන ලද අතර, විවිධ ප්‍රතිමූල්‍යකරණ, පොළී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම සම්බන්ධීකරණය, පහසුකම් සැලසීම සහ ක්‍රියාත්මක කිරීම අඛණ්ඩවම සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව, ශ්‍රී ලංකා රජය, ණය ලබාදෙන නියෝජිත ආයතන සහ සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් එකී ණය යෝජනා ක්‍රම සඳහා අරමුදල් සපයන ලදී.

මූල්‍ය අන්තර්ගතභාවය සම්බන්ධයෙන් බැලුකළ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2021 වසරේ දී ශ්‍රී ලංකාවේ ප්‍රථම වරට දියත් කරන ලද මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයේ කාර්යයන් සම්බන්ධීකරණය, අධීක්ෂණය සහ ඇගයීම සඳහා ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ලේකම් කාර්යාලය පිහිටුවන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුව සහ මුදල් අමාත්‍යාංශය ප්‍රමුඛ ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනවල සහාය ඇතිව 2022 වසර අවසානය වන විට, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙහි සුවිශේෂී ප්‍රගතියක් අත්පත් කරගන්නා ලදී.

2024 වසරේ දී ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත ප්‍රධාන දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනට අරමුදල් සැපයීමේ හැකියාවන් සොයා බැලීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව වෙනුවෙන් PricewaterhouseCoopers (PWC) හි උපදේශක මඩුල්ලක්, දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනෙහි නියමු අදියරයෙහි ප්‍රගතිය සමාලෝචනය කර ඇත.

වෙළඳපොළෙහි සහ ප්‍රතිලාභීන්ගේ අවශ්‍යතා හඳුනා ගනිමින් අඩු පහසුකම් සහිත කණ්ඩායම් වලට වඩාත් උචිත නිෂ්පාදන සැපයීම සඳහා වර්ෂය තුළදී අදාළ පොලී අනුපාතික වෙනස් කිරීම, මෙහෙයුම් කාල පරිච්ඡේද දීර්ඝ කිරීම සහ ණය ආපසු ගෙවීම සඳහා ණය සහන කාලයක් සැපයීම යනාදි, ක්‍රියාමාර්ග කිහිපයක් ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන යෝජනා ක්‍රම සම්බන්ධව ගන්නා ලදී. එලෙස සිදු කිරීමේ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දරනු ලබන ණය අවදානම සැලකිල්ලට ගනිමින්, ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් වෙත ලබා දී ඇති ණයවලට අදාල ණය අවදානම ඇප යෝජනා ක්‍රම ඔස්සේ බෙදා ගැනීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අබණ්ඩව කටයුතු කරන ලදී.

සමාජ දුරස්ථ පිළිවෙත් සහ රෙගුලාසී අත්හිටුවීමත් සමග, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය මට්ටමින් ශ්‍රී ලංකා මහ බැංකුව නියෝජනය කරන ප්‍රාදේශීය කාර්යාල හා එක්ව ආර්ථිකයේ අවශ්‍යතා ඇති ජන කොටස් සඳහා සහ රටතුළ මූල්‍ය අන්තර්ගතභාවය වැඩි දියුණු කිරීම සඳහා මූල්‍ය සාක්ෂරතාව, ව්‍යවසායකත්ව සංවර්ධනය සහ අනෙකුත් වැඩසටහන් භෞතිකව පැවැත්වීම යළි හඳුන්වා දෙන ලදී.

24.1 සහනදායී ණය පහසුකම් පුළුල් කිරීම

2022 වසරේ දී, ප්‍රතිමූල්‍ය, පොලී සහනාධාර සහ/හෝ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 22ක් ක්‍රියාත්මක කිරීම මගින් මූල්‍ය ව්‍යාප්තිය පුළුල් කිරීමට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව අබණ්ඩවම කටයුතු කළ අතර, මෙම යෝජනා ක්‍රමවල විස්තර සංඛ්‍යා සටහන II-18 හි දක්වා ඇත.

2022 වසරේ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම මඟින් ප්‍රතිලාභීන් 63,202ක් වෙත රුපියල් මිලියන 17,244.4 ක මුළු ණය මුදලක් සහභාගීත්ව මූල්‍ය ආයතන හරහා මුදා හරින ලදී. මුදා හරින ලද මුළු ණය වලින් සියයට 50.7 ක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සපයනු ලබන ණය යෝජනා ක්‍රම මඟින් මුදා හරින ලද අතර ශ්‍රී ලංකා රජය මඟින් සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල විසින් අරමුදල් සපයනු ලබන යෝජනා ක්‍රම හරහා පිළිවෙළින් සියයට 47.8 ක් (රජය විසින් අරමුදල් සපයනු ලබන පොලී සහනාධාර යෝජනා ක්‍රම හරහා සහභාගිත්ව මූල්‍ය ආයතන විසින් කරන ලද මුදා හැරීම් ඇතුළුව) සහ සියයට 1.5ක් මුදා හරින ලදී. සමස්ත ණය මුදා හැරීම් වලින්, සියයට 57.6ක් ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම හරහා මුදා හරින ලද අතර, ඉතිරි සියයට 42.4 ක ප්‍රමාණය පොලී සහනාධාර සහ/හෝ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම හරහා මුදා හරින ලදී.

24.1.1 රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම

රජයේ නියෝජිතයෙකු ලෙස ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින්, 2022 වසරේ දී, රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන ලද ණය යෝජනා ක්‍රම 12ක් හරහා ණය මුදල් මුදා හරින ලද අතර එය ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම 9ක් සහ පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම 3 කින් සමන්විත වේ. මෙම යෝජනා ක්‍රම හරහා 2022 වසරේ දී ප්‍රතිලාභීන් 54,046ක් වෙත මුදා හරින ලද ණය ප්‍රමාණය, රුපියල් මිලියන 8,240.8 ක් එනම්, මුළු ණය බෙදා හැරීම්වලින් සියයට 47.8ක් විය.

(අ) රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන ලද පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම

ගොවීන් අතර වඩාත් ප්‍රචලිත ණය යෝජනා ක්‍රමයක් වන නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (සරුසාර) පොලී සහනාධාර සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රමයක් වන අතර, එය දීප ව්‍යාප්ත ගොවීන්ගේ කෙටි කාලීන කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලමින්, 2022 වසරේ දී ද අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය මඟින්, කෙටි කාලීන භෝග වර්ග 34ක් සඳහා ණය පහසුකම් ලබාදෙන අතර 2022 වසරේ දී ගොවීන් 48,762ක් සඳහා රුපියල් මිලියන 7,251ක ණය මුදල් ප්‍රමාණයක් මුදා හරින ලදී. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් මෙම යෝජනා ක්‍රමය යටතේ නිකුත් කරන ලද මුළු ණය ප්‍රමාණය රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම හරහා මුදා හරින ලද මුළු ණය මුදා හැරීම්වලින් සියයට 88.0ක් වේ.

2022 වසරේ දී නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධන කරමින් අදාළ පොලී අනුපාත සහ මූල්‍ය පරිමාණ සංශෝධනය කරන ලදී. ආහාර සුරක්ෂිතතාව තහවුරු කිරීම සඳහා රටේ කෘෂිකාර්මික කටයුතු දිරිමත් කිරීම, ආහාර ආනයන සඳහා වැය වන විදේශ විනිමය වියදම් අවම කිරීම, ජනතාව කෘෂිකාර්මික නිෂ්පාදන කෙරෙහි වඩාත් නැඹුරු කරවීම සහ කුඩා පරිමාණ ගොවීන්ගේ සමාජ ආර්ථික තත්ත්වයන් ඉහළ නැංවීම මෙම සංශෝධනවල අරමුණ විය. මෙම සංශෝධන හඳුන්වා දීමේ දී රටේ පවතින ආර්ථික තත්ත්වය සහ අදාළ රජයේ ප්‍රතිපත්තිමය ක්‍රියාමාර්ග ද සැලකිල්ලට ගන්නා ලදී. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින්

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය සඳහා ණය අරමුදල් සපයනු ලබන අතර, රජය විසින් වසරකට සියයට 7ක පොලී සහනාධාරයක් සපයන ලදී. අවසන් ණය ගැනුම්කරු සඳහා අදාල වන පොලී අනුපාතිකය වසරකට සියයට 8ක් වේ. 2022 වසරේ දී, රජය විසින් නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය යටතේ පොලී සහනාධාර ලෙස රුපියල් මිලියන 78.6ක් මුදා හරින ලදී.

2022.12.31 දින නිමා වීමට නියමිත ව තිබූ කුඩා පරිමාණ තේ හා රබර් පුනර්ජනන පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමේ කාලය, එම යෝජනා ක්‍රමයෙහි ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කරන ලද කුඩා පරිමාණ තේ හා රබර් පුනර්ජනන ව්‍යාපෘතිය දීර්ඝ කිරීමට අදාලව 2023.06.30 දින තෙක් දීර්ඝ කරන ලදී. කෙසේ වෙතත්, වෙළෙඳපොළෙහි සංවර්ධනයන්ට අනුකූලව, මෙම යෝජනා ක්‍රමයෙහි පොලී අනුපාතික සුදුසු පරිදි වෙනස් කරමින් කුඩා පරිමාණ තේ හා රබර් පුනර්ජනන පොලී සහනාධාර ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. ඒ අනුව, 2022 ජූලි 08 වන දින සිට 2022 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය සඳහා අවසන් ණය ගැනුම්කරු සඳහා අදාල වන අනුපාතිකය සියයට 6.5 සිට සියයට 9 දක්වා ඉහළ නැංවීමට කුඩා පරිමාණ තේ හා රබර් පුනර්ජනන පොලී සහනාධාර යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී. මූල්‍යමය වශයෙන් බැලුකළ, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව කුඩා පරිමාණ තේ හා රබර් පුනර්ජනන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සමග සහයෝගීව 2022 වසරේ දී ප්‍රතිලාභීන් 180ක් අතරේ රුපියල් මිලියන 37.8ක මුදලක් මුදා හරින ලදී.

(ආ) රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන ලද ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රම

2022 වසරේ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම 9ක් ඔස්සේ ප්‍රතිලාභීන් 5,104 ක් වෙත රුපියල් මිලියන 951.3ක් මුදලක් මුදා හරින ලදී. රජය, කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන හා එක්ව, 2022 වසරේ දී ප්‍රතිමූල්‍ය කෘෂිව්‍යාපාර ණය යෝජනා ක්‍රමය, ප්‍රතිමූල්‍ය තුරුණු ණය යෝජනා ක්‍රමය, ප්‍රතිමූල්‍ය මූල්‍ය ආයතන තොග ණය යෝජනා ක්‍රමය, ප්‍රතිමූල්‍ය ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය සහ ප්‍රතිමූල්‍ය ප්‍රවර්ධක තොග ණය යෝජනා ක්‍රමය සඳහා අරමුදල් සපයන ලදී.

තවද, පිළිගත් වෘත්තීය පුහුණු ආයතනයක් මඟින් පුහුණුවීම් ලද තරුණ තරුණියන්ට තමන්ගේම ස්වයං රැකියා ව්‍යාපෘතියක් ආරම්භ කිරීමට අවශ්‍ය මූල්‍ය ආධාර සැපයීමේ අරමුණින් ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමයෙහි II වන අදියරෙහි (SEPI II අදියර) මෙහෙයුම් කාලය 2023.01.01 දින සිට ආරම්භ වන වසර පහක කාලයක් සඳහා දීර්ඝ කිරීමට රජය සමග අත්සන් කළ පරිපාලන ගිවිසුම සංශෝධනය කෙරිණි.

24.1.2 ශ්‍රී ලංකා මහ බැංකුවේ අරමුදල් මඟින් ක්‍රියාත්මක කරන ලද යෝජනා ක්‍රම

ශ්‍රී ලංකාවේ ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල මූල්‍යමය ශක්‍යතාව පුළුල් කිරීමේ අරමුණෙහිව, ශ්‍රී ලංකා මහ බැංකුව 2022 වසරේ දී ප්‍රධාන ණය යෝජනා ක්‍රම 7ක් සඳහා අරමුදල් සැපයීමට අඛණ්ඩව ක්‍රියා කළ අතර, මෙම යෝජනා ක්‍රම 07 මඟින් ප්‍රතිලාභීන් 8,559 ක් අතරේ රුපියල් මිලියන 8,740 ක ණය මුදල් ප්‍රමාණයක් මුදා හරින ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ප්‍රමුඛතම ණය යෝජනා ක්‍රමය වන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය 2022 වසරේ දීත් අඛණ්ඩවම ක්‍රියාත්මක වූ අතර එමඟින් ප්‍රතිලාභීන් 8,062 ක් අතරේ රුපියල් මිලියන 7,706.3 ක ණය මුදලක් මුදා හරින ලදී. තවද, කෘෂිකාර්මික අංශය වෙත අරමුදල් ගලා යාම තීව්‍ර කිරීමේ ඇති වැදගත්කම සැලකිල්ලට ගෙන සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය යටතේ මුදා හරිනු ලබන නව ණය ප්‍රමාණය සියයට 80ක්, කෘෂිකර්මය, පශු සම්පත්, ධීවර සහ ආශ්‍රිත කර්මාන්තයන් සඳහා මුදා හරින ලෙස සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත උපදෙස් ලබා දෙමින් එකී ණය යෝජනා ක්‍රමයේ පොලී අනුපාතිකය සියයට 9ක් දක්වා ඉහළ නැංවීමට අදාලව මෙහෙයුම් උපදෙස් සංශෝධනය කරන ලදී.

නිෂ්පාදනය සහ නිෂ්පාදිත ගුණාත්මකභාවය ඉහළ නැංවීම සහ මනා ලෙස සම්බන්ධිත කෘෂිකාර්මික අගය දාම ඔස්සේ වෙළෙඳපොළ අවස්ථා ප්‍රවර්ධනය කිරීමට අවශ්‍ය තාක්ෂණික සහ මූල්‍යාධාර ලබාදෙමින් කුඩා වතු හිමියන් සඳහා පුළුල් සංවර්ධන ක්‍රමවේදයන් හඳුන්වා දීම සඳහා දේශීය කෘෂිකාර්මික නියමු ව්‍යාපෘතිය, ප්‍රතිමූල්‍ය ණය යෝජනා ක්‍රමයක් ලෙස ස්ථාපිත කරන ලදී. හඳුනාගත් අගය දාමය විධිමත් කිරීමෙහිලා මූලිකත්වය ගෙන කටයුතු කිරීමට අපේක්ෂා කරන සහ අදාල කෘෂිකාර්මික අගය දාමයෙහි ක්‍රියාකරුවන්ගේ සහභාගීත්වය තහවුරු කරනු ලබන සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් තෝරා ගන්නා ලද ප්‍රධාන ක්‍රියාකරුවන් මෙයට සම්බන්ධවීම මෙම යෝජනා ක්‍රමයේ සුවිශේෂී ලක්ෂණයකි. ඔවුන් මෙම අගය දාමයට සම්බන්ධ පෞද්ගලික අංශයේ සංවිධාන වල හෝ ප්‍රධාන ක්‍රියාකරුවෙකුගේ භූමිකාව ඉටු කිරීමට එකඟ වූ වෙනත් ඕනෑම අගය දාමයක සහභාගීකරුවෙකු විය හැකිය. මෙම යෝජනා ක්‍රමය 2024 වසරේත් ආසියානු සංවර්ධන බැංකුවේ අරමුදල් සමඟින් විස්තීරණ වැඩසටහනක් ලෙස හඳුන්වා දීමට අපේක්ෂිත ය.

මේ සම්බන්ධයෙන් වත්මන් සන්දර්භය තුළ මනා ලෙස සම්බන්ධීකරණය කළ කෘෂිකාර්මික අගය දාම වැඩසටහනක් පිහිටු වීමේ වැදගත්කම සලකා බලමින්, එ.ජ.ඩො. මිලියන 100ක මුදලක් සැපයීම මඟින් දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහන අඛණ්ඩව සිදු කරගෙන යෑමට අවශ්‍ය මූල්‍ය සහාය ලබා දීම සඳහා ආසියානු සංවර්ධන බැංකුව කැමැත්ත පළ කර ඇත. ඒ අනුව, ආසියානු සංවර්ධන බැංකුව නියෝජනය කරන PWC උපදේශක කණ්ඩායමක් 2022 වසරේ අග භාගයේ දී දේශීය කෘෂිකාර්මික සංවර්ධන-වැඩසටහන සමාලෝචනය කර ඇති අතර, මෙම සමාලෝචනයේ නිගමනයන් දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනට ඇතුළත් කිරීමට නියමිත ය.

II-18 සංඛ්‍යා සටහන

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනාක්‍රමවල සාරාංශය

අරමුදල් ප්‍රභවය	ණය යෝජනා ක්‍රමයේ තොරතුරු/සහනදායී ණය යෝජනා ක්‍රම				
	නම	අරමුණ	යෝජනා ක්‍රමයේ වර්ගය	2022 වසරේ දී අරමුදල් මුදා හැරීම (රුපියල් මිලියන)	අවසන් ණය ගැනුම්කරු වෙත පොළී අනුපාතිකය (වසරකට %)
ශ්‍රී ලංකා රජයේ අරමුදල් මඟින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම	දිළිඳුකම පිටුදැකීම සඳහා වන ක්ෂුද්‍ර මූල්‍ය ණය ව්‍යාපෘතිය - චක්‍රීය අරමුදල	ආදායම් උත්පාදන වැඩසටහන් හරහා දිළිඳුකම පිටුදැකීම ප්‍රවර්ධනය සහ අඩු ආදායම්ලාභී ජන කොටස් විධිමත් බැංකු පද්ධති හා සම්බන්ධ කිරීම	ප්‍රතිමූල්‍ය	69.30	12.00
	'ස්වශක්ති' ණය යෝජනා ක්‍රමය	ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර අංශයේ ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් වල නියුතු සහ නව ව්‍යවසායකයින් සඳහා රැකියා අවස්ථා බිහි කිරීම.	ප්‍රතිමූල්‍ය	175.00	5.50
	ස්වයං රැකියා ප්‍රවර්ධන මූලාරම්භක ණය යෝජනා ක්‍රමය - අදියර II	පිළිගත් වෘත්තීය පුහුණු ආයතන හරහා පුහුණුව, තරුණ තරුණියන්ට ස්වයං රැකියා අවස්ථා උදාකර ගැනීම සඳහා අවශ්‍ය මූල්‍ය පහසුකම් සැලසීම	ප්‍රතිමූල්‍ය	2.00	7.00
	SAPP - RF ආදායම් උත්පාදන ණය යෝජනා ක්‍රමය	කුඩා පරිමාණ ඉඩම් හිමියන්ගේ දිළිඳුකම දුරලීම, තරඟකාරීත්වය ඉහළ නැංවීම, වාණිජමය නිෂ්පාදන සහ වාණිජ පද්ධති වල අගය ඉහළ නැංවීම.	ප්‍රතිමූල්‍ය	83.10	6.50
	SAPP - RF කෘෂි ව්‍යාපාර ණය යෝජනා ක්‍රමය		ප්‍රතිමූල්‍ය	161.70	6.50
	SAPP - RF තුරුණු ණය යෝජනා ක්‍රමය		ප්‍රතිමූල්‍ය	357.80	6.50
	SAPP - RF FI තොග ණය යෝජනා ක්‍රමය		ප්‍රතිමූල්‍ය	59.36	6.50
	SAPP - RF ප්‍රවර්ධක තොග ණය යෝජනා ක්‍රමය		ප්‍රතිමූල්‍ය	31.16	6.50
	සැපයුම්දාම පුනර්ජීවන ණය යෝජනා ක්‍රමය	තේ සැපයුම්කරුවන්ගේ අගයදාම ශක්තිමත් කරමින් ව්‍යාපාර යලි නඟා සිටුවීම	ප්‍රතිමූල්‍ය	12.00	3.50
	'සරුසාර' නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය (NCRCS[1])	වී සහ කෙටිකාලීන බෝග වගාවේ නියුතු ක්ෂුද්‍ර හා කුඩා පරිමාණ වගාකරුවන්ගේ ජීවන තත්ත්වය නංවාලීම	පොළී සහනාධාර	5,034.60	2022.06.15 තෙක් 4.00 ඉන්පසු 8.00
	ශ්‍රී ලංකාවෙහි ඉස්සන් ගොවිපළ තිබු කිරීම සඳහා වන පොළී සහනාධාර ණය යෝජනා ක්‍රමය[1]	ඉස්සන් වගාකරුවන්ගේ ගොවිපල පහසුකම් ඉහල නැංවීමට සහය ලබාදීම.	පොළී සහනාධාර	-	මුල් මාස 18-4.50 ඉදිරි මාස 6-8.50
	කුඩා පරිමාණ තේ සහ රබර් පුනර්ජීවන STaRR[1] පොළී සහනාධාර වැඩසටහන	නව වගාවන් හරහා නිෂ්පාදනය ජනනය වනතුරු කුඩා තේ හා රබර් වගාකරුවන්ට ස්වයං රැකියා උත්පාදනයට හෝ කෙටි කාලීන ආදායම් ජනනය කිරීමේ ව්‍යාපෘති සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබාදීම.	පොළී සහනාධාර	37.80	9.0
ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අරමුදල් සම්පාදන කරන ලද	සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය	ස්වභාවික ආපදා හමුවේ හානියට පත් වූ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර නැවත ගොඩනැංවීම සහ දියුණු කිරීම සඳහා	ප්‍රතිමූල්‍යය	7,706.6	9.00
	කොවිඩ්-19න් බලපෑමට ලක් වූ රාජ්‍ය ව්‍යාපාර සඳහා වන ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමය - SCRF IV අදියර	කොවිඩ්-19 වසංගතය හමුවේ බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ ව්‍යාපාර ආර්ථිකමය වශයෙන් නැවත නඟා සිටුවීම	ප්‍රතිමූල්‍යය	-	9.00
	දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනෙහි නියමු ව්‍යාපෘතිය	දේශීය කෘෂිකාර්මික අංශය සංවර්ධනය කිරීම සහ කෘෂිකාර්මික අපනයන ප්‍රවර්ධන කිරීම	ප්‍රතිමූල්‍යය	337.11	<රුපියල් මිලියන 1-4.00 > රුපියල් මිලියන 1 සිට රුපියල් මිලියන 25 දක්වා - 5.00
	සෞභාග්‍යා කොවිඩ්-19 පුනරුද සහන ණය යෝජනා ක්‍රමය (SCRF) අදියර I	කොවිඩ්-19 වසංගතය හමුවේ බලපෑමට ලක්වූ පුද්ගලයින් සහ ව්‍යාපාර ආර්ථිකමය වශයෙන් නැවත නඟා සිටුවීම	ප්‍රතිමූල්‍යය	677.5	4.00
			ප්‍රතිමූල්‍යය	-	4.00
	SCRF අදියර II		පොළී සහනාධාර සහ ණය ඇප ආවරණ	-	4.00
	SCRF අදියර III				
	ක්ෂුද්‍ර, සුළු හා මධ්‍ය පරිමාණ සහල් මෝල් හිමියන් සඳහා වන ණය ඇප ආවරණ යෝජනා ක්‍රමය[2]	ණය යෝජනා ක්‍රමය යටතේ වී මිලදී ගැනීමට අරමුදල් සපයන සහභාගීත්ව මූල්‍ය ආයතන වලට ණය ඇප ආවරණ ලබාදීම		-	පවතින වෙළෙඳ අනුපාතිකය
දායකයකු විසින් අරමුදල් සපයනු ලබන	SAPP - 4P කෘෂිව්‍යාපාර ණය යෝජනා ක්‍රමය[3]	කුඩා පරිමාණ ඉඩම් හිමියන්ගේ දිළිඳුකම පිටුදැකීම, තරඟකාරීත්වය ඉහළ නැංවීම, වාණිජමය පද්ධති වල අගය ඉහළ නැංවීම	ප්‍රතිමූල්‍ය	38.78	6.50
	SAPP - 4P තුරුණු ණය යෝජනා ක්‍රමය[3]		ප්‍රතිමූල්‍ය	45.79	6.50
	SAPP මූල්‍ය අතරමැදි තොග ණය[3]		ප්‍රතිමූල්‍ය		

1 සහභාගීත්ව මූල්‍ය ආයතන සතු අරමුදල් සහ ශ්‍රී ලංකා රජය විසින් ලබා දෙන පොළී සහනාධාර

2 ශ්‍රී ලංකා මහ බැංකුව - ණය ඇපආවරණය, සහභාගීත්ව මූල්‍ය ආයතන - ණය මූල්‍යනය

3 කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල

24.1.3 ණය ලබාදෙන නියෝජිත ආයතන වල අරමුදල් මඟින් ක්‍රියාත්මක වන ණය යෝජනා ක්‍රම

2022 වසරේ දී, කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල විසින් අරමුදල් සපයනු ලබන කුඩාපරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි දායක අරමුදල් සපයනු ලබන සංරචකය යටතේ පොදු - පෞද්ගලික - නිෂ්පාදක - හවුල්කාරීත්ව (4P) කෘෂි ව්‍යාපාර, 4P තුරුණු ණය යෝජනා ක්‍රමය සහ 4P තොග ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව අඛණ්ඩවම කටයුතු කරන ලදී. මෙම යෝජනා ක්‍රම යටතේ බෙදා හරින ලද ණය ප්‍රමාණය රුපියල් මිලියන 263.4ක් වූ අතර, එම ණය ප්‍රමාණය කෘෂිකාර්මික අංශයේ ප්‍රතිලාභීන් 597ක් සඳහා මුදා හරින ලදී.

දරිද්‍රතාවය අවම කිරීම සහ ශ්‍රී ලාංකික කුඩා පරිමාණ ප්‍රජාව තුළ තරඟකාරීත්වය ඉහළ නැංවීමට දායක වීම කුඩාපරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහනෙහි ප්‍රධාන අරමුණ වේ. කුඩා පරිමාණ කෘෂි ව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන හා සම්බන්ධව වාණිජමය වශයෙන් නැඹුරු වූ කෘෂිකාර්මික නිෂ්පාදන සහ අලෙවිකරණ පද්ධති හා සම්බන්ධව කුඩාවතු ගොවි පවුල් වල ආදායම සහ පෝෂණයේ ගුණාත්මකභාවය ඉහළ නැංවීම එමඟින් අරමුණු කෙරේ.

24.2 ශ්‍රී ලංකාවේ මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය ක්‍රියාත්මක කිරීම

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගය 2021 වසරේ මාර්තු මාසයේ දී දියත් කරන ලද අතර එය ජාත්‍යන්තර මූල්‍ය සහයෝගීතාවේ සහ ප්‍රධාන ක්‍රියාත්මක කිරීමේ ආයතනවල සහයෝගය ඇතිව අඛණ්ඩව ක්‍රියාත්මක කෙරේ. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ ස්ථාපිත මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයේ ලේකම් කාර්යාලය විසින් පාර්ශවකරුවන්ගේ ප්‍රයත්නයන් සම්බන්ධීකරණය කර ව්‍යාපෘතියේ සුමට ක්‍රියාකාරීත්වය සහතික කිරීම සඳහා ක්‍රියාත්මක කරන ආයතනක වලට පහසුකම් සලසමින් මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයේ ක්‍රියාකාරී සැලැස්මේ ප්‍රගතිය අධීක්ෂණය සහ ඇගයීමට ලක් කරන ලදී. 2022 වසර තුළ දී, මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ග ලේකම් කාර්යාලය විසින් ජාතික මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ සභා රැස්වීම් 2ක්, කළමනාකරණ කමිටු රැස්වීම් 3ක් සහ ක්‍රියාකාරී කණ්ඩායම් රැස්වීම් 25කට වැඩි ගණනක් පවත්වන ලදී. 2022 වසර අවසානය වන විට, ක්‍රියාමාර්ගවලින් සියයට 24ක් පූර්ණ වශයෙන් නිමා කර ඇති අතර, මෙම ක්‍රියාමාර්ගවලින් සියයට 60කට වැඩි ප්‍රමාණයක් නියමිත වේලාවට ක්‍රියාත්මක වෙමින් පැවතිණි.

24.3 මූල්‍ය සාක්ෂරතාව

සාමාන්‍ය ජනතාවගේ මූල්‍ය සාක්ෂරතාව, කුසලතා සහ ධාරිතාව ඉහළ නැංවීමේ ඇති අවශ්‍යතාවය හඳුනා ගනිමින්, 2022 වසර තුළ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් වැඩසටහන් 490ක් පවත්වන ලදී.

මූල්‍ය අංශයෙන් බැහැරවීම හේතුවෙන් ඇතිවියහැකි අවාසි සහ ගැටළුකාරී තත්ත්වයන් පිළිබඳව දැනුවත්භාවය ඇති කිරීම මෙම වැඩසටහන්වල අරමුණ වූ අතර, ග්‍රාමීය සහ ප්‍රාදේශීය අංශ යන දෙකෙහි ම අවධානමට ලක් විය හැකි සමාජ කොටස් වෙත ළඟා වීම සඳහා ප්‍රයත්නයන් මෙමඟින් ගන්නා ලදී. ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය කාර්යාල විසින් විධිමත් මූල්‍ය අංශය වෙත පිවිසීමෙන් සහ සම්බන්ධ වීමෙන් අත්වන ප්‍රතිලාභ පිළිබඳව ඉස්මතු කරමින්, ඉලක්කගත පිරිසගේ අවශ්‍යතා පිරිමැසීම සඳහා වැඩසටහන් නිර්මාණය කරන ලදී. තවද, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව, ප්‍රාදේශීය කාර්යාල හා එක්ව ව්‍යවසායකයන්ගේ අවශ්‍යතා හඳුනා ගැනීමට සහ ඉහළ ආර්ථික නිමවුමක් උත්පාදනය කිරීමට අවශ්‍ය ශක්‍යතාවයන් තවදුරටත් ඉහළ නැංවීම සඳහා ක්ෂේත්‍ර චාරිකා 799 ක් පවත්වන ලදී.

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් පවත්වන ලද වැඩසටහන් පිළිබඳ විස්තර සංඛ්‍යා සටහන II-19 හි දක්වා ඇත.

II-19 සංඛ්‍යා සටහන

2022 වසරේ දී පවත්වන ලද දැනුම්වත් කිරීමේ සහ විශේෂ වැඩසටහන්

	වැඩසටහන් වර්ගය	වැඩසටහන් ගණන
1.	මූල්‍ය සාක්ෂරතාවය, ව්‍යවසායකත්ව සංවර්ධනය, ශක්‍යතා ගොඩනැංවීම සහ කුසලතා සංවර්ධන	476
2.	පුහුණුකරුවන් පුහුණු කිරීමේ වැඩසටහන	11
3.	ගුවන් විදුලි සහ රූපවාහිනී	02
4.	දැනුම් හුවමාරු කරගැනීම	01
5.	ක්ෂේත්‍ර චාරිකා	799
	එකතුව	1,289

24.4 ප්‍රාදේශීය මට්ටමේ නියෝජනය

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් අනුරාධපුර, කිළිනොච්චි, මාතලේ, මාතර, නුවරඑළිය සහ ත්‍රිකුණාමලය යන ප්‍රදේශවල ස්ථාපිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල හය හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය මට්ටමේ නියෝජනය තහවුරු කරනු ලබයි. මෙම ප්‍රාදේශීය කාර්යාල විසින් ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනය දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම සිදු කරනු ලබන අතරම, සේවක අර්ථසාධක අරමුදල ආශ්‍රිත කරුණු, දත්ත රැස් කිරීමේ කර්තව්‍යයන්, සමීක්ෂණ ආශ්‍රිත කටයුතු, මහ බැංකු ප්‍රකාශන සහ අනුස්මරණ කාසි සහ නෝට්ටු අලෙවිකිරීම වැනි ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන කටයුතු සම්බන්ධීකරණය කරනු ලබයි.

මූල්‍ය අන්තර්ගතභාවය පිළිබඳ ජාතික උපාය මාර්ගයෙ හි අරමුණු වලට අදාලව ප්‍රාදේශීය මට්ටමින් සාමාන්‍ය ජනතාව අතර මූල්‍ය අන්තර්ගතභාවය සහ මූල්‍ය සාක්ෂරතාව මට්ටම ඉහළ නැංවීම සඳහා ප්‍රාදේශීය කාර්යාල විසින් ඉමහත් පරිශ්‍රමයක් දරන අතර, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රාදේශීය මට්ටමින් ක්‍රියාත්මක කරනු ලබන විශේෂ ව්‍යාපෘති සඳහා ද සහය දක්වනු ලබයි. විධිමත් බැංකුකරණය, බලයලත්/බලපත්‍රලාභී ආයතන මඟින් සපයනු ලබන මූල්‍ය සේවා, එම ආයතන විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය

යෝජනා ක්‍රම සහ ව්‍යාජ මුදල් නෝට්ටු හඳුනා ගැනීම වැනි ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවාවන් සහ කාර්යයන් පිළිබඳ දැනුම්වත් කිරීමේ සැසි, සම්මන්ත්‍රණ සහ වැඩමුළු පැවැත්වීම මගින්, ප්‍රාදේශීය මට්ටමින්, මහ ජනතාව, නීතිය බලාත්මක කිරීමේ නියෝජිත ආයතන, පොදු සහ පෞද්ගලික ආයතනවල දැනුම්වත්භාවය ඉහළ නැංවීමට ද ප්‍රාදේශීය කාර්යාල විසින් ක්‍රියාමාර්ග ගනු ලබයි.

2022 වසරේ දී, ප්‍රාදේශීය කාර්යාල හය විසින් සේ.අ.අ. හා සම්බන්ධ ගැටලූ/ ඉල්ලීම් 143,882ක් සහ විවිධ අංශයන් හා සම්බන්ධ මහජන දුක්ගැනවිලි 1,658 ක් සෘජුවම හසුරුවන ලදී. සමීක්ෂණය ආශ්‍රිත කටයුතුවලට අදාළව, සියලූම ප්‍රාදේශීය කාර්යාල මඟින්, විවිධ දිස්ත්‍රික්කවල නියැදි 1,262 ක් ආවරණය කරන ලද අතර විදේශ විනිමය ප්‍රේෂණ, නීතිවිරෝධී තැන්පතු භාර ගැනීම, තහනම් කළ මූල්‍ය යෝජනා ක්‍රම, ව්‍යාජ මුදල් නෝට්ටු සහ ව්‍යාජ නෝට්ටු හඳුනා ගැනීම පිළිබඳ දැනුම්වත් කිරීමේ වැඩසටහන් 184ක් පවත්වන ලදී.

24.5 අනෙකුත් හඳුන්වාදීම්

24.5.1 හරිත ගම්මාන වැඩසටහන

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් 2020 වසරේදී නියමු ව්‍යාපෘතියක් ලෙස හඳුන්වා දෙන ලද හරිත ගම්මාන වැඩසටහන 2022 වසරේ දී ද අඛණ්ඩවම ක්‍රියාත්මක කරන ලදී. 2022 වසරේ දී ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ප්‍රාදේශීය කාර්යාලවල සහයෝගය ඇතිව තෝරා ගත් ගම්මානවල මුලපිරීම් කිහිපයක් සිදු කරන ලදී. ගෙවතු වගා පුහුණු කිරීම්, වැසි ජල සංරක්ෂණය, අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය, පුනර්ජනනීය බලශක්තිය, රුක් රෝපණය, පරිසර - සංචාරක ව්‍යාපාරය, හරිත ආදායම් උත්පාදන වැනි පරිසර හිතකාමී ව්‍යාපෘති මෙම වැඩසටහන්වලට ඇතුළත් විය. තවද, ගම්වැසියන් හට තම ආදායම් උත්පාදන විභවයන් කරා ළඟා වීමට අවශ්‍ය නව කුසලතා තුළින් සන්නද්ධ කිරීම ඉලක්ක කරගත් විවිධ ධාරිතා සංවර්ධන වැඩසටහනවලින් මෙන්ම, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය කාර්යාල විසින් පවත්වන ලද ණය කඳවුරු, ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් සහ මූල්‍ය සාක්ෂරතා වැඩසටහන්වලින් ප්‍රතිලාභ රැසක් අත්පත් කර ගැනීමට ගම්වැසියන්ට හැකිවිය.

24.5.2 ජාත්‍යන්තර ආයතන සමග සහයෝගීව කටයුතු කිරීම

2022 වසර තුළ දී, ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් මූල්‍ය අන්තර්ගතභාවය සඳහා වන සංවිධානය, ආසියානු ණය පරිපූරක ආයතන සම්මේලනය හා ආසියා පැසිෆික් ග්‍රාමීය හා කෘෂිකර්මාන්ත ණය සංගමය වැනි උපාය මාර්ගික වශයෙන් වැදගත් ජාත්‍යන්තර ආයතන සමග සිය සබඳතාවන් අඛණ්ඩව පවත්වා ගන්නා ලදී. රට තුළ මූල්‍ය අන්තර්ගතභාවය ඉහළ නැංවීම සඳහා ප්‍රඥප්තිය අත්සන් කරමින් දකුණු ආසියානු කලාපීය මූල්‍ය අන්තර්ගත මුලපිරීම් සමග ශ්‍රී ලංකා මහ බැංකුව අත්වැල් බැඳගන්නා ලදී.

25. නිරාකරණ හා බලගැන්වීම්

නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රධාන අරමුණක් වන මූල්‍ය පද්ධති ස්ථායිතාව පවත්වා ගැනීම සඳහා ප්‍රධාන මූල්‍ය ආරක්ෂණ යාන්ත්‍රණයක් වන ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල කාර්යක්ෂමව මෙහෙයවීමෙන් දායකත්වය සපයන ලදී. තවද, 1988 අංක 30 දරණ බැංකු පනතේ 83ඇ වගන්තිය යටතේ තහනම් මූල්‍ය යෝජනා ක්‍රම සම්බන්ධයෙන් විමර්ශන කටයුතු සිදු කිරීමෙන්ද, ශ්‍රී ලංකා මහ බැංකුව යටතේ නියාමනයට හා අධීක්ෂණයට ලක්වන බලපත්‍රලාභී බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සම්බන්ධ නිරාකරණ කටයුතු සම්බන්ධයෙන් පුළුල් නීතිමය ප්‍රතිපත්ති රාමුවක් සකස් කිරීමෙන්ද දායකත්වය සපයන ලදී.

ඒ අනුව 2022 වසර තුලදී දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යයන්හි සාරාංශයක් පහත දැක්වේ.

25.1 ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය කළමනාකරණය කිරීම

නිරාකරණ හා බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් මුදල් මණ්ඩලය මඟින් අනුමත කරන ලද රෙගුලාසි සහ ප්‍රතිපත්තීන්ට අනුකූලව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සියලූම මෙහෙයුම් සහ කළමනාකරණ කටයුතු තවදුරටත් සිදුකර ගෙන යන ලදී. තවද, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ නීතිමය රාමුව ශක්තිමත් කිරීමේ අරමුණින් තැන්පතු රක්ෂණයට අදාළ විධිවිධාන කෙටුම්පත් කර බැංකු (විශේෂ විධිවිධාන) පනතට ඇතුළත් කරන ලද අතර එය 2023 වසර තුළ නීතිගත කිරීමට නියමිතය. බැංකු (විශේෂ විධිවිධාන) පනත බලාත්මක කිරීමත් සමග, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ යෝජනා ක්‍රමයට යම් යම් නිරාකරණ ක්‍රියාමාර්ග සඳහා දායක වීමට හැකි වන අතර ඒ අනුව ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලෙහි කාර්ය හා බලතල රාමුව දැනට පවතින "pay box" රාමුවෙන් ඔබ්බට වැඩිදියුණු කරනු ඇත.

2022 අවසන් වන විට, මෙම යෝජනා ක්‍රමය සාමාජික ආයතන හැට හතකින් (67) සමන්විත වූ අතර එහි මුළු අරමුදල් ප්‍රමාණය දළ වශයෙන් රුපියල් මිලියන 86,107.9 (විගණනය කරන ලද) විය. තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලෙහි මූල්‍ය විශේෂතා පහත II-20 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II-20 සංඛ්‍යා සටහන

ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලෙහි මූල්‍ය විශේෂ අවස්ථා

අයිතමය	වටිනාකම (රුපියල් මිලියන)	
	31.12.2021 වන විට	31.12.2022 වන විට
අරමුදලෙහි ප්‍රමාණය	67,877.3	86,107.9
වෙනත් විස්තීර්ණ ආදායම් සංචිතය	(2,103.0)	(25,931.5)
ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමයේ සමස්ත ප්‍රාග්ධනය	65,784.4	60,176.4
සමස්ත ආදායම	19,298.9	24,889.9
සමස්ත වියදම	(96.6)	(226.3)
වසර සඳහා වූ අතිරික්තය (බදු වලට පෙර)	19,202.4	24,656.6
ආදායම් බදු	(2,647.1)	(6,436.1)
වසර සඳහා වූ අතිරික්තය (බදු වලට පසු)	16,555.2	18,220.6
මුළු වත්කම්	74,443.9	69,017.6
රජයේ සුරැකුම්පත්වල ආයෝජනය	69,529.2	63,596.0
ණය සහ ලැබිය යුතු මුදල් (භාතිකර ප්‍රතිපාදන ශුද්ධ)	381.9	192.7

25.2 පීඩාවට පත් මුදල් සමාගම්වල තැන්පතුකරුවන්ට වන්දි ගෙවීම

2022 වර්ෂයේදී ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදලෙහි රෙගුලාසිවලට අනුව බලපත්‍ර අවලංගු කරන ලද/අත්හිටවූ මූල්‍ය සමාගම් හයක (06) තැන්පතුකරුවන්ට නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් වන්දි ගෙවීම් අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල විසින් රුපියල් මිලියන 30,499.24 ක වන්දි මුදලක් එම මුදල් සමාගම් හයේ තැන්පතුකරුවන් 72,641 කට ගෙවීමට හැකි විය. 2022.12.31 දිනට බලපත්‍ර අවලංගු කරන ලද/අත්හිටවූ සමාගම් සහ විස්තර පහත II-21 සංඛ්‍යා සටහනෙහි දක්වා ඇත.

II-21 සංඛ්‍යා සටහන

2022.12.31 දිනට ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ සහ ද්‍රවශීලතා ආධාරක අරමුදල විසින් ගෙවන ලද සම්පූර්ණ වන්දිය

සමාගමේ නම	සම්පූර්ණ රක්ෂිත වටිනාකම (රු. මිලියන)	ගෙවන ලද තැන්පතුකරුවන් සංඛ්‍යාව	ගෙවා ඇති වන්දි මුදල (රු. මිලියන)	සම්පූර්ණ රක්ෂිත වටිනාකමේ ප්‍රතිශතයක් ලෙස ගෙවන ලද වන්දි මුදල
සෙන්ට්‍රල් ඉන්වෙස්ට්මන්ට් ඇන්ඩ් ෆයිනෑන්ස් පී.එල්.සී.	2,465.66	3,497	1,982.76	80.41%
ද ස්ටැන්ඩර්ඩ් ක්‍රෙඩිට් ෆයිනෑන්ස් ලිමිටඩ්	1,667.84	2,536	1,311.24	78.62%
ටී.කේ.එස්. ෆයිනෑන්ස් ලිමිටඩ්	1,190.74	1,876	1,017.37	85.44%
ද ෆයිනෑන්ස් කම්පැනි පීඑල්සී	14,735.82	35,343	12,573.62	85.33%
ඒ.ටී.අයි ෆයිනෑන්ස් ලිමිටඩ්	13,915.89	26,782	12,565.68	90.30%
ස්වර්ණමහල් ෆයිනෑන්ෂියල් සර්විසස් ලිමිටඩ්	1,253.27	2,607	1,048.57	83.67%
එකතුව	**35,229.22**	**72,641**	**30,499.24**	**86.57%**

25.3 විමර්ශන කටයුතු

තහනම් යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීම සහ අනෙකුත් මූල්‍ය වංචාවන් සම්බන්ධයෙන් නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව වෙත විවිධ ආකාරවලින් මහජන පැමිණිලි ලැබී ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනෙකුත් දෙපාර්තමේන්තු සහ නීතිය ක්‍රියාත්මක කරන අධිකාරීන් සමග එක්ව, බැංකු පනතේ 83ඇ වගන්තියේ විධිවිධානවලට පටහැනි බවට චෝදනා කරන ලද තහනම් මූල්‍ය යෝජනා ක්‍රම පිළිබඳව එතැන් සහ විතැන් පරීක්ෂණ කිහිපයක් වසර තුළදී පවත්වන ලදී. නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව විසින් විමර්ශන දෙකක් අවසන් කර වාර්තා නීතිපති දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව, ලැබී ඇති මහජන පැමිණිලි පදනම් කරගෙන වසර තුළ කරුණු සෙවීමේ විමර්ශන 16 ක් පවත්වන ලදී.

තවද, සාමාන්‍ය ජනතාව තහනම් යෝජනා ක්‍රමවල ආයෝජනය කිරීම අවම කිරීම සහ වැළැක්වීම සඳහා, රජයේ නිලධාරීන්, පොලිස් නිලධාරීන්, බැංකු කාර්ය මණ්ඩල, පාසල් ගුරුවරුන්, ළමුන් සහ විශ්ව විද්‍යාල සිසුන් ඇතුළු ප්‍රජාවේ විවිධ කණ්ඩායම් ඉලක්ක කර ගනිමින් විවිධ ප්‍රවේශයන් ඔස්සේ ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් විශාල ප්‍රමාණයක් පවත්වන ලදී.

II-22 සංඛ්‍යා සටහන

2022 දී පවත්වන ලද දැනුවත් කිරීමේ වැඩසටහන් පිළිබඳ විස්තර

විස්තරය	ප්‍රමාණය
පුවත්පත් නිවේදන/ගැසට්	02
පුවත්පත් දැන්වීම්/පුවත්පත් නිවේදන	04
පිරමිඩ යෝජනා ක්‍රම සම්බන්ධ ෆේස්බුක් විමසීම්	42
පෝස්ටර්/පත්‍රිකා බෙදාහැරීම්	11,508
සාකච්ඡා	01
සම්මන්ත්‍රණ/ වෙබ් සම්මන්ත්‍රණ	29

25.4 මහ බැංකුවේ බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා නිරාකරණ රාමුවක් සකස් කිරීම

මහ බැංකුවේ බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා නිරාකරණ රාමුව ශක්තිමත් කිරීම සඳහා, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (IMF) සහ ලෝක බැංකුවේ (WB) තාක්ෂණික සහාය ලබා ගනිමින් බැංකු (විශේෂ විධිවිධාන) පනත කෙටුම්පත් කිරීමට නිරාකරණ සහ බලගැන්වීම් දෙපාර්තමේන්තුව දායක වී ඇත.

කෙටුම්පත් කරන ලද බැංකු (විශේෂ විධිවිධාන) පනත මගින් ශ්‍රී ලංකා මහ බැංකුව නිරාකරණ අධිකාරිය ලෙස ස්ථාපිත කිරීම සඳහා විධිවිධාන ඇතුළත් වන අතර මෙම පනතෙහි තැන්පතුකරුවන්ගේ සහ ණයහිමියන්ගේ අයිතීන් ආරක්ෂා කර මූල්‍ය පද්ධතියේ ස්ථායීතාවය ආරක්ෂා කර ගැනීමේ අරමුණ ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුවට සහ ශ්‍රී ලංකා රජයට මුදල් සමාගම්හි අඛණ්ඩ පැවැත්ම සහතික කිරීම සඳහා

නියමිත වේලාවට අදාල නිරාකරණ ක්‍රියාමාර්ග ගැනීම සඳහා ක්‍රියාත්මක කල හැකි පරිදි සවිස්තරාත්මක ක්‍රියාමාර්ගයන් ඇතුළත් වේ.

කෙටුම්පත් කරන ලද බැංකු (විශේෂ විධිවිධාන) පනත සඳහා අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබාගෙන පනත කෙටුම්පත් කිරීම සඳහා නීති කෙටුම්පත් දෙපාර්තමේන්තුව වෙත යවා ඇත. පනත් කෙටුම්පත සඳහා පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබුණු පසු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍ර නිකුත්කර නියාමනය සහ අධීක්ෂණය කරනු ලබන බලපත්‍රලාභී බැංකු සහ බැංකු නොවන මුදල් සමාගම්වල නිරාකරණ පියවර මෙම පනතේ පවතින ප්‍රතිපාදන මත පදනම්ව ක්‍රියාත්මක කරනු ලැබේ.

26. අවදානම් කළමනාකරණ

සිය ප්‍රතිපත්තිමය අරමුණු ඉටු කර ගැනීමේදී, ශ්‍රී ලංකා මහ බැංකුවට මූල්‍යමය හා මූල්‍යමය නොවන විවිධ අවදානම් වලට මුහුණ දීමට සිදු වේ. මෙවැනි අවදානම් ඇති වීම තුළින්, බැංකුවේ අරමුණු සාක්ෂාත් කර ගැනීමට, බැංකුවේ මූල්‍ය තත්වයට සහ කීර්තිනාමයට අහිතකර බලපෑමක් ඇතිවිය හැකි බැවින්, මනා ලෙස පිළියෙළ කල අවදානම් කළමනාකරණ රාමුවක් පැවතීම ශ්‍රී ලංකා මහ බැංකුවට ඉතා වැදගත් වේ.

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි අවදානම් කළමනාකරණ රාමුවට අනුකූලව පිළියෙළ කරන ලද අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයේ (Risk Management Policy Statement) දක්වා ඇති පරිදි, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව මහ බැංකුවම ආවරණය කරමින් අවදානම් කළමනාකරණය ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිපත්ති සකස් කරයි. මෙම ක්‍රියාවලියේදී, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, පිළිගත් ප්‍රමිතීන්, මාර්ගෝපදේශ සහ අවදානම් කළමනාකරණය සඳහා නිසි භාවිතයන් අනුගමනය කරන අතර, අවදානම්වල හිමිකාරිත්වය සහ එහි කළමනාකරණය පිළිබඳව පැහැදිලි වගවීමක් අදාල පාර්ශ්වකරුවන් වෙත පවරා දී ඇත.

26.1 මෙහෙයුම් අවදානම (Operational Risk)

අවදානම් හඳුනාගැනීමේ ක්‍රියාවලිය යාවත්කාලීනව තබා ගැනීම සහ මෙහෙයුම් සඳහා වන අවදානම් ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් 2022 වර්ෂයේදී ශ්‍රී ලංකා මහ බැංකුවෙහි "මෙහෙයුම් අවදානම් වර්ගීකරණය (Operational Risk Taxonomy)" සමාලෝචනය කළ අතර, මේ සඳහා අවශ්‍ය පරිදි සංශෝධන ඇතුළත් කරන ලදී.

දෙපාර්තමේන්තු අවදානම් තක්සේරු කිරීම් සඳහා සපයනු ලබන පහසුකම් අඛණ්ඩව පවත්වා ගනිමින්, දෙපාර්තමේන්තු අවදානම් ලේඛන පිළියෙළ කිරීමට සහාය වීම සඳහා අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව අනෙකුත් දෙපාර්තමේන්තු සමග සමීපව කටයුතු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව තුළ අවදානම් පිළිබඳ දැනුම් සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමේ අදහසින්, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකු කාර්ය මණ්ඩලය සඳහා වසර මුඵල්ලේම අවදානම් කළමනාකරණය පිළිබඳ දැනුවත් කිරීමේ සැසි පවත්වන ලදී.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව, "සිදුවීම් වාර්තාකරණ පද්ධතිය (Incident Reporting System) හරහා වාර්තා වූ සිදුවීම් අඛණ්ඩව අධීක්ෂණය කරමින්, සිදුවීම්වල කේන්ද්‍රීය ගබඩාවක් නිර්මාණය කිරීම සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ගයන්හි ප්‍රගතිය නිරීක්ෂණය කිරීම සිදුකරන ලදී. මෙම ක්‍රමය හරහා රැස්කරගත් තොරතුරු, අවදානම් ප්‍රවණතා හා අවදානම් සහිත කලාප හඳුනා ගැනීමට මෙන්ම, ඒ හා සම්බන්ධ අවදානම් ප්‍රතිකර්ම වැඩි දියුණු කිරීමට උපකාරී වේ.

26.2 මූල්‍ය අවදානම (Financial Risk)

දෙවන පෙළ ආරක්ෂක ක්‍රියාදාමය ලෙස, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින්, මූල්‍ය අවදානම යටතේ ණය, වෙළඳපොළ සහ ද්‍රවශීලතා අවදානම් අධීක්ෂණය, විශ්ලේෂණය, ඇගයීම සහ වාර්තා කිරීම ස්වාධීනව සිදු කරනු ලැබේ. තවද, ජාත්‍යන්තර සංචිත (International Reserves), අභ්‍යන්තර ආයෝජන අරමුදල් (Internal Investment Funds) සහ රජය සඳහා නියෝජිතායතන කාර්යයක් ලෙස සිදු කරනු ලබන සේවක අර්ථසාධක අරමුදල හා සම්බන්ධ (Employee's Provident Fund) අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම්වලට අදාළව, අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශයට අනුව වැඩිදියුණු කරන ලද, ආයෝජන ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ වලට අදාළ දෙපාර්තමේන්තුවල අනුකූලතාවය සහතික කිරීමද අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරනු ලැබේ.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් අභ්‍යන්තර ආයෝජන අරමුදල් හා ජාත්‍යන්තර සංචිත සඳහා ආයෝජන ප්‍රතිපත්ති ප්‍රකාශයන් (Investment Policy Statement), ආයෝජන මාර්ගෝපදේශයන් (Investment Guidelines) හා උපායමාර්ගික වත්කම් විභජනයන් (Strategic Asset Allocation) ද සේවක අර්ථසාධක අරමුදල සඳහා උපායමාර්ගික වත්කම් විභජනයන් අවශ්‍ය පරිදි සංශෝධන ඇතුළත් කරමින් සංස්කරණය කරන ලදී. අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළ අවදානම් සහ ණය අවදානම් දර්ශක විශ්ලේෂණය කිරීම නිරන්තරයෙන් සිදු කරනු ලබන අතර, ඉහත සඳහන් අරමුදල් සඳහා අදාළ මාර්ගෝපදේශයන්හි දක්වා ඇති සීමා රාමු පිළිපැදීම නිරීක්ෂණය කරයි. මෙම සියලු අවදානම් තක්සේරු කිරීම් සහ අනුකූල නොවීම් අදාළ ආයෝජන අධීක්ෂණ කමිටු (Investment Oversight Committee) රැස්වීම්වලදී මාසිකව ඉදිරිපත් කරන ලදි.

අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් දැනට භාවිතා කරනු ලබන අවදානම් කළමනාකරණ යාන්ත්‍රණය තවදුරටත් ප්‍රවර්ධනය කිරීම උදෙසා අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති ප්‍රකාශය සමාලෝචනය කර සංශෝධනය කරන ලදි.

මීට අමතරව, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුව සඳහා අවදානම් අභිරුචි රාමුවක් (Risk Appetite Framework) හඳුන්වා දීම අරමුණු කරගනිමින් ඒ සඳහා මූලාරම්භයක් ලෙස, පුළුල් අධ්‍යයනයක් සිදු කිරීමෙන්

අනතුරුව සකස් කරන ලද වාර්තාව මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව (Non-Financial Risk Management Committee) සමග ද, මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුවේ (Board Risk Oversight Committee) බාහිර සාමාජිකයින් දෙදෙනා සමග ද සාකච්ඡා කරන ලදී.

මහ බැංකුවේ සියලුම මෙහෙයුම් සහ අරමුදල් කළමනාකරණ ක්‍රියාකාරකම් හා සම්බන්ධ අවදානම්, ඵලදායී ලෙස කළමනාකරණය කිරීම සඳහා කාර්තුමය වශයෙන්, මෙහෙයුම් අවදානම් පිළිබඳ වාර්තාවන්, මූල්‍ය නොවන අවදානම් කළමනාකරණ කමිටුව වෙත වාර්තා කිරීම සහ සියලුම මෙහෙයුම් හා මූල්‍යමය අවදානම් පිළිබඳ වාර්තාවන් මුදල් මණ්ඩල අවදානම් අධීක්ෂණ කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කිරීම, අවදානම් කළමනාකරණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

27. ලේකම් දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව ආරම්භයේදීම ප්‍රතිෂ්ඨාපිත දෙපාර්තමේන්තු අතරින් එකක් වන ලේකම් දෙපාර්තමේන්තුව මගින් සිදුකෙරෙන කාර්යයන් අතරින් ශ්‍රී ලංකා මහ බැංකුවේ සමස්ත ආයතනික පරිපාලන කටයුතු සිදු කිරීම, ප්‍රසම්පාදන කළමනාකරණය, විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම, විදේශ අධ්‍යයන කටයුතු හා විදේශ පුහුණු සංචාර සම්බන්ධයෙන් පහසුකම් සැලසීම, වත්කම් බැහැර කිරීම් කළමනාකරණය කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීම, මුදල් මණ්ඩලයට, අධිපතිතුමාට, නියෝජ්‍ය අධිපතිවරුන්ට හා සහකාර අධිපතිවරුන්ට අවශ්‍ය කාර්යාලීය සේවා සැපයීම සහ අධිපතිතුමාට අවශ්‍ය සන්ධාන සේවා සැපයීම ප්‍රධාන වේ.

(අ) සමස්ත ආයතනික පරිපාලනය

2022 වර්ෂය තුළදී ද, බැංකුවේ සමස්ත ආයතනික පරිපාලනය; පාලන රෙගුලාසි, වගවීම, අවදානම් කළමනාකරණය සහ වෙනත් ප්‍රධාන යහපාලන ගුණාංගවලට අනුකූලව කරගෙන යන ලදී. පසුගිය වසර තුළදී ලේකම් දෙපාර්තමේන්තුව විසින් බැංකුවේ දේපළ සම්බන්ධයෙන් සමීක්ෂණයක් පවත්වා ඇති විය හැකි අවදානම් හඳුනාගෙන බැංකුවේ සියලුම දේපල සඳහා පූර්ණ රක්ෂණ ආවරණයක් ලබා ගන්නා ලදී. තවද, මේ යටතේ ලේකම් දෙපාර්තමේන්තුව විසින් පිටතින් ලබාගෙන ඇති තැපැල් කළමනාකරණ සේවාව මගින් එන සහ යන ලිපි සම්බන්ධ අවශ්‍ය කටයුතු කිරීම, බැංකුවේ ලිපි ද්‍රව්‍ය ගබඩා කළමනාකරණය කාර්යක්ෂමව සහ පිරිමැසුම්දායක ලෙස කරගෙන යෑම, බැංකුව සම්බන්ධ විශේෂ උත්සව සංවිධානය කිරීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් වසර තුළ ඉටු කරන ලද අනෙකුත් කාර්යයන් විය. මීට අමතරව, වර්ෂය තුළ බැංකුව සඳහා සේවා සපයන ආයතන සමග මුදල් මණ්ඩලය වෙනුවෙන් මහ බැංකුවේ ලේකම් විසින් ගිවිසුම් වලට එළඹීමද සිදු කරන ලදී.

(ආ) ප්‍රසම්පාදන කළමනාකරණය

මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ වාර්ෂික අයවැය පදනම් කරගෙන 2022 වසර සඳහා පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලැස්මට අනුව, 2022 වසර තුළ දී ලේකම් දෙපාර්තමේන්තුව මගින් ප්‍රසම්පාදන කටයුතු කරගෙන යන ලදී. ජාතික ප්‍රසම්පාදන මාර්ගෝපදේශයන්ට අනුකූලව සකස් කරන ලද ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතෙහි දක්වා ඇති ප්‍රසම්පාදන පටිපාටියට සහ ටෙන්ඩර් ක්‍රමවේදයට අනුකූලව මෙකී භාණ්ඩ හා සේවා ප්‍රසම්පාදනය කරන ලදී. ඊට අමතරව, ඉතා කෙටි කාල සීමාවක් තුළ හදිසි අවශ්‍යතා සපුරාලීම සඳහා භාණ්ඩ හා සේවාවන් ගණනාවක් ප්‍රසම්පාදනය කිරීමට ද ලේකම් දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී.

(ඇ) විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය ක්‍රියාත්මක කිරීම

දෙදහස් තුන්සිය හතක (2,307) ප්‍රතිලාභීන් සංඛ්‍යාවක් සඳහා මහ බැංකු විශ්‍රාම ප්‍රතිලාභ ක්‍රමය යටතේ අදාළ ගෙවීම් කටයුතු කිරීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළදී ද අඛණ්ඩව කරගෙන යන ලදී. ඒ අනුව, විශ්‍රාම පාරිතෝෂික හා පරිවර්තිත විශ්‍රාම වැටුප් ගෙවීම, අර්ථසාධක අරමුදල් මුදා හැරීම, මාසික විශ්‍රාම වැටුප්, වැන්දඹු හා අනත්දරු අරමුදල්, වැන්දඹු පුරුෂ හා අනත්දරු අරමුදල් ගෙවීම ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී. තවද, ශ්‍රී ලංකා මහ බැංකු අත්පොතේ දක්වා ඇති නීතිරීති වලට අනුව ජීවත්වීමේ සහතික ලබා ගැනීමත්, විශ්‍රාම ප්‍රතිලාභීන්ගේ නොයෙකුත් අවශ්‍යතා ඉටුකර දීම සඳහා ඔවුන් සමග ලිපි ගනුදෙනු ගණනාවක් සිදු කිරීමත් වසර පුරා ලේකම් දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

(ඈ) විදේශ අධ්‍යයන කටයුතු හා පුහුණු සංචාර සඳහා පහසුකම් සැලසීම

මහ බැංකු සේවා නියුක්තයන්ගේ පශ්චාත් උපාධි කටයුතු සහ රාජකාරී විදේශ ගමන් සඳහා ලේකම් දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී අඛණ්ඩව පහසුකම් සලසන ලදී. මේ යටතේ ලේකම් දෙපාර්තමේන්තුව විසින් විශ්ව විද්‍යාලවලට සහ ඉහත කටයුතු සඳහා විදේශගත වූ සේවා නියුක්තයන්ට අදාළ ගෙවීම් කටයුතු සිදු කරන ලද අතර, විදේශගත වන සේවා නියුක්තයන් සඳහා වීසා ලබා ගැනීමට හැකි වනු පිණිස වීසා ලිපි හා අර්ථසාධක අරමුදල් ශේෂය තහවුරු කිරීමේ ලිපි නිකුත් කිරීම, ගුවන් ටිකට් පත් මිලදී ගැනීම සහ රක්ෂණ ආවරණ ලබා ගැනීම සඳහා සහාය වීම ද සිදු කරන ලදී. කෙසේ වුවද, පසුගිය වසරවලට සාපේක්ෂව මෙම වසර තුළ සිදු කළ විදෙස් සංචාර ප්‍රමාණය, පැවති COVID-19 වසංගතය හා ආර්ථික අර්බුදය හේතුවෙන් අඩු අගයක් ගනු ලැබීය.

(ඉ) සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීම

මහ බැංකුව විසින් එහි ස්ථාවර වත්කම් බැහැර කිරීම සඳහා යොදා ගනු ලබන සමීක්ෂණ මණ්ඩල කටයුතු සිදු කිරීමේ ක්‍රමවේදයට අනුව, යල්පිනූ, හානි වූ, සේවාකරණය කළ නොහැකි සහ අලුත්වැඩියා කළ නොහැකි වත්කම් හඳුනා ගැනීම සඳහා සමීක්ෂණ කටයුතු සිදු කරන ලද අතර මහ බැංකු අත්පොතේ අදාළ විධිවිධානවලට යටත්ව හඳුනාගත් එකී වත්කම් බැහැර කිරීම සිදු කරන ලදී.

(ඊ) අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය හා සන්ධාන සේවා සපයා දීම

2022 අප්‍රේල් 08 දින අධිපති ලේකම් දෙපාර්තමේන්තුව අහෝසි කිරීමෙන් පසු මහ බැංකු අධිපතිතුමාට අවශ්‍ය කාර්යාලයීය සහ සන්ධාන සේවා ලේකම් දේපාර්තමේන්තුවට අනුබද්ධිත කාර්යාලයක් ලෙස අධිපති ලේකම් කාර්යාලය විසින් සපයන ලදී. ඒ අනුව, අධිපතිතුමාගේ නිළ හමුවීම් සහ රැස්වීම් සංවිධානය දේශන හා ලිපි සඳහා කෙටුම්පත් සකස් කිරීම, අධිපතිතුමාගේ දේශීය සහ විදේශීය නිළ සංචාර සංවිධානය කිරීම, අධිපතිතුමාගේ නිළ උත්සව සඳහා අදාළ කටයුතු සංවිධානය කිරීම සහ මහ බැංකුවේ සහ අධිපතිතුමාගේ විශේෂිත ආරාධිත අමුත්තන් හට අවශ්‍ය සන්ධාන සේවා සැපයීම සිදු කරන ලදී.

28. ආරක්ෂක සේවා

1. කොවිඩ් - 19 වසංගත තත්ත්වය මත ඇති වූ විවිධ අභියෝග ජය ගනිමින් ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සහ එහි අනෙකුත් ස්ථාපිත ආයතනයන් ද ඇතුළුව සේවකයින්ට, අමුත්තන්ට, දේපළට සහ මුදල් ප්‍රවාහනය සඳහා ආරක්ෂාව සැපයීමේ මෙහෙයුම් කටයුතුවල අඛණ්ඩව වසර පුරා නිරත වෙන ලදී. එසේම, හදිසි තත්ත්වයන් යටතේ මුදල් ප්‍රවාහන කටයුතුවලදී ශ්‍රී ලංකා පොලිසිය සමග සම්බන්ධීකරණය වෙමින් ඒවාට විශේෂ ආරක්ෂාවන් සැපයීම ද සිදු කරන ලදී. ශ්‍රී ලංකා මහ බැංකුවේ සියළුම ව්‍යාපාර කටයුතු අඛණ්ඩව පවත්වාගෙන යාම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව ක්‍රියාකාරී වෙමින් දායකත්වය සපයන ලදී.

(අ) පද්ධතිය වැඩිදියුණු කිරීම

වර්ෂය තුළදී ශ්‍රී ලංකා මහ බැංකු මූලස්ථානයේ සහ මහ බැංකු පරිශ්‍රයන්හි පිහිටුවා ඇති සියළුම ගිනි නිවීමේ උපකරණයන්හි මෙහෙයුම් යෝග්‍යතාවය නිරන්තරයෙන් පරීක්ෂා කරමින්, නඩත්තු කිරීම සහ ප්‍රතිස්ථාපනය සිදු කරන ලදී. ගමන් මලු පරීක්ෂණ යන්ත්‍ර, භාණ්ඩ පරීක්ෂා කිරීමේ යන්ත්‍රය ඇතුළු අනෙකුත් සියළුම ආරක්ෂක උපකරණ නඩත්තුව අදාළ සේවා සපයන්නන් සමග සේවා ගිවිසුම් ප්‍රකාරව වසර පුරා සිදු කරන ලදී. ජංගම පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ යන්ත්‍ර දෙකක් ආරක්ෂක පද්ධතිය වැඩිදියුණු කිරීම සඳහා අළුතින් හඳුන්වා දෙන ලදී. ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව බුද්ධි තොරතුරු සම්බන්ධයෙන් නිසි බලධාරීන් සමග සම්බන්ධීකරණය වෙමින් ඒ සම්බන්ධව අඛණ්ඩව යාවත්කාලීන කිරීම සිදු කරන ලදී.

(ආ) නිරීක්ෂණ කටයුතු

අදාළ වර්ෂය තුළදී දෙපාර්තමේන්තුව, මහ බැංකු මූලස්ථානයට පැමිණි අමුත්තන් 85,299 දෙනෙකුගේ සහ ප්‍රාදේශීය කාර්යාලවලට පැමිණි සියළුම අමුත්තන්ගේ ආරක්ෂාවන් තහවුරු කරන ලදී. වර්ෂය තුළදී මුදල් පෙට්ටි හුවමාරු කිරීම් 30,514 ක් නිරීක්ෂණය කිරීම් සඳහා පහසුකම් සලසා ඇත.

(ඇ) කොවිඩ් - 19 වැළැක්වීම

සෞඛ්‍ය බලධාරීන් විසින් හඳුන්වාදුන් මාර්ගෝපදේශ ප්‍රකාරව, කොවිඩ්-19 වැළැක්වීම සඳහා මහ බැංකු පරිශ්‍රයට ඇතුළුවීමට පෙර කාර්ය මණ්ඩලයේ සහ අමුත්තන්ගේ ශරීර උෂ්ණත්වය මැනීම, දර්ශන ගත කිරීම හා තොරතුරු ලේඛනගත කිරීම යනාදී විවිධ ක්‍රියාමාර්ග සිදු කරන ලදී. කොවිඩ්-19 වසංගත තත්ත්වය හේතුවෙන් සේවය ලබා දිය නොහැකි කාර්ය මණ්ඩලයන්ට ලිපිලේඛන කළමනාකරණ කටයුතු වැඩිදියුණු කිරීමට සහාය වන ලදී. එසේම වැඩිදුරටත් බැංකු පරිශ්‍රය තුළ කාර්ය මණ්ඩලය අතර සම්බන්ධතා අවම කිරීම සඳහා ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව සඳහා නව රාජකාරී වාර්තා කිරීමේ ක්‍රමවේදයක් හඳුන්වා දෙන ලදී.

(ඈ) ආරක්ෂක සේවා පාලනයේ ගුණාත්මකභාවය ඇගයීම

අළුතින් මිලදී ගන්නා ලද ජංගම පුපුරණ ද්‍රව්‍ය පරීක්ෂා කිරීමේ යන්ත්‍ර පිළිබඳව ආරක්ෂක නිලධාරීන් හට පුහුණු වැඩ සටහනක් පැවැත්වූ අතර, එහි දී නව තාක්ෂණික උපකරණ පරිහරණය පිළිබඳ නිපුනතා වර්ධනය කිරීමට හැකි විය. ආරක්ෂක සේවා දෙපාර්තමේන්තුව විසින් වාර්ෂිකව සංවිධානය කරන පුහුණු වැඩ සටහන් සාර්ථකව නිම කිරීමට හැකියාව ලැබිණි.

29. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ

කාර්යක්ෂම, සෞඛ්‍යසම්පන්න සහ තෘප්තිමත් ශ්‍රම බලකායක් සහතික කරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යමණ්ඩලයේ යහපැවැත්මට පහසුකම් සැලසීම කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ කාර්යභාරය වේ. එබැවින් කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුවේ සුබසාධන පහසුකම් සැලසුම් කර ඇත්තේ ශ්‍රී ලංකා මහ බැංකුවේ සේවකයින්ගේ යහපත් කායික හා මානසික සෞඛ්‍යය පෝෂණය කිරීම සඳහා වන අතර එමගින් ශ්‍රී ලංකා මහ බැංකුව තුල සෞඛ්‍ය සම්පන්න සේවා පරිසරයක් ප්‍රවර්ධනය කරනු ලබයි. දෙපාර්තමේන්තුව විසින් සපයනු ලබන ප්‍රධාන සේවාවන් ලෙස කාර්යමණ්ඩල නිවාස (උකස්) ණය සැපයීම, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්යමණ්ඩල සුබසාධන ණය ක්‍රමය යටතේ වාහන ණය ඇතුළු ණය ලබාදීම, සේව්‍යදායක වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ වෛද්‍ය ව්‍යදම් ප්‍රතිපූර්ණය කිරීම, වෛද්‍ය මධ්‍යස්ථාන පහසුකම් හා ආපනශාලා පහසුකම් සැපයීම යනාදිය දැක්විය හැකිය. කාර්යමණ්ඩලයේ නිවාස, වාහන, වෛද්‍ය සහ අනෙකුත් සුභසාධන අවශ්‍යතා ආවරණය වන මෙම සේවාවන් සේවකයින් ගේ ජීවන තත්ත්වය ඉහළ නැංවීමට උපකාරී වන අතර, ඉහළ මට්ටමේ කාර්යක්ෂමතාවකින් යුතුව වැඩ කළ හැකි අභියෝගාත්මක සහ අභිප්‍රේරණය වූ ශ්‍රම බලකායක් ඇතිකරනු ලබයි. තවද, ශ්‍රී ලංකා මහ බැංකුවේ කාර්යමණ්ඩලයේ යැපෙන්නන්ගේ මෙන්ම විශ්‍රාමිකයන්ගේ වෛද්‍ය අවශ්‍යතා ද වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ ආවරණය වනු ලැබේ.

කොවිඩ්-19 වසංගතය හේතුවෙන් ඇතිවූ අභියෝගාත්මක වාතාවරණය මධ්‍යයෙහි වුවද කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව සුබසාධන පහසුකම් ප්‍රතිලාභීන් වෙත ලබාදීම 2022 වර්ෂය තුළද අඛණ්ඩව සිදු කරන ලදී. කොවිඩ්-19 වසංගතය සම්බන්ධයෙන් සෞඛ්‍ය බලධාරීන් විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශ වලට අනුකූලව කාර්යමණ්ඩලයට අවශ්‍ය නව සේවාවන් සඳහා

පහසුකම් සැලසීමට පියවර ලෙස එන්නත් ලබා ගැනීමේ වැඩසටහන් මහ බැංකු පරිශ්‍රය තුළ සංවිධානය කරන ලදී. කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව කාර්යමණ්ඩලය වෙත නිවාස සහ අනිකුත් සුබසාධන ණය පහසුකම් සැපයීම අඛන්ඩව සිදු කරන ලද අතර වසර තුළ වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි වූ සියලුම ප්‍රතිලාභීන් විසින් දරන ලද වෛද්‍ය වියදම් ප්‍රතිපූර්ණය කරන ලදී. 2022 වසර අවසාන වන විට සේවා නියුක්තියන්, විශ්‍රාමිකයන්, වැන්දඹුවන්, වැන්දඹු පුරුෂයන් සහ ලියාපදිංචි යැපෙන්නන්ගෙන් සමන්විත වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය යටතේ ලියාපදිංචි මුළු ප්‍රතිලාභීන් සංඛ්‍යාව ආසන්න වශයෙන් 9,842 ක් පමණ විය. වෛද්‍ය මධ්‍යස්ථානය මගින් මහ බැංකු සේවා නියුක්තියන් වෙත කාර්යාල වේලාවන් තුල දී වෛද්‍ය පහසුකම් සපයන ලද අතර සාධාරණ මිල ගණන් යටතේ වෛද්‍ය පරීක්ෂණ සහ රසායනාගාර සේවා පහසුකම් ද වෛද්‍ය මධ්‍යස්ථානය තුළින් ලබා ගැනීමට පහසුකම් සලසන ලදී. ජනවාරි මාසයේදී වෛද්‍ය මධ්‍යස්ථානයේ සේවා සැපයුම්කරු හරහා ඖෂධාලයක් විවෘත කරන ලදී. සුවපත් සිතක්, කොවිඩ් රෝගය හා හදවත් රෝග, නිරෝගිමත් දරු උපතක් සහ ගෙවතු වගාව යන මාතෘකා යටතේ 2022 වසර තුළදී සේවා නියුක්තිකයන් දැනුවත් කිරීමේ වැඩසටහන් MS Teams මාර්ගගත ක්‍රමය යටතේ සංවිධානය කර පවත්වන ලදී.

කාර්යමණ්ඩලය වෙත කාර්යාල වේලාවන් තුල දී ආපනශාලා පහසුකම් සැපයීම බාහිරින් ලබාගත් සේවා සපයන්නෙකු හරහා සිදු කරන ලදී. කාර්යමණ්ඩලයට සාධාරණ මිලකට ගුණාත්මක ආහාර පාන සැපයීම සහතික කිරීම සඳහා කාර්යමණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව ආපනශාලා කටයුතු නිරන්තරව අධීක්ෂණය කරන ලදී.

කාර්ය මණ්ඩල සේවා කළමනාකරණ දෙපාර්තමේන්තුව මගින් සපයනු ලබන සේවාවන් කාර්යක්ෂමව සිදු කිරීම සඳහා තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවේ සහයෝගය ඇතිව කාර්ය මණ්ඩල නිවාස (උකස්) ණය ක්‍රමය, අර්ථසාධක අරමුදල් ණය ක්‍රමය සහ කාර්ය මණ්ඩල සුභසාධන ණය ක්‍රමය, වෛද්‍ය ප්‍රතිලාභ ක්‍රමය සහ දුම්රිය බලපත්‍ර නිකුත් කිරීම සඳහා නව තොරතුරු පද්ධති වැඩිදියුණු කරමින් සිටී.

30. සංඛ්‍යාන

2022 වසරේ දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව දත්ත රැස් කිරීමේ දී ඇති වූ අපහසුතා සහ ඇතැම් මාසවල පැවති සංචරණ සීමා වැනි අභියෝග මධ්‍යයේ වුව ද සිය කටයුතු සැලසුම් කළ පරිදි සිදු කරන ලදී.

වසර තුළ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කටයුතු අතරට ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී භාවිතා කිරීම සඳහා කෙටිකාලීන උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතය (ද.දේ.නි.) පුරෝකථනය කිරීම, දත්ත පදනම් කරගත් තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා කාලෝචිත තොරතුරු සැපයීමට දත්ත එක්රැස් කිරීම හා දර්ශක සම්පාදනය කිරීම සහ ප්‍රකාශන හරහා තොරතුරු බෙදා හැරීම ඇතුළත් විය.

30.1 ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී භාවිතා කිරීම සඳහා කෙටිකාලීන උද්ධමනය සහ දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය (FPAS) සඳහා දායකත්වය ලබා දෙමින් කෙටිකාලීන උද්ධමනය සහ ද.දේ.නි.හි වර්ධනය පිළිබඳව පුරෝකථන අඛණ්ඩව සිදු කරන ලදී. ඒ අනුව, විවිධ මූලාශ්‍රවලින් ලබාගත් තොරතුරු උපයෝගී කරගනිමින් සංඛ්‍යානමය ආකෘති සහ දර්ශක පදනම් කරගත් පුරෝකථන සිදු කරන ලදී. මෙම පුරෝකථන මුදල් ප්‍රතිපත්ති කමිටු රැස්වීම්වල දී සවිස්තරාත්මකව සාකච්ඡා කරන ලද අතර ප්‍රතිපත්ති තීරණ ගැනීමට උපකාරී කරගැනීම සඳහා මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කරන ලදී.

30.1.1. කෙටිකාලීන උද්ධමනය පුරෝකථනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් වෙළඳපොළ ආශ්‍රිත නවතම මිල ප්‍රවණතා සහ අපේක්ෂිත මිල විචලන මෙන්ම ආර්ථිකමිතික ක්‍රමවේද පදනම් කරගනිමින් කොළඹ පාරිභෝගික මිල දර්ශකයට සහ ජාතික පාරිභෝගික මිල දර්ශකයට අදාළව කෙටිකාලීන උද්ධමන පුරෝකථන සිදු කරන ලද අතර උද්ධමන පුරෝකථනවල නිරවද්‍යතාව වැඩි දියුණු කිරීම සඳහා සැපයුම සහ ඉල්ලුම යන දෙ අංශයෙන්ම උද්ධමනය මත ඇතිවන බලපෑම පෙන්නුම් කෙරෙන නව විචල්‍ය පිළිබඳව අඛණ්ඩව අධ්‍යනය කරමින් කාල ශ්‍රේණි (time series) සහ යන්ත්‍ර ඉගෙනුම් ක්‍රමවේද (machine learning techniques) උපයෝගී කොටගෙන නව උද්ධමන පුරෝකථන ආකෘති ගොඩනැගීමේ ප්‍රයත්නයන්හි ද නිරත වන ලදී.

30.1.2. කෙටිකාලීන දළ දේශීය නිෂ්පාදිතය පුරෝකථනය කිරීම

කාර්තුමය වශයෙන් කෙටිකාලීන ද.දේ.නි. වර්ධන වේගයන් පුරෝකථනය කිරීම සඳහා ආකෘති සහ දර්ශක පදනම් කරගත් සංඛ්‍යානමය ක්‍රම භාවිතා කරන ලදී. දර්ශක පදනම් කරගත් පුරෝකථන සඳහා ප්‍රාථමික සහ ද්විතීයික පූර්ව ආර්ථික දර්ශක මෙන්ම සමීක්ෂණ මඟින් ලබාගත් තොරතුරු සමග විශේෂඥ දැනුම භාවිතා කරන ලද අතර, සංඛ්‍යානමය ආකෘති පදනම් කරගත් පුරෝකථන සඳහා ආර්ථිකමිතික ක්‍රම උපයෝගී කරගන්නා ලදී.

30.2 දත්ත පදනම් කරගත් තීරණ ගැනීමේ ක්‍රියාවලිය පහසු කිරීම සඳහා කාලෝචිත තොරතුරු සැපයීමට දත්ත රැස් කිරීම සහ දර්ශක සම්පාදනය කිරීම

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව, සමීක්ෂණ, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල (CWDCS) සහ වෙනත් ආයතන හරහා දත්ත ලබා ගැනීමෙන් ඒවා මඟින් දර්ශක සම්පාදනය කිරීමෙන් අඛණ්ඩව නිරත විය. මෙම දත්ත සහ අදාළ විශ්ලේෂණ ද.දේ.නි./උද්ධමනය පුරෝකථනය කිරීමේ දී භාවිතා කරන ලද අතර තීරණ ගැනීමේ ක්‍රියාවලියේ දී සලකා බැලීමට කළමනාකාරීත්වයට ද ලබා දෙන ලදී. තවද, මේ අතරින් ඇතැම් තොරතුරු මහ බැංකු වෙබ් අඩවියේ පළ කරන ලදී.

30.2.1 සමීක්ෂණ පදනම් කරගත් දත්ත රැස් කිරීම සහ දර්ශක සම්පාදනය කිරීම

30.2.1.1 ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශක පිළිබඳ සමීක්ෂණ

ගැණුම් කළමනාකරුවන්ගේ දර්ශක (PMI) පිළිබඳ සමීක්ෂණ, ආර්ථිකයේ තත්කාලීන තොරතුරු ලබා ගැනීමේ අරමුණින් මාසිකව සිදු කරන ලදී. මෙම සමීක්ෂණ, නිෂ්පාදන කර්මාන්ත, ඉදිකිරීම් සහ සේවා කටයුතු ආවරණය වන පරිදි ප්‍රධාන වශයෙන් බස්නාහිර පළාතේ කේන්ද්‍රගතව ඇති විශාල සමාගම් ඉලක්කකොටගෙන සිදු කරනු ලබයි. මෙම සමීක්ෂණයන්හි ප්‍රතිඵල, දර්ශක පදනම් කරගත් ද.දේ.නි. පුරෝකථනයේ දී අදාළ ආර්ථික කටයුතුවල මෑතකාලීන ප්‍රවණතා විශ්ලේෂණය කිරීම සඳහා පූර්ව දර්ශක ලෙස ද භාවිතා කරන ලදී. තවද, සමීක්ෂණවලින් ලබා ගන්නා තොරතුරු මත පදනම්ව කරන ලද විශ්ලේෂණ, ප්‍රතිපත්ති සැකසීමේ ක්‍රියාවලියට යොදා ගැනීම සඳහා කළමණාකාරීත්වය වෙත වාර්තා කරන ලදී. තවද, ආර්ථික විශ්ලේෂකයින් සහ සාමාන්‍ය ජනතාවගේ ප්‍රයෝජනය සඳහා නිෂ්පාදන සහ සේවා ගැනුම් කළමණාකරුවන්ගේ දර්ශක සමීක්ෂණයන්හි ප්‍රතිඵල මාසිකව මාධ්‍ය නිවේදන මඟින් ප්‍රකාශයට පත් කරන ලදී.

30.2.1.2 ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය

ආර්ථිකයේ පවත්නා සහ අපේක්ෂිත ප්‍රවණතාවන් පිළිබඳව පෙන්නුම් කරන ව්‍යාපාර අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය 2022 වසර තුළ දී ද කාර්තුමය වශයෙන් අඛණ්ඩව සිදු කරන ලදී. මෙම සමීක්ෂණය ආර්ථිකයේ කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා කටයුතු ආවරණය වන පරිදි විශාල සමාගම් ඉලක්කකොටගෙන සිදු කරනු ලබයි. මෙම සමීක්ෂණයේ සමස්ත ප්‍රතිඵල සහ අනෙකුත් තොරතුරු මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත වාර්තා කරන ලද අතර සමීක්ෂණ ප්‍රතිඵල මත පදනම්ව සංඛ්‍යාන ක්‍රමවේද භාවිතා කරමින් ආර්ථික වර්ධනය පුරෝකථනය කරන ලදී. තවද, මෙම සමීක්ෂණයේ සාරාංශගත නිරීක්ෂණ සහ ප්‍රධාන දර්ශක බාහිර පරිශීලකයින්ගේ දැන ගැනීම පිණිස කාර්තුමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

30.2.1.3 සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණය

කාර්තුමය සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණය හරහා ප්‍රමුඛ සහාධිපත්‍ය ඉදිකරන්නන්ගෙන් තත්‍ය විකුණුම් පිළිබඳ තොරතුරු, මිල උච්චාවචනයවීම් සඳහා හේතු, වත්මන් සහ අපේක්ෂිත ඉල්ලුම, අරමුදල් ව්‍යූහය, පවත්නා හා ඉදිරියේ දී ඉදිවන නිවාස ඒකක සංඛ්‍යාව, එක් එක් ව්‍යාපෘතිවල දැනට වෙන් කරවාගෙන ඇති නිවාස ඒකක සංඛ්‍යාව සහ ගැනුම්කරුවන් පිළිබඳ තොරතුරු ඇතුළු සහාධිපත්‍ය අංශය හා සම්බන්ධ දත්ත රැස් කිරීම සිදු කරන ලදී. මූල්‍ය පද්ධති ස්ථායීතාව සම්බන්ධයෙන් මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය ශක්තිමත් කිරීම සඳහා සමීක්ෂණ හරහා රැස් කරගත් තොරතුරු කාර්තුමය වාර්තා මඟින් කළමනාකාරීත්වය වෙත යොමු කරන ලදී. මීට අමතරව, නව සහාධිපත්‍යවල මිල මට්ටමේ සමස්ත වෙනස්වීම් හඳුනා ගැනීමට උපකාරීවන නව සහාධිපත්‍ය සඳහා වන කාර්තුමය මිල දර්ශකයක් සමීක්ෂණය හරහා ලබා ගන්නා ලද විකුණුම් දත්ත මත පදනම්ව සම්පාදනය කරන ලදී. සමීක්ෂණයේ ප්‍රතිඵලවල සාරාංශගත වාර්තාවක් කාර්තුමය පදනමින් මහ බැංකුවේ වෙබ් අඩවිය හරහා ප්‍රකාශයට පත් කිරීම ද සිදු කරන ලදී.

30.2.1.4 උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය

තෝරාගත් ආර්ථික නියෝජිත කාණ්ඩ දෙකක, එනම් ආයතනික අංශයේ සහ කුටුම්භ අංශයේ, උද්ධමන අපේක්ෂා පිළිබඳ දත්ත සහ තොරතුරු රැස් කිරීම සඳහා මාසිකව උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය පවත්වනු ලැබේ. මෙම සමීක්ෂණය 2022 වසරේ දී ආයතනික අංශය සඳහා විද්‍යුත් තැපෑල හරහා ද, කුටුම්භ අංශය සඳහා මාර්ගගත ක්‍රමයට ද සිදු කරන ලදී. මාතලේ, අනුරාධපුර, කිලිනොච්චි, ත්‍රිකුණාමලය සහ නුවර එළිය යන ප්‍රාදේශීය කාර්යාල සමග ඒකාබද්ධව, රාජ්‍ය අංශයේ තෝරාගත් ආයතනවල සේවක පිරිසක් සඳහා මෙම සමීක්ෂණය මාර්ගගත ක්‍රමයට පවත්වන ලද අතර මෙහිදී සමීක්ෂණයේ අරමුණ, වැදගත්කම සහ උද්ධමනය පිළිබඳ න්‍යායාත්මක කරුණු පිළිබඳව සහභාගීවන්නන් දැනුවත් කරන ලදී. මීට අමතරව, කුටුම්භ අංශයේ සමීක්ෂණය සඳහා ප්‍රතිචාර, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙලට අයත් ගුරු සමීක්ෂකවරුන්ගෙන් මාසිකව රැස් කරගන්නා ලදී. තවද, 2022 සිව්වන කාර්තුව තුළ පර්යේෂණ ආයතනවල උද්ධමන අපේක්ෂාවන් ග්‍රහණය කර ගැනීමේ බලාපොරොත්තුවෙන් උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණය තවදුරටත් පුළුල් කරන ලදී. උද්ධමන අපේක්ෂා පිළිබඳ සමීක්ෂණයේ සොයාගැනීම්, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී සලකා බැලීම සඳහා මුදල් ප්‍රතිපත්ති කමිටුව වෙත වාර්තා කරන ලදී.

30.2.1.5 වෙනත් සමීක්ෂණ

ණය වෙළඳපොළේ ඉල්ලුම් සහ සැපයුම් අංශවල ප්‍රවණතා හඳුනා ගැනීමේ අරමුණින් ණය ඉල්ලුම සහ ණය සැපයුම පිළිබඳ සමීක්ෂණ 2022 වසරේදී ද අඛණ්ඩව සිදු කරන ලදී. ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාල සමග එක්ව වාර්ෂික සමීක්ෂණයක් ලෙස සිදු කරන ලද අතර මෙහිදී සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඒකක විශේෂයෙන්ම මෙම අනපේක්ෂිත කාලසීමාවේ දී සිය මූල්‍යකරණ අවශ්‍යතා සපුරා ගත් ආකාරය සහ මුහුණ දුන් ගැටලු හඳුනා ගැනීම ද අරමුණු කරගන්නා ලදී. මේ අතර, සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂ බැංකු ආවරණය වන පරිදි ණය සැපයුම් ආශ්‍රිත මෑතකාලීන ප්‍රවණතා සහ අනාගත අපේක්ෂා පිළිබඳව කාර්තුමය වශයෙන් අධ්‍යනය කිරීමේ අරමුණින් ණය සැපයුම පිළිබඳ සමීක්ෂණය සිදු කරනු ලබයි. ණය ඉල්ලුම පිළිබඳ සමීක්ෂණයේ සහ ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී උපයෝගී කරගන්නා ලද අතර, ණය සැපයුම පිළිබඳ සමීක්ෂණයේ ප්‍රතිඵල බාහිර පරිශීලකයින්ගේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ ප්‍රකාශයට පත් කරන ලදී.

සිල්ලර වෙළඳාම් අංශයේ ප්‍රවණතා හඳුනාගැනීමේ අරමුණින් සාමාන්‍ය සිල්ලර වෙළඳාම් අංශය සඳහා සිල්ලර විකුණුම්

පරිමා සමීක්ෂණය මාසිකව ද, සුපිරි වෙළඳසැල් අංශය සඳහා සුපිරි වෙළඳසැල්හි සිල්ලර වෙළඳ කටයුතු සමීක්ෂණය කාර්තුමය වශයෙන් ද අඛණ්ඩව සිදු කරන ලදී. මෙම සමීක්ෂණ ප්‍රතිඵල, දර්ශක පදනම් කරගත් ආර්ථික වර්ධනය පුරෝකථන ක්‍රියාවලියට භාවිතා කරන ලදී.

ප්‍රවාහන අංශයේ ප්‍රවණතා හඳුනාගැනීමේ අරමුණින්, ගොඩබිම ප්‍රවාහන සේවා, ගුවන් ප්‍රවාහන සේවා, වරාය සේවා මෙන්ම භාණ්ඩ ප්‍රවාහනය හා ගබඩාකරණ සේවා ආවරණය කෙරෙන ප්‍රවාහන සේවා පිළිබඳ සමීක්ෂණය 2022 වසර තුළදී ද මාසික සමීක්ෂණයක් වශයෙන් අඛණ්ඩව සිදුකරන ලදී. තවද, තොරතුරු තාක්ෂණ සහ ව්‍යාපාර ක්‍රියාවලි කළමණාකරණ (IT & BPM) අංශයට අදාළ 2022 වසරේ ප්‍රවණතා මෙන්ම 2023 වසර සඳහා වන අපේක්ෂා හඳුනා ගැනීම සඳහා සමීක්ෂණයක් සිදු කරන ලදී. මෙම සමීක්ෂණවල ප්‍රතිඵල, විශේෂයෙන්ම ආර්ථික වර්ධනය පුරෝකථනය කිරීම ඇතුළුව, අභ්‍යන්තර ආර්ථික විශ්ලේෂණ කටයුතු සඳහා භාවිතා කරන ලදී.

රාජ්‍ය අංශයේ සේවා නියුක්තියේ ප්‍රවණතා හඳුනාගැනීම සඳහා රාජ්‍ය අංශයේ මධ්‍යම රජයට හා පළාත් සභා යටතට ගැනෙන සියලුම ආයතන ආවරණය වන පරිදි පවත්වනු ලබන රාජ්‍ය අංශයේ සේවා නියුක්තිය පිළිබඳ සමීක්ෂණය 2022 වසරේ දී ද පවත්වන ලදී.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් නිතිපතා සිදු කරනු ලබන සමීක්ෂණවලට අමතරව සමස්ත ආර්ථිකය කෙරෙහි හෝ මහ බැංකු කටයුතු කෙරෙහි සැලකිය යුතු බලපෑමක් ඇති කළ හැකි හදිසි අනපේක්ෂිත සිදුවීම් පිළිබඳ තොරතුරු ලබා ගැනීමේ අරමුණින් විවිධ සමීක්ෂණ ද සිදු කරනු ලබයි. ඒ අනුව, 2022 වසර තුළ දී, වෙනත් පුද්ගලික සේවා පිළිබඳ සමීක්ෂණය, ශ්‍රම වෙළඳපොළ ඉල්ලුම පිළිබඳ සමීක්ෂණය සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ලබා දුන් කොවිඩ්-19 සහනදායී ණය යෝජනා ක්‍රමයන්හි ඵලදායීතාව පිළිබඳ සමීක්ෂණය සිදු කරන ලදී.

30.2.2 දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල

දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල, 2022 වසර තුළ දී ද, ගුරු සමීක්ෂකවරු 53කගේ සහභාගිත්වයෙන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදී. ඒ හරහා ජාතික පාරිභෝගික මිල දර්ශකයට අදාළ භාණ්ඩ පැසට සමාන භාණ්ඩ පැසක සිල්ලර මිල ගණන් මෙන්ම කෘෂිකාර්මික භාණ්ඩ සහ ගොඩනැගිලි ද්‍රව්‍යවල නිෂ්පාදක මිල, අවිධිමත් පෞද්ගලික අංශයේ සේවකයන්ගේ දෛනික වැටුප්, උද්ධමන අපේක්ෂා සහ තෝරා ගත් භාණ්ඩවල සිල්ලර විකුණුම් පරිමා පිළිබඳ දත්ත රැස්කළ අතර එමඟින් මහ බැංකුවේ ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලිය සඳහා උපකාරීවන තත්කාලීන තොරතුරු ලබා දීමට හැකි විය. දත්තවල ගුණාත්මකභාවය වැඩි දියුණු කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය කාර්යාලවල සහය ඇතිව, ගුරු සමීක්ෂකවරු විසින් කරනු ලබන දත්ත එක් රැස් කිරීමේ කටයුතු පිළිබඳව විතැන් අධීක්ෂණ සිදු කිරීමට ද සංඛ්‍යාන දෙපාර්තමේන්තුව කටයුතු කරන ලදී. මීට අමතරව, දත්ත රැස් කිරීමේ ක්‍රියාවලියේ දී ගුරු සමීක්ෂකවරුන් මුහුණ දෙන ගැටළු සාකච්ඡා කොට දත්තවල ගුණාත්මකභාවය වැඩිදියුණු කිරීමට අවශ්‍ය උපදෙස් ලබා දීම සඳහා වාර්ෂිකව සංවිධානය කරනු ලබන සම්මන්ත්‍රණය ශ්‍රී ලංකා මහ බැංකුවේ විදු පියසෙහි දී පවත්වන ලදී. දීප ව්‍යාප්ත දත්ත රැස්කිරීමේ වැඩපිළිවෙල මඟින් එක්රැස් කරන දත්තවලට අදාළ වාර්තා ජනනය කිරීම ටැබ්ලූ (Tableau) මෘදුකාංගය හරහා අඛණ්ඩව සිදු කරන ලද අතර, සතිපතා, මාසිකව සහ කාර්තුමය වශයෙන් එක් රැස් කරන දත්ත/තොරතුරු මිල විචලන සහ උද්ධමනය පුරෝකථනය කිරීම සඳහා යොදා ගන්නා ලදී. මීට අමතරව, පාරිභෝගික කටයුතු අධිකාරිය විසින් සිදු කරන ලද ඉල්ලීමකට අනුව තෝරා ගත් අයිතමවල දත්ත සතිපතා එම ආයතනයට ලබා දීම ද 2022 වසර තුළ දී අඛණ්ඩව සිදු කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ කළමණාකරණ තොරතුරු පද්ධතිය ශක්තිමත් කිරීම සඳහා ගුරුවරුන් නොවන දත්ත සමීක්ෂකවරුන් හරහා පිටකොටුව වෙළඳපොළ, මරදගහමුල සහල් වෙළඳපොළ, දඹුල්ල හා නාරාහේන්පිට විශේෂ ආර්ථික මධ්‍යස්ථාන සහ මීගමුව හා පැලියගොඩ මත්ස්‍ය වෙළඳසැල්වලින් තොග සහ සිල්ලර මිල ගණන්/තොරතුරු දෛනිකව එක්රැස් කිරීම, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරන ලදී. තවද, මෙම මිල තොරතුරුවල සාරාංශය ඇතුළත් වාර්තාවක් දෛනිකව ශ්‍රී ලංකා මහ බැංකුවේ නිල වෙබ් අඩවියේ පළ කරන ලදී. මීට අමතරව, ජනාධිපති ලේකම් කාර්යාලයේ ඉල්ලීම පරිදි තෝරාගත් ආහාර අයිතම කිහිපයක මිල ගණන්, දෛනිකව ජනාධිපති ලේකම් කාර්යාලය වෙත ලබා දීමට ද කටයුතු කරන ලදී.

තවද, සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ප්‍රධාන සුපිරි වෙළඳසැල් දෙකක වෙබ් අඩවිවලින් දිනපතා ලබාගත් ආහාර මිල ගණන් යොදා ගනිමින් පූර්ව දර්ශක සකස් කිරීම අඛණ්ඩව සිදු කරන ලදී.

30.2.3 වෙනත් මූලාශ්‍ර හරහා දත්ත රැස් කිරීම සහ දර්ශක සම්පාදනය කිරීම

30.2.3.1 වැටුප් ප්‍රමාණ දර්ශක

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් රාජ්‍ය, විධිමත් පෞද්ගලික සහ අවිධිමත් පෞද්ගලික යන අංශ සඳහා වැටුප් ප්‍රමාණ දර්ශක සම්පාදනය කරනු ලබන අතර ආර්ථිකයේ වැටුප් සහ වේතනවල විචලන අධ්‍යනය කිරීම සඳහා ඒවා යොදා ගනු ලබයි. ඒ අනුව, රාජ්‍ය පරිපාලන වැටුප් චක්‍රලේඛ මත පදනම්ව රාජ්‍ය අංශය සඳහා නාමික හා මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක මාසිකව සම්පාදනය කරන ලදී. විධිමත් පෞද්ගලික අංශය සම්බන්ධයෙන් ගත් කළ, කම්කරු දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරනු ලබන, පඩිපාලක සභාවල සේවකයන්ගේ නාමික වැටුප් ප්‍රමාණ දර්ශක මත පදනම්ව මූර්ත වැටුප් ප්‍රමාණ දර්ශක මාසිකව සම්පාදනය කරන ලදී.

මේ අතර, අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් විචලන විශ්ලේෂණය කිරීම සඳහා භාවිතා කරන මූර්ත සහ නාමික අවිධිමත් පෞද්ගලික අංශයේ වැටුප් ප්‍රමාණ දර්ශක, දීප ව්‍යාප්ත දත්ත රැස් කිරීමේ වැඩපිළිවෙල හරහා එකතු කරන ලද වැටුප් තොරතුරු මත පදනම්ව සම්පාදනය කරන ලදී. මෙම

දර්ශකයේ අඛණ්ඩ වැඩිදියුණු කිරීමක් ලෙස, 2012 වශයෙන් පැවති එහි පදනම් වර්ෂය 2018 වශයෙන් 2022 වසරේ දී යාවත්කාලීන කරන ලදී. මෙම වැටුප් ප්‍රමාණ දර්ශක, ප්‍රතිපත්ති සම්පාදන ක්‍රියාවලියේ දී සලකා බැලීම සඳහා පුරෝකථන සහ ප්‍රතිපත්ති විශ්ලේෂණ පද්ධතිය, මුදල් ප්‍රතිපත්ති කමිටුව සහ මුදල් මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීමටත් ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ විශේෂ දත්ත බෙදා හැරීමේ පද්ධතිය (SDDS) සඳහා ලබා දීමටත් අඛණ්ඩව කටයුතු කරන ලදී.

30.2.3.2 දේපල වෙළඳපොළ දර්ශක

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් වෙබ් අඩවිවල පළවන වෙළඳ දැන්වීම්වල දත්ත උපයෝගී කර ගනිමින් කොළඹ දිස්ත්‍රික්කයේ නේවාසික දේපළ (සහාධිපත්‍ය, ඉඩම් සහ නිවාස) සඳහා වන මිල දර්ශක මාසික පදනමින් සම්පාදනය කරන ලදී. 2022 වසරේ පළමු කාර්තුවේ සිට මහ බැංකු වෙබ් අඩවියේ දේපළ වෙළඳපොළ විශ්ලේෂණ වාර්තාව ප්‍රකාශයට පත් කිරීම ආරම්භ කරන ලද අතර එහි සහාධිපත්‍ය වෙළඳපොළ සමීක්ෂණය හරහා රැස් කරන ලද තොරතුරු සහ ඉහත මිල දර්ශක ඇතුළත් වේ.

දේපළ වෙළඳපොළේ වර්ධනයන් තක්සේරු කිරීම සඳහා අර්ධ වාර්ෂික පදනමින් ඉඩම් තක්සේරු දර්ශකය (LVI) සම්පාදනය කිරීම ද දෙපාර්තමේන්තුව විසින් අඛණ්ඩව සිදු කරගෙන යන ලදී. මෙම දර්ශකය නේවාසික, වාණිජ සහ කාර්මික යන ඉඩම් කාණ්ඩ තුනකින් සමන්විත වන අතර එම එක් එක් කාණ්ඩ යටතට ගැනෙන ඉඩම්වල වටිනාකම රජයේ තක්සේරු දෙපාර්තමේන්තුවෙන් ලබාගන්නා ලද ඉඩම් පර්චසයක් සඳහා ඇස්තමේන්තු කරන ලද මිල මත පදනම් වේ. 2022 වසර තුළ දී ඉඩම් තක්සේරු දර්ශකය පිළිබඳ තොරතුරු මාධ්‍ය නිවේදන දෙකක් හරහා ප්‍රකාශයට පත් කරන ලදී.

30.2.4 ප්‍රාදේශීය මට්ටමේ සංඛ්‍යාන සම්පාදනය කිරීම

30.2.4.1 ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය

ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය යනු ද.දේ.නි. ඇස්තමේන්තු කිරීමේ දී සලකා බලන අංශවලට අමතරව විශේෂයෙන්ම සමාජ ආර්ථික තත්ත්වයන් සලකමින් රටේ ප්‍රගතිය මැන බැලීම සඳහා මහ බැංකුව විසින් සම්පාදනය කරන ලද බහුමාන දර්ශකයකි. පළාත් මට්ටමේ දත්ත සුදුසු පරිදි භාවිතයෙන් වාර්ෂිකව සම්පාදනය කෙරෙන මෙම දර්ශකය ආර්ථික හා ව්‍යාපාර පරිසරය, ජන ජීවිතයේ යහපැවැත්ම සහ සමාජ ආර්ථික යටිතල පහසුකම් යන අනු දර්ශක තුනකින් සමන්විත වේ. සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් විචල්‍ය 41ක් භාවිතා කරමින් 2021 වසර සඳහා වන ශ්‍රී ලංකා සෞභාග්‍යතා දර්ශකය සම්පාදනය කර 2022 වසර අග දී ප්‍රකාශයට පත් කරන ලදී.

30.2.4.2 පළාත් දළ දේශීය නිෂ්පාදිතය

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව මඟින් ප්‍රකාශයට පත් කරන ලද ජාතික ගිණුම් ඇස්තමේන්තු, කෘෂිකර්මාන්ත, කර්මාන්ත සහ සේවා ආශ්‍රිත ක්‍රියාකාරකම්වලට අදාළ සුදුසු විචල්‍යයන් පළාත්වලට බෙදීමෙන් 2021 වසර සඳහා වන පළාත් දළ දේශීය නිෂ්පාදිතය සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සම්පාදනය කරන ලදී. 2022 වසරේ දෙසැම්බර් මාසයේ දී මෙම ඇස්තමේන්තු මාධ්‍ය නිවේදනයක් මඟින් ප්‍රකාශයට පත් කරන ලදී. මෙම ඇස්තමේන්තු මඟින් ජාතික දළ දේශීය නිෂ්පාදිතයට එක් එක් පළාතේ දායකත්වය පිළිබඳ දළ තක්සේරුවක් සපයනු ලබන අතර එය පළාත් අතර සම්පත් බෙදා වෙන් කිරීම පිළිබඳව තීරණය කිරීමට රාජ්‍ය බලධාරීන්ට ප්‍රයෝජනවත් වේ.

30.2.5 ශ්‍රම වෙළඳපොළ තොරතුරු විශ්ලේෂණය කිරීම

ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය, කම්කරු දෙපාර්තමේන්තුව මෙන්ම අනෙකුත් විශ්වසනීය දත්ත සපයන්නන්ගේ දත්ත සහ තොරතුරු මත පදනම්ව සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ශ්‍රම බලකාය, සේවා නියුක්තිය, සේවා වියුක්තිය, විදේශ සේවා නියුක්තිය, කම්කරු සබඳතා සහ ශ්‍රම වෙළඳපොළ ප්‍රතිසංස්කරණවලට අදාළව සමස්ත ශ්‍රම වෙළඳපොළ දත්ත විශ්ලේෂණය සිදු කරන ලදී. මෙම විශ්ලේෂණ මත පදනම්ව, ප්‍රතිපත්ති තීරණ ගැනීමේ ක්‍රියාවලියට සහාය වීම සඳහා කළමණාකාරීත්වය වෙත කාර්තුමය වාර්තාවක් ඉදිරිපත් කරන ලදී.

30.3 තොරතුරු බෙදා හැරීම

දත්ත රැස්කිරීමේ දී මුහුණ පෑමට සිදු වූ අභියෝග මධ්‍යයේ නිල සංඛ්‍යාන දත්ත නිතිපතා බෙදා හැරීම 2022 දී සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් ඉලෙක්ට්‍රොනික ක්‍රමවලින් සිදු කරන ලදී. ඒ අනුව, වාර්ෂික සංඛ්‍යාන ප්‍රකාශන, 'ශ්‍රී ලංකාවේ ආර්ථික හා සමාජ සංඛ්‍යාන 2022 - XLIV වෙළුම' සහ 'ශ්‍රී ලංකා සමාජ ආර්ථික දත්ත 2022 - XLV වෙළුම' නිකුත් කරන ලදී. තවද, විනිමය අනුපාත, මුදල් වෙළඳපොළ අනුපාත, කොටස් වෙළඳපොළ සහ බලශක්ති අංශයේ සංඛ්‍යාන ඇතුළත් දෛනික ආර්ථික දර්ශක නිකුත් කිරීම සහ තෝරාගත් පාරිභෝගික භාණ්ඩවල දෛනික මිල වාර්තාව නිකුත් කිරීම සිදු කරන ලදී. සතිපතා සහ මාසික ආර්ථික දර්ශක ද නිසි පරිදි වසර පුරා මහ බැංකු වෙබ් අඩවියේ පළ කරන ලදී.

සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් මහ බැංකුවේ වාර්ෂික වාර්තාවේ සහ මැතකාලීන ආර්ථික ප්‍රවණතා පිළිබඳ වාර්තාවේ පරිච්ඡේද දෙකකට දායක වන අතරම ශ්‍රී ලංකා මහ බැංකුවේ මාසික ප්‍රකාශනය සඳහා ද අඛණ්ඩව දත්ත සපයන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුවේ මාර්ගගත දත්ත ගබඩාව වන 'දත්ත පුස්තකාලය,' පර්යේෂකයන්ගේ සහ අනෙකුත් බාහිර පාර්ශ්වකරුවන්ගේ දත්ත අවශ්‍යතා සපුරාලන පරිදි යාවත්කාලීන කොට පවත්වාගෙන යෑම සංඛ්‍යාන දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

31. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය

2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි, 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතෙහි සහ 2016 අංක 06 දරන ක්ෂුද්‍රමූල්‍ය පනතෙහි දක්වා ඇති විධිවිධානයන් යටතේ පිළිවෙළින් බලපතලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ බලපතලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් නියාමනය සහ අධීක්ෂණය කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය

ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත බලතල පැවරී ඇත. මීට අමතරව, 2009 අංක 01 දරන සංශෝධිත ලියාපදිංචි ස්කන්ධ හා සුරැකුම්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග හා 2009 අංක 01 දරන සංශෝධිත දේශීය භාණ්ඩාගාර බිල්පත් (ප්‍රාථමික අලෙවිකරුවන්) නියෝග යටතේ බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ප්‍රාථමික අලෙවිකාර සමාගම් අධීක්ෂණය ද බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව සිදු කරයි.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධීක්ෂණ කාර්යයන් යටතට බලපත්‍රලාභී/ලියාපදිංචි ආයතනවල ව්‍යවස්ථාපිත පරීක්ෂණ (එතැන් පරීක්ෂණ) හා අඛණ්ඩ සුපරීක්ෂණ (විතැන් පරීක්ෂණ) සිදු කිරීම ඇතුළත් වන අතර, නියාමන කාර්යයන් යටතට බලපත්‍ර/ලියාපදිංචි සහතික නිකුත් කිරීම, විචක්ෂණ නියාමනයන් ක්‍රියාත්මක කිරීම හා නියාමන අනුමැතීන් ලබා දීම සහ අනවසර මුදල් ව්‍යාපාර කටයුතු සිදු කරන ආයතන පිළිබඳ විමර්ශනය කිරීම ඇතුළත් වේ. මෙම ප්‍රධාන කාර්යයන්ට අමතරව, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම අංශයේ ශක්‍යතා වැඩිදියුණු කිරීම, අධිකරණ කාර්යයන් සඳහා මැදිහත් වීම සහ මහජන පැමිණිලි සම්බන්ධයෙන් මැදිහත් වීම වැනි විවිධ කාර්යයන්වල ද නිරත වේ.

2022 වසර අවසානය වන විට, බැංකු නොවන මූල්‍ය ආයතන අංශය බලපත්‍රලාභී මුදල් සමාගම් 37කින්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් 1කින්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් 4කින් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් 7කින් සමන්විත විය. තවද, බලපත්‍රලාභී බැංකු, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් ඇතුළුව, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන 54ක් කල්බදු මූල්‍යකරණ පනත යටතේ ලියාපදිංචි කර ඇත. එම බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල නාම ලේඛනය මෙම කොටස අවසානයේ දක්වා ඇත.

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී සිදු කරන ලද කාර්යයන්හි සාරාංශය පහත දක්වා ඇත.

31.1 ප්‍රතිපත්ති ක්‍රියාමාර්ග

(අ) විචක්ෂණ නියාමන නිකුත් කිරීම

2022 වසර තුළ දී, වත්මන් වෙළෙඳපොළ සහ ජාත්‍යන්තර විශිෂ්ඨ භාවිතයන්ට අනුකූලව බැංකු නොවන මූල්‍ය ආයතනවල පවතින නියාමන රාමුව විධිමත් කිරීමට බැංකු නොවන මූල්‍ය ආයතන සහ මෙම අංශයේ අදාළ ඇල්මැති පාර්ශ්වයන්ගේ උපදෙස් ද ලබා ගනිමින් විචක්ෂණ නියාමන කිහිපයක් නිකුත් කරන ලදී. පවතින සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ගන්නා ලද සුවිශේෂ ක්‍රියාමාර්ග ද ඇතුළුව බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් වෙත වසර තුළ නිකුත් කරන ලද එවැනි විචක්ෂණ නියාමනයන් මෙම වාර්තාවේ III වන කොටසේ දැක්වේ. 2022 වසර තුළ දී නිකුත් කරන ලද එම ප්‍රධාන විචක්ෂණ නියාමනයන්ගේ සාරාංශයක් පහතින් දක්වා ඇත.

i. තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ නියාමන රාමුව.

ii. විදෙස් රැකියාවල නියුතු ශ්‍රී ලාංකිකයන් සඳහා විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ මත ලබා දෙන දිරි දීමනාව.

iii. ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් පිළිබඳ විධානය.

iv. තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාතික සංශෝධනය කිරීම.

v. ක්ෂුද්‍රමූල්‍ය ණය මත උපරිම පොලී අනුපාතිකය ඉවත් කිරීම.

vi. වත්මන් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් තම ආදායම හෝ ව්‍යාපාර අභිතකර බලපෑම්වලට ලක් වී ඇති ණය ගැනුම්කරුවන් වෙත සහන ලබා දීම.

vii. බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පත්කරුවන් සඳහා අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංක සටහන් කිරීම අනිවාර්ය කිරීම.

viii. තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ.

(ආ) මුදල් ව්‍යාපාර පනතට සහ කල්බදු මූල්‍යකරණ පනතට සිදු කරන සංශෝධන

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්වල සුපරීක්ෂණය, නියාමනය සහ නිරාකරණ කටයුතු වැඩි දියුණු කිරීම සඳහා මුදල් ව්‍යාපාර පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීම සහ කල්බදු මූල්‍යකරණ ව්‍යාපාරවල තිබෙන අක්‍රමිකතාවන් සඳහා පිළියම් යෙදීමට කල්බදු මූල්‍යකරණ පනතට අවශ්‍ය සංශෝධන සිදු කිරීමේ ක්‍රියාවලියෙහි නිරත වී සිටියි.

(ඇ) බැංකු නොවන මූල්‍ය ආයතන අංශය ඒකාබද්ධ කිරීම සඳහා වන ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ ක්‍රියාත්මක කිරීම

i. බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් අංශය තුළ පවතින දුර්වලතා සහ අවදානම් නිරාවරණයට පිළියම් යෙදීම සඳහා, මෙම වැඩපිළිවෙළ 2020 වසරේ දී හඳුන්වා දෙන ලදී.

ii. ඒකාබද්ධකරණ වැඩපිළිවෙලෙහි 1 වන අදියර යටතේ, මෙම වසර තුළ දී ගනුදෙනු 5ක් සම්පූර්ණයෙන් නිම කරන ලදී. සිංහපුත්‍ර ෆිනෑන්ස් පීඑල්සී සමාගම, කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම සමග, කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, එල් ඕ එල් සී ෆිනෑන්ස් පීඑල්සී සමාගම සමග සහ ප්‍රයිම් ෆිනෑන්ස් පීඑල්සී සමාගම, එච් එන් බී ෆිනෑන්ස් පීඑල්සී සමාගම සමග ඒකාබද්ධ කිරීම මෙම වසර තුළ දී සම්පූර්ණ කරන ලදී. ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් (මින් පෙර ඇසට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ් ලෙස හැඳින්වූ) සහ එස් එම් බී ෆිනෑන්ස් පීඑල්සී (මින් පෙර එස් එම් බී ලීසිං පීඑල්සී ලෙස හැඳින්වූ) වෙත

නව මුදල් ව්‍යාපාර බලපත්‍ර නිකුත් කරන ලදී. තවද, 2022 වසරේ දී මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද මෙම වැඩපිළිවෙළ යටතේ යෝජිත ඒකාබද්ධ කිරීම් ත්‍රිත්ත්වයක් (03) වර්තමානයේ දී ක්‍රියාත්මක කෙරෙමින් පවතියි.[1]

iii. තවද, මෙම ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ ඒකාබද්ධ කිරීමේ හවුල්කරුවෙකු සොයා ගැනීමට නොහැකි වූ සමාගම්වලට, බලපත්‍රය අහෝසි කිරීම මත වෙළෙඳපොළෙන් නික්ම යාමට යොමු කරන ලදී. ඒ අනුව, මුදල් ව්‍යාපාර පනතෙහි 37 (3) වගන්තිය ප්‍රකාරව, ස්වර්ණමහල් ෆිනෑන්ෂියල් සර්විසස් පීඑල්සී වෙත නිකුත් කරන ලද මුදල් ව්‍යාපාර බලපත්‍රය අවලංගු කර ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් මුදල් ව්‍යාපාර පනතෙහි 25 (1) (ක) වගන්තිය ප්‍රකාරව, කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් සමාගමට එහි මහජන වගකීම් සම්පූර්ණයෙන් නැවත ගෙවීමට කටයුතු කරන ලෙස නියෝග කිරීමට තීරණය කරන ලදී.

31.2 බලපත්‍රලාභී සමාගම් අධීක්ෂණය කිරීම

(අ) ව්‍යවස්ථාපිත පරීක්ෂණ (එතැන් පරීක්ෂණ) පැවැත්වීම

i. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් 2022 වසර තුළ දී බලපත්‍රලාභී මුදල් සමාගම් 13ක සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් 4ක ව්‍යවස්ථාපිත පරීක්ෂණ සිදු කරන ලදී. ඉපැයීම් සහ වත්කම්වල ගුණාත්මකභාවය පිරිහීම, ණය කළඹ සංකේන්ද්‍රණය වීමේ අවදානම්, සම්බන්ධිත පාර්ශ්ව ගනුදෙනු ඇතුළුව යහපාලන ආකෘතීන්වල පවතින දුර්වලතා, අවදානම් කළමනාකරණයේ දුර්වලතා, එවැනි කාර්යයන් ඵලදායී ලෙස ඉටු කිරීමට ප්‍රමාණවත් සම්පත් නොමැතිවීම ඇතුළුව අභ්‍යන්තර විගණන සහ අනුකූලතා කාර්යයන්හි දුර්වලතා සහ නියාමන අවශ්‍යතා සපුරාලීමට අපොහොසත් වීම මෙකී පරීක්ෂණවල ප්‍රධාන සොයා ගැනීම් විය.

ii. බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල පවත්වන ලද පරීක්ෂණ අතරතුර දී හඳුනා ගන්නා ලද සුපරීක්ෂණ ගැටලු නිවැරදි කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් අනුමත කරන ලද නිර්දේශ සහ ක්‍රියාකාරී සැලසුම් අදාළ සමාගම් වෙත අවශ්‍ය නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා දැනුම් දෙන ලදී.

iii. තවද, හානිකරණ ආදර්ශකය තක්සේරු කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් 12ක, සහ නියාමන තොරතුරු ජාලගත දත්ත සම්ප්‍රේෂණ පද්ධතිය හරහා යොමු කිරීමේ ක්‍රියාවලිය තක්සේරු කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් 10ක ස්ථානීය පරීක්ෂණ ඇතුළුව ස්ථානීය පරීක්ෂණ 25ක් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

(ආ) අඛණ්ඩ සුපරීක්ෂණ (විතැන් පරීක්ෂණ) සිදු කිරීම

i. සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්/බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් ජාලගත දත්ත සම්ප්‍රේෂණ පද්ධතිය හරහා කාලාවර්තිතව ඉදිරිපත් කරනු ලබන මූල්‍ය තොරතුරු පදනම් කර ගනිමින් අඛණ්ඩව අධීක්ෂණය කරන ලදී. විගණන වාර්තා, කළමනාකරණ ලිපි, බාහිර ශ්‍රේණිගත කිරීම් සහ පුවත්පත් වාර්තා ඇතුළුව වෙනත් මූල්‍ය තොරතුරු ද දෙපාර්තමේන්තුව විසින් සමාලෝචනය කරන ලදී. මෙම සමාලෝචනයන් මගින් පූර්ව අනතුරු ඇඟවීම් හඳුනා ගැනීමේ දර්ශකයන් සහ අභ්‍යන්තර ශ්‍රේණිගත කිරීමේ පද්ධතිය හරහා ප්‍රාග්ධනය, ද්‍රවශීලතාව සහ හානිකරණය ආදී බලපත්‍රලාභී මුදල් සමාගම්, විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම්වල ඇති විය හැකි අවදානම් හඳුනා ගැනීම සහ අවශ්‍ය අවස්ථාවල දී සුදුසු නිර්දේශයන් ඉදිරිපත් කරන ලදී.

ii. අඛණ්ඩ පරීක්ෂණයන් තුළින් හෙළිදරව් වූ බරපතලභාවය සහ ප්‍රමුඛ ඇඟයීම පදනම් කොටගෙන පැහැදිලිව නියම කර ඇති කාල රාමුවක් තුළ අධීක්ෂණ අවශ්‍යතා නිවැරදි කිරීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගන්නා ලදී.

iii. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා ණය සාධන පත්‍ර නිකුත් කිරීමට, කොටස් ප්‍රාග්ධනය ඉහළ නැංවීමට, හිමිකාරිත්වය වෙනස් කිරීමට, නව ආයෝජකයන් හරහා ප්‍රාග්ධනය ආයෝජනයට, සාංඝමික ව්‍යවස්ථාවලින් සංශෝධනය කිරීමට, පාලිත සමාගම් පිහිටුවීමට, වාර්ෂික ශාඛා පුළුල් කිරීමේ සැලසුම්, ප්‍රචාරණ දැන්වීම් සහ තැන්පතු දිරිගැන්වීමේ යෝජනා ක්‍රම සහ නව අධ්‍යක්ෂවරුන් සහ විධායක කාර්යයන්හි නියුතු නිලධාරීන් පත් කිරීමට නියාමන අනුමැතීන් 1180ක් ලබා දෙන ලදී.

iv. එතැන් පරීක්ෂණ මගින් හඳුනාගත් ප්‍රධාන සුපරීක්ෂණ ගැටලු නිවැරදි කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සහ ප්‍රාථමික අලෙවිකාර සමාගම් විසින් ගනු ලැබූ ක්‍රියාමාර්ගවල ප්‍රගතිය පසු විපරම් කර බැලීම මෙම දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලදී.

v. බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සම්බන්ධව මහජනයාගෙන් ලැබී ඇති පැමිණිලි 258ක් විසඳීමට මැදිහත් වී තිබෙන අතර, ඉන් විශාල ප්‍රමාණයක් ප්‍රතිපත්තිමය කරුණු සහ බලපත්‍ර අවලංගු කළ මුදල් සමාගම්වලට අදාළ වේ.

1 පසුව එල් ඕ එල් සී ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය 2023.01.31 දින සිට බලපැවැත්වෙන පරිදි එල් ඕ එල් සී ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සමග ඒකාබද්ධ කරන ලදී.

31.3 නියාමන සහ නිරාකරණ ක්‍රියාමාර්ග

විචක්ෂණ විධානවලට අනුකූල නොවන සමාගම් මත නියාමන ක්‍රියාමාර්ග කඩිනම් ආකාරයකින් ක්‍රියාත්මක කිරීම සහ බලපත්‍රය අවලංගු කර ඇති හෝ අත්හිටුවා ඇති සමාගම් මත ගනු ලබන ක්‍රියාමාර්ග සඳහා පහසුකම් සැලසීම, 2022 වසර තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ ප්‍රධාන අරමුණ විය. ඒ අනුව, මේ සම්බන්ධව පහත ක්‍රියාමාර්ග ගන්නා ලදී.

i. කඩිනම් නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග රාමුව හා අනුකූලව, ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුකූල නොවූ බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පතු, ණය දීම් සහ ණය ගැනීම් පිළිබඳ සීමා පැනවීම ඇතුළුව නියාමන ක්‍රියාමාර්ග කිහිපයක් දියත් කරන ලදී.

ii. 2022 වසර තුළ දී, පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ් සමාගමෙහි ව්‍යාපාර කටයුතු තාවකාලිකව අත්හිටුවීම 2022.01.05 සහ 2022.07.05 යන දිනවල දී දෙවරක් දීර්ඝ කරන ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරමින් පවතින විමර්ශන කටයුතු අඛණ්ඩව සිදු කර ගෙන යෑම සඳහා 2023.01.05 දින සිට තවත් මාස හයක කාලයක් සඳහා මෙම අත්හිටුවීම බලපැවැත්වේ.

iii. බලපත්‍ර අවලංගු කර හෝ අත්හිටුවා ඇති සමාගම් තුළ පවතින ගැටලුවලට අදාළව, බලපත්‍රලාභී මුදල් සමාගම්වල ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය සහ පත් කළ කළමනාකරණ මණ්ඩල සමග ද රැස්වීම් පවත්වන ලදී.

31.4 මහජනයා දැනුම්වත් කිරීම සහ ශක්‍යතාව වැඩිදියුණු කිරීම

i මහජනතාවට හෙළිදරව් කිරීම

විචක්ෂණශීලී ප්‍රාග්ධන අවශ්‍යතාවයන්ට අනුකූල නොවන සහ නියාමන සීමාවන්ට යටත්ව ඇති බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල නම් ශ්‍රී ලංකා මහ බැංකුවේ වෙබ් අඩවියේ පළ කරන ලදී.

ii ශක්‍යතාව වැඩිදියුණු කිරීම

බැංකු විදු පියසේ පැවති පුහුණු වැඩමුළු ද ඇතුළුව පුහුණු වැඩමුළු සඳහා මෙම දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ නිලධාරීන් සම්පත් දායකත්වය අඛණ්ඩව ලබා දෙන ලදී.

iii බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සහ වෙනත් සම්බන්ධිත පාර්ශ්වයන් සමග පැවති රැස්වීම්

ආර්ථිකමය කරුණු සහ නියාමන වර්ධනයන් සම්බන්ධව අදහස් හුවමාරු කිරීම සඳහා අවස්ථාවක් සැලසීමේ පරමාර්ථයෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිතුමාගේ ප්‍රධානත්වයෙන් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්වල සභාපතිවරුන් සහ ප්‍රධාන විධායක නිලධාරීන් සමග බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රැස්වීම් පවත්වන ලදී. මීට අමතරව, සමස්තයක් ලෙස දෙපාර්තමේන්තුව විසින් එක් එක් බලපත්‍රලාභී ආයතනයට/අංශයට අදාළ ගැටලු සාකච්ඡා කිරීමට සහ නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීමට අදාළව පවතින ගැටලු සාකච්ඡා කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම්/විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්, ෆිනෑන්ස් හවුස් ඇසෝසියේෂන් (Finance House Association), ලීසිං ඇසෝසියේෂන් (Leasing Association), බාහිර විගණකවරුන් සහ ජාත්‍යන්තර නියෝජිත ආයතන සමග අඛණ්ඩව රැස්වීම් පවත්වන ලදී.

iv මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන්

බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මහජනතාව දැනුම්වත් කිරීමේ වැඩසටහන් සඳහා නිරාකරණ සහ බලගැන්වීමේ දෙපාර්තමේන්තුව, සන්නිවේදන දෙපාර්තමේන්තුව සහ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව වැනි වෙනත් දෙපාර්තමේන්තු වෙතින් ලද ඉල්ලීම් අනුව අවශ්‍ය වූ විට ඒ සඳහා දායකත්වය ලබා දෙන ලදී. මෙම දෙපාර්තමේන්තුව විසින් "අනවසර මුදල් තැන්පතු භාර ගන්නා ආයතන සහ පුද්ගලයන්ගෙන් ප්‍රවේශම් වෙමු" යන මාතෘකාවෙන් පුවත්පත් ලිපියක් ප්‍රකාශයට පත් කරනු ලැබූ අතර, මහජනයා දැනුවත් කිරීමේ වැඩසටහන් 6ක් ප්‍රාදේශීය මට්ටමින් පවත්වන ලද අතර අනවසර මුදල් ව්‍යාපාරවල අවදානම් සම්බන්ධව මහජනතාවගේ දැනුවත්භාවය ඉහළ නැංවීම සඳහා රූපවාහිනී/ගුවන් විදුලි වැඩසටහන් 5කට සහභාගී වන ලදී.

31.5 අනවසර මුදල් ව්‍යාපාර සම්බන්ධව සිදු කරන විමර්ශන

2022 වසර අවසානය වන විට ශ්‍රී ලංකා මහ බැංකුවට ලැබුණු පැමිණිලි සහ තොරතුරු මත පදනම්ව අනවසර තැන්පතු රැස් කිරීම සහ මුදල් ව්‍යාපාර කටයුතු පිළිබඳව විමර්ශන 125ක් බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙහෙයවනු ලබයි. තවද, 2022 වසර තුළ දී, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය විසින් විමර්ශන 04කට අදාළව මුදල් ව්‍යාපාර පනතේ 44 වන වගන්තිය යටතේ නිකුත් කරන ලද අත්හිටු වීමේ නියෝග සඳහා කොළඹ මහාධිකරණයෙන් දීර්ඝ කිරීම් ලබා ගන්නා ලදී. එමෙන්ම, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරිය විසින් විමර්ශන සිදු කිරීමට යටත්ව, ආයතන හතරක සම්බන්ධිත පාර්ශ්වයන්ගේ විදේශ සංචාර වළක්වාලීම සඳහා අදාළ මහේස්ත්‍රාත් අධිකරණවලින් උසාවි නියෝග ලබා ගන්නා ලදී.

II- 23 සංඛ්‍යා සටහන

2022 වසර තුළ දී බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සිදු කරන ලද කාර්යය විස්තර

කාර්යය	සංඛ්‍යාව
නියාමන අනුමැතීන්	1180
හසුරවනු ලැබූ පාරිභෝගික පැමිණිලි	258
බාහිර පාර්ශ්වයන් සමග පැවැත්වූ රැස්වීම්	103
විතැන් පරීක්ෂණ වාර්තා	542
අනවසර මුදල් ව්‍යාපාර පිළිබඳ විමර්ශනය	125
ව්‍යවස්ථාපිත පරීක්ෂණ (එතැන් පරීක්ෂණ)	17
ස්ථානීය පරීක්ෂණ	25
මුදල් මණ්ඩලය වෙත යොමු කළ මුදල් මණ්ඩල පත්‍රිකා	97
හසුරවනු ලැබූ තොරතුරු දැන ගැනීමේ අයිතියට අදාළ ඉල්ලීම්	35

ඇමුණුම II- 4

2022.12.31 දිනට බලයලත් මූල්‍ය ආයතන

(2022 වර්ෂය අවසානය වන විට)

	බලපත්‍රලාභී මුදල් සමාගම්		
1	අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී	20	බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී(ඒ)
2	ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් (අ)	21	මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී
3	ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී	22	මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී(ඒ)
4	ඊටිඅයි ෆිනෑන්ස් ලිමිටඩ් (ආ)	23	මල්ටි ෆිනෑන්ස් පීඑල්සී(ඔ)
5	එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී (ඇ)	24	මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ්(ඕ)
6	එල්බී ෆිනෑන්ස් පීඑල්සී	25	යූබී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
7	එල්ඕඑල්සී ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී (ඈ)	26	රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ්(ඖ)
8	එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී (ඉ)	27	ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී(ක)
9	එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී	28	වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී
10	එස්එම්බී ෆිනෑන්ස් පීඑල්සී (ඊ)	29	සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී(ග)
11	එඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	30	සියපත ෆිනෑන්ස් පීඑල්සී
12	ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී	31	සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
13	ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී	32	සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
14	කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් (උ)	33	සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී
15	කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	34	සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
16	ඩයලොග් ෆිනෑන්ස් පීඑල්සී	35	සීබීසී ෆිනෑන්ස් ලිමිටඩ්
17	තේමත් ලංකා ෆිනෑන්ස් පීඑල්සී (ඌ)	36	සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී(ව)
18	පීඑම්එෆ් ෆිනෑන්ස් පීඑල්සී (එ)	37	ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් ලිමිටඩ්
19	පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී		

ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන

	(අ) බලපත්‍රලාභී වාණිජ බැංකු		(ආ) බලපත්‍රලාභී විශේෂිත බැංකු
1	අමානා බැන්ක් පීඑල්සී	1	ප්‍රාදේශීය සංවර්ධන බැංකුව
2	එම්සීබී බැන්ක් ලිමිටඩ්	2	ශ්‍රී ලංකා සේවින්ස් බැන්ක් ලිමිටඩ්
3	කොමර්ෂල් බැන්ක් ඔෆ් සිලෝන් පීඑල්සී	3	ශ්‍රී ලංකා නිවාස සංවර්ධන මූල්‍ය සංස්ථා බැංකුව
4	ඩීඑෆ්සීසී බැන්ක් පීඑල්සී	4	සණස සංවර්ධන බැන්ක් පීඑල්සී
5	නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පීඑල්සී		
6	නේෂන්ස් ට්‍රස්ට් බැන්ක් පීඑල්සී		
7	පෑන් ඒෂියා බැන්කිත් කෝපරේෂන් පීඑල්සී		
8	යුනියන් බැන්ක් ඔෆ් කොළම්බෝ පීඑල්සී		
9	ලංකා බැංකුව		
10	සම්පත් බැන්ක් පීඑල්සී		
11	සෙලාන් බැන්ක් පීඑල්සී		
12	හැටන් නැෂනල් බැන්ක් පීඑල්සී		
	(ඇ) බලපත්‍රලාභී මුදල් සමාගම්		
1	අබාන්ස් ෆිනෑන්ස් පීඑල්සී	22	මර්චන්ට් බැන්ක් ඔෆ් ශ්‍රී ලංකා ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී (ඒ)
2	ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් (අ)	23	මල්ටි ෆිනෑන්ස් පීඑල්සී (ඔ)
3	ඇසෝසියේටඩ් මෝටර් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී	24	මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ් (ඕ)
4	ඊටිඅයි ෆිනෑන්ස් ලිමිටඩ් (ආ)	25	යූබී ෆිනෑන්ස් කම්පැනි ලිමිටඩ්
5	එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී (ඇ)	26	රිචඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් (ඖ)
6	එල්බී ෆිනෑන්ස් පීඑල්සී	27	ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී (ක)
7	එල්ඕඑල්සී ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී (ඈ)	28	වැලිබල් ෆිනෑන්ස් පීඑල්සී
8	එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී (ඉ)	29	සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී (ග)
9	එලයන්ස් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී	30	ස්වර්ණමහල් ෆයිනෑන්ෂල් සර්විසස් පීඑල්සී (ජ)
10	එස්එම්බී ෆිනෑන්ස් පීඑල්සී (ඊ)	31	සියපත ෆිනෑන්ස් පීඑල්සී
11	එඑම්ඩබ්ලිව් කැපිටල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	32	සිංගර් ෆිනෑන්ස් (ලංකා) පීඑල්සී
12	ඒෂියා ඇසෙට් ෆිනෑන්ස් පීඑල්සී	33	සිටිසන්ස් ඩිවලොප්මන්ට් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී
13	ඔරියන්ට් ෆිනෑන්ස් පීඑල්සී	34	සෙන්කඩගල ෆිනෑන්ස් පීඑල්සී
14	කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් (උ)	35	සෙන්ට්‍රල් ෆිනෑන්ස් කම්පැනි පීඑල්සී
15	කොමර්ෂල් ක්‍රෙඩිට් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	36	සීබීසී ෆිනෑන්ස් ලිමිටඩ්
16	ඩයලොග් ෆිනෑන්ස් පීඑල්සී	37	සොෆ්ට්ලොජික් ෆිනෑන්ස් පීඑල්සී (ව)
17	තේමත් ලංකා ෆිනෑන්ස් පීඑල්සී (ඌ)	38	ෆින්ට්‍රෙක්ස් ෆිනෑන්ස් ලිමිටඩ්
18	පීඑම්එෆ් ෆිනෑන්ස් පීඑල්සී (එ)		

19	පීපල්ස් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී	(ඇ) විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම්	
20	බිම්පුත් ෆිනෑන්ස් පීඑල්සී (ඒ)	1	කෝපරේටිව් ලීසිං කම්පැනි ලිමිටඩ්
21	මර්කන්ටයිල් ඉන්වෙස්ට්මන්ට්ස් ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී		

බලපත්‍රලාභී ක්ෂුද්‍රමූල්‍ය සමාගම්

1	දුම්බර මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්	3	ලක් ජය මයික්‍රෝ ෆිනෑන්ස් ලිමිටඩ්
2	බෙරෙන්ඩිනා මයික්‍රෝ ඉන්වෙස්ට්මන්ට් කම්පැනි ලිමිටඩ්	4	සේජය මයික්‍රෝ ක්‍රෙඩිට් ලිමිටඩ්

ප්‍රාථමික අලෙවිකාර සමාගම්

1	ඇකියුට් සෙකියුරිටිස් ලිමිටඩ්	5	පර්පෙචුවල් ට්‍රෙෂරීස් ලිමිටඩ්(ඩ)
2	එන්එස්බී ෆන්ඩ් මැනේජ්මන්ට් කම්පැනි ලිමිටඩ්	6	වෙල්ත්ට්‍රස්ට් සෙකියුරිටිස් ලිමිටඩ්
3	එන්ට්‍රස්ට් සෙකියුරිටිස් පීඑල්සී(ට)	7	ෆස්ට් කැපිටල් ට්‍රෙෂරීස් පීඑල්සී
4	කැපිටල් ඇලායන්ස් පීඑල්සී		

(අ) ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ ඇසට්ලයින් ලීසිං කම්පැනි ලිමිටඩ් ආයතනය, 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගමක් ලෙස 2022.08.29 දින සිට බලපැවැත්වෙන පරිදි, බලපත්‍ර ලබා ඇත. ඒ අනුව එහි නාමය ඇසට්ලයින් ෆිනෑන්ස් ලිමිටඩ් ලෙස වෙනස් කර ඇත.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 31(5)(ආ) වගන්තිය ප්‍රකාරව ඊටිඅයි ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය ගණුන් බේරා වසාදැමීම සඳහා, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් නිසි බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලීමක් කරනු ලැබීමට සැලැස්වීම සඳහා තීරණය කරන ලදී.

(ඇ) ප්‍රයිම් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය 2022.05.12 දින සිට බලපැවැත්වෙන පරිදි එච්එන්බී ෆිනෑන්ස් පීඑල්සී සමග ඒකාබද්ධ කරන ලදී.

(ඈ) එල්ඕඑල්සී ඩිවෙලෝප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය 2023.01.31 දින සිට බලපැවැත්වෙන පරිදි එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සමග ඒකාබද්ධ කරන ලදී.

(ඉ) කොමර්ෂල් ලීසිං ඇන්ඩ් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය 2022.03.31 දින සිට බලපැවැත්වෙන පරිදි එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සමග ඒකාබද්ධ කරන ලදී. තවද එල්ඕඑල්සී ඩිවෙලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී ආයතනය 2023.01.31 දින සිට බලපැවැත්වෙන පරිදි එල්ඕඑල්සී ෆිනෑන්ස් පීඑල්සී ආයතනය සමග ඒකාබද්ධ කරන ලදී.

(ඊ) එස්එම්බී ලීසිං පීඑල්සී ආයතනය ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ 2022.12.01 දින සිට බලපැවැත්වෙන පරිදි බලපත්‍රලාභී මුදල් සමාගමක් ලෙස 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍ර ලබා දී ඇත. ඒ අනුව, එහි නාමය එස්එම්බී ෆිනෑන්ස් පීඑල්සී ලෙස වෙනස් කර ඇත.

(උ) මෙම සමාගමට නියමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීමට නොහැකි වීම හේතුවෙන් ණය නිකුත් කිරීමේ සහ තැන්පතු භාර ගැනීමේ සීමාවන් පනවා ඇත. තවද, නියමන ප්‍රාග්ධන අවශ්‍යතාවලට අනුකූල වීම සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන ඒකාබද්ධ කිරීමේ ප්‍රධාන වැඩපිළිවෙල යටතේ කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් සහ නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී අතර යෝජිත ඒකාබද්ධ කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් කොන්දේසි කිහිපයක් සපුරාලීමේ අවශ්‍යතාවට යටත්ව අනුමැතිය ලබා දී ඇත. තවද, යෝජිත ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලිය සාර්ථකව අවසන් වූ පසු, නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී ආයතනය ව්‍යාපාර කටයුතුවල රැඳී සිටිනු ඇත. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය වෙත එම ආයතනයේ සියලු මහජන වගකීම් (තැන්පතු සහ පොරොන්දු නෝට්ටු) 2022.12.26 සිට 2023.02.28 කාලසීමාව තුලදී සම්පූර්ණයෙන්ම නැවත ගෙවීමට කටයුතු කරන ලෙසට විධාන ලබා දී ඇත.

(උ෧) මෙම සමාගමට නියමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීමට සහ/හෝ ඒකාබද්ධකරණ වැඩපිළිවෙළට අනුගත වීමට නොහැකි වීම හේතුවෙන්, ණය වර්ග කිහිපයක් ලබා දීම සහ නව තැන්පතු භාර ගැනීම අත්හිටුවා ඇත. කොන්දේසි කිහිපයක් සපුරාලීමට යටත්ව නියමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීම සඳහා ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ කැන්රිච් ෆිනෑන්ස් ලිමිටඩ් සහ නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී අතර යෝජිත ඒකාබද්ධ කිරීම සඳහා මුදල් මණ්ඩලය විසින් අනුමැතිය ලබා දී ඇත. මෙම යෝජිත ඒකාබද්ධ කිරීම සාර්ථකව නිමා කිරීමෙන් පසු, නේෂන් ලංකා ෆිනෑන්ස් පීඑල්සී ආයතනය ඉතිරිව පවතින ආයතනය වනු ඇත.

(එ) පීපල්ස් මර්චන්ට් ෆිනෑන්ස් පීඑල්සී ආයතනයෙහි නාමය 2022.10.21 දින සිට බලපැවැත්වෙන පරිදි පීඑම්එෆ් ෆිනෑන්ස් පීඑල්සී ලෙස වෙනස් කර ඇත.

(ඒ) මෙම සමාගමට නියමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීමට සහ/හෝ ඒකාබද්ධකරණ වැඩපිළිවෙළට අනුගත වීමට නොහැකි වීම හේතුවෙන්, නව ණය මුදල් ලබා දීම හෝ නව තැන්පතු භාර ගැනීම අත්හිටුවා ඇත. එම සමාගම විසින් 2022.06.03 දින සිට බලපැවැත්වෙන පරිදි එහි තැන්පතු ආපසු ගෙවිය යුතු වේ.

(ඓ) මෙම සමාගමට නියමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීමට සහ/හෝ ඒකාබද්ධකරණ වැඩපිළිවෙළට අනුගත වීමට නොහැකි වීම හේතුවෙන්, ණය ලබා දීම, තැන්පතු සහ උපරිම පොලී අනුපාතිකය පිරිනැමීම මත සීමා පනවා ඇත.

(ඔ) මෙම සමාගමට නියමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීමට සහ/හෝ ඒකාබද්ධකරණ වැඩපිළිවෙළට අනුගත වීමට නොහැකි වීම හේතුවෙන්, ණය දීම් සහ තැන්පතු මත සීමා පනවා ඇත. තවද, ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ මෙම සමාගම එල්බී ෆිනෑන්ස් පීඑල්සී සමග ඒකාබද්ධ කිරීමේ ක්‍රියාවලියක පවතියි.

(ඕ) 2022.01.28 දින සිට බලපැවැත්වෙන පරිදි අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ් යන නාමය මහින්ද්‍රා අයිඩියල් ෆිනෑන්ස් ලිමිටඩ් ලෙස වෙනස් කර ඇත.

(ඖ) රිච්ඩ් පීරිස් ෆිනෑන්ස් ලිමිටඩ් ආයතනය විසින් මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කර ඇති 2017 අංක 02 දරන අවම මූලික ප්‍රාග්ධනය හා 2018 අංක 03 දරන ප්‍රාග්ධන ප්‍රමාණාත්මක අවශ්‍යතා විධාන සමග පිළිවෙලින් 2022.10.31 හා 2022.11.30 යන දිනයන්හි සිට අනුකූල නොවුවද, පසුව 2023.01.31 දින එම ආයතනය විසින් ඉහත සඳහන් කරන ලද විධාන සමග අනුගත වී ඇත.

(ක) ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ සමාගම් ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් 2022.01.21 දින සිට බලපැවැත්වෙන පරිදි ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් ලිමිටඩ් යන නාමය ලංකා ක්‍රෙඩිට් ඇන්ඩ් බිස්නස් ෆිනෑන්ස් පීඑල්සී ලෙස වෙනස් කර ඇත.

(ග) ඒකාබද්ධකරණ වැඩපිළිවෙළ යටතේ සමාගම් ලැයිස්තුගත කිරීමේ අවශ්‍යතාවය හේතුවෙන් 2022.01.06 දින සිට බලපැවැත්වෙන පරිදි සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් ලිමිටඩ් යන නාමය සර්වෝදය ඩිවලොප්මන්ට් ෆිනෑන්ස් පීඑල්සී ලෙස වෙනස් කර ඇත.

(ඛ) මෙම සමාගමට නියමන ප්‍රාග්ධන අවශ්‍යතා සමග අනුකූල වීමට සහ/හෝ ඒකාබද්ධකරණ වැඩපිළිවෙළට අනුගත වීමට නොහැකි වීම හේතුවෙන්, ණය ලබා දීම, තැන්පතු සහ උපරිම පොලී අනුපාතිකය පිරිනැමීම මත සීමා පනවා ඇත. නව තැන්පතු භාර ගැනීම 2022.08.12 වන දින සිට බලපැවැත්වෙන පරිදි අත්හිටුවා ඇත.

(ඡ) ස්වර්ණමහල් ෆයිනෑන්ෂල් සර්විසස් පීඑල්සී වෙත නිකුත් කරන ලද මුදල් ව්‍යාපාර බලපත්‍රය 2022.12.28 වන දින සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කර ඇති අතර, එම ආයතනය ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතනයක් ලෙස ලියාපදිංචි කිරීම 2023.01.18 වන දින සිට බලපැවැත්වෙන පරිදි අහෝසි කර ඇත.

(ට) 2017.07.24 දින සිට ක්‍රියාත්මක වන පරිදි රජයේ සුරුකුම්පත් සඳහා වන ප්‍රාථමික වෙන්දේසි කටයුතුවලට සහභාගී වීම අත්හිටුවා ඇත.

(ඩ) 2017.07.06 දින සිට ප්‍රාථමික අලෙවිකරුවෙකු ලෙස ව්‍යාපාර කටයුතු කර ගෙන යෑම අත්හිටුවා ඇති අතර, මෙම අත්හිටුවීම 2023.07.05 දින දක්වා ක්‍රියාත්මක වේ.

තුන්වැනි කොටස

තුන්වැනි කොටස

මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ රජය හා මුදල් මණ්ඩලය විසින් වසර තුළදී උපයෝගී කරගනු ලැබූ පරිපාලන විධිවිධාන

මෙහෙයුම් උපදෙස්, චක්‍රලේඛ, නියෝග සහ නිවේදන

		යොමු අංකය	පිටුව
බැංකු අධීක්ෂණ			
1.	මුදල් නීති පනත් නියෝගය 2022 අංක 01: බලපත්‍රලාභී බැංකු විසින් පිරිනමනු ලබන ණය පහසුකම් සඳහා අයකරනු ලබන උපරිම පොලී අනුපාතිකවලට සිදු කරන සංශෝධනය		1
2.	මුදල් නීති පනත් නියෝගය 2022 අංක 02: බලපත්‍රලාභී වාණිජ බැංකුවල හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ මුදල් තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත සඳහා සිදු කෙරෙන සංශෝධනය		1
3.	බැංකු පනත් විධාන 2022 අංක 01: බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමය ඉදිරි විකුණුම් සහ මිලදී ගැනීම්		2
4.	චක්‍රලේඛය 2022 අංක 01: බලපත්‍රලාභී බැංකුවල පශ්චාත් කොවිඩ්-19 පුනර්ජීවන ඒකක පිහිටුවීම පිළිබඳ මාර්ගෝපදේශ		2
5.	මුදල් නීති පනත් නියෝගය 2022 අංක 03: බලපත්‍රලාභී බැංකු වල ණය සහ තැන්පතු පහසුකම් සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික		4
6.	බැංකු පනත් විධාන 2022 අංක 02: වාණිජ බැංකුවල අභිමතානුරූපී ගෙවීම් සීමා කිරීම.		4
7.	බැංකු පනත් විධාන 2022 අංක 03: ආනයනවලට එරෙහිව ආන්තික අවශ්‍යතා		5
8.	බැංකු පනත් විධාන 2022 අංක 04: පවත්නා සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ නියාමන අවශ්‍යතාවන්		6
9.	මුදල් නීති පනත් නියෝගය 2022 අංක 04 : බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුවෙහි විදේශ මුදල් තැන්පතු සඳහා වන උපරිමය පොලී අනුපාත සඳහා සිදු කෙරෙන සංශෝධනය		8
10.	බැංකු පනත් විධාන 2022 අංක 05: බලපත්‍රලාභී බැංකුවල තිරසාර මූල්‍ය කටයුතු		9
11.	බැංකු පනත් විධාන 2022 අංක 06: 2011 අංක 8 දරන බලපත්‍රලාභී බැංකු වල පාරිභෝගික ප්‍රඥප්තිය පිළිබඳ බැංකු පනත් විධානය සඳහා වන අතිරේකය		11
12.	චක්‍රලේඛය 2022 අංක 02: පවතින සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන් සඳහා වන සහන		14

		යොමු අංකය	පිටුව
13.	බැංකු පනත් නියෝගය 2022 අංක 01: බැංකු (අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු පටිපාටිය) නියෝගය නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල්		16
14.	බැංකු පනත් විධාන 2022 අංක 07: බලපත්‍රලාභී බැංකු විසින් තැන්පත්කරුවන්ගේ අනන්‍ය හඳුනාගැනීමේ අංක අනිවාර්යයෙන් සටහන් කිරීම.		17
15.	බැංකු පනත් විධාන 2022 අංක 08: ද්‍රවශීලතා අනුපාත පිළිබඳ නියාමන අවශ්‍යතා		18
16.	බැංකු පනත් නීර්ණය 2022 අංක 01: බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු		18
විදේශ විනිමය			
17.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2263/41 - 2022 ජනවාරි මස 21 වැනි සිකුරාදා	2263/41	19
18.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2022 අංක 01 දරන විධානයන්: පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCAs) පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද විධානයන්		21
19.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 02 දරන විධානයන්: ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCAs) පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද විධානයන්		21
20.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අතිවිශෙෂ): අංක 2270/66 - 2022 මාර්තු මස 11 වැනි සිකුරාදා	2270/66	21
21.	2017 අංක 12 දරණ විදේශ විනිමය පනත යටතේ, 2022 අංක 03 දරණ විධානයන්: "තායි බාත්" නම් කිරීම පිළිබඳ බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		24
22.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2273/06 - 2022 මාර්තු මස 28 වැනි සඳුදා	2273/06	24
23.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ, 2022 අංක 04 දරණ විධානයන්: විශේෂ තැන්පතු ගිණුම පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		25
24.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2282/27 - 2022 ජුනි මස 01 වැනි බදාදා	2282/27	25
25.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2282/59 - 2022 ජූනි මස 03 වැනි සිකුරාදා	2282/59	25
26.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2282/60 - 2022 ජූනි මස 03 වැනි සිකුරාදා	2282/60	26
27.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2284/34 - 2022 ජූනි මස 16 වැනි බ්‍රහස්පතින්දා	2284/34	27

		යොමු අංකය	පිටුව
28.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2022 අංක 05 දරන විධානයන්: විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම හා හුවමාරු කිරීම සිදු කරන, තම මූලික ව්‍යාපාරය ලෙස මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ නිරතව සිටින පරිසීමිත වෙළෙඳුන් (මුදල් හුවමාරු කරන්නන්) වෙත නිකුත් කරනු ලබන විධානයන්		28
29.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය අති විශෙෂ: අංක 2284/40 - 2022 ජූනි මස 16 වැනි බ්‍රහස්පතින්දා	2284/40	28
30.	2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රකාර 2022 අංක 6 දරන විධානයන්: කොළඹ වරාය නගර ආයෝජන ගිණුම-ආයෝජක යන ගිණුම (ආයෝජක ගිණුම) පිළිබඳව බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන විධානයන්		29
31.	2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ප්‍රකාර 2022 අංක 7 දරන විධානයන්: කොළඹ වරාය නගර ආයෝජන ගිණුම-ආයෝජිත යන ගිණුම (ආයෝජිත ගිණුම) පිළිබඳව බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන විධානයන්		30
32.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2286/27 - 2022 ජූනි මස 30 වැනි බ්‍රහස්පතින්දා	2286/27	32
33.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ, 2022 අංක 08 දරන විධානයන්: පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (PFCAs) සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		33
34.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ, 2022 අංක 09 දරන විධානයන්: ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් (BFCAs) සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්		34
35.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2287/16 - 2022 ජූලි මස 05 වැනි අඟහරුවාදා	2287/16	34
36.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2292/50 - 2022 අගෝස්තු මස 12 වැනි සිකුරාදා	2292/50	35
37.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2293/07 - 2022 අගෝස්තු මස 15 වැනි සඳුදා	2293/07	35
38.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 10 දරන විධානයන්: ඉන්දියානු රුපියල් නාමකරණය පිළිබඳ බලයලත් වෙළෙන්දන් වෙත කරන විධානයන්		36
39.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2296/12 - 2022 සැප්තැම්බර් මස 08 වැනි බ්‍රහස්පතින්දා	2296/12	37
40.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 11 දරන විධානය: රන් පාරාදීසය විශේෂ ගිණුම පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්		37

		යොමු අංකය	පිටුව
41.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2308/51 - 2022 දෙසැම්බර් මස 02 වැනි සිකුරාදා	2308/51	38
42.	2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2022 අංක 12 දරන විධානයන්: විදේශයෙන් ලබාගන්නා කෙටි කාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය සඳහා විශේෂ ව්‍යවහාර මුදල් ගිණුම-කෙටිකාලීන ණය (SFCA - Short Term Loans) පිළිබඳ බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන විධානයන්.		39
43.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2311/38 - 2022 දෙසැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා	2311/38	41
	දේශීය මෙහෙයුම් කටයුතු		
44.	මෙහෙයුම් උපදෙස් අංක: 2022 අංක 01: ලංකාසෙට්ල්හි නිර්ලේඛන රාජ්‍ය සුරැකුම්පත් මත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සැපයීම පිළිබඳ මෙහෙයුම් උපදෙස්		42
45.	ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 1949 අංක 58 දරන මුදල් නීති පනතේ අංක 103 වන වගන්තියේ විධිවිධානවලට අනුව ණයවර ලිපි මත මුදල් ආන්තික තැන්පතු පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව පිළිබඳ නියෝගය		45
46.	චක්‍රලේඛ අංක: 2022 අංක 01: අත්තිකාරම් සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකු පොලී අනුපාතිකය (බැංකු අනුපාතිකය)		51
	මූල්‍ය බුද්ධි ඒකකය		
47.	චක්‍රලේඛ අංක 01/2022: සංවෘත පරිපථ රූපවාහිනී පද්ධති (CCTV) මෙහෙයුම් සම්බන්ධයෙන් මූල්‍ය ආයතන වෙත නිකුත් කරනු ලබන 2021 අංක 02 දරන මාර්ගෝපදේශයන් සඳහා සංශෝධන	037/06/008/0006/020	51
48.	චක්‍රලේඛ අංක 02/2022:සැක කටයුතු ගනුදෙනු වාර්තා පිළිබඳ වැඩිදුර තොරතුරු ඉල්ලීම	037/05/002/0005/022	52
49.	චක්‍රලේඛ අංක 03/2022: විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා කාර්යක්ෂම බැංකු සේවාවන් සැපයීමට අදාල ප්‍රතිපාදන	037/06/006/0005/022	52
50.	චක්‍රලේඛ අංක 04/2022: ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හරහා ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ තොරතුරු සත්‍යාපනය කිරීම	037/05/003/0005/022	53
	විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසු කිරීම්		
51.	විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මෙරටට එවීමේදී දැරීමට සිදුවන ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා වන මෙහෙයුම් උපදෙස්	69/02/002/0002/001	53

		යොමු අංකය	පිටුව
52.	විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මෙරටට එවීමේදී දැරීමට සිදුවන ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා වන මෙහෙයුම් උපදෙස්වලට අදාළ සංශෝධන	69/02/002/0002/002	55
ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු			
53.	"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන අතිරේක දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අතැ'ති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම වෙනුවෙන් සාමාන්‍ය ජනතාව වෙත ලබාදෙන දිරි දීමනා" පිළිබඳ මෙහෙයුම් උපදෙස් බලපැවැත්වෙන කාල සීමාවන් දීර්ඝ කිරීම	33/04/012/0012/001	56
54.	පුළුල් සාර්ව ආර්ථික ස්ථායීතාවයක් සඳහා සහය වීමට අවශ්‍ය ප්‍රතිපත්ති මාලාව: විනිමය අනුපාතිකයේ නම්‍යශීලීභාවයට ඉඩ ලබා දීම		56
55.	"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" පිළිබඳ මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධන	33/04/012/0012/002	57
56.	"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" පිළිබඳ මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධන	33/04/012/ 0012/003	57
57.	විනිමය අනුපාතිකයේ දෛනිකව සිදුවන විචලනය කළමනාකරණය කිරීම පිළිබඳ මෙහෙයුම් උපදෙස්	33/04/012/0012/004	58
58.	"අපනයන ආදායම ශ්‍රී ලංකාව වෙත ආපසු ගෙන්වා ගැනීම" පිළිබඳ මෙහෙයුම් උපදෙස් හා සම්බන්ධ සංශෝධන	33/04/012/0012/005	58
59.	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය (අති විශෙෂ): අංක 2292/50 - 2022 අගෝස්තු මස 12 වැනි සිකුරාදා	2292/50	59
60.	"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳ බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්	33/04/012/0012/006	60
රාජ්‍ය ණය			
61.	ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඍජු නිකුතු කවුළුව සඳහා වන දිරි දීමනා ක්‍රමවේදයට අදාළ මෙහෙයුම් උපදෙස්	08/21/007/047/002	60
ගෙවීම් සහ පියවීම්			
62.	2022 අංක 01 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පොදු විධිවිධාන: ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය සඳහා වූ පොදු විධිවිධාන		62
63.	2022 අංක 02 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පොදු විධිවිධාන: ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු		68

		යොමු අංකය	පිටුව
64.	2022 අංක 03 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පොදු විධිවිධාන: විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු		71
65.	2022 අංක 04 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති පොදු විධිවිධාන: විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු		75
66.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 02/2022: 2022 මැයි 11 වන දින ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික මෙහෙයුම් කාලසටහන	34/07/029/0001/002	78
67.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 03/2022: ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි වගකීම් කළමනාකරණ සීමාවන්		83
68.	ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 04/2022: 2022 ජූලි මස 22 වන දින ආපදා ප්‍රතිසාධන වැඩබිමෙහි සිට සිදුකෙරෙන ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම්	34/01/024/0106/06	85

ප්‍රාදේශීය සංවර්ධන

69.	මෙහෙයුම් උපදෙස්: සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම - උප ණය සඳහා අදාල වන වාර්ෂික පොලී අනුපාතය ඉහළ නැංවීම	RDD/PR/2010/03 (A-7)	86
70.	මෙහෙයුම් උපදෙස්: කුඩා පරිමාණ තේ සහ රබර් වතු පුනර්ජීවන (STaRR) පොලී සහනාධාර යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම	RDD/STaRR-IS/2019/01 (1 වන සංශෝධනය)	86
71.	මෙහෙයුම් උපදෙස්: නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයේ (NCRCS) මෙහෙයුම් උපදෙස් සඳහා වන සංශෝධනය	RDD/NCRCS/2011/2022/ 01	87
72.	මෙහෙයුම් උපදෙස්: කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන (STaRR) පොලී සහනාධාර යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම	RDD/STaRR-IS/2019/01 - (2 වන සංශෝධනය)	89
73.	මෙහෙයුම් උපදෙස්: ''කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන (STaRR) පොලී සහනාධාර යෝජනා ක්‍රමයේ'' මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම	RDD/STaRR-IS/2019/01 - (3 වන සංශෝධනය)	90
74.	ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම යටතේ බෙදා හරින ලද ණය සඳහා සහන සැලසීම	32/04/034/0001/001	91

		යොමු අංකය	පිටුව
බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණය			
75.	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2022 අංක 01 දරන විධානය: තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව		94
76.	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2022 අංක 02 දරන විධානය: ජංගම දුරකථන පදනම් කර ගත් විද්‍යුත් මුදල් සේවා		110
77.	බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තැන්පතු සහ ණය උපකරණ මත ගෙවන උපරිම පොලී අනුපාතයන්හි සිදු කරන සංශෝධන	24/06/002/0002/002	115
78.	2022 අංක 01 දරන චක්‍රලේඛය: පවතින සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන් සඳහා සහන සැලසීම		118
79.	මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2022 අංක 03 දරන විධානය: තැන්පතුකරුවන් සඳහා අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංක සටහන් කිරීම		120
80.	තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ	24/10/001/0019/005	121

මුදල් නීති පනත් නියෝගය 2022 අංක 01 2022 මාර්තු 11

බලපත්‍රලාභී බැංකු විසින් පිරිනමනු ලබන ණය පහසුකම් සඳහා අයකරනු ලබන උපරිම පොලී අනුපාතිකවලට සිදු කරන සංශෝධනය

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත) 104(1) (ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

ඉහළ මට්ටමේ සාර්ව ආර්ථික ස්ථාවරත්වයක් ප්‍රවර්ධනය කරනු ලබන අවසානයේ බාහිර අංශයේ පීඩනය ලිහිල් කිරීම මගින් ආර්ථිකයේ ඉල්ලුම් පීඩනයන් ගොඩනැගීමේ හැකියාව සමනය කිරීම සඳහා ප්‍රතිපත්ති පොලී අනුපාත ඉහළ දැමීම ඇතුළුව මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ ක්‍රමවේදයන්ට ශ්‍රී ලංකා මහ බැංකුව මෑත කාලීනව අනුගත වී ඇත. එහි ප්‍රතිඵලයක් වශයෙන් මුදල් මණ්ඩලය විසින් සමස්ත වෙළඳපොල පොලී අනුපාත ඉහළ යාම සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී බැංකු මගින් නිකුත් කර ඇති ණය සඳහා වන උපරිම පොලී අනුපාත පිළිබඳ 2020 අංක 02 දරන මුදල් නීති පනතේ නියෝගයට සංශෝධනයක් මෙතුළින් නිකුත් කරනු ලබයි.

ඒ අනුව, ඉහත නියෝගයෙහි 2.1 නියෝගය පහත පරිදි ආදේශනය කෙරෙන අතර, 2.2 නියෝගය ඉවත් කෙරේ.

2. රුපියල් මත පදනම් වූ ණය සහ අත්තිකාරම් මත පොලී අනුපාත

2.1 2022 මාර්තු 14 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි, ණයපත් අත්තිකාරම්, පෙර ගිවිසගත් තාවකාලික අයිරා සහ උකස් අත්තිකාරම් සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින් අය කළ හැකි උපරිම පොලී අනුපාතික පහත දක්වා ඇත.

(i) මීළඟ බිල්පත් චක්‍රයෙන් ආරම්භ වන පරිදි ණය කාඩ්පත් මඟින් ලබාගන්නා අත්තිකාරම් මත වාර්ෂිකව සියයට 20ක්

(ii) පෙර ගිවිසගත් තාවකාලික අයිරා පහසුකම් මත වාර්ෂිකව සියයට 18 ක්

(iii) ඇප ලෙස පිළිගැනෙන රනින් නිම කරන ලද පෞද්ගලික අයිතම සුරැකුම් ලෙස තබාගන්නා සියලුම නව උකස් අත්තිකාරම් සහ දැනට පවතින උකස් අත්තිකාරම් අලුත් කිරීම සඳහා ණයට දෙනු ලබන මුදල් මත වාර්ෂිකව සියයට 12ක්

අත්සන් කළේ
නිවාඩ් අජිත් ලෙස්ලි කබ්‍රාල්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් නීති පනත් නියෝගය 2022 අංක 02 2022 මාර්තු 11

බලපත්‍රලාභී වාණිජ බැංකුවල හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ මුදල් තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත සඳහා සිදු කෙරෙන සංශෝධනය

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත) 104(1) (ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

මෑත කාලීන මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීමේ ක්‍රියාමාර්ග, අපේක්ෂිත සාර්ව ආර්ථික වර්ධනයන් සහ බලපත්‍රලාභී බැංකු වල විදේශ මුදල් තැන්පතු සඳහා පවතින පොලී අනුපාත සැලකිල්ලට ගනිමින්, බලපත්‍රලාභී වාණිජ බැංකුවල හා ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ මුදල් තැන්පතු සඳහා දැනට පවතින උපරිම පොලී අනුපාත සීමාවන් ඉවත් කරමින්, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ මුදල් තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත යන මැයෙන් නිකුත් කළ 2021 අංක 03 දරන මුදල් නීති පනතේ නියෝගයට සංශෝධනයක් මුදල් මණ්ඩලය විසින් මෙයින් නිකුත් කරනු ලබයි.

ඒ අනුව, ඉහත නියෝගයෙහි 2 සහ 3 නියෝග මෙමගින් ඉවත් කෙරේ.

අත්සන් කළේ
නිවාඩ් අජිත් ලෙස්ලි කබ්‍රාල්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධානය 2022 අංක 01 2022 මාර්තු 22

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමය ඉදිරි විකුණුම් සහ මිලදී ගැනීම්

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) වගන්තිය මඟින් ලබා දී ඇති බලතල අනුව නිකුත් කරන ලදී.

බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් සිදු කරනු ලබන විදේශ විනිමය ඉදිරි විකුණුම් සහ මිලදී ගැනීම් පිළිබඳ නිකුත් කළ 2021 අප්‍රේල් 25 දිනැති 2021 අංක 07 දරන බැංකු පනත් විධාන මෙයින් අවලංගු කෙරේ.

අත්සන් කලේ
නිවාඩ අජිත් ලෙස්ලි කබ්‍රාල්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

චක්‍රලේඛය 2022 අංක 01 2022 මාර්තු 24

බලපත්‍රලාභී බැංකුවල පශ්චාත් කොවිඩ්-19 පුනර්ජීවන ඒකක පිහිටුවීම පිළිබඳ මාර්ගෝපදේශ

කොවිඩ්-19 වසංගතය දිගු කාලීනව පැවතීම, ව්‍යාපාර/ආදායම් උත්පාදන කටයුතුවලට බාධා මතු වීමට හේතු වී ඇති අතර එමඟින් බලපත්‍රලාභී වාණිජ බැංකුවල සහ බලපත්‍රලාභී විශේෂ බැංකුවල (මින් මතුවට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වේ) ණය ගනුදෙනුකරුවන්ට තම බැංකු ණය නිසි ලෙස පියවා ගත නොහැකි වී ඇත. එබැවින්, කොවිඩ්-19 වසංගතයෙන් පීඩාවට පත් වූ ව්‍යාපාරවල තිරසාර ආර්ථික පුනර්ජීවනයට පහසුකම් සැලසීමේ අරමුණින් සහ එමඟින් බලපත්‍රලාභී බැංකුවල ණය හානිකරණ වත්කම් ඉහළ යාම අවම කිරීම සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුව එහි "සාර්ව ආර්ථික සහ මූල්‍ය පද්ධති ස්ථායිතාව සහතික කිරීම සඳහා වන සය මාසික පෙර දැක්ම" යටතේ බලපත්‍රලාභී බැංකුවල පශ්චාත් කොවිඩ්-19 පුනර්ජීවන ඒකක පිහිටුවීමේ අවශ්‍යතාවය නිවේදනය කරන ලදී. ඒ අනුව, බලපත්‍රලාභී බැංකුවල පශ්චාත් කොවිඩ්-19 පුනර්ජීවන ඒකක පිහිටුවීම බලාත්මක කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙම චක්‍රලේඛය හරහා පුළුල් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබේ.

1. අරමුණ

1.1 පශ්චාත් කොවිඩ්-19 පුනර්ජීවන ඒකක (මෙතැන් සිට ඒකකය ලෙස හැඳින්වේ) පිහිටුවීමේ අරමුණ වන්නේ, බලපත්‍රලාභී බැංකු වල කොවිඩ්-19 බලපෑමෙන් මෙහෙයුම් අඩුවීම/අඩාල වීම හෝ ව්‍යාපාර වසා දැමීම වැනි හේතූන් නිසා මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දී සිටින ඌණ ක්‍රියාකාරී සහ අක්‍රීය ණය ගැතියන් හඳුනා ගැනීම සහ එම ණයගැතියන්ට අවශ්‍ය සහය ලබා දීම මෙන්ම, එම ණයගැතියන්ගේ ව්‍යාපාර ස්ථාවරත්වය ඇතිකිරීම තුළින් ආර්ථික ක්‍රියාකාරකම් වැඩි දියුණු කිරීම, ජාතික ආර්ථිකය සංවර්ධනය සහ පුනර්ජීවනය කිරීමයි.

2. පාලන රාමුව සහ සම්පත්

2.1 ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත බලපත්‍රලාභී බැංකු සඳහා එම බැංකු වල අධ්‍යක්ෂ මණ්ඩලය විසින්ද, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත බලපත්‍රලාභී බැංකු සඳහා කලාපීය/ගෝලීය මූලස්ථානය විසින්ද අනුමත කරන ලද පුනර්ජීවන සහ පුනරුත්ථාපන ප්‍රතිපත්තියක් සැකසීම අවශ්‍ය වේ.

2.2 පුනර්ජීවන සහ පුනරුත්ථාපන ප්‍රතිපත්තියට අවම වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් විය යුතුය:

(i) ඒකකය ස්ථාපිත කිරීම සඳහා වන නියෝගය;

(ii) එහි ක්‍රියාකාරකම්වල විෂය පථය සහ ඒවා සිදු කරන ආකාරය;

(iii) පවතින ණය පහසුකම් ප්‍රතිලේඛනගත කිරීම/ප්‍රතිව්‍යුහගත කිරීමට පමණක් සීමා නොවූ සියළුම මූල්‍ය සහ මූල්‍ය නොවන උපාය මාර්ග අන්තර්ගත වන ණය ගනුදෙනුකරුවන් උදෙසා ඇති පුනර්ජීවන යාන්ත්‍රණය;

(v) අවශ්‍යතාවය මත අමතර ණය පහසුකම් ලබා දීම සහත

(vi) කොවිඩ්-19 න් පසු බලපෑමකට ලක් වූ ණය ගැනුම්කරුවන් පුනර්ජීවනය කිරීම සඳහා වෙනත් සුදුසු ක්‍රියාමාර්ග සැපයීම.

2.3 මෙම ඒකකයේ ඵලදායී සහ කාර්යක්ෂම අධීක්ෂණය සහතික කිරීම සහ පුනර්ජීවන හා පුනරුත්ථාපන කටයුතු කඩිනමින් ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා, ප්‍රමාණවත් අධිකාරියක් සහ ජ්‍යෙෂ්ඨත්වයක් ඇති බලපත්‍රලාභී බැංකුවේ ප්‍රධාන කළමනාකරණ නිලධාරියෙකු විසින් මෙම ඒකකය මෙහෙයවිය යුතුය.

2.4 බලපත්‍රලාභී බැංකු විසින් මෙම ඒකකයට ප්‍රමාණවත් කාර්ය මණ්ඩලයක් සහ ණය තක්සේරු කිරීම සහ අධීක්ෂණය සඳහා ප්‍රමාණවත් ප්‍රවීණත්වයක් සහ අධිකාරියක් ඇති බව සහතික කළ යුතු අතර අවශ්‍යතා පදනම මත අනෙකුත් සියලුම සම්පත් ලබා දීමට කටයුතු කළ යුතුය.

2.5 බැංකු ශාඛා 50කට වඩා වැඩි බලපත්‍රලාභී බැංකු වල විශාල ශාඛාවල/ප්‍රාදේශීය කාර්යාලවල මෙම ඒකක පිහිටුවීම යෝග්‍යවේ. අනෙකුත් බලපත්‍රලාභී බැංකුවල පශ්චාත් කොවිඩ්-19 පුනර්ජීවන ඒකකය මධ්‍යගතව පවත්වා ගෙන යා යුතුය.

3. පුනර්ජීවන ඒකකයේ වගකීම් සහ කාර්යයන්

3.1 පහත කාර්යයන් සිදු කිරීම සඳහා මෙම ඒකකය බැංකු ශාඛා හා අනෙකුත් ව්‍යාපාරික ඒකක සමඟ සක්‍රීය සම්බන්ධතාවයක් පවත්වා ගෙන යා යුතුය.

(i) ණය සහන සඳහා මෙන්ම ද්‍රවශීලතා ආධාරක ලබා දීමට සලකා බැලූ ණය ගැතියන් ඇතුළුව, පුනර්ජීවනය සඳහා සහය අවශ්‍ය වන ණය ගැනුම්කරුවන් හඳුනා ගැනීම

(ii) ගැඹුරු විශ්ලේෂණයක් කිරීමෙන් අනතුරුව සහ සියලුම පාර්ශවකරුවන් සමඟ සම්බන්ධීකරණය සම්පූර්ණ කිරීමෙන් පසු පුනරුත්ථාපන යෝජනා සකස් කිරීම.

(iii) අවශ්‍ය අනුමැති ලබා ගැනීම සහ කාර්යසාධනය සමාලෝචනය කිරීම.

3.2 ඉහත 3.1 (i) හි දී, බලපත්‍රලාභී බැංකු විසින් පහත සඳහන් ණය ගැනුම්කරුවන් පුනර්ජීවන කාර්යය සඳහා සලකා බලනු නොලැබේ.

(අ) සිතාමතා පැහැර හැරීම් සිදු කරන්නා යැයි හඳුනාගෙන ඇති ණය ගැනුම්කරුවන්

(ආ) අරමුදල් වෙනත් කාර්යයන් උදෙසා යොමු කිරීම හේතුවෙන් ගෙවීම් පැහැර හැරී ඇති ණය ගැනුම්කරුවන් (එනම් බලපත්‍රලාභී බැංකුවලින් ලබා ගත් ණය මුදල් ගැනුම්කරුගේ ව්‍යාපාරයේ මෙහෙයුම්වලට අදාළ නොවන කටයුතු සඳහා භාවිත කර තිබීම)

(ඇ) ව්‍යාපාරයේ අයහපත් කළමනාකරණය සහ/හෝ වංචා හේතුවෙන් ණය ගෙවීම පැහැර හැරී ඇති ණය ගැනුම්කරුවන්

(ඈ) සාර්ථක නොවන ව්‍යාපෘතිවල නියැලී සිටින ණය ගැනුම්කරුවන්

3.3 ඉහත 3.1 (i) හි දී, බලපත්‍රලාභී බැංකු විසින් පුනර්ජීවනය සඳහා පහත සඳහන් ණය ගැනුම්කරුවන් සලකා බැලිය හැකිය.

(i) 2020 අප්‍රේල් 01 දිනට පෙර අක්‍රිය ලෙස වර්ගීකරණය කර ඇති ණය ගැනුම්කරුවන්

(ii) දැනටමත් ඔවුන්ට එරෙහිව නඩු පවරා ඇති ණය ගැනුම්කරුවන්

3.4 බලපත්‍රලාභී බැංකුවල ස්ථාපිත මෙම ඒකක මඟින් බැංකු ශාඛා, ව්‍යාපාරික ඒකක, ණය ගැතියන් යනාදී පාර්ශවකරුවන් වෙත පුනර්ජීවනය, ආරම්භක කටයුතු සම්බන්ධ උපදෙස්, ක්‍රියා පටිපාටි සහ ක්‍රමවේදයන් පිළිබඳ දැනුවත් කිරීමේ වැඩසටහන් පැවැත්විය යුතුය.

3.5 මෙම ඒකකය විසින් ණය උපදේශන සහ ව්‍යාපාර උපදේශන සේවා සැපයිය යුතු අතර, අවශ්‍ය නම්, විභව ආයෝජකයින් වෙත ළඟා වීමට, මූලික ප්‍රාග්ධනය, හිමිකම් ප්‍රාග්ධනය ආදිය ලබා ගැනීමට ව්‍යාපාරවලට සහාය විය යුතුය.

4. ගිණුම්කරණ සලකා බැලීම්

4.1 බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත්කර ඇති ඊට අදාළ චක්‍රලේඛ/මාර්ගෝපදේශ අනුව මෙම ඒකකය යටතේ සලකා බලන පහසුකම් සඳහා ගිණුම්කරණ සලකා බැලීම් අනුගමනය කළ යුතුය. වැඩි අවදානමක් සහිත ණය ගැනුම්කරුවන් හෝ අංශ සඳහා බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රමාණවත් ණය හානිකරණ වෙන්කිරීම සිදු කළ යුතු අතර මේ සම්බන්ධව අමතර මඟ පෙන්වීමක් අවශ්‍ය වන්නේ නම් ඒ සඳහා ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් උපදෙස් පැතිය හැක.

5. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම.

5.1 මෙම ඒකක විසින් පුනර්ජීවන සහ පුනරුත්ථාපන වැඩසටහන් වලට සහභාගී වීම ණය ගැනුම්කරුවන්ගේ ඉදිරි ණය තොරතුරු වාර්තා කිරීම කළ යුතු අතර අනාගත ණය ශ්‍රේණිගත කිරීම් කෙරෙහි බලපෑමක් ඇති නොවන ආකාරයෙන් මෙම ඒකකයේ පුනර්ජීවන සහ පුනරුත්ථාපන යෝජනා ක්‍රම වලට අදාළ වාර්තා සකස් කිරීම් සඳහා ක්‍රමවේදයක් ද බලපත්‍රලාභී බැංකු විසින් ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය සමඟ සාකච්ඡා කොට සකස් කළ යුතුවේ.

6. ප්‍රතිමූල්‍යනය හෝ පොලී සහනාධාර යෝජනා ක්‍රමය

6.1 ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව හෝ මුදල් අමාත්‍යාංශය විසින් නිකුත් කරන ලද මාර්ගෝපදේශවලට අනුකූලව ප්‍රතිමූල්‍යන හෝ පොලී සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සලකා බැලිය යුතුය.

7. පුනර්ජීවනයෙන් පසු ගෙවීම් පැහැර හැරීමකදී නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග

7.1 බැංකුවේ අභ්‍යන්තර මාර්ගෝපදේශ සහ ප්‍රතිපත්තිවලට අනුව මෙම ඒකකය යටතේ පුනර්ජීවනය සහ පුනරුත්ථාපනය සඳහා එකඟ වූ නියමයන් සහ කොන්දේසි පිළිපැදීමට අපොහොසත් වූ ණය ගැනුම්කරුවන්ට එරෙහිව බලපත්‍රලාභී බැංකු විසින් සුදුසු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග අනුගමනය කළ හැකිය.

8.	ක්‍රියාත්මක කිරීම	8.1	බලපත්‍රලාභී බැංකු 2022 අප්‍රේල් 30 වන විට පශ්චාත් කොවිඩ්-19 පුනර්ජීවන ඒකක පිහිටුවීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය. තවද, දැනටමත් පුනර්ජීවන ඒකක පිහිටුවා ඇති බලපත්‍රලාභී බැංකු විසින් මෙම චක්‍රලේඛයේ කොන්දේසි වලට අනුකූල වන පරිදි එම ඒකකයේ ක්‍රියාකාරකම්වල විෂය පථය පුළුල් කළ හැකිය.
9.	වාර්තාකරණ අවශ්‍යතාව	9.1	බලපත්‍රලාභී බැංකු විසින් 2022 ජූනි 30 සිට වැඩකරන දින 15ක් ඇතුළත, සෑම කාර්තුවකම අවසාන දින වන විට තම ණය ගැනුම්කරුවන් වෙත ලබා දුන් පුනර්ජීවන යෝජනාවල ප්‍රගතිය පිළිබඳ විස්තර ඇමුණුම 1 හි දක්වා ඇති වාර්තාකරණ ආකෘතියට අනුව වාර්තා කළ යුතුය.

අත්සන් කලේ
නිවාඩ් අජිත් ලෙස්ලී කබ්‍රාල්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙහි ඇමුණුම පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_circular_no_1_of_2022_e.pdf

මුදල් නීති පනත් නියෝගය 2022 අංක 03 2022 අප්‍රේල් 21

බලපත්‍රලාභී බැංකු වල ණය සහ තැන්පතු පහසුකම් සඳහා පිරිනමනු ලබන පොලී අනුපාතික

(1) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මේ දක්වා ක්‍රියාත්මක කර ඇති මූල්‍ය ප්‍රතිපත්ති දැඩි කිරීමේ ක්‍රියාමාර්ග සැලකිල්ලට ගනිමින්, 2022 මාර්තු 11 දින නිකුත් කරන ලද 2022 අංක 01 දරන මුදල් නීති පනත් විධානයේ විධාන 2.1 මඟින් සංශෝධිත, 2020 අගෝස්තු 21 දින නිකුත් කරන ලද 2020 අංක 02 දරන මුදල් නීති පනත් විධානයේ විධාන 2.1, පහත දැක්වෙන අයුරින් ඉවත් කරනු ලැබේ.

(i) ණය කාඩ්පත් අත්තිකාරම්, ඊළඟ බිල්පත් චක්‍රයේ සිට ක්‍රියාත්මක වන පරිදි.

(ii) සියලුම නව පෙර ගිවිසගත් තාවකාලික අයිරා සහ දීර්ඝ කරනු ලබන /අළුත් කරනු ලබන දැනට පවතින පෙර ගිවිසගත් අයිරා

(iii) සියළුම නව උකස් අත්තිකාරම් සහ අළුත් කරනු ලබන දැනට පවතින උකස් අත්තිකාරම්.

(2) ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරන ලද මුදල් ප්‍රතිපත්ති දැඩි කිරීම් හා සමගාමීව බැංකු ක්ෂේත්‍රය වෙත තැන්පතු ආකර්ෂණය කර ගැනීම සඳහා සහ, බලපත්‍රලාභී බැංකු විසින් තැන්පතු පොලී අනුපාතික ද ප්‍රමාණවත් පරිදි ගැලපිය යුතු වේ.

අත්සන් කලේ
ටී එම් ජේ වයි පී ප්‍රනාන්දු මිය
ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය අධිපතිනි
ශ්‍රී ලංකා මහ බැංකුව

බැංකු පනත් විධාන 2022 අංක 02 2022 මැයි 06

වාණිජ බැංකු වල අභිමතානුරූපී ගෙවීම් සීමා කිරීම

දැනට පවතින සාර්ව ආර්ථික තත්වයන් යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (මින් මතුවට බලපත්‍රලාභී බැංකු ලෙසින් හැඳින්වෙන) ද්‍රවශීලතාවය සහ අනෙකුත් ප්‍රධාන කාර්යසාධන දත්තයන් මත ඇතිවිය හැකි අයහපත් බලපෑම් සැලකිල්ලට ගනිමින් සහ එම බලපත්‍රලාභී බැංකු විසින් පවත්වාගත යුතු ද්‍රවශීලතා මට්ටම් සහ ප්‍රාග්ධන ස්වාරක්ෂකයන්හි වැදගත්කම සැලකිල්ලට ගනිමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් වාණිජ බැංකු වල අභිමතානුරූපී ගෙවීම් සීමා සම්බන්ධව මෙම විධානය නිකුත් කරනු ලබයි.

1.	බලගැන්වීම	1.1	බැංකු පනතේ 46(I) වගන්තිය ප්‍රකාරව, බැංකු පද්ධතියේ අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහා, සියළුම බලපත්‍රලාභී බැංකුවලට බැංකු ව්‍යාපාරවලට අදාළ ඕනෑම ව්‍යාපාර පැතිකඩක් සම්බන්ධව විධානයන් නිකුත් කිරීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වේ.

1.2 බැංකු පනතේ 76(ඒ)(I) ප්‍රකාරව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එහි ඕනෑම ව්‍යාපාර කටයුත්තක් සිදු කළ යුතු ආකාරය සම්බන්ධව විධාන දීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වේ.

2. මෙම විධානයේ අදාළත්වය

2.1 මෙම විධානයන් ශ්‍රී ලංකාව තුල සංස්ථාගත සෑම බලපත්‍රලාභී බැංකුවකට ම සහ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත හෝ පිහිටුවන ලද බැංකුවක ශ්‍රී ලංකා ශාඛාවක් වන සෑම බලපත්‍රලාභී බැංකුවකට ම අදාළ වේ.

3. අභිමතානුරූපී ගෙවීම් මත පනවනු ලබන සීමා

3.1 ශ්‍රී ලංකාව තුල සංස්ථාපිත හෝ පිහිටුවන ලද සෑම බලපත්‍රලාභී බැංකුවක්ම 2022 වසර සඳහා වන මූල්‍ය වාර්තා/අතුරු මූල්‍ය වාර්තා අවසන් කොට බාහිර විගණකයෙකු විසින් විගණනය සිදුකර අවසන් කරන තුරු මුදල් ලාභාංශ ගෙවීම් ප්‍රමාද කළ යුතුය.

3.2 ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත බැංකුවක ශ්‍රී ලංකා ශාඛාවක් වන සියලුම බලපත්‍රලාභී බැංකු විසින් 2022 මූල්‍ය වාර්තා අවසන් කර බාහිර විගණකයෙකු විසින් විගණනය සිදුකර අවසන් කරන තුරු, 2021 සහ 2022 වසර සඳහා ප්‍රකාශයට පත් කර නොමැති ලාභ මෙරටින් බැහැර කිරීම ප්‍රමාද කළ යුතුය.

3.3 සියලු බලපත්‍රලාභී බැංකු විසින් මුදල් ලාභාංශ ගෙවීම සහ ලාභ තම මව් රටට පැවරීම පිළිබඳව තීරණය කිරීමේදී, බලපත්‍රලාභී බැංකු සඳහා බාසල් III යටතේ වන ප්‍රාග්ධන අවශ්‍යතා සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2016 අංක 01 දරන බැංකු පනත් විධානය, අපේක්ෂිත වත්කම් වර්ධනය, ව්‍යාපාර පුළුල් කිරීමේ හැකියාව සහ කොවිඩ්-19 වසංගතයෙන් වූ බලපෑම මෙන්ම දැනට පවතින සාර්ව ආර්ථික තත්වයන් යනාදී වූ කරුණු වෙත නිසි අවධානය යොමු කළ යුතු වේ.

3.4 වහාම බලපැවැත්වෙන පරිදි, 2022 දෙසැම්බර් 31 වනතෙක් සියලුම බලපත්‍රලාභී බැංකු පහත කරුණු වෙත අනුගත විය යුතුය.

(අ) තම බැංකුවේම කොටස් මිලදී ගැනීමෙන් වැළකිය යුතුය.

(ආ) කළමණාකාර දීමනා සහ අධ්‍යක්ෂක මණ්ඩල ගෙවීම් ඉහල දැමීමෙන් වැළකිය යුතුය.

(ඇ) අත්‍යවශ්‍ය නොවන සහ/හෝ හදිසි නොවන වියදම් සිදුකිරීමෙන් වැලකිය යුතු අතර එවැනි වියදමක් දැරීමට අවශ්‍ය නම් එවැන්නක් සහේතුක කිරීම සඳහා අධ්‍යක්ෂක මණ්ඩලය අනුමත කළ ප්‍රතිපත්තියක් තිබිය යුතුය.

(ඈ) ප්‍රාග්ධන වියදම් සිදුකළ යුතු අවස්ථාවක, ඉතාමත් සුපරීක්ෂාකාරීව සහ විචක්ෂණශීලීව කටයුතු කළ යුතුය.

4. ක්‍රියාත්මක වන දිනය

4.1 වහාම බලපැවැත්වෙන පරිදි මෙම විධානය ක්‍රියාත්මක කළ යුතුය.

අත්සන් කළේ
ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධාන 2022 අංක 03 2022 මැයි 19

ආනයනවලට එරෙහිව ආන්තික අවශ්‍යතා

1988 අංක 30 දරන බැංකු පනතේ සංශෝධිත 46 (1) සහ 76 (ඒ) (1) වගන්ති බලතල ප්‍රකාරව නිකුත් කරන ලදී.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බැංකු පද්ධතියෙහි විනිමය අනුපාතිකයේ සහ විදේශ මුදල් ද්‍රවශීලතාවෙහි ස්ථාවරභාවය පවත්වා ගෙන යෑමේ අරමුණුතිව, වහාම බලපැවැත්වෙන පරිදි නැවත දැනුම් දෙන තුරු, ඇතැම් අත්‍යවශ්‍ය නොවන සහ හදිසි නොවන භාණ්ඩ ආනයන මත පහත පියවර අනුගමනය කරන මෙන් බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකු වෙත දැනුම් දෙනු ලැබේ.

1. ප්‍රතිග්‍රහණ මත ලියවිලි ලබා දීමේ සහ ගෙවීම් මත ලියවිලි ලබා දීමේ කොන්දේසි යටතේ, "අ" උපලේඛනයෙහි නිශ්චිතව දක්වා ඇති ඉන්වොයිසි අගය මත පොලී නොදරන සියයට සියයක මුදල් ආන්තිකයක් තැබිය යුතුය.

2. ජාතික ඉතිරි කිරීමේ බැංකුව සලකා බැලීමේදී, ඉහත 1 විධානයෙහි නිශ්චිතව දක්වා ඇති ආන්තික අවශ්‍යතා, ප්‍රතිග්‍රහණ මත ලියවිලි ලබා දීමේ සහ ගෙවීම් මත ලියවිලි ලබා දීමේ කොන්දේසි වලට අමතරව ණයවර ලිපි (LC) නියමයන් යටතේ සිදු කළ එවැනි ආනයන සඳහා අදාළ වේ.

3. මෙම විධානයන් මඟින් ආවරණය කෙරෙනු ලබන භාණ්ඩ ආවරණය කරනා, දැනට පවතින ප්‍රතිග්‍රහණ මත ලියවිලි ලබා දීම් වල දී සහ ගෙවීම් මත ලියවිලි ලබාදීම් වලදී, ඉහත 1 විධානයෙන් අවශ්‍ය වන පරිදි මුදල් ආන්තික තැන්පතු මඟින් අගයේ ඉහළ යෑමක් ආවරණය කරනු ලබන්නේ නම් මිස, බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව විසින් එවැනි ප්‍රතිග්‍රහණ මත ලියවිලි ලබා දීමේ සහ ගෙවීම් මත ලියවිලි ලබා දීමේ අගයෙහි කිසිඳු ඉහළ යෑමකට අවසරට ලබා නොදිය යුතුය.

4. ආනයනකරු විසින් ලේඛන ප්‍රතිග්‍රහණය කරන අවස්ථාවේදී හෝ බලපත්‍රලාභී බැංකුව විසින් සහතික කිරීම සිදු කරන අවස්ථාවේදී, ආනයන සහ අපනයන පාලක ජනරාල් විසින් නිකුත් කරන ලද 2022.05.12 දිනැති අංක 05/2022 දරන මෙහෙයුම් උපදෙස් ප්‍රකාරව ලේඛන මුදා හරින බැංකුව සමඟ පොලී නොදරන මුදල් ආන්තිකයක් තැබිය යුතුය.

5. එවැනි පොලී නොදරන ආන්තික මුදල් අවශ්‍යතාවක් පවත්වා ගැනීම ඉන්වොයිසියේ මුළු අගය මත වන අතර මෙම විධාන යටතේ ආවරණය නොකෙරෙන භාණ්ඩ ඉන්වොයිසියේ ඇතුළත් වීම නොසලකා හැරිය යුතුය.

6. ඉන්වොයිසිය සඳහා ආන්තික තැන්පතු ලබා ගෙන ඇති බවට බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් පිටසන් කළ යුතුය.

7. ශ්‍රී ලංකාව තුළ බැංකුකරණ මාර්ග ඔස්සේ ගෙවීම් මත ලේඛනමය සාක්ෂි සැපයීම සහ ආනයන නිෂ්කාශනයට අදාළව රේගු ලේඛන සැපයීම මත ආන්තික තැන්පතුව නිදහස් කළ හැකිය.

8. බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරි කිරීමේ බැංකුව මෙම ආනයනවලට අදාළව ආන්තික තැන්පතු තැබීම සඳහා ආනයනකරුවන්ට හැකියාව ලබා දීමට කිසිඳු ණය පහසුකමක් ලබා නොදිය යුතුය.

9. භාණ්ඩ ආනයනයට අදාළව ඕනෑම නීතියක් ප්‍රකාරව හඳුන්වා දෙනු ලබන එවැනි වෙනත් අවශ්‍යතා සහ දැනට ක්‍රියාත්මකව පවතින ඕනෑම අවශ්‍යතාවකට අමතරව මෙම විධානයන්හි විධිවිධාන බලාත්මක වනු ඇත.

අත්සන් කලේ

ආචාර්ය පී නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙහි ඇමුණුම පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Banking_Act_Directions_No_03_of_2022_e.pdf

බැංකු පනත් විධාන 2022 අංක 04 2022 මැයි 23

පවත්නා සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ නියාමන අවශ්‍යතාවන්

බැංකු ශක්තිමත් සහ ප්‍රත්‍යාස්ථ ආකාරයෙන් ක්‍රියාත්මක වීමට හැකි වන පරිදි ඕනෑම අලාභයක් පියවා ගැනීම සඳහා ප්‍රමාණවත් ප්‍රාග්ධනයක් පවත්වා ගැනීමේ පියවරක් ලෙස, වසර ගණනාවක් පුරා බැංකු ක්ෂේත්‍රය විසින් ප්‍රාග්ධනය ගොඩනඟා ඇත. අභියෝගාත්මක කාලවලදී අනපේක්ෂිත අලාභ අවශෝෂණය කර ගැනීමට මෙම ප්‍රාග්ධන ස්වාරක්ෂක ප්‍රයෝජනවත් වී ඇති අතර, දිගු කාලීන අරමුදල් අඩු අවදානම් අධිභාරයක් යටතේ රැස් කිරීමට මෙන්ම, බැංකුව, ණය ශ්‍රේණිගත කිරීම් පවත්වා ගෙනයාමටද ඒවා උපකාර වී ඇත.

කෙසේ වෙතත්, වත්මන් සාර්ව ආර්ථික තත්ත්වයන් නිසා ඇති වී ඇති අසාමාන්‍ය තත්ත්වයන් මනාව සලකා බැලීමෙන් අනතුරුව, කාලීන සමාලෝචනයට යටත්ව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වේ) වෙත මුදල් මණ්ඩලය විසින් මෙම විධානයන් නිකුත් කරනු ලැබේ.

1. බලගැන්වීම

1.1 බැංකු පනතේ 46 (I) වගන්තිය ප්‍රකාරව, බැංකු පද්ධතියේ අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහා, සියළුම බලපත්‍රලාභී බැංකුවලට බැංකු ව්‍යාපාරවලට අදාළ ඕනෑම ව්‍යාපාර පැතිකඩක් සම්බන්ධව විධානයන් නිකුත් කිරීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වේ.

1.2 බැංකු පනතේ 76 (ඒ)(I) ප්‍රකාරව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එහි ඕනෑම ව්‍යාපාර කටයුත්තක් සිදු කළ යුතු ආකාරය සම්බන්ධව විධාන දීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වේ.

2. ප්‍රාග්ධන ආරක්ෂණ ස්වාරක්ෂක

2.1 බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා බාසල් III යටතේ වන ප්‍රාග්ධන අවශ්‍යතාවන් සම්බන්ධයෙන් නිකුත් කර ඇති 2016 අංක 01 දරන විධානයෙහි සඳහන් පහත සඳහන් කොන්දේසිවලට යටත්ව ප්‍රාග්ධන ආරක්ෂණ ස්වාරක්ෂක 2.5 % දක්වා පහත දැමීමට බලපත්‍රලාභී බැංකුවලට හැකියාව ඇත.

(i) වගුව 01 හි දක්වා ඇති පරිදි බෙදාහැරීම් පහත සීමාවන්ට යටත් වේ.

වගුව 01: අවම ප්‍රාග්ධන ආරක්ෂණ ස්වාරක්ෂක අනුපාතයන් ප්‍රාග්ධන ආරක්ෂණ ස්වාරක්ෂක පවත්වා ගැනීමේ අනුපාතයන් අදාළ වන අවම ඉපැයීම් රඳවා ගැනීමේ අනුපාතයන්

ප්‍රාග්ධන ආරක්ෂණ ස්වාරක්ෂක පවත්වා ගැනීමේ අනුපාතයන්	අදාළ වන අවම ඉපැයීම් රඳවා ගැනීමේ අනුපාතයන්
2.5 %	0%
>1.875% - 2.5%	40%
>1.25% - 1.875%	60%
>0.625% - 1.25%	80%
0 % < - 0.625 %	100%

බලපත්‍රලාභී බැංකු විසින් මෙම විධානය ප්‍රාග්ධන ආරක්ෂණ ස්වාරක්ෂකය පහත දැමීම සඳහා මුදල් මණ්ඩලය විසින් ලබා දුන් පූර්ව අනුමැතියක් ලෙස සලකනු ලැබිය යුතු අතර ප්‍රාග්ධන ආරක්ෂණ ස්වාරක්ෂකය පහත දමා දින 21ක් ඇතුළත ප්‍රාග්ධන ආරක්ෂණ ස්වාරක්ෂකය නැවත ගොඩ නැගීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රාග්ධන වර්ධන සැලැස්මක් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

3. ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතාවය යටතේ මෙහෙයුම් අවදානම සඳහා අවදානම මත බර තැබූ වත්කම් ගණනය කිරීම

3.1 2016 අංක 01 දරන බැංකු පනත් විධානයේ දක්වා ඇති පරිදි, බලපත්‍රලාභී බැංකුවලට, 2023.12.31 දින දක්වා විචක්ෂණ ලේඛනගත කිරීමේ ක්‍රියා පටිපාටියක් අනුගමනය කරමින්, සිය වත්මන් ව්‍යාපාරික කටයුතු පවත්නා විධානයන්ට අනුකූලව යෝග්‍ය ව්‍යාපාරික කාණ්ඩ වෙත අනුරූපණය කරමින්, බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂගේ පූර්ව ලිඛිත අනුමැතියට යටත්ව, මෙහෙයුම් අවදානම සඳහා අවදානම මත බර තැබූ වත්කම් ගණනය කිරීම සඳහා ප්‍රමිතිගත ප්‍රවේශය (The Standardized Approach) හෝ විකල්ප ප්‍රමිතිගත ප්‍රවේශය (The Alternative Standardized Approach) වෙත මාරු විය හැකිය.

4. වෙළඳපළ මිල මත ලකුණු කළ අලාභ එලෙසම පවත්වා ගැනීම

4.1 2022.04.08 දිනැති අංක 03 දරන මුදල් ප්‍රතිපත්ති විවරණයේ දී සිදු වූ ප්‍රතිපත්තිමය පොලී අනුපාතිකයන්හි වෙනස්කම් නිසා වෙළඳපළ අගය මත පවත්වා ගෙන යන ලද ශ්‍රී ලංකා රුපියල්වලින් නිකුත් කරන ලද රාජ්‍ය සුරැකුම්පත් මත එකවරම ඇති වූ අලාභය, පහත සඳහන් 4.2 සහ 4.3 විධානයන්ට යටත්ව, ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයන් ගණනය කිරීමේ අවශ්‍යතාවය සඳහා, 2024 දෙවන කාර්තුව දක්වා කොටස් වශයෙන් අවශෝෂණය කළ හැක.

වගුව 02: ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයන් ගණනය කිරීම සඳහා වෙළඳපළ මිල මත ඇති වූ අලාභ කොටස් වශයෙන් අවශෝෂණය කිරීම

අවශෝෂණය කිරීමේ සමුච්චිත ප්‍රතිශතය		
2022 දෙවන කාර්තුව	2023 දෙවන කාර්තුව	2024 දෙවන කාර්තුව
33.33 %	66.66%	100%

4.2 බලපත්‍රලාභී බැංකු විසින් එලෙස කොටස් වශයෙන් අවශෝෂණය කිරීමට අවශ්‍ය අලාභයන් පිළිබඳ තක්සේරුවක් බාහිර/අභ්‍යන්තර විගණකවරුන්ගේ සහතිකයක් සමඟ බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතුය.

		4.3	බලපත්‍රලාභී බැංකුවක් විසින් ඉහත අලාභයන් කොටස් වශයෙන් අවශෝෂණය කිරීමට තීරණය කරන්නේ නම්, එවැනි බලපත්‍රලාභී බැංකු රාජ්‍ය සුරැකුම්පත් වෙළඳපොළ අගය මත මිල කිරීමේදී ඇති වූ මුළු අලාභය ප්‍රාග්ධන ප්‍රමාණාත්මතා අනුපාතයන් ගණනය සඳහා සම්පූර්ණයෙන් අවශෝෂණය කරන තුරු ලාභාංශ ගෙවීම/ලාභ මවුරටට පැවරීම සිදු නොකළ යුතු අතර අත්‍යවශ්‍ය නොවන සහ ප්‍රාග්ධන වියදම් දැරීමෙන් හැකිතාක් දුරට වැළකී සිටිය යුතුය.
5.	වෙනත් විස්තීරණ ආදායම් සඳහා ගැලපුම්	5.1	බලපත්‍රලාභී බැංකු විසින් 2016 අංක 01 දරන බැංකු පනත් විධානයෙහි දක්වා ඇති අනෙකුත් සියලුම කොන්දේසිවලට අනුකූලව, විගණනය කරන ලද වාර්ෂික හෝ අතුරු මූල්‍ය ප්‍රකාශයන්හි අඩංගු හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශයෙහි දක්වා ඇති වෙනත් විස්තීරණ ආදායම්වලට අදාල සමුච්චිත ලාභයෙන් සියයට 100ක් අන්තර්ගත කළ යුතුය.
6.	ද්‍රවශීලතා ආවරණ සහ ශුද්ධ ස්ථායි අරමුදල් අනුපාත	6.1	තීව්‍ර අධීක්ෂණය සහ නිරන්තර වාර්තා කිරීම් සමඟින්, බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතා අවශ්‍යතාවයන් අවස්ථානුරූපීව ගැලපීමේ කෙටි කාලීන පියවරක් ලෙස, 2022.09.30 දක්වා සියයට 90ක අවම ද්‍රවශීලතා ආවරණ සහ ශුද්ධ ස්ථායි අරමුදල් අනුපාත පවත්වා ගෙන යාමට බලපත්‍රලාභී බැංකුවලට අවසර දී ඇත.
7.	අවම ප්‍රාග්ධන අවශ්‍යතාවය	7.1	2017 අංක 05 දරන බැංකු පනත් විධානය ප්‍රකාරව, බලපත්‍රලාභී බැංකු විසින් පවත්වා ගත යුතු අවම ප්‍රාග්ධන අවශ්‍යතාවයන් වැඩි කිරීම සඳහා වන කාලසීමාව, එම ප්‍රාග්ධන අවශ්‍යතා 2022.12.31 වන විට සපුරාලීමට නොහැකි බලපත්‍රලාභී බැංකු සඳහා 2023.12.31 දක්වා දීර්ඝ කරන ලදී.
		7.2	එවැනි බලපත්‍රලාභී බැංකු, 2022.12.31 දින වන විට යෝග්‍ය මූල්‍ය ආයතන සමඟ ඒකාබද්ධ වීම හෝ එකතු වීම සම්බන්ධයෙන් ඇති සැලසුම් ද ඇතුළුව, අවම ප්‍රාග්ධන අවශ්‍යතා 2022.12.31 දින වන විට සපුරාලීම සඳහා නිසි කාලරාමුවක් සහිත ප්‍රාග්ධන වර්ධන සැලැස්මක් බැංකු අධීක්ෂණ අධ්‍යක්ෂ වෙත ඉදිරිපත් කළ යුතු අතර, අවම ප්‍රාග්ධන අවශ්‍යතා සපුරාලන තෙක් ලාභාංශ ගෙවීමෙන් සහ ලාභ මවුරටට පැවරීමෙන් වැළකී සිටිය යුතුය.
8.	අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලියට අදාළ ලියකියවිල්ල ඉදිරිපත් කිරීම	8.1	2022 වසර සඳහා අභ්‍යන්තර ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා ඇගයීමේ ක්‍රියාවලියට අදාළ ලියකියවිල්ල ඉදිරිපත් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු වෙත 2022.06.30 දක්වා කාලය ලබා දෙන ලදී.

අත්සන් කලේ
ආචාර්ය පී නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් නීති පනත් නියෝගය 2022 අංක 04 2022 ජූනි 08

බලපත්‍රලාභී වාණිජ බැංකු වල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ මුදල් තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත සඳහා සිදු කෙරෙන සංශෝධනය

1949 අංක 58 දරන මුදල් නීති පනතේ (සංශෝධිත) 104 (1) (ආ) වගන්තිය ප්‍රකාරව නිකුත් කරන ලදී.

බලපත්‍රලාභී වාණිජ බැංකු වල සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවෙහි විදේශ මුදල් තැන්පතු සඳහා වන උපරිම පොලී අනුපාත පිළිබඳ 2021 දෙසැම්බර් 30 දින නිකුත් කරන ලද 2021 අංක 03 දරන මුදල් නීති පනත් නියෝගය, එහි නියෝග 7 හැර මෙමගින් ඉවත් කෙරේ.

අත්සන් කලේ
ආචාර්ය පී නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් විධානය 2022 අංක 05 2022 ජූනි 22

බලපත්‍රලාභී බැංකුවල තිරසාර මූල්‍ය කටයුතු

එක්සත් ජාතීන්ගේ තිරසාර සංවර්ධන අභිමතාර්ථ ළඟා කරගැනීමට කැපවීමේ වැදගත්කම සහ හරිත, අන්තර්ගත මෙන් ම සමබර ආර්ථිකයක් කරා යොමු වීමේ අවශ්‍යතාව සලකා බලා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 වසරේදී තිරසාර මූල්‍ය පිළිබඳ මාර්ග සිතියම එළි දක්වන ලදි. මෙම මාර්ග සිතියම මගින් මූල්‍ය නියාමන ආයතනවලට සහ මූල්‍ය ආයතනවලට ඔවුන් විසින් මූල්‍යනය කරනු ලබන ව්‍යාපෘති හා බැඳුනු පාරිසරික, සමාජයීය හා යහ පාලන අවදානම් සළුලදායී ලෙස කළමනාකරණය කර ගැනීම උදෙසා පුළුල් දිශානතියක් ලබා දීම මෙන්ම හරිත සංකල්පිත, දේශගුණික හිතකාමී සහ සමාජයීය අන්තර්ගතකරණයට යොමු වූ ව්‍යාපාර වෙත ලබා දෙන අනුග්‍රහය ප්‍රවර්ධනය කිරීමක් ද සිදුකරනු ලබයි.

එම මාර්ග සිතියම මඟින් සියලු ඇල්මැති පාර්ශවයන්ගේ සහය ඇති ව තිරසාර මූල්‍ය කටයුතු වර්ගීකරණය සහ මිනුම්කරණය සඳහා පද්ධතියක් පිහිටුවීම අවශ්‍ය කර තිබූ අතර, 2022 මැයි මස 06 වන දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණ පද්ධතිය එළි දක්වන ලදි.

තිරසාර මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය කිරීමේ ජාතික වැදගත්කම සහ තිරසාර මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකුවලට යහපාලන හා අවදානම් කළමනාකරණ රාමුවක් ලබාදීමේ අවශ්‍යතාව සලකා බලා, ඉහත මාර්ග සිතියමට සමගාමීව, මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකුවල තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ පහත විධානයන්, තිරසාර ආර්ථිකයක් ලබා දීම සහ තිරසාර මූල්‍ය කටයුතු ප්‍රවර්ධනය යන අරමුණු සාක්ෂාත් කරගැනීම උදෙසා නිකුත් කරනු ලබයි.

1. බලගැන්වීම

1.1 බැංකු පනතේ 46(I) වගන්තිය ප්‍රකාරව, බැංකු පද්ධතියේ අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහා, සියළුම බලපත්‍රලාභී බැංකුවලට බැංකු ව්‍යාපාරවලට අදාළ ඕනෑම ව්‍යාපාර පැතිකඩක් සම්බන්ධව විධානයන් නිකුත් කිරීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වේ.

1.2 බැංකු පනතේ 76(ඒ)(I) ප්‍රකාරව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එහි ඕනෑම ව්‍යාපාර කටයුත්තක් සිදු කළ යුතු ආකාරය සම්බන්ධව විධාන දීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වේ.

2. අදාළත්වය

2.1 මෙම විධානයන් සියලු ම බලපත්‍රලාභී බැංකු වලට අදාළ වේ.

3. තිරසාර මූල්‍ය කටයුතු සඳහා මූලපිරීම්

3.1 බලපත්‍රලාභී බැංකු විසින් සිය ව්‍යාපාර කටයුතු තිරසාර අයුරින් සිදුකිරීමට සුදුසු මාර්ගෝපදේශ හඳුනා ගැනීම සහ සකස් කිරීම කළ යුතු ය.

3.2 බලපත්‍රලාභී බැංකු විසින් තිරසාර මූලපිරීම් වලට සහය වීම සඳහා නව්‍ය මූල්‍ය විසඳුම් සකස් කළ යුතුය.

3.3 බලපත්‍රලාභී බැංකු හරිත/තිරසාර බැඳුම්කර වැනි උපකරණ හරහා අරමුදල් සම්පාදනය කිරීම සලකා බැලිය යුතු අතර එම අරමුදල් තිරසාර කටයුතු වල ආයෝජනය කිරීම සලකා බැලිය යුතු ය.

4. හඳුනාගත් ප්‍රමුඛතා අංශ

4.1 පහත සඳහන් අංශ බලපත්‍රලාභී බැංකු විසින් තිරසාර ණය පහසුකම් සැපයීමේ ප්‍රමුඛ අංශ ලෙස හඳුනාගෙන ඇත.

හඳුනාගත් අංශ	ප්‍රමුඛතා අනු අංශ
කෘෂිකර්මය, වන වගාව සහ දැව කැපීම	තිරසාර කෘෂිකර්මය, වන සංවර්ධනය
නිෂ්පාදනය	බලශක්ති පිරිමැසුම් යන්ත්‍රෝපකරණ /උපකරණ
විදුලි බල උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදාහැරීම	පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති
ප්‍රවාහනය හා ගබඩාකරණය	සියලු ආකාරයේ තිරසාර ප්‍රවාහන හා ගබඩාකරණ කටයුතු
ජල සැපයුම, මලාපවහන පද්ධති සහ අපද්‍රව්‍ය කළමනාකරණය	ජල සැපයුම/ කළමනාකරණ ව්‍යාපෘති, අපද්‍රව්‍ය කළමනාකරණ ව්‍යාපෘති
ඉදිකිරීම්	හරිත ඉදිකිරීම් ව්‍යාපෘති
තිරසාර සංචාරක කර්මාන්තය සහ ක්‍රීඩා/ විනෝද කටයුතු	සියලු තිරසාර සංචාරක සහ ක්‍රීඩා/ විනෝද කටයුතු
වෙනත් අංශ	ගෑස්, වාෂ්ප සහ වායුසමීකරණ සැපයුම, මූල්‍ය සේවා, තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය, තිරසාර කාන්තා බලගැන්වීමේ මූලපිරීම්

4.2 බලපත්‍රලාභී බැංකු ඉහත ප්‍රමුඛතා අංශ සඳහා අරමුදල් ලබා දීමේදී සහ තොරතුරු වාර්තා කිරීමේදී අදාළ පාරිසරික/දේශගුණික අනුවර්තන සහ ප්‍රගමනය යන කරුණු, සමාජ බලපෑම, රෙගුලාසි, සහතික කිරීම්, සහ තිරසාර ක්‍රියාකාරකම් අදාළ බාහිර හා අභ්‍යන්තර මාර්ගෝපදේශ සලකා බැලිය යුතුය.

4.3 ඉහත ප්‍රමුඛතා අංශ සහ ක්‍රියාකාරකම් හඳුනාගැනීමේදී, ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණයේ අවශ්‍යතාවයන්ට අනුකූල වන බවට බලපත්‍රලාභී බැංකු විසින් සහතික කරගත යුතුය.

5. තිරසාර මූල්‍ය මුලපිරීම් සඳහා වන යහපාලන රාමුව

5.1 අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය විසින් තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ සඵලදායි සහ කාර්යක්ෂම අධීක්ෂණයක් තහවුරු කළ යුතු අතර අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද ප්‍රතිපත්තියක් තුළ අවම වශයෙන් පහත සඳහන් දෑ ඇතුළත් විය යුතු ය.

(අ) බලපත්‍රලාභී බැංකුවල පාරිසරික සහ සමාජයීය අවදානම් සහ තිරසාර ව්‍යාපාර කටයුතු අධීක්ෂණය සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ හා ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වයේ භූමිකාව හා වගකීම් පැහැදිලි ලෙස.

(ආ) පාරිසරික කරුණු සහ හරිත සහ දේශගුණික මූල්‍ය කටයුතු මඟින් බලපත්‍රලාභී බැංකු වෙත ඇතිවිය හැකි ප්‍රධාන අවදානම් හඳුනා ගැනීම.

(ඇ) තිරසාර මූල්‍ය කටයුතු සහ හඳුනාගත් පාරිසරික අවදානම් බැංකුවේ සමස්ත කළමනාකරණ රාමුව තුළ අන්තර්ගත කර ඇති බවට තහවුරු කිරීම.

(ඉ) එවැනි අවදානම් තක්සේරු කිරීම, අධීක්ෂණය, සමාලෝචනය කිරීම සහ වාර්තා කිරීම සඳහා ප්‍රතිපත්තීන් සහ ක්‍රියාවලීන්.

(ඊ) මූලපුරන ලද තිරසාර මූල්‍ය කටයුතුවල ප්‍රගතිය තක්සේරු කිරීම සඳහා පරාමිතීන් සහ නිර්ණායක.

(උ) සුදුසු අභ්‍යන්තර පාලන විධි ස්ථාපිත කිරීම.

5.2 අධ්‍යක්ෂ මණ්ඩලය මඟින් ලබා දෙන මඟපෙන්වීම් යටතේ බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරී සහ අදාළ ප්‍රමුඛ පෙළේ කළමනාකරණ කාර්යයන්හි නියුතු නිලධාරීන් පහත දෑ තහවුරු කළ යුතු ය.

(අ) තිරසාර මූල්‍ය කටයුතු සම්බන්ධව බලපත්‍රලාභී බැංකු මඟින් ක්‍රියාත්මක කරන ප්‍රතිපත්තීන්, මෙවලම්, නිර්ණායක, මෙහෙයුම් ක්‍රියාපටිපාටි සහ පාලන විධි, අනෙකුත් අදාළ ප්‍රතිපත්තීන් හා ක්‍රියා පටිපාටින් සමග ඒකාබද්ධ කිරීම, සමාලෝචනය කිරීම සහ යාවත් කාලීන කිරීම (අවම වශයෙන් වාර්ෂිකව)

(ආ) තිරසාර මූල්‍ය කටයුතු කළමනාකරණය කිරීම සඳහා ප්‍රමාණවත් සම්පත්, කුසලතා සහ විශේෂඥ දැනුම ලබා දී ඇති බව.

(ඇ) තිරසාර මූල්‍යනය හා බැඳුනු අවදානම් කළමනාකරණය කිරීම සම්බන්ධ ව්‍යාපාර ඒකකවල සහ අංශවල කාර්යයන්, භූමිකා හා වගකීම් පිලිබඳ නිරවුල් පැහැදිලි කිරීම්.

(ඉ) තිරසාර මූල්‍යනය හා ව්‍යාපාර විධි පිලිබඳ අධ්‍යක්ෂ මණ්ඩලය කාලීනව දැනුවත් කිරීම.

6. අවදානම් කළමනාකරණය

6.1 බලපත්‍රලාභී බැංකු විසින්, ඒ හා බැඳුනු දේශගුණික, පාරිසරික හා වෙනත් හරිත මූල්‍යන කටයුතුවලින් ජනනය වන අවදානම් ඒවායේ ස්වභාවය, පරිමාණය, සංකීර්ණත්වය සහ මෙහෙයුම්වල අන්තර්සම්බන්ධය, අවදානම්වල වැදගත්කම සහ ප්‍රමාණාත්මක බව සලකා බලා හඳුනා ගැනීම සහ ඇගයීම සිදුකළ යුතු ය.

6.2 බලපත්‍රලාභී බැංකු විසින් පාරිසරික සහ සමාජයීය ප්‍රතිපත්තීන්, අවදානම් ඇගයීම, පාරිසරික සහ සමාජයීය කරුණු අන්තර්ගත පාරිසරික, සමාජයීය සහ යහපාලන අවදානම් කළමනාකරණය සමස්ත තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් කළ යුතුය.

6.3 ඉහත 6.1 විධානයේ නිර්වචනය කර ඇති සියලු ප්‍රමාණාත්මක අවදානම් ප්‍රාග්ධන අවශ්‍යතා අදියර II යටතේ අගය කළ යුතු ය.

6.4 බලපත්‍රලාභී බැංකු විසින් ඉහත 6.1 විධානයේ හඳුනාගත් අවදානම් සිය ව්‍යාපාර ආකෘතියට බලපාන ආකාරය සහ එමගින් බැංකුවට ඇතිවිය හැකි බලපෑම ඇගයීමට ලක් කළ යුතු ය.

6.5 ඉහත 6.1 විධානයේ සඳහන් අවදානම් අවම කිරීම සඳහා සඵලදායී අවදානම් කළමනාකරණ විධි සහ අභ්‍යන්තර පාලන ක්‍රම බලපත්‍රලාභී බැංකු විසින් ක්‍රියාත්මක කළ යුතුය.

6.6. දේශගුණික අවදානම් සහ හරිත මූල්‍යන කටයුතු වලින් ඇති විය හැකි විකල්ප බලපෑම් අගය කිරීම බලපත්‍රලාභී බැංකු විසින් සිද්ධි විශ්ලේෂණයක් හෝ ආතති පරීක්ෂාවක් සිදු කළ යුතු ය.

7. දැනුම හැකියාවන් වර්ධනය සහ නවෝත්පාදනය

7.1 මින් ඉදිරියට බලපත්‍රලාභී බැංකු විසින් සිය සේවක පිරිස සඳහා ප්‍රමාණවත් පුහුණුවීමක් ලබාදී තිරසාර මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් දැනුම හා හැකියාවන් වර්ධනය කිරීම අපේක්ෂිතය.

7.2 බලපත්‍රලාභී බැංකු සිය ගනුදෙනුකරුවන් සඳහා නව්‍ය තිරසාර මූල්‍ය විසඳුම් ගොඩනැංවීම අපේක්ෂා කෙරේ.

7.3 පාරිසරික හා දේශගුණික අවදානම් අංශ ආශ්‍රිත ව සුදුසු බාහිර සාධක පිළිබඳ විශේෂඥ දැනුම ලබා ගන්නා අතරතුර බලපත්‍රලාභී බැංකු විසින් පාරසරික ආතති පරීක්ෂාව සහ සිද්ධි විශ්ලේෂණය පිළිබඳ විශේෂඥ දැනුම වර්ධනය කළ යුතු ය.

8. අනාවරණයන් සහ වාර්තාකරණ

8.1 තිරසාර මූල්‍යනය සම්බන්ධ භාවිත පිළිබඳ පහත තොරතුරු බලපත්‍රලාභී බැංකු විසින් වාර්ෂික වාර්තාවල අනාවරණය කළ යුතුය.

(අ) බැංකුවල තිරසාර මූල්‍යන ප්‍රතිපත්තීන් හා කාර්යයන් පිළිබඳ දළ විශ්ලේෂණය

(ආ) හඳුනාගත් තිරසාර මූල්‍යනය පිලිබඳ අවදානම් සහ එම අවදානම් අවම කිරීම ආශ්‍රිත ක්‍රියාමාර්ග; සහ

(ඇ) තිරසාර මූල්‍ය කටයුතු සම්බන්ධයෙන් බැංකුවල ප්‍රවේශය සහ ඉදිරි ක්‍රියාමාර්ග පිළිබඳ ප්‍රකාශය.

8.2 Global Reporting Initiative සහ Task Force on Climate Related Financial Disclosures නිර්දේශ වැනි ජාත්‍යන්තර වශයෙන් පිළිගත් වාර්තාකරණ රාමු මගින් ව්‍යාපාර කටයුතු හරහා ජනනය වන පාරිසරික හා සමාජ බලපෑම අනාවරණය කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු ධෛර්යමත් කෙරේ.

8.3 බලපත්‍රලාභී බැංකු විසින් සෑම කාර්තුවක් ම අවසානයේ සිට දින 30ක් ඇතුළත ඇමුණුම I හි සඳහන් ආකාරයට බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත තොරතුරු ලබා දිය යුතු ය.

අත්සන් කලේ

ආචාර්ය පී නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙහි ඇමුණුම පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/Banking_Act_Directions_No_5_of_2022.pdf

බැංකු පනත් විධාන 2022 අංක 06 2022 ජූලි 04

2011 අංක 8 දරන බලපත්‍රලාභී බැංකු වල පාරිභෝගික ප්‍රඥප්තිය පිළිබඳ බැංකු පනත් විධානය සඳහා වන අතිරේකය

විශේෂ අවශ්‍යතා සහිත ගනුදෙනුකරුවන් හට බැංකු සේවා සඳහා ප්‍රවේශයන් සැලසීම

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 46(1) සහ 76(ඒ)(1) වගන්ති ප්‍රකාර ව පැවරී ඇති බලතල යටතේ නිකුත් කරන ලදී.

විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් සඳහා මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ පියවරයන් තවදුරටත් ශක්තිමත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී බැංකුවල පාරිභෝගික ප්‍රඥප්තිය මැයෙන් නිකුත් කරන ලද 2011 අංක 08 දරන බැංකු පනත් විධානයට පහත සඳහන් අතිරේකය නිකුත් කරනු ලැබේ.

ඒ අනුව, බලපත්‍රලාභී බැංකුවල පාරිභෝගික ප්‍රඥප්තිය පිළිබඳ 2011 අංක 08 දරන බැංකු පනත් විධානයෙහි ඇතුළත් ඇමුණුමේ 7 වැනි ඡේදය පහත සඳහන් පරිදි පුළුල් කෙරේ.

7. විශේෂ අවධානය සහ සැලකිල්ල

7.1 වැඩිහිටි, ආබාධිත හෝ අඩු මූල්‍ය සාක්ෂරතාවක් ඇති (මින් ඉදිරියට විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් ලෙස හැඳින්වෙනු ලැබේ) ගනුදෙනුකරුවන්ට බැංකු සේවා සඳහා සාධාරණ ප්‍රවේශයක් ලබා ගැනීමට පහසුකම් සැලසීම සඳහා විශේෂ අවධානයක් ලබා ගැනීමේ අයිතිය ඇත.

7.2 ඒ අනුව, බලපත්‍රලාභී බැංකු විසින් මෙහි උපලේඛන 1 හි දක්වා ඇති මාර්ගෝපදේශ ද ඇතුළුව, නමුත් ඒවාට පමණක් සීමා නොවී, විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් වෙත බැංකු සේවා සඳහා වැඩි ප්‍රවේශයක් සැලසීම සහතික කරනු පිණිස පුළුල් ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය.

7.3 අදාළ ගනුදෙනුකරුවන්ට සිදු විය හැකි අපහසුතාවයන් වළක්වා ගැනීම සඳහා, බලපත්‍රලාභී බැංකු විසින් ශාඛා මට්ටමින් එවැනි ක්‍රියාමාර්ග කඩිනමින් ක්‍රියාත්මක කිරීමට කටයුතු කළ යුතුය.

අත්සන් කලේ
ආචාර්ය පී නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

උපලේඛනය 1

විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් හට බැංකු සේවා ලබා ගැනීමට වැඩි ප්‍රවේශයක් සැලසීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත නිකුත් කරනු ලබන මාර්ගෝපදේශ

1. හැඳින්වීම

1.1 මෙම මාර්ගෝපදේශ මගින් විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් හට බැංකු සේවා සඳහා ප්‍රවේශ වීමට පහසුකම් සැලසීම සහ එවැනි ගනුදෙනුකරුවන්ගේ මූල්‍ය පාරිභෝගික ආරක්ෂාව හා මූල්‍ය අන්තර්ගත භාවය වැඩි දියුණු කිරීමට බලපත්‍රලාභී බැංකු වෙත අවම අවශ්‍යතා හඳුන්වා දීම සිදු වේ.

1.2 මෙකී මාර්ගෝපදේශයන් සඳහා "විශේෂ අවශ්‍යතා ඇති පාරිභෝගිකයින්" යනුවෙන් හැඳින්වෙන ගනුදෙනුකරුවන් යටතට, දෘශ්‍යාබාධිත, ශ්‍රවණාබාධිත, අත් පා අහිමි වීම් ආදිය සහ වයෝවෘද්ධ භාවය ඇතුළුව, මේවාට පමණක් සීමා නොවන, ශාරීරික, හෝ වෛද්‍ය තත්වයන් හේතුවෙන් බැංකු ගනුදෙනු සිදු කිරීමට සහ/හෝ බැංකු සේවා ලබා ගැනීමට අමතර සහාය අවශ්‍ය පුද්ගලයින් ඇතුළත් වේ.

2. පොදු මාර්ගෝපදේශ

2.1 බැංකු සේවා සඳහා ප්‍රවේශය වැඩිදියුණු කිරීම

(i) විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් හට ද වෙනත් ඕනෑම පාරිභෝගිකයෙකුට මෙන් බැංකු සේවා වෙත සාධාරණ ප්‍රවේශයක් ඇති බවට බලපත්‍රලාභී බැංකු විසින් සහතික කළ යුතුය.

(ii) මේ සම්බන්ධයෙන්, විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන්ට ප්‍රවේශ විය හැකි ආකාරයෙන් බැංකු සේවා සැපයීම සහතික කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් පහත සඳහන් දෑ සැපයිය යුතුය.

(අ) බලපත්‍රලාභී බැංකු විසින් බැංකු ශාඛා, ජංගම බැංකු ඒකක, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM) සහ මුදල් තැන්පතු යන්ත්‍ර (CDM) ඇතුළුව, අලුතින් විවෘත කරනු ලබන සියළුම භෞතික සේවා ස්ථාන වෙත රෝද පුටු, කිහිලිකරු, ඇවිදීමේ ආධාරක ආදිය භාවිතා කරන පුද්ගලයන් ඇතුළු විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන්ට හට ප්‍රවේශ වීමේ හැකියාව පවතින බව තහවුරු කළ යුතුය.

(ආ) අන්තර්ජාල බැංකුකරණ සහ ජංගම බැංකු යෙදවුම් ඇතුළු ඩිජිටල් බැංකුකරණ මාධ්‍යයන්, තිර විශාලනය (screen magnifiers), තිර කියවනය (screen readers), ලිඛිත පිටපත් කථනයට හැරවීම (text to speech) සහ ශ්‍රව්‍ය මාධ්‍යයන්ගෙන් ඇති තොරතුරු වෙත ශ්‍රව්‍යාබාධිත පුද්ගලයන්ට ප්‍රවේශ වීම පහසුකරවීම සඳහා ඒවායේ ලිඛිත පිටපත් ඉදිරිපත් කිරීම (text transcripts of audio information) ආදී අන්තර්ජාතිකව පිළිගත් ප්‍රවේශ්‍යතා ප්‍රමිතීන්ට (international accessibility standards) අනුකූලව පවත්වා ගත යුතුය. මේ සඳහා, විශේෂ අවශ්‍යතා ඇති පාරිභෝගිකයින් විසින් භාවිතා කරන උපාංගවල (ජංගම දුරකථන, ලැප්ටොප්, ටැබ්, ආදිය) පවතින සම්මත ප්‍රවේශ්‍යතා විශේෂාංග (in-built standard accessibility features) සමඟ අනුකූල වන පරිදි බැංකුකරණ යෙදවුම් සහ වෙබ් අඩවි පවත්වා ගැනීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කරනු ඇතැයි අපේක්ෂා කෙරේ.

(ඇ) සිය බැංකුකරණ සේවා විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන්ට ප්‍රවේශවීමට පහසු ආකාරයෙන් පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් තත්ත්ව පාලනය/සහතික කිරීමේ අංශයක් හෝ ඒ හා සමාන වැඩපිළිවෙළක් ස්ථාපිත කිරීමට කටයුතු කළ යුතු වේ.

2.2 විශේෂ අවධානය සහ නිසි සැලකිල්ල

(i) බැංකු කාර්ය මණ්ඩලයට විශේෂ අවශ්‍යතා සහිත ගනුදෙනුකරුවන් පහසුවෙන් හඳුනා ගැනීමට සහ එවැනි ගනුදෙනුකරුවන්ට බැංකු සේවා සැපයීමේදී විශේෂ අවධානයක් සහ නිසි සැලකිල්ලක් දැක්වීමට හැකිවන පරිදි විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන්ගේ බැංකු ගිණුම් සලකුණු කිරීම (flagging) සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීම ට බලපත්‍රලාභී බැංකු විසින් සලකා බැලිය හැක.

(ii) විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන්ට සුහදශීලී සහ ඵලදායී සේවාවක් සැපයීම සඳහා බැංකු ශාඛාවල සහ අනෙකුත් සේවා ස්ථාන වල අදාළ කාර්ය මණ්ඩල වෙත විශේෂ පුහුණුවක් ලබා දීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය.

(iii) විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවෙකු සිය බැංකු සේවා ලබා ගැනීමේ දී හෝ බැංකුකරණ ගනුදෙනුවක් සිදු කිරීමේ දී අමතර සහයක් අවශ්‍ය යැයි විශ්වාස කරන්නේ නම්, එවැනි ගනුදෙනුකරුවන් ට ඒ සඳහා බැංකු කාර්ය මණ්ඩලයෙන් සහය ලබා ගැනීමට අවස්ථාව ඇති බවට බලපත්‍රලාභී බැංකු විසින් සහතික කළ යුතුය.

(iv) විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන්ට ඔවුන්ගේ පැමිණිලි/ගැටළු විසඳීම සඳහා පාරිභෝගික සේවා ක්ෂණික ඇමතුම්/විද්‍යුත් මාධ්‍ය (කසඩැ ජය්ළු ආදී) පහසුකම් සැලසීමට සහ එවැනි පහසුකම් පිළිබඳව ගනුදෙනුකරුවන් දැනුවත් කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය.

2.3 සාධාරණව සැලකීම සහතික කිරීම

(i) විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් ඇතුළු සියලුම ගනුදෙනුකරුවන් වෙත සාධාරණ ලෙස සැලකීම සහතික කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය. ඒ අනුව, විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන් හට බැංකු සේවා සඳහා සාධාරණ ප්‍රවේශයක් ලබා දීමට බාධා විය හැකි අභ්‍යන්තර ප්‍රතිපත්ති සහ ක්‍රියා පටිපාටි සමාලෝචනය කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් කටයුතු කළ යුතුය.

(ii) බලපත්‍රලාභී බැංකු විසින් ගනුදෙනුකරුවන් හට සිය වයෝවෘද්ධ භාවය හෝ විශේෂ අවශ්‍යතා පැවතීම මත පදනම්ව බැංකු සේවා සැපයීම ප්‍රතික්ෂේප නොකළ යුතු අතර, ඒ සඳහා බලපත්‍රලාභී බැංකු විසින් එවැනි ගනුදෙනුකරුවන් අවාසිදායක තත්ත්වයකට පත් කළ හැකි අමතර නියමයන් සහ කොන්දේසි (විශේෂ අවශ්‍යතා ඇති පාරිභෝගිකයෙකුට අදාළ ගිණුම විවෘත කර ඇති ශාඛාව හැර වෙනත් ශාඛාවකින් බැංකු සේවා ලබා ගැනීම වළක්වන අවශ්‍යතාවයන් ඇතුළුව) පැනවීම නොකළ යුතුය.

(iii) වලංගු අත්සනක් තැබීමට නොහැකි වීම හේතුවෙන් අනන්‍යතාවය තහවුරු කළ නොහැකි පාරිභෝගිකයින්ගේ අනන්‍යතාවය තහවුරු කිරීම සඳහා ඇඟිලි සලකුණු කියවන උපකරණයක් වැනි ජෛවමිතික සත්‍යාපන විකල්ප (biometric authentication options) භාවිතා කිරීමට බලපත්‍රලාභී බැංකු විසින් සලකා බැලිය හැක.

(iv) ඕනෑම හේතුවක් මත සිදුකරන වෙනස්කම් සහ කොන් කිරීම් සඳහා කිසිදු ඉඩක් නොමැති විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් වෙත විශේෂ අවශ්‍යතා ඇති පුද්ගලයන් වෙත මිත්‍රශීලී සහ හිතකර වටපිටාවක් නිර්මාණය කිරීම සඳහා විවිධත්වයෙන් යුතු වූ ද පරිපූර්ණ වූද (diverse and inclusive), ආයතනික සංස්කෘතියක් ප්‍රවර්ධනය කිරීමට බලපත්‍රලාභී බැංකු දිරිමත් කරනු ලැබේ.

3. දෘශ්‍යාබාධිත පාරිභෝගිකයින්ගේ බැංකුකරණ අත්දැකීමේ ගුණාත්මක භාවය ඉහළ දැමීම සඳහා වන විශේෂිත මාර්ගෝපදේශ

3.1 දැනුම්වත් තීරණ ගැනීමට පහසුකම් සැලසීම: බැංකුකරණ සේවා පිළිබඳ දැනුම්වත් තීරණ ගැනීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් දෘශ්‍යාබාධිත ගනුදෙනුකරුවන්ට බැංකුකරණ සේවා සඳහා සම්බන්ධ වීමේ මුල් අවස්ථාවේදීත්, ඉන් අනතුරුවත්, බැංකුකරණ සේවාවන් හි විශේෂ ලක්ෂණ සහ ගුණාංග, ඒවායේ කොන්දේසි සහ නියමයන් ආදී සහ ඒවාට සීමා නොවූ ප්‍රමාණවත් තොරතුරු ලබා ගැනීම ට ප්‍රවේශයක් ඇති බව සහතික කළ යුතුය.

3.2 විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන්ට සහාය වීම සඳහා කැපවූ කාර්ය මණ්ඩලයක් පවත්වා ගැනීම ට සහ එවැනි ගනු දෙනුකරුවන් ට දැනුම්වත් තීරණ ගැනීම සඳහා ප්‍රධාන තොරතුරු සහිත ලිපි ලේඛන විද්‍යුත් මාධ්‍ය ඔස්සේ පහසුවෙන් ලබාගත හැකිවන ලෙස (accessible friendly) කටයුතු කිරීමට බලපත්‍රලාභී බැංකු උත්සුක විය යුතුය.

3.3 ප්‍රවේශ්‍යතා සහ දෘශ්‍යතා විකල්ප: බලපත්‍රලාභී බැංකු විසින් වැඩිහිටි පාරිභෝගිකයින් සහ අර්ධ දෘෂ්ටි ඌනතා සහිත ගනුදෙනුකරුවන්ගේ පහසුව තකා බැංකු ප්‍රකාශයන්, ගිණුම් විවෘත කිරීමේ ලේඛන ඇතුළු විවිධ අයදුම් පත් සඳහා විශාල ප්‍රමාණයේ අකුරු සහ ඉහළ ප්‍රතිවිරුද්ධ වර්ණ සහිත පහසුවෙන් කියවිය හැකි ආකාරයේ පිටපත්/ලේඛන තෝරා ගැනීමේ විකල්පය ඉදිරියේ දී ලබා දීම සඳහා නිශ්චිත කාල නියමයන් සහිත සැලැස්මක් සකස් කළ යුතුය.

3.4 බලපත්‍රලාභී බැංකු විසින් නව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර (ATM), මුදල් තැන්පතු යන්ත්‍ර (CDM) සහ වෙනත් ස්වයං සේවා යන්ත්‍ර (SSM) මිලදී ගැනීමේදී දෘෂ්‍යාබාධිත ගනුදෙනුකරුවන් සඳහා ප්‍රවේශ්‍යතා විශේෂාංග සහිත වීම වැදගත් සාධකයක් ලෙස සැලකිය යුතු අතර, දෘශ්‍යාබාධිත ගනුදෙනුකරුවන් සඳහා බැංකු සේවා සඳහා ප්‍රවේශය වැඩි දියුණු කිරීම සඳහා එවැනි යන්ත්‍රවල අන්තර්ගත බ්‍රේල් යතුරු පුවරු සහ ශ්‍රව්‍ය ආදාන/ ප්‍රතිදාන (input/output) භාවිතා කිරීමේ පහසුකම් ඉවහල් වනු ඇත. මේ සම්බන්ධයෙන්, දැනට භාවිතයේ පවතින විශේෂ අවශ්‍යතා සහිත ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා අනුකූල නොවන යන්ත්‍ර වෙනුවට අනාගතයේදී දෘෂ්‍යාබාධිත ගනුදෙනුකරුවන්ට පහසුකම් සැලසීම සඳහා එවැනි වඩාත් සුදුසු යන්ත්‍ර ක්‍රමානුකූලව හඳුන්වා දීමට කටයුතු කළ යුතුය.

3.5 බලපත්‍රලාභී බැංකු විසින් අනෙකුත් බැංකු සමඟ ද සාකච්ඡා කර, අවම වශයෙන් දෘෂ්‍යාබාධිත ගනුදෙනුකරුවන්ගේ අවශ්‍යතා හා අනුකූල වන එක් යන්ත්‍රයක්වත් සෑම ප්‍රදේශයකම පවතින පරිදි, එවැනි යන්ත්‍ර උපායමාර්ගිකව ස්ථානගත කිරීමට කටයුතු කළ යුතුය.

3.6 දෘශ්‍යාබාධිත ගනුදෙනුකරුවන්ට ඒකාබද්ධ ගිණුම් විවෘත කිරීමට බල කිරීම සහ එවැනි ගනුදෙනුකරුවන් ට බැංකු සේවා සැපයීම තම බැංකු ගිණුම් විවෘත කර ඇති ශාඛාවට පමණක් සීමා කිරීම වැනි අමතර කොන්දේසි කිසිවක් පනවා නොමැති බවට බලපත්‍රලාභී බැංකු විසින් සහතික කළ යුතුය.

4. ක්‍රියාත්මක කිරීම

4.1 විශේෂ අවශ්‍යතා ඇති ගනුදෙනුකරුවන්ට බැංකු සේවා සඳහා වැඩිදියුණු කළ ප්‍රවේශයක් ලබා දීම සහතික කිරීම වෙනුවෙන් බලපත්‍රලාභී බැංකු විසින් මෙම මාර්ගෝපදේශයන් ඇතුළුව, නමුත් ඊට පමණක් සීමා නොවූ පුළුල් ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටි ක්‍රියාත්මක කළ යුතු අතර, මෙහිදී, එවැනි ගනුදෙනුකරුවන් විසින් මුහුණ දිය හැකි ප්‍රායෝගික දුෂ්කරතාවයන් විසඳීම අරමුණ විය යුතුය.

4.2 බැංකු සේවා ලබා ගැනීම සඳහා ප්‍රවේශ්‍යතා විකල්ප ලබා ගන්නා ගනුදෙනුකරුවන් හට ඒ සඳහා කිසිදු විශේෂ අමතර ගාස්තුවක් අය නොකිරීමට බලපත්‍රලාභී බැංකු කටයුතු කළ යුතුය.

4.3 මෙම මාර්ගෝපදේශයන්ගේ ඇතැම් අවශ්‍යතා ක්‍රියාවට නැංවීමට අවශ්‍ය අමතර සම්පත් සැලකිල්ලට ගනිමින්, මෙකී මාර්ගෝපදේශ, 2022.12.31 වන විට පූර්ණ ලෙස අනුගත වීමට යටත්ව, පියවර වශයෙන් ක්‍රියාත්මක කිරීමට බලපත්‍රලාභී බැංකු වෙත අවසර ලබා දෙනු ලැබේ.

චක්‍රලේඛය 2022 අංක 02 2022 ජූලි 07

පවතින සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන් සඳහා වන සහන

(මෙය 2022 ජූලි 07 දින නිකුත් ලද 2022 අංක 02 දරන චක්‍රලේඛයේ සිංහල පරිවර්තනයකි)

පවතින සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් විවිධ ආර්ථික අංශයන්හි නියැලී සිටින ව්‍යාපාර සහ පුද්ගලයන් මුහුණ දී ඇති අභියෝග සලකා බලමින් අවශ්‍යතා මත පදනම්ව බලපෑමට ලක්වූ ගනුදෙනුකරුවන්ට පහත සඳහන් සහන දෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු (බලපත්‍රලාභී බැංකු) වෙතින් ඉල්ලා සිටී.

මූල්‍ය පද්ධතිය මත ඉහළ පීඩනයන් ඇතිවීම වළක්වා ගනිමින් බැංකු අංශයේ ස්ථායීතාවය රැක ගන්නා අතරතුර ණය ගනුදෙනුකරුවන්ගේ ණය ආපසු ගෙවීමේ නව හැකියාව මත පදනම්ව සුදුසු ආපසු ගෙවීමේ ක්‍රමවේදයන් සැලසුම් කිරීම සඳහා මෙම සහන ලබා දෙනු ලැබේ. ඒ අනුව, සියලුම බලපත්‍රලාභී බැංකු මඟින් ඒකාකාරීව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වන විචක්ෂණ අවශ්‍යතා සහිතව පුළුල් මාර්ගෝපදේශ ලබා දීම සඳහා මෙම චක්‍රලේඛය නිකුත් කරනු ලැබේ. බලපත්‍රලාභී බැංකු විසින් 2022 මාර්තු 24 දින නිකුත් කරන ලද 2022 අංක 01 චක්‍රලේඛය ප්‍රකාරව දැනටමත් ස්ථාපිත කර ඇති පශ්චාත් කොවිඩ්-19 පුනරුද්ද ඒකක හරහා මෙම සහන ක්‍රියාත්මක කිරීමට සලකා බැලිය හැක.

1. සක්‍රීය ණය පහසුකම් සඳහා වන සහන

1.1 බලපත්‍රලාභී බැංකු විසින් දැනටමත් කොවිඩ්-19න් බලපෑමට ලක්ව සහන ලබන ණය ගනුදෙනුකරුවන්ද ඇතුළුව වත්මන් සාර්ව ආර්ථික තත්ත්වයන් හේතුවෙන් අහිතකර ලෙස බලපෑමට පත් වූ පුද්ගලයන් හෝ ව්‍යාපාර වල (ණය ගනුදෙනුකරුවන්) සක්‍රීය ණය පහසුකම් සඳහා සුදුසු සහන (එනම්, මුල් ණය මුදල හෝ පොලිය සඳහා හෝ ඒ දෙකම සඳහා හෝ මුල් මුදලෙන් හෝ පොළියෙන් කොටසක් සඳහා සහන කාලසීමාවක් ලබා දීම, ණය ප්‍රතිව්‍යුහගත කිරීම, හෝ වෙනත් යම් සහනයන්) සැපයීම අවශ්‍යවේ. සංචාරක සහ ප්‍රවාහන ක්ෂේත්‍රයන්හී නියැලී සිටින ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් ඇතුළුව, නමුත් එම අංශවලට පමණක් සීමා නොවී, සියලුම ආර්ථික අංශයන්හි බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන් හට ඔවුන්ගේ ණය ආපසු ගෙවීමේ නව හැකියාව/ශක්‍යතාව මත පදනම්ව, මෙම චක්‍රලේඛය නිකුත් කළ දින සිට මාස හයක කාලයක් සඳහා අවස්ථානුකූලව මෙම සහන ලබා දෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

1.2 සමාන වාරික ණය පහසුකම් සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකු විසින් ණය ගනුදෙනුකරුවන්ගේ ආපසු ගෙවීමේ හැකියාවට ගැලපෙන පරිදි, පවතින ණය පහසුකම හෝ පහසුකම්වල ගිවිසුම්ගත වාරික වටිනාකම නොඉක්මවන ලෙස, දීර්ඝ කාල සීමාවක් සහිතව ආපසු ගෙවීමේ සැලැස්මක් සැකසීමට යාන්ත්‍රණයක් සකස් කළ යුතු වන අතර, වෙනත් ණය පහසුකම් සම්බන්ධයෙන්, ආපසු ගෙවීමේ සැලැස්ම සකස් කිරීම සඳහා බලපත්‍රලාභී බැංකු විසින් සුදුසු යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

1.3 ණය සහන සඳහා සලකා බලනු ලබන රුපියල් ණය පහසුකම් සම්බන්ධයෙන්, සහන කාල සීමාව සඳහා (නැවත අය කරගැනීමේ කාල සීමාවද ඇතුළුව) අදාළ වන පොළී අනුපාතිකය, නවතම ගිවිසුම්ගත පොළී අනුපාතිකය හෝ මෙම චක්‍රලේඛයේ දිනට ඇති ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම් අනුපාතය (එනම්, 15.5%), යන දෙකෙන් ඉහළ අගය වන අතර, එය ණය සහන සඳහා සලකා බලනු ලබන වටිනාකම මත පමණක් අය කළ යුතුවේ. විදේශ විනිමය ණය පහසුකම් සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු විසින් සිය ගනුදෙනුකරුවන් සමඟ අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වූ සහනදායී පොළී අනුපාතිකයක් අය කළ හැකිය.

2. ප්‍රතිමූල්‍යන/පොලී සහනාධාර යෝජනා ක්‍රම යටතේ ලබා දී ඇති ණය පහසුකම් සඳහා අදාළත්වය

2.1 රජය සහ වෙනත් ආයතන මඟින් හඳුන්වා දුන් විවිධ ප්‍රතිමූල්‍යකරණ හෝ පොලී සහනාධාර යෝජනා ක්‍රම යටතේ ලබා දී ඇති ණය පහසුකම් සඳහා මෙම සහන ලබා දීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු විසින් එම අදාළ ආයතන සහ රජයේ ආයතනයන්ගෙන් සුදුසු මාර්ගෝපදේශ ලබා ගත යුතුය.

3. ණය කලින් පියවීමේ පහසුකම් සැලසීම

3.1 කිසියම් ණය ගනුදෙනුකරුවෙකු දැනට පවතින ඕනෑම ණය පහසුකමක් සම්පූර්ණයෙන් පියවීමට කැමැත්තක් දක්වයි නම්, එවැනි ණය ගනුදෙනුකරුවන්ට පූර්ව ණය පියවීමේ ගාස්තු වැනි අමතර ගාස්තු කිසිවක් අය කිරීමකින් තොරව එම ණය පහසුකම පියවීම සඳහා අවස්ථාව ලබා දිය හැකිය. එමෙන්ම කල්බදු පහසුකම් සම්බන්ධයෙන්, අනාගත පොලී අය කර ගැනීම ද කපා හැරිය යුතු වේ.

3.2 බලපත්‍රලාභී බැංකු විසින් අවස්ථානුකූලව එවැනි ණය කලින් පියවීම් සඳහා පොලී ප්‍රතිදාන ලබා දීම සම්බන්ධයෙන් සලකා බැලීමද සිදු කළ හැකිය.

3.3 තම ණය පහසුකම් කලින් පියවීමට කැමැත්ත ප්‍රකාශ කරන ඕනෑම ණය ගනුදෙනුකරුවෙකුට 2022.09.30 දින හෝ ඊට පෙර අදාළ බලපත්‍රලාභී බැංකුව වෙත සිය ඉල්ලීම් යොමු කළ හැකිය.

4. අක්‍රීය ණය පහසුකම් සඳහා වන සහන

4.1 බලපත්‍රලාභී බැංකු විසින් අදාළ පුද්ගලයන්ගේ සහ ව්‍යාපාර/ව්‍යාපෘති වල ණය ආපසු ගෙවීමේ නව හැකියාව/ශක්‍යතාව සලකා බලා, අවස්ථානුකූලව, දැනට පවතින අක්‍රීය ගණයේ ණය පහසුකම් දීර්ඝ කාලයකට ප්‍රතිලේඛන ගත කිරීම වැනි සුදුසු සහන ලබා දීමට සලකා බැලිය හැකිය.

4.2 බලපත්‍රලාභී බැංකු විසින් ණය පහසුකම් ආපසු ගෙවීම සඳහා වන සැලැස්ම සඳහා සුදුසු යාන්ත්‍රණයන් සැලසුම් කළ යුතුය.

4.3 රුපියල් ණය පහසුකම් සම්බන්ධයෙන් සහන ලබා දුන් අක්‍රීය ණය පහසුකම සඳහා අදාළ වන පොලී අනුපාතිකය, නවතම ගිවිසුම්ගත පොලී අනුපාතිකය හෝ මෙම චක්‍රලේඛයේ දිනට පවතින ශ්‍රී ලංකා මහ බැංකුවේ නිත්‍ය ණය පහසුකම් අනුපාතය (එනම්, 15.5%), යන දෙකෙන් ඉහළ අගය නොඉක්මවිය යුතුය. විදේශ මුදල් ණය පහසුකම් සම්බන්ධයෙන්, බලපත්‍රලාභී බැංකුවලට සිය ණය ගනුදෙනුකරුවන් සමඟ එළඹී අන්‍යෝන්‍ය එකඟතාවයකට අනුව සහනදායී පොලී අනුපාතිකයක් අය කළ හැකිය.

4.4 බලපත්‍රලාභී බැංකු විසින් ණය ගනුදෙනුකරුවන්ට කාලීනව ණය ආපසු ගෙවීම සැලසුම් කිරීමට හැකිවන පරිදි, 2020.01.01 දින හෝ ඊට පසු අක්‍රීය ණය ලෙස වර්ගීකරණය කර ඇති සියලුම ණය පහසුකම්වලට එරෙහිව නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග සහ කල්බදු වත්කම් බලහත්කාරයෙන් නැවත පවරා ගැනීම ඇතුළුව නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග 2022.12.31 දින දක්වා අත්හිටුවිය යුතුය.

4.5 කුඩා හා මධ්‍ය පරිමාණ වී මෝල් හිමියන්ට එරෙහිව සිදු කරන නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග වලදී, දැනට පවතින ඔඩපණ ණය සම්පූර්ණයෙන් සහ/හෝ දැනට අක්‍රීය කාණ්ඩයේ පවතින ණය පහසුකම් පියවීම (කොටසක් හෝ සම්පූර්ණ ලෙස පියවීම) සඳහා සුදුසු යාන්ත්‍රණයක් හරහා ඉදිරි අස්වැන්න නෙළන සමයේ විකුණුම් ආදායම සෘජුවම බැංකු වෙත යොමු කිරීමට ණය ගනුදෙනුකරුවන් සහ බලපත්‍රලාභී බැංකුව අතර එකඟතාවයකට එළඹීමට යටත්ව, ඕනෑම අක්‍රීය ණය පහසුකමකට එරෙහිව සිදු කරන නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග (පරාටේ බලගැන්වීමද ඇතුළත්ව), 2022.12.31 වන දින දක්වා අත්හිටුවිය යුතුය.

4.6 බලපත්‍රලාභී බැංකුවක් විසින් 1990 අංක 04 දරන බැංකු මඟින් ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ හෝ 1949 අංක 06 දරන සංශෝධිත උකස් පනතේ හෝ 2000 අංක 56 දරන මූල්‍ය කල්බදු පනතේ හෝ මේ සම්බන්ධයෙන් වන වෙනත් ඕනෑම පනතක විධිවිධාන යටතේ නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ගයක් ආරම්භ කර හෝ ඒ සඳහා දැනුම් දීමක් ලබා දී ඇති අවස්ථාවකදී, අදාළ බලපත්‍රලාභී බැංකුව සහ ණය ගනුදෙනුකරුවන් අතර ණය ආපසු ගෙවීමේ ගිවිසුමකට එළැඹීමේ කොන්දේසිය මත එවැනි ණය නැවත අයකර ගැනීමේ ක්‍රියාමාර්ග 2022.12.31 දක්වා අත්හිටුවිය යුතුය.

4.7 බලපත්‍රලාභී බැංකු විසින් අදාළ බලපත්‍රලාභී බැංකුව සහ ණය ගනුදෙනුකරුවන් අතර ණය ආපසු ගෙවීමේ ගිවිසුමකට එළැඹීමේ කොන්දේසිය මත, එම ණය සහ අත්තිකාරම් නැවත අයකර ගැනීම සඳහා ඉහත පනත් යටතේ නව යෝජනා සම්මත කිරීම 2022.12.31 දින දක්වා කල්දැමිය යුතුය. තවද, ණය නැවත අය කරගැනීමේ ක්‍රියාමාර්ග සඳහා දැනටමත් යෝජනා සම්මත කර ඇති අවස්ථා වලදී, අදාළ වත්කම් වෙන්දේසි කිරීම 2022.12.31 දක්වා අත්හිටුවීම සිදු කළ යුතුය.

4.8 ණය අය කරගැනීම සම්බන්ධයෙන් අධිකරණයේ නඩු කටයුතු සිදුවෙමින් පවතින අවස්ථාවකදී මෙම සහන ලබා ගැනීම සඳහා ණය ගනුදෙනුකරුවන් අධිකරණය හමුවේ එකඟතාවයකට එළැඹිය යුතුය.

4.9 කෙසේ වෙතත්, හිතා මතා ණය ආපසු ගෙවීම පැහැර හැරීම, අරමුදල් වෙනත් අරමුණු සඳහා යොමු කිරීම හේතුවෙන් වන ණය ගෙවීම පැහැර හැරීම, ව්‍යාපාරයේ වැරදි කළමණාකරණය සහ/හෝ වංචාවන් නිසා සිදුවන ණය පැහැර හැරීම සහ ශක්‍යතාවයකින් තොර ව්‍යාපෘති හේතුවෙන් වන පැහැර හැරීම යන කරුණු සම්බන්ධයෙන් වන ගනුදෙනුකරුවන් ඉහත සඳහන් කිසිඳු සහනයක් සඳහා සලකා නොබැලිය යුතුය.

4.10 බලපත්‍රලාභී බැංකු හට සිය ණය ගනුදෙනුකරුවන්ට අධික ලෙස ඇමතුම් ලබා දීම /හමුවීමට යාම, බල කිරීම ආදියෙන් තොරව, තම සුපුරුදු අයකර ගැනීමේ ක්‍රියාමාර්ග මඟින් ණය අය කරගැනීම, පසු විපරම් කිරීම ආදිය සඳහා හැකියාව ඇත.

5. ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය (CRIB) වෙත වාර්තා කිරීම

5.1 බලපත්‍රලාභී බැංකු විසින් අසතුටුදායක ණය තොරතුරු කාර්යාංශ (CRIB) වාර්තා මත පමණක් පදනම්ව ණය ගනුදෙනුකරුවන්ගේ නව ණය අයදුම්පත් ප්‍රතික්ෂේප කිරීම සිදු නොකළ යුතුය.

5.2 අවශ්‍ය වන්නේ නම්, ණය තොරතුරු කාර්යාංශයේ උපදේශනයන්ද සහිතව බලපෑමට ලක්වූ ණය ගනුදෙනුකරුවන් සඳහා ලබා දී ඇති සහනයන් සම්බන්ධයෙන් වාර්තා කිරීමේ ක්‍රමවේදයක් බලපත්‍රලාභී බැංකු විසින් සකස් කළ යුතුය.

6. ගිණුම්කරණ කටයුතු හා ණය හානිකරණ සඳහා වෙන් කිරීම

6.1 බලපත්‍රලාභී බැංකු විසින් සහන සඳහා සලකා බලනු ලබන ණය පහසුකම් හා සම්බන්ධිත ගිණුම්කරණ කටයුතු වලදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සහ මේ සමඟ අමුණා ඇති ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද අතිරේකය තුළ සඳහන් මාර්ගෝපදේශවලට අනුකූල විය යුතුය.

6.2 මේ සම්බන්ධව අමතර මඟ පෙන්වීම්/පැහැදිලි කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකුවලට ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් හෝ විගණකවරුන්ගෙන් උපදෙස් පැතිය හැක.

7. ලබා දුන් ණය සහන සම්බන්ධ විනිවිදභාවය

7.1 සුදුසුකම් ලත් ණය ගනුදෙනුකරුවන් විසින් ඉහත සඳහන් ණය සහන සඳහා 2022 ජූලි 31 දින හෝ ඊට පෙර ලිඛිතව හෝ විද්‍යුත් මාධ්‍ය මඟින් ඉල්ලුම් කළ හැකිය.

7.2 එකී ඉල්ලීම් සම්බන්ධයෙන්, එය පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධ බලපත්‍රලාභී බැංකුවේ තීරණය, ඉල්ලීම ලැබුණු දින සිට මාසයක් ඇතුළත අයදුම්කරුවන් වෙත නිසි පරිදි දැනුම් දිය යුතුය.

7.3 ඉහත ඉල්ලීම් ප්‍රතික්ෂේප කරන අවස්ථාවකදී, එම ප්‍රතික්ෂේප කිරීම සඳහා හේතු බලපත්‍රලාභී බැංකුව විසින් අයදුම්කරු වෙත දැනුම් දිය යුතු අතර, අයදුම්කරුට තම ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීමට එරෙහිව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය පාරිභෝගික සබඳතා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත අභියාචනයක් ඉදිරිපත් කිරීමට අවස්ථාවක් තිබෙන බව ද එම ලිපිය මඟින්ම දන්වා සිටිය යුතුය.

7.4 ණය පහසුකම් කල් තැබීම හෝ ප්‍රතිව්‍යුහගත කිරීම සම්බන්ධිත ක්‍රමවේදය සහ අදාළ පොලී අනුපාත සම්බන්ධයෙන් අදාළ පහසුකම අනුමත කිරීමට පෙර දැනුවත් කළ බවට බලපත්‍රලාභී බැංකු විසින් සහතික විය යුතු අතර ඒ සඳහා ගනුදෙනුකරුගේ කැමැත්ත ලිඛිතව හෝ විද්‍යුත් ආකාරයෙන් ලබා ගත යුතුය.

8. වාර්තාකරණ අවශ්‍යතාව

බලපත්‍රලාභී බැංකු විසින් ණය ගනුදෙනුකරුවන් විසින් ලබාගත් සහන පිළිබඳ තොරතුරු 2022 ජූලි 31 දින සිට ආරම්භ වන පරිදි, සෑම මාසයකම අවසානයට පවතින තත්වය එදින සිට දින 15ක් ඇතුළත, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතු අතර, අදාළ වාර්තාකරණ ආකෘති බලපත්‍රලාභී බැංකු වෙත ඉදිරි කාලයේදී යොමු කරනු ඇත.

අත්සන් කලේ
ආචාර්ය පී නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් නියෝගය 2022 අංක 01 2022 අගෝස්තු 26

බැංකු (අක්වෙරළ බැංකු ව්‍යාපාර කටයුතු පටිපාටිය) නියෝගය නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල්

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 23,25 සහ 26 යන වගන්තීන් යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මඟින් අමාත්‍යවරයාගේ අනුමැතිය සහිතව නිකුත් කරන ලද නියෝගය

1. නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල්

1.1 මෙම නියෝගයේ පහත උපලේඛනයේ දක්වා ඇති විදේශ ව්‍යවහාර මුදල්, බැංකුකරණ (අක්වෙරළ බැංකුකරණ ව්‍යාපාර යෝජනා ක්‍රමය) නියෝගය යටතේ නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ලෙස නීර්ණය කරනු ලැබේ.

1.2 මෙම නියෝගයේ පහත උපලේඛනය, 2021.06.18 දිනැති 2021 අංක 01 දරන බැංකුකරණ (අක්වෙරළ බැංකුකරණ ව්‍යාපාර යෝජනා ක්‍රමය) නියෝගයේ උපලේඛනය ප්‍රතිස්ථාපනය කරනු ලබයි.

අත්සන් කලේ
ආචාර්ය පී නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදල්

1. ඕස්ට්‍රේලියානු ඩොලර්
2. කැනේඩියානු ඩොලර්
3. චීන රෙන්මින්බි
4. ඩෙනිෂ් ක්‍රෝනර්
5. යූරෝ
6. හොංකොං ඩොලර්
7. ඉන්දියානු රුපියල්
8. ජපාන යෙන්
9. නවසීලන්ත ඩොලර්
10. නෝර්වේජියානු ක්‍රෝනර්
11. ස්ටර්ලිං පවුම්
12. සිංගප්පූරු ඩොලර්
13. ස්විඩිෂ් ක්‍රෝනර්
14. ස්විස් ෆ්‍රෑන්ක්
15. තායි බාත්
16. ඇමරිකා එක්සත් ජනපද ඩොලර්

බැංකු පනත් විධාන 2022 අංක 07 2022 අගෝස්තු 29

බලපත්‍රලාභී බැංකු විසින් තැන්පත්කරුවන්ගේ අනන්‍ය හඳුනාගැනීමේ අංක අනිවාර්යයෙන් සටහන් කිරීම

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල (මෙතැන් සිට බලපත්‍රලාභී බැංකු ලෙස හැඳින්වේ) තොරතුරු කළමනාකරණ ක්‍රියාවලියේ ස්ථාවරත්වය සහ අඛණ්ඩතාව ශක්තිමත් කිරීමේ අරමුණින් ශ්‍රී ලංකා මහ බැංකුව, අදාළ බැංකු පද්ධති තුළ බලපත්‍රලාභී බැංකු විසින් තැන්පත්කරුවන්ගේ අනන්‍ය හඳුනාගැනීමේ අංකය සටහන් කිරීම අනිවාර්ය කිරීම සම්බන්ධයෙන් බලපත්‍රලාභී බැංකු වෙත පහත විධානයන් නිකුත් කරනු ලැබේ.

1. බලගැන්වීම

1.1 බැංකු පනතේ 46 (I) වගන්තිය ප්‍රකාරව, බැංකු පද්ධතියේ අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහා, සියළුම බලපත්‍රලාභී බැංකුවලට බැංකු ව්‍යාපාරවලට අදාළ ඕනෑම ව්‍යාපාර පැතිකඩක් සම්බන්ධව විධානයන් නිකුත් කිරීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වේ..

1.2 බැංකු පනතේ 76 (ඒ)(I) ප්‍රකාරව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එහි ඕනෑම ව්‍යාපාර කටයුත්තක් සිදු කළ යුතු ආකාරය සම්බන්ධව විධාන දීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වේ.

2. විෂයපථය හා අදාළත්වය

2.1 නියෝජිතයින් සහ තෙවන පාර්ශවීය සේවා සපයන්නන් හරහා සිදුකරන මෙහෙයුම් ඇතුළුව සියලුම බලපත්‍රලාභී බැංකු සඳහා මෙම උපදෙස් අදාළ වේ.

3. තැන්පතුකරුවන්ගේ අනන්‍ය හඳුනාගැනීමේ අංක අනිවාර්යයෙන් සටහන් කිරීම

3.1 සියලුම බලපත්‍රලාභී බැංකු විසින් මෙම විධානයන් සඳහා ඇමුණුම I හි දක්වා ඇති හඳුනාගැනීමේ අංක එක් එක් වර්ගයේ තැන්පත්කරුවන් සඳහා අනන්‍ය හඳුනාගැනීමේ අංකය ලෙස අනිවාර්යයෙන් සටහන් කළ යුතුය.

4. ක්‍රියාත්මක කිරීම

4.1 බලපත්‍රලාභී බැංකු සියලුම නව තැන්පත්කරුවන් සඳහා 01.10.2022 දින සිට බලපැවැත්වෙන පරිදි මෙම උපදෙස්වල අවශ්‍යතාවලට අනුකූල විය යුතුය.

4.2 බලපත්‍රලාභී බැංකු විසින් 31.12.2023 දින වන විට පද්ධතිවල දැනට පවතින තැන්පත්කරුවන්ගේ අනන්‍ය හඳුනාගැනීමේ අංකය වාර්තා කිරීම සම්පූර්ණ කළ යුතුය.

අත්සන් කලේ
ආචාර්ය පී නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙහි ඇමුණුම පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැක.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/bsd_circular_no_2_of_2022_e.pdf

බැංකු පනත් විධාන 2022 අංක 08 2022 නොවැම්බර් 18

ද්‍රවශීලතා අනුපාත පිළිබඳ නියාමන අවශ්‍යතා

පවතින සාර්ව ආර්ථික තත්වයන් හේතුවෙන් හටගෙන ඇති සුවිශේෂී බලපෑම් සැලකිල්ලට ගනිමින්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්,බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වෙත පහත විධානයන් නිකුත් කරනු ලැබේ.

1. **බලගැන්වීම**

1.1 බැංකු විසින් කරන්නා වූ ව්‍යාපාරයේ ස්වභාවය මත, බැංකු පනතේ 21 (1) වගන්තියට අනුව සෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක්ම මුදල් මණ්ඩලය විසින් වරින් වර තීරණය කරන්නා වූ අගයක් ද්‍රවශීලතා වත්කම් ලෙස පවත්වා ගත යුතු අතර, එලෙස මුදල් මණ්ඩලය තීරණය කරන්නා වූ ප්‍රතිශතයන් සියයට 20 ට වඩා නොඅඩු විය යුතු අතර, සියයට 40ට වඩා නොවැඩි විය යුතුය.

1.2 බැංකු පනතේ 46 (I) වගන්තිය ප්‍රකාරව, බැංකු පද්ධතියේ අඛණ්ඩතාව තහවුරු කිරීම සඳහා, සියළුම බලපත්‍රලාභී බැංකුවලට බැංකු ව්‍යාපාරවලට අදාළ ඕනෑම ව්‍යාපාර පැතිකඩක් සම්බන්ධව විධානයන් නිකුත් කිරීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වේ.

1.3 බැංකු පනතේ 76 (ඒ)(I) ප්‍රකාරව, බලපත්‍රලාභී විශේෂිත බැංකුවලට හෝ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට එහි ඕනෑම ව්‍යාපාර කටයුත්තක් සිදු කළ යුතු ආකාරය සම්බන්ධව විධාන දීමේ හැකියාව මුදල් මණ්ඩලය සතු වේ.

2. **ව්‍යවස්ථාපිත ද්‍රවශීලතා වත්කම් අනුපාතය** (SLAR)

2.1 නැවත දැනුම් දෙන තුරු, බලපත්‍රලාභී වාණිජ බැංකු විසින්, 2022 දෙසැම්බර් මාසයේ සිට ක්‍රියාත්මක වන පරිදි, සමස්ත බැංකුව සඳහා ඒකාබද්ධ පදනම මත, කොටස් හිමියන්ට සහ ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඇති වගකීම් අඩු කළ පසු මුළු වගකීම් වලින් 20 % කට නොඅඩු අගයක ද්‍රවශීල වත්කම් පවත්වා ගත යුතුය.

2.2 ඒ අනුව 2003.01.21, 2003.10.08 සහ 2004.05.20 දින වල නිකුත් කළ චක්‍රලේඛ යටතේ දේශීය බැංකු ඒකකය සම්බන්ධයෙන් සහ අක්වෙරළ බැංකු ඒකකය සම්බන්ධයෙන් වෙන වෙනම ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතය පවත්වා ගැනීමේ අවශ්‍යතාවය තාවකාලිකව කල් දමා ඇත.

2.3 අධීක්ෂණ කටයුතු සඳහා, බලපත්‍රලාභී වාණිජ බැංකු වල දේශීය බැංකු ඒකක සහ අක්වෙරළ බැංකු ඒකකවල ව්‍යවස්ථාපිත ද්‍රවශීල වත්කම් අනුපාතයන් බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වෙන වෙනම වාර්තා කිරීම සිදු කළ යුතුය.

3. **ද්‍රවශීලතා ආවරණ අනුපාතය** (LCR) **සහ ශුද්ධ ස්ථායී අනුපාතය** (NSFR)

3.1 තීව්‍ර අධීක්ෂණය සහ නිරන්තර වාර්තා කිරීම් සමඟින්, බලපත්‍රලාභී බැංකුවල ද්‍රවශීලතා ව්‍යුහයන් සකස් කර ගැනීම පිණිස තව දුරටත් කාලය ලබා දීම සඳහා කෙටි කාලීන පියවරක් ලෙස, 2022.12.31 දක්වා අවම වශයෙන් සියයට 90 ක ද්‍රවශීලතා ආවරණ සහ ශුද්ධ ස්ථායී අරමුදල් අනුපාත පවත්වා ගෙන යාමට බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා අවසර ලබා දී ඇත.

අත්සන් කලේ

ආචාර්ය පී නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

බැංකු පනත් නිර්ණය 2022 අංක 01 2022 දෙසැම්බර් 05

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු

1988 අංක 30 දරන සංශෝධිත බැංකු පනතේ 8 වන හා 76 ඈ (6) යන වගන්ති ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය මගින් නිකුත් කරන ලද නිර්ණය

1988 අංක 30 දරන බැංකු පනතේ 8(1) සහ 76 ඈ (6) වගන්ති ප්‍රකාරව, සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු හා බලපත්‍රලාභී විශේෂිත බැංකු විසින්, 2023 වර්ෂය සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු, 2022 වසර අවසානයේ රෙගුලාසිමය වාර්තා අනුව පවතින සමස්ත වත්කම් මත

පදනම්ව, පහත වගුවේ දක්වා ඇති පරිදි, 2023 ජනවාරි 31 හෝ එදිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ගෙවන ලෙසට මුදල් මණ්ඩලය විසින් නිර්ණය කර ඇත.

2023 වසර සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තු

2022 වසර අවසානයේ මුළු වත්කම් **(රු. බිලියන)**	**බලපත්‍ර ගාස්තුව** **(රු. මිලියන)**
2,000 ට වැඩි	38.0
1,000 සිට 2,000 දක්වා	35.0
500 සිට 1,000 දක්වා	28.5
200 සිට 500 දක්වා	25.0
125 සිට 200 දක්වා	18.5
75 සිට 125 දක්වා	12.5
25 සිට 75 දක්වා	6.5
25 ට අඩු	3.3

අත්සන් කලේ
ආචාර්ය පී නන්දලාල් වීරසිංහ

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2263/41 - 2022 ජනවාරි මස 21 වැනි සිකුරාදා - 2022.01.21

I වැනි කොටස : (I) වැනි ජේදය – සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 68 වන වගන්තිය සමඟ කියවිය යුතු
10 (C) වගන්තිය යටතේ සකස් කළ රීතීන්

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

2022 ජනවාරි මස 21 වැනි දින
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය පිළිගැනීම

1. මෙම රීති "2022 අංක 1 දරන හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය පිළිගැනීමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, 1949 අංක 58 දරන (සංශෝධිත) මුදල් නීති පනතෙහි 10 (ඡ) වගන්තියෙහි විධිවිධාන සමඟ එක්ව කියවිය යුතු එම පනතේ 68 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කරමින්, හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය පිළිගැනීමට අදාල රීතීන් මෙමගින් නිකුත් කරනු ලබයි.

3. ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි බලපත්‍රලාභී හෝටල් සේවා සැපයුම්කරුවන්, ශ්‍රී ලංකාවෙන් පිටත වාසික

පුද්ගලයින්ට සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් වන ගෙවීම් මෙම රීතීන් නිකුත් කරන දින සිට ක්‍රියාත්මක වන පරිදි විදේශ විනිමයෙන් පමණක් පිළිගනු ලැබිය යුතු ය.

4. ඉහත 3 රීතියට අනුව පිළිගත් විදේශ මුදල්, බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට විකිණීම හෝ හෝටල් සේවා සැපයුම්කරුවාගේ ව්‍යාපාරික විදේශ මුදල් ගිණුමකට බැර කිරීම, එලෙස විදේශ විනිමය පිළිගත් දින සිට ව්‍යාපාරික දින තුනක් ඇතුළත සිදු කළ යුතු ය.

5. ඉහත 3 රීතියට අනුව විද්‍යුත් මුදල් හුවමාරු කාඩ්පත් හරහා සිදු කරන සියලුම ගෙවීම් හෝටල් සේවා සැපයුම්කරුවාගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට වහාම බැර කළ යුතු ය.

6. ඉහත 3 රීතියට අගතියකින් තොරව ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයින් විසින් ශ්‍රී ලංකාවට ගෙන එන ලද විදේශ මුදල් බලයලත් වෙලෙන්දෙකු හෝ පරිසීමිත වෙලෙන්දෙකු හරහා ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන ලද බවට අදාල මුල් ලේඛනයක සාක්ෂි ලබා දෙන්නේ නම් හෝටල් සේවා සැපයුම්කරු ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයකුට සපයන සේවා-වන් සඳහා ශ්‍රී ලංකා රුපියල් වලින් ගෙවීම් භාරගත හැක.

7. හෝටල් සේවා සැපයුම්කරුවකු, ශ්‍රී ලංකාවෙන් පිටත වාසික පුද්ගලයකු විසින් ඔහුට සපයන ලද මුල් ලියකියවිලි පිටසන් කළ යුතු අතර, එම ලේඛනගත සාක්ෂිවල පිටපත් ශ්‍රී ලංකා රුපියල් භාරගත් දිනයේ සිට, වසර 6ක කාලයක් හෝ නීතියෙන් පනවන ලද වෙනත් වාර්තා රඳවා තබා ගැනීමේ කාල සීමාවක් දක්වා තබා ගත යුතු ය.

8. සියලුම හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල් සහ/හෝ ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් කලින් කලට නියම කරන පරිදි, වාර්තා සහ/හෝ ප්‍රකාශන ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවට පිටපතක් ද සමඟ ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියට ඉදිරිපත් කළ යුතු ය.

9. සෑම හෝටල් සේවා සැපයුම්කරුවෙකු විසින් මෙම රීතිවල අරමුණු සඳහා පවත්වාගෙන යනු ලබන වාර්තා සෝදිසි කිරීමට හෝ පරීක්ෂා කිරීමට සහ මෙම රීතිවලට පූර්ණව සහ දැඩි ලෙස අනුකූල වීම සහතික කිරීම සඳහා එවැනි හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ගනු ලබන සියලුම ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා හෝ නියෝජ්‍ය අධිපතිවරයා විසින් බලය පවරනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකු නිලධාරීන්ට බාධාවකින් තොර ප්‍රවේශය ලබා දිය යුතු ය.

10. ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට ඕනෑම හෝටල් සේවා සැපයුම්කරුවෙකු විසින් මෙම රීති වලට අනුකූල නොවීම හෝ උල්ලංඝනය කිරීමකට එරෙහිව පියවර ගැනීමට අයිතිය ඇත.

11. මෙම රීතිවල කාර්යය සඳහා;

"බලයලත් වෙළෙන්දා" යන්නෙහි අර්ථය 2017, අංක 12 දරන විදේශ විනිමය පනතෙහි දක්වා ඇති පරිදි වේ.

"විද්‍යුත් මුදල් මාරු කිරීමේ කාඩ්පත" යන්නෙන් බැර, හර හෝ වෙනත් යම් ආකාරයක වටිනාකමක් මාරු කිරීම සඳහා භාවිතා කරනනාට හැකියාව ලබා දෙන කාඩ්පතක් හෝ උපකරණයක් අදහස් වන අතර, එයට ණය කාඩ්පත්, හර කාඩ්පත් සහ විනිමය පාලන පනතේ විධි විධානයන්ට අනුකූළ වන බවට බලයලත් වෙළෙඳුන් විසින් ගනුදෙනු විස්තර හඳුනාගත හැකි අවස්ථා වල දී වටිනාකම තැන්පත් කළ කාඩ්පත් ද ඇතුළත් වේ.

"විදේශ විනිමය" යන්නෙහි අර්ථය 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි දක්වා ඇති පරිදි වන අතර නම් කරන ලද විදේශ විනිමය භාවිතයෙන් සිදු කරන එකී ගනුදෙනු 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ රෙගුලාසි හා 1988 අංක 30 දරන බැංකු පනත යටතේ නිකුත් කරන ලද අක්වෙරළ බැංකු විධාන වලට යටත් ය.

"ව්‍යාපාරික විදේශ මුදල් ගිණුම්" යන්නෙහි අර්ථය අංක 2213/38 හා 2021.02.03 දිනැති ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කර ඇති පරිදි 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනු වල යෙදීම සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම) රෙගුලාසිවල සඳහන් අර්ථයට සමාන වේ.

"හෝටල් සේවා සැපයුම්කරුවන්" යන්නෙන් 2005 අංක 38 දරන සංචාරක පනතේ විධි විධාන ප්‍රකාරව ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරියේ ලියාපදිංචි වී බලපත්‍ර ලබා ඇති හෝටල්, විලා, සංචාරක බංගලා, ආගන්තුක නිවාස, හෝම් ස්ටේ හෝ ඊට සම්බන්ධ වෙනත් ආයතන ඇතුලු සංචාරක ව්‍යවසායන් සහ සංචාරක සේවා අදහස් වේ.

"ශ්‍රී ලංකාවෙන් පිට නේවාසික තැනැත්තා" යන්නෙහි අර්ථය 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දක්වා ඇති පරිදි වේ.

"පරිසීමිත වෙළෙන්දා" යන්නෙහි අර්ථය 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දක්වා ඇති පරිදි වේ.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2022 අංක 01 දරන විධානය

පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද 2022 අංක 01 දරන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය සහ 2021.02.03 දිනැති 2213/38 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 අංක 5 දරන විදේශ විනිමය නියෝගය අනුව, 2021.03.18 දිනැති 2021 අංක 4 දරන විධානයන් (විධානයන්) පහත පරිදි වෙනස් වේ.

I. විධානයන් හි 1.4 ඡේදයේ සඳහන් අවසරලත් හර කිරීම් වලට අමතරව, අයිතම (එ) ලෙස පහත සඳහන් හර කිරීම ද ඇතුළත් විය යුතු ය.

(එ). ගිණුම් හිමියා විදේශයක සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයෙකු (විගාමිකයෙකු හැර) වන අවස්ථාවක දී, දේශීය අධ්‍යාපන ආයතනයන්ට ශිෂ්‍යයන් ලෙස ඇතුළත් වී සිටින තම පවුලේ සමීපතම සාමාජිකයින්ගේ පාඨමාලා ගාස්තු හෝ ඉගැන්වීම් ගාස්තු වෙනුවෙන්, එකී අධ්‍යාපන ආයතනයන්හි ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් වෙත මාරු කිරීම.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

2022 පෙබරවාරි 24

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 02 දරන විධානය

ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද 2022 අංක 02 දරන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය සහ 2021.02.03 දිනැති 2213/38 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2021 අංක 5 දරන විදේශ විනිමය නියෝගය අනුව, 2021.03.18 දිනැති 2021 අංක 5 දරන විධානයන් (විධාන) පහත පරිදි වෙනස් වේ.

I. විධානයන් හි 1.3 ඡේදයේ අවසරලත් බැර කිරීම් වලට අමතරව, අයිතම (හ) ලෙස පහත සඳහන් හර කිරීම ද ඇතුළත් විය යුතු ය.

(හ). ගිණුම් හිමියා විදේශයක සේවයේ නියුතු ශ්‍රී ලාංකිකයෙකු (විගාමිකයෙකු හැර) වන අවස්ථාවක දී, දේශීය අධ්‍යාපන ආයතනයන්ට ශිෂ්‍යයන් ලෙස ඇතුළත් වී සිටින තම පවුලේ සමීපතම සාමාජිකයින්ගේ පාඨමාලා ගාස්තු හෝ ඉගැන්වීම් ගාස්තු වෙනුවෙන්, එකී අධ්‍යාපන ආයතනයන්හි පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම්වලින් මාරු කිරීම.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

2022 පෙබරවාරි 24

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2270/66 - 2022 මාර්තු මස 11 වැනි සිකුරාදා - 2022.03.11

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 68 වන වගන්තිය සමග කියවිය යුතු 10 (ඡ) වගන්තිය යටතේ සකස් කළ රීතීන්

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

2022 ජනවාරි මස 11 වැනි දින
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම

1. මෙම රීති "2022 අංක 1 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, 1949 අංක 58 දරන (සංශෝධිත) මුදල් නීති පනතෙහි 10 (ඡ) වගන්තියෙහි විධිවිධාන සමඟ එක්ව කියවිය යුතු එම පනතේ 68 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කරමින්, අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාව වෙත ගෙන්වා ගැනීම සහ එකී මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමට අදාළ රීතීන් මෙමගින් නිකුත් කරනු ලබයි.

3. සෑම භාණ්ඩ සහ/හෝ සේවා අපනයනකරුවෙකුම;

   (i) අපනයනය කරන ලද සියලු භාණ්ඩ සහ/හෝ ශ්‍රී ලංකාවෙන් පිටතට සපයන ලද සේවා වලට අදාළව අපනයන ඉපැයීම්, අදාළ පරිදි භාණ්ඩ නැව්ගත කරන ලද දිනයේ සිට හෝ සේවාවන් සැපයූ දිනයේ සිට, දින එකසිය අසූවක් (180) ඇතුළත අනිවාර්යයෙන්ම ශ්‍රී ලංකාව වෙත ගෙන්විය යුතුය.

   (ii) භාණ්ඩ සහ/හෝ සේවා අපනයනය සම්බන්ධයෙන් වන සියලුම අපනයන ඉපැයීම් ලද විගස, සියලු අපනයන ඉපැයීම් ලැබීම්වලට අදාළ සියලු ලේඛනගත සාක්ෂි, එම මුදල් ලබන්නාවූ ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී වාණිජ බැංකුවකට හෝ අවසරලත් බලපත්‍රලාභී විශේෂිත බැංකුවකට (මෙහි මින්මතු "බලපත්‍රලාභී බැංකුව" වශයෙන් හඳුන්වනු ලබන) නොපමාව ඉදිරිපත් කළ යුතුය.

4. ඉහත 3 රීතියට අනුව අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා සෑම භාණ්ඩ සහ/හෝ සේවා අපනයනකරුවෙකුම, මාසයක් තුළ, ශ්‍රී ලංකාවට ලැබෙන එම ආදායමෙන් පහත සඳහන් අවසරලත් ගෙවීම් සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එළඹෙන මාසයේ හත්වන (7) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල්වලට අනිවාර්යයෙන්ම පරිවර්තනය කළ යුතුය.

   (i) එක් මසක වගකීම් ද ඇතුළුව නිශ්චිත භාණ්ඩ සහ/හෝ සේවා අපනයනයකට අදාල ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ;

   (ii) භාණ්ඩ සහ/හෝ සේවා අපනයනයට අදාළ සංචාරක අරමුණු සඳහා විදේශ මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ මුදල් මාරුකිරීම;

   (iii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත හෝ 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද රෙගුලාසි, නියෝග සහ විධාන ප්‍රකාරව, එක් මසක ණය වගකීම් ද ඇතුළුව භාණ්ඩ සහ/හෝ සේවා අපනයනකරුවන් විදේශ ව්‍යවහාර මුදලින් ලබා ගන්නා ලද ණය මුදල්, ආපසු ගෙවීමේ වියදම් සහ ණය වාරික;

   (iv) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අවසර දී ඇති පරිදි අනේවාසික ආයෝජකයන්ට ප්‍රකාශිත ලාභාංශ ගෙවීම් සහ/හෝ විදේශීය ජාතිකයන් හෝ ද්විත්ව පුරවැසියන් වන ප්‍රවාසික සේවකයින්ට වැටුප් ගෙවීම්.

   (v) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සඳහා, එම ලබන්නා වූ අපනයන ආදායමෙන් ප්‍රතිශතාංක දහයක් (10%) දක්වා, සිදු කරන ගෙවීම්.

   (vi) නිශ්චිත භාණ්ඩ සහ/හෝ සේවා අපනයනයක් සම්බන්ධ මිල දී ගැනීමක් සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අවසරලත් දේශීය සැපයුම්කරුවන්ට කරන ගෙවීම්.

5. ඉහත 4 රීතියෙහි සඳහන් එකී පරිවර්තන දිනය ඉහත 3 (1) රීතියට අනුව, අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ලැබිය යුතු දිනට පසු දිනයක් නොවිය යුතුය. (එනම්, භාණ්ඩ නැව්ගත කළ/සේවාව සැපයූ දිනයේ සිට දින එකසිය අසූවකට (180) පසු දිනයක් නොවිය යුතුය).

6. ඉහත 4 (vi) රීතිය ප්‍රකාරව, අපනයන ඉපැයීමකින් විදේශ මුදලින් ගෙවීම් ලබන සෑම දේශීය සැපයුම්කරුවෙකුම, එසේ ලැබෙන ආදායමෙන්, ඉහත 4 රීතියෙහි (i) අයිතමයේ සිට (v) අයිතමය දක්වා සඳහන් කර ඇති අවසරලත් ගෙවීම් සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එළැඹෙන මාසයේ හත්වන (7) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල්වලට අනිවාර්යයනේම පරිවර්තනය කළ යුතු ය.

7. 2008 අංක 14 දරන ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති පනත (සංශෝධිත) යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලයේ "ක්‍රමෝපාය සංවර්ධන ව්‍යාපෘති" ලෙස ලියාපදිංචි කරන ලද භාණ්ඩ සහ/හෝ සේවා අපනයනකරුවන් හට, අවස්ථානුකූලව, මුදල් මණ්ඩලය විසින් තම අභිමතය පරිදි මෙම රීති යටතේ වන යම් හෝ සියළුම අවශ්‍යතා වලින් නිදහස් කිරීම් ලබා දීම සිදු කළ හැකිය.

8. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම ඉහත 3 වන රීතියෙන් නියම කරන ලද කාලය තුළ අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම සහ ඉහත 4 සහ 6 වන රීති වලින් නියම කර ඇති පරිදි එම මුදල් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්යයෙන්ම දැඩිව අධීක්ෂණය කළ යුතු අතර, ඒ සඳහා අදාළ වන හෝ ඒ හා බැඳෙන අවශ්‍ය සියලු ලිඛිත සාක්ෂි පවත්වාගෙන යා යුතුය.

9. සෑම බලපත්‍රලාභී බැංකුවක් විසින්ම කලින් කලට නියම කරනු ලබන පරිදි වාර්තා සහ/හෝ ප්‍රකාශන, ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති හෝ නියෝජ්‍ය අධිපති විසින් බලය දෙනු ලබන ශ්‍රී ලංකා මහ බැංකුවේ නිලධාරීන් හට ඉහත 8 වන රීතිය යටතේ පවත්වාගෙන යනු ලබන වාර්තා පරි-ක්ෂා කිරීම සහ එකී බලපත්‍රලාභී බැංකු විසින් මෙම රීතින් විෂයෙහි අනුකූලතාවය තහවුරු කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග සමාලෝචනය කිරීම සඳහා බාධාවකින් තොරවූ ප්‍රවේශයක් ලබා දිය යුතුය.

10. මෙම රීතීන්ට අනුව, භාණ්ඩ සහ/හෝ සේවා අපනයනයේ දී, ඕනෑම අපනයනකරුවෙකු/දේශීය සැපයුම්කරුවෙකු හෝ බලපත්‍රලාභී බැංකුවක් විසින් මෙකී රීතීන් සමග අනුකූල නොවීමට හෝ උල්ලංඝනය කිරීමට විරුද්ධව ක්‍රියාත්මක වීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයාට අයිතිය ඇත.

11. මෙම රීතීන් බලාත්මක වන දින හෝ ඉන් පසුව අපනයනය කරන ලද සියලුම සහ සෑම භාණ්ඩයකට සහ/හෝ සේවාවකට සහ මෙම රීතිය බලාත්මක කිරීමට පෙර දිනක අපනයනය කරන ලද එහෙත් භාණ්ඩ නැව් ගත කළ හෝ සේවා සැපයූ දින සිට එකසිය අසූව (180) වැනි දිනය මෙම රීතිය ක්‍රියාත්මක වූ දිනට පසු ඕනෑම දිනයක් වන භාණ්ඩ සහ/හෝ සේවා සඳහා ද මෙම රීතිය අදාළ වේ.

12. සැක දුරුකර ගැනීම පිණිස හා මෙකී රීතිවල කාර්යය සඳහා "අපනයන ඉපැයීම්" යන්නට, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/37 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයහි (සංශෝධිත) ප්‍රකාශයට පත් කරන ලද, 2021 අංක 4 දරන විදේශ විනිමය (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) නියෝග ප්‍රකාරව සහ ඒ යටතේ ශ්‍රී ලංකාවට නැවත ගෙන්වා ගැනීමට අවශ්‍ය වන අපනයන ඉපැයීම්වලින් ලද මුදල්, අපනයන බිල්පත් මිල දී ගැනීම් වලින් ලබන ආදායම (බිල්පත් වට්ටම් කිරීම), දේශීය සේවා සපයන්නන්/දේශීය නිෂ්පාදකයන් විසින් අපනයනය කරන ලද භාණ්ඩ සහ/හෝ සේවා වෙනුවෙන් දේශීය නියෝජිතයන්/අතරමැදිකරුවන් හරහා ලැබෙන ගෙවීම් සහ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසිකයෙකුට වෘත්තීමය, වෘත්තීය හෝ ව්‍යාපාරික සේවා ඇතුළුව සේවා සැපයී-මෙන් ශ්‍රී ලංකාවේ නේවාසිකයෙකුට විදේශ විනිමයෙන් ලැබෙන ගෙවීම් ඇතුළත් වේ.

13. මෙකී රීතිවල කාර්යය සඳහා "බලපත්‍රලාභී වාණිජ බැංකු" සහ "බලපත්‍රලාභී විශේෂිත බැංකු" යන්නට, 1988 අංක 30 දරන (සංශෝධිත) බැංකු පනතේ විධිවිධාන ප්‍රකාරව නියම කරන ලද අර්ථය අදාළ වේ.

14. මෙම රීතිවල කාර්යය සඳහා "ජංගම ගනුදෙනු" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ නියම දී ඇති අර්ථයම තිබිය යුතුය.

15. මෙම රීතිවල කාර්යය සඳහා "විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ සංචාරක අරමුණු වෙනුවෙන් මුදල් මාරු කිරීම" 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද විධානයන් ප්‍රකාරව විය යුතුය.

16. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද, 2021 ඔක්තෝම්බර් 28 දිනැති, අංක 2251/42 දරන අති විශේෂ ගැසට් පත්‍රයහි ප්‍රකාශයට පත් කරන ලද, 2021 අංක 5 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීමේ රීති මෙමගින් අවලංගු කෙරේ.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ, 2022 අංක 03 දරන විධානයන්

"නායි බාත්" නම් කිරීම පිළිබඳ බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

අනුපිළිවෙලින්, අංක 2213/34, 2213/35, 2213/36, 2213/37 සහ 2213/38 දරන හා 2021.02.03 දිනැති රජයේ (අති විශෙෂ) ගැසට් පත්‍ර වල පළ කරන ලද 2021 අංක 01 දරන විදේශ විනිමය රෙගුලාසි (ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග), 2021 අංක 02 දරන විදේශ විනිමය රෙගුලාසි (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) 2021 අංක 03 දරන, විදේශ විනිමය රෙගුලාසි (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම), 2021 අංක 04 දරන විදේශ විනිමය රෙගුලාසි (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) සහ 2021 අංක 05 දරන විදේශ විනිමය රෙගුලාසි (විදේශ විනිමය ගනුදෙනු වල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) යන රෙගුලාසි සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පණතේ 09 වන වගන්තිය ප්‍රකාරව, විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි හා විධාන වල අරමුණු උදෙසා, **"නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්"** යන්නට **"නායි බාත්"** ද ඇතුළත් කරන ලද බව බලයලත් වෙළඳුන් හට මෙයින් දන්වා සිටිනු ලැබේ.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

2022 මාර්තු 11

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2273/06 - 2022 මාර්තු මස 28 වැනි සඳුදා - 2022.03.28

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන මුදල් නීති පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 7 වන වගන්තිය සමග කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරනු ලබන නියෝග.

1. 2020 නොවැම්බර් මස 17 වන දින අංක 2202/7 දරන රජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රයෙහි සහ 2021 අප්‍රියෙල් 07 වන දින අංක 2222/37 දරන රජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග මගින් සංශෝධනය කරන ලද 2020 අප්‍රියෙල් මස 8 වන දින අංක 2170/4 දරන රජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග, පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

   (අ) 1 වන ඡේදයෙහි දැක්වෙන "මාස විසිහතරක්" යන වචන, මෙමගින් ඉවත් කරනු ලබන අතර එම වචන වෙනුවට "මාස තිස්හයක" යන වචන ආදේශ කරනු ලැබේ.

2. 2020 නොවැම්බර් මස 17 වන දින අංක 2202/7 දරන රජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රයෙහි සහ 2021 අප්‍රියෙල් 07 වන දින අංක 2222/37 දරන රජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග මගින් සංශෝධනය කරන ලද 2020 ජූලි මස 1 වන දින අංක 2182/32 දරන රජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග, පහත දැක්වෙන පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

   (අ) 1 වන ඡේදයෙහි සහ 2 වන ඡේදයෙහි දැක්වෙන "මාස විසිහතරක්" යන වචන මෙමගින් ඉවත් කරනු ලබන අතර එම වචන වෙනුවට "මාස තිස්හයක්" යන වචන ආදේශ කරනු ලැබේ.

බැසිල් රාජපක්ෂ
මුදල් අමාත්‍ය

2022 මාර්තු මස 28 වැනි දින,
කොළඹ දී ය.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ, 2022 අංක 04 දරන විධානයන්

විශේෂ තැන්පතු ගිණුම පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්

2020 අප්‍රියෙල් මස 8 දිනැති අංක 2170/4 දරන රජයේ ගැසට් පත්‍රයෙහි (අති විශෙෂ) පළ කරන ලද නියෝග, 2020 ජූලි 01 දිනැති අංක 2182/32, 2020 ඔක්තෝබර් 06 දිනැති අංක 2196/22, 2020 නොවැම්බර් 17 දිනැති අංක 2202/7, 2021 අප්‍රියෙල් 07 දිනැති අංක 2222/37, 2021 ජුනි 30 දිනැති අංක 2234/19 සහ 2022 මාර්තු 28 දිනැති අංක 2273/06 දරන රජයේ ගැසට් පත්‍රවල පළ කරන ලද නියෝග සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි (පනත) 9 වන වගන්තිය ප්‍රකාර ව, 2021 අංක 25 දරන විධිවිධානයන් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

2. 2021 අංක 25 දරන විධාන

2.1 3(a) සහ 7(ඉ) යන ඡේදයෙහි දැක්වෙන "මාස විසිහතර" යන වචන මෙමගින් ඉවත් කරනු ලබන අතර "මාස තිස්හය" යන වචන ආදේශ කරනු ලැබේ.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2022 අප්‍රියෙල් 07

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2282/27 - 2022 ජූනි මස 01 වැනි සඳුදා - 2022.06.01

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන මුදල් නීති පනත

4 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 4 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින් 2021 මාර්තු මස 26 දිනැති අංක 2220/69 දරන (අති විශෙෂ) ගැසට් පත්‍රයෙහි ප්‍රකාශයට පත් කරන ලද, "4 වන වගන්තිය යටතේ වූ නියමය" මෙමගින් අවලංගු කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022 මැයි මස 31 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01 දී ය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2282/59 - 2022 ජූනි මස 03 වැනි සිකුරාදා - 2022.06.03

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් නිකුත් කරන නියෝග.

අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ
මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022 මැයි මස 31 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01 දී ය

නියෝග

1. මෙම නියෝග 2022 අංක 01 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ ආයෝජන) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික ඕනෑම පුද්ගලයෙකු හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික පුද්ගලයන්ට විසින් සම්පූර්ණ හිමිකාරීත්වය දරනු ලබන ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත ඕනෑම සමාගමක් හෝ ශ්‍රී ලංකාවේ ලියාපදිංචි / සංස්ථාපිත බද්ධ ව්‍යාපාරයක් (එනම් ආයෝජකයා) සඳහා, කොළඹ වරාය නගරයේ ආයෝජන මූල්‍යයනය කිරීමේ අරමුදල් වශයෙන් විදේශයන්ගෙන් ලද ආමුඛ ප්‍රේෂණවලින්, 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ ලබා දී ඇති අවසරයට යටත්ව, කොළඹ වරාය නගරයේ ආයෝජනය කිරීමට මෙයින් අවසර ප්‍රදානය කරනු ලැබේ.

3. කොළඹ වරාය නගරයේ ආයෝජන සඳහා අරමුදල් ප්‍රේෂණය කිරීමට සහ එවැනි ආයෝජනයක් මගින් ලද, අනේවාසික ආයෝජකයාට ගෙවිය යුතු ඕනෑම ආදායමක් හෝ ප්‍රාග්ධන ආදායමක් ආපසු සියරට යැවීම සඳහා ආයෝජකයා විසින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් වෙළෙන්දන්හට නිකුත් කරන ලද විධානවලට යටත්ව, ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දෙකු සමඟ "කොළඹ වරාය නගර ආයෝජන ගිණුම-ආයෝජක"යන ගිණුම විවෘත කළ යුතු ය.

4. 2021 අංක 11 දරන කොළඹ නගර ආර්ථික කොමිෂන් සභා පනතේ විධිවිධාන යටතේ, කොළඹ වරාය නගරයේ ස්ථාපිත ආයෝජකයා විසින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලයලත් වෙළෙන්දන්හට නිකුත් කරන ලද විධාන වලට යටත්ව, ශ්‍රී ලංකාවේ බලයලත් වෙළෙන්දෙකු සමඟ විවෘත කරන ලද "කොළඹ වරාය නගර ආයෝජන ගිණුම-ආයෝජිත" යන ගිණුමකට බැර වශයෙන් ආයෝජන අරමුදල් ලබාගත යුතු ය.

5. මෙම නියෝගයන්හි කාර්යය සඳහා -

"බලයලත් වෙළෙන්දා" යන්නට, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ දී ඇති අර්ථයම තිබිය යුතු ය.

"බද්ධ ව්‍යාපාර" යන්නෙන්, කොළඹ වරාය නගරය තුළ ආයෝජනය කිරීමේ අරමුණෙන් නේවාසික සහ අනේවාසික කොටස් හිමියන් විසින් හිමිකාරීත්වය දරනු ලබන 2007 අංක 7 දරන සමාගම් පනත ප්‍රකාරව ස්ථාපිත සමාගමක් හෝ නේවාසික සහ අනේවාසික පුද්ගලයන් අතර ඇති කරගත් ඕනෑම බද්ධ ව්‍යාපාර ගිවිසුමක් අදහස් වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2282/60 - 2022 ජූනි මස 03 වැනි සිකුරාදා - 2022.06.03

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි 5 වන, 7 වන සහ 8 වන වගන්ති සමග කියවිය යුතු එකී පනතේ 29 වන වගන්තිය යටතේ මුදල් අමාතයවරයා විසින් නිකුත් කරනු ලබන නියෝග.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022 මැයි මස 31 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01 දී ය

නියෝග

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/38 දරන රජයේ අති විශෙෂ ගැසට් නිවේදනයෙහි පළ කරන ලද 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරතවීමේ අරමුණු සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) නියෝග (නියෝග), මෙමගින් පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

නියෝගවල උපලේඛනයෙහි අංක 2 දරන ඡේදය යටතේ වන අංක (3) දරන අනුඡේදය සඳහා පහත පරිදි කරුණු ඇතුළත් කරනු ලැබේ.

(3) "2021 අංක 11 දරන කොළඹ වරාය නගරය ආර්ථික කොමිෂන් සභාව පනතේ විධිවිධානවලට අනුව, කොළඹ වරාය නගරයේ බල ප්‍රදේශය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරතවීමට අවසරය ඇති බලයලත් පුද්ගලයෙකුගෙන් විදේශ විනිමය උපයන මතු දැක්වෙන ශ්‍රී ලංකාවේ නේවාසික පුද්ගලයන්.

(අ) බලයලත් පුද්ගලයෙකුගේ සේවකයෙකු

(ආ) භාණ්ඩ හා සේවා සැපයීමේ අරමුණින් බලයලත් පුද්ගලයෙකු සමග ව්‍යාපාර කටයුතුවල නිරත වී සිටින ඕනෑම පුද්ගලයෙකු"

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2284/34 - 2022 ජූනි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2022.06.16

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

8 වන වගන්තිවය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 8 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව, මුදල්, ආර්ථික ස්ථායිතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මෙම නියමය මගින්, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/39 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ (නියමය) ප්‍රකාශයට පත් කර ඇති පරිදි පනතේ 8 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද නියමය පහත පරිදි සංශෝධනය කරනු ලැබේ.

I. උපලේඛනයේ II වන කොටසේ 1 වන ඡේදයේ (1) වන අනු ඡේදයේ සහ 2 වන ඡේදයේ (2) වන අනුඡේදයේ අයිතම (ආ) හි දක්වා ඇති "ඇ.එ.ජ. ඩොලර් 15,000" යන වචන මෙමගින් ඉවත් කරනු ලබන අතර "ඇ.එ.ජ. ඩොලර් 10,000" යන වචනය ඒ වෙනුවට ආදේශ කරනු ලැබේ.

II. පහත සඳහන් දෑ ඇතුළත් කරනු ලබන අතර එය මෙම නියමයේ **උපලේඛනයේ III** වන කොටස ලෙස කියවිය යුතු වේ.

(1) මෙහි සඳහන් උපලේඛනයේ II වන කොටසේ 1 වන ඡේදයේ සහ 2 වන ඡේදයේ සඳහන් කර ඇති කාල සීමාව සහ මුදල් අගයන් පිළිබඳව සීමා නොතකා, ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තෙකු විසින් නීත්‍යානුකූලව අත්පත් කරගත් සහ එසේ තම සන්තකයේ රඳවා තබාගත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු,

(අ) එම පුද්ගලයාගේ නමින් බලයලත් වෙළෙන්දෙකු සමඟ විවෘත කර පවත්වාගෙන යනු ලබන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ව්‍යාපාර ව්‍යවහාර විදේශ මුදල් ගිණුමකට අවස්ථානෝචිත පරිදි තැන්පත් කිරීම; හෝ

(ආ) බලයලත් වෙළන්දෙකුට එකී විදේශ ව්‍යවහාර මුදල් විකිණීම

අදාළ බලයලත් වෙළන්දා සෑහීමට පත්වන පරිදි එකී විදේශ ව්‍යවහාර මුදල් නීත්‍යානුකූලව අත්පත් කර ගැනීම සම්බන්ධව අවශ්‍ය සාක්ෂි ලබා දීමෙන්, මේ නියමය බලාත්මක වන දිනයේ සිට වැඩ කරන දින 14ක පොදු සමාකාලය තුළ දී පමණක් කළ හැකි ය.

(2) ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික තැනැත්තෙකු විසින් ඉහත සඳහන් කර ඇති II (1) වන වගන්තියෙහි දක්වා ඇති අයුරින් හැර වෙනත් අයුරකින් අත්පත් කරගෙන ඔහුගේ සන්තකයේ තබාගෙන ඇති විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු, මේ නියමය **බලාත්මක වන දින සිට වැඩ කරන දින 14ක පොදු සමාකාලය තුළ දී පමණක්** අනිවාර්යයෙන් ම බලයලත් වෙළෙන්දෙකු හට විකිණීම අවශ්‍ය වේ.

(3) පනතේ 11 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ව, මෙම නියෝගයේ සඳහන් කර ඇති විදේශ විනිමය රඳවාගත හැකි කාල සීමාව ඉක්මවමින් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු තම සන්තකයේ රඳවා තබාගෙන සිටින සියලුම පුද්ගලයන් විසින් මෙම නියෝගය උල්ලංඝනය කරනු ලැබීමකට එරෙහිව වහාම ක්‍රියාත්මක විමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුව ඇත.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022 ජුනි මස 13 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01 දී ය.

මේ නියමයේ කාර්යය සඳහා

"පනත" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය;

"පුද්ගලයා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය;

"ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තා" යන්න සංශෝධිත පරිදි, 2021.02.03 දිනැති අංක 2213/40 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කොට ඇති, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 31 වන වගන්තිය යටතේ නිකුත් කර ඇති නියමය ප්‍රකාර ව ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022 මැයි මස 31 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ, 2022 අංක 05 දරන විධානයන්

විදේශ ව්‍යවහාර මුදල් මිලදී ගැනීම, විකිණීම හා හුවමාරු කිරීම සිදු කරන, තම මූලික ව්‍යාපාරය ලෙස මුදල් හුවමාරු කිරීමේ ව්‍යාපාරයේ නිරතව සිටින පරිසීමිත වෙළෙඳුන් (මුදල් හුවමාරු කරන්නන්) වෙත නිකුත් කරනු ලබන විධානයන්

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 9 වන වගන්තිය සමඟ කියවිය යුතු 4(2) වන වගන්තිය ප්‍රකාරව, විදේශ ව්‍යවහාර මුදල් මිල දී ගැනීම, විකිණීම හා හුවමාරු කිරීම පිළිබඳ පරිසීමිත වෙළෙන්දන් වෙත නිකුත් කරන ලද 2020.12.15 දිනැති 2020 අංක 11 දරන විධානය, පහත පරිදි සංශෝධනය වේ.

විධානයේ 2 වන ඡේදයේ නිශ්චිත ව දක්වා ඇති සාමාන්‍ය කොන්දේසිවලට අමතර ව, පහත සඳහන් අයිතම ඇතුළත් කර ඒවා (2.14), (2.15) සහ (2.16) ලෙස කියවිය යුතු ය.

2.14 මුදල් හුවමාරු කරන්නන් සිය විදේශ මුදල් තැන්පත් කිරීම සඳහා ගිණුම් පවත්වා ගෙන යන බලයලත් වෙළෙන්දන් විසින් ඔවුන්ට ලබා දෙන විනිමය අනුපාතවලට වඩා ඉහළ විනිමය අනුපාත පාරිභෝගිකයින්ට ලබා නොදිය යුතු ය.

2.15 සෑම මුදල් හුවමාරු කරන්නෙකු ම, CCTV පද්ධතිය අඛණ්ඩ සහ බාධාවකින් තොර ව පවත්වා ගැනීමට වග බලා ගැනීම සඳහා අවශ්‍ය පූර්ව ආරක්ෂක සහ අවස්ථානුකූල ක්‍රියාමාර්ග ගත යුතු ය.

2.16 සෑම මුදල් හුවමාරු කරන්නෙකු ම අවම වශයෙන් දින 30ක කාලයක් සඳහා CCTV පටිගත කිරීම් පවත්වාගෙන යා යුතු අතර විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ ඉල්ලීම මත ඒවා ලබා දිය යුතු ය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

2022 ජූනි 15

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2284/40 - 2022 ජූනි මස 16 වැනි බ්‍රහස්පතින්දා - 2022.06.16

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකු නිවේදන

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 68 වන වගන්තිය සමඟ කියවිය යුතු 10(ජ) වගන්තිය යටතේ සාදනු ලබන රීති

පී. නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

2022 ජූනි මස 16 වැනි දින
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය භාර ගැනීම

1949 අංක 58 දරන (සංශෝධිත) මුදල් නීති පනතේ 10(ජ) වගන්තියෙහි විධිවිධාන සමඟ එක්ව කියවිය යුතු පනතේ 68 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව ක්‍රියාකරමින් ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින්, වහාම ක්‍රියාත්මක වන පරිදි, 2022 ජනවාරි 21 දිනැති අංක 2263/41 දරන (අති විශෙෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන කරන ලද "2022 අංක 1 දරන හෝටල් සේවා සැපයුම්කරුවන් විසින් ශ්‍රී ලංකාව ඇතුළත විදේශ විනිමය භාරගැනීමේ රීති" මෙමගින් අවලංගු කරනු ලැබේ.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ, 2022 අංක 06 දරන විධානයන්

කොළඹ වරාය නගරය ආයෝජන ගිණුම-ආයෝජක යන ගිණුම (ආයෝජක ගිණුම) පිළිබඳව බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන විධාන

අංක 2282/59 දරන 2022 ජූනි 03 දිනැති රජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත, 2022 අංක 1 දරන විදේශ විනිමය (කොළඹ වරාය නගරය තුළ සිදු කරන ආයෝජන) රෙගුලාසි සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 6,7 සහ 9 වගන්ති ප්‍රකාරව, 'කොළඹ වරාය නගරය ආයෝජන ගිණුම ආයෝජක'යන ගිණුම (ආයෝජක ගිණුම) විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට බලයලත් වෙළඳුන් සඳහා, පහත සඳහන් කරුණුවලට යටත්ව, අවසරය ලබා දී තිබේ.

2. සුදුසුකම්ලත් පුද්ගලයන්

යම් අනේවාසික පුද්ගලයෙක් හෝ කොළඹ වරාය නගරය තුළ ආයෝජන සිදු කිරීමේ අරමුණින් පිහිටුවන ලද අනේවාසික පුද්ගලයන් විසින් පූර්ණ හිමිකාරීත්වය දරන ශ්‍රී ලංකාව තුළ සංස්ථාපිත යම් සමාගමක් හෝ යම් බද්ධ ව්‍යාපාරයක්.

3. ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම

ඉතිරිකිරීමේ ගිණුමක් ලෙස ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකින් ආයෝජක ගිණුම විවෘත කිරීම හා පවත්වා ගැනීම සිදුකළ හැකිය.

4. අවසරලත් බැර කිරීම්

(අ) 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිෂන් සභා පනතේ ප්‍රතිපාදන ප්‍රකාරව කොළඹ වරාය නගරය තුළ සිදු කරන ආයෝජන මූල්‍යනය කිරීම සඳහා වන යම් ආමුඛ ආයෝජනයක්.

(ආ) කොළඹ වරාය නගරය තුළ සිදු කරන ආයෝජන සම්බන්ධව අනේවාසික පුද්ගලයෙකු වෙත ගෙවීමට ඇති යම් ආදායමක් හෝ යම් ප්‍රාග්ධන උත්පාදනයක්

(ඇ) ගිණුමේ පවත්වාගෙන යන අරමුදල් සඳහා වන පොලිය

5. අවසරලත් හර කිරීම්

(අ) කොළඹ වරාය නගරය තුළ සිදු කරන ආයෝජන සම්බන්ධයෙන් 'කොළඹ වරාය නගරය ආයෝජන ගිණුම -ආයෝජිත' යන ගිණුම වෙත සිදු කරන අරමුදල් මාරු කිරීම

(ආ) ශ්‍රී ලංකා රුපියල්වලින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරන වියදම්

(ඇ) කොළඹ වරාය නගරය කොමිෂන් සභාව මගින් අවසර ලබා දෙන ඕනෑම අරමුදල් මාරුවක්

6. අනෙකුත් කොන්දේසි

(අ) අවසරලත් බැර කිරීම් අනුව කටයුතු කිරීමේ දී, ආයෝජක ගිණුමට කිසිවිටෙකත් ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීමෙන් රැස් කරගත් අරමුදල් බැර නොකළ යුතුය.

(ආ) බලයලත් වෙළඳුන් විසින් ආයෝජක ගිණුමේ අවශ්‍යතාව අනුව, එවැනි ගිණුමක් විවෘත කිරීම සඳහා ඉල්ලුම් කරන පුද්ගලයෙකුගේ ඒ සඳහා වන සුදුසුකම නිර්ණය කර ගැනීම සඳහා, ගිණුම විවෘත කරන අවස්ථාවේ දී ප්‍රමාණවත් තරම් ලිඛිත සාක්ෂි ලබාගත යුතුය.

(ඇ) බලයලත් වෙළඳුන් විසින්, මෙම විධාන ප්‍රකාරව ආයෝජක ගිණුම හරහා අවසරලත් ගනුදෙනු සිදු කිරීමේදී නිසි විචක්ෂණශීලී (Due Diligence) ක්‍රියාත්මක කළ යුතුය.

(ඈ) බලයලත් වෙළඳුන් විසින්, ආයෝජක ගිණුම හරහා සිදු කරනු ලබන ගනුදෙනු පිළිබඳ ලිඛිත සාක්ෂි (දෘඪ පිටපත් හෝ ඉලෙක්ට්‍රොනික/ඩිජිටල් පිටපත්), ගිණුම වසා දමන ලද දිනයේ සිට වසර හයක කාලයක් දක්වා හෝ අදාළ බලයලත් වෙළෙන්දා කෙරෙහි බල පවත්නා යම් වෙනත් ලිඛිත නීතියක් මගින් නිශ්චය කර ඇති කාලසීමාවක් දක්වා පවත්වාගෙන යා යුතුය.

7. තොරතුරු වාර්තා කිරීමේ අවශ්‍යතාව

(අ) බලයලත් වෙළඳුන් විසින්, ආයෝජක ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධ තොරතුරු, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන ආකෘතියකට අනුව මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

(ආ) ඉහත සඳහන් තොරතුරු වාර්තා කිරීමේ අවශ්‍යතාව අනුව, බැංකුවේ ගිණුම් වාර්තාවලින් අදාළ තොරතුරු උත්පාදනය කිරීම සඳහා හෝ උපුටා ගැනීම සඳහා බැංකුව තුළ යම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට බලයලත් වෙළඳුන් කටයුතු කළ යුතුය.

8. **ආයෝජක ගිණුම වසා දැමීම**

(අ) බලයලත් වෙළඳුන් විසින්, ආයෝජක ගිණුමක් වසා දැමීම කොළඹ වරාය නගරය කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ සිදු කළ යුතුය.

(ආ) බලයලත් වෙළඳුන් විසින්, ආයෝජක ගිණුම් වසා දැමීම් පිළිබඳ තොරතුරු (ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, ගිණුම් වසා දැමීමට හේතු ද ඇතුළත්ව) ඉලෙක්ට්‍රොනික ආකෘතියෙන් විදුහුත් තැපැල් ලිපිනයට ලැබෙන පරිදි ගිණුම වසා දමන ලද දිනයේ සිට සතියක් තුළ දී විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම්දිය යුතුය.

9. **මෙම විධාන සම්බන්ධ අරමුණු සඳහා**

(අ) **'නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්'** සඳහා අංක 2213/38 දරන 2021 පෙබරවාරි 03 දිනැති රජයේ අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත, 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල යෙදීම සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) රෙගුලාසිවල සඳහන් අර්ථයම භාවිත කළ යුතුය.

(ආ) **'බද්ධ ආයතනයක්'යනු,** කොළඹ වරාය නගරය තුළ ආයෝජන සිදු කිරීමේ අරමුණින් නේවාසික කොටස් හිමියන් සහ අනේවාසික කොටස් හිමියන් විසින් හිමිකාරීත්වය දරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් හෝ නේවාසික පුද්ගලයන් හා අනේවාසික පුද්ගලයන් අතර පවතින යම් බද්ධ ව්‍යාපාර ගිවිසුමක් වේ.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

2022 ජූනි 28

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ, 2022 අංක 07 දරන විධාන

කොළඹ වරාය නගරය ආයෝජන ගිණුම-ආයෝජිත ගිණුම (ආයෝජිත ගිණුම) පිළිබඳව බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන විධාන

අංක 2282/59 දරන 2022 ජූනි 03 දිනැති රජයේ අති විශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශිත, 2022 අංක 01 දරන විදේශ විනිමය (කොළඹ නගරය තුළ සිදුකරන ආයෝජන) රෙගුලාසි සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 6,7 සහ 9 දරන වගන්ති ප්‍රකාරව, කොළඹ වරාය නගරය ආයෝජන ගිණුමආයෝජිත ගිණුම විවෘත කිරීමට සහ පවත්වාගෙන යාමට බලයලත් වෙළඳුන් සඳහා පහත සඳහන් කරුණුවලට යටත්ව අවසරය ලබා දී තිබේ.

2. **සුදුසුකම්ලත් පුද්ගලයන්**

2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිසම පනත යටතේ අවසරලත් පුද්ගලයන්

3. **ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම**

(අ) ඉතිරි කිරීමේ ගිණුමක් ලෙස ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල් ඒකකයකින් ආයෝජිත ගිණුම විවෘත කිරීම හා පවත්වාගෙන යාම සිදුකළ හැක.

(ආ) සුදුසුකම්ලත් පුද්ගලයන් ආයෝජිත ගිණුම තනි පුද්ගල ගිණුමක් ලෙස පවත්වාගෙන යා යුතුය.

4. **අවසරලත් බැර කිරීම්**

(අ) 'කොළඹ වරාය නගර ආයෝජන ගිණුම -ආයෝජක' ගිණුමෙන් සිදුකරන අරමුදල් මාරු කිරීම

(ආ) ගිණුම්හිමියා විසින් විදේශ මුදලින් උපයන ලද ආදායම් හෝ අනෙකුත් ලැබිය යුතු ආදායම්

(ඇ) ගිණුමේ පවත්වාගෙන යන අරමුදල් සඳහා වන පොලිය

5. **අවසරලත් හර කිරීම්**

(අ) ශ්‍රී ලංකා රුපියල්වලින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරන වියදම්

(ආ) අනේවාසික ආයෝජකයාගේ ආයෝජන මත ලැබෙන ඕනෑම ආදායමක් හෝ ප්‍රාග්ධන උත්පාදන, 'කොළඹ වරාය නගර ආයෝජන ගිණුම - ආයෝජකයා' ගිණුම වෙත සිදුකරන අරමුදල් මාරු කිරීම

(ඇ) කොළඹ වරාය නගරය කොමිෂන් සභාව මගින් අවසර ලබා දෙන ඕනෑම අරමුදල් මාරුවක්/ගෙවීමක්

6. අනෙකුත් කොන්දේසි

(අ) අවසරලත් බැර කිරීම් අනුව කටයුතු කිරීමේ දී, ආයෝජිත ගිණුමට කිසිවිටෙකත් ශ්‍රී ලංකා රුපියල් පරිවර්තනය කිරීමෙන් රැස් කරගත් අරමුදල් බැර නොකළ යුතුය.

(ආ) බලයලත් වෙළඳුන් විසින් ආයෝජක ගිණුමේ අවශ්‍යතාව අනුව, එවැනි ගිණුමක් විවෘත කිරීම සඳහා ඉල්ලුම් කරන පුද්ගලයෙකුගේ ඒ සඳහා වන සුදුසුකම නිර්ණය කර ගැනීම සඳහා, ගිණුම විවෘත කරන අවස්ථාවේ දී ප්‍රමාණවත් තරම් ලිඛිත සාක්ෂි ලබාගත යුතුය.

(ඇ) බලයලත් වෙළඳුන් විසින්, මෙම විධාන ප්‍රකාරව ආයෝජක ගිණුම හරහා අවසරලත් ගනුදෙනු සිදු කිරීමේදී නිසි විචක්ෂණශීලී බව (Due Diligence) ක්‍රියාත්මක කළ යුතුය.

(ඈ) බලයලත් වෙළඳුන් විසින්, ආයෝජක ගිණුම හරහා සිදු කරනු ලබන ගනුදෙනු පිළිබඳ ලිඛිත සාක්ෂි (දෘඩ පිටපත් හෝ ඉලෙක්ට්‍රොනික/ඩිජිටල් පිටපත්), ගිණුම වසා දමන ලද දිනයේ සිට වසර හයක කාලයක් දක්වා හෝ අදාළ බලයලත් වෙළෙන්දා කෙරෙහි බල පවත්නා යම් වෙනත් ලිඛිත නීතියක් මගින් නිශ්චය කර ඇති කාලසීමාවක් දක්වා පවත්වාගෙන යා යුතුය.

7. තොරතුරු වාර්තා කිරීමේ අවශ්‍යතාව

(අ) බලයලත් වෙළඳුන් විසින්, ආයෝජක ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධ තොරතුරු, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන ආකෘතියකට අනුව මෙම දෙපාර්තමේන්තුව වෙත යොමු කළ යුතුය.

(ආ) ඉහත සඳහන් තොරතුරු වාර්තා කිරීමේ අවශ්‍යතාව අනුව, බැංකුවේ ගිණුම් වාර්තාවලින් අදාළ තොරතුරු උත්පාදනය කිරීම සඳහා හෝ උපුටා ගැනීම සඳහා බැංකුව තුළ යම් පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට බලයලත් වෙළඳුන් කටයුතු කළ යුතුය.

8. ආයෝජක ගිණුම වසා දැමීම

(අ) බලයලත් වෙළඳුන් විසින්, ආයෝජක ගිණුමක් වසා දැමීම කොළඹ වරාය නගරය කොමිෂන් සභාවේ අනුමැතිය යටතේ සිදු කළ යුතුය.

(ආ) බලයලත් වෙළඳුන් විසින්, ආයෝජක ගිණුම් වසා දැමීම් පිළිබඳ තොරතුරු (ගිණුම් හිමියාගේ නම, ගිණුම් අංකය, ගිණුම් වසාදැමීමට හේතු ද ඇතුළත්ව) dfem@cbsl.lk යන විද්‍යුත් තැපැල් ලිපිනයට ලැබෙන පරිදි ගිණුම වසා දමන ලද දිනයේ සිට සතියක් තුළ දී විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම්දිය යුතුය.

9. මෙම විධාන සම්බන්ධ අරමුණු සඳහා

(අ) **'නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්'** සඳහා අංක 2213/38 දරන 2021 පෙබරවාරි 03 දිනැති රජයේ අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශිත, 2021 අංක 5 දරන විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල යෙදීම සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) රෙගුලාසිවල සඳහන් අර්ථයම භාවිත කළ යුතුය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2022 ජූනි 28

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2286/27 - 2022 ජූනි මස 30 වැනි බ්‍රහස්පතින්දා - 2022.06.30

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

22 වන වගන්තිය යටතේ වන නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මෙම නියමය මගින්,

(i) 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/36 දරන අතිවිශේෂ ගැසට් නිවේදනවල පළ කරන ලද 2021 අංක 3 දරන නියෝගවල (මෙහි මින්මතු "2021 අංක 3 දරන නියෝග" වශයෙන් හඳුන්වනු ලබන) උපලේඛනයේ I කොටසෙහි ප්‍රදානය කර ඇති පොදු

අවසරය යටතේ, ශ්‍රී ලංකාව තුළ ඇති යම් වත්කමකින් උපලබ්ධි වූ (චංචල, නිශ්චල, ස්පෘශ්‍ය සහ අස්පෘශ්‍ය වත්කම් ඇතුළුව) සමීපතම පවුලේ සාමාජිකයෙකුගෙන් මුදල් ත්‍යාග ලෙස විගාමිකයෙකු ලද අරමුදල්වලින් සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් ආපසු සියරට යැවීම අත්හිටුවනු ලැබේ.

(ii) 2021 අංක 3 දරන නියෝගවල දක්වා ඇති පොදු අවසරය යටතේ, මෙම නියමයෙහි දිනය දක්වා, සංක්‍රමණික දීමනාවට හිමිකම් පාන ලද විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හරහා සංක්‍රමණික දීමනාව යටතේ අරමුදල් ආපසු සියරට යැවීම, මෙම නියමය බලපැවැත්වෙන කාල පරිච්ඡේදය තුළ, එ.ජ.ඩො. 10,000 හෝ වෙනත් ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ.

(iii) 2021 අංක 3 දරන නියෝගවල දක්වා ඇති පොදු අවසරය යටතේ සංක්‍රමණික දීමනාවට පළමුවරට හිමිකම් කියනු ලබන විගාමිකයන් සඳහා සුදුසුකම්ලත් සංක්‍රමණික දීමනාව, මෙම නියමය බලපැවැත්වෙන කාල පරිච්ඡේදය තුළ, එ.ජ.ඩො. 30,000 හෝ වෙනත් ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ.

(iv) 2021 අංක 3 දරන නියෝගවල ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ඕනෑම වර්තන ආදායමක් හෝ සමුච්ඡිත වර්තන ආදායමක් (සේවක අර්ථසාධක අරමුදල, සේවා නියුක්තයන්ගේ භාර අරමුදල, පාරිතෝෂිකය සහ විශ්‍රාම වැටුප් හෝ වෙනත් ඕනෑම විශ්‍රාම ප්‍රතිලාභ ඇතුළුව) විගාමිකයන් විසින් ප්‍රාග්ධන ගනුදෙනු රුපියල් ගිණුම් හෝ විගාමිකයන්ගේ ප්‍රේෂණය කළ හැකි ආදායම් ගිණුම් හරහා ආපසු සියරට යැවීම, මෙම නියමය බලපැවැත්වෙන කාල පරිච්ඡේදය තුළ, එ.ජ.ඩො. 30,000 හෝ වෙනත් ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ.

(v) 2021 අංක 3 දරන නියෝගවල ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික සහ වෙනත් රටක තාවකාලික නේවාසික වීසා ලබාගෙන ඇති ඕනෑම ශ්‍රී ලාංකික පුද්ගලයෙකු වෙනුවෙන් කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ හෝ විදේශ විනිමය නිකුත් කිරීම, එක් පුද්ගලයෙකු සඳහා එ.ජ.ඩො. 20,000 හෝ වෙනත් ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ.

(vi) 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/37 දරන අතිවිශේෂ ගැසට් නිවේදනවල පළ කරන ලද 2021 අංක 4 දරන නියෝගවල උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ, වෙනත් රටක තාවකාලික නේවාසික වීසා යටතේ ශ්‍රී ලංකාව හැර යාමට අදහස් කරන ශ්‍රී ලංකාව තුළ නේවාසික ඕනෑම පුද්ගලයෙකු වෙනුවෙන් විදේශ විනිමය නිකුත් කිරීම එක් පුද්ගලයෙකු සඳහා එ.ජ.ඩො. 10,000 හෝ වෙනත් ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ.

(vii) 2021 පෙබරවාරි මස 03 දිනැති අංක 2213/34 දරන අතිවිශේෂ ගැසට් නිවේදනවල පළ කරන ලද, 2021 අංක 1 දරන විදේශ විනිමය නියෝගවල උපලේඛනයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තන් විසින් විදේශයන්හි ආයෝජන කිරීම සඳහා ප්‍රතිමුඛ ආයෝජන ගිණුම් හරහා පහත (අ) සිට (ඈ) දක්වා අවශ්‍යතාවයන් ඉටු වන බවට විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ සෑහීමකට පත්වන ගෙවීම් හැර අනෙකුත් ගෙවීම්, අත්හිටුවනු ලැබේ.

(අ) පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන, හෝ

(ආ) පනතේ විධිවිධාන යටතේ ආයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් මූල්‍යනය කිරීමට යෝජිත ආයෝජන, හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා සිදු කරන අමතර ආයෝජනයක්, හෝ

(ඇ) ආයෝජිතයාගේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා එ.ජ. ඩො. 15,000 ක උපරිමයක් දක්වා, පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට යටත්ව දැනටමත් විදේශයක සංස්ථාපිත/පිහිටුවා ඇති පාලිත සමාගම්වල හෝ ශාඛා කාර්යාලවල සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින් සිදු කිරීමට නියමිත අමතර ආයෝජනයක්/අරමුදල් යෙදවීමක් (අදාළ පරිදි), හෝ

(ඈ) සුදුසුකම්ලත් නේවාසික සමාගම් විසින්, පනතෙහි හෝ අවලංගු කරන ලද පනතෙහි විධිවිධානවලට යටත්ව විදේශයක දැනටමත් පිහිටුවා ඇති සම්බන්ධීකරණ, අලෙවිකරණ, අනුයෝජිත, ව්‍යාපෘති, නියෝජිත හෝ වෙනත් ඕනෑම සමාන කාර්යාල නඩත්තු කිරීමේ අරමුණ සඳහා, එ.ජ.ඩො. 30,000ක උපරිමයක් දක්වා සිදු කරන ප්‍රේෂණ.

(viii) 2021 පෙබරවාරි 03 දිනැති අතිවිශෙෂ ගැසට් නිවේදනවල පළ කරන ලද 2021 අංක 1 දරන නියෝගවල උපලේඛනයෙහි I වන කොටසෙහි 6 වන ඡේදයෙහි ප්‍රදානය කර ඇති පොදු අවසරය යටතේ, විදේශයක සංස්ථාපිත සමාගමක පාලිත සමාගමක් හෝ ශාඛා කාර්යාලයක් වන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගමක් විසින්, එහි සේවානියුක්තිකයන් වෙනුවෙන් සේවක කොටස් හිමිකම් සැලසුමකට හෝ සේවක කොටස් වරණීය ක්‍රමයකට දායකත්වය දැරීමේ අරමුණ සඳහා කරනු ලබන ප්‍රතිමුඛ ප්‍රේෂණ අත්හිටුවනු ලැබේ.

(ix) ශ්‍රී ලංකාව තුළ නේවාසික පුද්ගලයෙකුගේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හෝ/සහ පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් හරහා සිදුකරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ, මෙම නියමය බලපැවැත්වෙන කාල

පරිච්ඡේදය තුළ, එ.ජ.ඩො. 20,000 හෝ වෙනත් ඕනෑම නම්කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින් එයට සමාන ප්‍රමාණයක උපරිමයක් දක්වා සීමා කරනු ලැබේ.

(x) 2021 අංක 1 දරන විදේශ විනිමය නියෝගවල ප්‍රදානය කර ඇති පොදු අවසරයෙහි නිශ්චිතව දක්වා ඇති සීමාවන් ඉක්මවා යන ආයෝජන සඳහා, පහත අවස්ථාවලදී, එක් එක් ආයෝජනය මත පදනම්ව, විදේශ විනිමය පනතෙහි 7(10) වගන්තිය ප්‍රකාරව අවසර ලබා දීම සඳහා මුදල් මණ්ඩලයට බලය පවරනු ලැබේ.

(අ) විදේශ විනිමය පනතෙහි විධිවිධාන යටතේ අයෝජකයා විසින් ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තකුගෙන් ලබාගන්නා විදේශ ව්‍යවහාර ණය මුදලක් මගින් යෝජිත ආයෝජනය මූල්‍යනය කිරීම, හෝ

(ආ) පනතේ හෝ අවලංගු කරන ලද විනිමය පාලන පනතේ විධිවිධානවලට අනුකූලව ආයෝජිත රටෙහි සමාගමක හෝ ශාඛා කාර්යාලයක දැනටමත් සිදු කරන ලද ආයෝජනයකට අදාළව එම රටෙහි පවතින නියාමන අවශ්‍යතාවක් සපුරාලීම සඳහා යෝජිත ආයෝජනය සිදු කිරීම.

මෙම නියමය, මෙම නියමයෙහි දින සිට මාස හයක කාලයක් සඳහා වලංගු වේ.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022 ජූනි මස 29 වැනි දින,
කොළඹ දී ය

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ, 2022 අංක 08 දරන විධාන

පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2022.06.03 වන දින අංක 2282/60 දරන රජයේ ගැසට් (අති විශෙෂ) නිවේදනයේ පළ කරන ලද රෙගුලාසිය මගින් සංශෝධනය කළ, 2021.02.03 වන දින අංක 2213/38 දරන රජයේ ගැසට් (අති විශෙෂ) නිවේදනයේ පළ කරන ලද විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනු වල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම) පිළිබඳව 2021 අංක 05 දරන රෙගුලාසිය සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි වගන්ති අංක 9 යටතේ, බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද 2021 අංක 4 දරන විධානයන් (විධානයන්) පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

විධානයන්හි 1.3 ඡේදයේ දක්වා ඇති හර කිරීම්වලට අමතරව පහත හර කිරීමද ඇතුළත් කර එහි අයිතමය (ඉ) ලෙස කියවිය යුතුය.

(ඉ) 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිසම් පනත ප්‍රකාරව කොළඹ වරාය නගරය තුළ සහ එහි සිට ව්‍යාපාර කටයුතුවල නිරත වීමට අවසර ලත්, බලපත්‍ර ලාභී පුද්ගලයෙකුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින් ගිණුම් හිමියා වෙත විදේශ විනිමයෙන් ලැබුණු ආදායම්/ වියදම්

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2022 ජූනි 30

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ, 2022 අංක 09 දරන විධාන

ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් ගිණුම් සම්බන්ධයෙන් බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරනු ලබන විධානයන්

2022.06.03 වන දින අංක 2282/60 දරන රජයේ ගැසට් (අති විශෙෂ) නිවේදනයේ පළ කරන ලද රෙගුලාසිය (රෙගුලාසි) මගින් සංශෝධනය කළ, 2021.02.03 වන දින අංක 2213/38 දරන රජයේ ගැසට් (අති විශෙෂ) නිවේදනයේ පළ කරන ලද විදේශ විනිමය (විදේශ විනිමය ගනුදෙනුවල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වා ගෙන යාම) පිළිබඳව 2021 අංක 05 දරන රෙගුලාසිය සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතෙහි වගන්ති අංක 9 යටතේ, බලයලත් වෙළඳුන් වෙත නිකුත් කරන ලද 2021 අංක 5 දරන විධානයන් (විධානයන්) පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ.

විධානයන්හි 1.3 ඡේදයේ දක්වා ඇති හර කිරීම්වලට අමතරව පහත හර කිරීමද ඇතුළත් කර එහි අයිතමය (ර) ලෙස කියවිය යුතුය.

(ර) 2021 අංක 11 දරන කොළඹ වරාය නගර ආර්ථික කොමිසම් පනත ප්‍රකාරව කොළඹ වරාය නගරය තුළ සහ එහි සිටවහාපාර කටයුතුවල නිරත වීමට අවසර ලත්, බලපත්‍ර ලාභී පුද්ගලයෙකුගේ විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකින්, රෙගුලාසීන් හි උපලේඛනයේ දෙවන ඡේදයේ 3 වන උප ඡේදය යටතේ ව්‍යාපාරික විදේශ ව්‍යවහාර මුදල් යනුවෙන් විවෘත කර පවත්වාගෙන යාමට සුදුසුකම් ඇති ගිණුම් හිමියා වෙත විදේශ විනිමයෙන් ලැබුණු ආදායම් / වියදම්.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2022 ජූනි 30

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2287/16 - 2022 ජූනි මස 05 වැනි අඟහරුවාදා - 2022.07.05

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

8 වන වගන්තිය යටතේ වන නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 8 වැනි වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මෙම නියමය මගින්, පනතේ 8 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/39 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කර ඇති, පනතේ 8 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද 2022 ජූනි 16 දිනැති අංක 2284/34 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ ප්‍රකාශයට පත් කර සංශෝධනය කර ඇති නියමය පහත පරිදි තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

නියමයේ උපලේඛනයේ III වන කොටසේ (1) වැනි සහ (2) වැනි ඡේද යටතේ ලබා දී ඇති වැඩ කරන දින 14ක පොදු සමාකාලය, 2022 ජූනි 16 දිනැති අංක 2284/34 දරන අති විශෙෂ ගැසට් නිවේදනය යටතේ ලබා දී ඇති වැඩ කරන දින 14ක කාල සීමාව ඉකුත් වීමේ දින සිට තවත් වැඩ කරන දින 14ක කාල සීමාවක් දක්වා පමණක් දීර්ඝ කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022 ජූලි මස 05 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01 දී ය

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2292/50 - 2022 අගෝස්තු මස 12 වැනි අඟහරුවාදා - 2022.08.12

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 68 වන වගන්තිය සමග කියවිය යුතු 10 (c) වගන්තිය යටතේ සකස් කළ රීතීන්

පී. නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

2022 ජූනි මස 16 වැනි දින
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම

1. මෙම රීති "2022 අංක 2 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2022 මාර්තු 11 වන දිනැති අංක 2270/66 දරන (අති විශෙෂ) ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 1 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීතිය මෙමගින් සංශෝධනය කරමින් එහි 4 වන රීතිය අවලංගු කර පහත දැක්වෙන නව රීතිය ඒ සඳහා ආදේශ කරනු ලැබේ.

"4. ඉහත 3 රීතියට අනුව අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, මාසයක් තුළ, ශ්‍රී ලංකාවට ලැබෙන එම ආදායමෙන් පහත සඳහන් **අවසරලත් ගෙවීම්** සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එළඹෙන මාසයේ හත්වන (7) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල්වලට අනිවාර්යයෙන්ම පරිවර්තනය කළ යුතුය.

(i) එක් මසක වගකීම් ද ඇතුළුව නිශ්චිත භාණ්ඩ අපනයනයකට අදාළ ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ii) භාණ්ඩ අපනයනයට අදාළ සංචාරක අරමුණු සඳහා විදේශ මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ මුදල් මාරුකිරීම;

(iii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත හෝ 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද රෙගුලාසි, නියෝග සහ විධාන ප්‍රකාරව, එක් මසක ණය වගකීම් ද ඇතුළුව භාණ්ඩ අපනයනකරුවන් ලබා ගන්නා ලද ණය මුදල්, ආපසු ගෙවීමේ වියදම් සහ ණය වාරික;

(iv) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අවසර දී ඇති පරිදි අනේවාසික ආයෝජකයන්ට ප්‍රකාශිත ලාභාංශ ගෙවීම් සහ/හෝ විදේශීය ජාතිකයන් හෝ ද්විත්ව පුරවැසියන් වන ප්‍රවාසික සේවකයින්ට වැටුප් ගෙවීම්;

(v) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සඳහා, එම ලබන්නා වූ අපනයන ආදායමෙන් ප්‍රතිශතාංක දහයක් (10%) දක්වා, සිදු කරන ගෙවීම්;

(vi) නිශ්චිත භාණ්ඩ අපනයනයක් සම්බන්ධිත මිල දී ගැනීමක් සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධාන යටතේ විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලබා ගැනීමට අවසරලත් දේශීය සැපයුම්කරුවන්ට කරන ගෙවීම්".

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2293/07 - 2022 අගෝස්තු මස 15 වැනි සඳුදා - 2022.08.15

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

8 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 8 වන වගන්තියේ (1) වන උප වගන්තියේ (අ) සහ (ආ) ඡේද යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව, මුදල්, ආර්ථික ස්ථායිතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මෙම නියමය මගින්, 2021 පෙබරවාරි 03 දිනැති අංක 2213/39 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ (නියමය) ප්‍රකාශයට පත් කර ඇති පරිදි පනතේ 8 වැනි වගන්තිය යටතේ නිකුත් කරන ලද නියමය පහත සඳහන් දෑ ඇතුළත් කරමින් නියමයේ උපලේඛනයේ III වන කොටස ලෙස සංශෝධනය කරනු ලැබේ.

(1) මෙහි සඳහන් උපලේඛනයේ II වන කොටසේ 1 වන ඡේදයේ සහ 2 වන ඡේදයේ සඳහන් කර ඇති කාල සීමාව සහ ව්‍යවහාර මුදල්වල සීමාව නොතකා, ශ්‍රී ලංකාවේ සිටින හෝ නේවාසික තැනැත්තෙකු විසින් නීත්‍යානුකූලව අත්පත් කරගත් සහ එසේ තම සන්තකයේ රඳවා තබාගත් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු

(අ) එම පුද්ගලයාගේ නමින් බලයලත් වෙළෙන්දෙකු සමඟ විවෘත කර පවත්වාගෙන යනු ලබන පුද්ගලික විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට හෝ ව්‍යාපාර විදේශ ව්‍යවහාර මුදල් ගිණුමකට අවස්ථානෝචිත පරිදි තැන්පත් කිරීම; හෝ

(ආ) බලයලත් වෙළන්දෙකුට එකී විදේශ ව්‍යවහාර මුදල් විකිණීම

අදාළ බලයලත් වෙළන්දා සෑහීමට පත්වන පරිදි එකී විදේශ ව්‍යවහාර මුදල් නීත්‍යානුකූලව අත්පත් කර ගැනීම සම්බන්ධව අවශ්‍ය සාක්ෂි ලබා දීමෙන්, මේ නියමය බලාත්මක වන දිනයේ සිට **මසක (1) පොදු සමාකාලය තුළ දී පමණක් කළ හැකි ය.**

(2) ශ්‍රී ලංකාව තුළ සිටින හෝ නේවාසික තැනැත්තෙකු විසින් ඉහත සඳහන් කර ඇති II (1) වන වගන්තියෙහි සඳහන් කරුණු අයුරින් නොව අන් අයුරකින් අත්පත් කරගෙන ඔහුගේ සන්තකයේ තබාගෙන ඇති විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු, මේ නියමය බලාත්මක වන දින සිට මසක **(1) පොදු සමාකාලය තුළ දී පමණක්** අනිවාර්යයෙන් ම බලයලත් වෙළෙන්දෙකු හට විකිණීම අවශ්‍ය වේ.

(3) පනතේ II වන වගන්තියේ විධිවිධාන ප්‍රකාර ව, මෙම නියෝගයේ සඳහන් කර ඇති විදේශ විනිමය රඳවාගත හැකි කාල සීමාව ඉක්මවමින් විදේශ ව්‍යවහාර මුදල් නෝට්ටු තම සන්තකයේ රඳවා තබාගෙන සිටින සියලුම පුද්ගලයන් විසින් මෙම නියෝගය උල්ලංඝනය කරනු ලැබීමකට එරෙහිව වහාම ක්‍රියාත්මක විමේ අයිතිය ශ්‍රී ලංකා මහ බැංකුව සතුව ඇත.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022 අගෝස්තු මස 15 වැනි දින,
මුදල් අමාත්‍යාංශය,
කොළඹ 01 දී ය.

මේ නියමයේ කාර්යය සඳහා

"පනත" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනත අදහස් වේ;

"බලයලත් වෙළෙන්දා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය;

"පුද්ගලයා" යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඇති අර්ථයම තිබිය යුතු ය;

"ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තා" යන්න සංශෝධිත පරිදි, 2021.02.03 දිනැති අංක 2213/40 දරන අති විශෙෂ ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කොට ඇති, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 31 වන වගන්තිය යටතේ නිකුත් කර ඇති නියමය ප්‍රකාර ව ලබා දී ඇති අර්ථයම තිබිය යුතු ය.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 10 දරන විධානයන්

ඉන්දියානු රුපියල් නාමකරණය පිළිබඳ බලයලත් වෙළෙන්දන් වෙත කරන විධානයන්

අනුපිළිවෙලින්, අංක 2213/34, 2213/35, 2213/36, 2213/37 සහ 2213/38 දරන හා 2021.02.03 දිනැති රජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රවල පළ කරන ලද 2021 අංක 01 දරන විදේශ විනිමය රෙගුලාසි (ශ්‍රී ලංකාවේ නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග), 2021 අංක 02 දරන විදේශ විනිමය රෙගුලාසි (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික තැනැත්තෙකු විසින් ශ්‍රී ලංකාව තුළ දී සිදු කරනු ලබන ප්‍රාග්ධන ගනුදෙනු වර්ග), 2021 අංක 03 දරන විදේශ විනිමය රෙගුලාසි (විගාමිකයන් විසින් අරමුදල් ප්‍රේෂණය කිරීම), 2021 අංක 04 දරන විදේශ විනිමය රෙගුලාසි (විවිධ ප්‍රාග්ධන ගනුදෙනු වර්ග) සහ 2021 අංක 05 දරන විදේශ විනිමය රෙගුලාසි (විදේශ විනිමය ගනුදෙනු වල නිරත වීමේ කාර්යය සඳහා ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම) යන රෙගුලාසි සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 09 වන වගන්තිය ප්‍රකාරව විදේශ විනිමය පනත යටතේ නිකුත් කරන ලද රෙගුලාසි හා විධානවල අරමුණු උදෙසා, "නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්" යන්නට "ඉන්දියානු රුපියල්" ද ඇතුළත් කරන ලද බව බලයලත් වෙළඳුන් හට මෙයින් දන්වා සිටිනු ලැබේ.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2022 අගෝස්තු 26

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ
අංක 2296/12 - 2022 සැප්තැම්බර් මස 08 වැනි බ්‍රහස්පතින්දා - 2022.09.08

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 7 වැනි වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ සාදනු ලබන නියෝග. 2021 ජූනි මස 30 වන දින අංක 2234/19 දරන රජයේ (අති විශෙෂ) ගැසට් පත්‍රයෙහි පළ කරන ලද නියෝග පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ;

(අ) නියෝග වල දැක්වෙන "මාස විසි හතරක" යන වචන මෙමඟින් ඉවත් කරනු ලබන අතර එම වචන වෙනුවට "මාස තිස් හයක" යන වචන ආදේශ කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022 සැප්තැම්බර් මස 08 වැනි දින,
කොළඹ 01 දී ය.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 11 දරන විධානය

රන් පාරාදීසය ගිණුම පිළිබඳ බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන විධානයන්

2021 අංක 5 දරන නියෝගය ප්‍රකාරව සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ 6 සහ 7 වගන්තිය සමඟ කියවිය යුතු 9 වගන්තිය ප්‍රකාර ව, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව (ක්‍රියාත්මක කිරීමේ අධිකාරිය) මගින් ක්‍රියාත්මක කරන **'රන් පාරාදීසය වීසා වැඩසටහන'** යටතේ ලබා දෙන අවුරුදු 10 නේවාසික වීසා මත ශ්‍රී ලංකාවේ පදිංචි වීමට අදහස් කරන විජාතික පුද්ගලයින්ගේ නමින් 'රන් පාරාදීස විදේශ ගිණුම්' **(Golden Paradise Foreign Currency Accounts - GPFCAs)** විවෘත කර පවත්වාගෙන යාමට මෙයින් අවසර දෙනු ලැබේ.

2. ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම.

අ) අයදුම්කරුවන් විසින් ආගමන හා විගමන පාලකවරයාගේ ලිඛිත ඉල්ලීම මත, **එ.ජ. ඩොලර් 200,000** හෝ වෙනත් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්වලින් ඊට සමාන අගයක අවම ආරම්භක තැන්පතුවක් සහිතව, GPFCAs ආරම්භ කළ යුතු ය.

ආ) GPFCAs ඉතිරි කිරීම් හෝ කාලීන තැන්පතු ගිණුම් ලෙස නම් කරන ලද ඕනෑම විදේශ ව්‍යවහාර මුදලකින් දේශීය බැංකු ඒකක තුළ පවත්වාගෙන යා යුතු ය.

ඇ) රන් පාරාදීසය වීසා වැඩසටහන යටතේ වීසා නිකුත් කළ දිනයේ සිට පළමු වසර අවසාන කළ පසු, දේශීය වියදම් සහ ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රේෂණ සඳහා, මෙම විධානයෙහි 2(අ) යටතේ සඳහන් මුදල් ආපසු ලබාගත හැකි ය.

ඈ) ඉහත 2(ඇ) යටතේ මුදල් ආපසු ලබා ගැනීමෙන් පසු ඉතිරි වන මුදල්, තැන්පතුවක් ලෙස GPFCAs හි වීසා බලාත්මක වන කාලය තුළ රඳවා තබා ගත යුතු ය.

3. අවසරලත් බැර කිරීම්

අ) බැංකු පද්ධතිය හරහා ගිණුම් හිමියාගේ නමට ශ්‍රී ලංකාවට පිටතින් ලැබෙන විදේශ මුදලින් වූ ආමුඛ ප්‍රේෂණ.

ආ) ගිණුම් හිමියා විසින් කරන ලද ප්‍රකාශයක් යටතේ ශ්‍රී ලංකාවට රැගෙන ආ විදේශ විනිමය.

ඇ) ගිණුම්වල ඇති මුදල් සඳහා විදේශ මුදලින් ලැබෙන පොලිය.

4. අවසරලත් හර කිරීම්

අ) ඉහත 2(ඇ) සහ 2(ඈ) ඡේදයන්ට යටත් ව, රන් පාරාදීසය වැඩසටහන යටතේ ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා මුදලින් සිදු කරන ගෙවීම්.

ආ) ඉහත 2(ඇ) සහ 2(ඈ) ඡේදයන්ට යටත් ව, ශ්‍රී ලංකාව තුළ ශ්‍රී ලංකා මුදලින් සිදු කරන ගෙවීම්.

ඇ) රන් පාරාදීසය වැඩසටහන යටතේ වීසා අවලංගු වීමෙන් පසු ආගමන හා විගමන පාලකවරයාගේ ලිඛිත ඉල්ලීම පරිදි හෝ අවුරුදු 10 ක නේවාසික වීසා කාලය අවසානයේ දී ගිණුම් හිමියාගේ නමින් ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යන ගිණුමකට මුදල් යැවීම.

5. වෙනත් කොන්දේසි

අ) 4(අ) සිට 4(ඈ) ඡේදයන්හි දක්වා ඇති අවසරලත් හර කිරීම් යටතේ සිදු කරන ගනුදෙනු/මාරු කිරීම්, 2(ඇ) සහ 2(ඈ) ඡේදයන් හි දක්වා ඇති අවශ්‍යතාවයන්ට යටත්ව සිදු කරන බව බලයලත් වෙළෙඳුන් විසින් තහවුරු කර ගත යුතු ය.

6. මාසික වාර්තා

අ) බලයලත් වෙළෙඳුන් විසින් ාෙපෙ?ජ්ඉිකගකන විද්‍යුත් තැපෑල හරහා, විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින්

නියම කරනු ලබන ආකෘතියක් අනුව මෙම විධානයන් යටතේ ආරම්භ කරනු ලැබූ ගිණුම් පිළිබඳ තොරතුරු, එළඹෙන මාසයේ 15 වන දින හෝ ඊට පෙර දෙපාර්තමේන්තුව වෙත සැපයිය යුතු ය.

ආ) ඉහත වාර්තා කිරීමේ අවශ්‍යතාවයන්ට අනුව බලයලත් වෙළෙඳුන් විසින් අදාළ බැංකුවල ගිණුම් පොත්වලින් අදාළ තොරතුරු ජනනය කිරීම හෝ උපුටා ගැනීම සඳහා බැංකුව තුළ පද්ධතියක් ස්ථාපනය කිරීම අවශ්‍ය වේ.

7. මෙම විධානයන්ගේ සීමාවෙන් පිටත සිදු කරන ඕනෑම ගනුදෙනුවක්/ගිණුමට හෝ ගිණුමෙන් සිදුවන මාරු කිරීමක් සඳහා, ක්‍රියාත්මක කිරීමේ අධිකාරියේ එකඟතාවය සමඟ බලයලත් වෙළෙඳුන්ට විදේශ විනිමය දෙපාර්තමේනුතුවේ අධ්‍යක්ෂවරයාගේ පෙර අවසරයක් අවශ්‍ය වේ.

8. **මෙම විධානයන්ගේ අරමුණු සඳහා**

(අ) **"ප්‍රේෂණ"** යන්නට, විදුලි පණිවුඩ පැවරුම්, අනෙකුත් අන්තර් බැංකු හුවමාරු, බැංකු අණකර, අනෙකුත් ගෙවීම් උපකරණ, අනෙකුත් අන්තර්ජාතිකව පිළිගත් ගෙවීම් ක්‍රමවේද හෝ පද්ධති හරහා ලැබෙන ගෙවීම් හෝ විදේශ විනිමය හුවමාරු ආයතන වෙතින් විදේශ මුදලින් ලැබෙන අරමුදල් අන්තර්ගත වන අතර, නෝට්ටුමය මුදල් ඇතුළත් නොවේ.

(ආ) **"ප්‍රකාශය"** යන්නෙන් විදේශ විනිමය අගය එ.ජ. ඩොලර් 15,000ක් නැතිහොත් වෙනත් විදේශ ව්‍යවහාර මුදලින් ඊට සමාන අගයක්ම වැඩිනම් රේගු දෙපාර්තමේන්තුව වෙත යොමු කළ ප්‍රකාශයක් හෝ එම අගය එ.ජ. ඩොලර් 15,000ට අඩු නම් හෝ ඊට සමාන වන අවස්ථාවක දී බලයලත් වෙළෙඳුන් වෙත සුදුසු පරිදි සිදුකළ ප්‍රකාශයක් අදහස් වේ.

(ඇ) **"ජංගම ගනුදෙනු"** යන්නට 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ ඊට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

9. මෙම විධාන මගින් අවසරය ලබා දී ඇති කිසිවක්, බලයලත් වෙළෙඳුන් හෝ මෙම විධාන යටතේ විදේශ විනිමයෙන් ගනුදෙනු කරන වෙනත් ඕනෑම පුද්ගලයෙක්, වෙනත් ඕනෑම නීතියක විධිවිධාන සමඟ අනුකූල වීමේ අවශ්‍යතාවයෙන් නිදහස් කිරීමක්, නිදොස් කිරීමක් හෝ වැළැක්වීමක් ලෙස වටහා නොගත යුතු ය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව

2022 නොවැම්බර් 08

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2308/51 - 2022 දෙසැම්බර් මස 02 වැනි සිකුරාදා - 2022.12.02

I වැනි කොටස : (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 29 වන වගන්තිය යටතේ මුදල් අමාත්‍යවරයා විසින් සාදනු ලබන නියෝග

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022 දෙසැම්බර් 02 දින,
කොළඹ දී ය.

නියෝග

1. මේ නියෝග, 2022 අංක 2 දරන විදේශ විනිමය (ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත සමාගමක් වෙතින් ලබා ගන්නා කෙටි කාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය) නියෝග යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. පහත කොන්දේසි සහ නියමවලට යටත් ව සහ පනතෙහි විධිවිධාන යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද විධානවලට අනුකූල ව, අවම වශයෙන් 30% ක දේශීය අගය එකතු කිරීමක් සහිත භාණ්ඩ නිෂ්පාදනය කිරීම සඳහා අමුද්‍රව්‍ය ආනයනය කරන 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගම්වලට (ණයගැතියා) එවැනි ආනයනවලට අදාළ ගෙවීම් මූල්‍යනය කිරීමේ අරමුණ සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපිත මව් සමාගමෙන් හෝ එකම සමාගම් සමූහයේ සමාග මකින් (ණයහිමියා) අවම අවුරුද්දක (1) සහන කාලයක් ඇතුළුව අවුරුදු තුනකට (3) අඩු ණය කාල සීමාවක් සහිත විදේශ ව්‍යවහාර මුදල් ණය ලබා ගැනීම සඳහා අවසර ප්‍රදානය කරනු ලැබේ.

(i) ආනයනය කිරීමට නියමිත අමුද්‍රව්‍ය භාවිත කරමින් සමාගම විසින් නිපදවනු ලබන අවසාන නිෂ්පාදිතයට, අවම වශයෙන් 30%ක දේශීය අගය එකතු කිරීමක් පවතින බවට, ණයගැතියා විසින් කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් නිර්දේශයක් ලබාගත යුතු ය.

(ii) ශ්‍රී ලංකා මහ බැංකුවෙන් නිකුත් කරන ලද විධානවලට යටත් ව, ඉහත පරිදි ණය මුදල් ලබා ගැනීම සහ නැවත ගෙවීම් සඳහා, ණයගැතියා විසින් "විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම කෙටි කාලීන ණය" නමින් ගිණුමක් විවෘත කර පවත්වාගෙන යා යුතු ය.

(iii) ඉහත පරිදි ලබාගත් ණය මුදල්වලට අදාළ පොළී අනුපාතය, ශ්‍රී ලංකාවේ දැනට පවතින වෙළෙඳපොළ පොලී අනුපාතවලට සංසන්දනාත්මක ව සාධාරණ සහනදායී අනුපාතයක් විය යුතු ය.

(iv) ඉහත පරිදි ලබාගත් ණය මුදල්වලට අදාළ පොළී අනුපාතය, ශ්‍රී ලංකාවේ දැනට පවතින වෙළෙඳපොළ පොලී අනුපාතවලට සංසන්දනාත්මක ව සාධාරණ සහනදායී අනුපාතයක් විය යුතු ය.

(v) අමුද්‍රව්‍ය ආනයනය සඳහා කරනු ලබන ගෙවීම් රටෙහි දැනට පවතින වෙළෙඳ නීතිවලට අනුකූල විය යුතු ය.

මේ නියෝග, මේ නියෝගවල දිනයේ සිට අවුරුද්දක (1) කාලයක් සඳහා වලංගු වේ.

විදේශ විනිමය දෙපාර්තමේන්තුව

ශ්‍රී ලංකා මහ බැංකුව

2017 අංක 12 දරන විදේශ විනිමය පනත යටතේ 2021 අංක 12 දරන විධානය

බලයලත් වෙළෙඳුන් වෙත නිකුත් කරන ලද විදේශයෙන් ලබාගන්නා විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-කෙටිකාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය (SFCA - Short Term Loans) පිළිබඳ විධාන

2022.12.02 දිනැති අංක 2308/51 දරන ගැසට් නිවේදනයේ (අති විශෙෂ) පළ කරන ලද 2022 අංක 02 දරන විදේශ විනිමය නියෝගය (ශ්‍රී ලංකාවට පිටත සංස්ථාගත සමාගමකින් ලබාගන්නා කෙටි කාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය) සහ 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 6 වන සහ 7 වන වගන්තිය සමඟ කියවිය යුතු 9 වන වගන්තිය ප්‍රකාරව, 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සංස්ථාපිත සමාගම් (ණය ගැනුම්කරු) වලට, ශ්‍රී ලංකාවෙන් පිටත මව් සමාගමෙන් හෝ එකම සමාගම් සමූහයේ සමාගමකින් (ණය හිමියන්) අවම අවුරුද්දක සහන කාලයක් ඇතුලුව අවුරුදු තුනකට අඩු ණය කාල සීමාවක් සහිතව ලබා ගන්නා විදේශ ව්‍යාවහාර මුදල් ණය මගින් භාණ්ඩ නිෂ්පාදනය සඳහා අමුද්‍රව්‍ය ආනයනය කිරීමට අදාළ ගෙවීම්වලට පහසුකම් සැලසීම පිණිස විශේෂ විදේශ ව්‍යාවහාර මුදල ගිණුම-කෙටි කාලීන ණය යන ගිණුම විවෘත කර පවත්වාගෙන යාම සඳහා බලයලත් වෙළෙඳුන් වෙත පහත සඳහන් කරුණුවලට යටත්ව අවසර ලබා දී ඇත.

2. සුදුසුකම් ලත් තැනැත්තන්

අවම වශයෙන් 30%ක දේශීයව අගය එකතු කිරීමක් සහිත අවසන් නිෂ්පාදනයක්, නිපදවීම කරනු ලබන බවට කර්මාන්ත අමාත්‍යාංශයේ ලේකම්වරයාගෙන් නිර්දේශ ලිපියක් ලබා ගැනීම සහ අවශ්‍ය අවස්ථාවන්හි දී ආනයන හා අපනයන පාලකවරයාගේ අවසර ලබා දීමේ ලිපියක් ලබා ගැනීමට යටත්ව, තම නිෂ්පාදන කටයුතු සඳහා අමුද්‍රව්‍ය ආනයනය කරනු ලබන 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ ශ්‍රී ලංකාව තුල සංස්ථාපිත සමාගම්.

3. ගිණුම් විවෘත කිරීම සහ පවත්වාගෙන යාම

(අ) ලබා ගන්නා ලද කෙටි කාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය භාවිතා කරමින් ඕනෑම නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදලකින්, ජංගම (බැංකු අයිරා පහසුකම් සහ චෙක්පත් නිකුත් කිරීමේ පහසුකම් නොමැතිව) හෝ ඉතුරුම් ගිණුම් ආකාරයෙන් තනිපුද්ගල ගිණුමක් ලෙස ''විශේෂ ව්‍යවහාර මුදල් ගිණුම-කෙටිකාලීන ණය" යන ගිණුම් විවෘත කර පවත්වාගෙන යා හැකිය.

(ආ) එක් එක් ණය දෙන්නා විසින් ලබා දෙන කෙටි කාලීන ණය පහසුකම් ලබා ගැනීම සඳහා, සුදුසුකම් ලත් පුද්ගලයින් හට විශේෂ ''විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-කෙටිකාලීන ණය" යන ගිණුම් විවෘත කර පවත්වාගෙන යා හැකි අතර පොලී ගෙවීම් ඇතුළුව සියලුම ආපසු ගෙවීම් එම ගිණුම තුළින්ම සිදු කළ යුතුය.

(ඇ) නියෝගයන්ගෙන් අවසර දී ඇති පරිදි මෙම විධානයන් යටතේ- ''විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-කෙටි කාලීන ණය" යන ගිණුම් විවෘත කිරීමේ වලංගු කාල සීමාව අවුරුදු (1) එකකට පමණක් සීමා වන අතර එකී ණය සේවාකරණය/ආපසු ගෙවීම් සම්පූර්ණ වන තෙක් එම ගිණුම පවත්වාගෙන යා යුතු ය.

4. අවසරලත් බැර කිරීම්

(අ) ශ්‍රී ලංකාවෙන් පිටත පවත්වාගෙන යනු ලබන ගිණුමකින් හෝ ආමුඛ ආයෝජන ගිණුමකින් හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යනු ලබන ගිණුමකින්, ගිණුම්හිමියා විසින් ණයහිමියාගෙන් ලබාගනු ලබන ණය මුදල් ලැබීම්වලට අදාළ ප්‍රේෂණ/මුදල් මාරු කිරීම්.

(ආ) ණය සේවාකරණ අරමුණු සඳහා ගිණුම් හිමියාගේ ශ්‍රී ලංකා රුපියල් ගිණුමෙන් සිදුකරනු ලබන මුදල් මාරු කිරීම්.

(ඇ) මෙම විධානයන්ගේ පරිච්ඡේද 5(අ) වෙනුවෙන් සිදුකරන ගෙවීම් සඳහා එකම ගිණුම්හිමියාගේ වෙනත් කෙටි කාලීන ''විශේෂ විදේශ ව්‍යාවහාර මුදල් ගිණුම-කෙටිකාලීන ණය යන ගිණුමකින් සිදු කරන ලබන මුදල් මාරු කිරීම්.

(ඈ) ගිණුමේ ඇති අරමුදල් මත උපයනු ලබන පොලිය,

5. අවසරලත් හර කිරීම්

(අ) භාණ්ඩ නිෂ්පාදනයට අවශ්‍ය අමුද්‍රව්‍ය ආනයනය කිරීම සඳහා වන ගෙවීම් වෙනුවෙන් සිදුකරන ප්‍රතිමුඛ ප්‍රේෂණ.

(ආ) ණය ගිවිසුම් ප්‍රකාර ව, නියෝගයන් යටතේ ලබාගෙන ඇති ණය මුදල් ආපසු ගෙවීම් හෝ සේවාකරණ අරමුණු සඳහා ණය හිමියාගේ ශ්‍රී ලංකාවට පිටත පවත්වාගෙන යනු ලබන ගිණුමක් හෝ ආමුඛ ආයෝජන ගිණුමක් හෝ අක්වෙරළ බැංකු ඒකකයක පවත්වාගෙන යනු ලබන ගිණුමක් වෙත සිදුකරන ප්‍රේෂණ / මුදල් මාරු කිරීම්.

(ඇ) කෙටි කාලීන ණය ලබාගැනීම් සඳහා ගෙවිය යුතු බැංකු ගාස්තු, ගාස්තු, කොමිස් මුදල් යනාදිය

(ඈ) මෙම විධානයන්ගේ පරිච්ඡේද 5(අ) වෙනුවෙන් සිදුකරන ගෙවීම් සඳහා එකම ගිණුම් හිමියාගේ වෙනත් ''විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-කෙටි කාලීන ණය'' යන ගිණුමකින් සිදුකරන ලබන මුදල් මාරු කිරීම්.

6. වෙනත් කොන්දේසි

(අ) මෙම විධානයන් හා නියෝගයන්ට අනුකූල බව සහතික කර ගැනීම, ''විශේෂ විදේශ ව්‍යවහාර මුදල්-ගිණුම කෙටිකාලීන ණය'' යන ගිණුමක් මගින් සිදුකරන ගනුදෙනුවල සද්භාවය සහ ගිණුම් හිමියන්ගේ සුදුසුකම් තහවුරු කර ගැනීමට බලයලත් වෙළෙඳුන් විසින් ප්‍රමාණවත් ලේඛන සාක්ෂි ලබා ගත යුතුය.

(ආ) අනෙකුත් නියාමන අවශ්‍යතාවයන්ට යටත් වන අපනයන ඉපයීම් වැනි දෑ හෝ අනෙකුත් ඕනෑම ව්‍යවස්ථාපිත අවශ්‍යතාවලට යටත් වන ආමුඛ ප්‍රේෂණ "විශේෂ විදේශ ව්‍යාවහාර මුදල් ගිණුම-කෙටි කාලීන ණය" ගිණුමට බැර නොකිරීමට බලයලත් වෙළෙඳුන් විසින් සහතික විය යුතුය.

(ඇ) නියෝගයේ සඳහන් පරිදි නිෂ්පාදනය සඳහා පමණක් අමුද්‍රව්‍ය ලෙස භාණ්ඩ ආනයනය සඳහා ගෙවීම් වෙනුවෙන් ණය මුදල් භාවිතා කිරීම පිළිබඳ කාර්යක්ෂමව අධීක්ෂනය කිරීම , රටෙහි පවතින වෙළඳ හා බදු නීතිවලට යටත්ව (එනම් ආනයන ගෙවීම් කොන්දේසි නියෝග, හුවමාරු මිලකරණ නියෝග යනාදිය.) අගය එකතු කිරීම සහ ප්‍රතිඅපනයන යන කාරණා ඇතුලුව ''විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-කෙටිකාලීන ණය'' යන ගිණුමක් තුළින් විදේශ විනිමය ගණුදෙනු සිදුකිරීමේ දී බලයලත් වෙළඳුන් විසින් ගණුදෙනුවල යථායෝගි බව පරීක්ෂා කිරීමේ සියලු ක්‍රියාකාරකම් සිදුකළ යුතුය.

(ඈ) මෙම විධානයන් යටතේ වන අවසරලත් ගනුදෙනුවලින් මතුවිය හැකි විනිමය අනුපාත අවදානම අවම කර ගැනීම පිණිස ණය ගැනුම්කරුගේ ඉල්ලීම මත සුදුසු ව්‍යුත්පන්න උපකරණවලට (සංශෝධිත, 1988 අංක 30 දරන බැංකු පනතේ විධිවිධාන යටතේ නිකුත් කර ඇති අදාළ විධාන සමග අනුකූලව) ඇතුලත් වීමට බලයලත් වෙළෙන්දාට හැකිය.

(ඉ) බලයලත් වෙළෙඳුන් විසින් කෙටි කාලීන ණය විශේෂ ව්‍යවහාර මුදල් ගිණුම පවත්වාගෙන යනු ලබන කාල සීමාව තුළ සහ ගිණුම් වසා දැමීමෙන් පසුව ව්‍යවස්ථාපිත වාර්තා තබා ගැනීමේ කාල සීමාව දක්වා ගිණුම තුළින් සිදුකරන ලද සියලු ගනුදෙනුවලට අදාළ ලේඛන ගත සාක්ෂි (දෘඩ පිටපත් හෝ ඉලෙක්ට්‍රොනික/ඩිජිටල් පිටපත්) නඩත්තු කළ යුතුය.

7. වාර්තා කිරීමේ අවශ්‍යතාවය

(අ) බලයලත් වෙළෙඳුන් විසින්, මෙම විධානයන් යටතේ වන ''විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-කෙටිකාලීන ණය'' යන ගිණුම් විවෘත කිරීම් සහ පවත්වාගෙන යාම පිළිබඳ තොරතුරු විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නියම කර ඇති ආකෘතිය පරිදි එළඹෙන මාසයේ 15 වැනි දිනට හෝ ඊට ප්‍රථම විද්‍යුත් තැපැල් මගින් වාර්තා කළ යුතුය.

(ආ) ඉහත දක්වා ඇති වාර්තා කිරීමේ අවශ්‍යතාවය පරිදි බලයලත් වෙළෙන්දන් විසින් අදාළ බැංකුවේ ගිණුම් පොත්වලින් අවශ්‍ය සියලු තොරුතුරු උපුටා ගැනීමට හැකිවන පිණිස බැංකුව තුළ පද්ධතියක් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදුකළ යුතුය.

8. ගිණුම් වසා දැමීම

(අ) බලයලත් වෙළෙන්දන් හට, ණය ගැනුම්කරුවන් විසින් අදාළ ණය මුදල් සම්පූර්ණයෙන් පියවා ඇති විට ''විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ණය ගිණුම-කෙටිකාලීන'' යන ගිණුම වසා දැමිය හැකිය.

(ආ) ණය ගැනුම්කරුවෙකු විසින් අදාළ ණය මුදල් සම්පූර්ණයෙන්ම පියවා දැමීමට පෙර වෙනත් බලයලත් වෙළෙන්දකු සමඟ විශේෂ විදේශ ව්‍යවහාර මුදල් ගිණුම-කෙටි කාලීන ණය'' - වසා දැමීමට ඉල්ලුම් කර ඇති විට දී, මුලින් ගිණුම පවත්වාගෙන යනු ලබන බලයලත් වෙළෙන්දා හට නව ගිණුම විවෘත කිරීමට බලාපොරොත්තු වන බලයලත් වෙළෙන්දා තෘප්ත වන ආකාරයෙන් අදාළ තොරතුරු/ලිපි ලේඛන (එනම්, ණය මුදල් ලැබීම් සම්බන්ධ තොරතුරු සහතික කිරීම, එකතු කරගත් සියලුම සාක්ෂි ලේඛන, යනාදිය) ඉදිරිපත් කිරීමෙන් පසුව, ගිණුම වසා දැමිය හැකි ය.

(ඇ) ගිණුම වසා දැමීමෙන් සතියක කාලයක් තුළ දී බලයලත් වෙළෙන්දන් විසින් dfem@cbsl.lk යන විද්‍යුත් ලිපිනය ඔස්සේ විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත දැනුම් දිය යුතු ය.

9. මෙම විධානයන්ගේ විෂය පථයට පරිබාහිර වෙනත් ඕනෑම ගනුදෙනුවක්/මුදල් මාරුකිරීමක් සඳහා බලයලත් වෙළඳුන් විසින් විදේශ විනිමය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂතුමාගේ පූර්ව අනුමැතිය ලබා ගත යුතු ය.

10. **මෙම විධානයේ අරමුණු සඳහා:**

(අ) **"නම් කරන ලද විදේශ ව්‍යවහාර මුදල්"** යන්නට එක්සත් ජනපද ඩොලර් (එ.ජ.ඩො.), යූරෝ, ස්ටර්ලිං පවුම්, ඕස්ට්‍රේලියානු ඩොලර්, සිංගප්පූරු ඩොලර්, ස්වීඩන ක්‍රෝනර්, ස්විස් ෆ්‍රෑන්ක්, කැනේඩියානු ඩොලර්, හොංකොං ඩොලර්, ජපන් යෙන්, ඩෙන්මාර්ක ක්‍රෝනර්, නෝර්වේජියානු ක්‍රෝනර්, චීන රෝමින්වේ, නවසීලන්ත ඩොලර්, තායි බාත් සහ ඉන්දියානු රුපියල් ඇතුළත් විය යුතු ය.

(ආ) **"ප්‍රේෂණ"** යන්නට විදුලි පණිවුඩ පැවරුම්, අනෙකුත් අන්තරු බැංකු පැවරුම්, බැංකු අණකර, අනෙකුත් ගෙවීම් උපකරණ, අනෙකුත් ජාත්‍යන්තර වශයෙන් පිළිගත් ගෙවීම් යාන්ත්‍රණ හෝ මධ්‍යස්ථාන හරහා ලද ගෙවීම් සහ ව්‍යවහාර මුදල් නෝට්ටු හැර විනිමය මධ්‍යස්ථාන/ආයතනවලින් විදේශයන්ගෙන් විදේශ ව්‍යවහාර මුදලින් ලද අරමුදල් යනාදිය ඇතුළත් විය යුතු ය.

11. මෙම විධාන මගින් අවසර දී ඇති කිසිවක්, වෙනත් ඕනෑම නීතියක ප්‍රතිපාදනවලට අනුකූල වීමේ අවශ්‍යතාවයෙන් විදේශ විනිමය ගනුදෙනු කරන බලයලත් වෙළෙන්දන් නිදහස් කිරීමක්, නිරපේක්ෂ කිරීමක් හෝ වැළැක්වීමක් ලෙස සැලකිය නොහැකිය.

අධ්‍යක්ෂ - විදේශ විනිමය දෙපාර්තමේන්තුව
2022 දෙසැම්බර් 09

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය
අති විශෙෂ

අංක 2311/38 - 2022 දෙසැම්බර් මස 22 වැනි බ්‍රහස්පතින්දා - 2022.12.22

I වැනි කොටස (I) වැනි ඡේදය - සාමාන්‍ය

රජයේ නිවේදන

2017 අංක 12 දරන විදේශ විනිමය පනත

22 වන වගන්තිය යටතේ වූ නියමය

2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ (පනත) 22 වන වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මා විසින්, මෙම නියමය මගින්, 2022 ජූනි මස 30 දිනැති අංක 2286/27 දරන අති විශෙෂ ගැසට් නිවේදනයේ පළකරන ලද පනතෙහි 22 වන වගන්තිය යටතේ වූ නියමයෙහි වලංගු කාලය, 2022 දෙසැම්බර් මස 30 වැනි දින සිට තවත් මාස හයක කාලයකින් දීර්ඝ කරනු ලැබේ.

රනිල් වික්‍රමසිංහ,
මුදල්, ආර්ථික ස්ථායීතා සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය

2022 දෙසැම්බර් 22 දින,
කොළඹ දී ය.

මෙහෙයුම් උපදෙස් අංක : 2022 අංක 1 2022 පෙබරවාරි 02

සියලුම ඍජු අලෙවි සහභාගිකරුවන් වෙත,

ලංකාසෙට්ල්හි නිර්ලේඛන රාජ්‍ය සුරුකුම්පත් මත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීම පිළිබඳ මෙහෙයුම් උපදෙස්

ශ්‍රී ලංකා මහ බැංකුවේ දේශීය මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව 2018 අප්‍රේල් 12 වැනි දින සිට බලපැවැත් වූ අංක 35/01/005/0006/36 දරන චක්‍රලේඛය අවලංගු කරමින් 'දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබාගැනීමට සුදුසුකම් ලබන සහභාගිකරුවන්' යන්න සංශෝධනය කරමින් චක්‍රලේඛය නැවත නිකුත් කරනු ලබන බව මෙයින් දැනුම් දෙමු.

ඒ අනුව, 2022 අංක 01 දරන මෙහෙයුම් උපදෙස් 2022 පෙබරවාරි 02 දින සිට බලපැවැත්වෙන අතර, සියලුම ඍජු අලෙවි සහභාගිකරුවන් එම චක්‍රලේඛයට අනුකූල විය යුතු බව දැනුම් දෙමු.

ආචාර්ය පී.කේ.ජී. හරිස්චන්ද්‍ර
අධ්‍යක්ෂ/ දේශීය මෙහෙයුම් කටයුතු

මෙහෙයුම් උපදෙස් අංක : 2022 අංක 1 2022 පෙබරවාරි 01

සියලුම ඍජු අලෙවි සහභාගිකරුවන් වෙත,

ලංකාසෙට්ල්හි නිර්ලේඛන රාජ්‍ය සුරුකුම්පත් මත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සැපයීම පිළිබඳ මෙහෙයුම් උපදෙස්

මෙම මෙහෙයුම් උපදෙස් 2022 පෙබරවාරි 02 වෙනි දින සිට බලපැවැත්වෙන අතර මහ බැංකුව විසින් මෙම මෙහෙයුම් උපදෙස් ඍජු අලෙවි සහභාගිත්ව ආයතනවලට සාධාරණ දැනුම් දීමකින් පසුව වරින්වර සංශෝධනය කිරීම හෝ වෙනස් කිරීම කරනු ලැබිය හැකිය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සුදුසුකම් ඇති සුරුකුම් භාවිතා කොට දවස ඇතුළත ද්‍රවශීලතා අවශ්‍යතා සැපයීමට අදාළ වන මෙහෙයුම් උපදෙස් පහත දැක්වේ.

තත්කාලීන දළ පියවීම් පද්ධතිය සුමට ලෙස පවත්වා ගෙන යාම සඳහා ලංකාසෙට්ල් (LankaSettle)හි පද්ධති රීතිවල දක්වා ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව (මහ බැංකුව) විසින් තම අභිමතය පරිදි ලංකාසෙට්ල් පද්ධතියට සහභාගිවීමට සුදුසුකම් ලබන ඍජු අලෙවි සහභාගිත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ අරමුදල් සපයයි.

1. සාමාන්‍යයෙන්, නම් කරන ලද අලෙවිකරුවන් නොවන ලංසු තබන්නන් හැර, ලංකාසෙට්ල්හි සියලුම ඍජු අලෙවි සහභාගිකරුවන් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබාගැනීම සඳහා සුදුසුකම් ලබති. මෙම මෙහෙයුම් උපදෙස් සඳහා:

   (i) ලංකාසෙට්ල් පද්ධතියේ මෙහෙයුම් කටයුතු සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මුදල් නීති පනතට අනුව නිකුත් කරන ලද රීති, ලංකාසෙට්ල් පද්ධති රීති (මින් මතු පද්ධති රීති) යනුවෙන් අදහස් කෙරෙන අතර, ඒවා කලින් කලට සංශෝධනය විය හැක.

   (ii) ඍජු අලෙවි සහභාගිත්ව ආයතන යනු, පද්ධති රීතීන්හි සාමාන්‍ය විධිවිධාන යටතේ අර්ථකථනය කර ඇති ඍජු අලෙවි සහභාගිකරුවන් වේ. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම භාවිතා කිරීම සඳහා සුදුසුකම් ලැබීමට සහභාගිත්ව ආයතනයක්, පද්ධති රීති 2 වැනි වෙළුමෙහි 7.1 වැනි රීතිය මගින් විස්තර කර ඇති පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව සමඟ නියමිත ආකෘතියට අනුව දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සම්බන්ධ ගිවිසුමකට එළඹිය යුතුය; සහ

   (iii) සුදුසුකම් ඇති සුරුකුම්පත් යනු, පද්ධති රීති 2 වැනි වෙළුමෙහි 7.2 කොටසෙහි අර්ථ දක්වා ඇති පරිදි වේ.

2. ඍජු අලෙවි සහභාගිත්ව ආයතනයක් විසින් කිසියම් ආකාරයකින් උකස් පිට තිබෙන සුරුකුම්පත් හෝ තමන් හැර වෙනත් පාර්ශ්වයක් සතු සුරුකුම්පත් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමේ ගනුදෙනු සඳහා ඇපකර ලෙස භාවිත නොකළ යුතුය. එවැනි සුරුකුම්පත් භාවිත කරන ලද බවට හඳුනාගත් අවස්ථාවක දී, පද්ධති රීතීන්හි 3 වැනි වෙළුමෙහි 11.3 වගන්තියේ දක්වා ඇති පරිදි ගෙවීමක් පනවනු ඇත.

3. මෙම මෙහෙයුම් උපදෙස්හි දක්වා ඇති පරිදි ඍජු අලෙවි සහභාගිත්ව ආයතන විසින් මහ බැංකුව වෙත සුදුසුකම්ලත් සුරුකුම්පත් මාරු කිරීම මත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ සහභාගිත්ව ආයතනවලට පොලී රහිතව අරමුදල් ලබා දෙනුයේ එකී ඍජු අලෙවි සහභාගිත්ව ආයතනය විසින් එකී සුරුකුම්පත් මත දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ ලබා ගත් අරමුදල්හි ආපසු නොගෙවා ඇති ප්‍රමාණයන් පද්ධති රීතීන්හි දෛනික මෙහෙයුම් කාලසටහනෙහි දක්වා ඇති වේලාවට හෝ ඊට පෙර පියවා එකී ආයතනය විසින් එම සුරුකුම්පත් ප්‍රතිමිලදී ගැනීමේ කොන්දේසිය මතය.

4 දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා ගැනීමට ඇපකර ලෙස ඉදිරිපත් කරන ලද සුරැකුම්පත් වෙනුවට වෙනත් සුරැකුම්පත් ආදේශ කිරීමට අවසර නොලැබේ.

දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ අරමුදල් ලබා ගැනීමේ ක්‍රියාවලිය

5. යම් දෙන ලද අවස්ථාවක, දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ගිණුමෙහි පවත්නා සුදුසුකම් ලැබූ සුරැකුම්පත් වටිනාකමට සාපේ-ක්ෂ අරමුදල් ප්‍රමාණයක් මහ බැංකුව විසින්, ඍජු අලෙවි සහභාගිත්ව ආයතනයකට, දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ සපයයි. මහ බැංකුව විසින් තීරණය කරනු ලබන නිල මිල ගණන් පදනම් කර ගෙන ගණනය කරනු ලබන එකී සුදුසුකම් ලත් සුරැකුම්පත්වල වටිනාකම අදාළ ඍජු අලෙවි සහභාගිත්ව ආයතනයේ තත්කාලීන දළ පියවුම් පද්ධතියේ ඇති පියවීමේ ගිණුමට බැර කරනු ලැබේ.

6. සෑම ව්‍යාපාරික දිනයක් ආරම්භයේදීම, ඍජු අලෙවි සහභාගිකරුවන්ගේ දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ගිණුමේ, පෙර ව්‍යාපාරික දිනය අවසානයේ පැවති සුදුසුකම් ලැබූ සුරැකුම්පත්, මහ බැංකුවේ දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ගිණුමට ස්වයංක්‍රීයව මාරු වේ.

7. දවස ඇතුළත ද්‍රවශීලතා අවශ්‍යතා පැන නැගීමක දී පද්ධතිය හරහා කරනු ලබන ඉල්ලීමක් මගින්, ඍජු අලෙවි සහභාගිත්ව ආයතනයේ අභිමතය පරිදි ව්‍යාපාරික දිනයක් ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ කිහිපවරක් අරමුදල් ලබාගැනීමේ සහ පියවීමේ හැකියාව ඇත. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබාගැනීමට බලාපොරොත්තු වන ඍජු අලෙවි සහභාගිත්ව ආයතනයක, සුදුසුකම් ලත් ප්‍රමාණවත් සුරැකුම්පත් ප්‍රමාණයක් ලංකාසෙක්‍යුහි ඇති සහභාගිවන්නන්ගේ දවස ඇතුළත ද්‍රවශීලතා ගිණුමෙහි පවත්වා ගත යුතුය.

සුරැකුම්පත්වල නිල මිල ගණන්

8. මහ බැංකුව විසින් සුදුසුකම් ලත් සුරැකුම්පත්වල නිල මිල ගණන් එදිනෙදා පවතින වෙළඳපොළ මිල ගණන් සහ වෙළෙඳපොළ ප්‍රවණතා පදනම් කරගෙන දෛනික පදනමක් මත තීරණය කරනු ලැබේ. මෙම මිල කිරීමේ දී, සුරැකුම්පත්හි ස්වභාවය හා කාලය මත පදනම්ව එම සුරැකුම්පත්වල මීලෙහි සිදු වන උච්චාවචනයකින් විය හැකි අලාභ අවම කිරීමට ගැලපීමක් ද අන්තර්ගතකොට (haircut) අදාළ සුරැකුම්පතෙහි නිල මිල ගණන් තීරණය කරනු ලබයි. මෙවැනි නිල මිල ගණන් ලංකා-සෙක්‍යු පද්ධතියෙහි සහ විවට වෙළෙඳපොළ කටයුතු සඳහා යොදා ගැනීමට විද්‍යුත් මංගත ලංසු තැබීමේ පද්ධතියෙහි වාර්තා කරනු ලබයි.

ව්‍යාපාරික දිනයක් අවසානයේ දී දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම මගින් ලබා ගත් අරමුදල් පියවීම

9. පද්ධති රීතිවලට අනුකූලව දෛනික මෙහෙයුම් කාලසටහනෙහි නිකුත් කර ඇති කොන්දේසි මත පදනම්ව, දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ ණයට ලබා ගත් අරමුදල් නියමිත වේලාවට පෙර සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් නැවත ගෙවා දැමීමෙන් ඇපකර ලෙස ඉදිරිපත් කරන ලද අදාළ සුරැකුම් සම්පූර්ණයෙන්ම හෝ කොටස් වශයෙන් නැවත අත්පත් කර ගැනීමටත් ඍජු අලෙවි සහභාගිත්ව ආයතනයට හැකියාව තිබේ.

10. ඍජු අලෙවි සහභාගිත්ව ආයතන දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ නොපියවා ඇති සියලුම ශේෂ පද්ධති රීති යටතේ දෛනික මෙහෙයුම් කාලසටහනෙහි දක්වා ඇති කොන්දේසිවලට අනුකූලව ව්‍යාපාරික දිනය නිමවීමට පෙර පියවිය යුතුය. මෙම කාර්යය සඳහා මහ බැංකුවට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් යටතේ නොපියවා ඇති ශේෂය ආපසු අයකර ගැනීමට හැකි වන ලෙස, ඍජු අලෙවි සහභාගිත්ව ආයතන තත්කාලීන දළ පියවුම් පද්ධතියේ ඔවුන්ගේ පියවුම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ප්‍රමාණයක් පවත්වා ගැනීමට වගබලා ගත යුතුය.

11. දිනය ඇතුළත ද්‍රවශීලතා පහසුකම්හි නොපියවූ ශේෂයන් අයකර ගැනීමේ ක්‍රියාවලිය පද්ධතිය හරහා සිදුවන අතර, එය පද්ධති රීති අනුව නිකුත් කර ඇති දෛනික මෙහෙයුම් කාලසටහනෙහි දක්වා ඇති වේලාවන්ට අනුව සිදු වේ. එහි දී අදාළ ඍජු අලෙවි සහභාගිත්ව ආයතනයේ තත්කාලීන දළ පියවීමේ ගිණුමේ පවත්නා අරමුදල් ප්‍රමාණය අනුව, මහ බැංකුවේ දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ගිණුමෙන්, ඍජු අලෙවි සහභාගිත්ව ආයතනයේ දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ගිණුමට අදාළ සුරැකුම්පත් මාරුවන අතර එය, ගෙවීම් මත බාරදීමේ පදනම යටතේ (DVP) අරමුදල් පියවීම සඳහා තත්කාලීන දළ පියවුම් පද්ධතියට සිදු කරන ඉල්ලුම් කිරීමක් හරහා සිදු වේ. දිනය ඇතුළත ද්‍රවශීලතා පහසුකම නැවත පැවරීම මුල් මිල සහ මුල් ගනුදෙනු අගය මත සිදු කරනු ලබයි.

දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ ලබා ගත් අරමුදල් ගෙවීම පැහැර හැරීම

12. කිසියම් හේතුවක් මත ඉහත 10 වන වගන්තියෙහි දක්වා ඇති නියමිත වේලාවට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම යටතේ ලබාගත් අරමුදල් ප්‍රමාණය මහ බැංකුවට සම්පූර්ණයෙන්ම පියවීමට ඍජු අලෙවි සහභාගිත්ව ආයතනයන් අසමත් වුවහොත්, එම ඍජු අලෙවි සහභාගිත්ව ආයතනය විසින් ලබා ගත් සම්පූර්ණ මුදලම නොගෙවා පැහැර හැරියා සේ සලකනු ලබන අතර, පහත සඳහන් 16 වන වගන්තියෙහි දක්වා ඇති පරිදි පැහැර හැරීම වෙනුවෙන් පොලියක් ගෙවීමට ද බැඳී සිටී. එවැනි පැහැර හැරීමකට අදාළ වන පොලිය, ඊළඟ ව්‍යාපාර දිනය ඇතුළත දී ඍජු අලෙවි සහභාගිත්ව ආයතන මහ බැංකුවේ පවත්වාගෙන යනු ලබන පියවීමේ ගිණුමට හර කරනු ලැබේ.

13. ඉහත සඳහන් කර ඇති පරිදි ඍජු අලෙවි සහභාගිත්ව ආයතනයක් ගෙවීම පැහැර හැර ඇති බවට හැඟෙන විටක දී, එවැනි ඍජු අලෙවි සහභාගිත්ව ආයතනයක්, ගෙවීම් පැහැර හැර ඇති සම්පූර්ණ ප්‍රමාණය සහ පොලිය පසු දින ව්‍යාපාරික කටයුතු අවසන් වීමට පෙර ගෙවිය යුතුය.

14. මහ බැංකුව භාරයේ පවතින සුරැකුම්පත්, පද්ධතිය මගින් ප්‍රතිවටිනාකම් කරනු ලබන අතර, ඊළඟ ව්‍යාපාර දිනය සඳහා අදාළ වන නිල මිල ගණන් මත පදනම්ව, ඊළඟ ව්‍යාපාර දිනයේ දී නැවත ගෙවීම් කළ යුතු ප්‍රමාණය ජනනය කරනු ලබයි. මෙලෙස ප්‍රතිවටිනාකම් කරනු ලැබූ ප්‍රමාණය, ගෙවීම් පැහැර හරිනු ලැබූ මුළු ප්‍රමාණය සහ ගෙවීම් පැහැර හැරීමේ පොලියට වඩා වැඩි වුවහොත් එම

අතිරික්ත මුදල මහ බැංකුව විසින් තත්කාලීන දළ පියවුම් පද්ධතියෙහි ඇති අදාළ සෘජු අලෙවි සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුමට බැර කිරීම මගින් නැවත ගෙවනු ඇත. මෙලෙස ප්‍රතිවටිනාකම් කරනු ලැබූ ප්‍රමාණය, ගෙවීම් පැහැර හරින ලද මුළු ප්‍රමාණය සහ ගෙවීම් පැහැර හැරීමේ පොලියට වඩා අඩු වුවහොත් මහ බැංකුව එම වෙනස තත්කාලීන දළ පියවුම් පද්ධතියේ ඇති අදාළ සෘජු අලෙවි සහභාගිත්ව ආයතනයේ පියවීම් ගිණුම හර කිරීම මගින් අය කර ගනු ඇත.

15. ගෙවීම් පැහැර හරින ලද ප්‍රමාණය සහ ගෙවීම් පැහැර හරින ලද පොලිය සඳහා ප්‍රතිවටිනාකම් කරන ලද වටිනාකම නැවත ගෙවීම සඳහා ඊළඟ ව්‍යාපාරික දිනයේ ව්‍යාපාරික කටයුතු අවසන් කරන වේලාවේ දී හෝ ඊට පෙර ප්‍රමාණවත් අරමුදල් සිය පියවීම් ගිණුමෙහි පවතින බව අදාළ සෘජු අලෙවි සහභාගිත්ව ආයතනය තහවුරු කර ගත යුතුය. ඊළඟ ව්‍යාපාරික දිනයේ ව්‍යා-පාර කටයුතු අවසන් වීමට පෙර ගෙවීම් පැහැර හරින ලද ප්‍රමාණය සම්පූර්ණයෙන් පියවීමට සෘජු අලෙවි සහභාගිත්ව ආයතනය අසමත් වූ අවස්ථාවක දී, දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කරන ලද සුරැකුම්පත් තම භාරයේ රඳවා ගැනීමට සහ සුදුසු යැයි හැඟෙන ආකාරයට කටයුතු කිරීමට මහ බැංකුවට හැකියාව ඇත.

16. දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම පැහැර හරින පළමු අවස්ථාවේ දී සෘජු අලෙවි සහභාගිත්ව ආයතනය විසින් පැහැර හරිනු ලැබූ මුදල හෝ ඉන් කොටසක් සඳහා අදාළ පොලිය මසකට සියයට 5ක් බැගින් ගෙවිය යුතු වේ. ඉන්පසු සෑම ලිත් වර්ෂයක් තුළම එවැනි අරමුදල් ගෙවීම පැහැර හරිනු ලබන සෑම අවස්ථාවක් සඳහාම පොලිය පදනම් අංක 100 බැගින් ඉහළ නැංවෙන අතර, දින 30ක කාලයක් තුළ එක්වරකට වඩා එවැනි අරමුදල් ගෙවීම පැහැර හරිනු ලබන්නේ නම්, මෙම වගන්තියේ දක්වා ඇති පැහැර හරිනු ලැබූ පොලියට අමතරව, මහ බැංකුවේ අභිමතය පරිදි, ගනුදෙනු සඳහා උපයෝගී කරගනු ලැබූ සුරැකුම්පත් රඳවා ගැනීමට බලය තිබේ. මෙම පැහැර හැරීම නැවත නැවතත් සිදුවුවහොත් මහ බැංකුව තීරණය කරනු ලබන කාලසීමාවක් සඳහා එම සෘජු අලෙවි සහභාගිත්ව ආයතනයට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් සැපයීම අත්හිටුවීමට ඉඩ ඇත.

17. දිනය ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා දීම සඳහා වන ගිවිසුම සහ මෙහෙයුම් උපදෙස්වල අනෙකුත් විධිවිධාන එසේ තිබියදීත් සහ දින 30ක කාලසීමාවක් තුළ එක් වරකට වඩා අරමුදල් ගෙවීම පැහැර හරිනු ලැබූ අවස්ථාවක මහ බැංකුව තම අභිමතය පරිදි පැහැර හැරීමේ අවස්ථාවන් සැලකිල්ලට ගනිමින්, සුරැකුම්පත් රඳවා ගැනීමට සහ මහ බැංකුවට සුදුසු යැයි හැඟෙන ආකාරයකට කටයුතු කිරීමට තීරණය කළ හැක.

18. ඉහත 2 වගන්තියේ සඳහන් පරිදි, සෘජු අලෙවි සහභාගිත්ව ආයතනයක් තුන්වන පාර්ශ්වයක් සතු සුරැකුම්පත් දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් යටතේ අරමුදල් ලබා ගැනීමට භාවිතා කරන ලද අවස්ථාවක දී, එවැනි සෘජු අලෙවි සහභාගිත්ව ආයතනයක් පද්ධති රීති සහ මෙහෙයුම් උපදෙස් යන දෙවර්ගයම උල්ලංඝනය කර තිබෙන බව සලකනු ලබයි. මෙම රීති උල්ලංඝනය කර ඇති අවස්ථාවක දී පහත ගෙවීම් අදාළ වේ.

සටහන 1 : දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම උල්ලංඝනය කර ඇති අවස්ථාවක දී අදාළ වන ගෙවීම්

තුන්වන පාර්ශ්වයක් සතු සුරැකුම්පත් හරහා ණයට ගත් ප්‍රමාණය (රු. මිලියන)	දිනකට අදාළ අනුපාතිකය (සියයට)
1,000ක් දක්වා	2.0
1,000ට වැඩි	2.5

19. මෙම මෙහෙයුම් උපදෙස්වල අනෙකුත් විධිවිධාන එසේ තිබියදීත් ගෙවීම් පැහැර හැරීමේ අවස්ථාව හෝ තෙවන පාර්ශ්වයක සුරැකුම්පත් භාවිතා කිරීම සැලකිල්ලට ගැනීමෙන්, මහ බැංකුවට සිය පූර්ණ අභිමතය පරිදි, එම සෘජු අලෙවි සහභාගිත්ව ආයතනයට දිනය ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම ස්ථිරවම හෝ මහ බැංකුව විසින් තීරණය කරන ලද කාලපරිච්ඡේදයක් සඳහා අත්හිටුවීමට හැකියාව ලැබේ.

20. ඒ අනුව ලංකාසෙට්ල් පද්ධතියෙහි නිර්-ලේඛන රජයේ සුරැකුම්පත් යටතේ වන දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම සඳහා වූ ප්‍රතිපාදන යටතේ වන 2018 අප්‍රේල් 12 දිනැති 35/01/005/0006/36 දරන මෙහෙයුම් උපදෙස් අවලංගු වේ.

21. මෙම මෙහෙයුම් උපදෙස් සහ දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා දීම සඳහා වන ගිවිසුම අතර වෙනසක් පවතින අවස්ථාවක, දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබා දීම සඳහා වන ගිවිසුම වලංගු වේ.

ආචාර්ය පී.කේ.ජී. හරිස්චන්ද්‍ර
අධ්‍යක්ෂ/ දේශීය මෙහෙයුම් කටයුතු

2022 මැයි 19

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත,

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 1949 අංක 58 දරන මුදල් නීති පනතේ අංක 103 වන වගන්තියේ විධිවිධානවලට අනුව ණයවර ලිපි මත මුදල් ආන්තික තැන්පතු පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව පිළිබඳ නියෝගය

1. වහාම ක්‍රියාත්මක වන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මෙහි අමුණා ඇති ලේඛනයේ සඳහන් කොට ඇති අයිතම ආ-නයනය සඳහා ණයවර ලිපි විවෘත කරන අවස්ථාවේ දී සියයට සියයක් (100%) ආවරණය වන පරිදි පොලී හිමිකම රහිත මුදල් ආන්තික තැන්පතුවක් බලපත්‍රලාභී වාණිජ බැංකුවෙහි තැන්පත් කර නොමැති අවස්ථාවක දී ණයවර ලිපි විවෘත නොකළ යුතු බව සියලු ම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මෙමගින් දැනුම් දෙනු ලැබේ.

2. මෙම නියෝගය මගින් ආවරණය වන අයිතම ආනයනය සඳහා තවදුරටත් පහත සඳහන් කොන්දේසි ද අදාළ විය යුතු බව බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත දැනුම් දෙනු ලැබේ.

   අ) යම් ඉන්වොයිසියක, මෙම නියෝගය මගින් ආවරණය නොවන අයිතම ඇතුළත් වුවද, මුදල් ආන්තික තැන්පතු අවශ්‍යතාව ඉන්වොයිසියේ මුළු වටිනාකම මත විය යුතුය.

   ආ) ඉහත (1) හි සඳහන් මුදල් ආන්තික තැන්පතු කොන්දේසිවලට පරිබාහිරව මෙම නියෝගය මගින් ආවරණය වන අයිතම ආනයනය සඳහා දැනටමත් විවෘත කර ඇති ණයවර ලිපිවල වටිනාකම වැඩි කිරීමට බලපත්‍රලාභී වාණිජ බැංකු අවසර නොදිය යුතුය.

   ඇ) මෙම නියෝගය මගින් පනවා ඇති අවම ආන්තික තැන්පතු අවශතාව සපුරා ගැනීමට හැකි වන පරිදි බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ගනුදෙනුකරුවන්ට අත්තිකාරම් ලබා නොදිය යුතුය.

   ඈ) බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් මෙම නියෝගයට අනුකූලව මුදල් ආන්තික තැන්පතුව පවත්වා ගෙන යන බවට අදාළ ඉන්වොයිසිය මත පිටසන් කළ යුතුය.

   ඉ) ආනයන නිෂ්කාශන සම්බන්ධව රේගු ලේඛන හා ශ්‍රී ලංකාවේ බැංකු පද්ධතිය හරහා ගෙවීම් පිළිබඳ ලේඛනමය සාක්ෂි ඉදිරිපත් කළ පසු ආන්තික තැන්පතුව නිදහස් කළ යුතුය.

3. දැනට බලපැවැත්වෙන ඕනෑම අවශ්‍යතාවක් සහ භාණ්ඩ ආනයනය කිරීමේ දී වෙනත් ඕනෑම නීතියක් යටතේ හඳුන්වාදෙනු ලැබිය හැකි අවශ්‍යතාවන්ට අමතරව මෙම නියෝගයේ විධිවිධාන ද බලපැවැත්වේ.

ආචාර්ය ආර්. ඒ. අනිල් පෙරේරා
අධ්‍යක්ෂ/ දේශීය මෙහෙයුම් කටයුතු

ඇමුණුම 1

මුදල් ආන්තික තැන්පතු පවත්වාගෙන යෑමේ අවශ්‍යතාව පිළිබඳ නියෝගය මගින් ආවරණය වන අයිතම ලැයිස්තුව

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය	අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය	අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය	අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
1	030441	38	081350	75	200860	112	220850
2	030449	39	081400	76	200870	113	220860
3	030451	40	090121	77	200897	114	220870
4	030461	41	090122	78	20089910	115	22089010
5	030462	42	09022019	79	20089990	116	240210
6	030469	43	09022093	80	20091110	117	24022020
7	030474	44	09022099	81	20091190	118	24022050
8	04029990	45	100490	82	200912	119	24022060
9	040310	46	110412	83	200949	120	24031920
10	040390	47	110419	84	200969	121	24031990
11	040510	48	110422	85	200971	122	24039190
12	040620	49	110423	86	200979	123	24039990
13	040630	50	110429	87	200981	124	33030010
14	040690	51	110430	88	20098990	125	33030021
15	060311	52	110510	89	200990	126	33030022
16	060490	53	110520	90	220210	127	33030029
17	08011190	54	110710	91	220291	128	330410
18	08011990	55	110720	92	22029910	129	330420
19	08021190	56	110814	93	22029930	130	330430
20	08023190	57	110900	94	22029940	131	330491
21	08028090	58	180620	95	22029951	132	330499
22	08041010	59	180631	96	22029959	133	330510
23	08041020	60	180632	97	22029961	134	330520
24	08051010	61	180690	98	22029969	135	330530
25	08052110	62	190211	99	22029970	136	330590
26	080610	63	190219	100	22029991	137	330610
27	080620	64	190220	101	22029999	138	330690
28	080810	65	190230	102	22030010	139	330710
29	080830	66	190240	103	22030020	140	330720
30	080940	67	190410	104	22030090	141	330730
31	081050	68	190420	105	220410	142	330749
32	08109090	69	200799	106	220421	143	33079090
33	081120	70	200811	107	220510	144	34011920
34	081190	71	20081910	108	220710	145	34012010
35	081320	72	20081920	109	220820	146	34013020
36	081330	73	20081990	110	220830	147	34029010
37	08134090	74	20083090	111	22084010	148	340510

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
149	340520
150	340530
151	34054010
152	34054090
153	340590
154	340600
155	38070010
156	38140010
157	38140090
158	381900
159	39262020
160	39262090
161	401519
162	401590
163	401691
164	401694
165	40169510
166	40169590
167	40169990
168	420100
169	420211
170	420212
171	420219
172	420221
173	420222
174	420229
175	420231
176	420232
177	420239
178	420291
179	420292
180	420299
181	420310
182	420321
183	420329
184	420330
185	420340
186	42050010
187	42050090
188	430400
189	441911
190	441990

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
191	442090
192	44219190
193	44219990
194	480300
195	48181010
196	48181090
197	481820
198	481830
199	48185090
200	48189020
201	48189090
202	570110
203	57019090
204	57022010
205	570231
206	570232
207	570241
208	570249
209	570292
210	570299
211	570320
212	570330
213	57039090
214	57049090
215	570500
216	610120
217	610130
218	610190
219	610210
220	610220
221	610230
222	610290
223	610310
224	610322
225	610323
226	610329
227	610331
228	610332
229	610333
230	610339
231	610341
232	610342

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
233	610343
234	610349
235	610413
236	610419
237	610422
238	610423
239	610429
240	610431
241	610432
242	610433
243	610439
244	610442
245	610443
246	610444
247	610449
248	610452
249	610453
250	610459
251	610461
252	610462
253	610463
254	610469
255	610510
256	610520
257	610590
258	610610
259	610620
260	610690
261	610721
262	610729
263	610791
264	610799
265	610831
266	610832
267	610839
268	610891
269	610892
270	610899
271	610910
272	610990
273	611011
274	611012

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
275	611019
276	611020
277	611030
278	611090
279	611120
280	611130
281	611190
282	611211
283	611212
284	611219
285	611231
286	611239
287	611241
288	611249
289	611300
290	611420
291	611430
292	611490
293	611510
294	611529
295	611530
296	611594
297	611595
298	611596
299	611599
300	611610
301	611691
302	611692
303	611693
304	611699
305	611710
306	61178010
307	61178020
308	620111
309	620112
310	620113
311	620119
312	620192
313	620193
314	620199
315	620211
316	620212

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
317	620213
318	620219
319	620291
320	620292
321	620293
322	620299
323	620311
324	62031290
325	62031990
326	62032290
327	62032390
328	62032990
329	620331
330	62033290
331	62033390
332	62033990
333	620341
334	62034290
335	62034390
336	62034911
337	62034990
338	62041290
339	62041390
340	62041990
341	62042290
342	62042390
343	62042990
344	620431
345	62043290
346	62043390
347	62043990
348	620441
349	62044219
350	62044290
351	62044390
352	62044419
353	62044490
354	62044990
355	62045290
356	62045390
357	62045990
358	620461

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
359	62046219
360	62046290
361	62046390
362	62046919
363	62046990
364	62052090
365	62053090
366	62059090
367	62061090
368	620620
369	62063090
370	62064019
371	62064090
372	62069090
373	62072290
374	62082190
375	62082290
376	62082990
377	62089190
378	620920
379	620930
380	620990
381	621010
382	621020
383	621030
384	621040
385	621050
386	621111
387	621112
388	621120
389	62113290
390	62113390
391	62113990
392	62114219
393	62114292
394	62114299
395	62114319
396	62114392
397	62114399
398	62114919
399	62114992
400	62114999

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
401	62132090
402	62139090
403	62141090
404	62144090
405	62149090
406	621510
407	621520
408	621590
409	621600
410	630110
411	630120
412	630130
413	630140
414	630190
415	630210
416	63022190
417	63022290
418	63022990
419	63023190
420	63023290
421	63023990
422	630240
423	63025190
424	63025990
425	63026090
426	63029190
427	63029390
428	63029990
429	630312
430	630319
431	630391
432	630392
433	630399
434	630411
435	63041990
436	630420
437	630491
438	63049290
439	63049390
440	63049990
441	63051010
442	63051090

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
443	630520
444	630532
445	630533
446	630539
447	630590
448	630612
449	630619
450	630622
451	630629
452	630630
453	630640
454	630690
455	630710
456	630720
457	630790
458	63079090
459	640110
460	640199
461	640212
462	64021910
463	64021919
464	640220
465	640291
466	640299
467	640312
468	64031910
469	64031919
470	640320
471	640340
472	640351
473	640359
474	640391
475	640399
476	640411
477	640419
478	640420
479	640510
480	640520
481	640590
482	650100
483	650200
484	650400

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
485	65050010
486	65050090
487	65061090
488	65069110
489	65069190
490	65069910
491	65069990
492	650700
493	660110
494	660191
495	660199
496	670300
497	670411
498	670419
499	670420
500	670490
501	691110
502	69120010
503	69120090
504	69139090
505	701310
506	701322
507	701328
508	701333
509	701337
510	701341
511	701342
512	701349
513	701391
514	70139990
515	701810
516	701820
517	701890
518	732111
519	732112
520	732119
521	732181
522	732182
523	732189
524	732310
525	732391

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
526	732392
527	732393
528	732394
529	732399
530	73241010
531	73241090
532	732421
533	732429
534	732490
535	74181090
536	741820
537	76151020
538	76151090
539	76152090
540	821000
541	821110
542	821191
543	821192
544	821194
545	82121010
546	82121090
547	82122090
548	821300
549	821410
550	821420
551	821490
552	821510
553	821520
554	821599
555	830300
556	830621
557	830629
558	830630
559	841451
560	841459
561	84151021
562	84151022
563	84151023
564	84151024
565	84151029
566	84151032

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
567	84151033
568	84151034
569	84151035
570	84151039
571	84158190
572	84158290
573	84158390
574	84159019
575	84159029
576	84181090
577	84182190
578	84182920
579	84182990
580	84231020
581	84501110
582	84501131
583	84501132
584	84501133
585	84501134
586	84501139
587	84501141
588	84501142
589	84501143
590	84501144
591	84501149
592	84501210
593	84501231
594	84501232
595	84501233
596	84501234
597	84501239
598	84501910
599	84501931
600	84501932
601	84501933
602	84501934
603	84501939
604	850811
605	850940
606	850980
607	851010

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
608	851020
609	851030
610	85131010
611	85131090
612	851610
613	851621
614	851629
615	851631
616	851632
617	851633
618	851640
619	851650
620	85166010
621	85166090
622	851671
623	851672
624	85167910
625	85167920
626	85167990
627	851680
628	851711
629	85171210
630	85171220
631	85171290
632	851718
633	85258090
634	852712
635	852713
636	852719
637	852721
638	852729
639	852791
640	852792
641	852799
642	85285990
643	852869
644	85287120
645	85287190
646	85287210
647	85287231
648	85287232

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
649	85287233
650	85287234
651	85287235
652	85287236
653	85287239
654	85287241
655	85287249
656	85287291
657	85287299
658	85287320
659	85287390
660	85291010
661	85291030
662	85291090
663	852990
664	853910
665	85392110
666	85392190
667	85392210
668	85392220
669	85392290
670	853929
671	85392910
672	85392990
673	85393110
674	85393190
675	853932
676	853939
677	853941
678	853949
679	853950
680	853990
681	900410

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
682	900490
683	900510
684	900580
685	910111
686	91011990
687	910121
688	910129
689	910191
690	910199
691	910211
692	910212
693	910219
694	910221
695	910229
696	910291
697	910299
698	910511
699	910519
700	910521
701	910529
702	910700
703	920110
704	920120
705	920190
706	920210
707	920290
708	920510
709	920590
710	920600
711	920710
712	920790
713	920890
714	94012090

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
715	94013090
716	94017190
717	94019090
718	94032090
719	94039090
720	94051010
721	94051020
722	94051090
723	94052010
724	94052020
725	94052090
726	940530
727	94054010
728	94054020
729	94054030
730	94054040
731	94054090
732	94055010
733	94055020
734	94055090
735	940560
736	940591
737	940592
738	94059910
739	94059990
740	95030010
741	95030030
742	95030050
743	95030070
744	95030080
745	95030090
746	950420
747	950440

අංකය	සංයෝජිත වර්ගීකරණ අංකය
748	950450
749	95049090
750	950510
751	950590
752	95062910
753	95062920
754	95062990
755	950631
756	950651
757	950659
758	950661
759	950662
760	950669
761	950691
762	950699
763	950720
764	950790
765	950890
766	960340
767	960400
768	960500
769	961310
770	961320
771	961390
772	961511
773	961519
774	961590
775	96161010
776	96161090
777	96170090
778	961800
779	962000

චක්‍රලේඛ අංක: 2022 අංක 01

2022 නොවැම්බර් 03

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත,

අත්තිකාරම් සඳහා වූ ශ්‍රී ලංකා මහ බැංකු පොලී අනුපාතිකය (බැංකු අනුපාතිකය)

2022 නොවැම්බර් 03 දින සිට බලපැවැත්වෙන පරිදි මහ බැංකුව විසින් හදිසි අවස්ථාවල දී වාණිජ බැංකු වෙත ලබාදෙන අතිවිශේෂණය සහ අත්තිකාරම් සඳහා භාවිතා කරන මහ බැංකුව විසින් තීරණය කරනු ලබන පොලී අනුපාතිකය (Bank Rate), එම අවස්ථාවේ පවතින මහ බැංකුව මගින් ප්‍රසිද්ධියට පත් කරනු ලබන බරිත සාමාන්‍ය නව තැන්පතු අනුපාතිකය (Average Weighted New Deposit Rate (AWNDR)) මත පදනම් අංක +700 ආන්තිකයක් එකතු කොට තීරණය කරනු ලබන බව සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

ආචාර්ය ආර්. ඒ. අනිල් පෙරේරා
අධ්‍යක්ෂ/දේශීය මෙහෙයුම් කටයුතු

මාර්ගෝපදේශ අංක : 01/2022 2022 ජනවාරි 10
යොමු අංකය : 037/06/008/0006/020

මූල්‍ය ආයතනවල විධායක නිලධාරීන්/සාමාන්‍යාධිකාරීවරුන් සහ කළමණාකරණ අධ්‍යක්ෂවරු වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

මුදල් විශුද්ධිකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීමේ අරමුණ ඇතිව සංවෘත පරිපථ රූපවාහිනී පද්ධති (CCTV) මෙහෙයුම් සම්බන්ධයෙන් මූල්‍ය ආයතන වෙත නිකුත් කරනු ලබන 2021 අංක 02 දරන මාර්ගෝපදේශයන් සඳහා සංශෝධන

2021 ජූලි 20 වන දින නිකුත් කරන ලද ඉහත මාර්ගෝපදේශයන්ට අතිරේකව මෙය නිකුත් කෙරේ.

ඉහත මාර්ගෝපදේශ වල 15 වැනි වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

15. මූල්‍ය ආයතන සිය **CCTV** පද්ධතියේ පටිගතවන සියළු තොරතුරු අවම වශයෙන් දින 90 ක කාලපරිච්ඡේදයක් පුරා පවත්වාගෙන යාම සිදු කළ යුතු වේ.

මීට විශ්වාසී

ඩී.ආර්. කරුණාරත්න
අධ්‍යක්ෂ,
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්: 1. අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
2. අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
3. අධ්‍යක්ෂ ජෙනරාල්, ශ්‍රී ලංකා සුරැකුම්පත් හා විනිමය කොමිෂන් සභාව
4. අනුකූලතා නිලධාරීන්, සියළුම මූල්‍ය ආයතන

චක්‍රලේඛ අංක : 02/22 2022 මාර්තු 22

යොමු අංකය : 037/05/002/0005/022

මූල්‍ය ආයතනවල සාමාන්‍යාධිකාරීවරුන් / ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

සැක කටයුතු ගනුදෙනු වාර්තා පිළිබඳ වැඩිදුර තොරතුරු ඉල්ලීම

සැක කටයුතු ගනුදෙනු වාර්තා හා සබැඳි "තොරතුරු කැඳවීම්" වලට අදාල වාර්තා මූල්‍යායතන මගින් සැපයීමේ දී යම් ප්‍රමාදයක් සිදුවන බව ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය නිරීක්ෂණය කර ඇත. එබැවින් සැක කටයුතු ගනුදෙනු වාර්තාවලට අදාල අතිරේක තොරතුරු සැපයීමේ දී මූල්‍ය ආයතන පහත සඳහන් නිශ්චිත කාල රාමුවලට අනුගත විය යුතුය.

- "ඉතා හදිසියි" තොරතුරු ඉල්ලීම් සඳහා මූල්‍යායතන පැය විසි හතරක් තුළ හෝ ඉල්ලීමේ සඳහන් ආකාරයට තොරතුරු සැපයීම අවශ්‍යයි.
- "හදිසියි" තොරතුරු ඉල්ලීම් සඳහා ලිපියෙහි සඳහන් දින සිට වැඩ කරන දින තුනක් ඇතුලත දී මූල්‍යායතන විසින් තොරතුරු සැපයීම අවශ්‍යයි.
- අනෙකුත් තොරතුරු ඉල්ලීම් සඳහා ලිපියෙහි සඳහන් දින සිට සති 2 ක් ඇතුළත මූල්‍යායතන විසින් තොරතුරු සැපයීම අවශ්‍යයි.

2006 අංක 06 දරන මුදල් ගනුදෙනු වාර්තා කිරීම් පනත, 2016 අංක 01 දරන මූල්‍යායතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‌යෝගයෙන් ක්‍රියාකිරීමේ) රීති සහ ඒ යටතේ නිකුත් කර ඇති අනෙකුත් නීති රීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශ වලට අනුකූල වීම සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා මූල්‍ය බුද්ධි ඒකකය විසින් කරන ලද තොරතුරු ඉල්ලීම් වලට ප්‍රතිචාර දැක්වීමේ දී ඉහත සඳහන් කාල නියමයන්ට දැඩි ලෙස අනුකූලවන ලෙස ඔබෙන් ඉල්ලා සිටිමු.

මීට විශ්වාසී
අධ්‍යක්ෂ,
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්: අනුකූලතා නිලධාරීන්

මාර්ගෝපදේශ අංක: 03/2022 2022 අගෝස්තු 25

යොමු අංකය: 037/06/006/0005/022

බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල විධායක නිලධාරීන්, සාමාන්‍යාධිකාරීවරුන්, කළමණාකරණ අධ්‍යක්ෂවරු වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි,

විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් සඳහා කාර්යක්ෂම බැංකු සේවාවන් සැපයීමට අදාල ප්‍රතිපාදන

රටේ වත්මන් ආර්ථික තත්ත්වය සළකා බැලීමේදී, ජාතික නීති සහ එම නීති යටතේ නිකුත් කර ඇති රීති, රෙගුලාසි, චක්‍රලේඛ සහ නියෝග පිළිපදිමින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ආකර්ෂණය කර ගැනීම අතිශයින් වැදගත් වේ.

විදේශගතව සිට බලපත්‍රලාභී වාණිජ බැංකු වල සහ බලපත්‍රලාභී විශේෂිත බැංකු වල ගිණුම් ආරම්භ කිරීමේදී සහ එම ගිණුම් හරහා අරමුදල් හුවමාරු කිරීමේදී විදෙස්ගත ශ්‍රී ලාංකික ශ්‍රමිකයන් මුහුණ දෙන දුෂ්කරතා පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවට සහ මූල්‍ය බුද්ධි ඒකකයට ලැබී ඇති පැමිණිලි පිළිබඳව අපගේ අවධානය යොමුවී ඇත.

එම පැමිණිලි බොහොමයක පහත දෑ ඇතුළත් වේ:

1. කාර්ය මණ්ඩලය විසින් සේවාවන් සම්පූර්ණ කිරීමට ගනු ලබන අසාධාරණ දිගු කාලය
2. විදේශයන්හි සිට දේශීය ගිණුම් වලට අරමුදල් බැර කිරීමට ගන්නා ප්‍රමාදයන් සහ දිගු කාල සීමාව
3. බැංකු කාර්ය මණ්ඩලය විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ/ මූල්‍ය බුද්ධි ඒකකයේ චක්‍රලේඛ වැරදි ලෙස අර්ථකථනය කිරීම සහ ගණුදෙනුකරුවන් වැරදි ලෙස දැනුවත් කිරීම

මෙම පැමිණිලි වලින් වැඩි ප්‍රමාණයක් සංකේන්ද්‍රණය වී ඇත්තේ ප්‍රාදේශීය සහ පිට පළාත් වල ශාඛාවන් පවත්වා ගෙන යාමේදී ය.

ඒ අනුව ප්‍රාදේශීය සහ පිට පළාත් වල ශාඛාවන් මගින් ප්‍රේෂණ ආකර්ෂණය කර ගැනීමේ ක්‍රියාවලිය විධිමත් කිරීමට ඔබගේ අවධානය යොමු කෙරේ.

මීට විශ්වාසී,
ඊ. එච්. මොහොට්ටි
අධ්‍යක්ෂ,
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්: 1. අධ්‍යක්ෂ, බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව, ශ්‍රී ලංකා මහ බැංකුව
2. අනුකූලතා නිලධාරීන්, සියළුම මූල්‍ය ආයතන

චක්‍රලේඛ : 04/2022 2022 නොවැම්බර් 21
යොමුව : 037/05/003/0005/022

මූල්‍ය ආයතනවල සාමාන්‍යාධිකාරීවරුන් / ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

ආගමන හා විගමන දෙපාර්තමේන්තුව හරහා ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ තොරතුරු සත්‍යාපනය කිරීම

2016 අංක 1 දරන මූල්‍ය ආයතන (ගනුදෙනුකරුවන් පිළිබඳ නිසි උද්‌යෝගයෙන් ක්‍රියා කිරීමේ) රීති ප්‍රකාර අවශ්‍ය වන, ගනුදෙනුකරුවන් හඳුනාගැනීමේ තොරතුරු සත්‍යාපනය කිරීමේ සේවාව සැපයීමට ආගමන හා විගමන දෙපාර්තමේන්තුව එකඟ වී ඇත.

ඉහත සේවාව ලබා ගැනීමට ඔබේ ආයතනය උනන්දුවක් දක්වන්නේ නම්, ආගමන විගමන පාලක ජනරාල් අයි. එස්. එච්. ජේ. ඉළුක්පිටිය මහතා වෙත ඉල්ලීමක් එවිය හැකිය. එම සේවාව ලබා ගැනීම සඳහා ඔබ ආයතනය විසින්, පුද්ගලයන් ලියාපදිංචි කිරීමේ දෙපාර්තමේන්තුව සමඟ දැනට පවත්වාගෙන යන වැඩපිළිවෙලට සමාන ආකාරයේ අවබෝධතා ගිවිසුමක්, ආගමන හා විගමන දෙපාර්තමේන්තුව සමඟ අත්සන් කිරීමට අවශ්‍ය වන බව කරුණාවෙන් සලකන්න.

මෙයට විශ්වාසී,
අධ්‍යක්ෂ,
මූල්‍ය බුද්ධි ඒකකය

පිටපත්: 1. අයි. එස්. එච්. ජේ. ඉළුක්පිටිය මහතා, ආගමන විගමන පාලක ජනරාල්
2. අනුකූලතා නිලධාරී

යොමුව: 69/02/002/0002/001 2022 ජනවාරි 19

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත

විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මෙරටට එවීමේදී දැරීමට සිදුවන ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා වන මෙහෙයුම් උපදෙස්

විධිමත් මුදල් හුවමාරු මාර්ග හරහා රටතුළට එන විදේශීය ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණ තවදුරටත් දිරිමත් කිරීමේ අරමුණින් ඔවුන් විසින් මෙරටට විදේශ මුදල් එවීමේ දී දැරීමට සිදුවන ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණයක් ලෙස එක් ගනුදෙනුවකට රුපියල් 1,000ක ස්ථාවර ගෙවීමක්, දිරිගැන්වීමක් ලෙස ලබාදීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇත. ඒ අනුව, මෙම යෝජනා ක්‍රමය 2022.02.01 දින සිට බලපැවැත්වෙන පරිදි ක්‍රියාත්මක කිරීමේ දී පහත සඳහන් මෙහෙයුම් උපදෙස්වලට අනුගතවන ලෙසට සියලුම බලපත්‍රලාභී බැංකු වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

1. සුදුසුකම්ලත් ගනුදෙනු **(Eligible Transactions)**

විදේශයන්හි සේවය කරන/ විදේශයන්හි සේවය කර ඇති ශ්‍රී ලාංකිකයන් විසින් රැකියාවක් මාර්ගයෙන් උපයන ලද විදේශ මුදල් හා ඔවුන්ගේ ප්‍රතිලාභීන්ට එවූ විදේශ මුදල් ශ්‍රී ලංකාවේ බලපත්‍රලාභී බැංකු හරහා ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමේ දී මෙම දිරිගැන්වීමේ යෝජනා ක්‍රමය සඳහා සුදුසුකම් ලබයි.

ශ්‍රී ලංකා මහ බැංකුව විදේශ ශ්‍රමිකයින්ගේ ප්‍රේෂණවලට අදාළ ගනුදෙනු පිරිවැය පහත සඳහන් කොන්දේසි වලට යටත්ව ප්‍රතිපූරණය කරනු ඇත.

(i) සෑම විදේශ සේවා නියුක්තිකයෙකු හෝ ඔහුගේ / ඇයගේ ප්‍රතිලාභියෙකුට මසකට ගනුදෙනු දෙකක් සඳහා පමණක් මෙම දිරිදීමනාව ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

(ii) පුද්ගලික විදේශ මුදල් ගිණුම් (Personal Foreign Currency Accounts) වෙත සෘජු අරමුදල් හුවමාරු කිරීම හරහා සිදුවන ගනුදෙනු මෙම දිරිදීමනාව ලබා ගැනීම සඳහා සුදුසුකම් නොලබයි.

(iii) ශ්‍රී ලංකාවේ පදිංචිව සිට විදේශ රැකියාවක ආකාරයේ සේවාවක් සැපයීම තුළින් ශ්‍රී ලාංකික පුරවැසියෙකු විසින් උපයන විදේශ විනිමය ආදායම, මෙම දිරිදීමනාව ලබා ගැනීමට සුදුසුකම් නොලබයි.

2. මෙහෙයුම් ක්‍රමවේදය (Operating Framework)

(i) බලපත්‍රලාභී බැංකු විසින් සෑම සුදුසුකම්ලත් ගනුදෙනුවකටම රුපියල් 1,000 බැගින් වූ මුදලක් බැර කිරීම හෝ ප්‍රතිලාභීන්ට ලබාදීම කළ යුතුය.

(ii) අතරමැදි බැංකුවක් හරහා ලැබෙන ප්‍රේෂණ සම්බන්ධයෙන් ගත් කළ, ප්‍රතිලාභියාගේ රුපියල් ගිණුම පවත්වාගෙන යන හෝ ප්‍රතිලාභියාට අවසන් වශයෙන් රුපියල් ගෙවීම් සිදුකරනු ලබන බැංකුව විසින් මෙම රුපියල් 1,000ක දිරිදීමනාව බැර කිරීම හෝ ගෙවීම කළ යුතුය.

(iii) බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රතිපූරණය කිරීමට අදාළ හිමිකම් පෑම ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසු කිරීමේ දෙපාර්තමේන්තුව වෙත කාර්තුමය වශයෙන් ඉදිරිපත් කළ යුතු අතර, එය ඇමුණුම 1හි දක්වා ඇති ආකෘතියට අනුව සෑම කාර්තුවක්ම අවසන් වී දින 15ක් ඇතුළත සිදුකළ යුතුය.

(iv) බැංකු විසින් සිදු කරනු ලබන හිමිකම්පෑම්, ඉදිරිපත් කිරීමට පෙරාතුව මහ බැංකුව විසින් නිකුත් කරන ලද උපදෙස්වලට අනුකූලදැයි තහවුරු කරගැනීම පිණිස සියලුම ප්‍රතිපූරණ හිමිකම්, බලපත්‍රලාභී බැංකුවල අභ්‍යන්තර විගණන දෙපාර්තමේන්තුව විසින් විගණනය කළ යුතුය.

3. ගිණුම්කරණය හා වාර්තා තබා ගැනීම (Accounting and Record Keeping)

ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණයට අදාළ සියලුම අවශ්‍ය කරන ලිපිලේඛන සමග ගිණුම් හා වාර්තා වෙනවෙනම බලපත්‍රලාභී බැංකු විසින් පවත්වාගෙන යා යුතුය.

4. විදේශගත සේවා නියුක්තිකයින් අතර මෙම යෝජනා ක්‍රමය පිළිබඳව දැනුම්වත් කිරීම ප්‍රවර්ධනය කිරීම සඳහා ඉහත යෝජනා ක්‍රමයේ අන්තර්ගතය පිළිබඳව, ප්‍රේෂණ සම්බන්ධව අදාළ බැංකු හා සමීපව කටයුතු කරන සියලුම විදේශීය ආයතන වෙත දැනුම්දෙන ලෙස සියලුම බලපත්‍රලාභී බැංකුවලට උපදෙස් දෙනු ලැබේ.

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් ලබාගැනීම සඳහා 0112477448, 0112398754 හෝ 0112477426 දුරකථන අංක ඔස්සේ ඔබට ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ විය හැකිය.

අජිත් නිවාඩ් කබ්රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

ඇමුණුම I

..... ආයතනික ලිපි ශීර්ෂය.....

බැංකුව : .....

වාර්තා කරන කාලපරිච්ඡේදය : .....න් අවසන් වන කාර්තුව සඳහා

විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මෙරටට එවීමේදී දැරීමට සිදුවන ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීම.

(අ) දිනය	(ආ) මුළු ප්‍රේෂණ ගලා ඒම එ.ජ. ඩොලර් වලින්*	(ඇ) මුළු ගනුදෙනු සංඛ්‍යාව	(ඈ) බලපත්‍රලාභී බැංකු වෙත සෘජුවම යොමු කරන ලද සහ ශ්‍රී ලංකා රුපියල් වලින් අවසාන ප්‍රතිලාභීන් වෙත බැර කරන ලද/ලබාදෙන ලද සුදුසුකම් ලත් ගනුදෙනු සංඛ්‍යාව	(ඉ) අනෙකුත් බලපත්‍රලාභී බැංකු හරහා යොමු කර ශ්‍රී ලංකා රුපියල් වලින් අවසාන ප්‍රතිලාභීන් වෙත බැර කරන ලද/ලබාදෙන ලද සුදුසුකම් ලත් ගනුදෙනු සංඛ්‍යාව	(ඊ) ප්‍රතිපූරණය සඳහා සුදුසුකම් ඇති මුළු ගනුදෙනු සංඛ්‍යාව (ඈ+ඉ)	(උ) සුදුසුකම්ලත් මුළු ගනුදෙනු සංඛ්‍යාවට (ඊ) අනුරූපව මුළු ප්‍රේෂණ ගලා ඒම (එ.ජ. ඩොලර්*)	(ඌ) ඉල්ලා සිටින මුළු මුදල (රුපියල්)

* බලපත්‍රලාභී බැංකු ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන දෛනික විනිමය අනුපාතික භාවිතා කළ යුතුය.

ඉහත ප්‍රකාශනයේ අඩංගු තොරතුරු නිරවද්‍ය සහ සම්පූර්ණ වන අතර බැංකුවේ පවත්වාගෙන යනු ලබන ගිණුම් පොත් සහ ගනුදෙනු වලට අදාළ ලැයිස්තු/ වාර්තා වලින් උපුටා ගෙන ඇති බව අපි සහතික කරමු.

අත්සන				
නම				
තනතුර	ප්‍රධාන විධායක නිලධාරී	ප්‍රධාන අනුකූලතා නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී	අභ්‍යන්තර විගණන ප්‍රධානී
දිනය				

යොමුව: 69/02/002/0002/002 2022 ජනවාරි 27

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත

විදේශ සේවා නියුක්තිකයින්ගේ ප්‍රේෂණ මෙරටට එවීමේදී දැරීමට සිදුවන ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීම සඳහා වන මෙහෙයුම් උපදෙස්වලට අදාළ සංශෝධන

මෙය 2022.01.19 දින නිකුත් කරන ලැබූ (යොමුව: 69/02/002/0002/001) විදේශීය ප්‍රේෂණවල ගනුදෙනු පිරිවැය ප්‍රතිපූරණය කිරීම හා සම්බන්ධ මෙහෙයුම් උපදෙස්වලට අදාළ වේ.

එකී මෙහෙයුම් උපදෙස් සම්බන්ධයෙන් පහත සංශෝධන සිදු කරනු ලැබේ.

(අ) 1 (ii) ප්‍රකාශය පහත පරිදි සංශෝධනය කෙරේ.

මසකට රුපියල් 20,000ක් හෝ ඊට වැඩියෙන් විදේශ විනිමය රටතුළට ප්‍රේෂණය කරන එක් එක් විදේශ සේවා නියුක්තිකයෙකු හෝ ඔහුගේ / ඇයගේ ප්‍රතිලාභියෙකු මෙම දිරිදීමනාව ලබා ගැනීමට සුදුසුකම් ලබයි.

(ආ) 1 (iii) ප්‍රකාශය අවලංගු කෙරේ.

2022.01.19 දින නිකුත් කරනු ලැබූ මෙහෙයුම් උපදෙස්වල අනෙකුත් සියලුම කොන්දේසි වෙනසකින් තොරව බලපැවැත්වේ.

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් ලබාගැනීම සඳහා 0112477448, 0112398754 හෝ 0112477426 දුරකථන අංක ඔස්සේ ඔබට ශ්‍රී ලංකා මහ බැංකුවේ විදේශීය ප්‍රේෂණ ප්‍රවර්ධනය පහසුකිරීමේ දෙපාර්තමේන්තුව හා සම්බන්ධ විය හැකිය.

අජිත් නිවාඩ් කබ්රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

අපගේ යොමුව : 33/04/012/0012/001 2022 ජනවාරි 31

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන අතිරේක දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අතැ'ති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම වෙනුවෙන් සාමාන්‍ය ජනතාව වෙත ලබාදෙන දිරි දීමනා" පිළිබඳ මෙහෙයුම් උපදෙස් බලපැවැත්වෙන කාල සීමාවන් දීර්ඝ කිරීම

මෙය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2021.12.01 දින නිකුත් කරන ලද (යොමුව: 33/04/012/0011/014) "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන අතිරේක දිරි දීමනා යෝජනා ක්‍රමය" සඳහා වන මෙහෙයුම් උපදෙස් සහ 2021.12.27 දින නිකුත් කරන ලද (යොමුව: 33/04/012/0011/017) "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන දිරි දීමනා යෝජනා ක්‍රමය", "අපනයන ආදායම් ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම", "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන අතිරේක දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අතැ'ති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා සාමාන්‍ය ජනතාව වෙත ලබාදෙන දිරි දීමනා" සඳහා වන සංශෝධිත මෙහෙයුම් උපදෙස් සඳහා අදාළ වේ.

විදේශයන්හි සේවය කරන ශ්‍රී ලාංකිකයින්ගේ ප්‍රතිලාභීන්ට සහ ශ්‍රී ලංකාවේ පදිංචිව සිටිමින් විදේශ රැකියාවකින් විදේශ මුදල් ආදායම් උපයන ශ්‍රී ලාංකිකයින්ට ලැබෙන මූල්‍යමය වාසි ද, එමගින් විධිමත් මාර්ග ඔස්සේ රටට ලැබෙන විදේශ විනිමය ගලාඒම්හි අපේක්ෂිත වර්ධනය සහ විධිමත් බැංකු පද්ධතිය හරහා විදේශ මුදල් නෝට්ටු ගලායෑම ප්‍රවර්ධනය කිරීම ද සලකාබලමින්, "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන අතිරේක දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අතැ'ති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා සාමාන්‍ය ජනතාව වෙත ලබාදෙන දිරි දීමනා" සඳහා වූ මෙහෙයුම් උපදෙස් බලපැවැත්වෙන කාලසීමාව නැවත දැනුම්දෙන තුරු දීර්ඝ කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කරන ලදී.

ඒ අනුව, ඉහත මෙහෙයුම් උපදෙස් යටතේ පිරිනමනු ලබන දිරිදීමනා නැවත දැනුම්දෙන තුරු දීර්ඝ කරන බව සියලුම බලපත්‍රලාභී බැංකු වෙත මෙයින් දන්වා සිටින අතර, බලපත්‍රලාභී බැංකු විසින් ප්‍රතිපූරණය සඳහා අදාළ හිමිකම් ඉල්ලුම්පත්‍ර, පසුව එළඹෙන මාසයේ 15 වැනි දින වන විට, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ඉදිරිපත් කළ යුතු වේ. තව ද, සාමාන්‍ය ජනතාව අතැ'ති විදේශ මුදලින් ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලද අගයෙන් සියයට විසිපහක් (25%) නැවත දැනුම්දෙන තුරු, සතිපතා, ශ්‍රී ලංකා මහ බැංකුවට විකුණන ලෙස බලපත්‍රලාභී බැංකුවලින් මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

ඉහත යෝජනා ක්‍රම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්වල දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා නොවෙනස්ව පවතිනු ඇත.

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, 0112398707, 0112398711 හෝ 0112398708 දුරකථන ඔස්සේ ඔබට ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ විය හැකි ය.

අජිත් නිවාඩ් කබ්රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

2022 මාර්තු 08

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ බලපත්‍රලාභී විශේෂිත බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

පුළුල් සාර්ව ආර්ථික ස්ථායීතාවයක් සඳහා සහය වීමට අවශ්‍ය ප්‍රතිපත්ති මාලාව: විනිමය අනුපාතිකයේ නම්‍යශීලීභාවයට ඉඩ ලබා දීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2022 මාර්තු 07 දින සිට වහාම ක්‍රියාත්මක වන පරිදි විනිමය අනුපාතිකයට ඉහළ නම්‍යශීලීභාවයක් ලබා දීමට තීරණය කරන ලද අතර, ශ්‍රී ලංකා මහ බැංකුවේ අදහස වන්නේ එක්සත් ජනපද ඩොලර් සහ අනෙකුත් සමානුපාතික හරස් මුදල් (cross currency) විදේශ විනිමය ගනුදෙනු, එක්සත් ජනපද ඩොලරයකට සාපේක්ෂව රු. 230.00ක් නොඉක්මවා සිදු වනු ඇති බවයි. මුදල් මණ්ඩලයේ ඉහත තීරණයට අනුව, 2021 සැප්තැම්බර් 06 වන දින එවකට සිටි අධිපතිවරයා විසින් ඉල්ලා සිටින ලද විධිමත් ලෙස එකඟ වූ විනිමය අනුපාත පරාසය 2022 මාර්තු 08 දින සිට ක්‍රියාත්මක නොවනු ඇත.

විනිමය අනුපාතිකයේ ඉහළ නම්‍යශීලීභාවයකට මේ වන විට අවසර දී ඇති බැවින්, "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන අතිරේක දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අතැ'ති විදේශ මුදල් තැන්පත් කිරීම, පරිවර්තනය කිරීම සහ ආයෝජනය කිරීම සඳහා සාමාන්‍ය ජනතාව වෙත ලබාදෙන දිරි දීමනා" සඳහා නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් අනුව, පිළිවෙලින් විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ පරිවර්තනය කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක්සත් ජනපද ඩොලරයක් සඳහා ගෙවනු ලබන රු. 8.00ක් වන දිරි දීමනාව සහ අතැ'ති විදේශ මුදල් නෝට්ටු පරිවර්තනය කිරීමේ දී එක්සත් ජනපද ඩොලරයක් සඳහා ගෙවනු ලබන රු. 10.00ක් වන දිරි දීමනාව 2022.03.09 දින සිට බලපැවැත්වෙන පරිදි ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අත්හිටුවනු ලැබේ.

ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් සහ අනිවාර්යයෙන් ම පරිවර්තනය කළ යුතු අපනයන ලැබීම්වලින් 25%ක් බැංකු විසින් මහ බැංකුවට විකිණීමේ අවශ්‍යතාවය තවදුරටත් බලපැවැත්වෙනු ඇත.

විදේශගත ශ්‍රමිකයන් විසින් ප්‍රේෂණය කරන ලද මුදල් පරිවර්තනය කිරීමේ දී නව දිරි දීමනාවක් ලබාදීම සඳහා රජය විසින් මෑතක දී ගත් තීරණය පිළිබඳව ඉදිරියේ දී රජය විසින් පැහැදිලි කිරීමක් කරනු ඇත.

අජිත් නිවාඩ් කබ්‍රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

අපගේ යොමුව: 33/04/012/0012/002 2022 මාර්තු 22

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" පිළිබඳ මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධන

2021 දෙසැම්බර් 27 වැනි දින ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්වලට අනුව, සියලුම බලපත්‍රලාභී බැංකු විසින්, ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් (විවිධ මුදල් ඒකකවලින් ලැබෙන) සහ අපනයන ආදායමෙන් ඉතිරි වන අගය ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීමෙන් ලැබෙන මුදලින් **සියයට විසිපහක් (25%)** වූ විදේශ විනිමය, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සතිපතා එක්සත් ජනපද ඩොලර්වලින් විකුණනු ලැබේ. මෙම විදේශ විනිමය මිලදී ගැනීම්, රටේ අත්‍යවශ්‍ය ආනයන සඳහා අවශ්‍ය වන විදේශ විනිමය මූල්‍යනය කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවට උපකාර වී ඇත.

මේ සම්බන්ධයෙන් මෑත කාලීන ප්‍රවණතා සැලකිල්ලට ගනිමින්, රටේ විදේශ සංචිත තවදුරටත් ඉහළ නංවාගැනීමේ අවශ්‍යතාවය සහ අත්‍යවශ්‍ය ආනයන (විශේෂයෙන් ම, ඉන්ධන, ගෑස්, ගල් අඟුරු සහ ඖෂධ) අඛණ්ඩව සැපයීම සහතික කිරීම සඳහා, ශ්‍රී ලංකා රුපියල්වලට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් (විවිධ මුදල් ඒකකවලින් ලැබෙන) සහ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්ය වන අපනයන ආදායමෙන් ඉතිරි වන අගයෙන්, **සියයට පනහක් (50%)**, 2022.03.21 වන දිනෙන් ආරම්භ වන සතියේ සිට 2022.07.29 දිනෙන් අවසන් වන සතිය දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සතිපතා එක්සත් ජනපද ඩොලර්වලින් විකිණීම සිදුකළ යුතු බව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සියලුම බලපත්‍රලාභී බැංකු වෙත මෙයින් නියමකරනු ලැබේ.

ඉහත යෝජනා ක්‍රම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්වල දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා නොවෙනස්ව පවතිනු ඇත.

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, 0112398707, 0112398711 හෝ 0112398715 දුරකථන ඔස්සේ ඔබට ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ විය හැකි ය.

අජිත් නිවාඩ් කබ්‍රාල්
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

අපගේ යොමුව: 33/04/012/0012/003 2022 අප්‍රේල් 11

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" පිළිබඳ මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධන

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන දිරි දීමනා යෝජනා ක්‍රමය" සහ "අපනයන ආදායම ශ්‍රී ලංකාවට ආපසු ගෙන්වා ගැනීම" සම්බන්ධයෙන් නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් හා සබැඳේ.

දේශීය විදේශ විනිමය වෙළඳපොළේ පවත්නා තත්ත්වය සහ බලපත්‍රලාභී බැංකුවල විදේශ විනිමය පිළිබඳ වගවීම් සැලකිල්ලට ගනිමින්, 2022.04.11 දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන ලද විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සහ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්ය වන අපනයන ආදායමේ ඉතිරිය වෙනුවෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට සිදුකරන අනිවාර්ය විදේශ විනිමය විකුණුම් අවශ්‍යතාවය **සියයට පනහේ (50%)** සිට **සියයට විසිපහක් (25%)** දක්වා අඩු කිරීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇත.

ඒ අනුව, සියලුම බලපත්‍රලාභී බැංකු ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරනු ලබන විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණවලින් (විවිධ මුදල් ඒකකවලින් ලැබුණු) සහ ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කිරීම අනිවාර්ය වන අපනයන ආදායමේ ඉතිරියෙන් **සියයට විසිපහක් (25%)**, 2022.04.11 දිනෙන් ආරම්භ වන සතියේ සිට නැවත දැනුම්දෙන තුරු, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සතිපතා එක්සත් ජනපද ඩොලර්වලින් විකුණන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව මෙයින් ඉල්ලා සිටිනු ලැබේ.

ඉහත යෝජනා ක්‍රම සම්බන්ධයෙන් මීට පෙර නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්හි දක්වා ඇති අනෙකුත් අවශ්‍යතා තවදුරටත් නොවෙනස්ව පවතී.

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, ඔබට 0112398707, 0112398711 හෝ 0112398715 දුරකථන ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ විය හැකි ය.

ආචාර්ය නන්දලාල් වීරසිංහ
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

අපගේ යොමුව: 33/04/012/0012/004 2022 මැයි 12

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

විනිමය අනුපාතිකයේ දෛනිකව සිදුවන විචලනය කළමනාකරණය කිරීම පිළිබඳ මෙහෙයුම් උපදෙස්

දේශීය විදේශ විනිමය වෙළඳපොළෙහි පවත්නා තත්ත්වය සහ විනිමය අනුපාතිකයෙහි පවතින අධික විචලනය සැලකිල්ලට ගනිමින්, විදේශ විනිමය වෙළඳපොළෙහි/ විනිමය අනුපාතිකයෙහි විධිමත්භාවය සඳහා පහසුකම් සැලසීම සඳහා පහත සඳහන් ක්‍රියාමාර්ග හඳුන්වාදීමට මුදල් මණ්ඩලය විසින් තීරණය කරන ලදී.

ඒ අනුව, 2022 මැයි 13 දින සිට බලපැවැත්වෙන පරිදි, අන්තර් බැංකු ගනුදෙනු සඳහා අදාළ වන අන්තර් බැංකු වෙළඳපොළෙහි පෙර දින පැවති බර තබන ලද සාමාන්‍ය එතැන් විනිමය අනුපාතිකය මත පදනම් වූ, එ.ජ.ඩො./ ශ්‍රී.ලං. රුපියල් මධ්‍ය විනිමය අනුපාතිකයක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත්කරනු ලබන බව සියලුම බලපත්‍රලාභී බැංකු වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ. තව ද, එ.ජ.ඩො/ ශ්‍රී. ලං. රුපියල් විනිමය අනුපාතිකය විචලනය විය හැකි විචල්‍ය ආන්තික පරාසය (variation margin) ද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දෛනිකව වෙළඳපොළ විවෘත වීමට ප්‍රථම ප්‍රකාශයට පත් කෙරෙනු ඇත. අනෙකුත් මුදල් වර්ග සඳහා අදාළ වන විනිමය අනුපාතික, ප්‍රකාශිත එ.ජ.ඩො./ ශ්‍රී.ලං. රුපියල් විනිමය අනුපාතිකය සහ විචල්‍ය ආන්තිකය මත පදනම් ව බලපත්‍රලාභී බැංකු විසින් තීරණය කළ යුතු වේ.

දිනය තුළ අන්තර් බැංකු වෙළඳපොළෙහි විනිමය අනුපාතිකයේ විචල්‍ය ආන්තිකය අවසරලත් පරාසය තුළ පැවතිය යුතු අතර, එය ප්‍රකාශයට පත් කරන ලද අන්තර් බැංකු එ.ජ.ඩො/ ශ්‍රී. ලං. රුපියල් එතැන් විනිමය අනුපාතිකයේ බර තැබූ සාමාන්‍යයට ධන හෝ සෘණ වශයෙන් යොදා ගත යුතු ය. පාරිභෝගික ගනුදෙනු සඳහා අදාළ වන විනිමය අනුපාතික තීරණය කිරීමේ දී සාධාරණ ආන්තික අගයයක් පමණක් යොදා ගත යුතු ලෙස බලපත්‍රලාභී බැංකුවලින් ඉල්ලා සිටිනු ලැබේ. එසේම බලපත්‍රලාභී බැංකුවල ඉදිරි වෙළඳ ගනුදෙනු සඳහා වන විනිමය අනුපාතික ද අන්තර් බැංකු වෙළඳපොළ එතැන් විනිමය අනුපාතිකවලට අනුකූල විය යුතු ය.

බලපත්‍රලාභී බැංකුවල ගාස්තු/කොමිස් මුදල් ව්‍යුහය සාධාරණ හා විනිවිදභාවයෙන් යුතු සිදුවිය යුතු අතර, එය ගනුදෙනුවේ රුපියල්වලට සමාන වටිනාකමෙන් සියයට තුනක් (3%) නොඉක්මවිය යුතු ය.

සියලුම බලපත්‍රලාභී බැංකු මෙම මෙහෙයුම් උපදෙස් දැඩි ව පිළිපැදිය යුතු ය.

ආචාර්ය පී නන්දලාල් වීරසිංහ
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

අපගේ යොමුව: 33/04/012/0012/005 2022 අගෝස්තු 25

සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"අපනයන ආදායම ශ්‍රී ලංකාව වෙත ආපසු ගෙන්වා ගැනීම" පිළිබඳ මෙහෙයුම් උපදෙස් හා සම්බන්ධ සංශෝධන

2022.08.12 දින සිට බලපැවැත්වෙන පරිදි, සේවා අපනයන ලැබීම්/ ආදායම්, අනිවාර්යයෙන් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතු බවට වූ අවශ්‍යතාවය අත්හිටුවමින් නිකුත් කරන ලද 2022.08.12 දිනැති අංක 2292/50 දරන අති විශෙෂ ගැසට් පත්‍රයට අනුව, රුපියල්වලට පරිවර්තනය කෙරෙන සේවා අපනයන ලැබීම්/ ආදායම් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත අනිවාර්යයෙන් ම විකිණීමේ අවශ්‍යතාවය බලාත්මක කෙරෙන පරිදි, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් උක්ත කරුණ සම්බන්ධයෙන් නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සංශෝධනය කෙරෙන බව සියලුම බලපත්‍රලාභී වාණිජ බැංකු සහ ජාතික ඉතිරිකිරීමේ බැංකුව (බලපත්‍රලාභී බැංකු) වෙත මෙයින් දන්වා සිටිනු ලැබේ (ඇමුණුම I).

ඒ අනුව, 2022.08.12 දින සිට බලපැවැත්වෙන පරිදි, ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කරන ලද සේවා අපනයන ලැබීම්/ ආදායම්වලින් **සියයට විසිපහක් (25%)** ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකුණන ලෙස සියලුම බලපත්‍රලාභී බැංකුවලින් ශ්‍රී ලංකා මහ බැංකුව මෙයින් ඉල්ලා සිටියි.

තව ද, සියලුම බලපත්‍රලාභී බැංකු විසින්, අනිවාර්යයෙන් ශ්‍රී ලංකා රුපියල් බවට පරිවර්තනය කළ යුතු භාණ්ඩ අපනයන ආදායමෙහි ඉතිරියෙන් **සියයට විසිපහක් (25%)** ශ්‍රී ලංකා මහ බැංකුව වෙත විකිණීම අඛණ්ඩව සිදු කළ යුතු ය.

ඉහත යෝජනා ක්‍රමය යටතේ පෙර නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්හි දක්වා ඇති අනෙකුත් සියලුම අවශ්‍යතා නොවෙනස්ව පවතිනු ඇත.

වැඩිදුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සඳහා, ඔබට 0112398707, 0112398711 හෝ 0112398715 යන දුරකථන අංක ඔස්සේ ශ්‍රී ලංකා මහ බැංකුවේ ජාත්‍යන්තර මෙහෙයුම් කටයුතු දෙපාර්තමේන්තුව හා සම්බන්ධ විය හැකි ය.

ආචාර්ය පී නන්දලාල් වීරසිංහ
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2292/50 - 2022 අගෝස්තු මස 12 වැනි සිකුරාදා - 2022.08.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

I වැනි කොටස: (I) වැනි ජෙදය - සාමාන්‍ය

ශ්‍රී ලංකා මහ බැංකුවේ දැන්වීම්

1949 අංක 58 දරන මුදල් නීති පනත

1949 අංක 58 දරන මුදල් නීති පනතේ 68 වන වගන්තිය සමග කියවිය යුතු 10 (c) වගන්තිය යටතේ සකස් කළ රීතීන්

පී. නන්දලාල් වීරසිංහ,
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති.

2022 අගෝස්තු මස 12 වැනි දින,
ශ්‍රී ලංකා මහ බැංකුව,
කොළඹ දී ය.

අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගැනීම

1. මෙම රීති "2022 අංක 2 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීති"යනුවෙන් හඳුන්වනු ලැබිය යුතුය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2022 මාර්තු 11 වන දිනැති අංක 2270/66 දරන (අතිවිශෙෂ) ගැසට් නිවේදනය මගින් ප්‍රකාශයට පත් කරන ලද 2022 අංක 1 දරන අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන ඒමේ රීතිය මෙමඟින් සංශෝධනය කරමින් එහි 4 වන රීතිය අවලංගු කර පහත දැක්වෙන නව රීතිය ඒ සඳහා ආදේශ කරනු ලැබේ.

"4. ඉහත 3 රීතියට අනුව අපනයන ඉපැයීම් ශ්‍රී ලංකාවට ගෙන්වා ගන්නා සෑම භාණ්ඩ අපනයනකරුවෙකුම, මාසයක් තුළ, ශ්‍රී ලංකාවට ලැබෙන එම ආදායමෙන් පහත සඳහන් **අවසරලත් ගෙවීම්** සඳහා පමණක් භාවිතයෙන් අනතුරුව, ශේෂය එළඹෙන මාසයේ හත්වන (7) දින හෝ ඊට ප්‍රථම ශ්‍රී ලංකා රුපියල්වලට අනිවාර්යයෙන්ම පරිවර්තනය කළ යුතුය.

(i) එක් මසක වගකීම් ද ඇතුළුව නිශ්චිත භාණ්ඩ අපනයනයකට අදාල ජංගම ගනුදෙනු සඳහා වන ප්‍රතිමුඛ ප්‍රේෂණ;

(ii) භාණ්ඩ අපනයනයට අදාල සංචාරක අරමුණු සඳහා විදේශ මුදල් නෝට්ටු ආපසු ලබා ගැනීම හෝ මුදල් මාරුකිරීම;

(iii) 2017 අංක 12 දරන විදේශ විනිමය පනත හෝ 1988 අංක 30 දරන බැංකු පනත (සංශෝධිත) යටතේ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද රෙගුලාසි, නියෝග සහ විධාන ප්‍රකාරව,එක් මසක ණය වගකීම් ද ඇතුළුව භාණ්ඩ අපනයනකරුවන් ලබා ගන්නා ලද ණය මුදල්, ආපසු ගෙවීමේ වියදම් සහ ණය වාරික;

(iv) 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන යටතේ අවසර දී ඇති පරිදි අනේවාසික ආයෝජකයන්ට ප්‍රකාශිත ලාභාංශ ගෙවීම් සහ/හෝ විදේශීය ජාතිකයන් හෝ ද්විත්ව පුරවැසියන් වන ප්‍රවාසික සේවකයින්ට වැටුප් ගෙවීම්;

(v) ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජන සඳහා, එම ලබන්නා වූ අපනයන ආදායමෙන් ප්‍රතිශතාංක දහයක් (10%) දක්වා, සිදු කරන ගෙවීම්;

(vi) නිශ්චිත භාණ්ඩ අපනයනයක් සම්බන්ධිත මිල දී ගැනීමක් සඳහා, 2017 අංක 12 දරන විදේශ විනිමය පනතේ විධිවිධාන ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් නිකුත් කරන ලද විධාන යටතේ විදේශ ව්‍යවහාර මුදලින් ගෙවීම් ලබාගැනීමට අවසරලත් දේශීය සැපයුම්කරුවන්ට කරන ගෙවීම්."

අපගේ යොමුව: 33/04/012/0012/006 2022 දෙසැම්බර් 30

සියලුම බලපත්‍රලාභී බැංකුවල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

"විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳ බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්

මෙය, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020.12.22 දින බලපත්‍රලාභී බැංකු වෙත නිකුත් කරන ලදු ව, 2021.01.01 දින සංශෝධනය කරන ලද "විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ සඳහා වන දිරි දීමනා යෝජනා ක්‍රමය" පිළිබඳ මෙහෙයුම් උපදෙස් හා සබැඳේ.

විදේශ සේවා නියුක්තිකයන්ගේ ප්‍රේෂණ රුපියල් බවට පරිවර්තනය කිරීමේ දී එක්සත් ජනපද ඩොලරයකට ගෙවනු ලැබූ රුපියල් 2.00ක් වන දිරි දීමනාව වහාම ක්‍රියාත්මක වන පරිදි අත්හිටවන ලෙස සියලුම බලපත්‍රලාභී බැංකු වෙත උපදෙස් ලබාදෙන මෙන් භාණ්ඩාගාර ලේකම්වරයා ශ්‍රී ලංකා මහ බැංකුවෙන් ඉල්ලීමක් කර ඇත. ඒ අනුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින්, යොමු අංක 33/04/012/0011/004 යටතේ 2020.12.22 දින නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස් සහ යොමු අංක 33/04/012/0011/005 යටතේ 2021.01.01 දින නිකුත් කරන ලද ඊට අදාළ සංශෝධන, 2023.01.01 දින සිට බලපැවැත්වෙන පරිදි අවලංගු කරන බව මෙයින් දන්වා සිටිමි.

ආචාර්ය පී නන්දලාල් වීරසිංහ
අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

2022 මාර්තු **22**

යොමුව 08/21/007/047/002

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඍජු නිකුතු කවුළුව සඳහා වන දිරි දීමනා ක්‍රමවේදයට අදාළ මෙහෙයුම් උපදෙස්

ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල ආයෝජනයන් තවදුරටත් දිරි ගැන්වීමේ අරමුණ සහිතව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර සඳහා ඍජු නිකුතු කවුළුවක් හඳුන්වා දෙන ලදී. මේ සම්බන්ධයෙන් ප්‍රවර්ධන හා මෙහෙයුම් ගාස්තු සඳහා දිරි දීමනා ක්‍රමවේදයක්ද හඳුන්වා දී ඇත. ඒ අනුව ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඍජු නිකුතු කවුළුව හරහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර වල ආයෝජනය කරන මුදල් ප්‍රමාණයෙන් පදනම් අංක 50ක් ශ්‍රී ලංකා රුපියල් මඟින් ගෙවන අතර, පත් කළ නියෝජිතයන් හරහා ආයෝජන සැකසුම්කරුවන්ට මෙම ගෙවීම සිදු කෙරේ. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල ආයෝජනය කරනු ලබන ඕනෑම ආයතනයක් හෝ පුද්ගලයෙක් ආයෝජන සැකසුම්කරුවන් ලෙස සලකනු ලැබේ.

සියලුම පත්කළ නියෝජිතයින් විසින් 2022 පෙබරවාරි 01 දින සිට ඍජු නිකුතු කවුළුව හරහා ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරවල සුදුසු ආයෝජනයන් සිදු කරන ක්‍රමවේදයේ දී, පහත සඳහන් මෙහෙයුම් උපදෙස් වලට අනුකූල විය යුතු වේ.

1. සුදුසුකම් ලත් ආයෝජනයන්

   පත්කළ නියෝජිතයන් මඟින් ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ඍජු නිකුතු කවුළුව හරහා සිදු කරනු ලබන ආයෝජනයන්

2. මෙහෙයුම් රාමුව

   i. පත් කළ නියෝජිතයන් විසින් වත්මන් සේවාදායකයන් හා අපේක්ෂිත ආයෝජකයින් අතර ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ප්‍රවර්ධනය කළ යුතුය.

   ii. ඍජු නිකුතු කවුළුව හරහා සිදු කරනු ලබන ආයෝජනයන් සඳහා ප්‍රවර්ධන හා මෙහෙයුම් දිරි දීමනාවක් ලෙස ආයෝජනයෙන් සියයට 0.5ක (පදනම් අංක 50) කට සමාන මුදලක් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පත් කළ නියෝජිතයින් හරහා ආයෝජන සැකසුම්කරුවකු වෙත ගෙවනු ඇත. ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර කල් පිරුණු පසු නැවත ගෙවන දිනයේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක්සත් ජනපද ඩොලර් ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ප්‍රකාශයට පත් කරන ලද විදේශ විනිමය අනුපාතිකය සලකා බලනු ඇත.

   iii. ඇමුණුම අංක 1හි දක්වා ඇති ආකෘතියට අනුව පත් කළ නියෝජිතයින් තමන්ට අයත් දිරිදීමනා සඳහා වන හිමිකම fopdd@cbls.lk යන විද්‍යුත් තැපැල් ලිපිනය හරහා ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුවේ ඉදිරි කාර්යාලය වෙත මාසිකව එවිය යුතුය. 2022 පෙබරවාරි 01 සිට 2022 පෙබරවාරි 28 වැනි දින දක්වා වන හිමිකම් 2022 මාර්තු මස 31 වන දිනට පෙර එවිය යුතුය. 2022 මාර්තු මස සිට, සලකා බලන මාසය සඳහා වන හිමිකම් සෑම මසක් අවසානයට පසුව එළඹෙන පළමු

ව්‍යාපාරික දින 7 ඇතුළත පත් කළ නියෝජිතයින් විසින් එවිය යුතුය.

iv හිමිකම් සඳහා ඉල්ලීම් ලැබීමෙන් පසු, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම හිමිකම් තහවුරු කළ යුතු අතර, යම් විෂමතාවක් පැවතියහොත්, එම හිමිකම්පෑමේ දින සිට වැඩ කරන දින 7ක් ඇතුළත පත්කළ නියෝජිතයින් හට එය දන්වනු ලැබේ. කිසිදු විෂමතාවක් මතු නොවන්නේ නම්, හිමිකම්පෑම් ලැබී වැඩ කරන දින 14ක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දිරි දීමනාව ගෙවිය යුතුය.

v. සැකසුම්කරු සහ පත්කළ නියෝජිතයින් අතර එකඟ වූ නියමයන්ට අනුව අදාළ අවස්ථාවන්වලදී, පත්කළ නියෝජිතයින් වෙත ගෙවනු ලබන දිරි දීමනාව සැකසුම්කරු සමඟ හුවමාරු කර ගත යුතුය. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඍජු නිකුතු කවුළුව හරහා, ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කර ආයෝජන සඳහා ඍජුවම ආයෝජන සැකසුම්කරුට වන්දි ලබා දීමක් සිදු නොවේ.

3. ගිණුම්කරණය සහ වාර්තා තබා ගැනීම

දිරි ගැන්වීමේ යෝජනා ක්‍රමය සම්බන්ධයෙන් වාර්තා පවත්වාගෙන යාම සහ ආයෝජන සැකසුම්කරුට ප්‍රවර්ධනය සහ දිරිගැන්වීම් සම්බන්ධ ගෙවීම් වල පියවීමේ කටයුතු හැසිරවීම, පත්කළ නියෝජිතයින් විසින් සිදුකළ යුතුය.

වැඩිදුර තොරතුරු හෝ විමසීම් සඳහා, ශ්‍රී ලංකා මහ බැංකුවේ රාජ්‍ය ණය දෙපාර්තමේන්තුව පහත සඳහන් දුරකථන අංක මඟින් සම්බන්ධ කර ගත හැක.

0112398611, 0112398877, 0112477574, 0112477316 හෝ 0112477011

රාජ්‍ය ණය අධිකාරි
ශ්‍රී ලංකා මහ බැංකුව
ඇමුණුම 1 -

ඇමුණුම 1

ආයතනික ලිපි ශීර්ෂය

පත්කළ නියෝජිතයාගේ නම - .....

වාර්තා කිරීමේ කාලය - .....

ඍජු නිකුතු කවුළුව හරහා "ශ්‍රී ලංකා සංවර්ධන බැඳුම්කරයන්හි ආයෝජන සඳහා දිරි දීමනා"

අයදුම් කළ දිනය	ගෙවීම් කළ යුතු දිනය	ආයෝජකයාගේ නම	ආයෝජන ප්‍රමාණය එක්සත් ජනපද ඩොලර්
කාල සීමාව සඳහා එකතුව			

දිරි දීමනා ලැබිය යුතු පත්කළ නියෝජිතයින්ගේ ගිණුම් විස්තර

ගිණුමේ නම .....

ගිණුම් අංකය .....

බැංකුව .....

ශාඛාව .....

ඉහත ප්‍රතිලාභයේ සඳහන් තොරතුරු නිරවද්‍ය සහ සම්පූර්ණ බවත් එම තොරතුරු අප විසින් පවත්වාගෙන යන ගිණුම් පොත් සහ පාරිභෝගික/ලැයිස්තු වාර්තාවලින් උපුටා ගෙන ඇති බවත් සහතික කරමු.

අත්සන	.....	.....	.....
නම	.....	.....	.....
තනතුර	ප්‍රධාන නියෝජිත/භාණ්ඩාගාර ප්‍රධානියා	ප්‍රධාන අනුකූලතා නීති නිලධාරී	ප්‍රධාන මූල්‍ය නිලධාරී
දිනය	.....	.....	.....

පොදු විධිවිධාන අංක : 01/2022

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනතේ 44 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු විධිවිධාන.

ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය
නියෝජ්‍ය අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

2022 පෙබරවාරි මස 28 වැනි දින
කොළඹ දී ය.

පොදු විධිවිධාන

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනතේ නීතිමය ප්‍රතිපාදන නිසි ආකාරයෙන් සහ කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, යෙදවීම සහ බලාත්මක කිරීම සඳහා වූ එකී පනතේ 44 වගන්තිය යටතේ මෙම පොදු විධිවිධාන නිකුත් කරනු ලැබේ. මෙම විධිවිධාන, අංක : 01/2022 දරන ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය සඳහා වූ පොදු විධිවිධාන යනුවෙන් හැඳින්වෙන අතර මෙමගින් අංක : 01/2011 දරන ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය සඳහා වූ පොදු විධිවිධාන ප්‍රතිස්ථාපනය කෙරෙනු ඇත. මෙම විධිවිධාන, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සහ ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතනවලට අදාළ වන අතර 2022 පෙබරවාරි මස 28 දින සිට ක්‍රියාත්මක වේ.

මෙම විධිවිධාන, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතනවලට අදාළ වන සහ අදාළ විය හැකි ලිඛිත නීති, නියෝග, නියමයන් හා කොන්දේසිවලට අතිරේක වන අතර අගතියක් වන අයුරින් නොයෙදේ.

ඉහත වගන්තියෙහි සාකල්‍යතාවයට හානි නොවන පරිදි, 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත මගින් පනවා ඇති වගකීම් මෙම නියෝග මගින් සීමා කෙරෙන අයුරින් අර්ථ නිරූපනය නොකළ යුතුය.

හැඳින්වීම

ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය යනු ගෙවීම් නියෝග ක්‍රියාත්මක කිරීම තුළින් මුදල් ගනුදෙනු සඳහා පහසුකම් සලසන ඉලෙක්ට්‍රොනික පද්ධතියකි. මංගත නොවන අන්තර්බැංකු ගෙවීම් පද්ධතියක් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 1993 වර්ෂයේදී ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය හඳුන්වා දෙන ලදී. 2002 වර්ෂයේ දී, ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය සහ චෙක්පත්වලට අදාළ නිෂ්කාශන කටයුතු සිදු කිරීමේ බලය ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම වෙත පවරන ලදී. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි අරමුණු වනුයේ පොදු හා ඒකාකාර සුළු පරිමාණ ඉලෙක්ට්‍රොනික ගෙවීම් පද්ධතියක් ස්ථාපිත කිරීමත්, ගෙවීම් පද්ධතියෙහි සුරක්ෂිතතාව සහ කාර්යක්ෂමතාව ඉහළ නැංවීමත්, ශ්‍රී ලංකාවේ සුළු පරිමාණ ගෙවීම් පද්ධතීන්හි විකාශනය සඳහා ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතන අතර සහයෝගීතාව ඉහළ නැංවීමත්ය. අදාළ ගනුදෙනු කරන දිනය තුළදීම අවසාන පියවීම සිදු කිරීම සඳහා පහසුකම් සලසමින්, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් 2010 වර්ෂයේ සැප්තැම්බර් මස දී ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය, මංගත අන්තර් බැංකු ගෙවීම් පද්ධතියක් ලෙස වැඩි දියුණු කරන ලදී.

ඇ. නිර්වචන

1. "අර්ථලාභියා" යන්නෙන් ගෙවීම් නියෝගයක මූල්‍යමය වටිනාකමෙහි අර්ථලාභියා වශයෙන් නම් කළ ඕනෑම නෛතික හෝ ස්වාභාවික පුද්ගලයෙක් සහ/හෝ එවන් පුද්ගලයෙකු විසින් නම් කරන ලද තැනැත්තෙක් හෝ නියෝජිතයෙක් අදහස් වේ.
2. "ගනුදෙනු කරන දිනය" යන්නෙන් ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනයේ සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟතාවයට

යටත්ව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ගනුදෙනු නොකරන දිනයක් ලෙස ප්‍රකාශයට පත් කළ දිනයක් නොවන ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය ක්‍රියාත්මක වන ලිත් වර්ෂයේ ඕනෑම දිනයක් අදහස් වේ.

3. "නිෂ්කාශන චක්‍රය" යන්නෙන් එක් පියවීමක සිට ඊළඟ පියවීම දක්වා වූ කාල සීමාව අදහස් වේ.

4. "ගනුදෙනුකරු" යන්නෙන් තමා වෙනුවෙන් හෝ තුන්වන පාර්ශවයක් වෙනුවෙන් ගෙවීම් නියෝගයක් නිකුත් කරන හෝ ඒ සඳහා අවසර ලබාදෙන සහ අදාළ ගෙවීම් නියෝගයෙහි මූල්‍ය වටිනාකමට සමාන වටිනාකමක් මුදලින් ලබාදීම හෝ හිඟුමක් හර කිරීම සඳහා ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතනයකට අවසර ලබාදෙන ඕනෑම නෛතික හෝ ස්වාභාවික පුද්ගලයෙක් අදහස් වේ.

5. "ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන් (422 වන අධිකාරිය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

6. "ඩිජිටල් සහතිකය" යන්නෙන් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි පණිවුඩවල සම්පූර්ණත්වය, වලංගු බව හා ප්‍රතික්ෂේප නොවන බව සහතික කිරීම සඳහා ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි ප්‍රාථමික සහ/හෝ ද්විතීයික සහභාගීත්ව ආයතනවලට, මූල්‍ය අංශයෙහි සහතික කිරීමේ සේවා සැපයුමකරු වන ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නිකුත් කරන සහතිකය අදහස් වේ.

7. "ඉලෙක්ට්‍රොනික තොරතුරු" යන්නෙන් මාධ්‍යය කුමක් වුවත් ඉලෙක්ට්‍රොනික, චුම්භක (magnetic), ප්‍රකාශ (optical) හෝ ඒ හා සමාන මාර්ගයකින්, ජනිත වන, යවන ලද, ලැබුණු හෝ ගබඩා කළ තොරතුරු අදහස් වේ.

8. "ඉලෙක්ට්‍රොනික" යන්නෙන් විද්‍යුත් තැපෑල හෝ අන්තර්ජාලය වැනි මංගත සන්නිවේදන ක්‍රම ඔස්සේ හෝ ටේප් පට, තැටි හෝ ඒ හා සමාන මංගත නොවන ක්‍රම ඔස්සේ සිදු කිරීම අදහස් වේ.

9. "අරමුදල්" යන්නෙන් මුදල්, තැන්පතු, මූල්‍යමය අගයන් සහ ආපසු ගත හැකි පරිදි ගිණුම්වල ඇති බැර ශේෂයන් අදහස් වේ.

10. "බලපත්‍රලාභී වාණිජ බැංකුව" හෝ "බලපත්‍රලාභී විශේෂිත බැංකුව" හෝ "බැංකුව" යන්නෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ 5 වැනි වගන්තිය ප්‍රකාර මුදල් විෂය භාර අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බැංකු කටයුතු කිරීමට නිකුත් කළ බලපත්‍රයක් ලබාගත් ශ්‍රී ලංකාවේ හෝ වෙනත් රටක සංස්ථාපනය කරන ලද පොදු සමාගමක් හෝ ලිඛිත නීතියක් යටතේ සංස්ථාපිත ආයතනයක් අදහස් වේ.

11. "ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම" යන්නෙන් 1982 අංක 17 දරන සමාගම් පනත යටතේ සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ නැවත ලියාපදිංචි කරන ලද, ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය මෙහෙයවීමේ බලයලත් අධිකාරිය අදහස් වේ.

12. "මූල්‍ය සම්ප්‍රේෂණය" යන්නෙන් මුදල් ආපසු ගැනීම, ගිණුම් අතර මුදල් මාරු කිරීම හෝ තුන්වන පාර්ශ්වයන් වෙනුවෙන් මුදල් ගෙවීම සඳහා පහසුකම් සැලසීම ඇතුළුව ගනුදෙනුකරුවෙකුගෙන්/ප්‍රේෂණය කරන්නෙකුගෙන් හෝ අර්ථලාභියෙකු වෙනුවෙන්, මූල්‍යමය වටිනාකම් ලබා ගැනීම හෝ නිකුත් කිරීම අදහස් වේ. ගනුදෙනුකරු, ප්‍රේෂණය කරන්නා හෝ අර්ථලාභියා අදාළ ගනුදෙනුවෙහි පාර්ශ්වකරුවෙකු හෝ සෘජු සහභාගිවන්නෙකු නොවුනත් ගනුදෙනුකරු, ප්‍රේෂණය කරන්නා හෝ අර්ථලාභියා වෙනුවෙන් ඕනෑම ගනුදෙනුවකට අදාළ මුදල් සම්ප්‍රේෂණය සඳහා සහභාගි වීමද මෙයට ඇතුළත් වේ. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය තුළින් මුදල් සම්ප්‍රේෂණය කළ හැක්කේ ශ්‍රී ලංකාව තුළ දේශීය මුදලින් පමණි.

13. "මූල්‍යමය වටිනාකම" යන්නෙන් ගිණුමක බැර ශේෂයක්, ගෙවීම් උපකරණයක්, රාශිගත අගයක් ද ඇතුළත්ව මුදල් ලෙස ලබා ගැනීමේ හැකියාව ඇති හෝ නැති හුවමාරු මාධ්‍යයක් අදහස් වේ.

14. "ගෙවීම් නියෝගය" යන්නෙන් නම් කරන ලද ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගිකරුවෙකු මගින් අර්ථලාභියෙකු සඳහා මූල්‍යමය වටිනාකමක් ගෙවන ලෙසට ප්‍රාථමික හෝ ද්විතීයික සහභාගිකරුවෙකුට අණ දෙමින් හෝ උපදෙස් දෙමින් ගනුදෙනුකරුවෙකු විසින් ලිඛිතව නිකුත් කරන හෝ ජනිත කරන ලද නියෝගය අදහස් වේ.

15. "ශුද්ධ ප්‍රේෂණ අගය" යන්නෙන් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය මගින් එහි සහභාගිකරුවෙකු විසින් ලද හෝ සිදුකළ සියළුම ගෙවීම්වල ශුද්ධ මූල්‍යමය වටිනාකම අදහස් වේ. මේ අනුව සෑම නිෂ්කාශන චක්‍රයක් අවසානයේදීම ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියේ සහභාගිකරුවෙකු ශුද්ධ ණය ගැතියෙකු හෝ ශුද්ධ ණය හිමියෙකු වේ.

16. "මෙහෙයුම් ක්‍රියාවලි අත්පොත" යන්නෙන් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි මෙහෙයුම් හා සම්බන්ධව එහි සහභාගිකරුවන්ට සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට මග පෙන්වීම සඳහා සැකසූ ක්‍රියාවලි ඇතුළත් ලියවිල්ල අදහස් වේ.

17. "ප්‍රේෂණය කරන්නා" යන්නෙන් ලබන්නා වෙත ගෙවීමක් සිදු කිරීම සඳහා බලය ලබා දෙමින් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි ගනුදෙනුවක් ආරම්භ කරන ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගිකරුවෙකු අදහස් වේ.

18. "ලබන්නා" යන්නෙන් ප්‍රේෂණය කරන්නෙකුගෙන් ගෙවීම් නියෝගයක් ලැබෙන සහ අදාළ නියෝගයෙහි අන්තර්ගත දත්ත මගින් ගෙවීමක් සිදු කිරීමට බලය ලැබෙන ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගිකරුවෙකු අදහස් වේ.

19. "තත්කාලීන දළ පියවීම් පද්ධතිය" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සතු සහ එය විසින් මෙහෙයවනු ලබන පද්ධතිමය වශයෙන් වැදගත් වූ පූර්ණ ස්වයංක්‍රීය ගෙවීම් පද්ධතිය අදහස් වේ. තත්කාලීන දළ පියවීම් පද්ධතිය, ලංකාසෙට්ල් පද්ධතියෙහි කොටසකි.

20. "ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙනුවෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් මෙහෙයවන සහ මධ්‍යගතව පාලනය කරන ඉලෙක්ට්‍රොනික පද්ධතිය හෝ ක්‍රියාවලිය අදහස් වේ. මුදල් ගනුදෙනු, මුදල් ආපසු ලබා ගැනීම සහ මූල්‍යමය වටිනාකම් හුවමාරුව සිදුකිරීම, නියෝග කිරීම, වලංගු කිරීම සහ ඒ සඳහා පහසුකම් සැලසීමට ගෙවීම් නියෝග සන්නිවේදනය කිරීම සහ සැකසීම තුළින් පහසුකම් සැලසීම මෙමගින් සිදුවේ. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම්

පද්ධතියෙහි සහභාගිකරුවෙකු විසින් සිදු කිරීමට අපේක්ෂිත ගෙවීම් ඉලෙක්ට්‍රොනිකව හුවමාරු කිරීම හා සම්ප්‍රේෂණය කිරීමට අවශ්‍ය ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සතු පද්ධති හා ක්‍රියාවලි ද මෙයට ඇතුළත් වේ.

21. "ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධති දත්ත" යන්නෙන් පිටතට යන සහ ලැබෙන දත්ත ද ඇතුළත්ව ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය, එහි සහභාගිකරුවන් සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ජනනය කරනු ලබන දත්ත වලින් උපුටා ගන්නා අනන්‍යතා කේත අංක සහ අනෙකුත් සියලු තොරතුරු අදහස් වේ.

22. "ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධති දත්ත ගොනුව" යන්නෙන් පිටතට යන ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි ගනුදෙනු ඇතුළත්කර සහභාගිකරුවෙකු විසින් ජනනය කර නිෂ්කාශනය සඳහා ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය හරහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම වෙත සම්ප්‍රේෂණය කරනු ලබන දත්ත ගොනුව අදහස් වේ.

23. "ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධති ගනුදෙනු" යන්නෙන් ගෙවීම් නියෝගයක් සිදු කිරීම හෝ සන්නිවේදනය කිරීම සඳහා සහභාගිකරුවෙකු සහ/හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ජනනය කළ ඉලෙක්ට්‍රොනික ගනුදෙනු අදහස් වේ.

24. "ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධති වාර්තාව" යන්නෙන් තේරුම් ගත හැකි වනසේ නැවත ලබාගත හැකි අයුරින් ලියවිල්ලක සටහන් කළ හෝ ඉලෙක්ට්‍රොනික හෝ වෙනත් මාධ්‍යයක ගබඩා කළ ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය ආශ්‍රිත තොරතුරු අදහස් වේ.

25. "ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය" යන්නෙන් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධති දත්ත පිටතට යැවීම, ලබා ගැනීම, සැකසීම සහ සංරක්ෂණය කිරීම සඳහා පවත්වාගෙන යන පද්ධතිද ඇතුළත්ව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ සහභාගිකරුවන් විසින් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට අදාළව මෙහෙයවනු ලබන හෝ පවත්වාගෙන යනු ලබන පද්ධති සහ ක්‍රියාවලි අදහස් වේ.

26. "ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගිකරු" හෝ "සහභාගිකරු" යන්නෙන් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි ප්‍රාථමික සහභාගිකරුවෙකු සහ/හෝ ද්විතියික සහභාගිකරුවෙකු අදහස් වේ.

27. "ප්‍රාථමික සහභාගිකරු" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුව හෝ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි ක්‍රියා කිරීමට අවසර දෙන ලද සහ තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිකරුවෙකු වන ශ්‍රී ලංකාව තුළ ක්‍රියාත්මක වන ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වේ.

28. "ද්විතීයික සහභාගිකරු " යන්නෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි ක්‍රියා කිරීමට අවසර දෙන ලද සහ ප්‍රාථමික සහභාගිකරුවෙකු විසින් එම පද්ධතිය මගින් සිදුකරන ගනුදෙනු තම තත්කාලීන දළ පියවීම් පද්ධති ගිණුම තුළින් පියවීමට අවසර ලබා දෙන නෛතික ඒකකයක් අදහස් වේ.

29. "පියවීම් දිනය" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය විසින් බැංකු ගනුදෙනු කරන දිනයක් ලෙස ප්‍රකාශයට පත් කල සහ තත්කාලීන දළ පියවීම් පද්ධතිය හරහා බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් සිදුවන දිනයක් අදහස් වේ.

30. "පියවීම් වේලාව" යන්නෙන් තත්කාලීන දළ පියවීම් පද්ධතිය මගින් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගිකරුවන් අතර ශුද්ධ පියවීම් සිදු කරනු ලබන වේලාවන් ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් කලින් කල නිර්ණය කරනු ලබන වේලාවන් අදහස් වේ.

31. "ශ්‍රී ලංකා බැංකුකරුවන්ගේ ආයතනය" යන්නෙන් ශ්‍රී ලංකා බෑන්ක්ස් ඇසෝසියේෂන් (ගරන්ටි) ලිමිටඩ් අදහස් වේ.

32. "ගනුදෙනුවෙහි වටිනාකම පිළිබඳ සීමාවන්" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුව, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ප්‍රාථමික සහභාගිකරුවන් විසින් ඔවුනොවුන් අතරේ එකඟතාවයෙන් තීරණය කරන ලද ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය හරහා සිදු කළ හැකි ගනුදෙනුවක උපරිම වටිනාකම අදහස් වේ.

33. "සහභාගීත්ව ගිවිසුම" යන්නෙන් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය හා සම්බන්ධව සෑම ප්‍රාථමික සහභාගිකරුවෙකු සහ/හෝ ද්විතීයික සහභාගිකරුවෙකු සමඟ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් එළඹෙන ගිවිසුම අදහස් වේ.

34. "සහභාගීත්ව මුරපදය" යන්නෙන් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට පිවිසීම සඳහා සෑම ප්‍රාථමික සහභාගිකරුවෙකු සහ/හෝ ද්විතීයික සහභාගිකරුවෙකු වෙත ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නිකුත් කරනු ලබන රහස්‍ය කේත අංක අදහස් වේ.

35. "වලංගු දිනය" යන්නෙන් ගෙවීම් නියෝගයෙහි මූල්‍යමය වටිනාකම අදාළ අර්ථලාභියා වෙත ලැබිය යුතු දිනය ලෙස ප්‍රේෂණය කරන්නා හෝ ගනුදෙනුකරු විසින් අදාළ ගෙවීම් නියෝගයෙහි සඳහන් කළ දිනය අදහස් වේ.

ආ. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි සහ ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගිකරුවන්ගේ වගකීම්

1. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය මෙහෙයවීම හා සහභාගීත්වය පිළිබඳව සෑම සහභාගිකරුවෙකුම ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සමඟ සහභාගීත්ව ගිවිසුමකට එළඹිය යුතුය.

2. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි නිරවුල් බව සහ සම්මතයන් ආරක්ෂා කිරීම සඳහා එම පද්ධතියට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟතාවයට යටත්ව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නියම කරන ලද කොන්දේසි සහභාගිකරුවන් සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් පිළිපැදිය යුතුය.

3. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් සෑම සහභාගිකරුවෙකුටම ඩිජිටල් සහතික සහ මුරපද නිකුත් කළ යුතු අතර ඒවායෙහි රහස්‍යභාවය සහභාගිකරුවන් විසින් උපරිම අයුරින් ආරක්ෂා කළ යුතුය.

4. ශ්‍රී ලංකා මහ බැංකුවේ එකඟතාවයට යටත්ව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නියම කරන ලද නීති සහ ක්‍රියාදාමයන් ඇතුළත් ඉලෙක්ට්‍රොනික අරමුදල් හුවමාරුව හා සම්බන්ධ සම්මුතීන් හෝ කලින් කලට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නියම කරනු ලබන සම්මුතීන්වලට අනුකූලව සහභාගිකරුවන් සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම කටයුතු කළ යුතුය.

5. මෙහෙයුම් ක්‍රියාවලි අත්පොත, එහි උප ග්‍රන්ථ සහ ඇමුණුම්වල අන්තර්ගත වන කොන්දේසි සහ මාර්ගෝපදේශවලට අනුකූලව කටයුතු කරන බවට සහභාගිකරුවන් හා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම එකඟ විය යුතුය.

6. ද්විතීයික සහභාගිකරුවන්ගේ ගෙවීම් නියෝග නිෂ්කාශනය හා පියවීම ප්‍රාථමික සහභාගිකරුවන් හරහා පමණක් සිදු කිරීමට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම හා ද්විතීයික සහභාගිකරුවන් විසින් කටයුතු සම්පාදනය කළ යුතුය.

ඇ. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි වගකීම්

1. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි එකම මෙහෙයුම්කරු වනුයේ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමය.

2. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව ප්‍රකාශයට පත් කළ ලියාපදිංචි කාර්යාලයේ සිට සෑම ගනුදෙනු කරන දිනකදීම ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කිරීම ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි වගකීමකි. එම ස්ථානයෙහි මෙහෙයුම් බිඳ වැටීමක් සිදු වූ අවස්ථාවක දී ප්‍රතිප්‍රාප්ති වැඩ බිමෙහි සිට ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු සිදු කළ යුතුය.

3. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය සහ, එම පද්ධතියත් සහ ඊට අදාළ සන්නිවේදන ජාලයත් අතර සම්බන්ධතාවය ගොඩනැගීමට හා පවත්වාගෙන යෑමට අවශ්‍ය පද්ධති ස්ථාපනය කිරීම, පවත්වාගෙන යෑම, මෙහෙයවීම සහ ආරක්ෂාව හා ප්‍රවේශ පාලනය සම්බන්ධව කටයුතු කිරීමේ වගකීම ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සතු වේ.

4. බහු පාර්ශ්වීය නිෂ්කාශන න්‍යාය මත (එනම් සහභාගිකරුවන් විසින් යොමු කළ ගෙවීම් නියෝගයන්හි ශුද්ධ ශේෂයන් ගණනය කිරීමෙන්) සහභාගිකරුවන්ගේ ගනුදෙනු නිෂ්කාශනය හා පියවීම සඳහා පහසුකම් සලසමින් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය මෙහෙය විය යුතුය.

5. කිසියම් ලිඛිත නීතියකට අනුව දත්ත හා තොරතුරු හෙළි කිරීම අවශ්‍ය වූ අවස්ථාවක දී හෝ සහභාගිකරු ලිඛිත අවසරයක් ලබා දුන් අවස්ථාවක දී හැර සහභාගිකරුවන්ගේ ගෙවීම් තොරතුරු, තාක්ෂණික හා ආයතනික තොරතුරු ද ඇතුළත්ව සියලු සූක්ෂම තොරතුරුවල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම බැඳී සිටී.

6. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කළ සෑම නිෂ්කාශන චක්‍රයකම පියවීම වේලාවට හෝ ඊට පෙර සියලුම ප්‍රාථමික සහභාගිකරුවන්ගේ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් දැක්වෙන ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට අදාළ බහු පාර්ශ්වීය පියවීම් දත්ත ගොනු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබාදීම ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් සිදු කළ යුතුය.

7. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය සඳහා මෙහෙයුම් ක්‍රියාවලි අත්පොතක් සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය පිළිබඳ රීති මාලාවක් සකස් කොට නිකුත් කිරීම ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් සිදු කළ යුතුය. මෙම රීතීන් හා මෙහෙයුම් ක්‍රියාවලි පැහැදිලිව හා විස්තරාත්මකව දැක්විය යුතුය. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නිකුත් කරන ලද මෙම පද්ධති රීති මාලාව සහ මෙහෙයුම් ක්‍රියාවලි අත්පොත ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු පාලනය කරන අතර, ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගිකරුවන් හා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම මේවාට අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටී.

8. අවශ්‍ය අවස්ථාවන්හිදී, මෙහෙයුම් ක්‍රියාවලි අත්පොත සහ ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය ඇතිව පද්ධති රීති මාලාව සංශෝධනය කළ හැකි අතර එවැනි සංශෝධන චක්‍රලේඛ මගින් සහභාගිකරුවන් වෙත දැනුම් දිය යුතුය.

9. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය මගින් සම්ප්‍රේෂණය කරනු ලබන ගනුදෙනු;

   i. ආරක්ෂිත හා වලංගු සම්ප්‍රේෂණයක් සහතිකවීම සඳහා ආරක්ෂිත ක්‍රමවේදයන්ට අනුකූල වන බව සහ

   ii. 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනතට අනුව සංරක්ෂණය කරනු ලබන බවට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් සහතික විය යුතුය.

10. මනා නිපුනත්වය, හැකියාව සහ දැනුම, විචක්ෂණශීලි බව සහ සැලකිලිමත් බව යන මූලධර්මවලට අනුකූලව ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය හා සම්බන්ධ තම වගකීම් හා බැඳීම් ඉටු කිරීමට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම බැඳී සිටී.

11. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගිකරුවන් මුහුණපාන සේවා අපහසුතා යොමු කිරීම සඳහා උපකාරක

අංශයක් (Help Desk) ස්ථාපනය කොට පවත්වා ගැනීම ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් කළ යුතුය. මෙම උපකාරක අංශය සෑම ගනුදෙනු කරන දිනයක් පුරාම විවෘතව තිබිය යුතු අතර එම අංශය හා සම්බන්ධ විය හැකි ආකාරය මෙහෙයුම් ක්‍රියාවලි අත්පොතෙහි සඳහන් කළ යුතුය.

12. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට අදාළ ගාස්තු කලින් කල සංශෝධනය කිරීමේ බලය, ශ්‍රී ලංකා මහ බැංකුව සහ සියලුම වාණිජ බැංකු නියෝජනය වන ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි අධ්‍යක්ෂ මණ්ඩලය සතු වේ.

13. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට අදාළ නීති උල්ලංඝනය කරන සහ අනුකූලව කටයුතු නොකරන අවස්ථාවන්හි දී පනවනු ලබන දඩ මුදල්, ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් මත ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් කලින් කල තීරණය කළ යුතු අතර සහභාගිකරුවන්ට ඒ පිළිබඳව දැන්විය යුතුය.

14. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධති සහභාගිකරුවන් සහ පොදු මහජනතාව දැනුවත් කිරීම උදෙසා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් අඛණ්ඩව පුහුණු සැසි සහ දැනුවත් කිරීමේ හා අධ්‍යාපන වැඩසටහන් පැවැත්විය යුතුය.

ඈ. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධති සහභාගිකරුවන්ගේ වගකීම්

සෑම සහභාගිකරුවෙකුම,

1. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් මෙහෙයවනු ලබන සුළු පරිමාණ ගෙවීම් සහ නිෂ්කාශන පද්ධතීන් හැර සුළු පරිමාණ ගෙවීම් මධ්‍යගතව නිෂ්කාශන කරනු ලබන වෙනත් ජාතික මට්ටමේ අන්තර්බැංකු ගෙවීම් සහ නිෂ්කාශන පද්ධතියක් මෙහෙයවීම හෝ එවැන්නක සහභාගිවීම නොකළ යුතුය.

2. තමන්ගේ පද්ධතීන්ට අදාළව දෘඩාංග, මෘදුකාංග සහ ජාලමය යටිතල පහසුකම් සම්පාදනය කරගත යුතුය.

3. එසේ සම්පාදනය කරගත් දෘඩාංග හා මෘදුකාංග, ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට අදාළ ගනුදෙනු සිදු කිරීම සහ ප්‍රතිග්‍රහණය කිරීම සඳහා ප්‍රමාණවත් වන බව සහ අනාගත වැඩි දියුණු කිරීම් සඳහා පහසුකම් සැලසීමට හැකියාව පවත්නා බවට ද සහතික විය යුතුය. එමෙන්ම එම දෘඩාංග සහ මෘදුකාංග මනා තත්වයෙන් පවත්වාගෙන යෑමට අවශ්‍ය කටයුතු සම්පාදනය කළ යුතුය.

4. නිශ්චය කළ දත්ත ගොනු ආකෘති සහ ගනුදෙනු ප්‍රවාහයන්ට අනුකූලව කටයුතු කිරීමටත්, ගනුදෙනුකරුවන්ගේ සහ සහභාගිකරුවන්ගේ ගෙවීම් නියෝග නිවැරදි ලෙස නිසි ආකාරයෙන් හා නිසි කලට යොමු කිරීම සහ අවසන් කිරීමටත්, ගෙවීම් නියෝගවල වලංගුභාවය සහතික කිරීමටත් බැඳී සිටී.

5. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය ආරක්ෂා කිරීමටත්, සහභාගිකරුවන් වෙත ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නිකුත් කළ ආරක්ෂණ ක්‍රමවේදවලට අනුකූල වීමටත්, උපදෙස් පිළිපැදීමටත් බැඳී සිටී. එමෙන්ම, තමන්ගේ ක්‍රියාවක් හෝ මඟහැරීමක් නිසා ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය හෝ අනෙකුත් සහභාගිකරුවන්ගේ පද්ධතිවල ආරක්ෂාවට තර්ජනයක් හෝ අගතියක් නොවීමට වගබලා ගත යුතුය.

6. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට හානියක්/වෙනසක් සිදුකළ හැකි අනවසර පිවිසුම් හෝ වෙනත් ක්‍රියාවන් වැළැක්වීම සහතික කළ යුතුය.

7. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගිකරුවෙකු වීමේ හැකියාවේ සහ නෛතික තත්වයෙහි වෙනසක් ඇති වුවහොත් ශ්‍රී ලංකා මහ බැංකුව සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම වෙත දැනුම් දිය යුතුය.

8. සෑම පියවීම් චක්‍රයක් අවසානයේදීම, ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට අදාළ බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පියවීම සඳහා, තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි පවත්නා තම පියවීම් ගිණුමෙහි අරමුදල් ප්‍රමාණවත්ව පවතින බවට වගබලා ගත යුතුය.

9. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය තුළ මුදල් ප්‍රේෂණ සාර්ථකව සම්පූර්ණ කළ බව හෝ නොකළ බව ගනුදෙනුකරුට දැනුම්දීම සඳහා ක්‍රමවේදයක් සහ/හෝ යාන්ත්‍රණයක් සකස් කළ යුතුය.

10. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට අදාළව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් කලින් කල නියම කරනු ලබන තාක්ෂණික, නෛතික, පරිපාලනමය, ආරක්ෂණ සහ අනෙකුත් අවශ්‍යතාවයන්ට අනුකූල විය යුතුය.

11. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙන් අදාළ දත්ත ලද පසු, ගෙවීම් නියෝගයෙහි සඳහන් වලංගු දිනයේදී, එම ගෙවීම් නියෝග යෙහි සඳහන් වටිනාකම, අර්ථලාභියාගේ ගිණුමට බැර කිරීම හෝ අර්ථලාභියා වෙත මුල්‍යමය වටිනාකම ලබා දෙන බවට සහතික විය යුතුය.

12. ඉහත 11 හි සඳහන් පහසුකම් ලබාදීම සඳහා සේවා නියමයන් හා ප්‍රමිතීන් ස්ථාපනය කිරීම හා යටිතල පහසුකම් පවත්වා ගැනීම කළ යුතුය.

13. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට අදාළ සියලු දත්ත, තොරතුරු සහ දත්ත ගබඩාවල රක්ෂිත පිටපත් නිතිපතා සැකසීමට වගබලා ගත යුතුය.

14. දෛනික ගනුදෙනු වාර්තා සැසඳිය යුතු අතර, යම් විෂමතාවයක් ඇතොත් එම ගනුදෙනුව සිදු වූ දින සිට එක් ගනුදෙනු කරන දිනක් ඇතුළත, අදාළ විෂමතාව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි උපකාරක අංශය වෙත ලිඛිතව දැනුම් දිය යුතුය.

15. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි මෙහෙයුම් හා සම්බන්ධ නීති, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නියම කරන ලද උපදෙස් හා ක්‍රියාදාමයන් හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කළ නියෝගවලට අනුකූල විය යුතුය.

16. 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනතට අනුව, කිසියම් ගනුදෙනුකරුවෙකුගෙන් ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතිය හරහා සිදු කිරීමට තමන් වෙත ලැබෙන ගෙවීම් නියෝග ප්‍රමාණයෙහි හෝ ගෙවීම් නියෝගවල වටිනාකමෙහි අසාමාන්‍ය වැඩිවීමක් ඇතොත්, ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකය වෙත දැනුම් දිය යුතු අතර, ඒ මගින් ලබාදෙන උපදෙස්වලට අනුව කටයුතු කළ යුතුය.

ඉ. ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම්:

1. පද්ධතිමය වශයෙන් වැදගත් වන ගෙවීම් පද්ධතියකින් අපේක්ෂිත ඉතා ඉහළ මට්ටමක ක්‍රියාකාරී පැවැත්මක් සහතික කිරීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ සහභාගිකරුවන් විසින්, ඔවුනගේ අධ්‍යක්ෂ මණ්ඩලවල අනුමැතියට යටත්ව ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධති මෙහෙයුම් හා සම්බන්ධව පරිපූර්ණ ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් සැකසිය යුතුය.

2. පද්ධතියේ ක්‍රියාකාරීත්වය අඩාල වීමකට පසු ක්ෂණිකව යථා තත්වයට පත් කිරීම තුළින් සිදුවෙමින් පැවති මෙහෙයුම් පවත්වාගෙන යෑමට සහ සම්පූර්ණ කිරීමට හැකිවන පරිදි, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ සහභාගිකරුවන් විසින් සියලු පහසුකම් සහිත ප්‍රතිප්‍රාප්ති වැඩබිමක් සහ අවදානම් කළමනාකරණය හා මෙහෙයුම් ප්‍රතිසාධනය සඳහා මනාව පුහුණු වූ කණ්ඩායමක් පවත්වා ගත යුතුය.

3. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියේ මෙහෙයුම් කටයුතු, කම්කරු ආරවුල් ඇතුළු හදිසි අවස්ථාවක දී අඩාල වීමකින් තොරව පවත්වාගෙන යෑම සහතිකවීම සඳහා එම පද්ධතියේ ප්‍රධාන මෙහෙයුම් කටයුතු පිළිබඳව පුහුණුවක් ලද මනා නිපුණත්වයකින් යුතු විකල්ප කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය.

4. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියේ කටයුතු පවත්වාගෙන යෑමට බාධා වන සේ කිසියම් තාක්ෂණික හෝ මෙහෙයුම් දෝෂයකට මුහුණ පෑමට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සිදු වුවහොත්, ඒ පිළිබඳව දැනුවත් වී මිනිත්තු 15 ක් ඇතුළත ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතුය. ප්‍රාථමික වැඩබිමෙහි (Primary Site) නැවත යථා තත්ත්වයට පත් කිරීමට අපහසු බිඳ වැටීමක් සිදු වුවහොත් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් වහාම ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත් කළයුතු අතර, ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට ආරම්භ කර බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කිරීමට කටයුතු කළ යුතුය. ප්‍රාථමික හා ප්‍රතිප්‍රාප්ති යන වැඩබිම් දෙකෙහිම ඉක්මණින් යථා තත්ත්වයට පත්කළ නොහැකි බිඳ වැටීමක් සිදු වූ අවස්ථාවක දී වහාම ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත් කළ යුතුය. එමෙන්ම, අවසාන පියවීම් චක්‍රයේ සිට පද්ධතියෙහි බිඳ වැටීම සිදු වූ වේලාව තෙක් වන කාල පරිච්ඡේදයට අදාළ ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි බහු පාර්ශ්වීය ශුද්ධ පියවුම් ශේෂයන් ලබා ගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු අතර, එම ශේෂයන් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දීමට ද කටයුතු කළ යුතුය.

5. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට අදාළ සියලු දත්ත හා තොරතුරු මෙන්ම තමන්ගේ දත්ත ගබඩාවල රක්ෂිත පිටපත් නිතිපතා සැකසීමට සහභාගිකරුවන් වලබලා ගත යුතුය. එමෙන්ම කඩඉම් වේලාවන්ට අනුකූලව කටයුතු කිරීම සඳහා පද්ධති බිඳ වැටීමක් හෝ දත්ත විනාශ වීමක්/නැතිවීමක් සිදු වූ අවස්ථාවක දී, දත්ත නැවත ලබාගත හැකි ක්‍රමවේදයක් ස්ථාපනය කර පවත්වාගෙන යෑම කළ යුතුය.

ඊ. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි දත්ත හා වාර්තාවල රහස්‍යභාවය

1. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගිකරුවන් වෙත නිකුත් කළ උපදෙස්, ගනුදෙනු හා ගිණුම් පිළිබඳ තොරතුරු ඇතුළත්ව ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට අදාළ සියලු වාර්තාවන්හි රහස්‍යභාවය සහභාගිකරුවන් විසින් ආරක්ෂා කළ යුතුය. එමෙන්ම, මෙම නියෝගයන්ට හා අනෙකුත් අදාළ නීතිවලට අනුකූලව සෑම අවස්ථාවකදීම තම ආයතනයේ නිලධාරීන්, සේවකයින්, නියෝජිතයින් සහ/හෝ ඕනෑම තත්වයක් යටතේ සේවයට බඳවාගෙන ඇති සේවකයින් රහස්‍යභාවය ආරක්ෂා කරන බවට වගබලා ගත යුතුය.

2. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි මෙහෙයුම් සම්බන්ධව, නීතියෙන් හෝ වෙනයම් අයුරකින් කලින් කල ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ සහභාගිකරුවන් වෙත පවරා ඇති බලතල හා කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී, ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනයට, අධීක්ෂණයට, නියාමනයට සහ අවේක්ෂණයට, සාමූහිකව සහ තනි තනිවම යටත් විය යුතු අතර, ඒ හා සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව නිකුත් කරන සියලුම නියමයන්ට සහ නියෝගයන්ට අනුකූලව කටයුතු කළ යුතුය.

3. ඉහත සඳහන් වගන්තියේ අඩංගු කරුණුවලට අමතරව, ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියට අදාළ තොරතුරු ලබාදෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට හා ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි

සහභාගිකරුවන්ට නියෝග කළ හැකි අතර, එවන් තොරතුරු ලබාදීමට ඔවුන් බැඳී සිටී.

4. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි සහභාගිකරුවන් විසින්, මෙම නියෝගයන්ට අනුකූලව, ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබාදෙන සියලු වාර්තා සහ තොරතුරු නිවැරදි සහ සම්පූර්ණ වේ යැයි සැලකේ.

ඌ. ආරවුල් බේරුම් කිරීම

1. ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධතියෙහි මෙහෙයුම් හා සම්බන්ධව සහභාගිකරුවන් අතර හෝ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ සහභාගිකරුවන් අතර ඇති වන්නා වූ ආරවුල් සාකච්ඡා මාර්ගයෙන් හෝ තුන්වන පාර්ශ්වයක මැදිහත්වීමෙන් විසඳා ගැනීම සඳහා අවශ්‍ය සෑම පියවරක්ම ගත යුතුය.

2. ඉහත ආකාරයෙන් අදාළ ආරවුල විසඳා ගත නොහැකි වේ නම් පමණක් බේරුම්කරණය (Arbitration) හෝ අධිකරණමය ක්‍රියාමාර්ගයක් මගින් විසඳීමට කටයුතු කළ යුතුය.

3. සාකච්ඡා මාර්ගයෙන්, තුන්වන පාර්ශ්වයක මැදිහත් වීමෙන් සහ බේරුම් කරණය මගින් ආරවුල් බේරුම් කිරීමේ ක්‍රමවේදය පැහැදිලිව හා සවිස්තරාත්මකව ශ්‍රී ලංකා අන්තර්බැංකු ගෙවීම් පද්ධති රීති මාලාවෙහි සඳහන් කළ යුතුය.

ඍ. පටහැනිවීම්

මෙම නියෝගවලට හෝ ඒ යටතේ නිකුත් කළ විධාන, උපදෙස් හෝ නීතිවලට පටහැනිව කටයුතු කරනු ලබන ඕනෑම පුද්ගලයෙකු, 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත යටතේ වැරදිකරුවෙකු වේ.

2022 අංක 02 දරන පොදු විධිවිධාන - ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනතේ 44 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු විධිවිධාන.

ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය
නියෝජ්‍ය අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

2022 පෙබරවාරි මස 28 වැනි දින

කොළඹ දී ය.

2022 අංක 02 දරන පොදු විධිවිධාන - ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු

මෙම විධිවිධාන, 2022 අංක 02 දරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු යනුවෙන් හැඳින්වෙන අතර, මෙමගින්, 2013 අංක 01 දරන ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිලිබඳ පොදු විධිවිධාන ප්‍රතිස්ථාපනය කෙරෙනු ඇත. මෙම විධිවිධාන, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයන්ට අදාළ වන අතර, 2022 පෙබරවාරි මස 28 වැනි දින සිට ක්‍රියාත්මක වේ.

2. නිර්වචන

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම පොදු විධිවිධානයෙහි;

2.1. "ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රය" යන්නෙන් කාඩ්පත් දරන්නාගේ පුද්ගල අනන්‍යතා අංකයෙහි නිරවද්‍යතාව තහවුරු කර සියලු ගනුදෙනු මංගතව සිදු කරන, කාඩ්පත් දරන්නාට සක්‍රීය කර ගත හැකි ටර්මිනලයක් අදහස් වේ.

2.2. "ශ්‍රී ලංකා මහ බැංකුව" යන්නෙන් 1949 අංක 58 දරන (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවනු ලැබූ ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ.

2.3. "ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය" යන්නෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සාමාගම මගින්

මෙහෙයවනු ලබන විද්‍යුත් ගෙවීම් පද්ධතියක් අදහස් කරනු ලබන අතර, එම පද්ධතිය මගින් මුදල් ආපසු ලබාගැනීම, ශේෂය පිරික්සීම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර මගින් සපයන අනෙකුත් සේවාවන් සැලසීමට අවශ්‍ය සන්නිවේදන හා ක්‍රියාවලි සඳහා පහසුකම් සලසනු ලබයි. එමෙන්ම ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ පද්ධතීන්, ක්‍රියාවලීන් සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයකු විසින් අපේක්ෂිත විද්‍යුත් දත්ත හුවමාරු කිරීම හා ගෙවීම් සඳහා අනුමැතිය ලබාදීමේ ක්‍රියා පිළිවෙළ මෙයට ඇතුළත් වේ.

2.4. "ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජික" යන්නෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි ප්‍රාථමික සාමාජිකයෙක් සහ ද්විතීයික සාමාජිකයෙක් අදහස් වේ.

2.5. "නිෂ්කාශන චක්‍රය" යන්නෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් කලින් නියම කර ඇති එක් පියවීම් කාලයක සිට ඊළඟ ආසන්නතම පියවීම් කාලය අදහස් වේ.

2.6. "මෙහෙයුම් ක්‍රියාවලි අත්පොත" යන්නෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට මග පෙන්වීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව සැකසූ ක්‍රියාවලි ඇතුළත් ලේඛනය අදහස් වේ.

2.7. "ප්‍රාථමික සාමාජික" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජිකයෙකු වීමට අනුමැතිය දෙන ලද තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතනයක් වන ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වේ.

2.8. "තත්කාලීන දළ පියවීම් පද්ධතිය" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන පූර්ණ ස්වයංක්‍රීය ගෙවීම් පද්ධතිය අදහස් වේ.

2.9. "ද්විතීයික සාමාජික" යන්නෙන් ප්‍රාථමික සාමාජිකයෙකු විසින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් ගනුදෙනු සිදු කිරීමටත්, එම ගනුදෙනුවල ශුද්ධ ශේෂය, එම ප්‍රාථමික සාමාජිකයාගේ තත්කාලීන දළ පියවීම් ගිණුම හරහා පියවීමටත්, අනුමැතිය ලබා දෙන සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එම පද්ධතියෙහි සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමටත් අවසර ලබා දෙන්නා වූ ඕනෑම නෛතික ඒකකයක් අදහස් වේ.

2.10. "සාමාජිකත්ව ගිවිසුම" යන්නෙන් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයකු ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සමග එළඹෙනු ලබන ගිවිසුමක් අදහස් වේ.

3. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයෙකුගේ වගකීම්:

3.1. ස්වයංක්‍රීය වූ ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි කටයුතු වලට සහභාගීවීම හා මෙහෙයුම් කටයුතුවල නිරතවීම පිළිබඳව ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම, සාමාජිකත්ව ගිවිසුමකට එළඹිය යුතුය.

3.2. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නියමයන් හා ක්‍රියාදාමයන් ආකාරයෙන් කලින් කලට පනවනු ලබන විධිවිධාන වලට අනුකූලව, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම ක්‍රියා කළ යුතුය.

3.3. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් ක්‍රියාවලි අත්පොතෙහි නියමයන් හා මාර්ගෝපදේශ අනුගමනය කිරීමට එකඟ විය යුතුය.

3.4. ස්වයංක්‍රීය ටෙලර් යාන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවලට අදාළ ගාස්තු සම්බන්ධයෙන් සිදු කරන අයකිරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවනු ලබන සීමාවන් ඇත්නම් ඊට අනුකූලව සිදු කළ යුතුය.

4. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි වගකීම්:

4.1. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තනි ක්‍රියාකරු වේ;

4.2. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම පහත සඳහන් කාර්යයන් සඳහා වගකිව යුතු වේ;

4.2.1. සෑම දිනකම දවස පුරාම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

4.2.2. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය සහිතව සුදුසුකම්ලත් ආයතන සඳහා ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික හා ද්විතීයික සාමාජිකත්ව ලබාදීම;

4.2.3. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් රීති මාලාවන් නිකුත් කළ යුතු අතර, එය ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ගේ බලතල, අයිතිවාසිකම්, යුතුකම් හා බැඳීම් මෙන්ම සාමාජිකත්වය ලබා ගැනීම්, ඉවත්වීම්, අවසන් කිරීම් හා අත්හිටුවීම්, මෙහෙයුම් අවශ්‍යතාවන්, ආරවුල් විසඳීමේ ක්‍රමවේදයන්, තොරතුරුවල රහස්‍යභාවය පවත්වාගෙන යාම සඳහා කොන්දේසි ආදී කරුණු ද ඇතුළත් පැහැදිලි හා විස්තරාත්මක රීති මාලාවක් විම;

4.2.4. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් සඳහා විශේෂ නියමයන්, ප්‍රමිතීන්, ආරක්ෂිත ලක්ෂණ සහ විගණන අනුකූලතා යනාදිය නිර්වචනය කිරීම;

4.2.5. සෑම සාමාජිකයකුගේ ම ශුද්ධ ශේෂ දක්වමින් ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් කාණ්ඩ, ශ්‍රී මහ බැංකුව විසින් නියම කරන ලද කඩඉම් වේලාවන්හි දී හෝ ඊට පෙර මහ බැංකුවට ලැබීමට සැලැස්වීම;

4.2.6. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම්වලට අදාළ ඕනෑම සේවා සපයන්නකු සමඟ ගිවිසුම්වලට සහ කොන්ත්‍රාත්වලට එළඹීම හා අවසන් කිරීම;

4.2.7. මෙහි 3.4 වගන්තියට යටත්ව, කලින් කලට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සංශෝධනය කළ හැකි ඒකීය ගාස්තු සහ දඩ අය කිරීමේ ව්‍යුහයක් සකස් කිරීම;

4.2.8. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් සහ ඊට අදාළ කරුණු සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද වාර්තා කිරීමේ අවශ්‍යතාවලට අනුගතව ක්‍රියා කිරීම.

5. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ගේ වගකීම්:

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයකුම පහත දැක්වෙන කාර්යයන් සිදු කළ යුතුය;

5.1. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ විශේෂ නියමයන්ට පූර්ණ වශයෙන් අනුකූල වන පරිදි පද්ධතීන්ට අදාළව දෘඩාංග, මෘදුකාංග සහ ජාලමය යටිතල පහසුකම් සපයා ගැනීම;

5.2. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවල මනා නඩත්තුව සහ දවස පුරා තම ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍රවල ප්‍රමාණවත් පරිදි මුදල් පවත්වා ගෙන යන බවට සහතික වීම;

5.3. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ආරක්ෂාව සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් සහභාගීකරුවන් වෙත නිකුත් කළ ආරක්ෂණ ක්‍රමවේදවලට අනුකූල වීම සහ උපදෙස් පිළිපැදීමට බැඳී සිටීම;

5.4. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් කලින් කලට නියම කරනු ලබන තාක්ෂණික, පරිපාලනමය සහ අනෙකුත් අවශ්‍යතාවන්ට අනුකූල වීම;

5.5. ශ්‍රී ලංකා මහ බැංකුව නියම කර ඇති පරිදි කඩඉම් වේලාවන්හි දී ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පියවීම සඳහා තත්කාලීන දළ පියවීම් ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් පවත්වාගෙන යන බවට සහතික වීම;

5.6. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දත්ත ගබඩාවෙහි සහ අනිකුත් සියලුම තොරතුරුවල ද මෙහෙයුම් කටයුතුවලට අදාළ දත්තයන්හි ද උපස්ථ පිටපත් නිතිපතා සැකසීම සහ පද්ධති බිඳ වැටීමක් හෝ දත්ත විනාශ වීමක් හෝ නැතිවීමක් හෝ සිදු වූ අවස්ථාවක දී එම දත්ත නැවත ලබාගෙන යථා තත්ත්වයට පත්විය හැකි ක්‍රමවේදයක් ස්ථාපනය කර පවත්වාගෙන යෑම;

5.7. දෛනික ගනුදෙනු වාර්තා සැසඳිය යුතු අතර යම් විෂමතාවක් ඇතොත් පියවීම් වාර්තාව ලැබී පැය 24 ක් ඇතුළත ඒ පිළිබඳව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට ලිඛිතව දැන්වීම;

5.8. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් සකසන ලද ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය සම්බන්ධයෙන් සකස් කොට ඇති පද්ධති රීතිවලට අනුකූලව කටයුතු කිරීම; සහ

5.9. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් දැනුම් දෙන ලද ගාස්තු සහ දඩ මුදල් ව්‍යුහයට අනුකූල වීම.

6. ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම:

6.1. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සේවාවන් දවස පුරාම පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ එම පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් විසින්, එම යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලවල අනුමැතිය සහිතව මනා ලෙස සැකසූ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක් තබා ගත යුතුය.

6.2. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් විසින් සියලු පහසුකම් සහිත ප්‍රතිප්‍රාප්ති වැඩබිමක් සහ ආපදා කළමනාකරණය හා ආපදාවන්ට ලක්වූ ව්‍යාපාර යථා තත්ත්වයට පත් කිරීම සඳහා මනාව පුහුණු වූ කණ්ඩායම් පවත්වා ගත යුතුය.

6.3. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු, කම්කරු ආරවුල් ඇතුළු හදිසි අවස්ථාවන්හිදී කිසිදු අඩාල වීමකින් තොරව පවත්වාගෙන යාම සහතික වීම සඳහා එම පද්ධතියේ ප්‍රධාන කාර්යයන් පිළිබඳව පුහුණුවක් ලද මනා නිපුණත්වයකින් යුතු විකල්ප කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය.

6.4. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ කටයුතු පවත්වාගෙන යෑමට බාධා වන සේ කිසියම් තාක්ෂණික හෝ මෙහෙයුම් දෝෂයකට මුහුණ පෑමට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සිදුවුවහොත්, ඒ පිළිබඳව දැනුවත් වූ වහාම ඒ බව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතුය. නැවත යථා තත්ත්වයට පත් කිරීමට අපහසු බිඳ වැටීමක් ප්‍රාථමික වැඩබිමෙහි සිදුවුවහොත්, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් වහාම ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව දැනුවත් කළ යුතු අතර ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට

ආරම්භ කර බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් දත්ත ගොනුව, එම වැඩබිමෙහි සිට ශ්‍රී ලංකා මහ බැංකුව යොමු කළ යුතුය. ප්‍රාථමික හා ප්‍රතිප්‍රාප්ති යන වැඩ බිම් දෙකෙහිම දිගුකාලීනව යථා තත්ත්වයට පත් කළ නොහැකි බිඳ වැටීමක් සිදු වූ අවස්ථාවක දී ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් වහාම ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුවත් කළ යුතුය. එමෙන්ම අවසාන නිෂ්කාශන චක්‍රයේ සිට පද්ධතියෙහි බිඳ වැටීම සිදුවූ වේලාව වන තෙක් වන කාල පරිච්ඡේදයට අදාළ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ශේෂයන් ලබාගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයක් අනුගමනය කළ යුතු අතර එම ශේෂ වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබාදීමට කටයුතු කළ යුතුය.

7. **රහස්‍යභාවය:**

7.1. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් සියලු දත්ත, තොරතුරු සහ වාර්තාවල රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර අදාළ නීතිවලට අනුකූලව සෑම අවස්ථාවකම එම ආයතනවල නිලධාරීන්, සේවකයින්, නියෝජිතයින් සහ/හෝ ඕනෑම තත්ත්වයක් යටතේ සේවයට බඳවාගෙන ඇති සේවකයින් රහස්‍යභාවය ආරක්ෂා කරන බවට සහතික විය යුතුය.

7.2. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් සම්බන්ධව, නීතියෙන් හෝ වෙනත් අයුරකින් කලින් කලට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයන් වෙත පවරා ඇති බලතල හා කටයුතු ක්‍රියාත්මක කිරීමේ දී ශ්‍රී ලංකා මහ බැංකුවේ පාලනයට, අධීක්ෂණයට, නියාමනයට සහ ආවේක්ෂණයට සාමූහිකව සහ තනි තනිව යටත් විය යුතු අතර ඒ සම්බන්ධව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන සියලුම උපදෙස්, විධාන සහ නියෝගවලට අනුකූලව කටයුතු කළ යුතුය.

7.3. ඉහත සඳහන් වගන්තියේ කරුණුවලට අමතරව සහ එකී කරුණුවලට අගති විරහිතව ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම්වලට අදාළව තොරතුරු ලබා දෙන ලෙස කලින් කලට සහ ඕනෑම වේලාවක ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට නියෝග කළ හැකි අතර, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්, එවැනි තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලබා දිය යුතුය.

7.4. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයන් විසින්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම්වලට අදාළව, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ වෙත ලබාදෙන සියලු වාර්තා සහ තොරතුරු නිවැරදි විය යුතුය.

8. **පොදු කරුණු:**

8.1. මෙම විධිවිධානය ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට අදාළ වන සහ කලින් කලට අදාළ විය හැකි ඕනෑම වෙනත් ලිඛිත නීති සහ රීති, රෙගුලාසි, නියමයන් හා කොන්දේසිවලට අතිරේක වන අතර අගතියක් වන අයුරින් නොයෙදේ.

8.2. ඉහත වගන්තියෙහි සාකල්‍යතාවයට හානි නොවන පරිදි 2005 අංක 28 දරන ගෙවීමේ හා බේරුම් කිරීමේ පද්ධති පනත මගින් පනවා ඇති ඕනෑම බැඳීමක් හෝ වගකීමක් මෙම විධිවිධාන මගින් සීමා කෙරෙන අයුරින් අර්ථ නිරූපනය නොකළ යුතුය.

2022 අංක 03 දරන පොදු විධිවිධාන - විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනතේ 44 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු විධිවිධාන.

ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය
නියෝජ්‍ය අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

2022 පෙබරවාරි මස 28 වැනි දින
කොළඹ දී ය.

2022 අංක 03 දරන පොදු විධිවිධාන - විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු

2022 අංක 03 දරන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු ලෙස හඳුන්වනු ලබන මෙම විධිවිධාන, 2018 අංක 01 දරන විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිලිබඳ පොදු විධිවිධාන ප්‍රතිස්ථාපනය කරනු ලබයි. මෙම විධිවිධාන, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජිකයින්ට අදාළ වන අතර, 2022 පෙබරවාරි මස 28 වැනි දින සිට මෙය බලාත්මක වේ.

2. නිර්වචන

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම පොදු විධිවිධානයෙහි:

2.1. "විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය" හෝ සෙන්ට්ස් යන්නෙන් රට තුළ ඇති මූල්‍ය ආයතන අතර තත්කාලීනව අරමුදල් පැවරීම සඳහා පහසුකම් සපයන සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් අතර අරමුදල් පැවරීම සහ අදාළ සාමාජිකයින් වෙත එම අරමුදල් යොමු කිරීම හා නිෂ්කාශනය කිරීම සඳහා වූ පද්ධති, ක්‍රියාවලීන් හා ක්‍රියාපටිපාටීන් ඇතුළත් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම මගින් මෙහෙයවනු ලබන විද්‍යුත් පද්ධතියක් අදහස් කරනු ලබයි.

2.2. "විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්" යන්නෙන් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික සහ ද්විතියික සාමාජිකයින් අදහස් වේ.

2.3. "විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණ පද්ධතිය" යන්නෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දත්ත කිසිදු සීමා කිරීමකින් තොරව බෙදාහැරීම්, ලැබීම්, සකස් කිරීම් සහ ලේඛනාගාර ගත කිරීම් ඇතුළුව විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සම්බන්ධයෙන් මෙහෙයවනු ලබන සහ පවත්වාගෙන යනු ලබන පද්ධති සහ ක්‍රියාවලීන් අදහස් වේ.

2.4. "නිෂ්කාශන චක්‍රය" යන්නෙන් පියවීම් සඳහා ගනුදෙනුවල ශුද්ධ අගය තීරණය කිරීමට, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තු අධ්‍යක්ෂ සමඟ එකඟතාවයෙන් අර්ථ දක්වන ලද කාල සීමාව අදහස් වේ.

2.5. "ගනුදෙනුකරු" යන්නෙන් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට ගෙවීම් නියෝග නිකුත් කිරීම හෝ ඒ සඳහා අවසර ලබාදීම සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට අදාළ ගිණුම් හර කිරීමට හෝ අදාළ ගෙවීම් නියෝගයෙහි මූල්‍ය වටිනාකමට සමාන වටිනාකමක් මුදලින් එම පොදු යාන්ත්‍රණයේ අදාළ සාමාජිකයින්ට ලබාදීම සිදු කරන ඕනෑම නෛතික හෝ ස්වාභාවික පුද්ගලයෙකු අදහස් කරනු ලබයි.

2.6. "මෙහෙයුම් ක්‍රියාවලි අත්පොත" යන්නෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට මඟ පෙන්වීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව සැකසූ ක්‍රියාවලි ඇතුළත් ලේඛනය අදහස් වේ.

2.7. "ප්‍රාථමික සාමාජික" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජිකයෙකු වීමට අනුමැතිය දෙන ලද තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගිත්ව ආයතනයක් වන ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වේ.

2.8. "තත්කාලීන දළ පියවීම් පද්ධතිය" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන පූර්ණ ස්වයංක්‍රීය ගෙවීම් පද්ධතිය අදහස් වේ.

2.9. "ද්විතියික සාමාජික" යන්නෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට අවසර ලබා දෙන්නා වූ සහ ප්‍රාථමික සාමාජිකයෙකු විසින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් ගනුදෙනු සිදු කිරීමටත් එම ගනුදෙනුවල ශුද්ධ ශේෂය, එම ප්‍රාථමික සාමාජිකයාගේ තත්කාලීන දළ පියවීම් ගිණුම හරහා පියවීමටත්, අනුමැතිය ලබාදෙන ඕනෑම නෛතික ඒකකයක් අදහස් වේ.

2.10. "සාමාජිකත්ව ගිවිසුම" යන්නෙන් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ කටයුතු සම්බන්ධයෙන් එම යාන්ත්‍රණයේ සාමාජිකයෙකු ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සමග එළඹෙනු ලබන ගිවිසුමක් අදහස් වේ.

3. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයෙකුගේ වගකීම්:

3.1. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සහභාගිත්ව හා මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සාමාජිකත්ව ගිවිසුමකට එළඹිය යුතුය.

3.2. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නියමයන්, ක්‍රියාදාමයන් සහ වෙනත් එබඳු එකඟතාවන් ඇතුළුව කලින් කලට පනවනු ලබන විධිවිධාන වලට අනුකූලව, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම ඔවුන් අතර ඇති කරගත් අන්‍යෝන්‍ය එකඟතාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.

3.3. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් ක්‍රියාවලි අත්පොතෙහි නියමයන් හා මාර්ගෝපදේශ අනුගමනය කිරීමට එකඟ විය යුතුය.

3.4. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම, විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවලට අදාළව යම් ගාස්තු අයකිරීමක් සිදු කරන්නේ නම් එකී අය කිරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවනු ලබන සීමාවන් ඇත්නම් ඊට අනුකූලව සිදු කළ යුතුය.

4. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි වගකීම්:

4.1. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තනි ක්‍රියාකරු වේ.

4.2. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම;

4.2.1. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සේවා මෙහෙයුම් කටයුතු සෑම දිනකම දවස පුරාම සිදු කිරීම;

4.2.2. ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව සුදුසුකම්ලත් ආයතන සඳහා විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික හා ද්විතීයික සාමාජිකත්වය ලබාදීම;

4.2.3. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් පද්ධති රීති මාලාවන් නිකුත් කළ යුතු අතර, එය ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ගේ බලතල, අයිතිවාසිකම්, යුතුකම් හා බැඳීම් මෙන්ම සාමාජිකත්වය ලබාගැනීම්, ඉවත්වීම්, අවසන් කිරීම් හා අත්හිටුවීම්, මෙහෙයුම් අවශ්‍යතාවන්, ආරවුල් විසඳීමේ ක්‍රමවේදයන්, තොරතුරුවල රහස්‍යභාවය පවත්වාගෙන යාම සඳහා වන කොන්දේසි ආදී කරුණු ද ඇතුළත් පැහැදිලි හා විස්තරාත්මක රීති මාලාවක් විය යුතුවේ. පද්ධති රීතීන්ට සංශෝධනයක් අවශ්‍ය වූ විට එම සංශෝධනයන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව සිදු කළ යුතුය;

4.2.4. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් සඳහා අදාළ වන විශේෂ නියමයන්, ප්‍රමිතීන්, ආරක්ෂිත ලක්ෂණ සහ විගණන අනුකූලතා යනාදිය නිර්වචනය කිරීම;

4.2.5. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද කඩඉම් වේලාවන්හි දී හෝ ඊට පෙර, සෑම සාමාජිකයෙකුගේම ශුද්ධ ශේෂ දක්වමින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් කාණ්ඩ, මහ බැංකුවට ලැබීමට සැලැස්වීම;

4.2.6. විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම්වලට අදාළ ඕනෑම සේවා සපයන්නෙකු සමඟ නිසිපරිදි ගිවිසුම්වලට සහ කොන්ත්‍රාත්වලට එළඹීම;

4.2.7. මෙහි 3.4 වගන්තියට යටත්ව, කලින් කලට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සංශෝධනය කළ හැකි ඒකීය ගාස්තු සහ දඩ අය කිරීමේ ව්‍යුහයක් සකස් කිරීම;

යන කාර්යයන් සඳහා වගකිව යුතු වේ.

4.3. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සහ අදාළ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද වාර්තා කිරීමේ අවශ්‍යතාවයන්ට අනුගතව ක්‍රියා කළ යුතුය.

4.4. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සම්බන්ධයෙන් අවශ්‍ය අවස්ථාවල දී එහි සාමාජිකයින්ට හා පොදු මහජනතාවට පුහුණු කිරීමේ වැඩසටහන්, දැනුවත් කිරීම් හා අධ්‍යාපනික වැඩසටහන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් කළ යුතුය.

5. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ගේ වගකීම්:

5.1. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජිකයෙක් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් මෙහෙයවනු ලබන නිෂ්කාශන පද්ධතීන්හි හැරුණු විට, ජාතික මට්ටමේ කිසිදු අන්තර්බැංකු නිෂ්කාශන සහ පියවීම් පද්ධතියකට සම්බන්ධ වී කටයුතු නොකළ යුතුය.

5.2. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සියළුම සාමාජිකයින් පහත දැක්වෙන කාර්යයන් සිදු කළ යුතුය.

5.2.1. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් සකස් කරන ලද විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පද්ධති රීතීන්වලට අනුකූල වීම;

5.2.2. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සුමටව පවත්වාගෙන යෑමට කලින් කලට නියම කරනු ලබන තාක්ෂණික, පරිපාලනමය සහ අනෙකුත් අවශ්‍යතාවයන්ට අනුකූල වීම;

5.2.3. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් ගනුදෙනුකරුවන්ට තත්කාලීනව සිදු කරන ගනුදෙනු සම්පූර්ණ කරන ලද බව හෝ අසම්පූර්ණ බව දැන්වීම සඳහා ක්‍රියාපටිපාටියක් සහ/හෝ ක්‍රමවේදයක් ඇති කිරීම;

5.2.4. ශ්‍රී ලංකා මහ බැංකුව නියම කර ඇති පරිදි කඩඉම් වේලාවන්හි දී විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් ගොනුව පියවීම සඳහා තත්කාලීන දළ පියවීම් ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් පවත්වාගෙන යන බවට සහතික වීම;

5.2.5. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දත්ත ගබඩාවෙහි මෙහෙයුම් කටයුතුවලට අදාළ දත්තයන්හි උපස්ථ පිටපත් නිතිපතා සැකසීම සහ ප්‍රාථමික වැඩබිමක පද්ධති බිඳවැටීමක් හෝ දත්ත විනාශ වීමක් හෝ නැතිවීමක් හෝ සිදුවූ අවස්ථාවක දී එම දත්ත නැවත ලබාගෙන යථා තත්ත්වයටය පත්විය හැකි ක්‍රමවේදයක් ස්ථාපනය කර පවත්වාගෙන යෑම;

5.2.6. දෛනික ගනුදෙනු වාර්තා සැසඳීම සහ යම් විෂමතාවක් ඇතොත් පියවීම් වාර්තාව ලැබී පැය 24ක් ඇතුලත ඒ පිළිබඳව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට ලිඛිතව දැන්වීම;

5.2.7. ශ්‍රී ලංකා මහ බැංකුවේ අනුමැතිය සහිතව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නියම කරන ලද විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනු සීමාවන්වලට අනුකූලව කටයුතු කිරීම;

5.2.8. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සහ ඊට අදාළ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දක්වා ඇති වාර්තාමය අවශ්‍යතා සපුරාලීම; සහ

5.2.9. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය හරහා සිදුවන ගනුදෙනු 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනත යටතේ නිකුත් කරන ලද නියෝග සහ මූල්‍ය බුද්ධි ඒකකයේ උපදෙස් ප්‍රකාරව ශ්‍රී ලංකා මහ බැංකුවේ මූල්‍ය බුද්ධි ඒකකයට වාර්තා කිරීම.

6. ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම:

6.1. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සේවාවන් දවස පුරාම පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ එම පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලවල අනුමැතිය ලත් මනා ලෙස සැකසූ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක් තබා ගත යුතුය.

6.2. මෙහෙයුම් කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් විසින් සියලු පහසුකම් සහිත ප්‍රතිප්‍රාප්ති වැඩබිමක් සහ ආපදා කළමනාකරණය හා ආපදාවන්ට ලක්වූ ව්‍යාපාර යථා තත්ත්වයට පත් කිරීම සඳහා මනාව පුහුණු වූ කණ්ඩායම් පවත්වා ගත යුතුය.

6.3. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු, හදිසි අවස්ථාවන්හි දී කිසිදු අඩාල වීමකින් තොරව පවත්වාගෙන යාම සහතික වීම සඳහා එම පද්ධතියේ ප්‍රධාන කාර්යයන් පිළිබඳව පුහුණුවක් ලද මනා නිපුණත්වයකින් යුතු විකල්ප කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය.

6.4. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ කටයුතු පවත්වාගෙන යෑමට බාධා වන සේ කිසියම් තාක්ෂණික හෝ මෙහෙයුම් දෝෂයකට මුහුණ පෑමට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සිදුවුවහොත්, ඒ පිළිබඳව දැනුවත් වූ වහාම ඒ බව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතුය. නැවත යථා තත්ත්වයට පත් කිරීමට අපහසු බිඳ වැටීමක් ප්‍රාථමික වැඩබිමෙහි සිදුවුවහොත්, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් වහාම ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැන්විය යුතු අතර විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට ආරම්භ කර බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් දත්ත ගොනුව, එම වැඩබිමෙහි සිට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ යුතුය. ප්‍රාථමික හා ප්‍රතිප්‍රාප්ති යන වැඩබිම් දෙකෙහිම දිගුකාලීනව යථා තත්ත්වයට පත් කළ නොහැකි බිඳ වැටීමක් සිදුවූ අවස්ථාවක දී ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් වහාම ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැන්විය යුතුය. එමෙන්ම අවසාන නිෂ්කාශන චක්‍රයේ සිට පද්ධතියෙහි බිඳ වැටීම සිදුවූ වේලාව වන තෙක් වන කාල පරිච්ඡේදයට අදාළ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ශේෂයන් ලබාගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයක් අනුගමනය කළයුතු අතර එම ශේෂ වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබාදීමට කටයුතු කළ යුතුය.

7. රහස්‍යභාවය:

ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් සියලු දත්ත, තොරතුරු සහ වාර්තාවල රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර, සෑම අවස්ථාවකදීම එම ආයතනවල නිලධාරීන්, සේවකයින්, නියෝජිතයින් සහ/හෝ ඕනෑම තනතුරක සේවයෙහි යොදවා ඇති සේවකයෙකු රහස්‍යභාවය ආරක්ෂා කරන බවට සහතික විය යුතුය.

8. පොදු කරුණු:

8.1. ඉහත සඳහන් වගන්තියේ කරුණුවලට අමතරව සහ එකී කරුණුවල අගති විරහිතව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම්වලට අදාළ තොරතුරු ලබාදෙන ලෙස කලින් කලට සහ ඕනෑම වේලාවක ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට නියෝග කළහැකි අතර, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් එවැනි තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දිය යුතුය.

8.2. මෙම විධිවිධානය ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට අදාළ වන සහ කලින් කලට අදාළ විය හැකි ඕනෑම වෙනත් ලිඛිත නීති සහ රීති, රෙගුලාසි, නියමයන් හා කොන්දේසිවලට අතිරේක වන අතර අගතියක් වන අයුරින් නොයෙදේ.

8.3. ඉහත වගන්තියෙහි සාකල්‍යතාවයට හානි නොවන පරිදි 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත මගින් පනවා ඇති ඕනෑම බැඳීමක් හෝ වගකීමක් හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ කරන ලද හෝ දෙන ලද ඕනෑම රීතියක්, රෙගුලාසියක්, උපදෙස්, නියමයක්, නියෝගයක් මෙම විධිවිධාන මගින් සීමා කෙරෙන අයුරින් අර්ථ නිරූපනය නොකළ යුතුය.

2022 අංක 04 දරන පොදු විධිවිධාන - විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත

2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනතේ 44 වැනි වගන්තිය යටතේ ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද පොදු විධිවිධාන.

ටී.එම්.ජේ.වයි.පී. ප්‍රනාන්දු මිය
නියෝජ්‍ය අධිපති
ශ්‍රී ලංකා මහ බැංකුව

2022 පෙබරවාරි මස 28 වැනි දින

කොළඹ දී ය.

2022 අංක 04 දරන පොදු විධිවිධාන - විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු

2022 අංක 04 දරන විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු ලෙස හඳුන්වනු ලබන මෙම විධිවිධාන, විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයන්ට සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට අදාළ වේ. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය යනු තම ගනුදෙනුකරුවෙකු නොවන කාඩ්පත් හිමියෙකුගේ (not-on-us) විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර ගනුදෙනු හුවමාරුවට සහ නිෂ්කාශනයට විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයන්ට පහසුකම් සැලසීමට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම මගින් මෙහෙයවනු ලබන විද්‍යුත් පද්ධතියකි. මෙම පොදු විධිවිධාන මගින් 2018 අංක 02 දරන විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය මෙහෙයුම් කටයුතු පිළිබඳ පොදු විධිවිධාන ප්‍රතිස්ථාපනය කරනු ලබන අතර එය 2022 පෙබරවාරි මස 28 වැනි දින සිට බලපැවැත් වේ.

2. නිර්වචන

පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස මෙම පොදු විධිවිධානයෙහි;

2.1. "විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයන්" යන්නෙන් විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික සහ ද්විතියික සාමාජිකයින් අදහස් වේ.

2.2. "නිෂ්කාශන චක්‍රය" යන්නෙන් පියවීම සඳහා ගනුදෙනුවල ශුද්ධ අගය තීරණය කිරීමට, ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් අර්ථ දක්වන ලද කාල සීමාව අදහස් වේ.

2.3. "තම ගනුදෙනුකරුවෙකු නොවන කාඩ්පත් හිමියෙකුගේ විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර ගනුදෙනු" යන්නෙන් විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ වෙනත් සාමාජිකයකුගේ ගනුදෙනුකරුවකු විසින් විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයකුගේ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍රය මගින් ආරම්භ කළ ගනුදෙනුව අදහස් වේ.

2.4. "මෙහෙයුම් ක්‍රියාවලි අත්පොත" යන්නෙන් විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට මඟ පෙන්වීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු පිළිබඳව සැකසූ ක්‍රියාවලි ඇතුළත් ලේඛනය අදහස් වේ.

2.5. "ප්‍රාථමික සාමාජික" යන්නෙන් ශ්‍රී ලංකා මහා බැංකුව සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සාමාජිකයෙකු වීමට අනුමැතිය දෙන ලද තත්කාලීන දළ පියවීම් පද්ධතියෙහි සහභාගීත්ව ආයතනයක් වන ඕනෑම බලපත්‍රලාභී වාණිජ බැංකුවක් හෝ බලපත්‍රලාභී විශේෂිත බැංකුවක් අදහස් වේ.

2.6. "තත්කාලීන දළ පියවීම් පද්ධතිය" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවට අයත් සහ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් මෙහෙයවනු ලබන පූර්ණ ස්වයංක්‍රීය ගෙවීම් පද්ධතිය අදහස් වේ.

2.7. "ද්විතීයික සාමාජික" යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුව සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයෙකු ලෙස කටයුතු කිරීමට අවසර ලබා දෙන්නා වූ සහ ප්‍රාථමික සාමාජිකයෙකු විසින් විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණය මගින් ගනුදෙනු සිදු කිරීමටත් එම ගනුදෙනුවල ශුද්ධ ශේෂය, එම

ප්‍රාථමික සාමාජිකයාගේ තත්කාලීන දළ පියවීම් ගිණුම හරහා පියවීමටත් අනුමැතිය ලබා දෙන ඕනෑම නෛතික ඒකකයක් අදහස් වේ.

2.8. "සාමාජිකත්ව ගිවිසුම" යන්නෙන් විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ කටයුතු සම්බන්ධයෙන් එම යාන්ත්‍රණයේ සාමාජිකයෙකු ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සමග එළඹෙනු ලබන ගිවිසුමක් අදහස් වේ.

3. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ සහ විකුණුම්පල ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයෙකුගේ වගකීම්:

3.1. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම, විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සහභාගිත්ව සහ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් සාමාජිකත්ව ගිවිසුමකට එළඹිය යුතුය.

3.2. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම, විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් ක්‍රියාවලි අත්පොතෙහි නියමයන් සහ මාර්ගෝපදේශ අනුගමනය කිරීමට එකඟ විය යුතුය.

3.3. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් නියමයන්, ක්‍රියාදාමයන් සහ වෙනත් එබඳු එකඟතාවන් ඇතුළුව කලින් කලට පනවනු ලබන විධිවිධානවලට අනුකූලව, විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම ඔවුන් අතර ඇති කරගත් අන්‍යෝන්‍ය එකඟතාවන්ට අනුකූලව ක්‍රියා කළ යුතුය.

3.4. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙක්ම සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවලට අදාළව යම් ගාස්තු අයකිරීමක් සිදු කරන්නේ නම් එකී අයකිරීම් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවනු ලබන සීමාවන් ඇත්නම් ඊට අනුකූලව සිදු කළ යුතුය.

4. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමෙහි වගකීම්:

4.1. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ තනි ක්‍රියාකරු වේ.

4.2. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම;

4.2.1. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සේවා මෙහෙයුම් කටයුතු සෑම දිනකම දවස පුරාම සිදු කිරීම;

4.2.2. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව සුදුසුකම්ලත් ආයතන සඳහා විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික හා ද්විතීයික සාමාජිකත්වය ලබාදීම;

4.2.3. ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් පද්ධති නීති රීති මාලාවක් නිකුත් කළ යුතු අතර, එය ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමේ සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ගේ වගකීම්, සාමාජිකත්වය ලබා ගැනීම්, ඉවත්වීම්, අවසන් කිරීම් හා අත්හිටුවීම්, මෙහෙයුම් අවශ්‍යතාවයන්, ආරවුල් විසඳීමේ ක්‍රමවේදයන්, තොරතුරුවල රහස්‍යභාවය පවත්වාගෙන යාම සඳහා වන කොන්දේසි ආදී කරුණු ද ඇතුළත් පැහැදිලි හා විස්තරාත්මක රීති මාලාවක් විය යුතුවේ. පද්ධති රීතීන්ට සංශෝධනයක් අවශ්‍ය වූ විට එම සංශෝධනයන් ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂකගේ අනුමැතිය සහිතව සිදුකළ යුතුය.

4.2.4. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නියම කරන ලද කඩඉම් වේලාවන්හි දී හෝ ඊට පෙර, විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවල පියවීම සඳහා විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ බහුපාර්ශ්වීය ශුද්ධ පියවීම් කාණ්ඩ, මහ බැංකුවට ලැබීමට සැලැස්වීම;

4.2.5. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ගනුදෙනුවලට අදාළව යම් ගාස්තු අය කිරීමක් සිදු කරන්නේ නම්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද සීමාවන්ට යටත්ව, කලින් කලට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සංශෝධනය කළ හැකි ඒකීය ගාස්තු සහ දඩ අය කිරීමේ ව්‍යුහයක් සකස් කිරීම;

4.3. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සහ අදාළ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් පනවන ලද වාර්තා කිරීමේ අවශ්‍යතාවයන්ට අනුගතව ක්‍රියා කළ යුතුය.

5. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ගේ වගකීම්:

5.1. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සියලුම සාමාජිකයින් පහත දැක්වෙන කාර්යයන් සිදු කළ යුතුය.

5.1.1. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ පද්ධති රීතීන්ට අනුකූල වීම;

5.1.2. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සුමටව පවත්වාගෙන යෑමට කලින් කලට නියම කරනු ලබන තාක්ෂණික, පරිපාලනමය සහ අනෙකුත් අවශ්‍යතාවයන්ට අනුකූල වීම;

5.1.3. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ දත්ත ගබඩාවෙහි මෙහෙයුම් කටයුතුවලට අදාළ දත්තයන්හි උපස්ථ පිටපත් නිතිපතා සැකසීම සහ ප්‍රාථමික වැඩබිමක පද්ධති බිඳවැටීමක් හෝ දත්ත විනාශවීමක් හෝ නැතිවීමක් හෝ සිදු වූ අවස්ථාවකදී එම දත්ත නැවත ලබාගෙන යථා තත්ත්වයට පත්විය හැකි ක්‍රමවේදයක් ස්ථාපනය කර පවත්වාගෙන යෑම;

5.1.4. දෛනික ගනුදෙනු වාර්තා සැසඳීම සහ යම් විෂමතාවක් ඇතොත් පියවීම් වාර්තාව ලැබී පැය 24ක් ඇතුළත ඒ පිළිබඳව ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට ලිඛිතව දැන්වීම; සහ

5.1.5. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සහ ඊට අදාළ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දක්වා ඇති වාර්තාමය අවශ්‍යතා සපුරාලීම.

5.2. ශ්‍රී ලංකා මහ බැංකුව නියම කර ඇති පරිදි කඩඉම් වේලාවන්හි දී විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ බහු පාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පියවීම සඳහා තත්කාලීන දළ පියවීම් ගිණුමෙහි ප්‍රමාණවත් අරමුදල් පවත්වාගෙන යන බවට විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සෑම සාමාජිකයෙකු විසින්ම සහතික වීම. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික සාමාජිකයෙකු මෙම වගන්තියට අනුගත නොවන අවස්ථාවක දී ලංකාසෙට්ල් පද්ධති රීතීන්ට අනුකූලව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාමාර්ග ගනු ඇත.

6. ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම:

6.1. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සේවාවන් දවස පුරාම පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ එම පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් විසින්, එම යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු සම්බන්ධයෙන් ඔවුන්ගේ අධ්‍යක්ෂ මණ්ඩලවල අනුමැතිය ලත් මනා ලෙස සැකසූ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුමක් තබා ගත යුතුය.

6.2. මෙහෙයුම් කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම සහතික කිරීම සඳහා ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් විසින් සියලු පහසුකම් සහිත ප්‍රතිප්‍රාප්ති වැඩබිමක් සහ ආපදා කළමනාකරණය හා ආපදාවන්ට ලක් වූ ව්‍යාපාර යථා තත්ත්වයට පත් කිරීම සඳහා මනාව පුහුණු වූ කණ්ඩායම් පවත්වා ගත යුතුය.

6.3. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු, හදිසි අවස්ථාවන්හි දී කිසිදු අඩාල වීමකින් තොරව පවත්වාගෙන යාම සහතික වීම සඳහා එම පද්ධතියේ ප්‍රධාන කාර්යයන් පිළිබඳව පුහුණුවක් ලද මනා නිපුණත්වයකින් යුතු විකල්ප කාර්ය මණ්ඩලයක් පවත්වාගත යුතුය.

6.4. විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ කටයුතු පවත්වාගෙන යෑමට බාධා වන සේ කිසියම් තාක්ෂණික හෝ මෙහෙයුම් දෝෂයකට මුහුණ පෑමට ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සිදුවුවහොත්, ඒ පිළිබඳව දැනුවත් වූ වහාම ඒ බව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතුය. නැවත යථා තත්ත්වයට පත් කිරීමට අපහසු බිඳ වැටීමක් ප්‍රාථමික වැඩබිමෙහි සිදුවුවහොත්, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් වහාම ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැන්විය යුතු අතර විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම් කටයුතු ප්‍රතිප්‍රාප්ති වැඩබිමෙහි සිට ආරම්භ කර බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් දත්ත ගොනුව, එම වැඩබිමෙහි සිට ශ්‍රී ලංකා මහ බැංකුව වෙත යොමු කළ යුතුය. ප්‍රාථමික හා ප්‍රතිප්‍රාප්ති යන වැඩබිම් දෙකෙහිම දිගුකාලීනව යථා තත්ත්වයට පත් කළ නොහැකි බිඳ වැටීමක් සිදු වූ අවස්ථාවක දී ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් වහාම ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැන්විය යුතුය. එමෙන්ම අවසාන නිෂ්කාශන චක්‍රයේ සිට පද්ධතියෙහි බිඳ වැටීම සිදු වූ වේලාව වන තෙක් වන කාල පරිච්ඡේදයට අදාළ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ බහු පාර්ශ්වීය ශුද්ධ පියවීම් ශේෂයන් ලබා ගැනීම සඳහා විකල්ප ක්‍රමවේදයක් අනුගමනය කළයුතු අතර එම ශේෂ වාර්තා ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබාදීමට කටයුතු කළ යුතුය.

7. රහස්‍යභාවය:

ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින් සියලු දත්ත, තොරතුරු සහ වාර්තාවල රහස්‍යභාවය පවත්වාගෙන යා යුතු අතර, සෑම අවස්ථාවකදීම එම ආයතනවල නිලධාරීන්, සේවකයින්, නියෝජිතයින් සහ/හෝ ඕනෑම තනතුරක සේවයෙහි යොදවා ඇති සේවකයෙකු රහස්‍යභාවය ආරක්ෂා කරන බවට සහතික විය යුතුය.

8. පොදු කරුණු:

8.1. ඉහත සඳහන් වගන්තියේ කරුණුවලට අමතරව සහ එකී කරුණුවල අගති විරහිතව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ මෙහෙයුම්වලට අදාළ තොරතුරු ලබාදෙන ලෙස කලින් කලට සහ ඕනෑම වේලාවක ලංකාක්ලියර් (පුද්ගලික) සමාගමට සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට නියෝග කළ හැකි අතර, ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්, එවැනි තොරතුරු ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ලබා දිය යුතුය.

8.2. මෙම විධිවිධානය ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම සහ විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සාමාජිකයින්ට අදාළ වන සහ කලින් කලට අදාළ විය හැකි ඕනෑම වෙනත් ලිඛිත නීති සහ රීති, රෙගුලාසි, නියමයන් හා කොන්දේසිවලට අතිරේක වන අතර අගතියක් වන අයුරින් නොයෙදේ.

8.3. ඉහත වගන්තියෙහි සාකල්‍යතාවයට හානි නොවන පරිදි 2005 අංක 28 දරන ගෙවීමේ සහ බේරුම් කිරීමේ පද්ධති පනත මගින් පනවා ඇති ඕනෑම බැඳීමක් හෝ වගකීමක් හෝ වෙනත් ලිඛිත නීතියක් යටතේ නිකුත් කරන ලද හෝ දෙන ලද ඕනෑම රීතියක්, රෙගුලාසියක්, උපදෙස්, නියමයක්, නියෝගයක් මෙම විධිවිධාන මගින් සීමා කෙරෙන අයුරින් අර්ථ නිරූපනය නොකළ යුතුය.

යොමු අංකය :- 34/07/029/0001/002

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 02/2022 **2022 මැයි 10**

ලංකාසෙට්ල් පද්ධතියේ සියලුම සහභාගීත්ව ආයතන වෙත,

2022 මැයි 11 දින ලංකාසෙට්ල් පද්ධතියේ විශේෂ දෛනික මෙහෙයුම් කාලසටහන

පහත සඳහන් දෛනික මෙහෙයුම් කාලසටහන් 2022 මැයි 11 දින අනුගමනය කෙරේ.

කාලසටහන 1: 2022 මැයි 10 වන දින සඳහා

වේලාව	මෙහෙයුම	කාර්යයන් / ගනුදෙනු
0630 පැය	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
0730 පැය සිට 0800 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරැකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරැකුම්පත් හිමිකාරිත්වය සලකුණු කිරීම
0800 පැය	ලංකාසෙට්ල් පද්ධතිය 2022 මැයි 10 දිනට ව්‍යාපාර සඳහා විවෘත කිරීම.	2022 මැයි 10 දින ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම.
0800 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් (SDF) ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවිට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම්වල දෙවැනි අදියරට අදාළ ආපසු ගෙවීම් කටයුතු.
0815 පැය	දිනය ආරම්භයේ කරන කල්පිරීම් / පොළී ගෙවීම්, දවසේ ආරම්භක ගොනුව (SOD) සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරකුම්පත් කල්පිරීම්	කල්පිරීම් පියවීම / සුරකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු / දඩ මුදල් අයකිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරකුම්පත් කල්පිරීම්
0830 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම (2022 මැයි 10 දිනට අදාළ) ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු සහ දෙවන චක්‍රය (2022 මැයි 10 දිනට අදාළ)
0830 පැය	ප්‍රාථමික වෙන්දේසි පියවීම / ස්ථිර පදනමක් මත මිළදී ගැනුම් සහ විකුණුම් / දිගුකාලීන ප්‍රතිමිලදී ගැනීම් වෙන්දේසිය /දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරකුම්පත් නිකුත් කිරීම	ප්‍රාථමික වෙන්දේසි පියවීම, විවිට වෙළඳ කටයුතු ආශ්‍රිත ස්ථිර පදනමක් මත මිළදී ගැනුම් සහ විකුණුම්, දිගුකාලීන ශ්‍රී ලංකා මහ බැංකු සුරකුම්පත් වෙන්දේසිය සහ දිගුකාලීන ප්‍රතිමිළදී ගැනීම් වෙන්දේසියෙහි ප්‍රථම අදියර

0845 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CAS) පළමු සහ දෙවන චක්‍රය (2022 මැයි 10 දිනට අදාළ) විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CEFTS) පළමු සහ දෙවන චක්‍රය (2022 මැයි 10 දිනට අදාළ) විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CPS) පළමු සහ දෙවන චක්‍රය (2022 මැයි 10 දිනට අදාළ)
0900 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CAS) තෙවන සහ හතරවන චක්‍රය (2022 මැයි 10 දිනට අදාළ) විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CEFTS) තෙවන සහ හතරවන චක්‍රය (2022 මැයි 10 දිනට අදාළ) විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CPS) තෙවන සහ හතරවන චක්‍රය (2022 මැයි 10 දිනට අදාළ)
0900 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට (SLF) අදාළ ආපසු ගෙවීම්	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල දෙවන අදියරට ආදාළ පියවීම් (2022 මැයි 10 දිනට සම්පූර්ණ වන)
0915 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය (2022 මැයි 10 දිනට අදාළ) පියවුම් නිශ්කාශනය සහ ගැලපුම් නිශ්කාශනය (2022 මැයි 10 දිනට අදාළ)
0925 පැය	තුන්වන පාර්ශවීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකු වලට අදාළ MT2XX කාණ්ඩයේ ගනුදෙනු හැර, එම දින තුළ, තුන්වන පාර්ශවයේ අලුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම (2022 මැයි 10 දිනට අදාළ)
0930 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CAS) පස්වන චක්‍රය (2022 මැයි 10 දිනට අදාළ) විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CEFTS) පස්වන චක්‍රය (2022 මැයි 10 දිනට අදාළ) විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CPS) පස්වන චක්‍රය (2022 මැයි 10 දිනට අදාළ)
0930 පැය	නිත්‍ය පහසුකම් සඳහා පද්ධතිය වැසීම	සහභාගීත්ව ආයතනවලට 0930 පැයෙන් පසු නිත්‍ය ණය පහසුකම සහ නිත්‍ය තැන්පතු පහසුකම සඳහා වන කවුළු වසනු ලැබේ.
0940 පැය	සහභාගීත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබාගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන විසින් 0940 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිළදී ගැනීම සිදු නොකළ යුතුය.
0945 පැය	නිත්‍ය තැන්පතු පහසුකම	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම අදියරට අදාළ පියවීම
1045 පැය	නිත්‍ය ණය පහසුකම	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම අදියරට අදාළ පියවීම

1050 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම.
1100 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩි දුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුනු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම සහ අවලංගු කිරීම සිදු වේ.
1100 පැය සිට 1115 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු (EOD)	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු ක්‍රියාවලීන් උදා: වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යෙමෙු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1115 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරකුම්පත් පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම.

සටහන: මහ බැංකුව සමඟ සිදු කරන ලද 2022 මැයි 10 දිනට වලංගු විදේශ විනිමය ගනුදෙනු, 2022 මැයි 11 වන දින 1000 පැයේදී පියවිය යුතුය.

කාලසටහන 2: 2022 මැයි 11 වන දින සඳහා

වේලාව	මෙහෙයුම	කාර්යයන්/ ගනුදෙනු
1200 පැය සිට 1215 පැය දක්වා	පද්ධතිය ආරම්භ කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරකුම්පත් පද්ධතිය ආරම්භ කිරීම
1215 පැය සිට 1230 පැය දක්වා	දිනයේ ආරම්භක සැකසුම් කටයුතු	සුරකුම්පත් සඳහා වන නිල මිල ගණන් යාවත්කාලීන කිරීම සහ දවස තුළ ලබා දෙන ද්‍රවශීලතා පහසුකම් සඳහා සුරකුම්පත් හිමිකාරීත්වය සලකුණු කිරීම.
1230 පැය	ලංකාසෙට්ල් පද්ධතිය 2022 මැයි 11 දිනට ව්‍යාපාර සඳහා විවෘත කිරීම	2022 මැයි 11 දින ගනුදෙනු ක්‍රියාත්මක කිරීම සඳහා පද්ධතිය විවෘත කිරීම.
1230 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම්/ ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් (SDF) ස්වයංක්‍රීයව පියවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම් ලබා දීම සහ විවිට වෙළඳ කටයුතු ආශ්‍රිත ප්‍රතිමිලදී ගැනීම් සහ නිත්‍ය තැන්පතු පහසුකම් වල දෙවැනි අදියරට අදාළ ආපසු ගෙවීම් කටයුතු.
1245 පැය	දිනය ආරම්භයේ කරන කල්පිරීම් / පොළී ගෙවීම්, දවසේ ආරම්භක ගොනුව (SOD) සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරකුම්පත් කල්පිරීම්.	කල්පිරීම් පියවීම / සුරකුම්පත් කුපන් සඳහා ගෙවීම්, ලංකාසෙට්ල් පද්ධතියේ ගාස්තු / දඩ මුදල් අයකිරීම් සහ ශ්‍රී ලංකා මහ බැංකු සුරකුම්පත් කල්පිරීම්.
1300 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	ප්‍රධාන නිෂ්කාශන පද්ධතියට අදාළ ශුද්ධ නිෂ්කාශන ශේෂයන් පියවීම (2022 මැයි 11 දිනට අදාළ) ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි පළමු සහ දෙවන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ)

1315 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CAS) පළමු සහ දෙවන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ)
1330 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CEFTS) පළමු සහ දෙවන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ) විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CPS) පළමු සහ දෙවන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ)
1345 පැය	ප්‍රතිවිකුණුම් සහ ස්ථාවර ණය පහසුකමට (SLF) අදාළ ආපසු ගෙවීම්.	විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්වල සහ නිත්‍ය ණය පහසුකම්වල දෙවන අදියරට ආදාළ පියවීම් (2022 මැයි 11 දිනට සම්පූර්ණ වන)
1400 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CAS) තෙවන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ) විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CEFTS) තෙවන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ) විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CPS) තෙවන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ)
1430 පැය	කෙටි කාලීන ප්‍රතිමිලදී ගැනීම්/ ප්‍රතිවිකුණුම් (වෙන්දේසිය)	කෙටි කාලීන ප්‍රතිමිලදී ගැනීම්හි ප්‍රථම අදියරට අදාළ පියවීම්/ විවට වෙළඳ කටයුතු යටතේ ප්‍රතිවිකුණුම්
1445 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	පියවුම් නිශ්කාශනය සහ ගැලපුම් නිශ්කාශනය (2022 මැයි 11 දිනට අදාළ)
1500 පැය	තුන්වන පාර්ශවීය ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	අන්තර් බැංකු වලට අදාළ MT2XX කාණ්ඩයේ ගනුදෙනු හැර, එම දින තුළ, තුන්වන පාර්ශවයේ අලුත් ගනුදෙනු (T+0) සඳහා පද්ධතිය වැසීම (2022 මැයි 11 දිනට අදාළ)
1500 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	ශ්‍රී ලංකා අන්තර් බැංකු ගෙවීම් ක්‍රමයෙහි තෙවන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ) ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CAS) හතරවන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ)
1515 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CEFTS) හතරවන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ) විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CPS) හතරවන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ

1530 පැය	නිත්‍ය පහසුකම් සඳහා පද්ධතිය වැසීම	සහභාගීත්ව ආයතනවලට 1530 පැයෙන් පසු නිත්‍ය ණය පහසුකම සහ නිත්‍ය තැන්පතු පහසුකම සඳහා වන කවුළු වසනු ලැබේ.
1545 පැය	සහභාගීත්ව ආයතනවලට දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ලබාගැනීම අවසන් කිරීම	සහභාගීත්ව ආයතන විසින් 1545 පැයෙන් පසු දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ප්‍රතිමිළදී ගැනීම සිදු නොකළ යුතුය.
1545 පැය	ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනුව පද්ධතිය වෙත යොමු කිරීම (MLNS)	ස්වයංක්‍රීය ටේලර් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CAS) පස්වන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ) විද්‍යුත් අරමුදල් පැවරීම සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CEFTS) පස්වන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ) විකුණුම්පළ ගෙවීම් යන්ත්‍ර සඳහා වූ පොදු යාන්ත්‍රණයේ (CPS) පස්වන චක්‍රය (2022 මැයි 11 දිනට අදාළ)
1545 පැය	නිත්‍ය තැන්පතු පහසුකම	නිත්‍ය තැන්පතු පහසුකම් ප්‍රථම අදියරට අදාළ පියවීම
1600 පැය	නිත්‍ය ණය පහසුකම	නිත්‍ය ණය පහසුකම් ප්‍රථම අදියරට අදාළ පියවීම
1615 පැය	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු ගෙවීම	දවස ඇතුළත ද්‍රවශීලතා පහසුකම ආපසු අය කර ගැනීම.
1630 පැය	ගනුදෙනු සඳහා පද්ධතිය වැසීම	පද්ධතිය විසින් මෙම වේලාවෙන් පසුව වැඩි දුරටත් ගනුදෙනු භාර නොගනී. ගනුදෙනු සඳහා පද්ධතිය වැසීමෙන් පසු එතෙක් පෙළගැසී තිබුණු ගනුදෙනු කිසිවක් වේ නම් ඒවා නතර කිරීම සහ අවලංගු කිරීම සිදු වේ.
1630 පැය සිට 1700 පැය දක්වා	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු (EOD)	දවස අවසානයට අදාළ සැකසුම් කටයුතු ක්‍රියාවලීන් උදා: වාර්තා පිළියෙළ කිරීම, අදාළ ගොනු පොදු ලෙජරය වෙත යොමු කිරීම, ලංකාසෙට්ල් ගාස්තු අය කිරීම සඳහා අදාළ දත්ත පිළියෙළ කිරීම සහ මුද්‍රණ වාර්තා සැකසීම අයත් වේ.
1700 පැය	පද්ධතිය සංවෘත කිරීම	තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ නිර්ලේඛන සුරකුම්පත් පද්ධතියට අදාළ සියලුම මෘදුකාංග වසා දැමීම. දත්ත වෙනත් දත්ත ගබඩාවක සටහන් කිරීම.

සියලුම ගනුදෙනු පියවීම් කටයුතු නිසියාකාරයෙන් සිදු කිරීම සඳහා සියලුම සහභාගීත්ව ආයතන විසින් තම පියවීමේ ගිණුම, පියවීම් ගිණුම් පිරික්සුම් බ්‍රවුසරය මගින් නිරීක්ෂණය කළ යුතු අතර, ලංකාක්ලියර් වෙතින් ලැබෙන බහුපාර්ශවීය ශුද්ධ පියවීම් ගොනු තත්කාලීන දළ පියවීම් පද්ධතිය වෙත පියවීම සඳහා යොමු කරන අවස්ථාවේ දී තම පියවීම් ගිණුම්වල ප්‍රමාණවත් අරමුදල් ශේෂයන් පවත්වා ගැනීමට වග බලා ගත යුතු බවටත් සහභාගීත්ව ආයතන වෙත මෙයින් උපදෙස් දෙනු ලැබේ.

එම්. ආර් විජේවර්ධන
අධ්‍යක්ෂ - ගෙවීම් සහ පියවීම්

එම්. ඉසඩ්. එම් ආසිම්
අධිකාරී - රාජ්‍ය ණය

ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 03/2022 2022 ජූනි 20

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සියලුම ප්‍රාථමික සාමාජිකයන් සහ ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම වෙත,

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි වගකීම් කළමනාකරණ සීමාවන්

ලංකාසෙට්ල් පද්ධතියේ සහභාගිත්ව තත්ත්වය සහ ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි ප්‍රාථමික සාමාජිකත්වය ලබා ගත් ජාතික ඉතිරිකිරීමේ බැංකුව (National Savings Bank) ඇතුළත් කරමින් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2020 නොවැම්බර් 27 වැනි දින නිකුත් කරන ලද 2020 අංක 19 දරන ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛයේ දක්වා ඇති ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සඳහා වූ බහු-ස්ථර වගකීම් කළමනාකරණ සීමා ව්‍යුහය සංශෝධනය කිරීමට තීරණය කර ඇත. වගකීම් කළමනාකරණ සීමාවන් නිර්වචනය කිරීමට ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයෙහි ප්‍රාථමික සාමාජිකයින්ගේ සංශෝධිත වර්ගීකරණය ඇමුණුම I හි දක්වා ඇත.

2. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සඳහා අදාළ වන අවම වගකීම් කළමනාකරණ සීමාවන් පහත පරිදි වේ;

   i. ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය සඳහා වන අවම වගකීම් කළමනාකරණ සීමාවන් (රුපියල් මිලියන)

	'අ' කාණ්ඩය	'ආ' කාණ්ඩය	'ඇ' කාණ්ඩය
'අ' කාණ්ඩය	200	150	100
'ආ' කාණ්ඩය	150	150	100
'ඇ' කාණ්ඩය	100	100	100

   ii. විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය සඳහා වන අවම වගකීම් කළමනාකරණ සීමාවන් (රුපියල් මිලියන)

	'අ' කාණ්ඩය	'ආ' කාණ්ඩය	'ඇ' කාණ්ඩය
'අ' කාණ්ඩය	500	350	250
'ආ' කාණ්ඩය	350	350	250
'ඇ' කාණ්ඩය	250	250	250

3. ඕනෑම කාණ්ඩයක ඕනෑම ප්‍රාථමික සාමාජිකයෙකුට වෙනත් ප්‍රාථමික සාමාජිකයෙකු සමඟ ඇතිකරගන්නා අන්‍යෝන්‍ය එකඟතාවය මත, ශ්‍රී ලංකා මහ බැංකුව අර්ථ දක්වා ඇති අවම වගකීම් කළමනාකරණ සීමාවන්ට වඩා වැඩි වගකීම් කළමනාකරණ සීමාවන් ලබා දිය හැකිය.

4. ලංකාක්ලියර් (පුද්ගලික) සමාගම විසින් ශ්‍රී ලංකා මහ බැංකුව මඟින් අර්ථ දක්වන ලද අවම වගකීම් කළමනාකරණ සීමාවන්, ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණය සහ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණය යන පද්ධතිවල ක්‍රියාත්මක කර පවත්වා ගත යුතු අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අර්ථ දක්වන ලද අවම සීමාවට වඩා ඉහළ සීමාවන් තීරණය කිරීම සඳහා බලපත්‍රලාභී වාණිජ බැංකු විසින් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීම්වලට පහසුකම් සැලසීම ද සිදු කළ යුතුය.

5. ශ්‍රී ලංකා මහ බැංකුව විසින් එක් කාණ්ඩයකට හෝ සියලුම කාණ්ඩවලට හෝ අදාළ වන පරිදි තීරණය කරන ලද අවම සීමාවන් සහ බලපත්‍රලාභී වාණිජ බැංකු වර්ගීකරණය වරින් වර සමාලෝචනය කරනු ලබන අතර, අවශ්‍ය නම් සංශෝධනය කරනු ලැබේ.

6. අවම වගකීම් කළමනාකරණ සීමාවන් නිර්ණය කිරීම සඳහා පමණක් මෙම ආකාරයට බලපත්‍රලාභී වාණිජ බැංකු වර්ගීකරණය කර ඇති අතර, එය වෙනත් කිසිදු කාර්යයක් සඳහා භාවිතා නොකළ යුතුය.

7. ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 19/2020 ප්‍රතිස්ථාපනය කරමින් නිකුත් කෙරෙන මෙම චක්‍රලේඛය 2022 ජූනි 27 දින සිට බලපැවැත්වේ.

එම්. ආර්. විජේවර්ධන
අධ්‍යක්ෂ, ගෙවීම් සහ පියවීම්

ඇමුණුම I

ස්වයංක්‍රීය ටෙලර් යන්ත්‍ර ආශ්‍රිත සේවා සඳහා වූ පොදු යාන්ත්‍රණයේ සහ/හෝ විද්‍යුත් අරමුදල් පැවරීම් සඳහා වූ පොදු යාන්ත්‍රණයේ ප්‍රාථමික සාමාජිකයන්

- **'අ' කාණ්ඩය**

ලංකා බැංකුව
මහජන බැංකුව
කොමර්ෂල් බෑන්ක් ඔෆ් සිලෝන් පී.එල්.සී
සම්පත් බැන්ක් පී.එල්.සී
හැටන් නැෂනල් බැන්ක් පී.එල්.සී
සෙලාන් බැන්ක් පී.එල්.සී
නැෂනල් ඩිවලොප්මන්ට් බැන්ක් පී.එල්.සී

- **'ආ' කාණ්ඩය**

ඩී.එෆ්.සී.සී. බැන්ක් පී.එල්.සී
නේෂන් ට්‍රස්ට් බෑන්ක් පී.එල්.සී
ද හොංකොං ඇන්ඩ් ෂැංහයි බෑන්කින් කෝපරේෂන් ලිමිටඩ්
පෑන් ඒෂියා බැන්කින් කෝපරේෂන් පී.එල්.සී
ස්ටැන්ඩර්ඩ් චාර්ටඩ් බෑන්ක්
අමානා බැන්ක් පී.එල්.සී
යූනියන් බැන්ක් ඔෆ් කලම්බු පී.එල්.සී
කාගිල්ස් බැන්ක් ලිමිටඩ්

- **'ඇ' කාණ්ඩය**

ජාතික ඉතිරිකිරිමේ බැංකුව
ඩොයිෂ් බෑන්ක් ඒජී
සිටි බැන්ක් එන්.ඒ.
එම්.සී.බී. බැන්ක් ලිමිටඩ්
ස්ටේට් බැන්ක් ඔෆ් ඉන්දියා
හබීබ් බැන්ක් ලිමිටඩ්
පබ්ලික් බැන්ක් බර්හාඩ්
ඉන්දියන් බැන්ක්
බැන්ක් ඔෆ් චයිනා ලිමිටඩ්
ඉන්දියන් ඕවර්සීස් බැන්ක්

මෙම වර්ගීකරණය බහු ස්ථර වගකීම් කළමනාකරණ සීමාවන් ව්‍යුහය පැනවීම යන තනි කාර්යය සඳහා පමණක් වන අතර, වෙනත් කිසිදු කාර්යයක් සඳහා ප්‍රයෝජනයට නොගත යුතුය.

2022 ජූලි 15

චක්‍රලේඛ අංකය: ගෙවීම් සහ පියවීම් පද්ධති චක්‍රලේඛ අංක 04/2022

යොමු අංකය: 34/01/024/0106/06

ලංකාසෙට්ල් පද්ධතියෙහි සියලු සහභාගීකරුවන් වෙත

2022 ජූලි මස 22 වන දින ආපදා ප්‍රතිසාධන වැඩබිමෙහි සිට සිදු කෙරෙන ලංකාසෙට්ල් පද්ධතියෙහි සජීවී මෙහෙයුම්

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් සිය ව්‍යාපාර අඛණ්ඩතා කටයුතු පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා 2022 ජූලි මස 22 වන (සිකුරාදා) එහි ආපදා ප්‍රතිසාධන වැඩබිමෙහි සිට ලංකාසෙට්ල් පද්ධතිය (තත්කාලීන දළ පියවීම් පද්ධතිය සහ ලංකාසෙකියු පද්ධතිය) සහ අනෙකුත් ආශ්‍රිත පද්ධතිවල මෙහෙයුම් කටයුතු සිදු කරනු ඇති බවට මින් ඔබ වෙත දැනුම් දෙනු ලැබේ.

CBSLNet වෙත සම්බන්ධ කර ඇති ඔබ ආයතනයෙහි පරිගණක යන්ත්‍ර ශ්‍රී ලංකා මහ බැංකු ආපදා ප්‍රතිසාධන වැඩබිම වෙත පිවිසීමට හැකි පරිදි දැනටමත් සකස්කර ඇත. කෙසේ වෙතත්, සුදානම්බව තහවුරු කර ගැනීම සඳහා 2022 ජූලි මස 21 වන දිනට පෙර ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුව අමතා සම්බන්ධතාව පරීක්ෂා කර ගන්නා ලෙස ඔබෙන් ඉල්ලා සිටිමු. මෙම ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් කාර්යයේ දී තොරතුරු තාක්ෂණ ගැටලු සඳහා සම්බන්ධ කර ගැනීමේ පාර්ශ්වය ලෙස ශ්‍රී ලංකා මහ බැංකුවේ තොරතුරු තාක්ෂණ දෙපාර්තමේන්තුවෙහි පහත නිලධාරීන් ක්‍රියා කරයි.

- බිලේෂ් කොග්ගලහේවා මහතා 0112398841 (bilesh@cbsl.lk)
- නිපුන සමරදිවාකර මහතා 0112398887 (nipunas@cbsl.lk)

කරුණාකර ඔබේ ආයතනයෙහි නම් කළ ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් නිලධාරියා ඔස්සේ ඉහත නිලධාරීන් සම්බන්ධ කර ගන්නා මෙන් ඔබේ ආයතනයෙහි සියලු මෙහෙයුම් නිලධාරීන් වෙත උපදෙස් ලබා දෙන්න.

කේ. වී. කේ. අල්විස්
අධ්‍යක්ෂ
ගෙවීම් සහ පියවීම්

පිටපත් :
- මහ ලේකම් ශ්‍රී ලංකා බැංකු සංගමය
- සභාපති ප්‍රාථමික අලෙවිකරුවන්ගේ සංගමය

} තොරතුරු සඳහා

- ප්‍රධාන විධායක නිලධාරී ලංකාක්ලියර් පුද්. සමාගම
- සභාපති සී/ස ලංකා මූල්‍ය සේවා කාර්යාංශය

} අවශ්‍ය වන්නේ නම්, සහභාගීකරුවන්ට අවශ්‍ය සහාය සඳහා

මෙහෙයුම් උපදෙස් අංක : RDD/PR/2010/03 (A-7)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
තැ.පෙ. 590
කොළඹ 01

2022 මැයි 20

සියලුම සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත,

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම උප ණය සඳහා අදාල වන වාර්ෂික පොලී අනුපාතය ඉහළ නැංවීම

සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමයට අදාලව ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ විසින් නිකුත් කරන ලද 2010.03.22 දිනැති (සංශෝධිත) මෙහෙයුම් උපදෙස් අංක RDD/RP/2010/03 හා බැඳේ.

වෙළඳපොල පොලී අනුපාතිකයන් සැලකිය යුතු ලෙස ඉහළ යාම සහ වර්තමාන ආර්ථික තත්ත්වයන් සැලකිල්ලට ගනිමින් ඉහත දක්වන ලද ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ඉහත සඳහන් කරන ලද මෙහෙයුම් උපදෙස් පහත පරිදි සංශෝධනය කරන ලදී.

නව වගන්තියක් ඇතුළත් කිරීම.

3.2 ණය සීමාවන්

මෙම මෙහෙයුම් උපදෙස් හි දක්වා ඇති දින සිට මුදා හරිනු ලබන ණය වලින් අවම වශයෙන් සියයට 80 ක ප්‍රමාණයක් කෘෂි කර්මාන්ත, පශු සම්පත්, ධීවර සහ ඒ ආශ්‍රිත ක්‍රියාකාරකම් සඳහා ලබාදිය යුතු අතර එය අර්ධ වාර්ෂික පදනමින් ගණනය කළ යුතු වේ.

පවතින වගන්ති වල සංශෝධනයන්

3.6	ප්‍රතිමූල්‍ය ණය සඳහා සහභාගිත්ව මූල්‍ය ආයතන සඳහා අදාළ වන පොලී අනුපාතිකය	වාර්ෂිකව සියයට 4 (4%)
3.7	උප ණය සඳහා අදාල වන පොලී අනුපාතිකය	වාර්ෂිකව සියයට 9 (9%)

ඉහත සංශෝධන 2022 මැයි මස 20 වන දින සිට බලාත්මක වන අතර මෙහෙයුම් උපදෙස් හි අනෙකුත් වගන්ති නොවෙනස්ව පවතී. කරුණාකර මෙම සංශෝධනවල අන්තර්ගතයන් ඔබ බැංකුවේ අදාල දෙපාර්තමේන්තු/ශාඛාවන් වෙත දැන්වීමට සලස්වන්න.

මෙයට
එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ

මෙහෙයුම් උපදෙස් අංක: RDD/STaRR-IS/2019/01 - (1 වන සංශෝධනය)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01.

2022 මැයි 27.

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත.

කුඩා පරිමාණ තේ සහ රබර් වතු පුනර්ජීවන (STaRR) පොලී සහනාධාර යෝජනා ක්‍රමයෙහි මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂක විසින් 2019.11.13 දින නිකුත් කරන ලද, අංක RDD/STaRR-IS/2019/01 දරන (මින්මතු "ප්‍රධාන මෙහෙයුම් උපදෙස්" ලෙස හැඳින්වෙන), මෙහෙයුම් උපදෙස් පහත පරිදි සංශෝධනය කරන බව STaRR පොලී සහනාධාර යෝජනා ක්‍රමයෙහි සියලු සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ;

1. ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 1 වන වගන්තිය මෙයින් අවලංගු වන අතර, ඒ වෙනුවට පහත වගන්තිය ආදේශ වනු ඇත.

1. හැඳින්වීම

තේ පැළ යළි සිටුවීම, නව රබර් පැළ සිටුවීම සහ ඒ ආශ්‍රිත කටයුතු දිරිමත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ තේ හා රබර් කර්මාන්තය පුනර්ජනනය කිරීමේ ප්‍රධාන අරමුණු ඇතිව, කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන (STaRR) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) සමඟ ශ්‍රී ලංකා රජය අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

STaRR ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල විසින් ඒකාබද්ධව අරමුදල් සපයනු ලබන අතර එය STaRR ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් ක්‍රියාත්මක කරනු ලබයි. STaRR ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලය 2016 සිට 2022 දක්වා වේ.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන STaRR පොළී සහනාධාර යෝජනා ක්‍රමය (මෙම යෝජනා ක්‍රමය) STaRR ව්‍යාපෘතියේ "C සංරචකය: එනම් සියලු දෙනාම ඇතුළත් වූ ග්‍රාමීය මූල්‍යය" යටතේ හඳුන්වා දෙනු ලබන අතර එය 2019.10.15 සිට 2025.12.31 දක්වා ක්‍රියාත්මක වේ.

2. ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 6.5 වන වගන්තිය මෙයින් අවලංගු වන අතර, පහත වගන්තිය එයට අදේශ කෙරේ:-

සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ලබා දෙන පොළී සහනාධාරය 2021.11.01 සිට 2022.05.31 දක්වා කාල පරිච්ඡේදය සඳහා සියයට 4ක වාර්ෂික පොළී සහනාධාරයක් සහ 2022.06.01 සිට 2022.12.31 දක්වා කාල පරිච්ඡේදය සඳහා වසරකට සියයට 7ක පොළී සහනාධාරයක් ලබාදෙනු ඇත.

මෙම මෙහෙයුම් උපදෙස්හි 12.3 වගන්තියෙහි දක්වා ඇති පරිදි, ශ්‍රී ලංකා රජය විසින් කාර්තුමය වශයෙන් ශ්‍රී ලංකා මහ බැංකුව හරහා පොළී සහනාධාරය සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ලබාදෙනු ඇත.

3. ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 11.2 වන වගන්තිය මෙයින් අවලංගු වන අතර, පහත වගන්තිය එයට ආදේශ කෙරේ:-

සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් 2022.12.31 දිනෙන් පසු මෙම යෝජනා ක්‍රමය යටතේ උප ණය ලබා නොදිය යුතුය. කෙසේ වෙතත්, සහභාගීත්ව මූල්‍ය ආයතනවල සියලු පොළී සහනාධාර හිමිකම් පියවන තෙක් STaRR පොළී සහනාධාර යෝජනා ක්‍රමය යටතේ ලබා දුන් ණය සඳහා වන පොළී සහනාධාරය සැපයෙනු ඇත.

STaRR පොළී සහන යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් වෙත සිදු කෙරෙන මෙම සංශෝධනයන් 2021.11.01 දින සිට බලාත්මක වන අතර මෙම ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි අනෙකුත් සියලුම නියමයන් සහ කොන්දේසි නොවෙනස්ව පවතිනු ඇත.

කරුණාකර මෙහෙයුම් උපදෙස්හි අදාල මෙම සංශෝධන වල අන්තර්ගතයන් අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කරන්න.

මීට විශ්වාසී,
එම්.එස්.කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ

මෙහෙයුම් උපදෙස් අංක : RDD/NCRCS/2011/2022/01

2022 ජූනි 13

සියලුම සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත,
මහත්මයාණෙනි/මහත්මියනි

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයේ (NCRCS) මෙහෙයුම් උපදෙස් සඳහා වන සංශෝධනය

2016 ජනවාරි 10, 2015 ජූලි 06, 2016 අගෝස්තු 22, 2020 අප්‍රේල් 08, 2021 අප්‍රේල් 05 සහ 2021 අප්‍රේල් 20 යන දිනවලදී පසුව සංශෝධනය කරන ලද 2011 සැප්තැම්බර් 23 දිනැති අංක RDD/NCRCS/2011 දරන මෙහෙයුම් උපදෙස් පහත පරිදි සංශෝධනය කරන ලද බව සියලුම සහභාගිත්ව මූල්‍ය ආයතන වෙත මෙයින් දන්වා සිටිමු.

1. පොළී අනුපාතිකය

ශ්‍රී ලංකා රජය මගින් ගෙවනු ලබන සහන පොළී අනුපාතික කොටස	අවසාන ණයගැතියාට අදාළ වන පොළී අනුපාතිකය	සහභාගීත්ව මූල්‍ය ආයතනයට අදාළ වන ඵලදායී පොළී අනුපාතිකය
7%	8%	15%

2. මූල්‍ය පරිමානයන් - ඇමුණුම 1 පරිදි

ඉහත සංශෝධන 2022 ජූනි 15 දින සිට බලාත්මක වන අතර නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් මගින් පනවා ඇති අනෙකුත් සියලුම නියමයන් සහ කොන්දේසි තවදුරටත් නොවෙනස්ව පවතී.

මෙම සංශෝධනයන් හි අන්තර්ගතය ඔබගේ බැංකුවේ අදාළ දෙපාර්තමේන්තු/ශාඛාවල නිලධාරීන්ගේ දැනගැනීම සඳහා යොමු කරන මෙන් කාරුණිකව දන්වා සිටිමු.

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ
ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව

ඇමුණුම I

නව සපිරි ග්‍රාමීය ණය යෝජනා ක්‍රමය
සුදුසුකම් ලත් බෝග සඳහා මූල්‍ය පරිමාණයන්

බෝගය සහ කේතය		බිම් සකස් කිරීම (රු.)	බීජ/පැල තවාන් හා සිටුවීම (රු.)	පොහොර (රු.)	රසායනික (කෘමි, වල් හා දිලීර (රු.)	වෙනත් (රු.)	මුළු පිරිවැය (රු)	අක්කරයකට උපරිම ණය සීමාව (රු.)	ඉඩම් ප්‍රමාණය ඒකක (අක්කර)	
									අවම	උපරිම
වී	වාරි ජලය (PI)	45.268.67	14,335.22	15,449.89	20,568.78	37,710.78	133,333.33	100,000.00	0.25	20
	වැසි ජලය (PR)	39,887.47	27,678.47	16,222.47	16,972.47	40,572.47	141,333.33	106,000.00	0.25	
මිරිස්	(C)	54,715.49	37,904.54	39,121.99	69,082.49	151,175.49	352,000.00	264,000.00	0.125	4
ළූණු	(O)	45,552.70	328,132.54	42,221.20	37,713.20	106,380.70	560,000.00	420,000.00	0.125	4
මාෂබෝග	කවුපි (M1)	21,072.08	16,679.90	7,562.10	9,063.64	29,622.28	84,000.00	63,000.00	0.125	10
	මුංඇට (M2)	27,119.80	19,881.98	14,434.76	18,814.42	27,749.06	108,000.00	81,000.00	0.125	
	උඳු (M3)	17,236.36	8,434.66	24,574.66	20,987.66	12,766.66	84,000.00	63,000.00	0.125	
	සෝයා බෝංචි (M4)	13,387.56	9,615.04	30,156.52	23,148.30	11,692.58	88,000.00	66,000.00	0.125	
	කුරක්කන් (M5)	28,326.50	5,939.20	20,702.56	13,379.40	7,652.34	76,000.00	57,000.00	0.125	
	බඩ ඉරිඟු (M6)	44,969.77	12,097.68	20,875.76	30,954.70	27,102.08	136,000.00	102,000.00	0.125	20
බීජ තෙල්	රටකජු (L1)	26,027.30	33,454.30	12,754.30	16,059.30	35,704.80	124,000.00	93,000.00	0.125	10
	තල (L2)	24,971.06	11,286.98	7,550.98	7,550.98	24,639.98	76,000.00	57,000.00	0.125	
	සූරියකාන්ත (L3)	12,973.75	11,361.25	10,555.00	8,136.25	12,973.75	56,000.00	42,000.00	0.125	
මූලමය බෝග හා ආකන්ද										
	අර්තාපල් (T)	154,370.59	377,166.66	143,918.62	148,252.65	184,291.50	1,008,000.00	756,000.00	0.125	4
	බතල (T1)	31,115.40	22,990.40	10,705.40	22,573.40	48,615.40	136,000.00	102,000.00	0.125	10
	මඤ්ඤොක්කා (T2)	32,604.51	24,652.45	30,847.05	13,861.99	26,034.01	128,000.00	96,000.00	0.125	
	කිරි අල (T3)	52,937.50	40,037.50	28,750.00	20,687.50	33,587.50	176,000.00	132,000.00	0.125	
එළවලු	වම්බටු (V1)	48,898.00	13,548.00	17,858.00	45,898.00	113,798.00	240,000.00	180,000.00	0.125	4
	බණ්ඩක්කා (V2)	22,238.00	6,388.00	5,398.00	13,438.00	76,538.00	124,000.00	93,000.00	0.125	
	බීට් (V3)	82,596.20	50,215.20	22,996.20	27,396.20	96,796.20	280,000.00	210,000.00	0.125	
	බෝංචි (V4)	39,906.00	46,506.00	21,526.00	31,956.00	136,106.00	276,000.00	207,000.00	0.125	
	ගෝවා (V5)	113,298.00	82,048.00	61,658.00	81,898.00	137,098.00	476,000.00	357,000.00	0.125	
	කැරට් (V6)	97,512.80	71,608.80	62,612.80	53,552.80	142,712.80	428,000.00	321,000.00	0.125	
	මාළු මිරිස් (V7)	101,130.00	74,480.00	47,130.00	69,530.00	155,730.00	448,000.00	336,000.00	0.125	
	තක්කාලි (V8)	81,854.40	61,182.40	53,054.40	81,554.40	178,354.40	456,000.00	342,000.00	0.125	
	ලීක්ස් (V9)	74,685.00	96,560.00	30,385.00	32,585.00	97,785.00	332,000.00	249,000.00	0.125	
	රාබු (V10)	49,084.00	24,084.00	14,564.00	4,384.00	55,884.00	148,000.00	111,000.00	0.125	
	නෝකෝල් (V11)	59,467.80	30,648.80	10,147.80	9,467.80	54,267.80	164,000.00	123,000.00	0.125	
	වැටකොළු (V12)	9,856.00	8,776.00	3,756.00	21,556.00	172,056.00	216,000.00	162,000.00	0.125	
	කරවිල (V13)	1,108.80	36,607.80	25,880.80	55,464.80	170,137.80	228,000.00	171,000.00	0.125	
	පතෝල (V14)	14,452.00	13,192.00	8,352.00	9,652.00	178,352.00	224,000.00	168,000.00	0.125	
	වට්ටක්කා (V15)	33,802.00	29,862.00	26,682.00	22,352.00	39,302.00	152,000.00	114,000.00	0.125	
වෙනත්	ඉඟුරු (W1)	38,600.00	127,050.00	41,500.00	32,800.00	40,050.00	280,000.00	210,000.00	0.250	4
	උක් (W2)	30,898.00	28,311.75	40,206.75	30,380.50	70,203.00	200,000.00	150,000.00	1.00	10
	කහ (Ta)	112,000.00	295,000.00	91,320.00	12,000.00	461,000.00	971,320.00	728,490.00	0.125	1

ගෙවතු වගා සඳහා උපරිම ප්‍රමාණය රු. 100,000/කි

පැළ තවාන් (බීජ නිෂ්පාදනය ද ඇතුළත්) සඳහා උපරිම ප්‍රමාණය රු. 500,000/ කි.

සටහන: ණයකරුවන්ගේ අවශ්‍යතාව පරිදි මුළු ණය මුදලින් සියයට 60 ක් දක්වා භූමිය සකස්කිරීම, බීජ, පැළ, පොහොර, වල් නාශක සහ කෘමි නාශක ආදිය සඳහා පළමු වාරිකය ලෙස ණය නිකුත් කිරීමට සහභාගිත්ව මූල්‍ය ආයතනවලට අවසර දී ඇති අතර ණය මුදලේ ඉතිරි ප්‍රමාණය පොහොර මිලදී ගැනීම හෝ අස්වනු නෙළීම සඳහා අදාළ ක්ෂේත්‍ර නිලධාරීන්ගේ නිර්දේශයන්ට යටත්ව වාරික එකක් හෝ දෙකක් ලෙස නිකුත් කළ හැක.

අදාළ ශාඛා කළමනාකරු ඉහත ලේඛනයේ දක්වා ඇති පරිදි අදාළ වියදම පියවාගැනීමට ණයකරුවාට පෞද්ගලිකව ඇති හැකියාව පිළිබඳව සලකා බලමින් අවශ්‍ය ණය ප්‍රමාණය පමණක් නිදහස් කිරීම අවශ්‍ය වේ. එසේම අදාළ වගා ක්‍රමය, යල හෝ මහ කන්නයන් ලෙස වාරිමාර්ග හෝ වැසි ජලයෙන් වගා කරන්නේද, වගා මිශ්‍රණයන් මොනවාද, වගාකරුවන්ගේ ණය නැවත ගෙවීමේ හැකියාව ආදිය සලකා බලමින් අක්කරයකට ලබාදිය හැකි උපරිම ණය සීමාවට යටත්ව ණය ලබාදීම තීරණය කිරීමට ශාඛා කළමනාකරුට හැකියාව ඇත.

මෙහෙයුම් උපදෙස් අංක: **RDD/STaRR-IS/2019/01** - (2 වන සංශෝධනය)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01.

2022 ජූනි 20.

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත.

කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන (STaRR) පොළී සහනාධාර යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් 2019.11.13 දින නිකුත් කරන ලද අංක RDD/STaRR-IS/2019/01 දරන, (මින්මතු "ප්‍රධාන මෙහෙයුම් උපදෙස්" ලෙස හැඳින්වෙන), මෙහෙයුම් උපදෙස් අනතුරුව 2022.05.27 දින පහත පරිදි සංශෝධනය කළ බව සියලුම STaRR පොළී සහනාධාර යෝජනා ක්‍රමයේ සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ;

1. 2022.05.27 දින සංශෝධනය කරන ලද ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 1 වන වගන්තිය මෙහි අවලංගු කරන අතර, පහත වගන්තිය එයට ආදේශ කෙරේ:-

1. **හැඳින්වීම**

   තේ පැළ යළි සිටුවීම, නව රබර් පැළ සිටුවීම සහ ඒ ආශ්‍රිත කටයුතු දිරිමත් කිරීම මගින් ශ්‍රී ලංකාවේ කුඩා පරිමාණ තේ හා රබර් කර්මාන්තය පුනර්ජනනය කිරීමේ ප්‍රධාන අරමුණු ඇතිව, කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන (STaRR) ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල (IFAD) සමඟ ශ්‍රී ලංකා රජය අවශ්‍ය කටයුතු සම්පාදනය කර ඇත.

   STaRR ව්‍යාපෘතිය සඳහා ශ්‍රී ලංකා රජය සහ කෘෂිකාර්මික සංවර්ධනය සඳහා වන ජාත්‍යන්තර අරමුදල විසින් ඒකාබද්ධව අරමුදල් සපයනු ලබන අතර එය ප්‍රධාන වැඩසටහන් නියෝජිත ආයතනය වන වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය (MPI) යටතේ ක්‍රියාත්මක වන STaRR ව්‍යාපෘතියේ ව්‍යාපෘති කළමනාකරණ ඒකකය (PMU) විසින් ක්‍රියාත්මක කරනු ලබයි. එමෙන්ම STaRR ව්‍යාපෘතිය ක්‍රියාත්මක කරනු ලබන කාලය 2016 සිට 2022 දක්වා වේ.

   ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ක්‍රියාත්මක කරනු ලබන STaRR පොළී සහනාධාර යෝජනා ක්‍රමය (මෙම යෝජනා ක්‍රමය) STaRR ව්‍යාපෘතියේ "C සංරචකය (එනම් සියලු දෙනාම ඇතුළත් වූ ග්‍රාමීය මූල්‍යය" යටතේ හඳුන්වා දෙනු ලබන අතර එය 2019.10.15 සිට 2025.12.31 දක්වා ක්‍රියාත්මක වේ.

2. **ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 5.9 වන වගන්තිය මෙයින් අවලංගු වන අතර, පහත වගන්තිය එයට ආදේශ කෙරේ:-**

   STaRR පොළී සහන යෝජනා ක්‍රමය යටතේ පොළී සහනාධාර ලබා දීම සඳහා වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හරහා මුදල් අමාත්‍යාංශය විසින් ශ්‍රී ලංකා මහ බැංකුව වෙත වෙන් කරන ලද අරමුදල් සහ සිදු කළ ගෙවීම් "මුදල් අමාත්‍යාංශය විසින් සපයනු ලබන අරමුදල්" ලෙස අදහස් කෙරේ.

3. **ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 8.5 වන වගන්තිය මෙයින් අවලංගු වන අතර පහත වගන්තිය එයට ආදේශ කෙරේ:-**

   "පොළී සහනාධාර ගෙවීම් පිළිබඳ වාර්තා පවත්වා ගෙන යෑම"

4. **ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 9.3 වන වගන්තිය මෙයින් අවලංගු වන අතර, පහත වගන්තිය එයට ආදේශ කෙරේ:-**

   "ශ්‍රී ලංකා මහ බැංකුවේ උපදෙස් සහ නිර්දේශ මත පදනම්ව, ශ්‍රී ලංකා මහ බැංකුව හරහා සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත කාලීනව පොළී සහනාධාර ගෙවීම් සිදු කිරීමට අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීම"

5. **ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 12.3 (ඇ) වන වගන්තිය මෙයින් අවලංගු වන අතර, පහත වගන්තිය එයට ආදේශ කෙරේ:-**

   "සහභාගීත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන කාර්යාල විසින් ඉදිරි කාර්තු හතර තුළ බෙදා හරිනු ලබන ණය සඳහා සෑම වසරක දී ම ජනවාරි, අප්‍රේල්, ජූලි, ඔක්තෝබර් යන මාසයන් අවසානයේ දී ව්‍යාපෘති කළමනාකරණ ඒකකය සහ/ හෝ වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය හරහා පොළී සහනාධාර අයදුම්පත් යොමු කළ යුතුය."

6. ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 14 වන වගන්තිය මෙයින් අවලංගු වන අතර, පහත වගන්තිය ඊට ආදේශ කෙරේ:-

"සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් විගණන කාර්යය සඳහා STaRR පොලී සහන යෝජනා ක්‍රමයේ මූල්‍ය ප්‍රකාශ පිළියෙළ කළ යුතුය."

STaRR පොලී සහනාධාර යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් හි සිදු කරන ලද මෙම සංශෝධනයන් 2021.11.01 දින සිට බලාත්මක වන අතර මෙම ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන මෙහෙයුම් උපදෙස්වල අඩංගු අනෙකුත් සියලුම නියමයන් සහ කොන්දේසි (2022.05.27 දින සංශෝධනය කළ පරිදි) නොවෙනස්ව පවතිනු ඇත.

කරුණාකර මෙහෙයුම් උපදෙස්වලට අදාළ මෙම සංශෝධනවල අන්තර්ගතයන් අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කරන්න.

මීට විශ්වාසී,
එම්.එස්.කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ

මෙහෙයුම් උපදෙස් අංක: RDD/STaRR-IS/2019/01 - (3 වන සංශෝධනය)

ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව
ශ්‍රී ලංකා මහ බැංකුව
අංක 30, ජනාධිපති මාවත
කොළඹ 01.

2022 ජූලි 08.

සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත.

"කුඩා තේ සහ රබර් වතු පුනර්ජීවන (STaRR) පොලී සහනාධාර යෝජනා ක්‍රමයේ" මෙහෙයුම් උපදෙස් සංශෝධනය කිරීම

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා විසින් 2019.11.13 දින නිකුත් කරන ලද අංක RDD/STaRRIS/2019/01 දරන (මින්මතු "ප්‍රධාන මෙහෙයුම් උපදෙස්"ලෙස හැඳින්වෙන), මෙහෙයුම් උපදෙස් අනතුරුව 2022.05.27 දින සහ 2022.06.20 දින සංශෝධනය කළ බව STaRR පොලී සහනාධාර යෝජනා ක්‍රමයේ සියලුම සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ;

1. ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි 6.4 වන වගන්තිය මෙයින් අවලංගු වන අතර, පහත වගන්තිය එයට ආදේශ කෙරේ:- සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් සඳහා වන පොලී අනුපාතිකය: වසරකට සියයට 9.0කි.

STaRR පොලී සහනාධාර යෝජනා ක්‍රමයේ මෙහෙයුම් උපදෙස් වෙත සිදු කෙරෙන මෙම සංශෝධනය 2022.07.08 දින සිට බලාත්මක වන අතර මෙම ණය යෝජනා ක්‍රමයේ ප්‍රධාන මෙහෙයුම් උපදෙස්හි අනෙකුත් සියලුම නියමයන් සහ කොන්දේසි (2022.05.27 සහ 2022.06.20 දින සංශෝධනය කළ පරිදි) නොවෙනස්ව පවතිනු ඇත.

කරුණාකර මෙම මෙහෙයුම් උපදෙස්වලට අදාළ මෙම සංශෝධනවල අන්තර්ගතයන් අදාළ නිලධාරීන්ගේ අවධානයට යොමු කරන්න.

මීට විශ්වාසී,

චතුර ආරියදාස
අතිරේක අධ්‍යක්ෂ
අධ්‍යක්ෂ වෙනුවට

යොමු අංක: 32/04/034/0001/001 2022 අගෝස්තු 16

සියලු සහභාගීත්ව මූල්‍ය ආයතනවල ප්‍රධාන විධායක නිලධාරී/සාමාන්‍යාධිකාරී වෙත,

මහත්මයාණෙනි/මහත්මියනි

ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ක්‍රියාත්මක කරනු ලබන ණය යෝජනා ක්‍රම යටතේ බෙදා හරින ලද ණය සඳහා සහන සැලසීම

රටේ පවතින ආර්ථික තත්ත්වය හේතුවෙන් ව්‍යාපාර සහ පුද්ගලයන් විසින් මුහුණ දෙනු ලබන අභියෝග හඳුනා ගැනීමෙන් අනතුරුව, පහත ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රමවල මෙහෙයුම් උපදෙස් සඳහා සංශෝධනයක් ලෙස පහත දැක්වෙන සහන ලබා දීමට ශ්‍රී ලංකා මහ බැංකුව තීරණය කර ඇත;

අ. 2010.03.22 දිනැති RDD/PR/2010/03 (සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය),

ආ. 2020.04.01 දිනැති RDD/PR-COVID19/2020/01, 2020.06.19 දිනැති RDD/PR-COVID19/2020/03, (සෞභාග්‍යා Covid19 පුනරුද සහන),

ඇ. 2021.05.04 දිනැති RDD/DAD-PP/2021/01 (දේශීය කෘෂිකාර්මික සංවර්ධන වැඩසටහනෙහි නියමු අදියර),

ඈ. සහ සංශෝධනය කර ඇති පරිදි 2019.08.06 දිනැති RDD/SAPP/4P/2019/01 සහ RDD/SAPP/RF/2019/01 (කුඩා පරිමාණ කෘෂිව්‍යාපාර සහභාගීත්ව වැඩසටහන)

2. පසුබිම

2.1. ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරන ලද 2022.07.07 දිනැති 2022 අංක 02 දරන මුදල් මණ්ඩල චක්‍රලේඛයට අනුකූලව (ඇමුණුම අ), ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද ණය යෝජනා ක්‍රම සඳහා සහන සැලසීමට තීරණය කර ඇත.

2.2. 2.1 වන වගන්තියෙහි දක්වා ඇති මුදල් මණ්ඩල චක්‍රලේඛයෙහි නිර්වචනය කර ඇති පරිදි, ණය ගැනුම්කරු විසින් ඉල්ලීම් කර ඇති පරිදි, එක් එක් ඉල්ලීම මත පදනම්ව,

2.3. මෙම සහන ලබා ගැනීමට බලාපොරොත්තු වන සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් 2022.09.15 දින වන විට අදාළ සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත එවැනි සහන සඳහා ඉල්ලීමක් සිදු කළ යුතුය. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් විද්‍යුත් තැපෑල, කෙටි පණිවුඩ ඇතුළුව මුද්‍රිත සහ/ හෝ විද්‍යුත් ක්‍රමවේද ඔස්සේ සියලු සුදුසුකම්ලත් ණය ගැනුම්කරුවන් වෙත සහන, නියමිත අවසාන දිනයන් සහ මෙය යොමු කිරීම සඳහා අදාළ වන අයදුම්පත් ආකෘතිය කඩිනමින් දැනුම් දෙනු ලැබිය යුතුය.

2.4. ඒ අනුව, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සුදුසුකම්ලත් ණයගැනුම්කරුවන් ගෙන් ලැබෙන ඉල්ලීම් භාර ගත යුතු අතර, එක් එක් යෝජනා ක්‍රම/ අදියර සඳහා එම තොරතුරු අමුණා ඇති ආකෘතියට (ඇමුණුම I) අනුව 2022.09.30 දින වන විට ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂවරයා වෙත වෙන වෙනම වාර්තා කළ යුතුය. කරුණාකර සෞභාග්‍යා ණය යෝජනා ක්‍රමය සහ සෞභාග්‍යා Covid19 පුනරුද සහනයෙහි මෘදු පිටපත් (එක්සෙල්) sehan@cbsl.lk, lansakara@cbsl.lk වෙත ද, අනෙකුත් යෝජනා ක්‍රම gihan@cbsl.lk වෙත ද යොමු කරන්න.

3. පිරිනමනු ලැබූ සහන

3.1. ප්‍රතිමූල්‍ය යෝජනා ක්‍රම

3.1.1. සහනදායී කාලපරිච්ඡේදයට අදාළව සහභාගීත්ව මූල්‍ය ආයතන වෙත ණය ගැනුම්කරුවන් විසින් සිදු කරනු ලබන ආපසු ගෙවීම්,

අ. ණයගැනුම්කරුවන් හට 2022 දෙසැම්බර් 31 වන දින දක්වා සහනදායී කාලයක් සඳහා සහ ආපසු ගෙවීමේ කාලය මාස හයකින් (06) දීර්ඝ කිරීම සඳහා අයදුම් කළ හැකිය.

ආ. සහනදායී කාලයට අදාළව පොලිය ගණනය කිරීම සහ ගෙවීම;

(i) සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් එක් එක් යෝජනා ක්‍රමය සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ ප්‍රාදේශීය සංවර්ධන දෙපාර්තමේන්තුවෙහි අධ්‍යක්ෂවරයා නිකුත් කළ අදාළ මෙහෙයුම් උපදෙස්වල දක්වා ඇති පොලී අනුපාතිකවලට අනුකූලව සහනදායී කාලය තුළ පොලිය ගණනය කළ යුතුය.

(ii) කිසියම් ණය ගැනුම්කරුවෙකු සහනදායී කාලය තුළ දී පොලිය නොගෙවීමට තීරණය කර ඇත්නම්, සමුච්චිත පොලිය ඉතිරි ණය වාරික අතර සමානව බෙදීම හෝ ණය ගැනුම්කරු සමඟ අන්‍යෝන්‍ය වශයෙන් එකඟ වී ඇති පරිදි ආපසු අය කර ගැනීමට කටයුතු කළ යුතුය. සහභාගීත්ව මූල්‍ය ආයතනවලට කිසිදු අවස්ථාවක දී සහනදායී කාලය තුළ දී සමුච්චිත පොලිය මත පොලිය හෝ වැල් පොලිය අය කළ නොහැක.

ඇ. සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් සහනදායී කාලය තුළ දී සමුච්චිත ප්‍රාග්ධන ආපසු ගෙවීම සඳහා මුදල් මණ්ඩල චක්‍රලේඛයට අනුකූලව සහ ඉහත ආ (i) හි දක්වා ඇති පොලී අනුපාතිකවලට සමුච්චිත ප්‍රාග්ධනය මත පොලිය ගණනය කළ යුතුය.

සහනදායී කාලයට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත සහභාගීත්ව මූල්‍ය ආයතනවල විශ්‍රාම සැලසුම්

ඇ. සහභාගීත්ව මූල්‍ය ආයතන ඇමුණුම I ට අනුව සහන සඳහා අයදුම් කළ එක් එක් ණය මුදලෙහි සියලු විස්තර ශ්‍රී ලංකා මහ බැංකුව වෙත දැනුම් දිය යුතුය.

ඈ. ණය මුදලෙහි සහන කාලය;

(i) මාස 03කට අඩු හෝ ඊට සමාන වන්නේ නම්, සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් දැනට පවතින ආපසු ගෙවීමේ උපලේඛනයට අනුව ශ්‍රී ලංකා මහ බැංකුව වෙත ආපසු ගෙවනු ලැබිය යුතුය.

(ii) මාස 03කට වැඩි නම්,

- සහභාගීත්ව මූල්‍ය ආයතනවලට ආපසු ගෙවීම සඳහා මාස 6ක දීර්ඝ කිරීමක් හිමි වේ.
- සහනදායී කාලය තුළ දී සමුච්චිත වූ පොලිය සහනදායී කාලය අවසානයේ දී ගෙවීම හෝ ඉතිරි ණය වාරික අතර සමානව බෙදා හැරීම සිදු කළ යුතුය.
- නව ආපසු ගෙවීමේ උපලේඛන ඒ අනුව සැපයෙනු ඇත.

3.2. පොලී සහන සහ ණය ඇප ආවරණ යෝජනා ක්‍රම

3.2.1. සහභාගීත්ව මූල්‍ය ආයතන මුදල් මණ්ඩල චක්‍රලේඛයට අනුව ණය ගැනුම්කරුවන් සඳහා අවශ්‍ය සහන සැපයිය යුතුය.

3.2.2. ණය ඇප ආවරණ සහ පොලී සහන දැනටමත් එකඟ වූ කාලය දක්වා පමණක් සැපයෙනු ඇත.

3.2.3. මුදල් මණ්ඩල චක්‍රලේඛයෙහි 4.4 වන වගන්තිය සමඟ අනුකූලව, 2022.12.31 වන දින තෙක් නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ගත නොහැකිය. සහභාගීත්ව මූල්‍ය ආයතනවල ණය ඇප ආවරණ යෝජනා ක්‍රම යටතේ නිකුත් කරන ලද මෙහෙයුම් උපදෙස්වලට අනුකූලව ණය ඇප ආවරණ හිමිකම් පෑමට ඉන් අනතුරුව ණය පැහැර හරින ලද ණය ගැනුම්කරුවන් මත නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග ගැනීමට ආරම්භ කළ යුතුය.

4. දීර්ඝ කළ කාලයට අදාළව පොලිය ගණනය කිරීම සමඟ අනුකූල වීම

යම් සහභාගීත්ව මූල්‍ය ආයතනයක් මෙහෙයුම් උපදෙස්හි (සංශෝධිත පරිදි) නියම කර ඇති පොලී අනුපාතිකයට වඩා ඉහළ පොලියක් ණය ගැනුම්කරුවෙකුගෙන් අය කර ඇති අවස්ථාවේ දී, එවැනි සහභාගීත්ව මූල්‍ය ආයතනයක් එම ණය ගැනුම්කරුගෙන් අය කළ එවැනි පොලියක් ආපසු හැරවීමට වහාම කටයුතු කළ යුතු අතර, අතිරික්තය එම ණය ගැනුම්කරු වෙත නැවත ගෙවිය යුතුය.

5. අක්‍රිය ණය කාණ්ඩයෙහි තිබෙන ණය සඳහා සහන සැලසීම

මුදල් මණ්ඩල චක්‍රලේඛය සමඟ අනුකූලව, අක්‍රිය ණයවලට අදාළව ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද සියලු විධාන සමඟ සහභාගීත්ව මූල්‍ය ආයතන අනුකූල වනු ඇතැයි යන කොන්දේසියට යටත්ව,

සහභාගීත්ව මූල්‍ය ආයතන විසින් අක්‍රිය ණය කාණ්ඩයෙහි ණය සඳහා ඉදිරියේ දී පැමිණෙන ණය වාරිකවලට සහන සැලසීම සම්බන්ධව සලකා බැලිය යුතුය. තවද, සහභාගීත්ව මූල්‍ය ආයතනවලට අක්‍රිය ණය කාණ්ඩයෙහි සිටින ණය ගැනුම්කරුවන් සඳහා සහන පසුදාතම් කිරීම සහ එවැනි ණය ගැනුම්කරුවන් සක්‍රිය කාණ්ඩයට මාරු කිරීම සිදු කළ නොහැකිය.

6. සහභාගීත්ව මූල්‍ය ආයතන මෙම උපදෙස් සමඟ අනුකූල වීම තහවුරු කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු අධීක්ෂණ දෙපාර්තමේන්තුව සමඟ සහයෝගීව කටයුතු සිදු කරනු ඇත.

7. කරුණාකර මෙම ලිපියෙහි දැක්වෙන කරුණු ඔබේ බැංකුවෙහි අදාළ දෙපාර්තමේන්තු/ ශාඛාවන්හි නිලධාරීන් වෙත දැනුම් දෙන්න. එමෙන්ම, මෙම යෝජනා ක්‍රමවල මෙහෙයුම් කාර්යක්ෂමතාව පවත්වා ගෙන යෑම සඳහා මෙම නියමිත අවසාන දිනයන් සපුරා ඇති බවට තහවුරු කර ගන්න.

8. මෙම සංශෝධනයන් 2022 අංක 02 දරන මුදල් මණ්ඩල චක්‍රලේඛ දින සිට (එනම්, 2022.07.07) බලපැවැත්වේ.

මීට විශ්වාසී

එම්. එස්. කේ. ධර්මවර්ධන
අධ්‍යක්ෂ

ණය සහතික 2022

ණය යෝජනා ක්‍රමය (ඇදිපැර)

සහාගීත්ව මූල්‍ය ආයතනයෙහි නම :

													ණය සහතික / ණය සහතික									ණය සහතික සම්බන්ධ විවාදසහ ඡන්දදීමේ කාල සීමාව		
	#	ශ්‍රී ලංකා මහ බැංකු ලිවෙස්දීම් ගණන	ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිමිදුම් ලැබුණු / නැවත ගත් (ඒකාබද්ධ කළ නම්)	ණය ගැනුම්කරු/ ණය ගැනුම්කරුගේ නම	ව්‍යාපෘති/වැඩසටහන් ලියාපදිංචිය	ශ්‍රී ලංකා මහ බැංකු ප්‍රතිමිදුම් ලැබුණු දින ණය මුදල (රු.)	සහතිකිත ණය වෙනුවෙන් ලබා ගත් ණය මුදල (රු.)	සහතිකිත ණය වෙනුවෙන් ලබා ගත් ණය මුදල් ශ්‍රී ලංකා මහ බැංකුව විසින් ගුප්තකේතනය කළ දින	ණය ගැනුම්කරු විසින් ණය ගෙවීම් සිදුකිරීමට ගතවූ දින ගණන	ණය මුදල සඳහා සහතික කළ මුදල	ණය මුදල නිදහස් කළ දිනය	ණය ගැනුම්කරු විසින් ණය ගෙවීම් සිදුකිරීමට ගතවූ දින ගණන	ණය මුදල නිදහස් කළ දිනය	සහතික කළ මුදල් ප්‍රතිශතය	ණය සහතික ගාස්තු	ණය සහතිකය යටතේ ගෙවීම් සිදුකිරීම්	ණය සහතිකය යටතේ ගෙවීම් සිදුකිරීම්	ණය සහතිකය යටතේ ගෙවීම් සිදුකිරීම්	ණය සහතිකය යටතේ ගෙවීම් සිදුකිරීම්	ණය සහතිකය යටතේ ගෙවීම් සිදුකිරීම්	සටහන්
	1																						
	2																						
	3																						
	4																						
	5																						

*ශ්‍රී ලංකා මහ බැංකුව විසින් අදාළ ණය ගැනුම්කරු / ණය ගැනුම්කරුවන්ට එරෙහිව පවත්වා ගෙන යනු ලබන නඩුවිවාදවල ප්‍රගතිය මත පදනම්ව ණය සහතිය සපයනු ඇත.

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2022 අංක 01 දරන විධානය 2022 ජනවාරි 28

තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව

1. **නෛතික ප්‍රතිපාදන**

1.1 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතේ 12 වන වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්වල තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳව මෙම විධානයන් නිකුත් කරනු ලබයි.

2. **විධානවල අරමුණු**

2.1 නවීන තාක්ෂණය ප්‍රතිග්‍රහණය කිරීම සහ නියෝජිතයන් හා තෙවන පාර්ශ්ව වෙත ලබා දෙන තාක්ෂණ සේවා ඉහළ නැංවීමත් සමඟ, බලපත්‍රලාභී මුදල් සමාගම් තාක්ෂණික අවදානමට ලක් වන අතර එය අවදානම් කළමනාකරණයට ඒකාබද්ධ කළ යුතු වේ. මෙම විධානයන් මගින් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව පිළිබඳ අවම නියාමන අවශ්‍යතා පිහිටුවීම අරමුණු කෙරේ.

3. **අදාළත්වය**

3.1 මෙම රාමුවේ අවශ්‍යතා, නියෝජිතයන් සහ තෙවන පාර්ශ්ව සේවා සපයන්නන් විසින් ක්‍රියාත්මක කරනු ලබන මෙහෙයුම් ඇතුළුව බලපත්‍රලාභී මුදල් සමාගම්වල සමස්ත මෙහෙයුම්වලට අදාළ විය යුතුය.

3.2 බලපත්‍රලාභී මුදල් සමාගමක් මෙම විධානයන් ක්‍රියාත්මක කරන ප්‍රමාණය සහ මට්ටම, භාවිත කරන තාක්ෂණයන්ගේ අවදානම් මට්ටම සහ සංකීර්ණත්වය සමඟ සමාන විය යුතු අතර, ඒවා නියමිත පරිදි අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අවම නියාමන අවශ්‍යතාවලින් ඔබ්බට ගොස් නිශ්චය කරනු ලැබිය යුතුය.

3.3 මෙම විධානයන්හි විධිවිධාන, 10 වන විධානයෙහි අන්තර්කාලීන විධිවිධානවලට යටත්ව, 2023.01.01 දින සිට බලපැවැත්විය යුතුය.

4. **තාක්ෂණික අවදානම් යහපාලනය සහ අධීක්ෂණය**

4.1 **අධ්‍යක්ෂ මණ්ඩලයේ කාර්යභාරය**

අ) තාක්ෂණය, ව්‍යාපාර ක්‍රමෝපාය සහ අවම නියාමන අවශ්‍යතා මගින් එල්ල කරනු ලබන විභව අවදානම්වලට ගැළපෙන පරිදි තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ ක්‍රමෝපායන් සම්පාදනය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

ආ) මැනවින් ලේඛනය කරන ලද තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්තියක්, නිසි මණ්ඩල අධීක්ෂණයක් සහිතව පූර්ණ සහ සවිමත් අවදානම් කළමනාකරණ රාමුවක්, ප්‍රමාණවත් තාක්ෂණික සම්පත්, විෂය පිළිබඳ දැනුවත්භාවයක් ගොඩනැංවීම සඳහා ආයතනික සැකසුමක් සහ ස්වාධීන විගණනයක් ඇතුළු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරනු ලබන ප්‍රතිපත්ති මගින් තොරතුරු තාක්ෂණ සහ සයිබර් ආරක්ෂණ ක්‍රමෝපාය සමන්විත විය යුතුය.

ඇ) වලාකුළු සේවාවන් (Cloud Services) සහ මූල්‍ය තාක්ෂණය (Fin Tech) භාවිතයෙන් පැන නඟින අවදානම් ඇතුළුව බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත එල්ල විය හැකි තොරතුරු තාක්ෂණ සහ සයිබර් අවදානම් සැලකිල්ලට ගනිමින් තෙවන පාර්ශ්වයන් සහ නියෝජිතයන් සමඟ ඇති ගිවිසුම් ඇගයීමට ලක් කළ යුතුය.

ඈ) බලපත්‍රලාභී මුදල් සමාගම්වල තොරතුරු ආරක්ෂාව සහ තාක්ෂණමය ඔරොත්තු දීමේ හැකියාව සඳහා වගකීම දරන අධ්‍යක්ෂ මණ්ඩල මට්ටමේ තොරතුරු ආරක්ෂණ කමිටුවක් පිහිටුවීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් දිරිමත් කෙරේ.

ඉ) තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ ඔරොත්තු දීමේ හැකියාව විධානය තුළ, නියාමන අවශ්‍යතා සාර්ථකව ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ප්‍රමාණවත් අධීක්ෂණ ක්‍රියාමාර්ග ගනු ලැබිය යුතුය.

4.2 තාක්ෂණික අවදානම් කළමනාකරණය

අ) තාක්ෂණික අවදානම් කළමනාකරණයේ අවධානය පුළුල් වශයෙන් හඳුනා ගැනීම, ආරක්ෂාව, අනාවරණය, ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රතිසාධනය යන කාර්යයන් කෙරෙහි යොමු විය යුතුය. තාක්ෂණික අවදානම් කළමනාකරණය මගින් පාලනයන් හි ප්‍රමාණවත් බව, සඵලතාවය සහ යෝග්‍යතාවය ඇගයීමට ලක් කිරීමත් නිරන්තර කාල විරාමයන් තුළ අධීක්ෂණය කරමින් නිරීක්ෂණය වන ඕනෑම ප්‍රධාන අනනුකූලතාවයන් සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය දැනුවත් කිරීමත් කළ යුතුය.

ආ) පහත කාර්යයන් සමඟ තාක්ෂණික අවදානම් කළමනාකරණ රාමුවක් පිහිටු විය යුතුය.

i. **අවදානම හඳුනා ගැනීම**

නියෝජිතයන් හෝ තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් විසින් පවත්වා ගෙන යනු ලබන හෝ සහාය ලබා දෙනු ලබන තොරතුරු පද්ධති ඇතුළුව, තොරතුරු තාක්ෂණ පරිසරයට අදාළ වන තර්ජන සහ අවදානම් තත්ත්වයන් හඳුනා ගැනීම.

ii. **අවදානම් තක්සේරුකරණය**

සමස්ත ව්‍යාපාරය සහ මෙහෙයුම් මත තොරතුරු තාක්ෂණ තර්ජන සහ අවදානම් තත්ත්වයන් ඇතිවීමේ සම්භාවිතාව හා ඒවාගේ විභව බලපෑම්/ප්‍රතිඵල පිළිබඳව විශ්ලේෂණයක් සිදු කිරීම. අවදානම් සිද්ධි ඇතිවීමේ සම්භාවිතාව සහ එහි බලපෑම, මැනීම සහ තීරණය කිරීම සඳහා නිර්ණායකයක් පිහිටු වීම.

iii. **අවදානම් සඳහා පිළියම් යෙදීම**

තොරතුරු තාක්ෂණ පද්ධතිවල තීරණාත්මක බව සහ අවදානමට ඔරොත්තු දීමේ මට්ටම සමඟ අනුකූල වන අවදානම් අවම කිරීමේ සහ පාලන ක්‍රියාමාර්ග සංවර්ධනය කිරීම සහ ක්‍රියාත්මක කිරීම. අවදානම් අවම කිරීමේ ක්‍රියාමාර්ග යෙදීමෙන් අනතුරුව අවදානම් පිළිගත හැකි මට්ටමකට අවම වී තිබේද යන වග තක්සේරු කිරීම.

iv. **අවදානම් අධීක්ෂණය, සමාලෝචනය සහ වාර්තාකරණය**

හඳුනාගත් අවදානම්වලට එරෙහිව තොරතුරු තාක්ෂණ පාලනවල සැලැස්ම සහ මෙහෙයුම් ඵලදායීතාවය තක්සේරු කිරීම සහ අධීක්ෂණය සඳහා ක්‍රියාවලියක් පිහිටු වීම.

4.3 ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ කාර්යභාරය

අ) සඵලදායී අධීක්ෂණය, වාර්තාකරණය, උත්සන්න වීමේ ක්‍රියාමාර්ගවල සහය ඇති හා අනුමත කරන ලද අවදානම් ඔරොත්තු දීමකට අනුකූල නිශ්චිත ප්‍රතිපත්ති සහ ක්‍රියාපටිපාටිවලට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තාක්ෂණ අවදානම් කළමනාකරණ රාමුව ක්‍රියාත්මක කිරීම සහ ඕනෑම අහිතකර ප්‍රවණතාවක් පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත දැනුම් දීම.

ආ) මාණ්ඩලික මට්ටමේ තොරතුරු ආරක්ෂණ කමිටුව සඳහා සහාය ලබා දීමට සහ තාක්ෂණය ප්‍රතිග්‍රහණය කිරීම, තොරතුරු ආරක්ෂාව, සයිබර් ආරක්ෂාව, බාහිරින් සේවා සපයා ගැනීම සහ සංකේන්ද්‍රනය පිළිබඳ ගැටලුවලට පිළියම් යෙදීම සඳහා ප්‍රධාන විධායක නිලධාරියා විසින් ප්‍රධානත්වය දරනු ලබන කළමනාකාරීත්ව මට්ටමේ තොරතුරු ආරක්ෂණ කමිටුවක් බලපත්‍රලාභී මුදල් සමාගම් සතු විය යුතුය. කළමනාකාරීත්ව මට්ටමේ තොරතුරු ආරක්ෂණ කමිටුවක කාර්යභාරයන් සහ වගකීම් ඇමුණුම 1 හි දක්වා ඇත.

ඇ) ආයතනය තුළ සහ බාහිර සේවා සපයන තෙවන පාර්ශ්වීය නියෝජිත ආයතන තුළ සයිබර් සනීපාරක්ෂාව අඛණ්ඩව පවත්වා ගෙන යනු ලබන බවට තහවුරු කිරීම. කාර්යමණ්ඩලය සහ අනෙකුත් සම්බන්ධිත පාර්ශ්වයන් විසින් සිදු කරනු ලබන භූමිකාව මත පදනම්ව දැනුවත් කිරීමේ වැඩසටහන් කලින් කලට පැවැත්විය යුතු වේ.

ඈ) විවිධ තොරතුරු ආරක්ෂණ ප්‍රමිතීන්/රාමුවල පැහැදිලිව දක්වා ඇති පරිදි භෞතික පිවිසුම (physical access), තාර්කික පිවිසුම (logical access), විපර්යාස කළමනාකරණය (change management), පරිමා කළමනාකරණය (patch management) සහ වින්‍යාස කළමනාකරණය (configuration management), යහ පරිචයන්ට (best practices) අදාළ නිසි පාලන මාර්ගයන් පිහිටුවීම සහ එවැනි පාලනයන් තොරතුරු පද්ධතිවල සමස්ත ජීවන චක්‍රය සඳහා සලකා බැලිය යුතු වේ.

ඉ) තොරතුරු ආරක්ෂණ පාලන මාර්ගවල කාර්යක්ෂමතාව සහ අදාළත්වය කලින් කලට සමාලෝචනය කිරීම හා ප්‍රමුඛතාව මත අවශ්‍ය පිළියම් ක්‍රියාමාර්ග ගැනීම.

4.4 ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියා

අ) බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තොරතුරු ආරක්ෂණ අවශ්‍යතාවන්ට නායකත්වය සැපයීමට ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු පත් කළ යුතුය. ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකුගේ ප්‍රධාන වගකීම් පහත පරිදි වේ:

i. තොරතුරු ආරක්ෂණ ක්‍රමෝපාය සංවර්ධනය කිරීම, කළමනාකරණය සහ ක්‍රියාත්මක කිරීම.
ii. තොරතුරු ආරක්ෂණ ක්‍රියාමාර්ග අඛණ්ඩව අධීක්ෂණය හා ඇගයීම.
iii. තොරතුරු ආරක්ෂණ විගණන සහ අවදානම් ඇස්තමේන්තු සිදු කිරීම.
iv. තොරතුරු ආරක්ෂණ රෙගුලාසිවලට අනුකූලව ආයතනය පවත්වා ගෙන යෑම.
v. ව්‍යාපාර අඛණ්ඩතා සැලසුම් සංවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යෑම.
vi. තොරතුරු ආරක්ෂණ අවදානම් සහ ක්‍රමෝපායන්ට අදාළව පුහුණුකරණය සහ දැනුවත් කිරීම.
vii. තොරතුරු ආරක්ෂණ අයවැයන් කළමනාකරණය; සහ
viii. තොරතුරු ආරක්ෂණය පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කිරීම.

ආ) ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියා ජ්‍යෙෂ්ඨ කළමනාකරණ කණ්ඩායමේ විධායක නිලධාරියෙකු විය යුතුය.

ඇ) තොරතුරු ආරක්ෂණ නිලධාරියා විසින් ප්‍රධාන විධායක නිලධාරියා වෙත වාර්තා කළ යුතුය, නැතහොත් වාර්තාකරණ ධූරාවලියක් අවසානයේ ප්‍රධාන විධායක නිලධාරියා සිටින සුදුසු වාර්තාකරණ ධූරාවලියක් තිබිය යුතුය.

ඈ) තොරතුරු ආරක්ෂණ කටයුතු බාධාවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා තොරතුරු ආරක්ෂක නිලධාරියා බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අවදානම් කළමනාකරණ සහ තොරතුරු තාක්ෂණ කාර්යයන් සමඟ සම්බන්ධීකරණය විය යුතුය.

ඉ) බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් මුහුණ දෙනු ලබන තාක්ෂණික සහ තොරතුරු ආරක්ෂණ අවදානම්වල විශාලත්වයට ඒ සඳහා ම වෙන් වූ ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු අවශ්‍ය නොවන බවට අධ්‍යක්ෂ මණ්ඩලය විසින් නිශ්චිතව දක්වන්නේ නම්, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරියෙකු ලෙස තම අනෙකුත් රාජකාරීන් හා සමගාමීව කටයුතු කිරීම සඳහා එම බලපත්‍රලාභී මුදල් සමාගමෙහි කළමනාකාරීත්ව කණ්ඩායමෙන් විධායක නිලධාරියෙකු පත් කළ යුතුය. කෙසේ වෙතත්, එවැනි නිලධාරියෙකු ප්‍රධාන තොරතුරු නිලධාරියා, ප්‍රධාන අභ්‍යන්තර විගණක, ප්‍රධාන අවදානම් නිලධාරියා හෝ අනුකූලතා නිලධාරියා වැනි ධූරයන් ඇතුළුව ඔහුගේ වගකීම් සමඟ පරස්පර වන කිසිදු කාර්යයක් ඉටු නොකළ යුතුය.

4.5 අභ්‍යන්තර විගණනය

බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අභ්‍යන්තර විගණනයක් තුළින් මෙම විධානයන්හි අවශ්‍යතා සමඟ අනුකූල වීම අවම වශයෙන් වාර්ෂිකව තහවුරු කළ යුතුය.

5. **තොරතුරු සහ තොරතුරු පද්ධතිවල ආරක්ෂාව**

5.1 පාරිභෝගික දත්ත සාධාරණව සහ සදාචාරාත්මකව භාවිත කිරීම

අ) පාරිභෝගිකයින් විසින් තම දත්ත බලපත්‍රලාභී මුදල් සමාගම් භාවිත කරනු ඇතැයි සාධාරණාත්මකව අපේක්ෂා කරන ආකාරයෙන් පමණක් එම පාරිභෝගික දත්ත භාවිත කරනු ඇති බවට බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තහවුරු කළ යුතුය.

ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සෑම කලක දී ම පාරිභෝගික දත්ත සාධාරණව සහ සදාචාරාත්මකව භාවිත කරන බව තහවුරු කිරීමට ඵලදායී ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කළ යුතුය. තවද, නෛතික අවශ්‍යතාවන් හැරුණු කොට, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් එවැනි දත්ත අනාවරණය නොකළ යුතුය.

ඇ) බලපත්‍රලාභී මුදල් සමාගම්වල මෙහෙයුම්වලට අදාළව පවතින පරිදි, පාරිභෝගික දත්ත සාධාරණව සහ සදාචාරාත්මකව භාවිත කිරීම පිළිබඳ අපේක්ෂාවන් ගෙන් බැඳී පවතින සහ එම රෙගුලාසිවලට ම ඔවුන් යටත් වන බැවින්, මූල්‍ය තාක්ෂණය (Fin Tech) ඇතුළුව, බාහිර සේවා සපයන විකුණුම්කරුවන්ගෙන් ද එම අනුකූලතාව ඉටු වන බවට බලපත්‍රලාභී මුදල් සමාගම් තහවුරු කළ යුතුය.

5.2 තොරතුරු වර්ගීකරණය සහ ලේබල්කරණය

අ) අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ තොරතුරු ආරක්ෂණ කමිටුවේ නිර්දේශ මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තොරතුරු වර්ගීකරණ ප්‍රතිපත්තියක් බලපත්‍රලාභී මුදල් සමාගම් සතු විය යුතුය.

ආ) ඉලෙක්ට්‍රොනිකමය වශයෙන් පවත්වා ගෙන යනු ලබන සියලුම දත්ත, තොරතුරු ආරක්ෂණ මට්ටම මත පදනම්ව වර්ග කළ යුතු අතර, තොරතුරු වර්ගීකරණ ප්‍රතිපත්තියට අනුව නියම කර ඇති වර්ගීකරණයට අනුව ලේබල් කළ යුතුය.

5.3 තීරණාත්මක තොරතුරු පද්ධති හඳුනා ගැනීම

අ) තීරණාත්මක තොරතුරු පද්ධතියක් යනු බලපත්‍රලාභී මුදල් සමාගමේ ඉතා වැදගත් කටයුතු හෝ ගෙවීම් සේවා සැපයීමට සහාය ලබා දෙන ඕනෑම තොරතුරු පද්ධතියක් වන අතර මෙම පද්ධතියේ සිදු වන ඇණ හිටීමකින් මූල්‍ය ආයතනය විසින් තම ගනුදෙනුකරුවන්ට හෝ ප්‍රතිපාර්ශ්වයන්ට සපයනු ලබන මූල්‍යමය සේවාවන්, ව්‍යාපාර මෙහෙයුම්, මූල්‍ය තත්ත්වය, කීර්තිනාමය හෝ අදාළ නීති සහ නියාමන අවශ්‍යතා සමඟ අනුකූල වීම කෙරෙහි සැලකිය යුතු ලෙස හානි සිදු කළ හැකිය.

ආ) තීරණාත්මක තොරතුරු පද්ධතීන් ලෙස ගනුදෙනු සැකසුම් පද්ධති, සාමාන්‍ය ලෙජර පද්ධති, ගෙවීම් සහ පියවීම් පද්ධති, බෙදාහැරීමේ මාර්ග, මුදල් විශුද්ධිකරණය (AML) වැළැක්වීමට හා/ඔබේ ගනුදෙනුකරු හඳුනා ගැනීමේ ක්‍රියාමාර්ග (KYC) සහ මුදල් ව්‍යාපාර බාධාවකින් තොරව පවත්වා ගෙන යෑම තහවුරු කිරීමට අවශ්‍ය වන වෙනත් ඕනෑම පද්ධතියක් හඳුනා ගන්නා නමුත් එකී පද්ධතීන්වලට පමණක්ම තීරණාත්මක තොරතුරු පද්ධතීන් සීමා නොවේ. ඉහතින් බැහැර කරනු ලබන ඕනෑම තොරතුරු පද්ධතියක් අභ්‍යන්තරිකව පිහිටු වන ලද ප්‍රතිපත්තියක් මත පදනම් විය යුතුය. එවැනි සියලු බැහැර කිරීම් අවම වශයෙන් සෑම දෙවසරකට වරක් සමාලෝචනය කළ යුතුය.

ඇ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ තොරතුරු ආරක්ෂණ කමිටුවේ නිර්දේශයන් මත තීරණාත්මක තොරතුරු පද්ධතිවල නිර්වචනයට ඇතුළත් වන තොරතුරු පද්ධති හඳුනා ගත යුතුය.

5.4 පරිශීලක ප්‍රවේශ (User Access) කළමනාකරණය

අ) පාරිභෝගික දත්ත වෙත නිරාවරණය වී තිබෙන තොරතුරු පද්ධති සහ තීරණාත්මක තොරතුරු පද්ධතිවලට පරිශීලක පිවිසුම් පාලනය අදාළ වනු ඇත.

ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ තොරතුරු ආරක්ෂණ කමිටුවේ උපදෙස් ඇතිව පාරිභෝගික නොවන රහස්‍ය දත්තවලට නිරාවරණය වන තීරණාත්මක නොවන තොරතුරු පද්ධති සඳහා තීරණාත්මක තොරතුරු පද්ධති හා සමාන පරිශීලක පිවිසුම් පාලන අවශ්‍යතා යෙදවීමේ අවශ්‍යතාව පිළිබඳව තීරණය කළ යුතුය.

ඇ) බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් වරප්‍රසාදිත (Privileged) පරිශීලකයන් ඇතුළුව සියලු පරිශීලකයන් කළමනාකරණය කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශයේ සම්මත පරිශීලක ප්‍රවේශයක් සහ අනන්‍යතා කළමනාකරණ පද්ධතියක් (පද්ධති) ක්‍රියාත්මක කළ යුතුය.

ඈ) තොරතුරු තාක්ෂණ අංශයේ සම්මත පරිශීලක පිවිසුමක සහ අනන්‍යතා කළමනාකරණ පද්ධතියක් (පද්ධතීන්) සාධ්‍ය හෝ උචිත නොවන අවස්ථාවක දී, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ තොරතුරු ආරක්ෂණ කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව පවතින ඕනෑම තොරතුරු පද්ධතියක් සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් නිසි පාලනයක් ක්‍රියාත්මක කරමින් විකල්ප පාලන භාවිත කළ යුතුය.

ඉ) වරප්‍රසාදිත පරිශීලක පිවිසුම "තිබිය යුතුය යන අවශ්‍යතාව" මත පමණක් පදනම්ව සැලසිය යුතු අතර, පිවිසුමේ ඉහළම මට්ටම එවැනි පිවිසුමක් අවශ්‍ය වූ විටක දී පමණක් සීමිත කාලයක් සඳහා පමණක් සැලසිය යුතුය. මෙම ගිණුම්වල කටයුතු සටහන් කළ යුතු අතර, බලපත්‍රලාභී මුදල් සමාගමෙහි සිදු කර ගෙන යමින් පවතින අධීක්ෂණයෙහි කොටසක් ලෙස ඒවා සමාලෝචනය කළ යුතුය.

ඊ) බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පරිශීලක පිවිසුම් සමාලෝචන පහත වාර ගණනින් සිදු කළ යුතුය.

i. තීරණාත්මක තොරතුරු පද්ධති සඳහා අවම වශයෙන් මාසික පදනමක් මත.

ii. පාරිභෝගික දත්ත සහ පාරිභෝගික නොවන රහස්‍ය දත්තවලට නිරාවරණය වූ තීරණාත්මක නොවන තොරතුරු පද්ධති සඳහා අවම වශයෙන් කාර්තුමය පදනමක් මත.

iii. අනෙකුත් සියලු තොරතුරු පද්ධති සඳහා අවම වශයෙන් වාර්ෂික පදනමක් මත.

iv. සම්බන්ධිත ගිණුම්වල (Linked Accounts) මෙහෙයුම් උපදෙස්වලට අනුකූලව සුදුසු ක්‍රමවේදයක් භාවිත කරමින්, විද්‍යුත් බෙදාහැරීමේ මාර්ග ඇතුළුව බලපත්‍රලාභී මුදල් සමාගමෙහි ඕනෑම තොරතුරු පද්ධතියක් භාවිත කිරීම සඳහා ලියාපදිංචි වූ පාරිභෝගිකයන් සහ ඔවුන්ගේ බලයලත් නියෝජිතයන් සඳහා අවම වශයෙන් අර්ධ වාර්ෂික පදනමක් මත.

උ) බලපත්‍රලාභී මුදල් සමාගම් තොරතුරු ආරක්ෂණ කමිටුව විසින් අනුමත කරන ලද පරිදි පරිශීලක පිවිසුම් වරප්‍රසාද සමාලෝචන පැවැත්වීම සඳහා නිසි ක්‍රමවේදයන් අනුගමනය කළ යුතුය.

ඌ) පරිශීලක පිවිසුම් වරප්‍රසාද සමාලෝචනයන් සිදු කරන විට දී, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තෙවන පාර්ශ්ව සේවා සපයන්නන් වැනි අභ්‍යන්තර සහ බාහිර පරිශීලකයන් හඳුනා ගැනීම, සත්‍යාපනය (authentication) සහ අවසර දීම (authorization) සමාලෝචනය කිරීමට සුදුසු යාන්ත්‍රණයක් ක්‍රියාත්මක කළ යුතුය.

5.5 පරිගණක ආරක්ෂාව සහ පරිශීලක කටයුතු සටහන් (User Activity Log) කළමනාකරණය

අ) තීරණාත්මක තොරතුරු පද්ධති සහ පාරිභෝගික දත්ත තොරතුරු පද්ධතිවල පරිගණක ආරක්ෂාව සහ පරිශීලක කටයුතු සටහන් කිරීම කළමනාකරණය සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් සටහන් කළමනාකරණ ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කළ යුතුය. එවැනි ප්‍රතිපත්තියක් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවක අභිමතය පරිදි අනෙකුත් තොරතුරු පද්ධති දක්වා පුළුල් කළ හැකිය.

ආ) අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ තොරතුරු ආරක්ෂණ කමිටුවේ නිර්දේශයන් මත පදනම්ව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් මෙම ප්‍රතිපත්තිය අනුමත කරනු ලැබිය යුතුය.

ඇ) පවත්වා ගෙන යා යුතු සටහන් වර්ග (Logs), රඳවා ගැනීමේ කාලය, සමාලෝචනය කිරීමේ වාර ගණන, සමාලෝචනය කිරීමේ ක්‍රමය හා භාවිත කළ යුතු මෙවලම් (Tools), සිද්ධි හඳුනා ගැනීම හා ප්‍රතිචාරය සහ සටහන් ගත කිරීම් පවත්වා ගෙන යෑම සහ සමාලෝචනය සඳහා වන වගකීම් යනාදිය මෙම ප්‍රතිපත්තියට ඇතුළත් විය යුතුය.

ඈ) ආරක්ෂණ මෘදුකාංග, මෙහෙයුම් පද්ධති සහ යෙදවුම් මගින් පරිගණක ආරක්ෂණ සටහන් උත්පාදනය කළ යුතුය. පවත්වා ගෙන යනු ලබන පරිගණක ආරක්ෂාව සහ පරිශීලක කටයුතු සටහන් කිරීම්, තොරතුරු ආරක්ෂණ සිදුවීම් සාර්ථකව හඳුනා ගැනීමට සහ ගවේෂණය කිරීම සඳහා ප්‍රමාණවත් විය යුතුය.

ඉ) වරප්‍රසාදිත පරිශීලකයන්ගේ සටහන් සඳහා ඉහළ අවධානයක් යොමු කළ යුතු අතර, නිසි මෙවලම් සහ උපක්‍රම භාවිත කරමින් ආසන්න තත් කාලීන පදනමක් මත සමාලෝචනය කළ යුතුය.

5.6 දත්ත සංකේතනය (Data Encryption)

5.6.1 පාරිභෝගික දත්ත සංකේතනය

අ) සංකේතනය මගින් පාරිභෝගික දත්ත ආරක්ෂා කළ යුතුය.

ආ) බලපත්‍රලාභී මුදල් සමාගම්, නියෝජිතයන් සහ තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් සමඟ පවත්වා ගෙන යනු ලබන පාරිභෝගික දත්ත සඳහා සංකේතනය අදාළ විය යුතුය.

ඇ) දත්ත සංකේතනයේ මට්ටම්,

i. ඩේටා ඇට් රෙස්ට් එන්ක්‍රිප්ෂන් (data-at-rest encryption)
පාරිභෝගික දත්තයන්, දත්ත සමුදාය (Database) සංකේතනයට හෝ ගොනු මට්ටමේ සංකේතනයට යටත් විය යුතුය.

ii. ඩේටා ඉන් ට්‍රාන්සිට් එන්ක්‍රිප්ෂන් (data-in-transit encryption)
පාරිභෝගික දත්තවලින් සමන්විත ගොනුවක් සම්ප්‍රේෂණය කරන ඕනෑම අවස්ථාවකදී, එය ගොනු මට්ටමින් සංකේතනය කර තිබිය යුතුය.

iii. අන්ත ලක්ෂ්‍ය උපාංග සහ වෙන් කළ හැකි මාධ්‍ය සඳහා පූර්ණ සංවාහක සංකේතනය (Full disk encryption for endpoint devices and removable media)
ස්ථිර වශයෙන් හෝ තාවකාලිකව යන දෙආකාරයෙන් එක් ආකාරයකට බලපත්‍රලාභී මුදල් සමාගම්වල ගනුදෙනුකරුවන්ගේ දත්ත තැන්පත් කරන තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් සහ නියෝජිතයන්ගේ උපාංග ඇතුළුව සියලු අන්ත ලක්ෂ්‍ය උපාංග සහ වෙන් කළ හැකි මාධ්‍ය පූර්ණ සංවාහක සංකේතනයට යටත් විය යුතුය.

ඈ) බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තොරතුරු තාක්ෂණ අංශයේ සම්මත සංකේතන ක්‍රමයන් භාවිත කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ තොරතුරු ආරක්ෂණ කමිටුවෙහි නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතියට යටත්ව එවැනි ක්‍රමයන් තෝරා ගැනීම සිදු කළ යුතුය.

ඉ) තොරතුරු තාක්ෂණ අංශයේ සම්මත සංකේතන ක්‍රම සාධ්‍ය නොවන හෝ සුදුසු නොවන විට දී, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ තොරතුරු ආරක්ෂණ කමිටුවෙහි අනුමැතියට යටත්ව ගනුදෙනුකරු දත්ත ආරක්ෂා කිරීම සඳහා විකල්ප පාලන භාවිත කළ යුතුය.

5.6.2 පාරිභෝගික නොවන රහස්‍ය දත්ත සංකේතනය

අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව විසින් තීරණය කරනු ලබන පරිදි සංකේතනය මගින් වළක්වා ගැනීමට හැකියාව තිබූ දත්ත පිටතට පැමිණීම හෝ වෙනත් අහිතකර තොරතුරු ආරක්ෂණ සිදුවීමකට යටත්ව බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නොසැලකිය හැකි අහිතකර බලපෑමක් පමණක් එල්ල කරන පාරිභෝගික නොවන රහස්‍ය දත්ත වර්ග හැරුණු කොට, පාරිභෝගික නොවන රහස්‍ය දත්තවලට ද සංකේතන අවශ්‍යතා අදාළ විය යුතුය.

5.7 ආරක්ෂණ මෙහෙයුම් කේන්ද්‍රය

විද්‍යුත් බෙදා හැරීමේ මාර්ග ලබා දෙන සියලු බලපත්‍රලාභී මුදල් සමාගම් (උදාහරණ: අන්තර්ජාල බැංකුකරණය, ජංගම යෙදවුම්, පාරිභෝගික/තෙවන පාර්ශ්ව ඒකාබද්ධ වීම් යනාදිය) ඇමුණුම II හි දක්වා ඇති අවම අවශ්‍යතාවලට අනුකූලව ආරක්ෂණ මෙහෙයුම් කේන්ද්‍රයක් ක්‍රියාත්මක කළ යුතුය.

5.8 දත්ත අහිමි වීම වැළැක්වීම

අ) බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් දත්ත කාන්දු වීමේ අවදානම අවම කිරීම සඳහා තොරතුරු තාක්ෂණ අංශයේ සම්මත දත්ත හානි වැළැක්වීමේ මෙවලම් ක්‍රියාත්මක කළ යුතුය. අදාළ ක්‍රියා පටිපාටියෙහි විෂය පථය මගින් සමස්ථ බලපත්‍රලාභී මුදල් සමාගම සහ පාරිභෝගික දත්තවලට නිරාවරණය වන ඕනෑම තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් සහ නියෝජිතයන් ආවරණය විය යුතුය.

ආ) තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් සහ නියෝජිතයන් පිළිබඳව සලකා බැලීමේ දී, බලපත්‍රලාභී මුදල් සමාගම් එම සමාගම් විසින් නිශ්චිතව දක්වන ලද අවම අවශ්‍යතාවලට අනුකූලව දත්ත හානි වැළැක්වීමේ මෙවලම් ක්‍රියාත්මක කිරීම සඳහා ඔවුනට ඉඩ ලබා දෙනු ඇත.

ඇ) තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් සහ නියෝජිතයන් විසින් ප්‍රමාණවත් දත්ත හානි වැළැක්වීමේ ක්‍රියාමාර්ග නිසි තැන්හි යොදා ගෙන ඇති බව තහවුරු කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් එවැනි ක්‍රියාත්මක කිරීම් පිළිබඳ සමාලෝචනයක් අවම වශයෙන් වාර්ෂිකව සිදු කළ යුතුය.

ඈ) තොරතුරු තාක්ෂණ අංශයේ ප්‍රමිතියෙන් යුත් දත්ත හානි වැළැක්වීමේ මෙවලම් සාධ්‍ය හෝ සුදුසු නොවන විට දී, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ තොරතුරු ආරක්ෂණ කමිටුවෙහි අනුමැතියට යටත්ව පාරිභෝගික දත්ත ආරක්ෂා කිරීම සඳහා විකල්ප පාලන භාවිත කළ යුතුය.

5.9 තොරතුරු ආරක්ෂණය සම්බන්ධ සිදුවීම් සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රතිසාධනය

5.9.1 සිද්ධි ප්‍රතිචාර සැලැස්ම

අ) සිද්ධි උත්සන්න වීම, පිළියම් යෙදීම, ප්‍රතිසාධනය සහ අභ්‍යන්තර සහ බාහිර සම්බන්ධිත පාර්ශ්වයන් සමඟ සන්නිවේදනය සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග ඇතුළුව, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද යාවත්කාලීන සිද්ධි ප්‍රතිචාර සැලැස්මක් බලපත්‍රලාභී මුදල් සමාගමක් සතු විය යුතුය.

ආ) සයිබර් ආරක්ෂණ සිද්ධීන් සහ එයට පමණක් සීමා නොවූ සිද්ධීන්ද ඇතුළුව, පොදුවේ හැඳින්වෙන තොරතුරු ආරක්ෂණ සිද්ධි සමඟ ගනුදෙනු කිරීම සඳහා සිද්ධි ප්‍රතිචාර සැලැස්ම කළ නිශ්චිත ක්‍රියාමාර්ග පැවතිය යුතුය.

5.9.2 සිද්ධි ප්‍රතිචාර සහ ප්‍රතිසාධන පරීක්ෂාව

බලපත්‍රලාභී මුදල් සමාගම්වල සිද්ධි සඳහා ප්‍රතිචාර දැක්වීමට තිබෙන සූදානම තීරණය කිරීම සඳහා හැකිතාක් සැබෑ ජීවිතයට සමීප අවස්ථා භාවිත කරමින් අවම වශයෙන් වාර්ෂිකව සිද්ධි ප්‍රතිචාර සහ ප්‍රතිසාධන හැකියාවන් පරීක්ෂා කළ යුතුය. එවැනි පරීක්ෂණයක ප්‍රතිඵල තොරතුරු ආරක්ෂණ කමිටුව මගින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව ඔස්සේ අධ්‍යක්ෂ මණ්ඩලය වෙත වාර්තා කළ යුතුය.

5.10 තොරතුරු ආරක්ෂණ පරීක්ෂණය

5.10.1 පූර්ව තොරතුරු ආරක්ෂණ පරීක්ෂණය ක්‍රියාත්මක කිරීම

අ) විෂය පථය

i. පාරිභෝගික දත්තවලට නිරාවරණය වූ තොරතුරු පද්ධති සහ තීරණාත්මක තොරතුරු පද්ධති, පූර්ව තොරතුරු ආරක්ෂණ පරීක්ෂාවන්ට යටත් විය යුතුය. පාරිභෝගික දත්තවලට නිරාවරණය වූ ඕනෑම තොරතුරු පද්ධතියක් හෝ ඕනෑම තීරණාත්මක තොරතුරු පද්ධතියක් හෝ අනාගතයේ දී අවදානමට ලක් කළ හැකි වෙනත් ඕනෑම තොරතුරු පද්ධති ද පූර්ව තොරතුරු ආරක්ෂණ පරීක්ෂාවන්ට යටත් විය යුතුය.

ii. අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ තොරතුරු ආරක්ෂණ කමිටුවේ නිර්දේශය මත රහස්‍ය පාරිභෝගික නොවන දත්තවලට නිරාවරණය වූ තීරණාත්මක නොවන තොරතුරු පද්ධති පූර්ව තොරතුරු ආරක්ෂණ පරීක්ෂාවට ලක් කිරීමේ අවශ්‍යතාව අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරනු ලැබිය යුතුය.

iii. මූලික ස්ථාපනය ක්‍රියාත්මක කිරීමට පෙර සහ සංශෝධන ක්‍රියාත්මක කිරීමට පෙර පූර්ව තොරතුරු ආරක්ෂණ පරීක්ෂාවන් සිදු කිරීම සිදු කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද බැහැර කිරීමේ ප්‍රතිපත්තිය (Exclusion Policy) මත පදනම්ව සුළු සංශෝධනයන් පූර්ව තොරතුරු ආරක්ෂණ පරීක්ෂා ක්‍රියාත්මක කිරීමෙන් බැහැර කළ හැකිය. ඕනෑම නිශ්චිත සුළු සංශෝධනයක් බැහැර කිරීමට අවශ්‍ය වන අවස්ථාවක දී, තොරතුරු ආරක්ෂණ කමිටුවෙහි අනුමැතිය ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය වේ.

ආ) යම් ස්ථාපනයක් ක්‍රියාත්මක කිරීමට අදාළව පහත වර්ගවල පූර්ව ක්‍රියාත්මක කිරීමේ පරීක්ෂා පවත්වා ගෙන යා හැකිය:

i. ඕනෑම අනිෂ්ට හෝ සුරක්ෂිත නොවන කේතයක් අනාවරණය කර ගැනීමට ස්ථිතික යෙදවුම් ආරක්ෂණ පරීක්ෂාව (Static Application Security Testing) හෝ මූල කේත සමාලෝචනය (source code reviews).

ii. ප්‍රහාරකයෙකුට ගවේෂණය කළ හැකි යෙදවුම් මට්ටමේ දුර්වලතා අනාවරණය කිරීම සඳහා ගතික යෙදවුම් ආරක්ෂණ පරීක්ෂාව (Dynamic Application Security Testing).

iii අභ්‍යන්තර දැඩි කිරීම් ප්‍රතිපත්ති සමඟ අනුකූල වීම තහවුරු කිරීම සඳහා පරිගණක සහ ජාලකරණ යටිතල පහසුකම් දැඩි කිරීම් පිළිබඳ තත්ත්ව සහතිකකරණ පරීක්ෂාව (Quality assurance testing), සහ

iv පරිගණක සහ ජාලකරණ යටිතල පහසුකම් තුළ පවතින අවදානම් සහගත තත්ත්වයන් හඳුනා ගැනීම සඳහා යටිතල පහසුකම් තුළ පවතින අවදානම් සහගත තත්ත්වයන් සඳහා තක්සේරු කිරීම් (Infrastructure vulnerability assessments).

ඇ) තොරතුරු පද්ධති සංවර්ධනය සහ/හෝ ක්‍රියාත්මක කිරීම සඳහා වගකිව යුතු කණ්ඩායමෙන් ස්වාධීන වන කණ්ඩායමක් විසින් පූර්ව ක්‍රියාත්මක කිරීමේ පරීක්ෂණ සිදු කළ යුතුය.

ඈ) 5.10.1 (ආ) ට අනුව පූර්ව ක්‍රියාත්මක කිරීමේ පරීක්ෂණ පැවැත්වීමට නොහැකි නම්, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පවතින තොගයෙන් (off the shelf) ගනු ලබන මෘදුකාංග සැපයීමේ දී සුදුසු විකල්ප ආරක්ෂණ ඇගයීම් ක්‍රමවේද අනුගමනය කළ යුතුය.

ඉ) බාහිර විකුණුම්කරුවන් විසින් සපයනු ලබන තොරතුරු පද්ධති සලකා බැලීමේ දී 5.10.1 (ආ)(i) ට විකල්පයක් ලෙස, බලපත්‍රලාභී මුදල් සමාගම සහ තොරතුරු පද්ධති සැපයුම්කරු යන දෙපාර්ශ්වයට ම අන්‍යෝන්‍යාමය වශයෙන් පිළිගත හැකි, ස්වාධීන තෙවන පාර්ශ්වයක් විසින් සපයනු ලබන සහතිකකරණයක් මත බලපත්‍රලාභී මුදල් සමාගම් විශ්වාසය තැබිය යුතුය.

ඊ) අදාළ පූර්ව ක්‍රියාත්මක කිරීමේ පරීක්ෂණ සම්පූර්ණ කිරීමෙන් අනතුරුව මූල කේතය, නිෂ්පාදන පරිසරයකට මාරු වීමේදී අනිෂ්ට කේතය නික්ෂේපනය නොකෙරෙනු ඇති බවට තහවුරු කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් තොරතුරු තාක්ෂණ අංශයේ සම්මත පාලනයන් ස්ථාපනය කළ යුතුය.

5.10.2 අවදානම් තක්සේරු කිරීම්

අ) තීරණාත්මත තොරතුරු පද්ධති සහ පාරිභෝගික දත්තවලට නිරාවරණය වී පවතින තොරතුරු පද්ධති අවම වශයෙන් අර්ධ වාර්ෂිකව හෝ තොරතුරු තාක්ෂණ යටිතල පහසුකම් සහ පද්ධති සංශෝධනවලට වෙනස්කමක් සිදු කරන විටෙක දී අවදානම් තක්සේරු කිරීම්වලට යටත් විය යුතුය.

ආ) යටිතල පහසුකම් සහ යෙදවුම්වල ඇති වන අවදානම් තත්ත්වයන් යන කරුණු දෙකම කෙරෙහි අවදානම් තක්සේරු කිරීමේ දී අවධානය යොමු කළ යුතුය.

ඇ) අවදානම් තක්සේරු කිරීම් නිෂ්පාදන පරිසරයන් මත සිදු කළ යුතුය.

ඈ) බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අභ්‍යන්තර තොරතුරු ආරක්ෂක නිළධාරීන් හෝ බාහිර විශේෂඥයන් විසින් අවදානම් තක්සේරු කිරීම් සිදු කළ යුතුය.

ඉ) හඳුනාගත් අවදානම් තත්ත්වයන් සඳහා තොරතුරු ආරක්ෂක කමිටුව විසින් අනුමත කරනු ලබන කාල පරිච්ඡේදයක් තුළ දී පිළියම් යෙදිය යුතුය.

5.10.3 විනිවිදුම් පරීක්ෂාව (Penetration Testing)

අ)
i. සැබෑ ලොව ශෛලීය ප්‍රහාරවලට ඔරොත්තු දීමට පරීක්ෂා කළ තොරතුරු පද්ධති සතු හැකියාව;

ii. පරීක්ෂාවට ලක් කළ තොරතුරු පද්ධති සාර්ථකව බිඳ හෙලීම සඳහා ප්‍රහාරකයෙකු සතු විය යුතු සංකීර්ණභාවයෙහි සහ අඛණ්ඩතාවයෙහි අවශ්‍ය වන මට්ටම;

iii. එවැනි ප්‍රහාර හඳුනා ගැනීමට සහ සුදුසු ලෙස ප්‍රතිචාර දැක්වීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගමෙහි තොරතුරු ආරක්ෂණය, මෙහෙයුම් සහ නායකත්ව කණ්ඩායම්වල හැකියාව;

iv. අනාගතයේ දී එවැනි තර්ජන අවම කර ගැනීම සඳහා අවශ්‍ය වන ඕනෑම වැඩි දියුණු කිරීමක්;

තීරණය කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ස්වාධීන බාහිර විශේෂඥයෙකු උපයෝගී කර ගනිමින් විනිවිදුම් පරීක්ෂාව සිදු කළ යුතුය.

ආ) තීරණාත්මක තොරතුරු පද්ධති, පාරිභෝගික දත්ත වෙත නිරාවරණය වූ තොරතුරු පද්ධති සහ බලපත්‍රලාභී මුදල් සමාගම් සමඟ පවතින පාරිභෝගික දත්තවල සුරක්ෂිතාගාර, නියෝජිතයන් සහ තෙවන පාර්ශ්ව සේවා සපයන්නන් අවම වශයෙන් වාර්ෂිකව, ස්වාධීන බාහිර විනිවිදුම් පරීක්ෂා විශේෂඥයෙකු විසින් සිදු කරනු ලබන විනිවිදුම් පරීක්ෂාවලට යටත් විය යුතුය. විනිවිදුම් පරීක්ෂණ පැවැත්වීම පිළිබඳ දක්වන ලද මාර්ගෝපදේශයක් III වන ඇමුණුමෙහි දී ඇත.

ඇ) පරිණත සහ තම ව්‍යාපාර කටයුතුවලට සහාය ලබා දීමට සංකීර්ණ තාක්ෂණයන් සතු බලපත්‍රලාභී මුදල් සමාගම්වලට විනිවිදුම් පරීක්ෂණවල දීර්ඝ කිරීමක් ලෙස රතු කණ්ඩායම් අභ්‍යාසයන් (Red team exercises) මෙහෙයවිය හැකිය. එවැනි රතු කණ්ඩායම් අභ්‍යාසයන් සිදු කළ හැක්කේ කෙසේද යන්න පිළිබඳව පෙන්නුම් කරන මාර්ගෝපදේශයක් ඇමුණුම IV හි දක්වා ඇත.

5.11 තොරතුරු ආරක්ෂණ පුහුණුකරණය සහ සහතිකකරණය

5.11.1 අධ්‍යක්ෂ මණ්ඩලය පුහුණුකරණය සහ දැනුවත් කිරීම

අ) බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පහත අවශ්‍යතාවලට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා තොරතුරු ආරක්ෂණය සහ තාක්ෂණික අවදානම් කළමනාකරණය පිළිබඳව පරිපූර්ණ වාර්ෂික පුහුණුවක් සහ දැනුවත් කිරීමේ වැඩසටහනක් ක්‍රියාත්මක කළ යුතුය.

i. තොරතුරු ආරක්ෂණයේ ප්‍රමාණවත් බව හා සඵලදායීත්වය සහ බලපත්‍රලාභී මුදල් සමාගමේ තාක්ෂණික අවදානම් කළමනාකරණ ප්‍රතිපත්ති සහ ක්‍රියාවලි සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලයට ඵලදායී සාර්ථක අධීක්ෂණයක් ඇති කිරීම එවැනි වැඩසටහනක අරමුණ විය යුතුය.

ii. මෙම නියාමන රාමුවෙහි අවශ්‍යතාවන්ට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ අධ්‍යක්ෂ මණ්ඩල කමිටුවල වගකීම් සහ තොරතුරු ආරක්ෂණය සහ තාක්ෂණික අවදානම් කළමනාකරණයට අදාළ වන අනෙකුත් නීති සහ රෙගුලාසි ද එවැනි වැඩසටහන් ඔස්සේ ආවරණය විය යුතුය.

iii. එවැනි පුහුණු කිරීමක්, අවම වශයෙන් වාර්ෂික ව්‍යුහගත පුහුණු කිරීමේ වැඩසටහනක් සහ සෑම වසරක් පාසාම තොරතුරු ආරක්ෂණ සහ තාක්ෂණික අවදානම් කළමනාකරණ විශේෂඥයන් විසින් මෙහෙයවනු ලබන දැනුවත් කිරීමේ සැසි එකක් හෝ ඊට වැඩි ගණනකින් සමන්විත විය යුතුය.

iv. බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල ලේකම් විසින් පුහුණුකරණය සහ දැනුවත් කිරීම සම්බන්ධව ඉහත අවශ්‍යතාවන් සමඟ එම සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අනුකූල වීම තහවුරු කරනු ලැබිය යුතුය.

5.11.2 කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු ආරක්ෂණ දැනුවත් කිරීමේ පුහුණුව සහ සහතිකකරණ අවශ්‍යතාව

අ) බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පහත අවශ්‍යතාවන්ට අනුකූලව, කීරණාත්මක තොරතුරු පද්ධති, පාරිභෝගික දත්ත, රහස්‍ය පාරිභෝගික නොවන දත්තවලට නිරාවරණය වූ හෝ අනාගතයේ දී නිරාවරණය විය හැකි, බලපත්‍රලාභී මුදල් සමාගමෙහි කාර්ය මණ්ඩලය, නියෝජිතවරුන් සහ තෙවන පාර්ශ්ව සේවා සපයන්නන් තොරතුරු ආරක්ෂණය පිළිබඳ පුහුණුවක් ලැබූ සහ සහතික ලත් පිරිස් බවට තහවුරු කරනු ලැබිය යුතුය.

i. බලපත්‍රලාභී මුදල් සමාගමෙහි තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග මත පදනම්ව තොරතුරු ආරක්ෂණ දැනුවත් කිරීම් පුහුණු කිරීමේ වැඩසටහනක් අවශ්‍ය පුද්ගලයන් විසින් සම්පූර්ණ කළ යුතුය.

ii. 5.11.2 අ (i) ට අනුව එවැනි වැඩසටහන් පුහුණුව, ලබන්නාගේ තොරතුරු ආරක්ෂණ වගකීම්වලට සරිලන ඒවා විය යුතු අතර, බලපත්‍රලාභී මුදල් සමාගමෙහි තොරතුරු ආරක්ෂණ ප්‍රතිපත්ති යාවත්කාලීන කෙරෙන සෑම අවස්ථාවක දී ම එය ද නිතිපතා යාවත්කාලීන කළ යුතුය.

iii. අවශ්‍ය පුද්ගලයන් විසින් තොරතුරු ආරක්ෂණ දැනුවත් කිරීම් පුහුණු කිරීම පදනම්ව අභ්‍යන්තර සහතිකකරණ පරීක්ෂණයක් අවම වශයෙන් වාර්ෂිකව සම්පූර්ණ කළ යුතුය.

ආ) නියෝජිතයන් සහ තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් විසින් ප්‍රමාණවත් සහ සැසඳිය හැකි තොරතුරු ආරක්ෂණ දැනුවත් කිරීමේ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කරනු ලැබ ඇති නම්, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනි නියෝජිතයන් සහ තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් 5.11.2 අ (i) හි අවශ්‍යතාවලින් බැහැර කළ යුතුය.

6. **තොරතුරු පද්ධතිවල උපයෝජ්‍යතාවය සහ ආපදා ප්‍රතිසාධනය**

6.1 විෂය පථය

6.2 සිට 6.5 දක්වා නිශ්චිතව දක්වා ඇති අවශ්‍යතා තීරණාත්මක තොරතුරු පද්ධතිවලට අදාළ විය යුතුය.

6.2 පද්ධති උපයෝජ්‍යතාව (System Availability)

අ) බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තීරණාත්මක තොරතුරු පද්ධති සඳහා ඉහළ මට්ටමකින් පද්ධති උපයෝජ්‍යතාවයක් ළඟා කර ගැනීම තහවුරු කළ යුතුය.

ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවෙහි නිර්දේශය මත එක් එක් තීරණාත්මක තොරතුරු පද්ධතිය සඳහා පද්ධති උපයෝජ්‍යතා ඉලක්ක පිහිටු විය යුතුය.

ඇ) තීරණාත්මක තොරතුරු පද්ධති සඳහා පද්ධති උපයෝජ්‍යතා ඉලක්ක අත්පත් කර ගැනීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධීක්ෂණය කරන බවට සහ ඔවුන් වෙත එය වාර්තා කරන බවට අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව තහවුරු කළ යුතුය.

6.3 ආපදා ප්‍රතිසාධන (Disaster Recovery) **සැකැස්ම**

අ) බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පහත අවම අවශ්‍යතාවන්ට අනුකූලව, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ නිර්දේශය මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් තීරණය කරන ලද ප්‍රතිසාධන කාල අරමුණු (Recovery Time Objectives) සහ ප්‍රතිසාධන ලක්ෂ්‍ය අරමුණු (Recovery Point Objectives) සමඟ තීරණාත්මක තොරතුරු පද්ධති සඳහා ආපදා ප්‍රතිසාධන සැකැස්මක් පවතින බවට තහවුරු කළ යුතුය.

i. බලපත්‍රලාභී මුදල් සමාගමෙහි තීරණාත්මක තොරතුරු පද්ධති සඳහා පැය 6කට අඩු ප්‍රතිසාධන කාල අරමුණු; සහ

ii. ශූන්‍ය හෝ ශූන්‍යයට ආසන්න ප්‍රතිසාධන ලක්ෂ්‍ය අරමුණු (එනම්, ආපදාවක දී දත්ත හානියක් සිදු නොවීම)

6.4 ආපදා ප්‍රතිසාධන සක්‍රීය කිරීම

අ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුවේ සහ තොරතුරු ආරක්ෂණ කමිටුවෙහි නිර්දේශයන් මත පදනම්ව එක් එක් තීරණාත්මක තොරතුරු පද්ධතිය සඳහා ආපදා ප්‍රතිසාධන සක්‍රීය කිරීමේ ක්‍රියාරම්භකයන් පිහිටුවිය යුතුය.

ආ) එවැනි සක්‍රීය කිරීමේ ක්‍රියාරම්භකයන් මගින් 6.3 හි නිශ්චිතව දක්වා ඇති ප්‍රතිසාධන කාල අරමුණුවලට අනුකූලව ආපදා ප්‍රතිසාධන සැකැස්ම සක්‍රීය කිරීම සඳහා ප්‍රමාණවත් කාලයක් තහවුරු කළ යුතුය.

6.5 ආපදා ප්‍රතිසාධන පරීක්ෂාව

අ) අවම වශයෙන් වසරකට එක් දිනයක දී හෝ ආපදා ප්‍රතිසාධන යටිතල පහසුකම් භාවිත කරමින් සියලු තීරණාත්මක තොරතුරු පද්ධති ක්‍රියාත්මක කිරීම මගින් ආපදා ප්‍රතිසාධන ක්‍රියා පිළිවෙල පරීක්ෂාවට ලක් කළ යුතුය.

ආ) 6.5 (අ) ට අනුව ආපදා ප්‍රතිසාධන යටිතල පහසුකම් පරීක්ෂා කිරීමට අමතරව, විවිධ ආපදා තත්ත්වයන් යටතේ අවශ්‍ය ප්‍රතිසාධන කාල අරමුණු සහ ප්‍රතිසාධන ලක්ෂ්‍ය අරමුණු සාක්ෂාත් කර ගැනීම සහ අවශ්‍ය වූ විට නිසි නිවැරදි කිරීමේ ක්‍රියාමාර්ග ගැනීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් සතු හැකියාව තීරණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලයට හැකියාව ලබා දීම සඳහා ආපදා ප්‍රතිසාධන අනුකරණවල වාර්ෂික චක්‍රයක් ක්‍රියාත්මක කළ යුතුය.

7. **කාර්යමණ්ඩල නිපුණත්ව අවශ්‍යතා**

7.1 අ) අවශ්‍ය සුදුසුකම්වලින් සමන්විත සේවකයන් තොරතුරු ආරක්ෂණය, තාක්ෂණික අවදානම් කළමනාකරණය සහ අභ්‍යන්තර විගණන කාර්යයන්වල සේවයෙහි නිරත වී සිටින බවට බලපත්‍රලාභී මුදල් සමාගම් තහවුරු කළ යුතුය. මීට අමතරව, තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන්ගේ කාර්යමණ්ඩල සාමාජිකයන්ට ද එවැනි සුදුසුකම් තිබිය යුතුය. පිළිගත් සුදුසුකම්, අදාළ භූමිකාවන් සඳහා ආයතන පිළිබඳ මඟපෙන්වීමක් V වන ඇමුණුමෙහි දක්වා ඇත.

ආ) බලපත්‍රලාභී මුදල් සමාගමකට 7.1 (අ) වන වගන්තියෙහි අවශ්‍යතා සමඟ අනුකූල වීමට නොහැකි වන අවස්ථාවේ දී, අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ තොරතුරු ආරක්ෂණ කමිටුවෙහි නිර්දේශයන්ට යටත්ව තොරතුරු ආරක්ෂණය සහ තාක්ෂණික අවදානම් කළමනාකරණයේ සුදුසු අත්දැකීම් සහ කුසලතා සඳහා දක්වන සුදුසුකම් ආදේශ කිරීමට නියම කළ යුතුය.

8. **තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් කළමනාකරණය**

8.1 අධ්‍යක්ෂ මණ්ඩලය සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය විසින් තීරණාත්මක තාක්ෂණ කාර්යයන් සහ පද්ධති සඳහා තෙවන පාර්ශ්ව සේවා සපයන්නන් සේවයේ යෙදවීමේ දී ඵලදායී අධීක්ෂණයක් සිදු කිරීම සහ ආශ්‍රිත අවදානම්වලට පිළියම් යෙදීමට කටයුතු කළ යුතුය. ස්වාධීන තක්සේරු ලබා ගැනීම් ඇතුළුව, තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් යොදා ගැනීම, තාක්ෂණ කාර්යයන් සහ පද්ධතිවල ආරක්ෂාව සහ විශ්වසනීයත්වය සඳහා බලපත්‍රලාභී මුදල් සමාගමෙහි මූලික වගවීම් සහ වගකීම් කිසිදු ආකාරයකින් අවම කිරීම හෝ පැහැර හැරීම සිදු නොකරයි.

8.2 තෙවන පාර්ශ්වීය සේවා සපයන්නෙකු විසින් සිදු කරනු ලබන ඕනෑම පාරිභෝගික දත්තවල රහස්‍යභාවය උල්ලංඝනය කිරීමක් සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය වගකිය යුතුය.

8.3 **තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් ඇගයීම**

අ) බලපත්‍රලාභී මුදල් සමාගම් තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් සේවයට පත් කර ගැනීමට පෙර, ඔවුන්ගේ නිපුණත්වය, පද්ධති යටිතල පහසුකම් සහ මූල්‍ය ශක්‍යතාවය පිළිබඳ නිසි යථායෝගීතා පරීක්ෂණයක් සිදු කළ යුතුය.

ආ) මීට අමතරව, පහත නිශ්චිත අවදානම් කළමනාකරණය කිරීමේ දී තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන්ගේ හැකියාවන් සම්බන්ධව ඇගයීමක් සිදු කළ යුතුය.

i. ගනුදෙනුකාර සහ ප්‍රතිපාර්ශ්වවල තොරතුරු අනවසර ලෙස හෙළිදරව් කිරීම ඇතුළුව දත්ත කාන්දු වීම්.

ii. ධාරිතා කාර්යසාධනය ඇතුළුව සේවාවලට බාධා වීම්.

iii. සැකසුම් දෝෂ.

iv. භෞතික ආරක්ෂණ උල්ලංඝනය කිරීම්.

v. සයිබර් තර්ජන.

vi. ප්‍රධාන පුද්ගලයන් මත අධික ලෙස යැපීම.

vii. මූල්‍ය ආයතනය හෝ එහි ගනුදෙනුකරුවන්ට අදාළ රහස්‍ය තොරතුරු සම්ප්‍රේෂණය කිරීම, සකස් කිරීම හෝ ගබඩා කිරීමේ දී සිදු කරන ලද අනිසි පරිහරණය කිරීම්.

viii. සංකේන්ද්‍රණ අවදානම.

ඇ) තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් විසින් 8.3 (ආ) හි ඉස්මතු කර ඇති අවදානම් පිළිබිඹු කරන අවස්ථාවක දී, එවැනි අවදානම් අවම කිරීම සඳහා නිසි ක්‍රියාමාර්ග ගනු ලබන බවට බලපත්‍රලාභී මුදල් සමාගම විසින් තහවුරු කළ යුතුය.

8.4 **සේවා සැපයීමේ ගිවිසුම්**

අ) සේවා සපයන තෙවන පාර්ශ්වයක් සමඟ කටයුතු කිරීමේ දී සේවා සැපයීමේ ගිවිසුමකට එළඹීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම් කටයුතු කළ යුතු වේ. අවම වශයෙන්, සේවා සැපයීමේ ගිවිසුමක පහත සඳහන් කරුණු අඩංගු විය යුතු වේ.

i. ශ්‍රී ලංකා මහ බැංකුව හෝ බලපත්‍රලාභී මුදල් සමාගමක කිසියම් කටයුත්තක් හෝ ආයතනයක් අධීක්ෂණය කිරීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම විසින් පත් කරනු ලැබූ ඕනෑම පාර්ශ්වයක් සඳහා ප්‍රවේශ අයිතිය. කළමනාකරණ තොරතුරු සහ සියලුම උපදේශන සහ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ සටහන් ඇතුළත්ව බලපත්‍රලාභී මුදල් සමාගමේ ඕනෑම වාර්තාවක්, ලිපි ගොනුවක් හෝ දත්ත සඳහා ප්‍රවේශ වීම මෙහි ඇතුළත් විය යුතුය.

ii. සේවා සපයන තෙවන පාර්ශ්වය සහ බලපත්‍රලාභී මුදල් සමාගම වෙත සපයනු ලබන සේවාවන් හා සම්බන්ධ සේවා සපයන තෙවන පාර්ශ්වයේ කාර්ය මණ්ඩලය පරීක්ෂා කිරීම සඳහා ශ්‍රී ලංකා මහ බැංකුව සතු අයිතිය.

iii. බලපත්‍රලාභී මුදල් සමාගම වෙත සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් අධ්‍යක්ෂවරයා විසින් ඉල්ලුම් කරනු ලබන කිසියම් තොරතුරක් හෝ දත්ත ලබා දීම සඳහා සේවා සපයන තෙවන පාර්ශ්වය කටයුතු කළ යුතු බව.

iv. බලපත්‍රලාභී මුදල් සමාගම වෙත සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් කිසියම් තොරතුරක් හෝ දත්ත ඉල්ලුම් කර ලබා ගැනීම සඳහා ශ්‍රී ලංකා අධිකරණය සතු අයිතිය.

v. පාරිභෝගික දත්ත සාධාරණව සහ බලපත්‍රලාභී මුදල් සමාගම විසින් දත්ත හුවමාරු කර ගනු ලැබූ අරමුණ සඳහා පමණක් භාවිත කිරීම, සේවා සපයන තෙවන පාර්ශ්වය තහවුරු කළ යුතු වේ.

vi. සේවා සපයන තෙවන පාර්ශ්වය සතුව ඇති සියලුම පාරිභෝගික දත්ත සහ රහස්‍ය පාරිභෝගික නොවන දත්ත, ගිවිසුම් කාල සීමාව අවසානයේ දී පෙර නිශ්චය කරන ලද කාලයක් තුළ සම්පූර්ණයෙන් මකා ඉවත් කළ යුතුය.

vii. මෙම විධානයන්ගේ සඳහන් අභ්‍යන්තර විගණන අවශ්‍යතා සහ තොරතුරු ආරක්ෂණය පරීක්ෂා කිරීමේ අවශ්‍යතා සඳහා සේවා සපයන තෙවන පාර්ශ්ව පහසුකම් සැලසිය යුතු වේ.

viii. සැලකිය යුතු කාලයකට පූර්වයෙන් බලපත්‍රලාභී මුදල් සමාගම වෙත පෙර දැනුම් දීමක් කිරීම සඳහා සේවා සපයන්නා සහ උපකොන්ත්‍රාත්කරුවන්ට අවශ්‍යතා.

ix. සේවා සපයන්නා විසින් අදාළ නීති යටතේ රහස්‍ය විධිවිධාන සමඟ අනුකූල වන බවට ලිඛිත එකඟතාවයක් පැවතීම. සේවා සපයන්නාගේ කටයුතු අවසන් වූ පසුව ද ගිවිසුමේ නිශ්චය කරන ලද රහස්‍යභාවය සඳහා වන ප්‍රතිපාදන හා බැඳී පවතින බව සේවා සැපයීමේ ගිවිසුමේ තවදුරටත් පැහැදිලිව සඳහන් කළ යුතු වේ.

x. ආපදාවකින් පසු යථා තත්ත්වයට පත් කිරීම සඳහා සැලසුම් සහ උපස්ථා (backup) හැකියාව.

xi. බාධාවකින් තොරව සේවා සැපයීම සඳහා තෙවන පාර්ශ්වය විසින් යොමු කරන ලද කාර්ය මණ්ඩලය කැපවීමෙන් කටයුතු කිරීම තහවුරු කිරීම සහ කිසියම් වෙනසක් වේ නම්, ඒ පිළිබඳව ප්‍රමාණවත් කාල සීමාවක් තුළ දැනුම් දීම.

xii. සේවා සපයන තෙවන පාර්ශ්වය විසින් පාරිභෝගිකයන්ගේ දත්තවල රහස්‍යභාවය උල්ලංඝනය කර ඇත්නම්, ඒ සඳහා වන්දි ලබා දීමේ යාන්ත්‍රණය සහ නිවැරදි කිරීමේ ක්‍රියාපටිපාටිය.

xiii. නීරණාත්මක පද්ධති සඳහා පිවිසීමට ඇති හැකියාව.

xiv. සේවා සපයන්නා සේවයෙන් ඉවත් වුවහොත් හෝ සේවය අත්හිටුවහොත් හෝ ව්‍යාපාර කටයුතු අඛණ්ඩව සිදු කරගෙන යාම තහවුරු කිරීම සඳහා වන සැලසුම් සකස් කිරීම.

ආ) තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් හා එළඹී ඇති ගිවිසුමේ ස්වභාවය සහ සංකීර්ණත්වය හේතුවෙන් සේවා සැපයීමේ ගිවිසුමේ ඉහත 8.4 (අ) හි දක්වා ඇති කොන්දේසි ඇතුළත් කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම අපොහොසත් වන අවස්ථාවකදී, එවැනි කොන්දේසි සේවා සැපයීමේ ගිවිසුමෙන් ඉවත් කිරීම, අධ්‍යක්ෂ මණ්ඩල ඒකාබද්ධ අවදානම් කළමනාකරණ කමිටුව සහ තොරතුරු ආරක්ෂණ කමිටුවේ නිර්දේශ මත අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සම්මත කළ යුතුය.

8.5 සපයනු ලබන සේවාවන් සම්බන්ධයෙන් නවතම ආරක්ෂණ සහ තාක්ෂණික දියුණුවන් සැලකිල්ලට ගනිමින් තෙවන, පාර්ශ්වයන් සමඟ සේවා සැපයීමේ ගිවිසුම් කාලීනව සමාලෝචනය කිරීමට ඇති හැකියාව බලපත්‍රලාභී මුදල් සමාගම් තහවුරු කළ යුතු වේ.

8.6 මෙම විධානයන්ගේ නියම කර ඇති සියලුම අදාළ නියාමන අවශ්‍යතා සමඟ තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් අනුකූල වන බවට බලපත්‍රලාභී මුදල් සමාගම් තහවුරු කළ යුතු වේ.

8.7 තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් භාරයේ ඇති දත්ත කාලීනව නැවත ලබා ගැනීමට හැකි බව බලපත්‍රලාභී මුදල් සමාගම් තහවුරු කළ යුතු වේ. සයිබර් අවකාශයේ සිදුවන ගැටලුවක දී බලපත්‍රලාභී මුදල් සමාගම වෙත කඩිනමින් දැනුම් දීම්, බලපත්‍රලාභී මුදල් සමාගම සහ අනෙකුත් නියාමන ආයතන වෙත කාලෝචිත යාවත්කාලීන කිරීම සඳහා පහසුකම් සැලසීම සඳහා තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් හා පැහැදිලිව නිර්වචනය කරන ලද සැලසුම් සකස් කර තිබෙන බවට බලපත්‍රලාභී මුදල් සමාගම් තහවුරු කළ යුතු වේ.

8.8 තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්හි දත්ත ගබඩා කිරීමේ දී එම දත්ත අවම වශයෙන් තාර්කික අයුරින් අනෙකුත් සේවාදායකයන්ගේ දත්තවලින් වෙන් කර ඇති බවට බලපත්‍රලාභී මුදල් සමාගම් තහවුරු කළ යුතු වේ. බලයලත් පරීක්ෂකයන් වෙත සපයා ඇති ප්‍රවේශයන් සම්බන්ධයෙන් නිසි පාලනයන් සහ කලින් කලට සමාලෝචනයන් කළ යුතුය.

8.9 තෙවන පාර්ශ්වීය සේවා සපයන්නන් විසින් ඔවුන්ගේ සේවාව සැපයීමට අසමත් වූ අවස්ථාවක දී හෝ කාර්ය සාධනය සතුටුදායී නොවන අවස්ථාවක දී නිසි අයුරින් එම කාර්යයෙන් ඉවත් වීම සඳහා සේවා සපයන තෙවන පාර්ශ්ව විසින් පවත්වාගෙන යන තීරණාත්මක පද්ධති ශක්තිමත්ව යථා තත්ත්වයට පත් කිරීම සහ නැවත ආරම්භ කිරීමේ හැකියාව, බලපත්‍රලාභී මුදල් සමාගම් තහවුරු කළ යුතුය.

9. වලාකුළු සේවාවන් (Cloud Services)

9.1 වලාකුළු සේවාවන්ට අනන්‍ය වූ අන්තර්ජාලය හරහා බහු විධි තැනැත්තන් සමඟ සම්පත් සහ සේවා හුවමාරු කර ගැනීම සැලකිල්ලට ගනිමින් වලාකුළු සේවාවන් ප්‍රතිග්‍රහණය කිරීමේ අන්තර්ගත අවදානම බලපත්‍රලාභී මුදල් සමාගම් පැහැදිලිව අවබෝධ කළ ගත යුතුය.

9.2 **විස්තීරණ අවදානම් තක්සේරුකරණය**

ඇ) වලාකුළු සේවාවන් ප්‍රතිග්‍රහණය කිරීමට පෙර බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් අවදානම් තක්සේරු කිරීමක් සිදු කළ යුතුය. පහත සඳහන් කරුණු හා සම්බන්ධ අවදානම් ආමන්ත්‍රණය කිරීම සඳහා මෙම තක්සේරුවෙන් කටයුතු කළ යුතුය.

i. යෙදවීම් ආකෘතියේ සංකීර්ණත්වය.

ii. පවතින පද්ධති, වලාකුළු සේවාව වෙත සංක්‍රමණය කිරීම.

iii. වලාකුළු සේවාව සඳහා යටිතල පහසුකම් පවතින ස්ථානය.

iv. බහු විධි තැනැත්තන් සඳහා සේවා සැපයීම සහ දත්ත අන්තර් හුවමාරු වීමේ හැකියාව.

v. සේවා සපයන්නා මත යැපීමට සිදුවීම (Vendor lock-in) සහ යෙදවුම් සුවහනීයතාවය (application portability) හෝ අන්තර් ක්‍රියාකාරීත්වය (Interoperability).

vi. ඉහළ මට්ටමේ දත්ත සහ තාක්ෂණික පද්ධති ආරක්ෂණයක් තහවුරු කිරීම සඳහා වලාකුළු සේවාවන්ගේ යටිතල පහසුකම්හි ආරක්ෂක සැකසුම් අභිරුචිකරණය කිරීමට ඇති හැකියාව.

vii වලාකුළු සේවා සපයන්නන් හරහා සයිබර් ප්‍රහාරයන්ට නිරාවරණය වීම.

viii සේවය අවසන් කිරීමෙන් පසුව මූල්‍ය ආයතනයේ දත්ත ආරක්ෂා කිරීමට ඇති හැකියාව ඇතුළුව වලාකුළු සේවා සපයන්නෙකුගේ සේවය අවසන් කිරීම.

ix සේවා සපයන්නාගේ වගකීම්, සීමා සහ බැඳීම් වෙන් කර දැක්වීම.

x අඛණ්ඩ පදනමක් මත වලාකුළු සේවා පහසුකම් සම්බන්ධයෙන් නියාමන අවශ්‍යතා සහ ජාත්‍යන්තර ප්‍රමිතීන් සපුරාලීමට ඇති හැකියාව.

ආ) ඉහත 9.2 (අ) හි මතු කර දක්වා ඇති අවදානම් වලාකුළු සේවා සපයන්නා විසින් පෙන්නුම් කරනු ලබන අවස්ථාවක දී, එවැනි අවදානම් අවම කර ගැනීම සඳහා අවශ්‍ය පියවර නිසි අයුරින් ක්‍රියාත්මක කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම් කටයුතු කළ යුතුය.

9.3 පහත සඳහන් කරුණු ප්‍රමාණවත් ලෙස ආමන්ත්‍රණය සඳහා තෝරාගත් වලාකුළු ආකෘතිය කෙතරම් දුරකට කටයුතු කරන්නේ දැයි බලපත්‍රලාභී මුදල් සමාගම් තක්සේරු කළ යුතුය.

අ) භූගෝලීය බලපෑම්වලින් වියුක්ත බව (Geographical redundancy)

ආ) අඛණ්ඩව ක්‍රියාත්මක වීමේ හැකියාව (High availability)

ඇ) පරිමාණීකෘතබව (Scalability)

ඈ) සුවහබව (Portability)

ඉ) අන්තර් ක්‍රියාකාරීත්වය (Interoperability)

ඊ) සිදු විය හැකි අන්තර්ජාල දෝෂ වලින් ආරක්ෂා වීම සඳහා සුදුසු විකල්ප අන්තර්ජාල ප්‍රවේශ ඇතුළුව ශක්තිමත්ව යථා තත්ත්වයට පත්වීම සහ නැවත ආරම්භ කිරීමේ හැකියාව

9.4 අවම වශයෙන්, පහත සඳහන් ක්ෂේත්‍රයන් ඇතුළුව වලාකුළු සේවා සපයන්නන් ස්වාධීන, ජාත්‍යන්තර වශයෙන් පිළිගත් සහතිකයක් ලබා ඇති දැයි බලපත්‍රලාභී මුදල් සමාගම් තක්සේරු කළ යුතුය.

අ) පරිශීලක දත්ත සංකේතනය (encryption) සහ විකේතනය (decryption) කිරීම සඳහා භාවිත කළ හැකි ක්‍රිප්ටෝග්‍රැපික් මොඩියුල (cryptographic modules) ඇතුළුව තොරතුරු ආරක්ෂණ කළමනාකරණ රාමුව.

ආ) භාවිත වන, ගබඩා කර ඇති සහ සංක්‍රාන්ති තත්ත්වයේ ඇති ගෙවීම් ගනුදෙනු දත්ත ඇතුළුව පාරිභෝගිකයා සහ ප්‍රතිපාර්ශ්වය හෝ හිමිකාර වාණිජ තොරතුරු ආරක්ෂා කිරීම සඳහා වලාකුළු සේවාවට විශේෂිත ආරක්ෂක පාලනයන්.

9.5 කිසියම් වලාකුළු සේවාවක් භාවිත කිරීමට පෙර බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තීරණාත්මක සහ තීරණාත්මක නොවන පද්ධති වෙන වෙනම හඳුනා ගැනීමට කටයුතු කළ යුතුය. ප්‍රතිග්‍රහණය කිරීමට පෙර 9.2 පරිච්ඡේදයේ දක්වා ඇති අවදානම් තක්සේරු කිරීම ලේඛනගත කර අධ්‍යක්ෂවරයාට දැනුම් දිය යුතුය.

9.6 වලාකුළු සේවාවන් භාවිත කිරීමේ දී පාරිභෝගික, ප්‍රතිපාර්ශ්ව තොරතුරු සහ හිමිකාරීත්ව වාණිජ දත්ත අනවසර හෙළිදරව් වීම් සහ අනවසර ප්‍රවේශයන්ගෙන් ආරක්ෂා වීම සඳහා සුදුසු ආරක්ෂණ ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම් කටයුතු කළ යුතුය. ක්‍රිප්ටෝග්‍රැපික් යතුරු (cryptographic keys) කළමනාකරණය ඇතුළුව පාරිභෝගික හා ප්‍රතිපාර්ශ්ව තොරතුරු හිමිකාරීත්වය වාණිජ දත්ත සහ අන්තර්ජාලය තුළින් සපයන සේවාවල හිමිකාරීත්වය, පාලනය සහ කළමනාකරණය, රඳවා ගැනීම මෙයට ඇතුළත් වේ.

10. **අන්තර්කාලීන ප්‍රතිපාදන**

10.1 මෙම විධානයට අදාළ අන්තර්කාලීන ප්‍රතිපාදන පහත දක්වා ඇති වගුව 1 පරිදි විය යුතුය.

යොමුව	අවශ්‍යතාව	අනුකූල විය යුතු දිනය
4.3 (ආ)	විධායක මට්ටමේ තොරතුරු ආරක්ෂණ කමිටුව	2023.07.01
4.4	ප්‍රධාන තොරතුරු ආරක්ෂක නිලධාරී පත්කිරීම	2025.01.01
5.2	තොරතුරු වර්ගීකරණය සහ ලේබල්කරණය	2023.07.01
5.3	තීරණාත්මක තොරතුරු පද්ධති හඳුනා ගැනීම	2023.07.01
5.4	පරිශීලක ප්‍රවේශ කළමනාකරණය	2024.01.01
5.5	පරිගණක ආරක්ෂණ සහ පරිශීලක කටයුතු සටහන් කළමනාකරණය	2024.01.01
5.6	දත්ත සංකේතනය	2024.01.01
5.7	ආරක්ෂණ මෙහෙයුම් කේන්ද්‍රය	2026.01.01
5.8	දත්ත අහිමි වීම වැලැක්වීම	2024.01.01
5.9	තොරතුරු ආරක්ෂණය සම්බන්ධ සිදුවීම් සඳහා ප්‍රතිචාර දැක්වීම සහ ප්‍රතිසාධනය	2024.01.01
5.10.2 5.10.3	තොරතුරු ආරක්ෂණය පරීක්ෂා කිරීම අ) අවදානම් තක්සේරු කිරීම ආ) විනිවිදුම් පරීක්ෂාව	 2024.01.01 2024.01.01
5.11.1 5.11.2	තොරතුරු ආරක්ෂණ පුහුණුව සහ සහතික කිරීම අ) අධ්‍යක්ෂ මණ්ඩලය පුහුණු කිරීම සහ දැනුම්වත් කිරීම ආ) කාර්ය මණ්ඩලය සඳහා තොරතුරු ආරක්ෂණ දැනුවත් කිරීමේ පුහුණුව සහ සහතිකකරණය	 2023.07.01 2023.07.01
6.2	පද්ධතිය උපයෝජ්‍යතාවය	2023.07.01
6.3/6.4/6.5	ආපදා ප්‍රතිසාධනය	2023.07.01

11. නිර්වචන

11.1 මෙම විධානයන්ගේ අරමුණු සඳහා පහත නිර්වචන අදාළ වේ.

අ) නියෝජිතයා-නියෝජිතයෙකු හෝ උප-නියෝජිතයෙකු යනු අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද අභ්‍යන්තර ප්‍රතිපත්තිවලට අනුකූලව, බලපත්‍රලාභී මුදල් සමාගම වෙනුවෙන් සීමිත මූල්‍ය ව්‍යාපාර කටයුතු සැලසීම සඳහා බලපත්‍රලාභී මුදල් සමාගම විසින් තෝරා පත් කර ගන්නා ලද ආයතනයක් හෝ පුද්ගලයෙකු වේ.

ආ) රහස්‍ය පාරිභෝගික නොවන දත්ත-බලපත්‍රලාභී මුදල් සමාගමේ මූල්‍ය ගනුදෙනු, අධ්‍යක්ෂ මණ්ඩලය සහ කළමනාකාරීත්වය වෙත ඉදිරිපත් කිරීම්, සංවේදී සේවක දත්ත සහ බලපත්‍රලාභී මුදල් සමාගම විසින් තීරණය කරනු ලබන වෙනත් ඕනෑම දත්තයක් ඇතුළුව, ද්වේශ සහගත ලෙස භාවිත කළහොත් හෝ අනවසරයෙන් මුදා හැරියහොත් සැලකිය යුතු මූල්‍ය හෝ කීර්ති නාමය අහිමි වීමක් සිදු විය හැකි සහ පාරිභෝගික දත්ත යන නිර්වචනය යටතට නොගැනෙන ඕනෑම පොදු නොවන දත්තයක් මේ යටතට අයත් වේ.

ඇ) පාරිභෝගික දත්ත-අතීත, වර්තමාන හෝ භව්‍ය පාරිභෝගිකයෙකුට අදාළ ප්‍රසිද්ධ නොවන දත්ත මේ යටතට අයත් වේ. කෙසේ වුවද, හඳුනා ගැනීම අපහසු කළ පාරිභෝගික දත්ත, පාරිභෝගික දත්ත යටතට ගැනීම සිදු නොකළ යුතු වේ.

ඈ) හඳුනා ගැනීම අපහසු කළ පාරිභෝගික දත්ත-දත්ත මූලිකව අදාළ වූ පාරිභෝගිකයා හඳුනා ගැනීම සඳහා තනිව, හෝ වෙනත් කිසියම් දත්ත සමඟ ඒකාබද්ධව භාවිත කළ නොහැකි වන ලෙස සිතාමතා වෙනස් කරන ලද පාරිභෝගික දත්ත වේ.

ඉ) අධ්‍යක්ෂවරයා-බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා වේ.

ඊ) පොදු දත්ත-කිසිදු සීමාවකින් තොරව භාවිත කිරීම සහ නැවත පළ කිරීම සඳහා සෑම දෙනාටම නොමිලේ ලබාගත හැකි දත්ත.

ඌ) සේවා සපයන්නා-මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 07 දරන ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සම්බන්ධව බාහිර සේවා ලබා ගැනීම විධානය හෝ එහි සංශෝධන අනුව බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් බාහිර සේවා ලබා ගැනීමේ ගිවිසුමකට යොමු වී ඇති සේවා සපයන්නෙකු.

ඍ) ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය-මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2021 අංක 06 දරන ප්‍රධාන වගකිව යුතු පුද්ගලයන්ගේ යෝග්‍යතාවය තක්සේරු කිරීම විධානය හෝ එහි සංශෝධන යටතේ දක්වා ඇති නිර්වචනය අනුකූල විය යුතුය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මෙම විධානයන්ගේ I, II, III, IV සහ V උපලේඛනයන් පහත සබැඳිය ඔස්සේ ලබා ගත හැකිය.

https://www.cbsl.gov.lk/sites/default/files/cbslweb_documents/laws/cdg/snbfi_finance_business_act_directions_no_01_of_2022_e.pdf

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2022 අංක 02 දරන විධානය 2022 මාර්තු 18

ජංගම දුරකථන පදනම් කර ගත් විද්‍යුත් මුදල් සේවා

1. නෛතික ප්‍රතිපාදන

1.1 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 12 වන වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් ඔස්සේ ලබා ගන්නා ජංගම දුරකථන මත පදනම් වූ විද්‍යුත් මුදල් සේවා පිළිබඳ විධාන ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබේ.

2. විධානයන්හි අරමුණ

2.1 රට පුරා පවතින බැංකු සහ බලපත්‍රලාභී මුදල් සමාගම් අංශයේ භෞතික ශාඛා ජාලය විසින් පාරිභෝගිකයන් සඳහා මූල්‍යමය සේවාවන් වෙත සීමිත ප්‍රවේශයක් පමණක් සලසනු ලබයි. එබැවින් පහසු මූල්‍ය ප්‍රවේශය සඳහා සක්‍රීය බැංකුකරණයට සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි දියුණු කිරීමට ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා විසඳුමක් වනු ඇත.

3. විධානයෙහි අදාළත්වය සහ විෂයපථය

3.1 මෙම විධානයන් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන 4.1 විධානයෙහි දක්වා ඇති ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන්ට අදාළ විය යුතුය.

3.2 මෙම විධානයන් පහත විධානයන්ගේ අවශ්‍යතාවලින් නිදහස් කළ යුතුය.

අ) මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 07 දරන (ව්‍යාපාර මෙහෙයුම් කටයුතු සම්බන්ධව බාහිර සේවා ලබා ගැනීම) විධානයේ 2.1 'අ' 2.1 'ඌ' හ 2.1 'ඒ' විධානය, සහ

ආ) මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 06 දරන (ව්‍යාපාර කටයුතු පුළුල් කිරීම සහ මෙහෙයුම් කටයුතු) විධානයේ '6.2' විධානය.

4. ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් ක්‍රමය ඔස්සේ අවසර ලබා දී ඇති සේවාවන්

4.1 බලපත්‍රලාභී සේවා සපයන්නන්ගේ සහ ඔවුන්ගේ වෙළෙඳුන්ගේ ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් පද්ධති ඔස්සේ බලපත්‍රලාභී මුදල් සමාගම්වලට පහත සේවා සිදු කර ගෙන යා හැකිය.

අ) තැන්පතු ලබා ගැනීම

ආ) තැන්පතු ආපසු ගැනීම

ඇ) ණය ප්‍රදානය කිරීම

ඈ) ණය ආපසු ගෙවීම් ලැබීම

ඉ) 4.1 අ) සිට ඈ) දක්වා වගන්ති සඳහා අදාළ වන ගාස්තු සහ වියදම්, සහ

ඊ) අධ්‍යක්ෂවරයා විසින් අනුමත කරනු ලබන පරිදි වෙනත් ඕනෑම කටයුත්තක්

5. බලපත්‍රලාභී මුදල් සමාගමේ වගකීම

5.1 **අධ්‍යක්ෂ මණ්ඩලය**

අ) ව්‍යාපාර උපායමාර්ගවලට අනුකූලව බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් සපයනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් පිළිබඳ උපායමාර්ග සම්පාදනය කිරීම සඳහා අධ්‍යක්ෂ මණ්ඩලයට වගකීම පැවරේ.

ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද ප්‍රතිපත්ති, අධ්‍යක්ෂ මණ්ඩල අධීක්ෂණයක් සහිතව සුදුසු ශක්තිමත් අවදානම් කළමනාකරණ රාමුව, ප්‍රමාණවත් තාක්ෂණික සම්පත් සහ ස්වාධීන විගණනයට ලක් කරනු ලබන වෙළෙඳුන් මගින් ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන්ට අදාළ උපායමාර්ග සඳහා සහාය විය යුතුය.

ඇ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ගේ ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා මගින් ඇති කරනු කරනු ලබන විභව අවදානම් පිළිබඳව අවබෝධ කර ගැනීම සහ ණය අවදානම, මෙහෙයුම් අවදානම, ද්‍රවශීලතා අවදානම, කීර්තිනාම අවදානම, තාක්ෂණ අවදානම, නෛතික හා අනුකූලතා අවදානම ඇතුළුව අදාළ සියලු අවදානම් කළමනාකරණය කළ යුතුය. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් එවැනි අවදානම් අවම වශයෙන් වාර්ෂික පදනමක් මත සමාලෝචනය කළ යුතුය.

5.2 **ප්‍රධාන විධායක නිලධාරියා**

අ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් ඔස්සේ ලබා ගත් ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන්හි ජීව්‍යතාව, බලපත්‍රලාභී මුදල් සමාගම වෙත ඇති කරන අවදානම සහ එම සේවාවන් දිගින් දිගට ම ලබා ගැනීමේ තීරණය සම්බන්ධව දැනුවත් වීම පිළිබඳව තක්සේරු කිරීම

ආ) බලපත්‍රලාභී මුදල් සමාගමෙහි අවදානම් පැතිකඩ සමඟ අනුරූප වන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් සඳහා සීමා ව්‍යුහයන්වල (ගනුදෙනු සීමා, දිනයක සීමා, පාරිභෝගික සීමා, සේවා සපයන්නන්ගේ සීමා, වෙළෙඳුන්ගේ සීමා) නිසි තක්සේරුවක් සිදු කිරීම.

ඇ) අභ්‍යන්තර විගණන සහ බාහිර විගණන පැවැත්වීම මගින් පාලනවල ප්‍රමාණවත් බව තක්සේරු කිරීම.

ඈ) ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව ශක්තිමත් කිරීම සඳහා පද්ධති සහ ක්‍රියාවලි ක්‍රියාත්මක කිරීම තහවුරු කිරීම.

ඉ) බලපත්‍රලාභී මුදල් සමාගම සහ බලපත්‍රලාභී සේවා සපයන්නන් අතර පවතින ගිවිසුමෙහි විධිවිධාන මෙම විධානයන්හි විධිවිධාන සමඟ අනුකූල වන බවට තහවුරු කිරීම.

6. අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දීම සහ යොමු කිරීම්

6.1 බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් ආරම්භ කිරීමක්, අත්හිටුවීමක් හෝ සිදු කරනු ලබන ඕනෑම සංශෝධනයකට පෙර බලපත්‍රලාභී මුදල් සමාගම විසින් අධ්‍යක්ෂවරයා දැනුවත් කළ යුතුය.

6.2 බලපත්‍රලාභී මුදල් සමාගමක් විසින් බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් ආරම්භ කිරීමට ප්‍රථම පහත දෑ අධ්‍යක්ෂවරයා වෙත යොමු කළ යුතුය.

අ) යෝජිත ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාව සඳහා බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි අනුමැතිය

ආ) උපලේඛනය I හි දී ඇති ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවෙහි අවම අවශ්‍යතා සමඟ අනුකූල වීම සම්බන්ධව බලපත්‍රලාභී මුදල් සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයෙහි තහවුරු කිරීමක්.

ඇ) උපලේඛනය II හි දී ඇති ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවෙහි අවම අවශ්‍යතා සමඟ අනුකූල වීම සම්බන්ධව බලපත්‍රලාභී මුදල් සමාගමේ ප්‍රධාන විධායක නිලධාරියාගේ තහවුරු කිරීමක්.

ඈ) උපලේඛනය III හි දක්වා ඇති පරිදි ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවෙහි නිරත වී සිටින වෙළෙඳුන් පිළිබඳ විස්තර.

ඉ) උපලේඛනය IV හි දක්වා ඇති පරිදි ප්‍රධාන අවදානම් වර්ග සහ අවදානම අවම කිරීම් ඇතුළුව ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාව සහ එහි ව්‍යාපාරික බලපෑම් තක්සේරුව පිළිබඳ කෙටි වාර්තාවක්.

ඊ) අධ්‍යක්ෂවරයා හට අවශ්‍ය වන ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවට අදාළ වෙනත් ඕනෑම තොරතුරක්.

7. ගනුදෙනුකරුවන්ගේ ආරක්ෂාව

7.1 බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන්, මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2018 අංක 01 දරන (මූල්‍ය පාරිභෝගික ආරක්ෂණ රාමුව) විධානයේ විධිවිධාන සමඟ අනුකූල වන බවට බලපත්‍රලාභී මුදල් සමාගම විසින් තහවුරු කළ යුතුය.

8. ශ්‍රී ලංකා මහ බැංකුවේ අධීක්ෂණය

8.1 අධ්‍යක්ෂවරයා විසින් බලපත්‍රලාභී මුදල් සමාගමක් මෙම විධානයන් සමඟ අනුකූල වන බවට නියාමනය කරනු ඇති අතරෙ

අ) අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම අවස්ථාවක බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන්ට අදාළව ඕනෑම තොරතුරක් ඉල්ලීම.

ආ) අවශ්‍ය වන්නේ නම්, ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන්හි නිරතව සිටින බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ගේ පොත් සහ ස්ථාන පරීක්ෂා කිරීම.

ඇ) අවශ්‍ය යැයි සලකනු ලබන්නේ නම්, බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් බලපත්‍රලාභී මුදල් සමාගමකට සපයනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා සැකැස්ම නවතා දැමීමට සහ අත්හිටු වීමට නියෝග දීම.

ඈ) නිසි පරිදි බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ට එරෙහිව ඕනෑම ක්‍රියාමාර්ගයක් හෝ පියවරක් ගැනීමට බලපත්‍රලාභී මුදල් සමාගමකට නියෝග දීම.

ඉ) ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් මත බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ගේ හැසිරීම හේතුවෙන් හට ගන්නා සිදුවීම් සඳහා ඕනෑම පිළියම් ක්‍රියාමාර්ගයක් ගැනීමට බලපත්‍රලාභී මුදල් සමාගමකට නියෝග දීම.

ඊ) බලපත්‍රලාභී මුදල් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුකූල නොවීමක් නිවැරදි කිරීම තහවුරු කරන තෙක් බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාව තාවකාලිකව අත්හිටු වීමට බලපත්‍රලාභී මුදල් සමාගමකට නියෝග දීම.

9. අනෙකුත් කොන්දේසි

9.1 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාව පවත්වා ගෙන යෑම සඳහා අවම ප්‍රාග්ධන ප්‍රමාණාත්මකතා අනුපාත විධානයන්ට පමණක් සීමා නොවී, ඒවා ද ඇතුළුව, විවක්ෂණ අවශ්‍යතාවන්ට අනුකූලව විය යුතුය.

9.2 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් සම්බන්ධව උපරිම ගනුදෙනු සීමා සහ ගාස්තු ශ්‍රී ලංකා මහ බැංකුවේ ගෙවීම් සහ පියවීම් දෙපාර්තමේන්තුව හෝ අධ්‍යක්ෂවරයා විසින් පනවනු ලබන ගනුදෙනු සීමාවන් සහ ගාස්තු නොඉක්මවිය යුතුය.

9.3 බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් ලබා ගැනීම මෙම විධාන ක්‍රියාත්මක කිරීමට පෙර ආරම්භ කර ඇත්නම්, මෙම විධාන ක්‍රියාත්මක කිරීමෙන් මාස 6 ක් තුළ මෙම විධානවල අවශ්‍යතාවන්ට අනුකූල විය යුතු අතර, අනුකූලතාව සම්බන්ධව අධ්‍යක්ෂවරයා වෙත දැනුම් දිය යුතුය.

10. බලාත්මක වන දිනය

10.1 මෙම විධානයේ දිනයේ සිට මෙම විධානයන් බලාත්මක විය යුතුය.

11. අර්ථකථන

11.1 'අධ්‍යක්ෂවරයා'යන්නෙන් ශ්‍රී ලංකා මහ බැංකුවේ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරයා යන්න අදහස් විය යුතුය.

11.2 'විද්‍යුත් මුදල්' යන්නෙන් මූල්‍ය වගකීම් ගෙවීමේ හෝ පියවීමේ ක්‍රමයක් ලෙස භාවිත කිරීමේ අරමුණ සඳහා ඉලෙක්ට්‍රොනිකමය වශයෙන් තැන්පත් කර තිබෙන, අරමුදල් ලැබීම මත නිකුත් කරනු ලබන මුදල්මය අගය යන්න අදහස් විය යුතුය.

11.3 'වෙළෙන්දා' යන්නෙන් ජංගම ගෙවීම් සේවා පවත්වා ගෙන යෑම සඳහා බලපත්‍රලාභී සේවා සපයන්නන් විසින් පත් කරන ලද ආයතන/පුද්ගලයන් යන්න අදහස් විය යුතුය.

11.4 'බලපත්‍රලාභී සේවා සපයන්නා' යන්නෙන් 2013 අංක 01 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම ගෙවීම් ක්‍රම රෙගුලාසි හෝ සංශෝධන ප්‍රකාරව බලපත්‍රලාභී සේවා සපයන්නෙකු යන්න අදහස් විය යුතුය.

නිවාඩ් අජිත් ලෙස්ලි කබ්රාල්
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

උපලේඛනය I

අධ්‍යක්ෂ මණ්ඩලයේ තහවුරු කිරීම

බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවන්ට අදාළව අවම වශයෙන් පහත අවශ්‍යතා බලපත්‍රලාභී මුදල් සමාගමක අධ්‍යක්ෂ මණ්ඩලයේ තහවුරු කිරීම මගින් ආවරණය කළ යුතුය.

අ) ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් සම්බන්ධව වන මෙම විධානයන්ට අනුකූල වීම සහ පිළිපැදීම.

ආ) අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද,

i. බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් තෝරා ගැනීමේ ප්‍රතිපත්තිය
ii. අවදානම් කළමනාකරණ රාමුව
iii. පාරිභෝගික ආරක්ෂණ යාන්ත්‍රණය
iv. ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා කළමනාකරණය, පාලනය සහ අධීක්ෂණ යාන්ත්‍රණය; සහ
v. මෙහෙයුම් කාර්ය පටිපාටි සහ සංග්‍රහයයන් ට අනුකූල වීම සහ පිළිපැදීම

ඇ) බලපත්‍රලාභී මුදල් සමාගම් සහ බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් සමඟ ගිවිස ගෙන ඇති එකඟතාවයෙහි අවශ්‍ය ප්‍රතිපාදන පැවතීම සහ මෙම විධානයන් සමඟ එවැනි ප්‍රතිපාදන අනුකූල වීම

ඈ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් 2013 අංක 01 දරන ගෙවීම් කාඩ්පත් සහ ජංගම ගෙවීම් ක්‍රම රෙගුලාසි හෝ සංශෝධන සමඟ හෝ ශ්‍රී ලංකා මහ බැංකුව විසින් නිකුත් කරන ලද ඕනෑම රෙගුලාසියක් සමඟ අනුකූල වන බවට තහවුරු කිරීම.

ඉ) බලපත්‍රලාභී මුදල් සමාගම්වල ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා ක්‍රියාත්මක කිරීමට ප්‍රමාණවත් සම්පත් සහ ප්‍රවීණතාව පැවතීම.

ඊ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා ආශ්‍රිත සියලු අවදානම් හඳුනා ගැනීම, ලේඛනගත කිරීම සහ එම අවදානම් අවම කිරීමට හෝ පැවරීමට නිසි පියවර ගැනීම.

උ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් සපයනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් භාවිතයෙන් පාරිභෝගික ආරක්ෂාව සඳහා පැමිණිලි විසඳීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග සහ සහන ක්‍රමවේදය සඳහා පද්ධති සහ ක්‍රියා පටිපාටි ස්ථාපිත කර ඇත.

ඌ) බලපත්‍රලාභී සේවා සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථන පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා අඛණ්ඩව නිරීක්ෂණය කිරීමට සහ පාලනය කිරීමට ප්‍රමාණවත් අභ්‍යන්තර පාලන, පද්ධති සහ පිරිස් පවත්වා ගැනීම සහ බලපත්‍රලාභී සේවා සහ ඔවුන්ගේ වෙළෙඳුන්ට නියම කර ඇති වගකීම්වලට අනුකූල නොවන අවස්ථා විසඳීම හෝ මඟ හැරීම් සඳහා පිළියම් යෙදීම සඳහා ප්‍රමාණවත් අධීක්ෂණයක් පැවතීම.

එ) 2006 අංක 06 දරන මූල්‍ය ගනුදෙනු වාර්තාකරණ පනතෙහි විධිවිධාන සහ ඒ යටතේ දක්වා ඇති මුදල් විශුද්ධීකරණය සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීමේ කටයුතු වැළැක්වීම සඳහා පවතින රීති, රෙගුලාසි සහ මාර්ගෝපදේශයන්හි වන නියාමන අවශ්‍යතාවලට අනුකූල වීම.

ඒ) බලපත්‍රලාභී මුදල් සමාගම් ගනුදෙනුකරුවන්ගේ තොරතුරුවල ආරක්ෂාව සහ ඒවායෙහි රහස්‍යභාවය පවත්වා ගෙන යෑම තහවුරු කිරීම සඳහා පද්ධති සහ ක්‍රියාවලි පිහිටුවීම.

ඓ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් සපයනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් බාධාවකින් තොරව සැපයීම තහවුරු කිරීම සඳහා ව්‍යාපාර අඛණ්ඩතා සැලැස්මක් පැවතීම.

ඔ) පහත අවම නිර්ණායකය මත ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාව ආරම්භ කිරීමට පෙර බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ගේ යෝග්‍යතාව තක්සේරු කිරීම.

i. ව්‍යාපාරික හැසිරීමේ දී විශ්වසනීයත්වය සහ වෘත්තීමය ප්‍රමිති නිරූපණය කිරීම.

ii. මුදල් විශුද්ධීකරණය වැළැක්වීම සහ ත්‍රස්තවාදයට මුදල් සැපයීම වැළැක්වීම, වාර්තා පවත්වා ගෙන යෑම, අභ්‍යන්තර පාලන සහ පාරිභෝගික ආරක්ෂණ ක්‍රියාමාර්ග සාර්ථකව ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් සම්පත් සතු වීම

iii. කිසිදු නීති විරෝධී /සදාචාරාත්මක නොවන කටයුත්තක නියැළී නොසිටීම.

iv. උසස් තත්ත්වයෙන් යුත් ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාවන් සැපයීමට දැනුම සහ නිපුණත්වය සතු වීම.

v. ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් ගනුදෙනු හා ආශ්‍රිත සියලු අවදානම් පාලනය කිරීමේ හැකියාව නිරූපණය කිරීම.

උපලේඛනය II

ප්‍රධාන විධායක නිලධාරියාගේ තහවුරු කිරීම

බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවන්ට අදාළව අවම වශයෙන් පහත අවශ්‍යතා බලපත්‍රලාභී මුදල් සමාගමක ප්‍රධාන විධායක නිලධාරියාගේ තහවුරු කිරීම මගින් ආවරණය කළ යුතුය.

අ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් බලපත්‍රලාභී මුදල් සමාගම්වල ගනුදෙනුකරුවන් වෙත පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවෙහි භාවිතය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් ඔස්සේ පැහැදිලි, අවබෝධිත සහ ලේඛනගත තීරණ ගැනීම.

ආ) බලපත්‍රලාභී මුදල් සමාගම විසින් එම සමාගමේ ප්‍රතිලාභී ගිණුම්හිමියා වෙත එවනු ලබන කෙටි පණිවුඩයක් සහ/ හෝ විද්‍යුත් තැපැල් පණිවුඩයක් ඔස්සේ තත් කාලීන පදනමක් මත ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් ගනුදෙනුව පිළිබඳව දැනුම් දිය යුතුය.

ඇ) බලපත්‍රලාභී මුදල් සමාගම්වල මෙහෙයුම් අත්පොත්වල පිළිබිඹු කර ඇති පරිදි බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා ක්‍රියා පටිපාටි පැවතීම.

ඈ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවා බලපත්‍රලාභී සේවා සපයන්නන්, බලපත්‍රලාභී මුදල් සමාගම් සහ බලපත්‍රලාභී මුදල් සමාගමේ ගනුදෙනුකරුගේ ගිණුම සමඟ සැසඳෙන්නේ ද යන්න සහතික කිරීමට පද්ධති සහ ක්‍රියාවලීන් පැවතීම.

ඉ) නම, දුරකථන අංකය, භෞතික ස්ථානය/ ලිපිනය ඇතුළුව ජංගම දුරකථනය පදනම් කරගත් විද්‍යුත් මුදල් සේවාව ඇතුළුව බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ගේ යාවත්කාලීන ලැයිස්තුව/දත්ත සමුදාය පවත්වා ගෙන යෑම.

ඊ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන්ට අභ්‍යන්තර සහ බාහිර තර්ජනවලින් තොරතුරු ආරක්ෂා කර ගැනීමට නිසි ආරක්ෂාකාරී පාලන ඔවුන් සතුව පවතින බවට තහවුරු කිරීම.

උ) බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවාවවන්ට අදාළව පැමිණිලි සහ දුක්ගැනවිලි යොමු කිරීම සඳහා ගනුදෙනුකරුවන් සඳහා ම වෙන්කළ ක්ෂණික දුරකථන අංකයක් පැවතීම.

උපලේඛනය III

බලපත්‍රලාභී සේවා සපයන්නන් හා සම්බන්ධිත වෙළෙඳුන්ගේ විස්තර (එහෙත් පහත ඒවාට පමණක් සීමා නොවේ)

ඇ) වෙළෙන්දාගේ නම
ඈ) ව්‍යාපාර ලියාපදිංචි අංකය
ඉ) ලියාපදිංචි ලිපිනය සහ සම්බන්ධ කර ගැනීමේ තොරතුරු (ලියාපදිංචි ලිපිනයෙන් වෙනස් වන්නේ නම් තැපැල් ලිපිනය ද ඇතුළුව)
ඌ) ප්‍රධාන ව්‍යාපාර කටයුතු
ඍ) මූල්‍ය අඛණ්ඩතාව

උපලේඛනය IV

බලපත්‍රලාභී සේවා සපයන්නන් සහ ඔවුන්ගේ වෙළෙඳුන් විසින් පිරිනමනු ලබන ජංගම දුරකථනය පදනම් කරගත් යෝජිත විද්‍යුත් මුදල් සේවා පිළිබඳ කෙටි ශක්‍යතා වාර්තාවක්

ඇ) ව්‍යාපාර යෝජනාවේ විෂයපථය
ඈ) අදාළ වන පාර්ශ්ව
ඉ) පිරිවැය/ ප්‍රතිලාභ විශ්ලේෂණය
ඌ) ගනුදෙනුකරුවන්ගෙන් අය කරන ගාස්තු/ වියදම්

යොමු අංකය: 24/06/002/0002/002 2022 අප්‍රේල් 18

සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම්වල ප්‍රධාන විධායක නිලධාරීන් වෙත,

මහත්මයාණනි/ මහත්මියනි,

බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තැන්පතු සහ ණය උපකරණ මත ගෙවන උපරිම පොලී අනුපාතයන්හි සිදු කරන සංශෝධන

ශ්‍රී ලංකා මහ බැංකුවෙහි මුදල් මණ්ඩලය විසින් 2022.04.12 වන දින පැවති මුදල් මණ්ඩල රැස්වීමේ දී පහත කරුණු සඳහා අනුමැතිය ලබා දී ඇති බව ඔබට මෙයින් දැනුම් දෙනු ලැබේ.

1. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2020 අංක 04 දරන තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාත සංශෝධනය කිරීමේ විධානය අහෝසි කිරීම සහ බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත නිකුත් කරන ලද 2022.03.31 දිනැති ලිපිය ඉල්ලා අස්කර ගැනීම,

2. මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2019 අංක 01 දරන තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාත විධානයෙහි 2 වන වගන්තිය වන තැන්පතු සහ ණය උපකරණ මත 'අදාළ වන නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය සහ එලදා අනුපාතිකය' අහෝසි කිරීම, සහ

3. පහත සඳහන් පරිදි බලපත්‍රලාභී මුදල් සමාගම්වලට තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාත තීරණය කිරීමට ඉඩ ලබා දීම,

(අ) පවත්නා නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය, සහ

(ආ) පහත 1 වන වගුව සහ 2 වන වගුවෙහි දක්වා ඇති පරිදි අවසන් භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙන්දේසි හතරෙහි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතයෙහි වල සාමාන්‍ය මත පදනම්ව, බලපත්‍රලාභී මුදල් සමාගම්වලට ඔවුන්ගේ අභිමතය පරිදි භාණ්ඩාගාර බිල්පත් වෙන්දේසියට පසු දිනයේ දී තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාතික සංශෝධනය කිරීමට අවසරය හිමි වේ:

01 වන වගුව : බලපත්‍රලාභී මුදල් සමාගම්වල තැන්පතු සඳහා කල් පිරීමේ දී උපරිම පොලී අනුපාත

තැන්පතු සඳහා කල් පිරීමේ දී උපරිම පොලී අනුපාත

තැන්පතුවෙහි කාල සීමාව	වසරකට උපරිම පොලී අනුපාතය
තැන්පතු කාල සීමාව මසකට වඩා අඩු හෝ කල් පිරීම නිශ්චිතව දක්වා නොමැති ඉතුරුම් සහ අනෙකුත් තැන්පතු	දැනට පවතින නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතය
කාලීන තැන්පතු	
මාසයක් සහ මාස 03කට වඩා අඩු	දින 91 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය
මාස 03ක් සහ මාස 06කට වඩා අඩු	දින 182 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 0.25%
මාස 06ක් සහ වසරකට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 0.50%
වසරක් සහ වසර 02කට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 2.00%
වසර 02ක් සහ වසර 03කට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 2.75%
වසර 03ක් සහ වසර 05කට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 3.25%
වසර 05ක්	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 4.25%

02 වගුව: බලපත්‍රලාභී මුදල් සමාගම්වල ණය උපකරණ සඳහා කල් පිරීමේ දී උපරිම පොලී අනුපාතික

ණය උපකරණවල කාල සීමාව	වසරකට උපරිම පොලී අනුපාතය
වසරකට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 0.50%
වසරක් සහ වසර 02කට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 2.75%
වසර 02ක් සහ වසර 03කට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 3.25%
වසර 03ක් සහ වසර 05කට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 3.75%
වසර 05ක්	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 4.75%

කෙසේ වෙතත්, බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් නිසි වත්කම් සහ වගකීම් කළමනාකරණ ක්‍රියාමාර්ගවලට අනුගතවීම තුළින් තැන්පත්කරුවන් වෙත පිරිනමනු ලබන උපරිම පොලී අනුපාත කෙරෙහි සුපරීක්ෂාකාරී විය යුතුය.

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරන ලද 2019 අංක 01 දරන තැන්පතු සහ ණය උපකරණ මත උපරිම පොලී අනුපාත විධානයේ වගන්ති 1.1(i), වගන්ති 1.1(ii), සහ වගන්ති 1.2 මෙමගින් අහෝසි කෙරේ.

මීට විශ්වාසී,

ආර්. එම්. සී. එච්. කේ. ජයසිංහ (මහත්මිය)

අධ්‍යක්ෂ

ඇමුණුම: ඇමුණුම I

අවසන් භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙන්දේසි හතර මත පදනම්ව 2022.04.18 දිනට අදාළ වන උපරිම පොලී අනුපාතික ගණනය කිරීම.

1 වන වගුව: බරිත සාමාන්‍ය ඵලදා අනුපාතයෙහි චල සාමන්‍ය ගණනය කිරීම

අවසන් භාණ්ඩාගාර බිල්පත් ප්‍රාථමික වෙන්දේසි හතර	2022 අප්‍රේල්-11	2022 අප්‍රේල්-6	2022 මාර්තු-30	2022 මාර්තු-23	බරිත සාමාන්‍ය ඵලදා අනුපාතයෙහි චල සාමාන්‍යය
දින 91 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය	19.71	14.12	12.92	12.10	14.71
දින 182 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය	22.73	15.36	12.25	11.98	15.58
දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය	23.36	15.69	12.28	12.00	15.83

2 වන වගුව: කාලීන තැන්පතු මත උපරිම පොලී අනුපාත ගණනය කිරීම

කාලීන තැන්පතුවල කාල සීමාව	වසරකට උපරිම පොලී අනුපාතය	වර්තමානයේ දී අදාළ වන උපරිම පොලී අනුපාතය (%)
මාසයක් සහ මාස 03කට වඩා අඩු	දින 91 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය	14.71
මාස 03ක් සහ මාස 06කට වඩා අඩු	දින 182 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 0.25%	15.58 + 0.25 = 15.83
මාස 06ක් සහ වසරකට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 0.50%	15.83 + 0.50 = 16.33
වසරක් සහ වසර 02ට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 2.00%	15.83 + 2.00 = 17.83
වසර 02ක් සහ වසර 03ට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 2.75%	15.83 + 2.75 = 18.58
වසර 03ක් සහ වසර 05ට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 3.25%	15.83 + 3.25 = 19.08
වසර 05	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 4.25%	15.83 + 4.25 = 20.08

3 වන වගුව: ණය උපකරණ මත උපරිම පොලී අනුපාත ගණනය කිරීම

ණය උපකරණවල කාල සීමාව	වසරකට උපරිම පොලී අනුපාතය	වර්තමානයේ දී අදාළ වන උපරිම පොලී අනුපාතය (%)
වසරකට අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 0.50%	15.83 + 0.50 = 16.33
වසරක් සහ වසර 02කට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 2.75%	15.83 + 2.75 = 18.58
වසර 02ක් සහ වසර 03කට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 3.25%	15.83 + 3.25 = 19.08
වසර 03ක් සහ වසර 05කට වඩා අඩු	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 3.75%	15.83 + 3.75 = 19.58
වසර 05	දින 364 භාණ්ඩාගාර බිල්පත්හි බරිත සාමාන්‍ය ඵලදා අනුපාතය + 4.75%	15.83 + 4.75 = 20.58

2022 අංක 01 දරන චක්‍රලේඛය 2022 ජූලි 20

පවතින සුවිශේෂී සාර්ව ආර්ථික තත්ත්වයන් හමුවේ බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන් සඳහා සහන සැලසීම

පවතින සුවිශේෂී ආර්ථික තත්ත්වයන් හේතුවෙන් විවිධ ආර්ථික අංශවල නිරත වී සිටින ව්‍යාපාර සහ පුද්ගලයන් විසින් මුහුණ දෙනු ලබන අභියෝගවලට මුහුණ දීමේ අරමුණුතිව, බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ට අවශ්‍යතා පදනමක් මත පහත සහන ලබා දෙන ලෙස ශ්‍රී ලංකා මහ බැංකුව විසින් බලපත්‍රලාභී මුදල් සමාගම් සහ විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් (මින්මතු බැංකු නොවන මූල්‍ය ආයතන ලෙස හැඳින්වෙන) වෙත උපදෙස් ලබා දී ඇත.

මූල්‍ය පද්ධතිය මත ඇති විය හැකි ඕනෑම ඉහළ ආතතියක් වැළැක්වීම මගින් බැංකු නොවන මූල්‍ය ආයතන අංශයේ ස්ථාවරත්වය පවත්වා ගෙන යමින්, එක් එක් ණය ගිවිසුම් සලකා බැලීමේ පදනමින් ණය ගනුදෙනුකරුගේ නව ආපසු ගෙවීමේ ධාරිතාවන් මත පදනම්ව නිසි අයුරින් ණය ආපසු ගෙවීමේ වැඩපිළිවෙලක් යෙදීම සඳහා මෙම සහන පිරිනමනු ලැබේ. ඒ අනුව, සියලු බැංකු නොවන මූල්‍ය ආයතනයන් තුළ මෙය අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සඳහා විචක්ෂණ අවශ්‍යතා සමඟ සවිස්තරාත්මක මාර්ගෝපදේශ සැපයීමට මෙම චක්‍රලේඛය නිකුත් කෙරේ. 2021 ඔක්තෝබර් 29 වන දින නිකුත් කරන ලද ලිපියට අනුව දැනටමත් පිහිටුවා ඇති පශ්චාත් කොවිඩ්-19 පුනර්ජීවන ඒකක ඔස්සේ මෙම සහන ක්‍රියාත්මක කිරීම පිළිබඳව සියලු බැංකු නොවන මූල්‍ය ආයතන සලකා බැලිය යුතුය.

1. සක්‍රීය ණය පහසුකම් සඳහා සහන

1.1 දැනටමත් කොවිඩ්-19 ණය සහන යෝජනා ක්‍රමයට යටත් වූ ණය ගනුදෙනුකරුවන් ඇතුළුව පවතින සුවිශේෂී ආර්ථික තත්ත්වයන් හේතුවෙන් ආදායම හෝ ව්‍යාපාරය අහිතකර ලෙස බලපෑමට ලක් වී තිබෙන පුද්ගලයන් හෝ ව්‍යාපාරවල (මින්මතු ණය ගනුදෙනුකරුවන් ලෙස හැඳින්වෙන) සක්‍රීය ණය පහසුකම් සඳහා බැංකු නොවන මූල්‍ය ආයතන විසින් සුදුසු සහන (එනම්, මුල් මුදල හෝ පොලිය සඳහා හෝ මුල් මුදල සහ පොලිය යන දෙකම සඳහා හෝ මුල් මුදලෙන් හෝ පොලියෙන් කොටසක් සඳහා ලබා දෙන සහන කාලය, ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම හෝ වෙනත් යම් සහනයක්) සැලසිය යුතු වේ. ණය ගනුදෙනුකරුගේ ණය ආපසු ගෙවීමේ නව ධාරිතාව/හැකියාව මත පදනම්ව, මෙම චක්‍රලේඛයේ දිනයේ සිට මාස හයක කාලයක් සඳහා එක් එක් සිද්ධීන් සලකා බලමින් සංචාරක ක්ෂේත්‍රය, ප්‍රවාහනය සහ නිෂ්පාදන, සේවා, කෘෂිකර්මාන්ත සහ ඉදිකිරීම් වැනි ව්‍යාපාර ක්ෂේත්‍රවල නිරතව සිටින ක්ෂුද්‍ර, කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර ඇතුළු නමුත් මෙම අංශවලට පමණක් සීමා නොවී සියලුම ආර්ථික අංශයන්හි බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන් සඳහා මෙම සහන සැලසීමට අපේක්ෂිත ය.

1.2 කල්බදු මූල්‍යකරණ පහසුකම් පිළිබඳ සලකා බැලීමේ දී, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ගනුදෙනුකරුගේ ආපසු ගෙවීමේ හැකියාවන්ට ගැළපෙන පරිදි, සාධාරණ පොලී අනුපාතිකයක් සහිතව දීර්ඝ කරන ලද භුක්ති කාලයක් සමඟ, පවතින ණය පහසුකම හෝ පහසුකම්වල ගිවිසුම්ගත වාරික වටිනාකම නොඉක්මවන ණය ආපසු ගෙවීමේ සැලැස්ම ව්‍යුහගත කිරීමට යාන්ත්‍රණයක් සැලසුම් කළ යුතුය. වෙනත් ණය පහසුකම් පිළිබඳ සලකා බැලීමේ දී, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ආපසු ගෙවීමේ සැලැස්ම ව්‍යුහගත කිරීම සඳහා සුදුසු යාන්ත්‍රණයක් සැලසුම් කළ යුතුය.

1.3 සහනයක් ලෙස සහන කාලයක් ලබා දෙන ණය පහසුකම් සම්බන්ධයෙන්, මෙම චක්‍රලේඛය යටතේ සහන කාලය සඳහා අදාළ වන පොලී අනුපාතිකය සියයට 20 හෝ සහන කාලය සලකා බැලීමට පෙර භාවිත කරන ලද ගිවිසුම්ගත පොලී අනුපාතිකයට සියයට 5 ක අගයක් එකතු කළ පසු අගයෙන් අඩු අගය නොඉක්මවිය යුතු අතර, සහන කාලය සඳහා සලකා බලන අගය මත පමණක් අය කළ යුතුය.

2. පූර්ව පියවීම සඳහා පහසුකම් සැලසීම

2.1 ඕනෑම ණය ගනුදෙනුකරුවෙකු විසින් පවතින ණය පහසුකම් සම්පූර්ණයෙන් පියවීමට අපේක්ෂා කරන අවස්ථාවක දී, එවැනි ණය ගනුදෙනුකරුවෙකුගෙන් පූර්ව පියවීමේ ගාස්තු, අනාගත පොලිය අය කර ගැනීම වැනි කිසිදු අතිරේක ගාස්තුවක් අය කිරීමකින් තොරව, එලෙස සිදු කිරීමට අවස්ථාව ලබා දිය යුතුය.

2.2 ණය පහසුකම් පූර්ව පියවීමට කැමැත්තක් දක්වන ඕනෑම ණය ගනුදෙනුකරුවෙකු විසින් 2022.09.30 දින හෝ ඊට පෙර අදාළ බැංකු නොවන මූල්‍ය ආයතනය වෙත ඉල්ලීමක් සිදු කළ යුතුය.

3. අක්‍රීය ණය පහසුකම් සඳහා සහන

3.1 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් එවැනි පුද්ගලයන් සහ ව්‍යාපාර/ව්‍යාපෘතිවල අනාගත ණය ආපසු ගෙවීම් ධාරිතාව/හැකියාව සලකා බලමින්, එක් එක් සිද්ධීන් සලකා බලමින් මුල් මුදල හෝ පොලිය හෝ මුල් මුදල සහ පොලිය යන දෙකම හෝ මුල් මුදල හෝ පොලියෙන් කොටසක් සඳහා සහන කාලයක් ලබා දීම, ප්‍රතිව්‍යුහගත කිරීම හෝ වෙනත් සහන වැනි සුදුසු සහන සැලසීම පිළිබඳ සලකා බැලිය යුතුය.

3.2 අක්‍රීය ණය පහසුකම් සඳහා ලබා දුන් සහන කාලය මත සහන සඳහා අදාළ වන පොලී අනුපාතිකය, සියයට 20 හෝ සහන කාලය සලකා බැලීමට පෙර භාවිත කරන ලද ගිවිසුම්ගත පොලී අනුපාතිකයට සියයට 5 ක අගයක් එකතු කළ පසු අගයෙන් අඩු අගය නොඉක්මවිය යුතුය.

3.3 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ගනුදෙනුකරුවන්ට කාලීනව ණය ආපසු ගෙවීම සකස් කර ගැනීමට හැකි වන පරිදි, 2020.01.01 දින හෝ ඉන් පසු අක්‍රීය ලෙස වර්ග කර ඇති කල්බදු වත්කම් බලෙන් අත්පත් කර ගැනීම හෝ යළි අයිතිය හිමි කර ගැනීම 2022.12.31 වන දින තෙක් අත්හිටුවිය යුතුය.

3.4 බැංකු නොවන මූල්‍ය ආයතනයක් විසින් කල්බදු වත්කමක් යළි අත්කර ගැනීමේ ක්‍රියාමාර්ග සඳහා කටයුතු ආරම්භ කර ඇත්නම් හෝ දැනුම් දීමක් සිදු කර ඇත්නම්, සලකා බලන බැංකු නොවන මූල්‍ය ආයතනය සහ ණය ගනුදෙනුකරු අතර ණය ආපසු ගෙවීමේ ගිවිසුමකට එළඹීමේ කොන්දේසිය මත, එවැනි යළි අත්කර ගැනීමේ ක්‍රියාමාර්ග 2022.12.31 වන දින තෙක් අත්හිටු විය යුතුය.

3.5 සලකා බලනු ලබන බැංකු නොවන මූල්‍ය ආයතනය සහ ණය ගනුදෙනුකරු ණය ආපසු ගෙවීමේ ගිවිසුමකට එළඹීමේ කොන්දේසි මත, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2022.12.31 දින දක්වා එවැනි ණය සහ අත්තිකාරම් නැවත අය කර ගැනීම සඳහා වන නව තීරණ සම්මත කිරීම ප්‍රමාද කළ යුතුය. නැවත අය කර ගැනීමේ ක්‍රියාමාර්ග සඳහා වන තීරණ දැනටමත් සම්මත කර ගෙන ඇති අවස්ථාවලදී, කල්බදු වත්කම අත්පත් කර ගැනීම සහ යළි අයිතිය හිමි කර ගැනීම 2022.12.31 වන දින තෙක් අත්හිටු විය යුතුය.

3.6 කෙසේ වෙතත්, සිතාමතා ණය පැහැර හරින්නන්, වෙනත් අරමුණ සඳහා අරමුදල් යෙදවීම, මුදල් අවභාවිතය, වැරදි කළමනාකරණය සහ/හෝ වංචා සහ ශක්‍යතාවයකින් තොර ව්‍යාපෘති සඳහා මුදල් යෙදවීම හේතුවෙන් ණය පැහැර හැරීම් සිදු ඇති ගනුදෙනුකරුවන් මෙම සහන සඳහා සලකා බලනු නොලැබේ.

3.7 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ගනුදෙනුකරු අධික වශයෙන් සම්බන්ධ කර ගැනීම, හමු වීම/ ණය ආපසු ගෙවීම සඳහා බල කිරීමකින් තොරව දෛනික රැස් කිරීමේ ක්‍රියාවලිය/ණය ආපසු අය කර ගැනීම අඛණ්ඩව සිදු කළ හැකිය.

4. ණය තොරතුරු කාර්යාංශය වෙත වාර්තා කිරීම

4.1 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් හුදෙක් ම අසතුටුදායක ණය තොරතුරු කාර්යාංශ වාර්තා මත පමණක් පදනම්ව ණය ගනුදෙනුකරුවන්ගෙන් ලැබෙන නව ණය පහසුකම් සඳහා ඉල්ලීම් ප්‍රතික්ෂේප නොකළ යුතුය.

4.2 අවශ්‍ය වන්නේ නම්, බැංකු නොවන මූල්‍ය ආයතන විසින් බලපෑමට ලක් වූ ණය ගනුදෙනුකරුවන්ට ලබා දුන් සහන වාර්තා කිරීම සඳහා ණය තොරතුරු කාර්යාංශයේ උපදේශනය සහිතව, වාර්තාකරණ ක්‍රමවේදයක් සකස් කළ යුතුය.

5. ගිණුම් තැබීම

5.1 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් සහන සඳහා සලකා බලන ණය පහසුකම්වලට අදාළ ගිණුම් තැබීම් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූලව කළ යුතුය.

5.2 මේ හා සම්බන්ධව අතිරේක මඟපෙන්වීමක්/ පැහැදිලි කිරීම් ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනයෙන් සහ විගණකවරුන්ගෙන් ලබා ගත හැකිය.

6. සහනවල විනිවිදභාවය

6.1 සුදුසුකම්ලත් ණය ගනුදෙනුකරුවන් ඉහත සහන ලබා ගැනීමට සිදු කරන ඉල්ලීම් ලිඛිතව හෝ විද්‍යුත් ක්‍රමවේදයන් ඔස්සේ 2022 අගෝස්තු 15 හෝ ඊට පෙර සිදු කළ යුතුය.

6.2 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ගනුදෙනුකරු සිදු කරන ඉල්ලීම ලැබීමෙන් මාසයක කාලයක් ඇතුළත එය පිළිගන්නේ ද නැතහොත් ප්‍රතික්ෂේප කරන්නේ ද යන වග තීරණය කළ යුතු අතර, එම තීරණය පිළිබඳ ණය ගනුදෙනුකරු නිසි ලෙස දැනුවත් කළ යුතුය.

6.3 බැංකු නොවන මූල්‍ය ආයතන විසින් ණය ගෙවීම් ප්‍රමාද කිරීමේ ව්‍යුහය හෝ ණය පහසුකම් ප්‍රතිව්‍යුහගත කිරීම සහ අදාළ වන පොලී අනුපාතිකය සම්බන්ධව ණය ගනුදෙනුකරුගේ අනුමැතිය සහ කැමැත්ත ලබා ගැනීමට පෙර, ණය ගනුදෙනුකරු දැනුවත් කරන බවට සහතික විය යුතු අතර ණය ගනුදෙනුකරුගේ අනුමැතිය සහ කැමැත්ත ලිඛිතව හෝ විද්‍යුත් ක්‍රමවේදයක් ඔස්සේ ලබා ගත යුතුය.

7. වාර්තා කිරීමේ අවශ්‍යතාව

බැංකු නොවන මූල්‍ය ආයතන විසින් 2022 අගෝස්තු 31 වන දින සිට වැඩ කරන දින 15ක් ඇතුළත, සෑම මසකම අවසාන දිනට ණය ගනුදෙනුකරුවන්ට ලබා දුන් සහන සහ සහන සඳහා ලද ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම් පිළිබඳ විස්තර බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත වාර්තා කළ යුතුය. වාර්තා කිරීමේ ආකෘතිය ඉදිරියේ දී යොමු කරනු ලැබේ.

අත්සන් කළේ,

ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

මුදල් ව්‍යාපාර පනත යටතේ නිකුත් කරනු ලබන 2022 අංක 03 දරන විධානය 2022 සැප්තැම්බර් 02

තැන්පතුකරුවන් සඳහා අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංක සටහන් කිරීම

1.	**නෛතික ප්‍රතිපාදන**	1.1	2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 12 වන වගන්තිය මගින් පැවරී ඇති බලතල ප්‍රකාරව, ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය විසින් 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංක සටහන් කිරීම පිළිබඳ මෙම විධාන හඳුන්වා දෙනු ලැබේ.
2.	**විධානයන්හි අරමුණු**	2.1	ශ්‍රී ලංකා තැන්පතු රක්ෂණ හා ද්‍රවශීලතා ආධාරක යෝජනා ක්‍රමය මගින් තොරතුරු සම්පාදනය කිරීමට පහසුකම් සැලැස්වීම සඳහා සියලු මුදල් සමාගම්වල තැන්පත්කරුවන්ගේ අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංක සටහන් කිරීමේ විධාන ලබා දීමට සහ මූල්‍ය අංශයේ ප්‍රධාන ප්‍රතිපත්ති තීරණ සඳහා වන තොරතුරු කළමනාකරණ ක්‍රියාවලියේ සවිමත්භාවය සහ විශ්වසනීයත්වය ශක්තිමත් කිරීමට මෙම විධානය නිකුත් කරනු ලැබේ.
3.	**තැන්පත්කරුට අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංකය වාර්තා කිරීම**	3.1	ඇමුණුම 1 හි දක්වා ඇති වගු අංක 1 හි නිරූපණය කර ඇති පරිදි සියලු මුදල් සමාගම් විසින් ඔවුන්ගේ ප්‍රධාන තොරතුරු පද්ධති තුළ එක් එක් තැන්පත්කරු සඳහා අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංකය සටහන් කිරීම සහ වාර්තා කිරීම සිදු කළ යුතුය.
4.	**බලාත්මක වන දිනය**	4.1	මෙම විධාන 2022.10.01 දින සිට බලාත්මක වේ. ඒ අනුව, සියලු මුදල් සමාගම් පහත 5 වන වගන්තියෙහි සඳහන් කර ඇති පරිදි අන්තර්කාලීන විධිවිධානවලට යටත්ව සියලු නව තැන්පත්කරුවන් සඳහා 2022.10.01 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙම විධානවල අවශ්‍යතාවන්ට අනුකූල විය යුතුය.
5.	**අන්තර්කාලීන විධිවිධාන**	5.1	සියලු මුදල් සමාගම් විසින් මෙම විධානයන් ප්‍රකාරව දැනට සිටින සියලු තැන්පත්කරුවන්ට අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංක සටහන් කිරීම 2023.12.31 දින වන විට සම්පූර්ණ කළ යුතුය.

ආචාර්ය පී. නන්දලාල් වීරසිංහ
මුදල් මණ්ඩලයේ සභාපති සහ
ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපති

ඇමුණුම 1

වගු අංක 1: මුදල් සමාගමෙහි තැන්පත්කරුවන්ගේ එක් එක් කාණ්ඩය සඳහා අනන්‍ය වූ හඳුනා ගැනීමේ අංක

#	තැන්පත්කරුගේ කාණ්ඩය	හඳුනා ගැනීමේ අංකයේ කාණ්ඩය	සටහන්
1	**තනි පුද්ගලයන්**		
1.1	ශ්‍රී ලාංකික පුරවැසියන්	ජාතික හැඳුනුම්පත් අංකය	මුදල් සමාගම්වලට ගිණුම් ආරම්භ කිරීම සඳහා තැන්පත්කරුගේ රියදුරු බලපත්‍රය හෝ ගුවන් ගමන් බලපත්‍රය පිළිගත හැකි නමුත්, ඔවුන්ගේ පද්ධති තුළ ජාතික හැඳුනුම්පත් අංකය සටහන් කිරීම අනිවාර්ය වේ
1.2	ශ්‍රී ලාංකික පුරවැසියන් (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික /නිත්‍ය නේවාසික/තාවකාලික නේවාසිකත්වය දරන්නන්), ශ්‍රී ලාංකික ද්විත්ව පුරවැසියන් (ශ්‍රී ලංකාවේ නේවාසික, ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික)	ජාතික හැඳුනුම්පත් අංකය	තැන්පතුකරුවෙකු විසින් ජාතික හැඳුනුම්පත තාවකාලිකව ආපසු භාර දී ඇති විට පමණක් ශ්‍රී ලංකා ගුවන් ගමන් බලපත්‍රය භාවිත කළ හැකිය

#	තැන්පත්කරුගේ කාණ්ඩය	හඳුනා ගැනීමේ අංකයේ කාණ්ඩය	සටහන්
1.3	ශ්‍රී ලාංකික නොවන පුරවැසියන්	විදේශ ගුවන් ගමන් බලපත්‍ර අංකය	ශ්‍රී ලාංකික සම්භවයක් සහිත විදේශීය ජාතිකයන් (ශ්‍රී ලංකාවෙන් පිටත නේවාසික) ඇතුළුව, ශ්‍රී ලංකාව වෙත තාවකාලිකව සංචාරයේ නිරතව සිටින හෝ ශ්‍රී ලංකාව වෙත සංචාරය කිරීමට බලාපොරොත්තු වන විදේශීය ජාතිකයන්, විදේශීය රාජ්‍ය තාන්ත්‍රිකයන්
1.4	බාල වයස්කාර තැන්පත්කරුවන්	උපන් දිනය + උප්පැන්න සහතික අංකය නිදසුන්: උපන් දිනය: 2005 ජනවාරි 7 වන දින (2005.01.07) උප්පැන්න සහතික අංකය: 0325 2 0 0 5 0 1 0 7 0 3 2 5	උපන්දිනය සමඟ උප්පැන්න සහතිකයේ අංකය යෙදීම මගින් ඉලක්කම් 12 ක අංකයක් නිර්මාණය කිරීම
2	**ආයතන**		
2.1	සමාගම් පනත යටතේ ලියාපදිංචි කරන ලද සමාගම්	සමාගම් ලියාපදිංචි අංකය	-
2.2	රාජ්‍ය නොවන සංවිධාන	රාජ්‍ය නොවන සංවිධාන සඳහා ජාතික ලේකම් කාර්යාලය විසින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකය	-
2.3	තනි පුද්ගල ව්‍යාපාර/හවුල් ව්‍යාපාර/බද්ධ ව්‍යාපාර යනාදී ප්‍රාදේශීය/පළාත් පාලන ආයතන යටතේ ලියාපදිංචි කළ ආයතන	ව්‍යාපාර ලියාපදිංචි අංකය	-
2.4	සමාජ, සංගම්, සමිති යනාදී අනෙකුත් සිය ආයතන	අදාළ බලධාරීන් විසින් නිකුත් කරන ලද ලියාපදිංචි අංකය	-

යොමු අංකය: 24/10/001/0019/005 2022 නොවැම්බර් 29

ප්‍රධාන විධායක නිලධාරීන්
බලපත්‍රලාභී මුදල් සමාගම්

මහත්මයාණනි/මහත්මියනි,

තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ

සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අදාළ වන තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ මේ සමඟ අමුණා ඇත.

ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019 වසරේ දී ප්‍රකාශයට පත් කරන ලද තිරසාර සංවර්ධනය සඳහා වන පෙර දැක්මට අනුකූලව බලපත්‍රලාභී මුදල් සමාගම්වල තිරසාර මූල්‍ය කටයුතු සඳහා මුල් පිරීමට පහසුකම් සැලසීමේ අරමුණ ඇතිව, තිරසාර ආර්ථිකයක වැදගත්කම සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල තිරසාර මූල්‍ය කටයුතු සඳහා පාලන සහ අවදානම් කළමනාකරණ රාමුවක් සැපයීමේ අවශ්‍යතාව සලකා බලමින් මෙම මාර්ගෝපදේශ නිකුත් කෙරේ.

පහත අමුණා ඇති මෙම මාර්ගෝපදේශ අදාළ සියලුම නිලධාරීන් වෙත සන්නිවේදනය කරන ලෙසටත්, මෙම මාර්ගෝපදේශ මගින් නියම කර ඇති අවශ්‍යතා ක්‍රියාත්මක කරන ලෙසටත් සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙයට විශ්වාසී,

ආර්.එම්.සී.එච්.කේ.ජයසිංහ මහත්මිය
අධ්‍යක්ෂ

ඇමුණුම්: තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ

තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ මාර්ගෝපදේශ

1. **හැඳින්වීම**

1.1 එක්සත් ජාතීන් විසින් නියම කරන ලද තිරසාර සංවර්ධන ඉලක්ක ළඟා කර ගැනීම සඳහා කැපවීමේ අවශ්‍යතාවය සහ හරිත, සර්ව සහභාගීත්වයක් සහිත සහ තුලිත ආර්ථිකයක් කරා ශ්‍රී ලංකාව ගෙන යෑමේ අවශ්‍යතාව සලකා බැලීමෙන් අනතුරුව, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2019.04.10 වන දින තිරසාර සංවර්ධනය සඳහා වන පෙරදැක්ම (පෙරදැක්ම) ප්‍රකාශයට පත් කරන ලදී. මෙම පෙරදැක්ම මගින් මූල්‍ය නියාමයකයන් සහ මූල්‍ය ආයතනවලට ඔවුන් මූල්‍යනය කරන ව්‍යාපෘති හා ආශ්‍රිත පාරිසරික, සමාජීය සහ පාලන අවදානම් සාර්ථකව කළමනාකරණය කර ගැනීම සහ හරිතවත්, දේශගුණික වශයෙන් හිතකර සහ සමාජීය වශයෙන් සර්ව සහභාගීත්වයක් සහිත ව්‍යාපාර සඳහා සහාය ලබා දීමට වඩා පුළුල් මඟපෙන්වීමක් සැපයයි.

1.2 තවද, ශ්‍රී ලංකාවේ තිරසාර මූල්‍ය කටයුතු සඳහා වර්ගීකරණ සහ මිනුම් පද්ධතියක් පිහිටුවනු ලබමින්, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් 2022.05.06 දින ශ්‍රී ලංකා හරිත මූල්‍ය වර්ගීකරණය (වර්ගීකරණය) පිහිටුවන ලදී.

2. **මාර්ගෝපදේශයන්හි අරමුණ**

2.1 මෙම පෙරදැක්මට අනුකූලව බලපත්‍රලාභී මුදල් සමාගම්වල තිරසාර මූල්‍ය කර්තව්‍යයන් සඳහා පහසුකම් සැලසීමේ අරමුණ ඇතිව, තිරසාර ආර්ථිකයක වැදගත්කම සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල තිරසාර මූල්‍ය කටයුතු සඳහා පාලන සහ අවදානම් කළමනාකරණ රාමුවක් සැපයීමේ අවශ්‍යතාව සලකා බලමින් මෙම මාර්ගෝපදේශ නිකුත් කෙරේ.

3. **අදාළත්වය**

3.1 මෙම මාර්ගෝපදේශ සියලුම බලපත්‍රලාභී මුදල් සමාගම් සඳහා අදාළ වේ.

4. **පෙරදැක්ම ක්‍රියාත්මක කිරීම සහ බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (අධ්‍යක්ෂ) වෙත වාර්තා කිරීම**

4.1 බලපත්‍රලාභී මුදල් සමාගම් එහි ක්‍රියාකාරී සැලැස්මෙහි දී ඇති කාල රාමු අනුගමනය කරමින්, පෙරදැක්ම ක්‍රියාත්මක කළ යුතු වේ.

4.2 2011 අංක 42 දරන මුදල් ව්‍යාපාර පනතෙහි 15 වන වගන්තිය මගින් අධ්‍යක්ෂ වෙත පැවරී ඇති බලතල යටතේ අධ්‍යක්ෂ විසින් නියම කරනු ලබන ආකාරයන්ට අනුව සහ අදාළ කාල පරාසවල දී බලපත්‍රලාභී මුදල් සමාගම් ඔවුන්ගේ තිරසාර මූල්‍ය කටයුතු පිළිබඳ තොරතුරු සහ ලේඛන අධ්‍යක්ෂ වෙත යොමු කළ යුතු වේ.

5. **තිරසාර මූල්‍ය කටයුතු සඳහා හඳුනාගත් ප්‍රමුඛතා අංශ**

5.1 මෙම වර්ගීකරණය (Taxanomy) මගින් තිරසර මූල්‍ය කටයුතු සඳහා පහත ප්‍රමුඛතා අංශ හඳුනා ගැනේ.

අ) වන වගාව සහ දැව නිෂ්පාදනය;

ආ) කෘෂිකර්මය;

ඇ) කර්මාන්ත;

ඈ) විදුලි බල උත්පාදනය, සම්ප්‍රේෂණය සහ බෙදා හැරීම;

ඉ) ජල සැපයුම, ජලාපවහන සහ අපද්‍රව්‍ය කළමනාකරණය;

ඊ) ඉදිකිරීම්;

උ) ප්‍රවාහනය සහ ගබඩාකරණය;

ඌ) සංචාරක කර්මාන්තය සහ විනෝදාස්වාදය;

ඍ) තොරතුරු සහ සන්නිවේදන තාක්ෂණය;

ඎ) මූල්‍ය සේවා (කෘෂිකර්මය සහ සංචාරක කර්මාන්ත කටයුතුවලදී දේශගුණික වශයෙන් ඔරොත්තු දීමේ හැකියාව ඉහළ නැංවීම සඳහා දැරිය හැකි ආකාරයේ රක්ෂණාවරණ සැපයීමට පහසුකම් සැලසීම); සහ

ඏ) ගෑස්, වාෂ්ප, වායු සම්කරණ සැපයීම, ස්ථීර භූගත කාබන්ඩයොක්සයිඩ් ගබඩාකරණය, හයිඩ්‍රජන් ගබඩාකරණය වැනි අනෙකුත් කටයුතු

5.2 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තිරසාර මූල්‍ය කටයුතු සඳහා අරමුදල් පිරිනැමීමේ දී සහ එම කටයුතු පිළිබඳ වාර්තා කිරීමේ දී, එම කටයුතු ඉහත ප්‍රමුඛතා අංශවලට වෙන්කොට හඳුනා ගැනීමට සහ වර්ග කිරීමට වර්ගීකරණය භාවිත කළ යුතු වේ.

5.3 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තිරසාර කල්බදු නිෂ්පාදිත ඇතුළුව, තිරසාර ඉතුරුම් නිෂ්පාදිත සහ තිරසාර ණය නිෂ්පාදිත එළිදැක්වීමට දිරිමත් කෙරේ.

5.4 හරිත සහ සමාජීය වශයෙන් සර්ව සහභාගීත්වයක් සහිත ව්‍යාපෘතිවලට සහාය දැක්වීමට සහ අවශ්‍ය පරිදි මාර්ගෝපදේශන සහ මෙහෙයුම් උපකරණ නිකුත් කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම් දිරිමත් කෙරේ.

6. **තිරසාර මූල්‍ය කටයුතු/මුල් පිරීම් සඳහා වන පාලන රාමුව**

6.1 බලපත්‍රලාභී මුදල් සමාගම් තුළ සිදු වන තිරසාර මූල්‍ය කටයුතු සාර්ථකව සහ කාර්යක්ෂමව අධීක්ෂණය කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය දිරිමත් කෙරේ.

6.2 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් පහත කරුණු ඇතුළත් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුමත කරන ලද තිරසාර මූල්‍ය ප්‍රතිපත්තියක් අනුගමනය කළ යුතු වේ:

අ) තිරසාර මූල්‍ය කටයුතු ක්‍රියාත්මක කරන අධ්‍යක්ෂ මණ්ඩලයේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයේ පැහැදිලි භූමිකාවන් සහ වගකීම්;

ආ) පාරිසරික, සමාජීය සහ පාලන අවදානම් සහ තිරසාර මූල්‍ය කටයුතුවලට අදාළ අවදානම් හඳුනා ගැනීම සහ කළමනාකරණය; සහ

ඇ) තිරසාර මූල්‍ය කටයුතුවල ප්‍රගතිය මැනීම සඳහා පරාමිතීන් සහ මිනුම්.

6.3 අධ්‍යක්ෂ මණ්ඩල විසින් සපයන මාර්ගෝපදේශයන් යටතේ, බලපත්‍රලාභී මුදල් සමාගමෙහි ප්‍රධාන විධායක නිලධාරී සහ අදාළ ප්‍රධාන වගකිවයුතු පුද්ගලයන් විසින් පහත කරුණු තහවුරු කරනු ලැබිය යුතුය:

අ) බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් තිරසාර මූල්‍ය කටයුතුවලට අදාළව ක්‍රියාත්මක කරනු ලබන ප්‍රතිපත්ති, උපකරණ, මිනුම්, මෙහෙයුම් ක්‍රියාවලි සහ පාලන අවම වශයෙන් වාර්ෂිකව සමාලෝචනය සහ යාවත්කාලීන කෙරෙන බව සහ බලපත්‍රලාභී මුදල් සමාගම්වල අනෙකුත් අදාළ ප්‍රතිපත්ති සහ ක්‍රියාමාර්ග සමඟ ඒකාබද්ධ කර ඇති බව.

ආ) තිරසාර මූල්‍ය කටයුතු ක්‍රියාත්මක කිරීම සහ කළමනාකරණය සඳහා ප්‍රමාණවත් සම්පත්, නිපුණතා සහ විශේෂඥභාවය වෙන් කර ඇති බව.

ඇ) ව්‍යාපාර ඒකකවල කාර්යභාරයන් සහ වගකීම් සහ තිරසාර මූල්‍ය කටයුතු ආශ්‍රිත අවදානම් කළමනාකරණය කිරීමේ කාර්යයන් පැහැදිලිව දන්වා තිබීම; සහ

ඈ) තිරසාර මූල්‍ය කටයුතුවලට අදාළව ප්‍රගතිය සහ සැලකිය යුතු ගැටලු පිළිබඳව අධ්‍යක්ෂ මණ්ඩලය වෙත කාලීනව දැනුම් දෙන බව තහවුරු කිරීම.

7. අවදානම් කළමනාකරණය

7.1 බලපත්‍රලාභී මුදල් සමාගම් ඒවායෙහි මෙහෙයුම්වල ස්වභාවය, පරිමාණය, සංකීර්ණභාවය සහ අන්තර් සම්බන්ධතාවය සලකා බලමින්, පාරිසරික, සාමාජයීය සහ පාලන අවදානම් සහ තිරසාර ව්‍යාපාර කටයුතුවලට අදාළ අවදානම් හඳුනා ගැනීම සහ සමීක්ෂණය කිරීම සහ එවැනි අවදානම්වල වැදගත්භාවය සහ ප්‍රමාණාත්මකභාවය තක්සේරු කිරීම කළ යුතුය.

7.2 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් බලපත්‍රලාභී මුදල් සමාගමෙහි සමස්ත අවදානම් කළමනාකරණ රාමුවට හඳුනාගත් පාරිසරික, සමාජීය සහ පාලන අවදානම් ඇතුළත් කළ යුතුය.

7.3 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් හඳුනාගත් අවදානම් අවම කිරීමට සුදුසුදායී අවදානම් කළමනාකරණ ක්‍රියාමාර්ග සහ අභ්‍යන්තර පාලන ක්‍රියාමාර්ග ක්‍රියාත්මක කිරීම සහ පාරිසරික, සාමාජීය සහ පාලන අවදානම් කළමනාකරණය සමස්ත තීරණ ගැනීමේ ක්‍රියාවලියට ඇතුළත් කිරීම සිදු කළ යුතුය.

8. ශක්‍යතාවය ගොඩනැඟීම සහ නවෝත්පාදනය

8.1 අ) අභ්‍යන්තර සහ බාහිර පුහුණු කිරීම් ඔස්සේ එහි කාර්යමණ්ඩල සාමාජිකයන්ගේ පාරිසරික, සමාජීය සහ පාලන අවදානම් කළමනාකරණ කුසලතා සංවර්ධනය කිරීමට;

ආ) තිරසාර මූල්‍ය ආශ්‍රිත කටයුතු ක්‍රියාත්මක කිරීමට අභ්‍යන්තර විශේෂඥභාවය සංවර්ධනය කිරීමට හෝ එවැනි ක්‍රියාත්මක කිරීමක් සඳහා සුදුසු පරිදි තිරසාර මූල්‍ය වෘත්තිකයෙකු/ වෘත්තිකයන් සේවයෙහි යෙදවීමට; සහ

ඇ) පාරිසරික ආතති පරීක්ෂාවෙහි සහ අවස්ථා විශ්ලේෂණයෙහි විශේෂඥභාවය සංවර්ධනය කිරීමට බලපත්‍රලාභී මුදල් සමාගම් දිරිමත් කෙරේ.

9. අනාවරණය සහ වාර්තාකරණය

9.1 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ඒවායෙහි වාර්ෂික වාර්තා මගින් තිරසාර මූල්‍ය කටයුතුවලට අදාළව පහත තොරතුරු අනාවරණය කළ යුතුය:

අ) තිරසාර මූල්‍ය ප්‍රතිපත්ති සහ කටයුතු පිළිබඳ සමස්ත විග්‍රහයක්;

ආ) හඳුනාගත් පාරිසරික, සාමාජීය හා පාලන සහ තිරසාර මූල්‍ය ආශ්‍රිත අවදානම් සහ ආශ්‍රිත බලපෑම් අවම කිරීමේ ක්‍රියාමාර්ග

ඇ) වර්තමාන සහ යෝජිත ආයෝජනවල සහ ව්‍යාපාර කටයුතුවල පාරිසරික සහ සමාජීය බලපෑම;

ඈ) මීළඟ වර්ෂය සඳහා වන පෙරදැක්ම සහ ක්‍රියාකාරී සැලැස්ම ක්‍රියාත්මක කිරීම ඇතුළුව තිරසාර මූල්‍යය ආශ්‍රිත කටයුතුවල ප්‍රගතිය

ඉ) තිරසාර මූල්‍ය ආශ්‍රිත කටයුතු සඳහා රැස් කළ සහ තිරසාර මූල්‍ය සම්බන්ධ කටයුතු සඳහා වෙන් කළ වාර්ෂික සහ සමස්ත අරමුදල් ප්‍රමාණ

9.2 බලපත්‍රලාභී මුදල් සමාගම් විසින් ගෝලීය වාර්තාකරණ මූලිකත්වය සහ දේශගුණය ආශ්‍රිත මූල්‍ය අනාවරණය කිරීම් පිළිබඳ කාර්යසාධක බලකායෙහි නිර්දේශයන් වැනි ජාත්‍යන්තර වශයෙන් පිළිගත් වාර්තාකරණ රාමු භාවිත කරමින් නව ව්‍යාපාර කටයුතුවලින් ඇති වූ පාරිසරික සහ සමාජීය බලපෑම අනාවරණය කළ යුතු වේ.

සිව්වැනි කොටස

සිවිවැනි කොටස

2022 වසරේ දී සම්මත කරන ලද මහ බැංකුවේ සහ ශ්‍රී ලංකාවේ බැංකු ආයතනවල වැඩ කටයුතු හා මෙහෙයුම්වලට අදාළ ප්‍රධාන නීති අණපනත්[අ]

පිටුව

1.	2022 අංක 6 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත	1
2.	2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත	1
3.	2022 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත	26
4.	2022 අංක 14 දරන අධිභාර බද්ද පනත	32
5.	2022 අංක 22 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත	34
6.	2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත	36
7.	2022 අංක 28 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත	37
8.	2022 අංක 30 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත	41
9.	විසි එක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය	42
10.	2022 අංක 31 දරන නොතාරිස් (සංශෝධන) පනත	58
11.	2022 අංක 32 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත	65
12.	2022 අංක 34 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත	68
13.	2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත	77
14.	2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත	79

(අ) මහ බැංකු වාර්ෂික වාර්තාවේ සහ රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව විසින් මුද්‍රණය කරන ලද පාඨ අතර යම් අනනුකූලතාවක් ඇති වුවහොත්, රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවෙහි පාඨ බලපැවැත්විය යුතු ය.

2022 අංක 6 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත

[සභතිකය සටහන් කළේ 2022 පෙබරවාරි මස 17 වන දින]

2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 6 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2011 අංක 13 දරන පළාත් සභා (මුද්දර ගාස්තු මාරු කිරීමේ) පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

   (1) 2 වන වගන්තිය එම වගන්තියේ (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

   (2) එම වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "අදාළ පළාත් සභා වෙත මාරු කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන වචන ආදේශ කිරීමෙන්:-

   "අදාළ පළාත් සභා වෙත මාරු කරනු ලැබිය යුතු ය:

   එසේ වුව ද, යම් තැනැත්තකු විසින්-

   (අ) නිසි ලෙස ගෙවිය යුතු මුදල් ප්‍රමාණය ඉක්මවා මුද්දර ගාස්තු ගෙවා ඇති බවට; හෝ

   (ආ) එම මුද්දර ගාස්තු අදාළ වන සාධන පත්‍රයක් මත වැරදි සහගත ලෙස මුද්දර ගාස්තු ගෙවා ඇති බව සහ 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනත යටතේ එවැනි මුද්දර ගාස්තුවක් ගෙවීමට ඔහු බැඳී නොසිටින බවට,

   කොමසාරිස් ජනරාල්වරයා සෑහීමට පත්වන පරිදි, ලිඛිතව සිදු කරනු ලබන ඉල්ලීමකින් ඔප්පු කරනු ලබන එම තැනැත්තා වෙත, පළාත් සභා වෙත මාරු කරනු ලැබීමට පෙරාතුව වූ යම් කාලසීමාවක් තුළ දී මුද්දර ගාස්තු වශයෙන් එකතු කරන ලද මුදලින්, එසේ ගෙවන ලද මුදල ආපසු ගෙවනු ලැබිය යුතු ය."; සහ

   (3) නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

   "(2) 2006 අංක 12 දරන මුද්දර ගාස්තු (විශේෂ විධිවිධාන) පනතේ 11 වන වගන්තියේ විධිවිධාන, මේ වගන්තිය යටතේ ආපසු ගෙවීම සඳහා වූ සියලු ඉල්ලීම් සඳහා අදාළ වන්නේ ය.

   (3) මේ වගන්තියේ කාර්යය සඳහා "කොමසාරිස් ජනරාල්වරයා" යන්නට 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ඒ සඳහා ඇති අර්ථයම තිබිය යුතු ය.".

3. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත

[සභතිකය සටහන් කළේ 2022 මාර්තු මස 19 වන දින]

පෞද්ගලික දත්ත සැකසීම නියාමනය කිරීම පිණිස ද; පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළව දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් හඳුනාගැනීම සහ ශක්තිමත් කිරීම පිණිස ද; දත්ත ආරක්ෂණ අධිකාරිය පිහිටුවීම පිණිස ද; සහ ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි

දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සුරක්ෂිත කරන අතර ම ශ්‍රී ලංකාවේ ඩිජිටල් ආර්ථිකය වර්ධනය කිරීම සහ නවීකරණය කිරීම සඳහා පහසුකම් සැලසීමට අවශ්‍ය වී ඇති හෙයින් ද;

පෞද්ගලික දත්ත ආරක්ෂණ රාමු අතර අන්තර් ක්‍රියාකාරිත්වය වැඩිදියුණු කිරීමට මෙන් ම පෞද්ගලික දත්ත ආරක්ෂණය බලාත්මක කිරීමේ අධිකාරීන් අතර දේශ සීමා හරහා වන සහයෝගීතාව ශක්තිමත් කිරීමට අවශ්‍ය වී ඇති හෙයින් ද;

දේශීය ලිඛිත නීති සහ අදාළ ජාත්‍යන්තර ව්‍යවස්ථා මාලාවන්ට ගරු කරන අතර ම පාරිභෝගික විශ්වාසය සහතික කරමින් ද, පෞද්ගලිකත්වය ආරක්ෂා කරමින් ද දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සඳහා වන යාන්ත්‍රණ සඳහා විධිවිධාන සැලැස්වීමට නෛතික රාමුවක් සැකසීමට ශ්‍රී ලංකා රජයට අවශ්‍ය වී ඇති හෙයින් ද,

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. (1) මේ පනත 2022 අංක 9 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

   (2) මේ වගන්තියේ විධිවිධාන, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 79 වන ව්‍යවස්ථාව ප්‍රකාර මේ පනත සම්බන්ධයෙන් කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව සටහන් කළ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) IV වන කොටසේ සහ V වන කොටසේ විධිවිධාන හැර, මේ පනතේ අනෙකුත් සියලු විධිවිධාන, (2) වන උපවගන්තියේ සඳහන් පරිදි කථානායකවරයාගේ සහතිකයේ දින සිට මාස දහඅටකට පෙරාතුව නොවන සහ මාස තිස්හයක් නොඉක්මවන දිනයක් විය යුතු ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක සිට බලාත්මක විය යුතු ය.

(4) මේ පනතේ IV වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වන දිනය (2) වන උපවගන්තියේ සඳහන් සහතිකයේ දින සිට මාස විසිහතරකට පෙරාතුව නොවන සහ මාස හතළිස්අටක් නොඉක්මවන දිනයක් විය යුතු ය.

(5) මේ පනතේ V වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වන දිනය, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන (3) වන උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන දිනයකට වඩා පසු දිනයක් නොවන්නා වූ දිනයක් විය යුතු ය.

2. (1) (අ) පෞද්ගලික දත්ත සැකසීම සම්පූර්ණ වශයෙන් හෝ අර්ධ වශයෙන් ශ්‍රී ලංකාව තුළ දී සිදුවන විට දී; හෝ

(ආ) (i) නිත්‍ය ලෙස හෝ සාමාන්‍ය ලෙස ශ්‍රී ලංකාවේ වාසය කරන;

(ii) ශ්‍රී ලංකාවේ යම් ලිඛිත නීතියක් යටතේ සංස්ථාපනය කරන ලද හෝ පිහිටුවන ලද;

(iii) ශ්‍රී ලංකාවේ සිටින දත්ත දායකයන් නිශ්චිතව ඉලක්කගත කර භාණ්ඩ හා සේවා සැපයීම ඇතුළුව ශ්‍රී ලංකාව තුළ සිටින දත්ත දායකයන්ට භාණ්ඩ හා සේවා සපයන; හෝ

(iv) දත්ත දායකයකුගේ හැසිරීම ශ්‍රී ලංකාව තුළ දී සිදුවනතාක් දුරට එකී දත්ත දායකයකුගේ හැසිරීමට අදාළ තීරණ ගැනීමේ අදහස ඇතිව, පුද්ගල පැතිකඩ දැක්වීම ඇතුළුව ශ්‍රී ලංකාව තුළ දත්ත දායකයන්ගේ හැසිරීම විශේෂිතව අධීක්ෂණය කරන,

පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් දත්ත සැකසීම සිදු කරනු ලබන විට දී,

එකී දත්ත සැකසීම සම්බන්ධයෙන් මේ පනත අදාළ විය යුතු ය.

(2) පිළිවෙළින් (1) වන උපවගන්තියේ (iii) වන සහ (iv) වන ඡේදවල කාර්ය සඳහා

(අ) දත්ත දායකයන් නිශ්චිතව ඉලක්කගත වීම සිදු විය හැකි අවස්ථාවන්; හෝ

(ආ) දත්ත දායකයන් නිශ්චිතව අධීක්ෂණය වීම සිදුවිය හැකි අවස්ථාවන්,

මේ පනත යටතේ සාදනු ලබන රීති මගින්, අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(3) (අ) යම් පුද්ගලයකු විසින් හුදෙක් ම පෞද්ගලික, ගෘහස්ථ හෝ ගෘහ ඒකකයකට අදාළ කාර්ය සඳහා පමණක් සකසනු ලබන යම් පෞද්ගලික දත්ත; සහ

(ආ) පෞද්ගලික දත්ත නොවන යම් දත්තයන්,

සම්බන්ධයෙන් මේ පනත අදාළ නොවිය යුතු ය.

3. (1) දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළව වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා, මේ පනතේ විධිවිධාන බලාත්මක විය යුතු ය:

එසේ වුව ද, පොදු අධිකාරියක් වෙනත් යම් ලිඛිත නීතියක් මගින් පාලනය වන අවස්ථාවක, මේ පනත සමඟ අනුකූලවනතාක් දුරට, එකී අධිකාරිය විසින් දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත එකී ලිඛිත නීතියේ විධිවිධානවලට අනුකූලව සැකසීම නීත්‍යනුකූල විය යුතු ය.

(2) මේ පනතේ විධිවිධාන සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන අතර යම් අනනුකූලතාවක් ඇති අවස්ථාවක, මේ පනතේ විධිවිධාන බලපැවැත්විය යුතු ය.

I වන කොටස

පෞද්ගලික දත්ත සැකසීම

4. සෑම පාලකවරයකු විසින් ම මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති වගකීම්වලට අනුකූලව පෞද්ගලික දත්ත සකසනු ලැබිය යුතු ය.

5. පාලකවරයකු විසින්-

(අ) මෙහි I වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසියකට;

(ආ) විශේෂ ප්‍රභේදවල පෞද්ගලික දත්ත සැකසීම සම්බන්ධයෙන් වන විට, මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් කොන්දේසියකට;

(ඇ) මෙහි I වන උපලේඛනයේ (අ) අයිතමය යටතේ හෝ II වන උපලේඛනයේ (අ) අයිතමය යටතේ දත්ත දායකයකුගේ කැමැත්ත මත පදනම්ව පෞද්ගලික දත්ත සැකසීම සම්බන්ධයෙන් වන විට, මෙහි III වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සියලු කොන්දේසිවලට; හෝ

(ඈ) අපරාධ විමර්ශන සඳහා පෞද්ගලික දත්ත සැකසීම සම්බන්ධයෙන් වන විට, මෙහි IV වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති සියලු කොන්දේසිවලට,

අනුකූලව කටයුතු කරන්නේ නම්, පෞද්ගලික දත්ත සැකසීම නීත්‍යානුකූල වන්නේ ය.

6. (1) සෑම පාලකවරයකු විසින් ම-

(අ) නිශ්චිත;

(ආ) පැහැදිලි; සහ

(ඇ) නීත්‍යානුකූල,

අරමුණක් සඳහා පෞද්ගලික දත්ත සැකසීම සහතික කරනු ලැබිය යුතු අතර, එම අරමුණ හා නොගැළපෙන ආකාරයකින් එකී පෞද්ගලික දත්ත තවදුරටත් සකසනු නොලැබිය යුතු ය.

(2) මේ පනතේ 10 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, මහජන යහපත අරමුණු කරගත් ලේඛනාරක්ෂක කටයුතු, විද්‍යාත්මක පර්යේෂණ, ඓතිහාසික පර්යේෂණ හෝ සංඛ්‍යානමය අරමුණු, සාක්ෂාත් කර ගැනීම සඳහා පාලකවරයකු විසින් එවැනි පෞද්ගලික දත්ත තවදුරටත් සැකසීම, (1) වන උපවගන්තියේ (අ), (ආ) සහ (ඇ) ඡේදවල සඳහන් මූලික අරමුණු සමඟ නොගැළපෙන බවට නොසැලකිය යුතු ය.

7. සෑම පාලකවරයකු විසින් ම, සිදු කරනු ලබන පෞද්ගලික දත්ත සැකසීම, එම දත්ත එකතු කරන හෝ සකසන අරමුණ සඳහා අවශ්‍යවනතාක් දුරට-

(අ) ප්‍රමාණවත් වන;

(ආ) අදාළ වන; සහ

(ඇ) සමානුපාතික වන,

බවට සහතික කරනු ලැබිය යුතු ය.

8. සෑම පාලකවරයකු විසින් ම, අනවශ්‍ය ප්‍රමාදයකින් තොරව, යම් සාවද්‍ය හෝ යාවත්කාලීන නොවූ පෞද්ගලික දත්ත මකා දැමීම හෝ නිවැරදි කිරීම සඳහා සෑම සාධාරණ පියවරක් ම ගනිමින්, පෞද්ගලික දත්ත සැකසීම-

(අ) නිරවද්‍යව; සහ

(ආ) යාවත්කාලීනව,

සිදුකරන බවට සහතික කරනු ලැබිය යුතු ය.

9. සෑම පාලකවරයකු විසින් ම, සකසනු ලබන පෞද්ගලික දත්ත, එම පෞද්ගලික දත්ත සකසනු ලබන අරමුණු සඳහා අවශ්‍ය විය හැකි හෝ අපේක්ෂා කළ හැකි යම් කාලසීමාවක් සඳහා පමණක්, දත්ත දායකයන් හඳුනාගැනීම සඳහා ඉඩ සලසන ආකෘතියකින් තබා ගැනීම සහතික කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ පනතේ 10 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව, පාලකවරයකු විසින්, හුදෙක් ම මහජන යහපත අරමුණු කරගත් ලේඛනාරක්ෂක කටයුතු, විද්‍යාත්මක පර්යේෂණ, ඓතිහාසික පර්යේෂණ හෝ සංඛ්‍යානමය අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා තවදුරටත් දත්ත සැකසීම සිදු කරන විට, එවැනි පෞද්ගලික දත්ත අවශ්‍යවනතාක් දුරට දීර්ඝ කාලයක් සඳහා ගබඩා කරනු ලැබිය හැකි ය.

10. සෑම පාලකවරයකු විසින් ම-

(අ) අවසර නොලත් හෝ නීත්‍යානුකූල නොවන ලෙස පෞද්ගලික දත්ත සැකසීම; හෝ

(ආ) පෞද්ගලික දත්ත නැති වීම, විනාශ වීම හෝ පෞද්ගලික දත්තවලට හානිවීම,

වැළැක්වීම පිණිස, දත්ත කේතගත කිරීම, ව්‍යාජ නමකින් යෙදීම, හඳුනාගැනීමේ ලක්ෂණ ඉවත් කිරීම හෝ ප්‍රවේශය පාලනය හෝ නියම කරනු ලැබිය හැකි වෙනත් යම් ක්‍රමවේද ඇතුළුව තාක්ෂණික සහ සංවිධානමය පියවර භාවිත කිරීම මගින්, සකසනු ලබන පෞද්ගලික දත්තවල විශ්වසනීයත්වය සහ රහස්‍යභාවය සහතික කරනු ලැබිය යුතු ය.

11. පාලකවරයකු විසින්-

(අ) මේ පනතේ V වන උපලේඛනයේ සඳහන් කර ඇති තොරතුරු; සහ

(ආ) මේ පනතේ II වන කොටස යටතේ කරන ලද ඉල්ලීමක් ප්‍රකාර ගන්නා ලද යම් තීරණයක් පිළිබඳ තොරතුරු,

ලිඛිතව හෝ විද්‍යුත් මාධ්‍යයක් මගින් සහ සංක්ෂිප්ත, පාරදෘශ්‍ය, තේරුම් ගත හැකි සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි ආකෘතියකින් දත්ත දායකයන් වෙත සැපයිය යුතු ය.

12. (1) 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන සහ 11 වන වගන්තිවල සඳහන් වගකීම්වලට අනුකූලව කටයුතු කිරීමේ කාර්යය සඳහා-

(අ) පාලකවරයා විසින් 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන, සහ 11 වන වගන්තිවල සඳහන් දත්ත ආරක්ෂණ වගකීම් ක්‍රියාත්මක කිරීම සිදු කරනු ලබන ආකාරය පෙන්නුම් කිරීමට නිසි පරිදි නාමාවලිගතකළ වාර්තා සකස් කර පවත්වාගෙන යනු ලබන;

(ආ) පාලකවරයාගේ දත්ත සැකසීමේ කටයුතුවල ව්‍යුහය, පරිමාණය, පරිමාව සහ සංවේදීතාව මත පදනම්ව සැලසුම් කරනු ලබන;

(ඇ) 24 වන වගන්තියේ නිශ්චිතව දක්වා ඇති දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීම් මත පදනම්ව උචිත ආරක්ෂණයන් සලස්වනු ලබන;

(ඈ) පාලකවරයාගේ පාලන ව්‍යුහයට ඒකාබද්ධ කරනු ලබන;

(ඉ) අභ්‍යන්තර අධීක්ෂණ යාන්ත්‍රණ පිහිටුවනු ලබන;

(ඊ) පැමිණිලි භාර ගැනීම, විමර්ශන පැවැත්වීම සහ පෞද්ගලික දත්ත කඩකිරීම හඳුනාගැනීම සඳහා යන්ත්‍රණයක් සහිත;

(උ) කාලානුරූපී අධීක්ෂණය සහ ඇගයීම් මත පදනම්ව යාවත්කාලීන කරනු ලබන; සහ

(ඌ) 13 වන, 14 වන, 15 වන, 16 වන සහ 18 වන වගන්ති යටතේ වන දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීම සඳහා පහසුකම් සලසනු ලබන,

(මෙහි මින්මතු දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන" යනුවෙන් සඳහන් කරනු ලබන) අභ්‍යන්තර පාලනයන් සහ කාර්යපටිපාටි ක්‍රියාත්මක කිරීම සෑම පාලකවරයකුගේ ම කාර්යය විය යුතු ය.

(2) අධිකාරිය විසින් කලින් කලට දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන සම්බන්ධයෙන් මාර්ගෝපදේශ නිකුත් කරනු ලැබිය යුතු ය.

II වන කොටස

දත්ත දායකයන්ගේ අයිතිවාසිකම්

13. (1) දත්ත දායකයකු විසින් පාලකවරයකු වෙත සිදු කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත, එම දත්ත දායකයාගේ පෞද්ගලික දත්ත පාලකවරයා විසින් සකසනු ලබන්නේ ද යන්න පිළිබඳ තහවුරු කිරීමක් ලබා ගැනීමට සහ V වන උපලේඛනයේ දක්වා ඇති තොරතුරු වෙත ප්‍රවේශ වීමට සෑම දත්ත දායකයකුට ම අයිතිවාසිකමක් තිබිය යුත්තේ ය.

(2) (1) වන උපවගන්තිය යටතේ දත්ත දායකයකු විසින් ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට දී, V වන උපලේඛනය යටතේ සැපයීමට නියම කර ඇති තොරතුරු පාලකවරයා විසින් 17 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව සපයනු ලැබිය යුතු ය.

14. (1) යම් දත්ත සැකසීමක් මේ පනතේ I වන උපලේඛනයේ (අ) අයිතමයේ හෝ II වන උපලේඛනයේ (අ) අයිතමයේ නිශ්චිතව දක්වා ඇති හේතු මත පදනම් වේ නම්, එකී දත්ත දායකයා විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත ඕනෑ ම විටක දී ස්වකීය කැමැත්ත ඉල්ලා අස්කර ගැනීමට, සෑම දත්ත දායකයකුට ම අයිතිවාසිකමක් ඇත්තේ ය:

එසේ වුව ද, එකී කැමැත්ත ඉල්ලා අස්කර ගැනීම මගින්, එකී ඉල්ලා අස්කර ගැනීමට පෙරාතුව සිදුකරන ලද යම් දත්ත සැකසීමක නීත්‍යානුකූලභාවයට බලපෑමක් නොවිය යුතු ය.

(2) යම් දත්ත සැකසීමක් I වන උපලේඛනයේ (ඉ) හෝ (ඊ) අයිතමවල හෝ II වන උපලේඛනයේ (ඊ) අයිතමයේ නිශ්චිතව දක්වා ඇති හේතු මත පදනම් වේ නම්, එකී දත්ත දායකයාට අදාළ පෞද්ගලික දත්ත වැඩිදුර සැකසීමෙන් වළකින ලෙස පාලකවරයකුගෙන් ලිඛිතව ඉල්ලා සිටීමට අයිතිවාසිකමක් ඇත්තේ ය.

15. සාවද්‍ය හෝ අසම්පූර්ණ පෞද්ගලික දත්ත නිවැරදි කරන හෝ සම්පූර්ණ කරන ලෙස පාලකවරයකු වෙත ඉල්ලීමක් කිරීමට සෑම දත්ත දායකයකුට ම අයිතිවාසිකමක් තිබිය යුතු අතර, දත්ත දායකයාගේ පෞද්ගලික දත්ත නිවැරදි කරන ලෙස හෝ සම්පූර්ණ කරන ලෙස ලිඛිත ඉල්ලීමක් කරනු ලැබූ විට දී, 17 වන වගන්තියේ විධිවිධානවලට යටත්ව පාලකවරයා විසින් ප්‍රමාදයකින් තොරව එය නිවැරදි කිරීම හෝ සම්පූර්ණ කිරීම කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ වගන්තියේ විධිවිධාන මගින්, දත්ත සැකසීමේ කාර්යය සඳහා අවශ්‍ය නොවන යම් අතිරේක පෞද්ගලික දත්ත එකතු කිරීමට සහ සැකසීමට පාලකවරයකු වෙත යම් වගකීමක් පනවනු නොලැබිය යුතු ය:

එසේම තවදුරටත්, පාලකවරයකු විසින් යම් ලිඛිත නීතියක් යටතේ හෝ යම් නිසි අධිකරණයක ආඥාවක් යටතේ සාක්ෂිමය කාර්ය සඳහා පෞද්ගලික දත්ත පවත්වා ගැනීමට අවශ්‍ය විට දී, එම පාලකවරයා විසින්, නිවැරදි කිරීමෙන් තොරව එම පෞද්ගලික දත්ත වැඩිදුර සැකසීමෙන් වළකිනු ලැබිය යුතු ය.

16. පහත දැක්වෙන අවස්ථානුගත කරුණු යටතේ තම පෞද්ගලික දත්ත මකා දමන ලෙස පාලකවරයාගෙන් ලිඛිත ඉල්ලීමක් කිරීමට සෑම දත්ත දායකයකුට ම අයිතිවාසිකමක් ඇත්තේ ය:-

(අ) 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන, 10 වන සහ 11 වන වගන්තිවල සඳහන් වගකීම් කඩකරමින් පෞද්ගලික දත්ත සැකසීම සිදු කිරීමේ දී;

(ආ) I වන උපලේඛනයේ (අ) අයිතමයට හෝ II වන උපලේඛනයේ (අ) අයිතමයට අනුකූලව, දත්ත සැකසීමට පදනම් වූ ස්වකීය කැමැත්ත දත්ත දායකයා විසින් ඉවත් කරගනු ලැබීමේ දී;

(ඇ) දත්ත දායකයා හෝ පාලකවරයා යටත් වන්නා වූ යම් ලිඛිත නීතියක් මගින් හෝ යම් නිසි අධිකරණයක ආඥාවක් මගින්, පෞද්ගලික දත්ත මකා දමන ලෙස නියම කරනු ලැබීමේ දී.

17. (1) 13 වන, 14 වන, 15 වන හෝ 16 වන වගන්ති යටතේ දත්ත දායකයකුගෙන් පාලකවරයකු වෙත ලිඛිත ඉල්ලීමක් ලැබුණු විට දී, එම පාලකවරයා විසින්, එම ඉල්ලීම කරන ලද දින සිට වැඩ කරන දින විසිඑකක් තුළ-

(අ) එම ඉල්ලීම ප්‍රදානය කර ඇති ද යන්න;

(ආ) (2) වන උපවගන්තිය යටතේ එම ඉල්ලීම ප්‍රතික්ෂේප කර ඇති ද යන්න සහ යම් ලිඛිත නීතියක් මගින් එම හේතු අනාවරණය කිරීම තහනම් කර ඇත්නම් මිස, ඒ සඳහා වන හේතු; හෝ

(ඇ) පාලකවරයා විසින්, 14(2) වන හෝ 15 වන වගන්තිය යටතේ එම පෞද්ගලික දත්ත වැඩිදුර සැකසීමෙන් වැළකී සිට ඇති ද යන්න සහ ඊට හේතු,

එම දත්ත දායකයාට ලිඛිතව දන්වා (අා) හෝ (ඇ) ඡේද යටතේ පාලකවරයා විසින් ගන්නා ලද තීරණ සම්බන්ධයෙන් දත්ත දායකයාට අභියාචනා කිරීමේ අයිතිවාසිකමක් ඇති බව, දන්වනු ලැබිය යුතු ය.

(2) පාලකවරයා විසින්-

(අ) ජාතික ආරක්ෂාව;

(අා) මහජන සාමය;

(ඇ) යම් ලිඛිත නීතියක් යටතේ පවත්වන ලද යම් පරීක්ෂණයක්, සිදුකරගෙන යන ලද විමර්ශනයක් හෝ කාර්ය පටිපාටියක්;

(ඈ) අපරාධ වැරදි වැළැක්වීම, අනාවරණය කර ගැනීම, අපරාධ වැරදි පිළිබඳ විමර්ශනය කිරීම හෝ ඒ සම්බන්ධයෙන් නඩු පැවරීම;

(ඉ) යම් ලිඛිත නීතියක් යටතේ වූ වෙනත් තැනැත්තන්ගේ අයිතිවාසිකම් සහ නිදහස;

(ඊ) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව, යම් ඉල්ලීමක් මත කටයුතු කිරීමට පාලකවරයා සතු තාක්ෂණික සහ මෙහෙයුම් ශක්‍යතාව;

(උ) (4) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව දත්ත දායකයාගේ අනන්‍යතාව තහවුරු කර ගැනීම සඳහා පාලකවරයාට නොහැකි වන අවස්ථාවක්; හෝ

(ඌ) යම් ලිඛිත නීතියක් යටතේ පෞද්ගලික දත්ත සැකසීමේ අවශ්‍යතාවය,

සැලකිල්ලට ගනිමින්, දත්ත දායකයකු විසින් මේ පනතේ 13 වන, 14 වන, 15 වන හෝ 16 වන වගන්ති යටතේ කරන ලද ඉල්ලීමකට අනුව කටයුතු කිරීම, ප්‍රතික්ෂේප කරනු ලැබිය හැකි ය.

(3) පාලකවරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ යම් ප්‍රතික්ෂේප කිරීමක් සඳහා වන හේතු වාර්තා කරනු ලැබිය යුතු අතර, අධිකාරිය විසින් ලිඛිතව ඉල්ලීමක් කරනු ලැබීමේ දී අධිකාරිය වෙත එම වාර්තා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(4) 13 වන, 14 වන, 15 වන හෝ 16 වන වගන්ති යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කරනු ලබන දත්ත දායකයකුගේ අනන්‍යතාව තහවුරු කර ගැනීමට පාලකවරයාට නොහැකි වන අවස්ථාවක දී, එම ඉල්ලීම් පිළිබඳ කටයුතු කිරීමට පාලකවරයාට හැකි වන පරිදි අතිරේක තොරතුරු සැපයීමට එම පාලකවරයා විසින් දත්ත දායකයකුගෙන් ඉල්ලීම් කරනු ලැබිය හැකි ය.

(5) (අ) දත්ත දායකයා බාල වයස්කරුවකු වන අවස්ථාවක දී, දෙමාපියන් හෝ බාල වයස්කරු සම්බන්ධයෙන් මව්පිය අධිකාරය ඇති යම් තැනැත්තකු හෝ ඔහුගේ නීත්‍යානුකූල භාරකරුවකු වශයෙන් පත්කර ඇති තැනැත්තකු විසින්; හෝ

(අා) දත්ත දායකයා කායික හෝ මානසික වශයෙන් අයෝග්‍ය වන අවස්ථාවක දී, අධිකරණයක් විසින් ඔහුගේ භාරකරු හෝ අද්මිනිස්ත්‍රාසිකරු වශයෙන් පත්කර ඇති තැනැත්තකු විසින්; හෝ

(ඇ) (අ) සහ (අා) ඡේදයන් හි සඳහන් කර ඇති අවස්ථාවන්හි දී හැර මේ කොටස යටතේ ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට දත්ත දායකයා විසින් ලිඛිතව යථා පරිදි බලය පවරන ලද තැනැත්තකු විසින්; හෝ

(ඈ) මියගිය දත්ත දායකයකුගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කරන උරුමකරුවකු විසින්, එවැනි දත්ත දායකයකුගේ මරණයේ දින සිට වසර දහයක කාලයක් තුළ,

මේ කොටස යටතේ දත්ත දායකයකු වෙත පවරන ලද යම් අයිතිවාසිකමක් නියෝග මගින් නියම කරනු ලබන ආකාරයට ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(6) 13 වන, 14 වන, 15 වන හෝ 16 වන වගන්ති යටතේ දත්ත දායකයකු විසින් කරනු ලබන ඉල්ලීමක්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ගාස්තුවලට යටත්ව ඉදිරිපත් කළ යුතු ය.

(7) (6) වන උපවගන්තිය යටතේ ගාස්තුවක් අයකරනු ලබන අවස්ථාවක දී, පාලකවරයා විසින්, දත්ත දායකයා වෙත එකී ගාස්තුවල තොරතුරු සහ එසේ පැනවීමට හේතු දැක්විය යුතු ය.

18. (1) යම් ලිඛිත නීතියක් යටතේ දත්ත දායකයකුගේ අයිතිවාසිකම්වලට හා නිදහසට අප්‍රතිවර්තනීය හා අඛණ්ඩව බලපෑම් සිදු කරන හෝ සිදු කිරීමට හැකිවන්නා වූ හුදෙක් ම ස්වයංක්‍රීය දත්ත සැකසීම මත පදනම් වූ පාලකවරයකුගේ තීරණය, 19 වන වගන්තියට යටත්ව සමාලෝචනය කිරීම සඳහා එම පාලකවරයා වෙත ඉල්ලීමක් කිරීමේ අයිතිය සෑම දත්ත දායකයකුට ම ඇත්තේ ය.

(2) ස්වයංක්‍රීය දත්ත සැකසීම මත පදනම් වූ පාලකවරයකුගේ තීරණය-

(අ) පාලකවරයකු යටත් වන යම් ලිඛිත නීතියක් මගින් බලය පවරනු ලබන;

(අා) අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකින් බලය පවරනු ලබන;

(ඇ) දත්ත දායකයාගේ කැමැත්ත මත පදනම් වන; හෝ

(ඈ) දත්ත දායකයා සහ පාලකවරයා අතර ගිවිසුමකට එළඹීම සඳහා හෝ ඒ අනුව ක්‍රියා කිරීම සඳහා අවශ්‍ය වන,

අවස්ථාවක දී ගනු ලබන විට, (1) වන උපවගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු අතර, පාලකවරයා විසින්, දත්ත දායකයාගේ අයිතිවාසිකම් හා නිදහස ආරක්ෂා කිරීම සඳහා අවශ්‍ය වන අධිකාරිය විසින් ඒ වෙනුවෙන් සාදන ලද රීති මගින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් පියවර සහ අදාළ වන නිර්ණායක අනුගමනය කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, (ඈ) ඡේදය යටතේ වන අවශ්‍යතාව, පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේද සඳහා අදාළ නොවිය යුතු ය.

19. (1) පාලකවරයා විසින්-

(අ) 14 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත වැඩිදුර සැකසීමෙන් වැළකී නොමැති අවස්ථාවක දී; හෝ

(ආ) 15 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත නිවැරදි කිරීම හෝ සම්පූර්ණ කිරීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී; හෝ

(ඇ) 16 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත මකා දැමීම ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී; හෝ

(ඈ) 17 (2) වගන්තිය යටතේ දත්ත දායකයකුගේ ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී; හෝ

(ඉ) 18 (1) වගන්තිය යටතේ ස්වයංක්‍රීය දත්ත සැකසීම මත පමණක් පදනම් වූ තීරණයක් සමාලෝචනය කිරීම සඳහා වන ඉල්ලීමක් ප්‍රතික්ෂේප කර ඇති අවස්ථාවක දී,

දත්ත දායකයා විසින් එම තීරණයට විරුද්ධව නියම කරනු ලැබිය හැකි ආකෘතියකින්, ආකාරයකින් සහ යම් කාලසීමාවක් ඇතුළත, අධිකාරිය වෙත අභියාචනය කරනු ලැබිය හැකි ය.

(2) (අ) 14 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත තවදුරටත් සැකසීමෙන් වැළකී නොසිටීමට වූ පාලකවරයාගේ තීරණය නීත්‍යානුකූල වූයේ ද යන්න;

(ආ) 15 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත නිවැරදි කිරීම හෝ සම්පූර්ණ කිරීම ප්‍රතික්ෂේප කිරීමට ගත් පාලකවරයාගේ තීරණය නීත්‍යානුකූල වූයේ ද යන්න;

(ඇ) 16 වන වගන්තිය යටතේ පෞද්ගලික දත්ත මකා දැමීම ප්‍රතික්ෂේප කිරීමට ගත් පාලකවරයාගේ තීරණය නීත්‍යානුකූල වූයේ ද යන්න;

(ඈ) 17 (2) වගන්තිය යටතේ පාලකවරයා සිදු කළ ප්‍රතික්ෂේප කිරීම නීත්‍යානුකූල වූයේ ද යන්න;

(ඉ) 18 (1) වගන්තිය යටතේ ස්වයංක්‍රීය දත්ත සැකසීම මත පදනම් වූ තීරණයක් සමාලෝචනය කිරීම සඳහා වූ ඉල්ලීම ප්‍රතික්ෂේප කිරීම නීත්‍යානුකූල වූයේ ද යන්න,

තීරණය කිරීම අධිකාරිය විසින් කරනු ලැබිය හැකි ය.

(3) අවශ්‍ය විමර්ශන සිදුකර අවසන් කිරීමෙන් පසු ව, නියම කරනු ලැබිය හැකි කාලසීමාවක් ඇතුළත, අභියාචනයට ඉඩදෙනු ලැබිය හැකි බව හෝ ඉඩදෙනු නොලැබිය හැකි බව අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය යුතු අතර, එකී තීරණය ඒ සඳහා වන හේතු ද සමඟ අධිකාරිය විසින් දත්ත දායකයාට සහ පාලකවරයාට දන්වනු ලැබිය යුතු ය.

(4) (2) වන උපවගන්තිය යටතේ අධිකාරිය විසින් අභියාචනය පිළිගනු ලබන අවස්ථාවක දී, අධිකාරිය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් කාලසීමාවක් ඇතුළත, පාලකවරයා විසින්, අධිකාරියෙහි තීරණය බලාත්මක කිරීම සඳහා පියවර ගනු ලැබිය යුතු අතර, එම තීරණය බලාත්මක කිරීම සඳහා ගන්නා ලද පියවර පාලකවරයා විසින් දත්ත දායකයාට සහ අධිකාරියට දන්වනු ලැබිය යුතු ය.

(5) අධිකාරියෙහි තීරණය මගින් අගතියට පත් යම් දත්ත දායකයකු හෝ පාලකවරයකු විසින්, එම තීරණය ලබා දෙන ලද දින සිට දින තිහක් පසු නොවන දිනක දී අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

III වන කොටස

පාලකවරුන් සහ දත්ත සකසන්නන්

20. (1) සෑම පාලකවරයකු විසින් ම සහ සෑම දත්ත සකසන්නකු විසින් ම පහත සඳහන් අවස්ථාවල දී, මේ පනතේ විධිවිධානවලට අනුකූල වීම සහතික කිරීම සඳහා දත්ත ආරක්ෂණ නිලධරයකු නම් කිරීම හෝ පත් කිරීම සිදු කරනු ලැබිය යුතු යඃ-

(අ) අධිකරණය විසින් එහි අධිකරණමය තත්ත්වය තුළ කටයුතු කිරීම සඳහා හැර, අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක් හෝ රාජ්‍ය සංස්ථාවක් විසින් දත්ත සැකසීම සිදුකරනු ලබන අවස්ථාවක; හෝ

(ආ) පහත සඳහන් කරුණු ඇතුළත්ව පාලකවරයා හෝ දත්ත සකසන්නා විසින් දත්ත සැකසීමේ මූලික කාර්යයන් සිදුකරනු ලබන අවස්ථාවක දී-

(i) මෙහෙයුම්වල ස්වභාවය, එහි විෂය පථය හෝ එහි අරමුණු ප්‍රකාරව, නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි පරිමාණය සහ විශාලත්වය මත දත්ත දායකයන්ගේ ක්‍රමවත් සහ විධිමත් අධීක්ෂණය කිරීමක් අවශ්‍ය වන විට දී; හෝ

(ii) නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි ප්‍රමාණයක සහ විශාලත්වය මත පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේදවල දත්ත සැකසීම සිදු කිරීමේ දී; හෝ

(iii) දත්ත සකස් කිරීමේ ස්වභාවය සහ දත්ත දායකයන්ට එයින් සිදුවන බලපෑම මත පදනම්ව, මේ පනත යටතේ ආරක්ෂා කරනු ලැබ ඇති දත්ත දායකයන්ගේ අයිතිවාසිකම්වලට බලපෑම් කරනු ලබන හානියක් පිළිබඳ අවධානමක් සහිත ප්‍රතිඵල ගෙන දෙන දත්ත සැකසීමේ දී.

(2) පෞද්ගලික දත්ත සැකසීමට අදාළ විමර්ශනවලට සහ සිදුවීම්වලට ප්‍රතිචාර දැක්වීම සඳහා වන උපාය මාර්ග හා යාන්ත්‍රණ ක්‍රියාත්මක කිරීමට නිපුණත්වය සහ හැකියාව සහිත දත්ත ආරක්ෂණයට අදාළ කාරණාවල අධ්‍යාපන පසුබිමක්, දැනුම සහ තාක්ෂණික නිපුණතාවන් ඇතුළත් වන නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි අදාළ අධ්‍යාපන සහ වෘත්තීය සුදුසුකම්, දත්ත ආරක්ෂණ නිලධරයකු සතු විය යුතු ය.

(3) පාලකවරයා අස්ථිත්ව සමූහයක් වන අවස්ථාවක දී එක් එක් අස්ථිත්වය විසින් පහසුවෙන් ප්‍රවේශ විය හැකි තනි දත්ත ආරක්ෂණ නිලධරයකු පාලකවරයා විසින් පත්කරගනු ලැබිය හැකි ය. පාලකවරයා හෝ දත්ත සකසන්නා පොදු අධිකාරියක් වන අවස්ථාවක දී, ඔවුන්ගේ සංවිධාන ව්‍යුහය සැලකිල්ලට ගනිමින්, යම් පොදු අධිකාරි කිහිපයක් සඳහා තනි දත්ත ආරක්ෂණ නිලධරයකු නම් කරනු ලැබිය හැකි ය.

(4) පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් දත්ත ආරක්ෂණ නිලධරයකු සම්බන්ධ කරගත හැකි තොරතුරු ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු අතර එම තොරතුරු අධිකාරිය වෙත සන්නිවේදනය කරනු ලැබිය යුතු ය.

(5) දත්ත ආරක්ෂණ නිලධරයකුගේ වගකීම පහත දැක්වෙන පරිදි විය යුතු ය:-

(අ) මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ විධිවිධාන සලස්වන ලද දත්ත සැකසීමේ නියමයන් පිළිබඳව පාලකවරයාට හෝ දත්ත සකසන්නාට සහ ඔවුන්ගේ සේවා නියුක්තිකයන්ට උපදෙස් ලබාදීම;

(ආ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව කටයුතු කරන බවට පාලකවරයා හෝ දත්ත සකසන්නා වෙනුවෙන් සහතික වීම;

(ඇ) දත්ත සැකසුම් මෙහෙයුම්වල නිරත කාර්ය මණ්ඩලයේ ශක්‍යතාවය ගොඩනැංවීම සඳහා පහසුකම් සැලසීම;

(ඈ) පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීම පිළිබඳව උපදේශනය සැපයීම; සහ

(ඉ) දත්ත ආරක්ෂණයට අදාළ කරුණු පිළිබඳව අධිකාරිය විසින් නිකුත් කරන ලද සියලු විධාන සහ උපදෙස්වලට සහයෝගය දැක්වීම සහ අනුකූලව කටයුතු කිරීම.

21. (1) පාලකවරයකු වෙනුවෙන් දත්ත සකසන්නකු විසින්, දත්ත සැකසීම සිදු කරනු ලබන අවස්ථාවක දී, පාලකවරයා විසින් -

(අ) මේ පනතේ විධිවිධානයන් බලාත්මක කිරීම සඳහා සුදුසු තාක්ෂණික සහ සංවිධානාත්මක පියවර සැපයීම සහතික කරනු ලබන සහ මේ පනත යටතේ දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සහතික කරනු ලබන, දත්ත සකසන්නන් පමණක් යොදා ගත යුතු ය; සහ

(ආ) විෂය කරුණු සහ දත්ත සැකසීමේ කාලසීමාව, දත්ත සැකසීමේ ස්වභාවය සහ අරමුණ, පෞද්ගලික දත්ත වර්ගය සහ දත්ත දායකයන්ගේ ප්‍රභේද සහ පාලකවරයාගේ වගකීම් පිළිබඳ දක්වනු ලබන ගිවිසුමකට හෝ යම් ලිඛිත නීතියකට එම දත්ත සකසන්නා යටත් වන බව සහතික කළ යුතු ය.

(2) පාලකවරුන් දෙදෙනකු හෝ ඊට වැඩි ගණනක් විසින්, දත්ත සැකසීමෙහි අරමුණු සහ උපක්‍රම පිළිබඳ සාමූහිකව නිශ්චය කරනු ලබන අවස්ථාවක දී, එම පාලකවරුන්, මේ පනත යටතේ සඳහන් වගකීම් ඉටුකිරීම සඳහා සාමූහිකව වගකිව යුතු "සාමූහික පාලකවරුන්" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු ය.

22. (1) පාලකවරයා වෙනුවෙන් දත්ත සකසන්නකු විසින් දත්ත සැකසීමේ කටයුතුවල නිරත වන අවස්ථාවක දී, දත්ත සකසන්නා විසින්-

(අ) පාලකවරයාගේ ලිඛිත උපදෙස් මත දත්ත සැකසීමේ කටයුතු සිදුකරන බව සහතික කළ යුතු ය;

(ආ) දත්ත සකසන්නාගේ සේවක පිරිස, උචිත තාක්ෂණික සහ ආයතනික පියවර ක්‍රියාත්මක කිරීම මඟින් විශ්වසනීයත්වය සහ රහස්‍යතාව පිළිබඳ ගිවිසුම්ගත වගකීම්වලට යටත් වන බව සහතික කළ යුතු ය;

(ඇ) දත්ත සැකසීමේ ස්වභාවය සහ දත්ත සකසන්නාට පවතින තොරතුරු පිළිබඳ සැලකිල්ලට ගෙන පාලකවරයාගේ ලිඛිත ඉල්ලීම මත පරීක්ෂණ කටයුතු ඇතුළුව අනුකූලතා විගණන කටයුතු කරගෙන යාමට පාලකවරයා වෙත පහසුකම් සලස්වනු ලැබිය යුතු ය; සහ

(ඈ) පාලකවරයාගේ ලිඛිත උපදෙස් මත දත්ත සැකසීමට අදාළ සේවා සැපයීම අවසන් වීමෙන් පසු, සියලුම පෞද්ගලික දත්ත පිටපත් මකා දැමිය යුතු ය, නැතහොත් පාලකවරයා වෙත නැවත එකී සියලු පෞද්ගලික දත්ත පිටපත් ලබා දිය යුතු ය.

(2) දත්ත සකසන්නකු විසින් (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ විධිවිධාන අනුව කටයුතු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී හෝ ඔහු විසින් ම දත්ත සැකසීමේ අරමුණු සහ දත්ත සැකසීමේ උපක්‍රම නිශ්චය කරනු ලබන අවස්ථාවක දී, එම දත්ත සකසන්නා එම දත්ත සැකසීමට අදාළව මේ පනතේ කාර්යය සඳහා, පාලකවරයකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) දත්ත සකසන්නකු විසින්, නිශ්චිත දත්ත සැකසීමේ කටයුතු සිදු කිරීම සඳහා (මෙහි මින් මතු "උප දත්ත සකසන්නා" යනුවෙන් හඳුන්වනු ලබන) වෙනත් දත්ත සකසන්නකු නිරත කරවනු ලබන අවස්ථාවක දී, එකී උප දත්ත සකසන්නාට සහ ඔහු සම්බන්ධයෙන් මේ වගන්තියේ විධිවිධාන අදාළ විය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ වන වගකීම් ඉටු කිරීමට උප දත්ත සකසන්නකු අපොහොසත් වන අවස්ථාවක දී, දත්ත සකසන්නා විසින් එකී උප දත්ත සකසන්නාගේ වගකීම් ඉටු කිරීම හෝ ක්‍රියාවේ යෙදවීම සම්බන්ධයෙන් පාලකවරයාට වගකිව යුතු ය.

(5) මේ වගන්තියේ කාර්ය සඳහා "සේවක පිරිස්" යන්නෙන්, යම් සේවා නියුක්තිකයකු, උපදේශකවරයකු, නියෝජිතයකු, අනුබද්ධ ආයතනයක් හෝ පෞද්ගලික දත්ත සැකසීම සඳහා දත්ත සකසන්නා විසින් ගිවිසුමකට ඇතුළත් කරනු ලබන යම් තැනැත්තකු අදහස් වේ.

23. (1) පෞද්ගලික දත්ත කඩ කිරීමක් සිදුවන අවස්ථාවක දී, පාලකවරයකු විසින්, මේ පනත යටතේ රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකෘතියකට සහ ආකාරයකට අනුරූපව සහ යම් කාල සීමාවක් තුළ පෞද්ගලික දත්ත කඩ කිරීමක් සම්බන්ධයෙන් අධිකාරිය වෙත දන්වනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය විසින්-

(අ) එවැනි දත්ත කඩකිරීම් පිළිබඳ අධිකාරිය වෙත දැනුම් දිය යුතු අවස්ථා;

(ආ) බලපෑමට ලක් වූ දත්ත දායකයා වෙත ඒ පිළිබඳ දැනුම් දිය යුතු අවස්ථා; සහ

(ඇ) එම නිවේදනයේ ආකෘතිය සහ ආකාරය සහ දත්ත කඩ කිරීමට අදාළ නිවේදනයේ සැපයිය යුතු තොරතුරු,

සම්බන්ධයෙන් මේ පනත යටතේ සාදනු ලබන රීති මගින් විධිවිධාන සැලැස්විය යුතු ය.

24. (1) පාලකවරයා විසින්-

(අ) පුද්ගල පැතිකඩ දැක්වීම ඇතුළුව පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේද හෝ පෞද්ගලික දත්ත ක්‍රමානුකූලව සහ පුළුල් ලෙස ඇගයීමක්;

(ආ) පොදු මහජනයාට ප්‍රවේශ විය හැකි ප්‍රදේශයක හෝ විදුලිසංදේශ ජාලවල ක්‍රමානුකූලව අධීක්ෂණය කිරීමක්; හෝ

(ඇ) එම දත්ත සැකසීමේ විෂය පථය සහ ඊට සම්බන්ධ අවදානම් පිළිබඳ සැලකිල්ලට ගනිමින් රීති මගින් නිශ්චය කරනු ලැබිය හැකි දත්ත සැකසීම් කටයුත්තක්,

සම්බන්ධ වන යම් දත්ත සැකසීමක් සිදු කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවක, එම පාලකවරයා විසින්, එම දත්ත සැකසීමට පෙරාතුව, මේ පනතේ I වන කොටස යටතේ පාලකවරයා මත පනවන ලද වගකීම් සහ මේ පනතේ II වන කොටස යටතේ දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් පිළිබඳ අපේක්ෂිත දත්ත සැකසුම්වල බලපෑම නිශ්චිතව දැනගැනීම සඳහා, නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි ආකෘතියකින් සහ ආකාරයකින් පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීමක් සිදු කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සඳහන් දත්ත සැකසීම මගින් දත්ත දායකයාට ඇතිවිය හැකි හානියක් වේ නම් ඒ පිළිබඳ අවදානම ලිහිල් කිරීම සඳහා පාලකවරයා විසින් ගනු ලබන යම් පියවර හා ආරක්ෂණයන් ඇතුළත් යම් තොරතුරු සහ විස්තර පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීමක, ඇතුළත් විය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීමක් සිදු කිරීමේ දී, දත්ත ආරක්ෂණ නිලධරයකු නම් කරනු ලැබ ඇති අවස්ථාවක, පාලකවරයා විසින් එම දත්ත ආරක්ෂණ නිලධරයාගේ සහාය ලබාගත යුතු ය.

(4) දැනටමත් පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීමක් සිදුකර තිබුණ ද, යම් දත්ත සැකසීමක් සඳහා යොදාගනු ලැබූ ක්‍රමවේදයෙහි, තාක්ෂණයෙහි හෝ ක්‍රියාවලියෙහි යම් වෙනසක් ඇතිවන ඕනෑම අවස්ථාවක, පාලකවරයා විසින් මේ වගන්තියට අනුව නව පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම ඇගයීමක් සිදු කරනු ලැබිය යුතු ය.

(5) දත්ත දායකයාගේ පෞද්ගලික දත්ත ආරක්ෂණයට ඇති අවදානම සහ ඊට අදාලව අධිකාරිය විසින් නිර්දේශිත ආරක්ෂණ පියවර පිළිබඳව සහ දත්ත සැකසීමේ අනුකූලතාවය පිළිබඳ ඇගයීමක් සිදු කිරීමේ කාර්යය සඳහා අධිකාරිය විසින් කරනු ලබන ලිඛිත ඉල්ලීමක් මත වෙනත් යම් තොරතුරු සපයමින් මේ වගන්තිය යටතේ නියම කර ඇති දත්ත ආරක්ෂණ ඇගයීමක් පාලකවරයා විසින් අධිකාරිය වෙත ඉදිරිපත් කළ යුතු ය.

25. (1) මේ පනත යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ සහතික කරනු ලැබ ඇති දත්ත දායකයන්ගේ අයිතිවාසිකම්වලට, දත්ත සැකසීම මගින් හානියක් වීමේ අවදානමක් ඇති විය හැකි බවට, 24 වන වගන්තිය යටතේ සිදු කරනු ලැබූ පෞද්ගලික දත්ත ආරක්ෂණ බලපෑම් ඇගයීමක් මගින් පෙන්වා දෙන අවස්ථාවක දී, පාලකවරයා විසින් කිසිදු පෞද්ගලික දත්ත සැකසීමක් සිදු කිරීමට පෙරාතුව එහි හානියක් වීමේ අවදානම ලිහිල් කිරීම සඳහා වන පියවර ගත යුතු ය.

(2) පාලකවරයා (1) වන උපවගන්තිය යටතේ පියවර ගැනීමෙන් පසුව වුව ද, දත්ත දායකයන්ට හානියක් වීමේ අවදානම ලිහිල් කිරීමට නොහැකි අවස්ථාවක දී, එවැනි දත්ත සැකසීමකට පෙරාතුව, එවැනි පාලකවරයකු විසින් අධිකාරිය විමසිය හැකි ය.

(3) එවැනි විමසීමක දී, අධිකාරිය විසින්, දත්ත දායකයන්ට සිදු විය හැකි හානියක් පිළිබඳ ඇති අවදානම ලිහිල් කිරීම සඳහා අතිරේක පියවර ගැනීමට හෝ එම දත්ත සැකසීම නැවැත්වීමට නියම කරමින් ලිඛිත උපදෙස් සපයනු ලැබිය හැකි ය.

(4) (2) වන උපවගන්තිය යටතේ පාලකවරයා විසින් අධිකාරිය විමසන අවස්ථාවක දී, අධිකාරිය විසින් ඉල්ලා සිටිනු ලැබිය හැකි යම් අතිරේක තොරතුරක් පාලකවරයා විසින් අධිකාරිය වෙත සපයනු ලැබිය යුතු ය.

(5) යම් සාධාරණ හේතුවක් නොමැතිව, අධිකාරියේ උපදෙස් අනුව කටයුතු කිරීමට පාලකවරයා අපොහොසත් වන අවස්ථාවක දී, එවැනි පාලකවරයකු මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

(6) සැක දුරු කිරීමේ කාර්යය සඳහා, II වන උපලේඛනයේ (ආ), (ඊ), (උ) සහ (උආ) අයිතමවල සඳහන් පෞද්ගලික දත්ත සකසනු ලබන විට, II වන උපලේඛනය යටතේ නියම කරනු ලැබ ඇති දත්ත දායකයන්ගේ අයිතීන් ආරක්ෂා කිරීම සඳහා වන එවැනි පියවර සහ සුදුසු අධීක්ෂණය සපයා ඇති බව සලකනු ලැබිය යුතු බව ප්‍රකාශ කරනු ලැබේ.

(7) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, පාලකවරයා විසින් 24(1) වන වගන්තියේ දක්වා ඇති පෞද්ගලික දත්ත සැකසීමෙහි නිරත වන ඕනෑම අවස්ථාවක සහ ජාතික ආරක්ෂාවට, මහජන සාමයට සහ මහජන සෞඛ්‍යයට අදාළව දත්ත සැකසීම සිදු කරනු ලබන අවස්ථාවක දී, පාලකවරයා විසින් අධිකාරිය විමසිය යුතු ය.

26. (1) පොදු අධිකාරියක් විසින් පාලකවරයකු හෝ දත්ත සකසන්නකු වශයෙන් පෞද්ගලික දත්ත සැකසීම කරනු ලබන අවස්ථාවක, එම පෞද්ගලික දත්ත ශ්‍රී ලංකාව තුළ පමණක් සැකසීම කරනු ලැබිය යුතු අතර, (2) වන උපවගන්තිය යටතේ ගනු ලැබූ ප්‍රමාණවත් තීරණයක් ප්‍රකාරව අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබූ, තුන්වන රටක දී දත්ත සැකසීමට අවසර දෙනු ලැබිය හැකි පෞද්ගලික දත්ත ප්‍රභේද, අධිකාරිය විසින්, අවස්ථාවෝචිත පරිදි, පාලකවරයා හෝ දත්ත සකසන්නා සහ අදාළ නියාමන හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලය විමසා වර්ග කරනු ලබන්නේ නම් මිස, එම පෞද්ගලික දත්ත තුන්වන රටක දී සැකසීම කරනු නොලැබිය යුතු ය.

(2) (අ) ප්‍රමාණවත් තීරණයක්" ගැනීමේ කාර්යය සඳහා, අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා, තුන්වන රටක දී පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීමට අදාළ නීති සහ නීති බලාත්මක කිරීමේ යාන්ත්‍රණ පිළිබඳ සහ මේ පනතේ I වන කොටස, II වන කොටස සහ III වන කොටසේ 20 වන, 21 වන, 22 වන, 23 වන, 24 වන සහ 25 වන වගන්තිවල විධිවිධාන අදාළ වීම පිළිබඳ සහ දේශසීමා හරහා පෞද්ගලික දත්ත සංචලනය කිරීමේ කාර්යය සඳහා තුන්වන රටක දී පෞද්ගලික දත්ත සැකසීමට අදාළ නියම කරනු ලැබූ වෙනත් නිර්ණායක පිළිබඳ සැලකිල්ලට ගනු ලැබිය යුතු ය;

(ආ) මේ උපවගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් ගනු ලැබූ යම් ප්‍රමාණවත් තීරණයක්-

(i) එකී තීරණවලට බලපෑ හැකි තුන්වන රටක සංවර්ධනයන් පිළිබඳ කාලානුරූපී අධීක්ෂණයට යටත් විය යුතු අතර, අමාත්‍යවරයා විසින් යටත් පිරිසෙයින් සෑම වර්ෂ දෙකකට වරක් ම එම තීරණය සමාලෝචනය කරනු ලැබිය හැකි ය; සහ

(ii) අමාත්‍යවරයා විසින්, අධිකාරිය විමසා, එම තීරණය සංශෝධනය කරනු ලබන තෙක් හෝ ප්‍රත්‍යාදිෂ්ට කරනු ලබන තෙක් බලාත්මකව පැවතිය යුතු ය.

(3) පොදු අධිකාරියක් හැර පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින්-

(අ) "ප්‍රමාණවත් තීරණයක් ප්‍රකාරව නියෝග මඟින් නියම කරනු ලැබූ තුන්වන රටක දී; හෝ

(ආ) ප්‍රමාණවත් තීරණයක් ප්‍රකාරව නියෝග මඟින් නියම කරනු ලැබූ තුන්වන රටක් නොවන රටක දී, මේ පනතේ I වන කොටස II වන කොටස සහ III වන කොටසේ 20 වන, 21 වන, 22 වන, 23 වන, 24 වන සහ 25 වන වගන්ති යටතේ පනවනු ලැබූ අදාළ වගකීම්වලට අනුකූලවීම අවස්ථාවෝචිත පරිදි එම පාලකවරයා හෝ දත්ත සකසන්නා විසින් සහතික කරනු ලබන අවස්ථාවක පමණක්,

පෞද්ගලික දත්ත සැකසීම කරනු ලැබිය හැකි ය.

(4) (3) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අනුකූලවීම සහතික කර ගැනීමේ කාර්යය සඳහා, මේ පනත මඟින් ආරක්ෂා කරනු ලබන දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් සහ ප්‍රතිකර්ම සඳහා උචිත ආරක්ෂණයන් සහතික කර ගැනීම සඳහා සහ තුන්වන රටේ සිටින ප්‍රතිග්‍රාහකයාගේ බැඳීම සහ බලාත්මක කළ හැකි කැපවීම් සහතික කර ගැනීම සඳහා අධිකාරිය විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් නීතිමය ලියවිලි පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් පිළිගනු ලැබිය යුතු ය.

(5) (2) වන උපවගන්තිය ප්‍රකාරව ප්‍රමාණවත් තීරණයක් හෝ (4) වන උපවගන්තිය ප්‍රකාරව උචිත ආරක්ෂණයන් ගෙන නොමැති අවස්ථාවක දී-

(අ) ප්‍රමාණවත් තීරණ සහ උචිත ආරක්ෂණයන් නොමැති වීම හේතුවෙන් දත්ත දායකයාට එම දත්ත සැකසීමෙන් සිදුවිය හැකි අවදානම පිළිබඳ දැනුම්වත් කිරීමෙන් පසුව, ශ්‍රී ලංකාවෙන් බැහැර පෞද්ගලික දත්තවල යෝජිත දත්ත සැකසීම සඳහා දත්ත දායකයා විසින් ප්‍රකාශිතව ම කැමැත්ත ලබා දී ඇත්නම්; හෝ

(ආ) දත්ත දායකයා සහ පාලකවරයා අතර ගිවිසුමක් ඉටු කිරීම සඳහා හෝ දත්ත දායකයාගේ ඉල්ලීමක් මත පාලකවරයා විසින් ගනු ලබන යම් පූර්ව ගිවිසුම්ගත පියවර ක්‍රියාත්මක කිරීම සඳහා දත්ත පැවරීම අවශ්‍ය වේ නම්; හෝ

(ඇ) දත්ත දායකයාට අදාළ නෛතික හිමිකම්පෑම් ප්‍රතිශ්ඨාපනය කිරීම, ක්‍රියාත්මක කිරීම හෝ එම හිමිකම්පෑම්වල විත්තිවාචක සඳහා දත්ත පැවරීම අවශ්‍ය වේ නම්; හෝ

(ඈ) මේ පනතේ I වන උපලේඛනයේ (උ) අයිතමයේ අර්ථනිරූපිත මහජන යහපත පිණිස වූ හේතු සම්බන්ධයෙන් දත්ත පැවරීම අවශ්‍ය වේ නම්; හෝ

(ඉ) දත්ත දායකයා හෝ වෙනත් තැනැත්තකුගේ ජීවිතය, සෞඛ්‍ය තත්ත්වය සහ ආරක්ෂාව සඳහා තර්ජනයක් වන යම් හදිසි අවස්ථාවක් සඳහා ප්‍රතිචාර දක්වීමට දත්ත පැවරීම අවශ්‍ය වේ නම් සහ දත්ත දායකයා හෝ ඔහුගේ නෛතික භාරකරු ශාරීරික හෝ නෛතික වශයෙන් කැමැත්ත ලබා දීමට නොහැකිව සිටින අවස්ථාවක දී; හෝ

(ඊ) මේ පනත යටතේ නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි වෙනත් තත්ත්වයන් යටතේ එම දත්ත සැකසීම සඳහා අවසර ලබා දී ඇත්නම්,

පොදු අධිකාරියක් හැර පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් ශ්‍රී ලංකාවෙන් පිටත දී පෞද්ගලික දත්ත සකස් කරනු ලැබිය හැකි ය.

IV වන කොටස

ආයාචිත පණිවුඩ පතුරුවා හැරීම සඳහා පෞද්ගලික දත්ත භාවිත කිරීම

27. (1) 14 වන වගන්තියට යටත්ව, (මෙහි මින් මතු "ආයාචිත පණිවුඩ" යනුවෙන් හඳුන්වනු ලබන) පණිවුඩ ලබා ගැනීම සඳහා දත්ත දායකයකු විසින් කැමැත්ත ලබා දී ඇත්නම් පමණක්, පණිවුඩ පතුරුවා හැරීමේ කාර්ය සඳහා පාලකවරයකු විසින් තැපැල් සේවා, විදුලි සංදේශ සේවා, විද්‍යුත් ක්‍රම හෝ ඊට සමාන වෙනත් යම් ක්‍රම භාවිත කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා, III වන උපලේඛනයේ කොන්දේසිවලට අනුකූලව පාලකවරයා විසින් කැමැත්ත ලබා ගනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ කැමැත්ත ලබා ගන්නා විට, සම්බන්ධ කරගැනීමේ තොරතුරු රැස් කරන අවස්ථාවේ දී සහ පණිවුඩයක් යවනු ලබන එක් එක් වේලාවේ දී, පාලකවරයා විසින්, ආයාචිත පණිවුඩ ලබා ගැනීමෙන් නොමිලේ ඉවත් වන ආකාරය පිළිබඳ විස්තර දත්ත දායකයා වෙත සපයනු ලැබිය යුතු ය.

(4) යම් ආයාචිත පණිවුඩ පතුරුවා හැරීම සඳහා තැපැල්, විද්‍යුත්, විදුලි සංදේශ හෝ ඊට සමාන වෙනත් යම් ක්‍රම භාවිත කරන්නා වූ පාලකවරයකු විසින්, එම පණිවුඩ යැවීමට අදහස් කරනු ලබන්නේ යම් දත්ත දායකයන් වෙත ද එකී දත්ත දායකයන් වෙත, පණිවුඩයේ ස්වභාවය පිළිබඳව සහ පාලකවරයාගේ හෝ පාලකවරයා යම් තුන්වන පාර්ශ්වයක් වෙනුවෙන් එම පණිවුඩය යවන්නේ නම් එම තුන්වන පාර්ශ්වයේ අනන්‍යතාවය පිළිබඳව ද දන්වනු ලැබිය යුතු ය.

(5) ආයාචිත පණිවුඩවල විවිධ ප්‍රභේද හඳුනාගැනීම සඳහා පාලකවරුන් විසින් යොදාගත යුතු යම් කේතයක් හෝ උප පදයක් අධිකාරිය විසින්, අදාළ නියාමන හෝ අධීක්ෂණ මණ්ඩලය විමසා, මේ පනත යටතේ සාදන ලද රීතීන් මගින් නිශ්චය කරනු ලැබිය හැකි ය.

(6) මේ වගන්තියේ කාර්යය සඳහා "පණිවුඩයක්" යන්නට, දත්ත දායකයා විසින් පාලකවරයාගෙන් ගාස්තුවක් රහිතව සේවයක් ලබා ගැනීමට කැමැත්ත ලබා දී ඇති යම් අන්තර්ජාල පාදක වූ වෙළඳ ප්‍රචාරක දැන්වීම් හැර මානව මැදිහත්වීම සහිතව හෝ රහිතව ස්වයංක්‍රීය ඇමතීම සහ සන්නිවේදන පද්ධති භාවිත කිරීම ඇතුළුව, විද්‍යුත් හෝ විදුලි සංදේශ සේවාවන් හෝ වෙනත් යම් සමාන ආකාරයන් භාවිතයෙන්-

(අ) පාලකවරයකුගේ හෝ වෙනත් යම් තුන්වන පාර්ශ්වයක භාණ්ඩ හෝ සේවා; හෝ

(ආ) පාලකවරයා ද ඇතුළත්වන යම් තැනැත්තෙක්, අස්ථිත්වයක් හෝ සංවිධානයක්,

ප්‍රවර්ධනය කිරීම සඳහා අදහස් කරනු ලබන යම් ලිඛිත, විද්‍යුත්, වාචික, චිත්‍රමය හෝ වීඩියෝ පණිවුඩයක් ඇතුළත් වේ.

V වන කොටස

දත්ත ආරක්ෂණ අධිකාරිය

28. (1) මේ පනතේ කාර්ය සඳහා (මේ පනතේ "අධිකාරිය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා දත්ත ආරක්ෂණ අධිකාරිය යනුවෙන් හඳුන්වනු ලබන අධිකාරියක් පිහිටුවනු ලැබිය යුතු ය.

(2) අධිකාරිය (1) වන උපවගන්තිය මගින් එයට පවරා ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, එයට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතු මෙන්ම, එකී නාමයෙන් නඩු පැවරීමට සහ නඩු පවරනු ලැබීමට හැකියාව තිබිය යුත්තේ ය.

29. (1) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීම, කළමනාකරණය කිරීම සහ පාලනය කිරීම (මේ පනතේ "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පවරනු ලැබිය යුත්තේ ය.

(2) අධිකාරියේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්ය සඳහා, මණ්ඩලය විසින් මේ පනත මගින් අධිකාරිය වෙත යොමු කරනු ලැබ ඇති, පවරනු ලැබ ඇති හෝ පනවනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) ඉංජිනේරු, වෛද්‍ය, බැංකු සහ මූල්‍ය, විදුලි සංදේශ, නීතිය යන ක්ෂේත්‍රවල විශිෂ්ටත්වයට පත් සහ වෘත්තීමය නිපුණතාවක් පෙන්නුම් කර ඇත්තා වූ ද මහජන උපයෝගීතා, ව්‍යාපාර සැකසුම් ලබාගැනීම් (BPO) ලොජිස්ටික්, රක්ෂණ, බැංකු සහ මූල්‍ය යන අංශවල පළපුරුද්දක් ඇත්තා වූ ද යටත් පිරිසෙයින් සාමාජිකයන් දෙදෙනකු රාජ්‍ය අංශයේ අස්ථිත්වවල පූර්ව පළපුරුද්දක් සහිත තැනැත්තන් වන්නා වූ ද තැනැත්තන් අතරින්, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් පහකට අඩුනොවන සහ හත්දෙනෙකුට වැඩි නොවන සාමාජිකයන් ගණනකින් මණ්ඩලය සමන්විත විය යුත්තේ ය.

(4) මණ්ඩලයට පත් කරනු ලබන තැනැත්තන්ට නියාමනයට සම්බන්ධ කාරණා, පෞද්ගලිකත්වය සහ දත්ත ආරක්ෂණය, තොරතුරු ආරක්ෂණය, දත්ත විද්‍යාව, දත්ත විශ්ලේෂණය, ආර්ථික විද්‍යාව, මුදල්, තොරතුරු තාක්ෂණය හෝ ඒ ආශ්‍රිත ක්ෂේත්‍රවල පළපුරුද්දක් සහ දැනීමක් ද තිබිය යුතු ය.

(5) මේ පනතේ VI වන උපලේඛනයේ විධිවිධාන, මණ්ඩලයේ සාමාජිකයන්ගේ නුසුදුසුකම් සහ සාමාජිකයන් ඉවත් කිරීම සඳහා වන හේතු, සාමාජිකයන්ගේ ඉල්ලා අස්වීම, සාමාජිකත්වයෙන් ඉවත් වීම හෝ නොපැමිණීම, සාමාජිකයන්ගේ ධුර කාලය, අධිකාරියේ රැස්වීම් සහ නිල මුද්‍රාව සම්බන්ධයෙන් බලාත්මක විය යුතු ය.

30. (1) රාජ්‍ය හෝ පෞද්ගලික අංශ අස්ථිත්වවල සක්‍රීය නායකත්ව ගුණාංග ප්‍රකට කර ඇති සාමාජිකයන් අතරින් එක් තැනැත්තකු ජනාධිපතිවරයා විසින් මණ්ඩලයේ සභාපතිවරයා ලෙස පත්කරනු ලැබිය යුතු ය.

(2) ජනාධිපතිවරයා අමතන ලද ලිපියක් මඟින් සභාපතිවරයාට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, එම ඉල්ලා අස්වීමේ ලිපිය ජනාධිපතිවරයා විසින් පිළිගනු ලබන දිනයේ සිට එම ඉල්ලා අස්වීම බලාත්මක විය යුතු ය.

(3) ජනාධිපතිවරයා විසින් තත් කාර්ය සඳහා හේතු දක්වමින් සභාපතිවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල සඳහන් විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලසීමාව විය යුතු ය.

(5) රෝගාතුර වීම, වෙනත් අශක්නුතාවයක්, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනත් යම් හේතුවක් නිසා සභාපතිවරයාට ස්වකීය ධුරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට, කිරීමට හෝ ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක දී, සාමාජිකයකුගේ සාමාන්‍ය කර්තව්‍ය ඉටු කිරීමට අමතරව, සභාපතිවරයා වශයෙන් ක්‍රියා කිරීම සඳහා ජනාධිපතිවරයා විසින් වෙනත් යම් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය.

31. (අ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව පෞද්ගලික දත්ත සැකසීම නියාමනය කිරීම;

(ආ) රාජ්‍ය හා පුද්ගලික අංශයේ ක්‍රියාවලීන් සහ සේවා ඩිජිටල්කරණය කිරීමෙන් මතුවන යම් අහිතකර බලපෑමකින් දත්ත දායකයන්ගේ පෞද්ගලිකත්වය ආරක්ෂා කිරීම;

(ඇ) ඩිජිටල් ගනුදෙනු සහ සන්නිවේදන කටයුතුවල නිරත වන දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සහතික කිරීම සඳහා යාන්ත්‍රණ සැපයීම;

(ඈ) ඩිජිටල් ආර්ථිකයේ වර්ධනයට සහ නවෝත්පාදනයට පහසුකම් සැලසීම සඳහා මේ පනතේ විධිවිධාන සමඟ ඇති නියාමන අනුකූලතාව සහතික කිරීම,

අධිකාරියේ පරමාර්ථ විය යුතු ය.

32. මේ පනත යටතේ සිය කාර්ය කිරීමේ සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්යය සඳහා පහත දැක්වෙන බලතල අධිකාරිය සතු විය යුතු ය:-

(අ) මේ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු කාරණා, සෘජුවම හෝ අධිකාරිය විසින් ඒ වෙනුවෙන් බලය පවරන ලද යම් නිලධරයකු, නියෝජිතයකු, අස්ථිත්වයක් හෝ ආයතනයක් මඟින් කරගෙන යාමට;

(ආ) මේ පනතේ විධිවිධානවලට අනුකූලව පාලකවරයන් සහ දත්ත සකසන්නන් ඔවුන්ගේ කාර්ය සහ වගකීම් කරගෙන යනු ලබන බවට තහවුරු කිරීම සඳහා වන සියලු පියවර ගැනීමට සහ ඔහුගේ කාර්ය සහ වගකීම් ඉටු කරන බවට තහවුරු කිරීම සඳහා පාලකවරයකු හෝ දත්ත සකසන්නකු සතු යම් තොරතුරක් පරීක්ෂා කිරීමට;

(ඇ) දත්ත සැකසීමේ කාර්ය කරගෙන යන්නේ යම් ආකාරයකට ද, එම ආකාරයට අදාළ නියම සහ කොන්දේසි පළකිරීමේ අවශ්‍යතාවය ද ඇතුළුව, මේ පනතේ විධිවිධානයන්ට අනුකූලව ක්‍රියාමාර්ග ගැනීම සඳහා පාලකවරයකුට හෝ දත්ත සකසන්නකුට විධාන කිරීමට;

(ඈ) කාලෝචිත ආකාරයකින් අවශ්‍ය දත්ත සැපයීමට අපොහොසත් වන විට, දත්ත දායකයකුගෙන් අයකරගන්නා ලද ගාස්තු ආපසු ගෙවන ලෙස පාලකවරයකුට හෝ යම් අදාළ දත්ත ආරක්ෂණ නිලධරයකුට විධාන කිරීමට;

(ඉ) මේ පනතේ විධිවිධාන ප්‍රකාරව විමර්ශන පැවැත්වීමට, පැමිණිලි භාර ගැනීමට, යම් තැනැත්තකුට අධිකාරිය ඉදිරියේ පෙනී සිටින ලෙස නියම කිරීමට, විධාන නිකුත් කිරීමට සහ දඩ මුදල් පැනවීමට;

(ඊ) ප්‍රතිඥාවක් හෝ දිවුරුමක් යටතේ යම් තැනැත්තකු පරීක්ෂා කිරීමට සහ අවශ්‍ය අවස්ථාවල දී මේ පනතේ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා නියෝග මඟින් නියම කරනු ලබන ආකාරයකට පාලකවරයකුගේ හෝ දත්ත සකසන්නකුගේ දත්ත සැකසීමේ කර්තව්‍යයන්ට අදාළ වන යම් තොරතුරු ඉදිරිපත් කරන ලෙස එවැනි තැනැත්තකුට නියම කිරීමට;

(උ) දත්ත දායකයකුගේ අයිතිවාසිකම්වලට දත්ත සැකසීම මගින් අත්‍යාසන්න හානියක් විය හැකි බවට විශ්වාස කිරීමට සාධාරණ හේතු අධිකාරිය වෙත පවතින අවස්ථාවක දී, යම් පාලකවරයකුගේ හෝ දත්ත සකසන්නකුගේ පරිශ්‍රයට ඇතුළුවීමට සහ වාර්තා පරීක්ෂා කිරීමට හෝ තහනමට ගැනීමට සහ විමර්ශන සිදු කිරීමට;

(ඌ) දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන ඇතුළුව, පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් කරගෙන යනු ලැබූ යම් දත්ත සැකසීමේ කාර්ය සිදුකරනු ලබන ආකාරය සහ භාවිත කරනු ලැබූ කාර්ය පටිපාටිය පිළිබඳව කාලානුරූප ඇගයීම් සිදු කිරීමට;

(එ) නියෝග මඟින් නියම කරනු ලැබිය යුතු සුදුසුකම්, පළපුරුද්ද සහ බලතල සහ කාර්ය සහිත සාමාජිකයන්ගෙන් සමන්විත උපදේශක කමිටු පත් කිරීමට;

(ඒ) පෞද්ගලික දත්ත ආරක්ෂණයට අදාළව සහතික කිරීම සහ සහතික කිරීමේ මණ්ඩල හඳුනා ගැනීමට;

(ඔ) මේ පනතේ කාර්යය සඳහා, ශ්‍රී ලංකාවෙන් පිටත දත්ත ආරක්ෂාව සඳහා වගකිව යුතු වන වෙනත් ඉහළම මට්ටමේ රජයන් හෝ නියාමන ආයතන හෝ ජාත්‍යන්තර නියෝජ්‍යායතන හෝ සංවිධාන සමඟ තනිවම හෝ නැතහොත් සාමූහිකව ගිවිසුම්වලට එළඹීමට හෝ යම් කාර්යයක නිරත වීමට;

(ඕ) යම් මිලට ගැනීමක්, පරිත්‍යාග, ප්‍රදාන ප්‍රකාරව හෝ අන්‍යාකාරයකින් අධිකාරිය සතු විය හැකි යම් චංචල හෝ නිශ්චල දේපළක් අත්කර ගැනීම, ගැනීම හා දැරීම සහ එවැනි යම් චංචල හෝ නිශ්චල දේපළක් විකිණීම, උකස් කිරීම, බද්දට දීම, ප්‍රදානය කිරීම, පවරා දීම, රික්තවරණය කිරීම, පැවරීම, නුවමාරු කිරීම, හෝ බැහැර කිරීමට;

(ක) සේවා නියුක්තියේ නියම සහ කොන්දේසිවලට යටත්ව අධිකාරියේ කර්තව්‍ය ඉටු කිරීම සඳහා සුදුසු විය හැකි බවට අධිකාරිය විසින් සලකනු ලබන, ප්‍රවීණයන් වශයෙන් සේවය කිරීම සඳහා උපදේශකවරුන් සහ අනුශාසකවරුන් ඇතුළුව නිලධරයන් සහ කාර්ය මණ්ඩලයක් පත් කිරීමට;

(ග) අවස්ථාවෝචිත පරිදි, අධිකාරිය විසින් සේවා නියුක්ත කරනු ලැබූ හෝ සේවා ගිවිසුමක් ඇති කරගනු ලැබූ, අධිකාරියේ කාර්ය මණ්ඩලයේ සහ නිලධරයන්ගේ, උපදේශකවරුන්ගේ සහ අනුශාසකවරුන්ගේ යහපත උදෙසා මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා, අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි පරිදි යම් දීමනා ගෙවීම සහ වෙනත් පහසුකම් ලබා දීම සහ අර්ථසාධක අරමුදල් ඇතිකිරීම හෝ විශ්‍රාම සැලසුම් සකස් කිරීමට;

(ච) අධිකාරිය විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් ආකාරයකින් එහි අරමුදල් ආයෝජනය කිරීමට;

(ජ) බැංකු ගිණුම් විවෘත කිරීමට, පවත්වාගෙන යාමට සහ වසා දැමීමට;

(ට) දත්ත ගබඩා කිරීම, දත්ත සකස් කිරීම, කැමැත්ත ලබා ගැනීම සහ මේ පනතේ විධිවිධානවල නිසි ක්‍රියාත්මකභාවය සඳහා අවශ්‍ය විය හැකි වෙනත් යම් කරුණුවල දත්ත ආරක්ෂණයට අදාළව ප්‍රමිතීන් ප්‍රතිෂ්ඨාපනය කිරීමට;

(ඩ) දේශීය හෝ විදේශීය මූලාශ්‍රවලින් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාරගැනීමට:

එසේ වුව ද, සියලු විදේශීය ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග සම්බන්ධයෙන්, මුදල් විෂය පවරන ලද අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ පූර්ව ලිඛිත අනුමතය, අධිකාරිය විසින් ලබාගත යුතු ය;

(ණ) මේ පනත යටතේ සෑදීමට හෝ නිකුත් කිරීමට නියම කරනු ලැබ ඇති රීති සෑදීමට සහ මාර්ගෝපදේශ සහ විධාන නිකුත් කිරීමට; සහ

(ත) මේ පනත යටතේ අධිකාරියේ පරමාර්ථ සාක්ෂාත් කරගැනීම සඳහා අවශ්‍ය විය හැකි හෝ පාදක වන වෙනත් යම් ක්‍රියාවන් කිරීමට.

33. අධිකාරිය විසින් එහි පරමාර්ථ ඉටු කිරීමේ කාර්යය සඳහා, පහත දැක්වෙන සියලු හෝ යම් කාර්ය සහ කර්තව්‍ය, කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු ය:-

(අ) මෙහි V වන උපලේඛනයේ දක්වා ඇති කොන්දේසිවලට අනුව 11 වන සහ 13 වන වගන්තිවල විධිවිධානවලට අනුකූල වන ලෙසට පාලකවරුන්ට විධාන කිරීම;

(ආ) අධිකාරිය ස්වකීය මෙහෙයවීම මත හෝ දත්ත දායකයකුගේ ඉල්ලීම මත මේ පනත යටතේ පාලකවරුන් හෝ දත්ත සකසන්නන් මත පනවනු ලැබ ඇති වගකීම් කෙරෙහි එම පාලකවරුන් හෝ දත්ත සකසන්නන්ගේ නිසි අනුකූලභාවය සහතික කර ගැනීම සඳහා සියලුම දත්ත සකස් කිරීමේ මෙහෙයුම් අධීක්ෂණය කිරීම සහ පරීක්ෂා කිරීම;

(ඇ) යම් පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් ඉටු කරන ලද යම් දත්ත සැකසීමේ කටයුත්තක් සම්බන්ධයෙන් එකී නිශ්චිත පාලකවරයාට හෝ දත්ත සකසන්නාට විධාන නිකුත් කිරීම;

(ඈ) මේ පනතේ විධිවිධාන ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහතික කිරීම සඳහා පාලකවරුන්ට සහ දත්ත සකසන්නන්ට ජාත්‍යන්තර වශයෙන් පිළිගත් යහපත් පරිචයන් මත පදනම්ව පුහුණුවීම් සිදුකිරීම හෝ ඒ සඳහා පහසුකම් සැලසීම;

(ඉ) පාලකවරුන් විසින් දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කරන බවට සහතික කිරීම සඳහා විධාන නිකුත් කිරීම;

(ඊ) පාලකවරුන් සහ දත්ත සකසන්නන් අතර විනිවිදභාවය සහ ස්වයං නියාමනය ප්‍රවර්ධනය කිරීම;

(උ) අන්තර්ජාතික සම්මුතීන් යටතේ දත්ත ආරක්ෂණ වගකීම් සඳහා දේශීය අනුකූලතාවය සහතික කිරීම;

(ඌ) දත්ත ආරක්ෂණයට අදාළ සියලු කරුණු පිළිබඳව රජයට නිර්දේශ ලබා දීම;

(එ) අමාත්‍යවරයාගේ අනුමතය සහිතව, දත්ත ආරක්ෂණයට අදාළ කරුණු පිළිබඳව ජාත්‍යන්තර වශයෙන් රජය නියෝජනය කිරීම;

(ඒ) දත්ත ආරක්ෂණයට අදාළ සම්මන්ත්‍රණ, වැඩමුළු සහ සාකච්ඡාමුළු සංවිධානය කිරීම සහ පැවැත්වීම ඇතුළුව දත්ත ආරක්ෂණයට අදාළ ඉගෙනුම් සහ අධ්‍යාපනික කටයුතු ප්‍රවර්ධනය කිරීම සහ එවැනි කටයුතු මෙහෙයවනු ලබන වෙනත් සංවිධානවලට සහයෝගය දැක්වීම;

(ඔ) අධිකාරිය වෙනුවෙන් හෝ රජය වෙනුවෙන්, විදේශීය දත්ත ආරක්ෂණ අධිකාරීන් සහ ජාත්‍යන්තර හෝ අන්තර් රාජ්‍ය සංවිධාන ඇතුළුව වෙනත් සංවිධාන සමඟ දත්ත ආරක්ෂණ ක්ෂේත්‍රයේ තාක්ෂණික සහයෝගය කළමනාකරණය කිරීම සහ හුවමාරු කර ගැනීම;

(ඕ) වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරිය වෙත පවරා ඇති කර්තව්‍ය ඉටු කිරීම;

(ක) පෞද්ගලික දත්ත සැකසීමේ දී නවීන තාක්ෂණයෙහි බලපෑම සහ භාවිතය පිළිබඳ පර්යේෂණ සිදු කිරීම;

(ග) පාලකවරු අතර පෞද්ගලික දත්ත හුවමාරුව සඳහා බලය පවරමින් සහ එමගින් වෙනත් පාලකවරයකු සතුව දැනටමත් පවතින දත්ත එකතු කර ගබඩා කිරීමෙන් ඇති වන ද්විකරණය සීමා කිරීම සඳහා නිර්ණායක ක්‍රියාත්මක කිරීම ඇතුළුව ආරක්ෂිත අන්තර් ප්‍රතිග්‍රහණ වේදිකාවක් හරහා පාලකවරු අතර පෞද්ගලික දත්ත හුවමාරු කරනු ලබන අවස්ථාවක, මේ පනතේ විධිවිධාන ප්‍රකාරව පොදු අධිකාරියක් වන පාලකවරු අතර දත්ත හුවමාරු කිරීම මෙහෙයවීම සඳහා රීති සෑදීම;

(ච) යම් ලිඛිත නීතියක් යටතේ දත්ත දායකයන්ට සපයනු ලබන අනන්‍යතා කළමනාකරණ සහ ඒ හා සම්බන්ධ සේවා නියාමනය කිරීමේ කාර්යය සඳහා ආංශික මාර්ගෝපදේශ සහ රීති සහ දත්ත සැකසීම සඳහා බලපත්‍රයක් අවශ්‍ය වන පාලකවරයන්ගේ සහ දත්ත සකසන්නන්ගේ ප්‍රභේද සහ බලපත්‍රවලට අදාළ උපමාන සැකසීම සඳහා උපදේශක කමිටු පත් කිරීම;

(ජ) පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේද භාවිත කිරීමට, 27 වන වගන්තියට අනුකූලව ආයාචිත පණිවුඩ පතුරුවා හැරීම සඳහා පෞද්ගලික දත්ත භාවිත කිරීමට, තනි පුද්ගල පැතිකඩ දැක්වීම සඳහා පෞද්ගලික දත්ත භාවිත කිරීමට සහ ස්වයංක්‍රීය තීරණ ගැනීම සඳහා පෞද්ගලික දත්ත භාවිත කිරීමට අදාළ රීති සෑදීම; සහ

(ට) මේ පනත යටතේ අධිකාරියේ පරමාර්ථ ප්‍රවර්ධනය කිරීම සඳහා අවශ්‍ය වන, මේ පනතේ විධිවිධාන හෝ වෙනත් යම් ලිඛිත නීතියක් සමඟ අනනුකූලතාවයක් ඇති නොවන්නා වූ වෙනත් යම් කටයුතු ඉටු කිරීම.

34. (1) යම් ලිඛිත නීතියක් යටතේ දත්ත දායකයන්ට සපයනු ලබන අනන්‍යතා කළමනාකරණ සහ ඒ හා සම්බන්ධ සේවා නියාමනය කිරීමේ කාර්යය සඳහා, උපදේශක කමිටුවේ නිර්දේශ මත, බලපත්‍රයක් අවශ්‍ය වන පාලකවරුන්ට සහ දත්ත සකසන්නන්ට අධිකාරිය විසින්, බලපත්‍ර නිකුත් කරනු ලැබිය හැකි ය.

(2) උපදේශක කමිටුවේ නිර්දේශවල දත්ත සැකසීම සඳහා බලපත්‍රයක් අවශ්‍ය වන පාලකවරුන්ගේ සහ දත්ත සකසන්නන්ගේ ප්‍රභේද සහ බලපත්‍රවලට අදාළ උපමාන ඇතුළත් විය යුතු ය.

(3) එම බලපත්‍රවලට අදාළ උපමාන, බලපත්‍ර ප්‍රභේද, නියම සහ කොන්දේසි, ආකෘතිය සහ කාලසීමාව, ඉල්ලුම් කිරීමේ කාර්ය පටිපාටිය, අලුත් කිරීම, අත්හිටුවීම, අවලංගු කිරීම, එම බලපත්‍ර ප්‍රතික්ෂේප කිරීමට, අත්හිටුවීමට හෝ අවලංගු කිරීමට විරුද්ධව අභියාචනය කිරීම සහ අය කළ යුතු ගාස්තු නියෝග මඟින් නියම කරනු ලබන ආකාරයෙන් විය යුතු ය.

(4) එම පාලකවරුන් සහ දත්ත සකසන්නන් විසින් එම බලපත්‍රවලට අදාළ නියම සහ කොන්දේසිවලට අනුකූලව කටයුතු කිරීම අධිකාරිය විසින් සමාලෝචනය කිරීම සහ අධීක්ෂණය කිරීම කරනු ලැබිය හැකි ය.

35. (1) යම් පාලකවරයකු හෝ දත්ත සකසන්නකු-

(අ) මේ පනත උල්ලංඝනය කරමින් යම් දත්ත සැකසීමේ කටයුත්තක යෙදෙන බවට හෝ යෙදීමට නියමිත බවට; හෝ

(ආ) පෞද්ගලික දත්ත සකස් කිරීමට අදාළව, වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ හෝ 52 වන වගන්තියේ (ඈ), (ඉ) හෝ (ඊ) ඡේද යටතේ වන යම් රීතියක්, මේ පනත යටතේ සාදන ලද නියෝගයක්, මාර්ගෝපදේශයක් හෝ නියමයක් උල්ලංඝනය කර ඇති බවට හෝ අනුකූලවීමට අපොහොසත්ව ඇති බවට හෝ උල්ලංඝනය කිරීමට හෝ අනුකූලවීමට අපොහොසත්වීමට නියමිත බවට,

අධිකාරිය වෙත පැමිණිල්ලක් ලැබීම මත හෝ වෙනත් ආකාරයකින් විශ්වාස කිරීමට හේතු පවතින අවස්ථාවක දී, අධිකාරිය විසින් නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි ක්‍රමවේදයකට අනුකූලව විමර්ශනයක් පවත්වනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ පවත්වනු ලබන යම් විමර්ශනයක දී, පාලකවරයාට සහ දත්ත සකසන්නාට කරුණු දැක්වීමට අවස්ථාවක් ලබාදීමෙන් පසුව, නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි යම් කාලයක් ඇතුළත-

(අ) දත්ත සකස් කිරීමට අදාළ ක්‍රියාවක, නොකර හැරීමක හෝ ක්‍රියාකලාපයක නිරත වීම නතර කිරීමට හෝ වැළකී සිටීමට; හෝ

(ආ) තත්ත්වය නිවැරදි කිරීම සඳහා අවශ්‍ය යැයි අධිකාරියේ මතය වන යම් ක්‍රියා සිදු කිරීමට; හෝ

(ඇ) (1) වන උපවගන්තිය යටතේ පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් සිදු කරන ලද උල්ලංඝනය කිරීමක ප්‍රතිඵලයක් ලෙස පාඩුවක්, අලාභයක් හෝ හානියක් විඳ ඇති අගතියට පත් තැනැත්තකුට අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන පරිදි වන්දි ලෙස යම් මුදලක් ගෙවීමට,

එම පාලකවරයාට හෝ දත්ත සකසන්නාට නියම කරමින් එකී පාලකවරයාට හෝ දත්ත සකසන්නාට විධානයක් කරනු ලැබිය හැකි ය.

(3) මේ වගන්තිය යටතේ එවැනි පාලකවරයකුට හෝ දත්ත සකසන්නකුට නිකුත් කරන ලද සෑම විධානයක් ම, ලිඛිතව විය යුතු අතර එම විධානයන් විධාන කරනු ලබන යම් පාලකවරයකු හෝ දත්ත සකසන්නකු වෙත ලියාපදිංචි තැපෑලෙන්, විද්‍යුත් සන්නිවේදනයක් මගින් හෝ අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන වෙනත් යම් සමාන මාර්ගයක් මගින් භාරදිය යුතුය, සහ එම පාලකවරුන් සහ දත්ත සකසන්නන් එම විධානයන්ගෙන් බැඳී සිටිය යුතු අතර, එම විධානය සන්නිවේදනය කරන ලද දින සිට එම විධානයට අනුකූලව කටයුතු කරනු ලැබිය යුතු ය.

VI වන කොටස

අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා සහ කාර්ය මණ්ඩලය

36. (1) මණ්ඩලය විසින්, අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයකු පත් කරනු ලැබිය යුතු අතර ඔහු රාජ්‍ය අංශයට හෝ පෞද්ගලික අංශයට නායකත්වය ලබාදීමෙහි ලා විශිෂ්ටත්වයට පත් සහ වෘත්තීය විශේෂඥතාව පෙන්නුම් කර ඇත්තා වූ ද, තැනැත්තකු විය යුතු ය.

(2) අධ්‍යක්ෂ ජනරාල්වරයා අධිකාරියේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, පාරිශ්‍රමික ඇතුළු අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ සේවා නියුක්ති කොන්දේසි මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(3) යම් තැනැත්තකු-

(අ) අධිකරණයක් හෝ විනිශ්චයාධිකාරයක් විසින් බරපතල විෂමාචාරයකට මින් පෙර වරදකරු ලෙස තීරණය කර ඇත්නම් හෝ නියාමන ආයතනයක් විසින් විනය ක්‍රියාමාර්ගයකට යටත් කර ඇත්නම්;

(ආ) කලින් ධුරයෙන් පහ කරනු ලැබ ඇත්නම්; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලබන නියෝග, රීති හෝ විධාන කඩ කිරීමක් සිදු කර ඇත්නම්,

එකී තැනැත්තා මණ්ඩලය විසින් අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(4) මණ්ඩලයේ සාමාන්‍ය අධීක්ෂණයට සහ පාලනයට යටත්ව, අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින්, අධිකාරියේ කටයුතු සහ ගනුදෙනු මෙහෙයවීම, එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සහ අධිකාරියේ නිලධරයන් සහ සේවා නියුක්තිකයින් පරිපාලනය කිරීම සහ පාලනය කිරීම භාරව කටයුතු කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලය විසින්, පහත දැක්වෙන හේතු කිසිවක් සැලකිල්ලට ගනිමින්, (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද අධ්‍යක්ෂ ජනරාල්වරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය:-

(අ) අධිකාරිය වෙනුවෙන් ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය කරගෙන යාමේ දී යම් සම්බන්ධතා අතර ගැටුමක් ඇතිවීමේ ඉඩකඩ;

(ආ) ඒ තැනැත්තා සිහි විකල් තැනැත්තකු බවට හෝ ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය කරගෙන යාමට නොහැකි තැනැත්තකු බවට පත්වීම;

(ඇ) ඒ තැනැත්තා ස්වකීය කාර්යන්ට හෝ කර්තව්‍යයන්ට අදාළව බරපතල විෂමාචාරය සම්බන්ධයෙන් වරදකරු වීම; හෝ

(ඈ) ඒ තැනැත්තා ස්වකීය කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීමේ දී ස්වකීය ස්වාධීනත්වයට බාධා කිරීමට හැකි යම් කටයුත්තකට සම්බන්ධ වීම හෝ මණ්ඩලයේ සාමාන්‍ය විධානවලට අනුකූල නොවීම:

එසේ වුව ද, එකී ඉවත් කිරීමට පෙරාතුව මණ්ඩලය විසින් අධ්‍යක්ෂ-ජනරාල්වරයාට කරුණු දැක්වීමට අවස්ථාවක් දිය යුතු ය.

37. (1) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, අධිකාරිය විසින්, ස්වකීය කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටු කිරීම සඳහා එය විසින් අවශ්‍ය යයි සලකනු ලබන පරිදි සේවක සංඛ්‍යා තනතුරු ඇති කිරීම සහ නිලධරයන් සහ සේවා නියුක්තිකයින් සේවයේ නියුක්ත කිරීම කරනු ලැබිය හැකි ය. තව ද, අධිකාරිය විසින්, මේ පනතේ විධිවිධාන යටතේ වන ස්වකීය කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීමේ කාර්ය සඳහා එම නිලධරයන්ගේ සහ සේවා නියුක්තිකයින්ගේ වැටුප් සහ වේතන හෝ ඔවුන්ගේ වෙනත් පාරිශ්‍රමික, ප්‍රතිලාභ සහ විශ්‍රාම වැටුප් නියම කරනු ලැබිය හැකි ය.

(2) අධිකාරිය විසින්, තොරතුරු සුරක්ෂිතභාවය, දත්ත විද්‍යාව දත්ත විශ්ලේෂණය, තොරතුරු තාක්ෂණය, මුදල්, නීතිය සහ අනෙකුත් අදාළ විෂයයන් පිළිබඳ තාක්ෂණික සේවක පිරිස පුහුණු කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ ඒ සඳහා අනුග්‍රහය දැක්වීම කරනු ලැබිය යුතු අතර, මේ කාර්යය සඳහා, අධිකාරිය විසින්, නිශ්චය කරනු ලබන පරිදි කුසලතාව පෙන්නුම් කර ඇති අධිකාරියේ නිලධරයන්ගේ සහ සේවා නියුක්තිකයින්ගේ ශ්‍රී ලංකාව තුළ දී හෝ විදේශයන්හි දී සිදු කරන අධ්‍යයන කටයුතුවල වියදම පියවීම සඳහා අධිකාරියට බලය තිබිය යුතු ය.

(3) අධිකාරියේ නිලධරයන්ට සහ සේවා නියුක්තිකයින්ට අදාළ විය යුතු ආචාර ධර්ම පද්ධතියක් අධිකාරිය විසින් සකස් කරනු ලැබිය යුතු ය.

(4) කලින් කලට වෙනස් කිරීමෙන්, පරිච්ඡින්න කිරීමෙන් හෝ සංශෝධනය කිරීමෙන් අධිකාරිය විසින් එම ආචාර ධර්ම පද්ධතිය ප්‍රතිශෝධනය කළ හැකි ය.

(5) යම් තැනැත්තකු-

(අ) අධිකරණයක් හෝ විනිශ්චය අධිකාරයක් විසින් බරපතල විෂමාචාරයක් සම්බන්ධයෙන් මින් පෙර වරදකරු කරනු ලැබ ඇති අවස්ථාවක හෝ යම් නියාමන ආයතනයක් විසින් ගනු ලැබූ විනය ක්‍රියාමාර්ගයකට යටත්ව සිට ඇති අවස්ථාවක;

(ආ) මින් පෙර ධුරයෙන් පහ කරනු ලැබ ඇති අවස්ථාවක; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද නියෝග, රීති හෝ විධාන කඩ කිරීමක් සිදු කර ඇති අවස්ථාවක,

අධිකාරිය විසින් එම තැනැත්තා අධිකාරියේ කාර්ය මණ්ඩලයට පත් කරනු නොලැබිය යුතු ය.

(6) අධිකාරියේ ඉල්ලීම පරිදි රාජ්‍ය සේවයේ යම් නිලධරයකු එම නිලධරයාගේ සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් පිහිටුවන ලද රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ කැමැත්ත ඇතිව අධිකාරිය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් කාල සීමාවක් සඳහා අධිකාරියට තාවකාලිකව පත් කරනු ලැබිය හැකි ය, නැතහොත් එම කැමැත්ත ඇතිව එම කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලැබිය හැකි ය.

(7) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට තාවකාලිකව පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (2) වන උපවගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(8) රාජ්‍ය සේවයේ යම් නිලධරයකු අධිකාරියේ කාර්ය මණ්ඩලයට ස්ථිරව ම පත් කරනු ලබන අවස්ථාවක, 1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තියේ (3) වන උපවගන්තියේ විධිවිධාන එම නිලධරයා සම්බන්ධයෙන් අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ කරගනු ලැබිය යුතු ය.

(9) යම් නිශ්චිත කාලසීමාවක් සඳහා රජය වෙනුවෙන් සේවය කිරීම සඳහා එකඟ වී ඇති යම් තැනැත්තකු අධිකාරිය විසින් සේවයේ යොදවන අවස්ථාවක, එම තැනැත්තා විසින් අධිකාරියේ සේවය කරනු ලබන යම් කාලසීමාවක් එම ගිවිසුමේ බැඳීම් ඉටු කිරීමේ කාර්යය සඳහා රජයට සිදුකරන ලද සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(10) අධිකාරිය විසින්, එහි නිලධරයන්ගේ හෝ සේවා නියුක්තිකයින්ගේ කැමැත්ත ඇතිව, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන කාලසීමාවක් සඳහා ඔවුන් වෙනත් රජයේ ආයතනවලට හෝ ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි නියාමන අධිකාරීන්ට අනුයුක්ත කිරීමට යෝජනා කරනු ලැබිය හැකි අතර, එය එම ආයතනය සහ අධිකාරිය අතර එකඟ වූ පැවරුමක් මත සිදු විය යුතු ය. අනුයුක්ත කරන ලද කාලසීමාව අධිකාරිය වෙනුවෙන් සිදු කරන ලද සේවාවක් ලෙස සලකනු ලැබිය යුතු ය.

VII වන කොටස

දඩ මුදල්

38. (1) පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින්, 35 වන වගන්තියේ විධිවිධාන යටතේ නිකුත් කරනු ලැබූ විධානයකට අනුකූල වීමට අපොහොසත් වන අවස්ථාවක, දත්ත දායකයන් කෙරෙහි වන බලපෑම, අදාළ අනනුකූලතාවන් හි ස්වභාවය සහ ප්‍රමාණය සහ මේ පනතේ 39 වන වගන්තියේ සඳහන් කාරණා සැලකිල්ලට ගැනීමෙන් පසු, අධිකාරිය විසින්, එම පාලකවරයාට හෝ දත්ත සකසන්නාට එක් එක් අනනුකූලතාවක් සඳහා රුපියල් මිලියන දහයකට නොවැඩි දඩ මුදලක් ගෙවීමට දැන්වීමක් මගින් නියම කරනු ලැබිය යුතු ය.

(2) කලින් අවස්ථාවක දී දඩ මුදලකට යටත් වූ තැනැත්තකු වෙනත් යම් පසු අවස්ථාවක දී යම් විධානයකට අනුකූලවීමට අපොහොසත් වන අවස්ථාවක, එම තැනැත්තා විසින්, (1) වන උපවගන්තිය යටතේ ඔහුට පනවනු ලැබිය හැකි දඩ මුදලකට අමතරව දෙවන අවස්ථාවේ දී සහ ඉන්පසු ඊට අනුකූලව කටයුතු නොකළ එක් එක් අවස්ථාව සඳහා දඩ මුදලක් වශයෙන්, පළමු අවස්ථාවේ දී පනවනු ලැබූ ප්‍රමාණය මෙන් දෙගුණයක් වන මුදලකින් සමන්විත අතිරේක දඩ මුදලක් ගෙවීමට යටත් විය යුතු ය.

(3) මේ වගන්තිය යටතේ පනවන ලද දඩ මුදලක් එකතු කිරීම සඳහා අධිකාරිය වගකිව යුතු අතර, එසේ එකතු කරන ලද දඩ මුදල් 35 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධිවිධානවලට අනුකූල නොවීම හේතුවෙන් අගතියට පත් තැනැත්තාට ගෙවිය යුතු වන්දි මුදල ලෙස නිශ්චය කරන ලද යම් මුදලක් ඇත්නම් එය අඩු කිරීමෙන් පසුව ඒකාබද්ධ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(4) (1) වන හෝ (2) වන උපවගන්ති ප්‍රකාරව දඩ මුදලකට යටත් වන තැනැත්තකු, දැන්වීමේ නිශ්චිතව දක්වනු ලැබිය හැකි කාලසීමාව ඇතුළත එම දඩ මුදල ගෙවීමට අපොහොසත් වන්නේ නම්, දඩ මුදල ගෙවීමේ ආඥාවක් සඳහා අධිකාරිය විසින් කොළඹ මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඒකපාර්ශ්වීය ඉල්ලීමක් කරනු ලැබිය යුතු අතර, ඒ ආඥාව කරනු ලැබූ විට, එම අධිකරණය විසින් එහි සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී පනවනු ලැබිය හැකි දඩ මුදල ඉක්මවනු ලබන යම් මුදලක් බව නොතකා, එකී දඩ මුදල එම අධිකරණය විසින් පනවනු ලැබූ දඩයකට සමාන ආකාරයෙන් අය කරගනු ලැබිය යුතු ය.

(5) යම් පාලකවරයකු හෝ දත්ත සකසන්නකු නියාමනය කිරීම සඳහා හෝ අධීක්ෂණය කිරීම සඳහා යම් අදාළ වන ලිඛිත නීතියක් හෝ රීතීන් ප්‍රකාරව පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් කරගෙන යනු ලබන ව්‍යාපාර හෝ වෘත්තීන් අත්හිටුවීම හෝ එකී ව්‍යාපාරය හෝ වෘත්තිය කරගෙන යාමට ප්‍රදානය කර තිබූ බලපත්‍රය අවලංගු කිරීම ඇතුළුව නමුත් ඊට සීමා නොවූ, වෙනත් යම් නියාමන පියවරයන් අදාළ නියාමන හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් විසින් ගනු ලැබීම මේ වගන්තිය යටතේ වන දඩ පැනවීමකින් වළක්වනු නොලැබිය යුතු ය.

(6) මේ වගන්තිය යටතේ පුද්ගල මණ්ඩලයකට දඩ මුදලක් පනවනු ලැබූ අවස්ථාවක දී, එවිට-

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් වන විට, (1) වන උපවගන්තිය යටතේ අනුකූල නොවීම සිදුවන අවස්ථාවේ ඒ සංස්ථාගත මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය කෙරෙහි වගකිව යුතු අධ්‍යක්ෂවරයකු හෝ වෙනත් නිලධරයකු වන සෑම තැනැත්තකු ම;

(ආ) ඒ පුද්ගල මණ්ඩලය හවුල් ව්‍යාපාරයක් වන විට, එම හවුල් ව්‍යාපාරයේ සෑම හවුල්කරුවකු ම; හෝ

(ඇ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත කරනු නොලැබූ මණ්ඩලයක් වන විට, (1) වන උපවගන්තිය යටතේ අනුකූල නොවීම සිදුවන අවස්ථාවේ දී ඒ මණ්ඩලයේ කළමනාකරණය සහ පාලනය කෙරෙහි වගකිව යුතු නිලධරයකු වන සෑම තැනැත්තකු ම,

(1) වන උපවගන්තිය යටතේ වන නියමයන්ට අනුකූල වීමට අපොහොසත් බව සහ ඒ සඳහා අනුකූල බව තහවුරු කිරීම සඳහා ඔහු සියලු නිසි සැලකිල්ලෙන් හා උද්යෝගයෙන් කටයුතු කළ බව ඔහු ඔප්පු කරන්නේ නම් මිස, එකී දඩ මුදල ගෙවීම සඳහා යටත් විය යුතු ය.

(7) මේ වගන්තිය යටතේ පරිපාලනමය දඩ මුදලක් පැනවීම මගින් අගතියට පත් තැනැත්තකු, එකී තැනැත්තාට එම පරිපාලනමය දඩ මුදල පැනවීම සන්නිවේදනය කරනු ලැබූ දින සිට දින විසි එකක් ඇතුළත එකී තීරණයට එරෙහිව අභියාචනාධිකරණය වෙත අභියාචනා කරනු ලැබිය හැකි ය.

(8) මේ වගන්තිය යටතේ යම් අභියාචනයකට අදාළව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 136 වන ව්‍යවස්ථාව යටතේ රීති සාදනු ලබන තෙක්, අභියාචනාධිකරණයට ප්‍රතිශෝධන මාර්ගයෙන් ඉදිරිපත් කරනු ලබන ඉල්ලීමකට අදාළව එම ව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති මේ වගන්තියේ (7) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම අභියාචනයක් සම්බන්ධයෙන් ම අදාළ කරගනු ලැබිය යුතු ය.

(9) (7) වන උපවගන්තිය යටතේ අභියාචනාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන යම් පාලකවරයකු හෝ දත්ත සකසන්නකු, (1) වන හෝ (2) වන උපවගන්ති යටතේ පනවන ලද දඩ මුදලට සමාන මුදලක් ඇප තැන්පතුවක් වශයෙන් අභියාචනාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා ඉදිරියේ මුදලින් තැන්පත් කළ යුතු ය.

(10) (7) වන උපවගන්තිය යටතේ අභියාචනයක් ඉදිරිපත් කරන ලද අවස්ථාවක දී, මේ පනතේ විධිවිධානවලට අනුකූලව ඔහු විසින් ක්‍රියා කළ බව ඔප්පුකිරීමේ භාරය අවස්ථානුකූලව පාලකවරයා හෝ දත්ත සකසන්නා වෙත පැවරී තිබිය යුතු ය.

39. 38 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් කර ඇති මුදල් ප්‍රමාණය ඇතුළු පරිපාලනමය දඩ මුදලක් පැනවීම සඳහා තීරණයක් ගැනීමේ දී පහත දැක්වෙන කරුණු පිළිබඳව අධිකාරිය විසින් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය:-

(අ) අදාළ සැකසීමේ ස්වභාවය, විෂයපථය හෝ අරමුණ සැලකිල්ලට ගනිමින් උල්ලංඝනය කිරීමේ ස්වභාවය, බරපතළකම සහ කාලසීමාව මෙන් ම බලපෑමට ලක් වූ දත්ත දායකයන් සංඛ්‍යාව සහ ඔවුන්ට විඳීමට සිදු වූ හානියේ මට්ටම;

(ආ) දත්ත දායකයන්ට විඳීමට සිදු වූ හානිය අවම කිරීම සඳහා පාලකවරයා හෝ දත්ත සකසන්නා විසින් ගනු ලැබූ යම් ක්‍රියාමාර්ග;

(ඇ) 12 වන වගන්තිය යටතේ පාලකවරයා වෙත නියම කරන ලද දත්ත ආරක්ෂණ කළමනාකරණ වැඩසටහනේ ඵලදායිතාවය;

(ඈ) උල්ලංඝනය කිරීමට පිළියම් කිරීම සඳහා සහ එකී උල්ලංඝනය කිරීමෙන් සිදු විය හැකි අයහපත් ප්‍රතිඵල අවම කිරීම සඳහා අධිකාරිය සමඟ දක්වන සහයෝගීතාවයේ ප්‍රමාණය;

(ඉ) යම් උල්ලංඝනය කිරීමක් මගින් බලපෑමට ලක් වූ පෞද්ගලික දත්ත ප්‍රභේද;

(ඊ) විශේෂයෙන් පාලකවරයා හෝ දත්ත සකසන්නා විසින් උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකාරිය වෙත දැනුම් දී තිබේ ද, එසේ දැනුම් දී තිබේ නම් එය කෙතෙක්දුරට ද සහ උල්ලංඝනය කිරීම පිළිබඳ අධිකාරිය දැනුවත් වූ ආකාරය;

(උ) මේ පනත යටතේ දත්ත පාලකවරයකුගේ හෝ දත්ත සකසන්නකුගේ පූර්වයෙන් වූ අනුකූල නොවීමේ අවස්ථාවන්;

(ඌ) ඍජුවම හෝ අන්‍යාකාරයෙන්, මේ පනත යටතේ හෝ එයින් පැන නැඟී අවස්ථානුකූලව පාලකවරයකු හෝ දත්ත සකසන්නකු විසින් මේ පනත උල්ලංඝනය කිරීම තුළින්, මූල්‍යමය ප්‍රතිලාභ හෝ නොවැළැක්විය හැකි පාඩු වැනි සිදුවීම්වලට අදාළ වන වෙනත් යම් උග්‍රකාරී හෝ ලිහිල් කිරීමේ යම් වෙනත් සාධක.

40. මේ පනතේ විධිවිධාන සඳහා වන යම් නිදහස් කිරීමක්, සීමා කිරීමක් හෝ බලහීන කිරීමක් සඳහා එකී නිදහස් කිරීම, සීමා කිරීම හෝ බලහීන කිරීම යම් නීතියක් මගින් විධිවිධාන සලසනු ලබන අවස්ථාවක සහ මූලික අයිතිවාසිකම් සහ නිදහස යනාදියෙහි හරයට ගරු කිරීම සඳහා සහ-

(අ) ශ්‍රී ලංකා ජනරජයේ ජාතික ආරක්ෂාව, ආරක්ෂණය, මහජන සුරක්ෂිතතාව, මහජන සෞඛ්‍ය, ආර්ථික සහ මූල්‍ය ක්‍රමවල ස්ථීරතාව ආරක්ෂා කිරීම;

(ආ) අධිකරණයේ අපක්ෂපාතිත්වය සහ ස්වාධීනත්වය;

(ඇ) අපරාධ වැරදි වැළැක්වීම, විමර්ශනය කිරීම හෝ නඩු පැවරීම;

(ඈ) අපරාධ දඬුවම් ක්‍රියාත්මක කිරීම; සහ

(ඉ) විශේෂයෙන් අදහස් ප්‍රකාශ කිරීමේ නිදහස සහ තොරතුරු දැන ගැනීමේ අයිතීන් ඇතුළුව සහ තැනැත්තන්ගේ මූලික නිදහස සහ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම,

සඳහා ප්‍රජාතාන්ත්‍රික සමාජයක් තුළ අවශ්‍ය සහ සමානුපාතික පියවර ගනු ලැබීම සඳහා හැර, එවැනි නිදහස් කිරීමකට, සීමා කිරීමකට හෝ බලහීන කිරීමකට ඉඩ ලබාදෙනු නොලැබිය යුතු ය.

VIII වන කොටස

අධිකාරියේ අරමුදල

41. (1) අධිකාරියට (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) එහි ම අරමුදලක් තිබිය යුතු ය.

(2) (අ) අධිකාරියේ ප්‍රයෝජනය සඳහා පාර්ලිමේන්තුව විසින් වෙන් කරනු ලැබිය හැකි සියලු මුදල;

(ආ) මේ පනත යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධිකාරියට ලැබෙන සියලු මුදල්;

(ඇ) මේ පනතේ විධිවිධාන යටතේ ගාස්තු වශයෙන් ගෙවනු ලැබිය හැකි සියලු මුදල්; සහ

(ඈ) ශ්‍රී ලංකාව තුළ දී හෝ ඉන් බැහැරව ඒකාබද්ධ අරමුදලෙන්, රජයෙන් හෝ විදේශ රජයකින් රාජ්‍ය නියෝජ්‍යායතනවලින් සහ බහු පාර්ශ්වික නියෝජ්‍යායතනවලින් ත්‍යාග, ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් අධිකාරියට ලැබෙන සියලු මුදල්,

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ අධිකාරියේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී අධිකාරිය විසින් දරන ලද වියදම් පියවා ගැනීමට අවශ්‍ය කරන සියලු මුදල් ප්‍රමාණයන් අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, ගෙවීම් කිරීම අවශ්‍ය වන සියලු මුදල් ප්‍රමාණයන් අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

(4) අධිකාරියේ අරමුදලට අයත් මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකින් අධිකාරිය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

42. (1) අධිකාරියේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

(2) රාජ්‍ය සංස්ථාවල ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවේ විධිවිධාන අධිකාරියේ ගිණුම් විගණනය කිරීම සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

IX වන කොටස

විවිධ

43. මේ පනත යටතේ අධිකාරියේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී සහ ඉටු කිරීමේ දී එය විසින් දරන ලද යම් වියදමක් පියවීම සඳහා අධිකාරියට අවශ්‍ය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක්, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයාගේ එකඟතාවය ඇතිව අමාත්‍යවරයාගේ කැමැත්ත සහිතව අධිකාරිය විසින් බැංකු අයිරාවක් වශයෙන් හෝ වෙනත් යම් ආකාරයකින් තාවකාලිකව ණයට ලබා ගත හැකිය:

එසේ වුව ද, මේ වගන්තිය යටතේ අධිකාරිය විසින් ලබාගත් යම් ණය මුදල් සම්බන්ධ නොගෙවූ මුදල් ප්‍රමාණයන්ගේ එකතුව, මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක් නොඉක්මවිය යුතු ය.

44. (1) මණ්ඩලය විසින්, මේ පනත යටතේ එහි බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් ලිඛිතව නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කොන්දේසිවලට යටත්ව අධ්‍යක්ෂ ජනරාල්වරයාට හෝ අධිකාරියේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි අතර අධ්‍යක්ෂ ජනරාල්වරයා හෝ ඒ නිලධරයා විසින් මණ්ඩලය විසින් නිකුත් කරනු ලබන යම් විශේෂ හෝ සාමාන්‍ය විධානවලට යටත්ව ඒ බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ සිදු කරන ලද යම් පැවරීමක කුමක් සඳහන් වුව ද, මණ්ඩලය විසින් එසේ පවරන ලද එවැනි යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය හැකි ය.

45. (1) අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් මේ පනත යටතේ ඔහුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් අධිකාරියේ යම් නිලධරයකුට පවරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය පවරනු ලැබුවේ යම් නිලධරයකු වෙත ද, ඒ නිලධරයා විසින් ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් ලබාදෙනු ලබන යම් විධානවලට යටත් ව, ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ සිදුකරන ලද යම් පැවරීමක කුමක් සඳහන් වුව ද, එසේ පවරන ලද යම් බලතල, කාර්ය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ, කිරීමේ සහ ඉටු කිරීමේ බලය අධ්‍යක්ෂ-ජනරාල්වරයාට තිබිය යුතු ය.

46. (1) යම් අධිකරණයක් ඉදිරියේ දී අධිකාරිය විසින් හෝ අධිකාරියට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී අධිකාරිය විසින් දරන ලද සියලු වියදම් අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී අධිකාරියට ගෙවන ලද හෝ අධිකාරිය විසින් අයකරගත් ගාස්තු පමණක් අධිකාරියේ අරමුදලට බැරකරනු ලැබිය යුතු ය.

(2) මේ පනත යටතේ මණ්ඩලයේ සාමාජිකයකු, අධ්‍යක්ෂ-ජනරාල්වරයා හෝ අධිකාරියේ යම් නිලධරයකු හෝ වෙනත් සේවා නියුක්තිකයකු විසින් සිදුකරන ලද හෝ සිදු කරන ලදයි අනුමාන කරන ලද යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් ඉදිරිපිට දී ඒ තැනැත්තා විසින් හෝ ඒ තැනැත්තාට එරෙහිව ඉදිරිපත් කරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩු කටයුත්තක දී ඒ තැනැත්තා විසින් දරන ලද යම් වියදමක් ඒ තැනැත්තා එම ක්‍රියාව සිදුකරනු ලැබුවේ සද්භාවයෙන් යුතුව වන බවට අධිකරණය විසින් තීරණය කරනු ලබන්නේ නම්, ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී ඒ තැනැත්තා විසින් ඒ වියදම් අයකරගනු ලබන්නේ නම් මිස, අධිකාරියේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

47. අමාත්‍යවරයා විසින් කලින් කල අධිකාරියේ කාර්ය සාධනය සමාලෝචනය කරනු ලැබිය යුතු අතර, අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි අධිකාරියේ කටයුතු සහ කාර්යවලට අදාළ යම් වාර්තා ඉදිරිපත් කරන ලෙසට අධිකාරියට නියම කරනු ලැබිය යුතු ය.

48. (1) අධිකාරියේ කාර්ය සාධනය සමාලෝචනය කිරීම සඳහා අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි පරිදි යම් සහායක ලේඛන සමඟ අධිකාරිය විසින් එක් එක් මුදල් වර්ෂය අවසානයේ මාස හයක කාලයක් ඇතුළත ඒ මුදල් වර්ෂය තුළ අධිකාරිය විසින් කරගෙන යන ලද කාර්ය පිළිබඳ වාර්ෂික වාර්තාවක් අමාත්‍යවරයා වෙත භාරදෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ භාරදෙන ලද වාර්තා සහ ලේඛන ලැබුණු දින සිට මාස හයක කාලයක් ඇතුළත ඒ වාර්තාවේ සහ ලේඛනවල පිටපත් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

49. මේ පනත යටතේ අධිකාරිය වෙත පනවන ලද හෝ පවරන ලද යම් කර්තව්‍ය හෝ බලතල ක්‍රියාත්මක කිරීමේ දී හෝ ඉටුකිරීමේ දී සද්භාවයෙන් සිදුකරන ලද කිසිවක් සඳහා, අධිකාරියේ යම් නිලධරයකුට හෝ අධිකාරිය විසින් බලය ලබා දෙනු ලැබූ යම් නිලධරයකුට එරෙහිව කිසිදු සිවිල් හෝ අපරාධ වගකීමක් පනවනු නොලැබිය යුතු ය.

50. අධිකාරියේ සියලු නිලධරයන් සහ සේවා නියුක්තිකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

51. (26 වන අධිකාරය වූ) අල්ලස් පනතේ අර්ථානුකූලව අධිකාරිය උපලේඛනගත ආයතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු අතර, ඒ පනතේ විධිවිධාන ඒ අනුව කියවා තේරුම් ගත යුතු ය.

52. (1) අධිකාරිය පහත සඳහන් කාරණා සම්බන්ධයෙන් රීති සාදනු ලැබිය යුතු ය:-

(අ) විවිධ නිලධරයන්ගේ පත් කිරීමේ යෝජනා ක්‍රම, පත්කිරීම්වල නියම, සේවා නියුක්තිය සහ සේවයෙන් ඉවත් කිරීම සහ අධ්‍යක්ෂ-ජනරාල්වරයාගේ බලතල සහ කර්තව්‍ය ඇතුළුව ඒ විවිධ නිලධරයන්ගේ බලතල, කර්තව්‍ය සහ පාරිශ්‍රමික ගෙවීම්;

(ආ) අධිකාරියේ රැස්වීම් කැඳවීමේ දී සහ පැවැත්වීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය;

(ඇ) අධිකාරියේ කටයුතු කළමනාකරණය කිරීම;

(ඈ) මේ පනතේ II වන කොටස යටතේ දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් ක්‍රියාත්මක කිරීමේ ආකෘතිය සහ ආකාරය;

(ඉ) 17 වන වගන්තිය යටතේ දත්ත දායකයන්ගේ ඉල්ලීම් ප්‍රතික්ෂේප කිරීම සඳහා වූ නිර්ණායක;

(ඊ) මේ පනත යටතේ සෑදිය යුතු බවට නියම කරනු ලබන හෝ බලය ලබාදෙන රීති සම්බන්ධ සියලු කාරණා.

(2) මේ පනතේ V වන කොටසේ විධිවිධාන ක්‍රියාත්මක වීමේ දින සිට මාස විසි හතරක් තුළ, අධිකාරිය විසින් (1) වන උපවගන්තිය යටතේ පළමු වරට රීති සාදනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ (ඈ), (ඉ) සහ (ඊ) ඡේද යටතේ රීති සෑදීමට පෙර අධිකාරිය විසින්, සති දෙකකට නොඅඩු කාලසීමාවක් සඳහා මහජන අදහස් විමසීමක් කරනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තියේ සඳහන් කරනු ලැබූ මහජන අදහස් විමසීමේ කාලසීමාව, අධිකාරිය විසින් නිශ්චිතව සඳහන් කළ හැකි වැඩිදුර කාලසීමාවක් සඳහා දීර්ඝ කරනු ලැබිය හැකි ය.

(5) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ රීතියක්, එය අමාත්‍යවරයා විසින් අනුමත කරන තෙක් සහ අනුමත රීති සහ එකී අනුමත කිරීමේ නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

(6) (1) වන උපවගන්තියේ (ඈ), (ඉ) හෝ (ඊ) ඡේද යටතේ සාදන ලද සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක් එම අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(7) අධිකාරිය විසින් සාදන ලද යම් රීතියක් පරිච්ඡින්න වූ බව සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු ය.

53. (1) අමාත්‍යවරයා විසින් අධිකාරිය විමසා, මේ පනත මගින් නියම කරනු ලැබිය යුතු බවට නියමිත හෝ නියෝග සාදනු ලැබිය යුතු බවට මේ පනත මගින් බලය දී ඇති හෝ සියලු කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය.

(2) විශේෂයෙන් ම සහ (1) වන උපවගන්තිය මගින් පවරන ලද බලතලවල සාමාන්‍ය ව්‍යාප්තියට අගතියක් නොමැතිව, අමාත්‍යවරයා විසින් අධිකාරිය විමසා, පහත දැක්වෙන සියලු හෝ යම් කාරණා සම්බන්ධයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය:-

(අ) I වන, II වන, III වන සහ IV වන උපලේඛන යටතේ වන කොන්දේසි සංශෝධනය කිරීම, එකතු කිරීම හෝ වෙනස් කිරීම;

(ආ) අදාළ වන නීති, දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් සහ නිදහස බලාත්මක කිරීමේ හැකියාව අන්තර්ජාතික බැඳීම් හුවමාරුවන පෞද්ගලික දත්තවලට අදාළ දත්ත දායකයින්ට ඇති ඵලදායී පරිපාලනමය සහ අධිකරණමය සහන සැලකිල්ලට ගෙන 26 වන වගන්තියේ (2) වන උපවගන්තියේ සඳහන් පරිදි ප්‍රමාණවත් මට්ටමේ ආරක්ෂණයක් සහතික කරන තුන්වන රටවල් හඳුනාගැනීම;

(ඇ) මේ පනත යටතේ සපයනු ලැබූ යම් සේවාවක් සඳහා අය කළ යුතු ගාස්තු සහ අයකිරීම් නිශ්චිතව දක්වමින්;

(ඈ) මේ පනත යටතේ නිකුත් කළ යුතු බලපත්‍ර වර්ග සහ උපමාන නිශ්චිතව දක්වමින්;

(ඉ) ඒ බලපත්‍රවල නියම, කොන්දේසි, ආකෘතිය සහ කාලය, අයදුම් කිරීම සඳහා වන කාර්ය පටිපාටිය, අලුත්කිරීම, තාවකාලිකව අත්හිටුවීම, අහෝසිකිරීම සහ ඒ බලපත්‍ර ප්‍රතික්ෂේප කිරීමට, තාවකාලිකව අත්හිටුවීමට හෝ අහෝසිකිරීමට එරෙහිව අභියාචනා කිරීම සම්බන්ධයෙන් විධිවිධාන සලස්වමින්;

(ඊ) බලපත්‍ර නිකුත් කිරීම සඳහා වන ගාස්තු නිශ්චිතව දක්වමින්;

(උ) දත්ත දායකයන්ගේ පෞද්ගලික දත්ත ආරක්ෂා කිරීම සම්බන්ධ අයිතිවාසිකම් සහ නිදහස සඳහා සුදුසු ආරක්ෂණයක් සැපයීම සඳහා වන කොන්දේසි නිශ්චිතව දක්වමින්;

(ඌ) මේ පනතේ විධිවිධාන යටතේ අධිකාරිය වෙත කරනු ලැබිය හැකි අභියාචනයන් හි ආකෘතිය සහ ආකාරය නිශ්චිතව දක්වමින්.

(3) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එසේ පළ කළ දිනයෙහි හෝ ඒ නියෝගයේ නිශ්චිතව සඳහන් යම් පසු දිනයක සිට හෝ ක්‍රියාත්මක විය යුතු ය.

(4) (1) වන උපවගන්තිය යටතේ සාදන ලද සෑම නියෝගයක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමෙන් මාස තුනක් ඇතුළත අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එම අනනුමතයේ දින සිට, එහෙත් ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

(5) අමාත්‍යවරයා විසින් සාදන ලද යම් නියෝගයක් අවලංගු වූ බව සලකනු ලබන දිනය පිළිබඳ දැන්වීම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු ය.

54. මේ පනතේ අධිකාරි බලය යටතේ පත් කරනු ලැබූ සෑම තැනැත්තකු ම ඔහුගේ කාර්ය කිරීම ආරම්භ කිරීමට පෙර මේ පනත යටතේ ඔහුගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ දී, කිරීමේ දී හෝ ඉටු කිරීමේ දී ඔහුට දැන ගැනීමට ලැබිය හැකි යම් තොරතුරක් සම්බන්ධයෙන් තමා දැඩි රහස්‍යතාව පිළිපදින බවට පොරොන්දු වෙමින් ප්‍රකාශයක් අත්සන් කළ යුතු අතර, එකී යම් තොරතුරක්-

(අ) අධිකරණයක් විසින් හෙළිදරව් කරන ලෙස නියම කරනු ලැබූ විට; හෝ

(ආ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක යම් විධිවිධානයක් සමඟ අනුකූල වීම සඳහා,

හැර හෙළිදරව් නොකරන බවට ඒ ප්‍රකාශය මගින් පොරොන්දු විය යුතු ය.

55. (1) මේ පනතේ හෝ මේ පනත යටතේ සාදනු ලැබූ රීති, නියෝග හෝ නියමයන්හි විධිවිධාන බලාත්මක කිරීමේ දී යම් දුෂ්කරතාවයක් පැන නැඟුනහොත්, අමාත්‍යවරයා විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ නියමයක් මගින්, දුෂ්කරතාව ඉවත් කිරීම සඳහා අවශ්‍ය හෝ අවස්ථානුකූල බවට අමාත්‍යවරයාට පෙනී යන පරිදි මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධාන සමඟ අනනුකූල නොවන යම් විධිවිධාන සාදනු ලැබිය හැකි ය:

එසේ වුව ද, මේ පනත බලාත්මක වීමේ දින සිට වසර පහක කාලයක් ඉක්මයාමෙන් පසු එවැනි නියමයක් සෑදීම නොකළ යුතු ය.

(2) මේ වගන්තිය යටතේ සාදනු ලැබූ සෑම නියමයක් ම, එය සාදනු ලැබීමෙන් පසු මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු ය.

X වන කොටස

අර්ථ නිරූපණය

56. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙ හි-

"හඳුනාගැනීමේ ලක්ෂණ ඉවත් කිරීම" යන්නෙන්, පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් වන විට, පෞද්ගලික දත්තවලින් යම් හඳුනාගැනීමේ ලක්ෂණ එම පෞද්ගලික දත්ත යම් හඳුනාගත් හෝ හඳුනාගත හැකි ස්වාභාවික තැනැත්තකු හා සම්බන්ධ වීම ස්ථිර ලෙස ඉවත් කිරීම අදහස් වේ;

"ස්වයංක්‍රීය දත්ත සැකසීම" යන්නෙන්, අතින් සිදු කරන දත්ත සැකසීමකට අයත් නොවන දත්ත සැකසීමක් අදහස් වේ;

"ජෛව මිතික දත්ත" යන්නෙන්, මුහුණෙහි ප්‍රතිරූපය හෝ ඇඟිලි සලකුණු, ඩැක්ටිලොස්කොපික් (dactyloscopic) දත්ත, හෝ ඇසේ කළු ඉංගිරියාවට අදාළ දත්ත ඇතුළත් වන යම් ස්වභාවික පුද්ගලයකුගේ අනන්‍ය හඳුනාගැනීමකට ඉඩ ලබාදෙන හෝ තහවුරු කරන එම ස්වාභාවික තැනැත්තාගේ භෞතික, කායික විද්‍යාමය හෝ හැසිරීම් ස්වභාවයන්ට අදාළ නිශ්චිත හෝ තාක්ෂණික සැකසීම්වලින් ජනනය වූ පෞද්ගලික දත්ත අදහස් වේ;

"සහතික කිරීමේ ආයතන" යන්නෙන්, පෞද්ගලික දත්ත සැකසීම හෝ දත්ත ආරක්ෂණ නිලධරයන්ගේ සුදුසුකම් සම්බන්ධයෙන් සහතික කිරීමේ සේවා සපයන දේශීය හෝ විදේශීය ආයතන අදහස් වේ;

"ළමයා" යන්නෙන්, වයස අවුරුදු දහසයට අඩු ස්වාභාවික තැනැත්තකු අදහස් වේ;

"කැමැත්ත" යන්නෙන්, ඔහුගේ පෞද්ගලික දත්ත සැකසීම සඳහා ලිඛිත ප්‍රකාශයක් ආකාරයෙන් හෝ අනුමත කරන ක්‍රියාවක් ආකාරයෙන් දත්ත දායකයකුගේ එකඟතාවය පළ කරන යම් නිර්බාධිතව ලබාදුන්, නිශ්චිත, දන්වන ලද සහ පැහැදිලි දැක්වීමක් අදහස් වේ;

"පාලකවරයා" යන්නෙන්, තනිවම හෝ අන් අය සමඟ ඒකාබද්ධව පෞද්ගලික දත්ත සැකසීමේ අරමුණු සහ ක්‍රම නිශ්චය කරනු ලබන යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, පොදු අධිකාරියක්, රාජ්‍ය සංස්ථාවක්, රාජ්‍ය නොවන සංවිධානයක්, නියෝජිත ආයතනයක් හෝ වෙනත් යම් මණ්ඩලයක් හෝ අස්ථිත්වයක් අදහස් වේ;

"පෞද්ගලික දත්ත දේශසීමා හරහා සංචලනය" යන්නෙන්, තුන්වන රටක දී සකස් කිරීම සඳහා ශ්‍රී ලංකා දේශ සීමාවෙන් පිටතට සිදුවන පෞද්ගලික දත්ත සංචලනය අදහස් වේ;

"ඩැක්ටිලොස්කොපික් දත්ත" යන්නෙන්, ඇඟිලි සලකුණු වලට අදාළ දත්ත අදහස් වේ;

"සෞඛ්‍ය පිළිබඳ දත්ත" යන්නෙන්, ඔහුගේ සෞඛ්‍ය තත්ත්වය හෝ ස්වභාවය පෙන්නුම් කරන යම් තොරතුරක් ඇතුළුව ස්වාභාවික තැනැත්තකුගේ කායික හෝ මානසික සෞඛ්‍යයට අදාළ පෞද්ගලික දත්ත අදහස් වේ;

"දත්ත ආරක්ෂණ අධිකාරිය" යන්නෙන්, මේ පනතේ 28 වන වගන්තියේ විධිවිධාන යටතේ පිහිටුවන ලද අධිකාරිය අදහස් වේ;

"දත්ත ආරක්ෂණ නිලධරයා" යන්නෙන්, මේ පනතේ 20 වන වගන්තිය යටතේ නම් කරන ලද හෝ පත් කරන ලද තැනැත්තා අදහස් වේ;

"දත්ත දායකයා" යන්නෙන්, පෞද්ගලික දත්ත අදාළ වන, ජීවත්වන හෝ මිය ගිය, හඳුනාගත් හෝ හඳුනාගත හැකි ස්වාභාවික තැනැත්තකු අදහස් වේ;

"හඳුනාගත හැකි ස්වාභාවික තැනැත්තකු" යන්නෙන්, විශේෂයෙන් යම් පෞද්ගලික දත්තවලට අදාළව සෘජුවම හෝ අන්‍යාකාරයෙන් හඳුනාගත හැකි තැනැත්තකු අදහස් වේ;

"දත්ත කේතනය" යන්නෙන්, යම් දත්ත අනවසරයෙන් භාවිත කරන්නන් හට අවබෝධකර ගත නොහැකි වන පරිදි පරිගණක විද්‍යාවේ දී භාවිත කෙරෙන ගණිතමය ක්‍රම භාවිත කරමින් එම දත්ත කේතාංකනය කිරීමේ හෝ වෙනස් කිරීමේ ක්‍රියාව අදහස් වේ;

"මූල්‍ය දත්ත" යන්නෙන්, යම් දත්ත දායකයකු විසින් විවෘත කරන ලද ගිණුමක් හඳුනාගත හැකි යම් අක්ෂරාංක හඳුන්වනයක් හෝ වෙනත් පෞද්ගලික දත්ත හෝ දත්ත දායකයකු වෙත යම් මූල්‍ය ආයතනයක් විසින් නිකුත් කරන ලද කාඩ්පතක් හෝ

ගෙවීම් උපකරණයක් හෝ මූල්‍ය ආයතනයක් සහ දත්ත දායකයකු අතර ඇති සම්බන්ධතාවයට අදාළ යම් පෞද්ගලික දත්ත, දත්ත දායකයකුට අදාළ මූල්‍ය තත්ත්වය සහ ණය ඉතිහාසය අදහස් වන අතර, පාරිශ්‍රමිකවලට අදාළ දත්ත ද ඊට ඇතුළත් වේ;

"ජානමය දත්ත" යන්නෙන්, යම් ස්වාභාවික තැනැත්තකුගේ ජෛව සාම්පලයක හෝ සිරුරේ යම් තරලයක විශ්ලේෂණයක ප්‍රතිඵල වශයෙන් ලබා ගන්නා එම ස්වාභාවික තැනැත්තාගේ කායික විද්‍යාත්මක හෝ සෞඛ්‍යය පිළිබඳ අනන්‍ය වූ තොරතුරු ලබා දෙන්නා වූ යම් ස්වාභාවික තැනැත්තකුගේ ජානමය ලක්ෂණවලට අදාළ පෞද්ගලික දත්ත අදහස් වේ;

"පළාත් පාලන ආයතන" යන්නෙන්, මහනගර සභාවක්, නගර සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් අදහස් වන අතර ඊට එකී යම් සභාවක් හෝ ප්‍රාදේශීය සභාවක් විසින් ක්‍රියාත්මක කරනු ලැබූ, සිදු කරනු ලැබූ හෝ ඉටු කරනු ලැබූ බලතල, කාර්ය සහ කර්තව්‍යවලට අනුරූපී හෝ සමාන බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා යම් නීතියක් මගින් හෝ යම් නීතියක් යටතේ ඇති කරනු ලැබූ හෝ පිහිටුවනු ලැබූ යම් අධිකාරියක් ඇතුළත් වේ;

"අමාත්‍යවරයා" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 44 හෝ 45 වන ව්‍යවස්ථා යටතේ පෞද්ගලික දත්ත ආරක්ෂණය යන විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා අදහස් වේ;

"පෞද්ගලික දත්ත" යන්නෙන්-

(අ) යම් නාමයක්, හඳුනාගැනීමේ අංකයක්, මූල්‍ය දත්තයක්, ස්ථානීය දත්තයක් හෝ යම් මාර්ගගත හඳුන්වනයක් වැනි යම් හඳුන්වනයක්; හෝ

(ආ) එම පුද්ගලයාගේ හෝ ස්වභාවික තැනැත්තාගේ කායික විද්‍යාත්මක, කායික, ජානමය, මානසික, ආර්ථික, සංස්කෘතික හෝ සමාජයීය අනන්‍යතාවයට විශේෂිත වූ සාධක එකක් හෝ වැඩි ප්‍රමාණයක්,

ආශ්‍රයෙන්, ඍජුව හෝ අන්‍යාකාරයෙන් යම් දත්ත දායකයකු හඳුනාගත හැකි යම් තොරතුරක් අදහස් වේ;

"පෞද්ගලික දත්ත කඩ කිරීම" යන්නෙන්, සම්ප්‍රේෂණය කරන ලද, ගබඩා කරන ලද හෝ අන්‍යාකාරයකින් සකසන ලද පෞද්ගලික දත්ත, අහම්බෙන් හෝ නීති විරෝධී ලෙස විනාශ කිරීම, නැති වීම, වෙනස් කිරීම, අනවසරයෙන් අනාවරණය කිරීම හෝ අනවසරයෙන් එම දත්තවලට ප්‍රවේශ වීම සිදු කෙරෙන යම් ක්‍රියාවක් කිරීමක් හෝ නොකර හැරීමක් අදහස් වේ;

"වාර්ගික හෝ ජනවාර්ගික සම්භවය පිළිබඳ හෙළිකරන පෞද්ගලික දත්ත" යන්නෙන්, යම් ස්වභාවික තැනැත්තකුගේ ජාතිය හෝ ජනවාර්ගිකත්වය නිරූපණය විය හැකි හෝ ඊට අදාළ විය හැකි, ඡායාරූප ද ඇතුළත්, යම් පෞද්ගලික දත්ත අදහස් වේ;

"නියමිත" යන්නෙන්, මේ පනත යටතේ සාදන ලද නියෝග මගින් නියම කිරීම අදහස් වේ;

"දත්ත සැකසීම" යන්නෙන්, පෞද්ගලික දත්ත එකතු කිරීම, ගබඩා කිරීම, සුරක්ෂිත කිරීම, වෙනස් කිරීම, නැවත ලබා ගැනීම, හෙළි කිරීම, සම්ප්‍රේෂණය කිරීම, ලබා ගැනීමට සැලැස්වීම, මැකීම, විනාශ කිරීම, විමසීම, පෙළ ගැස්වීම, සංයුක්ත කිරීම හෝ ඒවා පිළිබඳව තාර්කික හෝ අංක ගණිතමය මෙහෙයුම් සිදු කිරීම ඇතුළත් වන නමුත් ඒවාටම පමණක් සීමා නොවන පෞද්ගලික දත්ත සම්බන්ධයෙන් කරනු ලබන යම් මෙහෙයුමක් අදහස් වේ;

"දත්ත සකසන්නා" යන්නෙන්, පාලකවරයා වෙනුවට පෞද්ගලික දත්ත සැකසීම සිදුකරන යම් ස්වාභාවික හෝ නෛතික තැනැත්තකු, රාජ්‍ය ආයතනයක් හෝ ලිඛිත නීතියක් මගින් හෝ ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද වෙනත් ආයතනයක් අදහස් වේ;

සැක දුරු කිරීම සඳහා දත්ත සකසන්නකු, පාලකවරයාගෙන් වෙන් වූ අස්ථිත්වයන් හෝ තැනැත්තකු විය යුතු සහ පාලකවරයාගේ යම් ධුරාවලි පාලනයකට යටත් තැනැත්තකු නොවිය යුතු අතර, එයට එක් අංශයක් විසින් තවත් අංශයක් වෙනුවෙන් දත්ත සැකසීම හෝ යම් සේවා නියුක්තයකු විසින් ඔවුන්ගේ සේව්‍යයා වෙනුවෙන් දත්ත සැකසීම වැනි වූ අභ්‍යන්තරව සිදු කෙරෙන දත්ත සැකසීම ඇතුළත් නොවේ;

නිදර්ශනය "ඒ" නමැති රෝහලක් විසින් එහි රෝගීන්ගේ වාර්තා පිළිබඳ විශ්ලේෂණ කළමනාකරණය කිරීම සඳහා සේවා නියුක්තිකයකු වශයෙන් දත්ත විද්‍යාඥවරයකු සේවයේ නියුක්ත කරයි. රෝහලේ රෝගීන්ගේ වාර්තා "බී" නමැති සමාගම මගින් සත්කාරකත්වය දරනු ලබන, තෙවන පාර්ශ්වයේ දේශීය දත්ත ගබඩා කරන වේදිකාවක තැන්පත් කිරීමට රෝහල තීරණය කර ඇත. "ඒ" නමැති රෝහල යනු පාලකවරයා ය. "බී" නමැති සමාගම යනු රෝගීන්ගේ වාර්තා කළමනාකරණය සම්බන්ධයෙන් වන දත්ත සකසන්නා ය. රෝහලේ දත්ත විද්‍යාඥවරයා යනු පාලකවරයාගේ සේවා නියුක්තිකයකු පමණක් වන අතර දත්ත සකසන්නකු නොවන්නේ ය;

"පුද්ගල පැතිකඩ දැක්වීම" යන්නෙන්, දත්ත දායකයකුගේ රැකියාවේ කාර්ය සාධනය, ආර්ථික තත්ත්වය, සෞඛ්‍යය, පෞද්ගලික මනාපයන්, සම්බන්ධතාවයන්, විශ්වසනීයත්වය, හැසිරීම, ගති පැවතුම්, සිටින ස්ථානය හෝ චලනයන් සැලකිල්ලට ගෙන ඇගයීම, විශ්ලේෂණය කිරීම හෝ අනාවැකි පළ කිරීම සඳහා සිදුකරන පෞද්ගලික දත්ත සැකසීම අදහස් වේ;

"ව්‍යාජ නාමකරණය" යන්නෙන්, යම් දත්ත දායකයකු හඳුනා ගැනීම සඳහා, අතිරේක තොරතුරු භාවිතයෙන් තොරව යම් පෞද්ගලික දත්තයන් භාවිත කළ නොහැකි වන සහ එම අතිරේක තොරතුරු වෙන්ව තබා සහ එම පෞද්ගලික දත්ත යම් දත්ත දායකයකු වෙත ආරෝපණය නොවන බවට තහවුරු කිරීම සඳහා තාක්ෂණික සහ සංවිධානාත්මක පියවරවලට යටත් වන යම් ආකාරයකින් එම පෞද්ගලික දත්ත සැකසීම අදහස් වේ;

"පොදු අධිකාරය" යන්නෙන්, අමාත්‍යාංශයක්, රජයේ දෙපාර්තමේන්තුවක්, පළාත් සභාවක්, පළාත් පාලන ආයතනයක්, ව්‍යවස්ථාපිත මණ්ඩලයක් හෝ යම් ලිඛිත නීතියක් මගින් පිහිටුවන ලද යම් ආයතනයක් හෝ පළාත් සභාවක් විසින් පිහිටුවන ලද හෝ නිර්ණය කරන ලද අමාත්‍යාංශයක්, යම් දෙපාර්තමේන්තුවක් හෝ වෙනත් අධිකාරියක් හෝ ආයතනයක් අදහස් වේ;

"අදාළ නියාමන හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලය" යන්නෙන්, මේ පනතේ 26 වන, 27 වන සහ 38 වන වගන්තිවල කාර්ය සඳහා අධීක්ෂණ කර්තව්‍ය ඉටුකරනු ලබන අමාත්‍යාංශයක් ඇතුළුව යම් ලිඛිත නීතියක් යටතේ පිහිටුවන ලද, පාලකවරයා නියාමනය කරන, පාලකවරයා වෙත බලය ලබා දෙන හෝ පාලකවරයා අධීක්ෂණය කරන නියාමන හෝ ව්‍යවස්ථාපිත මණ්ඩලයක් අදහස් වේ;

"ප්‍රතිග්‍රාහකයා" යන්නෙන්, පෞද්ගලික දත්ත අනාවරණය වන්නා වූ ස්වභාවික හෝ නෛතික තැනැත්තකු, පොදු අධිකාරයක් හෝ යම් සංස්ථාපිත හෝ සංස්ථාපිත නොකළ මණ්ඩලයක් අදහස් වේ;

"පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේද" යන්නෙන්, වාර්ගික හෝ ජනවාර්ගික සම්භවය, දේශපාලනික මත, ආගමික හෝ දාර්ශනික විශ්වාස හෙළිකරන පෞද්ගලික දත්ත, යම් ස්වභාවික තැනැත්තකු අනන්‍ය ලෙස හඳුනා ගැනීමේ කාර්යය සඳහා සකස් කරන ජානමය, ජෛවමිතික දත්ත, සෞඛ්‍යය සම්බන්ධ දත්ත හෝ යම් ස්වාභාවික තැනැත්තකුගේ ලිංගික ජීවිතය හෝ ලිංගික හැඩගැස්ම සම්බන්ධ දත්ත, වැරදි, අපරාධ නඩු කටයුතු සහ වරදකරු කරනු ලැබීම් සම්බන්ධ පෞද්ගලික දත්ත සහ ළමයකුට අදාළ පෞද්ගලික දත්ත අදහස් වේ;

"ශ්‍රී ලංකාව" යන්නෙන්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 5 වන ව්‍යවස්ථාව මගින් නියම කර ඇති පරිදි ශ්‍රී ලංකාවේ දේශ සීමාවන් අදහස් වන අතර, එයට, ශ්‍රී ලංකාවේ දේශීය ජල තීරය හෝ ගුවන් අවකාශය, ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කළ යම් නෞකාවක් හෝ ගුවන් යානාවක්, ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටි ශ්‍රී ලංකා දූත මණ්ඩලයක හෝ එවැනි කාර්යාලයක ප්‍රධානියාගේ, දූත මණ්ඩල ප්‍රධානීගේ නියෝජිතගේ හෝ එම දූත මණ්ඩලයේ ඕනෑම සාමාජිකයකුගේ නිවස පිහිටි ස්ථානය අයත් පරිශ්‍රයක් හෝ ශ්‍රී ලංකා රජයේ හෝ ශ්‍රී ලංකාව තුළ පිහිටුවන ලද සහ ශ්‍රී ලංකාවෙන් පිටත පිහිටා ඇති යම් ව්‍යවස්ථාපිත මණ්ඩලයක පාලනයට හෝ නතු කරගැනීමකට යටත්, යම් පරිශ්‍රයක් ඇතුළත් වේ;

"තෙවන රට" යන්නෙන්, දේශසීමා හරහා දත්ත සංචලනය සඳහා 26 වන වගන්තියෙන් නියම කරනු ලබන රටක් අදහස් වේ;

"තෙවන පාර්ශ්වය" යන්නෙන්, පෞද්ගලික දත්ත සැකසීම සඳහා බලය ලබා දෙනු ලැබූ දත්ත දායකයා, පාලකවරයා, දත්ත සකසන්නා සහ පාලකවරයාගේ හෝ දත්ත සකසන්නාගේ සෘජු අධිකාරී බලය යටතේ වන තැනැත්තන් නොවන ස්වභාවික හෝ නෛතික තැනැත්තකු, රාජ්‍ය ආයතනයක්, නියෝජිත මණ්ඩලයක් හෝ ආයතනයක් අදහස් වේ.

"ලිඛිත" යන්නට අතින් හෝ විද්‍යුත් ආකාරයෙන් ලියන ලද ලේඛනයක් ඇතුළත් වේ.

57. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

(5(අ) වන වගන්තිය)

I වන උපලේඛනය

නීත්‍යනුකූල දත්ත සැකසීම සඳහා වන කොන්දේසි

(අ) දත්ත දායකයා විසින් ඔහුගේ පෞද්ගලික දත්ත සැකසීම සඳහා කැමැත්ත ලබා දී ඇත; හෝ

(ආ) දත්ත දායකයා පාර්ශ්වයක් වන ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම සඳහා හෝ ගිවිසුමකට එළඹීමට පෙරාතුව දත්ත දායකයාගේ ඉල්ලීම මත අවශ්‍ය පියවර ගැනීම සඳහා දත්ත සැකසීම අවශ්‍ය වේ; හෝ

(ඇ) යම් ලිඛිත නීතියක් යටතේ පාලකවරයා හෝ දත්ත සකසන්නා යටත් වන්නා වූ නෛතික වගකීමකට අනුකූල වීම සඳහා දත්ත සැකසීම අවශ්‍ය වේ; හෝ

(ඈ) දත්ත දායකයාගේ හෝ වෙනත් ස්වභාවික තැනැත්තකුගේ ජීවිතයට, සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට තර්ජනයක් වන හදිසි අවස්ථාවකට ප්‍රතිචාර දැක්වීම සඳහා දත්ත සැකසීම අවශ්‍ය වේ; හෝ

(ඉ) මහජන සුබසිද්ධිය උදෙසා සිදු කරනු ලබන යම් කාර්යයක් ඉටු කිරීම සඳහා හෝ යම් චක්‍රලේඛයක්, මග පෙන්වීමක් හෝ රජය මගින් නිකුත් කළ සංග්‍රහයක් මගින් හෝ යම් ලිඛිත නීතියක් මගින් හෝ යටතේ පාලකවරයා වෙත පවරා දී හෝ පනවනු ලැබ ඇති බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාවට නැංවීමේ දී දත්ත සැකසීම අවශ්‍ය වේ; හෝ

(ඊ) විශේෂයෙන් ම දත්ත දායකයා ළමයකු වන අවස්ථාවක දී, පෞද්ගලික දත්ත සුරක්ෂිත කිරීම අවශ්‍ය වන, දත්ත දායකයාගේ අපේක්ෂාව මගින් පාලකවරයාගේ අපේක්ෂාවන් බලහීන කරන අවස්ථාවන්හි දී හැර, පාලකවරයා විසින් හෝ තුන්වන පාර්ශ්වයක් විසින් අනුගමනය කරනු ලබන නීත්‍යනුකූල අපේක්ෂාවන් පිළිබඳ කාර්ය සඳහා දත්ත සැකසීම අවශ්‍ය වේ;

(උ) මේ උපලේඛනයේ (ඉ) අයිතමයේ කාර්යය සඳහා "මහජන සුබසිද්ධිය" යන්නට-

(i) මහජන සෞඛ්‍ය වැනි සෞඛ්‍ය අරමුණු සහ සමාජ ආරක්ෂණය සඳහා සහ සෞඛ්‍ය සත්කාර සේවා කළමනාකරණය සඳහා පෞද්ගලික දත්ත සැකසීම;

(ii) බෝවන රෝග පාලනය කිරීම සහ සෞඛ්‍යයට ඇති වෙනත් බරපතළ තර්ජන සඳහා පෞද්ගලික දත්ත සැකසීම;

(iv) නීතිය මගින් නියම කර ඇති අරමුණු සපුරා ගැනීම සඳහා රාජ්‍ය අධිකාරීන් විසින් පෞද්ගලික දත්ත සැකසීම,

ඇතුළත් වේ.

(ඌ) මේ උපලේඛනයේ (ඊ) අයිතමයේ කාර්යය සඳහා "නීත්‍යානුකූල අපේක්ෂාව" යන්නට-

(i) දත්ත දායකයා සේවාදායකයකු වන අවස්ථාවක දී හෝ පාලකවරයාගේ සේවයේ සිටින අවස්ථාවක දී දත්ත සැකසීම;

(ii) පෞද්ගලික දත්ත එකතු කරනුයේ යම් කාර්යයක් සඳහා ද සහ යම් කාලසීමාවක දී ද එම කාර්යය සඳහා දත්ත සැකසීම සිදුවිය හැකි බවට දත්ත දායකයා සාධාරණව අපේක්ෂා කරනු ලැබීම;

(iii) වංචා වැළැක්වීම් කාර්ය සඳහා නිශ්චිතව අවශ්‍ය වන පෞද්ගලික දත්ත සැකසීම;

(iv) තොරතුරු ජාල සහ තොරතුරුවල සුරක්ෂිතතාව තහවුරු කිරීමේ කාර්යය සඳහා නිශ්චිතව අවශ්‍ය වන සහ අනුකූලවන ප්‍රමාණයට පෞද්ගලික දත්ත සැකසීම,

ඇතුළත් වේ.

(5 (ආ) වන වගන්තිය)

II වන උපලේඛනය

පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේද වල සැකසීම සඳහා වන කොන්දේසි

(අ) අදාළ දත්ත දායකයාගේ කැමැත්ත කුමක් වුව ද, යම් පෞද්ගලික දත්තවල විශේෂ ප්‍රභේද වල සැකසීම වෙනත් යම් ලිඛිත නීතියකින් තහනම් කරනු ලබන්නේ නම් මිස, දත්ත සැකසීමේ අවස්ථාවේ දී පාලකවරයා විසින් නිශ්චිතව දක්වනු ලබන කාර්ය එකක් හෝ වැඩි ගණනක් සඳහා එකී දත්ත සැකසීමට දත්ත දායකයා විසින් කැමැත්ත ලබා දී ඇත. ළමයකු සම්බන්ධයෙන් වන විට, කැමැත්ත යන්නෙන් එම ළමයාගේ දෙමව්පියන්ගෙන් කෙනෙකුගේ හෝ එම ළමයාගේ නෛතික භාරකරුගේ කැමැත්ත අදහස් විය යුතු ය; හෝ

(ආ) විශ්‍රාම වැටුප් ඇතුළුව සේවා නියුක්තිය, සමාජ සුරක්ෂිතභාවය පිළිබඳ ක්ෂේත්‍රවල දී, පාලකවරයාගේ වගකීම ඉටු කිරීමේ සහ දත්ත දායකයාගේ අයිතිවාසිකම් ක්‍රියාවට නැංවීමේ කාර්යය සඳහා සහ දත්ත දායකයාගේ අයිතිවාසිකම් සඳහා උචිත ආරක්ෂණයන් සම්බන්ධයෙන් විධිවිධාන සලස්වන යම් ලිඛිත නීතියක විධිවිධාන සලස්වනු ලබන තාක් දුරට මහජන ආරක්ෂක, ළඟාවිය හැකි වෙනත් හදිසි අවස්ථාවලට අදාළ පොදු අනතුරු අඟවන පද්ධති හා අධීක්ෂණය, බෝවන රෝග සහ මහජන සෞඛ්‍යය කෙරෙහි ඇති වෙනත් බරපතල තර්ජන වැළැක්වීම හෝ පාලනය කිරීම සහ මහජන සෞඛ්‍යය ආරක්ෂණ සේවා කළමනාකරණය වැනි මහජන සෞඛ්‍ය අරමුණු සඳහා දත්ත සැකසීම අවශ්‍ය වන විට; හෝ

(ඇ) දත්ත දායකයාට සිය කැමැත්ත ලබා දීම සඳහා ශාරීරිකව හෝ නෛතිකමය වශයෙන් නොහැකියාවක් පවතින අවස්ථාවක දී, දත්ත දායකයාගේ හෝ වෙනත් ස්වාභාවික තැනැත්තකුගේ ජීවිතයකට, සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට තර්ජනයක් වන හදිසි අවස්ථාවකට ප්‍රතිචාර දැක්වීම සඳහා දත්ත සැකසීම අවශ්‍ය වන විට; හෝ

(ඈ) දත්ත සැකසීම, දත්ත දායකයා විසින් පැහැදිලි ලෙසම ප්‍රසිද්ධ කර ඇති පෞද්ගලික දත්තවලට අදාළවන විට; හෝ

(ඉ) යම් අධිකරණයක් හෝ විනිශ්චයාධිකරණයක් හෝ යම් සමාන විනිශ්චය සභාවක් ඉදිරියේ හෝ අධිකරණයන් විසින් ඒවායෙහි අධිකරණ බලය තුළ කටයුතු කරන කවර හෝ අවස්ථාවක දී නෛතික හිමිකම්පෑම් ස්ථාපනය කිරීම, ක්‍රියාවට නැංවීම හෝ ආරක්ෂාව සඳහා දත්ත සැකසීම අවශ්‍ය වන විට; හෝ

(ඊ) දත්ත දායකයාගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් සුදුසු සහ විශේෂිත පියවර සපයන අතරතුර දී අනුග මනය කරනු ලබන ඉලක්කය සඳහා අවශ්‍ය විය යුතු සහ ඊට සමානුපාතික විය යුතු, යම් ලිඛිත නීතියක හෝ I වන උපලේඛනයේ (උ) වන අයිතමය යටතේ නිශ්චය කර ඇති පරිදි මහජන යහපත සඳහා විධිවිධාන සලස්වා ඇති පරිදි යම් කාර්යයක් සඳහා දත්ත සැකසීම අවශ්‍ය වන විට; හෝ

(උ) නිවාරණ හෝ වෘත්තිය වෛද්‍ය විද්‍යාවන්හි කාර්ය සඳහා, රෝග විනිශ්චය සත්කාර හෝ ප්‍රතිකාර සිදු කිරීම හෝ සෞඛ්‍ය සේවා කළමනාකරණය සඳහා සහ ශ්‍රී ලංකාවේ බලාත්මක වන යම් ලිඛිත නීතියක් යටතේ බලපත්‍ර ලබා දෙනු ලැබූ හෝ බලය ලබා දෙනු ලැබූ සෞඛ්‍ය වෘත්තිකයකු විසින් එකී දත්ත සකසනු ලැබූ අවස්ථාවක දී දත්ත සැකසීම අවශ්‍ය වන විට; හෝ

(ඌ) මේ පනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක දක්වෙන දත්ත ආරක්ෂණ අයිතිවාසිකම් ආරක්ෂා කරන සහ දත්ත දායකයාගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂණය සම්බන්ධයෙන් සුදුසු සහ විශේෂිත පියවර සඳහා විධිවිධාන සලස්වනු ලැබ ඇති නීති සමඟ අනුකූලව සහ එහි අනුගමනය කරන අරමුණු වලට සමානුපාතික වන ලෙසට සිදු කරන පොදු යහපත වෙනුවෙන් වන ලේඛනාරක්ෂක කටයුතු, විද්‍යාත්මක පර්යේෂණ හෝ ඓතිහාසික පර්යේෂණ අරමුණු හෝ සංඛ්‍යානමය අරමුණු සඳහා දත්ත සැකසීම අවශ්‍ය වන විට.

(5 (ඇ) වන වගන්තිය)

III වන උපලේඛනය

දත්ත දායකයාගේ කැමැත්ත සඳහා කොන්දේසි

(අ) දත්ත දායකයා ඔහුගේ පෞද්ගලික දත්ත සැකසීම සඳහා කැමැත්ත ලබා දී ඇති බව පෙන්වීමට පාලකවරයාට හැකි විය යුතු ය;

(ආ) දත්ත දායකයාගේ කැමැත්ත ලබා දී ඇත්තේ වෙනත් කාරණා සම්බන්ධයෙන් ද සලකා බැලෙන යම් ලිඛිත ප්‍රකාශයක සන්දර්භය තුළ නම්, කැමැත්ත සඳහා වන ඉල්ලීම වෙනත් කාරණාවලින් පැහැදිලිවම වෙන් කොට හඳුනාගත හැකි ආකාරයකින්, අවබෝධ කර ගත හැකි සහ පහසුවෙන් ප්‍රවේශ විය හැකි ආකෘතියකින් පැහැදිලි සහ සරල භාෂාවක් භාවිත කරමින්ල ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

එසේ වුව ද, එවැනි ප්‍රකාශයක මේ පනතේ යම් විධිවිධාන උල්ලංඝණය කිරීමක් සංයුක්ත නොවිය යුතු ය.

(ඇ) කැමැත්ත නිදහසේ ලබා දී ඇත්තේ ද යන්න තක්සේරු කිරීමේ දී, අනෙකුත් දේ අතර, යම් සේවාවක් සැපයීම ඇතුළුව යම් ගිවිසුමක් ක්‍රියාත්මක කිරීම, එම ගිවිසුම ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය නොවන පෞද්ගලික දත්ත සැකසීම සඳහා කැමැත්ත සම්බන්ධයෙන් කොන්දේසි සහිත වන්නේ ද යන්න පිළිබඳ විශේෂයෙන් සැලකිල්ලට ගනු ලැබිය යුතු ය; සහ

(ඈ) කැමැත්ත ලබාදීමට පෙර, මේ පනතේ විධිවිධානවලට යටත්ව යම් අවස්ථාවක එම කැමැත්ත ඉල්ලා අස්කරගනු ලැබිය හැකි බව දත්ත දායකයා වෙත දැනුම් දෙනු ලැබිය යුතු ය.

(5 (ඈ) වන වගන්තිය)

IV වන උපලේඛනය

අපරාධ විමර්ශන සඳහා පෞද්ගලික දත්ත සැකසීම

(අ) වැරදි පිළිබඳ නීත්‍යනුකූල විමර්ශන හෝ අදාළ ආරක්ෂක පියවරවලට අදාළ පෞද්ගලික දත්ත සැකසීම, දත්ත දායකයාගේ අයිතිවාසිකම් සහ නිදහස සඳහා උචිත ආරක්ෂණ විධිවිධාන සලස්වන අතරතුර දී, අදාළ ලිඛිත නීතිවලට අනුකූලව පමණක් සිදු කරනු ලැබිය යුතු ය;

(ආ) සැක දුරු කිරීම සඳහා 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ විධිවිධානවලට හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ වන විධිවිධානවලට අනුව විමර්ශන සිදු කරනු ලබන්නේ නම්, මේ උපලේඛනය යටතේ පෞද්ගලික දත්ත සැකසීම නීත්‍යනුකූල වන ලෙස සලකනු ලැබිය හැකි ය; සහ

(ඇ) මේ උපලේඛනය යටතේ දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් සහ නිදහස සඳහා උචිත ආරක්ෂණයන් සැපයීම සඳහා කොන්දේසි නියෝග මඟින් නියම කරනු ලැබිය හැකි ය.

(11 වන සහ 13 වන වගන්ති)

V වන උපලේඛනය

පෞද්ගලික දත්ත එකතු කරගැනීම

1. යම් දත්ත දායකයකුට අදාළ පෞද්ගලික දත්ත එම දත්ත දායකයාගෙන් එකතු කර ගනු ලබන අවස්ථාවක, එකී පෞද්ගලික දත්ත එකතු කරගන්නා අවස්ථාවේ දී, පාලකවරයා විසින් දත්ත දායකයා වෙත පහත දැක්වෙන තොරතුරු සැපයිය යුතු ය:-

(අ) පාලකවරයාගේ සහ අදාළ වන අවස්ථාවල දී පාලකවරයාගේ නියෝජිතයාගේ අනන්‍යතාවය සහ සම්බන්ධකර ගත හැකි විස්තර;

(ආ) අදාළ වන අවස්ථාවල දී දත්ත ආරක්ෂණ නිලධරයාගේ සම්බන්ධ කර ගත හැකි විස්තර;

(ඇ) පෞද්ගලික දත්ත සැකසීමට අදහස් කරනු ලබන්නේ කුමන කාර්යයක් සඳහා ද යන්න සහ දත්ත සැකසීම සඳහා වන නෛතික පදනම;

(ඈ) දත්ත සැකසීම 1 වන උපලේඛනයේ (ඊ) අයිතමය මත පදනම් වන අවස්ථාවක දී පාලකවරයා විසින් හෝ තුන්වන පාර්ශ්වයන් විසින් අනුගමනය කරනු ලබන නීත්‍යනුකූල අපේක්ෂාව;

(ඉ) එකතු කරනු ලබන පෞද්ගලික දත්තවල ප්‍රභේද;

(ඊ) I වන උපලේඛනයේ (අ) අයිතමය සහ II වන උපලේඛනයේ (අ) අයිතමය අනුව ලබාගත් කැමැත්ත මත පදනම්ව දත්ත සැකසීම සිදු කිරීමට අදහස් කරනු ලබන අවස්ථාවක දී, දත්ත දායකයකුට ඔහුගේ කැමැත්ත ඉල්ලා අස්කර ගැනීමට අයිතිවාසිකමක් තිබීම සහ එය ඉල්ලා අස්කර ගැනීමට පෙර, කැමැත්ත මත පදනම් වූ දත්ත සැකසීමේ නීත්‍යනුකූලභාවයට බලපෑමක් ඇති නොවන පරිදි එවැනි ඉල්ලා අස්කර ගැනීමක් සඳහා වන කාර්ය පටිපාටිය;

(උ) අදාළ වන්නේ නම්, එම පෞද්ගලික දත්ත බෙදා ගනු ලබන්නේ කවර ප්‍රතිග්‍රාහකයන් හෝ තුන්වන පාර්ශ්වයක් සමඟ ද එම ප්‍රතිග්‍රාහකයන් හෝ තුන්වන පාර්ශ්වයන්වල විස්තර;

(ඌ) අදාළ වන්නේ නම්, පාලකවරයා විසින් සිදු කරනු ලැබීමට අදහස් කරන යම් පෞද්ගලික දත්ත දේශසීමා හරහා සංචලනයකට අදාළ තොරතුරු;

(එ) 9 වන වගන්තිය ප්‍රකාර පෞද්ගලික දත්ත රඳවා තබා ගනු ලැබිය යුතු කාල සීමාව හෝ එම කාලසීමාව නොදන්නා අවස්ථාවල දී එම කාලසීමාව නිශ්චය කිරීම සඳහා වන නිර්ණායක;

(ඒ) II වන කොටසේ සඳහන් කරන ලද දත්ත දායකයාගේ අයිතිවාසිකම් හි පැවැත්ම සහ ඒවා ක්‍රියාවට නැංවීම සඳහා වන කාර්ය පටිපාටිය;

(ඔ) අධිකාරිය වෙත පැමිණිලි ගොනු කිරීමට අයිතිවාසිකමක් පැවතීම;

(ඕ) දත්ත දායකයකු විසින් පෞද්ගලික දත්ත ලබාදීම ව්‍යවස්ථාපිත හෝ ගිවිසුම් ප්‍රකාර අවශ්‍යතාවක් ද, එය යම් ගිවිසුමකට එළඹීම සඳහා අවශ්‍ය අවශ්‍යතාවක් ද යන්න මෙන්ම, දත්ත දායකයා පෞද්ගලික දත්ත ලබා දීමට බැඳී සිටින්නේ ද සහ දත්ත දායකයාට එම දත්ත ලබා දීමට අපොහොසත් වීමෙන් ප්‍රතිවිපාක ඇතිවීමට හැකියාවක් තිබේ ද යන්න; හෝ

(ක) පුද්ගල පැතිකඩ දැක්වීම ඇතුළුව 18 වන වගන්තියේ දක්වා ඇති, ස්වයංක්‍රීය තීරණ ගැනීමක පැවැත්ම සහ යටත් පිරිසෙයින් එම අවස්ථාවන්හි දී යොදාගෙන ඇති තර්කානුකූලභාවය පිළිබඳ සාධාරණ ලෙස අර්ථවත් තොරතුරු මෙන්ම දත්ත දායකයකු සඳහා එවැනි දත්ත සැකසීමක වැදගත්කම සහ අපේක්ෂිත ප්‍රතිඵල.

2. පෞද්ගලික දත්ත මූලිකවම එකතු කරන ලද්දේ කුමන කාර්යයක් සඳහා ද එම කාර්යය නොවන යම් කාර්යයක් සඳහා එම පෞද්ගලික දත්ත වැඩිදුරටත් සැකසීමට පාලකවරයා අදහස් කරන අවස්ථාවක දී, පාලකවරයා විසින් දත්ත දායකයා වෙත මේ උපලේඛනයේ 1 වන අයිතමයේ සපයා ඇති ආකාරයෙන් වැඩිදුර සැකසීම පිළිබඳ සහ එකී කාර්යය පිළිබඳ සවිස්තරාත්මක තොරතුරු සැපයිය යුතු ය.

3. දත්ත දායකයා දැනටමත් තොරතුරු ලබා ගෙන ඇති හෝ එම තොරතුරු පිළිබඳව දැනුවත්ව ඇති අවස්ථාවක දී මේ උපලේඛනයේ 1 වන සහ 2 වන අයිතම අදාළ නොවිය යුතු ය.

4. දත්ත දායකයාගේ පෞද්ගලික දත්ත, දත්ත දායකයා ඍජුවම සම්බන්ධ කර ගැනීමකින් තොරව ලබා ගෙන ඇති අවස්ථාවක දී, පාලකවරයා විසින් දත්ත දායකයා වෙත, මේ උපලේඛනයේ 1 වන අයිතමය යටතේ නියම කර ඇති තොරතුරු වලට අමතරව, අදාළ අවස්ථාවලදී, පෞද්ගලික දත්ත ලබා ගන්නා ලද ප්‍රභවය සහ එම දත්ත ලබාගත්තේ පොදුවේ ප්‍රවේශ විය හැකි ප්‍රභවයකින් ද නැති ද යන්න පිළිබඳ තොරතුරු සැපයිය යුතු ය.

5. දත්ත දායකයාගේ පෞද්ගලික දත්ත, දත්ත දායකයා ඍජුවම සම්බන්ධ කර ගැනීමකින් තොරව ලබා ගෙන ඇති අවස්ථාවක දී, පාලකවරයා විසින්-

(අ) පෞද්ගලික දත්ත ලබාගැනීමෙන් පසුව සාධාරණ කාලසීමාවක් ඇතුළත, එහෙත් යටත් පිරිසෙයින් එක් මසක් ඇතුළත, පෞද්ගලික දත්ත සකසනු ලබන විශේෂිත අවස්ථානුගත කරුණු සැලකිල්ලට ගනිමින්;

(ආ) පෞද්ගලික දත්ත, දත්ත දායකයා සමඟ සන්නිවේදනය කිරීම සඳහා භාවිත කරනු ලැබිය යුතු වන්නේ නම්, යටත් පිරිසෙයින් එම දත්ත දායකයාට පළමු සන්නිවේදනය සිදු කරන අවස්ථාවේ දී; හෝ

(ඇ) වෙනත් ප්‍රතිග්‍රාහකයකු වෙත හෙළි කිරීමක් සිදු කිරීමට අපේක්ෂා කරනු ලබන්නේ නම්, යටත් පිරිසෙයින් පෞද්ගලික දත්ත පළමුවරට හෙළි කරනු ලබන අවස්ථාවේ දී,

මේ උපලේඛනයේ 1 වන සහ 4 වන අයිතම යටතේ වන තොරතුරු සැපයිය යුතු ය.

6. මේ උපලේඛනයේ 1 සිට 4 දක්වා වන අයිතම පහත දැක්වෙන අවස්ථාවල දී අදාළ නොවිය යුතු ය:-

(අ) තොරතුරු දැනටමත් දත්ත දායකයා වෙත සපයා දී ඇති බවට පාලකවරයා විසින් ඔප්පු කරන අවස්ථාවක දී; හෝ

(ආ) විශේෂයෙන්ම මේ පනතේ සපයන ලද කොන්දේසි සහ ආරක්ෂණයන්ට යටත්ව, යම් ලිඛිත නීතියක් මගින් විධිවිධාන සලස්වා ඇති ආකාරයකින් මහජන සුබසිද්ධිය පිණිස ලේඛනාරක්ෂක අරමුණු සඳහා විද්‍යාත්මක පර්යේෂණ, ඓතිහාසික පර්යේෂණ හෝ සංඛ්‍යානමය පර්යේෂණ සඳහා දත්ත සැකසීම කළ නොහැකි බව හෝ සමානුපාතික නොවන උත්සාහයක් විය හැකි බව ඔප්පු කරන අවස්ථාවක දී හෝ මේ උපලේඛනයේ 1 වන අයිතමයේ සඳහන් වගකීම් එම දත්ත සැකසීමේ අරමුණු සාක්ෂාත් කරගැනීම කෙරෙහි ඉඩදිය නොහැකි හෝ බලවත් හානියක් සිදුවන තාක් දුරට ඒ අවස්ථාවල දී පාලකවරයා විසින් තොරතුරු මහජනතාවට ලබා ගැනීමට සැලැස්වීම ඇතුළුව යම් ලිඛිත නීතියක් යටතේ සහතික කරන ලද දත්ත දායකයාගේ අයිතිවාකම් සහ නිදහස ආරක්ෂා කිරීම සඳහා උචිත පියවර ගත යුතු ය; හෝ

(ඇ) මේ පනතේ විධිවිධාන සහ එවැනි ලිඛිත නීතියක් යටතේ ආරක්ෂා කරන ලද දත්ත දායකයන්ගේ අයිතිවාසිකම් සහ නිදහස ආරක්ෂා කිරීම සඳහා උචිත පියවර සපයන්නා වූ සහ පාලකවරයා යටත් වන්නා වූ යම් ලිඛිත නීතියක් මගින් ලබා ගැනීම හෝ අනාවරණය කිරීම ප්‍රකාශිතවම දක්වා ඇති අවස්ථාවක දී; සහ

(ඈ) රහසිගතභාවය පිළිබඳ ව්‍යවස්ථාපිත වගකීමක් ඇතුළු ව පෞද්ගලික දත්ත, වෘත්තීයමය වරප්‍රසාද පිළිබඳ වගකීම්වලට අනුගාමීව, රහස්‍යව තිබිය යුතු හෝ යම් ලිඛිත නීතියක් යටතේ හෙළි කරනු ලැබීමට අවසර නොදෙනු ලබන අවස්ථාවක දී.

(29 (5) වන වගන්තිය)

VI වන උපලේඛනය

1. සභාපතිවරයා හැර මණ්ඩලයේ සෑම සාමාජිකයකු ම මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ස්වකීය ධුරය කලින් හිස් කළහොත් මිස, ඔහු පත්කළ දින සිට වසර තුනක කාලයක් සඳහා ධුරය දරිය යුතු අතර, ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කිරීම සඳහා සුදුස්සකු විය යුතු ය:

එසේ වුව ද, මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ධුරය හිස් කරන ලද සාමාජිකයකු වෙනුවට පත් කරනු ලබන සාමාජිකයකු විසින් ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දරිය යුතු ය.

2. (1) අධිකාරියේ යම් සාමාජිකයකුට, ජනාධිපතිවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් කවර හෝ අවස්ථාවක ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි අතර, ඉල්ලා අස්වීම ජනාධිපතිවරයා විසින් පිළිගනු ලැබීමෙන් පසුව බලාත්මක විය යුතු ය.

(2) යම් සාමාජිකයකු මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කිරීමෙන් ධුරය හිස් කරනු ලබන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් 29 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ඔහු අනුප්‍රාප්ත වන සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව ඇති කාලසීමාව සඳහා ධුරය දරීමට වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(3) සභාපතිවරයා හැර මණ්ඩලයේ යම් සාමාජිකයකු රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැර වීම හේතුවෙන් හෝ වෙනත් යම් හේතුවක් මගින් මාස තුනක් ඉක්මවන කාලසීමාවක් සඳහා තාවකාලිකව ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී, ජනාධිපතිවරයා විසින් 29 වන වගන්තියේ (3) වන සහ (4) වන උපවගන්තිවල විධිවිධාන සැලකිල්ලට ගනිමින්, එකී කාලසීමාව සඳහා ඔහුගේ ධුරයේ කටයුතු කිරීමට වෙනත් යම් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.

(4) කලින් අවසර ලබා ගැනීමෙන් තොරව, මණ්ඩලයේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණෙන මණ්ඩලයේ යම් සාමාජිකයකු ස්වකීය ධුරය අත්හැර ගියාක් සේ සලකනු ලැබිය යුතු ය.

3. (1) යම් තැනැත්තකු-

(අ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, යම් පළාත් සභාවක මන්ත්‍රීවරයකු හෝ යම් පළාත් පාලන ආයතනයක සභිකයකු වන්නේ නම් හෝ එසේ පත් වුවහොත්;

(ආ) සිහිවිකල තැනැත්තකු හෝ ස්වකීය කාර්ය කරගෙනයාමට නොහැකි තැනැත්තකු වන්නේ නම් හෝ එසේ වුවහොත්ත

(ඇ) නිදහස් කරනු නොලැබූ බංකොලොත් වූවකු වන්නේ නම් හෝ එසේ පත් වී ඇත්නම්;

(ඈ) චරිත දූෂණය හා සම්බන්ධ වරදකට වරදකරු වන්නේ නම් හෝ වරදකරු කරනු ලැබ ඇත්නම්;

(ඉ) කලින් ධුරයෙන් ඉවත් කරනු ලැබ ඇත්නම්;

එම තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් පත් කරනු ලැබීමට හෝ සාමාජිකයකු වශයෙන් අඛණ්ඩව කටයුතු කිරීමට නුසුදුස්සකු විය යුතු ය.

(2) මණ්ඩලයේ සාමාජිකයකු-

(අ) ස්වකීය කාර්යයන්ට අදාළව බරපතල විෂමාචාරයකට වරදකරු වන්නේ නම්;

(ආ) ස්වකීය ධුරය අඛණ්ඩව කරගෙන යාම අධිකාරියේ යහපතට හානියක් වන පරිදි ස්වකීය තනතුර අයුතු ලෙස භාවිත කරන්නේ නම්;

(ඇ) 3 වන අයිතමයේ (1) වන ඡේදය යටතේ නුසුදුස්සකු වන්නේ නම්; හෝ

(ඈ) මේ පනතේ විධිවිධාන උල්ලංඝනය කරන්නේ නම්,

අමාත්‍යවරයා විසින් ඔහු සාමාජිකයකු වශයෙන් අඛණ්ඩව කටයුතු කරගෙන යාමෙන් ඉවත් කළ යුතු ය.

4. මණ්ඩලය විසින් යම් කාරණාවක් සම්බන්ධයෙන් ගනු ලැබිය යුතු යම් තීරණයකට සෘජුව හෝ වක්‍රව සම්බන්ධතාවක් දක්වන සාමාජිකයන් විසින්, එම සම්බන්ධතාවයේ ස්වභාවය පිළිබඳ එම තීරණය ගනු ලබන රැස්වීමේ දී අනාවරණය කරනු ලැබිය යුතු අතර, එකී අනාවරණය කිරීම මණ්ඩලයේ රැස්වීම් සටහන්වල වාර්තා කරනු ලැබිය යුතු ය. තව ද, එකී සාමාජිකයා එම කාරණයට අදාළව මණ්ඩලයේ යම් සාකච්ඡාවකට හෝ තීරණයකට සහභාගී නොවිය යුතු අතර, එවැනි සාකච්ඡාවක් සිදු කෙරෙමින් පවතින හෝ එවැනි තීරණයක් ගනිමින් පවතින අතරතුර දී යම් රැස්වීමකින් ඔහු ඉවත් විය යුතු ය.

5. මණ්ඩලයේ සාමාජිකයන්ට මුදල් විෂයය පවරනු ලැබ ඇති අමාත්‍යවරයා විමසා යම් ආකාරයකට පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, ජනාධිපතිවරයා විසින් කලින් කලට නිශ්චය කරනු ලැබිය හැකි යම් නියමයන්ට සහ කොන්දේසිවලට යටත්ව ඔවුන්ගේ කර්තව්‍ය සිදු කරගෙන යනු ලැබිය යුතු ය.

6. (1) මණ්ඩලයේ යම් රැස්වීමක ගණපූරණය සභාපතිවරයා ඇතුළුව සාමාජිකයන්ගෙන් තිදෙනෙක් විය යුතු ය.

(2) මණ්ඩලයේ සියලු රැස්වීම් අධ්‍යක්ෂ-ජනරාල්වරයා විසින් කැඳවනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලයේ රැස්වීමක්-

(අ) ඒ රැස්වීම සඳහා නියම කරගත් ස්ථානයේ, දිනයේ සහ වේලාවේ රැස්ව සිටින ගණපූරණය සංයුක්ත කරන සාමාජිකයන් සංඛ්‍යාව විසින්; හෝ

(ආ) ඒ රැස්වීම පැවැත්වෙන කාලසීමාව තුළ, ඊට සහභාගී වන ගණපූරණය සංයුක්ත කරන සියලුම සාමාජිකයන්ට ඊට සහභාගී වන එක් එක් සාමාජිකයා එකවර දැකිය හැකි සහ ඒ එක් එක් සාමාජිකයාට සවන් දිය හැකි ශ්‍රව්‍ය දෘශ්‍ය සන්නිවේදනයක් මගින්,

පවත්වනු ලැබිය හැකි ය.

(4) මණ්ඩලයේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු සියලු ප්‍රශ්න එකී රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් තීරණය කරනු ලැබිය යුතු ය. ඡන්ද සමාන වන අවස්ථාවක දී, සභාපතිවරයාට ඔහුගේ ඡන්දයට අමතරව තීරක ඡන්දයක් තිබිය යුතු ය.

(5) මණ්ඩලයේ සෑම රැස්වීමක දී ම සභාපතිවරයා විසින් මුලසුන දරනු ලැබිය යුතු ය. සභාපතිවරයා මණ්ඩලයේ යම් රැස්වීමකට නොපැමිණ ඇති අවස්ථාවක, පැමිණ සිටින සාමාජිකයන් විසින් තෝරා පත් කර ගනු ලබන යම් සාමාජිකයකු විසින් මණ්ඩලයේ එම රැස්වීමේ මුලසුන දරනු ලැබිය යුතු ය.

(6) මණ්ඩලයේ රැස්වීම්, කලින් කලට එය විසින් සාදනු ලබන රීති සහ පිහිටුවනු ලබන කාර්ය පටිපාටිවලට අනුකූලව පවත්වනු ලැබිය යුතු ය.

7. මණ්ඩලයේ කිසිදු කටයුත්තක්, ක්‍රියාවක් හෝ තීරණයක් එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් පැවතීම හෝ එහි යම් සාමාජිකයකු පත් කිරීමේ යම් දෝෂයක් පැවතීම හේතුවෙන් ම පමණක් අවලංගු නොවිය යුතු ය.

8. (1) අධිකාරියේ මුද්‍රාව මණ්ඩලය භාරයේ තැබිය යුතු ය.

(2) අධිකාරියේ මුද්‍රාව අධිකාරිය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකට වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ එක් සාමාජිකයකු සහ අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්වරයා ඉදිරිපිට දී හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයා නොපැමිණෙන අවස්ථාවක දී මණ්ඩලයේ යම් සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී මිස කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට හෝ අධිකාරියේ මුද්‍රාව නොතැබිය යුතු අතර, ඔවුන් පැමිණි බවට සලකුණක් වශයෙන් එකී සාධන පත්‍රයේ හෝ ලේඛනයේ තම නම අත්සන් කළ යුතු ය.

(4) මණ්ඩලය විසින් අධිකාරියේ මුද්‍රාව තබන ලද සාධන පත්‍ර සහ ලේඛන පිළිබඳව රෙජිස්ටරයක් පවත්වාගෙන යා යුතු ය.

2022 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 මාර්තු මස 19 වන දින]

(139 වන අධිකාරය වූ) කම්කරු වන්දි ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 10 දරන කම්කරු වන්දි (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් හඳුන්වනු ලබන) (139 වන අධිකාරය වූ) කම්කරු වන්දි ආඥාපනතේ දීර්ඝ නාමය එහි "සේවයේ යෙදී සිටිය දී තුවාල ලැබූ" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර තුවාල ලැබූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 2 වන වගන්තිය, එහි "අසම්පූර්ණ අබලතාව" යන යෙදුමේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

""නේවාසික ස්ථානය" යන්නට කම්කරුවකුගේ යම් ස්ථිර නේවාසික ස්ථානයක් හෝ සේවා ස්ථානය වෙත පැමිණීමේ කාර්යය සඳහා යම් කම්කරුවකු තාවකාලිකව වාසය කරන නවාතැන්පොළක් හෝ වෙනත් යම් ස්ථානයක් ඇතුළත් වේ;".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය, එහි සේවයේ යෙදී සිටිය දී" යන වචන වෙනුවට සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී හෝ සේවය නිසාම ඇති වූ තුවාලයක්" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ සේවය නිසාම ඇති වූ ද, නැතහොත් නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර සිදු වූ අනතුරකින් සිදු වූ තුවාලයක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

6අ. 6 වන වගන්තියේ කුමක් සඳහන්ව ඇත ද, ඒ නොතකා, ස්ථිර හෝ අසම්පූර්ණ අබලතාවක් සිදු වූ අවස්ථාවක, යම් තුවාලයක් සම්බන්ධයෙන් වන්දි මුදල ගණනය කිරීමේ දී කම්කරුවකුගේ රැකියාවේ ස්වභාවය සලකා බැලිය යුතු ය. එම වන්දිය, අදාළ වෛද්‍යවරයා විසින් නිකුත් කරනු ලබන වෛද්‍ය වාර්තාව මත පදනම් විය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (ඇ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන ඡේදය ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඈ) දෛනික වැටුප් ලබන හෝ කෑලි පදනම මත වේතන ලබන කම්කරුවකු සම්බන්ධයෙන් වන විට, අනතුර සිදුවීමට පෙරාතුව ම එම කම්කරුවා සේවයේ යෙදී සිටි අවසාන මාස දොළහ සඳහා ලබාගත් දෛනික වැටුපෙන් හෝ කෑලි පදනම මත වේතනයෙන් ඉපැයූ මුදල් ප්‍රමාණය, දොළහෙන් බෙදා එය නැවත විසිපහෙන් බෙදා ලැබෙන එකතුව එම කම්කරුවාගේ මාසික වේතනය විය යුතු ය.".

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 11 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ අතුරු විධානයේ "එකතුව රුපියල් දස දහසක් නොඉක්මවන මුදලක්" යන වචන වෙනුවට "එකතුව රුපියල් විසි දහසක් නොඉක්මවන මුදලක්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය, එහි (1) වන උපවගන්තිය ඉවත්කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) 11 වන වගන්තිය යටතේ, මිය ගිය කම්කරුවකු සම්බන්ධයෙන් වන්දියක් ලෙස යම් මුදලක් තැන්පත් කිරීමේ දී, කොමසාරිස්වරයා විසින්, කම්කරුවාගේ අවමංගල්‍ය කෘත්‍යය වෙනුවෙන් සැබවින්ම වැය වූ මුදල් ලෙස රුපියල් ලක්ෂයක් නොඉක්මවන මුදලක්, එයින් අඩු කර ඒ වියදම දරනු ලැබුවේ යම් තැනැත්තකු විසින් ද, ඒ තැනැත්තා වෙත එම මුදල ගෙවනු ලැබිය යුතු ය.

(1අ) මිය ගිය කම්කරුවාගේ වන්දිය බෙදා දීම තීරණය කිරීම සඳහා, කොමසාරිස්වරයා විසින් නියම කරනු ලැබිය හැකි දිනයක දී ඔහු ඉදිරියේ පෙනී සිටීම සඳහා ඉල්ලීමක් කරමින් කොමසාරිස්වරයා විසින් මිය ගිය කම්කරුවාගේ ශ්‍රී ලංකාවේ නේවාසික එක් එක් යැපෙන්නා වෙත දන්වීමක් භාරදීමට කටයුතු සැලැස්විය යුතු ය. කොමසාරිස්වරයා විසින් අවශ්‍ය යැයි සලකනු ලැබිය හැකි යම් පරීක්ෂණයකින් පසු, කිසිදු යැපෙන්නකු නොසිටින බවට ඔහු සෑහීමට පත්වන්නේ නම්, කොමසාරිස්වරයා විසින් එහි ශේෂ මුදල, වන්දිය ගෙවනු ලැබුවේ යම් සේවායෝජකයකු විසින් ද, එම සේවායෝජකයාට ආපසු ගෙවනු ලැබිය යුතු ය. එසේ වුව ද, 11 වන වගන්තිය යටතේ මුදල් තැන්පත් කරනු ලැබූ දින සිට ගණන් ගනු ලබන මාස දොළහක කාලසීමාවක් ඉකුත්වන තෙක් එවැනි කිසිදු ආපසු ගෙවීමක් සිදුකරනු නොලැබිය යුතු ය. සේවායෝජකයා විසින් කරන ලද ඉල්ලීමක් මත, කොමසාරිස්වරයා විසින්, සිදු කරන ලද සියලු විය පැහැදිම් පිළිබඳ එකඟතා ප්‍රකාශයක් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "හදිසි අනතුර සිදුවී හෝ මරණයෙන් කෙළවර වී නම් මරණය සිදුවී හෝ අවුරුදු දෙකක් ගත වන්නට කලින්" යන වචන වෙනුවට "හදිසි අනතුර සිදුවී අවුරුදු දෙකක් ඇතුළත හෝ මරණයෙන් කෙළවර වී නම්, මරණය සිදුවී අවුරුදු දෙකක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියේ "රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්;

(2) (2) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(3) සෑම සේවායෝජකයකු විසින්ම, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති දැන්වීම් පොතට අමතරව, යම් කර්මාන්ත ශාලාවක හෝ යම් සේවා ස්ථානයක සිදුවන යම් හදිසි අනතුරක් පිළිබඳ තොරතුරු සහ විස්තර ඇතුළත් කරනු ලබන වාර්තා පොතක් පවත්වාගෙන යනු ලැබිය යුතු ය. තව ද, සේවායෝජකයා විසින් එම වාර්තා පොත භාරව කටයුතු කිරීම සඳහා වගකිවයුතු තැනැත්තකු පත්කරනු ලැබිය යුතු ය. කොමසාරිස්වරයාට එම වාර්තා පොත වෙත ප්‍රවේශ විය හැකි අතර, පරීක්ෂා කිරීම සඳහා එහි උධෘත හෝ පිටපත් ඔහු විසින් ඉල්ලා සිටිය හැකි ය.".

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:

(1) එහි (1) වන උපවගන්තියේ "සේවයේ යෙදී සිටියදී" යන වචන වෙනුවට, "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(5) මිය ගිය කම්කරුවාගේ අවමංගල්‍ය වියදම වශයෙන් සේවායෝජකයා විසින් ගෙවිය යුතු රුපියල් පනස් දහසක් නොඉක්මවන මුදලක් කොමසාරිස්වරයා විසින් තීරණය කරනු ලැබිය හැකි ය. එම මුදල සේවායෝජකයා විසින් ගෙවිය යුතු වන්දියට අමතරව විය යුතු අතර, අදාළ සේවායෝජකයා විසින් කොමසාරිස්වරයාගේ හෝ එම කම්කරුවාගේ ළඟම ඥාතියාගේ ගිණුමේ තැන්පත් කරනු ලැබිය යුතු ය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 23අ වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

23අ. මේ පනත යටතේ, අවස්ථාවෝචිත පරිදි, කම්කරුවකුට හෝ ඔහුගේ උරුමකරුවන්ට වන්දියක් වශයෙන් ගෙවිය යුතු යම් මුදලක් ගෙවීමට යටත් වන යම් සේවායෝජකයකු විසින්, නියමිත දිනයේ දී හෝ එදිනට පෙර එම මුදල ගෙවීමට අපොහොසත් වන විට හෝ ගෙවීම පැහැර හරින විට, ඔහු විසින් වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලට අමතරව එම මුදල මත පහත දක්වෙන ආකාරයට ගණනය කරන ලද අධිභාරයක්, අවස්ථාවෝචිත පරිදි, එම කම්කරුවාට හෝ ඔහුගේ උරුමකරුවන්ට ගෙවීමට යටත් විය යුතු ය:-

(අ) වන්දි ගෙවීම, නියමිත දින සිට එක් මාසයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට දහයක අධිභාරයක්;

(ආ) වන්දි ගෙවීම, නියමිත දින සිට එක් මාසයක් ඉක්මවන එහෙත් මාස තුනක් නොඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට පහළොවක අධිභාරයක්;

(ඇ) වන්දි ගෙවීම, නියමිත දින සිට මාස තුනක් ඉක්මවන එහෙත් මාස හයක් නොඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට විස්සක අධිභාරයක්;

(ඈ) වන්දි ගෙවීම, නියමිත දින සිට මාස හයක් ඉක්මවන එහෙත් මාස දොළහක් නොඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට විසි පහක අධිභාරයක්; හෝ

(ඉ) වන්දි ගෙවීම, නියමිත දින සිට මාස දොළහක් ඉක්මවන කාලසීමාවක් සඳහා හිඟව ඇති විට, වන්දිය වශයෙන් ගෙවිය යුතු මුදලින් සියයට තිහක අධිභාරයක්.".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 27අ වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

27අ. මේ පනතේ කාර්ය සඳහා, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් කම්කරු වන්දි පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයකු පත් කරනු ලැබිය යුතු ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තිය, එහි (2) වන උපවගන්තිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(2) (1) වන උපවගන්තියේ සඳහන් යම් මුදලක්, එම උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ආකාරයට අයකර ගත නොහැකි වේ නම්, ගෙවීම පැහැරහරින්නාගේ නිශ්චල දේපළ තහනමට ගැනීමෙන් හෝ විකිණීමෙන් එම මුදල අයකර ගැනීම සඳහා කොමසාරිස්වරයා විසින් නියමයක් කරනු ලැබිය හැකි ය. 27අ වන වගන්තිය යටතේ පත්කරන ලද කම්කරු වන්දි පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා විසින්, එම පැහැරහරින්නා වාසය කරන අධිකරණ බල ප්‍රදේශයේ අදාළ දිසා අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා මඟින් එම නියමය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය. අධිකරණයක් විසින් නිකුත් කරන ලද රිට් ආඥාවක් ක්‍රියාත්මක කිරීමේ දී, පිස්කල් විසින් නිශ්චල දේපළ තහනමට ගැනීම සහ විකිණීම සහ ඔහු විසින් තහනමට ගන්නා ලද යම් නිශ්චල දේපළක් සම්බන්ධයෙන් වන හිමිකම් කියා පෑම් ඉදිරිපත් කිරීම හා විනිශ්චය කිරීම සම්බන්ධයෙන් අදාළ වන, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධාන, මෙම වගන්තිය යටතේ කොමසාරිස්වරයා විසින් කරන ලද කොමසාරිස්වරයාගේ නියමයේ නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණය අයකර ගැනීම සඳහා නිශ්චල දේපළ තහනමට ගැනීම සහ විකිණීම සම්බන්ධයෙන් ද, එම මුදල් ප්‍රමාණය අය කර ගැනීම සඳහා තහනමට ගන්නා ලද නිශ්චල දේපළ පිළිබඳ හිමිකම් කියා පෑම් ඉදිරිපත් කිරීම හා විනිශ්චය කිරීම සම්බන්ධයෙන් ද අදාළ වන්නේ ය. එම විධිවිධාන අදාළ කරගැනීමේ කාර්යය සඳහා, එසේ නිශ්චිතව දක්වා ඇති මුදල, අධිකරණය විසින් එළඹෙන ලද තීන්දු ප්‍රකාශයක් මත ලැබිය යුතු බවට සලකනු ලැබිය යුතු මෙන්ම, කොමසාරිස්වරයා විනිශ්චිත ණය හිමියා ලෙස සලකනු ලැබිය යුතු අතර, එම මුදල ගෙවීමට යටත් වන තැනැත්තා විනිශ්චිත ණයකරුවකු ලෙස සලකනු ලැබිය යුතු ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 44 වන වගන්තිය, එහි "වංචාවකින්, අනිසි බලපෑමකින් හෝ වෙනත් අයුතු ක්‍රමවලින්" යන වචන වෙනුවට "වංචාවකින්, අනිසි බලපෑමකින් හෝ වෙනත් අයුතු ක්‍රමවලින් හෝ එකඟතා ගිවිසුම යටතේ කම්කරුවාට ගෙවිය යුතු වන්දි මුදල වැරදි ලෙස ගණනය කිරීමේ හෝ අඩුවෙන් තක්සේරු කිරීමේ හේතුවෙන්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තිය, එහි (2) වන උපවගන්තියේ "රුපියල් දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය, එහි "රුපියල් සියයක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "රුපියල් සියයක වටිනාකමකින්" යන වචන වෙනුවට "රුපියල් දෙදහසක වටිනාකමකින්" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය, එහි "අභියාචනාධිකරණය" යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 53 වන වගන්තිය, එහි "අභියාචනාධිකරණය විසින්" යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 57 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ "සේවයේ යෙදී සිටිය දී සිදු වූ" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර සිදු වූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 59 වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී සිදු වූ" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර සිදු ව" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 60අ වන වගන්තිය, එහි "සේවයේ යෙදී සිටිය දී සිදු වූ" යන වචන වෙනුවට "සේවයේ යෙදී සිටිය දී හෝ නේවාසික ස්ථානයේ සිට සේවා ස්ථානය වෙත පැමිණෙන අතරතුර හෝ සේවා ස්ථානයේ සිට නේවාසික ස්ථානය වෙත ආපසු පැමිණෙන අතරතුර සිදු වූ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ I වන උපලේඛනය මෙයින් ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

"I වන උපලේඛනය

(2 වන වගන්තිය)

ස්ථිර/අසම්පූර්ණ අබලතාවක් සිදුකෙරේ යැයි සලකනු ලබන තුවාල ලැයිස්තුව

තුවාලය	ඉපැයීමේ හැකියාව නැතිවීමේ ප්‍රතිශතය
ස්ථිර වශයෙන් ම ඔත්පලවීමක් සිදුකෙරෙන, ස්ථිර වූ ද, අසාධ්‍ය වූ ද අවයව පක්ෂඝාතය හෝ තුවාල	100
වැඩ කිරීමේ පූර්ණ අශක්නුතාව සිදුකෙරෙන, ස්ථිර, සුව කළ නොහැකි මානසික ශක්තිය නැතිවීම හෝ වැඩ කිරීමේ පූර්ණ අශක්නුතාවට හේතුවන වෙනත් යම් තුවාලයක්	100
ඇසේ තුවාල	
(i) ඇස් දෙකේ පෙනීම මුළුමනින් ම නැතිවීම	100
(ii) එක් ඇසක පෙනීම මුළුමනින් ම නැතිවීම	80
ශ්‍රවණ ආබාධ	
(i) ශ්‍රවණය මුළුමනින් ම නැතිවීම	80
(ii) එක් කණක ශ්‍රවණය මුළුමනින් ම නැතිවීම	50
කථනය නැතිවීම	
(i) කථනය මුළුමනින් ම නැතිවීම	100
ඉන්ද්‍රියයන් නැතිවීම	
(i) ගන්ධය හා රසය දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම	60
(ii) ගන්ධය දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම	60
(iii) රසය දැනෙන ඉන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම	60
බාහුවේ තුවාල	
(i) වැලමිටෙන් හෝ ඊට ඉහළින් බාහුව නැතිවීම	85
(ii) වැලමිටෙන් හෝ ඊට පහළින් බාහුව නැතිවීම	80
අත්වල තුවාල	
(i) අත් දෙක ම නැතිවීම	100
(ii) අතක් හෝ මාපට ඇඟිල්ලක් සහ ඇඟිලි හතරක් නැතිවීම	80
(iii) මාපට ඇඟිල්ලක් (ඇඟිලි පුරුක් දෙකම) නැතිවීම	50
(iv) මාපට ඇඟිල්ලක් (එක් ඇඟිලි පුරුකක්) නැතිවීම	40
(v) ඇඟිලි හතරක් නැතිවීම	80
දබරැඟිල්ල නැතිවීම	
(i) ඇඟිලි පුරුක් තුනක්	50
(ii) ඇඟිලි පුරුක් දෙකක්	40
(iii) එක් ඇඟිලි පුරුකක්	20

	මැදගිල්ල, වෙදගිල්ල සහ සුළඟිල්ල නැති වීම	
(i)	ඇඟිලි පුරුක් තුනක්	30
(ii)	ඇඟිලි පුරුක් දෙකක්	20
(iii)	එක් ඇඟිලි පුරුකක්	15
	කකුල නැතිවීම	
(i)	දණහිසින් හෝ ඉන් ඉහළට	90
(ii)	දණහිසින් හෝ ඉන් පහළට	80
	පාදවල තුවාල	
(i)	දෙපා නැතිවීම	100
(ii)	එක් පාදයක් නැතිවීම	90
	පා ඇඟිලි නැතිවීම	
(i)	මාපට ඇඟිල්ල - ඇඟිලි පුරුක් දෙකම	40
(ii)	මාපට ඇඟිල්ල - එක් ඇඟිලි පුරුකක්	20
(iii)	මාපට ඇඟිල්ල නොවන එකකට වැඩි ඇඟිලි ගණනක් නැතිවුවහොත්, එක් එක් ඇඟිල්ල සඳහා	20
	විවිධ	
(i)	ජනනේන්ද්‍රියයන් මුළුමනින් ම නැතිවීම	75
(ii)	ජනනේන්ද්‍රියක කොටසක් නැතිවීම	60
(iii)	මුහුණේ බරපතල කැළැල් ඇතිවීම හෝ මුහුණ විරූපී වීම	90
(iv)	මුහුණේ කැළැල් ඇතිවීම හෝ මුහුණ විරූපී වීම නොවන, බරපතල ලෙස ශරීරය විරූපී වීම - උපරිමය	60
(v)	එක් දතක් නැතිවීම	10
(vi)	වෛද්‍ය නිලධරයකු විසින් තක්සේරු කරනු ලැබිය යුතු ඉහත සඳහන් නොකරන ලද යම් අවයවයක් හෝ ඉන් යම් කොටසක් (උදා- නාසය, ළපැත්ත, කණ ආදිය නැතිවීම) - උපරිමය.".	60

27. ප්‍රධාන ප්‍රඥප්තියේ IV වන උපලේඛනය මෙයින් ඉවත්කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛනය ආදේශ කරනු ලැබේ:-

"IV වන උපලේඛනය

(6 වන වගන්තිය)

ගෙවිය යුතු වන්දි මුදල

තුවාල ලත් කම්කරුවාගේ මාසික වේතනය		කම්කරුවාගේ මරණය	කම්කරුවාගේ ස්ථිර අබලතාව	කම්කරුවා තාවකාලිකව අබලතාවට පත්වීම වෙනුවෙන් වන්දි වශයෙන් අර්ධ මාසික ගෙවීම
රු.	රු.	රු.	රු.	රු.
0	10,000	1,140,000	1,200,000	5,000
10,001	12,500	1,180,000	1,240,000	5,625
12,501	15,000	1,220,000	1,280,000	6,875
15,001	17,500	1,260,000	1,320,000	8,125
17,501	20,000	1,300,000	1,360,000	9,375
20,001	22,500	1,340,000	1,400,000	10,625
22,501	25,000	1,380,000	1,440,000	11,875
25,001	27,500	1,420,000	1,480,000	13,125
27,501	30,000	1,460,000	1,520,000	14,375
30,001	35,000	1,510,000	1,570,000	16,250
35,001	40,000	1,560,000	1,630,000	18,750
40,001	45,000	1,610,000	1,680,000	21,250
45,001	50,000	1,660,000	1,730,000	23,750
50,001	55,000	1,710,000	1,780,000	26,250
55,001	60,000	1,760,000	1,830,000	28,750
60,001	70,000	1,820,000	1,890,000	32,500
70,001	80,000	1,880,000	1,960,000	37,500
80,001	90,000	1,940,000	2,000,000	42,500
90,001	100,000	2,000,000	2,000,000	47,500
100,000	සහ ඊට වඩා	2,000,000	2,000,000	47,500
	වැඩි මුදලක්			

".

28. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2022 අංක 14 දරන අධිභාර බද්ද පනත

[සභාතිකය සටහන් කළේ 2022 අප්‍රේල් මස 08 වන දින]

අධිභාර බද්ද පැනවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස සහ ඊට සම්බන්ධ සහ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 14 දරන අධිභාර බද්ද පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (1) මේ පනතේ මතු සඳහන් විධිවිධානවලට යටත්ව, (මෙහි මින්මතු "බද්ද" යනුවෙන් සඳහන් කරනු ලබන) අධිභාර බද්ද යනුවෙන් හඳුන්වනු ලබන බද්දක්-

(අ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන, 2020 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, බදු අයකළ හැකි ආදායම රුපියල් මිලියන දෙදහසක් ඉක්මවනු ලබන යම් පුද්ගලයකුගේ, හවුල් ව්‍යාපාරයක හෝ සමාගමක, බදු අයකළ හැකි ආදායම මත සියයට විසිපහක අනුප්‍රමාණයකින් අයකරනු ලැබිය යුතු යැ

එසේ වුව ද, බදු අයකළ හැකි ආදායම මත හවුල් ව්‍යාපාරය විසින් බද්ද ගෙවා ඇත්නම්, මේ ඡේදය යටතේ තනි පුද්ගලයකු වශයෙන් යම් හවුල්කරුවකුගේ බදු අයකළ හැකි ආදායම ගණනය කිරීමේ දී, හවුල් ව්‍යාපාරයකින් උපචිත වන යම් හවුල්කරුවකුගේ ආදායම පිළිබඳ සලකා බලනු නොලැබිය යුතු ය; සහ

(ආ) 2020 අප්‍රේල් මස පළමු වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා, සමාගම් සමූහයක සියලු පාලිත සමාගම් සහ පාලක සමාගමේ, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන ප්‍රකාරව ගණනය කරනු ලබන බදු අයකළ හැකි ආදායමේ එකතුව රුපියල් මිලියන දෙදහස ඉක්මවන්නේ නම්, එම සමාගම් සමූහයේ එක් සමාගමක බදු අයකළ හැකි ආදායම රුපියල් මිලියන දෙදහස නොඉක්මව වුව ද, එය නොතකා, එම තක්සේරු වර්ෂය සඳහා, එම එක් එක් සමාගමක බදු අයකළ හැකි ආදායමේ කොටසක් වන්නා වූ පාලිත සමාගමෙන් ලද ලාභාංශවලින් ලැබීම් සහ ලාභ අඩු කිරීමෙන් පසුව එම එක් එක් සමාගමේ බදු අයකළ හැකි ආදායම මත සියයට විසිපහක අනුප්‍රමාණයකින් අයකරනු ලැබිය යුතු යැ

එසේ වුව ද, සමාගමක්, (ආ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව බද්ද ගෙවීමට යටත් වන්නේ නම්, එකී සමාගම (අ) ඡේදයේ විධිවිධාන ප්‍රකාරව බද්ද ගෙවීම සඳහා යටත් නොවිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ බදු අයකළ හැකි ආදායමේ එකතුව ගණනය කිරීමේ දී, පාඩු හෝ හිලව් නොකළ පාඩු හේතුවෙන් බදු අයකළ හැකි ආදායම ශූන්‍ය වටිනාකමක් සහිත එම සමාගම් සමූහයේ යම් පාලිත සමාගමක් හෝ පාලක සමාගමක් පිළිබඳ සලකා බලනු නොලැබිය යුතු ය.

(3) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් යම් සමාගමක ගිණුම් පවත්වාගෙන යාමේ කාර්යය සඳහා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ කොමසාරිස්-ජනරාල්වරයා විසින් මාස දොළහක විකල්ප කාලසීමාවක් සඳහා අනුමතිය ලබා දී ඇති අවස්ථාවක දී, මේ පනතේ කාර්ය සඳහා එම අනුමත කාලසීමාව 2020 අප්‍රේල් මස 1 වන දින සිට ආරම්භ වන තක්සේරු වර්ෂය ලෙස සලකනු ලැබිය යුතු ය.

(4) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් සෑම යම් තනි පුද්ගලයෙක්, හවුල් ව්‍යාපාරයක්, සමාගමක් සහ සමාගම් සමූහයක සියලු පාලිත සමාගම් සහ පාලක සමාගම විසින් ම කොමසාරිස් ජනරාල්වරයා වෙත 2022 අප්‍රේල් මස විසි වන දිනයේ දී සහ 2022 ජූලි මස විසි වන දිනයේ දී හෝ ඒ දිනවලට පෙරාතුව සමාන වාරික දෙකකින් බද්ද ගෙවනු ලැබිය යුතු ය.

(5) කොමසාරිස්-ජනරාල්වරයා විසින් බද්ද එකතු කරනු ලැබිය යුතු අතර එකතු කිරීමේ දිනයේ සිට දින පහළොවක් ඇතුළත ඒකාබද්ධ අරමුදල වෙත ප්‍රේෂණය කරනු ලැබිය යුතු ය.

(6) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා-

(අ) මේ පනත යටතේ අයකරනු ලබන බද්ද, 2020 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වූ තක්සේරු වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශයේ වූ වියදමක් ලෙස සලකනු ලැබිය යුතු යැ;

(ආ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ යම් තක්සේරු වර්ෂයක් සඳහා බදු අයකළ හැකි ආදායම ගණනය කිරීමේ දී, මේ පනත යටතේ බද්ද ගෙවීම වෙනුවෙන් කිසිදු අඩු කිරීමක් ප්‍රදානය කරනු නොලැබිය යුතු යැ;

(ඇ) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත යටතේ මූල්‍ය සේවා සැපයුම මත එකතු කළ අගය මත බදු ගණනය කිරීමේ දී, මේ පනත යටතේ බද්ද ගෙවීම වෙනුවෙන් කිසිදු අඩු කිරීමක් ප්‍රදානය කරනු නොලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ කාර්යය සඳහා "බදු අයකළ හැකි ආදායම" යන්නෙන්-

(අ) ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩල පනතේ 17 වන වගන්තිය යටතේ ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමග ගිවිසුමකට එළඹී සිටින්නා වූ ද, ඒ ගිවිසුමේ දක්වා ඇති බදු වලින් නිදහස් කාලසීමාව ඉකුත්වීමෙන් පසුව ඒ ගිවිසුමට අනුව නිශ්චය කරන ලද ආදායම් බදු ගෙවීමට යටත් වී සිටින්නා වූ ද සමාගමකට අදාළව, විගණනය කරන ලද මූල්‍ය ප්‍රකාශයට අනුව ඒ සමාගමේ ආදායම් බදු ගෙවීමට පෙර පැවති ලාභය අදහස් වේ;

(ආ) තනි පුද්ගලයකුට, හවුල් ව්‍යාපාරයකට හෝ (අ) ඡේදයේ සඳහන් සමාගම් හැර සමාගමකට සහ සමාගම් සමූහයක පාලිත සමාගමකට සහ පාලක සමාගමට අදාළව 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 3 වන වගන්තිය යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථය ම තිබිය යුතු ය.

3. (1) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් සෑම පුද්ගලයෙක්, හවුල් ව්‍යාපාරයක්, සමාගමක් සහ සෑම සමාගම් සමූහයක ම පාලිත සමාගම් සහ පාලක සමාගම විසින්, කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව නියම කරනු ලැබිය හැකි යම් ආකෘතියකට අනුව එසේ නියමිත තොරතුරු ඇතුළත් බදු වාර්තාවක් 2022 අප්‍රේල් මස 20 වන දින හෝ එදිනට පෙරාතුව කොමසාරිස්-ජනරාල්වරයා වෙත ලිඛිතව සපයනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින්-

(අ) බදු වාර්තාව සඳහා වන ආකෘතිය;

(ආ) බදු වාර්තාව මගින් ඉදිරිපත් කළ යුතු තොරතුරු සහ බදු වාර්තාව සමග ගොනු කළ යුතු ඇමුණුම් ඇත්නම් ඒ ඇමුණුම්; සහ

(ඇ) ගොනු කළ යුතු ආකාරය,

නිශ්චිතව දක්වනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ කාර්යය සඳහා, (1) වන උපවගන්තිය යටතේ සපයනු ලබන බදු වාර්තාවක්, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධාන යටතේ වන "බදු වාර්තාවක්" ලෙස සලකනු ලැබිය යුතු අතර, එය ස්වයං-තක්සේරු කිරීමකට හේතු විය යුතු ය.

4. (1) මේ පනත යටතේ බද්ද ගෙවීමට යටත් යම් පුද්ගලයෙකු, හවුල් ව්‍යාපාරයක්, සමාගමක් හෝ යම් සමාගම් සමූහයක පාලිත සමාගම් සහ පාලක සමාගම විසින්, මේ පනතේ විධිවිධාන සලසා ඇති පරිදි එම බද්ද ගෙවීමට අපොහොසත් වන අවස්ථාවක, එම පුද්ගලයා, හවුල් ව්‍යාපාරය, සමාගම හෝ සමාගම් සමූහයේ පාලිත සමාගම් සහ පාලක සමාගම මේ පනත යටතේ බදු ගෙවීම පැහැර හරින්නකු ලෙස සලකනු ලැබිය යුතු ය.

(2) හවුල් ව්‍යාපාරයේ නාමයෙන් තක්සේරුවක් කිරීම නීත්‍යනුකූල විය යුතු අතර ඒ සඳහා වැය වන මුදල, හවුල් ව්‍යාපාරයේ වත්කම්වලින් හෝ යම් හවුල්කරුවකුගෙන් හෝ හවුල් ව්‍යාපාරයේ යම් අනුයෝජිතයකුගෙන් අයකර ගත යුතු ය.

5. (1) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ IX වන පරිච්ඡේදයේ, X වන පරිච්ඡේදයේ, XI වන පරිච්ඡේදයේ, XII වන පරිච්ඡේදයේ, XIII වන පරිච්ඡේදයේ, XIV වන පරිච්ඡේදයේ, XVවන පරිච්ඡේදයේ, XVI වන පරිච්ඡේදයේ, XVII වන පරිච්ඡේදයේ, XVIII වන පරිච්ඡේදයේ විධිවිධාන, අවශ්‍ය වෙනස්කම් සහිතව, මේ පනත යටතේ පරිපාලන විධිවිධාන, වාර්තා තබාගැනීම සහ තොරතුරු රැස්කිරීම, බදු වාර්තා, තක්සේරු කිරීම්, විරෝධතා සහ අභියාචනා, බදු සඳහා බැඳීම සහ බදු ගෙවීම, පොළිය, බදු අයකර ගැනීම, දණ්ඩන සහ අපරාධ නඩු කටයුතු සඳහා අදාළ විය යුතු ය.

(2) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ ඉහත කී යම් විධිවිධානවල ආදායම් බදු සම්බන්ධයෙන් වන සෑම සඳහනක් ම, මේ පනතේ විධිවිධාන ප්‍රකාර අයකරනු ලබන සහ ගෙවනු ලබන බද්ද සම්බන්ධයෙන් වන සඳහනක් ලෙස සලකනු ලැබිය යුතු ය.

(3) 2024 දෙසැම්බර් මස තිස් එක් වන දිනයට පසු යම් පුද්ගලයකුට, හවුල් ව්‍යාපාරයකට, සමාගමකට හෝ සමාගම් සමූහයක පාලිත සමාගම්වලට සහ පාලක සමාගමට අදාළව පැහැර හරින ලද තක්සේරුවක්, සංශෝධිත තක්සේරුවක් හෝ අතිරේක තක්සේරුවක් සකස් නොකළ යුතු ය:

එසේ වුව ද, විරෝධතාවයක හෝ අභියාචනයක තීරණයක් මත පදනම්ව සංශෝධිත තක්සේරුවක් කිරීම සඳහා ඉහත කාලසීමාව අදාළ නොවිය යුතු ය.

6. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතේ-

"කොමසාරිස්-ජනරාල්වරයා" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"සමාගම" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු නමුත්-

(අ) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ 2 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල;

(ආ) 1980 අංක 46 දරන සේවා නියුක්තයන්ගේ භාර අරමුදල පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද සේවා නියුක්තයන්ගේ භාර අරමුදල;

(ඇ) 1969 අංක 17 දරන ලංකා විදුලිබල මණ්ඩලය පනතේ 12 වන වගන්තියේ (ඒ) ඡේදය යටතේ පිහිටුවන ලද ලංකා විදුලිබල මණ්ඩලයේ අර්ථසාධක අරමුදල සහ ලංකා විදුලිබල මණ්ඩලයේ විශ්‍රාම අරමුදල;

(ඈ) 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 90 වන වගන්තිය යටතේ පිහිටුවන ලද විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල;

(ඉ) (289 අධිකාරය වූ) වෙළඳ සංගම් ආඥාපනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද වෙළඳ සේවා අර්ථසාධක සමිතිය;

(ඊ) (397 අධිකාරය වූ) ලංකා බැංකු ආඥාපනත යටතේ පිහිටුවන ලද ලංකා බැංකුව මගින් පිහිටුවන ලද ලංකා බැංකු අර්ථසාධක අරමුදල;

(උ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමාසහිත හැටන් නැෂනල් බැංකුව පොදු සමාගම යටතේ පිහිටුවන ලද හැටන් නැෂනල් බැංකු සේවා නියුක්තයන්ගේ අර්ථසාධක අරමුදල;

(ඌ) 1961 අංක 29 දරන මහජන බැංකු පනතේ 5 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඕ) ඡේදය යටතේ පිහිටුවන ලද මහජන බැංකු විශ්‍රාම භාර අරමුදල;

(එ) (422 අධිකාරය වූ) මුදල් නීති පනතේ 10 වන වගන්තියේ (ආ) ඡේදය යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකු සේවා නියුක්තයන්ගේ විශ්‍රාම අරමුදල;

(ඒ) 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ සංස්ථාගත කරන ලද සීමාසහිත ශ්‍රී ලංකා ටෙලිකොම් පොදු සමාගම මඟින් පිහිටුවන ලද ශ්‍රී ලංකා ටෙලිකොම් අර්ථසාධක අරමුදල;

(ඔ) 2006 අංක 28 දරන ජාතික රක්ෂණ භාර අරමුදල පනතේ 3 වන වගන්තිය යටතේ පිහිටුවන ලද ජාතික රක්ෂණ භාර අරමුදල;

(ඕ) (87 වන අධිකාරය වූ) භාර ආඥාපනත යටතේ පිහිටුවන ලද (1996 න් පසු) 2014 ලංකා බැංකු විශ්‍රාම භාර අරමුදල;

(ක) 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනතේ IV වන කොටසේ විධිවිධාන ප්‍රකාරව කම්කරු කොමසාරිස්වරයා විසින් අනුමත කරන ලද යම් අර්ථසාධක අරමුදලක් හෝ දායක විශ්‍රාම යෝජනා ක්‍රමයක්,

ඇතුළු යම් සේවක භාර අරමුදලක්, අර්ථසාධක අරමුදලක්, විශ්‍රාම අරමුදලක්, විශ්‍රාම භාර අරමුදලක්, පාරිතෝෂික හෝ සේවය අවසන් කිරීමේ අරමුදලක් ඇතුළත් නොවේ;

"සමාගම් සමූහය" යන්නෙන්, පාලක සමාගමක් සහ එහි පාලිත සමාගම් අදහස් වේ;

"පාලක සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XVIII වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි නොකරන ලද පාලක සමාගමක් හැර 2021 මාර්තු මස තිස් එක් වන දිනය වන විට වෙනත් සමාගමක ඡන්දය දීමේ අයිතිය සහිත කොටස්වලින් සියයට පනහක ප්‍රතිශතයකට වැඩියෙන්, සෘජුව හෝ වක්‍රව හිමිකාරීත්වය ඇති සමාගමක් අදහස් වේ;

"හවුල් ව්‍යාපාරය" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"බදු වාර්තාව" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය;

"පාලිත සමාගම" යන්නෙන්, ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XVIII වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි නොකරන ලද පාලක සමාගමක ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාපනය කරන ලද සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ XVIII වන පරිච්ඡේදය යටතේ ලියාපදිංචි නොකරන ලද පාලිත සමාගමක් හැර, 2021 මාර්තු මස තිස් එක් වන දිනය වන විට ස්වකීය කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රතිශතයක ඡන්දය දීමේ අයිතිය සහිත කොටස් ප්‍රමාණයක්, සෘජුව හෝ වක්‍රව වෙනත් සමාගමකට හිමිකාරීත්වය ඇති සමාගමක් අදහස් වේ;

"තක්සේරු වර්ෂය" යන්නට, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 20 වන වගන්තිය යටතේ ඒ යෙදුමට දී ඇති අර්ථයම තිබිය යුතු ය.

7. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2022 අංක 22 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 16 වන දින]

(131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 22 දරන කාර්මික ආරාවුල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (131 වන අධිකාරය වූ) කාර්මික ආරාවුල් පනතේ 31ඈ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1අ) කම්කරු විනිශ්චය අධිකාරයක යම් ආඥාවකට එරෙහිව යම් කම්කරුවකු විසින් කරන ලද අභියාචනයක් මත, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයක් මඟින් එම කම්කරුවාට පක්ෂව දෙන ලද අවසාන තීන්දුවකින් අතෘප්තියට පත් සේවායෝජකයකු ඒ තීන්දුවට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයට අභියාචනයක් ඉදිරිපත් කරන අවස්ථාවක දී, එම අභියාචනයට විෂයය වන නියෝගය මඟින්-

(අ) කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස පමණක් විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන මුදලක ඇප මුදලක්; සහ

(ආ) කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස ද, එම කම්කරුවා නැවත සේවයේ පිහිටුවන ලෙස ද විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන මුදලක් සහ එම කම්කරුවාගේ සේවය අවසන් කරන ලද අවස්ථාව වන විට එම කම්කරුවාගේ මාසික වැටුප හෝ වේතන මෙන් දොළොස් ගුණයක් වූ මුදලක ඇප මුදලක්,

සේවායෝජකයා විසින් ඒ විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(1ආ) (1ඇ) උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම අභියාචනයක් ම, (1ඇ) උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල එම සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇති බවට කම්කරු විනිශ්චය අධිකාරයේ සභාපතිවරයා විසින් ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(1ඈ) සෑම විනිශ්චය අධිකාරයක සභාපතිවරයකු විසින් ම, (1ඇ) උපවගන්තිය යටතේ ඇප මුදල් ලෙස ඉදිරිපත් කරනු ලබන සියලු මුදල් ශ්‍රී ලංකාවේ යම් අනුමත බැංකුවක පොළී දරන ගිණුමක තැන්පත් කිරීමට සලස්වනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඈඈඈඈඈ වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ප්‍රධාන ප්‍රඥප්තියේ 31ඈඈඈඈඈඈ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

31ඈඈඈඈඈඈ. (1) මේ පනතේ 17(1) වගන්තිය යටතේ බේරුම්කරුවකු විසින් හෝ 24 වන වගන්තිය යටතේ කාර්මික අධිකරණයක් විසින් කරන ලද ප්‍රදානයකට එරෙහිව රිට් ආඥාවක ස්වභාවයේ වූ ආඥාවක් නිකුත් කරනු ලැබීම සඳහා සේවායෝජකයකු විසින් අභියාචනාධිකරණයට ඉල්ලීමක් ඉදිරිපත් කරන අවස්ථාවක දී, ඒ ඉල්ලීමට විෂයය වන්නා වූ ප්‍රදානය මඟින් කම්කරුවාට යම් මුදලක් ගෙවීමට නියම කරනු ලබන අවස්ථාවක දී, සේවායෝජකයා විසින් ඒ මුදලට සමාන මුදලක ඇප මුදලක් කොමසාරිස් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කිරීමෙන් පසු අභියාචනාධිකරණය විසින් ඒ ඉල්ලීම සලකා බලනු ලැබිය යුතු ය.

(2) කොමසාරිස් ජනරාල්වරයා විසින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල් ශ්‍රී ලංකාවේ අනුමත යම් බැංකුවක කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොළී දරන ගිණුමක තැන්පත් කිරීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) මේ උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල ඒ සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ ප්‍රඥප්තියේ 33අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

33අ. (1) යම් කම්කරුවකුට පක්ෂව කම්කරු විනිශ්චය අධිකාරයක් විසින් කරන ලද ආඥාවක් හෝ කාර්මික අධිකරණයක හෝ බේරුම්කරුවකුගේ ප්‍රදානයක් අනුව කටයුතු කිරීමට අපොහොසත් වීම හේතුවෙන් යම් සේවායෝජකයකුට එරෙහිව 1979 අංක 15 දරන අපරාධ නඩු විධාන සංග්‍රහය පනතේ 136ආ වගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද යම් ලිඛිත පැමිණිල්ලකට අනුව මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් දෙන ලද තීන්දුවක් මඟින් අතෘප්තියට පත් සේවායෝජකයකු, ඒ තීන්දුව සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයේ ප්‍රතිශෝධන අධිකරණ බලය ලබා ගැනීමට ඉල්ලීමක් කරන අවස්ථාවක දී, එම ඉල්ලීමට විෂයය වන්නාවූ ආඥාව මඟින් ඒ කම්කරුවාට යම් මුදලක් ගෙවීමට නියම කරනු ලබන අවස්ථාවේ දී සේවායෝජකයා විසින්, එම මුදලට සමාන මුදල් ප්‍රමාණයකින් වූ ඇප මුදලක් අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, (1) වන උපවගන්තිය යටතේ ඇප මුදල් ලෙස ඉදිරිපත් කරන ලද සියලු මුදල්, ශ්‍රී ලංකාවේ අනුමත බැංකුවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොළී දරන යම් ගිණුමක තැන්පත් කරනු ලැබීම පිණිස කොමසාරිස් ජනරාල්වරයා වෙත යැවීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල ඒ සේවායෝජකයා විසින් යථා පරිදි ඉදිරිපත් කරනු ලැබ ඇති බවට අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ අවසාන තීන්දුවට අනුකූලව, (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද මුදල, ඒ මුදල මත වූ පොලිය ද සමඟ අදාළ පාර්ශ්වය වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.".

5. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 සැප්තැම්බර් මස 16 වන දින]

1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 23 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1971 අංක 45 දරන කම්කරුවන්ගේ රක්ෂාව අවසන් කිරීමේ (විශේෂ විධිවිධාන) පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

   (1) එහි (3) වන උපවගන්තියේ "රුපියල් දහසකට නොවැඩි දඩයකට" යන වචන වෙනුවට "රුපියල් විසි දහසකට නොවැඩි දඩයකට" යන වචන ආදේශ කිරීමෙන්;

   (2) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

   "(3අ) (1) යම් සේවායෝජකයකු (3) වන උපවගන්තිය යටතේ වන වරදකට වරදකරු කරනු ලැබූ අවස්ථාවක, (2) වන උපවගන්තිය යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් ලබා දෙන තීරණයකට අනුකූලව කටයුතු කිරීම ඔහු විසින් අඛණ්ඩව පැහැර හරිනු ලබන්නේ නම්, වරදකරු කරනු ලැබීමෙන් පසු, (3) වන උපවගන්තිය යටතේ පනවනු ලබන යම් දඩයකට අතිරේකව, එම තීරණයට අනුකූලව කටයුතු නොකිරීම අඛණ්ඩව කරගෙන යනු ලබන එක් එක් දිනය සඳහා රුපියල් පන්සියයක අතිරේක දඩයක් කම්කරුවාට ගෙවීමට එම සේවායෝජකයා යටත් විය යුතු ය.

   (2) යම් සේවායෝජකයකු විසින්, (2) වන උපවගන්තියේ (ඉ) ඡේදය යටතේ කම්කරුවකුට ගෙවිය යුතු යම් මුදලක් ගෙවීම පැහැර හරිනු ලබන අවස්ථාවක, එම සේවායෝජකයා වරදකරු කරනු ලැබ ඇත්තේ කවර මහෙස්ත්‍රාත් අධිකරණයකින් ද, එම මහෙස්ත්‍රාත් අධිකරණයෙන් ඔහුට පනවන ලද දඩයක් ලෙස ඒ අධිකරණය විසින් කරනු ලබන ආඥාවක් මඟින් එම මුදල අයකරගනු ලැබිය හැකි අතර, එසේ අයකරගනු ලබන මුදල කම්කරුවාට ගෙවනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තිය, එහි (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "රුපියල් පනහක දඩයකට" යන වචන වෙනුවට "රුපියල් පන්සියයක දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ වගන්ති එම ප්‍රඥප්තියේ 10අ සහ 10ආ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

   10අ. (1) යම් සේවායෝජකයකු මහෙස්ත්‍රාත් අධිකරණය විසින් කරනු ලබන ආඥාවකින් අතෘප්තියට පත් වූ අවස්ථාවක, එම සේවායෝජකයා විසින්, එම මහෙස්ත්‍රාත් අධිකරණය පිහිටා ඇත්තේ යම් පළාතක් තුළ ද, එම පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද මහාධිකරණය වෙත ඒ ආඥාවට එරෙහිව ලිඛිත පෙත්සමක් මඟින් ප්‍රතිශෝධන ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

   (2) (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරන සෑම සේවායෝජකයකු විසින් ම, එම ඉල්ලීමට විෂයය වන ආඥාවෙන් කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස විධාන කරනු ලබන අවස්ථාවක, එම මුදලට සමාන ඇප මුදලක් එම මහෙස්ත්‍රාත් අධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

   (3) (1) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරනු ලබන සෑම ඉල්ලීමක් ම, එම සේවායෝජකයා විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල යථා පරිදි ඉදිරිපත්කොට ඇති බවට අදාළ මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින් ස්වකීය අත්සන යටතේ ඉදිරිපත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

   (4) මහෙස්ත්‍රාත් අධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා විසින්, (2) වන උපවගන්තිය යටතේ ඇප මුදල් ලෙස ඉදිරිපත් කරනු ලබන සියලු මුදල්, ශ්‍රී ලංකාව තුළ අනුමත බැංකුවක, කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන, පොළී දරන යම් ගිණුමක තැන්පත් කිරීම සඳහා කොමසාරිස් ජනරාල්වරයාට යැවීමට කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

   10ආ. (1) යම් සේවායෝජකයකු 6 වන හෝ 6අ වන වගන්ති යටතේ කොමසාරිස් ජනරාල්වරයා විසින් කරන ලද නියමයකින් අතෘප්තියට පත් වූ අවස්ථාවක, එම සේවායෝජකයා විසින් රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා එම නියමයට එරෙහිව අභියාචනාධිකරණය වෙත ඉල්ලීමක් කරනු ලැබිය හැකි ය.

   (2) රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ ඉල්ලීමක් කරන සෑම සේවායෝජකයකු විසින් ම, එම ඉල්ලීමට විෂයය වන නියමය මඟින්-

   (අ) වන්දි ලෙස යම් මුදලක් ගෙවන ලෙස ද, නැවත සේවයේ පිහිටුවන ලෙස ද, විධාන කරනු ලබන අවස්ථාවක, එම නියමයේ දින සිට එම කම්කරුවා නැවත සේවයේ පිහිටුවනු ලැබිය යුතු දින දක්වා ගණනය කළ යුතු වැටුප් හෝ වේතන ලෙස වන යම් මුදල් ප්‍රමාණයක් සහ නැවත සේවයේ පිහිටුවීම වෙනුවෙන් එම කම්කරුවාගේ මාසික වැටුප හෝ වේතන මෙන් දොළොස් ගුණයක් වූ මුදලක ඇප මුදලක්; සහ

(ආ) වන්දි ලෙස කම්කරුවාට යම් මුදලක් ගෙවන ලෙස පමණක් විධාන කරනු ලැබූ අවස්ථාවක, එම මුදලට සමාන මුදලක ඇප මුදලක්.

අභියාචනාධිකරණය වෙත තබනු ලැබිය යුතු ය.

(3) රිට් ආඥාවක ස්වභාවයෙන් වූ ආඥාවක් නිකුත් කිරීම සඳහා (1) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම ඉල්ලීමක්ම, එම සේවායෝජකයා විසින් (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇප මුදල යථා පරිදි ඉදිරිපත්කොට ඇති බවට කොමසාරිස් ජනරාල්වරයා විසින් ස්වකීය අත්සන යටතේ නිකුත් කරනු ලබන සහතිකයක් මඟින් සනාථ කරනු ලැබිය යුතු ය.

(4) කොමසාරිස් ජනරාල්වරයා විසින්, (2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති මුදල් ප්‍රමාණය, ශ්‍රී ලංකාව තුළ අනුමත යම් බැංකුවක කොමසාරිස් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොළී දරන ගිණුමක තැන්පත් කිරීම සඳහා කටයුතු සලස්වනු ලැබිය යුතු ය.

(5) කොමසාරිස් ජනරාල්වරයා විසින්, අවස්ථාවෝචිත පරිදි, අභියාචනාධිකරණය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත කරනු ලබන ඉල්ලීම සම්බන්ධයෙන් වන අවසාන තීරණය ප්‍රකාර, (2) වන උපවගන්තිය යටතේ ඉදිරිපත් කරන ලද ඇප මුදල එම මුදලට අදාළ පොළිය ද සමඟ අදාළ පාර්ශ්වයට ආපසු ගෙවනු ලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ "රුපියල් එක් දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් විසිදහසක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2022 අංක 28 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 25 වන දින]

(122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 28 දරන ඇටෝර්නි බලපත්‍ර (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (122 වන අධිකාරය වූ) ඇටෝර්නි බලපත්‍ර ආඥාපනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "ඇටෝර්නි බලපත්‍රය" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""ඇටෝර්නි බලපත්‍රය" යන්නෙන් යම් නීතීඥවරයකුට යම් තැනැත්තකු වෙනුවෙන් නීතීඥවරයකු ලෙස පෙනී සිටීමේ කාර්යය සඳහා දෙන ලද යම් ලිඛිත බලයක් හෝ අධිකාර බලයක් හැර, ඔහුව නියෝජනය කිරීමට, යම් කාර්යයක් ඉටු කිරීමට, ක්‍රියාවක් කිරීමට හෝ යම් වෙළඳාමක් හෝ ව්‍යාපාරයක් කරගෙන යාමට, එවැනි යම් තැනැත්තකු විසින් තවත් තැනැත්තකුට දෙන ලද්දා වූ ද-

(අ) එය ශ්‍රී ලංකාව තුළ ලියා අත්සන් කරනු ලබන විට, සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරියේ ලියා අත්සන් කරනු ලැබ සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරනු ලැබ; හෝ

(ආ) එය ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියා අත්සන් කරනු ලබන විට, සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරියේ සහ තානාපතිවරයකු හෝ මහ කොමසාරිස්වරයකු හෝ 1981 අංක 4 දරන කොන්සල් කර්තව්‍ය පනතේ අර්ථය තුළට ගැනෙන යම් රාජ්‍ය තාන්ත්‍රික නිලධරයකු හෝ කොන්සල් නිලධරයකු හෝ එකී රටේ නීතිය අනුව එවැනි ඇටෝර්නි බලපත්‍රයක් ලියා සහතික කිරීමට බලය ලබා ඇති යම් තැනැත්තකු ඉදිරියේ ලියා අත්සන් කරනු ලැබ,

ලබා දෙන ලද යම් ලිඛිත බලයක් හෝ අධිකාර බලයක් අදහස් වේ.";

(2) "රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන්:-

""රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා" යන්නට, හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු, සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකු, සහ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ, හිමිකම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගේ, ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකුගේ, නියෝජ්‍ය රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකුගේ හෝ සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරයකුගේ කාර්යයන් තත්කාලයේ නීත්‍යනුකූලව ඉටු කරනු ලබන යම් තැනැත්තකු ඇතුළත් වේ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

3. (1) (අ) ශ්‍රී ලංකාව තුළ හෝ වෙනත් යම් රටක දී ලියා අත්සන් කරනු ලබන සෑම ඇටෝර්නි බලපත්‍රයක්ම රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ලියාපදිංචි කළ යුතු ය.

(ආ) සෑම ඇටෝර්නි බලපත්‍රයක් දරන්නකු (මෙහි මින්මතු "ඇටෝර්නි බලකරු", යනුවෙන් හඳුන්වනු ලබන) විසින් ම -

(i) ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සත්‍ය පිටපතක් බවට සහතික කරන ලද ඇටෝර්නි බලපත්‍රයේපිටපතක්; සහ

(ii) මෙහි i වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති පරිදි සාදන ලද දිවුරුම් ප්‍රකාශයක් ද,

සමඟ ඇටෝර්නි බලපත්‍රය ශ්‍රී ලංකාවේ දී ලියා අත්සන් කරන ලද්දක් නම් ලියා අත්සන් කරන ලද දිනයේ සිට එක් මාසයක කාලයක් ඇතුළත ද, එය ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියා අත්සන් කරන ලද්දක් නම්, ලියා අත්සන් කරන ලද දිනයේ සිට මාස තුනක කාලයක් ඇතුළත ද, එම ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ සඳහන් ඇටෝර්නි බලපත්‍රයේ නිරවද්‍යතාව පිළිබඳව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සෑහීමට පත්වීමෙන් අනතුරුව, ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කර, එහි සහතික පිටපත ගොනුකොට එම සහතික පිටපත මත සහ ඇටෝර්නි බලපත්‍රයේ මුල් පිටපත මත එහි ලියාපදිංචි අංකය හා දිනය සහ එම ලියාපදිංචිය සටහන්කොට ඇති වෙළුමට සහ පත්ඉරුවට යොමුවක් සමඟ සටහන් කොට, එම ඇටෝර්නි බලපත්‍රයේ මුල් පිටපත ඉදිරිපත් කරන ලද තැනැත්තා වෙතම ආපසු භාරදිය යුතු ය.

(3) එවැනි ලියාපදිංචි කිරීමක් මෙහි II වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියට අනුකූලව රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් පවත්වාගෙන යනු ලබන පොතක සටහන් කළ යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්ති මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එම ප්‍රඥප්තියේ 3ඒ, 3ඓ, 3ඇ සහ 3ඈ වගන්ති ලෙස බලාත්මක විය යුතු ය:-

3ඒ. (1) (70 වන අධිකාරය වූ) වංචා වැලැක්වීමේ ආඥා පනතේ 2 වන වගන්තියේ විෂය පථය තුළට ගැනෙන ගණුදෙනුවක අරමුණ සඳහා භාවිත කිරීම පිණිස ප්‍රදානය කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් අවස්ථාවෝචිත පරිදි, (2) වන හෝ (3) වන උපවගන්තිවල නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට යටත්ව ලියා අත්සන් කළ යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇටෝර්නි බලපත්‍රයක් ශ්‍රී ලංකාව තුළ ලියා අත්සන් කරනු ලබන අවස්ථාවක දී-

(අ) එය වංචා වැළැක්වීමේ ආඥාපනතට සහ (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනතට අනුකූලව ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් විධිමත් ලෙස සහතික කරනු ලැබිය යුතු ය;

(ආ) එය ඉඩමකට හෝ ඉඩම් කොටසකට අදාළ වන විට අවස්ථාවෝචිත පරිදි එම ඉඩමේ හෝ ඉඩම් කොටසේ මායිම් සහ සීමා, සහ ප්‍රමාණය සමඟ විස්තරයක් ඊට අන්තර්ගත කළ යුතු ය;

(ඇ) එය සහාධිපත්‍ය දේපළකට අදාළ වන විට සහාධිපත්‍ය කොටස හඳුනාගත හැකි වන විට සහාධිපත්‍ය කොටසේ සහ අනෙකුත් අංගෝපාංගවල විස්තරයක් ද, සහාධිපත්‍ය කොටස හඳුනාගත නොහැකි වන විට දී මුළු ඉඩම පිළිබඳ විස්තරයක් ද ඊට අන්තර්ගත කළ යුතු ය;

(ඈ) ගණුදෙනුවට අදාළ ඉඩම, ඉඩම් කොටස හෝ සහාධිපත්‍ය කොටස පෙර ලියාපදිංචියක් සහිත වන අවස්ථාවක දී, එම ඉඩම, ඉඩම් කොටස හෝ සහාධිපත්‍ය කොටස ලියාපදිංචි කොට ඇති වෙළුම හා පත්ඉරුවට යොමුව ද ඊට අන්තර්ගත කළ යුතු ය;

(ඉ) ප්‍රදානකරුගේ අත්සනට අමතරව ප්‍රදානකරුගේ වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ සහ ප්‍රදානකරුගේ මාපට ඇඟිලි දෙකම නොමැති විට, ප්‍රදානකරුගේ වම් හෝ දකුණු අතේ කවර හෝ ඇඟිල්ලක සලකුණ තැබිය යුතු අතර ඔහුගේ අත් දෙකම නොමැති අවස්ථාවක, ඔහුගේ කකුලේ මාපට ඇඟිලි සලකුණ, ප්‍රසිද්ධ නොතාරිස්වරයා සහ සාක්ෂිකරුවන් ඉදිරියේ තැබිය යුතු ය; සහ

(ඊ) ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් සහතික කරන ලද ප්‍රදානකරුගේ සහ ඇටෝර්නි බලකරුගේ විදේශ ගමන් බලපත්‍රයේ ජීව පිටුවේ, ජාතික හැඳුනුම්පතේ හෝ රියදුරු බලපත්‍රයේ පිටපතක් ඇටෝර්නි බලපත්‍රයට අමුණනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති ඇටෝර්නි බලපත්‍රයක් ශ්‍රී ලංකාවෙන් පිටත දී ලියා අත්සන් කරනු ලබන අවස්ථාවක දී-

(අ) එය මේ පනතේ 2 වන වගන්තිය යටතේ බලයලත් තැනැත්තකු ඉදිරියේ දී නිසි පරිදි ලියා අත්සන් කළ යුතු ය;

(ආ) එය ඉඩමකට හෝ ඉඩම් කොටසකට අදාළ වන විට ඉඩමේ හෝ ඉඩම් කොටසේ මායිම් සහ සීමා, සහ ප්‍රමාණය සමඟ විස්තරයක් ඊට අන්තර්ගත කළ යුතු ය;

(ඇ) එය සහාධිපත්‍ය දේපළකට අදාළ වන විට, සහාධිපත්‍ය කොටස හඳුනාගත හැකි අවස්ථාවක දී, සහාධිපත්‍ය කොටසේ සහ අනෙකුත් අංගෝපාංගවල විස්තරයක් ද, සහාධිපත්‍ය කොටස හඳුනාගත නොහැකි අවස්ථාවක දී මුළු ඉඩම පිළිබඳ විස්තරයක් ද ඊට අන්තර්ගත කළ යුතු ය;

(ඈ) ගණුදෙනුවට අදාළ ඉඩම, ඉඩම් කොටස හෝ සහාධිපත්‍ය කොටස පෙර ලියාපදිංචියක් සහිත වන අවස්ථාවක දී, එම ඉඩම, ඉඩම් කොටස හෝ සහාධිපත්‍ය කොටස ලියාපදිංචි වී ඇති වෙළුමට හා පත්ඉරුවට අදාළ යොමුව ද ඊට අන්තර්ගත කළ යුතු ය; සහ

(ඉ) ප්‍රදානකරු විසින් අත්සන් කරන ලද ප්‍රදානකරුගේ විදේශ ගමන් බලපත්‍රයේ ජීව පිටුවේ පිටපතක් සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ඇටෝර්නි බලකරුගේ විදේශ ගමන් බලපත්‍රයේ ජීව පිටුවේ, ජාතික හැඳුනුම්පතේ හෝ රියදුරු බලපත්‍රයේ පිටපතක්, ඇටෝර්නි බලපත්‍රයට අමුණනු ලැබිය යුතු ය.

3ආ. (1) මේ පනතේ 3ඇ වගන්තියේ සඳහන් ගනුදෙනුවකට අදාළව නොතාරිස් ආඥාපනතට අනුකූලව ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සහතික කරන සෑම ප්‍රසිද්ධ නොතාරිස්වරයෙක් ම -

(අ) රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ, අදාළ වෙළුම් සහ පත්ඉරු පරීක්ෂා කළ යුතු ය;

(ආ) ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට හෝ අවලංගු කර නොමැති බවට සෑහීමට පත් විය යුතු අතර, එසේ සෑහීමට පත් වූ බව එම ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ ඔහුගේ සහතිකයේ සඳහන් කළ යුතු ය; සහ

(ඇ) ප්‍රදානකරුගේ සහ ඇටෝර්නි බලකරුගේ අවස්ථාවෝචිත පරිදි, ජාතික හැඳුනුම්පතේ හෝ රියදුරු බලපත්‍රයේ හෝ විදේශ ගමන් බලපත්‍රයේ ජීව පිටුවේ පිටපතක් සහ ඇටෝර්නි බලපත්‍රයේ පිටපතක් රඳවා තබා ගත යුතු ය.

(2) සැක දුරුකිරීමේ කාර්යය සඳහා, ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කර හෝ අවලංගු කර තිබේ ද, නැති ද යන්න නිශ්චය කිරීමේ කාර්යය පිණිස, එවැනි ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සහතික කරන ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ අදාළ වෙළුම් සහ පත්ඉරු පරීක්ෂා කිරීම ප්‍රමාණවත් විය යුතු බවට ප්‍රකාශ කරනු ලැබේ.

3ඇ. රජයේ ආයතනයක් විසින් ලියා අත්සන් කරන ලද ඇටෝර්නි බලපත්‍රයක් හැර, ඇටෝර්නි බලපත්‍රයක එහි වලංගු කාලසීමාව නිශ්චිතව සඳහන් කර ඇත්නම් මිස හෝ 4 වන වගන්තියේ විධිවිධානවලට අනුකූලව එම ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ඨ කර හෝ අවලංගු කරනු ලැබ ඇත්නම් මිස, ඇටෝර්නි බලපත්‍රයක් එහි අත්සන් කරන ලද දිනයේ සිට වසර පහක කාලසීමාවක් සඳහා පමණක් වලංගු විය යුත්තේ ය.

3ඈ. රජයේ ආයතනයක් හැර කිසිදු තැනැත්තකු විසින් ශ්‍රී ලංකාව තුළ අවලංගු කළ නොහැකි ඇටෝර්නි බලපත්‍රයක් ලියා අත්සන් කරනු නොලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන අලුත් වගන්තිය ආදේශ කරනු ලැබේ:-

4. (1) යම් ඇටෝර්නි බලපත්‍රයක් ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ අවලංගු කිරීමට එහි ප්‍රදානකරු අදහස් කරනු ලබන අවස්ථාවක හෝ එම ඇටෝර්නි බලපත්‍රය යටතේ ක්‍රියා කිරීමට ඇටෝර්නි බලකරු අදහස් නොකරන අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, එම ප්‍රදානකරු හෝ ඇටෝර්නි බලකරු විසින් -

(අ) එම අදහස අනෙක් පාර්ශ්වයට දැනුම් දිය යුතු ය;

(ආ) අවස්ථාවෝචිත පරිදි, ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ අවලංගු කිරීමට හෝ එම ඇටෝර්නි බලපත්‍රය යටතේ ක්‍රියා නොකිරීමට වන ඔහුගේ අදහස ප්‍රකාශ කරමින් ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කරනු ලබන ලේඛනයක් ලියා අත්සන් කළ යුතු ය; සහ

(ඇ) (ආ) ඡේදයේ සඳහන් එවැනි ලේඛනයක් එම ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචි කරන ලද වෙළුමට සහ පත්ඉරුවට හරස් යොමුව ද සමග අදාළ වෙළුමේ සහ පත්ඉරුවේ ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය.

(2) (අ) යම් ඇටෝර්නි බලපත්‍රයක ප්‍රදානකරුට වහාම ක්‍රියාත්මකවන පරිදි ඔහුගේ ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම අවශ්‍ය වන විට, (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් ලේඛනය ලියා අත්සන් කරනු ලැබ රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලබන තෙක්, ප්‍රදානකරු හෝ ඔහුගේ නීතීඥවරයා විසින් ඇටෝර්නි බලපත්‍රය ප්‍රත්‍යාදිෂ්ට කිරීමට හෝ අවලංගු කිරීමට වන ඔහුගේ අදහස, iii වන උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති ආකෘතියෙන් පිටපත් දෙකකින් යුතු දැන්වීමක් මගින්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා දැනුවත් කළ හැකි ය:

එසේ වුව ද, එවැනි දැන්වීමක් එකී දැන්වීමේ දිනයේ සිට මාස තුනක කාලයක් සඳහා පමණක් වලංගු විය යුතු ය.

(ආ) (අ) ඡේදය යටතේ සඳහන් එවැනි දැන්වීමක් ලැබීම මත, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, එම ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ හෝ අවලංගු කිරීමේ අදහස පිළිබඳ, අදාළ වෙළුමේ සහ පත්ඉරුවේ පිටසනක් යෙදිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තියේ "උපලේඛනයේ නියම කරනු ලැබ ඇති" යන වචන වෙනුවට "II වන උපලේඛනයේ නියම කරනු ලැබ ඇති" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛන ආදේශ කරනු ලැබේ:-

[3 (1) වන වගන්තිය]

I වන උපලේඛනය

..... පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක ..... දරන)..... වන මා විසින් .... භක්තිකයකු වශයෙන් අවංකවත්, ගාම්භීර පූර්වකව සහ සත්‍යවත් පහත දැක්වෙන පරිදි මෙයින් ප්‍රතිඥා දී /දිවුරුම් දී ප්‍රකාශකර සිටිමි.

(1) ඉහත සඳහන් දිවුරුම්/ප්‍රතිඥා ප්‍රකාශක මම වෙමි.

(2) ..... පදිංචි (ජාතික හැඳුනුම්පත් අංක ..... දරන)..... යන අය විසින් ලියා අත්සන් කරනු ලැබ ප්‍රසිද්ධ නොතාරිස් ..... විසින් සහතික කරන ලද අංක ..... හා ..... දිනැති ඇටෝර්නි බලපත්‍රයෙන් එහි සඳහන් කාර්යය සඳහා මා ඔහුගේ/ ඇයගේ ඇටෝර්නි බලකරු ලෙස පත් කර ඇති බව මම දිවුරා/ප්‍රතිඥා දී ප්‍රකාශ කරමි.

(3) එම ඇටෝර්නි බලපත්‍රය අව්‍යාජ හා දැනට බලාත්මක ව පවතින බවත්, ප්‍රදානකරු ජීවත්ව සිටින බවට මම විශ්වාස කරන බවත් කියා සිටිමි.

ඉහත සඳහන් දිවුරුම් ප්‍රකාශය මෙහි නම් සඳහන් දිවුරුම් ප්‍රකාශක හට කියවා පැහැදිලි කරදීමෙන් පසුව එහි අන්තර්ගතය අවබෝධ කරගෙන ..... දින..... .....දී ප්‍රතිඥා දී/ දිවුරුම් දී අත්සන් කරන ලදී.

.....
ඇටෝර්නි බලකරු

මා ඉදිරිපිට දී ය.

.....
සාමදාන විනිශ්චයකාර/
දිවුරුම් කොමසාරිස්.

[3 (3) සහ 5 වන වගන්ති]

II වන උපලේඛනය

අනු අංකය:	
ලියාපදිංචි කළ දිනය:	
ප්‍රදානකරුගේ නම සහ ලිපිනය:	
ඇටෝර්නි බලකරුගේ නම සහ ලිපිනය:	
ඇටෝර්නි බලපත්‍රයේ දිනය:	
ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලැබුවේ කා විසින් ද:	
ඇටෝර්නි බලපත්‍රය ලියාපදිංචිය වූ වෙළුම සහ පත්ඉරුව:	
ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම සඳහා ලියා අත්සන් කරනු ලැබ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ලේඛනයේ දිනය සහ අංකය:	
ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම සඳහා ලියා අත්සන් කරනු ලැබ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ලේඛනය භාරදෙන ලද්දේ කා විසින් ද:	
ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම සඳහා ලියා අත්සන් කරනු ලැබ නොතාරිස්වරයකු විසින් සහතික කරන ලද ලේඛනයේ ලියාපදිංචි කරනු ලබන වෙළුම සහ පත්ඉරුව:	

[4 (2) වන වගන්තිය]

III වන උපලේඛනය

රෙජිස්ට්‍රාර් ජනරාල්,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව,
.....

..... (ලිපිනය) යන තැන පදිංචි ..... (ප්‍රදානකරුගේ නම) වන මා විසින්, ඇටෝර්නි බලපත්‍ර රෙජිස්ටරයේ ..... වන වෙළුමේ ..... වන පත්ඉරුවේ ..... දින පොත් අංක ..... යටතේ ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රය අවලංගු

කරන සාධන පත්‍රයක්, මේ දැන්වීමේ දින සිට මාස තුනක් ඇතුළත ලියාපදිංචි කිරීම සඳහා ඔබ වෙත ඉදිරිපත් කිරීමට අදහස් කරන බව, ඇටෝර්නි බලපත්‍ර ආඥාපනත යටතේ දැනුම් දෙමි.

වර්ෂ ....., ... වන දින,

..... හි දී ය.

.....

ප්‍රදානකරුගේ හෝ ප්‍රදානකරුගේ

නීතීඥවරයාගේ අත්සන.

1. අත්සනඃ-

   සම්පූර්ණ නමඃ-

   ජා.හැ.අ.ඃ-

   ලිපිනයඃ-

2. අත්සනඃ-

   සම්පූර්ණ නමඃ-

   ජා.හැ.අ.ඃ-

   ලිපිනයඃ-

   යන අය ඉදිරිපිටදි අත්සන් තබන ලදී.".

8. (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ මේ පනතේ විධිවිධානවල පටහැනිව කුමක් සඳහන් වුව ද, එය නොතකා -

   (අ) මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයක දී ලියා අත්සන් කරනු ලැබ ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි නොකරන ලද, සහ මේ පනත ආරම්භ වන දින හෝ එදිනට පෙරාතුව ම වූ දිනක දී ප්‍රත්‍යාදිෂ්ට හෝ අවලංගු නොකරන ලද සෑම ඇටෝර්නි බලපත්‍රයක් ම මේ පනත ආරම්භ වන දින සිට මාස හයක කාලසීමාවක් ඇතුළත ලියාපදිංචි කිරීම සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කළ යුතු ය;

   (ආ) මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයක දී ලියා අත්සන් කරනු ලැබ ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචි කරනු ලැබ ඇති සහ මේ පනත ආරම්භ වන දින හෝ එදිනට පෙරාතුව ම වූ දිනක දී ප්‍රත්‍යාදිෂ්ට හෝ අවලංගු නොකරන ලද සෑම ඇටෝර්නි බලපත්‍රයක් ම මේ පනතේ 4 වන වගන්තිය යටතේ ප්‍රත්‍යාදිෂ්ට කිරීම හෝ අවලංගු කිරීම සිදු කරන තෙක් තවදුරටත් වලංගු හා බලාත්මක විය යුතු ය;

   (ඇ) මේ පනත ආරම්භ වන දිනට පෙරාතුව ම වූ දිනයක දී ලියා අත්සන් කරනු ලැබ ලියාපදිංචිය සඳහා රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබ ඇති සහ මේ පනත ආරම්භ වන දිනයේ දී ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තියේ විධිවිධාන යටතේ ලියාපදිංචිය අවසන් නොවූ, සෑම ඇටෝර්නි බලපත්‍රයක් ම, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් ලියාපදිංචි කළ යුතු ය.

   (2) (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාලසීමාව තුළ ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු නොලබන එම ඡේදයේ සඳහන් සෑම ඇටෝර්නි බලපත්‍රයක් ම, එම කාලසීමාව අවසන් වීමේ දිනයේ සිට බලාත්මක වන පරිදි ශූන්‍ය සහ බල රහිත වූ ලෙස සලකනු ලැබිය යුතු ය.

9. මෙම පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2022 අංක 30 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 25 වන දින]

(70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේඃ-

1. මේ පනත 2022 අංක 30 දරන වංචා වැළැක්වීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (70 වන අධිකාරය වූ) වංචා වැළැක්වීමේ ආඥාපනතෙ 2 වන වගන්තිය, "එය ලිඛිත වන්නේ නම් ද" යන වචනවල සිට ඒ වගන්තියේ අවසානය දක්වා වූ සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේඃ-

   "(අ) අදාළ ඔප්පුව හෝ සාධන පත්‍රය ලිඛිත වන්නේ නම් ද එකම අවස්ථාවක දී පැමිණ සිටින සාක්ෂිකරුවන් දෙදෙනෙකු ඉදිරිපිට එකී සෑම ලියා අත්සන් කරන්නකු විසින් ම අත්සන් කර ප්‍රසිද්ධ නොතාරිස්වරයකු විසින් සහතික කර ඇත්නම් ද; සහ

(ආ) එකී සෑම ලියා අත්සන් කරන්නකුගේ ම වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ එවැනි ලියා අත්සන් කරන්නකුගේ මාපට ඇඟිලි දෙකම නොමැති නම්, අවස්ථාවෝචිත පරිදි වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයක ඇඟිලි සලකුණ අදාළ ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතේ, දෙවන පිටපතේ සහ මූලපත්‍රයේ අත්සනට ඉහළින් හෝ ඒ අසලින් තබා ඇත්නම් මිස,

බලාත්මක නොවිය යුතු ය; හෝ නීතියෙහිලා ආධාර කර ගත නොහැකි විය යුතු ය:

එසේ වුව ද, යම් හේතුවක් මත එවැනි යම් ලියා අත්සන් කරන්නකුගේ අත්සන හෝ මාපට ඇඟිලි සලකුණ ලබා ගත නොහැකි අවස්ථාවක, ප්‍රසිද්ධ නොතාරිස්වරයාගේ සහතිකයෙහි එකී හේතුව සඳහන් කරනු ලැබිය යුතු අතර, එකී ලියා අත්සන් කරන්නා විසින් අවස්ථාවෝචිත පරිදි වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක් තබනු ලැබිය යුතු ය.";

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 4 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තිය (1) වන උපවගන්තිය ලෙස නැවත අංකනය කිරීමෙන්;

(2) ඒ වගන්තියේ නැවත අංකනය කරන ලද (1) වන උපවගන්තියේ "මෙහි මින්මතු සඳහන් කරනු ලබන ආකාරයට" යන වචනවල සිට ඒ උපවගන්තියේ අවසානය දක්වා වූ වචන ඉවත් කර ඒ වෙනුවට "(2) වන උපවගන්තියේ නිශ්චිතව දක්වා ඇති විධිවිධානවලට යටත්ව ලියා අත්සන් කර ඇත්නම් මිස වලංගු නොවිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(3) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) තෙස්තමේන්තුකරු විසින්, එකම අවස්ථාවක දී පැමිණ සිටින ප්‍රසිද්ධ නොතාරිස්වරයකු සහ සාක්ෂිකරුවන් දෙදෙනකු ඉදිරිපිට (1) වන උපවගන්තියේ සඳහන් අන්තිම කැමති පත්‍රයේ, තෙස්තමේන්තුවේ හෝ කොඩිසිල් පත්‍රයේ පාමුල හෝ කෙළවර -

(අ) අත්සන් කරනු ලැබිය යුතු ය; සහ

(ආ) ඔහුගේ වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ තබනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් හේතුවක් මත තෙස්තමේන්තුකරුගේ මාපට ඇඟිලි සලකුණ ලබා ගත නොහැකි අවස්ථාවක, ඔහු විසින්, අවස්ථාවෝචිත පරිදි, වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක් තබනු ලැබිය යුතු ය.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "තෙස්තමේන්තුකරුගේ හෝ තෙස්තමේන්තුකාරියගේ "අත්සන" යන වචන වෙනුවට "අත්සන සහ තෙස්තමේන්තුකරුගේ අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ වෙනත් යම් ඇඟිලි සලකුණක් හෝ පාදයක ඇඟිලි සලකුණක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන ව්‍යතිරේඛය ඇතුළත් කිරීමෙන්:-

"එසේ වුව ද, තෙස්තමේන්තුකරුගේ අවස්ථාවෝචිත පරිදි වම් හෝ දකුණු මාපට ඇඟිලි සලකුණ හෝ වෙනත් යම් ඇඟිලි සලකුණක් යම් හේතුවක් මත ලබාගැනීමට නොහැකි වූ අවස්ථාවක දී, තෙස්තමේන්තුකරු විසින් ඔහුගේ පාදයක ඇඟිලි සලකුණ තැබිය යුතු අතර ප්‍රසිද්ධ නොතාරිස්වරයා විසින් එම හේතුව ඔහුගේ සහතිකයේ සටහන් කළ යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) "පිටපත් දෙකකින්" යන වචන වෙනුවට "පිටපත් තුනකින්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) එහි පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන්:-

"ඔප්පු පිටපත් තුනකින් ලියා අත්සන් කළ යුතු බව".

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

විසි එක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය

[සහතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 31 වන දින]

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත විසි එක්වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මේ පනතේ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ:-

"VIIඅ වන පරිච්ඡේදය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව

41අ. (1) පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත වන, (මේ පරිච්ඡේදයේ "සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවක් තිබිය යුත්තේ ය:-

(අ) අග්‍රාමාත්‍යවරයා;

(ආ) කථානායකවරයා;

(ඇ) පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකවරයා;

(ඈ) ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;

(ඉ) පහත සඳහන් පරිදි නාමයෝජනා කරනු ලැබ ජනාධිපතිවරයා විසින් පත්කරනු ලැබිය යුතු තැනැත්තන් පස් දෙනෙක්:-

(i) ආණ්ඩුව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාමයෝජනා කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;

(ii) විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් වන දේශපාලන පක්ෂයේ හෝ ස්වාධීන කණ්ඩායමේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ බහුතරයේ එකඟත්වය මත නාමයෝජනා කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්; සහ

(iii) අග්‍රාමාත්‍යවරයාගේ සහ විරුද්ධ පක්ෂයේ නායකවරයාගේ එකඟත්වය මත, කථානායකවරයා විසින් නාමයෝජනා කරනු ලබන තැනැත්තන් තිදෙනෙක්; සහ

(ඊ) ආණ්ඩුව නියෝජනය කරන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා අයත් වන දේශපාලන පක්ෂයට හෝ ස්වාධීන කණ්ඩායමට අයත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්ගේ එකඟත්වය මත නාමයෝජනා කොට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන එක් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්.

(2) කථානායකවරයා සභාවේ සභාපතිවරයා විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදය හෝ (ඊ) ඡේදය යටතේ වන පත්කිරීම් සඳහා වූ නාමයෝජනා, ඒ නාමයෝජනා කිරීමේ අවශ්‍යතාවය පැහැදිලි කරන කවර හෝ අවස්ථාවන්හි දී සිදු කිරීමට වගබලා ගැනීම කථානායකවරයාගේ කාර්යය වන්නේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ සඳහන් තැනැත්තන් පස්දෙනා නම් කිරීමේ දී, අවස්ථාවෝචිත පරිදි, අග්‍රාමාත්‍යවරයා, කථානායකවරයා සහ විරුද්ධ පක්ෂයේ නායකවරයා හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසින් ව්‍යක්තීය සහ සමාජයීය විවිධත්වය ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ත්ව ලක්ෂණය සහාවෙන් පිළිබිඹු වන බව සහතික කරනු ලැබිය යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදය යටතේ පත් කරනු ලබන්නා වූ ද, පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් නොවන්නා වූ ද තැනැත්තන් විශිෂ්ටත්වයෙන් හා අවංකභාවයෙන් යුත්, පොදු හෝ ව්‍යක්තීය ජීවිතයේ දී කීර්තියට පත්, කිසිදු දේශපාලන පක්ෂයක සාමාජිකයන් නොවන තැනැත්තන් විය යුතු අතර ඔවුන් නම් කරනු ලැබීම පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබිය යුත්තේ ය.

(6) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) සහ (ඊ) ඡේද යටතේ කරන ලද නාම යෝජනා නිශ්චිතව දක්වමින් ලිඛිත දැනුම් දීමක් ජනාධිපතිවරයා වෙත ලැබී දින දහහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින් ඒ අවශ්‍ය පත්කිරීම් කරනු ලැබිය යුත්තේ ය.

(7) (අ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 64 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ කවර විධිවිධානයක් තිබුණ ද, පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූ විටක, ඉහත කී ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු කථානායකවරයා වශයෙන් තෝරා පත් කර ගන්නා තෙක්, ඒ දක්වා සිටි කථානායකවරයා සභාවේ සාමාජිකයකු ලෙස තවදුරටත් ධුරය දැරිය යුත්තේ ය.

(ආ) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබූව ද, අග්‍රාමාත්‍යවරයා, විරුද්ධ පක්ෂයේ නායකවරයා සහ සභාවේ සාමාජිකයන් වන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් එකී විසුරුවා හැරීමට පසුව පවත්වනු ලබන මහමැතිවරණයට ඉක්බිතිව පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු, අවස්ථාවෝචිත පරිදි, අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලබන තෙක් හෝ පාර්ලිමේන්තුවේ විරුද්ධ පක්ෂයේ නායකයා ලෙස පිළිගනු ලබන තෙක් හෝ යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් සංඛ්‍යාවක් (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ), (ඉ) සහ (ඊ) ඡේද යටතේ සභාවේ සාමාජිකයන් ලෙස පත් කරනු ලබන තෙක්, සභාවේ සාමාජිකයන් ලෙස තවදුරටත් ධුර දැරිය යුත්තා හ.

(8) (අ) (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ) ඡේදය යටතේ පත්කරනු ලබන සභාවේ සාමාජිකයා ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය.

(ආ) (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) සහ (ඊ) ඡේද යටතේ පත් කරන ලද සභාවේ සෑම සාමාජිකයකු ම ඔහු විසින්, ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ එවැනි යම් සාමාජිකයකු ශාරීරික හෝ මානසික අශක්තතාවකට පත් වීම සහ ඔහුට තවදුරටත් තම ධුරයේ කටයුතු කරගෙන යාමට නොහැකි වීම පදනම් කොට ගෙන (නොපැමිණි මන්ත්‍රීවරයන් ද ඇතුළුව) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන්

බහුතරයක් පක්ෂව ඡන්දය දී සම්මත කරගනු ලබන යෝජනා සම්මතයක් මත ජනාධිපතිවරයා විසින් ඔහු ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු විෂයයෙහි ප්‍රජා අශක්නූතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබ ඇත්නම් හෝ 41ඉ වන ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාව යටතේ ඔහු සිය ධුරය හැර ගියාක් සේ සලකනු ලබන්නේ නම් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය.

(9) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ), (ඉ) හෝ (ඊ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයන් අතර පුරප්පාඩුවක් ඇති වූ විටක, එම පුරප්පාඩුව ඇතිවීමේ දින සිට දින දහතරක් ඇතුළත, ඉහත සඳහන් ඡේදයන්හි විධිවිධාන සැලකිල්ලට ගනිමින්, ජනාධිපතිවරයා විසින් ඒ සාමාජිකයා වෙනුවට අනුප්‍රාප්ත වීම පිණිස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය යුත්තේ ය. එසේ පත් කරනු ලැබූ යම් තැනැත්තෙක්, ඔහු අනුප්‍රාප්ත වන්නේ යම් සාමාජිකයකු වෙනුවට ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඉතිරිව තිබෙන කොටස සඳහා ධුරය දැරිය යුත්තේ ය.

(10) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ), (ඉ) හෝ (ඊ) ඡේදය යටතේ පත් කරන ලද සාමාජිකයකු නැවත පත් කරනු ලැබීමට සුදුස්සෙක් නොවන්නේ ය.

(11) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ), (ඉ) සහ (ඊ) ඡේද යටතේ ජනාධිපතිවරයා විසින් කරනු ලබන පත්වීම් කථානායකවරයාට දැනුම් දිය යුත්තේ ය.

41ආ.(1) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස හෝ ජනාධිපතිවරයා විසින් තැනැත්තකු පත් කිරීම සභාවේ නිර්දේශය මත හැර, කරනු නොලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන, එකී යම් කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් ලෙස හෝ සාමාජිකයන් ලෙස පත් කිරීම සඳහා අවස්ථාව එළඹෙන කවර හෝ විටක එසේ පත් කරනු ලැබිය යුතු නිසි සහ යෝග්‍ය තැනැත්තන් ජනාධිපතිවරයා වෙත නිර්දේශ කිරීම සභාවේ කාර්යය වන අතර ඒ නිර්දේශවලින් ස්ත්‍රී පුරුෂ භාවය ඇතුළුව ශ්‍රී ලාංකීය සමාජයේ බහුත්ත්ව ස්වභාවය පිළිබිඹු වන බව වගබලා ගැනීමට ප්‍රයත්න දරනු ලැබිය යුත්තේ ය. ඒ කොමිෂන් සභාවල සභාපතිවරුන් සම්බන්ධයෙන් වන විට, පත් කිරීම සඳහා සභාව විසින් තැනැත්තන් තිදෙනකු නිර්දේශ කරනු ලැබිය යුතු අතර, නිර්දේශ කරනු ලැබූ තැනැත්තන්ගෙන් එක් අයෙකු ජනාධිපතිවරයා විසින් සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

(4) පත්කිරීම් සඳහා සභාවේ නිර්දේශය ලැබුණු දින සිට දින දහතරක් ඇතුළත ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කොමිෂන් සභාවල සභාපතිවරුන් සහ සාමාජිකයන් පත්කරනු ලැබිය යුත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන යම් තැනැත්තකු හෝ කොමිෂන් සභාවක සභාපතිවරයා ලෙස හෝ සාමාජිකයකු ලෙස වැඩ බැලීම සඳහා පත් කරනු ලබන තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියක හෝ විධිවිධානවල සලසා තිබෙන පරිදි හැර ඉවත් කරනු නොලැබිය යුත්තේ ය. එවැනි විධිවිධානයක් නොමැති අවස්ථාවක දී ඒ තැනැත්තා සභාවේ පූර්ව අනුමතය ඇතිව පමණක් ජනාධිපතිවරයා විසින් ඉවත් කරනු ලැබිය යුත්තේ ය.

(6) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් සියලු කොමිෂන් සභා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය. පිළිතුරු දීමට බැඳී සිටිය යුත්තේ ය.

උපලේඛනය

(අ) මැතිවරණ කොමිෂන් සභාව.

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාව.

(ඈ) විගණන සේවා කොමිෂන් සභාව.

(ඉ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාව.

(ඊ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාව.

(උ) මුදල් කොමිෂන් සභාව.

(ඌ) සීමා නිර්ණය කොමිෂන් සභාව.

(එ) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව.

41ඇ. (1) ජනාධිපතිවරයා විසින් සභාවට කරන ලද නිර්දේශයක් මත, සභාව විසින් අනුමත කර ඇත්නම් මිස, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති කිසිම ධුරයකට ජනාධිපතිවරයා විසින් කිසිදු තැනැත්තකු පත් කරනු නොලැබිය යුත්තේ ය.

(2) මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන, මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් ධුරයක දින දහහතරකට වැඩි කාලයක් වැඩ බැලීම සඳහා පත් කරනු ලබන යම් තැනැත්තකු සම්බන්ධයෙන් ද අදාළ විය යුත්තේ ය:

එසේ වුව ද, දින දහහතරක් නොඉක්මවන අනුක්‍රමික කාලසීමා සඳහා එවැනි කවර හෝ ධුරයක වැඩ බැලීමට යම් තැනැත්තකු පත් කිරීම ජනාධිපතිවරයා විසින් කරන ලද නිර්දේශයක් මත සභාව විසින් අනුමත කරනු ලැබ ඇත්නම් මිස, නොකළ යුත්තේ ය.

(3) මේ ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව සඳහන් කවර හෝ ධුරයකට පත් කරනු ලැබූ කිසිදු තැනැත්තකු හෝ ඒ ධුරයකට පත් කරන ලද තැනැත්තකු වෙනුවෙන් වැඩ බැලීම සඳහා පත් කරනු ලැබූ කිසිදු තැනැත්තකු, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ යම් ලිඛිත නීතියකින් හෝ විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, එකී ධුරයෙන් ඉවත් කරනු නොලැබිය යුත්තේ ය.

(4) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන් සහ අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන් පත් කිරීම හා සම්බන්ධ ස්වකීය කර්තව්‍යය ඉටු කිරීමේ දී, සභාව විසින් අග්‍ර විනිශ්චයකාරවරයාගේ අදහස් ලබාගත යුත්තේ ය.

උපලේඛනය

I වන කොටස

(අ) අග්‍රවිනිශ්චයකාරවරයා සහ ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්.

(ආ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා සහ අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්.

(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සභාපතිවරයා හැර අනෙකුත් සාමාජිකයන්.

II වන කොටස

(අ) නීතිපතිවරයා.

(ආ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා.

(ඇ) විගණකාධිපතිවරයා.

(ඈ) පොලිස්පතිවරයා.

(ඉ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්).

(ඊ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා.

41ඈ.(1) සභාවට මහ ලේකම්වරයකු සිටිය යුත්තේ ය. මහ ලේකම්වරයා සභාව විසින් අවුරුදු තුනක කාලයක් සඳහා පත් කරනු ලැබිය යුත්තේ ය. මහ ලේකම්වරයා ඔහුගේ ධුර කාලය අවසන් වීමෙන් පසු නැවත පත්කරනු ලැබීමට සුදුසු විය යුත්තේ ය.

(2) එහි කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය යයි සභාව විසින් සලකනු ලබන යම් නිලධරයන්, සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත සභාව විසින් පත් කරනු ලැබිය හැක්කේ ය.

41ඉ. (1) සභාව විසින් සෑම මාසයක ම යටත් පිරිසෙයින් දෙවාරයක් ද, එය වෙත මේ පරිච්ඡේදයේ විධිවිධාන මගින් හෝ වෙනත් යම් නීතියක් මගින් හෝ පවරා ඇති කර්තව්‍ය ඉටුකිරීම සඳහා අවශ්‍ය විය හැකි තාක් වාර ගණනක් ද රැස්විය යුතු අතර, සභාවේ සභාපතිවරයාගේ විධානය මත සභාවේ මහ ලේකම්වරයා විසින් ඒ රැස්වීම් කැඳවනු ලැබිය යුත්තේ ය.

(2) සභාපතිවරයා, සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය. සභාවේ යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති අවස්ථාවක දී අග්‍රාමාත්‍යවරයා ද, අග්‍රාමාත්‍යවරයා පැමිණ නොමැති අවස්ථාවක දී විරුද්ධ පක්ෂයේ නායකවරයා ද, සභාවේ රැස්වීම්වල මූලාසනය දැරිය යුත්තේ ය.

(3) සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස්දෙනෙක් විය යුත්තේ ය.

(4) සභාව විසින් කරනු ලැබිය යුතු සෑම නිර්දේශයක් හෝ අනුමත කිරීමක් ද, ගනු ලබන සෑම තීරණයක් ද, ඒකමතිකව තීරණය කිරීමට සභාව විසින් උත්සාහ දරනු ලැබිය යුත්තේ ය. ඒකමතික තීරණයක් නොමැති අවස්ථාවක දී සභාවේ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් පස් දෙනකුට නොඅඩු සංඛ්‍යාවක් විසින් සනාථ කළහොත් මිස, සභාව විසින් කරන ලද යම් නිර්දේශයක් හෝ අනුමත කිරීමක් හෝ ගනු ලැබූ යම් තීරණයක් හෝ බල සහිත නොවිය යුත්තේ ය.

(5) සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයාට මුල් ඡන්දයක් නොමැති නමුත්, සභාවේ යම් රැස්වීමක දී තීරණය කරනු ලැබිය යුතු යම් ප්‍රශ්නයක් සඳහා සම සමව ඡන්දය ලැබුණු අවස්ථාවක දී සභාපතිවරයාට හෝ රැස්වීමේ මූලාසනය දරන වෙනත් සාමාජිකයාට තීරක ඡන්දයක් තිබිය යුත්තේ ය.

(6) 41ආ වන හෝ 41ඇ වන ව්‍යවස්ථාව යටතේ යම් පත්කිරීමක් සඳහා යෝග්‍ය තැනැත්තන් නිර්දේශ කිරීමේ දී හෝ අනුමත කිරීමේ දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ද ඇතුළුව, සභාවේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරන ආකාරය සම්බන්ධයෙන් අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සභාව විසින් තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(7) 41ඇ වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඈ), (ඉ) හෝ (ඊ) ඡේදය යටතේ පත් කරනු ලැබූ සභාවේ යම් සාමාජිකයකු සභාවේ පූර්ව අවසරය ලබා නොගෙන සභාවේ අනුක්‍රමික රැස්වීම් තුනකට නොපැමිණ සිටි අවස්ථාවක දී, ඒ සාමාජිකයා ඒ තෙවන රැස්වීමේ දින සිට බලාත්මක වන පරිදි ධුරය අත්හරිනු ලැබුවාක් සේ සැලකිය යුත්තේ ය.

(8) සභාව පූර්ණ වශයෙන් සංස්ථාපිත නොවූවද, නැතහොත් සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබුණ ද, ඒ බව නොතකා ක්‍රියා කිරීමට සභාවට බලය ඇත්තේ ය. සභාව පූර්ණ වශයෙන් සංස්ථාපිත නොවීමේ හේතුව හෝ සභාවේ සාමාජිකත්වයේ පුරප්පාඩුවක් තිබීමේ හේතුව හෝ නිසාම පමණක් සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් ක්‍රියාත්මක කරනු ලැබූ හෝ ගනු ලැබූ සභාවේ යම් ක්‍රියාවක්, කටයුත්තක් හෝ තීරණයක් නිර්බල නොවන්නේ ය; නිර්බල වන්නේ යයි නොසැලකිය යුත්තේ ය.

41ඊ. සභාවේ සාමාජිකයන්ගේ හෝ 41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ නිශ්චිතව දක්වා ඇති යම් කොමිෂන් සභාවක සාමාජිකයන්ගේ හෝ ධුර කාල ඉකුත් වීම නොතකා, අවස්ථාවෝචිත පරිදි, සභාවේ හෝ ඒ වෙනත් කොමිෂන් සභාවල හෝ අලුත් සාමාජිකයන් ධුර භාරගන්නා තෙක්, ඒ දක්වා සිටි සභාවේ හෝ ඒ වෙනත් කොමිෂන් සභාවල සාමාජිකයන් තවදුරටත් ධුර දැරිය යුත්තේ ය.

41උ. (1) සභාව විසින් සෑම මාස තුනකට ම වරක් ඊට පෙරාතුව වූ මාස තුන තුළ එහි කටයුතු පිළිබඳව වාර්තාවක් ජනාධිපතිවරයා වෙත සහ පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුත්තේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් හෝ වෙනත් යම් ලිඛිත නීතියකින් පනවනු ලැබිය හැකි පරිදි වූ හෝ පවරනු ලැබිය හැකි පරිදි වූ වෙනත් කාර්ය සහ කර්තව්‍ය සභාව විසින් කිරීම ද ඉටු කිරීම ද කරනු ලැබිය යුත්තේ ය.

(3) ස්වකීය කාර්ය හා කර්තව්‍ය කිරීමට සහ ඉටු කිරීමට අදාළව රීති සැදීමට සභාවට බලය ඇත්තේ ය. එකී සියලු රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එකී පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

41ඌ. සභාව විසින් දරනු ලබන වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුත්තේ ය.

41එ. 126 වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, සභාවේ යම් තීරණයක් හෝ සභාව විසින් කරන ලද යම් අනුමත කිරීමක් හෝ නිර්දේශයක් භාර ගැනීමට, විභාග කිරීමට හෝ ඒ පිළිබඳ තීරණයක් දීමට හෝ කවර වූ හේතුවක් මත හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීමට, කිසිදු අධිකරණයකට බලය හෝ අධිකරණ බලය නොමැති විය යුත්තේ ය. එකී තීරණය, අනුමතය හෝ නිර්දේශය සියලු කාර්ය සඳහා අවසානාත්මක හා තීරණාත්මක විය යුත්තේ ය.".

3. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIII වන පරිච්ඡේදය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ:

"VIII වන පරිච්ඡේදය

විධායකය

අමාත්‍ය මණ්ඩලය

42. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ද, මහජන ආරක්ෂාව සම්බන්ධයෙන් තත්කාලයේ බලපවත්නා නීතිය ඇතුළු යම් ලිඛිත නීතියක් යටතේ ද, ස්වකීය බලතල, කාර්ය සහ කර්තව්‍ය යථා පරිදි ක්‍රියාත්මක කිරීම හා යථා පරිදි ඉටුකිරීම සම්බන්ධයෙන් ජනාධිපතිවරයා පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය.

43. (1) ජනරජයේ ආණ්ඩුවේ පාලනය මෙහෙය වීම සහ ඒ පාලනය පිළිබඳ විධානය භාර අමාත්‍ය මණ්ඩලයක් වන්නේ ය.

(2) අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුවට සාමූහිකව වගකීමට සහ පිළිතුරු දීමට බැඳී සිටින්නේ ය.

(3) ජනාධිපතිවරයා අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයෙක් ද අමාත්‍ය මණ්ඩලයේ ප්‍රධානයා ද වන්නේ ය:

එසේ වුව ද, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩලය විසිර ගිය ද ජනාධිපතිවරයා තවදුරටත් තම ධුරය දරන්නේ ය.

(4) ජනාධිපතිවරයාගේ මතය අනුව පාර්ලිමේන්තුවේ විශ්වාසය උපරිම වශයෙන් ඇති පාර්ලිමේන්තු මන්ත්‍රීවරයා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.

44. (1) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින්, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාව ද, අමාත්‍යාංශ සංඛ්‍යාව ද, ඒ අමාත්‍යවරයන්ට පවරන විෂය සහ කාර්ය ද, නිශ්චය කළ යුත්තේ ය.

(2) ජනාධිපතිවරයා විසින් එසේ නිශ්චය කරනු ලබන අමාත්‍යාංශ භාරව කටයුතු කිරීම සඳහා අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් අතුරෙන් අමාත්‍යවරයන් පත්කළ යුත්තේ ය.

(3) ජනාධිපතිවරයා ආරක්ෂක විෂයය භාර අමාත්‍යවරයා විය යුතු අතර, මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ හෝ 45 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ හෝ අමාත්‍ය මණ්ඩලයේ යම් අමාත්‍යවරයකු හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන යම් අමාත්‍යවරයකු වෙත යම් විෂයයක් හෝ කාර්යයක් පවරා නොමැති කාලපරිච්ඡේදයක් වන්නේ ද, එවන් කාලපරිච්ඡේදයක් ඇතුළත වූ දින දහහතරක්

නොඉක්මවන කාලයක් සඳහා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව ජනාධිපතිවරයා විසින් ඒ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම කළ හැක්කේ ය. ඒ අනුව, ඒ විෂයය හෝ කාර්යය පවරනු ලැබූ අමාත්‍යවරයා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක ඇති සඳහනක් ජනාධිපතිවරයා සම්බන්ධයෙන් වූ සඳහනක් ලෙස කියවා තේරුම්ගත යුත්තේ ය:

එසේ වුව ද, මේ අනුව්‍යවස්ථාවේ මීට ඉහතින් වූ විධිවිධාන මගින්, යම් විෂයයක් හෝ කාර්යයක් ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, තමන්ගේ භාරය වෙත පවරා ගැනීම වළක්වනු නොලබන්නේ ය. ඒ අනුව, ඒ විෂයය හෝ කාර්යය පවරනු ලැබූ අමාත්‍යවරයා සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක ඇති සඳහනක් ජනාධිපතිවරයා සම්බන්ධයෙන් වූ සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුත්තේ ය.

(4) ජනාධිපතිවරයා විසින් කවර අවස්ථාවක දී වුව ද, අමාත්‍ය මණ්ඩලය වෙත පවරන ලද විෂය සහ කාර්ය වෙනස් කිරීම සහ අමාත්‍ය මණ්ඩලයේ සංයුතිය වෙනස් කිරීම ද, කරනු ලැබිය හැක්කේ ය. අමාත්‍ය මණ්ඩලයේ අඛණ්ඩ පැවැත්මට සහ පාර්ලිමේන්තුව වෙත අමාත්‍ය මණ්ඩලය දරන වගකීමේ අඛණ්ඩ පැවැත්මට එවැනි වෙනස් කිරීමක් බල නොපාන්නේ ය.

45. (1) ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් පත් කරනු ලැබිය හැක්කේ ය.

(2) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසීම අවශ්‍ය යයි ජනාධිපතිවරයා සලකන අවස්ථාවන්හි අග්‍රාමාත්‍යවරයාගේ අදහස් ද විමසා, ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව යටතේ පත් කරනු ලබන අමාත්‍යවරයන්ට පැවරිය යුතු විෂය සහ කාර්ය ද, ඔවුන්ට යම් අමාත්‍යාංශ භාර කරන්නේ නම් ඒ අමාත්‍යාංශ ද, නිශ්චය කරනු ලැබිය හැක්කේ ය.

(3) ජනාධිපතිවරයා විසින්, මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ කරන යම් භාර කිරීමක් කවර වූ හෝ විටක වෙනස් කරනු ලැබිය හැක්කේ ය.

(4) (1) වන අනුව්‍යවස්ථාව යටතේ පත්කරනු ලබන සෑම අමාත්‍යවරයෙක් ම අමාත්‍ය මණ්ඩලයට සහ පාර්ලිමේන්තුවට වගකීමට සහ උත්තර දීමට බැඳී සිටින්නේ ය.

(5) අමාත්‍ය මණ්ඩලයේ කවර වූ හෝ අමාත්‍යවරයකු විසින් ඔහු වෙත පැවරී ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් හෝ යම් ලිඛිත නීතියකින් ඔහුට පැවරී ඇත්තා වූ හෝ නියම වී ඇත්තා වූ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් ගැසට් පත්‍රයේ පළකරනු ලබන නිවේදනයක් මගින් අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුට පවරා දිය හැකි අතර, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාට එකී බලතල කිසිවක් හෝ කාර්යයක් පවරන්නා වූ හෝ නියම කරන්නාවූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, මේ අනුව්‍යවස්ථාව යටතේ එකී වෙනත් අමාත්‍යවරයා වෙත පවරා දෙනු ලැබූ යම් බලතල කිසිවක් හෝ කාර්යයක් ඔහු විසින් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

46. (1) ජනාධිපතිවරයා විසින්, අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන්ට ඔවුන්ගේ කාර්ය ඉටු කිරීමෙහි ලා සහාය වීම පිණිස පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයන් අතුරෙන් නියෝජ්‍ය අමාත්‍යවරයන් පත් කරනු ලැබිය හැක්කේ ය.

(2) අමාත්‍ය මණ්ඩලයේ කවර හෝ අමාත්‍යවරයකු විසින්, ඔහු වෙත පවරා ඇති යම් විෂයයකට හෝ කාර්යයකට අදාළ යම් බලයක් හෝ කාර්යයක් හෝ යම් ලිඛිත නීතියකින් ඔහු වෙත පැවරී ඇත්තා වූ හෝ නියම කරනු ලැබ ඇත්තා වූ බලතල කිසිවක් හෝ කාර්යයක්, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් තම නියෝජ්‍ය අමාත්‍යවරයාට පවරා දිය හැකි අතර, එකී අමාත්‍යවරයාට එකී බලය හෝ කාර්යය පවරන්නා වූ හෝ නියම කරන්නා වූ ලිඛිත නීතියේ පටහැනිව කුමක් සඳහන් වුව ද, එකී නියෝජ්‍ය අමාත්‍යවරයා විසින්, එසේ පවරා දෙනු ලැබූ යම් බලයක් හෝ කාර්යයක් ක්‍රියාත්මක කිරීම හෝ ඉටු කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

47. (1) (අ) අමාත්‍ය මණ්ඩලයේ මුළු අමාත්‍යවරයන් සංඛ්‍යාව තිහ නොඉක්මවිය යුතු ය; සහ

(ආ) අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන්ගේ සහ නියෝජ්‍ය අමාත්‍යවරයන්ගේ සංඛ්‍යාවේ එකතුව හතලිහ නොඉක්මවිය යුතු ය.

(2) අග්‍රාමාත්‍යවරයා-

(අ) ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවන ලිපියක් මඟින් ඉවත් කරනු ලැබුවහොත්;

(ආ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යවන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත්; හෝ

(ඇ) තවදුරටත් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු නොවුවහොත්,

මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම් තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවතින්නේ ද, ඒ තාක් කල් ස්වකීය ධුරය දරන්නේ ය.

(3) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයෙක්, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයෙක් හෝ නියෝජ්‍ය අමාත්‍යවරයෙක්-

(අ) අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, ජනාධිපතිවරයාගේ අත්සන යටතේ යවනු ලබන ලිපියක් මගින්, ඉවත් කරනු ලැබුවහොත්;

(ආ) ස්වකීය අත්සන යටතේ ජනාධිපතිවරයා වෙත යොමු කරනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්වුවහොත්; හෝ

(ඇ) තවදුරටත් පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු නොවුවහොත්,

මිස, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ යම්තාක් කල් අමාත්‍ය මණ්ඩලය පවතින්නේ ද, ඒ තාක් කල් ස්වකීය ධුරය දරන්නේ ය.

(4) (1) වන අනුව්‍යවස්ථාවේ කුමක් සඳහන් වුව ද, පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාවක් ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම හෝ විසින් ජාතික ආණ්ඩුවක් පිහිටුවන අවස්ථාවේ දී, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් සංඛ්‍යාව ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් සංඛ්‍යාව ද, නියෝජ්‍ය අමාත්‍යවරයන් සංඛ්‍යාව ද, පාර්ලිමේන්තුව විසින් තීරණය කළ යුත්තේ ය.

(5) (4) වන අනුව්‍යවස්ථාවේ කාර්යය සඳහා ජාතික ආණ්ඩුවක් යනු, පාර්ලිමේන්තුවේ වැඩිම ආසන සංඛ්‍යාව ලබාගන්නා පිළිගත් දේශපාලන පක්ෂය හෝ ස්වාධීන කණ්ඩායම සහ පාර්ලිමේන්තුවේ අනෙකුත් පිළිගත් දේශපාලන පක්ෂ හෝ ස්වාධීන කණ්ඩායම් එකතුව පිහිටුවනු ලබන ආණ්ඩුවක් වන්නේ ය.

48. (1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලබන තෙක් ක්‍රියාකළ අමාත්‍ය මණ්ඩලය පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුව ද, දිගටම ක්‍රියා කළ යුතු අතර මහ මැතිවරණය අවසාන වූ විට, එසේ ක්‍රියා කිරීම නතර කළ යුත්තේ ය. ඒ අනුව අග්‍රාමාත්‍යවරයා ද අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද, 47 වන ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ සහ (3) වන අනුව්‍යවස්ථාවේ (අ) ඡේදයේ හෝ (ආ) ඡේදයේ විධිවිධාන සලසා ඇති පරිදි ධුර දැරීම නතර වුවහොත් මිස, දිගටම ක්‍රියා කළ යුතු අතර, එසේ ධුර දැරීමේ දී ඔවුන් විසින් මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා විසින් නියම කරනු ලබන නිර්නායකයන් පිළිපදිමින් මැතිවරණයට අයුතු ලෙස බලපෑමක් නොවන පරිද්දෙන් ක්‍රියා කළ යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත්, මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ අග්‍රාමාත්‍යවරයා මිය ගියේ වුව ද, ධුරයෙන් ඉවත් කරනු ලැබුවේ වුව ද, අස්වූයේ වුව ද, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කළ යුත්තේ ය. තව ද, අග්‍රාමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටුකිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතුරෙන් යම් අමාත්‍යවරයකු පත්කරනු ලැබිය හැක්කේ ය.

(3) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත්, මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකු මිය ගිය විට හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබූ විට හෝ ඉල්ලා අස් වූ විට ඒ අමාත්‍යවරයාගේ අමාත්‍යාංශය භාරව කටයුතු කිරීම හෝ ඒ අමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමට හා ඉටුකිරීමට වෙනත් කවර වූ හෝ අමාත්‍යවරයකු ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, පත්කරනු ලැබිය හැක්කේ ය.

49. (1) පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබීමත් මහ මැතිවරණය අවසාන වීමත් අතර කාලය තුළ හැර, මිය යාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ අන්‍යාකාරයකින් හෝ අග්‍රාමාත්‍යවරයා ධුරය දැරීම නතර වූ විට, 70 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හැර ඇතොත් මිස, අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේ ය. එසේ වූ විට ජනාධිපතිවරයා විසින් 43 වන, 44 වන, 45 වන සහ 46 වන ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යවරයකු ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් ද, නියෝජ්‍ය අමාත්‍යවරයන් ද පත් කළ යුත්තේ ය:

එසේ වුව ද, ඉහත කී පරිදි අග්‍රාමාත්‍යවරයා ධුරය දැරීම නතර වීමෙන් පසුව පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත්, අමාත්‍ය මණ්ඩලය, අමාත්‍ය මණ්ඩලයේ අනෙකුත් අමාත්‍යවරයන්ගෙන් සමන්විතව මහ මැතිවරණය අවසාන වන තෙක් ක්‍රියා කළ යුත්තේ ය. තව ද, අග්‍රාමාත්‍යවරයාගේ බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සඳහා සහ ඉටුකිරීම සඳහා ජනාධිපතිවරයා විසින් එකී අමාත්‍යවරයන් අතුරෙන් යම් අමාත්‍යවරයකු පත්කරනු ලැබිය හැක්කේ ය. තව ද, 48 වන ව්‍යවස්ථාවේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, මේ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(2) පාර්ලිමේන්තුව විසින් ආණ්ඩුවේ ප්‍රතිපත්ති ප්‍රකාශය හෝ විසර්ජන පනත් කෙටුම්පත හෝ ප්‍රතික්ෂේප කළහොත් එවිට ද, ආණ්ඩුව කෙරෙහි විශ්වාසභංග යෝජනාවක් සම්මත කළහොත් එවිට ද, අමාත්‍ය මණ්ඩලය විසිරෙන්නේ ය. එසේ වූ විට 70 වන ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කරමින් ජනාධිපතිවරයා විසින් පාර්ලිමේන්තුව විසුරුවා හරිනු ලැබුවහොත් මිස, ජනාධිපතිවරයා විසින් 43 වන, 44 වන, 45 වන සහ 46 වන ව්‍යවස්ථා අනුව අග්‍රාමාත්‍යවරයෙක් ද, අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයන් ද, අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයන් නොවන අමාත්‍යවරයන් ද, නියෝජ්‍ය අමාත්‍යවරයන් ද පත් කළ යුත්තේ ය.

50. අමාත්‍ය මණ්ඩලයේ යම් අමාත්‍යවරයකුට හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයකුට හෝ නියෝජ්‍ය අමාත්‍යවරයකුට හෝ ඔහුගේ ධුරයේ කාර්ය ඉටුකිරීමට නොහැකි වුවහොත්, එවිට, එකී අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයාගේ හෝ අමාත්‍ය මණ්ඩලයේ සාමාජිකයකු නොවන අමාත්‍යවරයාගේ හෝ නියෝජ්‍ය අමාත්‍යවරයාගේ ධුරයේ වැඩ බැලීම සඳහා ජනාධිපතිවරයා විසින් අග්‍රාමාත්‍යවරයාගේ අදහස් විමසා, පාර්ලිමේන්තුවේ කවර වූ හෝ මන්ත්‍රීවරයකු පත් කිරීම කළ හැකි වන්නේ ය.

51. (1) (අ) අග්‍රාමාත්‍යවරයාට, ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(ආ) අග්‍රාමාත්‍යවරයාගේ කාර්යාලය භාරව කටයුතු කිරීමත් අග්‍රාමාත්‍යවරයාගේ විධානයන්ට යටත්ව ඔහුගේ ධුරයේ කාර්ය හා කර්තව්‍ය ඉටු කිරීම හා කිරීමත් අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයා විසින් කළ යුත්තේ ය.

(2) (අ) අමාත්‍ය මණ්ඩලයට ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(ආ) ජනාධිපතිවරයාගේ විධානයන්ට යටත්ව අමාත්‍ය මණ්ඩලයේ කාර්යාලය භාරව කටයුතු කිරීමත් ජනාධිපතිවරයා විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ ඔහුට පවරනු ලබන්නා වූ වෙනත් යම් කර්තව්‍ය හෝ කාර්ය ඉටුකිරීමත්, කිරීමත් ලේකම්වරයා විසින් කරනු ලැබිය යුත්තේ ය.

52. (1) අමාත්‍ය මණ්ඩලයේ අමාත්‍යවරයකුගේ සෑම අමාත්‍යාංශයක් ම සඳහා ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු ලේකම්වරයෙක් වන්නේ ය.

(2) අමාත්‍යාංශයක ලේකම්වරයා ඔහුගේ අමාත්‍යවරයා භාරයේ ඇති ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ද, වෙනත් ආයතන ද, අමාත්‍යවරයාගේ විධානයට හා පාලනයට යටත්ව මෙහෙයවන්නේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ අමාත්‍ය මණ්ඩලය විසුරුවා හැරීම නොතකා, අමාත්‍යාංශයකට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන ප්‍රකාරව නව ලේකම්වරයකු පත් කරනු ලබන තෙක් ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් ධුරය දරනු ලැබිය යුත්තේ ය:

එසේ වුව ද, යම් අමාත්‍යාංශයක පැවැත්ම නතර වීමේ ප්‍රතිඵලය ඇති තීරණයක්, 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ ජනාධිපතිවරයා විසින් ගනු ලැබීම මත ඒ අමාත්‍යාංශයේ ලේකම්වරයා ධුරය දැරීම අවසන් විය යුත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ කාර්ය සඳහා ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ කාර්යාලය, විගණකාධිපතිවරයාගේ කාර්යාලය, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයාගෙ (ඔම්බුඩ්ස්මන්) කාර්යාලය, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්යාලය, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව සහ 41ආ ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා ආණ්ඩුවේ දෙපාර්තමේන්තු ලෙස නොසැලකිය යුත්තේ ය.

53. මේ පරිච්ඡේදයේ දැක්වෙන යම් ධුරයකට පත් කරනු ලැබූ සෑම තැනැත්තකු ම ඔහු හතරවන උපලේඛනයේ සහ හත්වන උපලේඛනයේ දැක්වෙන ප්‍රතිඥාව දී ඊට අත්සන් තබන්නේ නම් මිස, හෝ දිවුරුම් දී ඊට අත්සන් තබන්නේ නම් මිස, ස්වකීය ධුරයට අයත් කාර්යන්හි නොයෙදිය යුත්තේ ය.".

4. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 54 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සාමාජිකයන් නව දෙනෙකුගෙන් සමන්විත (මේ පරිච්ඡේදයෙහි "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් විය යුත්තේ ය. ඒ සාමාජිකයන් අතුරෙන් සාමාජිකයන් තිදෙනකුට නොඅඩු සංඛ්‍යාවක් රජයේ නිලධරයන් වශයෙන් අවුරුදු පහළොවකට වැඩි පළපුරුද්දක් ඇති තැනැත්තන් විය යුත්තේ ය. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් එක් සාමාජිකයකු එහි සභාපතිවරයා ලෙස පත් කරනු ලැබිය යුත්තේ ය.";

(2) ඒ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(4) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම (2) වන අනුව්‍යවස්ථාව යටතේ නුසුදුසුකමකට පාත්‍ර වුවහොත් හෝ ජනාධිපතිවරයා අමතා යවන ලියවිල්ලක් මගින්, කලින් ධුරයෙන් ඉල්ලා අස්වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුව හොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධව අධිකරණයක් විසින් වරදකරු කරනු ලැබුවහොත් හෝ ඔහු ප්‍රජා අශක්නුතාවන්ට යටත් කළ යුතු බවට යෝජනා සම්මතයක් 81 වන ව්‍යවස්ථාව යටතේ සම්මත කොට ඇත්නම් හෝ (6) වන අනුව්‍යවස්ථාව යටතේ ධුරය හැරයන ලද සේ සලකනු ලැබුවහොත් හෝ මිස, ඔහු පත් කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය."; සහ

(3) ඒ ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාවේ "ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයකු වශයෙන්, 41ඇ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව, පත් කරනු ලැබිය යුත්තේ ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට "ඒ නිවාඩු කාලය සඳහා තාවකාලික සාමාජිකයකු වශයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත පත් කරනු ලැබිය යුත්තේ ය." යන වචන ආදේශ කිරීමෙන්.

5. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඉ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (ආ) අනුව්‍යවස්ථාවේ "41ඇ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

6. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 61ඊ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:-

61ඊ. මේ පරිච්ඡේදයේ කාර්ය සඳහා, "රජයේ නිලධරයා" යන්නට යුද හමුදා, නාවුක හමුදා හෝ ගුවන් හමුදා සාමාජිකයකු හෝ මැතිවරණ කොමිෂන් සභාව විසින් පත් කරන ලද මැතිවරණ කොමිෂන් සභාවේ නිලධරයකු හෝ ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් පත් කරන ලද පොලිස් නිලධරයකු හෝ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද උපලේඛනගත රජයේ නිලධරයකු හෝ විගණන සේවා කොමිෂන් සභාව විසින් පත් කරන ලද ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයකු හෝ ඇතුළත් නොවන්නේ ය.".

7. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 65 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41ඇ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (6) වන අනුව්‍යවස්ථාව ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ආදේශ කිරීමෙන්:-

"(6) මහ ලේකම්වරයාට ස්වකීය ධුරයේ කර්තව්‍ය ඉටු කිරීමට නොහැකි වන කවර හෝ විටෙක, ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව, මහ ලේකම්වරයා වෙනුවෙන් වැඩ බැලීමට තැනැත්තකු පත් කළ හැක්කේ ය.".

8. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ෑ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (iv) වන අයිතමයේ "41ඒ වන ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "41ඈ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ ඡේදයේ (vඒ) වන අයිතමයට ඉක්බිතිව ම පහත දක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන්:-

"(Vඈ) යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හැර, 41ඒ වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඉ) ඡේදයේ සඳහන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයකු,"; සහ

(3) ඒ ඡේදයේ (xiii) වන අයිතමයට ඉක්බිතිව ම පහත දක්වෙන අයිතමය ඇතුළත් කිරීමෙන්:-

"(xiii) වෙනත් යම් රටක ද පුරවැසියකු වන ශ්‍රී ලංකාවේ පුරවැසියකු;".

9. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 95 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ "(1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සහ 41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන අනුව්‍යවස්ථාවේ විධිවිධාන අනුව සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 103 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (7) වන අනුව්‍යවස්ථාවේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන ආදේශ කිරීමෙන්.

11. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104ආ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාවේ (ඒ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඒ) ඡන්ද විමසීමක් හෝ ජනමත විචාරණයක් පැවැත්වීම විෂයයෙහි ලා නිදහස් හා සාධාරණ ඡන්ද විමසීමක් පැවැත්වීම සහතික කිරීම සඳහා අවශ්‍ය යයි කොමිෂන් සභාව විසින් සලකනු ලබන උපමාන, කොමිෂන් සභාව විසින් උචිත යයි සලකනු ලබන, අවස්ථාවෝචිත පරිදි, යම් ගුවන් විදුලි හෝ රූපවාහිනී සේවයක් පවත්වා ගෙන යන්නකු හෝ යම් ප්‍රවෘත්ති පත්‍රයක අයිතිකරුවකු හෝ ප්‍රකාශකයකු වෙත, කලින් කල, නිකුත් කිරීමේ බලය කොමිෂන් සභාවට තිබිය යුත්තේ ය.".

12. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 107 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 109 වන ව්‍යවස්ථාව පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත," යන වචන ආදේශ කිරීමෙන්.

14. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ෑ වන ව්‍යවස්ථාව පහත දක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ "මුල් අවස්ථා අධිකරණයක විනිශ්චයකාරවරයකු" යන වචන යෙදී ඇති කවර හෝ අවස්ථාවක ඒ වචන වෙනුවට "මහෙස්ත්‍රාත්වරයකු හෝ දිසා විනිසුරුවරයකු" යන වචන ආදේශ කිරීමෙන්.

15. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඉ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාවේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව," යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

16. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 111ඕ වන ව්‍යවස්ථාව, එහි (ඒ) වන අනුව්‍යවස්ථාවේ "අධිකරණ නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහාධිකරණ විනිශ්චයකාරවරයකු හෝ" යන වචන වෙනුවට "අභියාචනාධිකරණ විනිශ්චයකාරවරයකු" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

17. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "සතියක් ඇතුළත" යන වචන වෙනුවට "දින දහහතරක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

18. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව" යන වචන ආදේශ කිරීමෙන්.

19. පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153 වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම ඇතුළත් කරනු ලබන අතර, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 153ඒ, 153ඓ, 153ඈ, 153ඌ, 153ඒ, 153ඒ සහ 153ඵ යන ව්‍යවස්ථා ලෙස බලපැවැත්විය යුත්තේ ය:

153ඒ. (1) (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විගණන සේවා කොමිෂන් සභාවක් තිබිය යුතු අතර, එකී කොමිෂන් සභාව, එකී සභාවේ සභාපතිවරයා විය යුතු විගණකාධිපතිවරයාගෙන් සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලැබිය යුතු පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුත්තේ ය:-

(අ) නියෝජ්‍ය විගණකාධිපති ධුරය හෝ ඊට ඉහළින් වූ ධුරයක් දරන ලද විගණකාධිපති දෙපාර්තමේන්තුවේ විශ්‍රාමලත් නිලධරයන් දෙදෙනෙක්;

(ආ) ශ්‍රී ලංකාවේ ශ්‍රේෂ්ඨාධිකරණයේ, අභියාචනාධිකරණයේ හෝ මහාධිකරණයේ විශ්‍රාමලත් විනිශ්චයකාරවරයෙක්; සහ

(ඇ) ශ්‍රී ලංකා පරිපාලන සේවාවේ විශ්‍රාමලත් I වන පන්තියේ නිලධරයෙක්.

(2) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරන ලද තැනැත්තකු-

(අ) ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් කලින් ඉල්ලා අස්වුවහොත්;

(ආ) මෙහි මින්මතු විධිවිධාන සලසා ඇති පරිදි ධුරයෙන් ඉවත් කළහොත්; හෝ

(ඇ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා සභිකයකු හෝ පළාත් පාලන ආයතන සභිකයකු හෝ වුවහොත්,

මිස, අවුරුදු තුනක කාලයක් සඳහා ධුරය දැරිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබූ තැනැත්තකු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත වැඩිදුර ධුර කාලයක් සඳහා පත් කරනු ලැබීමට සුදුස්සකු වන්නේ ය.

(4) ජනාධිපතිවරයා විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය ඇතිව (1) වන අනුව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාවේ සාමාජිකයකු ලෙස පත්කරනු ලැබූ යම් තැනැත්තකු හේතු දක්වා ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැක්කේ ය.

(5) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සාමාජිකයන්ට පාර්ලිමේන්තුව විසින් තීරණය කරනු ලබන දීමනාවක් ගෙවනු ලැබිය යුත්තේ ය. එම දීමනාව ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු අතර සභාපතිවරයාගේ හෝ සාමාජිකයන්ගේ ධුර කාලය තුළ දී එය අඩු කරනු නොලැබිය යුත්තේ ය.

(6) කොමිෂන් සභාවේ සභාපතිවරයා සහ සාමාජිකයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

(7) කොමිෂන් සභාවට, කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන ලේකම්වරයකු සිටිය යුත්තේ ය.

153ඓ. (1) කොමිෂන් සභාවේ යම් රැස්වීමක ගණපූරණය එකී සභාවේ සාමාජිකයන් තුන්දෙනකු විය යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව විසින්, (1) වන අනුව්‍යවස්ථාවට යටත්ව, කොමිෂන් සභාවේ රැස්වීම් සඳහා ද, ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවය ස්ථාපිත කිරීම සඳහා ද, ඒ හා සම්බන්ධිත වූ සහ ඊට ආනුෂංගික වූ වෙනත් කාරණා සඳහා ද නීතියෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

153ඈ. (1) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන් පත්කිරීමේ, උසස් කිරීමේ, මාරු කිරීමේ, විනය පාලනය කිරීමේ සහ සේවයෙන් පහකිරීමේ බලතල කොමිෂන් සභාවට පැවරෙන්නේ ය.

(2) කොමිෂන් සභාව විසින් පහත සඳහන් බලතල, කාර්ය සහ කර්තව්‍ය ද ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම සහ කිරීම කළ යුත්තේ ය:-

(අ) ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයට අයත් සාමාජිකයන් සේවයට බඳවා ගැනීමේ පටිපාටිවලට අදාළ රීති සහ ඔවුන්ගේ පත්කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම්වලට අදාළ රීති, ඒවාට අදාළව අමාත්‍ය මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිපත්තිවලට යටත්ව සකස් කිරීම;

(ආ) නීතිය මගින් ස්ථාපිත ජාතික විගණන කාර්යාලයේ වාර්ෂික ඇස්තමේන්තු සකස් කිරීම; සහ

(ඇ) නීතිය මගින් විධිවිධාන සලස්වනු ලැබිය හැකි පරිදි වූ වෙනත් බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටුකිරීම හා කිරීම.

(3) (2) වන අනුව්‍යවස්ථාව යටතේ සාදනු ලබන රීති කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(4) එවැනි සෑම රීතියක් ම එසේ පළ කරනු ලැබූ දින සිට හෝ එම රීති මගින් නිශ්චිතව දක්වා ඇති යම් පසු දිනයක සිට ක්‍රියාත්මක විය යුත්තේ ය.

(5) එවැනි සෑම රීතියක් ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබූ දින සිට මාස තුනක කාලයක් ඇතුළත පාර්ලිමේන්තුවේ අනුමතය සඳහා ඉදිරිපත් කළ යුත්තේ ය. එසේ අනුමත කරනු නොලැබූ යම් රීතියක් එම අනනුමතයේ දින සිට පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ යටතේ ඊට පෙර කරන ලද කිසිවකට අගතියක් නොවිය යුත්තේ ය.

153ඈ. (1) තමාගේ රාජකාරි කටයුතු අතරතුර දී හැර, කෙළින් ම හෝ අන්‍යාකාරයකින්, තමන් විසින් ම හෝ වෙනත් යම් තැනැත්තකු මගින්, කවර වූ හෝ ආකාරයකින් කොමිෂන් සභාවේ තීරණයකට, එකී සභාවේ යම් සාමාජිකයකුට හෝ ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකුට හෝ බලපෑමක් කරන හෝ බලපෑමක් කිරීමට තැත් කරන යම් තැනැත්තෙක් වරදක් සිදු කරන අතර, වරදකරු කිරීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ අවුරුදු තුනකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ යටත් විය යුත්තේ ය.

(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද සෑම මහාධිකරණයකට ම (1) වන අනුව්‍යවස්ථාවේ සඳහන් යම් කාරණයක් විභාගකොට තීරණය කිරීමට අධිකරණ බලය තිබිය යුත්තේ ය.

153ඉ. 126 වන ව්‍යවස්ථාව යටතේ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පිරිනමා ඇති අධිකරණ බලයට සහ 153උ වන ව්‍යවස්ථාව යටතේ පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට ප්‍රදානය කොට ඇති බලතලවලට යටත්ව, මේ පරිච්ඡේදය යටතේ හෝ යම් ලිඛිත නීතියක් යටතේ කොමිෂන් සභාව වෙත පවරා දී ඇති යම් කර්තව්‍යයක් ඉටුකිරීමේ දී එකී සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් තීරණයක් පිළිබඳව විභාග කිරීමට, මතයක් ප්‍රකාශ කිරීමට හෝ කවර වූ හෝ ආකාරයකින් ප්‍රශ්න කිරීමට කිසිදු අධිකරණයකට හෝ විනිශ්චය අධිකාරයකට බලය හෝ අධිකරණ බලය නොතිබිය යුත්තේ ය.

153ඊ. කොමිෂන් සභාවේ පිරිවැය සහ වියදම් ඒකාබද්ධ අරමුදලට වැයබරක් විය යුත්තේ ය.

153උ. කොමිෂන් සභාව විසින් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකු සම්බන්ධයෙන් වූ යම් පත් කිරීමකට, උසස් කිරීමකට හෝ ස්ථාන මාරුවකට අදාළව කරන ලද යම් නියමයකින් හෝ විනය පිළිබඳ කාරණයක් මත හෝ සේවයෙන් පහකිරීමක් මත කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ යම් නිලධරයකු විසින් එයට විරුද්ධව 59 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරියට අභියාචනයක් ඉදිරිපත් කිරීම කළ හැක්කේ ය. කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් තීරණයක් වෙනස් කිරීමට, සුළු වශයෙන් වෙනස් කිරීමට, ප්‍රත්‍යාදිෂ්ඨ කිරීමට හෝ ස්ථිර කිරීමට එකී විනිශ්චය අධිකාරියට බලය ඇත්තේ ය.

153ඌ. කොමිෂන් සභාව, ස්වකීය කර්තව්‍ය ඉටු කිරීම සම්බන්ධයෙන් පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගවල විධිවිධානවලට අනුකූලව පාර්ලිමේන්තුවට වගකිව යුත්තේ ය. පිළිතුරු දීමට බැඳී සිටිය යුත්තේ ය. එසේම සෑම ලිත් වර්ෂයක දී ම එහි ක්‍රියාකාරකම් පිළිබඳව පාර්ලිමේන්තුවට වාර්තාවක් ඉදිරිපත් කළ යුත්තේ ය.".

20. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "පාර්ලිමේන්තු සභාව, 41ඒ වන ව්‍යවස්ථාවේ I වන උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41ඒ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

21. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ජ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ (ඇ) ඡේදයේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

22. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඒ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

23. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ආ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ (4) වන අනුව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අනුව්‍යවස්ථාව ඇතුළත් කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) පොලිස්පතිවරයාට අදාළ යම් කාරණයක් සාකච්ඡා කිරීම සඳහා යෝජිත යම් රැස්වීමකට හැර, කොමිෂන් සභාවේ රැස්වීම්වලට පැමිණීමට ද, සහභාගීවීමට ද, පොලිස්පතිවරයාට හිමිකම ඇත්තේ ය. එකී රැස්වීම්වල දී ඡන්දය භාවිත කිරීමට ඔහුට හිමිකම නොමැත්තේ ය.".

24. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඇ වන ව්‍යවස්ථාව, ඒ ව්‍යවස්ථාවේ "126 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දී ඇති බලයට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "126 වන ව්‍යවස්ථාවේ (1) වන අනුව්‍යවස්ථාවෙන් ශ්‍රේෂ්ඨාධිකරණයට පවරා දී ඇති බලයට යටත්ව සහ 155ඔ වන ව්‍යවස්ථාව මගින් පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ප්‍රදානය කොට ඇති බලතලවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

25. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඊඊඊ වන ව්‍යවස්ථාවට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ව්‍යවස්ථා මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ ව්‍යවස්ථා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිවෙළින් 155උ වන, 155ඌ වන, 155එ වන, 155ඒ වන සහ 155ඔ වන ව්‍යවස්ථා ලෙස බලපැවැත්විය යුතු ය:-

155උ. (1) (අ) පොලිස්පතිවරයා හැර, පොලිස් නිලධරයන් පත් කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ ඔවුන් සේවයෙන් පහකිරීමේ බලය කොමිෂන් සභාව වෙත පැවරිය යුත්තේ ය. උසස් කිරීම්, ස්ථාන මාරු කිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම් පිළිබඳ කොමිෂන් සභාවේ බලතල පොලිස්පතිවරයා විමසා කොමිෂන් සභාව විසින් ක්‍රියාත්මක කරනු ලැබිය යුත්තේ ය.

(ආ) මේ ව්‍යවස්ථාව යටතේ ස්වකීය බලතල ක්‍රියාත්මක කිරීමේ දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XVIII පරිච්ඡේදය යටතේ පළාත් පොලිස් කොමිෂන් සභා පිහිටුවනු ලබන පරිදි සහ පිහිටුවනු ලබන විට ඒ පළාත් පොලිස් කොමිෂන් සභා වෙත පවරනු ලබන බලතල සහ කාර්ය හීන කිරීමක්, කොමිෂන් සභාව විසින් නොකළ යුත්තේ ය.

(2) මහජනයාගෙන් ලැබෙන පැමිණිලි සහ අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් පොලිස් නිලධරයකුට හෝ පොලිස් සේවයට හෝ විරුද්ධව ඉදිරිපත් කරනු ලබන පැමිණිලි භාරගැනීමේ හා ඒවා විමර්ශනය කිරීමේ කාර්ය පටිපාටි කොමිෂන් සභාව විසින් පිහිටුවිය යුතු අතර, පාර්ලිමේන්තුව විසින් පනවන ලද යම් නීතියක් මගින් විධිවිධාන සලසා ඇති පරිදි සහන සැලසිය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් සහන සැලසීමේ දී කොමිෂන් සභාව විසින් ඒ පිළිබඳව වහාම පොලිස්පතිවරයාට දැනුම් දිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාව විසින්, පොලිස්පතිවරයා විමසා-

(අ) තත් කාර්යය සම්බන්ධයෙන් අමාත්‍ය මණ්ඩලය විසින් තීරණය කරනු ලබන යම් ප්‍රතිපත්තියකට යටත්ව පොලිස් නිලධරයන් බඳවා ගැනීම, උසස් කිරීම සහ ස්ථාන මාරු කිරීම පිළිබඳ පටිපාටි සකස් කිරීම;

(ආ) පුහුණුව සහ පොලිස් සේවයේ කාර්යක්ෂමතාව හා ස්වාධීනත්වය වැඩි දියුණු කිරීම;

(ඇ) ජාතික අංශයේ සහ පළාත් අංශයේ භාවිතය සඳහා අවශ්‍ය අවිආයුධ, වෙඩි ද්‍රව්‍ය සහ වෙනත් උපකරණවල ස්වභාවය සහ වර්ගය; සහ

(ඈ) චර්යා සංග්‍රහ සහ විනය පිළිබඳ පටිපාටි,

ඇතුළුව පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් වූ සියලු කාරණා සඳහා කටයුතු සැලසීම දැල ඒ කාරණා නිශ්චය කිරීම ද, කරනු ලැබිය යුත්තේ ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නවවන උපලේඛනයේ I වන ලැයිස්තුවේ I වන පරිශිෂ්ටය යටතේ කොමිෂන් සභාව වෙත පවරා ඇති සියලු ම බලතල ක්‍රියාත්මක කිරීම හා සියලු කාර්ය සහ කර්තව්‍ය ඉටු කිරීම කොමිෂන් සභාව විසින් කරනු ලැබිය යුත්තේ ය.

155ඌ. (1) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලබන කාණ්ඩවල පොලිස් නිලධරයන් පත්කිරීමේ, උසස් කිරීමේ, ස්ථාන මාරු කිරීමේ, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීමේ සහ ඔවුන් සේවයෙන් පහකිරීමේ ලා කොමිෂන් සභාව සතු බලතල කොමිෂන් සභාව විසින් නම් කරනු ලැබිය යුතු (කොමිෂන් සභාවේ සාමාජිකයන්ගෙන් සමන්විත නොවන) කමිටුවක් වෙත, කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් කමිටුවක් පත්කිරීම කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(3) (1) වන අනුව්‍යවස්ථාව යටතේ නම් කරනු ලබන කමිටුවක රැස්වීම්වල දී අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය සහ ඒ රැස්වීම්වල ගණපූරණය, කොමිෂන් සභාව විසින් සාදනු ලබන රීතිවලට අනුකූලව විය යුත්තේ ය. කොමිෂන් සභාව විසින් ඒ රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

155එ. (1) යම් කාණ්ඩයකට අයත් පොලිස් නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම සහ සේවයෙන් පහකිරීම සඳහා කොමිෂන් සභාව සතු බලතල, කොමිෂන් සභාව විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි කොන්දේසිවලට සහ කාර්ය පටිපාටිවලට යටත්ව, පොලිස්පතිවරයා වෙත හෝ පොලිස්පතිවරයා විමසා යම් පොලිස් නිලධරයකු වෙත කොමිෂන් සභාව විසින් පවරනු ලැබිය හැක්කේ ය.

(2) එවැනි යම් බලතල පැවරීමක්, කොමිෂන් සභාව විසින් ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

155ඒ. (1) යම් කාණ්ඩයකට අයත් පොලිස් නිලධරයන් පත්කිරීම, උසස් කිරීම, ස්ථාන මාරු කිරීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය කිරීම හෝ ඔවුන් සේවයෙන් පහකිරීම පිළිබඳව කොමිෂන් සභාවට ඇති බලතල කොමිෂන් සභාව විසින් 155එ වන ව්‍යවස්ථාව යටතේ යම් පොලිස් නිලධරයකුට පවරා ඇති අවස්ථාවක එකී පොලිස් නිලධරයා විසින් එසේ ඔහු වෙත පවරනු ලැබූ බලතල ක්‍රියාත්මක කිරීමේ දී කරන ලද යම් නියමයකට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනය කිරීමට පොලිස්පතිවරයාට අයිතිය ඇත්තේ ය.

(2) පොලිස්පතිවරයා හෝ 155ඌ වන සහ 155එ වන ව්‍යවස්ථාවල සඳහන් කමිටුවක් හෝ පොලිස් නිලධරයකු හෝ විසින් තමන්ගේ යම් උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ විනය පිළිබඳ කාරණයක් හෝ සේවයෙන් පහකිරීමක් සම්බන්ධයෙන් කරන ලද යම් නියමයකින් අතෘප්තියට පත් පොලිස් නිලධරයකු විසින්, අභියාචනයක් කිරීම සහ අභියාචනයක් විභාග කිරීම සඳහා නියම කරනු ලැබ ඇති කාර්යපටිපාටිය ද කාලසීමාව ද විධිමත් කරමින් කොමිෂන් සභාව විසින් කලින් කල සාදනු ලබන රීතිවලට අනුකූලව, එකී නියමයට විරුද්ධව කොමිෂන් සභාවට අභියාචනය කරනු ලැබිය හැක්කේ ය.

(3) (1) වන හෝ (2) වන අනුව්‍යවස්ථාව යටතේ කරන ලද අභියාචනයක් මත, කරන ලද එකී නියමය වෙනස් කිරීමේ, සුළු වශයෙන් වෙනස් කිරීමේ, ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ හෝ ස්ථිර කිරීමේ හෝ ඒ සම්බන්ධයෙන් විධාන නිකුත් කිරීමේ හෝ තවදුරටත් වූ හෝ වෙනත් හෝ පරීක්ෂණයක් පැවැත්වීමට නියම කිරීමේ බලය කොමිෂන් සභාවට ඇත්තේ ය.

(4) මේ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාව යටතේ කොමිෂන් සභාව විසින්, කලින් කල, සාදනු ලබන රීති ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුත්තේ ය.

(5) මේ පරිච්ඡේදයේ 155ඌ වන හෝ 155එ වන ව්‍යවස්ථාව යටතේ කමිටුවක් වෙත හෝ පොලිස්පතිවරයා වෙත හෝ පොලිස් නිලධරයකු වෙත ස්වකීය බලතල පවරා දෙනු ලැබූ විට කොමිෂන් සභාව විසින් එසේ පවරන ලද බලතල බලාත්මකව පවතිද්දී, ඒ බලතල පැවරීම කරන ලද්දේ යම් කාණ්ඩයකට අයත් පොලිස් නිලධරයන් සම්බන්ධයෙන් ද, ඒ කාණ්ඩයේ පොලිස් නිලධරයන් සම්බන්ධයෙන්, මෙහි ඉහත විධිවිධාන සලස්වා ඇති පරිදි අභියාචනය කිරීමේ අයිතියට යටත්ව, කොමිෂන් සභාව විසින් ඒ බලතල ක්‍රියාත්මක කිරීම හෝ ඒ කාර්ය හෝ කර්තව්‍ය ඉටු කිරීම කරනු නොලැබිය යුත්තේ ය.

155ඔ. තමන්ගේ යම් උසස්වීමක් හෝ ස්ථාන මාරුවක් හෝ තමා සම්බන්ධයෙන් වූ විනය පිළිබඳ කාරණයක් හෝ සේවයෙන් පහකිරීමක් සම්බන්ධයෙන් කොමිෂන් සභාව විසින් 155ඒ වන ව්‍යවස්ථාව ප්‍රකාරව කරන ලද නියමයකින් අතෘප්තියට පත් යම් පොලිස් නිලධරයකු විසින් ඊට විරුද්ධව අභියාචනයක්, 59 වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද පරිපාලන අභියාචන විනිශ්චය අධිකාරිය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැක්කේ ය. කොමිෂන් සභාව විසින් කරන ලද යම් නියමයක් හෝ දෙන ලද යම් තීරණයක් වෙනස් කිරීමේ, සුළු වශයෙන් වෙනස් කිරීමේ, ප්‍රත්‍යාදිෂ්ට කිරීමේ හෝ ස්ථිර කිරීමේ බලය ඒ විනිශ්චය අධිකාරියට ඇත්තේ ය.".

26. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 155ඕ වන ව්‍යවස්ථාව මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන ව්‍යවස්ථාව ආදේශ කරනු ලැබේ:-

155ඕ. කොමිෂන් සභාව විසින් අන්‍යාකාරයකින් විධිවිධාන සලස්වනු ලබන තෙක්, මේ ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන දිනයේ දී බලාත්මකව පවත්නා සියලු ම රීති, නියෝග සහ කාර්ය පටිපාටි තවදුරටත් ක්‍රියාත්මකව සහ බලාත්මකව පැවති යුත්තේ ය.".

27. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 156 වන ව්‍යවස්ථාව පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ව්‍යවස්ථාවේ (2) වන අනුව්‍යවස්ථාවේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ව්‍යවස්ථාවේ (5) වන අනුව්‍යවස්ථාවේ "41ඒ වන ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතයට යටත්ව," යන වචන ආදේශ කිරීමෙන්.

28. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIX වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේද මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ XIX වන සහ XIXඒ වන පරිච්ඡේද ලෙස බලපැවැත්විය යුතු ය:

"XIXඒ වන පරිච්ඡේදය

අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා වූ කොමිෂන් සභාව

156ඒ. (1) පාර්ලිමේන්තුව විසින්, අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීම සඳහා කොමිෂන් සභාවක් ස්ථාපිත කිරීම පිණිස නීතිය මගින් විධිවිධාන සැලැස්විය යුත්තේ ය. ඒ නීතිය මගින්-

(අ) ජනාධිපතිවරයා විසින ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත කොමිෂන් සභාවේ සාමාජිකයන් පත්කිරීම;

(ආ) අල්ලස් හෝ දූෂණ චෝදනාවක් සම්බන්ධයෙන් තමාගේ ම මෙහෙයවීමෙන් හෝ වෙනත් තැනැත්තකු විසින් කරනු ලබන පැමිණිල්ලක් මත යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් පිළිබඳව මූලික පරීක්ෂණයක් පැවැත්වීමට හෝ විමර්ශනයක් කිරීමට විධාන කිරීම සඳහා වූ බලතල සහ අල්ලස් හෝ දූෂණවලට අදාළව බලපවත්නා නීතිය යටතේ වැරදි සඳහා නඩු පැවරීමට ඇති බලතල ද ඇතුළු කොමිෂන් සභාවේ බලතල; සහ

(ඇ) ශ්‍රී ලංකාව පාර්ශ්වයක් වන, දූෂණයට එරෙහි එක්සත් ජාතීන්ගේ සම්මුතිය සහ දූෂණය වැළැක්වීමට අදාළ වෙනත් යම් ජාත්‍යන්තර සම්මුතියක් ක්‍රියාත්මක කිරීම පිණිස ගත යුතු පියවර,

සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්විය යුත්තේ ය.

(2) පාර්ලිමේන්තුව විසින් යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් විභාග කිරීම හෝ විමර්ශනය කිරීම සඳහා එසේ විධිවිධාන සලස්වන තෙක්, 1994 අංක 19 දරන අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභා පනත යටතේ පත්කරනු ලැබූ කොමිෂන් සභාව විසින් තම මෙහෙයවීමෙන් ම හෝ එය වෙත කරන ලිඛිත පැමිණිල්ලක් මත යම් අල්ලස් හෝ දූෂණ චෝදනාවක් විභාග කිරීම හෝ විමර්ශනය කිරීම නීත්‍යානුකූල බවට වූ සුළු වෙනස් කිරීමට යටත්ව, එකී පනත අදාළ විය යුත්තේ ය.

XIXඒ වන පරිච්ඡේදය

ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාව

156ඒ. (1) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන්නා වූ ද, සාමාජිකයන් පස්දෙනකුගෙන් සමන්විත වූ ද (මේ පරිච්ඡේදයේ "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික ප්‍රසම්පාදන කොමිෂන් සභාවක් තිබිය යුත්තේ ය. එකී සභාවේ යටත් පිරිසෙයින් සාමාජිකයන් තිදෙනකු ප්‍රසම්පාදනය, ගණකාධිකරණය, නීතිය හෝ රාජ්‍ය පරිපාලනය පිළිබඳ පිළිගත් අත්දැකීම් සහිත තැනැත්තන් විය යුත්තේ ය. ජනාධිපතිවරයා විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ නිර්දේශය මත එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස පත් කළ යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සෑම සාමාජිකයකු ම, ජනාධිපතිවරයා අමතා යවන ලිපියක් මගින් තම ධුරයෙන් කලින් ඉල්ලා අස්වුවහොත් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ අනුමතය මත හේතු දක්වා ජනාධිපතිවරයා විසින් ධුරයෙන් ඉවත් කරනු ලැබුවහොත් හෝ චරිත දූෂණ වරදක් සම්බන්ධයෙන් යම් අධිකරණයක් විසින් ඔහු වරදකරු කරනු ලැබුවහොත් හෝ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු හෝ පළාත් සභා මන්ත්‍රීවරයකු හෝ පළාත් පාලන ආයතනයක සභිකයකු හෝ වශයෙන් තේරී පත්වුවහොත් හෝ ඔහු විෂයයෙහි ප්‍රජා අශක්නූතා නියම කිරීමේ යෝජනා සම්මතයක් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 81 වන ව්‍යවස්ථාවට අනුකූලව සම්මත කරනු ලැබුවහොත් හෝ මිස, එවැනි සාමාජිකයකු වශයෙන් ඔහු පත්කරනු ලැබූ දින සිට අවුරුදු තුනක කාලයක් ධුරය දැරිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ සභාපතිවරයාට සහ සෑම සාමාජිකයකුට ම, පාර්ලිමේන්තුවේ යෝජනා සම්මතයක් මගින් නිශ්චය කරනු ලැබිය හැක පරිදි වූ දීමනාවක් ගෙවිය යුත්තේ ය. එම දීමනාව ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුතු අතර එකී සභාපතිවරයාගේ හෝ සාමාජිකයාගේ ධුර කාලය අතරතුර එය අඩු නොකළ යුත්තේ ය.

156ඇ. (1) සියලු රජයේ ආයතන විසින් භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය කරනු ලැබීම සම්බන්ධයෙන් සාධාරණ, යුක්ති සහගත, විනිවිද පෙනෙනසුලු, තරඟකාරී සහ පිරිවැය සඵලතාවයකින් යුත් පටිපාටි සහ උපමාන සකස් කිරීම කොමිෂන් සභාවේ කර්තව්‍යය වන්නේ ය. කොමිෂන් සභාව විසින් එකී උපමාන ගැසට් පත්‍රයේ පළ කරනු ලැබීමට සැලැස්විය යුතු අතර, එකී පළ කිරීමෙන් මාස තුනක් ඇතුළත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුත්තේ ය.

(2) (1) වන අනුව්‍යවස්ථාවේ ව්‍යාප්තියට අගතියක් නොමැතිව-

(අ) රජයේ ආයතන විසින් කරනු ලබන භාණ්ඩ සහ සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති ප්‍රසම්පාදනය, පූර්වයෙන් අනුමත වූ ක්‍රියාකාරී සැලසුම්වලට අනුකූලව පිළියෙල කරන ලද ප්‍රසම්පාදන සැලසුම් මත පදනම්ව ඇත් ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ආ) රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා වූ සියලු සුදුසුකම් ලත් ලංසුකරුවන්ට එකී භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා වූ ලංසු තැබීමේ ක්‍රියාවලියට සහභාගීවීම පිණිස සමාන අවස්ථා ලබා දී ඇත් ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ඇ) රජයේ ආයතනවලට භාණ්ඩ හා සේවා, වැඩ, උපදේශක සේවා සහ තොරතුරු පද්ධති සැපයීම සඳහා කොන්ත්‍රාත්කරුවන් තෝරා ගැනීමේ සහ කොන්ත්‍රාත් ලබා දීමේ ක්‍රියා පටිපාටිය සාධාරණ හා විනිවිද පෙනෙනසුලු වන්නේ ද යන්න පිළිබඳව නියාමනය කොට උචිත බලධරයන් වෙත වාර්තා කිරීම;

(ඈ) රජයේ ආයතන විසින් ප්‍රසම්පාදන කමිටුවලට සහ ප්‍රසම්පාදනවලට සම්බන්ධ තාක්ෂණික ඇගයුම් කමිටුවලට පත් කරනු ලබන සාමාජිකයින් යෝග්‍ය පරිදි සුදුසුකම් ලබා ඇත් ද යන්න පිළිබඳව වාර්තා කිරීම; සහ

(ඉ) රජයේ ආයතන විසින්, පිළිගත් පටිපාටිවලින් සහ උපමානවලින් බැහැරව කරන ලද ප්‍රසම්පාදන වාර්තා විමර්ශනය කිරීම සහ එකී ප්‍රසම්පාදන සම්බන්ධයෙන් වගකිව යුතු නිලධරයන් අවශ්‍ය ක්‍රියාමාර්ග සඳහා අදාළ බලධරයන් වෙත වාර්තා කිරීම,

කොමිෂන් සභාවේ කර්තව්‍ය වන්නේ ය.

156ඈ. (1) කොමිෂන් සභාව විසින් යම් තැනැත්තකුට, ලිඛිත දැන්වීමක් මගින්-

(අ) කොමිෂන් සභාව විසින් ප්‍රශ්න කරනු ලැබීම සඳහා කොමිෂන් සභාව ඉදිරියට පැමිණෙන ලෙසට;

(ආ) එකී දැන්වීමේ නිශ්චිතව දක්වනු ලබන්නා වූ ද, එකී තැනැත්තාගේ සන්තකයේ හෝ පාලනයේ තිබෙන්නා වූ ද, යම් ලේඛනයක් හෝ දෙයක් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙසට,

නියම කරනු ලැබිය හැක්කේ ය.

(2) (අ) (1) වන අනුව්‍යවස්ථාව යටතේ යවනු ලැබූ දැන්වීමක් මගින් කොමිෂන් සභාව ඉදිරියට පැමිණෙන ලෙසට නියම කරනු ලැබ සාධාරණ හේතුවක් නොමැතිව කොමිෂන් සභාව ඉදිරියට පැමිණීමට අපොහොසත් වන;

(ආ) එවැනි දැන්වීමකට අනුකූල වෙමින් කොමිෂන් සභාව ඉදිරියට පැමිණ, එහෙත්, කොමිෂන් සභාව විසින් ඔහුට ඉදිරිපත් කරනු ලබන යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම සාධාරණ හේතුවක් නොමැතිව ප්‍රතික්ෂේප කරන; හෝ

(ඇ) (1) වන අනුව්‍යවස්ථාව යටතේ යවනු ලැබූ දැන්වීමක් මගින් කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලෙස නියම කරනු ලැබූ යම් ලේඛනයක් හෝ දෙයක්, සාධාරණ හේතුවක් නොමැතිව, ඉදිරිපත් කිරීමට අපොහොසත් වන හෝ ප්‍රතික්ෂේප කරන,

සෑම තැනැත්තකු ම වරදක් සිදුකරන අතර, වරදකරු කිරීමේ දී රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ අවුරුදු හතක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීමට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකට ම හෝ ඒ තැනැත්තා යටත් විය යුත්තේ ය.

(3) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවනු ලැබූ සෑම මහාධිකරණයකට ම (2) වන අනුව්‍යවස්ථාවේ දක්වා ඇති යම් කාරණයක් විභාග කොට තීරණය කිරීමට අධිකරණ බලය ඇත්තේ ය.

156ඉ. (1) කොමිෂන් සභාව, එහි කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි පරිදි කවර හෝ වාර ගණනක් රැස්විය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු රැස්වීම්වල මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුත්තේ ය. කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා සභාපතිවරයා නොපැමිණි විට දී පැමිණ සිටින සාමාජිකයින් විසින් තමන් අතුරෙන් සභාපතිවරයකු එකී රැස්වීම සඳහා තෝරා පත්කර ගත යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් තිදෙනකු විය යුත්තේ ය.

(4) කොමිෂන් සභාවේ තීරණ, එකී තීරණ ගනු ලබන්නේ යම් රැස්වීමක දී ද, එකී රැස්වීමට පැමිණ ඡන්දය දෙන සාමාජිකයන්ගේ බහුතර ඡන්දයෙන් විය යුත්තේ ය. ඡන්ද සමාන වන විටක සභාපතිවරයාට හෝ එකී රැස්වීමේ මූලාසනය දරන සාමාජිකයාට තීරක ඡන්දයක් ඇත්තේ ය.

(5) මේ ව්‍යවස්ථාවේ ඉහත විධිවිධානවලට යටත්ව, කොමිෂන් සභාව විසින් එහි රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කළ යුතු ආකාරය සම්බන්ධයෙන් වන කාර්ය පටිපාටිය නිශ්චය කරනු ලැබිය හැක්කේ ය.

(6) කොමිෂන් සභාවේ සාමාජිකත්වයේ යම් පුරප්පාඩුවක් තිබුණ ද, ඒ නොතකා කටයුතු කිරීමට කොමිෂන් සභාවට බලය ඇත්තේ ය. එවැනි යම් පුරප්පාඩුවක් තිබූ පමණින් ම හෝ යම් සාමාජිකයකු පත්කිරීමෙහි ලා දෝෂයක් තිබූ පමණින් ම, කොමිෂන් සභාවේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් හෝ තීරණයක් නිර්බල නොවන්නේ ය; නිර්බල වන්නේ යයි නොසැලකිය යුත්තේ ය.

156ඊ. (1) කොමිෂන් සභාව විසින් නිශ්චය කරනු ලැබිය හැකි නියම සහ කොන්දේසි මත, එහි කර්තව්‍ය නිසි පරිදි ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය යයි සලකනු ලබන පරිදි මහ ලේකම්වරයකු ද, වෙනත් යම් නිලධරයන් ද, කොමිෂන් සභාවට පත්කර ගනු ලැබිය යුත්තේ ය.

(2) කොමිෂන් සභාවේ සියලු සාමාජිකයන් සහ නිලධරයන් (19 වන අධිකාරය වූ) දණ්ඩ නීති සංග්‍රහයේ IX වන පරිච්ඡේදයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුත්තේ ය.

(3) කොමිෂන් සභාවේ යම් සාමාජිකයකු හෝ නිලධරයකු හෝ විසින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ ස්වකීය කාර්ය ඉටුකිරීමේ දී හෝ ස්වකීය කර්තව්‍ය කිරීමේ දී ඔහු විසින් සද්භාවයෙන් කරන ලද හෝ සද්භාවයෙන් කරන ලදැයි උද්දේශිත යම් ක්‍රියාවක් හෝ දෙයක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිදු සිවිල් හෝ අපරාධ නඩුවක් හෝ වෙනත් නඩු කටයුත්තක් නොපවරනු ලැබිය යුත්තේ ය.

156උ. කොමිෂන් සභාවේ වියදම් ඒකාබද්ධ අරමුදලට වැය බරක් විය යුත්තේ ය.

156ඌ. මේ පරිච්ඡේදයේ "රජයේ ආයතනය" යන්නට, ජනාධිපතිවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අග්‍රාමාත්‍යවරයාගේ ලේකම්වරයාගේ කාර්යාලය, අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාගේ කාර්යාලය, 44 වන හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ පත් කරන ලද අමාත්‍යවරයන්ගේ කාර්යාල, අධිකරණ සේවා කොමිෂන් සභාව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාව, 41ආ වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ සඳහන් කොමිෂන් සභා, පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා, පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා, අමාත්‍යාංශ, ආණ්ඩුවේ දෙපාර්තමේන්තු, පළාත් සභා, පළාත් පාලන ආයතන, රාජ්‍ය සංස්ථා, යම් ලිඛිත නීතියක් යටතේ රජය වෙත පවරනු ලැබ ඇති වෙළෙඳ ව්‍යාපාර හෝ වෙනත් ව්‍යාපාර සහ 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි වී ඇති හෝ ලියාපදිංචි වී ඇති බවට සලකනු ලබන සහ ස්වකීය කොටස්වලින් සියයට පනහකට වැඩි ප්‍රතිශතයක් රජය, රාජ්‍ය සංස්ථාවක් හෝ පළාත් පාලන ආයතනයක් හෝ විසින් දරනු ලබන සමාගම් ද ඇතුළත් වේ.".

29. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 170 වන ව්‍යවස්ථාව, එහි "රජයේ නිලධරයා" යන යෙදුමේ අර්ථ නිරූපණය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අර්ථ නිරූපණය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

" "රජයේ නිලධරයා" යන්නෙන්, අධිකරණ නිලධරයකු හැර ජනරජය යටතේ වැටුප් ලබන ධුරයක් දරන තැනැත්තෙක් අදහස් වේ; එහෙත් ඊට-

(අ) ජනාධිපතිවරයා;

(ආ) අග්‍රාමාත්‍යවරයා;

(ඇ) කථානායකවරයා;

(ඈ) 44 වන ව්‍යවස්ථාව හෝ 45 වන ව්‍යවස්ථාව යටතේ පත්කරනු ලැබූ අමාත්‍යවරයෙක්;

(ඉ) 46 වන ව්‍යවස්ථාව යටතේ පත් කරනු ලැබූ නියෝජ්‍ය අමාත්‍යවරයෙක්;

(ඊ) පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්;

(උ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවේ සාමාජිකයෙක්;

(ඌ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(එ) 41ආ වන ව්‍යවස්ථාවේ සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා හෝ සාමාජිකයෙක්;

(ඒ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා;

(ඔ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයාගේ කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙක්;

(ඕ) විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ක) රාජ්‍ය භාෂා කොමිෂන් සභාවේ සාමාජිකයෙක්;

(ග) විගණකාධිපතිවරයා; සහ

(ච) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා,

ඇතුළත් නොවන්නේ ය.".

30. (1) (අ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින නවවන පාර්ලිමේන්තුව, එය කලින් විසුරුවා හරිනු ලැබුවහොත් මිස, 2025 අගෝස්තු මස 19 වන දින තෙක් දිගට ම ක්‍රියා කළ යුතු අතර, ඉන්පසු එය විසිරෙන්නේ ය.

(ආ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පිළිවෙළින් ජනාධිපති ධුරය සහ අග්‍රාමාත්‍ය ධුරය දරන තැනැත්තන් ඒ දිනයෙන් පසු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධානවලට යටත්ව එම ධුර දැරිය යුතු වන්නේ ය.

(2) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී-

(අ) අග්‍රවිනිශ්චයකාරවරයා;

(ආ) ශ්‍රේෂ්ඨාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(ඇ) අධිකරණ සේවා කොමිෂන් සභාවේ සාමාජිකයන්;

(ඈ) අභියාචනාධිකරණයේ සභාපතිවරයා;

(ඉ) අභියාචනාධිකරණයේ විනිශ්චයකාරවරයන්;

(ඊ) නීතිපතිවරයා;

(උ) ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා;

(ඌ) විගණකාධිපතිවරයා;

(එ) පොලිස්පතිවරයා;

(ඒ) පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා (ඔම්බුඩ්ස්මන්);

(ඔ) පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා;

(ඕ) මහාධිකරණයේ විනිශ්චයකාරවරයන්; හෝ

(ක) අධිකරණ නිලධරයන්, උපලේඛනගත රජයේ නිලධරයන්, රජයේ නිලධරයන් හෝ පොලිස් නිලධරයන්,

වශයෙන් ධුර දරන සෑම තැනැත්තකු ම තවදුරටත් එම ධුර දරනු ලැබිය යුතු අතර, 41ඇ වන ව්‍යවස්ථාවේ (3) වන අනුව්‍යවස්ථාවට යටත්ව එම නියම හා කොන්දේසි යටතේ එම ධුරයේ බලතල, කාර්ය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටුකිරීම කරනු ලැබිය යුතු වන්නේ ය.

(3) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයකු ලෙස ධුරය දරන සෑම තැනැත්තකු ම මේ පනත ක්‍රියාත්මක වන දින සිට බලපවත්වන පරිදි පාර්ලිමේන්තු සභාවේ සාමාජිකයකු ලෙස ධුරය දැරීම නතර වන්නේ ය.

(4) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී-

(අ) මැතිවරණ කොමිෂන් සභාවේ;

(ආ) රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ;

(ඇ) ජාතික පොලිස් කොමිෂන් සභාවේ;

(ඈ) ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිෂන් සභාවේ;

(ඉ) අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශනය කිරීමේ කොමිෂන් සභාවේ;

(ඊ) මුදල් කොමිෂන් සභාවේ; සහ

(උ) සීමා නිර්ණය කොමිෂන් සභාවේ,

සභාපතිවරයා හෝ සාමාජිකයකු හෝ ලෙස ධුරය දරන සෑම තැනැත්තකු ම මේ පනත ක්‍රියාත්මක වන දින සිට බලපවත්වන පරිදි ඒ ධුරය දැරීම නතර වන්නේ ය:

එසේ වුව ද, මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී ඉහත සඳහන් යම් කොමිෂන් සභාවක සභාපතිවරයා හෝ යම් සාමාජිකයකු හෝ වශයෙන් ධුරය දරන තැනැත්තකුට එකී අදාළ කොමිෂන් සභා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ VIIඅ වන පරිච්ඡේදයට අනුකූලව ස්ථාපිත කරනු ලබන දිනය තෙක් තම අදාළ ධුරවල බලතල සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටුකිරීම දිගටම කරගෙන යනු ලැබිය හැක්කේ ය.

(5) මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා-

(අ) පොලිස් නිලධරයන්ගේ පත්කිරීම්, උසස් කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම් සම්බන්ධ සියලු කාරණා; සහ

(ආ) පොලිස් නිලධරයන් විසින් රාජ්‍ය සේවා කොමිෂන් සභාවට ඉදිරිපත් කරන ලද සියලු අභියාචන,

ඒ දිනයේ සිට බලපවත්වන පරිදි 155අ වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද ජාතික පොලිස් කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ජාතික පොලිස් කොමිෂන් සභාව විසින් ඒවා තීරණය කරනු ලැබිය යුත්තේ ය.

(6) මෙම පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී රාජ්‍ය සේවා කොමිෂන් සභාව ඉදිරියේ පවත්නා ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ සාමාජිකයන්ගේ පත්කිරීම්, උසස්කිරීම්, මාරුකිරීම්, විනය පාලනය සහ සේවයෙන් පහකිරීම් සම්බන්ධ සියලු කාරණා ඒ දිනයේ සිට බලපවත්වන පරිදි 153අ වන ව්‍යවස්ථාව යටතේ පිහිටුවන ලද විගණන සේවා කොමිෂන් සභාව වෙත පවරනු ලැබූ ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව විගණන සේවා කොමිෂන් සභාව විසින් ඒවා තීරණය කරනු ලැබිය යුත්තේ ය.

31. (අ) මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පාර්ලිමේන්තු සභාවේ නිර්දේශය හෝ අනුමතය ලබා ගැනීම සඳහා යම් ලිඛිත නීතියකින් නියම කර ඇති අවස්ථාවක දී, පාර්ලිමේන්තු සභාවට කරනු ලබන ඒ සඳහන, මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සභාවට කරනු ලබන සඳහනක් ලෙස කියවා තේරුම් ගනු ලැබිය යුතු යයි ද; සහ

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 91 වන ව්‍යවස්ථාවේ (1) වන අනු ව්‍යවස්ථාවේ (ඈ) ඡේදයේ (xiii) වන අයිතමයේ දක්වා ඇති නුසුදුසුකමට යටත් වන්නා වූ මේ පනත ක්‍රියාත්මක වන දිනයට පෙරාතුව ම වූ දිනයේ දී පවතින නවවන පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයකු මේ පනත ක්‍රියාත්මක වන දිනයේ සිට බලපැවැත්වෙන පරිදි පාර්ලිමේන්තුවේ අසුන් ගැනීමට සහ පාර්ලිමේන්තුවේ දී ඡන්දය දීමට සුදුස්සෙක් නොවන්නේ යයි ද,

සැක දුරු කිරීම සඳහා මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

32. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2022 අංක 31 දරන නොතාරිස් (සංශෝධන) පනත

[සභාතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 31 වන දින]

(107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:

1. මේ පනත 2022 අංක 31 දරන නොතාරිස් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (107 වන අධිකාරය වූ) නොතාරිස් ආඥාපනතේ 3 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

3. (1) නීති අධ්‍යාපන සභාව විසින් පවත්වනු ලබන ඔප්පු ලිවීම පිළිබඳ විභාගයෙන් සමත්ව ඇත්තා වූ සහ එක් අවුරුදු කාලයක් සඳහා නොතාරිස් ධුරයේ වැඩ කටයුතු ඉගෙන ගෙන ඇති බවට හා මේ ආඥාපනතේ හෝ ඒ යටතේ නිශ්චිතව දක්වා ඇති ඔප්පු ලිවීමේ පරිචයන්, රීති හා මාර්ගෝපදේශ පිළිබඳ සම්පූර්ණ අවබෝධයක් ඇති බවට, අවම වශයෙන් අවුරුදු දහයක අනුගාමී කාලයක් නොතාරිස්වරයකු වශයෙන් ක්‍රියාකාරීව වෘත්තියෙහි යෙදී සිටි නීතීඥවරයකුගෙන් මෙහි දෙවැනි උපලේඛනයේ දක්වා ඇති ආ1 ආකෘතියේ ඇති සහතිකයක් ලබාගෙන ඇත්තා වූ ද සෑම නීතීඥවරයකුට ම, එසේ නීතීඥවරයකු ලෙස ඇතුළත් කර ගැනීමෙන් පසුව ඉල්ලීමක් කිරීමෙන්, තමා ඔප්පු ලිවීමේ විභාගය සමත් වී ඇති භාෂාවෙන් තමා පදිංචිව සිටින අධිකරණ කලාපය තුළ නොතාරිස්වරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීමට බලය පැවරෙන බලපත්‍රයක් ලබාගැනීමට හිමිකමක් ඇත්තේ ය.".

(2) (1) වන උපවගන්තිය යටතේ බලපත්‍රයක් ලබා දී ඇති සෑම නොතාරිස්වරයකු ම, නොතාරිස්වරයකු ලෙස වෘත්තියේ යෙදීම ආරම්භ කිරීමට පෙරාතුව, වැඩ ආරම්භ කිරීමේ ලිපියක් අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත භාර දෙනු ලැබිය යුතු ය.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:

(1) එහි (1) වන උපවගන්තියේ (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ආ) නොතාරිස්වරයකු ලෙස ස්වකීය කාර්ය යථා පරිදි ද විශ්වසනීය ලෙස ද ඉටුකිරීම සඳහා, ඒකාබද්ධ අරමුදලට බැර කළ යුතු වන රුපියල් දසදහසක මුදලක් තැන්පත් කර මහාධිකරණය ඉදිරියෙහි ඇපකරයක් ලියා අත්සන් කරනු ලැබිය යුතු යත සහ";

(2) එහි (2) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

(2) (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සෑම ඇපකරයක් ම නොතාරිස් බලපත්‍රයේ නිශ්චිතව දක්වා ඇති ප්‍රදේශය සම්බන්ධයෙන් අධිකරණ බලය ඇති මහාධිකරණ විනිශ්චයකාරවරයා ඉදිරියෙහි අත්සන් කරනු ලැබිය යුතු ය.";

(3) එහි (3) වන උපවගන්තිය ඉවත් කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 13 වන වගන්තියේ "ඉහත සඳහන් එකී ඇපකරය සහ සුරැකුම" යන වචන වෙනුවට "ඉහත සඳහන් එකී ඇපකරය" යන වචන සහ "රුපියල් දස දහසකට නොඅඩු" යන වචන වෙනුවට "රුපියල් විසි පන් දහසකට නොඅඩු" යන වචන අදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 17 වන වගන්තියේ "සුරැකුම" යන වචනය වෙනුවට "ඇපකරය" යන වචනය ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:

"(1) නොතාරිස්වරයකුට එරෙහිව මහාධිකරණයේ අධිචෝදනා නගා ඇති අවස්ථාවක නීතිපතිවරයාගේ ඉල්ලීම මත, අමාත්‍යවරයා විසින්, එකී නොතාරිස්වරයාගේ නඩු විභාගය පැවැත්වෙනතුරු ඔහු නොතාරිස් ධුරයේ කාර්ය ඉටුකිරීමෙන් අත්හිටුවනු ලැබිය හැකි ය.".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ "අමාත්‍යවරයාගේ මතය අනුව," යන වචන වෙනුවට "මේ ආඥාපනත යටතේ" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 21 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(අ) එහි (1) වන උපවගන්තියේ (ඉ) ඡේදයේ "අශක්නුතාව, වයස" යන වචන වෙනුවට "අශක්නුතාව" යන වචනය ආදේශ කිරීමෙන්; සහ

(ආ) එහි (4) වන උපවගන්තියේ "රුපියල් දෙදහස් පන්සියයකට නොඅඩු" යන වචන වෙනුවට "රුපියල් දස දහසකට නොඅඩු" යන වචන ආදේශ කිරීමෙන්.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 24 වන වගන්තියේ "රුපියල් දස දහසකට නොඅඩු සහ රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් ලක්ෂයකට නොඅඩු සහ රුපියල් ලක්ෂ පහක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 26 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (2) වන උපවගන්තියේ "සුරැකුම" යන වචනය වෙනුවට "ඇපය" යන වචනය ආදේශ කිරීමෙන්;

(2) එහි (3) වන උපවගන්තියේ "සුරැකුම" යන වචනය වෙනුවට "ඇපය" යන වචනය ඇතුළත් කිරීමෙන්;

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 27 වන වගන්තිය එහි (2) වන උපවගන්තියේ "මාර්තු" යන වචනය වෙනුවට "අප්‍රේල්" යන වචනය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 28 වන වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන උපවගන්තිය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1අ) සෑම නොතාරිස්වරයකු විසින් ම, ඔහු පෙර වර්ෂයේ ලියා සහතික කරන ලද සියලු ඔප්පුවල හෝ සාධන පත්‍රවල අනුපිටපත් ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා වෙත යවා ඇති බවට දිවුරුම් ප්‍රකාශයක් එම ඉල්ලුම් පත්‍රයට ඇමිණිය යුතු ය.".

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (3) වන රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන්:-

(3) ඔහු, තමා ඉදිරිපිට ලියා අත්සන් කරන ලද හෝ ලියා අත්සන් කිරීමට නියමිත යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සම්පූර්ණයෙන් ලියනු ලබන තෙක් හෝ එය සුලේඛනය කරනු ලබන තෙක්, එම ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කරන්නකුට හෝ යම් සාක්ෂිකරුවකුට, එකී ඔප්පුවට හෝ සාධන පත්‍රයට හෝ එහි අනුපිටපතට හෝ නොතාරිස්ගේ පිටපතට එකී ලියා අත්සන් කරන්නාගේ හෝ සාක්ෂිකරුගේ අත්සන හෝ සලකුණ යෙදීමට හෝ එකී ලියා අත්සන් කරන්නාට, අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මහපට ඇඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ තැබීමට නියම කිරීමට අවසර දීම හෝ එවැනි අත්සන් තැබීමක්, සලකුණක් යෙදීමක් හෝ අතේ හෝ පාදයේ ඇඟිලි සලකුණ තැබීමක් සිදුවීමකට ඉඩ නොදිය යුතු යන හෝ එවැනි යම් කාර්යයක් සඳහා පසුව භාවිත කිරීමට අදහස් කරන යම් කඩදාසියක හෝ කොළයක එකී ලියා අත්සන් කරන්නාට හෝ සාක්ෂිකරුට එකී ලියා අත්සන් කරන්නාගේ හෝ සාක්ෂිකරුගේ අත්සන හෝ සලකුණ යෙදීමට සහ එකී ලියා අත්සන් කරන්නාට, අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මහපට අඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ තැබීමට නියම කිරීම නොකළ යුතු ය. කිසිදු අවස්ථාවක යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සඳහා වූ හිස් කඩදාසියකට හෝ යම් අසම්පූර්ණ ආකෘති පත්‍රයකට එකී ලියා අත්සන් කරන්නාගේ අත්සන ගැනීම හෝ වම් හෝ දකුණු මහපට ඇඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක සලකුණක් හෝ පාදයේ ඇඟිල්ලක සලකුණක් ගැනීම නොකළ යුතු ය.";

(2) එහි (4) වන රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන්:-

(4) කල් පවතින පාර්ලිමන්ට් කඩදාසියක හෝ නිල් කඩදාසියක ලියා, යතුරු ලියනය කර හෝ මුද්‍රණය කර ඇත්නම් මිස, ඔහු විසින් යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ලියා සහතික කිරීම හෝ සත්‍යාපනය කිරීම නොකළ යුතු ය.";

(3) එහි (5) වන රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන්:-

(5) (අ) ඔහු විසින්, බෙදා වෙන් නොකරන ලද එක් තනි කොළයක හෝ නිල් කඩදාසියක ලියනු ලබන යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සත්‍යවත් කිරීම හෝ සහතික කිරීම කළ යුතු ය; හෝ

(ආ) ඔහු වෙන් වූ කොළ දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් යොදා ගනු ලබන අවස්ථාවක, ඔහු විසින්-

(i) සෑම පිටුවක් ම අංකනය කළ යුතු ය;

(ii) එහි එක් එක් කොළයේ ඔහුගේ අත්සන තැබිය යුතු ය; සහ

(iii) අවස්ථාවෝචිත පරිදි, සෑම ලියා අත්සන් කරන්නකුට ම, (මෙහි ඕන්මතු ඇටෝර්නි බලකරු" ලෙස සඳහන් කරනු ලබන) ඇටෝර්නි බලපත්‍රයක් දරන්නකුට ම හෝ යම් සංස්ථාපිත මණ්ඩලයක බලයලත් තැනැත්තකුට ම එහි එක් එක් කොළයේ සිය අත්සන සහ වම් හෝ දකුණු මහපට ඇඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ තැබීමට සැලැස්විය යුතු ය.";

(4) එහි (6) වන රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන් :-

(6) නියමිත මුද්දර ගාස්තු ලබා දී ඇති බවට සහතික වශයෙන් දන්නේ නම් මිස, ඔහු විසින් යම් සාධන පත්‍රයක් සත්‍යායනය කිරීම හෝ සහතික කිරීම නොකළ යුතු ය.";

(5) එහි (7) වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන් :-

(7අ) (අ) මේ ආඥාපනතේ හෝ වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, යම් ලිඛිත නීතියක් යටතේ ලියා අත්සන් කරන ලද පැවරුමක්, තෑග්ගක් හෝ හුවමාරුවක් සම්බන්ධයෙන් වන සියලු ඔප්පු හෝ සාධන පත්‍ර සඳහා ගෙවිය යුතු යම් මුද්දර ගාස්තුවක් නොතාරිස්වරයා විසින් ගෙවිය යුතු ය.

(ආ) එකී මුදල ගෙවනු ලැබීම සනාථ කරන අදාළ රාජ්‍ය බැංකුවෙන් නොතාරිස්වරයා ලද කුවිතාන්සියෙහි මුල් පිටපත, ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ අනුපිටපතට ඇමිණිය යුතු ය.

(ඇ) එම කුවිතාන්සියේ පිටපත්, එකී ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතට සහ නොතාරිස්ගේ පිටපතට ඇමිණිය යුතු ය.".

(6) එහි (9) වන රීතියේ යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ලියා අත්සන් කරන තැනැත්තාව ඔහු විසින් හෝ එය සහතික කරන සාක්ෂිකරුවන්ගෙන් අවම වශයෙන් දෙදෙනකු විසින් හඳුනන්නේ නම් මිස, ඔහු විසින් එම ඔප්පුව හෝ සාධන පත්‍රය සත්‍යවත් කිරීම හෝ සහතික කිරීම නොකළ යුතුය;" යන වචන වෙනුවට යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ලියා අත්සන් කරන තැනැත්තන්ගෙන් එක් අයකු හෝ එය සහතික කරන සාක්ෂිකරුවන් දෙදෙනා ඔහු විසින් හඳුනන්නේ නම් මිස හෝ එම ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කරන තැනැත්තන්ගේ අනන්‍යතාව, ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රයේ ජීව දත්ත පිටුව හෝ රියදුරු බලපත්‍රය පරීක්ෂා කිරීමෙන් ඔහු විසින් තහවුරු කරන්නේ නම් මිස, ඔහු විසින් එම ඔප්පුව හෝ සාධන පත්‍රය සත්‍යවත් කිරීම හෝ සහතික කිරීම නොකළ යුතු ය;" යන වචන ආදේශ කිරීමෙන්;

(7) එහි (14) වන රීතිය වෙනුවට පහත දැක්වෙන රීතිය ආදේශ කිරීමෙන්:-

(14) ඔහු විසින්, ඔප්පුවට හෝ සාධන පත්‍රයට යම් ලියා අත්සන් කරන්නකු හෝ සාක්ෂිකරුවකු අත්සන් කිරීමට හෝ සලකුණු තැබීමට පෙර හා යම් ලියා අත්සන් කරන්නකු වම් හෝ දකුණු මහපට ඇඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ තැබීමට පෙර, සහ යම් ඔප්පුවක හෝ සාධන පත්‍රයක ලියා අත්සන් කරන්නකු සංස්ථාපිත මණ්ඩලයක් වේ නම්, එහි මුද්‍රාව තැබීමට සලස්වා අධ්‍යක්ෂ මණ්ඩලයේ අත්සන් හෝ එම ඔප්පුව හෝ සාධන පත්‍රය අත්සන් කිරීමට යෝජනා සම්මතයකින් අධ්‍යක්ෂ මණ්ඩලය විසින් බලය දෙන ලද යම් තැනැත්තකුගේ අත්සන ලබා ගැනීමට පෙර, එකී ලියා අත්සන් කරන්නාගේ හෝ සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ නම් නිශ්චය කර ගත යුතු අතර, එකී යම් ලියා අත්සන් කරන්නාගේ හෝ සාක්ෂිකරුවකුගේ නම අනන්‍යතා ලේඛනවල සඳහන් නමට වඩා වෙනස් වේ නම්, එම ඔප්පුව හෝ සාධන පත්‍රය සහතික කිරීමේ දී එම නමින් සහ අත්සනේ ලියන ලද නමින් එකී ලියා අත්සන් කරන්නා හෝ සාක්ෂිකරුවා විස්තර කළ යුතු ය. ලියා අත්සන් කරන තැනැත්තා සංස්ථාපිත මණ්ඩලයක් වන අවස්ථාවක, එම ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ නොතාරිස්ගේ පිටපතට, එකී ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කරන තැනැත්තාට බලය පවරමින් අධ්‍යක්ෂ මණ්ඩලය කළ යෝජනා සම්මතයේ පිටපතක් ඔහු විසින් ඇමිණිය යුතු ය.";

(8) එහි (15) වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන්:-

(15අ) (1) (අ) නිශ්චල දේපළක් සම්බන්ධයෙන් වන ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ලියා අත්සන් කරන සෑම-

(i) ලියා අත්සන් කරන්නකු ම;

(ii) ඇටෝර්නි බලකරුවකු ම; හෝ

(iii) සංස්ථාපිත මණ්ඩලයක අධ්‍යක්ෂ මණ්ඩලය හෝ බලයලත් තැනැත්තකු ම,

(15) වන රීතියේ විධිවිධානවලට අතිරේකව, එකී ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතේ, අනු පිටපතේ සහ නොතාරිස්ගේ පිටපතේ සිය අත්සනට ඉහළින් හෝ පැත්තෙන් යම් අතක මහපට ඇඟිල්ලේ සලකුණ තැබිය යුතු ය.

(ආ) ලියා අත්සන් කරන්නෙකුගේ, ඇටෝර්නි බලකරුවකුගේ හෝ බලයලත් තැනැත්තකුගේ මහපට ඇඟිලි සලකුණ ලබා ගත නොහැකි වන අවස්ථාවක, එවැනි ලියා අත්සන් කරන්නකු, ඇටෝර්නි බලකරුවකු හෝ බලයලත් තැනැත්තකු එකී ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතේ, අනුපිටපතේ සහ නොතාරිස් පිටපතේ සිය අත්සනට ඉහළින් හෝ පැත්තෙන් යම් අතක ඇඟිලි සලකුණ හෝ පාදයක ඇඟිලි සලකුණ තැබිය යුතු ය.

(ඇ) ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ඇටෝර්නි බලකරු විසින් ලියා අත්සන් කරනු ලබන අවස්ථාවක දී, එකී ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් තබන වේලාවේ දී එම ඇටෝර්නි බලපත්‍රය අවලංගු හා වලංගු බවටත්, ඇටෝර්නි බලපත්‍රයේ දීමනාකරු ජීවත්ව සිටින බවටත් තහවුරු කරන දිවුරුම් ප්‍රකාශයක් ඇටෝර්නි බලකරු විසින් නොතාරිස්වරයා වෙත ලබාදිය යුතු ය.

(ඈ) දීමනා ලාභියා බාලවයස්කරුවකු වන විට, නෛතික භාරකරු හෝ භාරකරු මෙම වගන්තියේ අරමුණු සඳහා දීමනා ලාභියා වෙනුවෙන් ක්‍රියා කිරීමට ශක්නුතාව ඇති පුද්ගලයකු විය යුතු ය.";

(9) එහි (16) වන රීතියේ-

(අ) එහි (අ) ඡේදයේ, "එහි වරිපනම් අංකය සහ වීථියේ නමක් ඇත්නම් එය ද" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"එහි වරිපනම් අංකය සහ වීථියේ නමක් ඇත්නම් එය ද, සභාධිපත්‍ය දේපළක් සම්බන්ධයෙන් වන විට දී සභාධිපත්‍ය කොටස හඳුනාගත හැකි අවස්ථාවක දී, එකී සභාධිපත්‍ය කොටස සහ අනෙකුත් මූලිකාංග පිළිබඳ විස්තර ද, සභාධිපත්‍ය කොටස හඳුනාගත නොහැකි අවස්ථාවක දී, සම්පූර්ණ ඉඩමේ හෝ ඉඩම් කොටස පිළිබඳ විස්තර ද"; සහ

(ආ) එහි (ආ) ඡේදයේ, "එය නොබෙදූ කොටසක් වන්නේ නම්, එය කොටසක් වන ඉඩමේ මායිම් සහ බිම් ප්‍රමාණය ද සඳහන් කරනු ලැබිය යුතු ය: එසේ වුව ද," යන වචනවල සිට එම ඡේදයේ අවසානය දක්වා වන වචන වෙනුවට "එය නොබෙදූ කොටසක් වන්නේ නම්, එය කොටසක් වන ඉඩමේ මායිම් සහ ප්‍රමාණය සඳහන් කරනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(10) (අ) එහි (17) වන රීතියේ (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ආ) (i) ඔහු විසින්, එකී ඉඩමට හෝ නිශ්චල දේපළට සම්බන්ධ හිමිකාරිත්වය සහ ලියාපදිංචි බැඳීම් අන්තර්ගත එකී ඉඩමට හෝ නිශ්චල දේපළට අදාළ අවසාන සටහන අන්තර්ගත පත් ඉරුවේ සහතික කරන ලද උද්ධෘතය අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ රෙජිස්ට්‍රාර්වරයාගෙන් ලබා ගත යුතු ය;

(ii) යම් ඔප්පුවක් පෙර ලියාපදිංචි කරනු ලැබ ඇත්නම්, ඔහු විසින්, ඔප්පුව පෙර ලියාපදිංචි කරනු ලැබ ඇති වෙළුමේ සහ පත් ඉරුවේ අංකය ඔප්පුවේ මුල් පිටුවේ ලිවීම හෝ මුද්‍රණය කිරීම කළ යුතු ය;

(iii) පැවරුම් ඔප්පුවක් හෝ තෑගි ඔප්පුවක් හෝ හුවමාරු ඔප්පුවක් හෝ අන්තිම කැමති පත්‍රයක් සම්බන්ධයෙන් වන විට දී, ඔහු විසින්, ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතට පාර්ශ්වයන්ගේ විදේශ ගමන් බලපත්‍ර ප්‍රමාණයේ සහතික කරන ලද ඡායාරූප අලවා ඔහුගේ මුද්‍රාව තැබිය යුතු අතර ජාතික හැඳුනුම්පතේ, විදේශ ගමන් බලපත්‍රයේ හෝ රියදුරු බලපත්‍රයේ පිටපත් නොතාරිස්ගේ පිටපතට අමුණා තැබිය යුතු ය;";

(ආ) එහි (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේද ඇතුළත් කිරීමෙන්:-

"(ඇ) ඔහු විසින් ඔප්පුවේ මුල් පිටුවේ ඔහුගේ සම්පූර්ණ නම, නොතාරිස්වරයාට ලබා දී ඇති අංකය, ඔහුගේ කාර්යාලයේ ලිපිනය සහ දුරකථන අංකය ලිවිය යුතු ය. ඔහු යම් සංවිධානයක, ආයතනයක හෝ සමාගමක සේවය කරන නීති නිලධරයකු වන්නේ නම්, ඔහු විසින් එම සංවිධානයේ, ආයතනයේ හෝ සමාගමේ ලියාපදිංචි ලිපිනය නිශ්චිතව දැක්විය යුතු ය;

(ඈ) යම් ඔප්පුවක හෝ සාධන පත්‍රයක පාර්ශ්වයක් සංස්ථාපිත ආයතනයක් වන්නේ නම්, ඔහු විසින්, එම සංස්ථාපිත ආයතනය සංස්ථාගත කිරීමේ සහතිකයේ හෝ එය පිහිටුවන වෙනත් සාධන පත්‍රයක සහතික කරන ලද පිටපතක් සහ අධ්‍යක්ෂ මණ්ඩලය පිළිබඳ විස්තර රඳවා තබා ගත යුතු ය; සහ

(ඉ) භාරයකට අදාළ ඔප්පුවක් සම්බන්ධයෙන් වන විට දී, ඔහු විසින්, භාර ඔප්පු යටතේ කටයුතු කරන භාරකරුවන්ගේ නම්, ලිපින සහ ජාතික හැඳුනුම්පත් අංක සහ, ඔප්පුව ලියා අත්සන් කිරීමට ඔවුන් වෙත බලය ලබා දී ඇත්තේ භාර ඔප්පුවේ කවර වගන්තියක් යටතේ ද එම වගන්තිය ද තම සහතිකයේ දැක්විය යුතු අතර භාර ඔප්පුවේ පිටපතක් ද රඳවා තබා ගත යුතු ය.";

(11) එහි (20) වන රීතියේ-

(අ) එහි (ආ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ආ) එකී ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා අත්සන් කරන්නන් ඔහු දන්නේ ද යන්න හෝ ඔවුන්ගේ ජාතික හැඳුනුම්පත, විදේශ ගමන් බලපත්‍රයේ ජීව දත්ත පිටුව හෝ රියදුරු බලපත්‍රය පරීක්ෂා කිරීමෙන් ඔවුන්ව හඳුනාගනු ලැබුවේ ද යන්න හෝ ඔහු එහි සාක්ෂිකරුවන් දන්නේ ද යන්න වග සහ, අවසානයට දක්වන ලද අවස්ථාවේ දී නම්, එකී සාක්ෂිකරුවන් හඳුනන්නේ ලියා අත්සන් කරන්නන්ගෙන් කවරෙක් ද හෝ ඔප්පුව හෝ සාධන පත්‍රය පිළිගන්නා කවර තැනැත්තා ද යන වග සඳහන් කළ යුතු ය.";

(ආ) එහි (ඉ) ඡේදය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"(ඉ) ඔහු ඉදිරිපිට දී, ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ ප්‍රතිඥාව හෝ ප්‍රතිඥාවේ කොටසක් වශයෙන් යම් මුදලක් ගෙවනු ලැබුවේ ද යන්න සහ එසේ ගෙවනු ලැබුවේ නම්, සත්‍ය වශයෙන්ම ගෙවන ලද එකී මුදල් ප්‍රමාණය දේශීය ව්‍යවහාර මුදලින් සහ එය ගෙවන ලද්දේ චෙක් පතකින්, ගෙවීම් නියෝගයකින්, බැංකු අණකරයකින් හෝ බැංකුකරුවාගේ චෙක් පතකින් නම්, එම සාධන පත්‍රයේ විස්තර, එකී ගෙවීමට සාක්ෂියක් වශයෙන්, ඔප්පුවේ සහතිකයේ දක්වනු ලැබිය යුතු ය."; සහ

(ඇ) එහි (උ) ඡේදයේ "මකා දැමීම, වෙනස් කිරීම සහ අන්තර් නිවේශන තිබේ නම්, ඒවා කර ඇත්තේ ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ අත්සන්වලට, අංකවලට හෝ යොදන ලද මුද්දර මත ලියන ලද්දකට ද යන බව" යන වචන වෙනුවට "මකා දැමීම, වෙනස් කිරීම් සහ අන්තර් නිවේශන තිබේ නම්, ඒවා කර ඇත්තේ ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ අත්සන්වලට, අංකවලට හෝ යොදන ලද මුද්දර මත ලියන ලද්දකට යන බව; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ඈ) එහි (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(උ1) අන්තිම කැමති පත්‍රයක් සම්බන්ධයෙන් වන විට දී-

(i) තෙස්තමේන්තුකරු අන්තිම කැමති පත්‍රය ලියා අත්සන් කිරීමට යහපත් සහ මනා සිහියෙන් යුතු ව සිටි බව අන්තිම කැමති පත්‍රය සහතික කිරීමේ දී දැක්විය යුතු ය; සහ

(ii) ඔහු විසින් පවත්වාගෙන යනු ලබන ඔප්පු නාමලේඛනයක, එම අන්තිම කැමති පත්‍රයට පවරා ඇති අංකය, දිනය සහ තෙස්තමේන්තුකරුගේ නම ඇතුළත් කළ යුතු ය.";

(12) එහි (27) වන රීතිය ඉවත් කිරීමෙන්;

(13) එහි (30) වන රීතියේ, "ඔහු විසින්, නොතාරිස්ගේ පිටපත සමඟ ලියාපදිංචි ඇටෝර්නි බලපත්‍රයේ සත්‍ය පිටපතක් සුරක්ෂිතව තබාගත යුතු වන අතර" යන වචනවල සිට එම රීතියේ අවසානය දක්වා වන වචන වෙනුවට, "ඔහු විසින්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලබාගත් ඇටෝර්නි බලපත්‍රයේ සහතික කරන ලද පිටපතක් මුල් පිටපතට ද එහි සත්‍ය පිටපත් එහි අනුපිටපතට සහ නොතාරිස්ගේ පිටපතට ද අමුණනු ලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්;

(14) එහි (30) වන රීතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් රීතිය ඇතුළත් කිරීමෙන්:-

(30අ) ඔහු විසින් සහතික කරනු ලබන සෑම ඔප්පුවක් ම හෝ සාධන පත්‍රයක් ම ඒවා ලියා සහතික කළ දිනයේ සිට දින තිහක් ඉකුත් වීමට පෙර ලියාපදිංචිය සඳහා රෙජිස්ට්‍රාර්වරයා වෙත ඉදිරිපත් කිරීම සෑම නොතාරිස්වරයකුගේ ම වගකීම විය යුතු ය:

එසේ වුව ද, ඔහු වෘත්තියෙහි නියැලෙන බල ප්‍රදේශයෙන් පිටත දී යම් ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් ලියාපදිංචි කිරීම අවශ්‍ය වන අවස්ථාවක දී, එම ඔප්පුව හෝ සාධන පත්‍රය ලියා සහතික කළ දිනයේ සිට දින හැටක් ඉකුත්වීමට පෙර ලියාපදිංචිය සඳහා ඔහු විසින් එම ඔප්පුව හෝ සාධන පත්‍රය ඉදිරිපත් කළ යුතු ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 34 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට, පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

34. (1) (අ) 31 වන වගන්තියේ දක්වා ඇති (1) වන, (31) වන හෝ (32) වන රීති උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන හෝ එම රීති පැහැර හරින හෝ නොසලකා හරින සෑම නොතාරිස්වරයකු ම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, ඒ සම්බන්ධයෙන් යටත් විය හැකි යම් සිවිල් වගකීමකට අමතරව, රුපියල් පන්දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය;

(ආ) 31 වන වගන්තියේ දක්වා ඇති (2) වන, (3) වන, (6) වන, (7) වන, (11) වන, (18) වන, (21) වන, (23) වන, (24) වන හෝ (30අ) වන රීති උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන හෝ එම රීති පැහැර හරින හෝ නොසලකා හරින සෑම නොතාරිස්වරයකු ම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, ඒ සම්බන්ධයෙන් යටත් විය හැකි යම් සිවිල් වගකීමකට අමතරව, රුපියල් විසි දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය; හෝ

(ඇ) 31 වන වගන්තියේ දක්වා ඇති වෙනත් යම් රීතියක් උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන හෝ එම රීති පැහැර හරින හෝ නොසලකා හරින සෑම නොතාරිස්වරයකු ම වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, ඒ සම්බන්ධයෙන් යටත් විය හැකි යම් සිවිල් වගකීමකට අමතරව, රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය.

(2) යම් නොතාරිස්වරයකු විසින්, 31 වන වගන්තියේ දක්වා ඇති (26) වන රීතියේ විධිවිධාන උල්ලංඝනය වන පරිදි ක්‍රියා කරන හෝ එම රීතිය පැහැර හරින හෝ නොසලකා හරින අවස්ථාවක දී, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, පෞද්ගලිකව ඔහු වෙත බාර දෙනු ලබන හෝ ලියාපදිංචි තැපෑලෙන් යවනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එකී දැන්වීමේ කාර්යය සඳහා එකී දැන්වීමෙහි ඔහු විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් වැඩිදුර කාලසීමාවක් තුළ එකී රීතියේ නියමයන්ට අනුකූල වන ලෙසට එකී නොතාරිස්වරයාට නියම කරනු ලැබිය හැකි ය. එකී නොතාරිස්වරයා එකී දැන්වීමේ නියමයන්ට අනුකූලව කටයුතු කිරීම පැහැර හරින අවස්ථාවක දී, අමාත්‍යවරයා විසින්, රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් තත් කාර්යය සඳහා කරනු ලබන ඉල්ලීමක් මත, නොතාරිස්වරයා ඔහුගේ ධුරයෙහි කාර්ය ඉටුකිරීමෙන් අත්හිටුවනු ලැබිය හැකි ය.

(3) තම බලපත්‍රය අත්හිටුවනු ලැබ ඇති නොතාරිස්වරයකු විසින්, එකී අත්හිටුවීමේ දැන්වීම ලැබුණු දිනයේ සිට, කිසිදු ඔප්පුවක් හෝ සාධන පත්‍රයක් සහතික කිරීම සිදු නොකළ යුතු ය.

(4) එකී අත්හිටුවීමේ දැන්වීමේ පිටපතක් අදාළ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලය හෝ අධිකරණ පරිශ්‍රවල ප්‍රදර්ශනය කරන ලෙස නියම කරමින් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින්, ඉඩම් රෙජිස්ට්‍රාර්වරුන් සහ මහාධිකරණ, දිසා අධිකරණ සහ මහෙස්ත්‍රාත් අධිකරණවල රෙජිස්ට්‍රාර්වරුන් වෙත වහාම නිවේදනය කළ යුතු ය.

(5) අත්හිටුවීමේ දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති කාලසීමා තුළ අනුපිටපත් ඉදිරිපත් කිරීම පැහැර හරින නොතාරිස්වරයකු වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබීමේ දී, රුපියල් ලක්ෂ පහකට නොවැඩි දඩයකට ඔහු යටත් විය යුතු අතර අමාත්‍යවරයා විසින්, තත් කාර්ය සඳහා රෙජිස්ට්‍රාර්වරයා කරනු ලබන ඉල්ලීමක් මත, එකී නොතාරිස්වරයාගේ බලපත්‍රය අවලංගු කරනු ලැබිය හැකි ය.".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "රුපියල් විසි පන් දහසක් නොඉක්මවන දඩයකට" යන වචන වෙනුවට "රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 39 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (ඇ) ඡේදයේ "අත්සන හෝ සලකුණ" යන වචන වෙනුවට "අත්සන සහ අවස්ථාවෝචිත පරිදි, වම් හෝ දකුණු මහපටඟිල්ලේ සලකුණ හෝ වෙනත් යම් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක සලකුණ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) "අවුරුදු පහකට නොවැඩි යම් කාලයකට බන්ධනාගාරගත කරනු ලැබීමට ඔහු යටත් විය යුතු ය." යන වචන වෙනුවට "අවුරුදු දහයකට නොවැඩි යම් කාලයක් සඳහා බන්ධනාගාරගත කරනු ලැබීමට හෝ රුපියල් ලක්ෂයක දඩයකට හෝ එම දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දෙකට ම ඔහු යටත් විය යුතු අතර, (අ) ඡේදයේ සිට (උ) ඡේදය දක්වා වන ඡේදවල

නිශ්චිතව දක්වා ඇති නොතාරිස්වරයකුගේ ක්‍රියාවක් හේතුවෙන් යම් අලාභයක් හෝ පාඩුවක් ලබා තිබෙන යම් තැනැත්තකු වෙත අධිකරණය විසින් තීරණය කරනු ලැබිය හැකි යම් වන්දි මුදලක් ගෙවීමට ද යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 41 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "ලිත් මාස දොළහකට නොවැඩි යම් කාලයකට සුළු හෝ බරපතළ වැඩ සහිතව බන්ධනාගාරගත කරනු ලැබීමට"යන වචනවල සිට එම උපවගන්තියේ අවසානය දක්වා වූ වචන වෙනුවට "රුපියල් පනස් දහසක් නොඉක්මවන දඩයකට යටත් විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 43 වන වගන්තියේ "මහාධිකරණ විනිශ්චකාරවරයා" යන යෙදුමේ අර්ථ නිරූපණයට පෙරාතුව ම පහත දැක්වෙන අර්ථ නිරූපණ ඇතුළත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

""නීති අධ්‍යාපන සභාව" යන්නට, (276 වන අධිකාරය වූ) නීති අධ්‍යාපන සභා ආඥාපනතේ 2 වන වගන්තිය මගින් ඊට දී ඇති අර්ථය ම තිබිය යුතු ය;

"ලියා අත්සන් කරන්නා" යනුවෙන්-

(අ) විකිණීමේ ඔප්පුවක් සම්බන්ධයෙන් වන විට විකුණුම්කරු සහ ගැනුම්කරු; සහ

(ආ) අනෙකුත් ඔප්පු හෝ සාධන පත්‍ර සම්බන්ධයෙන් වන විට එකී ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ පාර්ශ්වකරුවන්,

අදහස් වේ.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:

(1) එහි "ආ" ආකෘතියට ඉක්බිතිව ම ප්‍රධාන ප්‍රඥප්තියේ "ආ1" ආකෘතිය ලෙස බලාත්මක විය යුතු පහත දැක්වෙන අලුත් ආකෘතිය ඇතුළත් කිරීමෙන්:

"ආ1 ආකෘතිය

[3 වන වගන්තිය]

..... අධිකරණ කලාපයේ නීතිඥවරයකු සහ ප්‍රසිද්ධ නොතාරිස්වරයකු වන ..... වන මම, ... දින සිට නොතාරිස්වරයකු වශයෙන් වෘත්තියෙහි යෙදීම ආරම්භ කරන ලද බවත් අනුගාමී අවුරුදු දහයක කාලයක් වෘත්තියෙහි ක්‍රියාකාරීව නියැලී සිටි බවත්, නීතිඥ .....මයා/මිය/මෙනෙවිය ....දින සිට අවුරුද්දක කාලයක් මා යටතේ නොතාරිස් වෘත්තිය පිළිබඳ අධ්‍යයන කටයුතු සිදු කළ බවත් මෙයින් සහතික කරමි.

දිනය : .....

.....

අත්සන

නීතිඥ සහ ප්‍රසිද්ධ නොතාරිස්

(මුද්‍රාව)";

(2) එම උපලේඛනයේ "ඉ" ආකෘතිය ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන ආකෘතිය ආදේශ කිරීමෙන්:-

"ඉ ආකෘතිය

[31 (21) වන වගන්තිය]

සහතික කිරීමේ ආකෘතිය

..... යන අධිකරණ කලාපයේ ..... (නොතාරිස්වරයාගේ ලිපිනය) හි පදිංචි ප්‍රසිද්ධ නොතාරිස් ..... වන මම පිළිවෙළින්, (අපැහැදිලි ලෙස අවස්ථාවෝචිත පරිදි .....ලෙස අත්සන් කරන ලද) මෙහි අත්සන් කරනු ලබන සාක්ෂිකරුවන් වන ජාතික හැඳුනුම්පත්/ විදේශ ගමන් බලපත්‍ර/ රියදුරු බලපත්‍ර අංක .....දරන (සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ නම සහ ලිපිනය ඇතුළත් කරන්න) යන අය ඉදිරිපිට දී (අපැහැදිලි ලෙස/අවස්ථාවෝචිත පරිදි/ ජුවානිස්"ලෙස) අත්සන් තබනු ලැබුවා වූ ද සහ ස්වකීය (වම්/දකුණු මහපට ඇඟිල්ලේ හෝ වෙනත් ඇඟිල්ලක හෝ පාදයේ ඇඟිල්ලක) සලකුණ තැබුවා වූ ද, මෙම ඔප්පුවේ ලියා අත්සන් කරන්නන් වන (ලියා අත්සන් කරන්නන්ගේ නම් ඇතුළත් කරන්න) තැනැත්තන් වෙත, එකී නොතාරිස් තැන වන මා විසින් කියවා දෙනු ලැබූ බවත්, (හෝ කියවා තේරුම්කර දෙනු ලැබූ බවත්) එම සාධන පත්‍රයට එකී ලියා අත්සන් කරන තැනැත්තන් විසින් ද, එකී සාක්ෂිකරුවන් විසින් ද සහ එකී නොතාරිස්වරයා වන මා විසින් ද, මා ඉදිරිපිට දී ත් සහ ඔවුනොවුන් ඉදිරිපිට දී ත් සියලු දෙනාම එකවර එක්ව සිටිය දී ත් වර්ෂ ..... වූ .... මස ..... දින ..... දී අත්සන් තබන ලද බවට මෙයින් සහතික කරමි.

තව ද, ... (ලියා අත්සන් කරන්නා මා දන්නා බවත්/ සාක්ෂිකරුවන් මා දන්නා බවත්/ඔවුන්ගේ (ජාතික හැඳුනුම්පත/විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය) පරීක්ෂා කිරීම මගින් ඔවුන්ගේ අනන්‍යතාව මා විසින් පරීක්ෂා කරන ලද

බවත්) තව ද, ඉහත සඳහන් කරන ලද සාධන පත්‍රය ලියා අත්සන් කිරීමට පෙර ලියා අත්සන් කරන්නාගේ/ කරන්නන්ගේ ජාතික හැඳුනුම්පත/ විදේශ ගමන් බලපත්‍රය/ රියදුරු බලපත්‍රය මා විසින් පරීක්ෂා කරන ලද බව ද මෙයින් සහතික කරමි.

තව ද, ඔප්පුවේ හෝ සාධන පත්‍රයේ මුල් පිටපතට ලියා අත්සන් කරන්නාගේ මෑතක දී ගත් ඡායාරූප ඇල වූ බව ද, (පැවරුම් හෝ තෑගි ඔප්පු සම්බන්ධයෙන් වන විට) රු. ..... (ඉලක්කමෙන්) වටිනාකමකට සරිලන සේ ..... පළාත් සභාවේ නමට බැර වන පරිදි ..... රාජ්‍ය බැංකුවට මුදල් ගෙවා ලබා ගන්නා ලද අංක ..... හා ..... දින දරන මුද්දර ගාස්තු ගෙවීමේ කුවිතාන්සියේ මුල් පිටපත ඔප්පුවේ අනු පිටපතට ද, එහි පිටපත් ඔප්පුවේ මුල් පිටපතට හා නොතාරිස්වරයාගේ පිටපතට ද (අනෙක් සෑම අවස්ථාවක දී ම) ඔප්පුවේ මුල් පිටපතට ..... වටිනාකමකින් යුතු මුද්දර ..... සංඛ්‍යාවක් ද, අනුපිටපතට රු. ..... වටිනාකමකින් යුතු මුද්දර ..... සංඛ්‍යාවක් ඇල වූ බව ද, මම මෙයින් සහතික කරමි.

තව ද, මෙහි සඳහන් ප්‍රතිෂ්ඨාව මා ඉදිරිපිට දී ගැනුම්කරු විසින් විකුනුම්කරුට/බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරුට ගෙවන ලද බවත්, මා ඉදිරිපිට දී හෝ නොගෙවන ලද මුත් ගැනුම්කරු/බදු ගැනුම්කරු වෙතින් එම ප්‍රතිෂ්ඨාව ලද බවට විකුනුම්කරු/බදු දීමනාකරු විසින් පිළිගන්නා ලද බවත් මම මෙයින් සහතික කරමි.

තව ද, මෙහි සඳහන් ප්‍රතිෂ්ඨාව මා ඉදිරිපිට දී ගැනුම්කරු විසින් විකුණුම්කරුට/ බදු ගැනුම්කරු විසින් බදු දීමනාකරු වෙත ගෙවන ලද බවත් හෝ මා ඉදිරිපිට දී නොගෙවන ලද නමුත් මෙහි ලියා අත්සන් කිරීමට පෙර එම ප්‍රතිෂ්ඨාව ගැනුම්කරුගෙන් හෝ බදු ගැනුම්කරුගෙන් ලද බවට (විකුණුම්කරු/බදු දීමනාකරු විසින් පිළිගන්නා ලද බවත්) මම වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

තව ද, (අන්තිම කැමති පත්‍රයක් සම්බන්ධයෙන් වන විට) අන්තිම කැමති පත්‍රය ලියා අත්සන් කිරීම සඳහා අන්තිම කැමතිපත්‍රකරු මනා සිහිකල්පනාවෙන් යුතු ව සිටි බව ද, මම වැඩිදුරටත් සහතික කරමි.

තව ද, මෙය ලියා සහතික කිරීමට පෙර ..... පිටුවේ ..... පේළියේ ..... වචන/අකුරු (මකා හැර එයට උඩින් තීන්තෙන් ලියන ලද බවත්/ කපා හරින ලද බවත්) මම වැඩිදුරටත් මෙයින් සහතික කරමි.

(ඇටෝර්නි බලකරුවකු සම්බන්ධයෙන් වන විට) ලියාපදිංචි කරන ලද ඇටෝර්නි බලපත්‍රයේ සහතික පිටපතක් මෙම ඔප්පුවේ මුල් පිටපතට ද, එහි සත්‍ය පිටපත් දෙවන පිටපතට සහ නොතාරිස්වරයාගේ පිටපතට ද අමුණා ඇති බව ද සහතික කරමි.

එමෙන්ම මා විසින් මාගේ වාර්ෂික නොතාරිස් බලපත්‍රය අලුත් කරගෙන ඇති බව ද/ඒ සඳහා ඉල්ලුම් කර ඇති බව ද සහතික කරමි.

.....

දිනය

.....

අත්සන

ප්‍රසිද්ධ නොතාරිස්

(මුද්‍රාව)".

23. සැක දුරුකිරීම සඳහා, මේ පනතේ විධිවිධාන-

(අ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙර නීත්‍යානුකූලව ලියා අත්සන් කරන ලද සහ (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව ලියාපදිංචිය අවසන්ව නොමැති යම් ඔප්පුවකට හෝ සාධන පත්‍රයකට බලනොපාන බවට;

(ආ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙර ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් හෝ ඔප්පුවක් මත යම් මුද්දර ගාස්තු අය කර ගැනීමට හෝ පියවා ගැනීමට යම් පළාත් සභාවක් සතු බලතලවලට අගතියක් නොමැති බවට;

(ඇ) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයට පෙර අධිකරණයක් ඉදිරියේ විභාග කර අවසන් ව නොමැති යම් අපරාධ හෝ සිවිල් නඩුවකට අධිකරණයක් විසින් ලබා දෙන ලද යම් තීන්දුවකට බලනොපාන බවට;

(ඈ) මේ පනත ක්‍රියත්මක වීම ආරම්භ වන දිනට පෙර සිය වෘත්තීමය කටයුතු ආරම්භ කර ඇති නොතාරිස්වරයකු ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියට අනුව ඇපකරයක් අත්සන් තැබීමේ වගකීමට යටත් නොවන බවට,

මෙයින් ප්‍රකාශ කරනු ලැබේ.

24. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2022 අංක 32 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත

[සභතිකය සටහන් කළේ 2022 ඔක්තෝබර් මස 31 වන දින]

(117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 32 දරන ලේඛන ලියාපදිංචි කිරීමේ (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) (117 වන අධිකාරය වූ) ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ 32 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(1) (අ) (මෙහි මින් මත "ඉඩම" යනුවෙන් සඳහන් කරනු ලබන) ඉඩමකට, නොබෙදූ ඉඩමකට, ඉඩම් කොටසකට හෝ සභාධිපත්‍ය කොටසකට-

(i) අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ඇත්තා වූ; හෝ

(ii) අයිතියක්, හිමිකමක් හෝ සම්බන්ධතාවක් ඇති බවට හිමිකම්පාන්නා වූ,

(මෙහි මින් මතු "කේවියටිකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) තැනැත්තකු විසින්, එකී ඉඩමට අදාළ යම් සාධන පත්‍රයක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කිරීමක් පිළිබඳ ව තමා වෙත දැන්වීමක් කළ යුතු බවට නියම කරමින්, මෙහි දෙවන උපලේඛනයේ VIII වන ආකෘතියෙහි වූ කේවියට් තහනමක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(ආ) ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන සෑම කේවියට් තහනමක් ම-

(i) පිටපත් දෙකකින් යුක්ත විය යුතු අතර, ඒ සමඟ, එකී ඉඩමට කේවියටිකරුට ඇති අයිතිය, හිමිකම හෝ සම්බන්ධතාව හෝ කේවියටිකරු විසින් ඉඩම සම්බන්ධයෙන් හිමිකම්පාන්නා වූ අයිතිය, හිමිකම හෝ සම්බන්ධතාව සනාථ කරන කේවියටිකරුගේ දිවුරුම් පෙත්සමක් සහ නීතිඥවරයකු විසින් නිකුත් කරන ලද සහතිකයක් ද ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(ii) කේවියටිකරු හිමිකරු නොවන අවස්ථාවක, එකී ඉඩම ලියාපදිංචි කර ඇති අදාළ වෙළුමේ සහ පත් ඉරුවේ නම් සහ ලිපින සඳහන් හිමිකරුවන් වෙත භාර දෙනු ලැබීම සඳහා, මුද්දර යෙදූ ලිපිකවර සමඟ දෙවන උපලේඛනයේ දක්වා ඇති X වන ආකෘතියෙහි වන දැන්වීමක පිටපත් අවශ්‍ය සංඛ්‍යාවක් ද සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය;

(iii) කේවියටිකරු, (මින් මතු "ඇටෝර්නි බලකරු" යනුවෙන් සඳහන් කරනු ලබන) ඇටෝර්නි බලපත්‍රයක් දරන්නකු වන අවස්ථාවක දී, (මින් මතු "රෙජිස්ට්‍රාර්" යනුවෙන් සඳහන් කරනු ලබන) රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා හෝ අදාළ ඉඩම් ලියාපදිංචි කාර්යාලයේ රෙජිස්ට්‍රාර්වරයා හෝ හිමිකම් පිළිබඳ රෙජිස්ට්‍රාර්වරයා වෙත යථා පරිදි ලියාපදිංචි කළ ඇටෝර්නි බලපත්‍රයේ මුල් පිටපතේ සහතික කළ පිටපතක් ද සමඟ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය; සහ

(iv) කේවියටිකරුගේ නම, අත්සන සහ ජාතික හැඳුනුම්පතේ අංකය හෝ විදේශ ගමන් බලපත්‍රයේ අංකය, හෝ රියදුරු බලපත්‍රයේ අංකය කේවියට් තහනමට අදාළ දැන්වීම් භාරදිය යුතු කේවියටිකරුගේ ශ්‍රී ලංකාවේ ලිපිනය, කේවියට් තහනමේ දිනය, කේවියටිකරු හිමිකරු නොවන අවස්ථාවක දී කේවියට් තහනම පිළිබඳ දැන්වීම යැවිය යුතු තැනැත්තන්ගේ නම් සහ ලිපින, ඉඩමට කේවියටිකරු විසින් හිමිකම් පාන අයිතිය, හිමිකම හෝ සම්බන්ධතාව, හිමිකම් පෑම තහවුරු කරන්නා වූ කරුණු, මායිම් හා ඉඩම ලියාපදිංචි කළ නිවැරදි වෙළුම හා පත්ඉරුව දක්වන ඉඩම පිළිබඳ විස්තරයක් ද, ඇතුළත් විය යුතු ය.

(ඇ) මෙම වගන්තියේ කාර්යය සඳහා-

(i) "කේවියටිකරු" යන්නට, සංස්ථාවක්, ඉඩමකට අදාළ යම් භාරයක අර්ථලාභියා, බාලවයස්කරුවකුගේ, සිහිවිකල තැනැත්තකුගේ හෝ මානසික වශයෙන් දුබල තැනැත්තකුගේ නීත්‍යානුකූල භාරකරු හෝ සහාය මිත්‍රයා, විනිශ්චිත ණයකරු, මරණකරුවකුගේ බූදලයක පොල්මඃකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ නීත්‍යානුකූල උරුමකරුවකු හෝ ඉඩමක හිමිකරු සමග ගිවිසුම්ගතව ඇති අපේක්ෂිත ගැනුම්කරුවකු හෝ ඉඩමක් සංවර්ධනය කරන්නකු අයත් වේ;

(ii) "සභාධිපත්‍ය කොටස" යන්නෙන්, 1973 අංක 11 දරන ජාතික රාජ්‍ය සභාවේ බද්ධ නිවාස අයිතිකම් පනතේ 10 වන වගන්තිය අනුව 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත යටතේ ලියාපදිංචි කරන ලද හෝ මෙම ආඥාපනත යටතේ ලියාපදිංචි කරන ලද සභාධිපත්‍ය කොටසක් අදහස් වේ; සහ

(iii) "සම්බන්ධතාවක්" යන්නට, ක්ෂණිකව ලියාපදිංචි කළ නොහැකි වන්නා වූ ඉඩමකට අදාළ ලියාපදිංචි නොකළ ඔප්පුවකින් හෝ සාධන පත්‍රයකින් පැහැනගින්නා වූ, භාරයකින් පැහැනගින්නා වූ, අන්තිම කැමති පත්‍රයක් හෝ අන්තිම කැමති පත්‍රයක් නොමැතිව අනුප්‍රාප්තියක් මගින් ලද උරුමයකින් පැහැනගින්නා වූ, උකස් කිරීම් හෝ විකුණුම් ගිවිසුමකට අදාළ සාධන පත්‍රවලින් පැහැනගින්නා වූ, සම හිමිකාරත්වයකින් පැහැනගින්නා වූ හෝ බාලවයස්කාරයකුගේ හෝ සිහිවිකල තැනැත්තකුගේ හෝ මානසික වශයෙන් දුබල තැනැත්තකුගේ බූදලයකින් පැහැනගින්නා වූ,

සම්බන්ධතාවක් ද ඇතුළත් වේ.";

(2) (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්ති ඇතුළත් කිරීමෙන්:-

"(1අ) රෙජිස්ට්‍රාර්වරයා විසින්, කේවියට්කරු (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් අවශ්‍ය සියලු ලේඛන හා තොරතුරු සපයා ඇති බවට සෑහීමට පත්වීමෙන් අනතුරුව, එකී කේවියට් තහනම ලද බවට දැන්විය යුතු අතර, 27 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් නියමිත තොරතුරු වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(1ආ) ලද බව දැන්වීමෙන් පසු, රෙජිස්ට්‍රාර්වරයා විසින්, (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ (ii) වන අනුඡේදය යටතේ කේවියට්කරු විසින් නම් හා ලිපින ලබා දුන් තැනැත්තන් වෙත වහාම දන්වනු ලැබිය යුතු අතර, (1) වන උපවගන්තියේ (ආ) වන ඡේදයේ (සස) වන අනුඡේදයේ සඳහන් දැන්වීම යවන ලද තැනැත්තන්ගේ නම් සහ ලිපින වෙනත් කරුණු තීරයේ සටහන් කළ යුතු ය.";

(3) එහි (3) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට, පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(3) කේවියට් තහනමක් උපරිම අවුරුදු දෙකක කාලයක් සඳහා වලංගු විය යුතු ය.";

(4) එහි (4) වන උපවගන්තියේ "කේවියට්කරු වෙත යවනු ලබන දැන්වීම, නියමිත ආකෘතියේ විය යුතු ය" යන වචන වෙනුවට "කේවියට් තහනමේ විස්තර කර ඇති එකී ඉඩම සම්බන්ධයෙන් සාධන පත්‍රයන් ලියාපදිංචිය සඳහා ඉන් පසුව ඉදිරිපත් කර ඇති අවස්ථාවක, කේවියට්කරුට දෙවන උපලේඛනයේ XI හි සඳහන් ආකෘතියෙහි වූ දැන්වීමක් යැවිය යුතු ය" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(5) එහි (5) වන උපවගන්තියේ "බලයලත් අධිකරණයක් මගින් දින තිහක් ඇතුළත" යන වචන වෙනුවට "බලයලත් අධිකරණයක් විසින් දින හැටක් ඇතුළත" යන වචන ආදේශ කිරීමෙන්.

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 33 වන වගන්තිය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "තහනම් පූර්වතා දැන්වීමක්, කේවියට් තහනමක් හෝ ලිස්පෙන්ඩනයක්" යන වචන වෙනුවට "තහනම් පූර්වතා දැන්වීමක් හෝ ලිස්පෙන්ඩනයක්" යන වචන ආදේශ කිරීමෙන්;

(2) එහි (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) (අ) කේවියට් තහනමක්-

(i) කේවියට්කරු විසින්;

(ii) ඇටෝර්නි බලකරු විසින්;

(iii) කේවියට්කරු මිය යාමේදී, පොල්මෑකරුවකු, අද්මිනිස්ත්‍රාසිකරුවකු හෝ නෛතික උරුමකරුවකු විසින්;

(iv) කේවියට් තහනම ඉදිරිපත් කර ඇත්තේ බාල වයස්කරුවකු, සිහිවිකල තැනැත්තකු හෝ මානසික වශයෙන් දුබල තැනැත්තකු වෙනුවෙන් ඔහුගේ නීත්‍යානුකූල භාරකරු හෝ සහාය මිත්‍රයා නම්, එකී භාරකරු හෝ සහාය මිත්‍රයා විසින්, නීත්‍යානුකූල භාරකරු මිය යාමෙන් හෝ ඔහුව ඉවත් කිරීමෙන් ඔහුගේ අනුප්‍රාප්තිකයා විසින්, හෝ වයෝපූර්ණත්වයට පත්වීමෙන්, බාලවයස්කරු විසින්;

(v) හවුල් කේවියට්කරුවන් සිටින්නේ නම්, ඔවුන්ගෙන් එක් කේවියට්කරුවකු හෝ කේවියට්කරුවන් කිහිපදෙනෙකු මිය යාමේ දී ජීවත්ව සිටින කේවියට්කරුවන් විසින්;

(vi) බුන්වත් බවට විනිශ්චය කරනු ලැබූවේ නම් නිල වශයෙන් පත් කරනු ලැබූ තැනැත්තා විසින්;

(vii) කේවියට්කරු සංස්ථාවක් වන්නේ නම් සහ එය ඈවර වෙමින් පවතින්නේ නම් සහ කේවියට්කරු හිමිකම්පාන සම්බන්ධතාව අධිකරණය විසින් පත් කරනු ලබන ඈවරකරුවකු වෙත පවතින විට, එම ඈවරකරු විසින් හෝ නිලභාර ගැනුම්කරු;

(viii) කේවියට් තහනමට විෂයය වූ බූදලය සම්බන්ධයෙන් බලයලත් අධිකරණයක් විසින් තීන්දුවක් නිකුත් කර ඇති අවස්ථාවක දී අධිකරණයේ පිස්කල්වරයා හෝ එකී තීන්දුව යටතේ අයිතියක් ලබන වෙනත් යම් තැනැත්තකු විසින්,

ලිඛිතව කරනු ලබන ඉල්ලීමක් මත ඉල්ලා අස්කර ගැනීමට හෝ අවලංගු කිරීම කළ හැකි ය.

(ආ) මෙහි (අ) ඡේදය යටතේ ඉල්ලා අස්කර ගැනීමේ සාධන පත්‍රයක් ලැබීමෙන් රෙජිස්ට්‍රාර්වරයා-

(i) ඉහත කී ආකාරයට කේවියට් තහනම පිළිබඳ රෙජිස්ටරයේ වූ සටහන අවලංගු කර එහි දිනය යෙදිය යුතු ය; සහ

(ii) එකී කේවියට් තහනමින් සිය අයිතියට, හිමිකමට හෝ සම්බන්ධතාවට බලපෑම් එල්ල වූ තැනැත්තන් හෝ සංස්ථා වෙත දැන්විය යුතු ය.";

(3) එහි (2) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

(2අ) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කේවියට් තහනමක් පිළිබඳ (2) වන උපවගන්තිය යටතේ වූ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වූ යම් සිතාසියක්, දැන්වීමක්, නෛසයි ආඥාවක් හෝ තීන්දුවක් 32 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (සඩ) වන අනුඡේදයේ සඳහන් පරිදි කේවියට්කරුගේ ශ්‍රී ලංකා ලිපිනය වෙත යැවිය යුතු ය.";

(4) එහි (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත සඳහන් අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(4) (3) වන උපවගන්තිය යටතේ කේවියට් තහනමක ලියාපදිංචිය අවලංගු කළේ යම් ඉඩමක් සම්බන්ධයෙන් ද, හෝ ඉඩමක යම් සම්බන්ධතාවක් සම්බන්ධයෙන් ද, එකී ඉඩම සම්බන්ධයෙන් ම හෝ එකී සම්බන්ධතාව සම්බන්ධයෙන් ම එම කේවියට්කරු ම ඉදිරිපත් කරන කේවියට් තහනමක් රෙජිස්ට්‍රාර්වරයා විසින් ලියාපදිංචි නොකළ යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 50 වන වගන්තියේ "අවස්ථානුකූලව අවශ්‍ය වන වෙනස්වීම් සහිතව යොදා ගත යුතු ය; නමුත් එම උපලේඛනය නියෝග මගින් වෙනස් කිරීම හෝ ඊට යමක් එකතු කිරීම කරනු ලැබිය හැකි ය." යන වචන වෙනුවට "අවස්ථානුකූලව අවශ්‍ය වන වෙනස්වීම් සහිතව යොදා ගත යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනය, පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි VIII වන ආකෘතිය වෙනුවට පහත සඳහන් අලුත් ආකෘතිය ආදේශ කිරීමෙන්:-

"VIII වන ආකෘතිය

කේවියට් තහනමක ආකෘතිය

[32 (ආ) වගන්තිය]

මෙහි උපලේඛනයේ සඳහන් කරනු ලබන (මට අයත්/වෙනත් අයෙකුට අයත් - අයිතිය/ හිමිකම/ සම්බන්ධතාව සඳහන් කරන්න) .... ඉඩමට අදාළ යම් සාධන පත්‍රයක් ලියාපදිංචිය සඳහා ඉදිරිපත් කරනු ලබන විට, (ජාතික හැඳුනුම්පත්/විදේශ ගමන් බලපත්‍ර/රියදුරු බලපත්‍ර) අංකඨ ..... දරන ..... (කේවියට්කරුගේ සම්පූර්ණ නම හා ලිපිනය ඇතුළත් කරන්න) වන මා වෙත, දැන්වීමක් කරනු ලැබිය යුතු ය.

තව ද, මෙම කේවියට් තහනම මා වෙනුවෙන් (කේවියට්කරු හිමිකරු නොවන විට) ..... වෙනුවෙන් මවිසින් ඉදිරිපත් කරනු ලබන්නේ පහත කාරණාව/කාරණා මත ය.

ඔප්පු අංක ..... යටතේ

අන්තිම කැමති පත්‍ර ..... යටතේ

වෙනත් (නිශ්චිතව දක්වන්න) .....

යටතේ හිමිකම.

තව ද, මේ සම්බන්ධයෙන් වූ දැන්වීම යොමු කිරීමේ ස්ථානය ලෙස මවිසින් (ශ්‍රී ලංකාවේ ලිපිනය) නම් කරමි.

.....

(කේවියට්කරුගේ/ඔහුගේ නීතීඥවරයාගේ හෝ

නොතාරිස්වරයාගේ/ඇටෝර්නි

බලකරුගේ අත්සන)

දිනය: .....

ඉහත නම් සඳහන් ..... (සාක්ෂිකරුවන්ගේ සම්පූර්ණ නම් හා ලිපින) ඉදිරිපිට දී අත්සන් තබන ලදී.

1. පළමුවන සාක්ෂිකරුගේ අත්සන

2. දෙවන සාක්ෂිකරුගේ අත්සන

උපලේඛනය

(13 වන වගන්තියේ පරිදි සහ පෙර ලියාපදිංචි කිරීම් දන්නේ නම්, විස්තර කරන්න)"; සහ

(2) එහි IX වන ආකෘතියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ආකෘතිය ඇතුළත් කිරීමෙන්:-

"X වන ආකෘතිය

[32(1)(ආ)(ii) වගන්තිය]

කේවියට් තහනමක් ලියාපදිංචි කළ දේපළක අයිතිකරු වෙත කරනු ලබන දැන්වීම

..... නමැති හා වරිපනම් අංක: ..... දරන ඉඩම සම්බන්ධයෙන් ..... යන අය කේවියට් තහනමක් ඉදිරිපත් කරනු ලැබූ බවත් එය මෙම ඉඩම් රෙජිස්ට්‍රාර් කාර්යාලයේ ..... වෙළුම් පත්‍රය අංක: ..... හි ලියාපදිංචි කරන ලද බවත් මෙයින් දන්වමි.

.....

(අත්සන)

(ඉඩම් රෙජිස්ට්‍රාර් .....)

දිනය: .....

XI වන ආකෘතිය

[32(4) වගන්තිය]

ලියාපදිංචිය අපේක්ෂාවෙන් පවතින සාධන පත්‍රයක් පිළිබඳ කේවියට්කරුට නිකුත් කරන දැන්වීම

ඔබ විසින් ඉදිරිපත් කරන ලද ..... දිනැති ..... අංක දරන කේවියට් තහනමට එදිරිව, මේ ඉඩම් ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ ..... වෙළුමේ.....පත්ඉරුවේ ලියාපදිංචිය අපේක්ෂාවෙන් මෙහි උපලේඛනයේ සඳහන් සාධන පත්‍රය පවතින බව ඔබ වෙත මෙයින් දැනුම් දෙනු ලැබේ.

.....

(අත්සන)

..... හි ඉඩම් රෙජිස්ට්‍රාර්

දිනය: .....

ඔප්පු අංකය	ඔප්පුවේ/ සාධන පත්‍රයේ ස්වභාවය	ඔප්පුව/ සාධන පත්‍රය සහතික කළ නොතාරිස්වරයාගේ නම	ඉඩම පිළිබඳ විස්තරය (උපලේඛනයට අනුව)	පාර්ශ්වකරුවන්

.".

6. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2022 අංක 34 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 නොවැම්බර් මස 17 වන දින]

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත සංශෝධනය කිරීම පිණිස වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. (1) මේ පනත 2022 අංක 34 දරන අධිකරණ සංවිධාන (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) මේ පනතේ විධිවිධාන ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින් නියම කරනු ලබන යම් දිනයක දී හෝ දිනවල දී ක්‍රියාත්මක විය යුතු ය.

(3) මේ පනතේ වෙනස් විධිවිධාන ක්‍රියාත්මකභාවයට එළඹවීම සඳහා වෙනස් දින නියමකරනු ලැබිය හැකි ය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 2 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

2. ශ්‍රී ලංකා ජනරජයේ යුක්තිය පසිඳලීම සඳහා වන මුල් අවස්ථා අධිකරණ, පහත දැක්වෙන අධිකරණ විය යුතු ය:

(අ) ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය;

(ආ) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාත් සඳහා පිහිටුවන ලද මහාධිකරණ;

(ඇ) දිසා අධිකරණ;

(ඈ) පවුල් අධිකරණ;

(ඉ) සුළු හිමිකම් අධිකරණ;

(ඊ) මහෙස්ත්‍රාත් අධිකරණ; සහ

(උ) ප්‍රාථමික අධිකරණ.".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

5. (1) එක් එක් අධිකරණ දිසාවේ මේ පනත හෝ යම් ලිඛිත නීතියක් යටතේ පවුල් අධිකරණයක් සතු අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී "පවුල් අධිකරණය" ලෙස සැලකිය යුතු සහ මේ පනත හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ සුළු හිමිකම් අධිකරණයක් සතු අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී "සුළු හිමිකම් අධිකරණය" ලෙස සැලකිය යුතු "දිසා අධිකරණයක්" තිබිය යුතු අතර සෑම අධිකරණ කොට්ඨාසයක "මහෙස්ත්‍රාත් අධිකරණයක්" සහ "ප්‍රාථමික අධිකරණයක්" තිබිය යුතු ය. තව ද, එක් එක් අධිකරණය පිළිවෙලින්, "දිසා විනිශ්චයකාරවරයා", පවුල් අධිකරණ

විනිශ්චයකාරවරයා", "සුළු හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරයා", "මහෙස්ත්‍රාත්වරයා" සහ "ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයා" යනුවෙන් හැඳින්වෙන එක් තැනැත්තකු විසින් ද, ඔහු ඉදිරියේද පවත්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙහි සඳහන් එක් එක් අධිකරණය, අමාත්‍යවරයා විසින් කලින් කල නියෝග මගින් නියම කරනු ලබන, අවස්ථාවෝචිත පරිදි, ඒ අධිකරණ දිසාව හෝ කොට්ඨාසය ඇතුළත වූ පහසු ස්ථානයක හෝ ස්ථානවල පැවැත්විය හැකි ය:

එසේ වුව ද, මේ වගන්තියේ කිසිවක්, ස්වකීය අධිකරණ බල ප්‍රදේශය ඇතුළත කවර හෝ පහසු ස්ථානයක අධිකරණය පැවැත්වීමට සෑම විනිශ්චයකාරවරයකුට ම ඇති බලය සීමා කරන ලෙස හෝ අඩු කරන ලෙස හෝ තේරුම් නොගත යුතු ය.".

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 5ආ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

5ආ. (1) එසේ පත් කිරීම අවශ්‍ය වන බව අධිකරණ සේවා කොමිෂන් සභාවේ මතය වන අවස්ථාවක දී, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් සිවිල් අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලබන යම් මුල් අවස්ථා අධිකරණයකට හෝ කිහිපයකට පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා යනුවෙන් හැඳින්වෙන අධිකරණ නිලධරයකු දිසා විනිශ්චයකාරවරු සහ මහෙස්ත්‍රාත්වරු අතරින් පත් කරනු ලැබිය යුතු ය.

(2) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ විධිවිධානවල නිශ්චිතව දක්වා ඇති පරිදි පූර්ව නඩු විභාග සම්මන්ත්‍රණවලට සහ පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා පත් කරනු ලැබ ඇති අධිකරණයේ පවරනු ලබන සිවිල් නඩු කටයුත්තක දී උද්ගත වන්නා වූ අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පවරනු ලබන පශ්චාත් විභාග කාරණාවලට යෙදීම සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම පූර්ව නඩු විභාගය මෙහෙයවනු ලබන විනිශ්චයකාරවරයා විසින් සිදු කරනු ලැබිය යුතු ය.".

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ (1) වන උපවගන්තිය ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) සියලු ම දිසා විනිශ්චයකාරවරයන් ද, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයන් ද, සුළු හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරයන් ද, මහෙස්ත්‍රාත්වරයන් ද, ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයන් ද, ඒ අධිකරණවල සියලු සෑම අතිරේක විනිශ්චයකාරවරයන් සහ අතිරේක මහෙස්ත්‍රාත්වරයන් ද අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් ඔවුන්ගේ ධුරවලට පත් කරනු ලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 8 වන වගන්තියේ (1) වන සහ (2) වන උපවගන්ති ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(1) එකම දිසා අධිකරණයට, පවුල් අධිකරණයට, සුළු හිමිකම් අධිකරණයට, මහෙස්ත්‍රාත් අධිකරණයට සහ ප්‍රාථමික අධිකරණයට පිළිවෙළින් අතිරේක දිසා විනිශ්චයකාරවයන්, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාරවරයන්, අතිරේක සුළු හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරයන්, අතිරේක මහෙස්ත්‍රාත්වරයන් හෝ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයන් අවස්ථානුකූලව අවශ්‍ය වන සංඛ්‍යාවක්, අධිකරණ සේවා කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) එවැනි යම් අධිකරණයකට පත් කරනු ලැබූ සෑම අතිරේක දිසා විනිශ්චයකාරවරයකු ම, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු ම, අතිරේක සුළු හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරයකු ම, අතිරේක මහෙස්ත්‍රාත්වරයකු ම හෝ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයකු ම, වෙන වෙන ම විනිශ්චයාසනාරූඪව අවස්ථාවෝචිත පරිදි ඒ අතිරේක දිසා විනිශ්චයකාරවරයා, අතිරේක පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා, අතිරේක සුළු හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරයා, අතිරේක මහෙස්ත්‍රාත්වරයා හෝ අතිරේක ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයා, එසේ පත්කරන ලද ඒ දිසාවේ හෝ කොට්ඨාසයේ පිළිවෙලින් දිසා අධිකරණය, පවුල් අධිකරණය, සුළු හිමිකම් අධිකරණය, මහෙස්ත්‍රාත් අධිකරණය සහ ප්‍රාථමික අධිකරණය වෙත පැවරී ඇති සියලු බලතල සහ අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ "මහාධිකරණය විසින්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (අ) ඡේදයෙහි "මහාධිකරණය විසින්" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණය හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය විසින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (ආ) ඡේදයෙහි "මහාධිකරණයේ වෙනත් යම්කිසි ආඥාවක් " යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ වෙනත් යම්කිසි ආඥාවක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "මහාධිකරණයේ" යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

19. සෑම දිසා අධිකරණයක් ම ලේඛනෝපගත කිරීමේ අධිකරණයක් විය යුතු අතර, සියලු සිවිල්, ආදායම්, භාර, වස්තුභංගත්ව සහ තෙස්තමේන්තු කාරණා යන මේ කාරණා අතුරින් මේ පනතේ Vඅ වන පරිච්ඡේදය යටතේ හෝ වෙනත් යම් ප්‍රඥප්තියක විධිවිධාන ප්‍රකාර හෝ මුල් අධිකරණ බලය වශයෙන් වෙනත් යම් අධිකරණයකට අනන්‍යව සතු කර දෙනු ලැබූ හෝ නැතහොත් වෙනත් යම් බලධරයකු වෙත අනන්‍යව පවරා දෙනු ලැබූ කාරණා හැර, එකී අනෙකුත් කාරණා සම්බන්ධයෙන් අසීමිත මුල් අධිකරණ බලය සහ එම අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමෙහි ලා දඩ, දණ්ඩන සහ රාජසන්තක කිරීම් පැනවීමෙහිලා අධිකරණ බලය ද දිසා අධිකරණයට ස්වකීය දිසාව තුළ තිබිය යුතු ය. තව ද, සිහිවිකල තැනැත්තන් සහ රක්ෂිත තැනැත්තන් හා ඔවුන්ගේ බූදල් සම්බන්ධයෙන් ද, අර්ථලාභීන්ගේ බූදල් සම්බන්ධයෙන් ද, පුද්ගලහාරකරුවන් සහ භාරකරුවන් සම්බන්ධයෙන් ද, දිසා අධිකරණය වෙත නීතිය මගින් පවරා ඇති වෙනත් යම් කාරණයක් සම්බන්ධයෙන් ද ඉහත කී අන්දමේ ම අධිකරණ බලය දිසා අධිකරණයට තිබිය යුතු ය.".

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 19අ වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 23 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "අභියාචනාධිකරණය" යන වචනය වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (2) වන උපවගන්තියේ පිළිවෙලින් "අභියාචනාධිකරණයේ අවසරය" සහ "අභියාචනාධිකරණය වෙත" යන වචන වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ අවසරය" සහ "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය වෙත" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ ඩ වන පරිච්ඡේදය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන පරිච්ඡේදය ආදේශ කරනු ලැබේ:-

"V වන පරිච්ඡේදය

පවුල් අධිකරණ

24. (1) සෑම පවුල් අධිකරණයක් ම ලේඛනෝපගත කිරීමේ අධිකරණයක් විය යුතු අතර, ඒ අධිකරණයට වෛවාහක ආරවුල්, දික්කසාද නඩු, ශූන්‍යතාව සහ වෙන්වීම සඳහා වන නඩු, අනාචාරය සඳහා වන වන්දි, දික්කසාද දීමනාව සඳහා වන හිමිකම්පෑම්, වෛවාහක දේපළ සම්බන්ධයෙන් කලත්‍රයන්, දෙමව්පියන් සහ ළමුන් අතර සිදුවන ආරවුල්, බාලවයස්කාර දරුවන්ගේ භාරකාරත්වය, යැපෙන්නන්ගේ හිමිකම්පෑම්, පුද්ගල භාරකාරත්වය සහ ආවේක්ෂණය පිළිබඳ කාරණා, සුජාතභාවය සහ අවජාතභාවය හා වෛවාහකත්වය, දරුකමට හදාවඩා ගැනීම පිළිබඳ ප්‍රකාශ සම්බන්ධයෙන් වන හිමිකම් පෑම් සහ උප්පැන්න ලියාපදිංචි කිරීමේ සටහන් සංශෝධනය කිරීම සඳහා වන ඉල්ලීම්, දූෂණය සහ විවාහ පොරොන්දු කඩ කිරීම සඳහා වන හිමිකම්පෑම් සහ වෙනත් යම් ලිඛිත නීතියක් මගින් විධිවිධාන සලස්වා ඇති වෙනත් යම් කාරණා සම්බන්ධයෙන් තනි මුල් අධිකරණ බලය තිබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ ඉහතින් වූ විධිවිධාන කිසිවක් (113 වන අධිකාරය වූ) උඩරට විවාහ හා දික්කසාද පනතේ විධිවිධානවලට සහ (115 වන අධිකාරය වූ) මුස්ලිම් විවාහ හා දික්කසාද පනතේ විධිවිධානවලට බලපානු නොලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ නිශ්චිතව දක්වන ලද සියලු කාරණා සම්බන්ධයෙන් ද, පවුල් අධිකරණයට තනි සහ අනන්‍ය අධිකරණ බලය තිබිය යුතු අතර මෙහි තුන්වන උපලේඛනයේ සඳහන් යම් ප්‍රඥප්තියක යම් කාරණා සම්බන්ධයෙන් යම් අධිකරණයක් වෙත යොමු කරනු ලබන අවස්ථාවක දී, ඒ යොමු කිරීම පවුල් අධිකරණයකට කරන ලද යොමු කිරීමක් ලෙස සලකනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මේ උපවගන්තියේ විධිවිධාන එවැනි යම් නීතියක විධිවිධාන උල්ලංඝනය කරමින් සිදුකරන ලදැයි කියනු ලබන යම් වරදකට අදාළ නොවිය යුතු ය.

(3) යම් බාලවයස්කාර දරුවකුගේ හෝ යම් විවාහයක කලත්‍රයකුගේ යම් දෙමවුපියකු හෝ අනෙක් කලත්‍රයා හෝ ඒ බාලවයස්කාර දරුවාගේ හෝ කලත්‍රයාගේ භාරකරුවකු හෝ ඥාතියකු විසින් අයුතු හෝ නීති විරෝධී භාරකාරත්වයේ තබා ගන්නා ලදැයි කියනු ලබන ඒ බාලවයස්කාර දරුවාගේ හෝ ඒ විවාහයේ කලත්‍රයාගේ භාරකාරත්වය සඳහා වන ඉල්ලීමක් පවුල් අධිකරණය විසින් විභාග කොට තීරණය කරනු ලැබිය යුතු ය. තව ද, ඒ පිළිබඳව විභාග කර තීරණය කිරීමේ සහ නඩුවේ කටයුතු සඳහා යුක්ති සහගතව අවශ්‍ය විය හැකි අතුරු ආඥාවක් සහ අවසාන ආඥාවක් යන දෙවර්ගයේම යම් ආඥා කිරීමේ සම්පූර්ණ බලය සහ අධිකරණ බලය ඒ අධිකරණයට තිබිය යුතු ය.

25. සිහිවිකල තැනැත්තන්ගේ සහ මානසික ඌනතා ඇති තැනැත්තන්ගේ ආරක්ෂාව සහ භාරකාරත්වය සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ දේපළවල භාරය සම්බන්ධයෙන් 20 වන වගන්තිය යටතේ දිසා අධිකරණවල අධිකරණ බලය සහ බලතල පවුල් අධිකරණයක් විසින් ඒ ආකාරයෙන් ම සහ සමාන බලතල සහිතව බාලවයස්කාර තැනැත්තන්ගේ සහ රක්ෂිතයන්ගේ ආරක්ෂාව සම්බන්ධයෙන් සහ ඔවුන්ගේ දේපළ භාර සම්බන්ධයෙන් ක්‍රියාත්මක කරනු ලැබිය යුතු අතර ශ්‍රී ලංකාවෙහි වාසික නොවන බාලවයස්කරුවන්ගේ සහ රක්ෂිතයන්ගේ ශ්‍රී ලංකාවෙහි පිහිටි දේපළ භාරව සිටීම කෙරෙහි ද ව්‍යාප්ත විය යුතු ය.

26. (1) සෑම අධිකරණ දිසාවකට ම "පවුල් උපදේශකවරයා" යනුවෙන් හඳුන්වනු ලැබිය යුතු නිලධරයකු සිටිය යුතු ය.

(2) පවුල් අධිකරණයක අධිකරණ බලය තුළ යම් කාරණයක් සම්බන්ධයෙන් යම් නඩුවක දී ආරවුලක් හෝ නඩත්තු සඳහා යම් ඉල්ලීමක් දිසා විනිශ්චයකාරවරයකු, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පරීක්ෂා කිරීමට හෝ විභාග කිරීම සඳහා ඇති අවස්ථාවක දී, නඩුවේ යම් පාර්ශ්වයක් පටහැනි ඉල්ලීමක් ලිඛිතව ප්‍රකාශ

කර නොමැති වන්නේ නම් මිස, අවස්ථාවෝචිත පරිදි, ඒ දිසා විනිශ්චයකාරවරයා, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ ආරවුල පවුල් උපදේශකවරයකු වෙත යොමු කරනු ලැබිය යුතු ය. ඒ පවුල් උපදේශකවරයා විසින්-

(අ) ඒ ආරවුල සමථයකට පත් කරගැනීම සඳහා පාර්ශ්වයන් පෙළඹවීමට සෑම උත්සාහයක්ම ගනු ලැබිය යුතු ය; සහ

(ආ) ඒ දිසා විනිශ්චයකාරවරයා, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් නිශ්චිතව දක්වනු ලැබිය හැකි යම් කාලසීමාවක් තුළ ඒ පිළිබඳව ඒ පවුල් උපදේශකවරයාගේ වාර්තාව අවස්ථාවෝචිත පරිදි, ඒ දිසා විනිශ්චයකාරවරයා, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා වෙත ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) යම් ආරවුලක් සමථයකට පත් කරනු ලබන අවස්ථාවක දී, ආරවුලේ එක් එක් පාර්ශ්වයන් සහ පවුල් උපදේශකවරයා විසින් සමථකරණයේ නියම ඇතුළත් කර ඒ සඳහා අත්සන් කිරීම කරනු ලැබිය යුතු අතර අවස්ථාවෝචිත පරිදි දිසා විනිශ්චයකාරවරයාට, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයාට හෝ මහෙස්ත්‍රාත්වරයාට ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. දිසා විනිශ්චයකාරවරයා, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා විසින් සමථකරණයේ නියම ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් ලෙස වාර්තාගත කරනු ලැබිය යුතු ය.

(4) (1) වන උපවගන්තියේ සඳහන් යම් ආරවුලක් සමථයකට පත් කිරීම සඳහා පවුල් උපදේශකවරයකු අපොහොසත්වන අවස්ථාවක දී, ඔහු විසින් ඒ ආරවුල පරීක්ෂණයකින් හෝ නඩු විභාග කිරීමකින් අනතුරුව තීරණය කිරීම සඳහා දිසා විනිශ්චයකාරවරයා, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයා හෝ මහෙස්ත්‍රාත්වරයා වෙත යොමු කරනු ලැබිය යුතු ය.

(5) යම් ආරවුලක් පවුල් උපදේශකවරයා විසින් (4) වන උපවගන්තිය යටතේ යම් දිසා විනිශ්චයකාරවරයකු, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු වෙත යොමු කරනු ලබන තෙක්, ඒ කිසිදු දිසා විනිශ්චයකාරවරයකු, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු හෝ මහෙස්ත්‍රාත්වරයකු විසින් ඒ ආරවුල සම්බන්ධයෙන් යම් පරීක්ෂණයක් හෝ නඩු විභාගයක් පවත්වනු නොලැබිය යුතු ය.

27. පරීක්ෂණයකින් හෝ නඩු විභාගයකින් අනතුරුව පවුල් අධිකරණයක් විසින් ප්‍රකාශ කරන ලද නඩු තීන්දුවකින්, තීන්දු ප්‍රකාශයකින් හෝ ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින් දිසා අධිකරණයේ අභියාචනයක් ඉදිරිපත් කරනු ලබන ආකාරය සහ කාර්ය පටිපාටිය පාලනය කරනු ලබන යම් නීතියකට, නියෝගයකට හෝ රීතියකට අනුකූලව, නීතිය පිළිබඳ හෝ සිද්ධිය පිළිබඳ වූ යම් දෝෂයක් මත යම් අභියාචනයක් පවුල් අධිකරණයේ සිට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

28. (1) එකම පවුල් ආරවුලක් සම්බන්ධයෙන් හෝ සාරානුකූලව සමාන පවුල් ආරවුලක් සම්බන්ධයෙන් හෝ පවුල් අධිකරණ එකකට වැඩි ගණනක එකිනෙකට වෙනස් නඩු කටයුතු හෝ නඩු දෙකක් හෝ වැඩි ගණනක් පවරනු ලැබූ විට ඒ නඩු කටයුත්ත හෝ නඩුව මාරු කරන ලෙස ඒ නඩු කටයුතුවල හො නඩුවල යම් පාර්ශ්වයක් විසින් අභියාචනාධිකරණයට ඉල්ලුම් කරනු ලැබිය හැකි ය. නැතහොත් ඉහත සඳහන් නඩු කටයුතු හෝ නඩු ගොනු කර තිබෙන ඒ පවුල් අධිකරණයේ යම් විනිශ්චයකාරවරයකු විසින් ඒ කාරණය අභියාචනාධිකරණය වෙත යොමු කරනු ලැබිය හැකි ය. අභියාචනාධිකරණය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීමෙහි ලා, අභියාචනාධිකරණය විසින් සුදුසු යැයි සළකනු ලැබිය හැකි පරිදි, ඉහත සඳහන් පාර්ශ්ව විසින් දැනටමත් නඩු කටයුතු හෝ නඩු ගොනු කර තිබෙන පවුල් අධිකරණ අතරින් එක් පවුල් අධිකරණයක් වෙත ඒ නඩු කටයුතු හෝ නඩු එකක් හෝ කිහිපයක් මාරු කරනු ලැබිය යුතු ය. එවිට ඒ සියලු ආරවුල් ඒ අධිකරණයේ දී පහසුවෙන් හෝ කඩිනමින් විභාග කොට තීරණය කරනු ලැබිය හැකි ය.

(2) එකම පාර්ශ්වකරුවන් අතර හෝ සාරානුකූලව එකම කාරණයක් සම්බන්ධව එකම පවුල් අධිකරණයක පවරනු ලැබ ඇති හෝ විනිශ්චයට භාජනව පවත්නා නඩු කටයුතු හෝ නඩු දෙකක් හෝ වැඩි ගණනක් ඇති විටක ඒ අධිකරණයේ මතය අනුව ඒ නඩු කටයුතු හෝ නඩු ඒකාබද්ධ කිරීමෙන් පහසුවක් වේ නම් හෝ යුක්තියේ යහපත සඳහා අවශ්‍ය වන බවට සහ ආරවුලේ ඒ කාරණා සම්බන්ධයෙන් කඩිනමින් සුදුස්සක් කිරීම අවශ්‍ය වන බවට ඉහත අධිකරණයේ මතය වන අවස්ථාවක දී ඒ නඩු කටයුතු හෝ නඩු එක් නඩු කටයුත්තකට ඒකාබද්ධ කරනු ලැබිය යුතු බවට විධාන කිරීමට ඉහත කී අධිකරණයට බලය තිබිය යුතු ය. අධිකරණය විසින් එවැනි අවස්ථාවක දී, හදිසි අවශ්‍යතා සහ නඩුවේ යුක්තිය සඳහා අවශ්‍ය වන ආකාරයට කලින් කලට යම් ආඥාවන් කිරීම හෝ යම් තීන්දුවක් ලබා දීම හෝ යම් තීන්දු ප්‍රකාශයක් ඇතුළත් කිරීම හෝ සිදු කරනු ලැබිය හැකි ය.

29. (1) පවුල් අධිකරණයක සියලු නඩු කටයුතු නියම කරනු ලැබිය හැකි පරිදි යම් නියෝගවලට අනුකූලව හැකිතාක් ඉක්මණින් පැවරිය යුතු ය සහ පැවැත්වීම සිදු කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ නියෝග එසේ නියම කරනු ලබන තෙක් පවුල් අධිකරණය විසින් ප්‍රායෝගිකව හැකිතාක් දුරට (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ ලඝු කාර්ය පටිපාටියට අදාළ විධිවිධාන අනුගමනය කරනු ලැබිය යුතු ය.

(2) (61 වන අධිකාරය වූ) ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත යටතේ නඩු කටයුතු පැවරීම සහ පවත්වාගෙන යාම සම්බන්ධයෙන් බලපවත්නා ඒ ආඥාපනතේ විධිවිධාන පවුල් අධිකරණයේ ගොනු කරනු ලැබිය හැකි යම් නඩු කටයුතුවලට අදාළ වන බවට සළකනු ලැබිය යුතු ය.

(3) බාලවයස්කාර දරුවන්ගේ රැකවරණය සහ භාරය සඳහා වන සෑම ඉල්ලීමකටම අන් සියලු කාරණා අභිබවා ප්‍රමුඛත්වය දිය යුතු අතර, ඒවා එදිනෙදා විභාග නොකිරීමට අති විශේෂ අවස්ථානුගත කරුණු ඇති වුවහොත් මිස, ඒ ඉල්ලීම පිළිබඳ කටයුතු සම්බන්ධයෙන් අප්‍රමාදව සුදුස්සක් කිරීම සහතික කිරීම සඳහා දෛනිකව විභාග කරනු ලැබිය යුතු ය.".

14. ප්‍රධාන ප්‍රඥප්තියේ V වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ Vඅ වන පරිච්ඡේදය ලෙස බලාත්මක විය යුතු ය:-

"Vඅ වන පරිච්ඡේදය

සුළු හිමිකම් අධිකරණ

29අ. (1) සෑම සුළු හිමිකම් අධිකරණයක් ම ලේඛනෝපගත කිරීමේ අධිකරණයක් විය යුතු අතර, ඊට අනන්‍ය මුල් අධිකරණ බලය ඇත්තේ ය. තව ද, මෙහි හත්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරන ලද සියලු නඩු සංජානනය කිරීමේ සහ ඒවා විභාග කොට තීරණය කිරීමේ සම්පූර්ණ බලය සෑම සුළු හිමිකම් අධිකරණයකට ම ඇත්තේ ය:

එසේ වුව ද, (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධිවිධාන සංග්‍රහයේ LIII වන පරිච්ඡේදයේ විධිවිධාන යටතේ ගොනු කරන ලද යම් නඩුවක් හෝ වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ විශේෂ විධිවිධාන පනවනු ලැබ ඇති මුදල් ආපසු අය කර ගැනීම සඳහා වන නඩුවක් විභාග කොට තීරණය කිරීම සඳහා අධිකරණ බලය හෝ බලතල සුළු හිමිකම් අධිකරණවලට නොමැති විය යුතු ය.

(2) හත්වන උපලේඛනයේ නිශ්චිතව සඳහන් කරනු ලබන සියලු නඩු, පොළිය හැර, රුපියල් ලක්ෂ පහළොවක මුදල් ප්‍රමාණය හෝ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මඟින් අමාත්‍යවරයා විසින් කලින් කල නියම කරනු ලැබිය හැකි වෙනත් යම් මුදල් ප්‍රමාණයක් නොඉක්මවනු ලැබිය යුතු ය.

(3) (2) වන උපවගන්තිය යටතේ කරනු ලබන සෑම නියමයක් ම, පාර්ලිමේන්තුව විසින් අනුමත කරනු ලැබ ඒ අනුමතය සම්බන්ධයෙන් වන නිවේදනය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන තෙක් බලාත්මක නොවිය යුතු ය.

29අා. යම් සුළු හිමිකම් අධිකරණයක් හමුවේ ඇති නඩු කටයුතු 2022 අංක 33 දරන සුළු හිමිකම් අධිකරණ කාර්ය පටිපාටිය පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතිවල විධිවිධාන සලස්වා ඇති පරිදි සුළු හිමිකම් අධිකරණ සඳහා වන විශේෂ කාර්ය පටිපාටිය මඟින් සිදු කරනු ලැබිය හැකි ය.

29ඇ. සෑම සුළු හිමිකම් අධිකරණයකම විනිශ්චයකාරවරයකු විසින් යම් නඩුවක දී තම ආඥාව හෝ නඩු තීන්දුව ප්‍රකාශ කිරීමේ දී යුක්තිසහගත යයි සහ සාධාරණ යයි තමාට පෙනී යන ගාස්තු සහ වියදම් ගෙවීම සම්බන්ධයෙන් ආඥාවක් කිරීම නිත්‍යානුකූල විය යුතු ය.

29ඈ. (1) තමා පාර්ශ්වකරුවකු වන යම් නඩුවක දී, නඩු කටයුත්තක දී හෝ කාරණයක දී යම් සුළු හිමිකම් අධිකරණයක් විසින් ප්‍රකාශ කරන ලද යම් නඩු තීන්දුවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, අභියාචනය කිරීමේ අයිතිය ප්‍රකාශිතව ම අහිමි කර ඇති අවස්ථාවක දී හැර, නීතිය හෝ සිද්ධිය හෝ පිළිබඳ යම් දෝෂයක් මත, අභියාචනයක් ඒ සුළු හිමිකම් අධිකරණය පිහිටා ඇති පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පිහිටුවා ඇති මහාධිකරණය වෙත ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(2) තමා පාර්ශ්වකරුවකු වන්නා වූ හෝ පාර්ශ්වකරුවකු වීමට අපේක්ෂා කරන්නා වූ හෝ යම් නඩුවක, නඩු කටයුත්තක හෝ කාරණයක දී යම් සුළු හිමිකම් අධිකරණයක් විසින් කරන ලද යම් ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, නීතියෙහිලා වූ හෝ සිද්ධිය පිළිබඳව වූ හෝ යම් දෝෂයක් නිවැරදි කරගැනීම සඳහා ඒ ආඥාවට විරුද්ධව, ඒ සුළු හිමිකම් අධිකරණය පිහිටා ඇති පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පිහිටුවා ඇති මහාධිකරණය වෙත, ඒ මහාධිකරණයේ අවසරය පළමුව ඇතිව සහ ලබාගෙන අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(3) තමා පාර්ශ්වකරුවකු වන්නා වූ හෝ පාර්ශ්වකරුවකුවීමට අපේක්ෂා කරන්නා වූ හෝ යම් නඩුවක, නඩු කටයුත්තක හෝ කාරණයක දී යම් සුළු හිමිකම් අධිකරණයක් විසින් පැහැරහැරීමක් මත ඇතුළත් කරන ලද නඩු තීන්දුවක් නිෂ්ප්‍රභ කරමින් හෝ නිෂ්ප්‍රභ කිරීම ප්‍රතික්ෂේප කරමින් කරන ලද යම් ආඥාවකින් අතෘප්තියට පත් යම් තැනැත්තකු විසින්, නීතියෙහිලා වූ හෝ සිද්ධිය පිළිබඳ වූ හෝ යම් දෝෂයක් නිවැරදි කර ගැනීම සඳහා ඒ ආඥාවට විරුද්ධව, ඒ සුළු හිමිකම් අධිකරණය පිහිටා ඇති පළාත සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පිහිටුවා ඇති මහාධිකරණය වෙත, ඒ මහාධිකරණයේ අවසරය පළමුව ඇතිව සහ ලබාගෙන අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

(4) අභියාචනය සහ අභියාචනයට පාත්‍ර වූ ක්‍රියාවේ යෙදවීම නතර කිරීම සම්බන්ධයෙන් (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ LVIII වන, LIX වන, LX වන සහ LXI වන පරිච්ඡේදවල විධිවිධාන මේ පරිච්ඡේදයේ විධිවිධාන සමඟ අනනුකූල නොවන තාක් දුරට අදාළ විය යුතුය.

(5) යම් අභියාචනයක දී ශ්‍රේෂ්ඨාධිකරණය විසින්, අභියාචනාධිකරණය විසින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග වන ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය විසින් කරනු ලැබූ හා ප්‍රකාශයට පත් කරන ලද සියලු නඩු තීන්දුවලට, ආඥාවලට සහ තීන්දු ප්‍රකාශවලට අනුකූලව ක්‍රියා කිරීම සහ ඉහත සඳහන් විනිශ්චකාරවරයා විසින් දෙන ලද යම් මුල් නඩු තීන්දුවක් හෝ ආඥාවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ආකාරයෙන් ඒ සියලු නඩු තීන්දු, ආඥා සහ තීන්දු ප්‍රකාශ ක්‍රියාත්මක කිරීම සෑම සුළු හිමිකම් අධිකරණයක ම විනිශ්චයකාරවරයා විසින් කරනු ලැබිය යුතු ය.

29ඉ. උචිත අවස්ථාවල දී සහ පාර්ශ්වයන් සමථ කිරීමකට එකඟ වන්නේ නම් නඩු විභාගයට පෙර හෝ නඩු විභාගය අතරතුර දී සමථයකට පත්වීමට පාර්ශ්වයන් පෙළඹවීම සඳහා නීත්‍යානුකූල ක්‍රියාමාර්ගවලින් සියලු ප්‍රයත්න දැරීම සුළු හිමිකම් අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය. සමථය වාර්තාගත කළ යුතු අතර පාර්ශ්වයන් විසින් එයට අත්සන් තැබිය යුතු ය. එම සමථයේ කොන්දේසි ප්‍රකාරව නඩු තීන්දුවක් ඇතුළත් කරනු ලැබිය යුතු ය.".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 31 වන වගන්තියේ "අභියාචනාධිකරණයට" යන වචනය වෙනුවට "ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මඟින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ VI වන පරිච්ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් පරිච්ඡේදය මෙයින් ඇතුළත් කරනු ලබන අතර එය ප්‍රධාන ප්‍රඥප්තියේ VII වන පරිච්ඡේදය ලෙස බලාත්මක විය යුතු යඃ-

"VII වන පරිච්ඡේදය

ප්‍රාථමික අධිකරණ

32. (1) සෑම ප්‍රාථමික අධිකරණයකට ම, ණය, අලාභය, ඉල්ලීම සහ හිමිකම්පෑම රුපියල් එක්දහස් පන්සියය නොඉක්මවන අවස්ථාවක දී වෙනත් යම් නීතියක විධිවිධානවලට යටත්ව, මුල් අධිකරණ බලය තිබිය යුතු අතර පළාත් පාලන ආයතනවල අතුරු ව්‍යවස්ථා ක්‍රියාවේ යෙදවීම සහ ඒ පළාත් පාලන ආයතනවල ආදායම අයකර ගැනීම සම්බන්ධයෙන් වන කාරණා සම්බන්ධයෙන් ද අධිකරණ බලය තිබිය යුතු ය.

(2) ප්‍රාථමික අධිකරණවලට මෙහි හතරවන උපලේඛනයේ සඳහන් ආරවුල් සම්බන්ධයෙන්, හිමිකම්පෑමේ වටිනාකම කුමක් වුව ද, කිසිදු අධිකරණ බලයක් නොතිබිය යුතු ය.

33. (1) අමාත්‍යවරයා විසින් නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් වැරදි සම්බන්ධයෙන් සෑම ප්‍රාථමික අධිකරණයකට ම අනන්‍ය මුල් අපරාධ අධිකරණ බලය තිබිය යුතු අතර අමාත්‍යවරයා විසින් ඒ නියෝගයේ එක් එක් වරද සම්බන්ධයෙන් වන සීමාවන්, සීමා කිරීම් සහ කොන්දේසි නිශ්චිතව දක්වනු ලැබිය හැකි ය.

(2) යම් ප්‍රඥප්තියක විධිවිධාන හෝ ඒ යටතේ සාදන ලද යම් අනු නීතියක විධිවිධාන උල්ලංඝනය කරමින් සිදු කරන ලදැයි කියනු ලබන්නා වූ ද අධිකරණ බලය ප්‍රාථමික අධිකරණය වෙත පවරනු ලැබ ඇත්තා වූ ද සියලු වැරදි සම්බන්ධයෙන් තනි සහ අනන්‍ය අධිකරණ බලය ප්‍රාථමික අධිකරණවලට තිබිය යුතු ය.

(3) මේ වගන්තියේ සඳහන් කිසිවකින්, (1) වන උපවගන්තියේ නිශ්චිතව සඳහන් කරන ලද යම් වරදක් සඳහා පවත්වනු ලැබූ නඩු විභාගයකින් පසුව වරදකරු බවට තීරණය කරනු ලැබූ යම් තැනැත්තකු වරදකරු කිරීමෙන් සහ ඔහුට දඬුවම් නියම කිරීමෙන් මහෙස්ත්‍රාත්වරයකු වළක්වනු නොලැබිය යුතු ය.

34. (1) යම් සිවිල් නඩු කටයුත්තක් හෝ කාරණයක් ප්‍රාථමික අධිකරණයක පවරනු ලබන අවස්ථාවක දී, ඒ නඩුවේ විනිශ්චයකාරවරයා ඉදිරියේ පෙනී සිටීම සඳහා පාර්ශ්වයන් කැඳවීම සහ සුදුසු අවස්ථාවල දී පරීක්ෂණ හෝ විභාග ආරම්භ කිරීමට පෙර ඒ පාර්ශ්වයන් බේරුම්කරණයකට එළඹීමට පෙළඹවීමට සෑම උත්සාහයක් ම ගැනීම ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය. ඒ පාර්ශ්වයන් බේරුම්කරණයට එකඟ වන අවස්ථාවක දී, එකී බේරුම්කරණය වාර්තාගත කරනු ලැබිය යුතු අතර එහි පාර්ශ්වයන් විසින් එකී වාර්තාවට අත්සන් කරනු ලැබිය යුතු අතර ඒ අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් වශයෙන් එය ඇතුළත් කරනු ලැබිය යුතු ය. තව ද එකී අධිකරණයේ තීන්දු ප්‍රකාශයක් වශයෙන් එය බලාත්මක විය යුතු ය.

(2) යම් අපරාධ නඩු කටයුත්තක් හෝ කාරණයක් ප්‍රාථමික අධිකරණයක පවරනු ලැබූ අවස්ථාවක දී, ඒ නඩුවේ විනිශ්චයකාරවරයා ඉදිරියේ පෙනී සිටීම සඳහා අදාළ පාර්ශ්වයන් කැඳවීම සහ සුදුසු අවස්ථාවල දී ඒ පාර්ශ්වයන් බේරුම්කරණයකට එළඹීමට පෙළඹවීම ඒ අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ කාර්යය විය යුතු ය. ඒ පාර්ශ්වයන් බේරුම්කරණයකට එකඟ වන අවස්ථාවක දී, ඒ බේරුම්කරණය වාර්තාගත කරනු ලැබිය යුතු අතර අදාළ පාර්ශ්ව විසින් අත්සන් කරනු ලැබිය යුතු අතර, වෙනත් යම් නීතියක පටහැනිව කුමක් සඳහන් ව තිබුණ ද, ඒ නඩු කටයුත්ත හෝ කාරණය අදාළ වන්නේ යම් වරදකට ද, ඒ වරද සමඨයට පත්කරනු ලැබිය යුතු ය.

35. (1) ප්‍රාථමික අධිකරණයක් විසින් පවත්වනු ලැබූ පරීක්ෂණයකින් හෝ නඩු විභාගයකින් පසුව ඇතුළත් කරන ලද හෝ බලාත්මක කරන ලද යම් නඩු තීන්දුවකින්, ආඥාවකින්, තීන්දු ප්‍රකාශයකින්, වරදකරු කිරීමකින් හෝ දණ්ඩන නියමයකින් අතෘප්තියට පත් යම් පාර්ශ්වයක් විසින්, එසේ අභියාචනය කරන කාර්ය පටිපාටිය සහ ආකාරය පාලනය කරන්නා වූ යම් නීතියකට යටත්ව සහ යම් නීතියකට, නියෝගයකට හෝ රීතියකට අනුකූලව නීතියෙහිලා වූ හෝ සිද්ධිය පිළිබඳ වූ හෝ යම් දෝෂයක් මත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය වෙත අභියාචනයක් ඉදිරිපත් කරනු ලැබිය හැකි යඃ

එසේ වුව ද, එසේ අභියාචනය කිරීමේ කාර්ය පටිපාටිය සහ ආකාරය පාලනය කරන්නා වූ එවැනි යම් නීතියක්, නියෝගයක් හෝ රීතියක් නොමැති අවස්ථාවක දී, අපරාධ නඩුවක් හෝ නඩු කටයුත්තක දී අභියාචනයක් සඳහා මහෙස්ත්‍රාත් අධිකරණයකින් ඉදිරිපත් කරනු ලබන අභියාචනාවලට අදාළ විධිවිධාන අදාළ විය යුතු අතර, සිවිල් නඩුවක හෝ නඩු කටයුත්තක අභියාචනයක් සඳහා දිසා අධිකරණයකින් ඉදිරිපත් කරනු ලබන අභියාචනාවලට අදාළ විධිවිධාන අදාළ විය යුතු ය.

(2) මේ පරිච්ඡේදයේ විධිවිධාන යටතේ පාර්ශ්වයන් අතර ආරවුල බේරුම් කර ගැනීමේ හේතුවෙන් ඇතුළත් කරන ලද හෝ බලාත්මක කරන ලද යම් නඩු තීන්දුවකට, ආඥාවකට, තීන්දු ප්‍රකාශයකට, වරදකරු කිරීමකට හෝ දණ්ඩන නියමයකට විරුද්ධව අභියාචනයක් කළ නොහැකි විය යුතු ය.

36. ප්‍රාථමික අධිකරණයක සියලු නඩු කටයුතු ඒ සඳහා අදාළ විය හැකි යම් නීතිවලට අනුකූලව හැකිතාක් ඉක්මණින් ගොනුකර පැවැත්විය යුතු අතර, එවැනි නීතියක් නොමැති වන්නේ නම්, ප්‍රාථමික අධිකරණයක සිවිල් කාරණයක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වන විට (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ ලඝු කාර්ය පටිපාටියට අදාළ විධිවිධානවලට අනුකූලව ද අපරාධ කාරණයක් හෝ නඩු කටයුත්තක් සම්බන්ධයෙන් වන විට මහෙස්ත්‍රාත් අධිකරණයක ලඝු නඩු විභාගවලට අදාළ විධිවිධානවලට අනුකූලව ද සිදුකරනු ලැබිය යුතු ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 37 වන වගන්තිය මෙයින් ඉවත් කරනු ලබන අතර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

37. (අ) ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයෙන් හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයෙන් ඉදිරිපත් කරන යම් අභියාචනයක් පිළිබඳ අභියාචනාධිකරණයේ යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් සම්බන්ධයෙන්; හෝ

(ආ) දිසා අධිකරණවලින්, පවුල් අධිකරණවලින්, සුළු හිමිකම් අධිකරණවලින්, මහෙස්ත්‍රාත් අධිකරණවලින් හෝ ප්‍රාථමික අධිකරණවලින් ඉදිරිපත් කරන යම් අභියාචනයක් පිළිබඳ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ යම් නඩු තීන්දුවක් හෝ ආඥාවක් සම්බන්ධයෙන්,

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සහ වෙනත් යම් නීතියක විධිවිධානවලට අනුකූලව, ශ්‍රේෂ්ඨාධිකරණය වෙත අභියාචනය කිරීමේ අයිතිවාසිකමක් තිබිය යුතු ය.".

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 38 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තිය එහි (1) වන උපවගන්තිය ලෙස නැවත අංක කිරීමෙන්; සහ

(2) එහි නැවත අංක කරන ලද (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දක්වෙන උපවගන්තිය එකතු කිරීමෙන්:-

"(2) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය හැර, මුල් අවස්ථා අධිකරණයකින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයට අභියාචනය කරනු ලැබූ සියලු අවස්ථාවල දී, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණය විසින් ඒ අභියාචනයේ දී කරනු ලැබ, ප්‍රකාශ කරනු ලැබූ සියලු නඩු තීන්දු, ආඥ සහ තීන්දු ප්‍රකාශ, එකී මුල් අවස්ථා අධිකරණය විසින් කරන ලද හෝ ප්‍රකාශ කරන ලද නඩු තීන්දුවක්, ආඥාවක් හෝ තීන්දු ප්‍රකාශයක් වූවාක් මෙන්, ඒ මුල් අවස්ථා අධිකරණය විසින් පිළිපැද ක්‍රියාවේ යෙදවිය යුතු ය.".

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 45 වන වගන්තියේ (4) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(4) (2) වන සහ (3) වන උපවගන්ති යටතේ පත් කරනු ලැබූ සෑම සාමදාන විනිශ්චයකාරවරයකු ම විසින් සහ සෑම නිල නොලත් මහෙස්ත්‍රාත්වරයකු ම විසින් මහාධිකරණ විනිශ්චයකාරවරයකු, දිසා විනිශ්චයකාරවරයකු, පවුල් අධිකරණ විනිශ්චයකාරවරයකු, සුළු හිමිකම් අධිකරණ විනිශ්චයකාරවරයකු, මහෙස්ත්‍රාත්වරයකු හෝ ප්‍රාථමික අධිකරණ විනිශ්චයකාරවරයකු ඉදිරියෙහි, අමාත්‍යවරයා නිශ්චය කරන ආකෘතියකින් වූ ධුරයේ ප්‍රතිඥාවක් හෝ දිවුරුමක් දී ඊට අත්සන් තැබිය යුතු අතර ඒ ධුරයේ ප්‍රතිඥාව හෝ දිවුරුම් දීම සලස්වන ලෙස ඉල්ලීමක් කරනු ලැබූ විට එය දීමට සැලැස්වීමටත් එකී ප්‍රතිඥාව හෝ දිවුරුම යථා පරිදි දෙනු ලැබූ බව තම අධිකරණයේ වාර්තාවල සටහන් කිරීමටත් ඒ සටහනේ පිටපතක් ශ්‍රේෂ්ඨාධිකරණයේ වාර්තාවල ඇතුළත් කරනු ලැබීම පිණිස ශ්‍රේෂ්ඨාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා වෙත වහාම යැවීමටත් ඒ සෑම විනිශ්චයකාරවරයකුටම බලය පවරන අතර, එසේ කිරීමට නියම කරනු ලැබේ.".

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 49 වන වගන්තියේ (3) වන උපවගන්තියේ අතුරු විධානය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අතුරු විධානය ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"එසේ වුව ද, වෙනත් සෑම අවස්ථාවක දී ම, අවස්ථාවෝචිත පරිදි යාබද කලාපයෙහි, දිසාවෙහි හෝ කොට්ඨාසයෙහි, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ, දිසා අධිකරණයේ, පවුල් අධිකරණයේ, සුළු හිමිකම් අධිකරණයේ යම් විනිශ්චයකාරවරයකුට, මහෙස්ත්‍රාත් අධිකරණයේ යම් මහේස්ත්‍රාත්වරයකුට සහ ප්‍රාථමික අධිකරණයේ යම් විනිශ්චයකාරවරයකුට ඒ නඩුව, අපරාධ නඩුව, නඩු කටයුත්ත හෝ කාරණය විභාග කිරීමට, නඩු විභාග කිරීමට හා තීරණය කිරීමට අධිකරණ බලය තිබිය යුතු ය.".

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 52 වන වගන්තිය පහත දැක්වෙන පරිදි සංශෝධනය කරනු ලැබේ:-

(1) එහි (1) වන උපවගන්තියේ "මහාධිකරණයට සහ එක් එක් දිසා අධිකරණයට, චූලායවන අධිකරණයට සහ මහෙස්ත්‍රාත් අධිකරණයට" යන වචන වෙනුවට, "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයට සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයට සහ එක් එක් දිසා අධිකරණයට, පවුල් අධිකරණයට, සුළු හිමිකම් අධිකරණයට, මහෙස්ත්‍රාත් අධිකරණයට සහ ප්‍රාථමික අධිකරණයට" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) එහි (2) වන උපවගන්තියේ "මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා " යන වචන වෙනුවට "ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයේ රෙජිස්ට්‍රාර්වරයා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.".

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ මහාධිකරණයක හෝ දිසා අධිකරණයක හෝ චූලායවන අධිකරණයක පවරන ලද යම් නඩුවක දී-" යන වචන වෙනුවට, ශ්‍රී ලංකා ජනරජයේ මහාධිකරණයක, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154ග ව්‍යවස්ථාව මගින් පළාතක් සඳහා පිහිටුවන ලද මහාධිකරණයක, දිසා අධිකරණයක,පවුල් අධිකරණයක හෝ සුළු හිමිකම් අධිකරණයක පවරන ලද යම් නඩුවක දී" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 55 වන වගන්තිය මෙයින් ඉවත් කර, ඒ වෙනුවට පහත දැක්වෙන වගන්තිය ආදේශ කරනු ලැබේ:-

55. (1) සෑම දිසා අධිකරණයක්ම, පවුල් අධිකරණයක්ම, සුළු හිමිකම් අධිකරණයක්ම, මහෙස්ත්‍රාත් අධිකරණයක්ම සහ ප්‍රාථමික අධිකරණයක්ම ඉදිරියේ සිදුකරනු ලබන අධිකරණයට අපහාස කිරීමේ සෑම වරදක් ම සහ පිළිවෙළින් ඒ ඒ අධිකරණවල දී කරනු ලබන යම් ක්‍රියාවක දී නැතහොත් පවත්වාගෙන යනු ලබන නඩු කටයුත්තක දී කරනු ලබන්නා වූ ද

අධිකරණයට අපහාස කිරීමක් වශයෙන් දඬුවම් කළ යුතු යයි තත් කාලයෙහි වලංගුව බලපවත්නා යම් නීතියකින් ප්‍රකාශයට පත් කරනු ලැබ ඇත්තා වූ ද සියලු වැරදි ඒ අධිකරණයේ නිසි අධිකාරය සහ කාර්යක්ෂමතාව පවත්වා ගෙන යාමේ කාර්යය සඳහා සංජානනය කිරීමට සහ ඒ වැරදි සඳහා මෙහි මින්මතු විධිවිධාන සලස්වා ඇති පරිදි වූ දණ්ඩනවලින් ඒ වැරදි සම්බන්ධයෙන් දඬුවම් කිරීමට විශේෂ අධිකරණ බලය ඒ ඒ වැරදි සඳහා අධිකරණවලට තිබිය යුතු ය.

(2) අධිකරණයට අපහාස කිරීම සම්බන්ධයෙන් වරදකරු කරනු ලැබූ විට, අවස්ථාවෝචිත පරිදි, පහත දැක්වෙන දඩ පිළිබඳ හෝ බන්ධනාගාර ගත කිරීම පිළිබඳ දණ්ඩන නියමයන් පිළිවෙළින් පහත දැක්වෙන අධිකරණවලින් නියම කරනු ලැබිය හැකි ය:-

(අ) දිසා අධිකරණයක් සහ පවුල් අධිකරණයක් විසින් රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන දඩයක් හෝ අවුරුදු දෙකක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව හෝ නැතිව හෝ බන්ධනාගාරගත කිරීමක්;

(ආ) සුළු හිමිකම් අධිකරණයක් සහ මහෙස්ත්‍රාත් අධිකරණයක් විසින් රුපියල් එක් දහස් පන්සියයක් නොඉක්මවන දඩයක් හෝ මාස දහඅටක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව හෝ නැතිව හෝ බන්ධනාගාරගත කිරීමක්; සහ

(ඇ) ප්‍රාථමික අධිකරණයක් විසින් රුපියල් පන්සියයක් නොඉක්මවන දඩයක් හෝ මාස තුනක් නොඉක්මවන කාලයක් බරපතල වැඩ ඇතිව හෝ නැතිව හෝ බන්ධනාගාරගත කිරීමක්.".

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 56 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය ඒ පනතේ 57 වන වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය:-

57. මේ පනත යටතේ පිහිටුවන ලද යම් අධිකරණ කොට්ඨාසයක ප්‍රාථමික අධිකරණයකට විනිශ්චයකාරවරයකු පත්කරනු ලැබ නොමැති අවස්ථාවක, ඒ ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයා පත්කරනු ලබන තුරු, ඒ කොට්ඨාසයේ මහෙස්ත්‍රාත්වරයා ඒ කොට්ඨාසයේ ප්‍රාථමික අධිකරණයෙහි විනිශ්චයකාරවරයා ලෙස සියලු කාර්ය සඳහා ම සලකනු ලැබිය යුතු අතර, ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් ඒ කොට්ඨාසයේ ප්‍රාථමික අධිකරණයේ විනිශ්චයකාරවරයාගේ සියලු අධිකරණ බලය ක්‍රියාත්මක කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, ඒ කොට්ඨාසයේ ප්‍රාථමික අධිකරණයක විනිශ්චයකාරවරයකු පත්කරනු ලබන අවස්ථාවක දී, ඒ කොට්ඨාසයේ මහෙස්ත්‍රාත්වරයා විසින් යම් සාක්ෂි සටහන් කිරීම ආරම්භ කර තිබෙන සියලු අපරාධ නඩු, නඩු, නඩු කටයුතු, කාරණා ඒ මහෙස්ත්‍රාත්වරයා විසින් විභාග කර තීරණය කරනු ලැබිය හැකි ය.".

25. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් උපලේඛන ඇතුළත් කිරීමෙන් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"තුන්වන උපලේඛනය

[24 (2) වන වගන්තිය]

ප්‍රඥප්තීන්

(1) (61 වන අධිකාරය වූ) ළමයින් දරුකමට හදා ගැනීමේ ආඥාපනත.

(2) (110 වන අධිකාරය වූ) උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ පනත.

(3) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහය.

(4) (58 වන අධිකාරය වූ) යාපනය වෛවාහික අයිතිවාසිකම් සහ උරුම ආඥාපනත.

(5) 1970 අංක 3 දරන සජාත කිරීමේ පනත.

(6) (112 වන අධිකාරය වූ) විවාහ ලියාපදිංචි කිරීමේ ආඥාපනත.

(7) (56 වන අධිකාරය වූ) විවාහක කාන්තාවන්ගේ දේපළ පිළිබඳ ආඥාපනත.

(8) (57 වන අධිකාරය වූ) වෛවාහික අයිතිවාසිකම් සහ උරුම ආඥාපනත.

හතරවන උපලේඛනය

[32 (2) වන වගන්තිය]

ප්‍රාථමික අධිකරණවල අධිකරණ බලයෙන් බැහැර කරන ලද නඩු

(1) රජය විසින් කළ යුතු යයි හෝ සෑදිය යුතු යයි අදහස් කරනු ලබන ක්‍රියාවක් හෝ නියමයක් සම්බන්ධයෙන් වන හෝ රාජ්‍යයේ නියමයකින් යම් තැනැත්තකු විසින් කළ යුතු යයි අදහස් කරනු ලබන ක්‍රියාවක් සම්බන්ධයෙන් වන යම් නඩුවක්.

(2) අධිකරණයක නඩු තීන්දුවක් හෝ ආඥාවක් ක්‍රියාවේ යොදවමින් යම් තැනැත්තකු විසින් කළ යුතු යයි අදහස් කරනු ලබන යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් හෝ අධිකරණ නිලධරයකුගේ ධුරය ක්‍රියාවෙහි යොදවමින් කටයුතු කිරීම නිසා හෝ වන යම් නඩුවක්.

(3) යම් රාජ්‍ය නිලධරයකු විසින් ඔහුගේ නිල තත්ත්වයෙන් කරන ලදැයි කියනු ලබන යම් ක්‍රියාවක් හෝ නියමයක් සම්බන්ධයෙන් වන යම් නඩුවක්.

(4) තත් කාලයේ බලාත්මකව පවතින බෙදුම් නීතිය යටතේ නිශ්චල දේපළක් බෙදා වෙන් කර ගැනීම හෝ විකිණීම සම්බන්ධයෙන් වන යම් නඩුවක්.

(5) උකස් බලාත්මක කිරීම සඳහා හෝ දේපළ විකිණීම සඳහා හෝ නිශ්චල දේපළක උකස් ලාභියකු විසින් පවරනු ලබන යම් නඩුවක් හෝ උකස් නිදහස් කරවා ගැනීම සඳහා නිශ්චල දේපළක උකස්කරුවකු විසින් පවරනු ලබන යම් නඩුවක්.

(6) අපතේ යාම වැළැක්වීම සඳහා වූ යම් නඩුවක්.

(7) (460 වන අධිකාරය වූ) ඉඩම් අත්කර ගැනීමේ පනත යටතේ හෝ ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 1 දරන ඉඩම් ප්‍රතිසංස්කරණ පනත යටතේ වන්දියක් ගෙවා තිබෙන යම් තැනැත්තකුගෙන් ඒ වන්දිය සම්පූර්ණයෙන් ම හෝ එයින් යම් කොටසක් හෝ ආපසු අයකර ගැනීම සඳහා වන යම් නඩුවක්.

(8) ගිවිසුමක් එපරිද්දෙන් ම ඉටුකිරීම හෝ පරිච්ඡින්න කිරීම සඳහා හෝ ගිවිසුම කඩකිරීම සඳහා අලාභ ලබා ගැනීම සඳහා වන යම් නඩුවක්.

(9) ඉන්ජන්ක්ෂන් තහනමක් නිවැරදි කිරීම හෝ අවලංගු කිරීම සඳහා වන යම් නඩුවක්.

(10) ඉන්ජන්ක්ෂන් තහනමක් ලබා ගැනීම සඳහා වන යම් නඩුවක්.

(11) භාරය කඩකිරීමක් මගින් ඇති වූ පාඩුව සඳහා මිය ගිය භාරකරුවකුගේ පොදු බූදලයෙන් සුදුස්සක් කිරීම සඳහා වන නඩුවක් සහ මියගිය භාරකරුවකුගේ බූදලය සම්බන්ධයෙන් දායක මුදල සඳහා හිමිකම් පෑමක් බලාත්මක කිරීම සඳහා සම භාරකරුවකු විසින් පවරනු ලබන යම් නඩුවක් ඇතුළුව භාරයකට අදාළ යම් නඩුවක්.

(12) ඉඩමකට හිමිකම් ප්‍රකාශයක් සඳහා වන තීන්දු ප්‍රකාශයක් ඇතුළුව ප්‍රකාශනීය තීන්දු ප්‍රකාශයක් සඳහා වන නඩුවක්.

(13) සිහිවිකල්ව සිටිය දී හෝ වෙනත් අශක්නුතාවක් යටතේ පැමිණිලිකරු විසින් පවරා ඇති දේපළක් සඳහා වන යම් නඩුවක්

(14) බේරුම්කරුකු විසින් කරන ලද ප්‍රධානයක් හබ කිරීම සඳහා වන යම් නඩුවක්.

(15) (101 වන අධිකාරය වූ) සිවිල් නඩු විධාන සංග්‍රහයේ අර්ථකථනය කර ඇති පරිදි විදේශ නඩු තීන්දුවක් මත හෝ ශ්‍රී ලංකාවේ යම් අධිකරණයක දී ලබාගත් නඩු තීන්දුවක් මත වන යම් නඩුවක්.

(16) පොල්මඃකරුවකු හෝ අද්මිනිස්ත්‍රාසිකරුවකු විසින් තෙස්තමේන්තු නියාදනයක් ගෙවා ඇත්තේ හෝ වත්කම් බෙදා ඇත්තේ යම් තැනැත්තකු වෙත ද, ඒ තැනත්තා වෙතින් ආපසු ගෙවීමක් කරන ලෙස බලකිරීම සඳහා වන යම් නඩුවක්.

(17) තෙස්තමේන්තු නියාදනයක් සඳහා හෝ අන්තිම කැමති පත්‍රකරුවකු විසින් රික්තවරණය කරන ලද සම්පූර්ණ ඉතිරි මුදල හෝ එහි කොටසක් සඳහා හෝ අන්තිම කැමතිපත්‍රයක් නොතබා මියගිය තැනැත්තකුගේ සම්පූර්ණ දේපළ හෝ එහි කොටසක් සඳහා වන යම් නඩුවක්.

(18) (අ) හවුල් ව්‍යාපාරය විසුරුවාහැරීම සඳහා හෝ හවුල් ව්‍යාපාරය විසුරුවාහැරීමෙන් පසුව ඒ ව්‍යාපාරය ගණන් බේරා වසා දැමීම සඳහා;

(ආ) හවුල් ව්‍යාපාරයක ගණුදෙනුවල ගිණුම පෙන්වීම සඳහා; හෝ

(ඇ) හවුල් ව්‍යාපාරයක ගිණුම තුලනය කිරීම සඳහා,

වන යම් නඩුවක්.

(19) යම් අධිකරණයක තීන්දු ප්‍රකාශයක් හෝ ආඥාවක් යටතේ අද්මිනිස්ත්‍රාසි කරනු ලබන දේපළ පිළිබඳ ගිණුම් පෙන්වීම සඳහා වන යම් නඩුවක්.

(20) උකස්ලාභියා වෙත ලැබුණු අතිරික්ත එකතුවක් ආපසු අයකර ගැනීම සඳහා උකස නිදහස් කිරීමෙන් පසුව උකස්කරුවකු විසින් පවරනු ලබන නඩුවක් ඇතුළුව ගිණුම් පෙන්වීම සඳහා වන වෙනත් යම් නඩුවක් සහ විත්තිකරු විසින් අයුතු ලෙස ලබාගෙන තිබෙන පැමිණිලිකරුට අයත් නිශ්චල දේපළ සම්බන්ධයෙන් වන ලාභ ලබාගැනීම සඳහා පවරනු ලබන නඩුවක්.

(21) පොදු සමානුපාතික අලාභ හෝ මුක්තාවශේෂ ගාස්තු සඳහා වූ යම් නඩුවක්.

(22) නෞකා ඝට්ටනයවීමක් සම්බන්ධයෙන් වන්දි ලබා ගැනීම සඳහා වන යම් නඩුවක්.

(23) යම් රක්ෂණ ඔප්පුවක් පිළිබඳව වූ හෝ එවැනි යම් රක්ෂණ ඔප්පුවක් යටතේ ගෙවන ලද යම් රක්ෂණ වාරිකයක් ආපසු අයකරගැනීම සඳහා පවරනු ලබන යම් නඩුවක්.

(24) (අ) නඩු පැවරිය හැකි වරදක් මගින් සිදු වූ යම් තැනැත්තකුගේ මරණය සිදුවීම නිසා හටගත් පාඩුවක් සඳහා;

(ආ) අයුතු ලෙස සිරභාරයට ගැනීම සම්බන්ධයෙන්;

(ඇ) ද්වේශ සහගතව අපරාධ නඩු පැවරීම සම්බන්ධයෙන්;

(ඈ) අයුතු අවහිරය හෝ රඳවා තබා ගැනීම සම්බන්ධයෙන්;

(ඉ) අපහාසය කිරීම සම්බන්ධයෙන්;

(ඊ) අනාචාරය හෝ දූෂණය සම්බන්ධයෙන්;

(උ) විවාහ ගිවිස ගැනීමේ ගිවිසුමක් හෝ විවාහ පොරොන්දුවක් කඩකිරීම සම්බන්ධයෙන්;

(ඌ) පැමිණිලිකරු සමඟ ඇති කරගත් ගිවිසුමක් කඩකිරීම සඳහා තැනැත්තකු පෙළඹවීම සම්බන්ධයෙන්;

(එ) දේපළක් මත යම් පරවශ්‍යතාවයක් භුක්ති විඳීම හෝ යම් අයිතිවාසිකමක් ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් බාධා කිරීම හෝ මැදිහත්වීම සඳහා,

වන්දි හෝ අලාභ ලබා ගැනීම සඳහා පවරනු ලබන යම් නඩුවක්.

(25) මහර් ආපසු අයකර ගැනීම සඳහා මුස්ලිම්වරයකු විසින් පවරනු ලබන යම් නඩුවක්.

(26) බාලවයස්කරුවකුගේ භාරකාරත්වය ලබා ගැනීම සඳහා පවරනු ලබන යම් නඩුවක්.

(27) දික්කසාදවීම සඳහා හෝ නීතියෙන් වෙන්වීම සඳහා පවරනු ලබන යම් නඩුවක්.

(28) නඩත්තුවලට, දරු බව නියම කිරීම හෝ දරුකමට හඳාගැනීම සම්බන්ධයෙන් වන යම් නඩුවක්.

(29) හවුල් දේපළක කොටස්කරුවකු විසින් හවුල් කොටස්කරුවකුගෙන් අයවිය යුතු මුදල් වෙනුවෙන් ඔහු විසින් කරන ලද ගෙවීමක් සම්බන්ධයෙන් වන දායක මුදල් ආපසු අයකරගැනීම සඳහා ඒ කොටස්කරු විසින් පවරනු ලබන යම් නඩුවක්.

(30) උකස් කරන ලද දේපළ නිදහස්කර ගැනීම සඳහා නිශ්චල දේපළ හවුල් උකස්කරුවන් කිහිපදෙනෙකුගෙන් එක් අයෙකු විසින් ගෙවන ලද මුදල් සම්බන්ධයෙන් වන දායක මුදල සඳහා ඒ නිශ්චල දේපළ බද්ද උකස්කරුවන් කිහිපදෙනාගෙන් එක් අයෙකු විසින් පවරනු ලබන යම් නඩුවක්.

(31) යම් බද්දක් හෝ අනුප්‍රමාණයක් හෝ වෙනත් අයබද්දක් සම්බන්ධයෙන් කරන ලද හිමිකම්පෑමක් සපුරාලීම සඳහා විරුද්ධත්වය යටතේ ගෙවන ලද මුදල් ආපසු අයකර ගැනීම සඳහා රජයට හෝ පළාත් පාලන ආයතනයකට එරෙහිව පවරනු ලබන යම් නඩුවක්.

(32) කලින් කල සංශෝධිත පරිදි 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ පවරනු ලබන යම් නඩුවක්.

(33) 2003 අංක 36 දරන බුද්ධිමය දේපළ පනත යටතේ වෙළඳ ලකුණු, පේටන්ට් බලපත්‍ර හෝ ප්‍රකාශන අයිතිය සම්බන්ධයෙන් පවරනු ලබන යම් නඩුවක්.

(34) පීඩාව මත පදනම් වූ යම් නඩුවක්.

(35) 1972 අංක 7 දරන ගෙවල් කුලී පනත යටතේ ගෙවල් කුලී සහ නෙරපීම සහ කාර්ය පටිපාටිය සඳහා වන යම් නඩුවක්.

(36) (මේ පනත හැර) තත් කාලයේ බලපවත්නා යම් ලිඛිත නීතියක් මගින් ප්‍රාථමික අධිකරණවල අධිකරණ බලයෙන් ප්‍රකාශිතව හෝ ව්‍යංගව බැහැර කරන ලද යම් නඩුවක්.".

26. ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපලේඛනය එකතු කිරීම මගින් ප්‍රධාන ප්‍රඥප්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"හත්වන උපලේඛනය

[29ඒ (2) වන වගන්තිය]

නඩු

1. මුදල් ආපසු අයකර ගැනීම සඳහා පවරනු ලබන යම් නඩුවක් (අනතුරක දී සිදු වූ අලාභ අයකර ගැනීම සඳහා හෝ පෞද්ගලික හානි හෝ වෙනත් යම් සමාන වර්ගයක නඩුවක් ඇතුළුව ණයක් හෝ ගාස්තුවක් හෝ ගෙවීමක් හෝ අලාභයක් හෝ හිමිකම්පෑමක් ලෙස);

2. චංචල දේපළ නැවත අත්කර ගැනීම සඳහා පවරනු ලබන යම් නඩුවක්;

3. 1 වන සහ 2 වන අයිතමයේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් නඩු නිමිත්තක් සම්බන්ධයෙන් ප්‍රතිහිමිකම්පෑමක් සඳහා පවරනු ලබන යම් නඩුවක්;

4. වෙනත් යම් නීතියක් මගින් එයට පවරනු ලබන වෙනත් යම් අධිකරණ බලයක්.".

27. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත

[සභතිකය සටහන් කළේ 2022 දෙසැම්බර් මස 14 වන දින]

2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. මේ පනත 2022 අංක 44 දරන එකතු කළ අගය මත බදු (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2002 අංක 14 දරන එකතු කළ අගය මත බදු පනතේ 2 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (v) වන අයිතමයේ "අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/23 ක් වේ)." යන වචන සහ ඉලක්කම් වෙනුවට "අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/23 ක් වේ);" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (vi) වන අයිතමයේ "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන

දින හෝ එදිනට පසු ආරම්භ වන, එහෙත් 2022 මැයි මස 31 වන දින හෝ එදිනට පෙර අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(3) එම වගන්තියේ (1) වන උපවගන්තියේ (v) වන අනුඡේදයේ (v) වන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(vii) 2022 ජුනි මස 1 වන දිනයෙන් ආරම්භව 2022 ජුනි මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සහ 2022 ජූලි මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භව එහෙත් 2022 අගෝස්තු මස 31 වන දිනෙන් අවසන් වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සියයට දොළහක අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/28 ක් වේ); සහ

(viii) 2022 සැප්තැම්බර් මස 1 වන දිනයෙන් ආරම්භව 2022 සැප්තැම්බර් මස 30 වන දිනයෙන් අවසන් වන කාලසීමාව සඳහා සහ 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු ආරම්භ වන යම් බදු අය කළ හැකි කාලසීමාවක් සඳහා සියයට පහළොවක අනුප්‍රමාණය මත (එහි බදු බණ්ඩය 3/23 ක් වේ).".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ, (1) වන උපවගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) (vi) වන ඡේදයේ ''2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු'' යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසු, එහෙත් 2022 සැප්තැම්බර් මස 30 වන දින හෝ එදිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) (vi) වන ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස ඇතුළත් කිරීමෙන්:-

"(vii) 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසු ශ්‍රී ලංකාව තුළ යම් බදු අය කළ හැකි ක්‍රියාකාරකමක් කරන හෝ කරගෙන යනු ලබන සෑම තැනැත්තකු ම-

(අ) අවස්ථාවෝචිත පරිදි, යම් බදු අය කළ හැකි මාස එකක හෝ මාස තුනක කාලසීමාව අවසානයේ දී, එම තැනැත්තාගේ එකී බදු අය කළ හැකි කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන විස්සක් හෝ ඊට වැඩි නම්; හෝ

(ආ) එවකට අවසන් වන මාස දොළහක කාලසීමාව තුළ දී, ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන අසූවක් ඉක්මවා ඇත්නම්; හෝ

(ඇ) යම් අවස්ථාවක දී, අවස්ථාවෝචිත පරිදි, ඉදිරියේදී එළඹෙන බදු අය කළ හැකි මාස එකක හෝ මාස තුනක කාලසීමාව තුළ දී ශ්‍රී ලංකාව තුළ එම තැනැත්තාගේ භාණ්ඩ හෝ සේවා හෝ භාණ්ඩ සහ සේවාවල බදු අය කළ හැකි සැපයුම්වල සමස්ත වටිනාකම රුපියල් මිලියන විස්සක් ඉක්මවීමට ඉඩ ඇති බවට, හෝ ඉදිරියේ දී එළඹෙන මාස දොළහක කාලසීමාව තුළ දී රුපියල් මිලියන අසූවක් ඉක්මවීමට ඉඩ ඇති බවට හෝ විශ්වාස කිරීමට සාධාරණ හේතු ඇත්නම්,

එම තැනැත්තා මේ පනත යටතේ ලියාපදිංචි කරනු ලැබීමට යටත් විය යුතු ය.".

(3) (1) වන උපවගන්තියේ දෙවන අතුරු විධානයේ, "2016 මැයි මස 2 වන දින සිට බලපැවැත්වෙන පරිදි පැන නැගිය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"2016 මැයි මස 2 වන දින සිට බලපැවැත්වෙන පරිදි පැන නැගිය යුතු ය:
එසේම තවදුරටත්, (vii) වන ඡේදයේ කාර්ය සඳහා, ලියාපදිංචි කිරීමේ අවශ්‍යතාවය මේ (සංශෝධන) පනත ක්‍රියාත්මක වන දින සිට බලපැවැත්වෙන පරිදි පැන නැගිය යුතු ය.''.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනයේ II වන කොටස පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) එම කොටසේ (ආ) ඡේදයේ (xi) වන අයිතමයේ (ඈ) අනු අයිතමයේ එම "සැපයුම් 2019 දෙසැම්බර් මස 1 වන දින හෝ එදිනට පසුව සිදු වී ඇත්නම්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එම සැපයුම් 2019 දෙසැම්බර් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2022 දෙසැම්බර් මස 31 වන දින හෝ එදිනට පෙර සිදු වී ඇත්නම්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) (ආ) ඡේදයේ (xi) වන අයිතමයේ (ඈ) අනු අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන කොටස එකතු කිරීමෙන්:-

"(ඉ) එම සැපයුම 2023 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව සිදුවී ඇත්නම්, යම් තැනැත්තකු විසින් කරනු ලබන පදිංචිය සඳහා වන නිවාස බදු දීමක් හෝ කුලියට දීමක් හෝ යම් පදිංචිය සඳහා වන සභාධිපත්‍ය දේපළ සැපයුමක් නොවන සැපයුම්.".

5. මේ පනතේ සිංහල හා දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2022 දෙසැම්බර් මස 19 වන දින]

2017 අංක 24 දරන දේශීය ආදායම් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:-

1. (1) මේ පනත 2022 අංක 45 දරන දේශීය ආදායම් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) (*'අ' වගුවේ, 'ආ' වගුවේ සහ 'ඇ' වගුවේ* සඳහන් වගන්තිවල විධිවිධාන හැර) මේ පනතේ විධිවිධාන, කථානායකවරයාගේ සහතිකය ඔහුගේ අත්සන ඇතිව මේ පනතෙහි සටහන් කරනු ලැබූ දින සිට ක්‍රියාත්මක විය යුතු ය.

(3) *'අ' වගුවේ* සඳහන් වගන්තිවල විධිවිධාන, 2022 අප්‍රේල් මස 1 වන දින සිට ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

(4) *'ආ' වගුවේ* සඳහන් වගන්තිවල විධිවිධාන, 2022 ඔක්තෝබර් මස 1 වන දින සිට ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

(5) *'ඇ' වගුවේ* සඳහන් වගන්තිවල විධිවිධාන, ඒ වගුවේ නිශ්චිතව දක්වා ඇති අදාළ දිනවල දී ක්‍රියාත්මක කරනු ලැබ ඇති ලෙසට සලකනු ලැබිය යුතු ය.

2. (මෙහි මින්මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ඇ) ඡේදයේ "ගෙවනු ලබන වියදම්" යන වචන වෙනුවට "කරනු ලබන ගෙවීම්" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "විශ්‍රාම යාමේ දී ලැබෙන මුදල්" යන වචන වෙනුවට "ලැබුණු විශ්‍රාම ගෙවීම්" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපවගන්තියේ (එ) ඡේදයේ ලද ත්‍යාග ඇතුළු වෙනත් ගෙවීම්;" යන වචන වෙනුවට ලැබුණු ත්‍යාග ඇතුළු වෙනත් ගෙවීම්; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ඉ) ඡේදයේ "අවස්ථාවේ වටිනාකම; සහ" යන වචන වෙනුවට "අවස්ථාවේ වටිනාකම;" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයේ "සේවායෝජකයා විසින් ගෙවනු ලබන දායක මුදල්" යන වචන වෙනුවට "සේවායෝජකයා විසින් ගෙවනු ලබන දායක මුදල්; සහ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපවගන්තියේ (ඊ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(උ) ආදායම් බදු ගෙවීමේ කාර්ය සඳහා අදාළ විශ්‍රාම දායක මුදල් දැනටමත් සලකා බලා ඇති බවට සහ පසුගිය තක්සේරු වර්ෂයක දී එම දායක මුදල් මත සේවා නියුක්තිකයා විසින් බදු ගෙවා ඇති බවට වූ කොන්දේසියට යටත්ව, සේවා නියුක්තියෙන් විශ්‍රාම යන අවස්ථාවේ දී ලැබෙන යම් විශ්‍රාම ගෙවීමක්".

3. ප්‍රධාන ප්‍රඥප්තියේ 10 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (iv) වන අනුඡේදයේ "තැනැත්තාගේ වියදම්;" යන වචන වෙනුවට "තැනැත්තාගේ වියදම් හෝ වෙනත් යම් අඩු කිරීම්;" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ ඡේදයේ (x) වන අනුඡේදයේ "බදු හෝ වෙනත් අයකිරීම්." යන වචන වෙනුවට "බදු හෝ වෙනත් අයකිරීම් සහ වෙනත් යම් ලිඛිත නීතියක් ප්‍රකාරව යම් තැනැත්තකුගේ ආදායම ගණනය කිරීමේ දී අඩුකිරීමට ඉඩ ලබා දී නොමැති යම් බදු හෝ අයකිරීම්;" යන වචන ආදේශ කිරීමෙන්.

4. ප්‍රධාන ප්‍රඥප්තියේ 12 වන වගන්තියේ (අ) ඡේදයේ "එම ණය බැඳීම මුදල් ණයට ගැනීමේ දී දරනු ලැබූ අවස්ථාවක, එම මුදල් එම වර්ෂය තුළ භාවිත කරන ලද තාක් දුරට හෝ එම වර්ෂය තුළ ආදායම උත්පාදනය කිරීමේ දී වත්කමක් අත්කර ගැනීමට එම මුදල්" යන වචන වෙනුවට "එම ණය බැඳීම යටතේ ණයට ගත් මුදල් එම වර්ෂය තුළ දී ආදායම උත්පාදනය කිරීමේ දී භාවිත කරන ලද වත්කමක් අත්කර ගැනීමට" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

5. ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (4) වන උපවගන්තිය, ඒ වගන්තියේ (5) වන උපවගන්තිය ලෙස නැවත අංක යෙදීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(4) ක්ෂය විය හැකි වත්කමක් සම්බන්ධයෙන් (2) වන උපවගන්තියේ සඳහන් ලිඛිත වටිනාකම ශූන්‍ය වන අවස්ථාවක දී, (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, (1) වන උපවගන්තියේ සඳහන් වැඩිදියුණු කිරීම් සඳහා වූ අඩුකිරීම-

(අ) වියදම් දරනු ලැබූ තක්සේරු වර්ෂයේ සිට ආරම්භ වන, 4 වන පන්තියේ ක්ෂය විය හැකි වත්කමක් වෙනුවෙන් තක්සේරු වර්ෂ දොළහක් සඳහා;

(ආ) වියදම් දරනු ලැබූ තක්සේරු වර්ෂයේ සිට ආරම්භ වන, වෙනත් පංතිවල ක්ෂය විය හැකි වත්කම් වෙනුවෙන් තක්සේරු වර්ෂ තුනක් සඳහා,

සමාන ප්‍රමාණවලින් බෙදා අඩු කරනු ලැබිය යුතු ය.".

6. ප්‍රධාන ප්‍රඥප්තියේ 16 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "(2) වන උපවගන්තියේ සඳහන්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(3) වන සහ (3අ) වන උපවගන්තිවලට යටත්ව, (2) වන උපවගන්තියේ සඳහන්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්: සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(3අ) ක්ෂය විය හැකි වත්කමක් සම්බන්ධයෙන් මේ පනතේ හතරවන උපලේඛනය යටතේ ප්‍රදානය කරනු ලබන සහ ගණනය කරනු ලබන ප්‍රාග්ධන දීමනාවල එකතුව කවර හෝ අවස්ථානුගත කරුණක් යටතේ එම ක්ෂය විය හැකි වත්කම්වල පිරිවැය නො ඉක්මවිය යුතු ය.".

7. ප්‍රධාන ප්‍රඥප්තියේ 18 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තිය සහ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(1) (අ) 2021 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, ව්‍යාපාරයක් කරගෙන යාමේ දී හෝ ආයෝජනයක් කිරීමේ දී (මූල්‍ය ආයතනයක් නොවන) යම් අස්ථිත්වයක් ලබන ආදායම ගණනය කිරීමේ දී අඩුකරනු ලබන මූල්‍ය පිරිවැය ප්‍රමාණය, (2) වන උපවගන්තියේ (අ) ඡේදයේ සඳහන් සීමාව ඇතුළත යම් මූල්‍ය සාධනපත්‍ර සඳහා ආරෝපණය කළ හැකි මූල්‍ය පිරිවැය ප්‍රමාණය නො ඉක්මවිය යුතු ය;

(ආ) 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ව්‍යාපාරයක් කරගෙන යාමේ දී හෝ ආයෝජනයක් කිරීමේ දී ශ්‍රී ලංකාව තුළ හෝ ශ්‍රී ලංකාවෙන් පිටත සංස්ථාගත කරන ලද සහ තක්සේරු වර්ෂය අවසන් වන දිනයේ දී නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයක් සහිත (මූල්‍ය ආයතනයක් නොවන) සමාගමක් ලබන ආදායම ගණනය කිරීමේ දී අඩුකරන ලද මූල්‍ය පිරිවැය ප්‍රමාණය, (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ සඳහන් සීමාව නො ඉක්මවිය යුතු ය.

(2) එම සීමාව පහත දැක්වෙන සූත්‍රයට අනුව ගණනය කරනු ලැබිය යුතු ය:-

(අ) A x B

මෙම සූත්‍රයෙහි-

'A' යනු, අස්ථිත්වයේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයේ සහ සංචිතවල මුළු එකතුව වේ; සහ

'B' යනු-

(i) නිෂ්පාදන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, අංක 3 වේත සහ

(ii) නිෂ්පාදන අස්ථිත්වයක් නොවන අස්ථිත්වයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, අංක 4 වේ;

(ආ)

මෙම සූත්‍රයෙහි-

'A' = වර්ෂයේ මූල්‍ය පිරිවැය;

'B' = වර්ෂය තුළ දී දරන ලද මූල්‍ය පිරිවැය මත වූ මූල්‍ය සාධනපත්‍රවල වටිනාකම; සහ

'C' = 4 x වර්ෂය අවසානයේ දී සමාගමේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයේ සහ සංචිතවල මුළු එකතුව,

වේ; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "භාවිත නොකළ සීමාවේ ප්‍රමාණයට පමණි." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"භාවිත නොකළ සීමාවේ ප්‍රමාණයට පමණි:

එසේ වුව ද, වර්ෂය තුළ දී දරන ලද මූල්‍ය පිරිවැයක් නොමැති අවස්ථාවක ඉහත කී කාර්යය සඳහා භාවිත නොකළ සීමාව ගණනය කිරීමේ දී, ඊට පෙරාතුව ම වූ වර්ෂයේ මුදල් ප්‍රමාණයන් යනා දී ලෙස භාවිත කරමින්, (2) වන උපවගන්තියේ සඳහන් සීමාව ගණනය කරනු ලැබිය යුතු ය.".

8. ප්‍රධාන ප්‍රඥප්තියේ 19 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපවගන්තියේ (3) වන උපවගන්තියේ, "නිදහස් කරන ලද මුදල් ප්‍රමාණ ගණනය කිරීමේ දී පමණක් අඩු කරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"නිදහස් කරන ලද මුදල් ප්‍රමාණ ගණනය කිරීමේ දී පමණක් අඩුකරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, යම් තැනැත්තකුට ව්‍යාපාරයක් සම්බන්ධයෙන් පාඩුවක් සිදු වී ඇති අවස්ථාවක, එය ලාභයක් වී නම් මේ පනත යටතේ නිශ්චිතව දක්වා ඇති අනුප්‍රමාණයක් අනුව බදු අය කළ හැකි නම් සහ ඒ අනුප්‍රමාණය පසුව වැඩි කරනු ලැබී නම්, ඒ පාඩුව අඩු අනුප්‍රමාණයක් මත බදු අයකළ හැකි පාඩුවක් ලෙස සලකනු නොලැබිය යුතු ය.";

(2) ඒ වගන්තියේ (4) වන උපවගන්තියේ-

(අ) ඒ වගන්තියේ (ආ) ඡේදයේ "පමණක් අඩුකරනු ලැබිය යුතු ය." යන වචන වෙනුවට "පමණක් අඩුකරනු ලැබිය යුතු ය; සහ" යන වචන ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්-

"(ඇ) ආයෝජනයකින් සිදුවන හිලව් නොකළ පාඩු, ඒ පාඩු සිදු වූ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂයේ පළමුවන දින සිට ආරම්භ වන තක්සේරු වර්ෂ හය ඇතුළත පමණක් අඩු කරනු ලැබිය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ (5) වන උපවගන්තියේ "ලැබීමකින් වෙනත් ආයෝජන වත්කමක් බැහැර කිරීමේ දී සිදුවන යම් පාඩුවක් අඩු කරනු නොලැබිය යුතු ය." යන වචන වෙනුවට "ලැබීමකින් යම් පාඩුවක් අඩුකරනු නොලැබිය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්.

9. ප්‍රධාන ප්‍රඥප්තියේ 46 වන වගන්තිය, එම වගන්තියේ (5) වන උපවගන්තියේ (ඇ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන ඡේදය ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ඇ) පැවරීම සිදුකරන අවස්ථාවේ දී-

(i) 2021 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව-

(iඅ) තැනැත්තා සහ ආශ්‍රිතයා වාසිකයන් වීම; සහ

(iආ) ආශ්‍රිතයා හෝ ආශ්‍රිත හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී එහි කිසිදු හවුල්කරුවකු හෝ ආදායම් බදු ගෙවීමෙන් නිදහස් නොවීම; සහ

(ii) 2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව-

(iiඅ) තැනැත්තා සහ ආශ්‍රිතයන් වාසිකයන් වීම;

(iiආ) ආශ්‍රිත හවුල් ව්‍යාපාරයක් සම්බන්ධයෙන් වන අවස්ථාවක දී, එහි කිසිදු හවුල්කරුවකු හෝ ආශ්‍රිතයා ආදායම් බදු ගෙවීමෙන් නිදහස් නොවීම; සහ

(iiඇ) (4) වන උපවගන්තියේ සඳහන් වත්කමක් උපලබ්ධි කිරීමෙන් තැනැත්තකුට ලැබෙන ලැබීම් මත අදාළ වන බදු අනුප්‍රමාණය එම වත්කම උපලබ්ධි කිරීමෙන් ආශ්‍රිතයාට ලැබෙන ලැබීම් මත අදාළ වන බදු අනුප්‍රමාණයට සමාන වීම හෝ අඩුවීම; සහ".

10. ප්‍රධාන ප්‍රඥප්තියේ 54 වන වගන්තියේ (1) වන උපවගන්තියේ "එම තක්සේරු වර්ෂය සඳහා එහි ව්‍යාපාර කටයුතු හෝ ආයෝජන මගින් ලැබෙන හවුල් ව්‍යාපාරයේ ආදායම විය යුතු ය (6 වන සහ 7 වන වගන්ති)." යන වචන සහ ඉලක්කම් වෙනුවට "එම තක්සේරු වර්ෂය සඳහා එහි ව්‍යාපාර කටයුතු ආයෝජන හෝ වෙනත් ආදායම් මගින් ලැබෙන හවුල් ව්‍යාපාරයේ ආදායම විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

11. ප්‍රධාන ප්‍රඥප්තියේ 66 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ 1988 අංක 30 දරන බැංකු පනතේ 76ඒ වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ "1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ බොල් ණය සහ අඩමාන ණය සම්බන්ධයෙන් ඒ ඒ තක්සේරු වර්ෂයට අදාළ වන විශේෂ විධිවිධාන සැලසීමට නිකුත් කරන ලද'' යන වචන සහ ඉලක්කම් වෙනුවට "1988 අංක 30 දරන බැංකු පනතේ 46 වන වගන්තියේ (1) වන උපවගන්තිය, 46ඒ වන වගන්තිය සහ 76ඒ වන වගන්තියේ (1) වන උපවගන්තිය මගින්, හෝ 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනතේ 12 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ හෝ 1988 අංක 78 දරන මුදල් සමාගම් පනතේ 9 වන වගන්තියේ (1) වන උපවගන්තිය යටතේ පැවරී ඇති බලතල යටතේ ණය පහසුකම් වර්ගීකරණය කිරීම, හඳුනාගැනීම සහ තක්සේරු කිරීම සම්බන්ධයෙන් නිකුත් කරන ලද'' යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

12. ප්‍රධාන ප්‍රඥප්තියේ 69 වන වගන්තියේ (4) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "එය ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කර ඇත්නම් හෝ එහි" යන වචන වෙනුවට "එහි ලියාපදිංචි හෝ" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

13. ප්‍රධාන ප්‍රඥප්තියේ 72 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදයේ "(3) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(2) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

14. ප්‍රධාන ප්‍රඥප්තියේ 73 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ඇ) ඡේදය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ ඡේදයේ (i) වන අනුඡේදයේ "ගෙවා ඇත්නම්; හෝ" යන වචන වෙනුවට "ගෙවා ඇත්නම්;" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ ඡේදයේ (ii) වන අනුඡේදයේ "ගෙවා ඇත්නම්;" යන වචන වෙනුවට "ගෙවා ඇත්නම්; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ ඡේදයේ (iii) වන අනුඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අනුඡේදය එකතු කිරීමෙන්:-

"(iii) ශ්‍රී ලංකාවේ ආණ්ඩුව වෙනුවෙන් යම් ආයතනයක් විසින් කරන ලද ගෙවීම් ඇතුළුව ශ්‍රී ලංකාවේ ආණ්ඩුව විසින් ගෙවා ඇත්නම්.".

15. ප්‍රධාන ප්‍රඥප්තියේ 83අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "2020 අප්‍රේල් මස 1 වන දින සිට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 අප්‍රේල් මස 1 වන දින සිට එහෙත් 2023 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්;-

"(1අ) කොමසාරිස් ජනරාල්වරයා විසින් නිශ්චිතව දක්වනු ලබන පරිදි, යම් සේවායෝජකයකු විසින් ස්වකීය සේවානියුක්තයා වෙත කරන ලද 5 වන වගන්තිය යටතට ගැනෙන යම් ගෙවීමක් මත 2023 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි එම සේවායෝජකයකු විසින් අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩුකරනු ලැබිය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ (2) වන උපවගන්තියේ "(1) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන උපවගන්තිය හෝ (1අ) වන උපවගන්තිය යටතේ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

16. ප්‍රධාන ප්‍රඥප්තියේ 84අ වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "2020 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 අප්‍රේල් මස 1 වන දින සිට එහෙත් 2023 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව බලාත්මක වන පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) 83අ වන වගන්තියට සහ 84 වන වගන්තියේ (3) වන උපවගන්තියට යටත්ව, 2023 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, මේ පනතේ පළමුවන උපලේඛනයේ 10 වන ඡේදයේ විධිවිධාන සලස්වා ඇති අනුප්‍රමාණය යටතේ, ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත යම් ලාභාංශයක්, පොලියක්, වට්ටමක්, ගාස්තුවක්, ස්වභාවික සම්පත් ගෙවීමක්, කුලියක්, රාජ්‍ය භාගයක් හෝ වාරික මුදලක් ගෙවීමකින් යම් තැනැත්තකු විසින් අත්තිකාරම් ආදායම් බද්ද අඩු කරනු ලැබිය යුතු ය.".

17. ප්‍රධාන ප්‍රඥප්තියේ 85 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තියේ "යම් තැනැත්තකු විසින්" යන වචන වෙනුවට "යම් තැනැත්තකු විසින් 2023 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ (1අ) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති ආදේශ කිරීමෙන්:-

"(1අ) (2) වන සහ (3) වන උපවගන්තිවලට යටත්ව, 2023 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, යම් තැනැත්තකු විසින් නිර්වාසික තැනැත්තකුට ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත යම් සේවා ගාස්තුවක් හෝ රක්ෂණ වාරික මුදලක් ගෙවනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් එම ගෙවීම් මුදලින් 14%ක අනුප්‍රමාණයක් මත බද්ද රඳවා ගනු ලැබිය යුතු ය.

(1ඇ) (3) වන උපවගන්තියට යටත්ව, 2023 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, ගෙවීම් කරන තැනැත්තාගේ සේවානියුක්තයකු නොවන වාසික පුද්ගලයකුට-

(අ) ඉගැන්වීම, දේශන පැවැත්වීම, විභාග පැවැත්වීම, හෝ විභාගයක් සමීක්ෂණය හෝ අධීක්ෂණය කිරීම වෙනුවෙන්;

(ආ) වාසික රක්ෂණ, අලෙවි හෝ ප්‍රචාරක නියෝජිතයකුට යම් කොමිස් මුදලක් හෝ තෑගි ගාස්තුවක් වශයෙන්ත හෝ

(ඇ) වෛද්‍යවරයකු, ඉංජිනේරුවරයකු, ගණකාධිකාරීවරයකු, නීතීඥවරයකු, මෘදුකාංග සංවර්ධකයකු, පර්යේෂකයකු, ශාස්ත්‍රඥයකු හෝ නියෝග මගින් නියම කරනු ලැබිය හැකි යම් ස්වාධීන සේවා සපයන පුද්ගලයකු වැනි ස්වාධීන සේවා සපයන්නකුගේ තත්ත්වයෙන් ඒ පුද්ගලයා විසින් සපයනු ලබන සේවා වෙනුවෙන්,

ශ්‍රී ලංකාවේ මූලාශ්‍රයක් සහිත යම් සේවා ගාස්තුවක් ගෙවනු ලබන අවස්ථාවක දී, එම තැනැත්තා විසින් එම ගෙවීම් මුදලින් 5%ක අනුප්‍රමාණයක් මත බද්ද රඳවාගනු ලැබිය යුතු ය:

එසේ වුව ද, මාසයකට රු. 100,000ක් නො ඉක්මවන සේවා ගෙවීමක් සඳහා මේ උපවගන්තිය අදාළ නොවිය යුතු ය."; සහ

(3) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ (අ) ඡේදයේ "83 වන වගන්තිය;" යන වචන සහ ඉලක්කම් වෙනුවට "83 වන වගන්තිය, 83අ වන වගන්තිය හෝ 84අ වන වගන්තිය;" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

18. ප්‍රධාන ප්‍රඥප්තියේ 87 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "83 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් වෙනුවට "83 වන වගන්තිය හෝ 83අ වන වගන්තිය" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

19. ප්‍රධාන ප්‍රඥප්තියේ 88 වන වගන්තියේ (1අ) වන උපවගන්තියේ (අ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(අඅ) 2023 ජනවාරි මස 1 වන දිනෙන් ආරම්භ වන දිනයේ දී හෝ ඉන් පසුව, වාසික සමාගමක් විසින් ගෙවන ලද ලාභාංශ;".

20. ප්‍රධාන ප්‍රඥප්තියේ 90 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "83 වන වගන්තිය" යන වචන සහ ඉලක්කම්වල සිට ඒ වගන්තියේ අවසානය තෙක් ඇති සියලු වචන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(ආ) 83 වන වගන්තිය හෝ 83ඇ වන වගන්තිය යටතේ සේවායෝජකයා විසින් බදු රඳවා ගැනීම අවශ්‍ය නොවන සේවා නියුක්තියකින්,

තක්සේරු කළ හැකි ආදායමක් උපයනු ලබයි නම් හෝ ඉපයීමට අපේක්ෂා කරයි නම් එම තැනැත්තා විසින් ත්‍රෛමාසික වාරික මගින් බද්ද ගෙවනු ලැබිය යුතු ය:

එසේ වුව ද, තක්සේරු වර්ෂයක් තුළ දී ආයෝජන වත්කමක් උපලබ්ධි කිරීමෙන් උපචිත වන හෝ උපචිත වනු ඇතැයි අපේක්ෂිත ලැබීම්, ත්‍රෛමාසික වාරිකවල කාර්යය සඳහා සලකා බලනු නොලැබිය යුතු ය.".

21. ප්‍රධාන ප්‍රඥප්තියේ 94 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ-

(අ) ඒ උපවගන්තියේ (ආ) ඡේදයේ "නිර්වාසික තැනැත්තකු," යන වචන වෙනුවට "නිර්වාසික තැනැත්තකු; හෝ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ආ) ඒ වගන්තියේ (ආ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය එකතු කිරීමෙන්:-

"(ඇ) සේවායෝජකයා විසින් 83ඇ වන වගන්තිය යටතේ අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩුකර ඇති අවස්ථාවක දී සහ 82 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) හෝ (ඇ) ඡේදය යටතේ කිසිදු බදු මුදලක් ගෙවනු නොලැබිය යුතු අවස්ථාවක දී, (2) වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ තක්සේරු වර්ෂය සඳහා ගෙවිය යුතු බදු මුදල සේවා නියුක්තියෙන් ලැබෙන ආදායමට පමණක් අදාළ වන යම් පුද්ගලයකු,"; සහ

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියේ "යම් සේවා නියුක්තියක් නතර කරන ලද අවස්ථාවක දී" යන වචන වෙනුවට "යම් සේවා නියුක්තියක් නතර කරන ලද අවස්ථාවක දී හෝ 83ඇ වගන්තිය යටතේ එම තැනැත්තාගේ සේවායෝජකයා විසින් ඔහුගේ සේවා නියුක්ති ආදායම මත අත්තිකාරම් පුද්ගල ආදායම් බද්ද අඩු කරනු ලැබ ඇති අවස්ථාවක දී" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

22. ප්‍රධාන ප්‍රඥප්තියේ 120 වන වගන්තියේ (1ඇ) වන උපවගන්තියේ, "මූල්‍ය ප්‍රකාශන සකස් කර පවත්වාගෙන යා යුතු ය." යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"මූල්‍ය ප්‍රකාශන සකස් කර පවත්වාගෙන යා යුතු ය;

එසේ වුව ද, එම තැනැත්තා විසින් සියලුම ව්‍යාපාර හෝ ආයෝජන කටයුතු සම්බන්ධයෙන් පොදුවේ වියදම් දරා ඇති අවස්ථාවක දී හෝ පොදුවේ යම් වත්කම් භාවිත කර ඇති අවස්ථාවක දී සහ මෙම උපවගන්තියේ කාර්යය සඳහා යම් වියදමක් හෝ අඩුකිරීම් වෙන්ව හඳුනා ගනු ලැබිය නොහැකි අවස්ථාවක දී, ඒ මූල්‍ය ප්‍රකාශ පිළියෙල කිරීමේ දී (පිරිවැටුමේ අනුපාතයට අනුව හෝ වත්කම් භාවිත කිරීමේ අනුපාතයට අනුව) අනුපාතික පදනමක් මත එම වියදම් හෝ අඩු කිරීම් බෙදා දැක්වීම නීත්‍යානුකූල විය යුතු ය.".

23. ප්‍රධාන ප්‍රඥප්තියේ 123 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "සාධාරණ ලිඛිත දැන්වීමක් ලබා දීම මගින්," යන වචන වෙනුවට "සාධාරණ දැන්වීමක් ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන් ලබා දීම මගින්," යන වචන ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (5) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන්:-

"(6) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, කොමසාරිස් ජනරාල්වරයා විසින් දැන්වීමක් මගින්, එම දැන්වීමේ නිශ්චිතව දක්වා ඇති තැනැත්තන්ගේ නම්, ලිපිනයන් හෝ ජාතික හැඳුනුම්පත් අංක සපයන ලෙස මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයා වෙත නියම කරනු ලැබිය හැකි අතර, එම තොරතුරු කොමසාරිස් ජනරාල්වරයා වෙත සැපයීම හෝ කොමසාරිස් ජනරාල්වරයා විසින් බලය පවරනු ලබන යම් බදු නිලධරයකු වෙත මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ භාරයේ පවතින වාර්තා වෙත ප්‍රවේශය ලබා දීම මැතිවරණ කොමසාරිස් ජනරාල්වරයාගේ කාර්යය වන්නේ ය.

(7) වෙනත් යම් ලිඛිත නීතියක පටහැනිව කුමක් සඳහන් වුව ද, සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා විසින් සමාගම් රෙජිස්ට්‍රාර් ජනරාල්වරයා සමඟ ලියාපදිංචි වී ඇති සමාගම්වල අධ්‍යක්ෂවරුන්ගේ නම් සහ ලිපිනයන් ඇතුළුව අධ්‍යක්ෂවරුන් සම්බන්ධයෙන් සිදුවන අදාළ වෙනස් වීම් පිළිබඳ හෝ අලුත් පත්වීම් පිළිබඳ තොරතුරු කොමසාරිස් ජනරාල්වරයා වෙත සෑම මාස හයකට ම වරක් සපයනු ලැබිය යුතු ය.".

24. ප්‍රධාන ප්‍රඥප්තියේ 133 වන වගන්තියේ (2) වන උපවගන්තියේ "ලිඛිත දැන්වීමක් සහිතව," යන වචන වෙනුවට "දැන්වීමක් සහිතව ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

25. ප්‍රධාන ප්‍රඥප්තියේ 134 වන වගන්තියේ (4) වන උපවගන්තියේ "ලිඛිත දැන්වීමක් සහිතව," යන වචන වෙනුවට "දැන්වීමක් සහිතව ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

26. ප්‍රධාන ප්‍රඥප්තියේ 135 වන වගන්තියේ (5) වන උපවගන්තියේ "දැන්වීමක්, ලිඛිතව," යන වචන වෙනුවට "දැන්වීමක් ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්," යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

27. ප්‍රධාන ප්‍රඥප්තියේ 136 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ "135 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ (i) වන අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව තුළ" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2022 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා, 135 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ආ) ඡේදයේ

(i) වන අනුඡේදයේ නිශ්චිතව දක්වා ඇති කාල සීමාව තුළ සහ 2022 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා ස්වයං තක්සේරු වාර්තාව ගොනු කරනු ලැබූ දින සිට මාස දොළහක කාල සීමාවක් තුළ" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

28. ප්‍රධාන ප්‍රඥප්තියේ 151 වන වගන්තියේ (3) වන උපවගන්තියේ "ලිඛිතව" යන වචනය වෙනුවට ලිඛිතව හෝ ඉලෙක්ට්‍රොනික ආකාරයෙන්" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

29. ප්‍රධාන ප්‍රඥප්තියේ 163 වන වගන්තියේ (4) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්ති එකතු කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

"(5) (3) වන උපවගන්තියේ සඳහන් සහතිකයේ දිනය වන විට ගෙවීමට ඇති බදු මුදල් ප්‍රමාණය, යම් දණ්ඩනයක් හා පොලී මුදලක් සහ එම සහතිකයේ දිනයේ සිට නඩු තීන්දුවේ දිනය දක්වා සහතිකයේ සඳහන් මුදල මත අයවිය යුතු නෛතික පොලිය, කොමසාරිස් ජනරාල්වරයා වෙත අයවිය යුතු සහ ගෙවිය යුතු බදු මුදල විය යුතු ය.

(6) 2023 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව මේ වගන්තිය යටතේ පවරනු ලබන නඩු කටයුතු, (3) වන උපවගන්තියේ සඳහන් සහතිකය ඉදිරිපත් කිරීමේ දිනයේ සිට මාස තිහක කාලයක් ඇතුළත සම්පූර්ණ කරනු ලැබිය යුතු ය.".

30. ප්‍රධාන ප්‍රඥප්තියේ 176 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (2) වන උපවගන්තිය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන්:-

"(2) බද්දක් තක්සේරු කිරීම, ගෙවීම, එකතු කිරීම සහ බද්දකට අදාළ ආරවුලක් සඳහා වන කාර්ය පටිපාටි බද්දකට අදාළ දණ්ඩනවලට ද එක හා සමානව අදාළ විය යුතු ය."; සහ

(2) ඒ වගන්තියේ (6) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(6අ) (6) වන උපවගන්තියේ කාර්ය සඳහා, මේ පනතේ අනෙකුත් විධිවිධානවලට අනුකූලව ක්‍රියා කිරීමේ දී, ගෙවිය යුතු බදු මුදල සහ පොලිය ද සමඟ මෙම පරිච්ඡේදය යටතේ අයකරනු ලබන දණ්ඩන මුදල් සඳහන් කරමින් තනි තක්සේරු දැන්වීමක් නිකුත් කිරීම නීත්‍යානුකූල විය යුතු ය.".

31. ප්‍රධාන ප්‍රඥප්තියේ 182 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ (1) වන උපවගන්තියේ "මේ පනත මගින් නියම කර ඇති පරිදි" යන වචන වෙනුවට "2023 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව, අවසන් වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත මගින් නියම කර ඇති පරිදි" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ වගන්තියේ (1) වන උපවගන්තියට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපවගන්තිය ඇතුළත් කිරීමෙන්:-

"(1අ) 2023 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා මේ පනත මගින් නියම කර ඇති පරිදි නිසි ගිණුම්, වාර්තා හෝ ලේඛන පවත්වාගෙන යාමට අපොහොසත් වන යම් තැනැත්තකු (2) වන උපවගන්තියේ විධිවිධාන සලසා ඇති පරිදි ගණනය කරනු ලබන දණ්ඩනයක් සඳහා යටත් විය යුතු ය.".

32. ප්‍රධාන ප්‍රඥප්තියේ 195 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ වගන්තියේ "අපනයන" යන යෙදුමේ අර්ථ නිරූපණයේ "නිශ්චිත ව්‍යවසායක්" යන වචන වෙනුවට "2022 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව නිශ්චිත ව්‍යවසායක්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(2) ඒ වගන්තියේ "සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යවසාය" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (ඈ) ඡේදයේ "එම තැනැත්තාගේ හෝ එම ආශ්‍රිතයාගේ" යන වචන වෙනුවට එම තැනැත්තාගේ සහ එම ආශ්‍රිතයාගේ" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(3) ඒ වගන්තියේ "නිශ්චිත ව්‍යවසාය" යන යෙදුමේ අර්ථ නිරූපණයේ (උ) ඡේදයේ "විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවනු ලබන;" යන වචන වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවනු ලබන:

එසේ වුව ද, ශ්‍රී ලංකා මහ බැංකුවේ යම් විධානයක් හේතුවෙන් මේ ඡේදයේ සඳහන් සේවා වෙනුවෙන් විදේශීය ව්‍යවහාර මුදලින් ගෙවීම් සිදු කිරීමෙන් අපනයනකරු වළක්වනු ලැබූ අවස්ථාවක දී, අපනයනකරු විසින් ඔහුගේ විදේශීය ව්‍යවහාර මුදල් ලැබීම් පිළිබඳව තහවුරු කිරීමක් සැපයිය යුතු ය.".

33. ප්‍රධාන ප්‍රඥප්තියේ පළමුවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (1අ) උපඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින සිට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින සිට, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (1ඉ) උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේද ඇතුළත් කිරීමෙන්:-

"(1ආ) (2) වන උපඡේදයේ විධිවිධානවලට යටත්ව, 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා වාසික හෝ නිර්වාසික පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායම මත පහත දැක්වෙන අනුප්‍රමාණයන් අනුව බදු පැනවිය යුතු ය:-

(අ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස නවයක කාලසීමාව සඳහා බදු අය කළ හැකි ආදායම:-

බදු අය කළ හැකි ආදායම	ගෙවිය යුතු බද්ද
රු. 2,250,000 නො ඉක්මවන	රු. 0 ට අතිරික්ත මුදලින් 6%
රු. 2,250,000 ඉක්මවන නමුත් රු. 4,500,000 නො ඉක්මවන	රු. 135,000 ක් වූ මුදලක් සහ රු. 2,250,000 ට අතිරික්ත මුදලින් 12%
රු. 4,500,000 ඉක්මවන	රු. 405,000 ක් වූ මුදලක් සහ රු. 4,500,000 ට අතිරික්ත මුදලින් 18%;

(ආ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ දෙවන මාස තුනක කාලසීමාව සඳහා බදු අය කළ හැකි ආදායම:-

බදු අය කළ හැකි ආදායම	ගෙවිය යුතු බද්ද
රු. 125,000 නො ඉක්මවන	රු. 0 ට අතිරික්ත මුදලින් 6%
රු. 125,000 ඉක්මවන නමුත් රු. 250,000 නො ඉක්මවන	රු. 7,500 ක් වූ මුදලක් සහ රු. 125,000 ට අතිරික්ත මුදලින් 12%
රු. 250,000 ඉක්මවන නමුත් රු. 375,000 නො ඉක්මවන	රු. 22,500 ක් වූ මුදලක් සහ රු. 250,000 ට අතිරික්ත මුදලින් 18%
රු. 375,000 ඉක්මවන නමුත් රු. 500,000 නො ඉක්මවන	රු. 45,000 ක් වූ මුදලක් සහ රු. 375,000 ට අතිරික්ත මුදලින් 24%
රු. 500,000 ඉක්මවන නමුත් රු. 625,000 නො ඉක්මවන	රු. 75,000 ක් වූ මුදලක් සහ රු. 500,000 ට අතිරික්ත මුදලින් 30%
රු. 625,000 ඉක්මවන	රු. 112,500 ක් වූ මුදලක් සහ රු. 625,000 ට අතිරික්ත මුදලින් 36%;

(1ඇ) (2) වන උපඡේදයේ විධිවිධානවලට යටත්ව, 2023, අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයක් සඳහා වාසික හෝ නිර්වාසික පුද්ගලයකුගේ බදු අය කළ හැකි ආදායම මත පහත දැක්වෙන අනුප්‍රමාණයන් අනුව බදු පැනවිය යුතු ය:-

බදු අය කළ හැකි ආදායම	ගෙවිය යුතු බද්ද
රු. 500,000 නො ඉක්මවන	රු. 0 ට අතිරික්ත මුදලින් 6%
රු. 500,000 ඉක්මවන නමුත් රු. 1,000,000 නො ඉක්මවන	රු. 30,000 ක් වූ මුදලක් සහ රු. 500,000 ට අතිරික්ත මුදලින් 12%
රු. 1,000,000 ඉක්මවන නමුත් රු. 1,500,000 නො ඉක්මවන	රු. 90,000 ක් වූ මුදලක් සහ රු. 1,000,000 ට අතිරික්ත මුදලින් 18%
රු. 1,500,000 ඉක්මවන නමුත් රු. 2,000,000 නො ඉක්මවන	රු. 180,000 ක් වූ මුදලක් සහ රු. 1,500,000 ට අතිරික්ත මුදලින් 24%
රු. 2,000,000 ඉක්මවන නමුත් රු. 2,500,000 නො ඉක්මවන	රු. 300,000 ක් වූ මුදලක් සහ රු. 2,000,000 ට අතිරික්ත මුදලින් 30%
රු. 2,500,000 ඉක්මවන	රු. 450,000 ක් වූ මුදලක් සහ රු. 2,500,000 ට අතිරික්ත මුදලින් 36%";

(ඇ) ඒ ඡේදයේ (5) වන උපඡේදයේ "2021 අප්‍රේල් මස 1 වන දින සිට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දින සිට, එහෙත් 2023 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්:

(2) ඒ උපලේඛනයේ 3 වන ඡේදයේ (1) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(1) (2) වන උපඡේදයේ විධිවිධානවලට යටත්ව, තක්සේරු වර්ෂයක් සඳහා 57 වන වගන්තියේ (1) වන උපවගන්තිය අදාළ වන භාරයක බදු අය කළ හැකි ආදායම මත-

(අ) 2020 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව 24% ක අනුප්‍රමාණයකින්;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 18% ක අනුප්‍රමාණයකින්;

(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 18% ක අනුප්‍රමාණයකින් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක අනුප්‍රමාණයකින්; සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින්,

බදු පැනවිය යුතු ය.";

(3) ඒ උපලේඛනයේ 4 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (1) වන උපඡේදයේ-

(i) ඒ උපඡේදයේ (ආ) අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්;-

"(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 24% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය;";

(ii) ඒ උපඡේදයේ (ආ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතම එකතු කිරීමෙන්:-

"(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 24% ක අනුප්‍රමාණයකින් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය; සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය.":

(ආ) ඒ ඡේදයේ (2අ) වන උපඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින සිට" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින සිට, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව සහ 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා" යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්":

(ඇ) ඒ ඡේදයේ (2අ) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය එකතු කිරීමෙන්:-

"(2ආ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය තුළ, 2022 ඔක්තෝබර් මස 1 වන දිනයෙන් ආරම්භ වන මාස හයක කාලසීමාව සඳහා සමාගමක බදු අය කළ හැකි ආදායමෙහි ඇතුළත් වන පහත දැක්වෙන ඒ ලැබීම් සහ ලාභ කොටස මත සහ 2023 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන්පසුව ආරම්භ වන යම් තක්සේරු වර්ෂයක් සඳහා සමාගමක ලැබීම් සහ ලාභ මත පහත දැක්වෙන අනුප්‍රමාණවලට අනුව බදු පැනවිය යුතු ය:-

(අ) ඔට්ටු ඇල්ලීම් සහ සූදු ක්‍රීඩා පැවැත්වීමෙන් ලබන ලැබීම් සහ ලාභ - 40%; සහ

(ආ) යම් මත්පැන් හෝ දුම්කොළ නිෂ්පාදනයන් නිෂ්පාදනය කොට විකිණීමෙන් හෝ ආනයනය කොට විකිණීමෙන් ලබන ලැබීම් සහ ලාභ - 40%.";

(ඈ) ඒ ඡේදයේ (4) වන උපඡේදයේ (අ) අයිතමයේ "එම ලැබීම් මත 10% ක අනුප්‍රමාණයකින්" යන වචන සහ ඉලක්කම් වෙනුවට "එම ලැබීම් මත, 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව 10% ක අනුප්‍රමාණයකින් සහ 2022 ඔක්තෝබර් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින්" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ඉ) ඒ ඡේදයේ (5) වන උපඡේදයේ-

(i) ඒ උපඡේදයේ "(1) වන, (2අ) වන," යන වචන සහ ඉලක්කම් වෙනුවට "(1) වන, (2අ) වන, (2ආ) වන," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) ඒ උපඡේදයේ (ආ) අයිතමයේ "ඒ තක්සේරු වර්ෂයට ඉක්බිතිව ම එළඹෙන තක්සේරු වර්ෂ දෙක සඳහා" යන වචන වෙනුවට "2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(iii) ඒ උපඡේදයේ (ආ)උප-උපඡේදයේ (ii) අයිතමය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන්:-

"(ii) පළමු වර්ෂයේ පළමු මාස හයට සාපේක්ෂව 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හයේ දී (නිශ්චිත ව්‍යවසායයන් හැර) අපනයනවල සියයට පනහක වැඩිවීමක් තිබිය යුතු වීම,";

(4) ඒ උපලේඛනයේ 5 වන ඡේදයේ (1) වන උපඡේදයේ "බදු අය කළ හැකි ආදායම මත 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 28% ක අනුප්‍රමාණයකින් සහ 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 24% ක අනුප්‍රමාණයකින් බදු පැනවිය යුතු ය." යන වචන සහ ඉලක්කම් වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන්:-

"බදු අය කළ හැකි ආදායම මත -

(අ) 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව 28% ක අනුප්‍රමාණයකින්;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 24% ක අනුප්‍රමාණයකින්;

(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 24% ක අනුප්‍රමාණයකින් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක අනුප්‍රමාණයකින්; සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින්,

"බදු පැනවිය යුතු ය.";

(5) ඒ උපලේඛනයේ 7 වන ඡේදයේ-

(අ) ඒ ඡේදයේ (1) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(1) (2) වන උපඡේදයට යටත් ව, යම් තක්සේරු වර්ෂයක් සඳහා රාජ්‍ය නොවන සංවිධානයක බදු අය කළ හැකි ආදායම මත -

(අ) 2020 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව 28% ක අනුප්‍රමාණයකින්;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 24%ක අනුප්‍රමාණයකින්;

(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 24% ක අනුප්‍රමාණයකින් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක අනුප්‍රමාණයකින්; සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක අනුප්‍රමාණයකින්,

බදු පැනවිය යුතු ය.";

(ආ) ඒ ඡේදයේ (3) වන උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්:-

"(3) යම් රාජ්‍ය නොවන සංවිධානයක් විසින්, 68 වන වගන්තිය යටතේ ප්‍රදානයක්, පරිත්‍යාගයක් හෝ දායක මුදලක් හෝ වෙනත් යම් ආකාරයකින් යම් තක්සේරු වර්ෂයක් තුළ ලැබුණු මුදල් ප්‍රමාණ මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය-

(අ) 2020 ජනවාරි මස 1 වන දිනයට පෙරාතුව 28% ක් විය යුතු ය;

(ආ) 2020 ජනවාරි මස 1 වන දින සිට බලාත්මක වන පරිදි, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව 24% ක් විය යුතු ය;

(ඇ) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භවන තක්සේරු වර්ෂයේ පළමු මාස හය සඳහා 24% ක් සහ එම තක්සේරු වර්ෂයේ දෙවන මාස හය සඳහා 30% ක් විය යුතු ය% සහ

(ඈ) 2023 අප්‍රේල් මස 1 වන දින සිට බලාත්මක වන පරිදි 30% ක් විය යුතු ය."; සහ

(6) ඒ උපලේඛනයේ 10 වන ඡේදයේ (1) වන උපඡේදයේ -

(අ) ඒ උපඡේදයේ (අ) අයිතමයේ "83 වන වගන්තිය අදාළ කරගනු ලබන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "83 වන වගන්තිය හෝ 83අ වගන්තිය අදාළ කරගනු ලබන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ උපඡේදයේ (ආ) අයිතමයේ "84(1)(අ)(ස) වන වගන්තිය අදාළ කරගනු ලබන" යන වචන සහ ඉලක්කම් වෙනුවට "84(1)(අ) වන වගන්තිය අදාළ කරගනු ලබන" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ උපඡේදයේ (ඇ) අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් අයිතමය එකතු කිරීමෙන්:-

"(ඈ) 84අ(1අ) වගන්තිය අදාළ කරගනු ලබන ගෙවීම් සඳහා-

(i) වාසික තැනැත්තකුට කරන කුලී ගෙවීම්වල මුළු එකතුව මසකට රු. 100,000 ක් නොඉක්මවන අවස්ථාවක දී - 0%;

(ii) ගෙවන ලද පොලිය හෝ වට්ටම සඳහා - 5%;

(iii) වාසික තැනැත්තකුට කරන කුලී ගෙවීම්වල මුළු එකතුව මසකට රු.100,000 ක් ඉක්මවන හෝ සමාන වන අවස්ථාවක දී, මුළු මුදලෙන් - 10%;

(iv) ලාභාංශ හැර වෙනත් සියලු ගෙවීම් සඳහා - 14%; සහ

(v) ගෙවන ලද ලාභාංශ සඳහා - 15%.";සහ

(7) ඒ උපලේඛනයේ 11 වන ඡේදයේ "වර්ෂ පහක කාල සීමාව" යන වචන වෙනුවට "වර්ෂ දෙකක කාල සීමාව" යන වචන ආදේශ කිරීමෙන්.

34. ප්‍රධාන ප්‍රඥප්තියේ දෙවන උපලේඛනයේ 1 වන ඡේදයේ (6) වන උපඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් උපඡේදය ඇතුළත් කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් සංශෝධනය කරනු ලැබේ;-

"(6අ) මේ ඡේදයේ උපඡේදයක් යටතේ තමා අදහස් කරන ලද මුළු ආයෝජනය සිදු කර නොමැති යම් තැනැත්තකුට, ක්ෂය විය හැකි වත්කම් මත ආයෝජනය කරනු ලබන පළමුවන දිනයෙන් ආරම්භ වන, ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ වසර තුනක කාල සීමාවක් දෙනු ලැබිය යුතු ය. (6) වන උපඡේදයේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, මේ ඡේදයේ උපඡේදයක් යටතේ පැන නගින ප්‍රාග්ධන දීමනා, ඔහු විසින් අදහස් කරන ලද මුළු ආයෝජනය සම්පූර්ණ කර ඇති තක්සේරු වර්ෂය තුළ දී එහෙත් ඒ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීමේ කාල සීමාව ඉකුත්වීමට පෙරාතුව, අඩු කරනු ලැබිය යුතු ය.".

35. ප්‍රධාන ප්‍රඥප්තියේ තුන්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ;-

(1) ඒ උපලේඛනයේ (උ) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(උඋ) අමාත්‍යවරයාගේ පූර්ව ලිඛිත අනුමැතියකට යටත්ව, ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනය සඳහා අත්‍යවශ්‍ය වන බවට වූ ශ්‍රී ලංකා ආණ්ඩුවේ යම් තීරණයක් හේතුවෙන් ඒ ලැබීම ලැබී ඇත්තේ නම්, ව්‍යාපාරයේ ප්‍රාග්ධන වත්කමක් හෝ බැරකමක් උපලබ්ධි කිරීමක් වශයෙන් හෝ ආයෝජන වත්කමක් උපලබ්ධි කිරීමක් වශයෙන් වූ ලැබීමක් ලෙස ශ්‍රී ලංකා ආණ්ඩුවට සම්පූර්ණයෙන්ම අයත් අස්ථිත්වයකට ලැබුණු ලැබීමක්;

(2) ඒ උපලේඛනයේ (උඋඑ) ඡේදයේ "2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(3) ඒ උපලේඛනයේ (චච) ඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව-" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව-" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(4) ඒ උපලේඛනයේ (චච) ඡේදයට ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් ඡේදය ඇතුළත් කිරීමෙන්:-

"(චචච) 2022 ඔක්තෝබර් මස 1 වන දින හෝ එදිනට පසුව-

(i) 2012 අංක 12 දරන මුදල් පනතේ IV වන කොටසේ විධිවිධානවලට අනුව පහත දැක්වෙන යම් ව්‍යාපාරයක හෝ ව්‍යාපාරවල නිරත වන සහ ජාතික රාජ්‍ය සභාවේ 1978 අංක 4 දරන ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සමඟ ගිවිසුමකට එළඹ ඇති යම් වාසික සමාගමක් විසින් ගෙවනු ලබන ලාභාංශයක්:-

(iඅ) ආනයනය කිරීම, සුළු වශයෙන් පිරිසැකසුම් කිරීම සහ ප්‍රතිඅපනයනය කිරීම හා සම්බන්ධිත යම් ව්‍යාපාර කේන්ද්‍රීය වෙළඳාම;

(iආ) එක් රටකින් භාණ්ඩ ප්‍රසම්පාදනය කර හෝ එක් රටක භාණ්ඩ නිෂ්පාදනය කර එම භාණ්ඩ ශ්‍රී ලංකාවට ගෙන ඒමෙන් තොරව වෙනත් රටකට නැව්ගත කිරීමේ අක්වෙරළ ව්‍යාපාර;

(iඇ) විදේශයන්හි සේවාදායකයන් සඳහා අභිමුඛ සේවා සැපයීම;

(iඈ) මූල්‍ය සැපයුම් ජාලය සහ බිල්පත් මෙහෙයුම් කටයුතු කළමනාකරණය සඳහා ප්‍රධාන පෙළේ ගැනුම්කරුවන්ගේ ප්‍රධාන කාර්යාලීය මෙහෙයුම් කටයුතු සිදු කිරීම;

(iඉ) ශ්‍රී ලංකාව තුළ බන්ධිත ගුදම් හෝ බහු පාර්ශ්වීය ඒකාබද්ධ කිරීම් ඇතුළු කාර්ය සම්පාදන සේවා සිදු කිරීම;

(ii) වාසික සමාගමකට හෝ 84අ වන වගන්තියේ (1අ) වන උපවගන්තිය යටතේ අත්තිකාරම් ආදායම් බද්දට යටත් වන වෙනත් වාසික සමාගමකට ලැබුණු වෙනත් ලාභාංශයකට ආරෝපණය කළ හැකි ප්‍රමාණයට හෝ ඒ ලාභාංශයෙන් ව්‍යුත්පන්න වන ප්‍රමාණයට, වාසික සමාගමක් විසින් සාමාජිකයකු වෙත ගෙවනු ලබන ලාභාංශයක්;";

(5) ඒ උපලේඛනයේ (VV) ඡේදයේ "උපලබ්ධි කිරීමෙන් ලැබීම් ලෙස" යන වචන වෙනුවට, "උපලබ්ධි කිරීමෙන් 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව ලැබීම් ලෙස" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(6) ඒ උපලේඛනයේ (ද) ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (ii) වන උපඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව," යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ ඉන්පසුව, එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ආ) ඒ ඡේදයේ (v) වන උපඡේදයේ -

(i) ඒ උපඡේදයේ "යම් වෘත්තීය අධ්‍යාපන ආයතනයක," යන වචන වෙනුවට "යම් වෘත්තීය අධ්‍යාපන ආයතනයක, 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව," යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්;

(ii) ඒ උපඡේදයේ (ආ) අයිතමයේ "වසර පහක" යන වචන වෙනුවට වසර දෙකක" යන වචන ආදේශ කිරීමෙන්;

(iii) ඒ උපඡේදයේ අතුරු විධානයේ "ඉදිරි වර්ෂ හතර සඳහා ද" යන වචන වෙනුවට "ඉදිරි වර්ෂය සඳහා ද" යන වචන ආදේශ කිරීමෙන්; සහ

(ඇ) ඒ ඡේදයේ (vi) වන උපඡේදයේ "බලාත්මක වන පරිදි," යන වචන වෙනුවට "බලාත්මක වන පරිදි, 2023 අප්‍රේල් මස 1 වන දිනට පෙරාතුව," යන වචන හා ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(7) ඒ උපලේඛනයේ (ප) ඡේදයේ "2021 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2021 අප්‍රේල් මස 1 වන දින හෝ ඉන් පසුව, එහෙත් 2023 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

36. ප්‍රධාන ප්‍රඥප්තියේ පස්වන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ (ඉ) උපඡේදයේ "වෙනත් යම් මූල්‍ය ආයතනයක් අත්කර ගැනීමේ පිරිවැය ලෙස හෝ ඒකාබද්ධ කිරීමේ පිරිවැය ලෙස දරන වියදම," යන වචන වෙනුවට "1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වෙනත් යම් බැංකුවක්, 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත යටතේ බලපත්‍රලාභී මූල්‍ය සමාගමක් හෝ 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 3 වන වගන්තියේ (ඇ) ඡේදය ප්‍රකාරව ලියාපදිංචි කරන ලද කල්බදු මූල්‍ය සමාගමක් හෝ අත්කර ගැනීමේ, කොටස් වශයෙන් අත්කර ගැනීමේ, ව්‍යාපාර අන්තර්ග්‍රහණය කිරීමේ හෝ ඒකාබද්ධ කිරීමේ පිරිවැය ලෙස දරන ලද වියදම" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්; සහ

(2) ඒ උපලේඛනයේ 2 වන ඡේදයේ -

(අ) ඒ ඡේදයේ (අ) උපඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන උපඡේදය ආදේශ කිරීමෙන්;-

"(අ) (i) 2020 ජනවාරි මස 1 වන දිනට පෙරාතුව වූ එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 500,000 ක්;

(ii) 2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව වූ එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 3,000,000 ක්ත

(iii) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස නවය සඳහා රු. 2,250,000 ක් සහ දෙවන මාස තුන සඳහා රු. 300,000 ක්; සහ

(iv) 2023 අප්‍රේල් මස 1 වන දින හෝ එදිනට පසුව ආරම්භ වන එක් එක් තක්සේරු වර්ෂය සඳහා රු. 1,200,000ක්,

එහෙත්, භාරකරුවකු, භාරගැනුම්කරුවකු, පොල්මෑකරුවකු හෝ ඈවරකරුවකු වන යම් පුද්ගලයකු ඒ භාරකරු, භාරගැනුම්කරු, පොල්මෑකරු හෝ ඈවරකරු වශයෙන් ඒ පෞද්ගලික සහනය අඩු කිරීම සඳහා හිමිකම් නොලැබිය යුතු අතර, ආයෝජන වත්කම් උපලබ්ධි කිරීමෙන් වන ලැබීම්වලින් ඒ සහනය අඩු නොකළ යුතු ය;"; සහ

(ආ) ඒ ඡේදයේ (ඊ) උපඡේදයේ "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව තක්සේරු වර්ෂයක් සඳහා මුළු මුදල රු. 1,200,000 ක් දක්වා දරන ලද" යන වචන සහ ඉලක්කම් වෙනුවට "2020 ජනවාරි මස 1 වන දින හෝ එදිනට පසුව, එහෙත් 2022 අප්‍රේල් මස 1 වන දිනයට පෙරාතුව, තක්සේරු වර්ෂයක් සඳහා මුළු මුදල රු. 1,200,000 ක් දක්වා සහ 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂයේ පළමු මාස නවය සඳහා රු. 900,000 ක් දක්වා දරන ලද" යන වචන සහ ඉලක්කම් ආදේශ කිරීමෙන්.

37. ප්‍රධාන ප්‍රඥප්තියේ හයවන උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:-

(1) ඒ උපලේඛනයේ 1 වන ඡේදයේ (4) වන උපඡේදයේ (ආ) අයිතමයේ "ව්‍යාපාර ක්‍රියාවලිය හෝ ඵලදායීතාවය වර්ධනය කිරීමට භාවිතා කරනු ලබන, ව්‍යාපාර පරිශ්‍රයට සවි වී ඇති" යන වචන වෙනුවට "ව්‍යාපාර පරිශ්‍රයට සවි වී ඇති" යන වචන ආදේශ කිරීමෙන්;

(2) ඒ උපලේඛනයේ 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන, 9 වන සහ 11 වන ඡේද පිළිවෙළින් ඒ උපලේඛනයේ 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන සහ 9 වන ඡේද ලෙස නැවත අංක යෙදීමෙන්;

(3) ඒ උපලේඛනයේ නැවත අංක යොදන ලද 8 වන ඡේදයේ "පොලී අනුපාතිකය ශූන්‍යය විය යුතුය." යන වචන වෙනුවට "පොලී අනුපාතිකය, ඒ ගෙවීම 2022 ඔක්තෝබර් මස 1 වන දිනයට පෙරාතුව කොමසාරිස් ජනරාල්වරයා වෙත කරනු ලැබ ඇත්නම්, ශූන්‍යය විය යුතු ය." යන වචන ආදේශ කිරීමෙන්; සහ

(4) ඒ උපලේඛනයේ 10 වන ඡේදයේ (1) වන උපඡේදයේ "වර්ෂ තුන" යන වචන වෙනුවට "වර්ෂ දෙක" යන වචන ආදේශ කිරීමෙන්.

38. (1) 2022 අප්‍රේල් මස 1 වන දිනයෙන් ආරම්භ වන තක්සේරු වර්ෂය සඳහා යම් තැනැත්තකු විසින් ගෙවිය යුතු ආදායම් බද්ද, තනි පුද්ගලයන් විසින් ඒ තක්සේරු වර්ෂයේ පළමු මාස නවය සහ දෙවන මාස තුන ලෙස ද, තනි පුද්ගලයන් නොවන යම් තැනැත්තන් විසින් පළමු මාස හය සහ දෙවන මාස හය ලෙස ද, කාල සීමා දෙකකට වෙන් වෙන්ව ගණනය කළ යුතු ය. ඒ ව්‍යාපාර ආදායම ගණනය කිරීමේ කාර්යය සඳහා, ඒ තැනැත්තා විසින් කාල සීමා දෙක සඳහා වූ බදු අයකළ හැකි ආදායම ලබා ගැනීමට (තනි පුද්ගලයන් විසින් පළමු මාස නවය සඳහා 75% ක් ලෙස සහ දෙවන මාස තුන සඳහා 25% ලෙස ද, තනි පුද්ගලයන් නොවන වෙනත් යම් තැනැත්තන් විසින් පළමු මාස හය සඳහා 50% ක් ලෙස හා දෙවන මාස හය සඳහා ඉතිරි 50% ක් ලෙස) සමානුපාතික පදනම භාවිත කළ හැකි ය.

(2) මේ පනතේ විධිවිධානවලට යටත්ව, යම් තැනැත්තකු විසින් වාරික මගින් බද්ද ගෙවීමේ කාර්යය සඳහා සංශෝධිත ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරනු ලැබිය හැකි ය.

39. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

'අ' වගුව

(1 වන වගන්තිය)

I වන තීරය	II වන තීරය
මේ පනතේ වගන්තිය	ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්තිය
2	5
4	12
5	14
6	16
11	66
18	87
21	92අ
22	94
23	120
25	133
26	134
27	135
28	136

35(1) සහ (3)	*195*
36 (1), (2), (3), (4) සහ (5)	පළමුවන උපලේඛනයේ 1 වන ඡේදයේ (1අ) සහ (1ආ) උපඡේද, 3 වන, 4 වන, 5 වන සහ 7 වන ඡේද
37	දෙවන උපලේඛනයේ 1 වන ඡේදයේ (6අ) උපඡේදය
38(1)	තුන්වන උපලේඛනයේ (උඋ) ඡේදය
40(1) සහ (2)	හය වන උපලේඛනයේ 1 වන ඡේදයේ (4) වන උපඡේදයේ (ආ) අයිතමය සහ 2 වන, 3 වන, 4 වන, 5 වන, 6 වන, 7 වන, 8 වන සහ 9 වන ඡේද
41	අලුත් වගන්තිය

'ආ' වගුව

(1 වන වගන්තිය)

I වන තීරය	II වන තීරය
මේ පනතේ වගන්තිය	ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්තිය
36(1)	පළමුවන උපලේඛනයේ (1) වන ඡේදයේ
38(2),(3),(4) සහ (5)	තුන්වන උපලේඛනයේ (ඌඋ), (චච), (චචච) සහ (ඩඩ) ඡේද
39(2)	පස්වන උපලේඛනයේ (2) වන ඡේදය
40(3) සහ (4)	හයවන උපලේඛනයේ (8) වන සහ (10) වන ඡේද

'ඇ' වගුව

(1 වන වගන්තිය)

I වන තීරය	II වන තීරය	III වන තීරය
මේ පනතේ වගන්තිය	ප්‍රධාන ප්‍රඥප්තියේ වගන්තිය	ක්‍රියාත්මක වන දිනය
3	10	01.04.2021
7	*18*	01.04.2021
8	*19*	01.04.2018
9	*46*	01.04.2021
10	54	01.04.2018
12	*69*	01.04.2018
13	*72*	01.04.2018
14	*73*	01.04.2018
15	*83අ*	01.01.2023
16	*84අ*	01.01.2023
17	*85*	01.01.2023
19	*88*	01.01.2023
20	*90*	01.04.2021
29	*139*	01.04.2023
35(2)	*195*	01.04.2020
36(1) සහ (7)	පළමුවන උපලේඛනයේ 1 වන ඡේදයේ (1ඇ) උපඡේදය සහ 11 වන ඡේදය	01.04.2023
38(6) සහ (7)	තුන්වන උපලේඛනයේ (ද) සහ (ප) ඡේද	31.03.2023
39(1)	පස්වන උපලේඛනයේ 1 වන ඡේදයේ (ඉ) උපඡේදය	01.04.2021

DESIGNED AND PRINTED BY M.D.GUNASENA AND COMPANY PRINTERS (PRIVATE) LIMITED

ISBN 978-624-5917-34-1
ISSN 1391-359x